විදුලිබලය සඳහා ඇති ප්‍රවේශය (2016)	ප්‍රතිශතය	99.3
එක පුද්ගල විදුලිබල පරිභෝජනය	කි.වොැ.පැ.	654.6
පණිවුඩ හුවමාරුව		
දුරකථන ඝනත්වය		
ස්ථාවර දුරකථන	පුද්ගලයින් 100 කට	12.0
ජංගම දුරකථන ද ඇතුළත්ව	පුද්ගලයින් 100 කට	142.0
අන්තර්ජාල ඝනත්වය (ඊ)	පුද්ගලයින් 100 කට	97.7
තැපැල් කාර්යාලයකින් සේවාව ලබන පුද්ගලයන්	සංඛ්‍යාව	5,365
මූල්‍ය ආයතන		
බැංකු		
බලපත්‍රලාභී වාණිජ බැංකු ශාඛා (උ)	සංඛ්‍යාව	2,924
බලපත්‍රලාභී විශේෂිත බැංකු ශාඛා (උ)	සංඛ්‍යාව	706
භාවිතයේ පවතින ණය කාඩ්පත්	පුද්ගලයින් 100,000 කට	9,264
බැංකු ඝනත්වය	පුද්ගලයින් 100,000 කට බැංකු ශාඛා	16
අනෙකුත් මූල්‍ය සමාගම්		
බලපත්‍රලාභී මුදල් සමාගම් ශාඛා	සංඛ්‍යාව	1,832
විශේෂිත කල්බදු සමාගම් ශාඛා (උ9)	සංඛ්‍යාව	02
බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් ශාඛා	සංඛ්‍යාව	124
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs), මුදල් ප්‍රතිචක්‍රීයකරණ යන්ත්‍ර (CRMs) සහ මුදල් තැන්පතු යන්ත්‍ර (CDMs)	පුද්ගලයින් 100,000 කට	32

	ඒකකය	2022
ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව		
පිරිසිදු පානීය ජල පහසුකම් සඳහා ප්‍රවේශය	ප්‍රතිශතය	96.0
නළ ජල පහසුකම් සඳහා ප්‍රවේශය	ප්‍රතිශතය	60.4
සාමාන්‍ය අධ්‍යාපනය		
පාසලකින් ආවරණය වන භූමි ප්‍රමාණය (එ)	වර්ග කි.මී.	6.5
ගුරු/ශිෂ්‍ය අනුපාතය (එ)	සංඛ්‍යාව	16.8
වයස් විශේෂිත ඇතුළත්වීමේ අනුපාතය (1-9 ශ්‍රේණි)	ප්‍රතිශතය	94.8
ප්‍රාථමික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය (ඒ)	ප්‍රතිශතය	95.3
විශ්වවිද්‍යාල අධ්‍යාපනය (ඔ)		
ගුරු/ශිෂ්‍ය අනුපාතය	සංඛ්‍යාව	20.2
වයස් විශේෂිත ඇතුළත්වීමේ අනුපාතය (වයස අවුරුදු 18-22) (ඕ)	ප්‍රතිශතය	9.3
අ.පො.ස. උසස් පෙළ සිට විශ්වවිද්‍යාලයට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ලැබූ ප්‍රමාණය	ප්‍රතිශතය	62.9
ඇතුළත්වීම් - සුදුසුකම් ලැබුවන්ගේ ප්‍රතිශතයක් ලෙස (2021)	ප්‍රතිශතය	22.6
අධ්‍යාපනය සඳහා රජයේ වියදම (ක)	ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස	1.5
මහජන සෞඛ්‍යය		
ආරෝග්‍යශාලා ඇඳන්	පුද්ගලයින් 1,000 කට	3.5
වෛද්‍යවරයෙක් සඳහා පුද්ගලයින්	සංඛ්‍යාව	1,054
හෙද සේවක	පුද්ගලයින් 10,000 කට	18.4
සෞඛ්‍ය සඳහා රජයේ වියදම	ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස	1.3

සටහන: 2022 වර්ෂය සඳහා වන දත්ත තාවකාලික වේ.

මූලයන්: අදාළ ආයතන සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාලේඛන

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය - 2019 මත පදනම් වේ.
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2019 ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණ වටයේදී, 2002 සමීක්ෂණ දත්ත මත පදනම්ව ගණනය කළ නිල දරිද්‍රතා රේඛාව, 2012/13 සමීක්ෂණ දත්ත භාවිතයෙන් සංශෝධනය කර ඇත. නිල දරිද්‍රතා රේඛාවේ සංශෝධනය සමඟ, ජනගහන දරිද්‍රතා දර්ශක දත්ත ද සංශෝධනය කර ඇත.
(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය මත පදනම් වේ.
(ඉ) මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද දත්ත මත පදනම් වේ.
(ඊ) ජංගම අන්තර්ජාල සේවා ඇතුළත්ය.
(උ) සිසු තැන්පතු ඒකක රහිතව සියලු බැංකු ශාඛා
(උ9) ඒකාබද්ධකිරීම් හා අත්පත්කරගැනීම් වලින් අනතුරුව
(එ) රජයේ පාසල් පමණි
(ඒ) රජයේ සහ පෞද්ගලික පාසල් පමණි
(ඔ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාලවල තොරතුරු ඇතුළත් වේ.
(ඕ) අභ්‍යන්තර වශයෙන් ලියාපදිංචි සිසුන් පමණක් ඇතුළත් වේ.
(ක) සාමාන්‍ය සහ උසස් අධ්‍යාපනය සඳහා වූ රජයේ වියදම්

1

ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති

1.1 සමස්ත නිරීක්ෂණ

ශ්‍රී ලංකා ආර්ථිකය නිදහසින් පසු ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ වඩාත් අසීරුතම කාලපරිච්ඡේදය සඳහා 2022 වසරේ දී මුහුණ දුන් අතර, පැවති දැඩි ආර්ථික දුෂ්කරතා හේතුවෙන් මහජන නොසන්සුන්වීම් මෙන්ම දේශපාලන කැළඹීම් ද ඇති විය. එවකට පැවති දුර්වල ආර්ථික තත්ත්වයන් තවදුරටත් පිරිහීම වැළැක්වීම සඳහා රජය සහ මහ බැංකුව මගින් කඩිනම් මෙන්ම මනාව සම්බන්ධීකරණය වූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය විය. මෙම ප්‍රතිපත්ති පිළියම් ක්‍රියාමාර්ග මගින් විශාල පිරිසකට කෙටි කාලීනව බලපෑම් ඇති වුවද, පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට වඩාත් අහිතකර අධි උද්ධමනය, ආර්ථික ක්‍රියාකාරකම් තවදුරටත් පරිහානියට පත්වීම සහ ශ්‍රී ලංකාව ලෝකයේ සෙසු රටවලින් සම්පූර්ණයෙන්ම දුරස්ථ වීම වැනි දැඩි ආර්ථික අස්ථාවරවීම් මගින් ඇති විය හැකි අයහපත් ප්‍රතිඵලවලින් ආර්ථිකය සහ එහි කොටස්කරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය විය. මෙම ප්‍රයත්නයන්හි යහපත් ප්‍රතිඵල 2022 වසරේ අග භාගයේ සිට දක්නට ලැබුණි. සමාජ-ආර්ථික ස්ථායීතාව නැවත ස්ථාපිත කිරීම ඉලක්ක කරගත් යම් ස්ථායී සමතුලිතයකට කෙටි කාලීන වශයෙන් ළඟා වීමට ශ්‍රී ලංකාව සමත් වූ අතර, විදේශීය මූල්‍ය ආයතනවලින් අපේක්ෂිත සහාය ලැබීම ද ආරම්භ විය.

දිගු කාලයක් මුළුල්ලේ පවතින අයවැය හිඟය සහ විදේශීය ජංගම ගිණුමෙහි හිඟය යන ද්විත්ව හිඟයන් හා සමගාමීව, තිරසාර නොවන සාර්ව ආර්ථික ආකෘතියකට අනුගතව සිටි ශ්‍රී ලංකා ආර්ථිකය, ගෝලීය සහ දේශීය මූලාශ්‍ර මගින් පැන නැගුණු අවදානම් රාශියකට මුහුණ දීම හේතුවෙන්, 2022 වසරේ මුල් කාලය වන විට එහි සියලුම ආර්ථික ස්වාරක්ෂක භාවිත කොට අවසන් විය. දුර්වල ප්‍රතිපත්තිමය තීරණ ගැනීම් හේතුවෙන් තවදුරටත් උග්‍ර වූ ආර්ථිකයේ දීර්ඝ කාලීනව මුල් බැස ගත් දුර්වලතා මගින් රට බහුවිධ ව්‍යසනයක් වෙත යොමු කරන ලදී. නුසුදුසු කාලයක දී සිදු කළ බදු අඩු කිරීම්, කිසිදු පූර්ව සූදානමකින් තොරව කාබනික කෘෂිකර්මාන්තය වෙත කඩිනමින් යොමු වීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග, නොකැළැල් ණය සේවාකරණ වාර්තාවක් එලෙසම පවත්වා ගැනීමේ නිරර්ථක උත්සාහයන් මධ්‍යයේ රටේ නිල සංචිත අඩු වීම, විනිමය අනුපාතිකයෙහි ගැළපීම් ප්‍රමාද වීම මෙන්ම පූර්ව අනතුරු ඇඟවීම් කෙරෙහි අවධානය යොමු නොකිරීම යනාදිය හේතුකොට ගෙන සමස්ත ආර්ථිකයට අතිවිශාල කම්පන ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස, උග්‍ර විදේශ විනිමය දුවශීලතා හිඟය සහ විනිමය අනුපාතිකය මත පීඩන සමඟ ගෙවුම් ශේෂය මත වූ පීඩන ඉහළ යෑම, ජීවනෝපායන් විශාල වශයෙන් අහිමි වීම මධ්‍යයේ උද්ධමනය අඛණ්ඩව ඉහළ යෑම හා ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම, රාජ්‍ය මූල්‍ය අසමතුලිතතා විශාල වීම, රාජ්‍ය ණය තිරසාර නොවන මට්ටම් කරා ළඟා වීම හා අවදානම් අධිමිල විශාල ලෙස ඉහළයෑම, ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් දැඩි ලෙස පහත වැටීම හේතුවෙන් විදේශ මූල්‍යනය වෙත වූ ප්‍රවේශය සීමා වීම, සමාජ-ආර්ථික හා සමාජ-දේශපාලනික අර්බුද පෙර නොවූ අන්දමින් උත්සන්න වීම සහ ව්‍යාපාරික විශ්වාසය ශීඝ්‍රයෙන් පහළ යෑම ඇතුළු ගැටලු රැසක් හේතුවෙන් ආර්ථිකය දැඩි බලපෑමකට ලක් විය. අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟ වීම හා සලාකකරණය, ජීවන වියදම හා නිෂ්පාදන පිරිවැය අධික ලෙස ඉහළ යෑම සහ සුබසාධනය හා ජීවනෝපායන් අහිමිවීම් මධ්‍යයේ ව්‍යාපාර මෙන්ම සාමාන්‍ය ජනතාව ද එක සේ දැඩි පීඩාවට පත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ශීඝ්‍රයෙන් වර්ධනය වූ සමාජ නොසන්සුන්තාව සමඟ නිර්මාණය වූ දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් ආර්ථිකය තවදුරටත් පසුබෑමට ලක්වීම වළක්වාලීම සඳහා ගත යුතු ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා නැවත නිර්ණය කිරීමේ කඩිනම් අවශ්‍යතාවක් මතු විය.

1

ගෙවුම් තුලනය මත වූ පීඩන ඉහළ යෑම මධ්‍යයේ, 2022 වසරේ මාර්තු මාසය ආරම්භයේ දී විනිමය අනුපාතිකයේ ක්‍රමානුකූල ගැළපීමක් සඳහා ඉඩ හරින ලදී. කෙසේ වෙතත්, ඉන් අනතුරුව විනිමය අනුපාතිකය වෙළඳපොළ මගින් තීරණය වීමට ඉඩ හැරීමත් සමඟ එය අධික ලෙස අවප්‍රමාණය වූ අතර, ඒ සඳහා වෙළඳපොළ සමපේක්ෂණ හැසිරීම් බොහෝ දුරට හේතු විය. උද්ධමන අපේක්ෂා පාලනය කිරීම ඉලක්ක කරගත් ශක්තිමත් සන්නිවේදන උපාය මාර්ගයක් අනුගමනය කරමින්, ඉල්ලුම් පීඩන මැඩපැවැත්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2022 වසරේ අප්‍රේල් මාසයේ දී සැලකිය යුතු ලෙස මුදල් ප්‍රතිපත්තිය දැඩි කළ අතර, 2022 වසරේ අප්‍රේල් මාසය වන විට අවම මට්ටමක පැවති භාවිත කළ හැකි නිල සංචිත ප්‍රමාණය හමුවේ විනිමය අනුපාතිකය ස්ථාවර කිරීමට ක්‍රියාමාර්ග ගත්තේය. මේ අතර, රට වෙත විදේශ විනිමය ලැබීම් හිඟවීම සහ නිල සංචිත සැලකිය යුතු ලෙස අඩු වීම මධ්‍යයේ අත්‍යවශ්‍ය ආනයන සඳහා වූ ඉල්ලුම හැකි උපරිමයෙන් සපුරාලීම සඳහා මහ බැංකුව විසින් වෙළඳපොළ වෙත විදේශ විනිමය ලබා දෙන ලදී. තවද, අපනයන ඉපැයීම් රට තුළට ගෙන්වා ගැනීම හා එම මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම මත බලපතලාභී බැංකු විසින් මහ බැංකුව වෙත විදේශ විනිමය අනිවාර්යයෙන් විකිණීමේ අවශ්‍යතාවය අඛණ්ඩව පවත්වාගෙන යෑම මෙන්ම, විනිමය අනුපාතිකයෙහි දිනක් තුළ සිදු විය හැකි දැඩි විචලන අවම කිරීම සඳහා විනිමය අනුපාතිකය පිළිබඳ දෛනික මාර්ගෝපදේශ සැපයීම ආරම්භ කළ අතරම, අත්‍යවශ්‍ය ආනයනවලට ප්‍රමුඛතාව ලබා දීමට සහ සුදුසු පාලන ක්‍රියාමාර්ග හරහා ප්‍රාග්ධන ගලායෑම සීමා කිරීම සඳහා ද ශ්‍රී ලංකා මහ බැංකුව අවශ්‍ය පියවර ගත්තේය. තවද, දැඩි සමාජ-ආර්ථික පීඩන මධ්‍යයේ, මහ බැංකුවෙහි ඵලදායී සන්නිවේදනය හා සමගාමීව අඛණ්ඩව මූල්‍ය අංශය අධීක්ෂණය කිරීම හා යෝග්‍ය නියාමන ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම හමුවේ, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහතික කෙරිණි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) සහාය ලබා ගැනීම සම්බන්ධයෙන් තීරණයකට එළඹීමට නොහැකිව මාස ගණනාවක් ගත කිරීමෙන් පසුව, 2022 වසර මුල දී ජා.මූ. අරමුදලේ සහාය ලබා ගැනීමට රජය පියවර ගැනීම ආරම්භ කළේය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය තිරසාර නොවන මට්ටමකට පැමිණ ඇති බව ජා.මූ. අරමුදල ඒ වන විටත් තක්සේරු කර තිබුණු බැවින්, ජා.මූ. අරමුදලෙන් ඕනෑම ආකාරයක මූල්‍ය සහායක් ලබා ගැනීමට පෙර රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා කටයුතු කළ යුතු විය. රාජ්‍ය ණය සේවාකරණය තවදුරටත් සිදු කළ නොහැකි තීරණාත්මක අවස්ථාවකට ළඟා වීමෙන් අනතුරුව, 2022 වසරේ අප්‍රේල් මස මැද භාගයේ දී තාවකාලික ක්‍රියාමාර්ගයක් වශයෙන්, ණය ගෙවීම අත්හිටුවන බව ප්‍රකාශයට පත් කරමින් විදේශ ණය, ප්‍රධාන වශයෙන් ද්විපාර්ශ්වික සහ වාණිජ ණය සේවාකරණය, රජය විසින් අත්හිටුවන ලද අතර, නොපියවූ ණය ප්‍රමාණය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා නිල සහ පෞද්ගලික ණය හිමියන්ගෙන් සහාය ඉල්ලා සිටින ලදී. මීට සමගාමීව, රජය විසින් රාජ්‍ය ආදායම ඉහළ නැංවීම, රජයේ වියදම් සීමා කිරීම, රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, ආනයන පාලන ක්‍රියාත්මක කිරීම හා බලශක්ති සැපයුම සීමා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ආරම්භ කළ අතර, අත්‍යවශ්‍ය වියදම් පියවා ගැනීමට මෙන්ම වඩාත් අවදානමට ලක්විය හැකි ජන කොටස් සඳහා සහාය සැපයීමට ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික හවුල්කරුවන්ගෙන් මූල්‍ය සහාය ලබා ගැනීමට ද කටයුතු කරන ලදී. 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී විස්තීර්ණ ණය පහසුකමක් සඳහා රජය ජා.මූ. අරමුදල සමඟ කාර්ය මණ්ඩල මට්ටමේ එකඟතාවකට එළැඹුණු අතර, ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන මගින්, අපේක්ෂිත තිරසාර ණය ඉලක්කවලට අනුකූලව ණය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා නිල ණය හිමියන්ගෙන් මූල්‍ය සහනිකවීම් ලබා ගැනීමට කටයුතු කළේය. 2023 වසරේ මාර්තු මාසයේ දී ජා.මූ. අරමුදලෙහි විධායක මණ්ඩලය විසින් මාස 48ක් සඳහා වූ දළ වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 3ක විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ අනුමත කරන ලද අතර, පසුගිය දශක කිහිපය තුළ රටේ වර්ධන විභවතාව සීමා කිරීමට මුල් වූ ව්‍යුහාත්මක බාධාවන් සඳහා පිළියම් යොදමින්, ශ්‍රී ලංකාව නැවත යථා තත්ත්වයට පත් කිරීම අරමුණු කරගත් ආර්ථික ගැළපුම් වැඩසටහනක් ද මෙයට ඇතුළත් වේ. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ ක්‍රියාත්මක වන වැඩපිළිවෙළ තුළින් සාක්ෂාත් කරගැනීමට නියමිත බහුවිධ ඉලක්ක අතර ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය හරහා රාජ්‍ය ණයෙහි තිරසාර බව නැවත ස්ථාපිත කරගැනීම ආර්ථිකයේ ස්ථිරසාර වර්ධනයක් අත්කර ගැනීම සඳහා වූ ගමන් මගෙහි ප්‍රධාන සංධිස්ථානයක් වේ. කෙසේ වෙතත්, ණය ප්‍රතිව්‍යුහගතකරණය තුළින් කෙටි කාලීනව මූල්‍ය අංශය කෙරෙහි අභියෝග ඇති කළ හැකි බැවින් එවැනි අභියෝග සඳහා රජය සහ මහ බැංකුව පූර්වෝපායිකව පිළියම් යෙදීම තුළින් මූල්‍ය පද්ධති ස්ථායීතාවය ඉදිරි කාලයේ දී තවදුරටත් ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

රජය සහ මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ප්‍රතිසංස්කරණ මේ වන විට සැලකිය යුතු සාර්ථකත්වයක් සාක්ෂාත් කරගෙන ඇත. 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී උද්ධමනය ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ උපරිම මට්ටම දක්වා ඉහළ යෑමෙන් අනතුරුව සැලකිය යුතු අන්දමේ නිර්-උද්ධමන මාවතක් කරා ප්‍රවේශ වී ඇති අතර, 2022 වසරේ පළමු භාගයේ දී සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වූ විනිමය අනුපාතිකය ඉන් පසුව ස්ථායීව පවතිමින්

1

රූප සටහන 1.1
2022 වසර තුළ සිදු වූ සමාජ-ආර්ථික අර්බුදය, ස්ථාවරත්වය යළි ඇති කිරීම සඳහා ගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ එහි ප්‍රතිඵල



මුදල් ප්‍රතිපත්තිය සැලකිය යුතු ලෙස දැඩි කිරීම



2022 වසර අග භාගයේ සිට එකිනෙකට සම්බන්ධ වූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල ලැබීම ආරම්භ වී ඇති අතර, ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල සහාය ලැබෙන තෙක් ක්‍රියාත්මක කළ හැකි සමතුලිතතාවයකට ළඟා වීමට රට සමත් විය.

1

2023 වසරේ මුල් කාලයේ දී අතිප්‍රමාණය විය. තවද, විදේශීය ජංගම ගිණුමේ හිඟය මධ්‍යස්ථ මට්ටමක පැවති අතර, නිල සංචිත ප්‍රමාණය ක්‍රමානුකූලව ඉහළ නැංවිණි. එමගින් 2023 වසරේ මාර්තු මාසය ආරම්භයේ සිට විනිමය අනුපාතිකයේ නම්‍යශීලීබව යළි ස්ථාපිත කිරීමට හැකි විය. අපේක්ෂිත පරිදි විදේශ විනිමය ලැබීම් යථා තත්ත්වයට පත් වීම හා 2023 වසර තුළ දී ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් කිරීම සහ රාජ්‍ය මූල්‍ය අංශයේ පුළුල් ප්‍රතිසංස්කරණ මගින් ඉදිරියේ දී රටේ ආර්ථික අභිවෘද්ධිය ළඟාකර ගැනීම සඳහා මග පෑදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නිදහසින් පසු මෙරට ඉතිහාසය මුළුල්ලේම මෙවැනි සාර්ව ආර්ථික අර්බුද නැවත නැවතත් අත්විඳ ඇතත්, රටක් වශයෙන් තවමත් අවබෝධ කර ගැනීමට අපොහොසත් වූ බොහෝ පාඩම් පිළිබඳව 2022 වසරේ දී ඇති වූ මෙම සමාජ-ආර්ථික අර්බුදය මගින් අවධාරණය කර ඇත. දත්ත මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ අවශ්‍යතාව; නිසි සැලැස්මකින් තොරව සිදු කරනු ලබන ප්‍රතිපත්ති අත්හදාබැලීම්වල අහිතකර බලපෑම්; ඉදිරි දැක්මක් නොමැති ජනප්‍රිය ප්‍රතිපත්තිවල අයහපත් සුබසාධන බලපෑම් මෙන්ම, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහි ප්‍රමාද වීම්, සාක්ෂි පදනම් කරගත් ප්‍රතිපත්ති විශ්ලේෂණ නොසලකා හැරීම්, මනාව ස්ථාපිත ආර්ථික මූලධර්ම පිළිබඳ අවධානය යොමු නොකිරීම හා විශේෂඥ අදහස් නොසලකා හැරීම්වල ඇති පිරිවැය, මෙම ආර්ථික අර්බුදය මගින් නැවත අවධාරණය කර ඇත. ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වූ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ එකවර සිදු කිරීම තුළින් පැන නැගුණු පිරිවැය සාමාන්‍ය ජනතාවට සහ ව්‍යාපාරවලට විශාල වශයෙන් දැරීමට සිදු විය. මෙම පසුබිම තුළ, පසුගිය දශක හත හමාරකට වඩා වැඩි කාලයක් පුරාවට ආර්ථිකය තුළ මුල් බැසගත් ව්‍යුහාත්මක ගැටලු විසඳීම සඳහා මේ තීරණාත්මක අවස්ථාවේ දී අත්‍යවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා රජය, මහ බැංකුව සහ අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන් සිය සහාය ලබා දිය යුතුය. එවැනි ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වුවහොත්, දිගින් දිගට ම මූල්‍ය සහනාධාර ලබා ගැනීමට සිදු වීම, දිගින් දිගට ම විදේශීය ණය මත යැපීම හා ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලීන්ට යොමු වීමට සිදු වීමත් සමඟ තිරසාර නොවන හා ඉතා අස්ථාවර ආර්ථික ක්‍රියාවලීන් මගින් රට දිගු කාලීන ආර්ථික ප්‍රගතියක් සහ සමෘද්ධිය අත්කර ගැනීම වළක්වමින් මහජනතාව මත අනවශ්‍ය පීඩනයක් ඇති කරනු ඇත. එබැවින්, වත්මන් අර්බුදයෙන් අත්මිදීම සඳහා ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නය තුළ, ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම යටතේ ක්‍රියාත්මක වන වැඩසටහනෙහි සඳහන් වන ප්‍රතිපත්තීන් ද ඇතුළත්ව ස්ථාවර සහ මනා ලෙස සම්බන්ධීකරණය කළ ප්‍රතිපත්ති ඉදිරි කාලයේ දී යළිත් අර්බුදයක් ඇති වීම වළක්වා ගැනීම සඳහා කාලෝචිත ලෙස ක්‍රියාත්මක කළ යුතුය.

1.2 2022 වසරේ සාර්ව ආර්ථික ප්‍රවණතා

මූර්ත අංශයේ ප්‍රවණතා සහ උද්ධමනය

වසංගතයෙන් පසු ආර්ථිකයේ යථා තත්ත්වයට පත්වීම නැවත ආපසු හරවමින් ඇති වූ දේශීය හා ගෝලීය අභියෝග මධ්‍යයේ උත්සන්න වූ පෙර නොවූ ආර්ථික අර්බුදයේ තීව්‍ර බලපෑම් ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන, ශ්‍රී ලංකා ආර්ථිකය නිදහසෙන් පසු ඉතිහාසයේ වාර්තා වූ දරුණුතම ආර්ථික සංකෝචනය, 2022 වසරේ දී වාර්තා කළේය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික පුරෝකථනයන්ට අනුව, මූර්ත ද.දේ.නි.ය 2021 වසරේ වාර්තා වූ සියයට 3.5ක වර්ධනයට සාපේක්ෂව, 2022 වසරේ දී සියයට 7.8කින් සංකෝචනය විය. සාර්ව ආර්ථික අසමතුලිතතා විසඳාලීමෙහි පැවති ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ප්‍රමාදයන්හි බලපෑම පිළිබිඹු කරමින්, අනෙකුත් එවැනි දුර්වලතා අතර, විශේෂයෙන් ම මෑත වසරවල දී බදුකරණයට සහ කෘෂිකාර්මික ප්‍රතිපත්තිවලට අදාළව මනා සුදානමකින් තොරව සහ කාලෝචිත නොවන පරිදි සිදු කළ ප්‍රතිසංස්කරණ මධ්‍යයේ, දිගු කලක සිට පවත්නා අයවැය හිඟයන් සහ විදේශීය ජංගම ගිණුම් හිඟයන් යන ද්විත්ව හිඟයන්ගෙන් සමන්විත දිගු කාලීන සාර්ව ආර්ථික දුර්වලතා 2022 වසරේ දී තවදුරටත් උග්‍ර විය. විදේශ විනිමය හිඟය හේතුවෙන් හටගත් උග්‍ර ඉන්ධන හිඟයෙහි ප්‍රතිඵලයක් ලෙස, සැපයුම් දාමයට බාධා ඇති වීම, දිගු කාලීන විදුලිය ඇනහිටීම්, ආනයන පාලනය යනාදිය හමුවේ අමුද්‍රව්‍ය හිඟයක් ඇති වීම සහ නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම හේතුවෙන් ආර්ථික කටයුතු සැලකිය යුතු ලෙස මන්දගාමී විය. තවද, ඉහළ යන ගෝලීය බලශක්ති මිල ගණන් සහ විනිමය අනුපාතිකයේ අවප්‍රමාණය වීම් හමුවේ ප්‍රධාන උපයෝගිතාවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමෙන් සැපයුම් අංශයේ පීඩන තවත් උත්සන්න වූ අතර, ශීඝ්‍රයෙන් ඉහළ ගිය උද්ධමනය සහ බදු ඉහළ නැංවීම් හේතුවෙන් කුටුම්භවල වැය කළ හැකි ආදායමට බලපෑම් එල්ල විය. මෙම වාතාවරණය තුළ, ආර්ථිකයේ අධි උද්ධමනකාරී තත්ත්වයක් සහ ආර්ථික අවපාතයක් දක්වා මග පෑදිය හැකි දැවැන්ත ආර්ථික ව්‍යසනයක් වැළැක්වීමේ අරමුණ ඇතිව, රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළියම් යෙදීමේ සහ පාලනයන් පැනවීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක්

1.1 සංඛ්‍යා සටහන

සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය (2018-2022)

දර්ශකය	ඒකකය	2018	2019	2020	2021 (අ)	2022 (ආ)
මූර්ත අංශය (ඇ)						
මූර්ත ද.දේ.නි. වර්ධනය	සියයට	2.3	-0.2	-4.6	3.5 (ආ)	-7.8
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි.	රුපියල් බිලියන	15,352	15,911	15,672	17,600 (ආ)	24,148
ඒක පුද්ගල ද.දේ.නි. (ඈ)	එ.ජ. ඩොලර්	4,372	4,082	3,858	3,997 (ආ)	3,474
විදේශීය අංශය						
වෙළඳ ශේෂය (ඇ) (ඈ)	ද.දේ.නි.යේ % වශයෙන්	-10.9	-9.0	-7.1	-9.2	-6.7
ජංගම ගිණුමේ ශේෂය (ඇ) (ඈ)	ද.දේ.නි.යේ % වශයෙන්	-3.0	-2.1	-1.4	-3.7	-1.9
සමස්ත ශේෂය	එ.ජ. ඩොලර් මිලියන	-1,102.9	376.6	-2,327.7	-3,966.6	-2,806.1
විදේශීය නිල සංචිත	එ.ජ. ඩොලර් මිලියන	6,919.2	7,642.4	5,664.3	3,139.2	1,897.6
රාජ්‍ය මූල්‍ය අංශය (ඇ)						
වර්තන ගිණුමේ ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-1.1	-3.4 (ඉ)	-7.5	-7.3	-6.4
ප්‍රාථමික ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	0.6	-3.4 (ඉ)	-4.4	-5.7	-3.7
සමස්ත අයවැය ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-5.0	-9.0 (ඉ)	-10.6	-11.7	-10.2
මධ්‍යම රජයේ ණය (ඊ)	ද.දේ.නි.යේ % වශයෙන්	78.4	81.9	96.5	100.1	113.8 (උ)
මුදල් අංශය සහ උද්ධමනය						
පුළුල් මුදල් වර්ධනය (M_{2b}) (උආ)	සියයට	13.0	7.0	23.4	13.2	15.4
පෞද්ගලික අංශයට ලබා දුන් ණය වර්ධනය (M_{2b}හි) (උආ)	සියයට	15.9	4.2	6.5	13.1	6.2
වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය (එ)	සියයට	4.3	4.3	4.6	6.0	46.4

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 මාර්තු මාසයේ දී නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) උපයෝගී කොටගෙන ඇත.
(ඈ) 2015 සිට කාර්තුමය සාමාන්‍ය විනිමය අනුපාතිකය යොදාගෙන ද.දේ.නි. එ.ජ. ඩොලර්වලින් ගණනය කර ඇත.
(ඉ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත්කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධනය කර ඇත.
(ඊ) 2012 ජනවාරි මාසයේ දී ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778ක් සහ 2022 ජනවාරි මස 01 දින රුපියල් මිලියන 25,217ක් වටිනා බැඳුම්කර කල්පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 31,446කි) ඇතුළත් වේ.
(උ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් මධ්‍යම රජයේ නොගෙවූ ණය ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවේ. අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව බලපෑමකට ලක් වූ විදේශ ණය කාණ්ඩවල ප්‍රාග්ධනයට එකතු කළ යුතු, ගෙවීමට නියමිත පොලී ගෙවීම් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට අදාළව නොගෙවූ ණය පොලී ගෙවීම් මෙම නොගෙවූ ණය සේවාකරණ ගෙවීම්වලට අයත් වේ.
(උආ) වසර අවසානයේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය
(එ) කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013-100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

ගනු ලැබීය. ගෙවුම් තුලන පීඩන පාලනය කිරීම සඳහා වන අනෙකුත් ක්‍රියාමාර්ග සමඟ සිදු කරන ලද සැලකිය යුතු මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමේ ක්‍රියාමාර්ග, බදුකරණයෙහි සහ උපයෝගිතා සැපයීම්වලට අදාළ මිල ගණන්වල සිදු කළ පෙර නොවූ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ මෙන්ම ඉන්ධන සලාක ක්‍රමය යනාදී ක්‍රියාමාර්ග හරහා අධික මිල පීඩනයන් පාලනය කිරීමට, විදේශ විනිමය ද්‍රවශීලතා තත්ත්වයන් වැඩිදියුණු කිරීමට, විදේශීය හා රාජ්‍ය මූල්‍ය අංශයේ ආතතීන් අවම කිරීමට, ආර්ථික කටයුතු සඳහා සහාය වීමට මෙන්ම, කෙටි කාලීනව සැලකිය යුතු ගැළපුම් පිරිවැයන් සහිතව වුව ද ආර්ථිකය ස්ථාවරත්වය කරා මෙහෙය වීමට රුකුලක් ලැබුණි. මේ අතර, රජය විසින් අරමුදල් පහසුකමක් සඳහා ජා.මූ. අරමුදලෙන් සහාය ඉල්ලා සිටි අතර, ද්විපාර්ශ්වික සහ වාණිජ ණය හිමියන් සමඟ ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ ඉදිරියේ දී සිදු කිරීමට නියමිත සාකච්ඡාවල අතුරු ක්‍රියාමාර්ගයක් ලෙස ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීම නිවේදනය කරන ලදී. රජයේ සහ මහ බැංකුවේ මෙම කඩිනම් සහ විසඳුම් ලබාදීමේ ක්‍රියාමාර්ග, ආර්ථික කටයුතු අඩපණ වීම පාලනය කිරීමට මෙන්ම ආර්ථිකය පිළිබඳ ජනතාවගේ විශ්වාසය ගොඩ නැංවීමට සහාය විය.

වසංගතයෙන් පසු ආර්ථිකයේ යථා තත්ත්වයට පත්වීම ආපසු හරවමින්, 2022 වසරේ දී මූර්ත ආර්ථිකය පුළුල් ලෙස සංකෝචනය විය. 2019 වසරේ සිට සුළු ප්‍රගතියක් පෙන්නුම් කළ කෘෂිකාර්මික අංශය, පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 4.6කින් සංකෝචනය විය. ප්‍රධාන වශයෙන් රසායනික පොහොර හා කෘෂි රසායනවල පැවති උග්‍ර හිඟය, අමුද්‍රව්‍ය පිරිවැය ඉහළ යෑම මෙන්ම, සැපයුම් දාමයේ අවහිරතා මෙමගින් පිළිබිඹු විය. වී, තේ, එළවළු, සත්ව නිෂ්පාදන සහ කරදිය ධීවර කර්මාන්තය හා කරදිය ජලජීව වගාව යන උප අංශ කෘෂිකාර්මික අංශයේ සංකෝචනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර,

1

1.2 රූප සටහන
ද.දේ.නි.යෙහි වර්ධනය සඳහා ආංශික දායකත්වය



මූලයෝ: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

තෙල් සහිත පලතුරු භෝග වගාව සහ වන වගාව, ගස් කැපීම හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන යන උප අංශවල වර්ධනයන් වසර තුළ දී වාර්තා විය. අමුද්‍රව්‍යවල උග්‍ර හිඟය සහ යෙදවුම් පිරිවැය ඉහළ යෑම මධ්‍යයේ ඉදිකිරීම් සහ නිෂ්පාදන උප අංශවල කාර්යසාධනය දුර්වලවීම මූලික වශයෙන් හේතුකොටගෙන කර්මාන්ත අංශය 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 16.0කින් සැලකිය යුතු ලෙස සංකෝචනය විය. බලශක්ති අර්බුදය සහ දැඩි මුදල් තත්ත්වයන් ද කර්මාන්ත උප අංශයේ ක්‍රියාකාරිත්වය මත අහිතකර බලපෑම් ඇති කළේය. 2022 වසර තුළ දී, කර්මාන්ත අංශයෙන් සියයට 28.0කට දායකත්වය සපයන ඉදිකිරීම් උප අංශය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 20.9කින් සංකෝචනය වූ අතර, සමස්ත කර්මාන්ත අංශය සඳහා සියයට 59ක පමණ දායකත්වයක් සපයන සමස්ත නිෂ්පාදන අංශය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 12.6කින් සංකෝචනය විය. නිෂ්පාදන අංශය තුළ, අඟුරු හා බනිජ තෙල් පිරිපහදු නිෂ්පාදන සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන උප අංශ, පිළිවෙළින්, සියයට 58.2කින් සහ සියයට 14.2කින් සැලකිය යුතු ලෙස සංකෝචනය වූ අතර, රෙදිපිළි, නිමි ඇඳුම්, සම් හා සම් භාණ්ඩ නිෂ්පාදන උප අංශය 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 8.1ක වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, පතල් හා කැණීම් කටයුතු 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 31.0කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. කොවිඩ්-19 වසංගතයෙන් අනතුරුව සේවා අංශයේ කටයුතු ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට පත්වීමත් සමඟ සේවා අංශය, 2022 වසරේ පළමු කාර්තුවේ දී ශක්තිමත් කාර්යසාධනයක් පෙන්නුම් කළ ද, ඉන් අනතුරුව උත්සන්න වූ ආර්ථික අවිනිශ්චිතතා හේතුවෙන් සේවා අංශය තවදුරටත් ප්‍රසාරණය වීම අඩපණ වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එම අංශය 2022 වසර තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 2.0කින් සමස්තයක් ලෙස සංකෝචනය විය. නවාතැන්, ආහාර හා පාන වර්ග උප අංශය මෙන්ම, භාණ්ඩ හා මගී ප්‍රවාහන උප අංශය, පිළිවෙළින්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 27.0කින් සහ සියයට 3.5කින් ශක්තිමත් ලෙස වර්ධනය වුවද, තොග හා සිල්ලර වෙළඳාම, මූල්‍ය සේවා සහ දේපළ වෙළඳාම යන උප අංශවල වාර්තා වූ සැලකිය යුතු පහළ යෑම් හේතුවෙන් සේවා අංශයේ කාර්යසාධනය මන්දගාමී විය.

නාමික අගයන් සැලකූ විට, ශ්‍රී ලංකා ආර්ථිකය පෙර වසරේ දී වාර්තා කළ සියයට 12.3ක වර්ධනයට සාපේක්ෂව, වසර තුළ ඉහළ ගිය අවධමනකයේ බලපෑම පිළිබිඹු කරමින්, 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 37.2කින් ප්‍රසාරණය විය. කෙසේ වෙතත්, විනිමය අනුපාතිකය විශාල ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන්, සමස්ත ආර්ථිකයේ ප්‍රමාණය 2021 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 88.5 සමඟ සැසඳීමේ දී 2022 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 77.1ක් දක්වා පහළ ගියේය. ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය 2021 වසරේ දී පැවති එ.ජ. ඩොලර් 3,997 සිට 2022 වසරේ දී එ.ජ. ඩොලර් 3,474ක් දක්වා පහළ ගියේය. වියදම් ප්‍රවේශය අනුව, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 69.2ක් පමණ වන පරිභෝජන වියදම, ආර්ථිකයේ නාමික වර්ධනය සඳහා විශාල වශයෙන් දායක වෙමින් 2021 වසරේ දී වාර්තා කළ සියයට 8.4ක ඉහළ යෑමට සාපේක්ෂව 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 34.3කින් ප්‍රසාරණය විය. ඒ අනුව, කාලපරිච්ඡේදය තුළ උද්ධමනයෙහි සිදු වූ ශීඝ්‍ර ඉහළ යෑම පිළිබිඹු කරමින්, කුටුම්භ පරිභෝජන වියදම, පෙර වසරේ වාර්තා කළ සියයට 9.4ක ඉහළ යෑම හා සාපේක්ෂව 2022 වසරේ දී සියයට 39.0ක ඉහළ අනුපාතයකින් ප්‍රසාරණය විය. රජයේ පරිභෝජන වියදම, 2021 වසරේ දී වාර්තා කළ සියයට 2.3ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 3.8කින් වර්ධනය විය. මේ අතර, ආයෝජන වියදම, 2021 වසරේ දී වාර්තා කළ සියයට 25.1ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 28.4කින් වර්ධනය විය. ඒ අනුව, නාමික දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ආයෝජනය, පෙර වසරේ පැවති සියයට 36.7 හා සාපේක්ෂව 2022 වසරේ දී සියයට 34.4ක් විය. රුපියල අවප්‍රමාණය වීමේ සහාය ලබමින් අපනයන කැපී පෙනෙන ලෙස ඉහළ යෑම සහ ආනයන පාලනයන් මෙන්ම, මන්දගාමී සමාහාර ඉල්ලුම මධ්‍යයේ ආනයන

1.2 සංඛ්‍යා සටහන

කර්මාන්ත මූලය අනුව ස්ථාවර මිල (2015) යටතේ දළ ජාතික ආදායම (අ)(ආ)

ආර්ථික කටයුතු	රු. බිලියන		ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (%)		වර්ධනය (%)		වර්ධනය සඳහා දායකත්වය (%)	
	2021 (ඇ)	2022	2021 (ඇ)	2022	2021 (ඇ)	2022	2021 (ඇ)	2022
කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය	**949.9**	**906.5**	**7.3**	**7.5**	**0.9**	**-4.6**	**0.1**	**-0.3**
කෘෂිකර්මාන්තය සහ වන වගාව	812.4	783.4	6.2	6.5	0.8	-3.6	0.1	-0.2
ධීවර කර්මාන්තය	137.6	123.1	1.1	1.0	1.5	-10.5	0.0	-0.1
කර්මාන්ත	**3,937.9**	**3,309.8**	**30.2**	**27.5**	**5.7**	**-16.0**	**1.7**	**-4.8**
පතල් සහ කැණීම් කර්මාන්ත	288.0	198.7	2.2	1.7	1.4	-31.0	0.0	-0.7
නිෂ්පාදන කර්මාන්ත	2,247.2	1,963.3	17.2	16.3	7.4	-12.6	1.2	-2.2
විදුලිය, ගෑස්, ජලය සහ කසළ කළමනාකරණය	230.0	220.0	1.8	1.8	2.2	-4.3	0.0	-0.1
ඉදිකිරීම්	1,172.8	927.7	9.0	7.7	4.4	-20.9	0.4	-1.9
සේවාවන්	**7,414.3**	**7,265.1**	**56.9**	**60.5**	**3.5**	**-2.0**	**2.0**	**-1.1**
තොග හා සිල්ලර වෙළඳාම, ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම සහ නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන්	3,149.8	3,230.3	24.2	26.9	1.3	2.6	0.3	0.6
තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන්	421.8	415.9	3.2	3.5	18.0	-1.4	0.5	0.0
මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම	1,375.3	1,163.3	10.5	9.7	7.5	-15.4	0.8	-1.6
වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන්	1,294.6	1,286.3	9.9	10.7	1.8	-0.6	0.2	-0.1
රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන්	1,172.8	1,169.4	9.0	9.7	2.2	-0.3	0.2	0.0
මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය	**12,302.1**	**11,481.4**	**94.4**	**95.5**	**4.0**	**-6.7**	**3.7**	**-6.3**
භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු-සහනාධාර	735.9	536.5	5.6	4.5	-3.6	-27.1	-0.2	-1.5
වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය	**13,037.9**	**12,017.8**	**100.0**	**100.0**	**3.5**	**-7.8**	**3.5**	**-7.8**
විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම	-294.1	-304.2			12.6	-3.5		
වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම	**12,743.8**	**11,713.6**			**4.0**	**-8.1**		

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සීමා වීමෙහි බලපෑම පිළිබිඹු කරමින් වෙළඳපොළ මිල ගණන් යටතේ භාණ්ඩ හා සේවා සඳහා වූ ශුද්ධ විදේශීය ඉල්ලුම 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත

1.3 රූප සටහන
ආයෝජන සහ ඉතිරිකිරීම්
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලයන්ඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 34.1කින් සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. ඒ අනුව, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස භාණ්ඩ හා සේවා සඳහා ශුද්ධ නාමික විදේශීය ශේෂය 2021 වසරේ වාර්තා වූ සියයට -7.4 හා සාපේක්ෂව, 2022 වසරේ දී සියයට -3.6ක් විය.

2022 වසර තුළ දී දුර්වල සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ශ්‍රම ඵලදායීතාව කෙරෙහි අභියෝග එල්ල වුවද, ආර්ථිකයේ සේවා වියුක්ති මට්ටම් සුළු වශයෙන් පහළ ගියේය. වැඩ කළ හැකි වයසේ ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස ශ්‍රම බලකාය පෙන්නුම් කරන ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය, 2021 වසරේ වූ සියයට 49.9ට සාපේක්ෂව ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනයෙහි ඉහළ යෑමත් සමඟ 2022 වසරේ දී සියයට 49.8ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය. පුරුෂ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය පෙර වසරේ වාර්තා වූ සියයට 71.0 සිට 2022 වසර තුළ දී සියයට 70.5ක් දක්වා පහළ යෑමක්

1

1.4 රූප සටහන
සේවා වියුක්ති අනුපාතිකය



මූලයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වාර්තා කළේය. හිතකර වර්ධනයක් පෙන්නුම් කරමින්, ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 2021 වසරේ වාර්තා වූ සියයට 31.8 හා සාපේක්ෂව 2022 වසර තුළ දී සියයට 32.1ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, සේවා වියුක්ති අනුපාතය 2022 වසරේ දෙවන සහ තුන්වන කාර්තුවල දී යම් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ ද, වාර්ෂික සේවා වියුක්ති අනුපාතය 2021 වසරේ වූ සියයට 5.1 හා සාපේක්ෂව 2022 වසරේ දී සියයට 4.7ක් දක්වා පහළ ගියේය. මේ අතර, උග්‍ර ඉන්ධන හිඟයන්, වරින් වර සිදු කළ විදුලිය විසන්ධි කිරීම් මෙන්ම, ආනයන සීමාවන් සමඟ අමුද්‍රව්‍ය හිඟවීම හේතුවෙන් සැපයුම් මාර්ග වෙත වූ දිගු කාලීන බලපෑම යනාදිය මගින්, සලකා බලන කාලපරිච්ඡේදය තුළ ප්‍රශස්ත අන්දමින් ශ්‍රමය යෙදවීම කෙරෙහි බාධා පැමිණි අතර, එය කිසියම් දුරකට ආර්ථිකයේ එකතු කළ නිෂ්පාදන අගය මන්දගාමී වීම සඳහා දායක වී ඇත. ඒ අනුව, වැඩ කළ පැයක් සඳහා එකතු කළ අගය (2015 මිල ගණන් අනුව), 2021 වසරේ දී වාර්තා වූ වැඩ කරන පැයකට රුපියල් 768.08ක සිට 2022 වසරේ දී

1.3 සංඛ්‍යා සටහන
පවත්නා වෙළඳපොළ මිල අනුව සමස්ත ඉල්ලුම සහ ඉතුරුම් - ආයෝජන පරතරය (අ)(ආ)

ශීර්ෂය	රුපියල් බිලියන		වර්ධනය (%)		ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස (%)	
	2021 (ඇ)	2022	2021 (ඇ)	2022	2021 (ඇ)	2022
1. දේශීය ඉල්ලුම	**18,901.2**	**25,005.2**	**13.6**	**32.3**	**107.4**	**103.6**
1.1 පරිභෝජනය	12,434.3	16,700.6	8.4	34.3	70.6	69.2
පෞද්ගලික	10,769.7	14,973.3	9.4	39.0	61.2	62.0
රාජ්‍ය	1,664.6	1,727.3	2.3	3.8	9.5	7.2
1.2 ආයෝජන (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය)	6,467.0	8,304.6	25.1	28.4	36.7	34.4
2. ශුද්ධ විදේශීය ඉල්ලුම	**-1,301.0**	**-857.5**	**-34.7**	**34.1**	**-7.4**	**-3.6**
භාණ්ඩ හා සේවා අපනයන	2,980.3	5,187.9	23.2	74.1	16.9	21.5
භාණ්ඩ හා සේවා ආනයන	4,281.3	6,045.4	26.5	41.2	24.3	25.0
3. මුළු ඉල්ලුම (ද.දේ.නි.) (1+2)	**17,600.2**	**24,147.7**	**12.3**	**37.2**	**100.0**	**100.0**
4. දේශීය ඉතුරුම් (3-1.1)	**5,165.9**	**7,447.2**	**22.9**	**44.2**	**29.4**	**30.8**
පෞද්ගලික	6,456.3	8,987.6	19.9	39.2	36.7	37.2
රාජ්‍ය	-1,290.4	-1,540.4	-9.3	-19.4	-7.3	-6.4
5. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම (ඈ)	**-395.5**	**-621.4**	**6.5**	**-57.1**	**-2.2**	**-2.6**
6. විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම (ඈ)	**1,034.7**	**1,159.5**	**-10.1**	**12.1**	**5.9**	**4.8**
7. ජාතික ඉතුරුම් (4+5+6)	**5,805.1**	**7,985.3**	**17.7**	**37.6**	**33.0**	**33.1**
8. ඉතුරුම්-ආයෝජන පරතරය						
දේශීය ඉතුරුම්-ආයෝජන (4-1.2)	-1,301.0	-857.5				
ජාතික ඉතුරුම්-ආයෝජන (7-1.2)	-661.9	-319.3				
9. විදේශීය ජංගම ගිණුම් ශේෂය (2+5+6) (ඈ) (ඉ)	**-661.9**	**-319.3**				

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
(ඈ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයෙන් කුමන හෝ වෙනසක් වනුයේ ගණනය කිරීමේ දී ඇතිවන කාල පමාව හේතුවෙනි.
(ඉ) විදේශීය ජංගම ගිණුම් ශේෂය ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස එ.ජ. ඩොලර්වලින් වාර්ෂික ඇස්තමේන්තු ගණනය කර, මෙම වාර්තාවේ 5වන පරිච්ඡේදයේ 5.1 සංඛ්‍යා සටහනේ දක්වා ඇත. එම අගය 2022 වසරේ දේශීය මුදල් අගයෙන් ගණනය කිරීමේ දී වෙනසක් වනුයේ විනිමය අනුපාතයන්හි සැලකිය යුතු විචලනයන් හේතුවෙනි.

මූලයන්ඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

වැඩ කරන පැයකට රුපියල් 686.57ක් දක්වා සියයට 10.6කින් පහළ ගියේය.

පාරිභෝගික මිල උද්ධමනය 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී ඉතිහාසගත ඉහළ මට්ටමක් කරා ළඟා වූ අතර ඉන් අනතුරුව දැඩි මුදල් තත්ත්වයන්හි බලපෑම සහ සැපයුම් අංශයේ අවහිරතා ක්‍රමානුකූලව ලිහිල් වීමත් සමඟ පහළ යෑම ඇරඹිණි. සැපයුම් අවහිරතා, පරිපාලිත මිල ගණන් සම්බන්ධයෙන් වරින් වර සිදු කරන ලද සංශෝධන, ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම යනාදිය හේතුවෙන් ආහාර, බලශක්ති සහ ප්‍රවාහන ක්ෂේත්‍රවල මිල ගණන් ඉහළ යෑම් හා ඒවායේ පසු බලපෑම් ඇතුළු විවිධ අංශවලින් ඇති වූ මිල පීඩන සහ පසුගිය වසර කිහිපය තුළ ක්‍රියාත්මක කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්තිවල පසු බලපෑම හේතුවෙන් ඇති වූ සමස්ත ඉල්ලුම් පීඩන පිළිබිඹු කරමින් 2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ උද්ධමනය ශීඝ්‍ර ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2022 වසර අග භාගයේ සිට උද්ධමනය අඩුවීම සඳහා සැලකිය යුතු ලෙස දැඩි කරන ලද මුදල් ප්‍රතිපත්තියේ බලපෑම සහ අත්‍යවශ්‍ය ආනයන සඳහා ප්‍රමුඛත්වය දීම වැනි අනෙකුත් ඉල්ලුම් කළමනාකරණ ක්‍රියාමාර්ගවල බලපෑම මෙන්ම ආහාර සහ බලශක්ති මිල ගණන් අඩු වීම හේතු විය. ඒ අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කොෂ.පා.මි.ද., 2013=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී සියයට 57.2ක් දක්වා පහළ යෑමට පෙර, 2021 වසර අවසානයේ දී පැවති සියයට 12.1 සිට 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 69.8ක් දක්වා ඉහළ ගියේය. ඒ හා සමාන ප්‍රවණතාවක් අනුගමනය කරමින්, ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2021 වසර අවසානයේ පැවති සියයට 14.0ට සාපේක්ෂව 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 73.7ක් වාර්තා කළ අතර 2022 වසර අවසානය වන විට සියයට 59.2ක අගයක් වාර්තා කළේය. වෙනස් වන වියදම් රටා සහ වෙළඳපොළෙහි පවතින භාණ්ඩ හා සේවා වෙනස්වීම් සැලකිල්ලට ගනිමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කොෂ.පා.මි.ද. සහ ජා.පා.මි.ද. යන දර්ශකවල පදනම් වර්ෂය 2013 සිට 2021 දක්වා සංශෝධනය කරන ලදී. 2022 වසර අග භාගයේ නිරීක්ෂණය කරන ලද මතුපිට උද්ධමනය පහළ යෑමේ ප්‍රවණතාවය 2023 වසර දක්වා ද අඛණ්ඩව පැවතුණි. ඒ අනුව, විදුලි ගාස්තු සංශෝධනය කිරීමේ සමස්ත බලපෑම 2023 වසරේ

1.5 රූප සටහන
මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)



(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජා.පා.මි.ද. සහ කොෂ.පා.මි.ද. නව පදනම් වර්ෂය වන 2021=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම, පිළිවෙළින්, 2023 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසවල දත්ත නිකුත් කිරීමේ සිට ආරම්භ කරන ලද අතර පැරණි පදනම් වර්ෂය වන 2013=100 ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී. ඒ අනුව, 2023 වසරේ ජනවාරි මාසයේ සිට රූප සටහනේ දක්වා ඇති දත්ත නව පදනම් වර්ෂය වන 2021=100 මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මාර්තු මාසයේ දී උද්ධමනය ගණනය කිරීමට ඇතුළත් වී ඇති බැවින් මෑත මාසවලට සාපේක්ෂව අඩු වේගයකින් වුව ද කොෂ.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2023 වසරේ මාර්තු මාසයේ දී සියයට 50.3ක් දක්වා තවදුරටත් පහළ ගියේය. මේ අතර, ජා.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2023 වසරේ පෙබරවාරි මාසයේ දී සියයට 53.6ක් ලෙස සටහන් විය. ශ්‍රී ලංකා රුපියල මෑතක දී අතිප්‍රමාණය වීමත් සමඟ ආනයනික භාණ්ඩ මිල ගණන් තවදුරටත් පහළ යෑමේ ලක්ෂණ නිරීක්ෂණය වූ අතර, 2023 වසරේ මාර්තු මාසය අවසානයේ දී සිදු කරන ලද බනිජ තෙල් මිල ගණන් සංශෝධන ඉදිරි මාසවල දී උද්ධමනය පහළ යෑම වේගවත් වීම සඳහා උපකාරී වනු ඇත. නිතර උච්චාවචනය වන ආහාර සහ බලශක්ති මිල ගණන් ඉවත් කිරීමෙන් පසුව මනින ලද සහ යටිදැරි ඉල්ලුම මත පදනම් වූ පීඩන පෙන්නුම් කරන මූලික උද්ධමනය ද 2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ ඉහළ ගොස් ඉන් පසුව පහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය. මූලික උද්ධමනයේ මෙම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් මෑත වසරවලදී මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ පසු බලපෑම හේතුවෙන් ඇති වූ ඉල්ලුම ඉහළ යෑම, ආනයනික භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම මෙන්ම ආපනශාලා හා හෝටල්, සෞඛ්‍යය, අධ්‍යාපනය වැනි ආහාර නොවන කාණ්ඩවල පිරිවැය ඉහළ යෑම හේතු විය. ඒ අනුව, කොෂ.පා.මි.ද. (2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2021 වසර අවසානයේ දී වාර්තා කළ

1

විශේෂ සටහන I

ශ්‍රී ලංකාවේ නිර්-උද්ධමන (උද්ධමනය පහළ යෑමේ) ක්‍රියාවලිය

2022 වසරේ දී පැවති ඉහළ උද්ධමනය ගෝලීය සංසිද්ධියකි. කොවිඩ්-19 වසංගතයත් සමඟ ඉතා ලිහිල් වූ මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල පසු බලපෑම, රුසියාව සහ යුක්‍රේනය අතර යුද්ධය හේතුවෙන් ඉන්ධන හා ඉන්ධන නොවන වෙළඳ භාණ්ඩ හිඟය තවදුරටත් උග්‍ර වීම සහ සැපයුම් ක්‍රියාවලියේ ගැටලු හා සමගාමීව සැපයුම් ධාරිතාව සීමා වීම ආදියෙහි බලපෑම පිළිබිඹු කරමින් 2022 වසරේ දී ගෝලීය උද්ධමනය සියයට 8.8ක් (IMF, 2023) දක්වා ඉහළ ගියේය. ගෝලීය මෙන්ම දේශීය සාධක මගින් ඇති වූ බලපෑම හේතුවෙන්, නිදහසින් පසු ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ විශාලතම මිල ඉහළ යෑම් වාර්තා කරමින් 2022 වසරේ දී පෙර නොවූ පරිදි ඉහළ උද්ධමනයක් ශ්‍රී ලංකාව විසින් ද අත්විඳින ලදී. කෙසේ වෙතත්, 2022 වසර අවසාන කාලයේදී නිර්-උද්ධමන ක්‍රියාවලියක මූලික සලකුණු පෙන්නුම් කරමින් උද්ධමනය එහි උපරිම මට්ටමේ සිට පහළ යෑම ආරම්භ විය. ඉදිරි කාලය තුළ දී ඉලක්කගත මට්ටම් දක්වා උද්ධමනය පහළ යෑම සඳහා සාධක කිහිපයකින් සහාය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. උද්ධමන අපේක්ෂා කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරමින් උද්ධමනය පිළිබඳව විවිධ වැරදි වැටහීම් සහ වැරදි අර්ථකථන හේතුවෙන් මහජනතාව ව්‍යාකුලත්වයට පත් වන පසුබිමක් තුළ, උද්ධමනය සහ නිර්-උද්ධමනය පිළිබඳ සංකල්ප සහ පසුගිය කාලයේදී ගෝලීය වශයෙන් නිර්-උද්ධමනය පැවති අවස්ථා සහ ඒවායේ ලක්ෂණ මෙන්ම, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ අපේක්ෂිත නිර්-උද්ධමන ක්‍රියාවලිය පිළිබඳව, අවබෝධ කර ගැනීම වැදගත් වේ.

උද්ධමනය පිළිබඳ සංකල්පය

උද්ධමනයේ වෙනස්වීම ඇතැම්විට මිල මට්ටමේ අනුරූප වෙනස් වීමක් යනුවෙන් වැරදි ලෙස අර්ථකථනය කෙරේ. පාරිභෝගික මිල දර්ශකයක් මගින් මනිනු ලබන පොදු මිල මට්ටම මගින් ආර්ථිකයේ සියලුම මිල ගණන්වල සාමාන්‍යය නියෝජනය කරනු ලබයි. ශ්‍රී ලංකාවේ මිල මට්ටම් පිළිබඳ වඩාත් බහුලව භාවිත වන මිනුම් වන්නේ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) වේ. එහෙත්, උද්ධමනය යනු කාලයත් සමඟ පොදු මිල මට්ටම ඉහළ යන වේගය වන අතර, එය සාමාන්‍යයෙන් කාලපරිච්ඡේද දෙකක් අතර, පාරිභෝගික මිල දර්ශකයේ ප්‍රතිශතාත්මක වෙනස ලෙස දැක්වේ. එබැවින්, පෙර කාලපරිච්ඡේදය හා සැසඳීමේදී උද්ධමනය පහළ යෑම මගින් පොදු මිල මට්ටමේ පහත වැටීමක් නිරූපණය වීම අනිවාර්ය නොවන අතර පොදු මිල මට්ටම වැඩිවීමේ වේගය අඩුවීමක් එමගින් පෙන්නුම් කෙරේ.

උද්ධමනය ගණනය කිරීම සඳහා බහුලවම භාවිත වන මිනුම් වන්නේ පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස් වීම සහ මාසික ලක්ෂ්‍යමය වෙනස් වීම වේ. පෙර මාසයට සාපේක්ෂව සලකා බලනු ලබන මාසයේ මිල හැසිරීම් වෙනස්වීම පිළිබඳ තක්සේරු කිරීම මාසික ලක්ෂ්‍යමය උද්ධමනය ගණනය කිරීම මගින් සිදුවේ. එබැවින්, මෙම ගණනය කිරීම 'මිල ගණන්වල ගතිකතාව (price momentum)' හෝ 'උද්ධමනයෙහි ගතිකතාව (momentum of inflation)' ලෙස ද හැඳින්වේ. කෙසේ වෙතත්, පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය, සලකා බලනු ලබන මාසයේ මිල ගණන් වෙනස්වීම් සහ ඊට අනුරූපව වසරකට පෙර වාර්තා වූ මිල ගණන් වෙනස්වීම් යන සාධක දෙක මත රඳා පවතී. වසරකට පෙර වාර්තා වූ මිල ගණන් වෙනස්වීම 'පදනම් බලපෑම (base effect)' ලෙස හඳුන්වනු ලබන අතර, එය පදනම් කාලපරිච්ඡේදයේ (එනම් වසරකට පෙර) මාසික ලක්ෂ්‍යමය උද්ධමනය වෙනස් වීම හරහා වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ වෙනසට දායක වේ. කො.පා.මි.ද.හි (පදනම් වර්ෂය 2013=100)[1] සහ වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයෙහි මෑතකාලීන හැසිරීම් රූප සටහන වි.ස. 1.1හි දැක්වේ. එම රූප සටහන මගින් යම් මාසයක (උදා. 2022 දෙසැම්බර්) වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය අනුරූප මාසයේ පාරිභෝගික මිල දර්ශකය සහ මාස 12කට පෙර (එනම් 2021 දෙසැම්බර්) එහි අගය මත රඳා පවතින බව නිරූපණය කරයි.

රූප සටහන වි.ස. 1.1
කො.පා.මි.ද.හි හැසිරීම සහ උද්ධමනය



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1 2023 පෙබරවාරි මාසයේ දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කොප්‍රා.මි.ද. (පදනම් වර්ෂය 2013=100) ගණනය කිරීම නවතා දමන ලද අතර, එය කොප්‍රා.මි.ද. (පදනම් වර්ෂය 2021=100) ලෙස සංශෝධනය කරන ලදී. 2023 ජනවාරි මාසයේ සිට කොප්‍රා.මි.ද. (2021=100) මත පදනම්ව ගණනය කරන ලද උද්ධමන (වාර්ෂික ලක්ෂ්‍යමය) අගයයන් ලබා ගත හැකිය.

තවද, සලකා බලනු ලබන කාලපරිච්ඡේදයේ මාසික ලක්ෂ්‍යමය උද්ධමනය (ගතික බලපෑම) සහ මාස 12කට පෙර අනුරූප කාලපරිච්ඡේදයේ පැවති මාසික ලක්ෂ්‍යමය උද්ධමනය (පදනම් බලපෑම) අතර වෙනස මගින් වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ මාසික වෙනස දළ වශයෙන් ගණනය කළ හැකිය.[2] එබැවින්, ශ්‍රී ලංකාවේ උද්ධමන හැසිරීම ගණනය කිරීම සඳහා, විශේෂයෙන්ම අපේක්ෂිත නිර්-උද්ධමන ක්‍රියාවලිය තක්සේරු කිරීම සඳහා, වසරකට පෙර කාලපරිච්ඡේදය තුළ පැවති මිල මට්ටම්වල හැසිරීම එනම්, සංඛ්‍යානමය පදනම් බලපෑම සහ මිල මට්ටම්වල අපේක්ෂිත අනාගත හැසිරීම එනම්, අපේක්ෂිත මිල ගතිකතාව පිළිබඳව පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය. රූප සටහන වි.ස. 1.2 මගින් මිලෙහි ගතිකතාව සහ පදනම් බලපෑම අනුව මෑතකාලීන උද්ධමනයේ වෙනස්වීම් නිරූපණය කරයි. විශේෂයෙන්ම වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය අඩු මට්ටමක පවතින කාලපරිච්ඡේද තුළ දී, මිලෙහි ගතික බලපෑම සහ පදනම් බලපෑම එකතු කිරීම මගින් වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ මාසික වෙනස දළ වශයෙන් ගණනය කළ හැකි බව එම රූප සටහනෙන් නිරූපණය කරයි.

රූප සටහන වි.ස. 1.2
මිලෙහි ගතික බලපෑම සහ පදනම් බලපෑම අනුව උද්ධමනයේ හැසිරීම
(කො.පා.මි.ද. මත පදනම්, 2013=100)



*මෙම ආසන්න අගය උද්ධමනය ප්‍රතිශතය කුඩා සංඛ්‍යාවක් වූ විට පමණක් වලංගු වේ.

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ උද්ධමනය සඳහා හේතු වන සාධක

කුඩා විවෘත ආර්ථිකයක් වන ශ්‍රී ලංකාවේ සමස්ත උද්ධමනය, දේශීය උද්ධමනය මෙන්ම ආනයනික උද්ධමනය මත රඳා පවතී. දේශීය උද්ධමනය කෙරෙහි ඉල්ලුම් අංශයේ සාධක, සැපයුම් අංශයේ සාධක සහ අනාගත උද්ධමනය පිළිබඳ ආර්ථික පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා බලපායි. ආර්ථික වර්ධනය හා එහි ප්‍රතිඵල, අනාගත මිල විචලනයන් පිළිබඳ මහජනතාවගේ අපේක්ෂා සහ ආර්ථිකයේ සමස්ත ඉල්ලුම් තත්ත්වයන්ට බලපෑම් කිරීම අරමුණු කරගත් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති (එනම්, මුදල් ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය) ඉල්ලුම් අංශයේ සාධක වන අතර, රජයේ සැපයුම් අංශයේ ප්‍රතිපත්තිවල ප්‍රතිඵල හෝ ස්වාභාවික විපත්, ගෝලීය සිදුවීම් වැනි වෙනත් බාහිර තත්ත්වයන් සැපයුම් අංශයේ සාධක වේ. ශ්‍රී ලංකාවේ ජනතාව සැලකිය යුතු ආනයනික භාණ්ඩ ප්‍රමාණයක් පරිභෝජනය කරන බැවින්, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන්වල විචලනයන් ද රටේ උද්ධමනය කෙරෙහි බලපානු ලබයි. මීට අමතරව, විනිමය අනුපාතිකයේ වෙනස්වීම් ද උද්ධමනය කෙරෙහි බලපායි. නිදසුනක් වශයෙන්, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම මගින් (බොහෝ ආනයන එ.ජ. ඩොලරයට අනුව අගය කර ඇති බැවින්) දේශීය ව්‍යවහාර මුදල් අනුව ආනයන මිල ගණන් ඉහළ යනු ඇත.

නිර්-උද්ධමනය යනු කුමක්ද?

නිර්-උද්ධමනය යනු ආර්ථිකයක පොදු මිල මට්ටම ඉහළ යාමේ වේගය අඩුවීමක් ලෙස අර්ථකථනය කළ හැකිය. මීට අමතරව, වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය තිරසාර පදනමින් පහළ යෑමක් ලෙස ද එය අර්ථ දැක්විය හැක. නිර්-උද්ධමනය යනු, උද්ධමනය අපේක්ෂිත මට්ටමට ළඟා වී මිල ස්ථායීතාව යථා තත්ත්වයට පත් වන තෙක් කෙටි කාලීනව සිට මැදි කාලීනව සිදුවන ක්‍රියාවලියකි. ඉහළ උද්ධමනයක් පැවතීමෙන් අනතුරුව නිර්-උද්ධමනය ඇති වීම, අවධමනයෙන් වෙනස් වන බව සැලකිල්ලට ගැනීම වැදගත් වන අතර, අවධමනය යනු සාමාන්‍ය මිල මට්ටම් තිරසාර පදනමකින් පහළ යෑම වේ. නිර්-උද්ධමන මගින් උද්ධමනය පහළ මට්ටමකට ළඟා වන අතර, එවැනි කාලපරිච්ඡේදයක් තුළදී ද මිල ගණන් ඉහළ ගියද එය අඩු වේගයකින් සිදු වේ.

සාමාන්‍යයෙන්, මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම මෙන්ම සැපයුම් අංශයේ තත්ත්වයන් හිතකර වීම හේතුවෙන් ක්‍රමානුකූලව නිර්-උද්ධමන ක්‍රියාවලිය සිදු වේ. උද්ධමනය නැවත ඉලක්කගත මට්ටමට ගෙන ඒම සහ ඉන් අනතුරුව තිරසාර මට්ටමක පවත්වා ගැනීම මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමෙහි අරමුණ වේ. නිර්-උද්ධමනය සඳහා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම සහ

2 පහත ගණිතමය නිරූපණයෙන් පෙන්වා දී ඇති පරිදි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (πt), සලකා බලන මාසයක පාරිභෝගික මිල දර්ශක අගය (p_t) සහ ඊට අනුරූප මාස 12කට පෙර පැවති පාරිභෝගික මිල දර්ශක අගය (p_{t-12}) මත රඳා පවතියි.

$$\pi_t = \left[\frac{p_t - p_{t-12}}{p_{t-12}}\right] \times 100 \approx [\ln p_t - \ln p_{t-12}] \times 100$$

ස්වභාවික ලඝුගණක (natural logarithms, ln) භාවිතයෙන් වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයෙහි ගණිතමය නිරූපණය ආසන්නව ගණනය කළ පසු, අනුයාත මාස දෙකක වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ වෙනස පහත පරිදි දැක්විය හැකිය.

$$\pi_t - \pi_{t-1} \approx \{[\ln p_t - \ln p_{t-12}] - [\ln p_{t-1} - \ln p_{t-13}]\} \times 100$$

$$\pi_t - \pi_{t-1} \approx \{[\ln p_t - \ln p_{t-1}] - [\ln p_{t-12} - \ln p_{t-13}]\} \times 100$$

සලකා බලනු ලබන විචල්‍යය (එනම් උද්ධමනය) ප්‍රතිශතාත්මක අගය අනුව කුඩා සංඛ්‍යාවක් වූ විට පමණක් ස්වභාවික ලඝුගණක භාවිත කරමින් දළ වශයෙන් ගණනය කිරීම වලංගු වන බව සැලකිය යුතු කරුණකි.

1

විරැකියාව ඉහළ යෑම වැනි අහිතකර තත්ත්වයන් කෙටි කාලීනව ඇති විය හැකිය. කෙසේ වෙතත්, කෙටි කාලීන අහිතකර තත්ත්වයන්ට සාපේක්ෂව උද්ධමනය ඉහළ යෑම හේතුවෙන් ආර්ථිකයට වන අවහිරතා අඩු වීම මගින් ආර්ථිකයට ලැබෙන දිගු කාලීන වාසි ඉතා වැඩි වේ. මේ අතර, දිගු කාලීනව පවතින අවධමනය ආර්ථික කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බැවින්, ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් නිර්-උද්ධමන කාලපරිච්ඡේදයන් අතරතුර අනාගතයේදී ඇති විය හැකි අවධමනය මගින් සිදු විය හැකි අවදානම් පිළිබඳ සුපරීක්ෂාකාරී විය යුතුය (Bernanke, 2012).

ගෝලීය වශයෙන් සැලකිය යුතු නිර්-උද්ධමනයන් පැවති කාලපරිච්ඡේද වාර්තා වී තිබේ. 1980 දශකයේ මුල් කාලයේ දී එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුවෙහි අධිපති ධූරය පෝල් වොල්කර් විසින් දැරූ සමයේ, එක්සත් ජනපදයේ උද්ධමනය අඩුවීම පුළුල් ලෙස සාකච්ඡා කරන ලද සාර්ව ආර්ථික ප්‍රතිඵලයකි (මෙය 'වොකර් නිර්-උද්ධමනය (Volcker disinflation)' ලෙස හැඳින්වේ). 1970 දශකයේ සහ 1980 දශකයේ මුල් කාලයේදී එක්සත් ජනපදයේ පොදු මිල මට්ටම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් වාර්ෂික උද්ධමන අනුපාතිකය, 1980 වසරේදී පැවති සියයට 13.5ක උපරිමයක සිට 1983 වසර වන විට සියයට 3.2ක් දක්වා පහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය තුළ එක්සත් ජනපද ආර්ථිකය අවපාත ද්විත්වයකට මුහුණ දුන් අතර, ඒවා නිර්-උද්ධමනය සඳහා ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති හේතුවෙන් එම ආර්ථික අවපාත ඇති වූ බවට බොහෝ විට සැලකේ. කෙසේ වෙතත්, 'වෝකර් නිර්-උද්ධමනය' මගින් 1980 සහ 1990 දශකවල එක්සත් ජනපදයේ දිගු කාලීන ආර්ථික වර්ධනය සඳහා අවශ්‍ය පදනම සපයන ලදී. මේ අතර, 1970 දශකයේ මුල් කාලයේදී ජපානය සහ ජර්මනිය තුළ ද ඉහළ උද්ධමන මට්ටමක් වාර්තා විය. කෙසේ වෙතත්, 1970 දශකයේ අග භාගය වන විට මෙම රටවල් දෙක තුළ අනෙකුත් දියුණු ආර්ථිකයන්ට සාපේක්ෂව අඩු උද්ධමනයක් වාර්තා විය. දිගු කාලීනව උද්ධමනය මූල්‍ය සංසිද්ධියක් යන අවබෝධය මත පදනම්ව, අදාළ රජයන් සහ මහ බැංකු දැඩි විනයකින් ක්‍රියාත්මක වීම මෙම නිර්-උද්ධමන ක්‍රියාවලියේ සාර්ථකත්වයට හේතු විය (Nelson, 2007). තවද, ඵලදායීතාව වැඩිදියුණු කිරීම ද නිර්-උද්ධමන ක්‍රියාවලිය සඳහා උපකාරී වේ. සැපයුම් අංශයේ ඵලදායී ප්‍රතිපත්ති හරහා දිගු කාලීනව විභව දළ දේශීය නිෂ්පාදිතය වර්ධනය කිරීම තුළින් සමස්ත ඉල්ලුම් පීඩන අඩු කළ හැකිය. 1970 දශකයේ සහ 1980 දශකයේ මුල් කාලයේදී ඉහළ මට්ටම්වල පැවති ගෝලීය උද්ධමනය සැලකිය යුතු ලෙස පහළ යෑම සඳහා ඵලදායීතාව ඉහළ නැංවීම, නියාමන සීමා ඉවත් කිරීම සහ ගෝලීයකරණය ඉහළ යෑම වැනි සාධක ද හේතු වූ බව සැලකේ (Rogoff, 2004).

ශ්‍රී ලංකාවේ අපේක්ෂිත නිර්-උද්ධමන ක්‍රියාවලිය

අපේක්ෂා කළ පරිදි නිර්-උද්ධමන ක්‍රියාවලිය ආරම්භ වී ඇති බව තහවුරු කරමින් ශ්‍රී ලංකාවේ උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේදී වාර්තා වූ එහි උපරිම මට්ටම වන සියයට 70 (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) සිට පහළ යෑම ආරම්භ විය. මෙම ක්‍රියාවලිය සඳහා දැඩි මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් අඩු වූ සමස්ත ඉල්ලුම් පීඩන, දේශීය සැපයුම් තත්ත්වයන්හි අපේක්ෂිත වර්ධනයන්, විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු වීම, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් පහළ යෑම, සහ එවැනි පහළ යෑම් දේශීය වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම ආදී ආර්ථික සාධක මගින් සහාය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංඛ්‍යානමය වශයෙන් සලකා බැලීමේදී නිර්-උද්ධමන ක්‍රියාවලිය සඳහා මිලෙහි ගතිකතාව සහ පදනම් බලපෑම යන සාධක ද්විත්වයම හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, මේ අතුරින් පදනම් බලපෑම වැඩි වශයෙන් දායකත්වයක් ලබා දෙනු ඇත.

තවද, සංඛ්‍යානමය සාධකවල බලපෑම් උද්ධමනය සඳහා හේතු වන සාධක සහ අපේක්ෂිත ආර්ථික ප්‍රවණතා මඟින් තක්සේරු කළ හැකිය. 2023 සහ 2024 වසරවලදී ගෝලීය උද්ධමනය පහත යනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (2023) අපේක්ෂා කරයි. ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන්වල අපේක්ෂිත පහළ යෑම නියමිත පරිදි සහ විනිවිදභාවයෙන් යුතුව දේශීය වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වන්නේ නම් ආනයනික උද්ධමනයෙහි මිලෙහි ගතිකතාව 2023 වසරේ දී සැලකිය යුතු ලෙස පහළ මට්ටමක තබා ගත හැකිය. තවද, ගෙවුම් ශේෂ වර්ධනය වීම මධ්‍යයේ, විනිමය අනුපාතිකය ස්ථායී ලෙස පැවතීම මේ සඳහා උපකාරී වනු ඇත. මෑතකදී දක්නට ලැබුණු එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම අබණ්ඩව පැවතියහොත් ආනයනික උද්ධමනය පහළ යෑමට සහ මෙම ආනයන හා සම්බන්ධ වක්‍ර බලපෑම් අඩු කිරීමට එය උපකාරී වන අතර ම, එමගින් නිර්-උද්ධමන ක්‍රියාවලියට සහාය ලැබෙනු ඇත. මේ අතර, ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම සහ ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම පිළිබිඹු කරමින් 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ ආනයන මිල ගණන් අසමානුපාතික ලෙස ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන් ම 2022 වසරේ මැද භාගයේ දී පමණ ආනයනික වෙළඳ භාණ්ඩ මිල ගණන් මාසික ලක්ෂ්‍යමය පදනම මත විශාල ලෙස ඉහළ ගියේය. මෙම ඉහළ යෑම 2023 වසරේ දී සැලකිය යුතු සෘණාත්මක පදනම් බලපෑමක් හරහා ආනයනික උද්ධමනයට හිතකර ලෙස බලපානු ඇති අතර, එය නිර්-උද්ධමන ක්‍රියාවලියට සහාය වෙනු ඇත (රූප සටහන වි.ස. 1.2). මේ අතර, දේශීය උද්ධමනය සලකා

රූප සටහන වි.ස. 1.3
මතුපිට උද්ධමන පුරෝකථන
කො.පා.මි.ද.* (කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය, %)



*සටහන: 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වූ දත්ත කො.පා.මි.ද. (2013-100) මත පදනම් වන අතර 2023 වසරේ පළමු කාර්තුව සඳහා වූ දත්ත කො.පා.මි.ද. (2021-100) මත පදනම් වේ. පුරෝකථන, පවතින සියලුම දත්ත මත පදනම් වේ.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

බැලීමේ දී, පෙර නොවූ අන්දමේ මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමේ ක්‍රියාමාර්ග සහ අතිශය දැඩි රාජ්‍ය මූල්‍ය ස්ථාවරය හේතුවෙන් මිල ඉහළ යෑම සැලකිය යුතු ලෙස අඩු වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මීට අමතරව, පසුගිය මාස කිහිපය තුළ දී දේශීය සැපයුම් තත්ත්වයන්හි යම් වර්ධනයන් දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ආහාර උද්ධමනය හා සම්බන්ධ මිල ඉහළ යෑම් ඇතැම් මාසවලදී සෘණ අගයන් ද වාර්තා කළේය. උද්ධමනය පහළ දැමීමේ ප්‍රයත්නයට සහාය වෙමින් වැඩිදියුණු වූ සැපයුම් තත්ත්ව 2023 වසරේදී ද අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, විවිධ බදු සම්බන්ධයෙන් රජය විසින් සිදු කරන ලද වෙනස්කම් මෙන්ම 2022 වසරේ සහ 2023 වසරේ මුල් කාලයේදී උපයෝගීතා ගාස්තු සංශෝධන කිරීම, සහ ඒවායේ වක්‍ර බලපෑම් පොදු මිල මට්ටම එක් වරක් පමණක් ඉහළ යෑමට හේතු විය. තවද, ගෙවුම් ශේෂ අර්බුදය හේතුවෙන් දේශීය සැපයුම් තත්ත්වයේ දක්නට ලැබුණු බොහෝ හිඟතා සහ අවහිරතා හේතුවෙන් 2022 වසරේ දී සැපයුම් අංශයේ සාධක උද්ධමනය සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. සැපයුම් අවහිරතා මෙන්ම බදු සහ උපයෝගීතා ගාස්තු ඉහළ දැමීම හේතුවෙන් 2022 වසරේදී දේශීය මිල ගණන්, මාසික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ ගිය අතර ඒ හේතුවෙන් වූ සැලකිය යුතු සංඛ්‍යානමය පදනම් බලපෑම 2023 වසරේ දී උද්ධමනය සඳහා හිතකර ලෙස බලපානු ඇත (රූප සටහන වි.ස. 1.2). එම නිසා, මිල ගණන් ඉහළ යෑම මන්දගාමී වීම සහ සැලකිය යුතු අන්දමේ පදනම් බලපෑමෙහි සහාය ඇතිව ඉදිරි කාලය තුළ දී දේශීය උද්ධමනය පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආනයනික සහ දේශීය උද්ධමනයෙහි අපේක්ෂිත වෙනස්වීම් මෙන්ම සැපයුම් තත්ත්වයන් වර්ධනය වීම ආදියෙහි ප්‍රතිඵලයක් වන රටේ සමස්ත උද්ධමනය, 2023 වසරේ දී තිරසාර පදනමකින් පහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් අපේක්ෂිත නිර්-උද්ධමන මාවත සාක්ෂාත් කර ගැනීමට හැකි වනු ඇත.

මහ බැංකුවේ 'උද්ධමන ව්‍යාප්ති සටහන (Inflation Fan Chart)' මගින් කාර්තුමය පදනමින්, උද්ධමනය සඳහා වන පුරෝකථන විශ්‍රම්භ ප්‍රාන්තර (Confidence Intervals, CI) ආකාරයෙන් ඉදිරිපත් කරයි. උද්ධමන පුරෝකථනය වටා ඇති අවිනිශ්චිතතා විශ්‍රම්භ ප්‍රාන්තර මගින් පෙන්නුම් කරන අතර, පුරෝකථන කාල පරාසය ඉහළ යෑමත් සමග උද්ධමන පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතා විශාල වේ. කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා වන මහ බැංකුවේ නවතම පුරෝකථන උද්ධමන ව්‍යාප්ති සටහන ඇසුරින් රූප සටහන වි.ස. 1.3හි දැක්වා ඇත.

2022 වසරේ දී උපරිම අගයට පැමිණ ඇතැයි ඇස්තමේන්තු කර ඇති ගෝලීය උද්ධමනය, මුදල් ප්‍රතිපත්තිය සැලකිය යුතු ලෙස දැඩි කිරීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම, සැපයුම් දාම යථා තත්ත්වයට පත් වීම සහ බලශක්ති හා වෙනත් වෙළඳ භාණ්ඩ මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2023 වසර තුළ දී පහළ ගොස් 2024 වසරේ දී තවදුරටත් අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. රූප සටහන වි.ස. 1.4 මගින් තෝරාගත් රටවල මෑතකාලීන මුදල් ප්‍රතිපත්ති වාර්තා අනුව එම රටවල උද්ධමන පුරෝකථන නිරූපණය කෙරෙයි. එමගින් බොහෝ රටවල උද්ධමනය 2022 වසරේ දී එම මහ බැංකුවල උද්ධමන ඉලක්කවලට වඩා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බව පෙන්වා දෙයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ මෙන්ම මෙම රටවලද 2023 වසරේ දී වේගවත් නිර්-උද්ධමන ක්‍රියාවලියක් අපේක්ෂා කරයි.

රූප සටහන වි.ස. 1.4
ගෝලීය වශයෙන් නිර්-උද්ධමන පුරෝකථන



මූලාශ්‍රය: ඇමරිකා එක්සත් ජනපදය 2023 මාර්තු පළ කරන ලද මුදල් ප්‍රතිපත්ති වාර්තාව; එක්සත් රාජධානිය 2023 පෙබරවාරි පළ කරන ලද මුදල් ප්‍රතිපත්ති වාර්තාව; යුරෝ කලාපය 2022 දෙසැම්බර් පළ කරන ලද යුරෝ කලාපයේ කාර්ය මණ්ඩල සාර්ව ආර්ථික පුරෝකථන; ඉන්දියාව 2022 සැප්තැම්බර් පළ කරන ලද මුදල් ප්‍රතිපත්ති වාර්තාව; තායිලන්තය 2022 සිව්වන කාර්තුවේදී පළ කරන ලද මුදල් ප්‍රතිපත්ති වාර්තාව

1

උද්ධමන අපේක්ෂා සහ උද්ධමන පුරෝකථනවල කාර්යභාරය

මනා ලෙස පාලනය වූ උද්ධමන අපේක්ෂා මගින් ද රටේ නිර්-උද්ධමන ක්‍රියාවලිය ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. උද්ධමන අපේක්ෂා මගින් ආර්ථිකයක පාර්ශ්වකරුවන් විසින් අනාගතයේදී මිල ගණන් වෙනස් වනු ඇතැයි අපේක්ෂා කරන ආකාරය පිළිබිඹු කරයි. වර්තමානයේ සිදු කරන වියදම්, ණය ගැනීම් සහ ආයෝජන තීරණ කෙරෙහි උද්ධමන අපේක්ෂා මගින් බලපෑම් කළ හැකි බැවින් මහජනයාගේ අපේක්ෂා අනුව යම්තාක් දුරට සැබෑ උද්ධමනය රඳා පැවතීම හේතුවෙන් උද්ධමන අපේක්ෂා වැදගත් වේ. එම නිසා, මැදි කාලීන උද්ධමන ඉලක්කයට වඩා ආර්ථික නියෝජිතයින්ගේ දැනට පවතින උද්ධමන අපේක්ෂා වැඩි නම් එම අපේක්ෂා වෙනස් කිරීම සඳහා මහ බැංකුවක් විසින් පූර්ව සූදානමකින් යුතුව ගනු ලබන ක්‍රියාමාර්ග නිර්-උද්ධමන ක්‍රියාවලියක ඇතුළත් වේ. 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ උද්ධමනය ඉහළ යෑමත් සමග උද්ධමන අපේක්ෂා යම් ප්‍රමාණයකට අස්ථාවර විය. කෙසේ වෙතත්, සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පූර්වෝපායික ලෙස ක්‍රියාත්මක කිරීම මෙන්ම මැදි කාලීන උද්ධමන පුරෝකථන ප්‍රකාශයට පත් කිරීම ඇතුළුව කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුතුව මුදල් ප්‍රතිපත්තිය සන්නිවේදනය කිරීමේ උපාය මාර්ග හේතුවෙන් මහජනතාවගේ අපේක්ෂිත උද්ධමන මට්ටම අබණ්ඩව පහළ යෑමක් මෑතකදී නිරීක්ෂණය වූ අතර, එය මහ බැංකුවේ විශ්වසනීයත්වය ඉහළ නැංවීමට ද උපකාරී විය. නිර්-උද්ධමන ක්‍රියාවලිය සාර්ථකව සිදු වීමත් සමඟ මහ බැංකුවේ උද්ධමන ඉලක්කයට අනුකූලව මැදි කාලීනව උද්ධමන අපේක්ෂා පාලනය කිරීම තවදුරටත් යහපත් වනු ඇත.

පුරෝකථනය කළ කෙටි හා මැදි කාලීන උද්ධමන ගමන් මග නිරන්තරයෙන් සන්නිවේදනය කිරීම නිර්-උද්ධමන ක්‍රියාවලියේ ප්‍රධාන අංගයක් ලෙස පවතී. මේ සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති විවරණයන්ගෙන් අනතුරුව ප්‍රකාශයට පත් වන මාධ්‍ය නිවේදනවල සහ සුදුසු පරිදි අනෙකුත් සන්නිවේදන ක්‍රම හරහා උද්ධමන ව්‍යාප්ති සටහන අබණ්ඩව ප්‍රකාශයට පත් කරනු ඇත. මැදි කාලීන උද්ධමන පුරෝකථනය සහ උද්ධමන ඉලක්කය අතර යම්කිසි වෙනසක් පවතී නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපත්තිමය පියවර කඩිනමින් ගත යුතුය. උද්ධමන ගමන් මග පිළිබඳව නිරන්තරයෙන් හා විනිවිදභාවයෙන් යුතුව සන්නිවේදනය කිරීම, මිල ස්ථායීතාව යථා තත්ත්වයට පත් කිරීම සහ පවත්වා ගැනීම සඳහා වන මහ බැංකුවේ කැපවීම සහතික කිරීමේ යාන්ත්‍රණයක් ලෙස ද ක්‍රියා කරයි.

තවද, මහ බැංකුව විසින් 2023 වසරේ දෙවන භාගයේ සිට ඉදිරි දැක්මක් සහිත (forward looking) අර්ධ වාර්ෂික මුදල් ප්‍රතිපත්ති වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරනු ඇත. මෙම වාර්තාව මගින් ප්‍රධාන වශයෙන් උද්ධමනය සඳහා වන මැදි කාලීන පුරෝකථන සහ පුරෝකථන සඳහා තුඩු දුන් සාධක මෙන්ම ප්‍රකාශයට පත් කරන ලද පුරෝකථනවලින් සැබෑ උද්ධමනය අපගමනය වී තිබේ නම් ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් ද සිදු කරනු ඇත.

ඉහත සාකච්ඡා කළ පරිදි මහ බැංකුව පිළිබඳ විශ්වාසනීයත්වය නිර්-උද්ධමන ක්‍රියාවලිය සඳහා ප්‍රධාන සාධකයක් වේ. මෙමගින් උද්ධමන අපේක්ෂා පාලනය කිරීමට සහාය වනු ඇත. මහ බැංකුව පිළිබඳ විශ්වසනීයත්වය මහ බැංකුවේ ස්වාධීනත්වයට බෙහෙවින් සම්බන්ධ වේ. එහිදී, අපේක්ෂිත නව ශ්‍රී ලංකා මහ බැංකු පනත බලාත්මක කිරීම මහ බැංකුවේ ස්වාධීනත්වය සහ විශ්වසනීයත්වය වර්ධනය කිරීමට විශාල දායකත්වයක් සපයනු ඇති අතර, එය වර්තමානයේ පවතින නිර්-උද්ධමන ක්‍රියාවලියට සහාය වී උද්ධමන අපේක්ෂා තවදුරටත් පාලනය කරනු ඇත.

මූලාශ්‍ර

1. Bernanke, B. S. (2002). Deflation: Making Sure "it" Doesn't Happen Here, Remarks by Governor Ben S. Bernanke Before the National Economists Club, Washington, DC November, 21.
2. International Monetary Fund (IMF), (2023). World Economic Outlook Update Jan 2023: Inflation Peaking amid Low Growth, Washington, DC: International Monetary Fund.
3. Nelson, E. (2007). The Great Inflation and Early Disinflation in Japan and Germany. International Journal of Central Banking, 3(4), 23-76.
4. Rogoff, K. (2004). Globalization and Global Disinflation, Federal Reserve Bank of Kansas City conference on Monetary Policy and Uncertainty: Adapting to a Changing Economy.

සියයට 8.3 හා සැසඳීමේ දී 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී සියයට 47.7ක් ලෙස සටහන් විය. ජා.පා.මි.ද. (2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය ද 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී පැවති සියයට 10.8ට සාපේක්ෂව 2022 වසරේ දෙසැම්බර් මාසය අවසාන වන විට සියයට 57.5ක් දක්වා ඉහළ ගියේය. මතුපිට උද්ධමනයට සමාන අන්දමින්, මූලික උද්ධමනය ද 2023 වසරේ මුල් භාගය තුළ අබණ්ඩව පහළ ගියේය. ඒ අනුව, කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2023 වසරේ මාර්තු මාසයේ දී සියයට 39.1ක් දක්වා පහළ ගිය අතර ජා.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2023 වසරේ පෙබරවාරි මාසයේ දී සියයට 50.1ක් දක්වා පහළ ගියේය. මූලික උද්ධමනය අබණ්ඩව පහළ යෑම සඳහා ඉල්ලුම මත පදනම් වූ උද්ධමන පීඩන සහ අහිතකර උද්ධමන අපේක්ෂා පාලනය සඳහා මහ බැංකුව විසින් ගෙන ඇති ශක්තිමත්

ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතු විය. මේ අතර, 2022 වසරේ සැප්තැම්බර් මාසය දක්වා උද්ධමනය වැඩි වූ කාල සීමාව තුළ ඉහළ මට්ටමක පැවති උද්ධමන අපේක්ෂා, නිර්-උද්ධමන කාල සීමාව තුළ සමස්තයක් ලෙස පහළ යෑමේ ප්‍රවණතාවක් අනුගමනය කළේය.

විදේශීය අංශයේ ප්‍රවණතා

විදේශීය මූල්‍ය ලැබීම් අඩු මට්ටමක පැවතීම, දළ නිල සංචිත අඩු වීම සහ විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස ඉහළ අවප්‍රමාණයකට ලක්වීම මධ්‍යයේ ශ්‍රී ලංකාවේ විදේශීය අංශය 2022 වසරේ දී දැඩි ගෙවුම් තුලන ආතතීන්ට මුහුණ දුන් අතර, එම තත්ත්වය තවදුරටත් උග්‍රවීම වළක්වා ගැනීමට සහ විදේශීය තුලනය යථා තත්ත්වයට පත් කිරීමට ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රාශියක් අවශ්‍ය විය. රජය, 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී ද්විපාර්ශ්වික සහ වාණිජ ණය හිමියන් සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමේ අපේක්ෂාවෙන් අතුරු කාලසීමාවක් සඳහා ණය සේවාකරණය අත්හිටුවීම ප්‍රකාශයට පත්කළ අතර අරමුදල් සපයා ගැනීම සඳහා ජා.මූ. අරමුදල වෙතින් සහාය ඉල්ලා සිටියේය. රජය සහ මහ බැංකුව විදේශ විනිමය ගෙවීම් සීමා කිරීමට පියවර ගත් අතර විදේශ විනිමය ලැබීම් ප්‍රවර්ධනය කිරීමට ද කටයුතු කළේය. සැලකිය යුතු ලෙස දැඩි කරන ලද මුදල් ප්‍රතිපත්තියේ සහ අඩු ඉල්ලුම් තත්ත්වවල බලපෑම පිළිබිඹු කරමින් ආනයන ඉල්ලුම කැපී පෙනෙන ලෙස අඩු විය. පවතින සීමාකාරී ක්‍රියාමාර්ග අඛණ්ඩව පවත්වාගෙන යමින් ආනයන ප්‍රමුඛතා ක්‍රියාමාර්ග මාලාවක් ආරම්භ කරන ලදී. මෙම සීමාවන්ට, තෝරාගත් ආනයන තාවකාලිකව අත්හිටුවීම් සහ බලපත්‍ර සහ ආන්තික තැන්පතු අවශ්‍යතා පැනවීම ඇතුළත් විය. එසේම, අවිධිමත් වෙළඳපොළෙහි ක්‍රියාකාරකම් අධෛර්යමත් කිරීමේ අරමුණින් තෝරාගත් ආනයන ගෙවීම් ක්‍රම සඳහා සීමාවන් පනවන ලදී. ප්‍රාග්ධන ස්වභාවයේ ඇතැම් විදේශ විනිමය ගෙවීම් සඳහා වූ සීමාවන් ද අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. තවද, සංක්‍රමණික සේවකයන් සඳහා මුදල් මත පදනම් වූ සහ මුදල් මත පදනම් නොවූ ඉලක්කගත දිරිගැන්වීම් තුළින් නිල මාර්ග හරහා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් දිරිමත් කරන ලදී. විනිමය අනුපාතිකයෙහි සිදු වූ ඉහළ අවප්‍රමාණය වීම, විවෘත ගිණුම් වැනි ඇතැම් ගෙවීම් ක්‍රම යටතේ සිදු කළ ආනයන සීමා කිරීම සහ ආනයන සඳහා ඇති ඉල්ලුම අඩුවීම යනාදිය නිල විනිමය අනුපාතිකය සහ අවිධිමත් වෙළඳපොළෙහි පිරිනමන විනිමය අනුපාතිකය අතර පැවති ඉහළ පරතරය නිවැරදි කිරීමට හේතු විය. මෙය, විධිමත් මාර්ග ඔස්සේ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් තවදුරටත් දිරිමත් කළේය. 2022 වසරේ දෙවන භාගයේ දී ආනයන වියදම් පහත වැටීම සහ අපනයන ඉපැයීම් ශක්තිමත් මට්ටමක පැවතීම හේතුවෙන් වෙළඳ හිඟයෙහි සැලකිය යුතු අඩු වීමක් නිරීක්ෂණය විය. සංචාරක ඉපැයීම් ඉහළ යෑම නිසා සේවා ගිණුමේ අතිරික්තය යම් ප්‍රමාණයකට ඉහළ ගියේය. කෙසේ වෙතත්, ප්‍රවාහනය, ගුවන් සහ මුහුදු භාණ්ඩ ප්‍රවාහනය සහ තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ අංශය වෙත වූ ලැබීම් ඇතුළු සේවා ගිණුමේ අනෙකුත් සියලුම අංශ පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතුණි. 2022 වසරේ දෙවන භාගයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සැලකිය යුතු වර්ධනයක් තිබියදීත් 2022 වසරේ දී ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය අඩු වූ අතර, උපචිත පදනම මත සම්පාදනය කරන ලද ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය, පෙර වසරට සාපේක්ෂව 2022 වසර තුළ දී සුළු වශයෙන් අඩු විය. මෙම ප්‍රවණතා හමුවේ, ජංගම ගිණුම් හිඟය 2021 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.7 සිට 2022 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.9ක් දක්වා අඩු විය. කොළඹ කොටස් වෙළඳපොළෙහි (ප්‍රාථමික වෙළඳපොළ මිලදී ගැනීම් ඇතුළුව) සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙත ශුද්ධ විදේශීය ආයෝජන ලැබීම් වාර්තා වී තිබියදීත්, රජය වෙත වූ විදේශීය ලැබීම් අඩුවීම හේතුවෙන් මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. මේ අතර, දළ නිල සංචිත පෙර වසර අවසන් වන විට වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 3.1ට සාපේක්ෂව 2022 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 1.9ක් දක්වා අඩු විය. කෙසේ වෙතත්, 2022 වසර අවසානය වන විට, චීන මහජන බැංකුවෙන් ලබා ගත් එ.ජ. ඩොලර් බිලියන 1.4ට පමණ සමාන විදේශ විනිමය හුවමාරු පහසුකම ද මෙයට ඇතුළත් වූ අතර එය භාවිත කිරීමේ කොන්දේසිවලට යටත් වේ. මහ බැංකුව, 2022 වසරේ දී ප්‍රධාන වශයෙන් බලපත්‍රලාභී බැංකු විසින් සිදු කළ අනිවාර්ය විකුණුම්වලින්, එ.ජ. ඩොලර් බිලියන 2.1ක් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් අවශෝෂණය කර ගත් අතර, ඉන්ධන, ගල් අඟුරු සහ ආහාර පිසීමට යොදා ගන්නා ගෑස් යනාදී අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමට අවශ්‍ය විදේශ විනිමය සපුරාලීම සඳහා එ.ජ. ඩොලර් බිලියන 2.7ක් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත සපයන ලදී. 2022 වසර තුළ අතිශය අභියෝගාත්මක තත්ත්වයන් යටතේ අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීම සහතික කිරීම

1

1.6 රූප සටහන
ගෙවුම් තුලනය



සඳහා, විදේශ විනිමය කළමනාකරණය කිරීමේ දී මහ බැංකුව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. මේ අතර, විදේශීය මූල්‍යන මූලාශ්‍ර වෙත ප්‍රවේශ වීමට තිබූ හැකියාව අඩු වීම සහ වාණිජ ණයවල වටිනාකම විශාල වශයෙන් තක්සේරු කිරීමේ වෙනස්කම්වලට ලක්වීම පිළිබිඹු කරමින්, 2021 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 51.8ක් වූ රටේ මුළු විදේශීය ණය ප්‍රමාණය 2022 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 49.7ක් ලෙස වාර්තා විය. නොපියවා ඉතිරිව ඇති රජයේ විදේශීය ණයවල කැපී පෙනෙන වැඩිවීමක් තිබියදීත්, වෙළඳපොළ මිල ගණන් අනුව තක්සේරු කළ රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය අඩුවීම හේතුවෙන්, රජයේ මුළු විදේශීය වගකීම් ප්‍රමාණය සමාන මට්ටම්වල පැවතුණි. ඉන්ධන, ඖෂධ සහ පොහොර ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීම සඳහා රජය විසින් ද්විපාර්ශ්වික ණය ආකාරයෙන් කලාපීය රටවලින් හදිසි ණය පහසුකම් රැසක් ලබාගෙන ඇති හෙයින් එමඟින් 2022 වසර තුළ දී සැලකිය යුතු විදේශීය ණය ලැබීම් ප්‍රමාණයක් වාර්තා කළේය. ද්විපාර්ශ්වික සහ වාණිජ ණය හිමියන්ට ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් විදේශීය ණය ආපසු ගෙවීමේ ප්‍රමාණය අඩු වීමෙන් යම් සහනයක් ලැබුණි. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාවයේ සැලකිය යුතු හිඟය විනිමය අනුපාතිකය මත පීඩනයක් ඇති කළ අතර, 2022 වසරේ මාර්තු මස මුල දී විනිමය අනුපාතිකයෙහි ක්‍රමානුකූල ගැළපීමක අවශ්‍යතාවය මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. කෙසේ වෙතත්, පසුව වෙළඳපොළ සමපේක්ෂණ හමුවේ විනිමය අනුපාතිකය සැලකිය යුතු ඉහළ අවප්‍රමාණයකට ලක් විය. ඒ අනුව, 2022 වසරේ අප්‍රේල් මස අවසානය වන විට, ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 41.4කින් සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. 2022 වසරේ මැයි මස මැද සිට, අධික සමපේක්ෂණ හේතුවෙන් දිනක් තුළ විනිමය අනුපාතිකයෙහි සිදුවන ඕනෑම සැලකිය යුතු උච්ඡාවචනයක් මැඩපැවැත්වීමේ අරමුණින්, මහ බැංකුව විසින් අන්තර් බැංකු බරිත සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකයට අදාළ වන මධ්‍ය විනිමය අනුපාතිකයක් සහ විචලන සීමාවන් ප්‍රකාශනයට පත් කිරීම මගින් වෙළඳපොළ වෙත මාර්ගෝපදේශ ලබා දීම ආරම්භ කරන ලදී. විනිමය අනුපාතිකය අධික ලෙස අවප්‍රමාණය වීමෙන් සහ විචලනය වීමෙන් සාර්ව ආර්ථිකය වෙත සිදු වීමට තිබූ අහිතකර බලපෑම් අවම කර ගැනීමට උපකාරී වෙමින්, එතැන් සිට විනිමය අනුපාතිකය ස්ථාවර කිරීමට මෙම පියවර ඵලදායී විය. මෙම ප්‍රවණතා පිළිබිඹු කරමින්, මුදල් වර්ග කිහිපයකින් සැදුම්ලත් පැසකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි සිදුවන වෙනස්කම් සහ එමගින් විදේශීය තරගකාරිත්වය මනිනු ලබන නාමික සඵල විනිමය අනුපාතික (නා.ස.වි.අ.) සහ මූර්ත සඵල විනිමය අනුපාතික (මූ.ස.වි.අ.) දර්ශක 2022 වසරේ දී සැලකිය යුතු ලෙස පහළ ගියේය. සමස්තයක් වශයෙන්, මූ.ස.වි.අ. දර්ශකය දර්ශකාංක 100 සීමාවට වඩා සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, විනිමය අනුපාතිකය ජාත්‍යන්තර වෙළඳාම සඳහා ප්‍රමාණවත් ලෙස තරගකාරීව පවතින බව එමගින් පිළිබිඹු විය.

ශ්‍රී ලංකාව 2023 වසරේ මාර්තු මාසයේ දී විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) මිලියන 2,286ක් (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 3,000ක්) සඳහා ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය ලබා ගත් අතර, එම වැඩසටහන යටතේ වි.ගැ.හි. මිලියන 254ක (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 333ක) පළමු වාරිකය 2023 වසරේ මාර්තු මාසයේ දී ලබා දෙන ලදී. විස්තීර්ණ ණය පහසුකමෙන් සහාය දක්වන වැඩපිළිවෙළ සම්බන්ධයෙන් ජා.මූ. අරමුදල සමඟ 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී ඇති කර ගත් නිලධාරී මට්ටමේ එකඟතාවයෙන් පසුව, ශ්‍රී ලංකාව මූල්‍ය සහතික ලබා ගැනීම සඳහා ද්විපාර්ශ්වික ණය හිමියන් සමඟ සාකච්ඡා ආරම්භ කළ අතර වාණිජ ණය හිමියන් සමඟ යහපත් අරමුණු ඇතිව වැඩපිළිවෙළක් වෙත යොමු විය. තවද, ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සියලුම පූර්ව ක්‍රියාමාර්ග සම්පූර්ණ කිරීමට ශ්‍රී ලංකාව විසින් පියවර ගන්නා ලදී. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ සාර්ථක කර ගැනීම සඳහා, 2023 වසරේ මුල් කාලපරිච්ඡේදයේ සිට හිතකර ක්‍රියාමාර්ගයන් කිහිපයක් ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ

විශේෂ සටහන 2

ශ්‍රී ලංකාවේ ආර්ථික ගැළපුම් වැඩසටහන සඳහා ආධාර වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ

හැඳින්වීම

ගෝලීය සහ දේශීය කම්පන හේතුවෙන් සාර්ව ආර්ථිකයෙහි පවතින ව්‍යුහාත්මක ගැටලු මගින් ඇති කරන ලද අවදානම් සහ අස්ථාවර තත්ත්වයන්වලට ශ්‍රී ලංකා ආර්ථිකය නිරන්තරයෙන් මුහුණ දෙමින් සිටියි. ආර්ථිකය මත පැවැති පීඩනය තවත් ඉහළ නංවමින්, පෙර සූදානමකින් තොරව ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති වෙනස්කම් හා සමඟ 2020 වසරේ සිට කොවිඩ්-19 වසංගතය ආරම්භ වීම නිසා ආර්ථික තත්ත්වය දැඩි ලෙස දුර්වල විය. එහි ප්‍රතිඵලයක් ලෙස, රට දැඩි ගෙවුම් තුලන අර්බුදයකට මුහුණ දුන් අතර, ඉන් අනතුරුව 2022 වසරේ දී ගැටලු රාශියකට මුහුණ දුන්නේය. ආර්ථිකය ඉහළ ස්ථාවරත්වයක් කරා යොමු කිරීම සඳහා 2022 වසරේ මුල් භාගයේ සිට ප්‍රතිපත්තිමය මැදිහත්වීම් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. සාර්ව ආර්ථික ස්ථායීකරණ වැඩසටහනකට යටත්ව මූල්‍ය ආධාර ලබා ගැනීම සහ ඊට අදාළව රාජ්‍ය ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු ආරම්භ කිරීම මෙම ක්‍රියාවලියේ දී ගනු ලැබූ ප්‍රධාන පියවර වේ. ගෙවුම් තුලනයට සහායවීම සඳහා සහ රජයේ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට සහාය දැක්වීම ඇතුළු විවිධ අරමුණු සඳහා ශ්‍රී ලංකාව 2022 වසරට පෙර, වරින් වර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) වැඩසටහන් ගණනාවකට යොමුවිය. කෙසේ වෙතත්, පෙර අවස්ථාවල දී මෙන් නොව, ශ්‍රී ලංකා ඉතිහාසය තුළ මෙතෙක් වාර්තා වූ දුෂ්කරම ආර්ථික අර්බුදය හමුවේ විස්තීර්ණ ණය පහසුකමක් ලබා ගැනීම සඳහා 2022 වසරේ දී ජා.මූ. අරමුදල සමඟ සාකච්ඡා ආරම්භ කළේය. ණය ප්‍රමාණය අධික ලෙස වර්ධනය වීම මෙන්ම රාජ්‍ය මූල්‍ය හා ගෙවුම් තුලන මූල්‍යන අවශ්‍යතා අබණ්ඩව ඉහළ යෑම හමුවේ ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වල සාර්ථකත්වය සීමා විය. ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් අබණ්ඩව පහත හෙළීම් මධ්‍යයේ විදේශීය මූල්‍යන සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රවේශය සීමිත වී ඇති අතර, එමගින් නව අරමුදල් රැස්කිරීම සහ පවතින ණය සේවාකරණය අතිශයින් අභියෝගාත්මක විය. භාවිතා කළ හැකි දළ නිල සංචිත ශූන්‍ය මට්ටමට ආසන්න වීම, විනිමය අනුපාතිකය පෙර නොවූ අන්දමින් අවප්‍රමාණය වීම, ඉන්ධන, විදුලිය සහ අනෙකුත් අත්‍යවශ්‍ය ආනයනික ද්‍රව්‍ය ලබාගැනීමට මහජනතාවට දුෂ්කර වීම, ඉල්ලුම් පීඩන සහ සැපයුම් හිඟතා හේතුවෙන් සාමාන්‍ය මිල මට්ටම් පැවති මට්ටමේ සිට වේගවත් ලෙස ඉහළ යෑම ආදිය මගින් මූල්‍ය පද්ධති ස්ථායීතාව අභියෝගයට ලක්වූ අතර, 2022 වසරේ මුල් භාගයේ දී සමාජ හා දේශපාලන ගැටුම් යළි යළිත් සිදුවිය. මෙවැනි පසුබිමක් තුළ, ආර්ථික ස්ථායීතාව ඇති කිරීම සඳහා බාහිර පාර්ශ්වයක සහාය අවශ්‍ය වූ අතර, ශ්‍රී ලංකා බලධාරීන් විසින් ජා.මූ. අරමුදල සමඟ සාකච්ඡා ආරම්භ කරන ලදී. යෝජිත ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජා.මූ. අරමුදලෙහි කාර්ය මණ්ඩල කණ්ඩායම සමඟ වසරකට අධික කාලයක් පුරා අබණ්ඩව සාකච්ඡා කිරීම සහ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ නියමිත පූර්ව ක්‍රියාමාර්ග ගැනීම සාර්ථකව අවසන් කිරීම මෙන්ම නිල ණය හිමියන්ගෙන් මූල්‍ය සහතිකවීම් ලැබීම හේතුවෙන් 2023 වසරේ මාර්තු මස අග දී විස්තීර්ණ ණය පහසුකම සඳහා අනුමැතිය ලබා ගැනීමට හැකි විය. මෙම ආර්ථික ගැළපුම් වැඩසටහනේ විශේෂ ලක්ෂණ, විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ අපේක්ෂිත වර්ධනයන්, ඉදිරි කාලපරිච්ඡේදය තුළ ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා වන රටේ කැපවීම, වසර හතරක් පුරා මෙම වැඩසටහන අබණ්ඩව ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පහත කොටස් මගින් කෙටියෙන් සාකච්ඡා කෙරේ.

ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමෙහි අරමුණු සහ ක්‍රියාපටිපාටිය

මාස 48ක වැඩපිළිවෙළක් සහිත වත්මන් ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම යටතේ ඇති සමස්ත මුදා හැරීම් ප්‍රමාණය වන විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) බිලියන 2.286ක් (එ.ජ. ඩොලර් බිලියන 3ක් පමණ) රජයේ අයවැය සඳහා සහාය පිණිස යොදා ගැනීමට නියමිතය. එසේ වුවත්, විස්තීර්ණ ණය පහසුකම යටතේ වූ ලැබීම්, දළ නිල සංචිත වලට දායක වෙමින් ගෙවුම් තුලනයට ද සහාය වේ. අර්ධ වාර්ෂිකව සිදු කරන සමාලෝචනවලට සහ ඉන් පසුව ලැබෙන විධායක මණ්ඩල අනුමැතියට යටත්ව මෙම අරමුදල් මුදා හැරීම සමාන කොටස් නවයක් යටතේ බෙදා සිදු කරනු ඇත. විධායක මණ්ඩලයේ අනුමැතිය ලැබුණු වහාම පළමු වාරිකය 2023 වසරේ මාර්තු මාසයේ දී ලැබුණි. මෙම වැඩසටහන මගින්, සාර්ව ආර්ථික ස්ථායීතාව යථා තත්ත්වයට පත් කිරීම පුළුල් ලෙස අරමුණු කෙරේ. ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම, ආදායම වැඩි කිරීම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය කඩිනමින් සිදු කිරීම, මිල ස්ථායීතාව යථා තත්ත්වයටපත් කිරීම සහ බාහිර ස්වාරක්ෂක යළි ගොඩනැගීම, මූල්‍ය ස්ථායීතාව සහතික කිරීම, දූෂණ අවදානම් සහගත තත්ත්වයන් අවම කිරීම සහ ආර්ථික වර්ධනය තවදුරටත් ඉහළ නැංවීම යන වැදගත් අංශ මත ශක්තිමත් පදනමක් නිර්මාණය කිරීම හරහා සමස්ත ආර්ථිකයේ ස්ථායීතාව ළඟා කර ගැනීමට මෙම වැඩසටහන මගින් අපේක්ෂා කෙරේ.

පූර්ව ක්‍රියාමාර්ග සහ ව්‍යුහාත්මක මිණුම්දඬු

2022 වසරේ මුල් භාගයේ දී ජා.මූ. අරමුදල සමඟ විස්තීර්ණ ණය පහසුකමක් සඳහා සාකච්ඡා ආරම්භ කිරීමේ සිට 2023 වසරේ මාර්තු මාසය වන විට ශ්‍රී ලංකාව පූර්ව ක්‍රියාමාර්ග නවයක් සම්පූර්ණ කර ඇති අතර ව්‍යුහාත්මක වෙනස්කම් ක්‍රියාත්මක කිරීම සඳහා යාන්ත්‍රණයක් ද සකස් කර ඇත. විස්තීර්ණ ණය පහසුකම යටතේ ඉදිරි

1

රූප සටහන වි.ස. 2.1

ජා.මු. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම යටතේ වූ ව්‍යුහාත්මක මිණුම් දඬු

රාජ්‍ය මූල්‍ය, රජය සතු ව්‍යවසායයන් සහ ආරක්ෂණ ජාලවලට අදාළ ප්‍රතිසංස්කරණ

- මාසිකව සූත්‍රය මත පදනම් වූ ගැළපීම් සමඟින් ඉන්ධන මිල ගණන් ඒවායෙහි පිරිවැය ආවරණය වන මට්ටමට සැකසීම — අඛණ්ඩව
- අර්ධ වාර්ෂික සූත්‍රය මත පදනම් වූ ගැළපීම් සමඟ අවසන් පරිභෝජකයා ගෙවිය යුතු විදුලි ගාස්තු ලැයිස්තුව එහි පිරිවැය ආවරණය වන මට්ටමට සැකසීම — අඛණ්ඩව
- සුභසාධන ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමයට සහ ප්‍රතිලාභීන් හඳුනාගැනීම සඳහා නව සුදුසුකම් නිර්ණායකයන්ට පාර්ලිමේන්තු අනුමැතිය — 2023 වසරේ මැයි මස අවසානයට
- ලං.ඩි.ම., ලං.බ.නි.සං., ශ්‍රී ලන්කන් ගුවන් සමාගම සහ මාර්ග සංවර්ධන අධිකාරියේ ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීමේ පුළුල් උපාය මාර්ගයට කැබිනට් අනුමැතිය — 2023 වසරේ ජූනි මස අවසානයට
- වැඩසටහන් පරාමිතීන්වලට අනුකූලව 2024 වසරේ දී රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයට සහාය වීම සඳහා ආදායම් රැස් කිරීමේ ක්‍රියාමාර්ග සඳහා කැබිනට් අනුමැතිය — 2023 වසරේ ජූලි මස අවසානයට
- ITMIS ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම, ආයතන 220ක් වෙත (ජාතික අයවැය ක්‍රියාත්මක කිරීමේ ආයතන) එහි ආවරණය පුළුල් කිරීම — 2023 වසරේ සැප්තැම්බර් මස අවසානයට
- වැඩසටහන් පරාමිතීන්වලට අනුකූලව 2024 වසරේ දී විසර්ජන පනත් කෙටුම්පත පළමුවර කියවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම — 2023 වසරේ ඔක්තෝම්බර් මස අවසානයට
- වැඩසටහන් පරාමිතීන්ට අනුකූලව 2024 වසරේ විසර්ජන පනත සහ වියදම් ප්‍රතිපාදන සඳහා පාර්ලිමේන්තු අනුමැතිය — 2023 වසරේ දෙසැම්බර් මස අවසානයට
- ජා.මු. අරමුදලේ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කර නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීතියක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම — 2023 වසරේ දෙසැම්බර් මස අවසානයට
- විදුලිබල සහනාධාරය නිවැරදිව මැනීම සඳහා තොග සැපයුම් ගනුදෙනු ගිණුම් වැඩිදියුණු කිරීම සහ පිරිවැය ආවරණය වීම පදනම් කරගත් විදුලි ගාස්තු සහ රජයේ සංක්‍රාම අවශ්‍යතා තීරණය කිරීම සඳහා එය භාවිතා කිරීම ආරම්භ කිරීම. — 2023 වසරේ දෙසැම්බර් මස අවසානයට

මූල්‍ය අංශය

- විශාලතම රාජ්‍ය බැංකු දෙකක් සහ පුද්ගලික අංශයේ විශාලතම බැංකු තුනක් සඳහා බැංකු තත්ත්ව විනිශ්චය කිරීමේ අභ්‍යාසයේ වත්කම් තත්ත්ව සමාලෝචන අංශය සම්පූර්ණ කිරීම — 2023 වසරේ අප්‍රේල් මස අවසානයට
- ජා.මු. අරමුදලේ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කර බැංකු පනතේ සම්පූර්ණ සංශෝධනයක් සඳහා කැබිනට් අනුමැතිය — 2023 වසරේ ජූනි මස අවසානයට
- බැංකු පද්ධතියේ ප්‍රාග්ධනය සහ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟයන් පියවා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සැලැස්මක් ගොඩනැගීම සහ ශක්‍යතාවයක් නොමැති බව තක්සේරු කර ඇති බැංකුවලට මැදිහත්වීම — 2023 වසරේ ජූලි මස අවසානයට
- පුද්ගලික මූලාශ්‍රවලින් ප්‍රාග්ධන හිඟයන් පියවා ගැනීමට නොහැකි ශක්‍යතා සහිත බැංකු සඳහා රජය විසින් ප්‍රාග්ධනය නැවත යෙදවීම වෙනුවෙන් ප්‍රමාණය, කාලය, උපකරණ සහ නියමයන් සහ කොන්දේසි මුදල් අමාත්‍යාංශය විසින් තීරණය කිරීම — 2023 වසරේ ඔක්තෝම්බර් මස අවසානයට
- ජා.මු. අරමුදලේ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කර බැංකු පනතේ සම්පූර්ණ සංශෝධනයක් සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය — 2023 වසරේ දෙසැම්බර් මස අවසානයට

මුදල් හා විනිමය අනුපාතික ප්‍රතිපත්ති

- ජා.මු. අරමුදලේ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කර නව මහ බැංකු පනතේ සම්පූර්ණ සංශෝධනයක් සඳහා කැබිනට් අනුමැතිය — 2023 වසරේ අප්‍රේල් මස අවසානයට

පාලනය

- ජා.මු. අරමුදලේ කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කර, පුළුල් වත්කම් පියවා ගැනීමේ ප්‍රතිපාදන අපේක්ෂාවෙන්, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සමඟ සම්පාත වෙමින් නව දූෂණ විරෝධී නීති සම්පාදනය කිරීම — 2023 වසරේ ජූනි මස අවසානයට
- ශ්‍රී ලංකාවේ දූෂණ විරෝධී රාමුව විනිශ්චය කිරීම සඳහා ජා.මු. අරමුදල ප්‍රමුඛව පාලනය පිළිබඳ විනිශ්චය කිරීමේ තාක්ෂණික සහාය ලබා දෙන මෙහෙයුමෙහි වාර්තාව ප්‍රකාශයට පත් කිරීම — 2023 වසරේ සැප්තැම්බර් මස අවසානයට

මූලය: ජා.මු. අරමුදල (2023). ශ්‍රී ලංකාව: විස්තීර්ණ ණය පහසුකම යටතේ වන වැඩපිළිවෙලක් සඳහා සිදුකළ ඉල්ලීම - මාධ්‍ය නිවේදනය, කාර්ය මණ්ඩල වාර්තාව සහ ශ්‍රී ලංකාව සඳහා වන විධායක අධ්‍යක්ෂකගේ ප්‍රකාශය

වසර හතර තුළ පුළුල් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට මග පෑදීම සඳහා මෙම පූර්ව ක්‍රියාමාර්ග සම්පූර්ණ කිරීම හේතු විය. ශ්‍රී ලංකාව විසින් දැනටමත් සම්පූර්ණ කර ඇති පූර්ව ක්‍රියාමාර්ග අතරට, වැඩසටහන් පරාමිතීන්ට අනුකූලව 2023 වසරේ දී රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයට සහාය වීම සඳහා වන ආදායම් වැඩි කර ගැනීමේ ක්‍රියාමාර්ග සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම, 2022 වසර සඳහා වන සංශෝධිත අයවැය සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම, 2023 වසර සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම, මාසික වශයෙන් ඛනිජ තෙල් මිල ගණන් වෙනස් කිරීමේ ක්‍රමවේදය සහ වර්ෂයකට දෙවතාවක් පිරිවැය පිළිබිඹු කෙරෙන පරිදි විදුලි ගාස්තු සංශෝධනය කිරීමේ ක්‍රමවේදය සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම, නව මහ බැංකු පනතට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සහ මහ බැංකුව සතු අර්බුද කළමනාකරණ කාර්යයන්හි ප්‍රධාන අංග ශක්තිමත් කරමින් බැංකු පනත සංශෝධන සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම, බැංකු පද්ධතිය විනිශ්චය කිරීමේ ක්‍රියාවලිය සඳහා ස්වාධීන ආයතනයක සේවය ලබා ගැනීම සහ ඉදිරි කාලීන මූර්ත ප්‍රතිපත්ති පොලී අනුපාතික අඛණ්ඩව ඉහළ යාම සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100කින් වැඩි කිරීම ඇතුළත් වේ.

ඉහත සඳහන් ක්‍රියාමාර්ගවලට අමතරව, වැඩසටහනේ පරාමිතීන්වලට අනුකූල වන පරිදි 2023 වසර සඳහා වන අයවැයට පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම, 2023 වසර සඳහා වන ආදායම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීතිමය සංශෝධන සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම සහ බැංකු සඳහා අදාළ වන හදිසි ද්‍රවශීලතා ආධාරක රාමුව යාවත්කාලීන කිරීම යන වැදගත් ඉදිරි පියවර තුනක් ද ක්‍රියාත්මක කරන ලදී. තවද, රූප සටහන වි.ස. 2.1හි විස්තර කර ඇති පරිදි, රාජ්‍ය මූල්‍ය සම්බන්ධ ගැටලු, රජය සතු වාණිජ ව්‍යවසායයන්, සමාජ ආරක්ෂණ ජාල ප්‍රතිසංස්කරණ, මුදල් හා විනිමය අනුපාතික ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූල්‍ය අංශය සහ පාලනය සම්බන්ධ ප්‍රතිසංස්කරණවලට අදාළ ව්‍යුහාත්මක මිණුම්දඬු කිහිපයක් ශ්‍රී ලංකාව විසින් ඉදිරි කාලසීමාව තුළ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

වැඩසටහන් ප්‍රගතිය අධීක්ෂණය කිරීම

ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක (QPCs), හිඟ විදේශීය ණය වගකීම් හා සම්බන්ධ අඛණ්ඩ කාර්ය සාධන නිර්ණායක (CPC) සහ ජා. මූ. අරමුදලේ VIII වගන්තිය ප්‍රකාර බැදීම්, දර්ශක ඉලක්ක (ITs) සහ මුදල් ප්‍රතිපත්ති උපදේශන වගන්තියෙන් සමන්විත පුළුල් යාන්ත්‍රණයක් අනුව විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළෙහි ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කෙරේ. රජයේ අයවැයෙහි ප්‍රාථමික ශේෂයේ අතිරික්තයක් උත්පාදනය කිරීමේ අවශ්‍යතාවය, ශුද්ධ ජාත්‍යන්තර සංචිත ගොඩනැගීම මගින් දළ නිල සංචිත මට්ටම් වැඩිදියුණු කිරීම, මහ බැංකුව විසින් රජය වෙත ලබා දෙන ශුද්ධ ණය ක්‍රමයෙන් අඩු කිරීම ආදිය ශ්‍රී ලංකාව සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක වේ. විදේශීය ණය නොගෙවීම හේතුවෙන් නව හිඟ විදේශීය ණය එකතු නොකිරීම සම්බන්ධයෙන් අඛණ්ඩ කාර්ය සාධන නිර්ණායකයක් පවතින අතර, එය බලධාරීන් විසින් අඛණ්ඩව අධීක්ෂණය කරමින්, එම අවස්ථා සපුරාලීමට නොහැකි වුවහොත් ජා.මූ. අරමුදල වෙත ක්ෂණිකව වාර්තා කෙරේ. මීට අමතරව, තවත් ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායකයක් තුළ, ජංගම විදේශීය ගනුදෙනු සඳහා වන ගෙවීම් සහ හුවමාරු සම්බන්ධයෙන් තවදුරටත් සීමා පැනවීම, බහු විදේශ විනිමය ක්‍රියාමාර්ගයන් (multiple currency practices) හඳුන්වාදීම හෝ වෙනස් කිරීම, ජා. මූ. අරමුදලේ VIII වගන්තියට අනුකූල නොවන ගෙවීම් හා සම්බන්ධ ද්විපාර්ශ්වික ගිවිසුම් සම්පූර්ණ කිරීම සහ ගෙවුම් තුලන අරමුණු සඳහා ආනයන සීමාකිරීම් තවදුරටත් පැනවීම හෝ වෙනස් කිරීම තහනම් වේ. මිල ස්ථායීතාවය යථා තත්ත්වයට පත් කරමින් ඉලක්කගත මට්ටමට ළඟා වීම සඳහා ශ්‍රී ලංකාව උද්ධමනය අඛණ්ඩව අඩුකිරීමේ මාවතක ගමන් කරන බව සහතික කිරීමට නිශ්චිත ඉලක්කගත දිනවල දී වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය අධීක්ෂණය කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති උපදේශන වගන්තියක් ඇතුළත් කර ඇත. තවද, ප්‍රධාන වශයෙන් මධ්‍යම රජයේ බදු ආදායම, සමාජ ආරක්ෂණ ජාල වියදම්, ඉන්ධන සහ විදුලිය සඳහා වන වාණිජමය නොවන වගකීම්වල පිරිවැය මෙන්ම භාණ්ඩාගාර ඇපකර සම්බන්ධයෙන් දර්ශක ඉලක්ක නිශ්චිතව දක්වා ඇත. විශේෂයෙන්ම, ණය තිරසාරභාවය ළඟා කර ගැනීමේ දී අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා සාධාරණ කාල රාමුවක් තුළ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණ කිරීමේ අරමුණින්, සෑම වැඩසටහන් සමාලෝචනයකදීම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රගතිය තක්සේරු කරනු ලැබේ. රූප සටහන වි.ස. 2.2හි වැඩසටහනට අදාළ ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක සහ දර්ශක ඉලක්ක පෙන්නුම් කර ඇත.

විදේශීය මූල්‍යන පරතරය සහ මූල්‍යන මුලාශ්‍ර

විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන සඳහා ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වෙතින් එ.ජ. ඩොලර් බිලියන 3.75ක අමතර සහයක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ඉන් එ.ජ. ඩොලර් මිලියන 900ක් 2023 වසරේ දී ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම සහ ස්වාරක්ෂක ගොඩනැංවීම හේතුවෙන් 2027 වසරේ දී ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු මගින් අරමුදල් රැස් කිරීම සඳහා ජාත්‍යන්තර වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමට ශ්‍රී ලංකාවට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම අරමුදල් ඇතුළු විදේශ රාජ්‍ය ණය සේවා සහන මගින් විදේශීය මූල්‍යන පරතරයන් අවම කරමින් ශ්‍රී ලංකාවට සිය දළ ජාත්‍යන්තර සංචිත යළි ගොඩනැංවීමට ඉඩ ප්‍රස්ථාව සලසනු ලැබේ.

1

රූප සටහන වි.ස. 2.2
ශ්‍රී ලංකාව යෝජිත ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායක (QPCs), අඛණ්ඩ කාර්යසාධන නිර්ණායක (CPC) සහ දර්ශක ඉලක්ක (ITs)
(නිශ්චිතව සඳහන් කර නොමැති නම්, වසර ආරම්භයේ සිට සමුච්චිත පදනමින්)

		2022	2023			
යෝජිත පරිමාණාත්මක කාර්ය සාධන නිර්ණායක		දෙසැම්බර් අවසානයට (සැබෑ අගය)	මාර්තු මස අවසානයට දර්ශක ඉලක්ක	ජූනි මස අවසානයට කාර්ය සාධන නිර්ණායක/ දර්ශක ඉලක්ක	සැප්තැම්බර් මස අවසානයට දර්ශක ඉලක්ක	දෙසැම්බර් අවසානයට කාර්ය සාධන නිර්ණායක/දර්ශක ඉලක්ක
මධ්‍යම රජයේ ප්‍රාථමික ශේෂය (අවම සීමාව)	රු.බිලියන	-895	56	-113	-160	-209
වැඩසටහනෙහි ශුද්ධ නිල ජාත්‍යන්තර සංචිත (වැඩසටහනෙහි ශුද්ධ ජාත්‍යන්තර සංචිත, අවම මට්ටම කාලපරිච්ඡේදය අවසානයේ තත්ත්වය)	එ.ජ.ඩො. මිලියන	-3,540	-3,188	-2,830	-2,068	-1,592
ශ්‍රී ලංකා මහ බැංකුවෙන් රජයට ලබා දුන් ශුද්ධ ණය (උපරිම සීමාව, කාලපරිච්ඡේදය අවසානයේ තත්ත්වය)	රු.බිලියන	2,834	2,890	2,890	2,840	2,740
මධ්‍යම රජයේ හිඟ වියදම් තත්ත්වය (උපරිම සීමාව)	රු.බිලියන	60	30	0	0	0
යෝජිත අඛණ්ඩ කාර්ය සාධන නිර්ණායක (වැඩසටහන ආරම්භයේ සිට සමුච්චිත පදනමට)						
මූල්‍ය නොවන රාජ්‍ය අංශයෙහි සහ මහ බැංකුව විසින් නොගෙවා එකතු වූ හිඟ නව විදේශීය වගකීම් (උපරිම සීමාව)	එ.ජ.ඩො. මිලියන	0	0	0	0	0
යෝජිත දර්ශක ඉලක්ක						
මධ්‍යම රජයේ බදු ආදායම (අවම සීමාව)	රු.බිලියන	1,751	650	1,300	2,100	2,940
මධ්‍යම රජයේ සමාජයීය වියදම් (අවම සීමාව)	රු.බිලියන	142	35	70	120	187
ඉන්ධන සහ විදුලිය සඳහා වාණිජමය නොවන බැඳීම්වල පිරිවැය (රජයේ සංක්‍රාම අඩු කළ විට) (උපරිම සීමාව)	රු.බිලියන	-	0	0	0	0
භාණ්ඩාගාර ඇපකර (උපරිම සීමාව)	රු.බිලියන	1,159	1,700	1,700	1,700	1,700

මූලාශ්‍රය: ජා.මූ. අරමුදල (2023). ශ්‍රී ලංකාව: විස්තීර්ණ ණය පහසුකම යටතේ වන වැඩපිළිවෙලක් සඳහා සිදුකළ ඉල්ලීම - මාධ්‍ය නිවේදනය, කාර්ය මණ්ඩල වාර්තාව සහ ශ්‍රී ලංකාව සඳහා වන විධායක අධ්‍යක්ෂකගේ ප්‍රකාශය

රූප සටහන වි.ස. 2.3
යෝජිත මුදල් ප්‍රතිපත්ති උපදේශන වගන්තිය (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ උද්ධමනය)



මූලාශ්‍රය: ජා.මූ. අරමුදල (2023). ශ්‍රී ලංකාව: විස්තීර්ණ ණය පහසුකම යටතේ වන වැඩපිළිවෙලක් සඳහා සිදුකළ ඉල්ලීම - මාධ්‍ය නිවේදනය, කාර්ය මණ්ඩල වාර්තාව සහ ශ්‍රී ලංකාව සඳහා වන විධායක අධ්‍යක්ෂකගේ ප්‍රකාශය

ජා. මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ අපේක්ෂිත ප්‍රවණතා

ජා. මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන මගින් අපේක්ෂිත ප්‍රධාන ප්‍රතිඵල කිහිපයක් පහත පරිදි වේ:

- **ණය තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම:** ණය තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව ණය මූල්‍යනය සහ ණය සේවාකරණය සම්බන්ධ නිශ්චිත ඉලක්ක සපුරාගත යුතුය. තවද, ණය අඩු කිරීම සහතික කිරීම, ණය තොගයේ නැවත ආයෝජන අවදානම් කළමනාකරණය කිරීම, ණය සේවාකරණ අවශ්‍යතාවලින් ඇති කෙරෙන විදේශ පීඩන නැවත ඇති වීම වළක්වා ගැනීම සහ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන ක්‍රියාත්මක වන කාල සීමාව තුළ මූල්‍යන පරතරයන් පියවා ඇති බව සහතික කිරීම සඳහා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ස්වෛරීත්ව අවදානම් සහ ණය තිරසාර රාමුව (SRDSF) යටතේ හඳුන්වා දෙන ලද ප්‍රමාණාත්මක ඉලක්ක මගින් ණය ප්‍රතිව්‍යුහගත

රූප සටහන වි.ස. 2.4
2022 වසරේ සිට 2027 වසර දක්වා විදේශීය මූල්‍යන පරතරය සහ වැඩසටහන් මූල්‍යන

එ.ජ.ඩොලර් මිලියන

	2022	2023	2024	2025	2026	2027	එකතුව 2022-27
මූල්‍යන පරතරය (අ)	-2,834	-4,939	-4,843	-5,018	-3,608	-3,911	-25,153
වැඩසටහන් මූල්‍යන (ආ)	2,834	4,939	4,843	5,018	3,608	3,911	25,153
ජා.මු. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම	0	663	665	663	662	329	2,982
ජාත්‍යන්තර මූල්‍ය ආයතනයේ අයවැය සහාය	0	900	850	700	700	600	3,750
ලෝක බැංකුව		250	400	400	400	300	1,750
ආසියානු සංවර්ධන බැංකුව		650	450	300	300	300	2,000
වෙනත්		0	0	0	0	0	0
ණය නොගෙවා සිටීම: විදේශීය නොගෙවා එකතු වූ ණය	2,834						2,834
ණය සහන		3,376	3,328	3,655	2,246	1,482	14,087
ස්වෛරීත්ව බැඳුම්කර (වෙළඳපොළ ප්‍රවේශය)		0	0	0	0	1,500	1,500
හිඟය (අ+ආ)	0	0	0	0	0	0	
දළ ජාත්‍යන්තර සංචිත	1,898	4,431	6,128	8,520	10,888	14,208	
ව්‍යාපෘති ණය	1,473	1,400	1,542	1,585	1,633	1,682	

මූලාශ්‍ර: ජා.මු. අරමුදල (2023). ශ්‍රී ලංකාව: විස්තීර්ණ ණය පහසුකම යටතේ වන වැඩපිළිවෙලක් සඳහා සිදුකළ ඉල්ලීම - මාධ්‍ය නිවේදනය, කාර්ය මණ්ඩල වාර්තාව සහ ශ්‍රී ලංකාව සඳහා වන විධායක අධ්‍යක්ෂකගේ ප්‍රකාශය

කිරීමේ ක්‍රියාවලිය මෙහෙයවනු ලබයි. මෙම අවශ්‍යතා සපුරාලීම මගින් ණය හිමියන් සහ ජාත්‍යන්තර ප්‍රජාව හමුවේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය නැවතත් තිරසාර මට්ටමට පත් වීම සහතික කරනු ඇති අතර, එමගින් ශ්‍රී ලංකාවේ අනාගත ණය ගැනීම් හා සම්බන්ධ දුෂ්කරතා සහ අවදානම් අධිමිල ලිහිල් වේ.

ජා.මු. අරමුදල විසින් ණය තිරසාරභාවය සම්බන්ධයෙන් සිදු කරන ලද විශ්ලේෂණය අනුව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හරහා ශ්‍රී ලංකාව විසින් සාක්ෂාත් කර ගත යුතු තිරසාර ණය ඉලක්ක පහත පරිදි වේ:

- ණය තොගය: 2032 වසර වන විට රාජ්‍ය ණය ප්‍රමාණය ද.දේ.නි.යෙන් සියයට 95ට වඩා අඩු වීම.
- විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙන් පසු අවධිය තුළ දළ මූල්‍යන අවශ්‍යතා: 2027-2032 කාල පරිච්ඡේදය තුළ දී මධ්‍යම රජයේ වාර්ෂික දළ මූල්‍යන අවශ්‍යතාවල සාමාන්‍යය ද.දේ.නි.යෙන් සියයට 13ට වඩා පහළ මට්ටමක පැවතීම.
- විස්තීරණ ණය පහසුකම් වැඩසටහනෙන් පසු අවධිය තුළ විදේශ මුදලින් ණය සේවාකරණය: මධ්‍යම රජයේ වාර්ෂික විදේශ මුදලින් ණය සේවාකරණය 2027-2032 දක්වා කාලපරිච්ඡේදය තුළ සෑම වසරකම ද.දේ.නි.යෙන් සියයට 4.5කට වඩා පහළ මට්ටමක පැවතීම.
- විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි මූල්‍යන පරතරයන්: විදේශ මූල්‍යන පරතරයන් පියවීම සඳහා ප්‍රමාණවත් වන පරිදි 2023-2027 කාලපරිච්ඡේදය තුළ ණය සේවාකරණය අඩු කිරීම.

- **වැඩිදියුණු වූ රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය සහ රාජ්‍ය මූල්‍ය විනය:** රාජ්‍ය මූල්‍ය අංශය සහ ඊට අදාළ ව්‍යුහාත්මක වෙනස්කම් පිළිබඳ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන මගින් කර ඇති අවධාරණය කිරීම තුළ, ආදායම් වර්ධනය කර ඇති ක්‍රියාමාර්ග සහ වියදම් තවදුරටත් තාර්කීකරණය කිරීම හරහා රාජ්‍ය මූල්‍ය ඉලක්ක සපුරාලීම සඳහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රකරණ ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉදිරි කාලයේ දී රාජ්‍ය අයවැය හිඟය මහ බැංකුව තුළින් මූල්‍යනය කිරීමට ඇති අවකාශය සීමිත වීම තුළ පවතින සංක්‍රාන්ති කාලසීමාව තුළ එවැනි අවශ්‍යතා මතු නොවන බව සහතික කිරීම සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කිරීම රජයෙන් අපේක්ෂා කෙරේ. ඒ අතරතුර කාලයේ දී, රජය සතු ව්‍යවසායන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පුළුල් වැඩසටහන හරහා රාජ්‍ය මූල්‍ය ආදායමෙන් අනවශ්‍ය ලෙස ආදායම් අහිමිව යෑම වැසඳනු ඇත.
- **වැඩිදියුණු වූ පරිපාලන සහ වගවීමේ රාමුව සඳහා වන නීතිමය වෙනස්කම්:** යෝජිත මහ බැංකු පනත වැනි නව නීති, බැංකු පනත සහ පවතින නීතිවලට සිදු කෙරෙන වෙනත් සංශෝධන ආදිය මගින් රටේ ආර්ථික කළමනාකරණයට අදාළ ආයතනික සහ නියාමන රාමුව ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

1

එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තියට සමගාමීව, නව දූෂණ විරෝධී නීතියක් දකුණු ආසියාවේ ප්‍රථම වරට මෙරට හඳුන්වාදීමට නියමිත අතර, එමගින් ස්වාධීන දූෂණ විරෝධී කොමිසමක් ස්ථාපිත කිරීම සඳහා පහසුකම් සපයයි. අයවැය සම්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීමට සහ රාජ්‍ය මූල්‍ය සම්බන්ධ වගවීමේ යාන්ත්‍රණය වැඩි දියුණු කිරීමට නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීතියක් පනවනු ලැබේ.

- **සමාජ ආරක්ෂණ ජාල ප්‍රතිසංස්කරණය කිරීම:** මෑත වසරවල සමාජ ආරක්ෂණ ජාල හා බැඳුණු වියදම් සහ එම ප්‍රතිලාභීන්ගේ ඉහළ යෑමක් පැවතිය ද, ප්‍රතිලාභීන් ආවරණය කිරීම සහ ඔවුන් තෝරා ගැනීම සම්බන්ධ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා සැලකිය යුතු ඉඩකඩක් ඇති බව හඳුනාගෙන ඇත. දැනට පවතින සමාජ ආරක්ෂණ ජාල රාමුවේ පවතින ගැටලු සැලකිල්ලට ගනිමින්, සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන්වල කාර්යක්ෂමතාවය, ආවරණය සහ ඉලක්ක කරණය වැඩිදියුණු කිරීම සඳහා විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන මගින් ඇතැම් ආයතනික ප්‍රතිසංස්කරණ නියම කර ඇත.
- **මිල ස්ථායීතාව යළි ස්ථාපිත කිරීම:** සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හරහා නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ උද්ධමනය ඉලක්කගත පරාසය වෙත ස්ථාවර නිර්-උද්ධමන මාවතක් ඔස්සේ නැවත ගෙන ඒමෙන්, මිල ස්ථායීතාව යළි ස්ථාපිත කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි. මෙම ක්‍රියාවලියේ කොටසක් ලෙස රාජ්‍ය අයවැය හිඟය මහ බැංකුව තුළින් මූල්‍යනය කිරීම පියවරෙන් පියවර අඩු කිරීමට අපේක්ෂා කෙරේ. විනිමය අනුපාතිකයෙහි වැඩි නම්‍යශීලී බවක් පවත්වා ගැනීම සහ අනාගත කම්පනයන්ට ඔරොත්තු දීම සඳහා සංචිත නැවත ගොඩනැංවීම ද මිල ස්ථායීතාව යථා තත්ත්වයට පත් කිරීමට ඇති කැපවීමට ඇතුළත් වේ.
- **මූල්‍ය ආයතන සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ශක්තිමත් කිරීම:** ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය රාජ්‍ය අංශය වෙත දැඩි ලෙස නිරාවරණය වී ඇති බවත්, ප්‍රාග්ධනීකරණය මධ්‍යස්ථව ඇති බවත් සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමකින් අනතුරුව මූල්‍ය පද්ධතිය ප්‍රාග්ධන හා විදේශ විනිමය හිඟයකට මුහුණ දිය හැකි බවත් ජා.මූ. අරමුදලෙහි අදහසයි. මේ අනුව, ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් බැංකු සැලකිය යුතු ප්‍රාග්ධන හා විදේශ විනිමය හිඟයකට මුහුණ පෑමේ හැකියාවක් පවතී. එබැවින්, රාජ්‍ය බැංකුවල අවදානම්වලට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා වත්කම්වල ගුණාත්මකභාවය සමාලෝචනය කිරීමෙන් අනතුරුව පද්ධතිමය වශයෙන් වැදගත් වන බැංකුවල ප්‍රාග්ධනය යළි ස්ථාපිත කිරීමට සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී. මේ අතර, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය වඩාත් ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය අංශයේ අධීක්ෂණය සහ අර්බුද කළමනාකරණ රාමුව ශක්තිමත් කරනු ඇත.

මෙම විශේෂිත ප්‍රතිලාභවලට අමතරව, ආයෝජකයන්ගේ විශ්වාසය වර්ධනය කිරීම, ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීම සහ වෙළඳපොළ වෙත නැවත ප්‍රවේශ වීමේ හැකියාව ඇති කිරීම ආදිය හරහා ජා.මූ. අරමුදලෙහි සහාය ඇති විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන මගින් ආර්ථිකයට චක්‍රාකාර ධනාත්මක බලපෑම් ඇති කරනු ඇත. ජා.මූ. අරමුදල විසින් ඉදිරිපත් කර ඇති ඉලක්කවල අභියෝගාත්මක ස්වභාවය සැලකිල්ලට ගනිමින්, වැඩසටහන ක්‍රියාත්මක වන කාලසීමාව පුරා එය සාර්ථකව නිම කිරීම සහතික කිරීම සඳහා බලධාරීන්ට විශාල උත්සාහයක් හා කැපවීමක් කිරීමට සිදුවනු ඇත. එසේම, විශේෂයෙන්ම ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ඇති විය හැකි අප්‍රසාදය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති විය හැකි මහජන විරෝධය සැලකිල්ලට ගනිමින්, මෙම වැඩසටහන ක්‍රියාත්මක වන කාලසීමාව තුළ දේශපාලන හා සමාජීය ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා, මුල් කාලයේ දී කළ යුතු කැපකිරීම් තුළින් දිගු කාලීන ආර්ථික ප්‍රතිලාභ අත්කර ගත හැකි ආකාරය පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම අවශ්‍ය වේ.

ජා.මූ. අරමුදල් වැඩසටහනෙන් ඔබ්බට ගිය ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය

දිගු කාලයක සිට නොසලකා හරින ලද ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අනුව ජා.මූ. අරමුදලේ වැඩසටහනෙහි සාර්ථකත්වය බොහෝ දුරට රඳා පවතියි. ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මගින් ආර්ථිකයේ තරගකාරිත්වය ඉහළ නැංවීම, ඵලදායීතාව ඉහළ නැංවීමට පදනමක් සැපයීම, සම්පත් භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ එමගින් වර්ධන විභවතාව ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දී සිටින දැඩි ආර්ථික අර්බුදය මගින්, ජා.මූ. අරමුදලෙහි ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයෙන් ඔබ්බට ගිය, පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර සම්පාදනය කරන ලද හා පෞද්ගලික උවමනාවන් සහිත දේශපාලන බලපෑම්වලින් තොර ජාතික ප්‍රතිපත්ති හරහා ඉදිරියේ ඇති දිගුකාලීන ව්‍යුහාත්මක ගැටලු තිරසාර ලෙස විසඳීමේ වැදගත්කම ඉස්මතු කරයි. වෙළඳ භාණ්ඩ අපනයන සහ සංචාරක කර්මාන්තය, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ඇතුලත් විභවතාවක් ඇති සේවා අපනයන යනාදී අංශවල විවිධාංගීකරණය ඉහළ නංවා ගනිමින් සහ විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගනිමින්, තාක්ෂණික නවෝත්පාදනය සහ වෙළඳාම හා ආයෝජන තුළින් ලෝක ආර්ථිකය වෙත සම්බන්ධ කිරීම මගින් ආර්ථිකයේ ඵලදායීතාව සහ නිෂ්පාදනය ඉහළ නැංවීමට, ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය යොමු විය යුතුය. රාජ්‍ය ආයතනවල මහජන වගවීම සහතික කිරීම සඳහා නීතිමය රාමු ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වන අතර, එමගින් රටේ ආර්ථික සුබසාධනයේ කල් පැවැත්ම සහතික කිරීම සඳහා අදාළ බලධාරීන් විසින් ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ ක්‍රියාත්මක කිරීමේදී පවතින නෛතික බලතල ක්‍රියාත්මක කළ යුතුය. මෙවැනි ප්‍රතිසංස්කරණ,

ජා.මූ. අරමුදලේ වැඩසටහනෙහි ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට අනුපූරක වෙමින්, ශ්‍රී ලංකාව විසින් හැකි ඉකිමනින් සාර්ව ආර්ථික ස්ථායීතාවය අත්කර ගැනීම සහ එය පවත්වා ගැනීම සහතික කරනු ඇත.

නිගමනය

ශ්‍රී ලංකාව 1965 වසරේදී ජා.මූ. අරමුදල සමඟ ඇති කරගත් පළමු වැඩසටහනේ සිට මේ දක්වා වැඩසටහන් 16කට සම්බන්ධ වුවද, බලධාරීන් විසින් සාර්ථකව ක්‍රියාත්මක කර ඇත්තේ ඉන් කිහිපයක් පමණකි. මේ සඳහා, විශේෂයෙන්ම, දැඩි සාර්ව ආර්ථික ගැළපුම් අවශ්‍ය වූ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ දිගු කාලීන සුබසාධන ප්‍රතිලාභ වර්ධනය කිරීම අරමුණු කරගත් ජනප්‍රිය නොවන ප්‍රතිපත්තිවලට අදාළ කොන්දේසි සපුරාලීමට කැපවීමක් නොදැක්වීම හේතු වී ඇත. එබැවින්, අනාගතයේ දී ජා.මූ. අරමුදල වෙතින් ණය ආධාර ලබා ගැනීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා නැවත යොමු වීමේ අවශ්‍යතාවය අවම කරමින්, ශ්‍රී ලංකාව සිය ප්‍රතිපත්ති සම්පාදනය තුළට මෙම ප්‍රතිසංස්කරණ එක් කර ගැනීම අත්‍යවශ්‍ය වන අතර, වත්මන් ජා.මූ. අරමුදලේ වැඩසටහනෙහි ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මෙන්ම ආර්ථිකය වැඩි ස්ථාවරත්වයක් සහිත ඉහළ වර්ධන මාවතක් කරා ඉක්මනින් පරිවර්තනය කිරීමට සහාය වීම සඳහා ඉන් ඔබ්බට ගිය ප්‍රතිසංස්කරණ ද ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

මූලාශ්‍රය

1. International Monetary Fund. (2023). Sri Lanka: Request for an Extended Arrangement Under the EFF - Press Release; Staff Report; and Statement by the Executive Director for Sri Lanka. 116. International Monetary Fund, Washington D.C.

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ක්‍රියාකාරකම් දිරිමත් කිරීම සහ වෙළඳපොළ මත පදනම් වූ විනිමය අනුපාතිකයක් වෙත නැවත යොමු වීමේ අරමුණින්, දෛනික විනිමය අනුපාතිකයෙහි විචලන සීමාවන් ක්‍රමානුකූලව ලිහිල් කිරීමට ද බලපත්‍රලාභී බැංකු විසින් මහ බැංකුව වෙත වූ විදේශ විනිමය අනිවාර්ය විකුණුම් අවශ්‍යතාව ලිහිල් කිරීමට ද කටයුතු කළ අතර, ඉන්පසුව 2023 වසරේ මාර්තු මස මුල සිට එම අවශ්‍යතාව සම්පූර්ණයෙන් ඉවත් කිරීමට මහ බැංකුව ක්‍රියා කරන ලදී. 2023 වසරේ මුල් කාලපරිච්ඡේදයේ සිට විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයන් වැඩිදියුණු වීම ආරම්භ වූ අතර, සේවා අංශයට විදේශ විනිමය ලැබීම්, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ විවිධ ආයෝජන සඳහා වූ මූල්‍ය ප්‍රවාහයන් සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ සඳහා අවසන් එකඟතාවයකට පැමිණීමත් සමඟ

1.7 රූප සටහන
විනිමය අනුපාතිකය හා දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ මැදිහත්වීම



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

වෙළඳපොළ විශ්වාසය වැඩිදියුණු වීම ඒ සඳහා දායක විය. විදේශ විනිමය වෙළඳපොළ තත්ත්වයන් වැඩිදියුණු වීමේ බලපෑම හේතුවෙන්, 2022 වසරේ මුල් භාගයේ දී දක්නට ලැබුණු විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිවැරදි කරමින් විනිමය අනුපාතිකය 2023 වසරේ මාර්තු මස මුල දී ඉහළ අතිප්‍රමාණය වීමක් පෙන්නුම් කළ අතර, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ සැලකිය යුතු මැදිහත් වීමක් තුළින් ඉහළ විදේශ විනිමය ප්‍රමාණයක් මිලදී ගැනීම දළ නිල සංචිත ගොඩනැගීමට ද උපකාරී විය. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළෙහි අරමුදල් ආධාර සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් සිදු කරන ලද විදේශ විනිමය මිලදී ගැනීම් සමඟ, දළ නිල සංචිත 2023 වසරේ මාර්තු මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 2.7ක් දක්වා ශක්තිමත් වූ අතර, වැඩිදියුණු වූ වෙළඳපොළ අපේක්ෂාවන් පිළිබිඹු කරමින් 2023 වසරේ මාර්තු මස අවසානය වන විට ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 10.9කින් අතිප්‍රමාණය විය. විනිමය අනුපාතිකය තීරණය කිරීමේ දී ඉඩ දී ඇති වැඩි නම්‍යශීලීභාවය පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකා රුපියල 2023 වසරේ මාර්තු මස අවසානයේ සිට යම් විචලනයක් පෙන්නුම් කළේය.

ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ ලබා දෙන අරමුදල් රජයේ මූල්‍යන අවශ්‍යතා සඳහා දායක කරගැනීමේ අරමුණින් රාජ්‍ය අයවැය සඳහා රුකුලක් ලෙස යෙදවීමට යෝජනා කරන ලදී. කෙසේ වුවත්, මෙම ලැබීම්, ණය ප්‍රතිව්‍යුහගතකරණයට ලක් නොවන රජයේ විදේශ විනිමය ණය ආපසු ගෙවීමට යොදා ගැනීම තුළින්, ඒ සඳහා මහ බැංකුවේ සංචිත යොදා ගැනීම වැළකෙන අතර, ගෙවුම් තුලනයේ පවතින ගැටලු අවම කිරීමට ද

1

එය උපකාරී වනු ඇත. තවද, අත්‍යවශ්‍ය ආනයන මූල්‍යනය සඳහා පහසුකම් සැලසිය හැකි වන පරිදි දළ නිල සංචිත ද එමඟින් ශක්තිමත් විය හැකිය.

රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රවණතා

මැදි කාලීනව ණය තිරසාරභාවය තහවුරු කිරීමේ අරමුණ ඇතිව රජය විසින් රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලද අතර, රාජ්‍ය මූල්‍ය අංශයේ දුර්වලතාවන්ට පිළියම් යෙදීම සඳහා පුළුල් රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ආරම්භ කරන ලදී. 2022 වසර මුල් භාගයේ දී ආදායම් රැස් කිරීම පහළ යෑම සහ ඉහළ දේශීය පොලී අනුපාතික සහ උද්ධමනය හේතුවෙන් ඉලක්කගත මට්ටම ඉක්මවා වියදම් ඉහළ යෑම හේතුවෙන්, 2022 අයවැයෙහි ඉදිරිපත් කළ අයවැය පුරෝකථන කරා ළඟා වීම අපහසු බව පැහැදිලි විය. 2022 අප්‍රේල් මාසයේ සිට රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කර ගැනීම සඳහා රජය විසින් පියවර මාලාවක් ක්‍රියාත්මක කරනු ලැබූ අතර, ආදායම් වැඩිදියුණු කරගැනීමේ ක්‍රියාමාර්ග සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කර ගැනීමේ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීමේ අරමුණින්, 2022 සැප්තැම්බර් මාසයේ දී 2022 අතුරු අයවැය සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගන්නා ලදී. 2022 වසරේ දී ක්‍රියාත්මක කරන ලද ආදායම් වැඩිදියුණු කරගැනීමේ ක්‍රියාමාර්ග සහ ආර්ථිකයේ මිල මට්ටම් ඉහළ යෑම හේතුවෙන්, රාජ්‍ය ආදායම 2022 වසරේ දී රුපියල් බිලියන 1,979.2ක් දක්වා සියයට 35.8ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, විශාල අවධමනකය සමඟ නාමික ද.දේ.නි.යෙහි ඇති වූ සැලකිය යුතු වර්ධනය හේතුවෙන්, රාජ්‍ය ආදායම, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2021 වසරේ පැවති සියයට 8.3ක සිට 2022 වසරේ දී සියයට 8.2ක් දක්වා පහළ ගියේය. ආදායම් බදු, එකතු කළ අගය මත බද්ද, වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද සහ මද්‍යසාර මත පනවන ලද සුරා බදු හා දුම්වැටි මත පනවන ලද නිෂ්පාදන බදුවලින් ලත් ආදායම් ඉහළ යෑම, රජයේ බදු ආදායමෙහි නාමික වර්ධනයට ඉවහල් විය. කෙසේ වෙතත්, ආනයන වියදම පහත වැටීමේ බලපෑම පිළිබිඹු කරමින්, ආනයන බදු, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සහ සෙස් බද්දෙන් රැස් කළ ආදායම 2022 වසර තුළ දී අඩු විය. මේ අතර, ගාස්තු හා අයකිරීම් සහ 2021 වාර්ෂික ගිණුම් වාර්තාව මත පදනම්ව මහ බැංකුව විසින් රජය වෙත සිදු කරන ලද ලාභ පැවරුම් ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන්, රැස් කළ බදු නොවන ආදායම ඉහළ ගියේය. 2022 වසරේ දෙවන භාගයේ දී සහ 2023 වසරේ මුල් කාලයේ දී ක්‍රියාත්මක කෙරුණු ආදායම් වැඩිදියුණු කරගැනීමේ ක්‍රියාමාර්ග

1.8 රූප සටහන
රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයෙහි සාරාංශය
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලාශ්‍ර: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

කිහිපයකම සම්පූර්ණ බලපෑම 2023 වසරේ දී ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, රජයේ වියදම් තාර්කීකරණ පියවර ක්‍රියාත්මක කළ ද, 2022 වසරේ දී රාජ්‍ය වියදම සහ ශුද්ධ ණය දීම් නාමික වශයෙන්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 27.0කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, නාමික ද.දේ.නි.යෙහි කැපී පෙනෙන වර්ධනයත් සමඟ, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, රාජ්‍ය වියදම පෙර වසරේ පැවති සියයට 20.0ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 18.5ක් දක්වා පහළ ගියේය. දේශීය පොලී ගෙවීම්, වැටුප් සහ වේතන, සහ සහනාධාර හා පැවරුම් වෙනුවෙන් ඉහළ ගිය වියදම, පුනරාවර්තන වියදම් ඉහළ යෑම සඳහා හේතු විය. ඒ සමඟම, විශේෂයෙන් ම, ඉන්ධන ආනයනය කිරීම සඳහා ඉන්දීය ණය පහසුකම ඔස්සේ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ණය ලබා දීම සහ පොහොර සහ එල්.පී. ගෑස් (ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව) ආනයනය කිරීම සඳහා ලෝක බැංකුව විසින් ලබා දුන් අරමුදල් භාවිත කරමින් රාජ්‍ය ව්‍යවසායයන් වෙත ණය ලබා දීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් ද 2022 වසරේ දී සියයට 23.1ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, නාමික වශයෙන් සමස්ත රාජ්‍ය මූල්‍ය හිඟය පෙර වසරේ පැවති රුපියල් බිලියන 2,057.9ක සිට 2022 වසරේ දී රුපියල් බිලියන 2,460.0ක් දක්වා පුළුල් විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, රාජ්‍ය මූල්‍ය හිඟය, 2021 වසරේ දී සියයට 11.7ක් වූ අතර, නාමික ද.දේ.නි.යෙහි ඇති වූ කැපී පෙනෙන වර්ධනය හේතුවෙන් 2022 වසරේ දී එය සියයට 10.2ක් දක්වා පහත වැටුණි. රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කෙරෙන වර්තන ගිණුමේ හිඟය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස

2021 වසරේ දී පැවති සියයට 7.3ක (රුපියල් බිලියන 1,290.4) සිට 2022 වසරේ දී සියයට 6.4ක් (රුපියල් බිලියන 1,540.4) දක්වා පහළ ගියේය. මේ අතර, 2021 වසරේ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5.7ක් (රුපියල් බිලියන 1,009.5ක්) වූ ප්‍රාථමික ගිණුමේ හිඟය, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කර ගැනීමේ ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් සහ නාමික වශයෙන් යන දෙආකාරයෙන් ම සංකෝචනය වෙමින් 2022 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.7ක් (රුපියල් බිලියන 894.8) දක්වා අඩු විය.

අහිතකර ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් සහ ණය ආපසු ගෙවීම තාවකාලිකව අත්හිටුවීම හමුවේ විදේශීය මූලාශ්‍රවලින් මූල්‍යනය සීමා වීම හේතුවෙන් 2022 වසරේ දී අයවැය හිඟය මූල්‍යනය සඳහා ප්‍රධාන වශයෙන් දේශීය මූලාශ්‍ර මත, විශේෂයෙන්ම බැංකු අංශය මත, යැපීමට රජයට සිදු විය. ඒ අනුව, දේශීය මූලාශ්‍ර මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2021 වසරේ දී සමස්ත මූල්‍යනයෙහි ප්‍රතිශතයක් ලෙස වාර්තා වූ සියයට 100.7ට (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 11.8ට) සාපේක්ෂව, 2022 වසරේ දී සමස්ත මූල්‍යනයෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 82.7ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 8.4ක්) විය. රාජ්‍ය සුරැකුම්පත් සඳහා වෙළඳපොළ අභිරුචිය අඩු වීම හමුවේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල දී දැක්වූ සෘජු දායකත්වය සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සෘජුව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම් හේතුවෙන්, 2022 වසරේ දී රුපියල් බිලියන 1,338.4ක ශුද්ධ මූල්‍යනයක් වාර්තා කරමින්, මහ බැංකුව රජයෙහි විශාලතම මූල්‍යන මූලාශ්‍රය වශයෙන් අඛණ්ඩව කටයුතු කළේය. ආර්ථික අර්බුදය හේතුවෙන් මහජනතාවට ඇති වූ දුෂ්කරතා අවම කිරීම සඳහා බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික මූලාශ්‍රවලින් අරමුදල් ලැබීම හේතුවෙන් 2022 වසර තුළ දී ශුද්ධ විදේශීය මූල්‍යනය රුපියල් බිලියන 424.8ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.8ක්) විය. 2021 වසරේ දී, විදේශීය මූල්‍යනය රුපියල් බිලියන 13.9ක (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.1ක) ශුද්ධ ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය. මේ අතර, පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව, භාණ්ඩාගාර බිල්පත් තොගයේ උපරිම සීමාව 2022 ජූනි මාසයේ දී රුපියල් බිලියන 3,000ක සිට රුපියල් බිලියන 4,000ක් දක්වා ඉහළ දැමුණු අතර, ඉහළ වෙළඳපොළ පොලී අනුපාතික හේතුවෙන් භාණ්ඩාගාර සුරැකුම්පත්වල මුහුණත් අගය අනුව ණය ගැනීමේ අවශ්‍යතාව ඉහළ යෑමේ හේතුවෙන්, 2022 නොවැම්බර් මාසයේ දී මෙම සීමාව රුපියල් බිලියන 5,000ක් දක්වා තවදුරටත් ඉහළ නංවන ලදී.

2021 වසර අවසානය වන විට වාර්තා වූ රුපියල් බිලියන 17,614.2ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 100.1ක්) වූ මධ්‍යම රජයේ නොපියවූ ණය, 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 27,492.0ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 113.8) දක්වා ඉහළ ගියේය. විශාල අයවැය හිඟයේ බලපෑම, විනිමය අනුපාතිකයේ හටගත් තියුණු අවප්‍රමාණය වීම හේතුවෙන් ඇති වූ අගයේ විචලනය (Parity change) සහ රජය සතු ව්‍යාපාර ව්‍යවසායයන් යටතේ මින් පෙර වාර්තා කරන ලද තෝරාගත් ණය වගකීම් කිහිපයක් මධ්‍යම රජය යටතේ යළි වර්ගීකරණය කිරීමෙහි බලපෑම මෙම ඉහළ යාමට හේතු විය. නාමික වශයෙන් ගත් කළ, දේශීය ණය සහ විදේශීය ණය 2022 වසර අවසානය වන විට, පිළිවෙළින්, සියයට 35.5කින් සහ සියයට 91.2කින් ඉහළ ගියේය. 2021 වසර අවසානයට මුළු දේශීය ණයෙන් නිරූපණය කල සියයට 62.8ක දායකත්වයට සාපේක්ෂව 2022 වසර අවසානයේ දී සියයට 57.9ක නිරූපණයක් පෙන්නුම් කරමින් භාණ්ඩාගාර බැඳුම්කර සමස්ත දේශීය ණය සඳහා වැඩි දායකත්වයක් ලබා දුන් අතර දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය කෙරෙනු ඇතැයි පවතින සමපේක්ෂණ සහ දිගු කාලීන රාජ්‍ය සුරැකුම්පත් සඳහා වෙළෙඳපොළ අභිරුචිය අඩු වීම හේතුවෙන්, 2022 වසර අවසානය වන විට භාණ්ඩාගාර බිල්පත් තොගය රුපියල් බිලියන 4,113.9ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

දැඩි ලෙස පහත වැටුණු දළ නිල සංචිත සහ ප්‍රමාණවත් නොවන විදේශීය මූල්‍යන ප්‍රවාහ හමුවේ, දළ මූල්‍යන අවශ්‍යතා ඉහළ යෑම සහ විශාල විදේශීය ණය සේවාකරණ වගකීම් ආසන්න සහ මැදි කාලීනව ගෙවීමට නියමිත වීම හේතුවෙන්, ණය ප්‍රතිව්‍යුහගතකරණ ප්‍රයත්න නිම වන තෙක්, ද්විපාර්ශ්වික සහ වාණිජ විදේශීය ණය සේවාකරණ තාවකාලිකව අත්හිටුවමින් 2022 අප්‍රේල් මස 12 වැනි දින ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය නිවේදනය කිරීමට රජයට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, පෙර වසරේ දී රුපියල් බිලියන 786.3ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.5ක්) වූ විදේශීය ණය සේවාකරණ ගෙවීම්, 2022 වසරේ දී රුපියල් බිලියන 487.4ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.0ක්) දක්වා පහත වැටුණි. සමාලෝචනයට ලක් කෙරෙන කාලය තුළ දී, දේශීය පොලී අනුපාතික තියුණු ලෙස ඉහළ යෑම සහ දේශීය ණය ඉහළ යෑම මූලික කරගෙන, දේශීය ණය සේවාකරණ ගෙවීම්, 2021 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 1,594.3ට (ද.දේ.නි.යෙහි

1

1.9 රූප සටහන
මධ්‍යම රජයේ නොපියවූ ණය
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රතිශතයක් ලෙස සියයට 9.1ක්) සාපේක්ෂව, 2022 වසරේ දී රුපියල් බිලියන 2,510.3ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 10.4ක්) දක්වා ඉහළ ගියේය. ඒ අනුව, සමස්ත ණය සේවාකරණ ගෙවීම්, 2021 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 2,380.6ක (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 13.5ක්) සිට 2022 වසරේ දී රුපියල් බිලියන 2,997.6ක් දක්වා (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 12.4ක්) ඉහළ ගියේය. සමාලෝචිත කාලය තුළ දී, පොළී ගෙවීම් සහ ණය ආපසු ගෙවීම්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, පිළිවෙළින්, සියයට 6.5ක් සහ සියයට 5.9ක් විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ තුළ පවතින අභිරුචීන් දුර්වල කළ, දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධයෙන් පැවති අවිනිශ්චිතතා සමනය කිරීම සඳහා රජය විසින් 2023 මාර්තු මස අග දී දේශීය ණය ප්‍රශස්තකරණ පරාමිතීන් පිළිබඳ වැඩිදුර තොරතුරු බෙදා හරින ලදී. රජයේ සමස්ත ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය නුදුරු කාලයේ දී ණය හිමියන් වෙත නිවේදනය කිරීමට බලාපොරොත්තු වන අතර, ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමෙහි අපේක්ෂිත ණය තිරසාරාත්මක ඉලක්ක සමඟ අනුගත වෙමින් ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය එමගින් කඩිනම් කෙරෙනු ඇත.

මුදල් අංශයේ ප්‍රවණතා

ශ්‍රී ලංකා මහ බැංකුව 2022 වසර මුළුල්ලේ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර 2022 අප්‍රේල් මාසයේ දී ප්‍රතිපත්ති පොළී අනුපාතික පදනම් අංක 700කින් සැලකිය යුතු ලෙස ඉහළ නැංවීය. ඉහළ යන උද්ධමන පීඩන පාලනය කිරීම, විදේශීය අංශයේ අවදානම් සමනය කිරීම හා උද්ධමන අපේක්ෂා පාලනය කිරීම සහ එමගින් අධි උද්ධමනකාරී තත්ත්ව හා දීර්ඝ කාලයක් ආර්ථික ක්‍රියාකාරකම් පිරිහීම වැළැක්වීම සඳහා එවැනි දැඩි මුදල් ප්‍රතිපත්තියක් අවශ්‍ය විය. ඒ අනුව, මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම ආරම්භ කළ 2021 වසරේ අගෝස්තු මාසයේ සිට මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති පොළී අනුපාතික, එනම්, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, 2022 වසර අවසානය වන විට ප්‍රතිශතාංක 10කින් ඉහළ නැංවිණි. 2022 අප්‍රේල් මාසයේ දී පෙර නොවූ ලෙස ප්‍රතිපත්ති පොළී අනුපාතික පදනම් අංක 700කින් ඉහළ නැංවීම ඉල්ලුම හේතුවෙන් ඇති වූ උද්ධමන පීඩන තවදුරටත් ඇති වීම පාලනය කිරීම සහ එමගින් අහිතකර උද්ධමන අපේක්ෂා ඉහළ යෑම වැළැක්වීම, විදේශීය අංශයේ පීඩන ලිහිල් කිරීම මෙන්ම වෙළඳපොළ පොළී අනුපාතික ව්‍යුහයේ නිරීක්ෂණය වූ විෂමතා නිවැරදි කිරීමට උපකාරී විය. මීට අමතරව, තෝරාගත් ණය උපකරණ මත මෙන්ම විදේශ විනිමය තැන්පතු සඳහා පනවා තිබූ උපරිම පොළී අනුපාතික සීමා ඉවත් කිරීම ඇතුළු නියාමන ක්‍රියාමාර්ග මහ බැංකුව විසින් ගනු ලැබූ අතර, එමගින් මුදල් තත්ත්වයන් දැඩි කිරීම සඳහා ප්‍රතිපත්ති පොළී අනුපාතික වෙනස්වීම් ඉතා කාර්යක්ෂම ලෙස වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම සඳහා අවකාශ සැලසුණි. මේ අතර, අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා පහසුකම් සැලසීමට මහ බැංකුව විසින් විදේශ විනිමය විකිණීම, ශුද්ධ පදනම මත රජයේ විදේශීය ණය ආපසු ගෙවීම්, බැංකු පද්ධතිය වෙතින් මහජනතාව ශුද්ධ පදනම මත මුදල් ආපසු ගැනීම් සහ දේශීය බැංකු සමඟ පැවති ගැනුම්-විකුණුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම් කල්පිරීම හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව, විශේෂයෙන්ම 2022 වසරේ පළමු භාගය තුළ දී විශාල හිඟ මට්ටමක අඛණ්ඩව පැවතිණි. කෙසේ වෙතත්, වෙළඳපොළ අවශ්‍යතා මත ද්‍රවශීලතාව සැපයීමට දිගු කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීම මධ්‍යයේ මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් ප්‍රාථමික වෙළඳපොළ වෙතින් මිලදී ගැනීම සහ තැන්පතු පොළී අනුපාතික ඉහළ යෑම හේතුවෙන් බැංකු පද්ධතිය වෙත වූ ව්‍යවහාර මුදල් තැන්පතු ඉහළ යෑම වැනි සාධක පිළිබිඹු කරමින් 2022 වසරේ අග භාගයේ දී දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව ක්‍රමයෙන් වර්ධනය වීමක් නිරීක්ෂණය විය. ප්‍රතිපත්ති පොළී අනුපාතික ඉහළ යෑම වේගයෙන් වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම, දේශීය මුදල් වෙළඳපොළ තුළ පැවැති හිඟ ද්‍රවශීලතා තත්ත්ව සහ අවදානම් ඉහළ මට්ටමක පැවතීම ආදියෙහි බලපෑම හේතුවෙන් 2022

1.10 රූප සටහන
නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයෙහි සහ තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම



මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

වසරේ දී වෙළඳපොළ තැන්පතු සහ ණය පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමෙන් අනතුරුව, රජයේ ණය ගැනීමේ අවශ්‍යතාවය ඉහළ යෑම සහ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය හා සම්බන්ධ වෙළඳපොළ තත්ත්වයන්හි ඉහළ අවිනිශ්චිතතා මධ්‍යයේ ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතිකවල ඉහළ යෑම්වලට අසමානුපාතික ලෙස රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික 2022 වසරේ දී විශාල ලෙස ඉහළ ගියේය. තවද, විවට වෙළඳපොළ කටයුතු හරහා වෙළඳපොළ අවශ්‍යතා මත ද්‍රවශීලතාව සැපයීම සිදුකරන අතරම, බලපත්‍රලාභී වාණිජ බැංකු මහ බැංකුවේ නිත්‍ය පහසුකම් මත අධික ලෙස රඳා පැවතීම අවම කිරීමටත්, එමගින් දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවයේ අසමමිතික ව්‍යාප්තිය අඩු කිරීමටත් අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග 2023 ජනවාරි මාසයේ දී හඳුන්වා දෙන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දේශීය මුදල් වෙළඳපොළ එක්දින ද්‍රවශීලතාව ඉහළ ගිය අතර, අන්තර් බැංකු ඒක්ෂණ වෙළඳපොළෙහි සහ ප්‍රතිමිලදී ගැනුම් වෙළඳපොළෙහි ක්‍රියාකාරිත්වය වර්ධනය විය. වැඩිදියුණු වූ රුපියල් ද්‍රවශීලතා තත්ත්වය සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙල සම්බන්ධයෙන් සාර්ථක ලෙස අවසන් එකඟතාවයකට පැමිණීමේ අපේක්ෂාව මත ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය වීමත් සමඟ 2022 වසර අවසානයේ දී සහ 2023 වසරේ මුල් කාලයේ දී රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වීමක් නිරීක්ෂණය විය. එසේම, වෙළඳපොළ පොලී අනුපාතිකවල අක්‍රමවත් ලෙස ඉහළ යෑම නිවැරදි කරමින් අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික ද 2022 වසර අග භාගයේ සිට ක්‍රමයෙන් අඩු වීම ආරම්භ විය. කෙසේ වෙතත්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙල පිළිබඳව අවසන් එකඟතාවයකට පැමිණීම සඳහා සියලු 'පූර්ව ක්‍රියාමාර්ග' සපුරාලීමේ අවශ්‍යතාවය සහ ප්‍රතිපත්ති පොලී අනුපාතික තවදුරටත් දැඩි කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද කරුණු සැලකිල්ලට ගෙන, 2022 සැප්තැම්බර් මාසයේ කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුම අවසන් කිරීමේ එකඟතාවයකට පැමිණීමේ දී ජා.මූ. අරමුදල විසින් යෝජනා කරන ලද ප්‍රතිපත්ති පොලී අනුපාතික විශාල ලෙස ඉහළ නැංවීමට සාපේක්ෂව, මහ බැංකුවේ සහ ජා.මූ. අරමුදලේ කාර්ය මණ්ඩලයේ එකඟතාවයකට අනුව 2023 මාර්තු මාසයේ මුල් කාලයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100කින් ඉහළ නැංවිණි. මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගය මෙන්ම දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රමෝපාය සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ලැබීමත් සමඟ අවදානම් පහළ යෑමේ හැකියාව අවධාරණය කරමින්, මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ ඉහළ වෙළඳපොළ පොලී අනුපාතික අතර පරතරය අඩු කිරීමේ අවශ්‍යතාව වෙළඳපොළ වෙත දැනුම් දුන්නේය. ඒ අනුව, අපේක්ෂා කළ පරිදි ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික අතර පරතරය අඩු කරමින් වෙළඳපොළ පොලී අනුපාතික අබණ්ඩව පහළ ගියේය. මේ අතර, රජය විසින් 2023 මාර්තු මස අවසානයේ දී දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලිය පිළිබඳ වැඩි විස්තර ලබා දුන් අතර, ඉන් පසුව භාණ්ඩාගාර බිල්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස පහළ යෑමට එය උපකාරී විය.

රාජ්‍ය අංශය වෙත ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම සහ විදේශ මුදලින් නාමනය කරන ලද දේශීය ණය රුපියල්වලින් ගණනය කිරීමේ දී විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිසා සිදු වූ ප්‍රසාරණාත්මක බලපෑම මධ්‍යයේ 2022 වසරේ මුල් කාලයේ දී සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වූ පුළුල් මුදල් සැපයුමෙහි (M_{2b}) වර්ධනය, ඉන් පසුව ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශයට ලබා දුන් ණය සංකෝචනය වීම හේතුවෙන් මන්දගාමී විය. පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2021 වසර අවසානයේ වාර්තා වූ සියයට 13.2ට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 15.4ක් ලෙස වාර්තා වූ අතර, එ.ජ.

1

1.11 රූප සටහන
වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය (අ)



(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ. ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ බලපෑම ඉවත් කළ පසු[1] පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය 2022 වසර අවසානය වන විට සියයට 7ක් පමණ දක්වා මන්දගාමී වී ඇති බව ඇස්තමේන්තු කර ඇත. විදේශ මුදලින් නාමනය කරන ලද ණය සහ අත්තිකාරම් රුපියල්වලින් ගණනය කිරීමේ දී විනිමය අනුපාතිකය විශාල ලෙස අවප්‍රමාණය වීම නිසා සිදු වූ ප්‍රසාරණාත්මක බලපෑම හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් නොපියවූ ණය ප්‍රමාණය, රුපියල්වලින් සැලකූ විට, 2022 වසරේ මුල් කාලයේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද, දැඩි මුදල් තත්ත්ව සහ ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2022 වසරේ මැද භාගයේ සිට අඛණ්ඩව සංකෝචනය විය. ඒ අනුව, 2022 වසර අවසානය වන විට පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සියයට 6.2ක් දක්වා මන්දගාමී විය (රුපියල අවප්‍රමාණය වීමේ බලපෑම ඉවත් කළ පසු වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.3ක සංකෝචනය වීමක් ඇස්තමේන්තු කර ඇත).[2] එසේ වුවද, රාජ්‍ය ආදායම අඩු මට්ටමක පැවතීම සහ විදේශීය මූල්‍යන සඳහා ප්‍රවේශය සීමා වීම මධ්‍යයේ රජය දේශීය මූල්‍යනය, විශේෂයෙන් ම මහ බැංකුව මත, අඛණ්ඩව රඳා පැවතීම පිළිබිඹු කරමින් බැංකු පද්ධතිය මගින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය 2022 වසරේ දී විශාල ලෙස ඉහළ ගියේය. 2021 වසරේ දී බැංකු පද්ධතිය මගින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 1,284.4ක වැඩිවීමක් වාර්තා වූ අතර, 2022 වසර තුළ දී එය රුපියල් බිලියන 1,638.7කින් ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය වැඩිම දායකත්වයක් සැපයීය. දුර්වල මූල්‍ය කාර්යසාධනය සහ විදේශ මුදලින් නාමනය කරන ලද ණය රුපියල්වලින් ගණනය කිරීමේ දී විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිසා සිදු වූ ප්‍රසාරණාත්මක බලපෑම පිළිබිඹු කරමින් බැංකු පද්ධතිය වෙතින් රජය සතු වාණිජ ව්‍යවසායයන් ලබා ගත් ණය ද සැලකිය යුතු ලෙස ප්‍රසාරණය විය. මේ අතර, වෙළඳපොළ තුළ විදේශ විනිමය ද්‍රවශීලතාව සීමිත වීම මධ්‍යයේ 2022 වසරේ මුල් කාලයේ දී ණය ආපසු ගෙවීම සහ වසර පුරා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය කිරීම මූල්‍යනය සඳහා නිල සංචිත උපයෝගී කර ගැනීම හේතුවෙන් මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් අඩුවීම සමඟ 2022 වසර තුළ දී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් සැලකිය යුතු ලෙස සංකෝචනය විය. කෙසේ වෙතත්, මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම්හි සුළු වර්ධනයක් 2022 වසර අග භාගයේ දී නිරීක්ෂණය විය. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් ද, විශේෂයෙන් ම වසර අවසාන කාලය වන විට, වර්ධනයක් වාර්තා කළේය.

1.12 රූප සටහන
පුළුල් මුදල් (M_{2b}) වර්ධනය හා තුඩුදුන් සාධක (අ)



(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ. ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

1 මෙහිදී සියලුම විදේශ මුදලින් නාමනය කරන ලද අගයන් 2022 පෙබරවාරි මස අවසානයේ පැවති විනිමය අනුපාතිකය භාවිත කරමින් රුපියල්වලින් ගණනය කිරීමෙන් මුදල් සැපයුමේ වර්ධනය ඇස්තමේන්තු කර ඇත.

2 මෙහිදී සියලුම විදේශ මුදලින් නාමනය කරන ලද ණය 2022 පෙබරවාරි මස අවසානයේ පැවති විනිමය අනුපාතිකය භාවිත කරමින් රුපියල්වලින් ගණනය කිරීමෙන් පෞද්ගලික අංශයට ලබා දුන් ණය වර්ධනය ඇස්තමේන්තු කර ඇත.

මූල්‍ය අංශයේ ප්‍රවණතා

පවතින ආර්ථික අර්බුදයේ බහුවිධ බලපෑම් මධ්‍යයේ 2022 වසරේ දී මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව අඛණ්ඩව පවත්වා ගැනුණි. ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම, බැංකු අංශය රාජ්‍ය අංශය වෙත වැඩි වශයෙන් නිරාවරණය වීම, ආර්ථිකය සංකෝචනය වීම, උග්‍ර විදේශ විනිමය හිඟය, උද්ධමනය ඉහළ මට්ටමක පැවතීම සහ 2022 වසරේ අප්‍රේල් මාසයේ දී රජය විසින් ද්විපාර්ශ්වික සහ වාණිජ ණය සම්බන්ධ විදේශ ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම පිළිබඳව නිවේදනය කිරීම වැනි සාධක මූල්‍ය අංශයේ ක්‍රියාකාරකම් කෙරෙහි සැලකිය යුතු හා පෙර නොවූ අන්දමේ අහිතකර බලපෑම් ඇති කළේය. එසේ වුවද, විචක්ෂණශීලී නියාමන ක්‍රියාමාර්ග සහ නියාමන ලිහිල් කිරීම් මගින් වසර තුළ දී මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව රැක ගැනීමට පහසුකම් සැලසුණි. ණයවල ගුණාත්මකභාවය අඛණ්ඩව පහළ යෑම, ද්‍රවශීලතාවය මත පීඩනය උග්‍ර වීම, ණය හානිකරණ ඉහළ යෑම හේතුවෙන් ලාභදායීත්වය පහළ මට්ටමක පැවතීම, සහ ප්‍රාග්ධන ස්වාරක්ෂක පිරිහීම හේතුවෙන් ඇති වූ සුවිශාල අභියෝග මධ්‍යයේ වුව ද 2022 වසර තුළ බැංකු අංශයේ ස්ථායීතාව පවත්වාගෙන යන ලදී. ණය වර්ධනය මන්දගාමී වීම, ලාභදායීත්වය අඩු වීම සහ අදියර 3 යටතේ පවතින ණය මගින් පිළිබිඹු වන අක්‍රීය ණය ඉහළ යෑම වැනි අභියෝග මධ්‍යයේ බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය, ප්‍රමාණවත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක සහිතව 2022 වසර තුළ දී, වත්කම් හා තැන්පතු අනුව ගත් කල, සිය අඛණ්ඩ වර්ධනය පවත්වා ගැනීමට සමත් විය. මේ අතර, රක්ෂණ අංශය 2022 වසර තුළ දී රක්ෂණ ව්‍යාප්තියේ අඩුවීමක් සහිතව වත්කම් පදනම සහ දළ ලියාභළ වාරිකය (Gross written Premium) අනුව සුළු වර්ධනයක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන් ආර්ථික අර්බුදයේ බලපෑම් හේතුවෙන් ප්‍රාථමික අලෙවිකාර සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්, විශ්‍රාම අරමුදල් සහ අනෙකුත් උප අංශවල මිශ්‍ර කාර්යසාධනයක් මෙම කාලපරිච්ඡේදය තුළ පෙන්නුම් කළේය.

2022 වසර තුළ දී මූල්‍ය වෙළඳපොළ ද විවිධ අංශ වෙතින් ඇති වූ පීඩනවලට ඔරොත්තු දීමට සමත් වූ අතර, 2022 වසර අග භාගයේ සිට යළි යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්නුම් කළේය. 2022 වසරේ පළමු භාගය තුළ අඛණ්ඩව ඉහළ හිඟ මට්ටමක පැවති මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව, ප්‍රධාන වශයෙන් මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් 2022 වසර අවසානය වන විට සැලකිය යුතු ලෙස වර්ධනය විය. මේ අතර, අරමුදල් ණයට ගැනීමට හෝ අතිරික්ත අරමුදල් තැන්පත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලබන නිත්‍ය පහසුකම් මත මුදල් වෙළඳපොළෙහි සහභාගීත්ව ආයතන අඛණ්ඩව රඳා පැවතීම සහ වෙළඳපොළ සහභාගිවන්නන් අතර අවදානම් සඳහා මුහුණ දීමට ඇති අකමැත්ත වැඩි වීමත් සමඟ මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් දුර්වල කාර්යසාධනයක් වාර්තා කළේය. 2023 වසරේ මුල් භාගයේ සිට නිත්‍ය පහසුකම් මත රඳා පැවතීම සීමා කිරීමට මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග, අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ සහ ප්‍රතිමිලදී ගැනීමේ වෙළඳපොළ විශාල වශයෙන් සක්‍රීය කිරීමට උපකාරී විය. 2022 වසර තුළ පැවති ගෙවුම් තුලන පීඩන සහ අහිතකර වෙළඳපොළ අපේක්ෂා හේතුවෙන් විනිමය අනුපාතිකය විශාල ලෙස අවප්‍රමාණය වීමත් සමඟ දේශීය විදේශ විනිමය වෙළඳපොළ ද්‍රවශීලතා හිඟ තත්ත්වයන්ට මුහුණ දුන් අතර, ජා. මූ. අරමුදලේ විස්තීරණ ණය පහසුකම ලබා ගැනීමත් සමඟ ඇතිවූ ධනාත්මක වෙළඳපොළ අපේක්ෂා සහ විනිමය අනුපාතික සම්බන්ධයෙන් නිකුත් කරන දෛනික වෙළඳපොළ මාර්ගෝපදේශ හා මහ බැංකුව වෙත විදේශ විනිමය අනිවාර්යයෙන් විකිණීමේ අවශ්‍යතාව ඉවත් කිරීමේ ක්‍රියාමාර්ග සමඟ 2023 වසරේ මුල් භාගයේ සිට යම් හිතකර වර්ධනයන් දක්නට ලැබුණි. අයහපත් සාර්ව ආර්ථික තත්ත්වයන් පවතින පසුබිමක් තුළ ස්ථාවර ආදායම් සුරැකුම්පත් සඳහා ඉහළ ඵලදායක් පැවතීම සහ සෘණාත්මක වෙළඳපොළ අපේක්ෂා පිළිබිඹු කරමින් කොටස් වෙළඳපොළ 2022 වසර තුළ දුර්වල කාර්යසාධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, වසර තුළ දී කොටස් වෙළඳපොළ වෙත ශුද්ධ විදේශ විනිමය ගලා ඒම් වාර්තා විය. මෙම අභියෝගාත්මක ආර්ථික පරිසරය තුළ මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සඳහා මූල්‍ය යටිතල පහසුකම් අඛණ්ඩව සහාය සැපයීය.

1.3. ගෝලීය ආර්ථික පරිසරය සහ ඉදිරි දැක්ම

රුසියාව හා යුක්‍රේනය අතර පවතින යුද්ධය සහ චීනයේ කොවිඩ්-19 වසංගතය යළි ව්‍යාප්ත වීම සමඟ ඉහළ ගිය උද්ධමනය පාලනය කිරීම අරමුණු කරගනිමින් ගෝලීය වශයෙන් මහ බැංකු එකම කාලසීමාවක දී ප්‍රතිපත්ති පොලී අනුපාතික දැඩි කිරීම හමුවේ, ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් 2022 වසරේ දී දැඩි ලෙස පහත වැටී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ජා.මූ. අරමුදල විසින් 2023 වසරේ ජනවාරි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද ලෝක ආර්ථික ඉදිරි දැක්මට

1

1.4 සංඛ්‍යා සටහන

ගෝලීය ආර්ථික ප්‍රවණතා සහ ඉදිරි දැක්ම (අ)

ශීර්ෂය	2021 (ආ)	2022 (ඇ)	2023 (ප්‍රක්ෂේපණ)	2024 (ප්‍රක්ෂේපණ)
ලෝක නිෂ්පාදිතය	**6.2**	**3.4**	**2.9**	**3.1**
සංවර්ධිත ආර්ථික	5.4	2.7	1.2	1.4
ඇමරිකා එක්සත් ජනපදය	5.9	2.0	1.4	1.0
යුරෝ කලාපය	5.3	3.5	0.7	1.6
එක්සත් රාජධානිය	7.6	4.1	-0.6	0.9
ජපානය	2.1	1.4	1.8	0.9
නැඟී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික	6.7	3.9	4.0	4.2
නැඟී එන වෙළඳපොළ සහ සංවර්ධනය වන ආසියාව	7.4	4.3	5.3	5.2
චීනය	8.4	3.0	5.2	4.5
ඉන්දියාව	8.7	6.8	6.1	6.8
ලෝක වෙළඳ පරිමාව (භාණ්ඩ හා සේවා)	**10.4**	**5.4**	**2.4**	**3.4**
මිල හැසිරීම				
පාරිභෝගික මිල				
සංවර්ධිත ආර්ථික	3.1	7.3	4.6	2.6
නැඟී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික	5.9	9.9	8.1	5.5
වෙළඳ භාණ්ඩ මිල				
ඉන්ධන	65.8	39.8	-16.2	-7.1
ඉන්ධන නොවන	26.4	7.0	-6.3	-0.4

(අ) වෙනත් සඳහනක් නොමැති විට වාර්ෂික ප්‍රතිශත වෙනස
(ආ) සංශෝධිත
(ඇ) ඇස්තමේන්තු

මූලාශ්‍රය: World Economic Outlook (2023 ජනවාරි), ජා.මූ. අරමුදල

(World Economic Outlook) අනුව, ගෝලීය ආර්ථික වර්ධනය 2021 වසරේ දී ඇස්තමේන්තු කළ සියයට 6.2ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 3.4ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු වී ඇතැයි පුරෝකථනය කර ඇත. මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම සමඟ ඉල්ලුම මත බලපෑම් ඇතිවීමත්, ඉහළ උද්ධමනය මගින් කුටුම්භවල මිල දී ගැනීමේ හැකියාව පහළ යෑම හා ආර්ථිකය පිළිබඳ විශ්වාසය බිඳ දැමීමත් හේතුවෙන්, 2022 වසරේ දී සංවර්ධිත රටවල ආර්ථික තත්ත්වයන් සැලකිය යුතු ලෙස පිරිහීමට ලක් විය. රුසියාව සහ යුක්‍රේනය අතර පවතින යුද්ධය, යුරෝපා කලාපයේ බලශක්ති සැපයුම දැඩි ලෙස අඩාල වීමට බලපෑ අතර, එය බලශක්ති මිල ගණන් සහ ඇතැම් ආහාර මිල ගණන් ඉහළ නැංවීම හරහා නිෂ්පාදනයට හා පරිභෝජනයට බාධා ඇති කරමින් අවිනිශ්චිතතා ඇති කිරීමට හේතු විය. විශාල වශයෙන් කොවිඩ්-19 වසංගතය නැවත ව්‍යාප්ත වීම සමඟ සමාජ සහ ආර්ථික කටයුතු සීමා කිරීම හේතුවෙන් 2022 වසරේ දී චීනයේ ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී විය. තවද, දැඩි ගෝලීය මූල්‍ය තත්ත්වයන්, ඉහළ උද්ධමනය මධ්‍යයේ පාරිභෝගික වියදම් අඩු වීම, විදේශීය ඉල්ලුම අඩු වීම සහ රුසියාව සහ යුක්‍රේනය අතර යුද්ධයේ බලපෑම හේතුවෙන් නැඟී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි ක්‍රියාකාරකම් 2022 වසරේ දී ශීඝ්‍ර ලෙස පහත වැටුණි.

උද්ධමනය පාලනය කිරීම සඳහා වූ ගෝලීය ක්‍රියාකාරකම් මධ්‍යයේ ඇති වූ දැඩි මූල්‍ය තත්ත්වයන් සහ රුසියාව හා යුක්‍රේනය අතර යුද්ධය අඛණ්ඩව පැවතීම, 2023 වසරේ දී ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම්වලට බලපෑම් කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, චීනය නැවත ආර්ථික හා සමාජීය කටයුතු සඳහා විවෘත කිරීම මගින් මෙම බලපෑම යම්තාක් දුරට සමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2023 වසරේ ජනවාරි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද ලෝක ආර්ථික ඉදිරි දැක්මට අනුව, ගෝලීය ආර්ථික වර්ධනය 2023 වසරේ දී සියයට 2.9ක් දක්වා පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, ඉන්පසුව 2024 වසරේ දී සියයට 3.1ක් දක්වා ඉහළ යෑමක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. දියුණු ආර්ථිකයන්හි වර්ධනය 2022 වසරේ දී වාර්තා වූ සියයට 2.7 සිට 2023 වසරේ දී සියයට 1.2ක් දක්වා සැලකිය යුතු ලෙස පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. එක්සත් ජනපදය, යුරෝපා කලාපීය ආර්ථිකයන් සහ එක්සත් රාජධානිය ඇතුළු දියුණු ආර්ථිකයන් බොහොමයක් 2023 වසරේ දී මන්දගාමී වර්ධනයක් අත්විඳිනු ඇතැයි පුරෝකථනය කර ඇත. කෙසේ වෙතත්, දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රමයෙන් ලිහිල් කිරීම සහ බලශක්ති වෙළඳපොළ ස්ථාවර වීම හමුවේ 2024 වසරේ දී දියුණු ආර්ථිකයන්හි වර්ධනය මධ්‍යස්ථ ලෙස ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. විදේශීය ඉල්ලුම අඩුවීම, ප්‍රධාන වශයෙන් රෙදිපිළි සහ ඇඟලුම් ඇතුළු අපනයන අඩු වීමට හේතු විය හැකි බැවින්, දියුණු ආර්ථිකයන්හි ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම ශ්‍රී ලංකාවේ අපනයන කෙරෙහි බලපෑමක් ඇති කළ හැකිය. එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන ගමනාන්තයන් වන බැවින්, මෙම කලාපවලින් ඇති වන ඉල්ලුම යම්කිසි ආකාරයකින් අඩු වීම ශ්‍රී ලංකාවේ අපනයන ක්‍රියාකාරිත්වය කෙරෙහි සැලකිය යුතු ඍණාත්මක බලපෑමක් ඇති කරනු ලබන අතර, එමගින් ආර්ථික වර්ධනයට බලපෑම් ඇති කරනු ලබයි. තවද, දියුණු ආර්ථිකයන්හි ආදායම් මට්ටම්වල වර්ධනය පහළ යෑම, එම රටවලින් පැමිණෙන සංචාරකයින් ප්‍රමාණය අඩුවීමට බලපානු ඇත. මේ අතර, ප්‍රධාන වශයෙන් නැඟී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආසියාවේ, විශේෂයෙන් චීනයේ අපේක්ෂිත ආර්ථික වර්ධනය සහ රුසියාව සම්බන්ධයෙන් පුරෝකථනය කර ඇති ඉහළ ආර්ථික වර්ධනය හේතුවෙන් නැඟී එන වෙළඳපොළ

සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි ආර්ථික ක්‍රියාකාරකම් 2022 වසරේ දී වාර්තා වූ සියයට 3.9 සිට 2023 වසරේ දී සියයට 4.0ක් දක්වා සුළු වශයෙන් ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. කෙසේ වෙතත්, නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ගේ අඩක පමණ ආර්ථික වර්ධනය, 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී අඩු වනු ඇතැයි පුරෝකථනය කර ඇත. දැඩි මූල්‍ය තත්ත්ව සහ භූ දේශපාලනික අර්බුදවලට අමතරව, දියුණු ආර්ථිකයන්හි පහළ ගිය ඉල්ලුම් තත්ත්ව මගින් ඇතිවන බලපෑම් සහ අඛණ්ඩ මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග ඇතුළු විවිධ ආකාරයේ බාධා මගින් නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ට බලපෑම් සිදු කරනු ඇත. සංචාරක හා විශේෂයෙන් ම ඉදිකිරීම් ආශ්‍රිත අංශ ඇතුළත් විදේශීය ආයෝජන ක්ෂේත්‍ර හරහා ශ්‍රී ලංකාව, චීනය හා ඉන්දියාව සමඟ දිගු කාලීන ආර්ථික සම්බන්ධතා පවත්වන බැවින් චීනයේ ආර්ථික ක්‍රියාකාරකම්වල අපේක්ෂිත වර්ධනය සහ ඉන්දියාවේ ආර්ථික වර්ධනය ශක්තිමත් වීමේ ප්‍රවණතාවය ශ්‍රී ලංකාවට වාසිදායක විය හැකිය.

2022 වසරේ දී ගෝලීය උද්ධමනය උපරිම මට්ටමට පැමිණ ඇති බවට ඇස්තමේන්තු කර ඇති අතර, ඉල්ලුම පහළ යෑම සහ වෙළඳ භාණ්ඩ මිල ගණන් පහළ යෑම මධ්‍යයේ 2023 වසරේ දී එය පහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2023 වසරේ ජනවාරි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද ලෝක ආර්ථික ඉදිරි දැක්මට අනුව, ලෝකයේ පාරිභෝගික භාණ්ඩ මිල ගණන්, 2021 වසරේ දී වාර්තා වූ සියයට 4.7ට සාපේක්ෂව, 2022 වසරේ දී සියයට 8.8කින් ඉහළ ගියේය. 2022 වසරේ දී උද්ධමනය ඉහළ යෑම සඳහා ඉල්ලුම් මෙන්ම සැපයුම් සාධක බලපෑ අතර, ඉල්ලුම් පාර්ශ්වයෙන්, වසංගතයෙන් පසු අතිශය ලිහිල් කරන ලද මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල පසු බලපෑම් අඛණ්ඩ මිල පීඩනයන්ට හේතු විය. සැපයුම් අංශය සම්බන්ධයෙන් ගත් කළ, රුසියාව සහ යුක්රේනය අතර පවතින යුද්ධය හේතුවෙන් උග්‍ර වූ ප්‍රධාන වෙළඳ භාණ්ඩවල හිඟය මෙන්ම ධාරිතාවයෙහි සීමා වීම් සහ සැපයුම් දාම කෙරෙහි වූ බාධාවන් මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යෑම සඳහා හේතු විය. කෙසේ වෙතත්, මුදල් ප්‍රතිපත්තිය සැලකිය යුතු ලෙස දැඩි කිරීම, ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම, සැපයුම් දාම වෙත වූ බාධාවන් ලිහිල් වීම සහ බලශක්ති හා අනෙකුත් වෙළඳ භාණ්ඩවල මිල ගණන් පහළ යෑම යන සාධක හමුවේ, උද්ධමනය ඉදිරි කාල සීමාව තුළ පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. ඒ අනුව, ගෝලීය උද්ධමනය, 2023 වසරේ දී සියයට 6.6ක් දක්වා සහ 2024 වසරේ දී සියයට 4.3ක් දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේ වුවද, උද්ධමනයේ පුරෝකථනය කර ඇති මට්ටම් තවමත් වසංගත තත්ත්වයට පෙර පැවති සියයට 3.5 මට්ටමට වඩා ඉහළ මට්ටමක පවතී. 2022 වසරේ දී දේශීය මිල ඉහළ යෑම සඳහා මෙම ගෝලීය මිල ගණන්වල දායකත්වය සැලකිය යුතු ලෙස හේතු වූ බැවින් ගෝලීය බලශක්ති සහ අනෙකුත් වෙළඳ භාණ්ඩ මිල ගණන් පහළ යෑම ශ්‍රී ලංකාවට වාසිදායක වනු ඇත. ගෝලීය මිල ගණන්වල අපේක්ෂිත පහළ යෑමට අනුකූලව කාලෝචිත හා විනිවිදභාවයකින් යුතුව දේශීය මිල ගණන් සඳහා ගැළපීම් කළහොත්, ආනයනික උද්ධමනය සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පවත්වා ගත හැකි අතර, එය රට අත් කර ගැනීමට අපේක්ෂිත නිර්-උද්ධමන ක්‍රියාවලියට සහාය වනු ඇත.

ඉහළ යන උද්ධමන පීඩන සහ අහිතකර උද්ධමන අපේක්ෂා සැලකිල්ලට ගනිමින් ලොව පුරා බොහෝ මහ බැංකු වසංගතය හමුවේ ක්‍රියාත්මක කළ උත්තේජක ක්‍රමයෙන් අඩු කරමින් 2022 වසරේ දී සිය ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම ආරම්භ කළහ. උද්ධමනය, 2021 වසරේ සිට අපේක්ෂිත ප්‍රමාණයට වඩා වේගයෙන් සහ අඛණ්ඩව වැඩි වෙමින් පවතී. 2022 වසරේ දී, දියුණු ආර්ථිකයන්හි උද්ධමනය 1982 වසරෙන් පසු වාර්තා වූ ඉහළම මට්ටමට ළඟා විය. ඉහළ යන මිල පීඩනය, දියුණු ආර්ථිකයන් සහ බොහෝ නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි මුදල් ප්‍රතිපත්ති එකම කාලසීමාවක දී දැඩි කිරීමට හේතු විය. කොවිඩ්-19 වසංගත කාලය තුළ ෆෙඩරල් අරමුදල් අනුපාතිකය ශූන්‍යයට ආසන්නව පවත්වාගෙන ගිය එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව, 2022 වසරේ දී ෆෙඩරල් අරමුදල් ඉලක්ක අනුපාතිකය පදනම් අංක 425කින් සැලකිය යුතු ලෙස ඉහළ නැංවූ අතර, 2023 වසරේ මේ දක්වා කාලය තුළ දී තවත් පදනම් අංක 50කින් වැඩි කර ඇත. ඊට අමතරව, වසංගත තත්ත්වය හේතුවෙන් ක්‍රියාවට නැංවූ මූල්‍ය තත්ත්වයන් ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රමයෙන් දැඩි කිරීමේ පියවරක් ලෙස ෆෙඩරල් සංචිත බැංකුව, භාණ්ඩාගාර සුරැකුම්පත්, නියෝජිතායතන ණය සහ නියෝජිතායතන දේපළ ඇපකර සහිත ණය සුරැකුම්පත් තොගය අඛණ්ඩව අඩු කරන ලදී. එමෙන්ම, දුර්වල ආර්ථික වර්ධනයක් පුරෝකථනය කළ ද, එංගලන්ත මහ බැංකුව සිය බැංකු අනුපාතිකය 2022 වසරේ දී පදනම් අංක 325කින් සහ 2023 වසරේ මේ දක්වා කාලය තුළ දී පදනම් අංක 75කින්, 2008 වසරේ අග සිට මේ දක්වා කාලය තුළ පැවති ඉහළම මට්ටමකට වැඩි කළේය. යුරෝපීය මහ බැංකුව ද සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික 2022 වසරෙහි ශූන්‍ය මට්ටමේ සිට

1

2023 වසරේ මාර්තු වන විට සියයට 3.5ක් දක්වා අඛණ්ඩව ඉහළ නංවන ලදී. තවද, යුරෝපීය මහ බැංකුව විසින්, යුරෝ පද්ධතියෙහි (Eurosystem) වත්කම් මිලදී ගැනීමේ වැඩසටහන යටතේ එහි සුරැකුම්පත් තොගය අඩු කිරීමක් නිවේදනය කරන ලදී. තවද, ප්‍රධාන දියුණු ආර්ථිකයන් 2023 සහ 2024 වසරවල බොහෝ විට මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අදාළව අපේක්ෂිත මාවත සහ අඛණ්ඩ දැඩි මුදල් ප්‍රතිපත්ති තත්ත්වයන් පිළිබඳ ඉදිරි මගපෙන්වීම් සපයන ලදී. බොහෝ රටවල සමස්තයක් ලෙස එලදා වක්‍රයට අදාළ පොලී අනුපාතික ඉහළ යෑම සමඟ දැඩි මුදල් ප්‍රතිපත්තිය සඳහා මූර්ත ආර්ථික ක්‍රියාකාරකම් සහ මූල්‍ය වෙළඳපොළ ප්‍රතිචාර දකිවා ඇති අතර, ශ්‍රම වෙළඳපොළ මන්දගාමී වීම සහ නිවාස වෙළඳපොළ මිල මට්ටම් අඩුවීමේ සලකුණු පෙන්නුම් කරමින් පවතී. කෙසේ වෙතත්, දියුණු ආර්ථිකයන්හි දැඩි මුදල් ප්‍රතිපත්තිය හේතුවෙන් ශ්‍රී ලංකාව ඇතුළු නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් වෙත ලැබෙන ප්‍රාග්ධන ප්‍රවාහ සඳහා බලපෑමක් සිදු විය හැකිය. මේ අතර, ඉහළ යන උද්ධමන පීඩනයන් සමනය කිරීමට නැගී එන වෙළඳපොළ සහ දියුණු වෙමින් පවතින රටවල ආර්ථිකයන්ගේ මහ බැංකු ද 2022 වසරේ දී දැඩි ප්‍රතිපත්ති අනුගමනය කරන ලදී. ඒ අනුව, ඉන්දියානු සංචිත බැංකුව, මැලේසියානු මහ බැංකුව, තායිලන්ත මහ බැංකුව, පිලිපීන මහ බැංකුව, සහ ඉන්දුනීසියානු බැංකුව වැනි අනෙකුත් මහ බැංකු උද්ධමනය පාලනය කිරීම සඳහා 2022 වසරේ දී මෙන්ම 2023 වසරේ මුල් කාලයේ දී ඔවුන්ගේ ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නංවන ලදී. මීට වෙනස්ව යමින්, 2022 වසරේ දී කොවිඩ්-19 හේතුවෙන් සිදුවූ දිගු කාලයක් පුරා පැවති සමාජ සහ ආර්ථික කටයුතු සීමා කිරීම සහ දේපළ වෙළඳාම් අංශයේ ගැටලු හේතුවෙන් බලපෑමට ලක් වූ ආර්ථිකය, නැවත යථා තත්ත්වයට පත් කිරීමේ උත්සාහයක් ලෙස 2022 වසරේ දී චීන මහජන බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමට අඛණ්ඩව කටයුතු කරන ලදී.

විශේෂයෙන් ම රාජ්‍ය සුරැකුම්පත්වල ඉහළ එලදා අනුපාතික ඇතුළු ඉහළ පොලී අනුපාතික මධ්‍යයේ, දියුණු ආර්ථිකයන්හි බැංකු අංශය මූල්‍ය අර්බුදයක සලකුණු පෙන්නුම් කළේය. 2023 මාර්තු මාසයේ දී, එක්සත් ජනපදයේ සිලිකන් වැලි බැංකුව (Sillicon Valley Bank) බිඳ වැටුණු අතර, එය එක්සත් ජනපද ඉතිහාසයේ වාර්තා වූ දෙවන විශාලතම බැංකු අසාර්ථක වීම වන අතර, 2008 ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසු වාර්තා වූ විශාලතම බැංකු අසාර්ථක වීම විය. ඉහළ යන උද්ධමනය මැඩපැවැත්වීම සඳහා ෆෙඩරල් සංචිත බැංකුව 2022 වසරේ දී පොලී අනුපාතික විශාල ලෙස ඉහළ නැංවූ හෙයින්, එක්සත් ජනපද භාණ්ඩාගාර සුරැකුම්පත්වල වෙළඳපොළ වටිනාකම සැලකිය යුතු ලෙස පහත වැටුණි. බොහෝ බැංකු එක්සත් ජනපද භාණ්ඩාගාර සුරැකුම්පත්වල ආයෝජනය කර තිබූ බැවින්, වෙළඳපොළ වටිනාකම පහත වැටීම හේතුවෙන් ඔවුන්ගේ ආයෝජන කලඹෙහි අලාභ සිදු වූ අතර, ප්‍රාග්ධන සංචිත අඩු වීමෙන් ඔවුන්ගේ ශේෂ පත්‍ර දුර්වල විය. සිලිකන් වැලි බැංකුවෙහි ණය කලඹ තුළ ෆින්ටෙක් සමාගම් සහ ආරම්භක ව්‍යාපාර කෙරෙහි වැඩි නැඹුරුවක් තිබූ අතර එමගින් එහි අවදානම ඉහළ ගියේය. විශාල එක්සත් ජනපද බැංකු සමූහයක් විසින් මුදවා ගන්නා ලද ෆස්ට් රිපබ්ලික් (First Republic) බැංකුව ඇතුළු තවත් එක්සත් ජනපද බැංකු කිහිපයක් ද එම සංසිද්ධිය හේතුවෙන් මූල්‍ය අර්බුදයකට ලක් විය. මීට අමතරව, ක්‍රිප්ටෝ ව්‍යවහාර මුදල් (Cryptocurrency) ආශ්‍රිත සමාගම් සමඟ වැඩි වශයෙන් ගනුදෙනු කිරීම හේතුවෙන් 2023 වසරේ මාර්තු මාසයේ දී එක්සත් ජනපදයේ සිල්වර්ගේට් බැංකුව ද (Silvergate Bank) අසාර්ථක වූ අතර, එම හේතුව නිසාම එක්සත් ජනපදයේ සිග්නේචර් (Signature) බැංකුවේ මෙහෙයුම්, නියාමන ආයතන විසින් අත්හිටුවන ලදී. මෙම අසාර්ථකත්වයන්ට ප්‍රතිචාර වශයෙන්, එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව සහ එක්සත් ජනපද රාජ්‍ය ආයතන විසින් මූල්‍ය අර්බුදයක පසුවන බැංකුවලට ද්‍රවශීලතාවය ලබා දීම සහතික කිරීම සහ අසාර්ථක වූ බැංකුවල තැන්පතු නැවත ලබා දීම සඳහා පියවර මාලාවක් නිවේදනය කරන ලදී. එක්සත් ජනපදයේ බැංකු අංශයට අමතරව, ස්විට්සර්ලන්තය පදනම් කරගත් ගෝලීය ආයෝජන බැංකුවක් සහ මූල්‍ය සේවා සමාගමක් වන ක්‍රෙඩිට් ස්විස් (Credit Suisse), 2023 වසරේ මාර්තු මාසයේ දී මූල්‍ය අර්බුදයක සලකුණු පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, ස්විට්සර්ලන්තයේ මහ බැංකුව වන ස්විට්සර්ලන්ත ජාතික බැංකුව (Swiss National Bank) විසින් මූල්‍ය කටයුතු ඉහළ නැංවීම සඳහා ලබා දුන් හදිසි ණය පහසුකමකින් එහි බිඳවැටීම වළක්වාලීය. ස්විට්සර්ලන්තයේ විශාලතම බැංකු ආයතනය වන යූ.බී.එස්. (UBS) විසින් ක්‍රෙඩිට් ස්විස් ආයතනය පසුව පවරා ගන්නා ලද අතර ස්විස් ජාතික බැංකුව සහ ස්විට්සර්ලන්ත රජය විසින් එම ගනුදෙනුව කඩිනම් කරන ලදී. තවද, පවතින බැංකු අර්බුදය හේතුවෙන් දියුණු ආර්ථිකයන් තුළ වෙළඳපොළ කැළඹීමක් ඇති කළ අතර, එක්සත් ජනපදයේ සහ යුරෝපීය බැංකු

අංශයේ කොටස්වල වටිනාකම් මත සැලකිය යුතු අලාභයක් ඇති කර තිබේ. මේ අතර, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව, කැනඩාවේ මහ බැංකුව, එංගලන්ත මහ බැංකුව, ජපාන මහ බැංකුව, යුරෝපීය මහ බැංකුව සහ ස්විස් ජාතික බැංකුව ගෝලීය මූල්‍ය පද්ධතියේ ද්‍රවශීලතා ගැටලු වළක්වා ගැනීම සඳහා 'ස්ථාවර එක්සත් ජනපද ඩොලර් ද්‍රවශීලතා විදේශ විනිමය හුවමාරු පහසුකම්' හරහා ද්‍රවශීලතා සැපයීම වැඩි කිරීම සඳහා සහයෝගීතා ක්‍රියාමාර්ගයක් 2023 වසරේ මාර්තු මාසයේ දී නිවේදනය කළහ. එසේ වුවද, ගෝලීය බැංකු ආයතනවල වර්තමානයේ පවතින ආතතීන් සහ ඒ ආශ්‍රිතව අනෙකුත් අංශ වෙත සිදුවන බලපෑම්, ආර්ථික දැක්මට සැලකිය යුතු අවදානම් ඇති කිරීමේ මූලාශ්‍රයක් බවට පත්විය හැකි අතර, ඒ හේතුවෙන් නැඟී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ට ද බලපෑම් ඇති විය හැකිය. එපමණක් නොව, මෙම තත්ත්වය මත ප්‍රධාන මහ බැංකුවලට ඔවුන්ගේ ප්‍රතිපත්ති දිශානතිය හෝ අනාගත ප්‍රතිපත්ති අනුපාතික ගැළපීම්වල වේගය ගැන නැවත සිතා බැලීමට සිදුවන හෙයින්, මෙම මූල්‍ය කැළඹීම ගෝලීය වශයෙන් අපේක්ෂිත දැඩි මූල්‍ය තත්ත්වයන්ගෙන් අපගමනය වීමට හේතු විය හැක. මේ අතර, මූල්‍ය අර්බුදය විසඳීම සඳහා විශාල ද්‍රවශීලතා ප්‍රතිපාදන සැපයීම තුළින් ඉල්ලුම් පීඩන ඉදිරියේ දී වර්ධනය විය හැකි අතර, එය ලොව පුරා විශාල වශයෙන් අපේක්ෂා කෙරෙන නිර්-උද්ධමන ප්‍රවණතාවයට තර්ජනයක් විය හැක.

සමස්තයක් ලෙස ගෝලීය ආර්ථිකයේ ඉදිරි දැක්මට ඇති අවදානම් තුළින් ගෝලීය වර්ධනය අපේක්ෂිත මට්ටමට වඩා අඩු විය හැකි අතර, උද්ධමනය වඩා ඉහළ මට්ටමක් දක්වා වැඩි විය හැකි බව පිළිබිඹු කරයි. ධනාත්මක අවදානම් සැලකීමේ දී, විශේෂයෙන්ම වසංගතය ආශ්‍රිත රාජ්‍ය මූල්‍ය ආධාර මෙන්ම අතිශය දැඩි ශ්‍රම වෙළඳපොළ සහ ඉහළ වැටුප් වර්ධනයන්හි දායකත්වයෙන් ඉහළ ගිය අතිරික්ත පුද්ගලික ඉතුරුම් මගින් සිදුවිය හැකි ඉල්ලුම ඉහළ යෑම තුළින් පරිභෝජනය වැඩි වීමට ඉඩ ප්‍රස්ථා පවතී. තවද, දියුණු ආර්ථිකයන්හි ශ්‍රම වෙළඳපොළ තත්ත්වයන් ලිහිල් වීම, වැටුප් හා බැඳුණු උද්ධමනය අඩු වීම සහ භාණ්ඩ මිලෙහි තියුණු පහත වැටීම හේතුවෙන් වේගවත් නිර්-උද්ධමනය තවත් හිතකර ප්‍රතිඵලයකි. කෙසේ වෙතත්, බොහෝ ඍණාත්මක අවදානම් 2023 වසරේ දී ගෝලීය ඉදිරි දැක්මට බලපෑ හැකිය. කොවිඩ්-19 වසංගතයේ දිගු කාලීන බලපෑම් සහ උත්සන්න වෙමින් පවතින දේපළ වෙළඳාම් අර්බුදය මධ්‍යයේ චීන ආර්ථිකයේ යථා තත්ත්වයට පත්වීම මන්දගාමී වීම ලොව පුරා ඉල්ලුම් ආශ්‍රිත සහ සැපයුම් දාම ආශ්‍රිත ගැටලු ඇති කරමින් සෙසු රටවලට අහිතකර ලෙස බලපෑ හැක. රුසියානු-යුක්‍රේන යුද්ධය තවත් උත්සන්න වීම තුළින් බලශක්ති සහ ආහාර මිල මට්ටම් තවදුරටත් ඉහළ යා හැකි බැවින්, විශේෂයෙන් ම යුරෝපය සහ අඩු ආදායම්ලාභී රටවල් සඳහා ඉහළ අවදානම් තත්ත්වයක් ඇති කරයි. මේ වන විට ණය ගැටලුවක සිටින හෝ එවැනි ගැටලුවක් ඇති වීමේ අවදානමක පවතින රටවල් සංඛ්‍යාව වැඩිවෙමින් පවතී. මෙම ගැටලුව ඇතුළුව අඩු ආර්ථික වර්ධනය හා ඉහළ ණය පිරිවැය මෙම ආර්ථිකයන්ගේ අවදානම් තත්ත්වය වඩා තීව්‍ර කළ හැකි අතර එමගින් ගෝලීය ඉදිරි දැක්මට බලපෑම් සිදුකළ හැක. මේ අතර, ශ්‍රම වෙළඳපොළෙහි පවත්නා අබණ්ඩ දැඩි තත්ත්වයන් සහ යුක්‍රේනයේ පවතින යුද්ධය මෙන්ම චීන ආර්ථිකය අපේක්ෂිත මට්ටමට වඩා වේගයෙන් නැවත යථා තත්ත්වයට පත්වීමේ හැකියාව තුළින් ගෝලීය උද්ධමනය නැවතත් ඉතා ඉහළ මට්ටම් දක්වා වැඩි වීමට හා උද්ධමන අපේක්ෂාවන් පාලනයෙන් ඔබ්බට යාමට ද හේතු විය හැක. තවද, මූල්‍ය තත්ත්වයන් නිසි කලට ප්‍රථම ලිහිල් කිරීම සහ ඒ ආශ්‍රිත මූල්‍ය වෙළඳපොළ අස්ථාවරත්වයන් මෙන්ම භූ දේශපාලනික බෙදීම් වැඩි වීම ගෝලීය ආර්ථිකයේ ඉදිරි දැක්මට ඇති අනෙකුත් ඍණාත්මක අවදානම් ලෙස පවතී. මීට අමතරව, ගෝලීය බැංකු පද්ධතියේ දැනට පවතින අර්බුදකාරී තත්ත්වයන් සහ එයින් සිදු විය හැකි බලපෑම්, ගෝලීය ආර්ථික වර්ධනයේ ඉදිරි දැක්මට සහ මූල්‍ය තත්ත්වයන්ට පවතින ප්‍රධාන අවදානම් මූලාශ්‍රයක් වේ.

1.4 සාර්ව ආර්ථික දැක්ම[3]

ශ්‍රී ලංකා ආර්ථිකයේ මැදි කාලීන ඉදිරි දැක්ම බොහෝ දුරට ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළෙහි දක්වා ඇති සාර්ව ආර්ථික ගැළපුම් වැඩසටහනේ කාර්යසාධන නිර්ණායක සහ ව්‍යුහාත්මක මිනුම් දඩු මෙන්ම ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිත කරුණු, නිසි කලට හා ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම මත රඳා පවතියි. ඉදිරි කාලය තුළ හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ කාලෝචිත හා

3 මෙම කොටසේ ඉදිරිපත් කර ඇති මැදි කාලීන සාර්ව ආර්ථික රාමුව 2023 සැප්තැම්බර් මාසය අවසන් වීමට පෙර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම ඇතුළුව ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දක්වන වැඩසටහන සාර්ථකව ඉදිරියට ගෙන යෑමේ සහ එමගින් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් තවදුරටත් මූල්‍ය සහාය ලැබීමේ උපකල්පනය ඇතුළත් ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළ මත පදනම් වී ඇත. විවිධ කාල පරාසවල තොරතුරු සහ ඒ සඳහා හේතු වූ උපකල්පන මත පදනම්ව ජාත්‍යන්තර මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකාව පිළිබඳ ප්‍රකාශයට පත් කරනු ලැබූ මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන මෙයින් වෙනස්විය හැකි බව සඳහන් කළ යුතුය.

1

1.5 සංඛ්‍යා සටහන

මැදි කාලීන සාර්ව ආර්ථික රාමුව (අ)

දර්ශකය	ඒකකය	2021 (අා)	2022 (ඇ)	2023	2024	2025	2026	2027
මූර්ත අංශය (ආ)								
මූර්ත ද.දේ.නි. වර්ධනය	සියයට	3.5 (ඇ)	-7.8	-2.0	3.3	4.0	4.5	5.0
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි.	රුපියල් ට්‍රිලියන	17.6 (ඇ)	24.1	28.5	31.0	33.8	37.1	40.9
ඒක පුද්ගල ද.දේ.නි.	එ.ජ. ඩොලර්	3,997 (ඇ)	3,474	3,489	3,621	3,811	4,030	4,281
මුළු ආයෝජන	ද.දේ.නි.යේ % වශයෙන්	36.7 (ඇ)	34.4	34.9	35.4	35.9	36.4	36.9
දේශීය ඉතුරුම්	ද.දේ.නි.යේ % වශයෙන්	29.4 (ඇ)	30.8	30.9	30.8	32.0	33.0	33.8
ජාතික ඉතුරුම්	ද.දේ.නි.යේ % වශයෙන්	33.0 (ඇ)	33.1	33.8	34.1	34.6	35.3	36.0
විදේශීය අංශය (ඈ)								
වෙළඳ ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-9.2	-6.7	-6.9	-7.4	-6.7	-6.1	-5.9
අපනයන	එ.ජ. ඩොලර් බිලියන	12.5	13.1	14.1	15.5	17.1	18.8	20.2
ආනයන	එ.ජ. ඩොලර් බිලියන	20.6	18.3	19.4	21.6	22.9	24.4	26.0
ජංගම ගිණුමේ ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-3.7	-1.9	-1.1	-1.3	-1.2	-1.1	-0.9
විදේශීය නිල සංචිත	ආනයනික මාස වශයෙන්	1.8	1.2	3.0	3.4	3.8	4.2	4.5
රාජ්‍ය මූල්‍ය අංශය (ඈ) (ඉ)								
සමස්ත ආදායම සහ ප්‍රදාන	ද.දේ.නි.යේ % වශයෙන්	8.3	8.3	11.0	13.3	14.9	15.0	15.1
වියදම හා ශුද්ධ ණය දීම්	ද.දේ.නි.යේ % වශයෙන්	20.0	18.5	19.0	19.7	19.9	19.9	19.6
වර්තන ගිණුමේ ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-7.3	-6.4	-4.5	-2.1	-0.7	-0.4	0.0
ප්‍රාථමික ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-5.7	-3.7	-0.7	0.8	2.3	2.3	2.3
සමස්ත අයවැය හිඟය	ද.දේ.නි.යේ % වශයෙන්	-11.7	-10.2	-8.0	-6.4	-5.0	-4.8	-4.5
මධ්‍යම රජයේ ණය	ද.දේ.නි.යේ % වශයෙන්	100.1	113.8	100.0	101.6	103.3	102.2	97.6
මුදල් අංශය සහ උද්ධමනය								
පුළුල් මුදල් වර්ධනය (M_{2b}) (ඊ)	සියයට	13.2	15.4	10.5	10.9	10.8	10.7	10.2
පෞද්ගලික අංශයට ලබාදුන් ණය වර්ධනය (M_{2b} හි) (ඊ)	සියයට	13.1	6.2	0.9	8.5	9.5	10.5	10.5
වාර්ෂික සාමාන්‍ය උද්ධමනය	සියයට	6.0 (උ)	46.4 (උ)	20.6 (උආ)	5.0 (උආ)	5.0 (උආ)	5.0 (උආ)	5.0 (උආ)

(අ) 2023 මාර්තු මස අවසානය වන විට පැවති තොරතුරු මත පදනම් වී ඇත.
(අා) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 මාර්තු මාසයේ දී නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) උපයෝගී කොටගෙන ඇත.
(ඉ) ජා.මූ. අරමුදලෙහි පුරෝකථනයන් (ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ උපකල්පන සහිතව)
(ඊ) වසර අවසානයේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය
(උ) කොා.පා.මී. දර්ශකය (2013 = 100) මත පදනම් වේ.
(උආ) කොා.පා.මී. දර්ශකය (2021 = 100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

ස්ථාවර ආකාරයකින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, අනපේක්ෂිත විදේශීය හා දේශීය කම්පනවලින් සාර්ව ආර්ථික දැක්මෙහි මූලිකව අපේක්ෂිත තත්ත්වය සාක්ෂාත් කර ගැනීමට බලපෑමක් ඇති විය හැකිය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පසුගිය කාලසීමාව තුළ ප්‍රකාශයට පත් කරන ලද මැදි කාලීන සාර්ව ආර්ථික දැක්ම මගින් ව්‍යුහාත්මක අවහිරතාවලට විසඳුම් ලබා දීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම උපකල්පනය කර ඇත. කෙසේ වෙතත්, අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ අසාර්ථකත්වය හේතුවෙන් පෙර අපේක්ෂා කළ හිතකර සාර්ව ආර්ථික දැක්ම සාක්ෂාත් කර ගැනීම ප්‍රමාද වී ඇත. නිදහසින් පසු ශ්‍රී ලංකාව සිය ආර්ථික ගමන්මග තුළ තීරණාත්මක අවධියක් කරා ළඟා වී ඇති බැවින්, දිගු කාලයක් පුරා සිදු නොවී ප්‍රමාද වී ඇති ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සඳහා වන ප්‍රතිපත්තිමය කැපවීම සහ එවැනි වැදගත් ප්‍රතිසංස්කරණ සඳහා මහජන සහයෝගය ඉදිරි කාලය තුළ ලැබෙනු ඇතැයි දැනට හේතු සහගත අපේක්ෂාවක් ඇත. කෙසේ වෙතත්, ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ දැනට සිදු කරන සාකච්ඡා අවසන් කිරීමට ගත වන කාලය, ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු අවධිය තුළ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ වේගය සහ ප්‍රමාණය, ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දැක්වෙන වැඩසටහනේ ඉලක්ක සාර්ථකව නිම කිරීම යනාදිය සම්බන්ධයෙන් ඇති විය හැකි අවදානම් හේතුවෙන් අපේක්ෂිත මැදි කාලීන ඉදිරි දැක්ම අවිනිශ්චිතතාවලින් සමන්විත වේ. මේ දක්වා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ සැලකිය යුතු ප්‍රගතියක් අත් කරගෙන ඇත. මැදි හා

දිගු කාලීන ස්ථායීතාව තිරසාර ලෙස සහතික කිරීම සඳහා ඉදිරි කාලසීමාව තුළ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස ප්‍රතිපත්ති සම්පාදකයන් සතු අධිෂ්ඨානය සහ නුදුරු කාලීනව දුෂ්කර ප්‍රතිසංස්කරණ අනුගමනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ මහජනතාවගේ අවබෝධය අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකා ආර්ථිකය 2022 වසරේ දී මුහුණ දුන් එහි දරුණුතම ආර්ථික පසුබෑමෙන් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමට වෙර දරමින් පසුවේ. සාර්ව ආර්ථික ස්ථායීතාවය හා ණය තිරසාරත්වය යළි තහවුරු කිරීම, මූල්‍ය පද්ධති ස්ථායීතාව ආරක්ෂා කිරීම, යහපාලනය ශක්තිමත් කිරීම මෙන්ම, ආර්ථිකයේ වර්ධන විභවතාවන් උපයෝජනය කර ගැනීම සිදු කරන අතර, ජනගහනයේ දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක්විය හැකි කාණ්ඩ මත ආර්ථික අර්බුදයේ අහිතකර බලපෑම් අවම කිරීම ඉලක්කකොටගත් ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ වන සාර්ව ආර්ථික ගැළපුම් මගින් ආර්ථිකයේ මෙම යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය සැලසෙනු ඇත. මේ අතර, රජය සහ මහ බැංකුව විසින් ස්ථායීකරණ ක්‍රියාමාර්ග ගණනාවක් ආරම්භයේ දී ම ක්‍රියාවට නැංවීම ඉල්ලුම් පීඩන පාලනය කිරීම සඳහා මෙන්ම, අඛණ්ඩව ඉහළ ගිය උද්ධමනය හා විනිමය අනුපාතික අවප්‍රමාණය වීම පාලනය කර ගැනීම සඳහා උපකාරී වූ අතර, එමගින් ආර්ථිකයේ තවදුරටත් සිදු විය හැකිව තිබූ පිරිහීම කිසියම් දුරකට වළක්වා ගැනීමට හැකිවිය. මෙම වර්ධනයන් සමඟ දේශීය සැපයුම් අංශයේ වර්ධනයන් සහ විදේශ විනිමය ද්‍රවශීලතා පීඩන ලිහිල් වීම නුදුරු කාලයේ දී ආර්ථික ක්‍රියාකාරකම් ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්වීම සඳහා විශාල සහායක් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, දැඩි මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මෙන්ම, ගෙවුම් ශේෂයට අදාළ ගැටලු මගින් 2023 වසරේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ වේගය මන්දගාමී විය හැක. 2023 වසරේ ගෝලීය ආර්ථිකයේ සියළුම අංශවල වර්ධනය මන්දගාමී වීම සහ ක්‍රමයෙන් වර්ධනය වන මූල්‍ය වෙළඳපොළ ආතතීන් මගින් පැන නඟින ගෝලීය බාධක සඳහා ද ආර්ථිකයට මුහුණ දීමට සිදුවනු ඇති අතර, එම බලපෑම් මගින් රටේ වෙළඳ විභාවතාවට බාධා ඇතිවීම මෙන්ම, අපේක්ෂිත විදේශ විනිමය ලැබීම් හා විදේශ ආයෝජන අධෛර්යවත් විම සිදු වනු ඇත. කෙසේ වෙතත්, 2023 මාර්තු මාසයේ දී ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ අනුමැතිය හිමිවීම සහ දැනට ක්‍රියාත්මක ණය ප්‍රතිව්‍යුහගතකරණ ප්‍රයත්නයන් සමඟ ආර්ථිකය පිළිබඳ ඉහළ ගිය ජනතා විශ්වාසය, සහ එහි ප්‍රතිඵලයක් ලෙස සාර්ව ආර්ථික තත්ත්වයන් ස්ථාවර වීම 2023 වසර අග භාගයේ දී ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම වේගවත් වීමට සහාය සලසනු ඇත. මැදි කාලීනව ආර්ථිකයේ වර්ධන මාවත ඉහළ විභව මට්ටමක් කරා ගෙන යෑම, ජා. මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දැක්වෙන වැඩසටහන යටතේ යෝජිත සැලසුම්ගත වර්ධනය ඉහළ නැංවීමේ උපායමාර්ග ක්‍රියාවට නැංවීම මත පදනම් වනු ඇතැයි අපේක්ෂිතය. තවද, රජය සතු වාණිජ ව්‍යවසායයන්වල ආයතනික ප්‍රතිසංස්කරණ, පොදු උපයෝගීතා සැපයීම් සඳහා පිරිවැය ආවරණය කෙරෙන මිල යාන්ත්‍රණ ක්‍රියාවට නැංවීම හා සමගාමීව රාජ්‍ය ආදායම් ඉපයීම් මත මූලිකව පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකග්‍රතා උපායමාර්ගය මගින් ඉදිරි කාල සීමාව තුළ රාජ්‍ය මූල්‍ය එකාග්‍රතාවයට සහාය සැලසෙන අතර, ආර්ථික ස්ථාවරත්වය ද ශක්තිමත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, විස්තීර්ණ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියක් හරහා ණයෙහි තිරසාරත්වය යළි ස්ථාපනය වීම මගින් විදේශීය මූල්‍යන අවස්ථා සඳහා ඉඩ ප්‍රස්ථාවක්, ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු වූ පසුව නිර්මාණය කරනු ඇතැයි අපේක්ෂිත අතර, වෙනත් විදේශීය මූල්‍ය ආයතනවලින් අපේක්ෂිත සැලකිය යුතු මට්ටමේ මූල්‍ය සහාය මගින් ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී ආයෝජක විශ්වාසය ශක්තිමත් කෙරෙනු ඇත. උද්ධමනයෙහි පුරෝකථනය කරන ලද ස්ථායීකරණය සමඟ මැදි කාලීනව ආයෝජන සඳහා හිතකර පරිසරයක් නිර්මාණය වනු ඇති අතර, විනිමය අනුපාතයේ ඉහළ නම්‍යශීලීභාවය හරහා ඉදිරි කාල සීමාව තුළ දී විදේශීය අංශයේ ස්ථාවරභාවය සහ ආර්ථිකයේ වෙළඳ තරගකාරීත්වය වැඩි දියුණු වනු ඇතැයි අපේක්ෂිතය. කෙසේ වෙතත්, අපේක්ෂිත මට්ටමට වඩා අඩු විදේශීය ඉල්ලුම සහ ගෝලීය සැපයුම් දාම ආශ්‍රිත ගැටලු අඛණ්ඩව පැවතීම හමුවේ ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වය සාමාන්‍ය තත්ත්වයට පත්වීම ප්‍රමාද වීමේ අවදානමක් පවතී. කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම සහ ප්‍රමාණවත් මූල්‍ය වෙන් කිරීම් සිදු කරමින් සමාජ ආරක්ෂණ ජාල ක්‍රියාවට නැංවීම හරහා ආර්ථික කම්පන හමුවේ පුද්ගලයන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැංවෙන අතර, ඔවුන්ට ආර්ථික සවිබලගැන්වීම සඳහා හා තිරසාර සංවර්ධනය සඳහා අවස්ථා නිර්මාණය කරමින්, මැදි කාලීනව සැමට ප්‍රතිලාභ හිමිවන ආර්ථික වර්ධනයක් ප්‍රවර්ධනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. කාලයක් මුළුල්ලේ ක්‍රියාත්මක කර නොමැති ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සඳහා රජය ප්‍රමුඛ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අප්‍රතිහත කැපවීම මත ආර්ථිකයේ යථා තත්ත්වයට පත්වීම සහ වර්ධනය වීම රඳා පවතින

1

අතර, ආර්ථිකයේ විභවතාව ළඟා කර ගැනීම සහ ජනගහනයේ සියලුම කාණ්ඩවලට වර්ධනයේ ප්‍රතිලාභ තිරසාරව හා සමානව බෙදී යෑම සඳහා මග පැදීමේ දී, ප්‍රතිපත්තිවල අඛණ්ඩතාව සහ නිශ්චිතභාවය වඩාත් තීරණාත්මක වනු ඇත.

දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය තත්ත්ව හේතුවෙන් සමස්ත ඉල්ලුම අඩුවීම, ගෝලීය හා දේශීය වශයෙන් ඇති වූ සැපයුම් අවහිරතා යථා තත්ත්වයට පත්වීම මෙන්ම හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑමේ සහාය ඇතිව 2023 වසරේ දී උද්ධමනය ශීඝ්‍රයෙන් පහළ ගොස් මැදි කාලීනව අපේක්ෂිත ඉලක්කගත මට්ටම්වල ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්තිය මගින් පෞද්ගලික අංශය වෙත ලබා දෙන ණය ප්‍රමාණයෙහි වර්ධනය සීමා වී, එමගින් ඉල්ලුම් පීඩන අඩු වනු ඇති අතර, රජය විසින් ක්‍රියාත්මක කරන ලද, ආදායම මත පදනම් වූ දැඩි රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග හේතුවෙන් ඉදිරියේ දී මහජනතාවගේ වියදම් කිරීමේ හැකියාව සැලකිය යුතු ලෙස අඩු විය හැක. මේ අතර, පොහොර සහ ඉන්ධන සැපයුම වර්ධනය වීම හේතුවෙන් සැපයුම් සම්බන්ධ අවහිරතා අඩු වනු ඇත. ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම ඉදිරියටත් සිදු වුවහොත්, ඉදිරියේ දී මිල පීඩන අඩුවීමට එම කරුණ ද දායක වනු ඇත. මෙම සාධක සහ හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම, කෙටි කාලීනව උද්ධමනය සැලකිය යුතු ලෙස අඩු වීමට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෑත කාලීන විදුලි ගාස්තු සංශෝධනවල වක්‍ර බලපෑම් මෙම නිර්-උද්ධමන ක්‍රියාවලිය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි වුවද, මහජනතාවගේ වියදම් කිරීමේ හැකියාව අඩු වීම සහ මිල සූත්‍ර මත පදනම්ව ඉන්ධන හා ගෑස් මිල පහළ දැමීම් මගින් එවැනි අහිතකර උද්ධමන පීඩන බොහෝ දුරට සමනය විය හැකිය. ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමත් සමඟ, ජා.මු. අරමුදල සහ අනෙකුත් බහුපාර්ශ්වික ආයතන මගින් සපයන ලද අරමුදල්වල සහාය ඇතිව අත්‍යවශ්‍ය අවශ්‍යතා සඳහා ප්‍රමුඛත්වය දෙමින් දැනට පවතින ආනයන සීමා ක්‍රමානුකූලව ලිහිල් කිරීමට හැකිවනු ඇති අතර, එමගින් සැපයුම් අවහිරතා තවදුරටත් අඩු වනු ඇත. කෙසේ වෙතත්, එවැනි ලිහිල් කිරීමකින් අනතුරුව විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ හැකියාවක් පැවතීම ආර්ථිකයේ පොදු මිල මට්ටම් කෙරෙහි ඉක්මනින් බලපෑ හැකි බැවින්, එබඳු තත්ත්ව ප්‍රවේශමෙන් කළමනාකරණය කළ යුතුය. මේ අතර, යෝජිත මහ බැංකු පනත බලාත්මක කිරීම මගින් මහ බැංකුවට වැඩි ස්වාධීනත්වයක් ලබා දෙමින්, මහ බැංකුව හරහා සිදු කරන රාජ්‍ය මූල්‍යනය සීමා කිරීමටත්, ඒ තුළින් උද්ධමනය හා උද්ධමන අපේක්ෂා කළමනාකරණය කිරීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති ශක්තිමත් කිරීමටත් ඉඩ සැලසෙනු ඇත. මෑත කාලීන ගෝලීය මූල්‍ය අර්බුදය සහ පවතින රුසියානු-යුක්‍රේන යුද්ධයේ දිශානතිය සහ බලපෑම බොහෝ දුරට අවිනිශ්චිත තත්ත්වයක පැවතිය ද, ගෝලීය සැපයුම් තත්ත්වයන් මැදි කාලීනව සාමාන්‍ය තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය ආහාර හා බලශක්ති මිල ගණන්වල සිදුවිය හැකි ඉහළ යෑම් මගින් ශ්‍රී ලංකාවේ නිර්-උද්ධමන ක්‍රියාවලිය මන්දගාමී විය හැකිය. ගෝලීය මූල්‍ය තත්ත්වයන්හි අස්ථාවරත්වය ගෝලීය මුදල් ප්‍රතිපත්තියේ ක්‍රියාකාරිත්වයට යම් ප්‍රමාණයකට බලපෑ හැකි වුවද, ලෝකයේ බොහෝ ප්‍රධාන මහ බැංකු විසින් උද්ධමන පීඩන මැඩපැවැත්වීම සඳහා 2023 වසර තුළ මෙන්ම ඇතැම්විට 2024 වසරේ මුල් කාලයේ දී ද දැඩි මුදල් තත්ත්ව පවත්වාගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ. පවතින ඉහළ උද්ධමනය 2023 වසර අවසාන භාගයේ දී තනි ඉලක්කමක මට්ටමට ගෙන ඒමට මහ බැංකුව කැපවී සිටී. කෙසේ වෙතත්, රාජ්‍ය මූල්‍ය හා විදේශීය ස්වාරක්ෂක තිරසාර ලෙස ශක්තිමත් කිරීමේ ප්‍රයත්න සමඟින් ජා. මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දක්වෙන වැඩසටහන සාර්ථකව අඛණ්ඩව පවත්වාගෙන යෑම මෙන්ම ආර්ථික විභවයන් වැඩිදියුණු කිරීම සඳහා යෝජිත ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මැදි කාලීනව ආර්ථික හා මිල ස්ථායීතාව සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වනු ඇත.

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ ප්‍රතිපත්ති රාමුව යටතේ ආර්ථික වර්ධනය එහි විභව මට්ටමෙහි ස්ථායී කිරීම සඳහා නිසි අවධානය යොමු කරමින් මුදල් ප්‍රතිපත්තිය මැදි කාලීනව මිල ස්ථායීතාව සහතික කිරීම සඳහා අඛණ්ඩව අවධානය යොමු කරනු ඇත. හිතකර උද්ධමන ඉදිරි දැක්ම, වැඩිදියුණු වන දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්ව සහ නුදුරේ දී ම නිවේදනය කිරීමට අපේක්ෂිත රජයේ සමස්ත ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය හා දේශීය ණය ප්‍රශස්තකරණය පිළිබඳ 2023 මාර්තු 30 වැනි දින සිදු කළ නිවේදනයෙන් අනතුරුව දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ අවිනිශ්චිතතා බොහෝ දුරට සමනය වීමෙන් පසු රජයේ සුරැකුම්පත් හා සම්බන්ධ අවදානම් පහළ යෑම යන කරුණුවල සහාය ලබමින්, රජයේ සුරැකුම්පත්, විශේෂයෙන්ම භාණ්ඩාගාර බිල්පත් මෙන්ම, තැන්පතු සහ ණය උපකරණවලට අදාළ වෙළඳපොළ පොලී අනුපාතික ඉදිරි කාලය තුළ දී පහළ යනු ඇතැයි අපේක්ෂා

විශේෂ සටහන 3

'ශ්‍රී ලංකා මහ බැංකු පනතේ' විශේෂ කරුණු

පසුබිම

ස්ථායීකරණය සහ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් බහුවිධ අරමුණු සහිතව, 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ ලංකා මහ බැංකුව 1950 වසරේ දී පිහිටුවන ලදී (එහි නාමය 1985 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව ලෙස වෙනස් කරන ලදී). *එක්ස්ටර් වාර්තාවේ* නිර්දේශ මත මුදල් නීති පනත කෙටුම්පත් කර ඇත. කෙසේ වෙතත්, එකිනෙකට නොගැළපෙන බහුවිධ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී ඇති වන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් මහ බැංකුකරණයේ ප්‍රවණතාවලට අනුකූලව, 2000 දශකයේ මුල් භාගයේ දී මහ බැංකුව විසින් නවීකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, මහ බැංකුවේ අරමුණු ප්‍රධාන අරමුණු දෙකක්, එනම් ආර්ථික සහ මිල ස්ථායීතාවය පවත්වා ගැනීම හා මූල්‍ය පද්ධති ස්ථායීතාවය පවත්වා ගැනීම ලෙසින් විධිමත් කරන ලදී.

නව මහ බැංකු පනතක අවශ්‍යතාවය

ඉහත සඳහන් කළ පරිදි ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ අරමුණු විධිමත් කරමින් 2002 වසරේ සිදු කළ සංශෝධන හැරුණු විට, පසුගිය වසර 74 තුළ මුදල් නීති පනත පුළුල් ලෙස සමාලෝචනය කරමින් සශෝධනය කර නොමැත. එබැවින්, ආර්ථික ප්‍රවණතා සහ මහ බැංකුකරණයේ විකාශනය මධ්‍යයේ, මුදල් නීති පනතෙහි විධිවිධාන කිහිපයක් ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන්ට අනුකූලව නැවත සමාලෝචනය කිරීම සහ සංශෝධන කිරීම අවශ්‍ය විය. මෙමගින්, ශ්‍රී ලංකාවේ මිල ස්ථායීතාව තිරසාර ලෙස සහතික කිරීම සඳහා මහ බැංකුවේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම, විනිවිදභාවය හා වගවීම වැඩිදියුණු කිරීම සහ මුදල් ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීමට අදාළ විධිවිධාන ඇතුළත් කරමින් ශ්‍රී ලංකා මහ බැංකු පනත කෙටුම්පත් කිරීමට අවස්ථාව සැලසිණි. මේ අතර, මහ බැංකු පනත මගින් මූල්‍ය අංශය හා සාර්ව විවක්ෂණ අධීක්ෂණය ශක්තිමත් කිරීමට සහ මහ බැංකුවේ පාලනය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. මුදල් නීති පනත සඳහා සිදු කළ සංශෝධන සහ ඉන් අනතුරුව කෙටුම්පත් කළ මහ බැංකු පනත, මහ බැංකුකරණය සම්බන්ධයෙන් ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන්ට අනුකූලවනු ඇති බවත් මුදල් නීති පනතෙහි පවතින දුර්වලතා මග හරිනු ඇති බවත් අපේක්ෂා කෙරේ.

මහ බැංකු පනතෙහි ප්‍රධාන ලක්ෂණ

මුදල් නීති පනත හා සසඳන විට මහ බැංකු පනත තුළ ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ අරමුණු සහ මුදල් ප්‍රතිපත්ති රාමුව, මහ බැංකුවෙහි ආයතනික ව්‍යූහය හා පාලනය, මහ බැංකුව සාර්ව විවක්ෂණ අධිකාරිය ලෙස පිළිගැනීම මෙන්ම පාර්ලිමේන්තුව, රජය හා මහජනතාව සඳහා වන මහ බැංකුවේ වගවීම යන ප්‍රධාන ක්ෂේත්‍රවල වැදගත් සංශෝධන කිහිපයක් ඇතුළත් වේ.

ප්‍රධාන අරමුණ ලෙස දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම

මුදල් නීති පනතට අනුව සමාන වැදගත්කමක් ඇති මහ බැංකුවේ ප්‍රධාන අරමුණු දෙකට සාපේක්ෂව, මහ බැංකු පනත මගින් දේශීය මිල ස්ථායීතාව සාක්ෂාත් කර ගැනීම සහ පවත්වා ගැනීම සඳහා ප්‍රමුඛතාව ලබා දෙයි. මෙමගින් අනාගතයේ දී අඩු සහ ස්ථායී උද්ධමනයක් පවත්වා ගැනීමට මහ බැංකුව කැපවී සිටින බව සහතික කෙරේ. උද්ධමනය පහළ මට්ටමක පවතින විට සහ ඉදිරියේ දී උද්ධමනය අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කරන විට ආර්ථිකය මනාව ක්‍රියාත්මක වන බව පසුගිය අත්දැකීම් මගින් පෙන්වා දී ඇත. පොලී අනුපාතික ස්ථායී මට්ටමක පවත්වා ගැනීම සඳහා අඩු සහ ස්ථායී උද්ධමනය උපකාරී වේ. එවැනි පරිසරයක් තුළ ආර්ථිකයට එහි වර්ධන විභවතාව සාක්ෂාත් කර ගැනීමට අවස්ථාව සැලසේ. තවද, සිය ප්‍රධාන අරමුණ සාක්ෂාත් කර ගැනීමේ දී මහ බැංකුව, ආර්ථිකය එහි විභව මට්ටම කරා ස්ථායී කිරීම පිළිබඳ සැලකිල්ලට ගත යුතුය. මෙම ක්‍රියාමාර්ග, මූර්ත ආර්ථිකයෙහි ක්‍රියාකාරිත්වය

රූප සටහන වි.ස. 3.1

මහ බැංකු පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනය සහ සංවිධානය



1

සඳහා වන බාධා අවම කරමින් උද්ධමනය එහි ඉලක්කගත මට්ටම වටා ස්ථාවර කිරීම අරමුණු කරගත් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූල වේ. තවද, මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව යන දෙඅංශය සම්බන්ධයෙන්ම අවධානය යොමු කිරීමට සිදු වන සහ මින් එක් අංශයක් සම්බන්ධයෙන් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ අනෙක් අංශය වෙත අහිතකර ලෙස බලපාන, එහෙත් මහ බැංකුව කුමන ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කළ යුතු ද යන්න තීරණය කළ යුතු දුලබ අවස්ථාවක දී, ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රධාන අරමුණ වන මිල ස්ථායීතාවය පවත්වා ගැනීම සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

පාලන ව්‍යුහය

මුදල් නීති පනත යටතේ, මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම මෙන්ම අනෙකුත් ප්‍රතිපත්ති සහ මෙහෙයුම් තීරණ ගැනීම සඳහා මුදල් මණ්ඩලය වෙත වගකීම පැවරේ. කෙසේ වෙතත්, මහ බැංකු පනත යටතේ, පාලක මණ්ඩලය සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වෙත සමාන්තර තීරණ ගැනීමේ බලතල පැවරී ඇති අතර දේශීය මිල ස්ථායීතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් පවත්වා ගැනීම ඇතුළුව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වෙත පවරා ඇත. මුදල් ප්‍රතිපත්තිය හැර මහ බැංකුවේ අනෙකුත් සාමාන්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීමේ වගකීම පාලක මණ්ඩලය වෙත පැවරී ඇත.

මහ බැංකු පනතට අනුව, භාණ්ඩාගාර ලේකම් තවදුරටත් මහ බැංකුවේ තීරණ ගැනීමේ මණ්ඩලයක සාමාජිකයෙකු නොවේ. කෙසේ වෙතත්, රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායීතාව පිළිබඳ ප්‍රතිපත්ති සම්බන්ධීකරණය සහතික කිරීම සඳහා සම්බන්ධීකරණ කවුන්සිලයක් පිහිටුවනු ලබන අතර භාණ්ඩාගාර ලේකම් එම සම්බන්ධීකරණ කවුන්සිලයේ සාමාජිකයෙකු වනු ඇත. මහ බැංකුවේ අනෙකුත් කාර්යයන් අධීක්ෂණය කරන සහ මූල්‍ය අංශය සහ අනෙකුත් ප්‍රතිපත්ති සම්පාදනය කරන පාලක මණ්ඩලය වෙතින් මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වෙන් කිරීම සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය තුළට තාක්ෂණික දැනුම ලබාගැනීම සඳහා අභ්‍යන්තර සාමාජිකයින් දෙදෙනෙකු (නියෝජ්‍ය අධිපතිවරුන්) සහ බාහිර විශේෂඥයින් නියෝජනය කිරීම මගින් මුදල් ප්‍රතිපත්තිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයනු ලැබේ. මුදල් ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳ අවශ්‍ය දැනුම සහ ප්‍රවීණත්වය සහිත බාහිර හා අභ්‍යන්තර සාමාජිකයන් ඇතුළත් මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයක් ක්‍රියාත්මක වීම ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයකි. එසේම, ප්‍රධාන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා කැපවූ තීරණ ගැනීමේ මණ්ඩලයක් පැවතීම මගින් මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ මුල් අවස්ථාව තුළම ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වැඩිදුරටත් සාකච්ඡා කිරීමට සාමාජිකයින්ට අවස්ථාව සලසා දෙන අතර එමගින් මුදල් ප්‍රතිපත්ති සම්පාදනය ශක්තිමත් කෙරේ.

මහ බැංකුවේ ස්වාධීනත්වය සහ වගවීම වැඩිදියුණු වීම

මහ බැංකුවේ ප්‍රතිපත්ති සහ මෙහෙයුම් තීරණ ගැනීමේදී මහ බැංකුවේ ස්වාධීනත්වය සහ වගවීම ශක්තිමත් කිරීමේ පුළුල් දැක්මක් සහිතව මහ බැංකු පනතෙහි විධිවිධාන සකස් කරන ලදී. මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තුළ මෙහෙයුම් ස්වාධීනත්වය වඩාත් අවධාරණය කරනු ලබන පරිපාලන සහ මූල්‍ය ස්වාධීනත්වය සහතික කිරීම සඳහා මහ බැංකු පනත තුළ පැහැදිලි විධිවිධාන ඇත. තවද, අධිපතිවරයා, පාලක මණ්ඩලය හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වෙත පත් කරන ලද සාමාජිකයින් සහ මහ බැංකු සේවකයින්ට බාහිර බලපෑම් සිදු කිරීම මහ බැංකු පනත යටතේ පැහැදිලිවම තහනම් වේ.

මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා, මහ බැංකු පනත මගින් මහ බැංකුවේ තීරණ ගැනීමේ මණ්ඩලවල කිසිදු ආකාරයක රජයේ නියෝජනයක් නොමැත. කෙසේ වෙතත්, සම්බන්ධීකරණ කවුන්සිලය මගින් මූල්‍ය ස්ථායීතාව හෝ ආර්ථික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සැලකිය යුතු අවදානමක් ඇති කරන සිදුවීම් පිළිබඳ තොරතුරු සහ අදහස් හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීමට අපේක්ෂා කෙරේ. මේ අතර, මහ බැංකුව රජයේ මූල්‍ය උපදේශක, රාජ්‍ය මූල්‍ය නියෝජිත සහ රජයේ බැංකුකරු ලෙස තවදුරටත් ක්‍රියා කරනු ඇත. කෙසේ වෙතත්, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවෙහි සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය වන, රාජ්‍ය මූල්‍ය භිඟය මහ බැංකුව මගින් මූල්‍යනය කිරීම සීමා කිරීම සහ රජය වෙත තාවකාලික අත්තිකාරම් සැපයීම සීමා කිරීම මගින් අතීතයේ දී මුදල් ප්‍රතිපත්තිය කෙරෙහි වූ ප්‍රධාන අවහිරතාව වන මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ දී පැවති රාජ්‍ය මූල්‍ය ආධිපත්‍යය වළක්වා ඇත. ඒ අනුව, මහ බැංකුව විසින්, රජය වෙත හෝ රජය සතු ඕනෑම ආයතනයකට හෝ වෙනත් පොදු අධිකාරියක් වෙත සෘජුව හෝ වක්‍රාකාරව ණය ප්‍රදානය කිරීම සීමා කර ඇති අතර, මහ බැංකුවෙහි කටයුතු සඳහා අදාළ වන ව්‍යදම් හැර රජය වෙනුවෙන් මහ බැංකුව විසින් යම් පිරිවැයක් නොදැරිය යුතුය. එමෙන්ම, රජය විසින් හෝ රජය සතු යම් ආයතනයක් විසින් හෝ වෙනත් පොදු අධිකාරියක් විසින් නිකුත් කරන ලද සුරුකුම්පත් මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළඳපොළ වෙතින් මිලදී නොගත යුතුය.[2] කෙසේ වෙතත්, රජය වෙත සෘජු ණය ලබා දීම සීමා කිරීම සඳහා ඇතැම් කොන්දේසිවලට යටත්ව, වසර ආරම්භයේදී[3] ව්‍යදම් මූල්‍යනය සඳහා රජය වෙත තාවකාලික අත්තිකාරම් ලබා දීමට මහ බැංකු පනත මගින් අවස්ථාව සලසනු ලැබේ. රජය වෙත ලබා දුන් එවැනි තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය, පසුගිය මුදල් වර්ෂයේ පළමු මාස හතරෙහි ආදායමෙන් සියයට දහයක් නොඉක්මවිය යුතු අතර එම අත්තිකාරම් සඳහා වෙළඳපොළෙහි පවතින පොලී අනුපාතික යටතේ පොලිය අය කරනු ලැබේ.

2 පවතින රාජ්‍ය මූල්‍ය සීමා සැලකිල්ලට ගනිමින්, පනත ක්‍රියාත්මක වන දින සිට මාස හයක කාලයක් තුළ මහ බැංකුව සඳහා රාජ්‍ය සුරුකුම්පත් ප්‍රාථමික වෙළඳපොළ වෙතින් මිලදී ගැනීමට තාවකාලිකව අවසර ලබා දී ඇත.

3 මහ බැංකුව විසින් රජය වෙත ලබා දී ඇති ණය ගණනය සඳහා තාවකාලික ගැළපීමක් සිදු කරනු ඇත.

මේ අතර, මෙහෙයුම් සහ මූල්‍ය ස්වාධීනත්වය සැපයීම මගින් මහ බැංකු පනත හරහා මහ බැංකුවේ ප්‍රතිපත්ති, ප්‍රතිඵල සහ අසාර්ථකවීම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව සහ මහජනතාව වෙත වැඩි වගවීමක් සහතික කරයි. ස්වාධීන තීරණ ගැනීම වැඩිදියුණු කිරීම, වගවීම සහතික කිරීම සහ මහජන විශ්වාසය පවත්වා ගැනීම සඳහා බලතල බෙදීමක් ඇති කරන මෙන්ම කිසිදු අධිකාරියක් අවශ්‍ය ප්‍රමාණයට වඩා බලය භාවිත නොකරන බව සහතික කරන සංවරණ හා තුලන ක්‍රම (Checks & Balances), වැදගත් වේ. ඒ අනුව, ව්‍යවස්ථාපිත මහජන අනාවරණ අවශ්‍යතා, පාර්ලිමේන්තුව වෙත වරින් වර වාර්තා ඉදිරිපත් කිරීම සහ පාර්ලිමේන්තුවට හෝ එහි ඕනෑම කමිටුවකට අධිපතිවරයාගෙන් වරින්වර විමසීම් සිදු කළ හැකි වීම වැනි ක්‍රම හරහා මහ බැංකුවේ වගවීම වැඩිදියුණු කිරීම අරමුණු කරගත් විධිවිධාන මහ බැංකු පනතෙහි ඇතුළත් වේ. මේ සම්බන්ධයෙන්, මහ බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී කිසියම් අසාර්ථක වීම් ඇතිවුවහොත් ඒ සඳහා හේතු, මෑතකාලීන ආර්ථික ප්‍රවණතා සහ ඉදිරි දැක්ම පිළිබඳව සඳහන් කරමින්, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ මහ බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් වාර්තා කිහිපයක් පාර්ලිමේන්තුව සහ මහජනතාව වෙත මහ බැංකුව විසින් ඉදිරිපත් කළ යුතුය.

මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය

2015 වසරේ සිට මුදල් ඉලක්කකරණය සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය යන ක්‍රමවේද දෙකෙහිම ලක්ෂණවලින් සමන්විත මුදල් ප්‍රතිපත්ති රාමුවක් අනුගමනය කිරීමෙන් අනතුරුව, මහ බැංකුව 2020 වසරේ සිට මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කරණය අනුගමනය කළේය. කෙසේ වෙතත්, මුදල් නීති පනත යටතේ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා වන අවශ්‍යතා සඳහා පහසුකම් සලසා තිබුණ ද, මුදල් නීති පනත මගින් ශ්‍රී ලංකාවට අදාළ මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලකක්කරණය නිශ්චිත වශයෙන් හඳුනාගෙන නැත. අදාළ කොන්දේසි ද ඇතුළත්ව මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය මහ බැංකු පනත මගින් විධිමත්ව පිළිගැනේ. මෙම සැලසුම තුළ, මහ බැංකුව සහ මුදල් අමාත්‍යවරයා විසින් එක්ව උද්ධමන ඉලක්කය සහ ප්‍රධාන පරාමිතීන් ඇතුළත් මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමක් අත්සන් කළ යුතු අතර, එම ගිවිසුම අත්සන් කළ දින සිට සතියක කාලයක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කළ යුතුය. මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමට අනුව, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය මගින් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ සුදුසු මුදල් ප්‍රතිපත්තිය සහ මුදල් ප්‍රතිපත්ති උපකරණ පිළිබඳව තීරණය කළ යුතු අතර, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා එම උපකරණ සුදුසු පරිදි ගළපා ගැනීමට මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වෙත බලය ලබා දී ඇත. උද්ධමන ඉලක්කය සහ ඊට අදාළ පරාමිතීන් සෑම වසර තුනකට වරක් හෝ සුවිශේෂී තත්ත්වයන් යටතේ අවශ්‍ය පරිදි වෙනත් කාල පරාසයන් තුළ සමාලෝචනය කරනු ලැබේ. තවද, උද්ධමන ඉලක්කය සකස් කරන අවස්ථාවේ තීරණය කරන ලද උද්ධමන පරාසය තුළ අඛණ්ඩව කාර්තු දෙකක දී උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට මහ බැංකුව අපොහොසත් වුවහොත්, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, එය මහජනතාවට ද ලබා දිය යුතුය. මේ අතර, මහ බැංකු පනත යටතේ උද්ධමනයේ මෑතකාලීන ප්‍රවණතා, උද්ධමනය සඳහා හේතු වූ කරුණු සහ උද්ධමනය සඳහා වන මැදි කාලීන පුරෝකථන හා එම පුරෝකථන සඳහා ඇති ප්‍රධාන අවදානම් පැහැදිලි කරමින් සෑම මාස හයකටම වරක් මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති වාර්තාවක් ප්‍රකාශයට පත් කළ යුතුය.

මූල්‍ය ආයතන අධීක්ෂණය හා නිරාකරණය සහ සාර්ව විචක්ෂණ අධිකාරිය

මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා මූල්‍ය ආයතන නියාමනය, බලපත්‍ර ලබා දීම, ලියාපදිංචිය සහ අධීක්ෂණය මෙන්ම මූල්‍ය ආයතන නිරාකරණය සඳහා ප්‍රධාන වගකිව යුතු මූල්‍ය ආයතනය ලෙස මහ බැංකුව අඛණ්ඩව කටයුතු කරයි. තවද, සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තියට අනුකූලව මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීම සඳහා මහ බැංකු පනත මගින් මහ බැංකුව සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස පත් කර ඇත. මේ සම්බන්ධයෙන් මහ බැංකුව විසින් මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවක් පිහිටුවනු ඇති අතර, එමගින් මූල්‍ය පද්ධතියට බලපාන හඳුනාගත් පද්ධතිමය අවදානම් ඇති වීම අවම කිරීම සඳහා සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තිය පරීක්ෂා කිරීම සහ සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කරමින් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ අදාළ රාජ්‍ය ආයතනවලට නිර්දේශ නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ.[4]

රාජ්‍ය ණය කළමනාකරණය

රාජ්‍ය ණය කළමනාකරණ ආයතනයකට හෝ කාර්යාලයකට අදාළ නීතිය ක්‍රියාත්මක වූ පසු දැනට රාජ්‍ය ණය කළමනාකරණ නියෝජිතයා වශයෙන් මහ බැංකුව ඉටු කරන කාර්යය මහ බැංකු පනතට අනුව මහ බැංකුවේ විෂය පථයෙන් ඉවත් කිරීමට නියමිතය. කෙසේ වෙතත්, එතෙක් මහ බැංකුව රජයේ නියෝජිතයෙකු වශයෙන් රාජ්‍ය ණය කළමනාකරණය අඛණ්ඩව සිදු කරනු ඇත.

සාරාංශය

මහ බැංකු පනත යටතේ, දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීම යන අනිවාර්ය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මහ

4 සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස මහ බැංකුව විසින් ඉටු කරන කාර්යභාරය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා විශේෂ සටහන 10 බලන්න.

1

බැංකුව වෙත ස්වාධීන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට හැකියාව ලබා දෙමින් මහ බැංකුවේ ස්වාධීනත්වය සෑම විටම ආරක්ෂා කරනු ලැබේ. මේ අතර, ව්‍යවස්ථාදායකය සහ මහජනතාව සඳහා වගකියමින් මහ බැංකුවේ වගවීම සහ විනිවිදභාවය මහ බැංකු පනත මගින් වැඩිදුරටත් තහවුරු කෙරේ. මිල ස්ථායීතාවය සහ මහ බැංකුවේ වගවීම ඉහළ නැංවීම යන මූලික අරමුණු මගින්, ඉහළ සහ විචලනය වන උද්ධමනය සහ ඒ හා සම්බන්ධ පොලී අනුපාතිකවල සැලකිය යුතු වෙනස්වීම් මගින් වන අයහපත් බලපෑම්වලින් රට ආරක්ෂා කරන අතර තිරසාර දිගුකාලීන ආර්ථික වර්ධනයක් ඇති කරනු ලැබේ.

මූලාශ්‍ර

1. Central Bank of Sri Lanka – A Bill (7 March 2023)
2. Jegajeevan, S. (2023) *Why do we need independent and publicly accountable central bank?,* Daily FT. Available at: https://www.ft.lk/columns/Why-do-we-need-independent-and-publiclyaccountable-central-bank/4-745738. (Accessed on 10 March 2023).

කෙරේ. එසේ වුවද, උද්ධමන පීඩන ප්‍රමාණවත් සහ ස්ථායී මට්ටමකට පාලනය වන තෙක් මෙන්ම උද්ධමන අපේක්ෂා මහ බැංකුවේ උද්ධමන ඉලක්කයට අනුකූලව පාලනය වන තෙක් මුදල් තත්ත්වයන් අවශ්‍ය පරිදි දැඩිව පවතිනු ඇත. තැන්පතු පොලී අනුපාතික ඒවායේ උපරිම මට්ටමේ සිට ක්‍රමයෙන් අඩු වීමත් සමඟ බැංකු අංශයෙහි තැන්පතු වර්ධනය ඉදිරි කාලයේ දී පහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පවතින වෙළඳපොළ ණය පොලී අනුපාතික මගින් පෞද්ගලික අංශයට ලබා දෙන ණය වර්ධනය අඩු කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස නුදුරු කාලීනව සමස්ත ණය තොගය සංකෝචනය වනු ඇත. කෙසේ වෙතත්, පොලී අනුපාතිකවල අපේක්ෂිත පහළ යෑම, ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීම සහ ව්‍යාපාරික අපේක්ෂා වැඩිදියුණු වීමත් සමඟ 2023 වසරේ අග භාගයේ සිට පෞද්ගලික අංශයට ලබා දෙන ණය වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ සහ අපේක්ෂිත විදේශ මූල්‍යනයන් රජයට ලැබීම හේතුවෙන් ඉදිරි කාලය තුළ දී රජය විසින් බැංකු අංශයෙන්, විශේෂයෙන් ම මහ බැංකුවෙන්, මූල්‍යන ලබා ගැනීම සඳහා යොමු වීම අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට අමතරව, රජය සතු වාණිජ ව්‍යවසායවල සැලසුම් කර ඇති ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ ඵලදායීතා වැඩිදියුණු කිරීම් මගින් එම ආයතන රජයේ ප්‍රතිපාදන මත මෙන්ම බැංකු අංශය මත රඳා පැවතීම ක්‍රමානුකූලව අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, ඉදිරි කාලය තුළ දී බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම් ප්‍රසාරණය හිතකර මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මහ බැංකුවේ විදේශීය සංචිත නැවත ක්‍රමයෙන් වර්ධනය කරගැනීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදේශීය වත්කම් තත්ත්ව (වගකීම් ගැළපීමෙන් පසුව) වැඩිදියුණු වීම හේතුවෙන් ඉදිරි කාලයේ දී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් තත්ත්වය වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දේශීය හා ගෝලීය වශයෙන් මෑත කාලීන සහ අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රවණතා මෙන්ම පුරෝකථන මගින් සහාය ලබමින්, ඉදිරි දැක්මක් සහිතව සහ දත්ත මත පදනම් වූ ප්‍රවේශයක් තුළින් ඉදිරි කාලයේ දී ද මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වනු ඇත. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ නවතම තොරතුරු ලැබීම අනුව මහ බැංකුවේ ප්‍රතිපත්ති සහ උපායමාර්ග සඳහා කාලීන ගැළපීම් සිදු කිරීමට අපේක්ෂිතය. මිල ස්ථායීතාවය යථා තත්ත්වයට පත් කිරීම සහ ඉන් පසුව උද්ධමනය අඩු සහ ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමෙන් පොලී අනුපාතිකවල විශාල විචලන ඇති වීම අවම වනු ඇති අතර, එමගින් ආර්ථික වර්ධනයට සහාය වීමට ව්‍යාපාර කටයුතු සැලසුම් කිරීම සහ ආයෝජන සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය වනු ඇත. ඉදිරියේ දී බලාත්මක කිරීමට නියමිත මහ බැංකු පනත මගින් මහ බැංකුවේ ස්වාධීනත්වය සහ වගවීම තවදුරටත් ශක්තිමත් කෙරෙනු ඇති අතර, එමගින් එහි ප්‍රධාන අරමුණ වන මිල ස්ථායීතාව තහවුරු කෙරේ. මේ අතර, වත්මන් ආර්ථික තත්ත්වය සහ ආර්ථිකයෙහි ඉදිරි දැක්ම පිළිබඳව ඵලදායී හා විනිවිදභාවයකින් යුතු සන්නිවේදන හරහා මහ බැංකුව මහජනතාව සමඟ අඛණ්ඩව සම්බන්ධ වනු ඇත. මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිළිබඳ විනිවිදභාවය තවදුරටත් වැඩිදියුණු කරමින් ආර්ථිකයේ ඉදිරි දැක්ම පිළිබඳව මහජනතාව වඩාත් හොඳින් දැනුම්වත් කිරීම සඳහා ඉදිරි දැක්මකින් යුතු මුදල් ප්‍රතිපත්ති වාර්තාවක් මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කිරීමට ද නියමිතය.

2023 වසර සහ ඉන් ඉදිරියට විදේශීය අංශයේ ඉදිරි දැක්ම, බොහෝ දුරට ණය ප්‍රතිව්‍යුහගතකරණයේ ප්‍රගතිය, ජා.මූ. අරමුදල යටතේ වන විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දැක්වෙන වැඩසටහන අඛණ්ඩව

ක්‍රියාත්මක කිරීම සහ ගෝලීය ආර්ථික හා මූල්‍ය දැක්ම මත රඳා පවතිනු ඇත. ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම සහ ඉදිරියේ දී විදේශ වෙළඳාම සඳහා පනවා ඇති ඇතැම් සීමා ලිහිල් කිරීම මගින් වෙළඳ භාණ්ඩ ආනයනවල අපේක්ෂිත වැඩිවීමත් සමඟ, 2023 වසරේ දී වෙළඳ හිඟය යම් මට්ටමකට පුළුල් වීමට ඉඩ ඇත. 2023 වසර සඳහා වන වෙළඳ හිඟය පිළිබඳ පුරෝකථනය, එක්සත් රාජධානියේ, යුරෝපීය සංගමයේ සහ එක්සත් ජනපදයේ ඇතිවන ආර්ථික පසුබෑමක් තුළින් අඩු විය හැකි විදේශ ඉල්ලුම මගින් ද බලපෑමට ලක් විය හැක. මීට අමතරව, රුසියානු-යුක්‍රේන යුධ තත්ත්වය තවදුරටත් උත්සන්න වීමක් තුළින් ගෝලීය සැපයුම් දාමයන්ට බලපෑම් සිදු විය හැකි අතර, එමගින් ආනයන වියදම් ඉහළ යා හැකිය. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් වීම සහ 2023 වසරේ දෙවන භාගයේ දී රට තුළ උද්ධමනයේ අපේක්ෂිත අඩුවීමත් සමඟ, සංචාරක ඉපැයීම්වල පුරෝකථනය කරන ලද වැඩිවීම මෙන්ම අනෙකුත් සේවා අපනයනවල තරගකාරිත්වයේ අපේක්ෂිත ප්‍රවර්ධනයන් සමඟ සේවා ගිණුමේ අතිරික්තය 2023 වසරේ දී ඉහළ යෑමට ඉඩ ඇත. දියුණු ආර්ථිකයන්ගේ මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම නිසා ඇති විය හැකි ණය ගැනීමේ පිරිවැය ඉහළ යෑම හේතුවෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය 2023 වසරේ දී සුළු වශයෙන් පුළුල් වීමට ඉඩ ඇත. විදේශ රැකියා සඳහා පිටත්වීම් අඛණ්ඩව වැඩිවීම සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල අපේක්ෂිත ඉහළ යෑම හේතුවෙන් ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය 2023 වසරේ දී පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වෙළඳ ගිණුමේ සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟයන්හි පුළුල් වීම, සේවා සහ ද්විතීයික ආදායම් ගිණුම්වල අපේක්ෂිත ඉහළ යෑම් මගින් ආවරණය කෙරෙනු ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2023 වසරේ දී ජංගම ගිණුමේ හිඟය තරමක් පහළ මට්ටමක පවතිනු ඇත. බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික හවුල්කරුවන්ගෙන් ලැබෙන අනෙකුත් විදේශීය මූල්‍ය ප්‍රවාහ සමඟ ඇතැම් යටිතල පහසුකම් ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම, අපේක්ෂිත විදේශීය සෘජු ආයෝජන සහ කොළඹ කොටස් වෙළඳපොළ හා රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙත විදේශීය විවිධ ආයෝජන ලැබීම් සමඟ මූල්‍ය ගිණුම වෙත වන ලැබීම් 2023 වසරේ දී තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ලැබීම් මගින්, ඉදිරි කාලය තුළ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය සමඟ සම්බන්ධ වීමට අපේක්ෂා කරනු ලබන විදේශීය ආයෝජකයන්ගේ විශ්වාසය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. තවද, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ අපේක්ෂිත සාර්ථක ප්‍රගතිය මෙන්ම ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම යටතේ ඇති ආර්ථික ගැළපුම් වැඩසටහන ඔස්සේ විදේශීය අංශය නැවත මැදි කාලීනව තිරසාර මාවතකට යොමු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. අපනයනවල වර්ධනය, ආනයනවල වැඩිවීම අබිබවා යනු ඇතැයි අපේක්ෂා කරන බැවින්, වෙළඳ හිඟය මැදි කාලීනව පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ගෝලීය ආර්ථිකය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් වීම මෙන්ම ලොව පුරා පුද්ගල සංචරණය ඉහළ යෑමත් සමඟ, ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී වර්ධනය වන සංචාරක ව්‍යාපාරය එහි විභවතා මට්ටම් කරා ළඟා වීමෙන් ශ්‍රී ලංකාවට හිතකර තත්ත්වයන් ඇතිවනු ඇත. මෙය, ප්‍රවාහන සේවා ක්‍රියාකාරකම්වල අපේක්ෂිත යථා තත්ත්වයට පත් වීම සහ තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ සේවා උප අංශයේ ඉහළ වර්ධනය ද සමඟින්, සේවා ගිණුමේ අතිරික්තය ශක්තිමත් කිරීමට මැදි කාලීනව දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන හේතුවෙන් අපේක්ෂිත පරිදි පොළී ගෙවීම් අඩුවීමත් සමඟ, ඉදිරි කාලය තුළ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, විදේශ රැකියා සඳහා පිටත්වීම් ක්‍රමානුකූලව ඉහළ යෑම, සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා ඇති ඉල්ලුම ඉහළ යෑම සහ විධිමත් මාර්ග හරහා ප්‍රේෂණ ගලා ඒම යථා තත්ත්වයට පත් වීම අඛණ්ඩව සිදු වීම සමඟ, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මැදි කාලීනව ක්‍රමානුකූලව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විදේශීය ජංගම ගිණුමේ හිඟය, මැදි කාලීනව තිරසාර ලෙස පහළ මට්ටමකට ක්‍රමයෙන් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, කොළඹ වරාය නගරය, බටහිර කොළඹ බහාලුම් පර්යන්ත සහ හම්බන්තොට කාර්මික කලාපය වැනි කාර්මික කලාප සංවර්ධනය සඳහා අපේක්ෂිත ණය නොවන මූල්‍ය ප්‍රවාහ ලැබීම් හේතුවෙන් විදේශීය මූල්‍ය ප්‍රවාහ මැදි කාලීනව ශක්තිමත් වනු ඇතැයි බලාපොරොත්තු වේ. ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි ආර්ථික ගැළපුම් වැඩසටහන සාර්ථක ලෙස අවසන් කිරීම හරහා ඇති වන ඉහළ ආයෝජක විශ්වාසය, මූල්‍ය ගිණුම වෙත ගලා ඒම් සඳහා සහාය වනු ඇතැයි බලාපොරොත්තු වේ. මැදි කාලීනව, සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය සහ ආයෝජකයන්ගේ සුබවාදී අපේක්ෂා ඉහළ නැංවීම මගින් විවිධ ආයෝජන මෙන්ම අනෙකුත් විදේශීය මූල්‍ය ප්‍රවාහ ක්‍රමයෙන් යථා

1

තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දළ නිල සංචිත මැදි කාලීනව ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂිතය.

ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දැක්වෙන වැඩසටහනෙහි නියම කර ඇති මැදි කාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමේ අරමුණ ඇතිව, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කිරීම සහ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන වෙනුවෙන් අඛණ්ඩව කැපවීමෙන් යුතුව රජය කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මැදි කාලීන සිට දිගු කාලීන පදනමකින් ප්‍රාථමික ගිණුමේ අතිරික්තයන් ඇති කර ගැනීම සහ 2027 වසර වන විට රාජ්‍ය ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 15ක් අබිබවා යෑමේ අපේක්ෂිත ආදායම් ඉලක්කය රජය විසින් නිවේදනය කරන ලදි. මේ සඳහා රජය දැනටමත් එකතු කළ අගය මත බදු, විදුලි සංදේශ බද්ද සහ පුද්ගලික හා ආයතනික ආදායම් බදු අනුපාතික ඉහළ දැමීම, එකතු කළ අගය මත බදු හා පුද්ගලික ආදායම් බදු පදනම පුළුල් කිරීම, ඛනිජ තෙල් නිෂ්පාදිත, මත්පැන් හා දුම්කොළ නිෂ්පාදිත මත නිෂ්පාදන/සුරා බදු ඉහළ නැංවීම, සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවීම ඇතුළු ආදායම් වැඩිදියුණු කිරීමේ දැඩි ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක කර තිබේ. මෑත වසරවල දී නිරීක්ෂණය වූ අසතුටුදායක ආදායම් කාර්යසාධන ප්‍රවණතාව නැවත හිතකර තත්ත්වයට හැරවීම මගින් මෙම ආදායම් වර්ධන ක්‍රියාමාර්ග නුදුරු කාලයේ සිට මැදි කාලීනව ප්‍රතිලාභ අත්කර දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, දැනටමත් අධික වශයෙන් ඉහළ බදු බරකට යටත්ව සිටින බදු ගෙවන්නන්ගේ කාණ්ඩ සඳහා යම් සහනයක් සපයන අතර, රජයේ මැදි කාලීන ආදායම් ඉලක්ක ළඟා කර ගැනීම සඳහා ආදායම් පරිපාලන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. මේ අතර, රජය විසින් රාජ්‍ය මූල්‍ය හිඟය අවම කිරීම සඳහා අත්‍යවශ්‍ය වන වියදම් තාර්කීකරණය සඳහා පියවර ගෙන ඇත. කෙසේ වෙතත්, ආර්ථික කටයුතු මත ඇති විය හැකි ඍණාත්මක බලපෑම් අවම කරන අතරතුර, මැදි කාලීනව රාජ්‍ය වියදම සීමා කිරීමේ සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කිරීමේ ප්‍රයත්න ශක්තිමත් කිරීම සඳහා, ප්‍රමුඛතා පදනමකින් ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ඵලදායී නොවන පුනරාවර්තන වියදම් හඳුනා ගැනීම සහ අවම කිරීම, රාජ්‍ය අංශයේ සේවක බඳවා ගැනීම් සීමා කිරීම, සමාජ ආරක්ෂණ ජාල වඩා ඉලක්කගත කිරීම සහ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය කඩිනමින් සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය වේ. ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දැක්වෙන වැඩසටහන යටතේ අපේක්ෂා කෙරෙන පරිදි, දැනට සිදු කෙරෙමින් පවතින ණය ප්‍රතිව්‍යුහගතකරණය නිමා කිරීමෙන් පසු, 2027-2032 කාලය තුළ දී වාර්ෂික දළ මූල්‍යන අවශ්‍යතාවල සාමාන්‍යය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 13කට අඩු ප්‍රමාණයකට සීමා වීම හරහා රජයේ ණය සේවාකරණ බර සැලකිය යුතු ලෙස පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, රජයේ විදේශීය ණය සේවාකරණ ගෙවීම්, 2027-2032 කාලය තුළ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.5කට වඩා අඩු මට්ටමක පවත්වා ගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ණය සේවාකරණ පීඩනය විශාල ප්‍රමාණයකට ලිහිල් වනු ඇත. තවද, 2032 වසර වන විට, රාජ්‍ය ණය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 95කට පමණ අඩු වනු ඇතැයි අපේක්ෂිත ය. මැදි කාලීනව ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් පවත්වා ගැනීමේ ඉහළ අභිප්‍රායකින් යුතු අපේක්ෂිත ගමන්මග හේතුවෙන් මැදි කාලීනව ණය ඒකරාශී වීම අවම කර ගැනීමට සහාය ලැබෙනු ඇත. ඒ සමඟ ම, උපායමාර්ගික නොවන රජය සතු ව්‍යවසායයන්හි ආයෝජන ඉවත් කර ගැනීම, උපයෝගිතා සඳහා පිරිවැය පිළිබිඹු වන මිල ගණන් අඛණ්ඩව පවත්වා ගෙන යෑම, සහ රජය සතු ව්‍යවසායයන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම තුළින් එවැනි ආයතන මගින් රාජ්‍ය අයවැය මත පැටවෙන බර අවම කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, රාජ්‍ය මූල්‍ය රීති තවදුරටත් ශක්තිමත් කරන, අපේක්ෂිත නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීති සම්පාදනය බලාත්මක කිරීමත් සමඟ ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දැක්වෙන වැඩසටහන යටතේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු වනු ඇතැයි බලාපොරොත්තු වේ. යෝජිත ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්පූර්ණ කිරීම සහ රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව, වගවීම සහ විනිවිදභාවය සඳහා පුළුල් පදනමක් සහිත ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමත් සමඟ, රාජ්‍ය මූල්‍ය අංශ කාර්යසාධනය මැදි කාලීනව තිරසාරාත්මක ව ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, දශක ගණනාවක් පුරා ආර්ථිකයට බලපෑම් ඇති කළ රාජ්‍ය මූල්‍ය අංශයෙන් ආර්ථික වර්ධනයට එල්ල වූ ප්‍රධාන බාධක වළක්වා ගැනීමට හැකි වනු ඇත.

1.5 ගැටලු හා ප්‍රතිපත්ති

දශක කිහිපයකට පෙර සංවර්ධනය වෙමින් පැවති රටවල් අතරින් වඩාත් ඉදිරියෙන් සිටි රාජ්‍යයක සිට වර්තමානය වන විට අර්බුද රාශියකින් අත්මිදීම සඳහා ප්‍රයත්න දරන රටක් දක්වා ගමන් කළ කාලය තුළ දී තිරසාර සමාජ-ආර්ථික ප්‍රගතිය සහ සෞභාග්‍යය කරා ශ්‍රී ලංකාව මෙහෙයවීමට පැවති රජයන් අසමත් වී ඇත. නිදහසින් පසු බොහෝ ක්‍රියාමාර්ග ගනු ලැබූව ද ශක්තිමත් සහ ස්ථාවර ජාතික ප්‍රතිපත්ති රාමුවක් නොමැතිකම හේතුවෙන් රට සංවර්ධනය වීමේ දුෂ්කරතාවලට මුහුණ දුන් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය දුර්වල වීම, දීර්ඝ කාලයක සිට පැවත එන ගැටලු පිළිබිඹු කරමින් අඛණ්ඩ ද්විත්ව හිඟයක් පැවතීම සහ මන්දගාමී ලෙස වෙනස්වීම, අනුගත වීම සහ පරිවර්තනය වීම හේතුවෙන් විශේෂයෙන් ම මෑත දශක කිහිපය තුළ දී ආර්ථික වර්ධන වේගය අඩාල වී කලාපයේ අනෙකුත් රටවල ආර්ථිකයන්ට සාපේක්ෂව පසුබෑමට ලක් විය. දශක තුනක් පුරා පැවැති අභ්‍යන්තර ගැටුමේ අවසානය රටට නව ආරම්භයක් සඳහා අවස්ථාව සැලසුව ද දූරදර්ශී ප්‍රතිපත්ති නොමැතිකම සහ නිවැරදි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හා ප්‍රතිසංස්කරණ නිසි පරිදි ක්‍රියාත්මක නොවීම මෙන්ම විවිධ සමාජ, දේශපාලන සහ සාර්ව ආර්ථික අභියෝග හේතුවෙන් ආර්ථිකයට එහි විභව මට්ටම කරා ළඟා වීමට බාධා ඇති විය. මෙම අභියෝග සහ දිගු කාලීන ගැටලු බොහොමයක් විසඳීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ අදාළ බලධාරීන් විසින්, දුෂ්කර විය හැකි, එහෙත් අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ රාශියක් කඩිනමින් ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ. විශේෂයෙන්ම, අර්බුදයක් මගින්, ව්‍යුහාත්මක ගැටලු විසඳීම සඳහා වෙනස්කම් සිදු කිරීමට මෙන්ම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට, එනම් ආර්ථිකය 'නැවත නගා සිටුවීම්' සඳහා, අවස්ථා නිර්මාණය කරයි. දීර්ඝ කාලයක සිට පවතින මෙවැනි ගැටලු කිහිපයක් විසඳීම සඳහා මෑතක දී රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග අගය කළ යුතුය. මැදි කාලීනව ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ කැපවීම අත්‍යවශ්‍ය වන අතර, දේශපාලන වැඩපිළිවෙළින් ස්වායත්තව ඉතිරි ක්‍රියාමාර්ග ඉටු කරන බවටත් එහිදී නුදුරු කාලීන ක්‍රියාමාර්ග මැදි කාලීන වැඩපිළිවෙළ හා අනුකූල වන බවටත් සහතික විය යුතුය.

දිගු කාලයක සිට ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වූ ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ අධිෂ්ඨානය සහ කැපවීම, මැදි කාලීනව සිට දිගු කාලීනව ආර්ථිකයේ දිශානතිය හැඩගැස්වීමේ ප්‍රධාන සාධකයක් වනු ඇත. 2023 වසරේ මාර්තු මාසයේ දී අනුමත කරන ලද, දළ වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 3ක් වන ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම සහ අනෙකුත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල අපේක්ෂිත සහාය ද සමඟින්, ආර්ථිකයෙහි පෙර නොවූ අයුරින් පැවති ස්ථෛර්ය්ත්ව ණය සහ ගෙවුම් තුලන අර්බුදවලින් නුදුරු කාලීනව යම් හිතකර මාවතකට යොමු වීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය අවකාශය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, අනාගතයේ දී මෙවැනි අර්බුද නැවත ඇති නොවීමට සහ මැදි කාලීනව සිට දිගු කාලීනව ආර්ථිකය තිරසාරව යළි යථා තත්ත්වයට පත් වීම සඳහා දැඩි දේශපාලන අභිමතයක් සහ කැපවීමක් යටතේ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ දක්වා ඇති සාර්ව ආර්ථික ගැළපුම් වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ. මෙම සාර්ව ආර්ථික ගැළපුම් වැඩසටහනට ඇතුළත් අනිවාර්ය අංග වන්නේ, (i) රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය නැවත ඇති කිරීම සහ මූල්‍ය විනය ශක්තිමත් කිරීම අරමුණු කරගත්, සමාජ ආරක්ෂණ ජාලය, රාජ්‍ය මූල්‍ය ආයතන සහ රජය සතු ව්‍යවසායයන් වෙත සිදු කෙරෙන ප්‍රතිසංස්කරණ මගින් සමන්විත ප්‍රධාන වශයෙන් ආදායම් රැස් කිරීම මගින් මෙහෙයවනු ලබන ඉහළ අභිලාෂයකින් යුත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය (ii) රජයේ ණය තිරසාරභාවය නැවත ඇතිකර ගැනීම අරමුණු කරගත් ස්ථෛර්ය්ත්ව ණය ප්‍රතිව්‍යුහගතකරණය උපායමාර්ගය (iii) විනිමය අනුපාතිකයෙහි ඉහළ නම්‍යශීලීභාවය හමුවේ, මිල ස්ථායීතාව නැවත ඇති කිරීමට සහ ජාත්‍යන්තර සංචිත නැවත ගොඩ නැංවීම සඳහා බහුවිධ උපායමාර්ග (iv) මූල්‍ය ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා වූ ප්‍රතිපත්ති (v) යහපාලනය ඇති කිරීම සහ වංචා හා දූෂණ අවදානම් මැඩපැවැත්වීම සඳහා මූලික වන ප්‍රතිසංස්කරණ, සහ (vi) ශ්‍රී ලංකාවේ වර්ධන විභවතාව ළඟා කර ගැනීම සඳහා පුළුල් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ යනාදියයි. 1965 වසරේ සිට ශ්‍රී ලංකාව ජා.මූ. අරමුදලේ වැඩසටහන් දහසයක් වෙත යොමු වුව ද, ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ හදිසියේ අත්හැර දැමීම හේතුවෙන් එවැනි වැඩසටහන් සම්පූර්ණ කිරීම සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සතුව අසතුටුදායක වාර්තාවක් ඇත. මෙමගින් ආර්ථික දුෂ්කරතා පවතින කාලපරිච්ඡේදයන් තුළ එවැනි වැඩසටහන්වලට පිවිසීමේ සහ ඉන් පසුව ආර්ථිකයේ ඇතිවන කෙටි කාලීන වැඩි දියුණුවීම් සමඟ එම වැඩසටහන් සම්පූර්ණ කිරීමට පෙර ඉන් ඉවත්වීමේ අහිතකර ප්‍රවණතාවක් පැවතුණි. මෙම පසුබිම හමුවේ, ඉහළ දැනුම්වත්භාවයකින් සහ

1

විනිවිදභාවයකින් යුත් සන්නිවේදනය තුළින් අවශ්‍ය ආර්ථික ගැළපීම් සිදු කිරීමට මහජන සහයෝගය ලබා ගනිමින්, වත්මන් ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ සිදු කිරීමට නියමිත එක් එක් සමාලෝචනය තුළ දී, අපේක්ෂිත කාලානුරූපී ඉලක්ක සපුරා ගැනීමට ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් දැඩි කැපවීමක් සහ විනයක් පෙන්නුම් කිරීම අත්‍යවශ්‍ය වේ. මෙමගින්, දිගු කාලයක් තිස්සේ නොසලකා හරින ලද ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීමට අවස්ථාවක් ලැබීම පමණක් නොව, දැඩි අස්ථාවරවීම් සහ වේදනාකාරී ගැළපීම්වලට නිරන්තරයෙන් මුහුණ නොදී මැදිකාලීනව තිරසාර වර්ධන මාවතකට යොමු වීම සඳහා ආර්ථිකයට ශක්තිමත් පදනමක් ද ලබා දෙනු ඇත. අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් හදිසි අරමුදල් අවශ්‍යතා සඳහා ජා.මූ. අරමුදල වෙත නැවත නැවතත් ප්‍රවේශ වීමේ අවශ්‍යතාවයක් ඇති නොවනු ඇති අතර ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ අවශ්‍යතාවය ද වැළැක්වෙනු ඇත. 2022 වසරේ වැඩි කාලයක් තුළ ආර්ථිකයේ පැවති ඉතා දුෂ්කර තත්ත්වයන්ගෙන් ශීඝ්‍රයෙන් යථා තත්ත්වයට පත්වීම, ඉහත සඳහන් කළ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජා.මූ. අරමුදලේ පෙර පැවති වැඩසටහන් මෙන් නොව, වත්මන් විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ වඩා වේදනාකාරී ප්‍රතිසංස්කරණ පළමුව සිදු කළ යුතු වීම සැලකිය යුතු කරුණක් වන අතර, එවැනි ප්‍රතිසංස්කරණ අබණ්ඩව පවත්වා ගෙන යාම සාපේක්ෂ වශයෙන් පහසු වනු ඇතැයි අපේක්ෂා කළ හැකි අතර, එමගින් දැනට පවතින වැඩසටහන සම්පූර්ණ කිරීමේ දී ආර්ථිකය වඩාත් සාර්ථක කර ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉදිරි කාලයේ දී, පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගතකරණ කාල සීමාව තුළ විදේශීය ණය තිරසාරභාවය පවත්වා ගැනීම සඳහා විදේශීය මූල්‍යනය එලදායී ලෙස යොදා ගැනීම ප්‍රමුඛතාවය කර ගැනීම සහ භාවිත කිරීමට ශ්‍රී ලංකාව සහතික විය යුතුය. ශ්‍රී ලංකාව 2007 වසරේ සිට එ.ජ. ඩොලර් බිලියන 17.6ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කර ඇති අතර 2001 වසරේ සිට එ.ජ. ඩොලර් බිලියන 17.2ක ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කර ඇත. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල මුල් නිකුතුවල දී ලද ලැබීම් මූලික වශයෙන් සංවර්ධන කටයුතු සඳහා පමණක් භාවිතා කරන ලදී. පසුකාලීනව සැලකිය යුතු ලෙස ඉහළ ගිය අයවැය හිඟයන් සහ රජයේ දළ මූල්‍යන අවශ්‍යතා මගින් තීව්‍ර වූ විදේශීය ණය වැඩිවීම හේතුවෙන්, නිකුත් කළ බැඳුම්කර බොහොමයක ලැබීම් මූලික වශයෙන් අයවැය සහාය සඳහා හෝ ණය ආපසු ගෙවීම හෝ එම ණය සඳහා වන පොලී ගෙවීම සඳහා යොදා ගත් බැවින්, ගෝලීය වෙළඳපොළවලින් වාණිජ පොලී අනුපාතික යටතේ තවදුරටත් විදේශ විනිමය ණය ගැනීමට සිදු විය. ඒ අනුව, ජාත්‍යන්තර ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් සහ රටේ ආර්ථික තත්ත්වයන්හි අපේක්ෂා කරන වර්ධනයන් මධ්‍යයේ, ශ්‍රී ලංකාවේ ණය උපායමාර්ගය, ඉහළ වාණිජමය විදේශීය ණයවලින් ඉවත් වූ, හිමිකම් කොටස් මත විදේශීය මූල්‍යනය පදනම් වීම ඉතා වැදගත් වේ. විදේශ විනිමය ලැබීම් උත්පාදනය කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ දැක්මක් සහිතව, එවැනි අරමුදල් යොදා ගන්නා අරමුණු හඳුනා ගනිමින් විදේශීය මූල්‍යන සංයුතිය සහ උපායමාර්ගය ප්‍රවේශමෙන් සකස් කළ යුතුය. නිදසුනක් වශයෙන්, පුනර්ජනනීය බලශක්තිය වැනි උපායමාර්ගික වශයෙන් වැදගත් ව්‍යාපෘති වෙත විදේශීය මූල්‍යන ආකර්ෂණය කර ගැනීම, රාජ්‍ය මූල්‍ය අංශයට සහ විදේශීය අංශයට දැඩි පීඩනයක් ඇති නොවන පරිදි බලශක්ති අංශයේ දුර්වලතා මග හරවා ගැනීම සඳහා ඉතා වැදගත් වනු ඇත. එපමණක් නොව, ඕනෑම ආකාරයක ණය මූල්‍යනයක් වෙත යොමු වීමට දරන ඉදිරි ප්‍රයත්නවල දී, පිරිවැය සහ ප්‍රතිලාභ මෙන්ම මූල්‍යන අවශ්‍යතාවය පිළිබඳව ද නිසි ඇගයීමට ලක් කිරීම, අනාගතයේ දී ණය අවදානම් ඇති නොවීම සහතික කිරීම සඳහා අවශ්‍ය වනු ඇත.

ගෝලීය මූල්‍ය සහ ප්‍රාග්ධන වෙළඳපොළ සඳහා රට විවෘත කිරීමට පෙර, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ දක්වා ඇති තිරසාර ණය ඉලක්කවලට අනුකූලව, ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම තීරණාත්මක වේ. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි සඳහන් කර ඇති ආකාරයට ණය තිරසාර ඉලක්කවලට අනුකූලව, ශ්‍රී ලංකාව ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කළ යුතුය. ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය කඩිනමින් ආරම්භ කිරීමට හැකි වන පරිදි, 2023 වසරේ මාර්තු මස අග දී දේශීය ණය සඳහා අපේක්ෂිත ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයෙන් පසුව ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගතකරණ උපායමාර්ගය නුදුරු කාලයේ දී ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කිරීමට සැලසුම් සකස් කරමින් පවතී. එමෙන්ම, 2023 වසරේ සැප්තැම්බර් මාසයට පෙර මෙම ක්‍රියාවලිය අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. සාර්ථක ණය ප්‍රතිව්‍යුහගතකරණයකින් පසුව වුව ද, ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම්වල යම් වර්ධනයක් ඇතිවීම ක්‍රමානුකූල ක්‍රියාවලියක් වන අතර එය ආර්ථිකය යළි ගොඩනැගීමේ සාර්ථකත්වය මත රඳා පවතී.

ජාත්‍යන්තර අත්දැකීම්වලින් පෙනී යන්නේ, ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසුව, ද්විපාර්ශ්වික සහ වාණිජමය ණය හිමියන්ගෙන් විදේශ මූල්‍යන ආකර්ෂණය කර ගැනීමට පෙර, ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් වර්ධනය කර ගැනීමට සහ ආර්ථිකය කෙරෙහි ඇති විශ්වාසය ගොඩනඟා ගැනීමට රටවල් සැලකිය යුතු කාලයක් ගත කර ඇති බවයි. මෙම පසුබිම හමුවේ, කෙටිකාලීන හා මැදිකාලීන ණය මුල්‍යනවලින් ඉවත් වීමට රට උත්සාහ කළ යුතු අතර, මූලික වශයෙන් විදේශීය සෘජු ආයෝජන සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව වැඩපිළිවෙළ හරහා සිදු කෙරෙන හිමිකම් කොටස් මුල්‍යනය වැනි ණය නොවන මූල්‍ය ප්‍රභවයන් ආකර්ෂණය කර ගැනීමේ ආකාර හඳුනාගත යුතුය.

පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායයන් එම තත්ත්වයෙන් මුදවාගෙන ලාභ ලබන ආයතන බවට පත් කිරීම මෙන්ම, එම ආයතන, රජයේ අයවැය මත ඇති කෙරෙන පීඩනය සහ වාණිජ බැංකු මත අධික ලෙස රඳා පැවතීම වැළැක්වීම සඳහා දිගු කාලයක් පුරා ක්‍රියාත්මක නොවුණු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ තවදුරටත් ප්‍රමාද වීමකින් තොරව සිදු කළ යුතු අතර, එමගින් රාජ්‍ය මූල්‍ය, සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායීතාවයට බාධා ඇති කරන මෙම ආයතන හේතුවෙන් උද්ගත වන අවදානම් වළක්වාගත හැකිය. විදුලිය, බනිජ තෙල්, ජලය, බැංකු, ප්‍රවාහන සහ ගුවන් සේවා වැනි උපායමාර්ගික වශයෙන් වැදගත් ආර්ථික අංශවල රජය සතු ව්‍යවසායයන් ප්‍රධාන භූමිකාවන් ඉටු කළත්, මෙම ආයතනවලින් සැලකිය යුතු ප්‍රමාණයක් මෙහෙයුම් අකාර්යක්ෂමතා, දුර්වල පරිපාලනය සහ අයථා කළමනාකරණය, වගවීම හා විනිවිදභාවය නොමැතිකම, වෙළඳපොළට ගැළපෙන ලෙස හැඩ ගැසීම දුර්වල වීම, දේශපාලන මැදිහත්වීම් හරහා ඉහළ මට්ටමේ පත්වීම් සිදු කිරීම දිගින් දිගට ම සිදු වීම, සහ අධික ශ්‍රම බලකාය ඇතුළු ගැටලු රාශියකින් පීඩාවට පත්ව සිටියි. මෙම ගැටලු රාජ්‍ය ව්‍යවසායයන්ගේ දුර්වල මූල්‍ය කාර්යසාධනයට හේතු පාදක වී ඇති අතර, එම දුර්වල මූල්‍ය කාර්යසාධනය නිසා රාජ්‍ය බැංකුවලට සහ මෑත කාලීනව ඇතැම් පෞද්ගලික බැංකුවලට ඇති කෙරෙන අහිතකර බලපෑම, ප්‍රාග්ධනය යෙදීමට සිදු වීමෙන් රජයට සිදු වන මූල්‍ය හානි, රජයේ අවිනිශ්චිත වගකීම් වැඩි වීම සහ මහජනතාවට සපයනු ලබන සේවාවන්වල ගුණාත්මකභාවය පිළිබඳ සතුටුදායක තත්ත්වයක් නොපැවතීම වැනි අහිතකර තත්ත්ව ඇති වීම හේතුවෙන් රට තුළ බහුවිධ සාර්ව ආර්ථික පීඩන නිර්මාණය වී ඇත. උදාහරණයක් ලෙස, 2022 වසර අවසානයේ දී බැංකු අංශයෙන් රජයේ සංස්ථා වෙත ලබා දී ඇති ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 1.7ක්[4] වන අතර, 2022 වසර තුළ දී රජය විසින් ද්‍රවශීලතා ගැටලු ලිහිල් කිරීම සඳහා රුපියල් බිලියන 80ක පමණ ප්‍රාග්ධනය ලං.වි.ම.ට ලබා දී ඇත. ශ්‍රී ලංකාවේ ස්ථාපිත රාජ්‍ය ව්‍යවසායයන් සාමාන්‍යයෙන් පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත කර ඇතත්, රාජ්‍ය ව්‍යවසායයන් කිහිපයක් සමාගම් පනත යටතේ ස්ථාපනය කර ඇති අතර, පාර්ලිමේන්තු අධීක්ෂණය මඟහැරීමට එයින් යම් ඉඩකඩක් සැලසේ. මීට අමතරව, රාජ්‍ය ව්‍යවසායයන් බහුතරයක මූල්‍ය ගිණුම් නියමිත වේලාවට සකස් කිරීම සහ එම ප්‍රකාශන හෙළිදරව් කිරීම සිදු නොවන බැවින්, ඒවායෙහි විනිවිදභාවයට සහ මහජන නිරීක්ෂණයට බාධා ඇති වේ. ඇතැම් රාජ්‍ය ව්‍යවසායයන්හි වංචා, දූෂණ, අයථා කළමනාකරණය සහ නොසැලකිලිමත්කම හඳුනාගෙන තිබියදීත්, අදාළ ආයතනවල අධ්‍යක්ෂක මණ්ඩලයේ හෝ පාර්ලිමේන්තු කාරක සභා මට්ටමේ දී එවැනි ගැටලුවලට කඩිනම් විසඳුම් ලැබී නොමැති තරම්ය. මීට අමතරව, දිගින් දිගටම පත්වුණු රජයන් මගින් ජනප්‍රිය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසායයන් අවභාවිත කර ඇත. උදාහරණයක් වශයෙන්, දීර්ඝ කාලයක් තිස්සේ, බලශක්තිය, බනිජ තෙල්, ජලය, ප්‍රවාහනය ඇතුළු උපයෝගිතා සහ රාජ්‍ය අංශයේ සේවා පිරිවැය ප්‍රතිසාධන මට්ටමට වඩා අඩු මිලකට පාරිභෝගිකයන්ට ලබා දී ඇත. මෙම ඉලක්කගත නොකළ සහනාධාරවල පිරිවැය රාජ්‍ය ව්‍යවසායයන් විසින් දරනු ලැබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස විශාල වශයෙන් සමුච්චිත අලාභ ඇති වූ අතර, ඒවා බොහෝ දුරට මධ්‍යම රජයේ අයවැයෙන් සිදු කරන පැවරුම් මගින් ආවරණය විය. මෙරට ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්ගේ දුර්වල මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ වෙළඳපොළට අනුව හැඩ ගැසීමට නොහැකි වීමට ප්‍රධාන ම හේතුව වී ඇත්තේ පිරිවැය පිළිබිඹු කරන මිලකරණයක් නොමැති වීමය. ඉහත සඳහන් කරන ලද සියලුම ගැටලු රාජ්‍ය ව්‍යවසායයන් ලාභ ලබන වාණිජ ව්‍යාපාර ලෙස ක්‍රියාත්මක වීම අධෛර්යමත් කර ඇති අතර, එමගින් රජයට, බැංකුවලට සහ මහජනතාවට අනවශ්‍ය පීඩන ඇති කර තිබේ. රාජ්‍ය ව්‍යවසායයන්ගේ ණය තිරසාර නොවන ඉහළ මට්ටම් කරා ළඟා වන විට, රජයේ ආදායම් යොදාගෙන එම ණය බර අඩු කිරීමට පසුගිය කාලයේ දී රජයට සිදු විය. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ එකඟ වූ ක්‍රියාමාර්ගවලට අනුව, ලං.ඛ.නී.සං.හි නොපියවූ විදේශ මුදල් ණය රුපියල් බිලියන 884.1ක්

4 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී මධ්‍යම රජයේ ණය යටතේ ඇතුළත් කෙරුණු, රජය විසින් ලබා දුන් ඇපකර මත ලබා ගන්නා ලද ලං.ඛ.නී.සං.හි විදේශ මුදල් ණයවල හිඟ ශේෂය ද මෙහි ඇතුළත් වේ.

1

(එ.ජ. ඩොලර් මිලියන 2,434.8ක්) 2022 වසර අවසානයේ දී මධ්‍යම රජයේ ණය යටතට ඇතුළත් කරගෙන ඇත. මීට අමතරව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ලං.වි.ම., සහ ගුවන්තොටුපළ හා ගුවන් සේවා (පුද්ගලික) සමාගම යටතේ වාර්තා කෙරුණු, චීන අපනයන-ආනයන බැංකුවෙන් (EXIM Bank of China) ලබා ගත් රුපියල් බිලියන 518.3ක් (එ.ජ. ඩොලර් මිලියන 1,427.3ක්) වූ ණය පහසුකම් අටක නොපියවූ ශේෂය 2022 වසර අවසානයේ දී මධ්‍යම රජයේ ණය යටතේ වර්ගීකරණය කිරීමට සිදු විය. මෙවන් පසුබිමක, රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යක්ෂමතාවය, මූල්‍ය ශක්‍යතාවය සහ වගවීම වැඩිදියුණු කිරීම සඳහා ආයතනික ප්‍රතිසංස්කරණ සිදු කිරීම ඉතා වැදගත් වේ. රාජ්‍ය ව්‍යවසායයන්ගේ මූල්‍ය ශක්‍යතාව ඇති කිරීමේ අවශ්‍යතාව හඳුනාගනිමින් ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන මගින් ප්‍රධාන උපයෝගිතා කිහිපයක පිරිවැය පියවීම සඳහා නියම කරන ලදී. රාජ්‍ය ව්‍යවසායයන් විසින් ලබන ආදායම් ඉහළ නැංවීමට පමණක් නොව, ඔවුන්ගේ අකාර්යක්ෂමතාවය නිසා උද්ගත වන වියදම් ඉහළ මිල ගණන් පැනවීම මගින් පියවා ගැනීම සිදු නොකර, පිරිවැය අඩු කිරීමට උත්සාහ කරන බව සහතික කිරීම සඳහා එවැනි මිලකරණ යාන්ත්‍රණයන් වඩා ඉහළ විනිවිදභාවයකින් යුතුව අබණ්ඩව පවත්වාගෙන යාම අවශ්‍ය වේ. තවද, එවැනි ආයතන මගින් රජයේ අයවැය මත වන පීඩනය අඩු කිරීම සහ ආයතනික හා වාණිජමය වශයෙන් වඩා ඉහළ කාර්යක්ෂමතාවක් සහතික කිරීම සඳහා උපායමාර්ගික නොවන ව්‍යවසායයන් විකිණීමට හෝ කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කිරීම සඳහා හෝ සලකා බැලිය යුතුය. අනිවාර්ය සහ නිරන්තර පාර්ලිමේන්තු අධීක්ෂණය මගින් ඉතිරි රාජ්‍ය ව්‍යවසායයන්ගේ ආයතනික විනිවිදභාවය සහ වගවීම වැඩිදියුණු කළ යුතුය. ප්‍රධාන කාර්යසාධන දර්ශකවලට සම්බන්ධව, අනිවාර්යයෙන් ම ළඟා කරගත යුතු ආයතනික ඉලක්ක සහ අරමුණු රාජ්‍ය ව්‍යවසායයන් වෙත ලබා දිය යුතු වන අතර, ඒ සඳහා රාජ්‍ය ව්‍යවසායයන්ගේ කළමනාකරණය වගකිව යුතු බව තහවුරු කළ යුතුය. මෙම රාජ්‍ය ව්‍යවසායයන්හි අධ්‍යක්ෂක මණ්ඩලයට, කළමනාකාරීත්වයට සහ සේවකයින්ට ලැබෙන වරප්‍රසාද සහ ප්‍රතිලාභ ඔවුන්ගේ කාර්යසාධනය සහ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සමඟ සම්බන්ධ කළ යුතුය. ඒ අනුව, එවැනි රාජ්‍ය ව්‍යවසායයන් ආර්ථිකයේ වර්ධනයට සහාය සපයන ආයතන බවට පත් කිරීම සහතික කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට රජය කැපවී සිටීම ඉතා වැදගත් වේ. තවද, රජය විසින් දැනටමත් හඳුනාගෙන ඇති පරිදි, විදුලිබල ක්ෂේත්‍රයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම යන උප අංශ ආයතනික වශයෙන් වෙන් කිරීම හරහා බලශක්ති අංශයේ පුළුල් ප්‍රතිසංස්කරණ සිදු කිරීම අවශ්‍ය වනු ඇත. ලං.වි.ම. වැනි රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලික අංශයේ බලශක්ති සපයන්නන් සමඟ එළඹුණු වාණිජ ගිවිසුම් නැවත සමාලෝචනයකට ලක් කිරීම මගින්, එම ගිවිසුම්වලින් ලං.වි.ම.ට වැඩි වියදමක් දැරීමට සිදු වන ආකාරයට එම සැපයුම්කරුවන්ට අනවශ්‍ය ප්‍රතිලාභ ලබා නොදෙන බව සහතික කළ යුතුය. මධ්‍යම රජයේ මූල්‍යන මත ඇති වන පීඩන අවම කර ගනිමින් රාජ්‍ය ව්‍යවසායයන්ගේ කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය සහතික කිරීම සඳහා මෙම ආයතනික ප්‍රතිසංස්කරණ ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කළ යුතුය.

බදු ප්‍රතිපත්ති හා බදු පරිපාලනය ප්‍රතිසංස්කරණය කිරීම සහ නීතිමය අනුකූලතා රාමුව ශක්තිමත් කිරීම රජයේ ආදායම් ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉතා වැදගත් වන අතර, එමගින් ඉදිරි කාලය තුළ දී සාර්ව ආර්ථික සමතුලිතතාව යථා තත්ත්වයට පත් කෙරෙනු ඇත. ශ්‍රී ලංකාවට සමාන ආර්ථිකයන් හා සසඳන විට ශ්‍රී ලංකාවේ අබණ්ඩව පවතින දුර්වල ආදායම් කාර්යසාධනය හඳුනා ගනිමින්, බදු අනුපාත වැඩි කර ගන්නා අතර බදු පදනම පුළුල් කරගැනීමට රජය විසින් පියවර කිහිපයක් දැනටමත් අනුගමනය කර ඇත. කෙසේ වෙතත්, රාජ්‍ය ආදායම් රැස් කිරීම තිරසාර පදනමක් සහිතව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා දියුණු තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධව කටයුතු කිරීමට විශේෂ අතිරේක ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍ය වේ. ප්‍රධාන වශයෙන්, සෑම වසරකම අපේක්ෂිත ආදායම් මට්ටමට ළඟා වීමට නොහැකි වීම හමුවේ කෙටි කාලීන විසඳුම් ලෙස සිදු කරන ලද නොගැළපෙන, අස්ථාවර සහ නිසි සැලැස්මකින් තොරව ක්‍රියාත්මක කෙරෙන ප්‍රතිපත්ති හේතුවෙන් ශ්‍රී ලංකාවේ බදු ක්‍රමය තුළ අසාර්ථක තත්ත්වයන් ඇති වී තිබේ. අතීතයට බලපාන පරිදි හඳුන්වා දුන් අධිභාර බද්ද සහ ව්‍යාපාර පිරිවැටුම මත පනවනු ලබන බදු සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය නිතර වෙනස් වීම, එවැනි අස්ථාවර බදු ප්‍රතිපත්තිවලට උදාහරණ වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ව්‍යාපාර සහ පුද්ගලයන්ට බදු වාර්තා ගොනු කිරීම සහ සිය බදු වගකීම් පුරෝකථනය කිරීම අපහසු කටයුත්තක් වී ඇති අතර, බදු ගෙවන්නන් ස්වේච්ඡාවෙන් බදු ගෙවීමට වන අනුකූලතාව පවත්වා ගැනීම එමගින් අධෛර්යමත් වේ. දුර්වල බදු පරිපාලන ක්‍රමයක් මගින්

ඉහළ බදු ආදායමක් උපයා ගැනීමට පහසුවෙන් බදු අය කර ගත හැකි ක්ෂේත්‍ර යොදා ගැනෙන නමුත්, සිදු විය යුත්තේ ජනතාව අතර බදු බර සාධාරණ ලෙස බෙදී යන, සාධාරණ බදු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමය. ඒ අනුව, රටේ බදු ප්‍රතිපත්ති සකස් කළ යුත්තේ රජයේ ආදායම් අවශ්‍යතා, රටේ සංවර්ධන අරමුණු, බදු ප්‍රතිපත්තිවල සාධාරණත්වය සහ බදු ගෙවන්නන් හා බදු පරිපාලකයන් යන දෙපාර්ශ්වයේ ම පහසුව සලකා බැලීමෙනි. මේ අතර, පරිපාලන වියදම්, බදු මගහැරීම්, බදු පැහැර හැරීම් සහ විවිධ බදු වංචා අවම කිරීම සඳහා බදු පරිපාලනය ශක්තිමත් කළ යුතුය. රජයට සැලකිය යුතු ආදායම් අහිමිවීමක් සිදු වීමට හේතුවක් වූ ආදායම් පරිපාලන හා කළමනාකරණ තොරතුරු පද්ධතියේ (RAMIS) දැනට පවතින දුර්වලතා කඩිනමින් නිවැරදි කළ යුතු අතර, සෘජු සහ වක්‍ර බදු ආදායම් එකතු කිරීම සඳහා නව තාක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වා දිය යුතුය. උදාහරණයක් ලෙස, තත්කාලීන ඉන්වොයිස් ක්‍රමයක් හඳුන්වා දීම මගින් එකතු කළ අගය මත බදු සහ පිරිවැටුම් බදු සම්බන්ධ වංචා වළක්වා ගැනීමට සහ බදු විගණනය කාර්යක්ෂමව සිදු කිරීමට අවස්ථාව උදා වේ. මීට අමතරව, ආදායම් එකතු කිරීමේ ආයතන, මූල්‍ය ආයතන සහ අනෙකුත් දේපළ ලියාපදිංචි කිරීමේ ආයතනවල දත්ත සමුදායන් සම්බන්ධ කිරීම බදු පැහැර හැරීම අවම කිරීමට උපකාරී වන අතර, එමගින් බදු ගෙවන්නන්ගේ පදනම පුළුල් වේ. බ්ලොක්චේන්, ඒකාබද්ධ රේගු කළමනාකරණ පද්ධති, භාණ්ඩ තොග සුපරීක්ෂක (cargo scanner) සහ භාණ්ඩ තොගවල ගමන්මග නිරීක්ෂක (trackers) වැනි නවීන තාක්ෂණයන් හඳුන්වා දීම මගින් දේශසීමාවල දී බදු පැහැර හැරීම් අවම කර ගැනීමට බොහෝ රටවලට හැකි වී ඇත. ශ්‍රී ලංකාවේ පවතින විශාල අවිධිමත් අංශය බදු ජාලයට හසු නොවන තරම් වන අතර, පුද්ගලයන් සහ ව්‍යාපාර විසින් මුදලින් සිදු කරන ගනුදෙනු නිසා ඔවුනට ඒ හරහා ලැබෙන ආදායම සොයා ගැනීමට ආදායම් එකතු කිරීමේ ආයතනවලට අපහසු වන බැවින් විධිමත් අංශයේ බොහෝ පිරිසක් ද බදු ගෙවීම් පැහැර හරිති. එබැවින්, බදු වංචා කරන්නන් මෙන්ම, තමන්ගේ ප්‍රතිලාභය සඳහා වෙනත් පුද්ගලයෙකු හෝ ආයතනයක නමින් දේපළ ගනුදෙනු (benami transactions) සිදු කරන්නන් සොයා ගැනීමට, 'මුදල් ගනුදෙනු රහිත ආර්ථිකයක්' ප්‍රවර්ධනය කිරීම තුළින් ආදායම් එකතු කිරීමේ ආයතනවලට හැකියාව ලැබේ. මේ අතර, වර්තමාන අභියාචනා සහ පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීමේ ක්‍රියාවලියට ඉතා දිගු කාලයක් ගත වීම බදු එකතු කිරීමේ ක්‍රියාවලියට සැලකිය යුතු මට්ටමින් අහිතකර ලෙස බලපා ඇති අතර, එය ආදායම් එකතු කිරීමේ ආයතනවලට ඔවුන්ගේ ආදායම් රැස් කිරීමේ ඉලක්ක සපුරා ගැනීමට බාධාවක් වී ඇත. බදු මග හැරීම, බදු නොගෙවීම සහ බදු පැහැර හරින්නන්ට බදු ගෙවීම සඳහා දිගු කාලයක් ලබා දීම සම්බන්ධයෙන් නොවිසඳුණු සිද්ධීන් රැසක් ඇති බව පෙනී යයි. විනිවිදභාවය වැඩි කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් තවමත් නොවිසඳුණු සහ විසඳන ලද බදු සම්බන්ධ නඩු සහ සිද්ධි සංඛ්‍යාව වරින් වර ප්‍රකාශයට පත් කිරීම මගින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් බදු එකතු කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට දරන ප්‍රයත්න මහජනතාවට පැහැදිලි වනු ඇත. තවද, බදු සම්බන්ධ ආරවුල් විසඳීම සඳහා කාර්යක්ෂම අභියාචනා ක්‍රියාවලියක් සහ කඩිනම් අධිකරණ ක්‍රියාවලියක් හඳුන්වා දීම මගින් රජයට සිදුවන බදු අහිමි වීම් විශාල ලෙස අඩු කර ගත හැකි වනු ඇත. එයට අමතරව, ස්වේච්ඡාවෙන් බදු ගෙවීම සඳහා වන අනුකූලතාව වැඩිදියුණු කිරීම සඳහා, අනුකූල නොවීම සම්බන්ධයෙන් දැඩි දඬුවම් හඳුන්වා දිය යුතු අතර, බදු ගෙවන්නන් සඳහා නිසි මග පෙන්වීමක් ලබාදෙන සේවා වැඩිදියුණු කළ යුතුය. පුද්ගලික ආදායම් බදු වාර්තා ගොනු කිරීම අනිවාර්ය කිරීමට සහ පුද්ගලික ආදායම් බදු ඉලෙක්ට්‍රොනික ක්‍රමයට ගෙවීම සඳහා රජය විසින් මෑතකාලීනව ගත් ප්‍රයත්න, බදු පරිපාලනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ගත්, අගය කළ යුතු මූලපිරීමකි. බදු පරිපාලනය වැඩිදියුණු කිරීමට රජය දරන උත්සාහයන් තවදුරටත් වැඩි කළ යුතු අතර, බදු පදනම පුළුල් කිරීමටත්, දැනටමත් බදු ගෙවන්නන් මත දැරිය නොහැකි බරක් පැටවීමකින් තොරව රජයේ ආදායම ඉහළ නැංවීමටත් එමගින් රජයට හැකි වනු ඇත.

මැදි කාලීනව හා දිගු කාලීනව රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයෙහි තිරසාර බව සහතික කිරීම සඳහා මෑත කාලයේ දී හඳුන්වා දුන් දැඩි බදු ප්‍රතිසංස්කරණවලට සමගාමීව නිසි වියදම් කළමනාකරණ උපායමාර්ග ද ක්‍රියාත්මක කළ යුතුය. රාජ්‍ය මූල්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා බදු ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍ය වුවද, කාර්යක්ෂම රාජ්‍ය වියදම් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක නොකරන්නේ නම්, වියදම් අඩු කර ගැනීමේ සහ වියදම් තාර්කීකරණය කිරීමේ උපායමාර්ග නොමැති වීම නිසා බදුවලින් ලැබෙන අමතර ආදායම අකාර්යක්ෂම රාජ්‍ය වියදම් වැඩසටහන්වලට වෙන් කිරීමට ඉඩ ප්‍රස්ථා ඇති බැවින් එම ක්‍රියාමාර්ග ප්‍රතිඵල රහිත විය හැක. වැටුප් හා චේතන, විශ්‍රාම වැටුප් හා සහනාධාර සහ පොළී ගෙවීම් සඳහා රජයේ වියදමින් සැලකිය යුතු තරම් කොටසක් වෙන් කෙරෙන නිසා ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදම්වලින් වැඩි ප්‍රමාණයක් පහසුවෙන් අඩු කළ නොහැකි වියදම් වේ. කෙසේ වුවද, වියදම් කළමනාකරණය සඳහා සුදුසු ක්‍රමවේද ක්‍රියාත්මක

1

කිරීම තුළින් වියදම් අඩුකර ගැනීම සඳහා ඉඩ ප්‍රස්ථාව සලසාගත හැකිය. රජයේ අයවැය පිළියෙල කිරීමේ දී, ප්‍රවර්ධී අයවැයකරණ ක්‍රමවේදය[5] (Incremental budgeting) වැනි සාම්ප්‍රදායික අයවැයකරණ ක්‍රමවේද වෙනුවට ශූන්‍ය මූලික අයවැයකරණ ක්‍රමවේදය[6] (Zero-based budgeting) වැනි වඩාත් සඵලදායී ක්‍රමවේද භාවිත කිරීම මගින් අනවශ්‍ය සහ ඵලදායී බවින් අඩු ක්‍රියාකාරකම් හඳුනාගැනීමට සහ එවැනි වියදම් කපා හැරීමට රජයට හැකියාව ලැබෙන අතර, වර්ධනය සහ සංවර්ධනය සඳහා ඉඩ සලසමින් ආර්ථිකයේ ඉතාමත් ම වැදගත් අවශ්‍යතා වෙත හිඟ සම්පත් වෙන් කිරීමට ද මෙමගින් හැකියාව ලැබේ. ශූන්‍ය මූලික අයවැයකරණය ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් දැනටමත් ප්‍රයත්න දරා තිබුණ ද, මෙම අයවැයකරණ ක්‍රමවේදය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා, විශේෂයෙන් ම, රජයේ අයවැය සැකසීමට දායක වන වියදම් සිදු කරන ආයතනවල කාර්යමණ්ඩල පුහුණු කිරීම මගින්, සාමූහික ප්‍රයත්නයක් දැරීම අවශ්‍ය වේ. තවද, වියදම් සිදු කරන ආයතනවල වියදම් කපා හැරීම සඳහා සෑමට එක සේ ක්‍රියාත්මක වන ප්‍රවේශයක් වෙනුවට, සංවර්ධන න්‍යාය පත්‍රය තුළ ඇති ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රමුඛතාවය, ඒවායෙහි සම්පත් අවශ්‍යතාවය සහ සම්පත් ලබා ගැනීමට ඇති හැකියාව සැලකිල්ලට ගෙන, අවශ්‍ය පියවර ක්‍රියාත්මක කළ යුතුය. ඵලදායී ලෙස වියදම් සිදු කරන ආයතනවලට අවශ්‍ය පරිදි සම්පත් ලැබෙන බව සහතික කිරීම සඳහාත්, ඵලදායී නොවන ආකාරයෙන් වියදම් සිදු කරන ආයතන ඔවුන්ගේ ඵලදායී බව තක්සේරුකොට අවශ්‍ය පරිදි වියදම් තාර්කීකරණ ක්‍රියාමාර්ග අනුගමනය කරන බව සහතික කිරීම සඳහාත්, එක් එක් අවස්ථා සහ ආයතන පිළිබඳව වෙන් වෙන් වශයෙන් සලකා බලමින් වියදම් තාර්කීකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය. මේ අතර, ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘති සඳහා ඵලදායී ලෙස අරමුදල් වෙන් කිරීම සහතික කිරීම සඳහා 'වැය කරන මුදලට සරිලන වටිනාකමක් ලබා දෙන' සහ සංවර්ධන න්‍යාය පත්‍රය තුළ ව්‍යාපෘතිවලට ඇති වැදගත්කම මත පදනම්ව ප්‍රාග්ධන වියදම් ප්‍රමුඛතාගත කිරීම ඉතා වැදගත් වේ. එබැවින්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි පරාමිතීන්ට අනුකූල වන පරිදි මැදි කාලීනව රජය විසින් ප්‍රාථමික ශේෂයෙහි අතිරික්තයක් ලබා ගැනීම සඳහා වැඩිදියුණු කරන ලද අයවැයකරණය ක්‍රමවේද සහ තාර්කික ලෙස සම්පත් වෙන් කිරීම අත්‍යවශ්‍ය වේ.

බලශක්ති අංශයේ පවතින අකාර්යක්ෂමතා විසඳීමේ අවශ්‍යතාව අවධාරණය කරමින්, මෑත කාලීන ආර්ථික අර්බුදය විසින් මෙරට බලශක්ති සුරක්ෂිතතාව අභියෝගයට ලක් කර ඇත. බාහිර කම්පන සඳහා බලශක්ති අංශයේ ඔරොත්තු දීමේ හැකියාවේ පවතින දුර්වලතා මෙන්ම, ඉහළ විභවතාවක් පැවතිය ද විදුලිබල උත්පාදනයේ පවතින සීමිත විවිධාංගීකරණය පිළිබිඹු කරමින්, විදුලිය සහ අනෙකුත් බලශක්ති සේවා සැපයුමට 2022 වසරේ දී දැඩි බාධා එල්ල වූ අතර, ඒ හේතුවෙන් දීර්ඝ විදුලි සැපයුම අත්හිටුවීම් සහ උග්‍ර ඉන්ධන හිඟයක් නිර්මාණය කරමින් උද්ගත වූ බලශක්ති අර්බුදය මගින් ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි අහිතකර බලපෑම් එල්ල විය. ජල විදුලිය, විදුලිබල උත්පාදනයේ වඩාත්ම ලාභදායී මූලාශ්‍රය වුව ද, දේශගුණික වෙනස්වීම් කෙරෙහි එහි සංවේදීතාව ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන්, විදුලිය සැපයීමේ තිරසාරභාවය පිළිබඳ සැලකීමේ දී, ජලවිදුලි උත්පාදනය මත විශාල වශයෙන් ශ්‍රී ලංකාව රඳා පැවතීම අවධානය යොමු විය යුතු කරුණකි. තවද, ආනයනික තාප බල ප්‍රභව වන ගල් අඟුරු සහ පෙට්‍රෝලියම් නිෂ්පාදන මත වැඩි වශයෙන් යැපීමත් සමඟ ගෝලීය බලශක්ති මිල ගණන්වල සිදුවන විචලන සඳහා ද විදුලි උත්පාදනය දැඩි ලෙස නිරාවරණය වේ. විදුලිබල උත්පාදනය සඳහා සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභවයන්හි දායකත්වය ඉහළ නැංවීමට නොයෙකුත් ක්‍රියාමාර්ග අනුගමනය කෙරුණ ද, මේ සඳහා බහුවිධ ආයතනවලින් අනුමැතිය ලබාගැනීමට සිදුවීම, පාරිසරික බලපෑම් පිළිබඳ ගැටලු මෙන්ම, විදුලි නිෂ්පාදකයන්ට ගෙවන ගාස්තු නිතර සංශෝධනයකට ලක් නොකිරීම වැනි නොයෙකුත් අභියෝගවලට පුනර්ජනනීය බලශක්ති අංශයේ නියැළී සිටින පෞද්ගලික ආයෝජකයින් මුහුණදෙන අතර, එය පුද්ගලික අංශයේ වැඩි දායකත්වයක් සහිතව සිදුවිය යුතු සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය අංශයේ ව්‍යාප්තියට බාධාවක්ව පවතී. මේ තත්ත්වය තුළ, විදුලිබල උත්පාදන මූලාශ්‍රවල උපයෝජ්‍යතාව සහ එම මූලාශ්‍රවල උත්පාදන පිරිවැය අනුව වඩාත් සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමේ කඩිනම් අවශ්‍යතාවක් පවතින අතර, එමගින් ඉදිරියේ දී කාර්යක්ෂම උත්පාදන සංයුතියක් තෝරා ගැනීමට ද හැකියාව ලැබෙනු ඇත. විදුලි උත්පාදන සංයුතියේ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව දායකත්වය වැඩි කිරීම සඳහා, ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් සුලබ සම්පත්වන, සූර්ය හා සුළං වැනි සුපිරිසිදු විදුලිබල ප්‍රභව සඳහා පුද්ගලික සහ විදේශීය මූලාශ්‍රවලින් ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ අවශ්‍යතාවක් පවතින අතර, ඒ සඳහා අනෙකුත් පියවර

5 ප්‍රවර්ධී අයවැයකරණ ක්‍රමයේ දී, පෙර වසරේ අයවැය පදනම ලෙස සලකන අතර, වර්තමාන මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යෑම සඳහා, පදනම් කරගත් අයවැයට අවශ්‍ය පරිදි කිසියම් ප්‍රතිශතයක් එකතු කිරීම මගින් ගැළපුම් සිදු කරනු ලබයි.

6 පෙර අයවැයෙන් පටන්ගෙන අවශ්‍යතාවයන්ට සරිලන ගැළපුම් සිදු කිරීම වෙනුවට අලුත් කාලපරිච්ඡේදයක් හෝ වසරක් සඳහා ශූන්‍ය පදනමින් පටන්ගෙන, සියලුම වියදම් සාධාරණීකරණය කිරීම හරහා අයවැයට එකතු කර ගැනීම ශූන්‍ය මූලික අයවැයකරණ ක්‍රමවේදයේ දී සිදු කරනු ලබයි.

අතර නියාමනයට හා බදුකරණයට අදාළ සෘජු ප්‍රවේශ, ප්‍රමාණවත් යටිතල පහසුකම් මෙන්ම යහපාලනයෙන් සමන්විත හිතකර ආයෝජන පරිසරයක් හරහා පහසුකම් සැලසිය යුතුය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ 2022 වසර සඳහා වූ තිරසාර සංවර්ධන ඉලක්ක ආයෝජන සිතියම (Sustainable Development Goals Investor Map - 2022) අනුව, ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති අංශය ඉහළ ආයෝජන විභවතාවක් ඇති ප්‍රමුඛතා අංශයක් ලෙස පිළිගෙන ඇති අතර, එමගින් පුනර්ජනනීය බලශක්ති අංශයේ ආයෝජන දිරිමත් කිරීම අරමුණු කරගත් පියවර සඳහා වන අවශ්‍යතාව ද අවධාරණය කෙරේ. මේ සඳහා, විදුලිය නිපදවන්නා සහ මිලදීගන්නා ඍජුව සම්බන්ධ වන මිලදී ගැනීමේ ගිවිසුම් පුද්ගලික අංශය සඳහා සක්‍රීය කිරීම සහ විදුලිය පාරිභෝගිකයින්ට තම ප්‍රදේශයෙන් පිටත විදුලිය උත්පාදනය කරන පෞද්ගලික උත්පාදකයින්ගෙන් විදුලිය ලබා ගැනීමේ පහසුකම (power wheeling) ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය වෙත අවධානය යොමු කළ යුතු අතර, එමගින් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව අංශය සඳහා වෙළඳපොළ සාධක මත තීරණය කෙරෙනු ලබන මිල ගණන් සහතික කෙරෙනු ඇත. මේ අතර, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල වැඩිදියුණු කිරීම තුළින් විදුලිබල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, විදුලිබල උත්පාදන පහසුකම් වැඩිදියුණු කිරීම හා නවීකරණය කිරීම, සුහුරු ජාල කළමනාකරණය සහ විදුලිබලය ගබඩා කිරීමේ විසඳුම් වැඩිදියුණු කිරීම හරහා විදුලිබල හානිය අවම කිරීම සහ විදුලි සැපයුමේ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීම අවශ්‍ය වේ. මේ අතර, වාහනවල ඉන්ධන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා දෙමුහුන් තාක්ෂණ ආදිය හඳුන්වා දීම තුළින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කළ යුතු අතර, ප්‍රවාහන ක්ෂේත්‍රයට පිරිසිදු බලශක්ති ප්‍රභව යොදා ගැනීම සඳහා විකල්ප සෙවීම ද සිදු කළ යුතුය. තවද, ප්‍රවාහන ක්ෂේත්‍රයේ බලශක්ති පරිභෝජනය අවම කිරීම සඳහා පොදු ප්‍රවාහන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කෙරෙන ප්‍රතිපත්තිමය ප්‍රවේශයක් අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, නාගරික ප්‍රදේශවල පවතින වාහන තදබදය හේතුවෙන් සිදුවන බලශක්ති හානිය අවම කිරීම අරමුණු කර ගනිමින් පොදු ප්‍රවාහන ක්‍රම සහ මාර්ග යටිතල පහසුකම් නවීකරණය කිරීම සහ පුළුල් කිරීම කළ යුතුය. එමෙන්ම, බලශක්ති කාර්යක්ෂමතාව හා සංරක්ෂණ පියවර පිළිබඳ මහජනතාව අතර දැනුම්වත්භාවය වැඩි කිරීම සහ ගෘහ, ව්‍යාපාර හා කර්මාන්තශාලාවල බලශක්ති කාර්යක්ෂමතා ප්‍රමිති ක්‍රියාත්මක කිරීම තුළින් බලශක්තිය කාර්යක්ෂමව භාවිතා කිරීම ප්‍රවර්ධනය කෙරෙනු ඇත. සමස්තයක් ලෙස, අවහිරතාවකින් තොරව බලශක්තිය ලබා ගැනීමේ හැකියාව ඉහළ නැංවීම සහ වැඩිවන බලශක්ති ඉල්ලුම පාරිභෝගිකයින්ට දැරිය හැකි මිලකට ලබා දීම තුළින් බලශක්ති සුරක්ෂිතතාව සාක්ෂාත් කරගත හැකිය. ඊට අදාළව, සැපයුමේ සහ ඉල්ලුමේ සිදුවන හදිසි වෙනස්වීම්වලට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම සඳහා බලශක්ති අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම නුදුරු කාලය තුළ දී සිදු කළ යුතු ය. එසේම, දිගු කාලීනව ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්නයට අමතරව, ආර්ථික සංවර්ධනය සහ පාරිසරික අවශ්‍යතාවලට සරිලන පරිදි බලශක්ති සම්පාදනයට අවශ්‍ය ආයෝජන දිරිගැන්වීම ද අත්‍යාවශ්‍ය වේ.

රාජ්‍ය මූල්‍ය අංශයේ වගවීම ඉහළ නැංවීම සඳහා සහ රාජ්‍ය වියදම් කළමනාකරණය අධීක්ෂණය ශක්තිමත් කිරීම පිණිස ආයතනික සහ ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ සිදු කිරීම මෙන්ම නීති රීති බලාත්මක කිරීම ද අවශ්‍ය වේ. දශක දෙකකට පමණ පෙර ශ්‍රී ලංකාව විසින් රාජ්‍ය මූල්‍ය නීති බලාත්මක කළ ද, එම නීතිවලට අනුගත නොවීම, පසුගිය රජයන් විසින් සිදු කරන ලද විචක්ෂණශීලී නොවන කළමනාකරණයට හේතු වී ඇත. එබැවින්, යථාර්ථවාදී ඉලක්ක සහිත අනිවාර්යයෙන් ම පිළිපැදිය යුතු රාජ්‍ය මූල්‍ය නීති හඳුන්වා දීම සඳහා ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ සිදු කිරීමට අවශ්‍ය වන අතර, එම නීතිවලට අනුකූල වීමේ දී ඒ සඳහා වගකිව යුතු බලධාරීන් ද හඳුනාගත යුතුය. ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ, බලාත්මක කිරීමට නියමිත නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මගින් මුදල් අමාත්‍යාංශයේ සහ වියදම් සිදු කරන ආයතනවල කාර්යභාරය හා වගකීම් පැහැදිලි කෙරෙන අතර, තොරතුරු ලබා දීමේ සහ වගවීමේ අවශ්‍යතාවයන් ද එමගින් ස්ථාපිත කරනු ලබයි. මෙයට අමතරව, අයවැයෙන් වෙන් කර ඇති සීමාව තුළ වියදම් පවත්වා ගැනීමට පමණක් නොව, කාර්යක්ෂම බව සහ ඵලදායී බව ඉහළ නැංවීමට ද රජයේ ආයතන දිරිමත් කළ යුතුය. තවද, කාර්යසාධනය පදනම් කරගත් වගවීම සහ ඒ පිළිබඳ තොරතුරු මහජනයා වෙත හෙළිදරව් කිරීම රජයේ ආයතන සහ රජයේ නිලධාරීන් සඳහා හඳුන්වා දිය යුතු අතර විනිවිදභාවය ඉහළ නැංවීම, විශ්වාසනීයත්වය ඉහළ නැංවීම සහ යහපාලනයට සහාය වීම පිණිස විගණන කාර්යයන් තවදුරටත් ශක්තිමත් කළ යුතුය. තවද, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ, ජා.මූ. අරමුදලේ තාක්ෂණික සහාය ද ඇතිව, දූෂණයට එරෙහි එක්සත්

1

ජාතීන්ගේ සම්මුතියට අනුකූල වන පරිදි දූෂණ විරෝධී පනතක් හඳුන්වා දීමට නියමිතය. 2022 වසරේ දූෂණ සංජානන දර්ශකයේ [7] (Corruption Perception Index) රටවල් 180ක් අතරින් ශ්‍රී ලංකාව 101 වන ස්ථානයේ පසුවීමෙන් පැහැදිලි වන ආකාරයට, රට තුළ දූෂණය බහුල බවට ප්‍රචලිතව ඇති අදහස පිළිබඳව සැලකීමේ දී මෙවැනි පනතක් ගෙන ඒම ඉතාමත් ම සුදුසුය. දූෂණය පාලනය කිරීමේ ක්‍රියාමාර්ග සහ විනිවිදභාවය ඉහළ නැංවීමේ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම ද, ඵලදායී නොවන රාජ්‍ය වියදම් කපා හැරීමේ දී ඉතා වැදගත් වේ. එබැවින්, ඉදිරි කාලය තුළ රාජ්‍ය මූල්‍ය විචක්ෂණභාවය හා රාජ්‍ය මූල්‍ය අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා වන අඛණ්ඩ කැපවීම මෙන්ම දූෂණය පාලනය කිරීම සඳහා පියවර ගැනීම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග සඳහා මහජන සහයෝගය ලබා ගැනීමට සහ රාජ්‍ය මූල්‍ය අංශයේ සමස්ත තිරසරභාවය සහ විනය සහතික කිරීමට අත්‍යවශ්‍ය වේ.

භාණ්ඩ හා සේවාවල නවීනත්වය වැඩිදියුණු කිරීම කෙරෙහි අපනයන අංශයේ ප්‍රතිපත්ති අවධානය යොමු කිරීම මගින් දේශීය අගය එකතු කිරීම සහ අපනයන තරගකාරීත්වය ශක්තිමත් කළ යුතුය. 2022 වසරේ දී ශ්‍රී ලංකා ඉතිහාසයේ ඉහළම අපනයන ඉපැයීම් වාර්තා කළ ද, කලාපයේ සමාන ආර්ථිකයන් වාර්තා කළ අපනයන ආදායම් හා සැසඳීමේ දී එම ඉපැයීම් ඉතා සුළු අගයකි. කාලයක් මුළුල්ලේ නිෂ්පාදනයන්හි නවීනත්වයේ විශේෂ ප්‍රගතියක් නොපෙන්වීම සහ නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම නිසා රටේ තරගකාරීත්වය අඩු වීම හේතුවෙන් ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සඳහා වෙළඳපොළ කොටස් අහිමි වෙමින් පවතී. අපනයන ආදායම් සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පවතින සාපේක්ෂ වාසි තවදුරටත් වැඩිදියුණු කිරීම හරහා ඉහළ ගුණාත්මක නිපැයීම, ගෝලීය වෙළඳපොළ තුළ තරග කිරීමට උපකාරී වේ. අපනයන කර්මාන්ත, අපනයනයන්හි ප්‍රමාණාත්මක අවශ්‍යතාවන් සපුරාලන අතරම, අපනයන විවිධාංගීකරණය, අගය එකතු කිරීම, සන්නාමකරණය සහ අපනයනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම ඉලක්ක කර ගත යුතුය. අපනයන ප්‍රවර්ධන ප්‍රතිපත්ති මගින් මැදි කාලීන සිට දිගු කාලීනව, නවෝත්පාදන ඉලක්ක කර ගත් පර්යේෂණ සහ සංවර්ධන (R&D) කටයුතුවල සහාය ඇතිව, අඩු නිෂ්පාදන පිරිවැයකින් ඉහළ අගය එකතු කිරීමක් සහිතව වැඩි දියුණු කළ ගුණාත්මක භාණ්ඩ අපනයනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. අපනයන අංශයෙහි නවෝත්පාදන හඳුනා ගැනීමටත්, සරල නිෂ්පාදනවල සිට සංකීර්ණ නිෂ්පාදන දක්වා පරිවර්තනය වීමටත් පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වැඩිදියුණු කළ යුතුය. එසේම, ශ්‍රී ලංකාව කලාපීය සහ ගෝලීය සැපයුම් දාමයන් වෙත පිවිසීමේ සහ නැඟී එන වෙළඳපොළ ආර්ථිකයන්හි වෙළඳපොළ කොටස් අත්පත් කර ගැනීමේ අරමුණින් සිය නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවිය යුතුය. මීට අමතරව, යෙදවුම්වල ගුණාත්මකභාවය අවසාන නිමැවුමේ ගුණාත්මකභාවය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන බැවින්, ආනයනික අමුද්‍රව්‍ය සඳහා තරගකාරී ලෙස ආදේශ කළ හැකි ද්‍රව්‍ය නිපදවන වක්‍ර අපනයනකරුවන්ට සහ දේශීය කර්මාන්ත සඳහා රජය විසින් දිරිගැන්වීම් ලබා දීම අවශ්‍ය වේ. තවද, මෑත වර්ෂවල කෘෂිකාර්මික අපනයනවල දක්නට ලැබෙන පහළ යෑමේ ප්‍රවණතාවය, ගෝලීය වශයෙන් තරගකාරී වීමට කෘෂිකාර්මික නිෂ්පාදිතයන්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ වැදගත්කම අවධාරණය කරයි. මේ සම්බන්ධයෙන්, ගෝලීය වෙළඳපොළ තුළ ශක්තිමත් ගුණාත්මක සහ සන්නාම වාසි ඇති කර ගැනීම සඳහා අපනයන ඉලක්ක කරගත් කලාපයට විශේෂිත වූ කෘෂිකාර්මික භාණ්ඩ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. පර්යේෂණ සහ සංවර්ධන හැකියාව වැඩිදියුණු කිරීමට සහ අඩු පිරිවැයක් යටතේ නිෂ්පාදනය ඉහළ නැංවීම හරහා පරිමාණානුකූල පිරිමැසුම් ලබා ගැනීම සඳහා ගොවි සමිති (farmer societies) ක්‍රමවේදයන් භාවිත කළ හැක. ගොවි මට්ටමේ සහභාගීත්වය සමඟ ඉහළ අස්වැන්නක් සහ වඩා ගුණාත්මකභාවයකින් යුත් බෝග වර්ග වැඩිදියුණු කිරීම සඳහා ජාතික මට්ටමේ කෘෂිකාර්මික පර්යේෂණ ක්‍රමෝපාය සංවර්ධනය කිරීම අවශ්‍ය විය හැකිය. කෘෂිකාර්මික නිෂ්පාදිතවල පසු අස්වනු හානි අවම කිරීම සඳහා ප්‍රධාන කෘෂිකාර්මික කලාපවල වාණිජ සැපයුම් සහ ගබඩා පහසුකම් ස්ථාපිත කිරීම ප්‍රවර්ධනය කළ යුතුය. තවද, දියුණු අපනයන වෙළඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කරන අතර, ආයතනික ගුණාත්මකභාවය ඉහළ නැංවීම, නිදහස් හා ස්ථාවර වෙළඳ ප්‍රතිපත්ති පවත්වාගෙන යාම, අපනයන අංශයට විදේශීය සෘජු ආයෝජන ගලා ඒම් ප්‍රවර්ධනය කිරීම, අපනයනයන්හි ගුණාත්මක බව ඉහළ නැංවීමේ හැකියාව ඇති මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා හිතකර දේශීය පරිසරයක් නිර්මාණය කිරීම කෙරෙහි ප්‍රතිපත්ති මගින් අවධානය යොමු කළ යුතුය.

7 දූෂණය අවම මට්ටමක ඇති රට දූෂණ සංජානන දර්ශකයේ පළමු ස්ථානයට පත් වේ.

ජාතික වෙළඳ ප්‍රතිපත්තිය සැලකිය යුතු ආකාරයෙන් නැවත දිශානතිගත කිරීම තුළින් අපනයන කරා වඩාත් කේන්ද්‍රගතවීමටත් සහ ආනයන මත අධික ලෙස යැපීමෙන් ඉවත් වීම සඳහාත් අවශ්‍ය ව්‍යුහාත්මක ගැළපීම් සඳහා කැපකිරීම් කිරීමට රටට අවශ්‍ය වේ. ශ්‍රී ලංකාව පරිභෝජන හා ආයෝජන අවශ්‍යතා සඳහා සහ ප්‍රධාන අපනයන හා දේශීය නිෂ්පාදනය සඳහා අවශ්‍ය යෙදවුම් සඳහා ආනයන මත දැඩි ලෙස රඳා පවතී. 2009 වසරේ සිට ආනයන වියදම දෙගුණයකට ආසන්න ප්‍රමාණයකට වැඩි වී ඇත. මේ අතර, සාම්ප්‍රදායික කෘෂිකාර්මික අපනයනවලට සහ ඇඟලුම් වැනි අඩු එකතු කළ අගයක් සහිත කාර්මික අපනයනවලට සීමා වූ අපනයන පැසෙහි සංයුතිය දශක ගණනාවක් පුරා එක ලෙසම පැවතුණි. 2018 වසරේ ජූලි මාසයේ දී ක්‍රියාත්මක කරන ලද 2018-2022 යන කාලපරිච්ඡේදය සඳහා වන සංශෝධිත ජාතික අපනයන ක්‍රමෝපාය, නවෝත්පාදන සහ ආයෝජන මගින් මෙහෙයවනු ලබන අපනයන කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම අරමුණු කර ගෙන ඇත. සේවා පහසුකම්, වෙළඳ තොරතුරු හා ප්‍රවර්ධනය, ජාතික තත්ත්ව යටිතල පහසුකම් සහ නවෝත්පාදනය හා ව්‍යවසායකත්වය තුළින් සියලුම අපනයන අංශ සඳහා වන ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීම එමගින් අපේක්ෂා කරන ලදී. ජාතික අපනයන ක්‍රමෝපායෙහි විශේෂිත අරමුණ වූයේ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (IT/BPO) සහ පුද්ගල සුවතාවය හා සබැඳුණු සංචාරක කර්මාන්තය (Wellness tourism) ඇතුළුව අපනයන අංශ හයක නවෝත්පාදනය සහ විවිධාංගීකරණය ප්‍රවර්ධනය කිරීමයි. අපනයන කර්මාන්ත සඳහා ශ්‍රම සැපයුම හා සම්බන්ධ ගැටලු විසඳීම, ආනයන ප්‍රතිපත්තිවල ස්ථාවරභාවය, පැහැදිලි හා විනිවිදභාවයෙන් යුත් බදු ප්‍රතිපත්ති, ශ්‍රී ලංකාව වෙත ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා විදේශීය රජයන් වෙත යොමුවීම සහ තරුණ පරපුර අතර ව්‍යවසායකත්වය වර්ධනය කිරීම වෙළඳ අංශය සම්බන්ධයෙන් කඩිනමින් සැලකිය යුතු ප්‍රමුඛතා අතර වේ. ගෙවුම් තුලන අර්බුද මධ්‍යයේ ආනයන සීමා කිරීමට සහ අත්හිටුවීමට ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වූ නමුත්, ආනයන මත යැපීම අඩු කිරීමෙන් සහ ආර්ථිකය තුළ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමෙන් අනාගතයේ දී එවැනි තාවකාලික පියවර වළක්වා ගත හැකිය. සුදුසු අතරමැදි යෙදවුම් සඳහා පසු මෙහෙයුම් ඒකාබද්ධ කිරීම, පැහැදිලිව හඳුනාගත් අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ දේශීය ආදේශන මගින් අධෛර්යමත් කිරීම, ආනයන සඳහා ලබා දී ඇති සහන ඉවත් කිරීම සහ වෙළඳපොළ මගින් තීරණය වන නම්‍යශීලී විනිමය අනුපාතයක් පවත්වා ගැනීම මෙහිදී වැදගත් අංගයන් වේ.

දිගින් දිගටම බලයට පත් සෑම රජයක් විසින්ම රටේ සංවර්ධන උපායමාර්ගවල මූලික ප්‍රමුඛතාවය ලෙස විදේශීය ඍජු ආයෝජන හඳුනාගෙන තිබුණ ද, පසුගිය දශක කිහිපය තුළ විදේශීය ඍජු ආයෝජනවල ප්‍රමාණය සහ වර්ධනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අත්දැකීම් පිළිබඳව සෑහීමකට පත් විය නොහැක. 2010 වසරේ සිට විශාල ලෙස බදු විරාම ලබා දී තිබියදීත්, ඍජු ආයෝජන ව්‍යවසායයන් සඳහා ලැබුණු විදේශීය ණය ද ඇතුළුව, විදේශීය ඍජු ආයෝජන ලෙස සාමාන්‍යයෙන් වසරකට ශ්‍රී ලංකාවට ලබාගත හැකි වූයේ ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.2ක් පමණි. එසේම, කලාපයේ අනෙකුත් රටවල් හා සසඳන විට, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස විදේශීය ඍජු ආයෝජන ඉතා පහළ මට්ටමක පවතී. මීට අමතරව, ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්තමාන තත්ත්වය සැලකූ විට, ආර්ථික ක්‍රියාකාරකම්වලට සිදුවන බාධා, ඉහළ සමාගම් ආදායම් බදු අනුපාත, ශ්‍රමය සහ උපයෝගිතා ඇතුළු ඉහළ නිෂ්පාදන පිරිවැය, පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය, පහසුවෙන් ලබාගත හැකි සුදුසු ඉඩම් නොමැතිකම, නිලධාරිවාදී හා බහු අනුමැතීන් අවශ්‍ය වන ක්‍රියාපටිපාටි සහ වංචා දූෂණවලට ඇති ඉඩකඩ හේතුවෙන් සමාගම්වලට ඔවුන්ගේ ප්‍රධාන සමාගම් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීමට ඇති දිරිගැන්වීම් ඉතා අල්ප වේ. මෙම අංශයට අදාළ ආයතනික ව්‍යුහය විධිමත් කිරීම සඳහා ආයෝජන මණ්ඩලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය සඳහා වන යෝජිත ඒකාබද්ධ කිරීම වැනි රජයේ මෑතකාලීන ප්‍රයත්න, ඇගයීමට ලක් කළ යුතු පියවර වේ. එහෙත්, ආයෝජන ආකර්ෂණය කර ගැනීමට සහ කාර්යක්ෂම ලෙස අනුමැතිය ලබා ගැනීමට එවැනි අධිකාරීන් බල ගැන්වීම අත්‍යවශ්‍ය වේ. මේ අතර, බලශක්ති සුරක්ෂිතතාව, ආහාර සුරක්ෂිතතාව සහ අපනයන ඉලක්ක කරගත් කර්මාන්ත වැනි සමස්ත ආර්ථිකයට පුළුල් ලෙස බලපෑම් ඇති කරනු ලබන උපාය මාර්ගික ආයෝජන ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍යන සම්පාදනය කිරීම සඳහා මිත්‍ර රටවල් සමග සමීපව කටයුතු කිරීම ආයෝජන අවස්ථා ගවේෂණය කිරීමට උපකාරී වනු ඇත. රටේ ආයෝජන අවශ්‍යතා පැහැදිලිව හඳුනාගෙන අනාගත ආයෝජකයින් ප්‍රවර්ධනය කළ යුතු අතර, එක් ස්ථානයකින් සියලු කටයුතු සිදු කරගැනීමේ හැකියාව (one-stop shop approach) සහිත ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන් එවැනි ආයෝජන අනුමත

1

කිරීම් සහ ක්‍රියාත්මක කිරීම් කඩිනම් කළ යුතුය. මේ සම්බන්ධයෙන්, 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී ආයෝජන මණ්ඩලය යටතේ ආයෝජක පහසුකම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම ප්‍රශංසනීය මුල පිරීමකි. ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සහ ආයෝජකයින්ගේ පහසුව සඳහා අන්තර් සම්බන්ධතා සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම හරහා ආයෝජකයන්ට කාර්යක්ෂම සේවාවක් සැපයීමට ආයෝජක පහසුකම් මධ්‍යස්ථානය කැපවී සිටී. වගකීම් පදනමකින් නොවන ආයෝජන ප්‍රවාහ ඉදිරි කාලපරිච්ඡේදය තුළ ආකර්ෂණය කරගැනීම ශ්‍රී ලංකාවේ ආර්ථික පුනර්ජීවන සඳහා වූ උපායමාර්ගයෙහි එක් වැදගත් අංගයක් විය යුතුය.

ශ්‍රී ලංකාව සංචාරක ව්‍යාපාරය වේගවත් ලෙස ප්‍රවර්ධනය කරන කාලයක දී සංචාරක පැමිණීම් ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග සහ සංචාරක ඉපැයීම් ග්‍රහණය කර ගැනීම සඳහා විධිමත් ජාලයක් ඇති කිරීම කඩිනමින් අවශ්‍ය වේ. විදේශ විනිමය ඉපැයීම් සඳහා ශ්‍රී ලංකාව සංචාරක ක්ෂේත්‍රය මත දැඩි ලෙස රඳා පවතින අතර, 2011 වසරේ සිට මුහුණ දෙන විශාල වෙළඳ ගිණුමේ හිඟයෙහි පීඩනය අර්ධ වශයෙන් සමනය කර ගැනීමට සංචාරක ඉපැයීම් භාවිත කරයි. සංචාරක පැමිණීම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් පවතින බැවින් සංචාරක ඉපැයීම්වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට රට උත්සාහ කළ යුතුය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) විසින් සංචාරක කර්මාන්තයෙන් ලැබෙන විදේශ විනිමය පිළිබඳ ඇස්තමේන්තුව සම්පාදනය කරනු ලබන්නේ, හෝටල් මගින් හා සංචාරකයින් රටින් පිටවීමේ දී ගුවන්තොටුපළ තුළ සිදු කරන සමීක්ෂණයක් මගින් සපයා ගන්නා දත්ත මත පදනම්ව සංචාරකයෙකු ගත කරන සාමාන්‍ය ආගන්තුක රාත්‍රී සංඛ්‍යාව සහ සංචාරකයෙකු ශ්‍රී ලංකාවේ දිනකට සාමාන්‍යයෙන් කොපමණ මුදලක් වැය කරන්නේද යන්න මතය. සංචාරකයින් රටින් පිටවීමේ දී ගුවන්තොටුපළ තුළ සිදු කරන සමීක්ෂණය මගින් තීරණය කරනු ලබන සංචාරකයෙකුගේ දෛනික වියදම, කලාපයේ අනෙකුත් බොහෝ ජනප්‍රිය සංචාරක ගමනාන්තවලට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා අතර එමගින් එහි නිරවද්‍යතාවය පිළිබඳ සැක මතු වී ඇත. එසේම, අනෙකුත් බොහෝ සාධක අතරින් විවිධ සංචාරක කාණ්ඩ, නවාතැන් පහසුකම් වර්ග, සංචාරකයින් පැමිණෙන රටේ ස්වභාවය ආදිය අනුව සංචාරකයෙකුගේ දෛනික වියදම් වෙනස් විය හැකිය. එබැවින්, සංචාරක කර්මාන්තයෙහි නියුතු එක් එක් පාර්ශ්වකරුවන්ගේ ඉපැයීම් නිවැරදිව හඳුනා ගැනීමට සුදුසු තොරතුරු ජාලයක් අත්‍යවශ්‍ය වේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි තාක්ෂණික මඟපෙන්වීම යටතේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ සහයෝගයෙන් ස්ථාපනය කරන සංචාරක සැටලයිට් ගිණුම්කරණය (Tourism Satellite Accounting) ශ්‍රී ලංකාවේ තවමත් සංවර්ධනය වෙමින් පවතින අතර, එමගින් සංචාරක ඉපැයීම් පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට සහාය විය හැකිය. තවද, බොහෝ සංචාරකයින් එයාර් බී ඇන්ඩ් බී (Airbnb), අගොඩා (Agoda) සහ බුකින් ඩොට් කොම් (Booking.com) වැනි විදේශීය වෙබ් අඩවි හරහා තම නවාතැන් වෙන්කරවා ගන්නා බැවින් එම වෙබ් අඩවි සංචාරක තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇත. මේ අතර, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරකයින් සඳහා නවාතැන් වෙන්කරවා ගැනීමට සහ සංචාරක සම්බන්ධ තොරතුරු ලබා ගැනීම සඳහා සංචාරක යෙදුමක් (tourism travel app) සංවර්ධනය කරමින් පවතී. කෙසේ වෙතත්, සංචාරකයින් නවාතැන් පහසුකම් වෙන් කිරීමේ දී, විශේෂයෙන්ම ගෙවීම් සිදු කිරීම, පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම සහ ඉහළ වට්ටම් ලබා ගැනීම සඳහා ජනප්‍රිය යෙදුම් විශ්වාස කරයි. එම නිසා, ජාත්‍යන්තර වෙබ් අඩවි හා යෙදුම් මෙන්ම මෙම වෙබ් අඩවි හා යෙදුම්වල ලැයිස්තුගත කර ඇති අවිධිමත් නවාතැන් සපයන්නන්ගෙන් නවාතැන් පහසුකම් වෙන්කරවා ගැනීම් හරහා රටට විදේශ විනිමය ගලා ඒම සහතික කිරීමේ ක්‍රමවේද සොයා ගන්නා අතරම, දේශීය වශයෙන් නවාතැන් සහ ප්‍රවාහන පහසුකම් වෙන්කරවා ගැනීමේ වෙබ් අඩවි සහ යෙදුම් සංවර්ධනය කිරීම අවශ්‍ය වේ. තවද, සංචාරක කර්මාන්තයට සම්බන්ධ සියලුම පාර්ශ්වයන්හි විදේශ විනිමය ඉපැයීම් වාර්තා ලබාගෙන ඒවා බැංකු පද්ධතියට ඇතුළත් කිරීමට නිසි යාන්ත්‍රණයක් අවශ්‍ය වන අතර, සංචාරක අංශයේ ඉහළ මට්ටමේ අවිධිමත් බව තුරන් කිරීම සඳහා ලියාපදිංචි නොකළ ආයතන පද්ධතියට ඇතුළත් කිරීම කඩිනම් කළ යුතුය.

වෘත්තිකයන් සහ පුහුණු ශ්‍රමිකයන් විශාල වශයෙන් සංක්‍රමණය වීම හේතුවෙන් ඇතැම් කර්මාන්තවල ශ්‍රම හිඟයක් මෙන්ම ඵලදායීතාවේ සැලකිය යුතු පහළ යෑමක් ඇතිවිය හැකි අතර, එය රට යථා තත්ත්වයට පත් වෙමින් සිටින අවධිය තුළ සහ ඉන්පසු කාලය තුළ රටේ ආර්ථික වර්ධනයට සැලකිය යුතු ලෙස බලපානු ඇත. උග්‍ර ආර්ථික අර්බුදය හේතුවෙන් වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, බැංකුකරුවන් සහ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් වැනි වෘත්තීය සුදුසුකම් ලත් පිරිස් විශාල වශයෙන් විදේශගත වී ඇත. ශ්‍රී ලංකා විදේශ සේවා

නියුක්ති කාර්යාංශයේ සංඛ්‍යා ලේඛනවලට අනුව, විදේශ රැකියා සඳහා ලියාපදිංචි වූ පිටත්ව යෑම් සංඛ්‍යාව 2015-2019 අතර වාර්ෂික සාමාන්‍යය වන 226,510ට සාපේක්ෂව 2022 වසරේ දී 311,056ක් දක්වා සියයට 37කින් වැඩි වී ඇති අතර, වෘත්තීය සංක්‍රමණිකයන්ගේ අනුරූප ඉහළ යෑම සියයට 87ක් ඉක්මවා ඇත. නිල සංඛ්‍යාලේඛන සීමිත වුව ද, රැකියා සඳහා පිටත්වන තාවකාලික සංක්‍රමණවලට අමතරව ස්ථිර වශයෙන් මානව ප්‍රාග්ධන සංක්‍රමණය වීම් 2022 වසරේ සිට කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇත. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පවතින සංඛ්‍යාලේඛන මගින් තවදුරටත් අනාවරණය වන පරිදි, වෘත්තීය සංක්‍රමණ, සමස්ත ශ්‍රම සංක්‍රමණවල ප්‍රතිශතයක් ලෙස, සාමාන්‍ය වශයෙන් සියයට 20කට වැඩි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින්, පශ්චාත් යුධ සමයේ ක්‍රමානුකූලව ඉහළ යමින් පවතී. මෙමගින් ශ්‍රී ලංකාවේ බුද්ධිගලනය වත්මන් ආර්ථික අර්බුදයට බොහෝ කලකට පෙර සිට සිදුවන බව පෙනී යයි. වත්මන් තත්ත්වය තුළ, ශ්‍රී ලාංකිකයන්ගේ සංක්‍රමණය වීම සඳහා ආර්ථිකය සංකෝචනය වීම හේතුවෙන් ආර්ථික හා මූල්‍ය අවිනිශ්චිතතා මධ්‍යයේ මූර්ත වැටුප් පහළ යෑම සහ ජීවන තත්ත්වය පහත වැටීම හේතු වී ඇත. සමාජ ආර්ථික තත්ත්ව පිරිහීම සඳහා සෞඛ්‍යය සේවා, නීති ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය පරිපාලනය, පොදු ප්‍රවාහනය ආදී අංශවල ආයතනික යටිතල පහසුකම් දැඩි ලෙස දුර්වල තත්ත්වයට පත්කිරීමට හේතු වූ දිගු කාලීන ව්‍යුහාත්මක ගැටලු ද හේතු වී ඇත. සේවා නියුක්තිකයින් විශාල වශයෙන් රටින් සංක්‍රමණය වීම මගින් ව්‍යාපාර කටයුතු දුර්වල කෙරෙන අතර එමගින් ප්‍රවීණයින් අහිමි වීම හේතුවෙන් නව සේවකයින් අබණ්ඩව පුහුණු කිරීමේ අවශ්‍යතාවයක් ඇති කරනු ලබයි. ඒ සඳහා සැලකිය යුතු කාලයක් හා සම්පත් අවශ්‍ය වන අතර එය කෙටි කාලීනව ධාරිතාවය හා නිමැවුම අහිමි වීමට හේතු වේ. නව සේවකයින් බඳවා ගනිමින් පුහුණු කිරීම සඳහා දැරීමට සිදුවන සැපයුම් පිරිවැය එම සේවකයින් ප්‍රශස්ත මට්ටමකට පුහුණු කරන තෙක් නිෂ්පාදිතය අහිමි වීමේ පිරිවැයෙන් සියයට 20කට වඩා ඉක්මවන බව ඇතැම් අධ්‍යයන මගින් පෙන්වා දී ඇත.[8] විශේෂයෙන්ම, සමස්ත වයස්ගත ජනගහනය පිළිබඳ සලකා බැලීමේදී පුහුණු ශ්‍රමිකයන් විශාල වශයෙන් සංක්‍රමණය වීම හේතුවෙන්, රටේ ඵලදායීතාව අහිමි වීමෙන් සැලකිය යුතු අන්දමේ දිගු කාලීන බලපෑම් ඇති විය හැකිය. පර්යේෂණවලට අනුව, බුද්ධිගලනය හේතුවෙන් ඇතිවන සම්බන්ධතා දියුණුවීම, නිපුණතා හුවමාරුව සහ විදේශීය ප්‍රේෂණ ඉහළ යෑම රටකට ධනාත්මකව බලපායි.[9] කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ පවතින තත්ත්වය තුළ බුද්ධිගලනය මගින් ඇති කරන අයහපත් ප්‍රතිඵල එවැනි ප්‍රතිලාභවලට වඩා වැඩි විය හැකිය. මෑතක දී සංක්‍රමණය වූ බොහෝ පුද්ගලයන්, සැලකිය යුතු ව්‍යවසායකත්ව හැකියාවක් ඇති ජාත්‍යන්තරව රැකියා කළ හැකි සහ ඉහළ සුදුසුකම්ලත් පුද්ගලයන්ය. එබැවින් ඇතැම් අවස්ථාවල දී, ඔවුන්ගේ සංක්‍රමණය වීම් අපනයන ව්‍යාපාර ඇතුළුව සමස්ත ව්‍යාපාර ප්‍රතිස්ථාපනය කිරීම හෝ වසා දැමීම සඳහා හේතු විය හැකිය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එවැනි සංක්‍රමණයවීම්වල ආර්ථික පිරිවැය, අදාළ පුද්ගලයන්ගේ සෘජු දායකත්වය අහිමි වීමෙන් ඇතිවන අහිතකර ප්‍රතිඵල ඉක්මවිය හැකිය. වෘත්තිකයන් හිඟ වීම හේතුවෙන් නිපුණතා මට්ටම් පහළ ගොස් බොහෝ ආයතනවල අඩු මට්ටමක පවතින කාර්යක්ෂමතාව තවදුරටත් දුර්වල වීම මගින් ඉදිරි කාලපරිච්ඡේදය තුළ රාජ්‍ය අංශය කෙරෙහි බහුවිධ බලපෑම් ඇති කළ හැකිය. රාජ්‍ය සේවකයන්ට විදේශ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට ඉඩ සැලසීම වැනි රාජ්‍ය අංශයේ මෑත කාලීනව හඳුන්වා දී ඇති වෙනස්කම් මගින් මෙම ගැටලු තවදුරටත් උග්‍ර විය හැකි නමුත් එම ගැටලු සංක්‍රමණික පිරිස් රැකියාව සිදු කරන ලද ආයතනය, නිපුණතා මට්ටම සහ ප්‍රවීණත්වය අනුව සැලකිය යුතු ලෙස වෙනස් විය හැකිය. මෙම ශ්‍රමිකයන්ගේ දායකත්වය අහිමි වීම හේතුවෙන් දැරීමට සිදුවන ආර්ථික පිරිවැයට අමතරව අධ්‍යාපනය සහ සෞඛ්‍යය සේවා නොමිලේ ලබාදීම සඳහා සිදු කරන ලද ආයෝජනවලින් ප්‍රමාණවත් ප්‍රතිලාභයක් නොලැබීම හේතුවෙන් රටට සැලකිය යුතු අලාභයක් සිදු වේ. බොහෝ අංශවල දුර්වලතා පැවතිය ද විශ්වවිද්‍යාල මට්ටම දක්වා සිය පුරවැසියන්ට නොමිලේ අධ්‍යාපනය ලබා දෙන ලෝකයේ සීමිත රටවල් කිහිපයක් අතර ශ්‍රී ලංකාව ද සිටී. කෙසේ වෙතත්, මෙම සුවිශාල ආයෝජනයේ පූර්ණ ප්‍රතිලාභ රටට ලබා ගැනීමට නොහැකි වී ඇති අතර, ඒ සඳහා බුද්ධිගලනය ද ප්‍රධාන සාධකයක් වී ඇත. මෙම ගැටලු මධ්‍යයේ ඇතැම් අංශ විසින් සිය සේවකයන් ආයතනය තුළ රඳවා තබා ගැනීම සඳහා වැටුප් වැඩිකිරීම සහ නම්‍යශීලී රැකියා තත්ත්ව, බදු බර අඩුකිරීම සඳහා මුදල් නොවන ප්‍රතිලාභ ලබා දීම, උද්ධමනයට අනුරූපව වැටුප් වැඩි කිරීම සහ එ.ජ. ඩොලරයට සාපේක්ෂව වැටුප් ලබා දීම

8 Oxford Economics, (2014). The cost of brain drain: understanding the financial impact of staff turnover, February [Online] (Accessed 22 March 2023).

9 Docquier, F. and Rapoport, H., (2012). Globalization, brain drain, and development. Journal of Economic Literature, Vol. 50, No. 3.; Gibson, J. and McKenzie, D., (2012). The economic consequences of 'brain drain' of the best and brightest: Microeconomic evidence from five countries. The Economic Journal, Vol. 122, No. 560.

1

ඇතුළු අනෙකුත් ප්‍රතිලාභ ලබාදීම වැනි කෙටි කාලීන ක්‍රියාමාර්ග කිහිපයක් අනුගමනය කර ඇත. පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ඇතිවන ගැටලු විසඳීම සඳහා එවැනි කෙටි කාලීන ක්‍රියාමාර්ග සහාය විය හැකිය. කෙසේ වෙතත්, තිරසාර වර්ධනයක් ඇති කිරීම ඇතුළුව ජීවන තත්ත්වයට බලපාන ආර්ථිකයේ දිගු කාලීන ව්‍යුහාත්මක දුර්වලතා නිවැරදි කිරීම, පසුගිය වසර තුළ වේගවත් වූ බුද්ධිගලනය විශාල වශයෙන් ඉහළ යෑම අවම කිරීම සඳහා අත්‍යවශ්‍ය වනු ඇත. තවද, සංක්‍රමණය වීම් මධ්‍යයේ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය වීමට අවශ්‍යතා ඇති අංශ සඳහා නුදුරු කාලීනව විදේශීය පුහුණු ව්‍යක්තිකයන් සඳහා රට විවෘත කිරීමේ හැකියාව රජයට සොයා බැලිය හැකිය. එවැනි ප්‍රයත්න ඇතුළුව, විශේෂ ප්‍රතිලාභ යෝජනා ක්‍රම සහ සුදුසුකම්ලත් පුද්ගලයින්ට පර්යේෂණ සඳහා අරමුදල් ලබාදීම වැනි ඉලක්කගත ක්‍රියාමාර්ග තුළින් සංක්‍රමණික ව්‍යක්තිකයින් නැවත මෙරටට පැමිණීමට පෙළඹවිය හැකිය.

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය මෑත කාලීනව පැවති සහ වර්තමානයේ පවතින ආර්ථික අර්බුදවල දී ආර්ථිකයේ වඩාත්ම බලපෑමට ලක් වූ අංශය වන අතර, සමස්ත ආර්ථික සංවර්ධනය සහ සුබසාධනය සඳහා එම අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමේ වැදගත්කම අවධාරණය කරයි. 2019 වසරේ සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාර, 2020 සහ 2021 වසරවල දී කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීම සහ ඉන් පසුව 2022 වසරේ දී ඇති වූ ආර්ථික අර්බුදය වැනි පසුගිය වසර කිහිපය තුළ අඛණ්ඩව පැවති අහිතකර සිදුවීම් හේතුවෙන්, ශ්‍රී ලංකා ආර්ථිකය සඳහා ප්‍රධාන වශයෙන් දායක වන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය අභියෝග රැසකට මුහුණ දුන්නේය. ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍ර තුළ ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වය කෙරෙහි, අවිනිශ්චිතතා මධ්‍යයේ ඉල්ලුම පහළ යෑම, ඉහළ උද්ධමනය සහ වේතන, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම, නිෂ්පාදන අමුද්‍රව්‍ය හිඟ වීම, විදුලිබලය සහ අනෙකුත් උපයෝගිතා සේවාවලට අවහිරතා ඇති වීම සහ මූල්‍ය පිරිවැය ඉහළ යෑම ආදී සාධක මගින් දැඩි ලෙස බලපෑම් ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ජාතික නිෂ්පාදනය, රැකියා සහ ජීවනෝපායන් දැඩි බලපෑමට ලක් වූ අතර, මෙම දුෂ්කර කාලය තුළ දී ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සඳහා සහාය වීමට ගත යුතු ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය ඇති විය. මුදල් ප්‍රවාහ සඳහා පැවති අභියෝග තාවකාලිකව විසඳීමට, ලබා ගත් ණය සඳහා සහන සැලසීම මෙන්ම ණය ආපසු ගෙවීම සඳහා සහන කාලයක් ලබා දීම වැනි ක්‍රියාමාර්ග කිහිපයක් මෙම අංශය වෙත හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත්, අහිතකර මූල්‍ය හා ආර්ථික තත්ත්වයන්ට මුහුණදීම සඳහා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ධාරිතාව සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමට දිගු කාලීන විසඳුම් අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල මුදල් අවශ්‍යතා සලකා බැලීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස හඳුනාගෙන ඇති ණය ඇපකර ආයතනයක් (Credit Guarantee Institution) පිහිටුවීම එහි අවසන් අදියර වෙත ළඟා වී ඇති අතර එය කඩිනමින් ස්ථාපිත කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ණය ඇපකර ආයතනය ක්‍රියාත්මක වූ පසු ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මුදල් ලබා ගැනීමේ අවශ්‍යතා පිළිබඳ පවතින බාධා ඉදිරියේ දී සැලකිය යුතු ලෙස අඩු වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එම අංශය ආශ්‍රිත ණය අවදානම් බෙදීයෑමක් සිදු වන බැවින් සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ණය ලබා දීම දිරිමත් කෙරෙනු ඇත. මීට අමතරව, බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන ද සිය ණය ලබා දීමේ කටයුතුවල දී මෙම ව්‍යාපාර ප්‍රමුඛතා අංශයක් ලෙස හඳුනා ගනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් ද එම අංශය වෙත අරමුදල් ලැබෙනු ඇත. දේශීය ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, මහා පරිමාණ ව්‍යවසායයන් බවට පත්වීමට සහාය වීම සඳහා අදාළ බලධාරීන් විසින් දැනට පවතින ජාත්‍යන්තර සබඳතා භාවිත කිරීම සහ නිදහස් වෙළඳ ගිවිසුම් තුළින් ප්‍රතිලාභ ලබා ගැනීම සිදු කළ යුතු අතර, එමගින් මෙම ව්‍යාපාර ගෝලීය අගය දාමයන්ට මෙන්ම ජාත්‍යන්තර වෙළඳාම සමඟ ද අනුකූල වීමට අවස්ථාව සැලසිය යුතුය. එවැනි අවස්ථා, එම ව්‍යාපාරවලට ගෝලීය ප්‍රමිතීන් කරා ළඟා වීමට උපකාරී වෙමින් රටට විදේශ විනිමය ගලා ඒම ඉහළ නැංවීමට ද දායක වනු ඇත. මෙම ප්‍රයත්නයට සහාය වීම සඳහා මූල්‍ය හා තාක්ෂණික දැනුම වැඩිදියුණු කිරීමට පියවර ගත යුතු අතර, ජාත්‍යන්තර වෙළඳපොළ වෙත පිවිසීම සඳහා සහාය වන විද්‍යුත් වාණිජ්‍ය (e-commerce) තාක්ෂණ භාවිත කිරීම සඳහා අවශ්‍ය හැකියාව සහ ධාරිතාව ඉහළ නැංවීමට ද පියවර ගත යුතුය. එසේම, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ වර්ධනය වැඩිදියුණු කිරීම සඳහා රජය සහ අදාළ බලධාරීන් විසින් නීති, රෙගුලාසි සහ නිලධාරිවාදී ගැටලු අවම කිරීම මගින් ව්‍යවසායකත්ව පරිසරයක් සහ පසුබිමක් නිර්මාණය කළ යුතුය. ඉහත ක්‍රියාමාර්ග ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට සිය ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට, අහිතකර සමාජ-ආර්ථික ප්‍රවණතා මගින් ඇති වන අභියෝග ජය ගැනීමට සහ

ශ්‍රී ලංකාවේ අභිවෘද්ධියට දායක වන අත්‍යවශ්‍ය ව්‍යාපාරික ආයතන ලෙස ගොඩනැගීමට උපකාරී වන නමුත්, එම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා සැමට එක ලෙස සලකා කටයුතු කිරීම ප්‍රශස්ත ක්‍රමවේදයක් නොවනු ඇත. ශක්‍යතාවයකින් තොර සහ ඵලදායීතාව අඩු ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට සහාය වීම අහිතකර මෙන්ම ඉහළ පිරිවැයක් ගන්නා බැවින් එවැනි ව්‍යාපාරවලින් වෙන් කර ආර්ථිකයට ධනාත්මක දායකත්වයක් දක්වන වර්ධන විභවතාවයක් සහිත බලපෑමට ලක් වූ ව්‍යාපාර හඳුනා ගැනීමට යාන්ත්‍රණයක් ක්‍රියාත්මක විය යුතු අතර, එමගින් ප්‍රතිලාභ සහිත ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට සහාය වීම ඉලක්කගත කළ හැකිය. තවද, විශේෂයෙන්ම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට අදාළව බුන්වත්භාවයට අදාළ නීති (insolvency laws) ස්ථාපිත කිරීම සහ තවදුරටත් ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ.

ආනයනික භාණ්ඩ මිල ගණන්වල පසුගිය කාලයේ දී වාර්තා වූ අධික ඉහළ යෑම සමඟ සැසඳීමේ දී, එම මිල ගණන් විදේශීය වෙළඳපොළෙහි පහළ යන විට ඊට සාපේක්ෂව දේශීය මිල ගණන් පහළ යෑමෙහි පවතින ප්‍රමාදය ජීවන වියදම පහත හෙළීමට බාධා විය හැකිය. පසුගිය වසරක පමණ කාලය තුළ, බනිජ තෙල්, ගෑස් සහ අනෙකුත් ආනයනික භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය කිහිපයක මිල ගණන් තියුණු ලෙස ඉහළ ගිය අතර ඒ සඳහා ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම පූර්ණ වශයෙන් හෝ ඊටත් වඩා වැඩියෙන් දේශීය මිල ගණන් වෙත ක්ෂණිකව සම්ප්‍රේෂණය වීම සහ දේශීය මුදල් අවප්‍රමාණය වීම හේතු විය. කෙසේ වෙතත්, ගෝලීය මිල ගණන් පහළ යෑම, සැපයුම් පිරිවැය අඩු වීම, මෙහෙයුම් පිරිවැය සංශෝධනය වීම සහ මෑත කාලීනව විනිමය අනුපාතිකයේ සිදු වූ වැඩිදියුණුවීම් සැලකිය යුතු කාල සීමාවක් ඉක්ම ගිය ද ආනයනික භාණ්ඩ හා සේවා මිල ගණන්වල ප්‍රමාණවත් පරිදි නිරූපණය වී නොමැත. පැරණි භාණ්ඩ තොගවල ඉහළ පිරිවැය, පෙර එකඟ වන ලද ගිවිසුම්, ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම් කෙරෙහි ඇති සීමිත විශ්වාසය හා ධනාත්මක ප්‍රවණතාවල තිරසාරභාවය පිළිබඳව පවතින අවිනිශ්චිතතා සහ ඉල්ලුම අඩු වීම හේතුවෙන් අහිමිවන ආදායම කිසියම් දුරකට පියවා ගැනීමට කටයුතු කිරීම වැනි සාධක හේතුවෙන් වෙළඳුන් මිල සංශෝධන සිදු කිරීමට පසුබට වන වාතාවරණයක් තුළ, රටෙහි ආර්ථික තත්ත්වයන් සම්බන්ධයෙන් වර්තමානයේ පවතින අවිනිශ්චිතතාව මෙම මිල ගණන් පහළ යෑමෙහි පවතින ප්‍රමාදය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය හැකිය. කෙසේ වෙතත්, සමස්ත ආර්ථික තත්ත්වයන්හි ස්ථායීතාව යථා තත්ත්වයට පත් වීමත් සමඟ, ආර්ථිකයට එහි පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීමට නම්, ආනයන ආශ්‍රිත ඇතැම් භාණ්ඩ හා සේවාවල ඉහළ ගිය මිල ගණන් පහළ දැමීම සිදු විය යුතුය. සුදුසු පරිදි මිල ගණන් සංශෝධනය වීමත් සමඟ ඉල්ලුම් තත්ත්වයන් ද සාමාන්‍යකරණය වනු ඇති බැවින්, එවැනි මිල සංශෝධන සියලු පාර්ශ්ව සඳහා ප්‍රතිලාභ ළඟා කරනු ඇත. මේ අතර, ගෝලීය මිල ප්‍රවණතා දේශීය ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය කරන මූලික මාර්ග යක් වන බලශක්ති මිල සංශෝධන මේ සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය සාධකයකි. ගෝලීය මිල ගණන් හා අනුකූල වන පරිදි දේශීය බලශක්ති මිල ගණන් සංශෝධනය කිරීම හා එම සංශෝධන වර්තමානයේ සිදු වන පරිදි විනිවිදභාවයකින් යුතුව සිදු කිරීම දේශීය බලශක්ති මිල ගණන් පිළිබඳ පුරෝකථන සිදුකිරීම පහසු කරවනු ඇත. මෙමගින් ව්‍යාපාරවලට සිය අනාගත පිරිවැය විශ්වාසයෙන් යුතුව සැලසුම් කිරීමට සහාය වන අතර, සමස්ත මිල මට්ටම් ස්ථායී කරමින් අනපේක්ෂිත උද්ධමන පීඩන අවදානම අවම කර උද්ධමන අපේක්ෂා කළමනාකරණය කිරීමට දායක විය හැකිය. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ උද්ධමන ඉලක්ක සැකසීමට සහ ප්‍රතිපත්ති තීරණවලට සහාය වීමට වඩාත් සාර්ථක උද්ධමන පුරෝකථන සිදු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම පුරෝකථන බොහෝ විට ගෝලීය මිල විචලන මත රඳා පවතින බැවින්, ප්‍රතිපත්ති දෝෂ අවම කිරීම සඳහා ගෝලීය මිල ප්‍රවණතා දේශීය මිල ගණන් තුළින් නිසි ලෙස පිළිබිඹු වීම ඉතා වැදගත් වේ. ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, දේශීය බලශක්ති මිල සංශෝධනවලට සම්බන්ධ අධිකාරීන් සහ පාරිභෝගික කටයුතු අධිකාරිය වැනි අනෙකුත් නියාමන අධිකාරීන් ඇතුළු අදාළ බලධාරීන්, සාධාරණ ලෙස මිල ගණන් පහළ යෑම සිදුවන බව තහවුරු කිරීමට ආනයනික භාණ්ඩවල මිල ගණන් පිළිබඳව අවධානයෙන් සිටිය යුතුය. අපේක්ෂා කළ පරිදි උද්ධමනය ශීඝ්‍රයෙන් පහළ යෑමත් සමඟ ඉහළ ගිය ජීවන වියදම අඩු කිරීම සඳහා එවැනි මිල ගණන් දේශීය වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම උපකාරී වනු ඇත.

උග්‍ර වූ ආර්ථික අර්බුදය හමුවේ ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ සුබසාධනය මත ඇති කළ සැලකිය යුතු හා දිගු කාලීන බලපෑම් මගින්, වඩාත් අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල සුබසාධනය සහතික කිරීම සඳහා ප්‍රතිපත්තිමය උපායමාර්ග නැවත සකස් කිරීමේ කඩිනම් අවශ්‍යතාව අවධාරණය කරයි. ආර්ථික අර්බුදයෙන් පැන නැගුණු පීඩනය ජනතාවට විෂමකාර ලෙස බලපා ඇත. ජීවනෝපායන් අහිමි වීම සහ

1

උද්ධමනය ඉහළ යෑම ඇතුළු විවිධ පැතිකඩ හරහා සමාජයේ අවදානමට ලක්විය හැකි ජනගහනයේ ජීවන තත්ත්වය බොහෝ දුරට පිරිහී ඇත. ශ්‍රී ලංකාව සඳහා යාවත්කාලීන කරන ලද ජාතික දරිද්‍රතා රේඛාව සියයට 74ක වාර්ෂික වර්ධනයක් වාර්තා කරමින් 2022 වසරේ දී රුපියල් 13,777ක් දක්වා ඉහළ ගොස් ඇත. එක් පුද්ගලයෙකු සඳහා වන අවම මාසික වියදම ඉහළ නංවමින්, මූලික ආහාර, ඇඳුම් පැළඳුම් සහ නවාතැන් වැනි අත්‍යවශ්‍ය භාණ්ඩවල පිරිවැය වැඩි වී ඇති බව උද්ධමනයේ මෙම ඉහළ යෑම මගින් පිළිඹිබු කරයි. ලෝක ආහාර වැඩසටහනේ දුරස්ථ ගෘහස්ථ ආහාර සුරක්ෂිතතා සමීක්ෂණයට (The Remote Household Food Security Survey) අනුව, ජනගහනයෙන් සියයට 85ක් මුදල් ණයට ගැනීම, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සඳහා වියදම් අඩු කිරීම, ඉතුරුම් වියදම් කිරීම හෝ ගෙවීමට ඇති ණය මුදල් කල් දැමීම වැනි ජීවනෝපාය මත පදනම් වූ විකල්ප ආර්ථික උපායමාර්ග මත වෙත යොමු වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. සේවා නියුක්තියෙන් වැඩි කොටසක් අවිධිමත් අංශයේ රැකියාවල නියුතු වී සිටීම සහ ජනගහනයෙන් සියයට 14.3ක් දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන තත්ත්වයක් තුළ, අර්බුදයේ පීඩනය වඩාත් උග්‍ර විය හැකි අතර, එය ජනතාවගෙන් විශාල පිරිසක් දරිද්‍රතාවයට ඇද දැමීමට හේතු විය හැකිය. එසේම, වර්තමාන අර්බුදය, පරම්පරාවෙන් පරම්පරාවට දරිද්‍රතාවය වර්ධනය කරමින්, ජනගහනයේ කොටස් අතර සමාජ ආර්ථික විෂමතාවන් පුළුල් කරයි. පවුල් ඒකක දරිද්‍රතාවෙන් පෙළෙනවිට, රැස් කළ හැකි ධනය අවම වීම හේතුවෙන් එය මෙම පවුල් ඒකක වලට ලබාගතහැකි අධ්‍යාපන සහ සෞඛ්‍යය සේවාවන්ට අහිතකර ලෙස බලපාන අතර, එමගින් ඔවුන්ගේ අනාගත ආදායම් උත්පාදන හැකියාව ද නැවතත් බලපෑමට ලක් කරමින් දරිද්‍රතාවයේ විෂම චක්‍රයක් නිර්මාණය කෙරේ. මෙම පසුබිම තුළ, රජය විසින් පවතින සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් යටතේ සහනාධාර මට්ටම් ඉහළ නැංවීම හා විදේශීය මූල්‍ය නියෝජිත ආයතනවල සහාය ඇතිව මුදල් හා ප්‍රදාන ලබා දීම තුළින් ජනගහනයේ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් ආරක්ෂා කිරීමට සහ දරිද්‍රතා මට්ටම් තවදුරටත් උග්‍ර වීම වැළැක්වීම සඳහා පියවර රාශියක් ගෙන ඇතත්, එම වැඩසටහන්වල දුර්වල ඉලක්ක කිරීම් හේතුවෙන් ඒවායෙහි කාර්යක්ෂමතාව අභියෝගයට ලක්ව ඇත. වසංගතය ආරම්භයේ සිටම, රටේ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් මෙන්ම, දරිද්‍රතා මට්ටමට ආසන්නයේ සිටින කණ්ඩායම් ද ආදායම් අහිමි වීම් සමඟ දුෂ්කරතාවලට මුහුණ දුන් අතර, විශ්වසනීය හා යාවත්කාලීන කරන ලද දත්ත පද්ධතියක් නොමැති වීම හේතුවෙන් රජයේ ආධාර දැඩි ලෙස අවශ්‍ය දරිද්‍රතාවයෙන් පෙළෙන නව ජන කොටස් හඳුනා ගැනීමේ දී ඇති වන ප්‍රමාදයන්, පවතින සීමිත අරමුදල් සහ විදේශ ආධාර අකාර්යක්ෂම ලෙස වෙන් කිරීමට හේතු වී ඇත. එබැවින්, අපේක්ෂිත ප්‍රතිලාභීන් වෙත සහනාධාර නියමිත කාලයේ දී ළඟා වීම සහතික කිරීම සඳහා අවශ්‍යතා ඇති පුද්ගලයින්ගේ ලේඛනයක් සකස් කිරීම සඳහා සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය යටතේ දැනටමත් ක්‍රියාත්මක කර ඇති ක්‍රියාමාර්ග කඩිනම් කිරීම අත්‍යවශ්‍ය වේ. මේ අතර, සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම, අවශ්‍යතා ඇති පුද්ගලයින්ගේ ලේඛනයක් සකස් කිරීම සඳහා වන අඛණ්ඩ ප්‍රයත්නයන් සමඟ සුදුසුකම් තීරණය කිරීමේ නිර්ණායක වැඩිදියුණු කිරීම මෙන්ම, සුබසාධන ප්‍රතිලාභ ගෙවීමේ නව ක්‍රමයක් හඳුන්වා දීම ඇතුළුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන්වලට අදාළ ප්‍රතිසංස්කරණ සම්පූර්ණ කිරීමත් සමඟ ආර්ථික අර්බුදයේ බලපෑමෙන් සහ ප්‍රතිපත්තිමය ගැළපීම්වලින් අවදානමට ලක් වූ පුද්ගලයින්ට සහාය සැපයෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ යටතේ, 2023 වසරේ මැයි මාසය වන විට සුබසාධන ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය හා සුදුසුකම් තීරණය කිරීමේ නිර්ණායක සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම සහ සමාජ ආරක්ෂණ ජාල වැඩසටහනෙහි වියදම් මට්ටම පුළුල් කිරීමේ සැලැස්ම වැනි ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට රජයේ ඇති කැපවීම, දිළිඳුකම පිටුදැකීම සඳහා දිගු කාලීන වශයෙන් අත්‍යවශ්‍ය වේ. මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන අතර, දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාවයෙන්, රජයේ මූලිකත්වය සහිත බහුආංශික ප්‍රතිපත්ති ප්‍රවේශයක් බලාත්මක කිරීම වැදගත් වන අතර, එමගින් ජනගහනයේ සියලුම කොටස් සඳහා අනාගත වර්ධන අපේක්ෂාවන්හි සාධාරණ ප්‍රතිලාභ ලැබීම සහතික කෙරේ. තවද, ආර්ථික අර්බුදයේ බලපෑම පිළිබඳව ගෘහස්ථ සමීක්ෂණයක් පැවැත්වීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවය ඇතිව රජය විසින් මෑතක දී ගන්නා ලද ක්‍රියාමාර්ග ප්‍රශංසනීය වන අතර, එමගින් පවුල් ඒකකයන්හි අවදානම් තත්ත්වයන් පිළිබඳ නිසි තක්සේරුවක් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. එවැනි දත්ත පද්ධති සහ සමීක්ෂණවල සොයා ගැනීම් මගින් දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වල සඵලතාවය වර්ධනය කරන අතර, දත්තවල ගුණාත්මක බව, ප්‍රමාණවත් බව සහ කාලානුරූපී බව වැඩිදියුණු කිරීම තුළින් අනාගතයේ දී සාක්ෂි මත පදනම් වූ සහ

දැනුම්වත් ප්‍රතිපත්ති තීරණ ශක්තිමත් කිරීම මෙන්ම, පවතින සමාජ ආරක්ෂණ ජාල යාන්ත්‍රණ වැඩිදියුණු කිරීම ද වැදගත් වේ. මේ යටතේ, ඩිජිටල් බැංකු පද්ධති හඳුන්වාදීම, ගෙවීම් කාඩ්පත මෙන්ම ඩිජිටල් හඳුනාගැනීමේ විකල්ප ක්‍රමවේද සැපයීම මගින් සහනාධාර බෙදා හැරීමේ යාන්ත්‍රණය ඩිජිටල්කරණය කිරීම, සුබසාධන ගෙවීම්වල අකාර්යක්ෂමතා සහ සිදුවිය හැකි මුදල් අවභාවිතාවන් අවම කිරීමට සහාය වනු ඇත. තවද, රජයේ වියදම් සීමා කිරීම් මධ්‍යයේ, මෙම වියදම්වල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා දරිද්‍රතාවය තුරන් කිරීමට දැනට පවතින උපායමාර්ග පිළිබඳ පරිපූර්ණ තක්සේරුවක් කිරීම අවශ්‍ය වේ. එවැනි තක්සේරුවක් මගින් රජය විසින් පෞද්ගලික අංශය සහ අදාළ බහුපාර්ශ්වික සංවිධාන සමඟ සහයෝගීතාවය අපේක්ෂා කළ හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සහාය සැපයේ. දරිද්‍රතාවය තුරන් කිරීමේ ප්‍රයත්නයන් අතරට, කෘෂිකාර්මික අංශයේ අගය එකතු කිරීම් ප්‍රවර්ධනය කිරීම, අනාගත ආදායම් අවස්ථා සහතික කිරීම සඳහා දිළිඳු සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා වන අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම, ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රම වෙළඳපොළෙහි කාන්තා සහභාගීත්වය සවිබල ගැන්වීම මෙන්ම, ආදායම් මට්ටම් ක්‍රමයෙන් වැඩිදියුණු වීමත් සමඟ පවතින ආරක්ෂිත ජාල වැඩසටහන්වලින් ක්‍රමානුකූලව ඉවත් වීමට ඉඩ සලසන ප්‍රතිපත්ති රාමුවක් ඇති කිරීම වැනි අනෙකුත් විවිධාකාර මැදිහත්වීම් ද ඇතුළත් විය යුතුය.

ශක්තිමත් ආර්ථික පුනර්ජීවනයක් සහ වර්ධනයක් කරා රට ගෙන යාමට සහාය වීම සඳහා ජාතික ප්‍රතිපත්ති සැලසුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ සියලු පැතිකඩ ආවරණය වන පරිදි එම සැලසුම් ක්‍රියාත්මක කිරීම වඩාත් ශක්තිමත්ව සිදු කළ යුතුය. ආර්ථික හා මූල්‍ය තීරණ ගැනීමට මෙන්ම ව්‍යාපාර සම්බන්ධයෙන් ඉදිරි සැලසුම් සකස් කිරීමට බාධාවක් වන, එකිනෙකට ගැළපෙන ස්ථාවර ප්‍රතිපත්ති නොමැතිකම, රට තුළ දේශීය හා විදේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා වන ප්‍රධාන දුෂ්කරතාව වේ. අනුප්‍රාප්තික රජයන් බොහෝ විට පැවති ප්‍රතිපත්ති විශාල ලෙස වෙනස් කරන බැවින්, ප්‍රතිපත්ති ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවන වෙනස්කම්වල බලපෑමෙන් මුළුමනින්ම තොර විය යුතුය. සියලු සම්පත් මනා ලෙස උපයෝජනය කෙරෙන ආර්ථිකයක් තුළ, ඵලදායිතාව වැඩිදියුණු කිරීම කෙරෙහි ජාතික ප්‍රතිපත්ති සැලසුම්කරණය මගින් අවධානය යොමු කළ යුතුය. එක් එක් ක්ෂේත්‍රවල රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම ප්‍රවීණයන් විසින් ජාතික සැලසුමක් සකස් කර එය ක්‍රියාත්මක කිරීමට පෙර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. අංශ අතර පවතින සහසම්බන්ධය සලකා උපාය මාර්ගික ප්‍රතිපත්ති පොකුරු නිර්මාණය කිරීම ද වැදගත් වේ. නිදසුනක් ලෙස, පෝෂණය හා බැඳුණු කෘෂිකර්මය සහ පශු සම්පත් නිෂ්පාදනය, ඉඩම් පරිහරණය මෙන්ම දේශගුණික විපර්යාසවල බලපෑම් අවම කිරීම පිළිබඳ අවධාරණය කෙරෙන පාරිසරික ප්‍රතිපත්ති යන ක්ෂේත්‍රවල සහසම්බන්ධය හඳුනාගෙන සකස් කෙරෙන ප්‍රතිපත්ති මගින් එම ක්ෂේත්‍රවල දිගු කාලීන ප්‍රශස්ත ප්‍රතිඵල අත් කර ගත හැකිය. එසේම, අපනයන ප්‍රතිපත්තිය විදේශ කටයුතු, ආයෝජන ප්‍රවර්ධන, කාර්මික හා කෘෂිකාර්මික ප්‍රතිපත්තිවලට සම්බන්ධ විය යුතු අතර, බනිජ භාවිතා කිරීමේ ප්‍රතිපත්තිය, කාර්මික ප්‍රතිපත්තිය හා සම්බන්ධ විය යුතුය. අපනයන, ආයෝජන, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සහ විදේශ අරමුදල් සඳහා ඇතැම් ද්විපාර්ශ්වික හවුල්කරුවන් මත පමණ ඉක්මවා රඳා පැවතීම මගින් විදේශ ප්‍රතිපත්තිය, ජාතික ආරක්ෂාව සහ රටේ ස්වාධිපත්‍යය සම්බන්ධයෙන් සුවිශාල අවදානමක් ඇති විය හැකිය. අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වන පුද්ගලයන් ඒ සඳහා වගවීම තහවුරු කෙරෙන ස්වාධීන ප්‍රතිපත්ති නිරීක්ෂණ යාන්ත්‍රණයක් ද ක්‍රියාත්මක විය යුතුය.

මෑත වසරවල දී රාජ්‍ය අංශය බැංකු පද්ධතිය මත රඳා පැවතීම අඛණ්ඩව පැවති අතර එහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අංශයට ආයෝජන සිදු කිරීමට ඇති හැකියාව සීමා වීම, උද්ධමන පීඩන ඉහළ යෑම සහ මූල්‍ය පද්ධතියේ ගැටලු ඇති විය. දුර්වල රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය මෙන්ම ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම් මධ්‍යයේ විදේශීය මූල්‍යන සඳහා ප්‍රවේශය සීමා වීම හේතුවෙන්, වසංගතය ආරම්භයේ සිට අයවැය හිඟය මූල්‍යනය කිරීමට සහ ණය සේවාකරණය සඳහා ප්‍රධාන වශයෙන් මහ බැංකුවෙන් සහ රජය සතු වාණිජ බැංකුවලින් අරමුදල් ලබා ගැනීමට රජයට සිදු විය. මේ අතර, ඉන්ධන සහ විදුලිය සම්බන්ධයෙන් විධිමත් මිල සූත්‍ර පදනම් කර ගනිමින් සංශෝධන ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම සහ අකාර්යක්ෂමතාව සහ අඩු ඵලදායිතාව වැනි දිගුකාලීන ගැටලු හේතුවෙන් රජය සතු වාණිජ ව්‍යාපාර මූල්‍යමය වශයෙන් දුර්වල වී ඇති අතර එමගින් රජයේ භාණ්ඩාගාරයට මෙන්ම සමස්ත බැංකු පද්ධතියටම පීඩන ඇති කර තිබේ. වසර ගණනාවක් පුරා එවැනි මූල්‍යන ලබා ගැනීම්වල ප්‍රතිඵලයක් ලෙස, බැංකු පද්ධතිය රාජ්‍ය අංශය වෙත නිරාවරණය වීම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර එමගින්

1

මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට අවදානම් ඇති වී තිබේ. තවද, රාජ්‍ය අංශයේ ණය ගැනීමේ අවශ්‍යතා ඉහළ යෑම හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික මත පීඩන ඉහළ ගොස් ඇති අතර රාජ්‍ය අංශය අධික ලෙස බැංකු පද්ධතියෙන් මූල්‍යනය සිදු කිරීම උද්ධමනය ඉහළ නැංවීමට හේතු විය හැකිය. රජය විසින් මහ බැංකුවෙන් ලබාගෙන ඇති විශාල අරමුදල් ප්‍රමාණය සහ ඵලදායීතාවයේ සහ නිෂ්පාදිතයේ කැපී පෙනෙන වර්ධනයකින් තොරව රජය සතු වාණිජ ව්‍යාපාර විසින් බැංකු අංශයෙන් ලබාගෙන ඇති ණය පහසුකම් මගින් වෙළඳපොළ මිල ගණන් මත ඉහළ පීඩන ඇති කරනු ලබයි. එබැවින්, මෙමගින් විශේෂයෙන්ම මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කර ඇති අවස්ථාවක මුදල් ප්‍රතිපත්තියේ කාර්යක්ෂමතාවයට බලපෑම් ඇති කරනු ලබයි. මෙම පරිච්ඡේදයේ මීට පෙර සඳහන් කර ඇති මෑත කාලීනව ක්‍රියාත්මක කර ඇති ඇතැම් විසඳුම් රාජ්‍ය අංශය බැංකු පද්ධතිය මත රඳා පැවතීම අඩු කිරීමට හේතු වනු ඇත. මේ අතර, රාජ්‍ය අංශයේ මූල්‍යනය ඉහළ යෑම සහ බැංකු මගින් අධික ලෙස මූල්‍යන ලබා ගැනීමේ අවශ්‍යතාවය අවම කිරීම සඳහා තවදුරටත් ක්‍රියාමාර්ග ගත හැකිය. කාර්යසාධනය මූලික කරගත් රාජ්‍ය අංශයක් තුළින් ඵලදායීතාව ඉහළ නංවමින් මූල්‍ය ශක්‍යතාව වර්ධනය කරන අතර එමගින් එම ආයතන බැංකු මගින් සිදු කරන මූල්‍යනය අඩු කිරීමට හේතු වේ. මේ අතර, දේශීය සාර්ව ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු වීම සහ රටේ පවතින තත්ත්වය වාසිදායක ලෙස යොදා ගනිමින් රජය අනෙකුත් ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ණය හිමියන්ගෙන් අඩු පිරිවැයක් සහිත අරමුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර, එමගින් රජය දේශීය බැංකු පද්ධතිය මත අධික ලෙස රඳා පැවතීම අඩු වනු ඇත. එසේම, විශේෂයෙන්ම රජය වෙත බහුපාර්ශ්වික අරමුදල් නැවත ලැබීමත් සමඟ රජය සතු වාණිජ ව්‍යාපාර සිය මූල්‍යන අවශ්‍යතා සඳහා ආයෝජන සහ ව්‍යාපෘති පදනම් කරගත් වෙනත් මූලාශ්‍ර, එනම් විදේශීය මූල්‍යන වුවද ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. මීට අමතරව, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේද හරහා පාඩු ලබන, එහෙත් උපායමාර්ගික වශයෙන් වැදගත් රජය සතු වාණිජ ව්‍යාපාර ලාභ ලබන ආයතන බවට පත් කිරීම සලකා බැලිය යුතු අතර, එමගින් පෞද්ගලික අංශයේ කළමනාකරණ දැනුම හුවමාරු කර ගැනීමට හැකි වීමෙන් එවැනි රජය සතු වාණිජ ව්‍යාපාරවල ඵලදායීතාව සහ ලාභදායීත්වය ඉහළ නංවනු ඇත. තවද, රාජ්‍ය අංශයේ අනවශ්‍ය නාස්තිය හා දූෂණය අවම කළ යුතු අතර, එම අංශ සඳහා පළපුරුද්ද සහ ප්‍රවීණත්වය සහිත සුදුසුකම්ලත් දක්ෂ නිලධාරීන් පත් කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, දේශීය බැංකු පද්ධතිය මත රාජ්‍ය අංශය අබණ්ඩව රඳා පැවතීම අවම වනු ඇති අතර එමගින් බැංකු පද්ධතිය තුළ පවතින සීමා සහිත අරමුදල් පෞද්ගලික අංශයේ නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමට වැඩි අවකාශයක් සහ අවස්ථාවක් සැලසෙනු ඇත.

අවිධිමත් ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආහාර සැපයුම් පද්ධතිවල වර්ධනය වන අවදානම්කාරී තත්ත්ව පිළිබඳව වූ මෑත කාලීන අත්දැකීම් මගින්, දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ගැටලු විසඳීම සඳහා සහ රටේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමට මනාව සම්බන්ධීකරණ වූ මෙන්ම ස්ථාවර වූ ප්‍රතිපත්තිමය ප්‍රවේශයක් ස්ථාපිත කිරීම සඳහා රජයේ දැඩි කැපවීමෙහි අවශ්‍යතාව නැවත අවධාරණය කෙරෙයි. කෘෂිකාර්මික අංශයේ ඵලදායීතාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පසුගිය දශක කිහිපය තුළ සහනාධාර ලබා දීම, විශේෂයෙන් ම පොහොර සහනාධාරය ලබා දීම, සහතික මිල ගණන් ක්‍රියාත්මක කිරීම, ඉහළ අස්වැන්නක් ලබා දෙන ප්‍රභේද සැපයීම මෙන්ම කෘෂි ව්‍යාප්ති සේවා සැපයීම සඳහා බලයට පත් වූ රජයන් විසින් අබණ්ඩව සහයෝගය ලබා දුන්න ද, රටේ කෘෂිකාර්මික අංශයේ ඵලදායීතාව සැලකිය යුතු අන්දමේ වර්ධනයක් නොපෙන්වන අතර, කෘෂිකාර්මික අංශය දේශගුණික කම්පනයන්ට මෙන්ම මිනිසා විසින් නිර්මාණය කරන කම්පනවලට ද ගොදුරු වීමේ වැඩි ඉඩකඩක් පවතී. කෘෂිකාර්මික අංශය වෙත පොහොර සහනාධාරය ලබා දීම තීරණාත්මක මැදිහත්වීමක් ලෙස පවතින අතර, එය රට තුළ දේශපාලනික වශයෙන් අතිශය සංවේදී කාරණයක් බවට පත්ව ඇති හේතුවෙන්, එවැනි ප්‍රතිපත්තිවලින් ලැබෙන ප්‍රතිඵලය කෙබඳු වුවද එවැනි ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යාමට බලයට පත් වූ ඒ ඒ රජයන් යොමු වී ඇත. ඒ අනුව, රටේ ආනයන වියදම මත වන පීඩනය අවම කර ගනිමින්, අධික ලෙස රසායනික පොහොර භාවිතය වැළැක්වීම සහ කාබනික වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා තිරසාර හා කාර්යක්ෂම පොහොර ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ අවශ්‍යතාව ඉහළ යමින් පවතී. එහෙත්, 2021 වසරේ දී රසායනික පොහොර ආනයනය හදිසියේ තහනම් කිරීම මගින් රටේ ප්‍රධාන ආහාර වර්ග නිෂ්පාදනයට ඇති කළ හානිකර බලපෑම්, 2022 වසරේ දී ආහාර අර්බුදයකට තුඩු දුන් අතර, විදේශ විනිමය ද්‍රවශීලතාවයේ හිඟය මධ්‍යයේ සීමිත ආහාර ආනයනය සමඟ එය තවදුරටත් උග්‍ර විය. කෙසේ වෙතත්, කෘෂිකර්මාන්තය තුළ රසායනික පොහොර භාවිතය ඉවත් කිරීම ක්‍රමානුකූලව සිදු කිරීමේ අවශ්‍යතාව හඳුනාගැනීමත් සමඟ මාස හයක් බලාත්මකව පැවති පොහොර තහනම පසුව ඉවත් කරන ලදී. දැරිය හැකි

මිලකට ආහාර ලබා දීම සහ ආහාර වෙත සැමට ප්‍රවේශයක් ඇති බව සහතික කිරීම සඳහා මිල පාලනය පිළිබඳ ප්‍රතිපත්ති මගින් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ හැකි වුවද, පාර්ශ්වකරුවන් අතර පවතින අඩු සම්බන්ධීකරණය සහ මිල පීඩනය වැළැක්වීම සඳහා ප්‍රමාණවත් ස්වාරක්ෂක තොග නොමැති වීම මෙන්ම ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස ආහාර සැපයුම් පිරිවැය ඉහළ යෑම පිළිබිඹු කරමින්, 2022 වසරේ පැවති ආහාර හිඟය මධ්‍යයේ ශ්‍රී ලංකාවේ ආහාර මිල පීඩනය ලිහිල් කිරීමෙහිලා රජය විසින් ක්‍රියාත්මක කරන ලද මිල පාලනයන්ගේ සාර්ථකත්වය සීමාසහිත විය. 2022 වසරේ අග භාගයේ දී, ගොවීන්ට සහාය වීම සඳහා වැඩි මිලට වී මිලදී ගැනීමට ක්‍රියාත්මක කරන ලද රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන, වී අලෙවි මණ්ඩලයේ ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා දීමට අපොහොසත් විය. තවද, ආනයනික සත්ත්ව ආහාර සීමිත වීමත් සමඟ, මිනිස් පරිභෝජනය සඳහා පවතින සහල් ප්‍රමාණය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් සත්ත්ව ආහාර නිෂ්පාදනයේ දී වී හෝ සහල් භාවිතය තහනම් කිරීම කුකුළු නිෂ්පාදන අංශයට අහිතකර ප්‍රතිවිපාක ඇති කළේය. රටෙහි ආහාර සුරක්ෂිතතාවයේ ප්‍රධාන අංගයක් වන ආහාරවල ගුණාත්මකභාවයට බලපෑම් ඇති කරමින්, කුකුළු නිෂ්පාදනවල මිල අධික ලෙස ඉහළ යෑමට මෙය කිසියම් දුරකට දායක වන්නට ඇත. මහජනතාවට දැරිය හැකි මිලක් යටතේ කුකුළු මස් ලබා ගැනීමට ඇති හැකියාව සහතික කිරීමට එම නිෂ්පාදන සඳහා රජය විසින් උපරිම මිලක් හඳුන්වා දුන්නද, එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳපොළ තුළ කුකුළු නිෂ්පාදන හිඟයක් ඇති වූ අතර, එමගින් එම නිෂ්පාදන සුලබතාව පිළිබඳ ගැටලු ඉස්මතු විය. ක්‍රියාත්මක කරන ලද බොහෝ කෘෂිකාර්මික ප්‍රතිපත්ති මගින් අපේක්ෂිත ප්‍රතිඵලයට ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵල ළඟා කර දුන් බව ශ්‍රී ලංකාවේ මෑත කාලීන අත්දැකීම් තුළින් පෙනී යන අතර, එමගින් කෘෂිකාර්මික අංශය තුළ පවතින අවිධිමත් සහ කෘෂිකර්මාන්තයේ එක් අංශයක් පමණක් පිළිබඳව සලකා ගනු ලැබූ ප්‍රතිපත්ති සම්පාදනයේ දුර්වලතා කෙරෙහි අවධානය යොමු කරවයි. ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන්ම ආහාර නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත නොවුවද, ආහාර සුලබතාව, ආහාර සඳහා වන දැරිය හැකි මිල, ආහාර සඳහා ප්‍රවේශය සහ ස්ථායීතාව යන ආහාර සුරක්ෂිතතාවට අදාළ ගැටලු මගින් මෑත දශකවලදී මෙරට දැඩි තර්ජනයකට ලක්වී නොමැත. 2021-2022 කාල සීමාව තුළ ක්‍රියාවට නැංවූ අවිධිමත් ප්‍රතිපත්ති හේතුවෙන්, වී සහ එළවලු නිෂ්පාදනය දිගින් දිගටම පහළ යෑම හමුවේ, ශ්‍රී ලංකාව ආහාර අනාරක්ෂිතතාවකට මුහුණ දුන් අතර, එම තත්ත්වය අද වනවිටත් සුළු පරිමාණයෙන් පවතී. රටේ ආහාර අවශ්‍යතාවයෙහි පවතින ඉහළ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, ගොවි ප්‍රජාවන් සමඟ නිසි සහයෝගීතාවෙන් යුතුව කඩිනමින් මෙම ගැටලු සඳහා පිළියම් යෙදිය යුතුය. රජයේ යෝජිත ප්‍රතිපත්ති පිළිබඳව ගොවි ප්‍රජාවන් දැනුම්වත් කළ යුතු අතර, ඔවුන්ට කෘෂිකාර්මික අනුවර්තනයන් පිළිබඳව පුහුණුවක් ලබා දිය යුතුය. ඵලදායී ලෙස සංවර්ධනයට පහසුකම් සැලසීමට සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා කෘෂිකාර්මික ක්ෂේත්‍රය හැඩගැස්වීමෙහිලා කෘෂිකර්මාන්තයට සම්බන්ධ සියලුම රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සහ ගොවීන් අතර සම්බන්ධීකරණයක් සහිතව කෘෂිකාර්මික අංශය සඳහා පරිපූර්ණ සහ තිරසාර උපායමාර්ගයක ඇති අවශ්‍යතාව, කෘෂිකාර්මික අංශයේ මෙම අවදානම් සහගත තත්ත්වය මගින් අවධාරණය කරයි. එවැනි පුළුල් පදනමකින් යුත් ප්‍රතිපත්ති ප්‍රවේශයක් මගින් අඩු කෘෂිකාර්මික ඵලදායීතාව, ඉහළ පසු අස්වනු හානි, ප්‍රශස්ත නොවන කෘෂිකාර්මික පිළිවෙත්, දුර්වල මට්ටමේ අගය එකතු කිරීම, මිල විකෘතිතා සහ කෘෂිකාර්මික නිෂ්පාදනවල දුර්වල අලෙවිකරණය වැනි ගැඹුරට මුල් බැස ගත් ගැටලු විසඳීම ඉලක්ක කර ගත යුතු අතර, එමගින් කෘෂිකාර්මික වටිනාකම් දාමයේ පාර්ශ්වකරුවන්හට ප්‍රමාණවත් ආදායම් මට්ටමක් උත්පාදනය කළ හැකි තිරසාර කෘෂිකාර්මික අංශයක් ගොඩනැගීමට හැකි වන අතර ම, රටේ ආහාර සුරක්ෂිතතාව සහ කාර්යක්ෂම පරිසර පද්ධති කළමනාකරණයක් සහතික කරනු ඇත.

අර්බුදයෙන් පසුව ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම වේගවත් කිරීම සහ මැදි කාලීනව ආර්ථික වර්ධනයට සහාය සැපයීම සඳහා, දීර්ඝ කාලයක් මුළුල්ලේ ප්‍රමාද වූ වෙළඳපොළ ප්‍රතිසංස්කරණ කඩිනමින් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ. අනම්‍යශීලී ප්‍රතිපත්ති සහ ප්‍රමාණවත් නොවන නීති බලගැන්වීම් සමඟ රටේ ඉඩම් සහ ශ්‍රම වෙළඳපොළ අඛණ්ඩව අභියෝග සහ සීමාකම්වලට මුහුණ දෙන අතර, ඒ හේතුවෙන් ගෝලීය වෙළඳපොළ තුළ නැගී එන යෝග්‍ය අවස්ථා ග්‍රහණය කර ගැනීමට අපොහොසත් වීම මෙන්ම විදේශ රටවලින් සෘජු ආයෝජන ගලා ඒමට ද බාධා එල්ල වී ඇත. ශ්‍රම වෙළඳපොළ තුළ දැනට පවතින නීති සහ රෙගුලාසි සේවකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වඩා ප්‍රමුඛතාවක් දී ඇත. මෙමගින් ශ්‍රම බලකායේ උපයෝජ්‍යතාවය සහ ඵලදායීතාවය යන අංශ දෙක කෙරෙහිම අයහපත් බලපෑමක් ඇති කළ හැකිය. මේ අතර, රාජ්‍ය අංශයේ රැකියා, සේවක දායකත්වය රහිත විශ්‍රාම වැටුප් යෝජනා

1

ක්‍රමයක් සමඟ ආකර්ෂණීය රැකියා ප්‍රතිලාභ ලබා දෙන අතර, එය වඩාත් ඵලදායී අංශ සහ ක්‍රියාකාරකම් කරා ශ්‍රම බලකාය ප්‍රවේශ වීම අධෛර්යමත් කරයි. තවද, නම්‍යශීලී වැඩ පැය සහ සම්පීඩිත වැඩ පැය ක්‍රම නොමැති වීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ බාධක, කාර්යසාධනය පදනම් කරගත් වැටුප් ක්‍රමයක් නොමැතිකම, ශ්‍රම බලකායේ නිපුණතා පිළිබඳ පවතින ගැටලු යනාදී ශ්‍රම වෙළඳපොළ තුළ අඛණ්ඩව පවතින යාවත්කාලීන නොවීම පිළිබඳ ගැටලු, පසුගිය දශක කිහිපය තුළ රටෙහි සේවා නියුක්තිය සහ ශ්‍රම ඵලදායිතාව කෙරෙහි බොහෝ දුරට අහිතකර ලෙස බලපා ඇත. එබැවින්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය යළි නගාසිටුවීම සඳහා පහසුකම් සැලසීමට, ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රම වෙළඳපොළ නීති සහ රෙගුලාසි යාවත්කාලීන කිරීම සහ සුදුසු පරිදි ලිහිල් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. මෙම රාමුව තුළ, ශ්‍රම වෙළඳපොළ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ප්‍රධාන ප්‍රතිපත්ති ක්ෂේත්‍ර අතරට, සේවය අවසන් කිරීමේ පිරිවැය අඩු කිරීම සහ රැකියා අවසන් කිරීම/වෙනස් කිරීම පහසු කිරීම, තාවකාලික රැකියා අවස්ථා ප්‍රවර්ධනය, අවම සහ ව්‍යවස්ථාපිත විශ්‍රාම යන වයස් පිළිබඳ නම්‍යශීලී ප්‍රතිපත්ති හඳුන්වා දීම, විශ්‍රාම යන වයස ආයු අපේක්ෂාව සමඟ ගැළපීම සහ කාන්තා සේවා නියුක්තිය ඉහළ නැංවීම ඇතුළත් වේ. එසේම, කාලීන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි සේවා නියුක්තියට අදාළ නැගී එන අංශ, මෙම රෙගුලාසි වලට ඇතුළත් විය යුතු අතර, ඒ යටතේ කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා විරැකියා රක්ෂණ යෝජනා ක්‍රම, නම්‍යශීලී වැඩ පැය, ආරක්ෂිත පොදු ප්‍රවාහනය සහ දිවා සුරැකුම්/ළමා රැකවරණ මධ්‍යස්ථාන පිහිටුවීම වැනි අංශ දිරිමත් කළ යුතුය. තවද, අර්බුදකාරී වාතාවරණය මධ්‍යයේ මානව ප්‍රාග්ධනය අධික ලෙස රටින් පිටවීම පාලනය කිරීමට ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වන අතර, ගෝලීය කුසලතා ආකර්ෂණය කරගැනීමට සහ රටේ ශ්‍රම වෙළඳපොළ තුළ කුසලතා සඳහා පවතින අවස්ථා සම්පූර්ණ කිරීමට, පවතින සංක්‍රමණ නීති සමාලෝචනය කිරීම ඉතා වැදගත් වේ. එසේම, ආර්ථික අර්බුදය හේතුවෙන් අනපේක්ෂිත ලෙස පවුල් ජීවිත වලට දුෂ්කරතා මෙන්ම සංක්‍රමණික සෞඛ්‍ය ගැටලු නිර්මාණය කළ අභ්‍යන්තර සහ බාහිර ශ්‍රම සංක්‍රමණ ගැටලු පිළිබඳව අවධානය යොමුකළ යුතු වේ. ඉඩම් සම්බන්ධ විවිධ නීති ක්‍රම මගින් නිර්මාණය කරන ලද හිමිකාරිත්වය පිළිබඳ විවිධ මට්ටම්, ඉඩම් නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා බහුවිධ ආයතන පැවැතීම, ඉඩම් කළමනාකරණයට අදාළ ආයතන විසින් අනුගමනය කරන නීතිවල වෙනස්කම්, ඉඩම්වල හිමිකාරිත්වය සම්බන්ධ ගැටලු, සහ ව්‍යාපෘති සඳහා ඉඩම් භාවිත කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා දීර්ඝ හා අකාර්යක්ෂම ක්‍රියා පටිපාටි පැවතීම ඇතුළු විවිධ සංකීර්ණතා හේතුවෙන් ඉඩම් වෙළඳපොළ දීර්ඝ කාලයක් තිස්සේ බාධකවලට මුහුණ දෙයි. ප්‍රයෝජනයට නොගත් / ඵලදායි නොවන ලෙස භාවිතා කරන ඉඩම් සහ සංවර්ධනය සඳහා පවතින ඉඩම් කළමණාකරණය කිරීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට විවිධ ආයතනවල කාර්යයන් ඒකාබද්ධකර තනි ආයතනයක් යටතේ මධ්‍යගත ආයතනයක් පිහිටුවීම හා සමගාමීව ඉඩම්වලට අදාළව නීතිය ක්‍රියාත්මක වීම විධිමත් කිරීම ඉඩම් වෙළඳපොළ පවතින සංකීර්ණතා සරල බවට පත්කිරීමට කිරීමට දායක වනු ඇත. තවද, පැහැදිලි සහ ගැටලු සහගත නොවන ආකාරයට හිමිකාරිත්වය සහතික කරන මධ්‍යගත ඩිජිටල් ඉඩම් තොරතුරු දත්ත සමුදායක් මගින් ඉඩම් දත්ත වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම මගින් ඉඩම් වෙන් කිරීමේ ක්‍රියාවලියේ අකාර්යක්ෂමතාව නිරාකරණය කළ හැකි අතර, එමගින් රට තුළ ආයෝජන සඳහා පහසුකම් සැලසේ. මංගත ඉඩම් ලේඛනයක් ස්ථාපිත කිරීම සඳහා වන රජයේ මූලපිරීම මේ සම්බන්ධයෙන් ගත්කල ප්‍රශංසනීය උත්සාහයක් වන අතර, එමගින් පහසු, ආරක්ෂිත සහ කාර්යක්ෂම ලෙස ඉඩම් ලියාපදිංචිය සහතික කෙරෙමින්, රජයේ ආයතන, පෞද්ගලික අංශය සහ පොදු මහ ජනතාව ඇතුළු අවශ්‍ය පාර්ශ්ව වෙත ඉඩම් තොරතුරු සහ අදාළ සේවාවන් සඳහා ඉක්මන් ප්‍රවේශයක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, රට තුළ ඉඩම් වෙළඳපොළ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පුළුල් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති රාමුවක් සංවර්ධනය කිරීම සහ ඉඩම් පරිපාලන පද්ධති ශක්තිමත් කිරීම ද ඉතා වැදගත් වේ. එබැවින්, ශ්‍රම සහ ඉඩම් වෙළඳපොළවල දීර්ඝ කාලීන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම කඩිනම් කිරීම මගින් සාධක වෙළඳපොළ තුළ සම්පත් වෙන්කිරීම සහ උපයෝගීතා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට හැකි වන අතර, එමගින් රැකියා, ආයෝජන සහ ආර්ථිකයේ සමස්ත වර්ධන වේගය ඉහළ නැංවිය හැකි වනු ඇත.

ඩිජිටල් ආර්ථිකයක් කරා පරිවර්තනය කිරීමට විශාල ශක්‍යතාවයක් ශ්‍රී ලංකා ආර්ථිකය සතුව ඇති අතර, ඩිජිටල් යුගයේ ප්‍රතිලාභ අත්කරගනිමින් ආර්ථිකයේ අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීමට පහසුකම් සැලසීම සඳහා ගෝලීය ඩිජිටල් ක්ෂේත්‍රයේ සිදුවන වර්ධනයන් වේගයෙන් ග්‍රහණය කර ගැනීම රටට ඉතා වැදගත් වේ. ඩිජිටල් ආර්ථිකයක් යනු ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණය

උපයෝගී කර ගැනෙන තාක්ෂණය මත පදනම් වූ ආර්ථික ක්‍රමයකි. ඩිජිටල් තාක්ෂණය භාවිතයත් සමඟ සම්බන්ධතා ඉහළ නැංවීම සහ විනිවිදභාවය ඉහළ යෑම මගින් කාර්යක්ෂමතාව හා ආර්ථික වර්ධනය සාක්ෂාත් කර ගැනීමට සහාය සැලසීම, මහජනතාවට වඩාත් පහසු ලෙස විවිධ ක්‍රියාකාරකම්හි නියුතුවීමට හැකියාව ලබාදීම, සම්පත් බෙදා හැරීමේ කාර්යක්ෂමතාව ඉහළ යෑම, තත්කාලීන දත්ත ප්‍රවේශය හරහා දත්ත මත පදනම් වූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවලට යොමු වීමට හැකිවන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකයේ සංවර්ධනය ද වේගවත් වේ. නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව සඳහා නව අපේක්ෂාවන් නිර්මාණය කරමින් බොහෝ ගෝලීය සමාගම් රට තුළ මෙහෙයුම් ආරම්භ කිරීමත් සමඟ, මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණ සේවාවල, විද්‍යුත් රාජ්‍ය සේවාවල සහ ඩිජිටල් යටිතල පහසුකම් වල දියුණුව හරහා මූල්‍ය තාක්ෂණයේ ද කැපී පෙනෙන ප්‍රගතියක් අත්කර ගනිමින්, ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතී. තවද, කොවිඩ්-19 වසංගත සමය තුළ ඩිජිටල් තාක්ෂණය භාවිතය ඉහළ ගිය අතර, බොහෝ ව්‍යාපාර සහ පුද්ගලයින් තම රැකියා සහ සන්නිවේදන කටයුතු සඳහා මංගත ක්‍රමවේද භාවිතයට යොමු වී ඇත. මීට අමතරව, මූල්‍ය තාක්ෂණය මගින් මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කරමින් නව්‍ය මූල්‍ය සේවා සඳහා අවස්ථා උදා කර ඇති අතර, විද්‍යුත් රාජ්‍ය සේවා මගින් පුරවැසියන්හට වඩාත් හොඳින් ඒ හා සම්බන්ධ වීමට මෙන්ම විනිවිදභාවය සහ වගවීම ඉහළ නැංවීමට හැකිව ඇත. මේ අතර, රට පුරා අඩු පහසුකම් සහිත ප්‍රජාවන්ට දැරිය හැකි මිලකට අන්තර්ජාල සම්බන්ධතාව සහ ඩිජිටල් සාක්ෂරතා පුහුණුව ලබා දීම අරමුණු කරගත් විවිධ මුලපිරීම් සමඟ, ශ්‍රී ලංකාව තුළ ඩිජිටල් අන්තර්ගතභාවයෙහි ප්‍රගතිශීලී පරිවර්තනයක් සිදු වී ඇත. රජයේ මුලපිරීමක් වන ඩිජිටල් රජය, ඩිජිටල් ආර්ථිකය සහ ඩිජිටල් සේවා යන ප්‍රධාන අංශ තුනක් මත පදනම් වූ ජාතික ඩිජිටල් පරිවර්තන උපායමාර්ගය (2021-2024 වසර සඳහා) ඩිජිටල් යුගයක් කරා යන ගමනේ ගත් ප්‍රශංසනීය උත්සාහයකි. මේ අතර, 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත බලාත්මක කිරීම සහ 2023 වසර සඳහා වන අයවැයෙන් ප්‍රකාශයට පත් කර ඇති පරිදි දත්ත ආරක්ෂණ අධිකාරියක් පිහිටුවීම සඳහා ගෙන ඇති මූලික ක්‍රියාමාර්ග, ඩිජිටල් පරිවර්තනය සඳහා අත්‍යවශ්‍ය වන මූලිකාංග වේ. ශ්‍රී ලංකාව ආර්ථිකය ඩිජිටල්කරණය කිරීමෙහිලා ප්‍රගතියක් අත්කරගෙන තිබුණ ද, රටේ ඩිජිටල් පරිවර්තනය ශ්‍රී ලංකාව හා සමාන ආර්ථිකයන්ට සාපේක්ෂව තවමත් සංවර්ධනය අතින් මුල් අවධියක පවතින බව පිළිබිඹු කරමින්, අන්තර්ජාලයෙහි දැරිය හැකි මිල, අන්තර්ජාල ගුණාත්මකභාවය, විද්‍යුත් රජය, විද්‍යුත් ආරක්ෂාව සහ විද්‍යුත් වාණිජ්‍යය ඇතුළු විවිධ නිර්ණායක මත පදනම් කරගෙන නිර්ණය කරන ඩිජිටල් ජීවන තත්ත්ව (Digital Quality of Life) දර්ශකය අනුව 2022 වසරේ දී රටවල් 117ක් අතරින් ශ්‍රී ලංකාව 89 වැනි ස්ථානයෙහි පසුවේ. ඩිජිටල්කරණයෙහි වර්ධනයක් අත් කරගැනීම සඳහා තවදුරටත් අභියෝග රාශියක් ජයගත යුතුව පවතින අතර, බොහෝ ක්ෂේත්‍ර තුළ තවදුරටත් ඩිජිටල් තාක්ෂණය වැඩිදියුණු කිරීම් සඳහා සැලකිය යුතු ඉඩකඩක් පවතී. ඒ අනුව, ඩිජිටල් යටිතල පහසුකම්වල ආයෝජනයට, ඩිජිටල්කරණය මගින් ඇතිවන විෂමතා මගහරවා ගැනීම සඳහා ඩිජිටල් සාක්ෂරතාවය සහ කුසලතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට මෙන්ම නවෝත්පාදන, තාක්ෂණ හුවමාරුව සහ විදේශ ආයෝජන දිරිමත් කිරීමට සහාය දක්වන නියාමන පරිසරයක් නිර්මාණය කිරීමට අදාළව සිය ප්‍රයත්නයන් වේගවත් කිරීම සඳහා ශ්‍රී ලංකාව උත්සාහ ගත යුතුය. ආර්ථිකයේ මානව ප්‍රාග්ධනයෙහි ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වැඩි ඉඩප්‍රස්ථා නිර්මාණය කරන අතර ම, සමාජ ආරක්ෂණ ජාල මගින් පුද්ගලයන් ඉලක්ක කිරීමෙහි පවතින දුර්වලතා, බදු පරිපාලනයේ සහ අධීක්ෂණයේ පවතින අභියෝග, සැපයුම් දාමවල ඇති අකාර්යක්ෂමතාව, අලෙවිකරණය සඳහා ඇති බාධා, සහ රාජ්‍ය අංශය තුළ පවතින සම්බන්ධීකරණ හා විනිවිදභාවය පිළිබඳ ගැටලු වැනි ආර්ථිකයේ ව්‍යුහාත්මක අවහිරතා මගහරවා ගැනීමට ඩිජිටල්කරණය මගින් ශ්‍රී ලංකාවට හැකියාව ලැබේ. තවද, ඩිජිටල්කරණය මගින් ගෝලීය වටිනාකම් දාමයන් වෙත ප්‍රවේශවීම ඉහළ නංවාලමින් ඒ හා ඒකාබද්ධ වීමට පහසුකම් සපයන අතර, අවසානයේ දී වෙළඳපොළ අවස්ථා අත්පත් කර ගැනීමට සහ ඉදිරි කාලය තුළ ආර්ථිකය යථා තත්ත්වයට ගෙනයාමට රටට ඇති හැකියාව වර්ධනය කරනු ඇත. රජය විසින් ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලිය මෙහෙයවනු ලැබුව ද ඩිජිටල් සංවර්ධනයේ දී පෞද්ගලික අංශයට සැලකිය යුතු වගකීමක් පැවරෙනු ඇත. තාක්ෂණයේ වෙනස්වීම්වලට සමගාමීව සමාජය තුළ පුළුල් ලෙස පැතිරී ඇති ඩිජිටල් භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ මට්ටමින් පවතින ඩිජිටල්කරණයෙහි විෂමතා අවම කිරීම අරමුණු කරගත් ආයෝජන, නවෝත්පාදන, තාක්ෂණ හුවමාරු සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය මෙයට ඇතුළත් වේ. ඒ අනුව, ආරක්ෂිත හා විශ්වාසදායක ඩිජිටල් පද්ධති සංවර්ධනයක් සඳහා වැදගත් වන රජය, නියාමනය සිදු කරන පාර්ශ්ව, නීති අධිකාරීන් සහ පෞද්ගලික අංශය ඇතුළු සියලුම පාර්ශ්වකරුවන්

1

අතර ක්‍රියාකාරී සහයෝගීතාවයෙන් යුතු බහුවිධ මෙන්ම මනා සම්බන්ධීකරණයක් සහිත, ස්ථාවර ප්‍රතිපත්තිමය ප්‍රවේශයක් මගින් වර්තමානයේ ඩිජිටල්කරණයෙහි විෂමතා අවම කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් ආර්ථිකයේ ක්‍රියාකාරකම්හි අනෙකුත් අංශයන් වෙත ධනාත්මක බලපෑම් ඇති කරනු ඇත. එසේම, සයිබර් ආරක්ෂාව සඳහා අදාළ නීති බලගැන්වීම ද අවශ්‍ය වන අතර, ඉන් පුළුල් මූල්‍ය පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා සුදුසු නීති සහ නියාමනයන් සකස් කිරීමට ද සහාය සැලසේ.

ආර්ථික අර්බුදයෙන් නැඟී සිටීම සඳහා දැඩි උත්සාහයෙන් යුතුව කටයුතු කිරීම සහ ආර්ථික ස්ථායිතාව හා වර්ධනය සඳහා උපාය මාර්ග සකස් කිරීම අත්‍යවශ්‍ය වන නමුත්, තිරසාර වර්ධනයක් සහතික කිරීමට පරිසරය සංරක්ෂණය ද අත්‍යවශ්‍ය වේ. වන විනාශය, අලි මිනිස් ගැටුම, නීතිවිරෝධී පතල් කැණීම්, අසංවිධිත කසළ බැහැර කිරීම, කාබන් විමෝචනය, වනජීවී හා කාලගුණික විපර්යාස හේතුවෙන් සිදු වන භෝග හානි වැනි දිගුකාලීන පාරිසරික ගැටලු හේතුවෙන් නොයෙක් සමාජ-ආර්ථික බලපෑම් ඇති කෙරෙයි. ශ්‍රී ලංකාවේ පාරිසරික උෂ්ණත්වයෙහි සැලකිය යුතු ඉහළ යෑමක් මෙන්ම මෑත දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ වාර්ෂික වර්ෂාපතනය සහ එක දිගට පවතින වියළි දින ගණන ද ඉහළ ගොස් ඇති බව සාක්ෂි මගින් පෙන්නුම් කෙරේ. ජාත්‍යන්තර අධ්‍යයනයන් කිහිපයක් ද ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාස සඳහා වඩාත් ම අවදානමට ලක්විය හැකි රටක් ලෙස හඳුනාගෙන ඇත. ගංවතුර, නියඟ, අක්‍රමවත් වර්ෂාපතන රටා, තාප තරංග, නාය යෑම් සහ පළිබෝධ පැතිරීම් වැනි දේශගුණය ආශ්‍රිත ගැටලුවලින් පසුගිය දශක දෙක තුළ ආර්ථිකය සැලකිය යුතු ලෙස පීඩාවට පත්ව ඇත. අපනයන ආදායම් උපයන අතර ම, රටෙහි පුරවැසියන්ගේ ප්‍රෝටීන් අවශ්‍යතාව සඳහා ද වැදගත් ප්‍රභවයක් වන මත්ස්‍ය සම්පතේ සුලබතාව සඳහා ඉහළ යන උෂ්ණත්වය සහ සාගර ආම්ලිකතාවය අහිතකර බලපෑම් ඇති කරයි. ආහාර සැපයුම අහිමි වීමේ ප්‍රතිඵලයක් ලෙස උද්ධමනය, ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ සුබසාධනය පහළ යෑම, ආහාර ආනයනය කිරීම සඳහා සීමිතව පවතින විදේශ විනිමය වැය කිරීමට සිදු වීම, සහ කෘෂිකාර්මික නිෂ්පාදනවලින් ලැබෙන අපනයන ආදායම අහිමි වීම සිදු වේ. ශ්‍රී ලංකාව, බලශක්තිය සඳහා ජල විදුලිය මත බොහෝ දුරට යැපීම (2022 වසරේ දී සියයට 33.7) සහ වැසි රටාවන්හි මෑතක දී සිදු වූ වෙනස්කම් සලකා බලන විට, දේශගුණික විපර්යාස මගින් බලශක්ති උත්පාදනය කෙරෙහි එල්ල කළ හැකි බලපෑම් ප්‍රබල වී ඇත. ශ්‍රී ලංකාවේ අඛණ්ඩව පවතින විදේශ විනිමය හිඟය සහ බලශක්ති අනාරක්ෂිතාව ගැන සලකා බැලීමේ දී, ගෝලීය තෙල් මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම මගින් මෙම ගැටලුව තවත් උග්‍ර කරවයි. තවද, විදේශ මුදල් හිඟය හේතුවෙන් විදුලිය නිපදවීමට ද්‍රව ඉන්ධනවල දායකත්වය ඉහළ නැංවීමට නොහැකි වීම නිසා වාර්ෂිකව බලශක්ති උත්පාදනය සඳහා ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 2කට අධික ප්‍රමාණයක් ආනයනය කෙරේ. අවාසනාවකට මෙන්, ශ්‍රී ලංකා ආර්ථිකය විශාල ලෙස යැපෙන කර්මාන්තයක් වන සංචාරක ව්‍යාපාරයට, අහිතකර දේශගුණය, ස්වභාවික විපත් සහ පරිසර දූෂණය ඍණාත්මක බලපෑමක් ඇති කරයි. රජය සහ මහ බැංකුව විසින් මෑතක සිට පරිසර සංරක්ෂණ ව්‍යාපාරයට සහයෝගය දැක්වීමටත්, ආර්ථික ක්‍රියාකාරකම්වලින් පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමටත්, පරිසර සංරක්ෂණයට සහාය ලබා දෙන ක්‍රියාකාරකම් සඳහා අරමුදල් ප්‍රවාහ යොමු කිරීමටත් පියවර කිහිපයක් ගන්නා ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව තිරසාර මූල්‍ය පෙර දැක්මක් සහ ඒ සම්බන්ධ වර්ගීකරණයක් (taxonomy) නිර්මාණය කිරීමට ලෝක බැංකුවේ ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (International Finance Corporation) සමඟ එක්ව කටයුතු කළේය. එමෙන්ම, දේශගුණ සෞභාග්‍යය පිළිබඳ සැලැස්මක් මෑතක දී දියත් කරන ලදී. පාරිසරිකව මතු විය හැකි ගැටලුවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමට අවශ්‍ය ආයෝජන සිදු කිරීම සඳහා රටේ ආර්ථිකමය ශක්තිමත්භාවය ඉහළ නැංවීම ද අවශ්‍ය වේ. හඳුනාගත් අධිකාරියක් විසින් මහජනතාව වෙත දේශගුණය, වායුගෝලීය උණුසුම, වන ආවරණය, වන සත්ත්ව ගහන, ඛනිජ සම්පත්, පරිසර දූෂණය යනාදී පරිසරයේ සියලු අංශ ආවරණය වන පරිදි පරිසරය පිළිබඳ පරිපූර්ණ සහ මධ්‍යගත වාර්තා ඉදිරිපත් කිරීමක් කලින් කලට කළ යුතුය. එමගින්, පාරිසරික ගැටලු පිළිබඳව ජනතාව අතර දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීමට සහ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සාර්ථක ලෙස සම්බන්ධීකරණය කිරීමට හැකි වේ. පුනර්ජනනීය බලශක්තිය, ජල කළමනාකරණය සහ කසළ කළමනාකරණය වැනි ක්ෂේත්‍ර කිහිපයක් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරන පරිසර හිතකාමී ව්‍යාපෘති සහ පරිසර සංරක්ෂණයට අදාළ ව්‍යාපෘති සඳහා විදේශ ආයෝජන සහ ප්‍රදාන ආකර්ෂණය කර ගත යුතුය. තිරසාර සහ සියලුදෙනා හට ප්‍රතිලාභ සලසන වර්ධනයක් උදෙසා, හරිත සහ නීල ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීමට දේශීය මූල්‍ය ආයතන දිරිමත් කළ යුතුය. පාරිසරික ආරක්ෂාව පිළිබඳ නිසි සැලකිල්ලකින් යුතුව කටයුතු

කරන බව පිළිබිඹු කිරීමෙන්, බහුපාර්ශ්වික, ද්විපාර්ශ්වික සහ වගකිවයුතු පෞද්ගලික අංශයේ ආධාර සපයන්නන්ගෙන් සහනදායී මූල්‍ය විකල්ප කිහිපයක් ලබා ගැනීමට ඉඩ සැලසෙනු ඇති අතර, එය රටෙහි ණය තිරසාරභාවය යළි ඇති කිරීමට වර්තමානයේ ගනු ලබන ප්‍රයත්නයට උපකාරයක් වනු ඇත. දිගු කාලීනව පාරිසරික වගවීම ඉහළ නැංවීම සඳහා, සිදුවන පාරිසරික හානිය සඳහා ගැළපුම් සිදු කරමින් ද.දේ.නි. ගණනය කිරීමෙන් ලබා ගන්නා 'හරිත දළ දේශීය නිෂ්පාදිතයක්' වැනි නව්‍ය පියවර යොදා ගත යුතුය.

දැනට සිදු කෙරෙමින් පවතින ණය ප්‍රතිව්‍යුහගතකරණ ප්‍රයත්නයන්ගෙන් ප්‍රතිලාභ ලබන අතරම, ආර්ථිකයේ ප්‍රධාන ක්ෂේත්‍රවල අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කඩිනමින් සිදුකිරීම මත ආර්ථික වර්ධනයේ තිරසාරභාවය රඳා පවතී. ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු රටක ආර්ථික වර්ධනය කෙරෙහි මිශ්‍ර බලපෑම් ඇතිකළ හැකි බව ඒ පිළිබඳව විශ්ලේෂණය කිරීමේ දී පෙනී යයි. ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය මගින් ඇති විය හැකි ආයෝජක සහ ව්‍යාපාරික විශ්වාසය පලුදු වීම, වාණිජ ණය සඳහා ප්‍රවේශය අඩුකම, ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම හා සම්බන්ධ ණය පිරිවැය ඉහළ යෑම සහ රජයේ වියදම් අඩු කිරීම වැනි සාධක ආර්ථික වර්ධනයට ඍණාත්මකව බලපෑ හැකිය. කෙසේ වෙතත්, ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට ධනාත්මක ලෙස බලපෑ හැකි මැදි කාලීනව රජයේ ණය ගැනීම් අඩු කිරීමට සහ පුද්ගලික අංශයේ ආයෝජන සඳහා ණය ලබා ගැනීමේ හැකියාව වැඩි කිරීමට ණය ප්‍රතිව්‍යුහගතකරණය සහාය විය හැකිය. ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් අනතුරුව වුව ද, පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගතකරණ කාල සීමාව තුළ රටක ණය ආපසු ගෙවීමට ඇති හැකියාව සඳහා ආර්ථිකය වර්ධනය වීම ප්‍රධාන සාධකයක් ලෙස පවතියි. රටක් තම ආර්ථික වර්ධනය යථා තත්ත්වයට පත් කිරීමට අසමත් වූ විට, පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගතකරණ කාල සීමාව තුළදී පෙර පරිදි රාජ්‍ය ණයවල තිරසාරභාවය පවත්වාගත නොහැකි වීම වැනි ගැටලුවලට ලක් නොවී ණය ප්‍රතිව්‍යුහගතකරණයේ ප්‍රතිලාභ පවත්වා ගැනීම මෙන්ම ණය වගකීම් සපුරාලීම වඩාත් දුෂ්කර විය හැකිය. පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගතකරණ කාල සීමාව තුළ රටක ආර්ථික ක්‍රියාකාරිත්වය සාධක කිහිපයක් හේතුවෙන් එහි විභව මට්ටමට වඩා පහතට වැටිය හැකිය. එම සාධක අතර, විදේශීය හෝ දේශීය ආර්ථික වර්ධනයට ඇති බාධා හේතුවෙන් ඇතිවිය හැකි අහිතකර ආර්ථික තත්ත්ව, ණය හිමියන් සමඟ ගිවිසුම්වලට එළඹීම හෝ ප්‍රතිව්‍යුහගතකරණය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ඇති අභියෝග, විශේෂයෙන් ම අපේක්ෂිත ආර්ථික වර්ධනයක් ලබාගැනීමට අපොහොසත් වන ප්‍රමාණවත් නොවන ප්‍රතිපත්තිමය පියවර මෙන්ම, ණය අර්බුදයක දී ඉහළ මට්ටමක පැවතිය හැකි දේශපාලන අස්ථාවරත්වය, සහ එමගින් ඇතිවන ආයෝජක විශ්වාසය අඩපණ වීම ඇතුළත් වේ. ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගතකරණයකින් පසු ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාවට නංවා විවිධ මට්ටමින් සාර්ථක වූ රටවල් පිළිබඳ උදාහරණ කිහිපයක් ඇත. 2010 වසරේ දී අයර්ලන්ත රජය විසින් සිය ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමෙන් පසු ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා බදු අඩු කිරීම්, රජයේ වියදම් වැඩි කිරීම සහ තරගකාරිත්වය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ඇතුළුව ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රාශියක් ක්‍රියාවට නංවන ලදී. මෙම ප්‍රතිසංස්කරණ, ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සහ තාක්ෂණික අංශයේ ඇති වූ පිබිදීම සමඟ, ඉල්ලුම ඉහළ නැංවීමට සහ ආර්ථික වර්ධනයට උපකාරී විය. තවත් උදාහරණයක් ලෙස ඉක්වදෝරය විසින් රජයේ වියදම් වැඩි කිරීම, යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම සහ ඉලක්කගත සමාජ වියදම් වැඩසටහන් ඇතුළුව ආර්ථික වර්ධනය ඉහළ නැංවීම අරමුණු කරගත් ප්‍රතිපත්ති මාලාවක් ක්‍රියාවට නැංවීම සඳහන් කළ හැකිය. මෑත වසරවල දී රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය පවත්වා ගැනීමේ අභියෝගවලට මුහුණ පෑමට මෙම රටට සිදු වුවත් ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු ඉල්ලුම වර්ධනය කිරීමට සහ ආර්ථික වර්ධනයට සහාය වීමට මෙම ක්‍රියාමාර්ග උපකාරී විය. ආර්ථික, දේශපාලනික සහ සමාජීය අභියෝග රැසකට මුහුණ දී සිටි අවස්ථාවල දී, ශ්‍රී ලංකාව පසුබෑම්වලින් යථා තත්ත්වයට පත් වීමට විශිෂ්ඨ හැකියාවක් ඇති බව පෙන්නුම් කර ඇත. මෙම ඔරොත්තු දීමේ හැකියාව සඳහා රටේ ශක්තිමත් සංස්කෘතික හා සමාජ ව්‍යුහය මෙන්ම එහි උගත් සහ කුසලතා ඇති ශ්‍රම බලකාය ද හේතු වේ. ශ්‍රී ලංකාවේ ඔරොත්තු දීමේ හැකියාව එහි ජනතාවගේ සහ ආයතනවල ශක්තිය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ සාක්ෂියක් වන අතර, එමගින් ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් අනතුරුව අනාගත ආර්ථික වර්ධනය සහ සංවර්ධනය සඳහා ශක්තිමත් පදනමක් සපයනු ලැබේ. කෙසේ වෙතත්, ආර්ථික වර්ධනය ඉක්මනින් යථා තත්ත්වයට පත් කිරීමේ දී අභියෝග කිහිපයක් පවතියි. පළමුව, තෝරාගත් ණය සේවාකරණ පරාසයක් තාවකාලිකව අත්හිටුවීම

1

මෙන්ම ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේ නිරත වීමේ පළමු අත්දැකීමට ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටියි. ණය ප්‍රතිව්‍යුහගතකරණය සූක්ෂ්මමව සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී මෙන්ම යථා තත්ත්වයට පත් වීම සඳහා පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගතකරණ උපාය මාර්ග කාලෝචිත ලෙස සකස් කිරීමේ දී අත්දැකීම් නොමැතිවීම මගින් එම ක්‍රියාවලිය දුර්වල විය හැකිය. තවද, වෙනත් බොහෝ රටවල් මෙන් නොව, ශ්‍රී ලංකාවේ තත්ත්වය වඩාත් සංකීර්ණ වේ. ගෙවුම් තුලන අර්බුදය, උද්ධමනය ඉහළ යෑම, ශ්‍රී ලංකා රුපියල කැපී පෙනෙන ලෙස දුර්වල වීම, සමාජ නොසන්සුන්තාවය හා දේශපාලනික අර්බුදය ඇතුළු වෙනත් අස්ථාවර තත්ත්ව හා දුෂ්කරතා සමඟ තිරසාර නොවන රාජ්‍ය ණය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ගනු ලැබූ පූර්ව ණය සේවාකරණ අත්හිටුවීමේ ක්‍රියාමාර්ගය බැඳී පවතියි. මෙම බහුවිධ අර්බුදය විසඳීම සඳහා දැනටමත් ගෙන ඇති සහ අපේක්ෂිත ක්‍රියාමාර්ග ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කර නොමැති අතර සාර්ව ආර්ථික ස්ථායීතාව යථා තත්ත්වයට පත් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. එබැවින්, ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේ ප්‍රගතියට සමගාමීව, විදේශීය හා දේශීය පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව ආර්ථික වර්ධනය වැඩිදියුණු කිරීමේ දැක්මක් රජය විසින් සකස් කිරීම අත්‍යවශ්‍ය වේ. ජා.මූ. අරමුදලේ සහ අනෙකුත් බහුපාර්ශ්වික නියෝජිතායතනවල මූල්‍යාධාර ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් නැවත විශ්වාසය ඇති කර ගැනීම සඳහා ශක්තිමත් පදනමක් ගොඩනැගීමට උපකාරී වනු ඇත. රාජ්‍ය අංශයේ සහ රජය සතු ව්‍යවසායයන්හි ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිව්‍යුහගතකරණ එම අංශයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට උපකාරී වන අතරම වක්‍ර ලෙස පුද්ගලික අංශය සඳහා ද සහාය වනු ඇත. දූෂණය වැළැක්වීම සහ නීතිය හා සාමය පිළිපැදීම වර්ධනය කිරීම ද අත්‍යවශ්‍ය වන අතර, ඒ සඳහා වන ඉල්ලුම සමස්ත සමාජයෙන් ම ඇති විය යුතුය. එමගින් නිසැකවම ව්‍යාපාර සිදු කර ගෙන යෑමේ පරිසරය වැඩි දියුණු වීම තුළින් ආයෝජන කලාපයක් ලෙස රටේ ආකර්ෂණය වැඩි වනු ඇත. කෘෂිකර්මාන්තය, කර්මාන්ත, ජාත්‍යන්තර වෙළඳාම සහ ආයෝජන ප්‍රතිපත්ති වැනි ප්‍රධාන ක්ෂේත්‍රවල ජාතික ප්‍රතිපත්ති සැකසීම මෙන්ම ඒවා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම තුළින් ආර්ථික වර්ධනය ඉහළ නංවනු ඇත. ණය ප්‍රතිව්‍යුහගතකරණය මගින් ශ්‍රී ලංකා ආර්ථිකය නැවත ස්ථායීතාවයට පත්වීමට අවශ්‍ය අවකාශය නිර්මාණය කෙරෙන බව නොඅනුමානය. කෙසේ වෙතත්, මෙම අවකාශය තිරසාරව පවත්වා ගනිමින් ආර්ථික විභවය කරා ළඟාවීම මගින් මෙම ඉතිහාසගත මොහොතේ පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීමට දොරගුළු විවර කෙරෙණු ඇත.

මෙම පසුබිම තුළ, වසර ගණනාවක් තිස්සේ ඉස්මතු කරන ලද සමහර ගැටලු විසඳීම සඳහා දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ග අගය කරන අතර ම, ක්‍රමානුකූල හා තිරසාර ලෙස ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත් කර ගැනීමට, අනෙකුත් දිගුකාලීන ව්‍යුහාත්මක ගැටලු විසඳීම පිණිස උපායමාර්ග සැකසීමට රජය, අදාළ බලධාරීන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් සාමූහික උත්සහයක් දැරිය යුතුය. ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දක්වන වැඩසටහනකින් පමණක් මේ අවස්ථාවෙහි රට මුහුණ පාමින් සිටින සියලු ගැටලු විසඳිය නොහැකි බව ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන් අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ. ඒ වෙනුවට, සියලු පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම මගින් කාලයක් මුළුල්ලේ ක්‍රියාත්මක කෙරෙන වැරදි පියවර නිවැරදි කිරීමට සහ ඒවාට පිළියම් යෙදීමට රටක් ලෙස මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගත යුතු අතර, එමගින් එවැනි සහාය ලබා ගැනීමේ වැඩසටහන් නැවත නැවතත් අවශ්‍ය වීම වළක්වා ගත හැකිය. එබැවින්, අවශ්‍ය රාජ්‍ය මූල්‍ය හා රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ ප්‍රතිසංස්කරණ සිදු කිරීම, රටේ වර්ධන විභවය වැඩිදියුණු කිරීම, විදේශ සංචිත නැවත ගොඩනංවා ගනිමින් මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම, රාජ්‍ය ණය තිරසාරත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ වඩාත් වැදගත් කරුණක් ලෙස දූෂණය අවම කිරීම හා සුදුසු සමාජ ආරක්ෂණ ජාල යෝජනා ක්‍රම හරහා අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට සහාය වීම ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට සියලුම පාර්ශ්වකරුවන් විසින් දැඩි නොපසුබට උත්සාහයක් යෙදීම අවශ්‍යය. මෙම ක්‍රියාවලියේ දී, රටට වඩාත් සුදුසු දේ පිළිබඳව දැනුම්වත්ව සිටීමටත්, කෙටිකාලීන දේශපාලන වාසි උදෙසා ඉහත සඳහන් කළ ප්‍රතිසංස්කරණ වැඩසටහන් ක්‍රියාත්මක නොකර සිටීමට උත්සාහ ගන්නේ නම් එය වළක්වාලීමටත්, මහජනතාව ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් වග බලා ගත යුතුය. මෙමගින් රටේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය ආරක්ෂා කරමින් තිරසාර ආර්ථික වර්ධන මාවතේ ස්ථාවර ප්‍රගතියක් ලබා ගැනීම සහතික කෙරෙනු ඇත.

2

ජාතික නිෂ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය

2.1 සමස්ත නිරීක්ෂණ

ශ්‍රී ලංකා ආර්ථිකය, නිදහසින් පසු මුහුණ දුන් බරපතළම ආර්ථික අර්බුදය හමුවේ, 2022 වසරේ දී පෙර නොවූ විරූ පරිදි සියයට 7.8ක පහත වැටීමක් වාර්තා කළ අතර, ක්‍රියාත්මක කරන ලද විචක්ෂණශීලී ප්‍රතිපත්ති අර්බුදකාරී වාතාවරණය තවදුරටත් තීව්‍ර වීම වැළැක්වීමට උපකාරී විය. අර්බුදය මුල් අවධියේ දී ප්‍රධාන වශයෙන් දැඩි විදේශ විනිමය හිඟතාවය හේතුවෙන් භාණ්ඩ සැපයුම් ක්‍රියාවලිය සඳහා බාධා සිදු වීම නිසා පාරිභෝගික භාණ්ඩ, ඉන්ධන හා විදුලිය වැනි බලශක්ති සහ නොයෙකුත් කර්මාන්ත සඳහා අවශ්‍ය යෙදවුම් ආදියේ උග්‍ර හිඟයක් ඇති වූ අතර, ඒ හා සමගාමීව ඒවායේ මිල මට්ටම් ද විශාල ලෙස ඉහළ යන ලදී. මෙම වාතාවරණය තවදුරටත් උග්‍ර වීම පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් උද්ධමනය පාලනය කිරීමට සැලකිය යුතු ලෙස ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම සහ විදේශ විනිමය පිටතට ගලා යෑම පාලනය කිරීමට අත්‍යවශ්‍ය ආනයන සඳහා පමණක් ප්‍රමුඛතාව ලබා දීම වැනි දැඩි නමුත් අත්‍යවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලැබීය. මෙම ක්‍රියාමාර්ග මගින් අධික ඉල්ලුම පාලනය කිරීමට, සැපයුම් අංශයේ අවහිරතා අවම කිරීමට මෙන්ම ඉන්ධන සහ කර්මාන්ත සඳහා අවශ්‍ය යෙදවුම් ඇතුළු අත්‍යවශ්‍ය ආනයන සඳහා වැඩි ඉඩප්‍රස්ථා ඇති කිරීම තුළින් ආර්ථිකය ක්‍රමයෙන් ස්ථාවර කිරීමට හැකි විය. ආර්ථිකයෙහි ඇති වූ අයහපත් ක්‍රියාකාරීත්වය පෙන්නුම් කරමින් කර්මාන්ත, සේවා සහ කෘෂිකර්මාන්ත යන ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වයේම ක්‍රියාකාරීත්වය 2022 වසරේ දී පහත වැටුණි. ඒ අනුව, නිෂ්පාදන කර්මාන්ත, ඉදිකිරීම් සහ පතල් හා කැණීම් කටයුතු කර්මාන්ත කටයුතුවල පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේ දී සංචාරක පැමිණීම් ඉහළ යෑම නිසා ඇති වූ ප්‍රතිලාභ හමුවේ වුවද, නිවාස අයිතිය ද ඇතුළත් දේපළ වෙළඳාම් කටයුතු, රක්ෂණ සේවා හා මූල්‍ය සේවා ආදියේ පසුගාමීත්වය සමස්ත සේවා කටයුතුවල පහත වැටීමට මූලිකව හේතු විය. මේ අතර, ඉන්ධන හිඟය හේතුවෙන් මත්ස්‍ය නිෂ්පාදන කටයුතු පහත වැටීම, සත්ත්ව ආහාර හිඟය නිසා සත්ත්ව නිෂ්පාදන කටයුතු පහත වැටීම සහ පොහොර හිඟය නිසා වී සහ එළවළු වගා කටයුතුවලට බාධා සිදුවීම සමස්ත කෘෂිකාර්මික කටයුතු පහත වැටීමට හේතු විය. තවද, ප්‍රධාන ශ්‍රම වෙළඳපොළ දර්ශක යම් යහපත් ප්‍රවණතාවයක් පෙන්නුම් කළ ද මෙම අයහපත් ආර්ථික තත්ත්වය මත ශ්‍රම ඵලදායීතාවය පහත වැටුණි. මේ අතර, වියදම් ප්‍රවේශය සැලකූ විට මිල මට්ටම් ශීඝ්‍රයෙන් ඉහළ යෑම හේතුවෙන් පවත්නා මිල අනුව ආයෝජන මෙන්ම පරිභෝජන වියදම් ද 2022 වසර තුළදී සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. කෙසේ වුව ද, ස්ථාවර මිල අනුව සැලකූ විට ඉහළ උද්ධමනය සහ ණය පොලී වියදම ඉහළ යෑම හමුවේ ක්‍රය ශක්තිය හීන වීම සහ ආයෝජකයින් විසින් ආයෝජන සිදු කිරීමට යොමු නොවීම නිසා පරිභෝජන මෙන්ම ආයෝජන වියදම ද පහත වැටුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම ද දායක කොටගෙන භාණ්ඩ හා සේවා ආනයනවලට වඩා භාණ්ඩ හා සේවා අපනයන ඉහළ යෑම හේතුවෙන් ශුද්ධ විදේශීය ඉල්ලුමෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. මෙහිදී, ආනයනවල සාපේක්ෂ අඩු වර්ධනය සඳහා බැංකු පද්ධතිය තුළ විදේශ විනිමය ද්‍රවශීලතාව පහත වැටීම, අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම, රුපියල වේගයෙන් අවප්‍රමාණය වීම මෙන්ම දැඩි මුදල් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම හේතු විය.

2

2.2 දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)[1], දළ ජාතික ආදායම (ද.ජා.ආ.) සහ ඒක පුද්ගල ද.දේ.නි.

2021 වසරේ දී ස්ථාවර වෙළඳපොළ මිල (2015) අනුව (මින් මතු "ස්ථාවර මිල" යනුවෙන් සඳහන් කරනු ලබන) සියයට 3.5කින් වර්ධනය වූ දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.), 2022 වසරේ දී සියයට 7.8කින් පහත වැටුණු අතර, මේ සඳහා රට හමුවේ පැවති අභිතකර ආර්ථික තත්ත්වයන් සමනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් ගන්නා ලද දැඩි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඉවහල් විය. මේ අතර, පවත්නා වෙළඳපොළ මිල අනුව (මින් මතු "පවත්නා මිල" යනුවෙන් සඳහන් කරනු ලබන) ද.දේ.නි. 2022 වසරේ දී රුපියල් බිලියන 24,147.7 (එ.ජ. ඩොලර් බිලියන 77.1)ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 2021 වසරේ දී වාර්තා වූ රුපියල්

1 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදන, වියදම් සහ ආදායම් යන ප්‍රවේශ තුන යටතේ ද.දේ.නි. ඇස්තමේන්තු කරනු ලබයි.

2.1 සංඛ්‍යා සටහන

කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2015 ස්ථාවර මිල අනුව) (අ)(ආ)

ආර්ථික කටයුතු	වර්ධනය (%)		ද.දේ.නි. හි වර්ධනයට දායකත්වය (%)		ද.දේ.නි. ට දායකත්වය (%)	
	2021 (ඇ)	2022	2021 (ඇ)	2022	2021 (ඇ)	2022
කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය	**0.9**	**- 4.6**	**0.1**	**- 0.3**	**7.3**	**7.5**
ධාන්‍ය වගාව (වී හැර)	2.8	- 21.6	0.00	- 0.04	0.2	0.1
වී වගාව	- 11.8	- 13.0	- 0.11	- 0.11	0.8	0.8
එළවළු වගාව	- 1.7	- 8.4	- 0.02	- 0.07	0.8	0.8
උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග	- 7.3	1.8	- 0.00	0.00	0.0	0.0
පලතුරු වගාව	- 10.8	0.5	- 0.07	0.00	0.6	0.6
තෙල් සහිත පලතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් ෆාම් වගාව)	11.2	8.6	0.08	0.07	0.8	0.9
තේ වගාව	8.5	- 15.9	0.05	- 0.09	0.6	0.5
වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී)	- 16.2	- 9.1	- 0.00	- 0.00	0.0	0.0
කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව	4.5	3.3	0.03	0.02	0.8	0.8
රබර් වගාව	6.2	- 6.7	0.01	- 0.01	0.2	0.2
වෙනත් බහුවාර්ෂික භෝග වගාව	- 9.5	2.0	- 0.02	0.00	0.2	0.2
කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන්	8.2	- 12.9	0.06	- 0.09	0.7	0.7
පැල බෝකිරීම	30.8	8.3	0.00	0.00	0.0	0.0
කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන්	14.2	14.7	0.03	0.03	0.2	0.3
වන වගාව, ගස් කැපීම හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන	4.4	16.1	0.01	0.05	0.3	0.4
ධීවර කර්මාන්තය	1.5	- 10.5	0.02	- 0.11	1.1	1.0
කර්මාන්ත	**5.7**	**- 16.0**	**1.7**	**- 4.8**	**30.2**	**27.5**
පතල් හා කැණීම් කර්මාන්තය	1.4	- 31.0	0.03	- 0.68	2.2	1.7
නිෂ්පාදන කර්මාන්ත	7.4	- 12.6	1.23	- 2.18	17.2	16.3
විදුලිය, ගෑස්, වාෂ්ප හා වායුසමීකරණ සැපයීම	4.9	- 5.9	0.07	- 0.09	1.4	1.5
ජලය පිරිසිදු කිරීම සහ බෙදාහැරීම	- 17.8	0.6	- 0.02	0.00	0.1	0.1
මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය	- 3.3	3.9	- 0.01	0.01	0.2	0.2
ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන්	4.4	- 20.9	0.39	- 1.88	9.0	7.7
සේවාවන්	**3.5**	**- 2.0**	**2.0**	**- 1.1**	**56.9**	**60.5**
වෙළඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන්	1.3	2.6	0.31	0.62	24.2	26.9
තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන්	18.0	- 1.4	0.51	- 0.05	3.2	3.5
මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම	7.5	- 15.4	0.76	- 1.63	10.5	9.7
වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන්	1.8	- 0.6	0.18	- 0.06	9.9	10.7
රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන්	2.2	- 0.3	0.20	- 0.03	9.0	9.7
මූලික මිල අනුව සමස්ත එකතු කළ අගය	**4.0**	**- 6.7**	**3.7**	**- 6.3**	**94.4**	**95.5**
භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු - සහනාධාර	- 3.6	- 27.1	- 0.2	- 1.5	5.6	4.5
වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)	**3.5**	**- 7.8**	**3.5**	**- 7.8**	**100.0**	**100.0**
විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම	12.6	- 3.5				
වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම	**4.0**	**-8.1**				

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2.1 රූප සටහන

2022 වසරේ ජාතික නිෂ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය සංක්ෂිප්තයක් ලෙස

අර්බුදකාරී වාතාවරණය හමුවේ ශ්‍රී ලංකා ආර්ථිකය පෙර නොවූ විරූ පහත වැටීමක් වාර්තා කළේය...



2

නිෂ්පාදන ප්‍රවේශය



- **සේවා** -2.0% ↓
  දේපළ වෙළඳාම් සහ රක්ෂණ කටයුතු පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.
- **කර්මාන්ත** -16.0% ↓
  නිෂ්පාදන සහ ඉදිකිරීම් කටයුතු පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.
- **කෘෂිකර්මාන්තය** -4.6% ↓
  වී වගාව සහ සත්ත්ව නිෂ්පාදන කටයුතු පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.
- **බදු-සහනාධාර** -27.1% ↓

වියදම් ප්‍රවේශය



- **පෞද්ගලික පරිභෝජනය** 39.0% ↑
  ආහාර සහ ප්‍රවාහනය සඳහා වූ වියදම් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය.
- **රාජ්‍ය පරිභෝජනය** 3.8% ↑
  සමාජ ආරක්ෂණය සහ අධ්‍යාපනය සඳහා වූ වියදම් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය.
- **දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය** 28.4% ↑
  දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය.
- **ශුද්ධ අපනයන** 34.1% ↑
  අපනයන වටිනාකම් වැඩි වශයෙන් ඉහළ යෑම බලපාන ලදී.
  - භාණ්ඩ හා සේවා අපනයන 74.1% ↑
  - භාණ්ඩ හා සේවා ආනයන 41.2% ↑

ආදායම් ප්‍රවේශය



- සේවක ආදායම් 32.6% ↑
- දළ මෙහෙයුම් අතිරික්තය 36.0% ↑
  - ශුද්ධ මෙහෙයුම් අතිරික්තය 36.8% ↑
  - ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය 31.2% ↑
- දළ මිශ්‍ර ආදායම් 45.4% ↑
  - ශුද්ධ මිශ්‍ර ආදායම් 46.4% ↑
  - ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය 23.0% ↑
- නිෂ්පාදනය මත වෙනත් බදු-සහනාධාර 30.4% ↑

ශ්‍රම වෙළඳපොළ දර්ශක

ශ්‍රම බලකාය	ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය	ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය	සේවා නියුක්ත ජනගහනය	සේවා වියුක්ති අනුපාතිකය	විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්
මිලියන 8.553 (2021) මිලියන 8.547 (2022)	මිලියන 8.581 (2021) මිලියන 8.615 (2022)	49.9% (2021) 49.8% (2022)	මිලියන 8.114 (2021) මිලියන 8.148 (2022)	5.1% (2021) 4.7% (2022)	122,264 (2021) 311,056 (2022)

2

2.2 රූප සටහන
වාර්ෂික ද.දේ.නි. වර්ධන අනුපාතිකය (අ)



(අ) ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ. (2015 පදනම් වර්ෂය)

මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

බිලියන 17,600.2 (එ.ජ. ඩොලර් බිලියන 88.5)ක අගයට සාපේක්ෂව සියයට 37.2ක වර්ධනයකි. පවත්නා මිල අනුව ද.දේ.නි.යේ දක්නට ලැබුණු මෙම ඉහළ වර්ධනයට ප්‍රධාන වශයෙන් වසර තුළ දී පැවති ඉහළ මිල මට්ටම්වල බලපෑම හේතු වූ අතර, එය ද.දේ.නි. ගම්‍ය මිල අවධමනකය 2021 වසරේ දී වාර්තා කළ සියයට 8.5ක අගයේ සිට 2022 වසරේ දී සියයට 48.8ක් දක්වා ඉහළ යෑම මඟින් ද පිළිබිඹු වේ.

ද.දේ.නි.ට ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායම ගැළපීම මඟින් ඇස්තමේන්තු කරනු ලබන දළ ජාතික ආදායම (ද.ජා.ආ.) ද, 2021 වසරේ දී වාර්තා කළ සියයට 12.8ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේදී සියයට 36.7ක වර්ධනයක් වාර්තා කරන ලදී. මෙහි දී, ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායම පහළ ගොස් ඇති අතර, ඒ අනුව ද.ජා.ආ.හි දක්නට ලැබුණු මෙම වර්ධනය මඟින් හුදෙක් පවත්නා මිල අනුව ද.දේ.නි.හි වාර්තා කළ ඉහළ වර්ධනය පිළිබිඹු වේ.

ඒක පුද්ගල ද.දේ.නි. 2021 වසරේ දී පැවති රුපියල් 794,376 (එ.ජ. ඩොලර් 3,997)ට සාපේක්ෂව, 2022 වසරේ දී රුපියල් 1,088,667 (එ.ජ. ඩොලර් 3,474)ක් දක්වා වර්ධනය විය. රුපියල් වටිනාකම අනුව ඒක පුද්ගල ද.දේ.නි.හි ඉහළ යෑම සඳහා පවත්නා මිල අනුව ද.දේ.නි.හි දක්නට ලැබුණු වර්ධනය බලපාන ලද අතර, එ.ජ. ඩොලර් අගය අනුව ගණනය කරන ලද ඒක පුද්ගල ද.දේ.නි. අඩු වීම කෙරෙහි එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම හේතු විය. මේ අතර, 2021 වසරේ දී රුපියල් 776,523 (එ.ජ. ඩොලර් 3,907)ක් ලෙස පැවති ඒක පුද්ගල ද.ජා.ආ. 2022 වසරේ දී රුපියල් 1,060,654 (එ.ජ. ඩොලර් 3,388)ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

2.3. ආයතනික අංශයන්හි දායකත්වය

මූල්‍ය නොවන ආයතනික අංශය 2022 වසරේ දී විශාලතම ආයතනික අංශය ලෙස පවත්නා මිල අනුව සමස්ත දළ එකතු කළ අගයෙන් සියයට 43.6කට දායකත්වය දක්වන ලදී. ඒ අනුව, මූල්‍ය නොවන ආයතනික අංශය පෙර වසරේ දී වාර්තා කළ සියයට 14.5ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 38.7කින් වර්ධනය විය. මෙහිදී, කර්මාන්ත කටයුතු සඳහා විශාලතම දායකත්වය මූල්‍ය නොවන ආයතනික අංශයෙන් ලැබුණු අතර, කෘෂිකර්මාන්ත සහ සේවා කටයුතු සඳහා ඉහළම දායකත්වය ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය

2.3 රූප සටහන
2022 වසර තුළදී ආයතනික අංශ අනුව සමස්ත එකතු කළ අගයෙහි ප්‍රතිශතාත්මක දායකත්වය (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)



(අ) ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ. (2015 පදනම් වර්ෂය)

මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

විශේෂ සටහන 4

ජාතික ගිණුම් ඇස්තමේන්තුවල පදනම් වර්ෂය 2015 ලෙස යාවත්කාලීන කිරීම[1]

හැඳින්වීම

ආර්ථිකයක මූර්ත අංශයේ ප්‍රවණතා පිළිබිඹු කරන ජාතික ගිණුම් ඇස්තමේන්තු ආර්ථික විශ්ලේෂණවල දී මෙන්ම ප්‍රතිපත්ති සම්පාදනයේ දී ද තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ඒ හේතුවෙන්, යම් රටක ආර්ථික සහ මිල ව්‍යූහයේ කාලානුරූපීව සිදුවන වෙනස්කම් නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ දී සිදුකරනු ලබන පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමේ ක්‍රමවේද මගින් ජාතික ගිණුම් ඇස්තමේන්තුවලට අනුගත කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම අවශ්‍යතාවය සපුරාලමින් ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් ඇස්තමේන්තුවල පදනම් වර්ෂය, අතීතයේ දී 1958, 1963, 1975, 1990, 2002, 2010 වසරවලදී සහ මෑතකාලීනව 2015 වසරේ දී යාවත්කාලීන කර ඇත. මෙහිදී, ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් ඇස්තමේන්තු සකස් කිරීමේ වගකීම දරන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජාතික ගිණුම් ඇස්තමේන්තුවල පදනම් වර්ෂය පෙර පැවති 2010 වසරෙන් 2015 වසරට යාවත්කාලීන කරන ලදී. මෑතකදී සිදුකරන ලද මෙම පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමට සමගාමීව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදන ඉම මෙන්ම ආර්ථික කටයුතුවල ආවරණ පරාසය ද ඉහළ නංවන ලද අතර ජාතික ගිණුම් සකස් කිරීමේ ක්‍රමවේදය වැඩි දියුණු කිරීම සඳහා යම් යම් වෙනස්කම් ද සිදු කරන ලදී.

නිෂ්පාදන ඉම සහ ආර්ථික කටයුතුවල ආවරණ පරාසය පුළුල් කිරීම

ජාතික ගිණුම් ඇස්තමේන්තුවල මෑතකදී සිදුකරන ලද පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය තුළ දී බොහෝ ආර්ථික කටයුතුවල ආවරණ පරාසය පුළුල් කර ඇත. මෙහිදී, වසර 2014 සිට 2018 දක්වා කාලය තුළ දී ක්‍රියාත්මක වූ කොළඹ ජාත්‍යන්තර මූල්‍ය නගර ව්‍යාපෘතියට අදාළ මුහුදු ප්‍රදේශය ගොඩකිරීමේ කටයුතු එම එක් එක් වර්ෂය තුළ දී නිම කරන ලද ප්‍රතිශතය සැලකිල්ලට ගනිමින් කර්මාන්ත කටයුතු ඇස්තමේන්තුවලට ඇතුළත් කිරීම, ආර්ථික කටයුතුවල ආවරණ පරාසය පුළුල් කිරීමට අදාළව සිදුකරන ලද ප්‍රධානතම වෙනසකි. මෙය 2014-2019 කාලය තුළ දී දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) ඇස්තමේන්තු සහ ඊට අනුරූප ද.දේ.නි.හි වර්ධන අගයයන්ගේ දක්නට ලැබුණු සැලකිය යුතු උච්චාවචනයන්ට හේතු වී ඇත. ඊට අමතරව, මෙම පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය තුළ දී, කෘෂිකාර්මික හා සේවා කටයුතු කිහිපයක ආවරණ පරාසය ද පුළුල් කර ඇත. මෙලෙස ආවරණ පරාසය වැඩි දියුණුවීමත් සමගම නිෂ්පාදන ප්‍රවේශයට අදාළ ද.දේ.නි. ඇස්තමේන්තු, 2010 පදනම් වර්ෂය යටතේ පැවති ආර්ථික කටයුතු 48 ක් වෙනුවට, 2015 පදනම් වර්ෂය යටතේ දී ආර්ථික කටයුතු 49 ක් යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙහිදී, කෘෂිකාර්මික කටයුතුවලට ඇතුළත් *පැළ බෝ කිරීම* සහ *කෘෂිකාර්මික කටයුතු සඳහා අදාළ වන ආධාරක කාර්යයන්* වෙන් වෙන් වශයෙන් ඇස්තමේන්තු කිරීම මෙම වෙනසට හේතු වී ඇත. මේ අතර, කෘෂිකාර්මික කටයුතු සැලකීමේදී, *පලතුරු සහ ඔයිල් පාම් වගාවන්, මල් පැල බෝ කිරීම, ගෘහස්ථ දුව නිෂ්පාදනය* සහ *කෘෂිකාර්මික කටයුතු සඳහා අදාළ වන ආධාරක කාර්යයන්වල* ආවරණ පරාසය වැඩිදියුණු කර ඇත. සේවා කටයුතු ආශ්‍රිතව සලකා බැලීමේදී, *තොරතුරු තාක්ෂණ, ගබඩාකරණ, ගුවන් විදුලි සහ රූපවාහිනී විකාශන, කුරියර් සේවා* සහ *මූල්‍ය සේවා* ආදී කටයුතුවල ආවරණ පරාසය මෙහිදී පුළුල් කර ඇත.

ඇස්තමේන්තු සම්පාදනය කිරීමේ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සහ නව දත්ත මූලාශ්‍ර භාවිතය

ජාතික ගිණුම් ඇස්තමේන්තුවල පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියට සමගාමීව, *කෘෂිකාර්මික කටයුතු සඳහා අදාළ වන ආධාරක කාර්යයන්, වන වගාව, මල් පැල බෝ කිරීම, නිෂ්පාදන කර්මාන්ත, ඉදිකිරීම්, විදුලිය උත්පාදනය, තොරතුරු තාක්ෂණ සේවා, නවාතැන් සැපයීමේ සේවා, ආහාර පාන සැපයීමේ සේවා* සහ *තොග හා සිල්ලර වෙළඳාම්* වැනි බොහෝ ආර්ථික කටයුතු ඇස්තමේන්තු කිරීමේ ක්‍රමවේද වැඩිදියුණු කර ඇත. තවද, *2013/14 ආර්ථික සංගණනය, තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා සමීක්ෂණය (Information Technology and Information Technology Enabled Services Survey)* සහ කොළඹ කොටස් වෙළඳපොළ තුළ ලියාපදිංචි සමාගම්වලට අදාළ ආදායම් තොරතුරු ද ඇතුළු නව දත්ත මූලාශ්‍ර 2015 පදනම් වර්ෂය යටතේ ඇස්තමේන්තු සම්පාදනය කිරීමේදී භාවිතා කර ඇත. එපමණක් නොව, බොහෝ ආර්ථික කටයුතු සඳහා නව පදනම් වර්ෂයට අනුව ස්ථාවර මිල ගණන් යටතේ ඇස්තමේන්තු සම්පාදනය කිරීමේදී, "ඒක අවධමන ක්‍රමය" *(Single Deflation Method)* වෙනුවට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් "ද්විත්ව අවධමන ක්‍රමය" *(Double Deflation Method)* අනුගමනය කර ඇත.[2]

ජාතික ගිණුම් ඇස්තමේන්තුවල පදනම් වර්ෂය 2015 වසරට යාවත්කාලීන කිරීම තුළින් දක්නට ලැබුණු ප්‍රධාන වෙනස්කම්

පදනම් වර්ෂය යාවත්කාලීන කිරීම ආර්ථිකයේ නිමැවුම (ද.දේ.නි.හි වටිනාකම), ද.දේ.නි.හි වර්ධන වේගය සහ ප්‍රධාන ආර්ථික කටයුතු ද.දේ.නි.ට දක්වන දායකත්වය වැනි බොහෝ

1. "Rebasing of National Accounts Estimates to Base Year 2015" යන මාතෘකාව යටතේ News Survey සඟරාවේ (වෙළුම 42, අංක 3) ප්‍රකාශයට පත් කරන ලද මෙම ලිපියේ සවිස්තරාත්මක පිටපත සකස් කිරීමේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සපයන ලද තොරතුරු සහ ඉතා ප්‍රයෝජනවත් අදහස් දැක්වීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අගය කරනු ලබයි.

2. "ඒක අවධමන ක්‍රමය" යටතේ, නිමැවුම සහ අතරමැදි යෙදවුම්වල වටිනාකම යන දෙකම එකම මිල දර්ශකයක් භාවිතයෙන් අවධමනය කරනු ලබන අතර, "ද්විත්ව අවධමන ක්‍රමය" තුළ දී වඩාත් නිවැරදි ව ස්ථාවර මිල අනුව ඇස්තමේන්තු පිළියෙළ කිරීම සඳහා නිමැවුම සහ අතරමැදි යෙදවුම්වල වටිනාකම එකිනෙකට වෙනස් සුදුසු මිල දර්ශක දෙකක් භාවිතා කරමින් අවධමනය කරනු ලැබේ.

2

රූප සටහන වි.ස. 4.1
ස්ථාවර මිල අනුව ද.දේ.නි. ඇස්තමේන්තු සහ වර්ධන වේග සංසන්දනය කිරීම (2010-2021)



මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආර්ථික දර්ශක කෙරෙහි බලපා ඇත. පෙර පැවති 2010 පදනම් වර්ෂයේ දත්ත හා සැසඳීමේදී, ස්ථාවර මිල ගණන් යටතේ පදනම් වර්ෂය 2015 වසරට යාවත්කාලීන කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තුවල වටිනාකමෙහි ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර ඒ සඳහා මිල ව්‍යුහයේ වෙනස්වීම් ග්‍රහණය කර ගැනීම උදෙසා 2010 පදනම් වර්ෂය යටතේ පැවති මිල ගණන් 2015 වසරේ මිල ගණන්වලින් යාවත්කාලීන කිරීම මෙන්ම ආර්ථික කටයුතුවල ආවරණ පරාසය පුළුල් කිරීම සහ ඇස්තමේන්තු සම්පාදනය කිරීමේ ක්‍රමවේද වැඩිදියුණු කිරීම හේතු විය. ඒ අනුව, එය ද.දේ.නි.හි අනුරූප වර්ධන අගයයන් කෙරෙහි ද බලපා ඇත. විශේෂයෙන්ම, කොළඹ ජාත්‍යන්තර මූල්‍ය නගර ව්‍යාපෘතියට අදාළ මුහුදු ප්‍රදේශය ගොඩකිරීමේ කටයුතු ජාතික ගිණුම් ඇස්තමේන්තුවලට ඇතුළත් කිරීම 2014-2019 කාලපරිච්ඡේදය තුළ දී ද.දේ.නි.හි වටිනාකම මෙන්ම ද.දේ.නි.හි වර්ධන අගයයන් ද සැලකිය යුතු ලෙස වෙනස් වීමට හේතු වී ඇති අතර එය සංඛ්‍යා සටහන වි.ස. 4.1 සහ රූප සටහන වි.ස. 4.1හි ඉදිරිපත් කර ඇති දත්ත වලින් පිළිබිඹු වේ.

සංඛ්‍යා සටහන වි.ස. 4.1
මෑතකදී සිදුකළ ද.දේ.නි.හි පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලි සංසන්දනය කිරීම

	2002	2010	2015
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. (රු. මිලියන)	1,636,036.6	6,413,668.5	11,566,987.4
ද.දේ.නි.හි වටිනාකමෙහි ඉහළ යෑම % (පවත්නා වෙළඳපොළ මිල අනුව)		14.4%	5.6%

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

තවද, පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමත් සමගම කෘෂිකර්මාන්තය, කර්මාන්ත, සේවා සහ භාණ්ඩ හා සේවා මත පනවන ලද බදු (සහනාධාර අඩු කරන ලද පසු) යන ද.දේ.නි.හි ප්‍රධාන සංරචක ද.දේ.නි.ට දක්වන දායකත්වය වෙනස්වී ඇත. ඒ අනුව, රූප සටහන වි.ස. 4.2හි දැක්වෙන පරිදි විශේෂයෙන්ම කර්මාන්ත කටයුතුවල දායකත්වයෙහි ඉහළ යෑමක් සහ සේවා කටයුතු මෙන්ම භාණ්ඩ හා සේවා මත පනවන ලද බදු (සහනාධාර අඩු කරන ලද පසු) යන සංරචකවල දායකත්වයෙහි පහළ යෑමක් දක්නට ලැබේ.

රූප සටහන වි.ස. 4.2
ස්ථාවර මිල අනුව ද.දේ.නි. සඳහා දක්වන දායකත්වය සංසන්දනය කිරීම (2015 සහ 2021)



මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමට සමගාමීව පවත්නා මිල අනුව ද.දේ.නි. ඇස්තමේන්තුවල වටිනාකම ඉහළ යෑම හේතුවෙන්, *අයවැය හිඟය* සහ *මධ්‍යම රජයේ ණය* වැනි ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශයට පත් කරන සාර්ව ආර්ථික දර්ශක ද සංශෝධනය වී ඇත. සාමාන්‍යයෙන්, ජාතික ගිණුම් ඇස්තමේන්තුවල පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියක් මඟින් ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට වඩා නිවැරදි දත්ත හා තොරතුරු මත පදනම් වූ තීරණ ගැනීම සඳහා පවතින ආර්ථික ව්‍යුහය වඩාත් නිවැරදිව නිරූපණය වන ආර්ථික සංඛ්‍යාලේඛන සපයනු ලබයි. කෙසේ වුව ද, පදනම් වර්ෂය යාවත්කාලීන කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු විශ්ලේෂණය කිරීමේදී, ආර්ථිකය තුළ එක් වරකදී පමණක් වූ සිදුවීම්වලින් ද.දේ.නි. ඇස්තමේන්තු කෙරෙහි ඇතිවන බලපෑම දිගුකාලීනව පවතින සිදුවීම් මගින් ඇතිවන බලපෑම්වලින් වෙන්ව අවබෝධ කර ගැනීම සහ ඊට අනුරූපව ඒවා ඇගැයීම අත්‍යවශ්‍ය වේ.

මූලාශ්‍ර

1. Department of Census and Statistics. Key Findings of Rebased GDP Estimates (Base year 2015). Available at:http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/2015/Reports/Key_findings

2. Thilangani, U.K.T. and Liyanage, D.N. (2022). 'Rebasing of National Accounts Estimates to Base Year 2015', News Survey, vol. 42, no. 03, pp. 2-8, Available at: https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/satahana/News_Survey_2022_03.pdf

සලසන ආයතන අංශයෙන් ලැබුණි. මේ අතර, ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය, රාජ්‍ය අංශය සහ මූල්‍ය ආයතන අංශය 2022 වසරේ දී පිළිවෙලින් සියයට 42.5කින්, සියයට 7.1කින් හා සියයට 52.1කින් වර්ධනය විය.

2.4. නිමැවුම, ප්‍රතිපත්ති, ආයතනික පහසුකම් සහ ගැටලු

කෘෂිකර්මාන්තය

පොහොර සහ අනෙකුත් කෘෂි රසායනික ද්‍රව්‍ය ඇතුළු කෘෂිකාර්මික යෙදවුම්වල පැවති උග්‍ර හිඟය, නිෂ්පාදන පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ යෑම සහ ඉන්ධන සැපයුමේ පැවති අවහිරතා 2022 වසරේ සමස්ත කෘෂිකාර්මික කටයුතුවල ක්‍රියාකාරිත්වයට බාධාවක් විය. ඒ අනුව, කෘෂිකාර්මික කටයුතුවල එකතු කළ අගය 2021 වසරේ වාර්තා කළ සියයට 0.9ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේදී සියයට 4.6කින් පහත වැටුණු අතර, මේ සඳහා ධීවර කටයුතු, වී වගාව සහ සත්ත්ව නිෂ්පාදනවල දක්නට ලැබුනු සැලකියයුතු පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. මෙයට අමතරව, තේ, එළවළු, වී නොවන ධාන්‍ය සහ රබර් වගා කටයුතු ද වසර තුළ පහත වැටුණි. කෙසේ වුවද, වන වගාව, කෘෂිකර්මය සඳහා වන ආධාරක කාර්යයන්, පොල් ඇතුළුව තෙල් සහිත පලතුරු භෝග වගාව, කුළු බඩු සහ පලතුරු භෝග වගා කටයුතු වසර තුළ දී වර්ධනය විය. එසේම, වසරේ අවසාන කාලපරිච්ඡේදය වන විට කෘෂිකාර්මික යෙදවුම් හා ඉන්ධන යම් ප්‍රමාණයකට පැවති බැවින් සහ හිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් කෘෂිකාර්මික කටයුතුවල වර්ධනයක් දක්නට ලැබුණි. කෘෂිකාර්මික කටයුතුවල දුර්වල ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාර්තුමය වශයෙන් පවත්වනු ලබන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයේ[2] කෘෂිකර්මාන්ත කටයුතුවලට අදාල නිෂ්පාදන සහ ඉල්ලුම යන උප දර්ශක වසර තුළ දී සමස්තයක් ලෙස පහත වැටුණි.

2.4 රූප සටහන
2022 වසරේ කෘෂිකාර්මික කටයුතුවල වර්ධන වේගයන් (අ)



(අ) ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ. (2015 පදනම් වර්ෂය)

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය

කෘෂිකාර්මික අංශයේ නිමැවුම මනිනු ලබන කෘෂිකාර්මික නිෂ්පාදන පරිමා දර්ශකය[3] 2022 වසරේ දී සැලකිය යුතු පහළ යෑමක් වාර්තා කළේය. සමස්ත කෘෂිකාර්මික නිෂ්පාදන පරිමා දර්ශකය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 2021 වසරේ සියයට 2.1ක වර්ධනයට සාපේක්ෂව, 2022 වසරේ දී සියයට 19.4කින් පහළ ගියේය. දර්ශකයෙහි සමස්ත පහත වැටීම සඳහා වී, තේ, රබර්, සහ පශු සම්පත් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ඇතුළු බොහෝ උප දර්ශක දායක වූ අතර, පලතුරු උප දර්ශකය මෙන්ම පොල් උප දර්ශකය පෙර වසරට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කළේය.

2 ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය මගින් ද.දේ.නි.හි සංයුතිය අනුව තෝරාගත් ප්‍රධාන ව්‍යාපාරික ආයතන විසින් ලබාදෙන තොරතුරු සම්පිණ්ඩනය කරනු ලබයි.

3 ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සම්පාදනය කළ කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය, 2022 වසරේ සිට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදිත කෘෂිකාර්මික නිෂ්පාදන පරිමා දර්ශකය මගින් යාවත්කාලීන කර ඇත.

2.2 සංඛ්‍යා සටහන
කෘෂිකාර්මික නිෂ්පාදන පරිමා දර්ශක
(2002 = 100) (අ)

අයිතමය	2021	2022 (ආ)	වර්ධන වේගය (%)	
			2020/21	2021/22 (ආ)
සමස්ත දර්ශකය	**199.1**	**160.4**	**2.1**	**-19.4**
තේ	96.6	81.1	7.5	-16.0
රබර්	84.9	78.3	-1.7	-7.8
පොල්	126.9	137.9	1.1	8.7
වී	180.1	118.6	0.6	-34.1
ධාන්‍ය වර්ග	1,473.9	838.1	50.1	-43.1
වෙනත් ආහාර බෝග	179.7	162.1	17.2	-9.8
එළවළු	200.4	185.5	-7.2	-7.4
පලතුරු	180.0	322.4	-15.5	79.1
පශු සම්පත් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත	180.1	175.2	3.5	-2.7
සුළු අපනයන බෝග	193.0	188.5	4.7	-2.3

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සම්පාදනය කරන ලද කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය, 2022 වසරේ සිට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදිත කෘෂිකාර්මික නිෂ්පාදන පරිමා දර්ශකය මගින් යාවත්කාලීන කර ඇත.
(ආ) තාවකාලික

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2

වී

පොහොර හිඟය ඇතුළු සැපයුම් අංශයේ දැඩි අවහිරතා මධ්‍යයේ, 2017 වසරෙන් පසු එහි අඩුම වාර්ෂික නිෂ්පාදනය වාර්තා කරමින්, රටේ සමස්ත වී නිෂ්පාදනය 2022 වසරේ දී සැලකිය යුතු ලෙස පහළ ගියේය. 2021 වසරේ අග භාගයේ දී අකාබනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ආනයනය කිරීම සඳහා පනවා තිබූ තහනම ඉවත් කළද, එම තහනමේ බලපෑම මෙන්ම, අවශ්‍ය පරිදි පොහොර ආනයනය කිරීම සඳහා ප්‍රමාණවත් විදේශ විනිමය නොමැති වීමේ ඒකාබද්ධ බලපෑම සමඟ, රට තුළ උග්‍ර පොහොර හිඟයක් නිර්මාණය වූ අතර, එමගින්, අනෙකුත් කෘෂිකාර්මික අංශ අතර, වී නිෂ්පාදන අංශය කෙරෙහි ද සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. 2021 වසරේ වාර්තා වූ ඉහළ අස්වැන්නෙන් පසුව, වාර්ෂික වී නිෂ්පාදනය, 2022 වසරේ දී මෙට්‍රික් ටොන් මිලියන 3.4ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 34.1කින් පහළ යෑමක් වාර්තා කළේය. මෙය, 2022 වසරේ සමස්ත වී නිෂ්පාදනයෙන් සියයට 57.0ක් වූ 2021/2022 මහ කන්නයේ දී වී අස්වැන්නෙහි සිදු වූ සියයට 36.9ක පහළ යෑමෙහි සහ 2022 වසරේ යල කන්නයේ සිදු වූ වී අස්වැන්න සියයට 30.0කින් පහළ යෑමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයකි. වසර තුළ දී අස්වැන්න නෙළා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය හෙක්ටයාර 1,114,246ක් දක්වා සියයට 1.1කින් සුළු වශයෙන් පහළ ගිය අතර, මෙම කන්නවල දී ඵලදායිතාවෙහි සිදු වූ පහළ යෑමෙහි සහ යෙදවුම් හිඟයෙහි සිදු වූ බලපෑම පිළිබිඹු කරමින්, වී නිෂ්පාදනයේ සාමාන්‍යය ඵලදාව, 2021 වසරේ වාර්තා වූ හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,571ට සාපේක්ෂව 2022 වසරේ දී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,045ක් දක්වා පහළ ගියේය. 2022 වසරේ සමස්ත වී නිෂ්පාදනය සහල් මෙට්‍රික් ටොන් මිලියන 2.1කට සමාන වූ අතර, එය ගෘහස්ථ සහල් ඉල්ලුමෙන් මාස 11ක් සඳහා පමණ ප්‍රමාණවත් වනු ඇත.[4] දේශීය වෙළඳපොළ තුළ පැවති සහල් හිඟය හේතුවෙන් ඇති වූ මිල පීඩනය මැඩපැවැත්වීම සඳහා සහ ආහාර සුරක්ෂිතතාව තහවුරු කරමින් රටේ සමස්ත සහල් අවශ්‍යතාවය සපුරාලීම සඳහා 2022 වසර තුළ දී, රජය විසින් සහල් ආනයනය කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, පෙර වසරේ ආනයනය කළ සහල් මෙට්‍රික් ටොන් 147,091ට සාපේක්ෂව, 2022 වසරේ දී සහල් මෙට්‍රික් ටොන් 783,420ක් පමණ ආනයනය කර ඇත. කෙසේ වෙතත්, ආනයනික තොග සහ යල කන්නයේ අස්වැන්න ලැබීමත් සමඟ දේශීයව පවතින සහල් තොග ක්‍රමයෙන් ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ දෙසැම්බර් 9 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි, වර්ග කිහිපයක් හැර, සහල් ආනයනය කිරීම තහනම් කරන ලදී.

යෙදවුම් පිරිවැය ඉහළ යෑම මෙන්ම, නිෂ්පාදනය පහළ යෑම, 2022 වසරේ දී, වී සහ සහල් මිල ගණන් ඉහළ යෑමට හේතු විය. 2021 වසරේ අග භාගයේ සිට දක්නට ලද ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින්, 2022 වසරේ මුල් භාගයේ දී වී මිල ගණන් තවදුරටත් ඉහළ යෑමක් වාර්තා කළේය. මේ සඳහා හේතු වූයේ 2021/2022 මහ කන්නයේ වී නිෂ්පාදනය පහළ යෑම හේතුවෙන් නිර්මාණය වූ සැපයුම් හිඟය සහ සැපයුම් හිඟය පිළිබඳ වෙළඳපොළ සමපේක්ෂණවල ප්‍රතිඵලයක් ලෙස වී සඳහා ඉල්ලුම ඉහළ යෑමයි. මිල විචලතා අවම කිරීමට සහ ස්ථාවර සැපයුමක් පවත්වා ගැනීම සඳහා, රජය, වී සහ සහල් වෙළඳපොළ වෙත වරින් වර මැදිහත් විය. ඒ අනුව, වී අලෙවි මණ්ඩලයේ වී මිලදී ගැනීමේ වැඩසටහනට අනුව 2021/2022 මහ කන්නයේ දී වී මිලදී ගැනීමේ සහතික මිල, සම්බා, නාඩු සහ කීරි සම්බා වී කිලෝග්‍රෑමයක් සඳහා පිළිවෙළින්, රුපියල් 92.00, රුපියල් 90.00 සහ රුපියල් 95.00ක් දක්වා ඉහළ දමන ලදී. 2021/2022 මහ කන්නයේ දී වී මෙට්‍රික් ටොන් 71,280ක් පමණ මිලදී ගැනීමට වී අලෙවි මණ්ඩලයට හැකි විය. තවද, වී නිෂ්පාදන අංශයේ නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම සැලකිල්ලට ගනිමින් 2022 වසරේ යල කන්නයේ දී, වී අලෙවි මණ්ඩලය විසින් සම්බා, නාඩු සහ කීරි සම්බා වී කිලෝග්‍රෑමයක් සඳහා මිලදී ගැනීමේ සහතික මිල, පිළිවෙළින්, රුපියල් 125.00, රුපියල් 120.00 සහ රුපියල් 130.00ක් දක්වා ඉහළ දමන ලදී. කෙසේ වෙතත්, වී අලෙවි මණ්ඩලයට වී මිලදී ගැනීම සඳහා මුදල් ප්‍රතිපාදන නොමැති වූ බැවින් නව සහතික මිල යටතේ වී මෙට්‍රික් ටොන් 7,076ක් පමණක් මිලදී ගැනීමට හැකි වූ අතර, ඒ හේතුවෙන් ගොවීන්ට තම වී තොග පෞද්ගලික සහල් මෝල් හිමියන් වෙත අඩු මිලට විකිණීමට සිදු වීමත් සමඟ, 2022 වසරේ අග භාගය වන විට වී මිල ගණන් පහළ ගියේය. කෙසේ වෙතත්, සියලුම වී වර්ගවල සාමාන්‍යය මිල ගණන් 2021 වසරේ දක්නට ලද මිල මට්ටම්වලට වඩා ඉහළ මට්ටමක පැවතුණි. සම්බා වී සඳහා සාමාන්‍ය මිල 2021 වසරේ වාර්තා වූ කිලෝග්‍රෑමයකට රුපියල් 65.32ක සිට කිලෝග්‍රෑමයකට රුපියල් 108.69ක් දක්වා 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත

4 මෙම ප්‍රමාණවත් මට්ටම, 2019 වසරේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයෙහි සාමාන්‍ය ගෘහස්ථ සහල් පරිභෝජන ඇස්තමේන්තුව මත පදනම් වේ. කෙසේ වෙතත්, ආපනශාලා සහ හෝටල්, සහල් ආශ්‍රිත ආහාර කර්මාන්ත වැනි අනෙකුත් ප්‍රභවයන් සඳහා වන සහල් ඉල්ලුම බැහැර කිරීම හේතුවෙන්, රටේ සැබෑ සහල් ඉල්ලුම, 2019 වසරේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයෙහි සාමාන්‍ය ගෘහස්ථ සහල් පරිභෝජන ඇස්තමේන්තුවට වඩා කිසියම් දුරකට වැඩි විය හැක.

2.3 සංඛ්‍යා සටහන

වී වගා අංශය පිළිබඳ සංඛ්‍යාන

අයිතමය	ඒකකය	2021 (අ)			2022 (ආ)		
		මහ	යල	එකතුව	මහ	යල	එකතුව
වපුරන ලද දළ බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	770	501	1,272	776	482	1,258
අස්වැන්න නෙළාගන්නා ලද දළ බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	762	497	1,259	766	480	1,246
අස්වැන්න නෙළාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	682	445	1,127	685	429	1,114
නිෂ්පාදනය	මෙ. ටො. දහස්	3,061	2,088	5,150	1,931	1,462	3,393
	බුසල් දහස්	146,720	100,079	246,799	92,555	70,050	162,605
හෙක්ටයාරයකට ඵලදාව (ඇ)	හෙක්ටයාරයට කි.ග්‍රෑ.	4,492	4,692	4,571	2,819	3,407	3,045
බැංකු අංශය මගින් දෙන ලද ණය ප්‍රමාණය (ඈ)	රුපියල් මිලියන	8,603	4,449	13,052	-	-	12,454
සහල් ආනයනය (ඉ)	මෙ. ටො. දහස්	-	-	147	-	-	783
සහල් ආනයනයට සමාන වී ප්‍රමාණය (ඉ)	මෙ. ටො. දහස්	-	-	216	-	-	1,152

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුළු නිෂ්පාදනය අස්වැන්න නෙළාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයකට ඵලදාව ගණනය කර ඇත.
(ඈ) 2022 වසරේ සිට ණය දෙන බැංකු මඟින් ලබා දුන් වගා ණය පිළිබඳ දත්ත මහ කන්නය සහ යල කන්නය සඳහා වෙන් වෙන් වශයෙන් ලබා ගත නොහැක.
(ඉ) වාර්ෂික අගය

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 66.4කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, නාඩු වී සඳහා සාමාන්‍ය මිල ද 2021 වසරේ වාර්තා වූ කිලෝග්‍රෑමයකට රුපියල් 57.61ක සිට කිලෝග්‍රෑමයකට 103.87ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 80.3කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2022 වසරේ අග භාගය වන විට මිල ගණන්වල සුළු පහළ යෑමක් පැවතිය ද, වී මිල ගණන් හා සමාන ප්‍රවණතාවක් අනුගමනය කරමින්, සහල් වර්ගවල මිල ද 2022 වසර පුරා ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2021 වසරේ, පිළිවෙළින්, කිලෝග්‍රෑමයකට රුපියල් 136.52ක් සහ රුපියල් 116.56ක් වූ සම්බා සහ නාඩු සහල්වල සාමාන්‍ය සිල්ලර මිල, 2022 වසරේ දී පිළිවෙළින්, කිලෝග්‍රෑමයකට රුපියල් 209.19ක් සහ රුපියල් 213.36ක් විය. මේ අතර, සහල් වර්ග සඳහා උපරිම සිල්ලර මිලක් නියම කිරීම සහ දේශීය වෙළඳපොළෙහි සහල් සැපයුම් හිඟය මධ්‍යයේ සහල් සිල්ලර මිලෙහි පවතින අධික උච්චාවචනයන්ට පිළියම් යෙදීම සඳහා සහල් ආනයනය හරහා සැපයුම ඉහළ නැංවීම ඇතුළු වෙළඳපොළ තුළ සහල් සඳහා සිල්ලර මිල ස්ථාවර කිරීමට රජය විසින් පියවර කිහිපයක් ගන්නා ලදී. ඒ අනුව, 2022 වසරේ මැයි මස 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි නාඩු, සම්බා සහ කීරි සම්බා සහල් සඳහා උපරිම සිල්ලර මිල ගණන්, පිළිවෙළින්, කිලෝග්‍රෑමයකට රුපියල් 220.00ක්, කිලෝග්‍රෑමයකට රුපියල් 230.00ක් සහ කිලෝග්‍රෑමයකට රුපියල් 260.00ක් ලෙස නියම කරන ලදී. අඛණ්ඩව පවතින ඉහළ මිල ගණන්වල බලපෑම අවම කිරීම සඳහා, 2023 වසරේ මාර්තු සහ අප්‍රේල් මාසවල දී අඩු ආදායම්ලාභී පවුල් සඳහා මසකට සහල් කිලෝග්‍රෑම් 10 බැගින් බෙදා දීමේ අරමුණු ඇතිව, 2022/2023 මහ කන්නයේ දී ගොවීන්ගෙන් නාඩු වී කිලෝග්‍රෑමයක් රුපියල් 100.00 බැගින් මිලදී ගැනීමේ වැඩසටහනක් රජය විසින් දියත් කරන ලදී.

කෘෂිකාර්මික අංශයේ දිගු කාලීන ඵලදායිතාව ඉහළ නැංවීමට ප්‍රයත්න දරන අතරම, කෘෂි අංශය මුහුණ දෙන කාලීන ගැටලු විසඳීම සඳහා රජය විසින් 2022 වසරේ දී පියවර කිහිපයක් ක්‍රියාවට නංවන ලදී. රසායනික පොහොර සහ කෘෂි රසායන ආනයනය තහනම් කිරීම සමඟ පොහොර ප්‍රමාණවත් පරිදි නොලැබීම හේතුවෙන් ඇතිවන අහිතකර බලපෑම් මෙන්ම, පොහොර ආනයනයට පහසුකම් සැලසීම සඳහා දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි පවතින සීමිත ද්‍රවශීලතාව පිළිබඳව මනා අවධානය යොමු කරමින්, 2022 වසරේ තෙවන කාර්තුවේ සිට රසායනික පොහොර ලබා දීම සඳහා රජය විසින් කඩිනම් පියවර ගන්නා ලදී. ඒ අනුව, රජය විසින්, 2022 වසරේ යල කන්නයේ වගා කටයුතු සඳහා ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ යූරියා මෙට්‍රික් ටොන් 65,000ක් ලබා ගත් අතර, 2022 වසරේ යල කන්නයේ දී කිලෝග්‍රෑම් 50ක යූරියා මිටියක් සඳහා රුපියල් 10,000.00ක සහනාධාර මිලක් යටතේ වී ගොවීන් වෙත යූරියා බෙදා හැරීම සිදු කරන ලදී. මීට අමතරව, විවිධ ආධාර වැඩසටහන් සහ ප්‍රදාන හරහා 2022/2023 මහ කන්නය සහ ඉදිරි කන්න සඳහා අවශ්‍ය වන යූරියා, ට්‍රිපල් සුපර් පොස්පේට් (TSP) හෙවත් මඩ පොහොර සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) හෙවත් බන්ඩි පොහොර යන පොහොර වර්ග නිසි කලට සැපයීම සහතික කිරීම සඳහා, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ ආහාර හා

2

2.5 රූප සටහන
සහල්: සැපයුම සහ ඉල්ලුම



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

කෘෂිකර්ම සංවිධානය ඇතුළු ජාත්‍යන්තර සංවිධාන සමඟ කටයුතු ගණනාවක් සිදු කරන ලදී. ඒ අනුව, 2022/2023 මහ කන්නයේ දී වී වගාව සඳහා යූරියා මෙට්‍රික් ටොන් 100,000ක් පමණ ලබා දීමට රජයට හැකි වූ අතර, එය වී නිෂ්පාදන අංශය යථා තත්ත්වයට පත් වීමට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය. තවද, දේශීය වශයෙන් වල් නාශකයක් ලෙස ග්ලයිෆොසේට් භාවිතයට අවසර දීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, 2022/2023 මහ කන්නයේ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ග්ලයිෆොසේට් ප්‍රමාණ ආනයනය කිරීමට හැකි වන පරිදි මාස හයක කාලයක් සඳහා ග්ලයිෆොසේට් ආනයනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී අනුමැතිය ලබා දෙන ලදී. මීට අමතරව, පළිබෝධ සහ රෝග කළමනාකරණය සඳහා ව්‍යාප්ති සේවා කඩිනම් කිරීම මෙන්ම, පොහොර සහ අනෙකුත් කාබනික අතිරේක ද්‍රව්‍ය සැපයීම හරහා, 2022/2023 මහ කන්නයේ ඇතැම් දිස්ත්‍රික්කවල ගොයම් පැළ කහ පැහැ ගැන්වීමට හේතු වූ පෝෂණ ඌනතා මඟහරවා ගැනීමට කඩිනම් පියවර ගන්නා ලදී. මීට අමතරව, ඉහළ ඵලදාවක් සහිත ප්‍රභේද හඳුනාගැනීම සඳහා සහල් ප්‍රභේද පරීක්ෂා කිරීමේ වැඩසටහන් 2022 වසර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර, කෙටි කාලයක් තුළ, ඉහළ අස්වැන්නක් ලබා ගත හැකි සහ නියඟයට ඔරොත්තු දෙන විශේෂ ලක්ෂණ සහිත නව වී ප්‍රභේද හතරක් 2022 වසරේ දී නිකුත් කරන ලදී. මෙම නව ප්‍රභේද හතරෙන් එකක් බිස්කට් නිෂ්පාදනය වැනි කාර්මික අරමුණු සඳහා නිකුත් කරන ලදී. වගා ප්‍රදේශයට විශේෂිත වූ වල් පැළෑටි බිහිවීම පාලනය හරහා වඩාත් ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමයක් වැඩිදියුණු කිරීමේ ප්‍රයත්නයක් ලෙස, බහු වර්ණාවලි ඩ්‍රෝන තාක්ෂණය හරහා, පරීක්ෂණය සඳහා යොදා ගන්නා වී වගා බිම්වල, දක්නට ලැබෙන ප්‍රධාන වල් පැළෑටි ප්‍රභේද හඳුනා ගැනීම සහ එමගින් වී වගාවට වන බලපෑම පිළිබඳව අධ්‍යනය කිරීම සිදු කෙරිණි.

තේ

දේශීයව පැවති පොහොර සහ කෘෂි රසායනවල උග්‍ර හිඟයෙහි පසු බලපෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන, 2022 වසරේ දී තේ නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 16.0ක කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා කළේය. තේ පර්යේෂණායතනය විසින් දිවයිනේ ප්‍රදේශ කිහිපයක තේ ඵලදාව විශාල වශයෙන් පහත වැටීම සම්බන්ධයෙන් සිදු කරන ලද මූලික හේතු විනිශ්චය මගින් රසායනික පොහොර සහ කෘෂි රසායන, විශේෂයෙන් ම යූරියා මත පදනම් වූ පොහොර සහ වල් නාශක ලබා ගත නොහැකි වීම, වසර තුළ වාර්තා වූ ඵලදාව අඩු වීම කෙරෙහි සැලකිය යුතු ලෙස බලපා ඇති බව පෙන්වා දී ඇත. ඒ අනුව සමස්ත තේ නිෂ්පාදනය සඳහා, පිළිවෙළින්, සියයට 22කින්, සියයට 16කින් සහ සියයට 62කින් පමණ දායක වූ උඩරට, මැදරට හා පහතරට තේ නිෂ්පාදනය, 2022 වසරේ දී, පිළිවෙළින්, සියයට 13.8කින්, සියයට 21.2කින් සහ සියයට 15.4කින් පහළ ගියේය. මේ අතර, කුඩා වතු හිමියන්ගේ තේ අස්වැන්නේ සාමාන්‍යය ඵලදාව, 2021 වසරේ දී වාර්තා වූ හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1,414 හා සාපේක්ෂව මෙම වසරේ දී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1,193ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 15.6කින් පහළ ගියේය. රසායනික පොහොර සහ අනෙකුත් කෘෂිකාර්මික යෙදවුම්වල මිල ඉහළ යෑම සහ එම යෙදවුම්වල දේශීයව පැවති හිඟය මෙන්ම, ඉන්ධන, විදුලිය සහ ජලය ඇතුළු උපයෝගිතාවල මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ දී තේ අංශයේ නිෂ්පාදන පිරිවැය ඉහළ ගිය අතර, එමගින් ගෝලීය තේ වෙළඳපොළ තුළ රට සතු තරගකාරිත්වයට බාධා පමුණුවා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී තේ සඳහා ඇස්තමේන්තුගත නිෂ්පාදන පිරිවැය කිලෝග්‍රෑමයකට රුපියල් 639.00ක් දක්වා රුපියල් 20.00කින් ඉහළ ගියේය.

2022 වසරේ දී කොළඹ තේ වෙන්දේසියේ තේ මිල ගණන් ඉතිහාසයේ වාර්තා වූ ඉහළම මට්ටම් දක්වා ළඟා වූ අතර, තේ මිල ගණන් වසර මුළුල්ලේම ඉහළ මට්ටමක පැවතුණි. 2021 වසරේ වාර්තා වූ කිලෝග්‍රෑමයකට රුපියල් 619.15ක් වූ තේ මිලෙහි

සාමාන්‍යය, 2022 වසර තුළ දී කිලෝග්‍රෑමයකට රුපියල් 1,270.50ක් දක්වා සියයට 105.2කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, 2022 වසරේ දී උඩරට, මැදරට සහ පහතරට තේ සඳහා වූ සාමාන්‍ය මිල ගණන්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, සියයට 94.6ක, සියයට 93.5ක සහ සියයට 110.8ක ඉහළ යෑමක් වාර්තා කළේය. තවද, අමු තේ දලු සඳහා කුඩා වතු හිමියන් ලද මිල ගණන්වල සාමාන්‍යය 2021 වසරේ දී පැවති කිලෝග්‍රෑමයකට රුපියල් 93.67ට සාපේක්ෂව 2022 වසර තුළ දී කිලෝග්‍රෑමයකට රුපියල් 182.07ක් දක්වා සැලකිය යුතු ඉහළ ගියේය. තේ අපනයන මිලෙහි (නැ.වි.ස.) සාමාන්‍යය පෙර වසරේ වාර්තා වූ කිලෝග්‍රෑමයකට ඩොලර් 4.63ට සාපේක්ෂව 2022 වසරේ දී කිලෝග්‍රෑමයකට ඩොලර් 5.03ක් දක්වා සියයට 8.7කින් ඉහළ ගියේය. දේශීය තේ නිෂ්පාදනය පහත වැටීම මධ්‍යයේ කොළඹ තේ වෙන්දේසිය වෙත සපයනු ලැබූ තේ ප්‍රමාණය පහළ යෑම 2022 වසර තුළ දී තේ සඳහා වූ සාමාන්‍ය මිල ගණන් ඉහළ යෑම සඳහා කිසියම් දුරකට හේතු වූ අතර, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් රුපියල් වටිනාකම අනුව මිල වැඩි වීම ද, තේ මිල ඉහළ යෑමට දායකත්වය සැපයීය.

2022 වසරේ දී, ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයෙහි ඵලදායිතාව, අගය එකතු කිරීම සහ තරඟකාරිත්වය ඉහළ නැංවීම ඉලක්ක කර ගනිමින් රජය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාවට නැංවීය. තේ කර්මාන්තශාලාවලට තම අමු තේ දලු සපයන්නන් සඳහා පොහොර මිලදී ගැනීමට හැකි වන පරිදි සියයට 8.0ක පොලී අනුපාතයකට සහනදායී ණය යෝජනා ක්‍රමයක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ආරම්භ කරන ලදී. නිෂ්පාදන ක්‍රියාවලියේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමේ අරමුණින්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් කර්මාන්තශාලා නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ නවීකරණ කටයුතු සඳහා සහාය වෙමින් 2022 වසර තුළ දී කර්මාන්තශාලා 38ක් සඳහා රුපියල් මිලියන 16.9ක් ලබා දුන්නේය. මීට අමතරව, තේ ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා නැවත වගා කිරීමේ සහනාධාර වැඩසටහන යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් රුපියල් මිලියන 56.4ක් ලබා දුන් අතර, මධ්‍යම පරිමාණ තේ ඉඩම් අක්කර 204ක වාරි ජල විදින පද්ධති සවි කිරීම සඳහා රුපියල් මිලියන 24.5ක සහනාධාරයක් ලබා දෙන ලදී. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් තේ පැළ නැවත සිටුවීමේ සහ නව වගා වැඩ සටහන් මෙන්ම, තේ වගා නැවත නගා සිටුවීමේ සහනාධාර වැඩසටහන්වලට අදාළව ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. 2022 වසරේ දී තේ ඉඩම් හෙක්ටයාර 912ක් නැවත වගා කිරීමට සහ නව ඉඩම් හෙක්ටයාර 408ක් තේ ඉඩම් බවට පරිවර්තනය කිරීමට කටයුතු කරන ලද අතර, තේ ඉඩම්වල පාළු සිටුවීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරන ලදී. කුඩා තේ වතු හිමියන් දැනුම්වත් කිරීමේ ප්‍රයත්නයන්, උපදේශන සේවා හරහා වසර පුරා ක්‍රියාත්මක විය. තේ පර්යේෂණායතනය සිය උපායමාර්ගික සැලැස්මට අනුකූලව පර්යේෂණ හා සංවර්ධන කටයුතු මෙන්ම සේවා ව්‍යාප්ති සම්බන්ධයෙන් සිය ක්‍රියාමාර්ග අඛණ්ඩව ඉදිරියට ගෙන ගියේය. ඒ අනුව මෙරට තේ ඉඩම් සඳහා සුදුසු තෝරාගත් තේ අස්වනු නෙළන මෝටර් යන්ත්‍රයක් සංවර්ධනය කිරීම හා හඳුන්වාදීම, නියඟ අවදානම් පවතින ප්‍රදේශවල රෝපණ ද්‍රව්‍ය ප්‍රභවයක් ලෙස වැඩිදියුණු කළ බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා බීජ වගාවන් පිහිටුවීම, තේ වගාවේ ක්ෂුද්‍ර ජීවී ජෛව පළිබෝධනාශක වාණිජකරණය ප්‍රවර්ධනය කිරීම සහ නව තේ ප්‍රභේදවල මව් පඳුරු වගා ප්‍රදේශ ව්‍යාප්ත කිරීම වැනි විශේෂ ව්‍යාපෘති වසර තුළ ක්‍රියාත්මක විය.

රබර්

රබර් වගා කරන ප්‍රදේශවල පැවති අයහපත් කාලගුණික තත්ත්වයන්, පොහොර හිඟය සහ පෙස්ටලොටියෝප්සිස් (Pestalotiopsis) රෝගය පැතිරීම යන කරුණුවල ඒකාබද්ධ බලපෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන 2022 වසරේ දී රබර් නිෂ්පාදනය අඛණ්ඩව දෙවන වසරටත් පහළ ගියේය. 2022 වසරේ දී පොහොර හිඟය හේතුවෙන් නොමේරූ රබර් වගාවන් සඳහා ඇති කළ බලපෑම සැලකිය යුතු මට්ටමක පැවති අතර, එමගින් ගස් වර්ධනය අඩාල වීම නිසා කිරි කැපීමේ අදියර ප්‍රමාද වන අතර, ඉදිරි කාලය තුළ එම රබර් ඉඩම්වල ඵලදායිතාව අඩු විය හැක. තවද, කෘෂිරසායන ද්‍රව්‍ය හිඟය හේතුවෙන් වසර තුළ දී පෙස්ටලොටියෝප්සිස් රෝගය රබර් වගාවන් තුළ දරුණු ලෙස ව්‍යාප්ත වීම සමඟ රබර් වගාවන් හෙක්ටයාර් 40,000කට පමණ ඉන් බලපෑම් ඇති වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඵලදාව සියයට 0-10 දක්වා අඩු විය. ඒ අනුව, 2022 වසරේ සමස්ත රබර් නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත කිලෝග්‍රෑම් මිලියන 70.9ක් දක්වා සියයට 7.8කින් පහළ ගියේය. රබර් නිෂ්පාදනයේ ප්‍රධාන කාණ්ඩ අතුරින්, සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 49.0කට දායක වන ෂීට් රබර් නිෂ්පාදනය සියයට 9.6ක පසුබෑමක් වාර්තා කළ අතර, අනෙකුත් කාණ්ඩවල රබර් නිෂ්පාදනය 2021 වසරට සාපේක්ෂව 2022 වසර තුළ දී සියයට 11.7ක

2

2.4 සංඛ්‍යා සටහන

ප්‍රධාන කෘෂි බෝගවල උපනති

අයිතමය	ඒකකය	2021 (අ)	2022 (ආ)	වාර්ෂික වෙනස්වීම (%)	
				2020/21 (අ)	2021/22 (ආ)
1. තේ					
1.1 නිෂ්පාදනය (ඇ)	කි.ග්‍රෑ. මිලියන	299.5	251.5	7.4	-16.0
- පහතරට	කි.ග්‍රෑ. මිලියන	183.2	155.0	7.8	-15.4
- මැදරට	කි.ග්‍රෑ. මිලියන	51.0	40.2	9.1	-21.2
- උඩරට	කි.ග්‍රෑ. මිලියන	65.3	56.3	5.0	-13.8
1.2 මුළු වගා බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	267	267	0.3	0.2
1.3 දලු කැඩීම සිදු කරන ලද බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	267	267	0.3	0.2
1.4 නිෂ්පාදන පිරිවැය (ඈ)	රුපියල්/කි.ග්‍රෑ.	618.49	638.99	13.2	3.3
1.5 සාමාන්‍ය මිල					
- කොළඹ වෙන්දේසිය	රුපියල්/කි.ග්‍රෑ.	619.15	1,270.50	-2.3	105.2
- අපනයන (නැ.වි.ස.)	රුපියල්/කි.ග්‍රෑ.	920.76	1,643.11	6.2	78.5
1.6 නැවත වගා කිරීම	හෙක්ටයාර	1,123	1,239	38.3	10.3
1.7 අලුතින් වගා කිරීම	හෙක්ටයාර	696	476	61.9	-31.6
1.8 එකතු කළ අගය (ඉ)	ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන්	0.6	0.5	4.8	-8.8
2. රබර්					
2.1 නිෂ්පාදනය	කි.ග්‍රෑ. මිලියන	76.9	70.9	-1.7	-7.8
- ෂීට් රබර්	කි.ග්‍රෑ. මිලියන	38.4	34.8	-1.7	-9.6
- ක්‍රේප් රබර්	කි.ග්‍රෑ. මිලියන	13.9	14.5	7.4	3.9
- වෙනත්	කි.ග්‍රෑ. මිලියන	24.5	21.7	-6.2	-11.7
2.2 මුළු වගා බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	139	139	0.6	-0.1
2.3 කිරි කපන ලද බිම් ප්‍රමාණය (ඊ)	හෙක්ටයාර දහස්	113	107	-6.1	-5.9
2.4 නිෂ්පාදන පිරිවැය	රුපියල්/කි.ග්‍රෑ.	221.00	288.00	3.5	30.3
2.5 සාමාන්‍ය මිල					
- කොළඹ වෙන්දේසිය (RSS 1)	රුපියල්/කි.ග්‍රෑ.	460.78	595.00	31.1	29.1
- අපනයන (නැ.වි.ස.)	රුපියල්/කි.ග්‍රෑ.	540.77	841.72	52.8	55.7
2.6 නැවත වගා කිරීම (ඊ)	හෙක්ටයාර	1,522	1,264	55.9	-16.9
2.7 අලුතින් වගා කිරීම (ඊ)	හෙක්ටයාර	1,188	489	58.2	-58.9
2.8 එකතු කළ අගය (ඉ)	ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන්	0.2	0.2	2.6	1.2
3. පොල්					
3.1 නිෂ්පාදනය	ගෙඩි මිලියන	3,120	3,391	11.7	8.7
- දිසිඳි පොල්	ගෙඩි මිලියන	298	314	31.8	5.2
- පොල් තෙල්	ගෙඩි මිලියන	211	445	340.6	110.7
- වෙනත්	ගෙඩි මිලියන	2,607	2,628	3.6	0.8
3.2 මුළු වගා බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	505	505	0.2	0.0
3.3 නිෂ්පාදන පිරිවැය	ගෙඩියකට රුපියල්	26.96	27.21	23.6	0.9
3.4 සාමාන්‍ය මිල					
- නිෂ්පාදක මිල	ගෙඩියක් රුපියල්	71.88	74.86	17.7	4.1
- අපනයන (නැ.වි.ස.) (උ)	ගෙඩියක් රුපියල්	65.36	84.54	24.2	29.3
3.5 නැවත වගා කිරීම/ යටි වගාව (උඋ)	හෙක්ටයාර	4,709	5,481	-11.7	16.4
3.6 අලුතින් වගා කිරීම (එ)	හෙක්ටයාර	9,622	13,913	20.3	44.6
3.7 එකතු කළ අගය (ඉ)	ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන්	0.8	0.9	7.4	17.8

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) හරිත තේ ඇතුළුව
(ඈ) අමු තේ දලු සැපයුම්කරුවන්ගේ ලාභාංශද ඇතුළත් වේ
(ඉ) වගා කිරීම සහ සැකසුම් කටයුතු සිදු කළ ප්‍රමාණය පමණි
(ඊ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුව වගා කළ බිම් ප්‍රමාණය
(උ) ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුන සඳහා පමණි
(උඋ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම් පමණක් ආවරණය වේ
(එ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් බෙදා හරින ලද බීජ පැළ සංඛ්‍යාව අනුව අලුතින් වගා කළ බිම් ප්‍රමාණය ගණනය කර ඇත. මෙහිදී පොල් බීජ පැල 158ක් සඳහා හෙක්ටයාර එකක් යනුවෙන් අනුපාතය යොදා ගෙන ඇත.

මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
වැවිලි අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
කොළඹ තේ තැරැව්කරුවන්ගේ සංගමය
ලංකා වාණිජ මණ්ඩලය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

පහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, 2022 වසර තුළ දී ක්‍රේප් රබර් නිෂ්පාදනය සියයට 3.9ක වර්ධනයක් වාර්තා කළේය. 2022 වසරේ දී දේශීය රබර් මිලෙහි කැපී පෙනෙන ඉහළ යෑමක් සිදු වුවද, රබර් අංශයේ ඵලදායිතාව සහ කිරි කැපීමේ සීමා හේතුවෙන් රබර් නිෂ්පාදනයේ සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගැනීම දුෂ්කර වී ඇත. මේ අතර, රබර් කිරි කැපීමේ දින ගණන් අඩුවීම හේතුවෙන් 2022 වසරේ දී රබර් වගාවේ සාමාන්‍යය ඵලදාව, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 665ක් දක්වා සියයට 2.1කින් පහළ ගියේය. රබර් නිෂ්පාදන පිරිවැය මෑත වසර කිහිපය තුළ දී ඉහළ යමින් පැවති අතර, 2022 වසර අවසන් වන විට එය කිලෝග්‍රෑමයකට රුපියල් 288.00ක් දක්වා පෙර වසරට සාපේක්ෂව සියයට 30.3ක ඉහළ යෑමක් වාර්තා කළේය. 2022 වසරේ දී, කාර්මික අංශයේ දේශීය අමු රබර් පරිභෝජනය කිලෝග්‍රෑම් මිලියන 117.3ක් දක්වා සියයට 12.4කින් පහළ ගිය අතර, කොවිඩ්-19 වසංගතය පහව යෑමත් සමඟ දේශීය හා ගෝලීය වෙළඳපොළ තුළ වෛද්‍ය අත්වැසුම් සඳහා ඇති ඉල්ලුම අඩුවීම එයට කිසියම් දුරකට හේතු විය.

2022 වසරේ පළමු භාගය තුළ ගෝලීය වෙළඳපොළ තුළ පැවති හිතකර ඉල්ලුම හේතුවෙන්, කොළඹ රබර් වෙන්දේසිය තුළ රබර් වර්ග බොහොමයක මිල ගණන් ඉතිහාසයේ වාර්තා වූ ඉහළම මට්ටමකට ළඟා විය. 2022 වසරේ දී, කොළඹ රබර් වෙන්දේසියේ, දුම් ගැසූ දාර ෂීට් රබර් (RSS1) මිලෙහි වාර්ෂික සාමාන්‍යය, 2021 වසරේ වාර්තා වූ කිලෝග්‍රෑමයකට රුපියල් 460.78 සිට රුපියල් 595.00ක් දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 29.1කින් ඉහළ ගිය අතර, ලේටෙක්ස් ක්‍රේප් රබර් මිලෙහි සාමාන්‍යය කිලෝග්‍රෑමයකට රුපියල් 626.32 සිට රුපියල් 903.27ක් දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 44.2කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් දේශීය හා ගෝලීය වෙළඳපොළ තුළ රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා පවතින දුර්වල ඉල්ලුම හේතුවෙන් වසරේ අග භාගය වන විට රබර් මිල ගණන් පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2022 වසර අවසානය වන විට දුම් ගැසූ දාර ෂීට් රබර් (RSS1) සහ ලේටෙක්ස් ක්‍රේප් රබර් වෙන්දේසි මිල ගණන්වල සාමාන්‍යය, පිළිවෙළින්, කිලෝග්‍රෑමයකට රුපියල් 517.67ක් සහ රුපියල් 628.33ක් විය. රබර්වල අපනයන මිලෙහි (නැ.වි.ස.) සාමාන්‍යය, පෙර වසරේ වාර්තා වූ කිලෝග්‍රෑමයකට එ.ජ. ඩොලර් 2.72ක සිට 2022 වසරේ දී එ.ජ. ඩොලර් 2.73ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.

2022 වසර තුළ දී, රබර් අංශයේ ඵලදායිතාව සහ අගය එකතු කිරීම් කටයුතු වැඩිදියුණු කිරීම සඳහා වූ උපාය මාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක විය. රබර් අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීමේ සිය ප්‍රයත්නය වෙනුවෙන් රබර් පර්යේෂණ ආයතනය විසින් වසර තුළ දී පර්යේෂණ අධ්‍යයනයන් කිහිපයක් සිදු කරන ලදී. වසර තුළ දී, විශේෂයෙන් ම සාම්ප්‍රදායික නොවන රබර් වගා ප්‍රදේශවල, නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සහ ශ්‍රම හිඟතාවයට විසඳුම් ලබා දීමේ අරමුණින්, දින කිහිපයකට වතාවක් අස්වනු නෙළීමේ ක්‍රම අනුගමනය කිරීම පිළිබඳ පර්යේෂණ සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කුඩා වතු හිමියන්ට සහ වතු සමාගම්වලට අයත් රබර් ඉඩම් දළ වශයෙන් හෙක්ටයාර් 1,600ක් 'දින හතරකට වරක් කිරි කැපීමේ ක්‍රමයට' පරිවර්තනය කරන ලදී. පත්‍ර රෝග හේතුවෙන් ඵලදාවේ සිදුවන සැලකිය යුතු පහළ යෑම් වැළැක්වීමේ ප්‍රයත්නයක් ලෙස පත්‍ර රෝගවලට එරෙහිව ප්‍රතිරෝධී ක්ලෝන හඳුනාගැනීම සඳහා ක්ලෝන පරීක්ෂා කිරීම 2022 වසරේ දී අවසන් කරන ලද අතර, තිරසාර රබර් වගාවක් සහතික කිරීම සඳහා දේශගුණයට ඔරොත්තු දෙන ක්ලෝන හඳුනාගැනීමේ ක්‍රියාමාර්ග ද ක්‍රියාවට නැංවිණි. මොණරාගල, මිද්දෙණිය, මතුගම, හොරණ, බුලත්සිංහල, කළුතර, කෑගල්ල සහ රත්නපුර යන ප්‍රදේශ ආවරණය වන පරිදි රබර් වගා කරන ප්‍රදේශ කිහිපයක, පොහොර අඩු වේගයකින් පසට අවශෝෂණය කරවීමේ ක්‍රමවේද (slow-release fertiliser techniques) සහ පැළවල පෝෂණ ගුණය ඉහළ නැංවීමේ ක්‍රමවේද පිළිබඳව රබර් වගා කරන්නන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් වසර තුළ දී ක්‍රියාත්මක කරන ලදී. තවද, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වසර තුළ දී නව වගා සහ නැවත වගා කිරීම් හරහා රබර් වගා ව්‍යාප්තිය පුළුල් කිරීමේ නිරත විය. රබර් නව වගා කිරීමේ වැඩසටහන් යටතේ උතුරු පළාතේ මුලතිව් දිස්ත්‍රික්කයෙහි ප්‍රථමයෙන් ස්ථාපිත කරන ලද රබර් වගාවෙහි රබර් කිරි කැපීම 2022 වසරේ දී ආරම්භ කරන ලදී. විවිධ රබර් ආශ්‍රිත අතුරු බෝග පද්ධති ප්‍රචලිත කිරීමට මෙන්ම ප්‍රයෝජනයට නොගත් ඉඩම්වල බෝග විවිධාංගීකරණය ප්‍රවර්ධනය කිරීමටද ආදර්ශ වගා බිම් වැඩසටහන් හරහා කටයුතු කරන ලදී. මේ අතර, වගා පිරිවැය ඉහළ යෑම මධ්‍යයේ, සහනාධාර අරමුදල් ප්‍රමාණය වෙනස් කිරීමකින් තොරව අරමුදල් සපයන වාරික ගණන අටේ සිට පහ දක්වා අඩු කරමින් 2022 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත වගා කිරීම සහ නව වගාකිරීම සඳහා වන සහනාධාර යෝජනා ක්‍රම සංශෝධනය කරන ලදී. ශ්‍රී ලංකා ජාතික

2

විද්‍යා පදනමේ මූල්‍ය අනුග්‍රහය ඇතිව, රබර් කඳ නිසි ලෙස කළමනාකරණය කිරීම තුළින් තිරසාර අස්වනු නෙලීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. මේ අතර, දේශීය රබර් නිෂ්පාදන ගෝලීය අගය දාමයට මුහු කිරීම ශක්තිමත් කිරීම උදෙසා රබර් අංශයේ අගය එකතු කිරීම ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගනිමින්, කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයින් මෙන්ම, කුඩා රබර් වතු හිමියන් ඉලක්ක කර ගනිමින් රබර් ආශ්‍රිත නිෂ්පාදනයන් පිළිබඳ පුහුණු වැඩසටහන් වසර තුළ ක්‍රියාත්මක කරන ලදී.

පොල්

2021 සහ 2022 වසරවල දී පැවති හිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් 2022 වසරේ දී පොල් අංශය මෙතෙක් වාර්තා වූ එහි ඉහළම වාර්ෂික නිෂ්පාදනය වාර්තා කළේය. ඒ අනුව, 2021 වසරේ වාර්තා වූ සියයට 11.7ක කැපී පෙනෙන වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 8.7ක වර්ධනයක් වාර්තා කරමින්, සමස්ත පොල් ගෙඩි නිෂ්පාදනය ගෙඩි මිලියන 3,391ක් දක්වා ඉහළ ගියේය. 2021 වසරේ සිට ප්‍රමාණවත් ලෙස ව්‍යාප්ත වූ වර්ෂාපතනයක් ලැබීම සහ ප්‍රධාන පොල් වගා කරන ප්‍රදේශයන්හි පැවති හිතකර වායුගෝලීය උෂ්ණත්වය පොල් නිෂ්පාදනයේ වර්ධනය සඳහා බොහෝ දුරට සහාය විය. මෙම හිතකර තත්ත්වයන්ගේ බලපෑම මගින් 2022 වසරේ දී පොල් වගාව සඳහා රසායනික පොහොර යෙදීම සීමාවීමෙහි අහිතකර බලපෑම මැඩපැවැත්විණි. ගෙඩි නිෂ්පාදනය ඉහළ යෑමත් සමඟම වසර තුළ දී පොල් ආශ්‍රිත නිෂ්පාදනවල ද ඉහළ යෑමක් දක්නට ලැබුණි. ඒ අනුව, දිසිදි පොල් නිෂ්පාදනය 2021 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 33,289 සිට මෙට්‍රික් ටොන් 35,030 දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 5.2කින් ඉහළ ගියේය. පොල්තෙල් සහ පාම් තෙල් යන දෙවර්ගයම සඳහා ආනයන සීමා පැනවීම සහ තෙල් නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් පරිදි පොල් ගෙඩි පැවතීමෙහි බලපෑම පිළිඹිබු කරමින් පොල්තෙල් නිෂ්පාදනය 2022 වසරේදී මෙට්‍රික් ටොන් 68,590 දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 59.4කින් ඉහළ ගියේය. පිටිකළ පොල් කිරි නිෂ්පාදනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 15.8කින් ඉහළ ගිය අතර, පොල් ක්‍රීම් සහ පොල් කිරි නිෂ්පාදන, පිළිවෙළින්, සියයට 12.5කින් සහ සියයට 0.9කින් පහළ යෑමක් වාර්තා කළේය. 2022 වසරේ දී පොල් නිෂ්පාදන අංශයේ කාර්යසාධනය ඉහළ ගියද, 2022 වසරේ දී ප්‍රමාද වී පොහොර යෙදීම සහ ප්‍රමාණවත් ලෙස රසායනික පොහොර නොයෙදීමේ පසු බලපෑම නුදුරු අනාගතයේ දී පොල් අස්වැන්න කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය. කෙසේ වෙතත්, 2022 වසර මුළුල්ලේ පැවති හිතකර වර්ෂාපතනයේ පසු බලපෑම මගින් පොහොර ප්‍රමාණවත් පරිදි නොයෙදීමේ අහිතකර ප්‍රතිවිපාක සමනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පොල් නිෂ්පාදනය ඉහළ ගියද, 2022 වසර තුළ පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදනවල මිල ගණන් ඉහළ මට්ටමක පැවතුණි. 2022 වසරේ දී, පොල් ගෙඩියක සිල්ලර මිලෙහි සාමාන්‍යය, ගෙඩියකට රුපියල් 91.36ක් දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 8.9කින් ඉහළ ගිය අතර, 2022 වසරේ අග භාගය වන විට ගෙඩියක මිල රුපියල් 100.00 ඉක්මවමින්, පොල් සඳහා මෙතෙක් වාර්තා වූ ඉහළම මිල වාර්තා විය. කොළඹ පොල් වෙන්දේසියේ පොල් ගෙඩියක සාමාන්‍ය වෙන්දේසි මිල 2021 වසරේ වාර්තා වූ ගෙඩියකට රුපියල් 56.51 සිට සියයට 6.4ක වර්ධනයක් වාර්තා කරමින් 2022 වසරේ දී ගෙඩියකට රුපියල් 60.14ක් ලෙස සටහන් විය. දේශීය වෙළඳපොළෙහි දිසිදි පොල් මිල ද කිලෝග්‍රෑමයකට රුපියල් 538.75ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 0.3කින් සුළු වශයෙන් ඉහළ ගියේය. පොල්තෙල් මිලි ලීටර් 750ක බෝතලයක මිල, 2021 වසරේ දී වාර්තා වූ සියයට 29.2ක ඉහළ යෑමට සාපේක්ෂව, 2022 වසරේ දී රුපියල් 520.19ක් දක්වා සියයට 17.3කින් ඉහළ ගියේය. තවද, දේශීය නිෂ්පාදනය ඉහළ යෑමෙහි හිතකර බලපෑම පිළිබිඹු කරමින්, 2022 වසරේ දී දිසිදි පොල්, පොල්තෙල් සහ කොප්පරාවල මුළු අපනයන ප්‍රමාණය සහ වටිනාකම කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය.

පොල් නිෂ්පාදන අංශය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවමින්, එම අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා රජය විසින් 2022 වසර තුළ දී අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී. ඒ අනුව, දැනට පවතින පොල් ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා ඉහළ අස්වැන්නක් ලබා දෙන පොල් වගා ප්‍රභේද ලබාදීමට පොල් වගා කිරීමේ මණ්ඩලය පියවර කිහිපයක් ආරම්භ කළේය. ඉහළ අස්වැන්නක් ලබා දෙන 'කප්සුවය' දෙමුහුන් පොල් වගා ප්‍රභේදයෙහි පැළ නිෂ්පාදනය සඳහා නව බීජ පොල් නිෂ්පාදන වගාවක් සංවර්ධනය කිරීමට අදාළ කටයුතු වසර තුළ දී සිදු කෙරුණු අතර, 'කප්රුවන' දෙමුහුන් ප්‍රභේදය නිෂ්පාදනය කිරීම සඳහා වූ පරාගනය වැඩසටහන සහ කිනියාම බීජ වගාවෙහි පාළු සිටුවීම ද හලාවත වැවිලි සමාගම සමඟ

එක්ව සිදු කරන ලදී. සහනදායී මිලකට පොල් පැළ සැපයීම, පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම, නැවත වගා කිරීම, යටි වගා කිරීම සහ අලුතින් වගා කිරීම සඳහා වන සහනාධාර ඇතුළු සහනාධාර යෝජනා ක්‍රම කිහිපයක් 2022 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2022 වසරේ දී සුදු මැස්සන්ගේ පළිබෝධ හානිය තීව්‍ර වීමත් සමඟ දංකොටුව, නාත්තන්ඩිය, වෙන්නප්පුව ඇතුළු ප්‍රදේශවල සුදු මැස්සන්ගේ බලපෑමට ලක් වූ පොල් වගාවන්ගේ හානිය පාලනය කිරීමේ නියමු ව්‍යාපෘතියක් දියත් කළ අතර, වසර තුළ දී රසායනික ද්‍රව්‍ය සහ ජෛව රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් සුදු මැස්සන් රෝගය පාලනය කිරීම සඳහා නිර්දේශයන් නිකුත් කරන ලදී. තවද, පොල් සැකසුම් කර්මාන්තශාලාවල අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා අවශ්‍ය ඉන්ධන සැපයීම මගින් එම කර්මාන්තශාලාවලට ඉන්ධන හිඟය මගින් සිදු වූ බලපෑම අවම කිරීමට පියවර ගන්නා ලදී. මේ අතර, 'සිලෝන් කොකනට්' (Ceylon Coconut) සන්නාමයෙහි ගෝලීය ව්‍යාප්තිය පුළුල් කිරීමට අදාළ පියවරයන් ක්‍රියාත්මක වූ අතර, එමගින් පොල් කර්මාන්තයේ අගය එකතු කිරීම් ප්‍රවර්ධනය කෙරෙන අතර, ඒ තුළින් රටේ පොල් කර්මාන්තය සඳහා ගෝලීය වෙළඳපොළ තුළ වැඩි වශයෙන් අවස්ථා නිර්මාණය වනු ඇත.

සුළු අපනයන බෝග

දේශීය සැපයුම් දාමවල සහ පොහොර සුලබතාවය පිළිබඳව ගැටලු මධ්‍යයේ වුවද, 2022 වසරේ දී සුළු අපනයන බෝග නිෂ්පාදනය අඛණ්ඩව වර්ධනය විය. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, සුළු අපනයන බෝග නිෂ්පාදනය 2021 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 143,165ක සිට මෙට්‍රික් ටොන් 186,962ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 30.6ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. ඉහළ ගෝලීය ඉල්ලුම් තත්ත්වයක් තුළ දේශීය මිල ඉහළ යෑම පාලනය කර ගැනීමට සහ ගෙවුම් ශේෂ අර්බුදය මධ්‍යයේ ආනයන වියදම සීමා කිරීම සඳහා පියවරක් ලෙස සුළු අපනයන බෝග කිහිපයක් මත පනවා ඇති ආනයන සීමා අඛණ්ඩව පවත්වාගෙන යෑමට රජය ගත් තීරණය සමඟ ගොවීන් සක්‍රීයව වගාවට යොමු වීමෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම අංශයේ නිෂ්පාදනය සැලකිය යුතු ලෙස වර්ධනය විය. 2022 වසරේ දී කුරුඳු, කරාබු නැටි, එනසාල්, කෝපි, කොකෝවා, සාදික්කා, පුවක් සහ බුලත් නිෂ්පාදන වර්ධනයන් වාර්තා කළ අතර, ගම්මිරිස් නිෂ්පාදනය පහළ ගියේය. මෙම අංශයේ සමස්ත අපනයන ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 7.0කින් පහළ ගිය අතර, රුපියල් වටිනාකම අනුව අපනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 44.8කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. 2022 වසරේ දී කුරුඳු අපනයනයෙන් ලද ආදායම පෙර වසරට සාපේක්ෂව සියයට 50.1කින් පමණ සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, සුළු අපනයන බෝග අංශයේ සමස්ත අපනයන ආදායමේ වර්ධනය සඳහා එය විශාල වශයෙන් දායක විය.

සුළු අපනයන කෘෂිකර්මාන්තයේ කාර්යසාධනය ඉහළ නංවාලීම සඳහා රජය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් අනුගමනය කරන ලදී. ඒ අනුව 2022 වසරේ දී, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් ගණනාවකගේ සහයෝගය ඇතිව, ශ්‍රී ලංකාවේ කුරුඳු සඳහා යුරෝපා කොමිසම වෙතින් භූගෝලීය දර්ශක සහතිකය (Geographical Indication Certification) ලබා ගැනීම සඳහා කටයුතු සම්පාදනය කරන ලදී. මෙමගින් කුරුඳුවල ලංකාවට සුවිශේෂී ගුණාංග පිළිබඳ ලොව පුරා පිළිගැනීම වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරනු ලබයි. තවද, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර, වව්නියාව සහ යාපනය වැනි සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල අපනයන කෘෂිකර්ම බෝග වගාව ව්‍යාප්ත කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කරන ලදී. මේ අතර, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෙම හඳුනාගත් ප්‍රදේශවල වගා බිම් ප්‍රමාණය ව්‍යාප්ත කිරීමේ අරමුණින් ගම්මිරිස්, පුවක්, ඉඟුරු, කහ සහ බුලත් වැනි සුළු අපනයන බෝග හඳුන්වා දීම අරමුණු කරගනිමින් විවිධ වැඩසටහන් ක්‍රියාවට නංවන ලදී. නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින් කාබනික වගාව හඳුන්වාදීම සහ එය ප්‍රචලිත කිරීම, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සහ යහපත් නිෂ්පාදන පිළිවෙත් හඳුන්වා දීම 2022 වසරේ දී සිදු කරන ලදී.

වෙනත් ක්ෂේත්‍ර බෝග

2021 වසරේ දී වාර්තා කළ ඉහළ අස්වැන්නට අනතුරුව, වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය කැපී පෙනෙන ලෙස පහත වැටුණු අතර, දේශීය වශයෙන් පොහොර සහ අනෙකුත් කෘෂි රසායනික ද්‍රව්‍ය හිඟවීම සහ සැපයුම් දාමයන්වලට ඇති වූ අවහිරතා ඒ සඳහා බොහෝ සෙයින් හේතු විය. පොහොර සහ අනෙකුත් කෘෂි රසායනික ද්‍රව්‍ය හිඟවීම හේතුවෙන් වෙනත් ක්ෂේත්‍ර බෝගවල දේශීය නිෂ්පාදනය පහත වැටුණු

2

අතර, බොහෝ දුරට එම හිඟය ආනයන මගින් සැපයීම හේතුවෙන් 2022 වසරේ රටේ ආනයන වියදම මත එයින් පීඩනයක් ඇති විය. ඒ අනුව, 2022 වසරේ දී, වෙනත් ක්ෂේත්‍ර බෝගවල සමස්ත නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 526,803ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 37.5කින් පහත වැටුණු අතර, එය 2021/2022 මහ කන්නයේ නිෂ්පාදනයෙහි වාර්තා වූ සියයට 37.8ක පහළ යෑම සහ 2022 වසරේ යල කන්නයේ නිෂ්පාදනයේ වාර්තා වූ සියයට 36.8ක පහළ යෑමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයකි. කෘෂිකාර්මික යෙදවුම්වල හිඟය සහ ඉහළ පිරිවැය හේතුවෙන් 2021 වසරට සාපේක්ෂව බඩ ඉරිඟු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 259,040ක් දක්වා සියයට 45.2කින් කැපී පෙනෙන ලෙස පහළ ගියේය. දේශීය බඩ ඉරිඟු නිෂ්පාදනය පහත වැටීමත් සමඟ, සත්ත්ව ආහාර කර්මාන්තයේ ඇති වූ ධාන්‍ය හිඟය සපුරාලීම සඳහා බඩ ඉරිඟු ආනයනය කිරීමට සිදු වූ අතර, 2021 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 22,724ට සාපේක්ෂව 2022 වසරේ දී මෙට්‍රික් ටොන් 190,686ක් දක්වා බඩ ඉරිඟු ආනයනය ඉහළ ගියේය. 2022 වසරේ දී අර්තාපල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 47,614ක් දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 37.3කින් පහළ ගිය අතර, 2021 වසරට සාපේක්ෂව අර්තාපල් ආනයන සියයට 31.8කින් ඉහළ ගියේය. තවද, 2022 වසරේ දී ලොකු ළූණු නිෂ්පාදනය පෙර වසරට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 17,799ක් දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 73.0කින් කැපී පෙනෙන ලෙස පහළ ගිය අතර, ලොකු ළූණු ආනයන මෙට්‍රික් ටොන් 263,781ක් දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 2.5කින් ඉහළ ගියේය. එසේම, කුරක්කන්, කව්පි සහ සෝයා බෝංචි වැනි වෙනත් ක්ෂේත්‍ර බෝගවල දේශීය නිෂ්පාදනය මෙම වසර තුළ දී ඉහළ ගිය අතර, රතු ළූණු, මුං, උඳු, රටකජු, ඉඟුරු සහ අමු මිරිස් නිෂ්පාදනය පහළ ගියේය. මේ අතර, රටේ ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝගවල දේශීය නිෂ්පාදනය වැඩිදියුණු කිරීමට රජය අඛණ්ඩව කටයුතු කළේය. ඒ අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය වසර තුළ දී ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කරන ලදී. අභිජනන වැඩසටහන හරහා මිරිස්, අර්තාපල්, බඩ ඉරිඟු, මෙනේරි, කව්පි, උඳු සහ මුං වැනි වෙනත් ක්ෂේත්‍ර බෝගවල නව ප්‍රභේද සංවර්ධනය කිරීම, නිර්දේශිත සියලුම බෝග වර්ග නඩත්තු කිරීම, නිර්දේශිත ප්‍රභේදවල බීජ නිෂ්පාදනය, වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා තාක්ෂණික නිර්දේශ සැපයීම, පාංශු පරීක්ෂණ සේවා සහ තාක්ෂණය බෙදාහැරීම යනාදිය මෙම ක්‍රියාමාර්ගවලට ඇතුළත් වේ. කෙසේ වෙතත්, පොහොර සහ පළිබෝධනාශක වැනි කෘෂිකාර්මික යෙදවුම්වල ප්‍රමාණවත් සැපයුමක් සහතික කිරීම, උසස් තත්ත්වයේ බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ පාංශු හා බෝග කළමනාකරණ සම්බන්ධ යහපත් පිළිවෙත් සහිත ජාතික මට්ටමේ වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදන සැලැස්මක් අනුව සියලුම වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය ඉහළ නැංවීමට තවදුරටත් ක්‍රියාකිරීම අවශ්‍ය වන අතර, දේශීයව නිෂ්පාදනය කිරීමට හැකියාව ඇති වෙනත් ක්ෂේත්‍ර බෝග ආනයනය සඳහා මුදල් රටින් පිටතට ගලායෑම අවම කිරීම සඳහා සැපයුම් දාම ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

එළවළු

දේශීය වශයෙන් පොහොර සහ වෙනත් කෘෂිරසායනික ද්‍රව්‍ය හිඟවීම, සැපයුම් දාමය ආශ්‍රිත අවහිරතා සහ නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම හේතුවෙන් 2022 වසරේ දී එළවළු සැපයුම පහළ ගියේය. සමස්ත එළවළු නිෂ්පාදනය 2021 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 1,669,515ට සාපේක්ෂව 2022 වසරේ දී මෙට්‍රික් ටොන් 1,588,256ක් දක්වා සියයට 4.9කින් පහළ ගියේය. 2021/2022 මහ කන්නයේ දී එළවළු නිෂ්පාදනය පෙර වසරේ මහ කන්නයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 815,482ක් දක්වා සියයට 6.5කින් පමණ පහළ ගිය අතර, 2022 යල කන්නයේ නිෂ්පාදනය ද 2021 වසරේ යල කන්නයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 772,773ක් දක්වා සියයට 3.1කින් පමණ පහළ ගියේය. මේ අතර, එළවළු නිෂ්පාදනය පහළ යෑම සහ ඉන්ධන හිඟය හේතුවෙන් සැපයුම් දාමයේ ඇති වූ කෙටි කාලීන අවහිරතා හේතුවෙන් 2022 වසර තුළ දී එළවළු මිල අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතිණි. එළවළු අස්වනු සඳහා අවාරය පැමිණීම මෙන්ම, ඉන්ධන හිඟය වඩාත් උග්‍ර වීම හේතුවෙන් 2022 වසරේ මැයි සහ ජූනි මාසවල දී එළවළු මිල ගණන් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවාහනය කිරීම සඳහා ඉන්ධන බෙදාහැරීම සහ 2022 වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී කන්න අස්වැන්න වෙළඳපොළට පැමිණීම හේතුවෙන් 2022 වසරේ ජූලි මාසයේ සිට දේශීය වෙළඳපොළ තුළ එළවළු මිල ගණන්වල සුළු පහළ යෑමක් දක්නට ලැබුණි. කෙසේ වෙතත්, අධික වර්ෂාව සහ ගබඩා කිරීමේ සහ ප්‍රවාහන පහසුකම්වල දුෂ්කරතා හේතුවෙන් 2022 වසරේ අග භාගය තුළ එළවළු මිල ගණන් ඉහළ මට්ටමක පැවතුණි. මේ අතර, 2022 වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 26.7ක වටිනාකමකින් යුත්

එළවළු මෙට්‍රික් ටොන් 15,835ක් අපනයනය කර ඇත. මෙම වසර තුළ දී දේශීය එළවළු නිෂ්පාදනය තිරසාර ලෙස ඉහළ නැංවීම සඳහා රාජ්‍ය ආයතන විසින් ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන ඇත. ඒ අනුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය විසින් මෙම අංශයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින්, නව එළවළු ප්‍රභේද සංවර්ධනය, පළිබෝධකයන්ට සහ රෝගවලට ප්‍රතිරෝධී එළවළු ප්‍රභේද හඳුන්වාදීම, එළවළු වගාව සඳහා සුදුසු පරිදි පසෙහි සාරවත් බව කළමනාකරණය කිරීම, එළවළු වගාවේ පළිබෝධකයින් සහ රෝග කළමනාකරණය සඳහා අවශ්‍ය වන තාක්ෂණික සංවර්ධනය සහ එළවළු සංරක්ෂණය සහ පෝෂක කළමනාකරණ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම ඇතුළු ක්‍රියාමාර්ග ගණනාවක් මෙම වසර තුළ දී ගෙන ඇත.

පලතුරු

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව, 2022 වසරේ දී සමස්ත පලතුරු නිෂ්පාදනය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. දොඩම්, දෙහි, රඹුටන්, අලිගැටපේර සහ කොමඩු නිෂ්පාදනය සැලකිය යුතු ලෙස පහළ යෑම සමඟ 2022 වසරේ දී සමස්ත පලතුරු නිෂ්පාදනය පෙර වසරට සාපේක්ෂව සියයට 26.9කින් පහළ ගිය අතර, අඹ, පැපොල්, කෙසෙල් සහ අන්නාසි යන පලතුරු නිෂ්පාදනයෙහි ඉහළ යෑම් වාර්තා විය. සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ, අපනයන වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 37.6ක වටිනාකමින් යුතු කෙසෙල්, පැපොල් ඇතුළු පලතුරු මෙට්‍රික් ටොන් 41,526ක් අපනයනය කර ඇති අතර, එ.ජ. ඩොලර් මිලියන 42.2ක වටිනාකමක් සහිත මෙට්‍රික් ටොන් 32,591ක පලතුරු ප්‍රමාණයක් ආනයනය කර ඇත. ආනයන වියදම අවම කිරීම සඳහා රජය විසින් පලතුරු කිහිපයක් ආනයනය කිරීමට පනවා ඇති තහනම හේතුවෙන් දේශීයව නිෂ්පාදනය කරනු ලබන පලතුරු සඳහා පවතින ඉල්ලුම ඉහළ ගියද, දේශීය නිෂ්පාදකයන් තුළ දේශීය ඉල්ලුමට සරිලන පරිදි පලතුරු සැපයීම ඉහළ නැංවීම සඳහා පවතින ධාරිතාව සීමා වීම සහ සැපයුම් දාමයන් සම්බන්ධ ගැටලු හේතුවෙන් දේශීය පලතුරු නිෂ්පාදන අංශයට එයින් අත්කර ගැනීමට හැකිව තිබූ ප්‍රතිලාභ සීමා විය. පලතුරු නිෂ්පාදන අංශය මගින් ආදායම් සහ රැකියා අවස්ථා නිර්මාණය කරමින් ජාතික ආර්ථිකයට ලබාදෙන දායකත්වය මෙන්ම, ජනතාවගේ පෝෂණය සම්බන්ධව එයින් ඇති කෙරෙන සැලකිය යුතු දායකත්වය හේතුවෙන් දේශීය පලතුරු නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන ශක්‍යතාව ඉහළ නැංවීම සහ දේශීය හා විදේශීය වෙළඳපොළවලට පලතුරු සැපයීමේ දී එහි ගුණාත්මය මෙන්ම සුරක්ෂිතභාවය වැඩිදියුණු කිරීමේ වැදගත්කම තවදුරටත් අවධාරණය කෙරේ. විශේෂයෙන් කෘෂිකාර්මික යෙදවුම් භාවිතය සහ අස්වනු නෙලීම වැනි කටයුතුවල දී යහපත් කෘෂිකාර්මික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම, නිෂ්පාදකයින් සහ අපනයනකරුවන් අතර සෘජු සම්බන්ධතා ඇති කිරීම, කොන්ත්‍රාත් පදනම මත නිෂ්පාදන ලබාගැනීමේ ක්‍රමවේදය තවදුරටත් වර්ධනය කිරීම, පසු අස්වනු හානිය අවම කිරීම හා පලතුරු සංරක්ෂණය, ගබඩා කිරීම සහ එකතු කළ අගය වැඩිකිරීම සම්බන්ධ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම යනාදිය මෙම අංශයේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, රජය විසින් දේශීය පලතුරු අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා වසර තුළ දී ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් පලතුරු වගාකිරීම හා සංවර්ධනය කිරීම, පලතුරු බෝග වගාව සම්බන්ධ නිෂ්පාදන තාක්ෂණයන් පිළිබඳ උපදේශන සේවා සැපයීම, පළිබෝධකයන් සහ රෝග හඳුනා ගැනීම, නිර්දේශිත පලතුරු වර්ගවල හොඳ තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය සැපයීම මෙන්ම, පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීම වසර තුළ දී සිදු විය. මේ අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවන ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ මූල්‍ය හා තාක්ෂණික සහාය ඇතිව අඹ, කෙසෙල්, දෙළුම්, අන්නාසි, රඹුටන් සහ දූරියන් ඇතුළු පලතුරු බෝග හයක් වගා කළ හැකි ප්‍රදේශ පිළිබඳ තක්සේරුවක් සහ සිතියම් ගතකිරීමක් සිදුකරන ලදී.

සීනි

2019 වසරේ සිට අඛණ්ඩව ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ සීනි නිෂ්පාදනය, දේශීය වශයෙන් පැවති පොහොර හිඟය මධ්‍යයේ සීනි කර්මාන්තය මුහුණ දුන් අවහිරතා හේතුවෙන් 2022 වසරේ දී පහළ ගියේය. වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සමස්ත සීනි නිෂ්පාදනය 2021 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 80,555ට සාපේක්ෂව 2022 වසරේ දී මෙට්‍රික් ටොන් 78,857ක් දක්වා සියයට 2.1කින් පහළ ගියේය. සමස්ත සීනි නිෂ්පාදනය පහළ යෑම සඳහා දායක වෙමින්, සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළ සෙවනගල සහ පැල්වත්ත සීනි කර්මාන්තශාලාවල නිෂ්පාදනය, පිළිවෙළින්, සියයට 29.0කින් සහ සියයට 20.6කින් පහළ ගියේය. කෙසේ වෙතත්, 2022 වසර

2

තුළ දී ගල්ඔය සහ ඇතිමලේ කර්මාන්තශාලාවල සීනි නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, සියයට 27.4කින් සහ සියයට 36.2කින් ඉහළ ගියේය. මේ අතර, ගල්ඔය, සෙවනගල, පැල්වත්ත සහ ඇතිමලේ කර්මාන්තශාලාවල සීනි නිෂ්පාදනය සමස්ත දේශීය නිෂ්පාදනයෙන්, පිළිවෙළින්, සියයට 36.2ක්, සියයට 16.0ක්, සියයට 30.6ක් සහ සියයට 17.2ක් විය. මෙම කර්මාන්තශාලා හතර විසින් සීනි නිෂ්පාදනය සඳහා යොදාගනු ලැබූ නිරි වගාව ඇතුළු උක් වගාවේ මුළු බිම් ප්‍රමාණය 2022 වසර තුළ දී සියයට 2.1කින් සුළු වශයෙන් පහළ ගියේය. මේ අතර, උක් වගාව සඳහා අවශ්‍ය පෝෂකවල පවතින කැපී පෙනෙන හිඟය පිළිබිඹු කරමින් මෙම සීනි කර්මාන්තශාලා හතරෙහි ඵලදාවේ සාමාන්‍යය සියයට 11.1කින් පහළ ගියේය. ඒ අනුව, ඵලදාවේ සාමාන්‍යය 2021 වසරේ දී වාර්තා වූ හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 67.2 හා සාපේක්ෂව 2022 වසරේ දී හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 59.7ක් දක්වා පහළ ගියේය. උක් පර්යේෂණායතනයට අනුව, 2022 වසර අවසානය වන විට, සමස්ත දේශීය සීනි අවශ්‍යතාවයෙන් සියයට 15.0 පමණ දේශීයව සපුරාගෙන ඇති අතර, ඉතිරි අවශ්‍යතාවය ආනයනය හරහා සපුරාගෙන ඇත.

දේශීය සීනි අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා ආනයනය මත අනවශ්‍ය පරිදි යැපීම අවම කරමින්, දේශීය සීනි කර්මාන්තය ශක්තිමත් කිරීම අරමුණු කරගත් වැඩසටහන් කිහිපයක් රජය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. දේශීය වශයෙන් සීනි නිෂ්පාදනය කිරීම සඳහා පවතින ඉහළ විභවතාව සහ දේශීය සීනි අවශ්‍යතාවය සපුරාලීම සඳහා දේශීය උක් වගාව ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින් උක් පර්යේෂණායතනය දේශීය සීනි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. දේශීය සීනි නිෂ්පාදනය ප්‍රවර්ධනයට අදාළව සිදුකළ යුතු ප්‍රමුඛ කාර්යභාරයන් ලෙස, වගා ප්‍රදේශ ව්‍යාප්ත කිරීමේ සහ කර්මාන්තශාලාවල ධාරිතාව ඉහළ නැංවීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, ලංකා සීනි (පුද්ගලික) සමාගමට අනුබද්ධිතව නව සීනි කර්මාන්ත ශාලාවක් ලෙස වැලිඔය සීනි කර්මාන්තශාලාව ස්ථාපිත කිරීමට 2022 වසරේ මුල් භාගයේ දී අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දුන්නේය. මේ අතර, නීතිමය ගැටලුවක් හේතුවෙන් කන්තලේ සීනි කර්මාන්තශාලාව නැවත ස්ථාපිත කිරීමේ වැඩසටහනට සම්බන්ධ කටයුතුවල ප්‍රගතිය මෙම වසර තුළ දී ද මන්දගාමීව සිදු විය. හකුරු නිෂ්පාදනය සඳහා විශේෂයෙන් ම වැඩිදියුණු කරන ලද නව ප්‍රභේදයක උක් බීජ ගුණනය කිරීමේ තවානක් කිලිනොච්චිය වන්නෙරිකුලම් ප්‍රදේශයේ ස්ථාපිත කිරීම ද 2022 වසරේ දී සිදුවිය. දේශීය සීනි කර්මාන්ත සඳහා සකස් කරන ලද ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ඉදිරිපත් කිරීමට විශේෂ කාර්යසාධක බලකායක් ස්ථාපිත කරන ලද අතර, තිරසාර ලෙස උක් බීජ නිෂ්පාදනය කිරීමට සහ සැපයුම් දාමයන් ස්ථාපිත කිරීම සඳහා උක් බීජ සම්බන්ධ ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කටයුතු ද සිදුවෙමින් පැවතුණි.

පශු සම්පත්

ආර්ථික අර්බුදය හේතුවෙන් පැන නැගුණු අභියෝග හේතුවෙන් 2022 වසරේ දී පශු සම්පත් අංශයේ ක්‍රියාකාරිත්වය මන්දගාමී විය. මෙම වසර තුළ දී, ආර්ථිකයේ තීව්‍ර වුණු විදේශ විනිමය ද්‍රවශීලතා අර්බුදය හේතුවෙන් පැන නැගුණු ගැටලු වන සත්ත්ව ආහාර ආනයන සීමා කිරීම සමඟ සත්ත්ව ආහාර හිඟවීම හේතුවෙන් එහි පිරිවැය ඉහළ යෑම, තෘණ සහ සත්ත්ව ආහාර වගාව සඳහා අවශ්‍ය රසායනික පොහොර නොමැතිවීම සහ ගබඩා කිරීමේ හා ප්‍රවාහන පහසුකම්වල දුෂ්කරතා යනාදිය හේතුවෙන් කිරි නිෂ්පාදනය හා සම්බන්ධ සමස්ත අගය දාමයට දැඩි බලපෑමක් එල්ල විය. ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව, ජාතික කිරි නිෂ්පාදනය, 2021 වසරේ වාර්තා වූ ලීටර් මිලියන 513ට සාපේක්ෂව 2022 වසරේ දී ලීටර් මිලියන 506ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 1.3කින් අඩු විය. 2022 වසරේ දී එළකිරි නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ලීටර් මිලියන 419ක් දක්වා සියයට 1.5කින් පහළ ගිය අතර, මී කිරි නිෂ්පාදනය

2.5 සංඛ්‍යා සටහන

පශු සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යාන

උප අංශය	2021 (ඇ)	2022 (ආ)	වාර්ෂික වෙනස්වීම් (%)	
			2020/21 (ඇ)	2021/22 (ආ)
1. මුළු ගවයන් සංඛ්‍යාව (මිලියන)	1.5	1.5	2.6	-0.8
එළ ගවයන්	1.1	1.1	2.5	-0.3
මී ගවයන්	0.3	0.3	3.2	-2.5
2. ජාතික කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන)	513.3	506.4	4.4	-1.3
එළ කිරි	425.4	419.2	2.8	-1.5
මී කිරි	87.9	87.3	12.9	-0.8
3. නිෂ්පාදක මිල - එළකිරි (රු./ලීටර්)	98.00	115.00	19.5	17.3
4. බිත්තර නිෂ්පාදනය (මිලියන)	1,953.7	1,848.6	4.5	-5.4
5. කුකුළු මස් නිෂ්පාදනය (මෙ.ටො.දහස්)	236.8	228.1	9.5	-3.7

(ඇ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ලීටර් මිලියන 87ක් දක්වා සියයට 0.8ක සුළු පහළ යෑමක් වාර්තා කළේය. මේ අතර, එළකිරි නිෂ්පාදනය සඳහා වන සාමාන්‍ය පිරිවැය 2021 වසරේ දී වාර්තා වූ ලීටරයක් සඳහා රු. 69.30ට සාපේක්ෂව 2022 වසරේ දී ලීටරයකට රු. 80.50ක් දක්වා කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, ආනයනික සහ දේශීය කිරිපිටි හිඟය සමඟ දියර කිරි සඳහා ඇති ඉල්ලුම වැඩිවීම මෙන්ම, කිරිපිටි මිලෙහි සැලකිය යුතු ඉහළ යෑම හේතුවෙන් ගොවීන්ට වසර තුළ දී දේශීයව නිෂ්පාදනය කරන ලද දියර කිරි සඳහා විධිමත් හා අවිධිමත් කිරි වෙළඳපොළ තුළ සාපේක්ෂ වශයෙන් ඉහළ මිලක් ලැබුණි. ඒ අනුව, එළකිරි ලීටරයක් සඳහා සාමාන්‍ය ගොවිපළ මිල 2021 වසරේ දී වාර්තා වූ රු.98.00 සිට 2022 වසරේ දී රු.115.00ක් දක්වා සියයට 17.3කින් ඉහළ ගියේය. වී සහ බඩ ඉරිඟු නිෂ්පාදනය කැපී පෙනෙන ලෙස පහළ යෑමත් සමඟ දේශීයව නිෂ්පාදනය කරනු ලබන සත්ත්ව ආහාර ද්‍රව්‍ය ප්‍රමාණය අඩුවීමත්, විදේශ විනිමය ද්‍රවශීලතාවය අඩුවීම නිසා ආහාර ද්‍රව්‍ය ආනයන සීමාකර තිබීමත් සමඟ කුකුල් පාලනය සඳහා ප්‍රමාණවත් ලෙස සත්ත්ව ආහාර ද්‍රව්‍ය නොලැබීම හේතුවෙන් 2022 වසරේ දී කුකුළු නිෂ්පාදන අංශය පසුබෑමට ලක් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, බිත්තර නිෂ්පාදනය 2021 වසරේ දී වාර්තා වූ මිලියන 1,954ට සාපේක්ෂව 2022 වසරේ දී මිලියන 1,849ක් දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 5.4කින් පහළ ගියේය. තවද, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අනුව, බිත්තරයක් සඳහා නිෂ්පාදන පිරිවැය 2021 දී වාර්තා වූ රු. 18.07 සිට 2022 වසරේ දී රු. 38.10ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, කුකුල් මස් නිෂ්පාදනය 2021 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 236,790ක අගයක සිට 2022 වසරේ දී මෙට්‍රික් ටොන් 228,130 දක්වා සියයට 3.7 ක පහළ යෑමක් වාර්තා කළ අතර, කුකුළු මස් කිලෝග්‍රෑමයක් සඳහා නිෂ්පාදන පිරිවැය 2021 වසරේ දී වාර්තා වූ රු. 434.19 සිට 2022 වසරේ දී රු. 965.66ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. රජය විසින් බිත්තර සහ කුකුළු මස් සඳහා පාලන මිලක් නියම කළ ද, විශේෂයෙන් ම බිත්තර සැපයුමෙහි පැවති දැඩි හිඟය සහ එහි ප්‍රතිඵලයක් ලෙස තොග රැස්කිරීම හේතුවෙන් වසර පුරාම බිත්තර මිල ගණන් ඉහළ මට්ටමක පැවතුණි. තවද, 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, එළු මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,730ක් දක්වා සියයට 9.2කින් ඉහළ ගිය අතර, ඌරු මස් සහ හරක් මස් නිෂ්පාදනය, පිළිවෙළින්, මෙට්‍රික් ටොන් 9,300ක් සහ මෙට්‍රික් ටොන් 21,890ක් දක්වා සියයට 5.3කින් සහ සියයට 21.4කින් පහළ ගියේය.

පශු සම්පත් අංශය මුහුණ දෙන කාලීන අභියෝග පිළිබඳව නිසි අවධානය යොමු කරමින්, එම අංශයේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා 2022 වසර මුළුල්ලේ අඛණ්ඩ ප්‍රයත්නයන් දරන ලදී. පසුගිය වසර කිහිපය තුළ, ශ්‍රී ලංකාව බිත්තර හා කුකුළු මස් නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වූ බැවින් දේශීය පරිභෝජන අවශ්‍යතා බොහෝ දුරට දේශීය නිෂ්පාදනය හරහා සපුරා ගන්නා ලද අතර, එම කර්මාන්තය අපනයන වෙළඳපොළ සඳහා තරගකාරීත්වයක් සහිත ව්‍යාපාරයක් ලෙස ඉදිරියට යමින් පැවතුණි. කෙසේ වෙතත්, සත්ත්ව ආහාර ද්‍රව්‍ය හිඟවීම සහ නිෂ්පාදන මිල ගණන් ඉහළ යෑම තුළින් නිෂ්පාදනය සඳහා පවතින බාධාවන් තවදුරටත් උග්‍ර කර ඇති අතර, මෙමගින් සත්ත්ව ප්‍රෝටීනවල සැපයුම් හිඟයක් නිර්මාණය කර ඇත. මෙම තත්ත්වය රටේ ආහාර සුරක්ෂිතතාව කෙරෙහි අභියෝගයක් වී ඇත. මෙම තත්ත්වය තුළ, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමඟ එක්ව, රජය විසින් සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා බඩ ඉරිඟු සහ වෙනත් සුදුසු ධාන්‍ය ආනයනය කිරීමට ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබූ අතර, මෙමගින් විදේශ ගිණුම් මත ඇතිවන පීඩනය අවම කිරීම සඳහා දේශීය වශයෙන් සත්ත්ව ආහාර නිෂ්පාදන අංශය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන ලදී. තවද, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ දැනට සිටින ගව ගහනයේ ජානමය විභවයන් වැඩිදියුණු කිරීම තුළින් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා වූ පශු සම්පත් (කිරි) අභිජනන ව්‍යාපෘතිය, සායනික හා උප සායනික බුරුළු ප්‍රදාහය වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා වූ විස්තීර්ණ බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන ඇතුළු ව්‍යාපෘති කිහිපයක් සහ පාද හා මුඛ රෝග, රක්තපාත සෙප්ටිසිමියා, කාල ගාත්‍ර රෝගය සහ බෲසෙල්ලා රෝගවලට එරෙහිව ගොවිපළවල සතුන් සඳහා එන්නත්කරණ වැඩසටහන්

2.6 සංඛ්‍යා සටහන

මත්ස්‍ය නිෂ්පාදනය

මෙ.ටො.දහස්

උප අංශය	2021	2022 (අ)	වාර්ෂික වෙනස්වීම (%)	
			2020/21	2021/22 (අ)
මුහුදු මත්ස්‍ය	332	281	1.5	-15.4
වෙරළ හා කලපු ආශ්‍රිත	178	149	-2.4	-16.2
ගැඹුරු මුහුදු මත්ස්‍ය	153	131	6.3	-14.5
මිරිදිය මත්ස්‍ය	104	117	2.4	11.9
මිරිදිය ජලාශ	81	95	-4.3	17.5
ජලජීවී වගාව	9	8	-10.2	-15.7
ඉස්සන් වගාව	14	14	95.8	-2.3
එකතුව	**436**	**397**	**1.7**	**-8.9**

(අ) තාවකාලික

මූලාශ්‍ර: ධීවර අමාත්‍යාංශය

2

ක්‍රියාත්මක කරන ලදී. තවද, ඇමෙරිකා එක්සත් ජනපදයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍යාධාර ඇතිව, කිරි නිෂ්පාදකයින්ගේ කාර්යසාධනය සහ ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ප්‍රශස්ත ගොවිපළ පරිචයන් යොදාගැනීම අරමුණු කරගත්, වෙළඳපොළ ඉලක්කගත කිරි නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක විය.

ධීවර

ආර්ථික අර්බුදයක් සමග පැන නැගුණු අභියෝග මධ්‍යයේ, 2022 වසරේ දී ධීවර අංශයේ ක්‍රියාකාරිත්වය මන්දගාමී විය. ප්‍රධාන වශයෙන් රට තුළ පැවති ඉන්ධන හිඟයත් සමඟ විශේෂයෙන් ම මුහුදු මත්ස්‍ය කර්මාන්තයට අදාළව ධීවර කටයුතු සහ සැපයුම් දාමවල ඇති වූ අවහිරතා හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 397,230ක් දක්වා සියයට 8.9කින් පහළ ගියේය. ඒ අනුව, 2022 වසරේ දී, සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 71ක් පමණ වූ මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය, මෙට්‍රික් ටොන් 280,610ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 15.4කින් පහළ ගියේය. කෙසේ වෙතත්, 2021 වසරට සාපේක්ෂව, මිරිදිය මත්ස්‍ය අංශය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 11.9ක වර්ධනයක් මෙම වසර තුළ දී වාර්තා කළ අතර, ඒ සඳහා ජල මූලාශ්‍ර නිසි පරිදි කළමනාකරණය කිරීම සහ ජලාශවල මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය ඉහළ නැංවීම හේතු විය. ප්‍රවාහන හා සැපයුම් වියදම් ඉහළ යෑමෙහි ප්‍රතිඵලයක් ලෙස, 2022 වසරේ දී මත්ස්‍ය ප්‍රභේදවල සිල්ලර මිල ගණන් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, 2022 වසරේ අගෝස්තු සහ නොවැම්බර් මාසවල භූමිතෙල් මිල ගණන් ඉහළ දැමීමත් සමඟ වසරේ අග භාගය වන විට මත්ස්‍ය මිල ගණන් 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි. ධීවර අමාත්‍යාංශයට අනුව, ධීවර අංශයේ මන්දගාමී ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින්, මත්ස්‍ය අපනයන ප්‍රමාණයද, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.8කින් පහළ ගිය අතර, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී මත්ස්‍ය ආනයන ප්‍රමාණයද, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 25.7කින් පහළ ගියේය. බලශක්ති අර්බුදය මධ්‍යයේ, මෙම අංශය කම්පන ගණනාවකට මුහුණ දුන් අතර, ක්ෂේත්‍රය දැඩි ආර්ථික කම්පන වලින් ආරක්ෂා කරගැනීම සහ ධීවර කර්මාන්තයේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා දුෂ්කර කාලපරිච්ඡේදවල දී ධීවර අංශයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වයක් සහතික කිරීම සඳහා රජයට පියවර ගැනීමට සිදුවිය. ඒ අනුව, සීමිත ඉන්ධන තොග බෙදාහැරීම සඳහා ප්‍රමුඛතා පදනම මත ප්‍රධාන ධීවර කලාපවල පිරවුම්හල් හඳුනා ගනිමින්, සාමාන්‍ය කාර්යපටිපාටියෙන් තොරව ධීවර කටයුතු සඳහා ඉන්ධන සැපයීම සිදුකරන ලදී.

2.7 සංඛ්‍යා සටහන

ප්‍රධාන ආහාර ද්‍රව්‍යයන්ගේ සුලබතාවය

	අයිතමය	ඒකකය	2010			2021 (අ)			2022 (ආ)		
			නිෂ්පාදනය	ආනයන	ඒක පුද්ගල ආහාර සුලබතාවය (වසරකට කි.ග්‍රෑ.)	නිෂ්පාදනය	ආනයන	ඒක පුද්ගල ආහාර සුලබතාවය (වසරකට කි.ග්‍රෑ.)	නිෂ්පාදනය	ආනයන	ඒක පුද්ගල ආහාර සුලබතාවය (වසරකට කි.ග්‍රෑ.)
1.	සහල් (ඇ)	මෙ.ටො.දහස්	3,011	126	152	3,203	147	151	2,081	783	129
2.	ඉරිඟු	මෙ.ටො.දහස්	162	16	9	472	23	22	259	191	20
3.	තිරිඟු	මෙ.ටො.දහස්	-	1,051	51	-	1,319	60	-	817	37
4.	ලොකු එෑණු	මෙ.ටො.දහස්	59	158	10	66	257	15	18	264	13
5.	සීනි	මෙ.ටො.දහස්	31	548	28	81	582	30	79	460	24
6.	අර්තාපල්	මෙ.ටො.දහස්	52	130	9	76	117	9	48	154	9
7.	මාළු	මෙ.ටො.දහස්	385	14	19	436	10	20	397	4	18
8.	එළ කිරි	ලීටර් මිලියන	192	-	9 (ඈ)	425	-	19 (ඈ)	419	-	19 (ඈ)
9.	පොල් තෙල්	මෙ.ටො.දහස්	65	3	3	43	99	6	69	14	4

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) වී මෙට්‍රික් ටොන් 1ක්, සහල් මෙට්‍රික් ටොන් 0.68කට සමාන වේ.
(ඈ) වසරකට ලීටර්

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම - සෙවනගල ඒකකය
සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම - පැල්වත්ත ඒකකය
සීමාසහිත ගල්ඔය (හිඟුරාන) සීනි කර්මාන්තායතනය
සීමාසහිත ඇතිමලේ වැවිලි (පෞද්ගලික) සමාගම
ධීවර අමාත්‍යාංශය
පොල් සංවර්ධන අධිකාරිය

2022 වසර තුළ දී ද ධීවර කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු විය. ඒ අනුව, ධීවර අමාත්‍යාංශය විසින් ධීවර අංශය සංවර්ධන කිරීම ඉලක්ක කරගත් ව්‍යාපෘති කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර, තිරසාර ධීවර භාවිතයන් සහතික කිරීම සඳහා, නීති විරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ ධීවර කටයුතු වැළැක්වීමට කටයුතු කරන ලදී. 2022 වසරේ මාර්තු මාසය වන විට වෙල්ලමංකර ධීවර වරායේ ඉදිකිරීම් කටයුතු නිම කරන ලද අතර, ගන්දර ධීවර වරාය, බලපිටිය ධීවර වරාය සහ රැකව ධීවර වරාය ඇතුළු තවත් වරාය සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් 2022 වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. වෙරළබඩ ප්‍රදේශවල ස්වභාවික මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම සඳහා කලපු කිහිපයක් පිරිසිදු කිරීම හා ඒවායේ ගැඹුර වැඩි කිරීම ඉලක්ක කරගත් කලපු සංරක්ෂණ හා සංවර්ධන ව්‍යාපෘතියක් වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවති අතර, පසු අස්වනු හානි අවම කිරීම සඳහා ඊට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමටද පියවර ගන්නා ලදී. මේ අතර, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් මිරිදිය මත්ස්‍ය සහ ජලජීවී වගාව ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා අඛණ්ඩව කටයුතු කළ අතර, එය මත්ස්‍ය අපනයනය ඉහළ නැංවීමට සැලකිය යුතු ලෙස දායක විය. ජලාශ තුළ ගබඩා කිරීම සඳහා අවශ්‍ය මත්ස්‍ය බීජ සැපයුම ඉහළ නැංවීම සඳහා ප්‍රජා මූලික මත්ස්‍ය අභිජනන ඒකක තුනක් අම්පාර, ත්‍රිකුණාමලය සහ කිලිනොච්චිය යන ප්‍රදේශවල ස්ථාපිත කරන ලද අතර, එම ඒකක මගින් මිරිදිය ජලජීවී වගාව සඳහා මත්ස්‍ය පැටවුන් අඛණ්ඩව සැපයීමට අපේක්ෂා කෙරේ. මෙම වසර තුළ දී, මත්ස්‍ය පැටවුන් මුදාහැරීම සඳහා කුඩා පරිමාණයේ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක වැඩිදියුණු කිරීම මෙන්ම, මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් කැපී පෙනෙන ප්‍රගතියක් ලබා ඇත. ඉස්සන් වගා කිරීම දිවයිනේ වඩාත්ම ලාභදායී වාණිජ ජලජීවී වගා ක්‍රියාකාරකමක් වන බැවින්, විභවයක් සහිත සෑම ප්‍රදේශයකම ඉස්සන් වගාව ව්‍යාප්ත කිරීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඒ අනුව, කාර්යක්ෂම ජල ප්‍රතිචක්‍රීකරණ පද්ධතියක් හඳුන්වාදීම සහ ගොවිබිම්වල ජෛවීය ආරක්ෂාව වැඩිදියුණු කිරීම මගින් ඉස්සන් වගාකිරීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීමට පියවර ගෙන ඇති අතර, ඕලන්ද ඇළ ගැඹුරු කිරීම සහ පුත්තලම ප්‍රදේශයේ ඉස්සන් ගොවිපළ සඳහා දියුණු විදුලිබල සැපයුම් පද්ධතියක් ලබාදීමේ කටයුතු අඛණ්ඩව සිදු කෙරිණි. ඉස්සන් වගාවට අමතරව, වාණිජ ජලජීවී වගාව ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා මුහුදු පැලෑටි, මෝදා මසුන්, මුහුදු කැකිරි සහ කිරි මත්ස්‍ය වගාව සංවර්ධනය කිරීම ද සිදුකෙරිණි. ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් යාපනය, කිලිනොච්චිය, මන්නාරම සහ පුත්තලම යන මුහුදු ප්‍රදේශවල ප්‍රජා මූලික මුහුදු පැලෑටි වගාව සඳහා පහසුකම් සැපයීම සිදු කරන ලදී. කිලිනොච්චිය සහ යාපනය දිස්ත්‍රික්කවල මුහුදු කැකිරි අපනයන ගම්මාන ආශ්‍රිතව පොකුරු වශයෙන් මුහුදු කැකිරි අභිජනනාගාර ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළ අතර, මන්නාරම ප්‍රදේශයේ ජලජීවී වගා කලාපයක් පිහිටුවීමට සැලසුම් සකස්කර ඇත. ඉහළ වටිනාකමකින් යුත් විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම හරහා විදේශ විනිමය ඉපයීම් ඉහළ නැංවීමේ අරමුණින් යුතුව, නව විසිතුරු මත්ස්‍ය ප්‍රභේද සංවර්ධනය කිරීම, අභිජනනය සඳහා පැටවුන් තොග සැපයීම, රෝග විනිශ්චය පහසුකම්, පුහුණුව සහ තාක්ෂණික සහාය ඇතුළුව විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය අඛණ්ඩව ක්‍රියාමාර්ග ගනු ලැබීය. තවද, බංගදෙණියේ සමුද්‍ර විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් පිහිටුවීමට ද ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මගින් පියවර ගෙන ඇත.

කර්මාන්ත

බලශක්ති අර්බුදය, බැංකු පද්ධතිය තුළ විදේශ විනිමය ද්‍රවශීලතාවය පහත වැටීම හේතුවෙන් අත්‍යවශ්‍ය අමුද්‍රව්‍ය හිඟ වීම මෙන්ම ක්‍රය ශක්තිය පිරිහීමත් සමඟ ඉල්ලුම පහත වැටීම 2022 වසරේ වැඩි කාලයක් තුළ දී කර්මාන්ත ක්‍රියාකාරකම් කෙරෙහි බාධා පැමිණවීය. ආර්ථිකයේ ඇති වූ මෙම බාධාකාරී තත්ත්වයන් පාලනය කිරීමට ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල බලපෑමෙන් වසර අවසානය වන විට සැපයුම් අංශයේ අවහිරතා සහ අමුද්‍රව්‍ය මිලගණන්හි ඉහළ යෑම යම් පමණකින් සමනය වුවද, දේශීය සහ විදේශීය යන දෙඅංශයෙන්ම පැමිණි මෙම බහුවිධ අභියෝගයන්ගේ දැඩි බලපෑමට ලක් වූ කර්මාන්ත කටයුතු 2022 වසරේ දී, 2021 වසර තුළ වාර්තා කළ සියයට 5.7ක වර්ධනයට සාපේක්ෂව සියයට 16.0කින් පහත වැටුණි. නිෂ්පාදන කර්මාන්ත හා ඉදිකිරීමේ කටයුතුවල පසුබෑම කර්මාන්ත කටයුතුවල පහත වැටීම කෙරෙහි මූලිකවම හේතු වූ අතර, පතල් හා කැණීම් කටයුතු මෙන්ම විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායුසමීකරණ සැපයීමේ කටයුතු ද සැලකිය යුතු ලෙස පහත වැටීම, සමස්ත කර්මාන්ත කටයුතුවල පසුබෑම තීව්‍ර කරන ලදී. එසේ වුවද, සමස්ත කර්මාන්ත ක්‍රියාකාරකම් සඳහා යහපත් දායකත්වයක් ලබා දෙමින්, ජලය

2

2.6 රූප සටහන
2022 වසරේ කර්මාන්ත කටයුතුවල වර්ධන වේගයන් (අ)



(අ) ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ. (2015 පදනම් වර්ෂය)

මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදා හැරීමේ කටයුතු සහ මලාපවහන, කසළ කළමණාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ කටයුතු වසර තුළ දී වර්ධනය විය. කර්මාන්ත කටයුතුවල මෙම සමස්ත පසුබෑම පිළිබිඹු කරමින් ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයේ කර්මාන්ත කටයුතුවලට අදාළ නිෂ්පාදන සහ ඉල්ලුම යන උප දර්ශක වසර තුළ දී සමස්තයක් ලෙස පහත වැටුණි.

නිෂ්පාදන කර්මාන්ත

දේශීය වශයෙන් ඇතිවන කම්පනයන්ට සෑහෙන දුරට ඔරොත්තු දිය හැකි රෙදිපිළි, නිමි ඇඳුම් හා සම් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත කටයුතු හැර අනෙකුත් සියළුම නිෂ්පාදන කර්මාන්ත මෙම වසර තුළ දී පහත වැටීමක් වාර්තා කළ අතර, ඒ කෙරෙහි විදුලි කප්පාදුව, ඉන්ධන හා අත්‍යවශ්‍ය අමුද්‍රව්‍ය හිඟය, ප්‍රවාහන අවහිරතා සහ ඉල්ලුම පහත වැටීම ආදියෙහි අහිතකර බලපෑම් හේතු විය. ඒ අනුව, සමස්ත නිෂ්පාදන කර්මාන්තවල එකතු කළ අගය 2021 වසරේ දී වාර්තා කළ සියයට 7.4ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 12.6කින් පහත වැටුණි. මෙහිදී, නිෂ්පාදන කර්මාන්ත සඳහා විශාලතම දායකත්වය දක්වන ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදන අංශය 2022 වසරේ දී සියයට 14.2කින් සැලකිය යුතු ලෙස පහත වැටීම සමස්ත නිෂ්පාදන කර්මාන්ත කටයුතුවල දක්නට ලැබුණු සැලකිය යුතු පහත වැටීම කෙරෙහි හේතු විය. තවද, ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන සහ ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, නිෂ්පාදන කර්මාන්තවල එකතු කළ අගය පහත වැටීම කෙරෙහි දායක වූ අනෙකුත් ප්‍රධාන නිෂ්පාදන අංශ විය. නිෂ්පාදන කටයුතුවල මෙම පහත වැටීම පිළිබිඹු කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන කාර්මික නිෂ්පාදන දර්ශකය මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පාදනය කරනු ලබන නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය[5] ද වසර තුළ දී සමස්තයක් ලෙස පහත වැටීමක් වාර්තා කරන ලදී.

2.7 රූප සටහන
නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)



(අ) 0 සිට 100 දක්වා පරාසය තුළ විහිදෙන විසරණ දර්ශකයක් (Diffusion Index) වන මෙහි දර්ශක අගය එහි කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50ට වඩා වැඩි නම් අදාළ ක්‍රියාකාරකමෙහි වර්ධනයක් ද දර්ශක අගය 50ට වඩා අඩු නම් එහි පහත වැටීමක් ද පෙන්නුම් කෙරේ.

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

කාර්මික නිෂ්පාදන දර්ශකය

ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දුන් පෙර නොවූ ආකාරයේ ආර්ථික අර්බුදය මගින් පැන නැගුණු අහිතකර බලපෑම් රාශියක් හේතුවෙන්, නිෂ්පාදන කර්මාන්තවල අගය එකතු කිරීම 2022 වසරේ දී සෘණාත්මක වර්ධනයක් වාර්තා කළේය. මෙතෙක් වාර්තාගත දරුණුතම ආර්ථික අර්බුදය හමුවේ නිෂ්පාදන අංශය, අමුද්‍රව්‍ය හිඟය, ප්‍රවාහන ජාල බිඳවැටීම්, විදුලිය විසන්ධි කිරීම්, සහ යෙදවුම් මිල ඉහළ යෑම ඇතුළුව බහුවිධ අභියෝගවලට මුහුණ දුන් අතර, එමගින් වසර තුළ දී එම අංශයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි අහිතකර බලපෑම් එල්ල විය. ඉහළ යන උද්ධමනය සහ වැය කළ හැකි ආදායමේ මූර්ත වටිනාකම පහත වැටීම මධ්‍යයේ, නිෂ්පාදන අංශයේ ක්‍රියාකාරිත්වයට තවදුරටත් බලපෑම් ඇති කරමින්, සමස්ත වෙළඳපොළ ඉල්ලුම ද වසර තුළ දී පහළ ගියේය. කාර්මික නිෂ්පාදන දර්ශකය මගින් පිළිබිඹු වන පරිදි, සමස්ත කර්මාන්ත අංශයෙන් සියයට 59ක් පමණ වූ සමස්ත නිෂ්පාදන අංශය, වාර්ෂික

5 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව සලකා බලනු ලබන මාසය තුළ දී සිදු වූ වෙනස්කම් පිළිබඳව විමසීමට ලක් කරනු ලබන ප්‍රධාන ව්‍යාපාරික ආයතන සහභාගී වන සංජානන සමීක්ෂණයක් මත පදනම්ව ඇත.

2.8 රූප සටහන
කාර්මික නිෂ්පාදන දර්ශකය



මූලයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2.8 සංඛ්‍යා සටහන
කාර්මික නිෂ්පාදන දර්ශකය
(2015 = 100)

කාණ්ඩය	දර්ශකයෙහි බරතැබීම් (%)	2021 (අ)	2022 (ආ)	වාර්ෂික වෙනස්වීම % 2020/21 (අ)	2021/22 (ආ)
1. ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය	35.2	109.3	93.1	0.2	-14.8
2. බීම වර්ග නිෂ්පාදනය	3.8	106.0	127.5	9.8	20.3
3. දුම්කොළ ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදනය	1.7	77.9	83.2	8.0	6.8
4. රෙදි නිෂ්පාදනය	3.3	128.7	101.5	25.9	-21.1
5. ඇඟලුම් නිෂ්පාදනය	19.8	95.4	100.5	17.5	5.3
6. සම් සහ සම්බන්ධ ද්‍රව්‍ය නිෂ්පාදනය	0.3	78.6	87.4	1.3	11.2
7. ගෘහ භාණ්ඩ හැර, දැව හා ලීයෙන් කරන ලද නිෂ්පාදන, පිඳුරුවලින් හා ගොතන ලද ද්‍රව්‍ය නිෂ්පාදනය	0.2	82.5	81.0	15.0	-1.8
8. කඩදාසි සහ කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදනය	1.7	86.5	49.0	5.8	-43.4
9. මුද්‍රණය සහ පටිගත කරන ලද මාධ්‍ය නිෂ්පාදනය	1.4	117.9	112.1	4.8	-4.9
10. අඟුරු සහ පිරිපහදු කළ බනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදනය	7.4	71.1	30.0	-26.8	-57.8
11. රසායනික සහ රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය	4.1	89.8	98.6	-4.7	9.8
12. මූලික ඖෂධ සහ ඖෂධ හා සම්බන්ධ සැකසීම් නිෂ්පාදනය	0.1	117.9	102.5	12.6	-13.1
13. රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදනය	5.7	102.9	92.7	35.7	-9.9
14. වෙනත් ලෝහ නොවන බනිජමය ද්‍රව්‍ය නිෂ්පාදනය	7.8	137.4	113.5	23.0	-17.4
15. මූලික ලෝහ වර්ග නිෂ්පාදනය	2.4	133.6	88.1	20.7	-34.1
16. පිරිසකසන ලද ලෝහ නිෂ්පාදනය (යන්ත්‍රසූත්‍ර සහ උපකරණ හැර)	1.3	124.6	72.0	23.5	-42.2
17. විද්‍යුලි උපකරණ නිෂ්පාදනය	2.0	81.4	65.1	20.6	-20.0
18. යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනය (වෙනත් තැනක සඳහන් නොවන)	0.7	122.0	139.1	18.6	14.0
19. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය	0.8	77.5	63.3	0.7	-18.3
20. අනෙකුත් නිෂ්පාදන	0.3	69.6	69.6	6.0	-
කාර්මික නිෂ්පාදන දර්ශකය		**104.2**	**91.6**	**7.3**	**-12.1**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ලක්ෂ්‍යමය පදනම මත, පෙර වසරේ දී වාර්තා කරන ලද සියයට 7.3ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 12.1කින් පසුබෑමකට ලක් විය. කාර්මික නිෂ්පාදන දර්ශකයෙහි සමස්ත පහළ යෑමට ප්‍රධාන වශයෙන් දායක වෙමින්, ආහාර නිෂ්පාදන, රෙදිපිළි, අඟුරු සහ පිරිපහදු කළ බනිජතෙල් නිෂ්පාදන, වෙනත් ලෝහ නොවන බනිජමය නිෂ්පාදන, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන සහ මූලික ලෝහ නිෂ්පාදන යන උප අංශ 2022 වසර තුළ දී සැලකිය යුතු පහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, කාර්මික නිෂ්පාදන දර්ශකයෙන් සියයට 30කට පමණ දායක වූ ඇඟලුම්, රසායනික ද්‍රව්‍ය හා රසායනික නිෂ්පාදන, බීම වර්ග, දුම්කොළ ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදන, සම් නිෂ්පාදනය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, සහ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නිෂ්පාදන යන උප අංශ, කෙටි කාලීනව යම් පහළ යෑම් වාර්තා කළ ද, වසර තුළ දී සමස්තයක් ලෙස වර්ධනයක් වාර්තා කළේය.

2022 වසර තුළ දී ආහාර නිෂ්පාදන කටයුතු සැලකිය යුතු පසුබෑමක් වාර්තා කළ අතර, බීම වර්ග නිෂ්පාදන කටයුතු දෙවන වසර සඳහාත් අඛණ්ඩව ශක්තිමත් වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, කාර්මික නිෂ්පාදන දර්ශකයෙන් තුනෙන් එකකට වඩා වැඩි ප්‍රමාණයකට දායක වන ආහාර ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශය, 2021 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වාර්තා කරන ලද සියයට 0.2ක සුළු වර්ධනයෙන් පසුව, 2022 වසරේ දී සියයට 14.8ක පහළ යෑමක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන්, ආර්ථික අර්බුදය සමග සැපයුම් දාමයන්ට සහ බෙදාහැරීම් ජාලයන්ට ඇති වූ බාධාවන්, අමුද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍යවල පිරිවැය ඉහළ යෑම මෙන්ම, ආනයන සීමා කිරීම් හේතුවෙන් ආහාර ද්‍රව්‍ය කිහිපයක අමුද්‍රව්‍ය සැපයුම සීමා වීම සමඟ සහල්, ටින් මාළු, කිරි පිටි, තිරිඟු පිටි, පාන් සහ තේ නිෂ්පාදනය පහත වැටීම ආහාර නිෂ්පාදන උප අංශයේ දුර්වල කාර්යසාධනයට

2

2.9 රූප සටහන
ධාරිතා උපයෝජනය



සටහන: කාණ්ඩවලට අදාළ බර තැබීම් වරහන් තුළ දක්වා ඇත.

මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

හේතුවිය. කෙසේ වෙතත්, අරක්කු, බියර් සහ සිසිල් බීම නිෂ්පාදනයන්ගේ වර්ධනය හේතුවෙන්, කාර්මික නිෂ්පාදන දර්ශකයෙහි අනෙකුත් සියලුම උප අංශ අතුරින්, බීම වර්ග නිෂ්පාදනයේ කාර්යසාධනය වසර තුළ දී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, 2021 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 9.8ක වර්ධනයක් වාර්තා කළ බීම වර්ග නිෂ්පාදන කටයුතු, 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 20.3ක වර්ධනයක් වාර්තා කර ඇත. 2022 වසරේ දී බීම වර්ග නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සමස්තයක් ලෙස ධනාත්මක කාර්යසාධනයක් වාර්තා කළ ද, වසරේ සිව්වන කාර්තුවේ දී එම අංශයේ ක්‍රියාකාරිත්වයේ සුළු මන්දගාමී වීමක් පෙන්නුම් කළේය.

ගෝලීය සැපයුම් දාමයන් යථා තත්ත්වයට පත් වීම ප්‍රධාන වශයෙන් මූලික කරගෙන, කාර්මික නිෂ්පාදන දර්ශකයෙහි දෙවන විශාලතම උප අංශය වන ඇඟලුම් නිෂ්පාදනය 2022 වසරේ දී යථා තත්ත්වයට පත්වීමක් වාර්තා කරන කළ අතර, රෙදිපිළි උප අංශයේ කාර්යසාධනය පහළ ගියේය. ඒ අනුව, 2021 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වාර්තා කරන ලද සියයට 17.5ක සැලකිය යුතු වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී ඇඟලුම් උප අංශයේ නිෂ්පාදනය සියයට 5.3ක වර්ධනයක් වාර්තා කළේය. ආනයන සීමා කිරීම්, සැපයුම් ක්‍රියාවලියෙහි ඇති වූ ගැටලු සහ විදුලිය විසන්ධි කිරීම් මගින් ඇඟලුම් ක්ෂේත්‍රය මත ඇති වූ අහිතකර බලපෑම්, රජය විසින් ක්‍රියාත්මක කරන ලද විවිධ ප්‍රතිපත්තිමය තීරණ මගින් බොහෝ දුරට සමනය විය. සලකා බලන ලද කාල පරිච්ඡේදය තුළ දී, අපනයනකරුවන්ට ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් සෘජුවම එ.ජ. ඩොලර් භාවිතා කර ඉන්ධන මිලදී ගැනීමට අවසර ලබා දීම සහ අමුද්‍රව්‍ය රැසක් ආනයනය සඳහා තීරුබදු සහන ලබා දීම වැනි තීරණ එයට ඇතුළත් විය. මීට අමතරව, විනිමය අනුපාතිකය අවප්‍රමාණයවීම සහ කොවිඩ්-19 වසංගතයෙන් පසුව, විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්තයන් ඇතුළුව ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම, ඇඟලුම් උප අංශයේ අපනයන ආදායම කෙරෙහි හිතකර බලපෑමක් ඇති කළේය. කෙසේ වෙතත්, වසංගතයෙන් පසුව වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 25.9ක වර්ධනයක් සමඟ 2021 වසරේ දී ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළ රෙදිපිළි නිෂ්පාදන ක්‍රියාකාරකම්, නිමි රෙදිපිළි, රෙදිපිළි මුද්‍රණ කටයුතු සහ කොහු කෙඳි නිෂ්පාදනය පහත වැටීම හේතුවෙන් 2022 වසරේ දී, සියයට 21.1 කින් පමණ සැලකිය යුතු ලෙස පහළ ගියේය.

වෙනත් ලෝහ නොවන බනිජමය නිෂ්පාදන, මූලික ලෝහ නිෂ්පාදන සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන යන උප අංශ 2022 වසරේ දී සැලකිය යුතු ලෙස පහළ යෑම් වාර්තා කළේය. ඒ අනුව, 2021 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 20කට වඩා වැඩි වර්ධනයක් වාර්තා කළ වෙනත් ලෝහ නොවන බනිජමය නිෂ්පාදන, මූලික ලෝහ නිෂ්පාදන සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන උප අංශවල කාර්ය සාධනය, 2022 වසර තුළ දී පිළිවෙළින්, සියයට 17.4කින්, සියයට 34.1කින් සහ සියයට 42.2කින් පහළ ගියේය. රජය විසින් අරමුදල් සපයන ලද ව්‍යාපෘති අත්හිටුවීම, ඉහළ යන අමුද්‍රව්‍ය පිරිවැය සහ ආනයන සීමා කිරීම් හේතුවෙන් දේශීය ඉදිකිරීම් අංශය විවිධ ගැටලුවලට මුහුණ දීමත් සමඟ එම අංශයෙන් වන ඉල්ලුම අඩු වීම, මෙම උප අංශවල නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. ඉදිකිරීම් අංශයෙන් වන ඉල්ලුම දුර්වල වීම පිළිබිඹු කරමින්, සිමෙන්ති, සෙවිලි තහඩු, පිඟන් ගඩොල් සහ සෙවිලි උළු නිෂ්පාදනය 2022 වසරේ දී සැලකිය යුතු පහළ යෑමක් වාර්තා කර ඇති අතර, එමගින් වෙනත් ලෝහ නොවන බනිජමය ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශයේ ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපෑම් ඇති විය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ මූලික යකඩ සහ වානේ, ඊයම් හා වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනවල පහළ යෑම, මූලික ලෝහ නිෂ්පාදන සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන උප අංශවල සමස්ත පහළ යෑම සඳහා විශාල වශයෙන් හේතු විය.

කාර්මික නිෂ්පාදන දර්ශකයේ සියයට 7කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා දායක වන අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය උප අංශයේ නිෂ්පාදනය, 2022 වසරේ දී අඛණ්ඩව තෙවැනි වසර සඳහාත් පසුබෑමක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2016 වසරේ සිට වාර්තා වූ විශාලතම වාර්ෂික පසුබෑම වාර්තා කරමින්, අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 57.8කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. දේශීය වෙළඳපොළ තුළ පැවති විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ බොරතෙල් ආනයනය කිරීම සීමා කිරීම හේතුවෙන් 2022 වසර තුළ දී ඛනිජ තෙල් පිරිපහදුව දිගු කාලයක් පුරා වසා දැමීම, මෙම පසුබෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, සුදු ඩීසල්, පෙට්‍රල් සහ දැව් තෙල් ඇතුළු පිරිපහදු කළ පෙට්‍රෝලියම් නිෂ්පාදන 2022 වසරේ දී පහළ ගියේය. කෙසේ වෙතත්, අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය උප අංශයේ නිෂ්පාදනය වසරේ පෙබරවාරි, ජූනි, අගෝස්තු, සැප්තැම්බර් සහ දෙසැම්බර් යන මාසවල දී මාසික පදනමින් ඉහළ යෑම් වාර්තා කළේය.

සම් නිෂ්පාදනය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන උප අංශය සහ රසායනික ද්‍රව්‍ය හා රසායනික නිෂ්පාදන උප අංශය 2022 වසර තුළ දී වර්ධනයක් වාර්තා කළේය. සම් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන උප අංශය 2021 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වාර්තා කළ සියයට 1.3ක් වූ සුළු ඉහළ යෑමට සාපේක්ෂව, නිමි සම්, ස්වභාවික සම් ජැකට් සහ සපත්තු, නිෂ්පාදනයන්හි වර්ධනය හේතුවෙන් 2022 වසර තුළ දී සියයට 11.2කින් වර්ධනය විය. මේ අතර, රසායනික ද්‍රව්‍ය සහ රසායනික නිෂ්පාදන උප අංශය ද වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 9.8ක සමස්ත වර්ධනයක් වාර්තා කළේය. මෙම වර්ධනයට දායක වෙමින් ආස්තරණ මලු සහ සේදුම්කාරක නිෂ්පාදනය වසර තුළ දී, සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන උප අංශය සහ මූලික ඖෂධ නිෂ්පාදන හා ඖෂධ සම්බන්ධ ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශවල නිෂ්පාදනය 2022 වසර තුළ දී පහළ යෑම් වාර්තා කළේය. 2021 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 35.7ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදනය, 2022 වසරේ දී සියයට 9.9කින් පහළ ගියේය. දේශීය හා ගෝලීය වශයෙන් කොවිඩ්-19 රෝගීන්ගේ පහළ යෑම හේතුවෙන් වෛද්‍ය රබර් අත්වැසුම්වලට පැවති ඉල්ලුම අඩු වීම, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන උප අංශයේ පසුබෑම සඳහා මූලික වශයෙන් හේතු විය. මීට අමතරව, ටයර්, සිපර (Zippers) සහ රබර් පීට් නිෂ්පාදනවල දේශීය නිෂ්පාදනය අඩු වීම ද මෙම පසුබෑම සඳහා බලපෑවේය. මේ අතර, වසංගත තත්ත්වය හේතුවෙන් ඖෂධ සහ අනෙකුත් සෞඛ්‍ය ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඇති වූ ඉල්ලුමත් සමඟ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කළ මූලික ඖෂධ නිෂ්පාදන හා ඖෂධ නිෂ්පාදන උප අංශය 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 13.1ක පහළ යෑමක් වාර්තා කළේය.

2022 වසරේ දී, කාර්මික නිෂ්පාදන දර්ශකයේ අනෙකුත් උප අංශයන් වන, දැව නිෂ්පාදන (ගෘහ භාණ්ඩ හැර), විදුලි උපකරණ, ගෘහ භාණ්ඩ, කඩදාසි හා කඩදාසි නිෂ්පාදන සහ මුද්‍රණ හා පටිගතකළ මාධ්‍ය නිෂ්පාදනය ආදී අංශයන්හි ක්‍රියාකාරිත්වයෙහි පසුබෑමක් දක්නට ලැබුණු අතර, දුම්කොළ නිෂ්පාදන සහ යන්ත්‍රෝපකරණ හා උපකරණ නිෂ්පාදන යන උප අංශවල වර්ධනයන් වාර්තා විය. රැලි සහිත කඩදාසි, කඩදාසි බෑග් සහ අභ්‍යාස පොත් නිෂ්පාදනය අඩුවීම හේතුවෙන් කඩදාසි හා කඩදාසි නිෂ්පාදන උප අංශය 2022 වසරේ දී මන්දගාමී කාර්යසාධනයක් පෙන්නුම් කළේය. ඒ අනුව, කඩදාසි හා කඩදාසි නිෂ්පාදන උප අංශය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම යටතේ 2022 වසරේ දී සියයට 43.4ක සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළේය. සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළ ප්‍රධාන වශයෙන් දක්නට ලැබුණු සැපයුම් හිඟය මෙන්ම, මුදල් නෝට්ටු සහ පුවත්පත් මුද්‍රණය පහළ යෑම හේතුවෙන් මුද්‍රණ හා පටිගතකළ මාධ්‍ය නිෂ්පාදන උප අංශයේ ක්‍රියාකාරිත්වය පෙර වසරට සාපේක්ෂව වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 4.9ක අඩුවීමක් පෙන්නුම් කළේය. විදුලි පැනල් පුවරු සහ දඟර උපාංග

2.10 රූප සටහන
2022 වසරේදී කාර්මික නිෂ්පාදන දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස්වීමට ප්‍රධාන කාණ්ඩවල දායකත්වය



සටහන: කාණ්ඩවලට අදාළ බරතැබීම් වරහන් තුළ දක්වා ඇත.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2

සඳහා ඇති ඉල්ලුම අඩුවීම හේතුවෙන්, විදුලි උපකරණ නිෂ්පාදන අංශයේ සමස්ත කාර්යසාධනය 2022 වසරේ දී දුර්වල විය. කෙසේ වුවද, යන්ත්‍රෝපකරණ හා උපකරණ නිෂ්පාදන උප අංශය පෙර වසරේ වාර්තා කළ සියයට 18.6ක වර්ධනයට සාපේක්ෂව 2022 වසර තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 14.0ක වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, ප්‍රධාන වශයෙන් සිගරට් නිෂ්පාදනය ඉහළ යෑමත් සමඟ, දුම්කොළ නිෂ්පාදන අඛණ්ඩව දෙවන වසරටත් ඉහළ යෑමක් වාර්තා කරමින්, 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.8කින් වර්ධනය විය.

කාර්මික ප්‍රතිපත්ති සහ ආයතනික සහාය

වසංගතයෙන් මෙන්ම ඉන් අනතුරුව ඇති වූ ආර්ථික අර්බුදයෙන් වූ බලපෑමෙන් යථා තත්ත්වයට පත්වීම සඳහා කර්මාන්ත අංශයට සහාය සපයමින්, ප්‍රතිපත්තිමය පියවර ගණනාවක් ක්‍රියාවට නැංවීම හරහා කර්මාන්ත අංශයේ වර්ධනයට සහ සංවර්ධනයට අඛණ්ඩව සහයෝගය ලබා දීමට 2022 වසර තුළ දී, රජය විසින් කටයුතු කරන ලදී. කර්මාන්ත අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවෙහි කර්මාන්ත අංශය සංවර්ධනය සඳහා විස්තීර්ණ සහ සමස්ත පැතිකඩ ආවරණය කෙරෙන ප්‍රතිපත්තිමය රාමුවක් ඇතිකිරීම උදෙසා 2023 - 2048 කාල සීමාව සඳහා 'කාර්මික සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය' (National Policy for Industrial Development - NaPID) සකස් කරන ලදී. තව ද, 'කාර්මික සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය' තුළින් ගෝලීය වශයෙන් තරගකාරීවන සහ සැමට ප්‍රතිලාභ හිමිවන දේශීය කාර්මික අංශයක් ඇති කිරීම අරමුණු කරයි. 'කාර්මික සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තයෙහි' සඳහන් කාර්යයන් බලගැන්වීම සඳහා ක්‍රියාත්මක කිරීමේ රාමුවක්, අධීක්ෂණය සහ ඇගයීම සඳහා වන යාන්ත්‍රණ සහ කාල පරාසයන් අතර සමාලෝචන සිදුකිරීමේ ක්‍රමවේදයන් ඇතුළත් උපාය මාර්ගික ක්‍රියාකාරී සැලසුම් වසර 5 බැගින් වූ කාල පරාසයන් සඳහා සකස් කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, කාර්මික සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය සහ 2023-2027 කාලපරිච්ඡේදය සඳහා උපාය මාර්ගික ක්‍රියාකාරී සැලසුම, 2023 වසරේ පෙබරවාරි මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. මේ අතර, 2012 වසරේ දී නවතා දැමුණු ඇඹිලිපිටිය කඩදාසි කම්හලේ නිෂ්පාදනය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් ලෙස නැවත ආරම්භ කිරීම සඳහා 2023 වසරේ පෙබරවාරි මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය දෙන ලදී. ඇමරිකානු ඩොලර් මිලියන 16ක ආයෝජනයක් මගින් මෙම ව්‍යාපෘතියෙහි පළමු අදියරේ සංවර්ධන කටයුතු සිදු කෙරෙන අතර, මෙමගින් යන්ත්‍රෝපකරණ සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හරහා ඍජු හා වක්‍ර අපනයන වෙළඳපොළ සඳහා කාර්මික ශ්‍රේණියේ කඩදාසි නිෂ්පාදනය කිරීම ඉලක්ක කර ඇත. 2024 වසර වන විට මෙම කර්මාන්තශාලාව නිම කිරීමට අපේක්ෂා කරන අතර, වාර්ෂිකව කඩදාසි මෙට්‍රික් ටොන් 74,000ක් පමණ නිෂ්පාදනය කිරීමට එමගින් අපේක්ෂා කරයි. වසර තුළ දී කුරුංචෙතිව් ලුණු ලේවායෙහි නිෂ්පාදන කටයුතු රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමය යටතේ නැවත ආරම්භ කිරීමට අදාළ කටයුතුද සිදු විය. මෙම ව්‍යාපෘතිය අවසන් වීමත් සමඟ මෙම ලුණු ලේවාය මගින් වාර්ෂිකව මෙට්‍රික් ටොන් 30,000ක පමණ ලුණු නිෂ්පාදනයක් සිදුකිරීමට අපේක්ෂා කෙරේ. තවද, මෝටර් රථ නිෂ්පාදනයට අදාළව, එකලස් කිරීම සහ අමතර කොටස් නිෂ්පාදන කර්මාන්තය සඳහා වන සම්මත මෙහෙයුම් පටිපාටි මාර්ගෝපදේශ යටතේ දේශීය වශයෙන් මෝටර් රථ එකලස් කිරීම අඛණ්ඩව පුළුල් විය. 2022 වසර අවසානය වන විට සම්මත මෙහෙයුම් පටිපාටි යටතේ නිෂ්පාදන සමාගම් 20ක් ලියාපදිංචි කර ඇති අතර, වසර තුළ දී වාහන 10,490ක් එකලස් කර ඇත. මේ අතර, ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය, ජාත්‍යන්තර හවුල්කරුවෙකු සමඟ සහයෝගීව, 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ ප්‍රථම ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය ස්ථාපිත කිරීම සඳහා පියවර රැසක් ක්‍රියාවට නැංවීය. රට තුළ ජෛව තාක්ෂණ නවෝත්පාදනයන් සඳහා වන සුවිශේෂී සන්ධිස්ථානයක් ලෙස කටයුතු කරමින්, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ආයෝජන ආකර්ෂණය කරගැනීමටත්, එමඟින් ශ්‍රී ලංකාවෙහි අධි තාක්ෂණික අපනයන ඉහළ නැංවීමටත් මෙම ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය මගින් අපේක්ෂා කෙරේ. මේ අතර, ආසියානු සංවර්ධන බැංකුවෙහි සහාය ඇතිව ස්ථාපිත කරන ලද 'කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර සම්බන්ධක වේදිකාව' 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ දියත් කරන ලදී. මෙම වේදිකාව මගින් දැනුම, හැකියාවන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අතර ජාලකරණය සඳහා ප්‍රවේශය ලබාදීමට අපේක්ෂා කරන අතර, කාන්තාවන්ගේ මූල්‍ය සාක්ෂරතාවය සහ ව්‍යාපාර කළමනාකරණ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා කාන්තාවන් විසින් මෙහෙයවන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කෙරෙහි මෙමගින් විශේෂ අවධානයක් යොමු කරයි. තවද, කලාපය තුළ ව්‍යාත්තීය පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා 'නිපුණතා

උදාන' වැඩසටහන වයඹ පළාත තුළ ආරම්භ කර ක්‍රියාවට නැංවීය. මේ අතර, මාතර දිස්ත්‍රික්කයෙහි ජර්මානු කාර්මික විද්‍යාලයක් ස්ථාපිත කිරීමට අදාළ පියවර රැසක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. කෙසේ වෙතත්, 2022 අංක 03 දරණ ජාතික අයවැය චක්‍රලේඛයට අනුව රාජ්‍ය වියදම් සීමා කිරීම හේතුවෙන් 2022 වසරේ අප්‍රේල් මාසයේ සිට කාර්මික අංශයෙහි ප්‍රවර්ධන සහ සංවර්ධන කටයුතු තරමක් දුරට සීමා විය.

අපනයන සංවර්ධන මණ්ඩලය සහ ආයෝජන මණ්ඩලය විසින් අපනයන ඉලක්කගත දේශීය නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමෙහි සක්‍රීයව නියැලුණු අතර, විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා පියවර කිහිපයක් ආරම්භ කරන ලදී. 2022 වසර සඳහා වන අතුරු අයවැය මගින් යෝජනා කළ පරිදි, ජාත්‍යන්තර වෙළඳපොළට සරිලන පරිදි දේශීය ඇසුරුම් ද්‍රව්‍ය හා මෝස්තර ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම අරමුණු කරගත් 'ජාතික ඇසුරුම් මධ්‍යස්ථානයෙහි' කටයුතු නැවත සක්‍රීය කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය පියවර ගත්තේය. තවද, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඇඟලුම්, මැණික්, ස්වර්ණාභරණ, විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝනික නිෂ්පාදන, රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන, සහ බෝට්ටු හා බෝට්ටු තැනීම ඇතුළු ආර්ථිකයේ හඳුනාගත් අපනයන අංශ කිහිපයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික අපනයන සන්නාමයක් සහ 2022-2026 කාලපරිච්ඡේදය සඳහා ප්‍රවර්ධන සැලැස්මක් ද සංවර්ධනය කරන ලදී. එසේම, 2021 වසරේ දී අපනයන සංවර්ධන මණ්ඩලය යටතේ ප්‍රධාන අපනයන ක්ෂේත්‍ර 24ක් ආවරණය වන පරිදි පත් කරන ලද අපනයන උපදේශක කමිටු මගින් අපනයන ක්ෂේත්‍රවල ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීමට අවශ්‍ය තේමාත්මක ප්‍රමුඛතා හඳුනාගැනීම සඳහා රැස්වීම් මාලාවක් වසර තුළ පවත්වන ලදී. එමෙන්ම, වසර තුළ දී අපනයන ඉලක්ක කරගත් ව්‍යාපාර ප්‍රවර්ධන කිරීම ඉලක්ක කරමින් වෙළඳ ප්‍රදර්ශන, වෙළඳපොළ සබඳතා නිර්මාණය කර ගැනීමේ වැඩසටහන්, දැනුම්වත් කිරීමේ සැසි, සහ ශක්‍යතා සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී. මේ අතර, ආයෝජන මණ්ඩලය විසින් සමාගම්, පර්යේෂණ ආයතන හා නව ව්‍යාපාර ආයතන සඳහා සහාය වීමට සහ ඔවුන්ගේ ඉදිරි ව්‍යාපාර යෝජනා හෝ නවෝත්පාදන සඳහා සුදුසු හවුල් කරුවන් සොයා ගැනීමට පහසුකම් සැලසීම සඳහා දේශීය හා ජාත්‍යන්තර ව්‍යවසායයන් සම්බන්ධීකරණය කෙරෙන පොදු වේදිකාවක් ලෙස නව ව්‍යාපාර හවුල්කාරිත්ව පිළිබඳ දත්ත පද්ධතියක් ස්ථාපිත කරන ලදී. තවද, ආයෝජකයන් හට ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව වැඩිදියුණු කෙරෙන පරිදි, ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම තුළින් ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් සහ කඩිනම් කිරීම සඳහා 'ආයෝජකයින් වෙත පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයක්' ස්ථාපිත කරන ලදී.

අනෙකුත් රාජ්‍ය නියෝජිත ආයතන දේශීය කර්මාන්ත අංශයට පහසුකම් සැලසීම සඳහා පියවර රැසක් ක්‍රියාත්මක කළේය. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් දේශීය සම්පත් භාවිතා කරන ව්‍යාපාර සඳහා පිළිගැනීමක් ලබාදෙන 'Made in Sri Lanka' ලාංඡනය ප්‍රචලිත කිරීමට අදාළ සිය ප්‍රයත්නයන් අඛණ්ඩව ක්‍රියාවට නැංවීය. මේ සඳහා, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් දිස්ත්‍රික් මට්ටමේ සහ ක්ෂුද්‍ර මට්ටමේ වෙළඳ ප්‍රදර්ශන පවත්වන ලද අතර, ප්‍රථම 'Made in Sri Lanka' බලයලත් වෙළඳසැල මාතලේ දිස්ත්‍රික්කයේ විවෘත කරන ලදී. 2022 වසරේ දී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් එහි 'ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන' හරහා ව්‍යවසායක පුහුණු වැඩසටහන් 1,292ක් පවත්වන ලද අතර, ව්‍යාපාර 957ක් සහ ව්‍යාපාර පුළුල් කිරීම් 1,573ක් නිර්මාණය කිරීමට සහාය දෙන ලදී. එමෙන්ම, ආහාර විජලනය, මී පැණි, දිවුල් සහ අනෙකුත් සෘතුමය නිෂ්පාදන, කොස්, පන් සහ තල් වර්ග යන ක්ෂේත්‍රවල කර්මාන්ත පොකුරු කිහිපයක් සඳහා සංවර්ධන වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී. මේ අතර, 2022 වසරේ පෙබරවාරි මාසයේ දී කර්මාන්ත සංවර්ධන මණ්ඩලය විසින් දේශීය කර්මාන්තකරුවන් සඳහා නව වෙළඳපොළ සහ ආයෝජන අවස්ථා නිර්මාණය කිරීමට අවශ්‍ය සහාය සැපයීම සඳහා 'කර්මාන්ත 2022' ජාතික කාර්මික ප්‍රදර්ශනය, කර්මාන්ත 20ක සහභාගීත්වයෙන් යුතුව පවත්වන ලදී. තවද, රටේ කාර්මික සහ ව්‍යවසාය වර්ධනය ඉහළ නැංවීමේ අරමුණින් කර්මාන්ත සංවර්ධන මණ්ඩලය යටතේ 'Getup Startup for a Wealthy Nation' වැඩසටහන ආරම්භ කරන ලදී. පාසල් සිසුන් සඳහා 'ව්‍යවසායක සමාජ' ඇරඹීම, ව්‍යවසායකයින් මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා 'ව්‍යාපාරික සායන' සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් වෙත ආයෝජන යොමු කිරීම සඳහා අන්තර්ජාලය පදනම් කරගත් 'ආයෝජක සංචිත' වැඩසටහන ඇතුළුව ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග මෙම වැඩසටහන තුළින් ආවරණය කරන ලදී. තවද, මෙම වැඩසටහන යටතේ කර්මාන්තකරුවන් සහ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය අතර සමීප සම්බන්ධතාවක් ඇති කිරීම සඳහා වේදිකාවක් නිර්මාණය කරමින් කර්මාන්ත සංවර්ධන

2

මණ්ඩලයේ ජංගම දුරකථන යෙදුම සහ හදිසි ප්‍රතිචාර අංකයක් ද හඳුන්වා දෙන ලදී. මේ අතර, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය දිවයින පුරා සිටින කුඩා පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම අරමුණු කරගත් ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කළේය.

කර්මාන්ත මණ්ඩල විසින් පුහුණු සහ ප්‍රවර්ධන කටයුතු හරහා දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සහාය සැලසීම අඛණ්ඩව සිදුකරන ලදී. මේ අතර, වසර තුළ දී, වෙළඳ හා ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළඳ නියෝජිත කණ්ඩායම්, ජාලකරණ වැඩසටහන්, ජාත්‍යන්තර අන්තර්ජාල සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංසඳ සඳහා ලංකා වාණිජ මණ්ඩලය විසින් අඛණ්ඩව පහසුකම් සලසන ලදී. තවද, 'දේශසීමා හරහා වෙළඳාම සඳහා ව්‍යාපාරික ඉඟි' (Business tips for Trading Across Borders) යන තේමාව යටතේ අපනයන අභිමුඛ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ වෙළඳ දැනුම ඉහළ නැංවීම සඳහා ලංකා වාණිජ මණ්ඩලය, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය සමඟ එක්ව කටයුතු කළේය. ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් දිවයින පුරා පුහුණු වැඩසටහන් මාලාවන් සංවිධානය කරමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය දැනුම්වත් කිරීමට සහ සවිබල ගැන්වීමට කැපවී ක්‍රියා කරන ලදී. එමෙන් ම, ජාතික වාණිජ මණ්ඩලය විසින් වෙළඳ අවස්ථා වැඩිදියුණු කිරීම සහ කාන්තා ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින්, කලාපීය කර්මාන්ත මණ්ඩල, රාජ්‍ය ආයතන, සහ ජාත්‍යන්තර ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් වලට එළඹෙන ලදී.

තාක්ෂණික දියුණුව ප්‍රවර්ධනය කිරීම සඳහා වූ රජයේ ප්‍රයත්න වසර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක විය. රජයේ මෙම ප්‍රයත්නය සඳහා පහසුකම් සපයමින්, ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් දේශීය නිෂ්පාදන කර්මාන්ත සඳහා තාක්ෂණ සහ පර්යේෂණ භාවිතයන් යොදා ගැනීමට පහසුකම් සැලසීම සඳහා තාක්ෂණ හුවමාරු ප්‍රතිපත්තියක් සකස් කරන ලදී. තවද, ජාතික මූලික අධ්‍යයන ආයතනය පෞද්ගලික අංශයේ සමාගමක් සමඟ එක්ව, කාර්මික අරමුණු සඳහා ඇල්ගී භාවිතා කරමින් ජෛව ඩීසල් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලියක නිරත වූ අතර, කෘෂිකාර්මික සංවර්ධන පියවරවලට සමගාමීව කුඹුරු අක්කර 280,000කට 'Biofilm' ජීව පොහොර හඳුන්වා දීම ද සිදුකර ඇත. මේ අතර, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය විසින් බලශක්ති, දියුණුකළ ද්‍රව්‍ය, බනිජ, රෙදිපිළි අමුද්‍රව්‍ය සහ නිෂ්පාදන ක්‍රියාවලි ඇතුළු ප්‍රධාන අංශවල පර්යේෂණ කටයුතු ද සිදු කරන ලදී. තවද, ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ වාණිජකරණයට අදාළව පවතින දුර්වලතා හඳුනාගැනීම පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින්, නවෝත්පාදන මත පදනම් වූ කාර්මික සංවර්ධනය දිරිගැන්වීම සඳහා ජාතික නවෝත්පාදන නියෝජිතයතනය වසර මුළුල්ලේ විවිධ ක්‍රියාකාරකම් සඳහා සක්‍රීයව සහභාගී විය. නව නිෂ්පාදන සංවර්ධන ක්‍රියාවලි සඳහා 2022 වසර තුළ දී පහසුකම් සලසන අතර ම, ජාතික විද්‍යා පදනම විසින් ශිෂ්‍යත්ව කිහිපයක් ලබාදීම සහ පර්යේෂණවල නියැළෙන්නන් සඳහා අවශ්‍ය පර්යේෂණ ආධාර ලබා දීමට ද අඛණ්ඩව පියවර ගන්නා ලදී.

කාර්මික අංශයේ අඛණ්ඩ පැවැත්ම සහතික කරන අතර ම, ආර්ථික අර්බුදය ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා රජය විසින් කර්මාන්ත අංශයට නොකඩවා පහසුකම් සලසන ලදී. ඉන්ධන හිඟය උග්‍ර ලෙස දක්නට ලැබුණු කාල සීමාවල දී, කාර්මික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමට පහසුකම් සලසමින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් කළමනාකරණය කෙරෙන ඩිපෝ මගින් කර්මාන්තශාලා සඳහා අවශ්‍ය ඉන්ධන සැපයීමට කර්මාන්ත අමාත්‍යාංශය විසින් නිර්දේශ ලිපි නිකුත් කිරීමට පියවර ගන්නා ලදී. තවද, දේශීය නිෂ්පාදකයින්ට සිය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමේ හැකියාව සහතික කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීමට හැකිවන පරිදි ඉන්දියානු ණය වැඩසටහන යටතේ විදේශ විනිමය ද්‍රවශීලතා පහසුකම් සපයන ලදී. මේ අතර, පෙර නොවූ විරූ සාර්ව ආර්ථික අර්බුදය සහ කොවිඩ්-19 වසංගතය මගින් ඇති කළ අහිතකර ප්‍රතිඵල සැලකිල්ලට ගනිමින්, එක් එක් සිද්ධිය පදනම් කරගෙන, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ඇතුළු සියලුම ආර්ථික අංශවල බලපෑමට ලක් වූ ණයගැතියන් සඳහා 2022 වසරේ ජූලි මාසයේ සිට මාස හයක කාලයක් සඳහා යෝග්‍ය පරිදි ණය සහන ලබාදෙන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවලින් ඉල්ලීම් කර ඇත. තවද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම සඳහා, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමයේ නොගෙවූ මුදලෙන් එ.ජ. ඩොලර් මිලියන 13.5ක පමණ මුදලක්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් හදිසි ප්‍රතිචාර අවශ්‍යතා සඳහා නැවත වෙන් කරන ලදී. මෙහි මූලික පරමාර්ථය වූයේ කෘෂිකර්මාන්තය, සංචාරක කර්මාන්තය සහ අනෙකුත් අපනයන ආශ්‍රිත අංශවල නියැළී සිටින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සාමාන්‍ය බරිත තැන්පතු

අනුපාතිකයට එකතු කළ සාධාරණ ආන්තිකයක් මත තීරණය වන පොලී අනුපාතිකයට යෝග්‍ය පරිදි කාරක ප්‍රාග්ධන ණය ලබා දීමයි. තවද, අමුද්‍රව්‍ය මිල ඉහළ යෑම හේතුවෙන් ඇඟලුම් නිෂ්පාදකයින් මුහුණ දෙන අභියෝග සැලකිල්ලට ගනිමින් දේශීයව නිෂ්පාදනය නොකරන, අවශ්‍ය උපාංග සහ භාණ්ඩ ආනයනය කිරීම මත තීරු බදු සහන ලබාදීමට 2022 වසරේ අගෝස්තු මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

ඉදිකිරීම් සහ පතල් හා කැණීම්

සැපයුම් සහ ඉල්ලුම් යන දෙඅංශයෙන්ම පැවති අවහිරතාවන්ගේ බලපෑමට ලක් වූ ඉදිකිරීම් කටයුතුවල එකතු කළ අගය, 2021 වසරේ වාර්තා කළ සියයට 4.4ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 20.9කින් පහත වැටුණි. මෙහිදී, අමුද්‍රව්‍ය සහ ඉන්ධන හිඟය මෙන්ම ශීඝ්‍රයෙන් ඉහළ ගිය යෙදවුම් පිරිවැය, සැපයුම්කරුවන් විසින් භාණ්ඩ ණයට ලබා දීම සීමා කිරීම සහ රජයේ අරමුදලින් සිදු කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වූ ගෙවීම් සැලකිය යුතු ලෙස ප්‍රමාද වීම සැපයුම් අංශයේ ඇති වූ ප්‍රධාන අවහිරතා විය. රජයේ අරමුදල් භාවිතයෙන් සිදු කරන ව්‍යාපෘති අත්හිටුවීම මෙන්ම ඉහළ පොලී අනුපාතික හේතුවෙන් පෞද්ගලික ආයෝජන සීමා වීමත් සමඟ ඇති වූ ඉල්ලුම් අංශයේ අවහිරතා මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර වීමට හේතු විය. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ මෙම පසුබෑම එම අංශයේ දර්ශක තුළින් ද පිළිබිඹු වේ. ඒ අනුව, 2021 වසරේ දී සියයට 0.8ක සුළු පහත වැටීමක් වාර්තා කළ රටේ සමස්ත සිමෙන්ති උපයෝජ්‍යතාවය 2022 වසරේ දී සියයට 35.9කින් සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, 2021 වසරේ දී සියයට 4.7කින් වර්ධනය වූ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය ද 2022 වසරේ දී සියයට 35.8කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් පෞද්ගලික නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ලබා දෙන ණය ප්‍රමාණය ද 2022 වසරේ දෙසැම්බර් මස අවසාන වන විට පහත වැටීමක් වාර්තා කරන ලදී. මේ අතර, වැලි කැණීම් වැනි ඉදිකිරීම් කටයුතු සඳහා අමුද්‍රව්‍ය සපයන කැණීම් කටයුතුවලින් මූලිකව සමන්විත වන පතල් හා කැණීම් කටයුතු ද 2021 වසරේ දී වාර්තා කළ සියයට 1.4ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 31.0කින් පහත වැටුණි. තවද, මැණික් කැණීමේ කටයුතුවල පහත වැටීම පිළිබිඹු කරමින් 2022 වසරේ දී මැණික් අපනයන පරිමාව ද සියයට 8.9ක අඩු වීමක් වාර්තා කරන ලදී.

විදුලිය, ජලය සහ අපද්‍රව්‍ය කළමනාකරණය

විදුලිය, ජලය සහ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතුවල එකතු කළ අගය 2021 වසරේ දී වාර්තා කළ සියයට 2.2ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 4.3කින් අඩු වූ අතර, ඒ සඳහා, මූලිකවම විදුලිය සහ ගෑස් සැපයීම ආශ්‍රිත කටයුතුවල පහත වැටීම හේතු විය. ඒ අනුව, වසර තුළ දී සැපයුම් අංශයේ දැඩි අවහිරතාවන්ට සහ මිල ඉහළ දැමීම් වලට ලක් වූ විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීමේ කටයුතු 2021 වසරේ වාර්තා කළ සියයට 4.9ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 5.9කින් අඩු විය. මේ අතර, 2021 වසරේ දී පිළිවෙලින් සියයට 17.8කින් සහ සියයට 3.3කින් පහත වැටුණු ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම හා බෙදා හැරීමේ කටයුතු සහ මලාපවහන, කසළ කළමණාකරණය හා එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ කටයුතු 2022 වසරේ දී පිළිවෙලින් සියයට 0.6කින් හා සියයට 3.9කින් වර්ධනය විය.

සේවා

බලශක්ති අර්බුදය, භාණ්ඩ හිඟය සහ ඉහළ උද්ධමනය හේතුවෙන් සේවා කටයුතුවල එකතු කළ අගය 2021 වසරේදී වාර්තා කළ සියයට 3.5ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේදී සියයට 2.0කින් පහත වැටුණි. මෙම පහත වැටීම කෙරෙහි මූලික වශයෙන් දේපළ වෙළඳාම, රක්ෂණය, මූල්‍ය සේවා, සෞඛ්‍යය සහ ව්‍යාත්තීයමය සේවාවන්හි දක්නට ලැබුණු පසුබෑම දායක විය. තවද, තොරතුරු තාක්ෂණය, ගුවන් විදුලි හා රූපවාහිනී විකාශන සේවා මෙන්ම තොග හා සිල්ලර වෙළඳ කටයුතු ද පහත වැටීමක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, කොවිඩ්-19 වසංගතයේ බලපෑම ක්‍රමයෙන් පහව යෑමත් සමඟ සංචාරක කටයුතු ඉහළ

2.11 රූප සටහන
2022 වසරේ සේවා කටයුතුවල වර්ධන වේගයන් (අ)



(අ) ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ. (2015 පදනම් වර්ෂය)

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2

2.12 රූප සටහන
සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)



(අ) 0 සිට 100 දක්වා පරාසය තුළ විහිදෙන විසරණ දර්ශකයක් (Diffusion Index) වන මෙහි දර්ශක අගය එහි කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50ට වඩා වැඩි නම් අදාල ක්‍රියාකාරකමෙහි වර්ධනයක් ද දර්ශක අගය 50ට වඩා අඩු නම් එහි පහත වැටීමක් ද පෙන්නුම් කෙරේ.

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

යෑම හේතුවෙන් නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා වසර තුළදී සැලකියයුතු ලෙස වර්ධනය වූ අතර, ප්‍රවාහනය, විදුලි සංදේශ සේවා, අධ්‍යාපනය, රාජ්‍ය පරිපාලනය, වෙනත් පෞද්ගලික සේවා සහ තැපැල් හා කුරියර් සේවා ද යහපත් වර්ධනයන් වාර්තා කරන ලදී. සේවා අංශයේ සමස්ත පසුබැස්ම, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මාසිකව සම්පාදනය කරනු ලබන සේවා අංශයේ ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය මෙන්ම ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයේ සේවා කටයුතුවලට අදාල ඉල්ලුම් සහ විකුණුම් උප දර්ශක ද වසර තුළ දී සමස්තයක් වශයෙන් පහත වැටීම තුළින් පිළිබිඹු විය.

තොග සහ සිල්ලර වෙළඳාම

සැපයුම් අංශයේ අවහිරතා මෙන්ම ඉල්ලුම පහළ යෑම හේතුවෙන් 2022 වසරේ දී තොග සහ සිල්ලර වෙළඳ කටයුතුවල එකතු කළ අගය, 2021 වසරේ දී වාර්තා කළ සියයට 1.5ක වර්ධනයට සාපේක්ෂව සියයට 0.2කින් පහත වැටුණි. ඒ අනුව, 2021/22 මහ කන්නයේ අස්වැන්න අඩු වීම, ආනයන සීමා කිරීම නිසා පාරිභෝගික භාණ්ඩ ද ඇතුළුව භාණ්ඩ ආනයනය පහත වැටීම සහ බනිජතෙල් සැපයුමට බාධා ඇති වීම ආදිය හේතුවෙන් ඇති වූ සැපයුම් අංශයේ අවහිරතා වසර තුළ වෙළඳ කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. තවද, විශේෂයෙන්ම වසරේ දෙවන භාගය වන විට පැවති ඉහළ උද්ධමනකාරී තත්ත්වය හේතුවෙන් පාරිභෝගිකයන්ගේ ක්‍රය ශක්තිය හීන වීම, බදු වැඩි කිරීම, විදුලිය හා ජල සම්පාදනය වැනි මහජන උපයෝගීතා සේවාවල ගාස්තු ඉහළ නැංවීම මෙන්ම ඉහළ පොලී අනුපාතික නිසා ණය ලබා ගැනීම අධෛර්යමත් වීම වැනි ප්‍රවණතා හේතුවෙන් ඇති වූ ඉල්ලුම පහළ යෑම තොග සහ සිල්ලර වෙළඳ කටයුතු තවදුරටත් පහත වැටීමට හේතු විය.

ප්‍රවාහනය සහ ගබඩා පහසුකම්

කොවිඩ්-19 වසංගතය ක්‍රමයෙන් පහව යෑමත් සමඟම මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා සහ ගබඩා පහසුකම් සැපයීමේ කටයුතුවල එකතුකළ අගය 2021 වසරේදී වාර්තා කළ සියයට 0.9ක සුළු වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 3.5ක වර්ධනයක් වාර්තා කරන ලදී. ප්‍රවාහන කටයුතු පිළිබඳ දර්ශක සැලකීමේ දී, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, පෞද්ගලික බස් ධාවකයන් සහ ශ්‍රී ලංකා දුම්රිය සේවය මගින් මෙහෙයවන ලද මගී කිලෝමීටර් සංඛ්‍යාව 2022 වසරේ දී සැලකියයුතු ලෙස ඉහළ යන ලදී. මේ කෙරෙහි ඉන්ධන පිරිවැය සැලකිය යුතු ලෙස වැඩි වීම නිසා පොදු ප්‍රවාහන සේවා සඳහා ඉල්ලුම ඉහළ යෑම මෙන්ම පොදු ප්‍රවාහන කටයුතු සඳහා ප්‍රමුඛතා පදනම යටතේ ඉන්ධන ලබා දීම ද හේතු විය. තවද, සංචාරක කටයුතු යථාවත් වීමත් සමඟම ගුවන් ප්‍රවාහන කටයුතුවල සිදුවූ ක්‍රමික වර්ධනය පිළිබිඹු කරමින් වසර තුළ දී ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් මෙහෙයවන ලද මගී කිලෝමීටර් ප්‍රමාණයේ ඉහළ යෑමක් වාර්තා විය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර වෙළඳ කටයුතුවල දක්නට ලැබුණු මන්දගාමීත්වය හේතුවෙන් ශ්‍රී ලංකා වරායයන් මගින් හසුරුවනු ලැබූ බහාලුම් (අඩි 20ට සමාන බහාලුම් ඒකක වලින්) හා නැව් බඩු ප්‍රමාණය වසර තුළ දී පහත වැටුණි.

නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මෙන්ම ඉන් අනතුරුව කොවිඩ්-19 වසංගතයේ බලපෑම හේතුවෙන් ද පහත වැටී තිබූ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා කටයුතු 2021 වසරේ දී වාර්තා කළ සියයට 1.7ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 27.0ක ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. බලශක්ති සැපයුම් හිඟය මෙන්ම සමාජයීය වශයෙන් පැන නැගුණු අසහනකාරී තත්ත්ව යටතේ ඇති වූ බාධා හමුවේ වුවද, පසුගිය වසරට සාපේක්ෂව සංචාරක පැමිණීම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම මේ සඳහා බෙහෙවින් දායක විය. මෙම ඉන්ධන හිඟය ඇතුළු දැඩි අපහසුතා පැවති කාලයේ දී

ප්‍රවාහන පහසුකම් ද ඇතුළත් විශේෂිත සංචාරක පැකේජ ලබා දීම වැනි ක්‍රමවේද තුළින් සංචාරකයන් ආකර්ශනය කර ගැනීමට බොහෝ හෝටල් කටයුතු කරන ලදී. තවද, පසුගිය වසරේදී ශ්‍රී ලංකා රුපියල ප්‍රධාන විදේශ මුදල් ඒකකයන්ට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම ද විදේශීය සංචාරකයින්ට මෙරට වඩා ආකර්ශනීය ගමනාන්තයක් වීමට හේතු විය. කෙසේ වුවද, ඇතැම් ජාත්‍යන්තර මාධ්‍ය තුළින් මෙරට ආර්ථික අර්බුදය අතිශයෝක්තියෙන් යුතුව වාර්තා කිරීම මගින් රට පිළිබඳව ඇති කරන ලද අයහපත් ප්‍රතිරූපය මෙන්ම සමහර රටවල් විසින් නිකුත් කරන ලද අවවාදාත්මක සංචාරක මාර්ගෝපදේශ ද වසර තුළදී සංචාරක කර්මාන්තය විසින් අත්කරගත හැකිව තිබූ වර්ධනයට බාධා ඇති කරන ලදී. තවද, සීමාසහිතව ඉන්ධන නිකුත් කිරීම දේශීය සංචාරකයන්ගේ දිගු දුර සංචාර කටයුතු පහළ යෑමට හේතු විය.

මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය හා දේපළ වෙළඳාම

සමස්තයක් වශයෙන් මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය ද ඇතුලත් දේපළ වෙළඳාම් කටයුතුවල එකතු කළ අගය 2021 වසරේ දී වාර්තා කළ සියයට 7.5ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේදී සියයට 15.4කින් පහත වැටුණි. රටේ පැවති ඉහළ පොලී අනුපාතික හේතුවෙන් ණය සඳහා වූ ඉල්ලුම අඩු වූ අතර, උද්ධමනය ඉහළ මට්ටමක පැවතීම මෙම සේවාවල මූර්ත එකතුකළ අගය පහත වැටීම කෙරෙහි හේතු විය. එසේම, ශ්‍රී ලංකා මහ බැංකුව කාර්තුමය වශයෙන් පවත්වනු ලබන ණය සැපයුම පිළිබඳ සමීක්ෂණයේ දී අනාවරණය වූ පරිදි ඉහළ උද්ධමනය සහ දුර්වල ආර්ථික තත්ත්වය හේතුවෙන් ගණුදෙනුකරුවන්ගේ ණය පියවීමේ හැකියාව පහත වැටීම බැංකු විසින් ණය ලබා දීම සීමා කිරීමට හේතු වී ඇත. ඒ අනුව, මූල්‍ය හා මූල්‍ය අතරමැදිකරණ සේවා 2021 වසරේ දී වාර්තා කළ සියයට 7.0ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 11.0කින් පහත වැටුණු අතර, නිවාස අයිතිය ද ඇතුළු දේපළ වෙළඳාම් කටයුතු 2021 වසරේ දී වාර්තා කළ සියයට 4.4ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 12.1කින් පහත වැටී ඇත. තවද, 2021 වසරේ දී සියයට 26.4ක වර්ධනයක් වාර්තා කළ රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණ කටයුතු ද එහි විශ්‍රාම අරමුදල් කළමනාකරණ කටයුතුවල සිදුවූ පසුබැස්ම හේතුවෙන් 2022 වසරේ දී සියයට 47.2කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි.

තොරතුරු සහ සන්නිවේදනය

කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟම ඇති වූ ඉල්ලුම හේතුවෙන් පසුගිය වසරවල ඉතා ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ තොරතුරු සහ සන්නිවේදන සේවාවල එකතු කළ අගය 2021 වසරේ දී වාර්තා කළ සියයට 21.0ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ වසංගත තත්ත්වය පහව යෑමත් සමඟ මෙම සේවා සඳහා වූ ඉල්ලුම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම හා දේශීය මෙන්ම විදේශීය වශයෙන් ද ආර්ථික කටයුතු මන්දගාමී වීමත් සමඟ සියයට 0.3කින් පහත වැටුණි. තවද, විදුලිය හා ඉන්ධන සැපයුමට සිදු වූ බාධා සහ අවශ්‍ය තාක්ෂණික උපකරණ හිඟ වීම ද තොරතුරු සහ සන්නිවේදන සේවාවල වර්ධනයට බාධා පමුණුවන ලදී. මෙහිදී, මෙම කාණ්ඩය සඳහා ප්‍රධාන දායකත්වය දක්වනු ලබන පරිගණක වැඩසටහන් සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා කටයුතු 2021 වසරේ දී වාර්තා කළ සියයට 25.2ක වර්ධනයට සාපේක්ෂව, විදුලි කප්පාදුව වැනි දේශීය වශයෙන් වූ සැපයුම් අංශයේ ගැටළු සහ ගෝලීය ඉල්ලුම මන්දගාමී වීම ද හේතුවෙන් 2022 වසරේ දී සියයට 2.3කින් පහත වැටුණි. මේ අතර, 2021 වසරේ දී සියයට 14.2කින් වර්ධනය වූ විදුලි සංදේශ සේවා, ඉහළ උද්ධමනය නිසා ක්‍රය ශක්තිය පහළ යෑම මෙන්ම විදුලි සංදේශ සේවා මත පැනවූ බදු ඉහළ නැංවීම හේතුවෙන් ඉල්ලුම අඩු වීම තුළ 2022 වසරේ දී සියයට 3.1ක අඩු වේගයකින් වර්ධනය විය.

අනෙකුත් සේවා කටයුතු

රටෙහි පැවති අයහපත් ආර්ථික වාතාවරණය හේතුවෙන් අනෙකුත් සේවා කටයුතු බොහොමයක එකතු කළ අගය 2022 වසරේ දී පහත වැටුණි. ප්‍රධාන වශයෙන් වසරේ පළමු භාගයේ පැවති සැපයුම් හිඟය ද වසරේ අවසාන භාගය වන විට ඉල්ලුමේ පහත වැටීමද මේ සඳහා හේතු විය. ඒ අනුව, පැවති අයහපත් ව්‍යාපාරික වාතාවරණය පිළිබිඹු කරමින් වෘත්තීයමය සේවා සහ ගුවන් විදුලි-රූපවාහිනී විකාශන හා එම නිෂ්පාදන කටයුතු පිළිවෙලින් සියයට 4.0ක් සහ සියයට 11.0ක් බැගින් 2022 වසරේ දී පහත වැටුණි. තවද, කොවිඩ්-19 වසංගතයේ දැඩි බලපෑමට ලක්ව තිබූ වසරවල දී ඉහළ වර්ධනයක් වාර්තා කළ සෞඛ්‍ය සේවා කටයුතු ද 2022 වසරේ දී සියයට 8.4කින් පහත වැටුණි. කෙසේ වුවද, අධ්‍යාපනය, රාජ්‍ය පරිපාලනය හා ජාතික ආරක්ෂාව, වෙනත් පෞද්ගලික සේවා සහ තැපැල් හා කුරියර් සේවා 2022 වසරේ දී ආර්ථික වර්ධනයට යහපත් දායකත්වයක් දක්වන ලදී.

2

2.5. වියදම

පරිභෝජන සහ ආයෝජන වියදමෙන් සමන්විත වන දළ දේශීය වියදම (ද.දේ.වි.), පවත්නා මිල අනුව 2021 වසරේ දී වාර්තා කළ සියයට 13.6ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 32.3ක ඉහළ අගයකින් වර්ධනය වූ අතර, ඒ සඳහා වසර තුළ පැවති ඉහළ මිල මට්ටම් බොහෝ දුරට හේතු විය. ද.දේ.වි.හි අන්තර්ගත පරිභෝජන වියදම 2021 වසරේ දී වාර්තා කළ සියයට 8.4ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 34.3කින් වර්ධනය වූ අතර, ආයෝජන වියදම ද පෙර වසරේ දී වාර්තා කළ සියයට 25.1ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 28.4කින් වර්ධනය විය. විදේශීය අංශය සැලකූ විට, පවත්නා මිල අනුව ශුද්ධ විදේශීය ඉල්ලුම පෙර වසරේ දී වාර්තා කළ සියයට 34.7ක පහත වැටීමට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 34.1කින් වර්ධනය විය. මේ කෙරෙහි භාණ්ඩ හා සේවා ආනයන වාර්තා කළ සියයට 41.2ක වර්ධනය අභිබවා භාණ්ඩ හා සේවා අපනයනයේ වාර්තා කළ සියයට 74.1ක සැලකිය යුතු වර්ධනය හේතු විය. මෙසේ ආනයන සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය වීම කෙරෙහි ආනයන සීමා කිරීම සහ විදේශ විනිමය හිඟය නිසා ආනයන පරිමා පහත වැටීම බලපෑ අතර, ශ්‍රී ලංකා රුපියල ප්‍රධාන විදේශ මුදල් ඒකකයන්ට සාපේක්ෂව තියුණු ලෙස අවප්‍රමාණය වීම අපනයන සඳහා වාසිදායක තත්ත්වයක් ඇති කරන ලදී. ඒ අනුව, ද.දේ.වි. සහ ශුද්ධ විදේශීය ඉල්ලුමෙන් සැදුම්ලත් ද.දේ.නි., පවත්නා මිල අනුව 2021 වසරේ දී වාර්තා කළ සියයට 12.3ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 37.2ක වර්ධනයක් වාර්තා කරන ලදී.

ස්ථාවර මිල අනුව ද.දේ.වි. වසර තුළ දී සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්, ක්‍රය ශක්තිය අඩු වීම, ඉහළ පොළී අනුපාතික හේතුවෙන් ආයෝජනය මෙන්ම පරිභෝජනය ද අධෛර්යමත් වීම සහ භාණ්ඩ හිඟය හේතු විය. ඒ අනුව, 2021 වසරේ දී සියයට 2.7කින් වර්ධනය වූ ද.ජා.වි. 2022 වසරේ දී පරිභෝජන සහ ආයෝජන යන වියදම් ද්විත්වයම පිළිවෙලින් සියයට 7.5කින් සහ සියයට 24.9කින් පහත වැටීම හේතුවෙන් සියයට 13.2කින් පහත වැටුණි. මේ අතර, අපනයන පරිමාව වර්ධනය වීමේ සහ ආනයන පරිමාව පහත වැටීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස, ස්ථාවර මිල අනුව ශුද්ධ විදේශීය ඉල්ලුම 2022 වසරේ දී යහපත් අතට පරිවර්තනය වෙමින් සියයට 101.1කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ඒ අනුව, ස්ථාවර මිල අනුව ද.දේ.නි. 2021 වසරේ දී වාර්තා කළ සියයට 3.5ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 7.8ක පහත වැටීමක් වාර්තා කරන ලදී.

2.9 සංඛ්‍යා සටහන
සමස්ත ඉල්ලුම (අ)

රුපියල් මිලියන

අයිතමය	පවත්නා වෙළඳපොළ මිල අනුව			2015 ස්ථාවර මිල අනුව		
	2020 (අා)	2021 (අා)(අෑ)	2022 (අෑ)	2020 (අා)	2021 (අා)(අෑ)	2022 (අෑ)
1. දේශීය ඉල්ලුම						
පරිභෝජනය	11,469,129	12,434,283	16,700,557	9,127,604	9,293,726	8,596,156
(%) වෙනස)	0.6	8.4	34.3	-4.9	1.8	-7.5
දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය	5,168,381	6,466,957	8,304,627	4,349,587	4,544,089	3,412,566
(%) වෙනස)	-4.8	25.1	28.4	-0.6	4.5	-24.9
මුළු දේශීය ඉල්ලුම	**16,637,510**	**18,901,240**	**25,005,184**	**13,477,191**	**13,837,815**	**12,008,722**
(%) වෙනස)	**-1.1**	**13.6**	**32.3**	**-3.6**	**2.7**	**-13.2**
2. විදේශීය ඉල්ලුම						
භාණ්ඩ සහ සේවා අපනයන	2,418,542	2,980,263	5,187,941	1,961,341	2,159,760	2,380,539
(%) වෙනස)	-30.3	23.2	74.1	-29.6	10.1	10.2
භාණ්ඩ සහ සේවා ආනයන	3,384,516	4,281,313	6,045,399	2,842,981	2,959,641	2,371,412
(%) වෙනස)	-22.9	26.5	41.2	-20.1	4.1	-19.9
ශුද්ධ විදේශීය ඉල්ලුම	**-965,975**	**-1,301,049**	**-857,458**	**-881,640**	**-799,881**	**9,127**
(%) වෙනස)	**-5.1**	**-34.7**	**34.1**	**-14.1**	**9.3**	**101.1**
3. මුළු ඉල්ලුම	**15,671,535**	**17,600,191**	**24,147,726**	**12,595,550**	**13,037,934**	**12,017,849**
(%) වෙනස)	**-1.5**	**12.3**	**37.2**	**-4.6**	**3.5**	**-7.8**

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(අා) සංශෝධිත
(අෑ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

පරිභෝජනය

ආර්ථිකයේ විශාලතම වියදම් කාණ්ඩය වන පරිභෝජන වියදම පවත්නා මිල අනුව 2021 වසරේ වාර්තා කළ සියයට 8.4ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 34.3කින් වර්ධනය වූ අතර, මේ කෙරෙහි ප්‍රධාන වශයෙන් පාරිභෝගික භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හේතු විය. මෙහිදී, පරිභෝජන වියදමෙහි ප්‍රධානතම වියදම් කාණ්ඩය වන පෞද්ගලික පරිභෝජන වියදම 2022 වසර තුළදී සමස්ත පරිභෝජන වියදමෙන් සියයට 89.7ක් නියෝජනය කරමින් ඉහළ වේගයකින් වර්ධනය විය. මේ අතර, සමස්ත පරිභෝජන වියදමෙහි අන්තර්ගත රජයේ පරිභෝජන වියදම ද පෙර වසරට වඩා වැඩි වේගයකින් වර්ධනය විය.

පාරිභෝගිකයන්ගේ ක්‍රය ශක්තිය පිරිහීම සහ සැපයුම් හිඟය හේතුවෙන් පෞද්ගලික පරිභෝජන වියදම මූර්ත වශයෙන් පහත වැටීමක් සිදු වුවද, 2022 වසරේ පැවති ඉහළ මිල මට්ටම් හේතුවෙන් පවත්නා මිල අනුව 2021 වසරේ දී වාර්තා කළ සියයට 9.4ක වර්ධනයට සාපේක්ෂව සියයට 39.0කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මෙම වර්ධනය කෙරෙහි, පිළිවෙලින් සියයට 25.9කින් සහ සියයට 69.8කින් වර්ධනය වූ ආහාර හා මධ්‍යසාර නොවන පානීය ද්‍රව්‍ය සහ ප්‍රවාහනය යන ප්‍රධාන පෞද්ගලික පරිභෝජන වියදම් කාණ්ඩයන් මූලික වශයෙන් දායක විය. පවත්නා මිල අනුව, පෞද්ගලික පාරිභෝජන වියදමෙහි දක්නට ලැබුණු ඉහළ වර්ධනය සඳහා ගෝලීය වශයෙන් භාණ්ඩ මිල ඉහළ යෑම සහ දේශීය මුදල් ඒකකය අවප්‍රමාණය වීම නිසා 2022 වසරේ දී ආනයනික පාරිභෝගික භාණ්ඩවල මිල මට්ටම් වැඩිවීම සැලකිය යුතු ලෙස දායක විය. තවද, බලශක්ති මිල ගණන් ඉහළ නැංවීමත් සමඟ විශේෂයෙන් ප්‍රවාහනය, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් බලශක්ති ආශ්‍රිත ගෘහස්ථ පෞද්ගලික පරිභෝජන වියදම් ඉහළ ගිය අතර, එම වැඩි වීම අනෙකුත් බොහෝ පෞද්ගලික පරිභෝජන වියදම් කාණ්ඩයන් වෙත ව්‍යාප්ත විය.

රජයේ පුද්ගල පරිභෝජන වියදම හා සමූහ පරිභෝජන වියදමෙන් සමන්විත වන රජයේ සමස්ත පරිභෝජන වියදම, පවත්නා වෙළඳපොළ මිල අනුව 2021 වසරේ වාර්තා කළ සියයට 2.3ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 3.8ක වේගයකින් වර්ධනය විය. ඒ අනුව, මෙහි ප්‍රධානතම වියදම් කාණ්ඩය වන සෞඛ්‍ය, අධ්‍යාපනය, සමාජ ආරක්ෂණය සහ ක්‍රීඩා, විනෝදාංශ හා සංස්කෘතික කටයුතු ආදිය සඳහා වන රජයේ පුද්ගල පරිභෝජන වියදම 2021 වසරේ වාර්තා කළ සියයට 1.0ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 5.6කින් වර්ධනය විය. තවද,

2.10 සංඛ්‍යා සටහන

පවත්නා වෙළඳපොළ මිල අනුව පෞද්ගලික පරිභෝජන වියදමේ සංයුතිය (අ)

කාණ්ඩය		මුළු පෞද්ගලික පරිභෝජන වියදමට දායකත්වය (%)			වර්ධනය (%)	
		2020 (ආ)	2021 (ආ)(ඇ)	2022 (ඇ)	2021 (ආ)(ඇ)	2022 (ඇ)
1.	ආහාරපාන සහ මද්‍යසාර නොවන පානීය ද්‍රව්‍ය	31.4	33.4	30.2	16.2	25.9
2.	මද්‍යසාර, දුම්කොළ නිෂ්පාදන සහ වෙනත් මත්ද්‍රව්‍ය	1.9	1.7	1.4	0.5	10.8
3.	ඇඳුම්-පැළඳුම් සහ පාවහන්	7.4	4.2	5.1	-38.0	70.7
4.	නිවාස කුලී, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් බලශක්ති භාවිතයන්	10.3	10.2	8.1	8.6	10.8
5.	ගෘහභාණ්ඩ, ගෘහ උපකරණ සහ දෛනික නිවාස අලුත්වැඩියාවන්	1.6	1.8	1.5	26.4	18.3
6.	සෞඛ්‍යය	2.7	3.7	3.1	48.4	16.9
7.	ප්‍රවාහනය	21.3	21.2	25.9	9.0	69.8
8.	සන්නිවේදනය	1.0	1.1	0.8	15.5	-0.3
9.	ක්‍රීඩා, විනෝදාංශ සහ සංස්කෘතික කටයුතු	3.2	3.2	3.0	9.1	31.1
10.	අධ්‍යාපනය	1.7	1.6	1.5	5.6	26.6
11.	හෝටල් සහ ආපනශාලා පහසුකම්	2.8	3.4	5.1	30.6	109.0
12.	වෙනත් තැනක සඳහන් නොවන විවිධ භාණ්ඩ හා සේවා ලබාගැනීම	15.1	15.0	15.9	8.7	47.4
13.	ශ්‍රී ලාංකිකයින් එතෙරදී කරන වියදම්	1.0	0.5	0.7	-38.6	68.8
14.	අඩු කළා: විදේශිකයින් මෙතෙරදී කරන වියදම්	1.3	1.0	2.3	-18.2	225.7
	මුළු පෞද්ගලික පරිභෝජන වියදම	**100.0**	**100.0**	**100.0**	**9.4**	**39.0**

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2

සාමාන්‍ය රජයේ සේවා, ආරක්ෂාව, නීතිය හා සාමය වැනි සමස්තයක් ලෙස ප්‍රජාවටම ප්‍රතිලාභ සලසන කටයුතු සඳහා වන පරිභෝජන වියදම්වලින් සමන්විත වන රජයේ සමූහ පරිභෝජන වියදම 2021 වසරේ දී වාර්තා කළ සියයට 3.9ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 1.7කින් වර්ධනය විය.

ආයෝජන

ස්ථාවර මිල අනුව ආයෝජන වියදමෙහි සැලකිය යුතු පසුබෑමක් පැවතිය ද භාණ්ඩවල මිල මට්ටම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් පවත්නා මිල අනුව ආයෝජන වියදම 2021 වසරේ දී වාර්තා කළ සියයට 25.1ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 28.4කින් වර්ධනය විය. විදේශ විනිමය හිඟය ද ශ්‍රී ලංකා රුපියල ශීඝ්‍ර ලෙස අවප්‍රමාණය වීම ද නිසා ආයෝජන භාණ්ඩ උග්‍ර ලෙස හිඟ වීම හා මිල වැඩි වීම මෙන්ම, රජයේ ඉදිකිරීම් ව්‍යාපෘති අත්හිටුවීම සහ ඉහළ පොලී අනුපාතික හේතුවෙන් වසර තුළ දී ආයෝජන සඳහා වූ පරිසරය අයහපත් තත්ත්වයක පැවතුණි. කෙසේ වුවද, වසර තුළ දී ඉදිකිරීම් ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණවල දක්නට ලැබුණු මිල ඉහළ යෑම පිළිබිඹු කරමින් ආයෝජන වියදම සඳහා විශාලතම දායකත්වය දක්වන දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය පවත්නා මිල අනුව, පෙර වසරේ වාර්තා කළ සියයට 15.8ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 21.9කින් වර්ධනය විය. මේ අතර, තොග/පරිලේඛන වෙනස් වීම් සහ වටිනා දේ අත්පත් කර ගැනීම් හා අතහැරීම් ද වසර තුළ දී වර්ධනය විය.

ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි සමාගම් විසින් ලබාගත් ණය ද ඇතුළුව සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය, 2021 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 780.2ට සාපේක්ෂව වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,075.6ක්[6] දක්වා සියයට 37.9කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි සමාගම් වෙත ලැබෙන මුළු විදේශ ආයෝජන වලින් සියයට 54.0ක් පමණ වන යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා වූ සෘජු විදේශ ආයෝජන ලැබීම් 2022 වසරේ දී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇති අතර, 2022 වසරේ

6 මෙයට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත ලැබුණු ණය ද ඇතුළත් වූ ලැබීම් අයත් වන අතර, මෙම ඇස්තමේන්තු මෙම වාර්තාවේ 5වන පරිච්ඡේදයේ දක්වා ඇති ඇස්තමේන්තුවලට සමාන නොවේ. මෙම වාර්තාවේ 5 වන පරිච්ඡේදයේ දක්වා ඇති ඇස්තමේන්තුවලට ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි නොවන සමාගම් සඳහා වූ සෘජු විදේශ ආයෝජනද ඇතුළත්වීම ප්‍රධාන වශයෙන් එයට හේතු වේ. ඒ අනුව, 5වන පරිච්ඡේදයේ සඳහන් 2022 වසරේ දී සමස්ත සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 1,181කි.

2.11 සංඛ්‍යා සටහන

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසායවල ආයෝජන සහ සේවා නියුක්තිය

කාණ්ඩය	ව්‍යාපෘති සංඛ්‍යාව		ඇස්තමේන්තුගත ආයෝජන (රු. මිලියන)						ඇස්තමේන්තුගත සේවා නියුක්තිය	
	2021 (අ)	2022 (ආ)	2021 (අ)			2022 (ආ)			2021 (අ)	2022 (ආ)
			විදේශීය	දේශීය	එකතුව	විදේශීය	දේශීය	එකතුව		
ආයෝජන මණ්ඩලය (1978 අංක 4 දරන පනත යටතේ)										
අනුමත කළ ව්‍යාපෘති	135	160	347,871	166,184	514,056	282,842	263,529	546,371	25,632	26,177
17 වන වගන්තිය යටතේ (ඇ)	130	158	346,878	165,735	512,613	281,789	262,707	544,496	25,459	26,013
16 වන වගන්තිය යටතේ	5	2	993	449	1,442	1,054	821	1,875	173	164
17 වන වගන්තිය යටතේ ගිවිසගත් ව්‍යාපෘති (ඇ)	93	142	41,305	74,130	115,436	327,810	188,864	516,674	21,685	21,685
17 වන වගන්තිය යටතේ දැනට කර ඇති ආයෝජන (ඈ) (ඉ)	1,875	1,922	2,258,989	2,021,406	4,280,395	2,420,110	2,055,046	4,475,156	486,362	ලැ.නො.
වාණිජ කටයුතුවල නිරතවූ ව්‍යාපෘති (ඈ)	2,735	2,718	651,662	1,057,348	1,709,010	662,641	1,059,813	1,722,454	459,828	461,371
17 වන වගන්තිය යටතේ (ඇ)	2,100	2,116	625,665	1,020,523	1,646,188	637,450	1,029,961	1,667,412	375,007	380,939
ඇඟලුම් කම්හල් 200 වැඩසටහන යටතේ	116	107	505	25,639	26,143	503	18,714	19,217	56,543	52,513
16 වන වගන්තිය යටතේ	519	495	25,492	11,187	36,679	24,688	11,137	35,825	28,278	27,919
කර්මාන්ත අමාත්‍යාංශය										
ලියාපදිංචි වූ සමාගම් (ඈ)	3,259	3,451	-	-	209,366	-	-	204,600	ලැ.නො.	ලැ.නො.

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පුළුල් කළ ව්‍යාපෘති ද ඇතුළත්ව
(ඈ) වර්ෂය අවසානයේ සමුච්චිත අගය
(ඉ) සමුච්චිත සැබෑ ආයෝජන අගයන් දක්වා ඇත.
සටහන: ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත කළ හා ගිවිසගත් ව්‍යාපෘති, ආයෝජන උපරිමයන් හෝ වෙනත් නම් කරන ලද විශේෂිත අවශ්‍යතාවන්ට යටත්ව තිරුබඳු සහ විනිමය පාලන විධිවිධානවලින් නිදහස් වේ.

මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
කර්මාන්ත අමාත්‍යාංශය

2.13 රූප සටහන
ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යවසායවල විදේශීය සෘජු ආයෝජන (අ)
(ඒ.ජ.ඩොලර් මිලියන)



(අ) ණය ද ඇතුළත්ව

මූලයඃ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

සමස්ත සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයේ වර්ධනයට එය ප්‍රධාන වශයෙන් දායක විය. තවද, ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි සමාගම් වෙත ලැබෙන මුළු විදේශ ආයෝජන වලින්, පිළිවෙළින්, සියයට 34.0ක් සහ සියයට 13.0ක් පමණ වන නිෂ්පාදන සහ සේවා අංශ වෙත වූ සෘජු විදේශ ආයෝජන ලැබීම් ද වර්ධනය වී ඇත. කෙසේ වෙතත්, කෘෂිකාර්මික අංශය සඳහා වූ සෘජු විදේශ ආයෝජන ලැබීම් 2022 වසරේදී ද අඛණ්ඩව අඩු අගයක පැවතුණි. 1978 අංක 4 දරණ ආයෝජන මණ්ඩල පනතේ 16වන සහ 17වන වගන්ති යටතේ, ආයෝජන මණ්ඩලය විසින් වසර තුළ අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම, පසුගිය වසරේ වාර්තා වූ රුපියල් බිලියන 514.1 සිට රුපියල් බිලියන 546.4ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.3ක වර්ධනයක් පෙන්නුම් කළේය. ආයෝජන මණ්ඩල පනතේ 16වන සහ 17වන වගන්ති යටතේ වාණිජ මෙහෙයුම් ආරම්භ කළ ව්‍යාපෘතිවල ඇස්තමේන්තුගත ආයෝජන වටිනාකම, පිළිවෙළින්, රුපියල් බිලියන 35.8ක් සහ රුපියල් බිලියන 1667.4ක් විය.

පවත්නා සම්පත් සහ උපයෝජනය

දේශීය සම්පත් නියෝජනය කරනු ලබන ද.දේ.නි. මෙන්ම, විදේශීය සම්පත් නියෝජනය කරනු ලබන ආනයනවලින් ද සමන්විත වන ආර්ථිකයේ සමස්ත සම්පත් ප්‍රමාණය, පවත්නා මිල අනුව 2021 වසරේ දී වාර්තා කළ සියයට 14.8ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 38.0ක ඉහළ වේගයකින් වර්ධනය විය.

2.12 සංඛ්‍යා සටහන
සම්පත් සංයුතිය සහ උපයෝජනය
(පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)(ආ)

අයිතමය	ප්‍රතිශතාත්මක දායකත්වය (%)		වර්ධනය (%)	
	2021 (ඇ)	2022	2021 (ඇ)	2022
1. සම්පත්				
දළ දේශීය නිෂ්පාදිතය	80.4	80.0	12.3	37.2
භාණ්ඩ සහ සේවා ආනයන	19.6	20.0	26.5	41.2
එකතුව	**100.0**	**100.0**	**14.8**	**38.0**
2. උපයෝජනය				
පරිභෝජනය	56.8	55.3	8.4	34.3
දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය	21.2	18.7	15.8	21.9
තොග/පරිලේඛන වෙනස්වීම් සහ වටිනාදේ අත්පත් කර ගැනීම් සහ අතහැරීම	8.4	8.8	57.2	44.9
භාණ්ඩ සහ සේවා අපනයන	13.6	17.2	23.2	74.1
එකතුව	**100.0**	**100.0**	**14.8**	**38.0**

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලයන්ඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2.14 රූප සටහන
2022 වසරේ ආර්ථිකය (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)



(අ) ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ. (2015 පදනම් වර්ෂය)

මූලයන්ඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2

මෙහිදී, ද.දේ.නි. හා ආනයන 2021 වසරට සාපේක්ෂව 2022 වසර තුළ දී පිළිවෙලින් සියයට 37.2කින් සහ සියයට 41.2කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එසේ වුවද, ස්ථාවර මිල අනුව සැලකීමේ දී 2022 වසර තුළ දී ද.දේ.නි. සහ ආනයන පහත වැටීමක් වාර්තා කරන ලදී. මේ අතර, පවතින සම්පත් බොහෝමයක් පරිභෝජන අරමුණු සඳහා උපයෝජනය කර ඇති අතර, එය පවත්නා මිල අනුව 2022 වසරේ දී මුළු සම්පත් භාවිතයෙන් සියයට 55.3ක් විය. තවද, ආයෝජනය සහ අපනයන මුළු සම්පත් භාවිතයෙන් පිළිවෙළින් සියයට 27.5ක් සහ සියයට 17.2ක් විය.

ඉතුරුම්

රටෙහි දේශීය ඉතුරුම් මෙන්ම ජාතික ඉතුරුම් ද පවත්නා මිල අනුව 2022 වසර තුළ දී වර්ධනය විය. ඒ අනුව, 2021 වසරේ දී සියයට 22.9කින් ඉහළ ගිය දේශීය ඉතුරුම්, රාජ්‍ය නිර්-ඉතුරුම්වල ඉහළ යෑම හමුවේ වුව ද පෞද්ගලික ඉතුරුම්වල වර්ධනය හේතුවෙන් 2022 වසර තුළදී සියයට 44.2කින් වැඩි විය. ඒ අනුව, දේශීය ඉතුරුම් ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස සියයට 30.8ක් දක්වා ඉහළ ගියේය. එමෙන්ම, රුපියල් වටිනාකම අනුව ශුද්ධ ප්‍රාථමික ආදායම තවදුරටත් පහත වැටුනු අතර, ශුද්ධ විදේශීය ජංගම සංක්‍රාම වර්ධනයක් වාර්තා කරන ලදී. එහි සමස්ත ප්‍රතිඵලයක් ලෙස ජාතික ඉතුරුම් පසුගිය වසරේ වාර්තා කළ සියයට 17.7ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේදී සියයට 37.6ක ඉහළ වේගයකින් වර්ධනය විය. මේ අතර, ආයෝජන වියදම්වලට සාපේක්ෂව ඉතුරුම් ඉහළ වේගයකින් වර්ධනයට වීම හේතුවෙන් ජාතික ඉතුරුම්-ආයෝජන පරතරය 2022 වසර තුළ දී අඩු විය.

2.6. ආදායම

2022 වසරේ දී විශාලතම ආදායම් සංරචකය වෙමින් දළ මිශ්‍ර ආදායම ආර්ථිකය තුළ දළ එකතු කළ අගයෙන් සියයට 34.6ක් ජනනය කරනු ලැබූ අතර, එය 2021 වසරේ දී පවත්නා මිල අනුව වාර්තා කළ සියයට 11.2ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 45.4ක වර්ධනයකි. මේ අතර, මෙම වසරේ දෙවන විශාලතම ආදායම් සංරචකය වූ දළ මෙහෙයුම් අතිරික්තය, 2021 වසරේ දී වාර්තා කළ සියයට 17.3ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 36.0කින් වර්ධනය වී ඇත. තවද, අනෙකුත් ආදායම් සංරචක සලකන විට, සේවක ආදායම් හා නිෂ්පාදනය මත සහනාධාර අඩු කරන ලද බදු ද 2022 වසරේ දී වර්ධනය වී ඇත. මේ අතර, දළ එකතු කළ අගය සඳහා දායකත්වය දක්වන ලද ආයතනික අංශ අනුව ආදායම ජනනය කිරීම සැලකීමේ දී මූල්‍ය නොවන ආයතනික අංශය ප්‍රධාන දායකත්වය දක්වන ලද අතර, ඉන් අනතුරුව ගෘහ ඒකක හා ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය, රාජ්‍ය අංශය හා මූල්‍ය ආයතන අංශය පිළිවෙලින් සිය දායකත්ව සපයන ලදී.

2.13 සංඛ්‍යා සටහන

පරිභෝජනය, ආයෝජන සහ ඉතිරිකිරීම් (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)(ආ)

කාණ්ඩය	රුපියල් මිලියන		වර්ධනය (%)		ද.දේ.නි. ට දායකත්වය (%)	
	2021 (ඇ)	2022	2021 (ඇ)	2022	2021 (ඇ)	2022
1. වෙළඳපොළ මිල අනුව ද.දේ.නි.	17,600,191	24,147,726	12.3	37.2	100.0	100.0
2. පරිභෝජන වියදම	12,434,283	16,700,557	8.4	34.3	70.6	69.2
පෞද්ගලික	10,769,655	14,973,295	9.4	39.0	61.2	62.0
රජය	1,664,627	1,727,261	2.3	3.8	9.5	7.2
3. ආයෝජන	6,466,957	8,304,627	25.1	28.4	36.7	34.4
4. දේශීය ඉතුරුම්	5,165,908	7,447,170	22.9	44.2	29.4	30.8
පෞද්ගලික	6,456,349	8,987,618	19.9	39.2	36.7	37.2
රජය	-1,290,441	-1,540,448	-9.3	-19.4	-7.3	-6.4
5. දේශීය ඉතුරුම්-ආයෝජන පරතරය	-1,301,049	-857,458	-34.7	34.1	-7.4	-3.6
6. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම (ඇ)	-395,539	-621,353	6.5	-57.1	-2.2	-2.6
7. විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම (ඇ)	1,034,694	1,159,474	-10.1	12.1	5.9	4.8
8. ජාතික ඉතුරුම්	5,805,063	7,985,291	17.7	37.6	33.0	33.1

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
(ඈ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයෙන් කුමන හෝ වෙනසක් වනුයේ ගණනය කිරීමේ දී ඇතිවන කාල පමාව හේතුවෙනි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

2.14 සංඛ්‍යා සටහන

පවත්නා වෙළඳපොළ මිල යටතේ ආයතනික අංශ අනුව ආදායම් සංරචක (අ)(ආ)

අයිතමය	ප්‍රතිශතක දායකත්වය (%)									
	2021 (ඇ)					2022				
	මූල්‍ය නොවන අංශය	මූල්‍ය අංශය	රාජ්‍ය අංශය	ගෘහ ඒකක හා ලා.තො.ගෘ.සේ.ආ.* අංශය	සමස්ත ආර්ථිකය	මූල්‍ය නොවන අංශය	මූල්‍ය අංශය	රාජ්‍ය අංශය	ගෘහ ඒකක හා ලා.තො.ගෘ.සේ.ආ.* අංශය	සමස්ත ආර්ථිකය
සේවක ආදායම්	45.6	6.5	26.5	21.4	100.0	47.7	10.2	21.7	20.5	100.0
දළ මෙහෙයුම් අතිරික්තය	84.6	12.1	3.3	0.0	100.0	86.4	11.3	2.4	0.0	100.0
මිශ්‍ර ආදායම	-	-	-	100.0	100.0	-	-	-	100.0	100.0
නිෂ්පාදනය මත වෙනත් බදු (අඩු කළා එම සහනාධාර)	74.5	10.4	-	15.2	100.0	73.2	10.7	-	16.1	100.0
මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය	43.5	6.2	9.2	41.1	100.0	43.6	6.8	7.1	42.4	100.0

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
*ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2.7 ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

ජනගහනය

පෙර වසරට සාපේක්ෂව අඩු වර්ධන වේගයකින් වුවද ශ්‍රී ලංකාවේ ජනගහනය 2022 වසරේ දී අඛණ්ඩව වර්ධනය විය. ඒ අනුව, 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ මධ්‍ය වාර්ෂික ජනගහනය මිලියන 22.181ක් ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කර ඇති අතර, එය 2021 වසරේ දී වාර්තා වූ සියයට 1.1ක වර්ධනයට සාපේක්ෂව සියයට 0.1ක සුළු වර්ධනයකි. මේ අතර, බස්නාහිර පළාත තුළ ජනගහනය 2022 වසරේ දී යම් අඩු වීමක් පෙන්නුම් කළ ද එම පළාත මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් සියයට 28.0ක ඉහළම ප්‍රතිශතය නියෝජනය කරන ලද අතර, ඉන් අනතුරුව මධ්‍යම සහ දකුණු පළාත් පිළිවෙලින් සියයට 12.7ක් සහ සියයට 12.2ක් බැගින් නියෝජනය කරන ලදී. මේ අතර, උතුරු පළාත 2022 වසරේ දී මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් සියයට 5.3ක් ලෙස අඩුම ප්‍රතිශතය නියෝජනය කරන ලදී. 2021 වසරේ දී වර්ග කිලෝමීටරයකට පුද්ගලයන් 353ක්ව පැවති ජන ඝනත්වය, ජනගහන වර්ධනයට සමගාමීව 2022 වසරේ දී වර්ග කිලෝමීටරයකට පුද්ගලයන් 354ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. එසේම, මෑත වසරවල පැවති ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින්, කාන්තා ජනගහනය පිරිමි ජනගහනයට වඩා ඉහළ මට්ටමක මෙම වසරේදී ද පැවතුණි.

2.15 සංඛ්‍යා සටහන

පළාත් මට්ටමෙන් ජනගහනය සහ ජන ඝනත්වය (අ)(ආ)

පළාත	2021		2022	
	ජනගහනය පුද්ගලයන් '000	ජන ඝනත්වය	ජනගහනය පුද්ගලයන් '000	ජන ඝනත්වය
බස්නාහිර	6,219	1,731	6,209	1,728
මධ්‍යම	2,811	504	2,812	504
දකුණ	2,696	501	2,702	502
උතුර	1,165	141	1,173	141
නැගෙනහිර	1,783	190	1,788	191
වයඹ	2,592	345	2,592	345
උතුරු මැද	1,402	144	1,406	144
ඌව	1,400	168	1,408	169
සබරගමුව	2,088	424	2,091	425
මුළු එකතුව	**22,156**	**353**	**22,181**	**354**

(අ) තාවකාලික
(ආ) මධ්‍ය වාර්ෂික ජනගහන දත්ත 2012 ජන හා නිවාස සංගණනය මත පදනම් වේ.

මූලය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

ශ්‍රම බලකාය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව 2022 වසරේ දී ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය 2021 වසරට සාපේක්ෂව ඉහළ ගිය අතර, ශ්‍රම බලකාය පහළ යන ලදී. මෙහිදී, කුටුම්බ ජනගහනයේ වර්ධනයට සමගාමීව, ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය 2021 වසරේ වාර්තා වූ මිලියන 8.581 සිට 2022 වසරේ දී මිලියන 8.615ක් දක්වා ඉහළ ගිය අතර, ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය[7] නිරූපණය කෙරෙන ශ්‍රම බලකාය 2021 දී වාර්තා කල මිලියන 8.553 සිට 2002 දී මිලියන 8.547ක් දක්වා සුළු වශයෙන් අඩු විය. ඒ අනුව, ශ්‍රම බලකාය සහ

7 ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය, එනම් සලකා බලන සතියක කාලසීමාව තුළ වයස අවුරුදු 15 සහ ඊට වැඩි සේවා නියුක්ත සහ සේවා වියුක්ත ජනගහනය අයත් වේ.

2

2.16 සංඛ්‍යා සටහන

කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය (අ)

ශීර්ෂය	2020	2022 (ආ)				
		පළමු කාර්තුව	දෙවන කාර්තුව	තෙවන කාර්තුව	සිව්වන කාර්තුව	වාර්ෂික
කුටුම්බ ජනගහනය පුද්ගලයන් '000	**17,134**	**17,105**	**17,126**	**17,186**	**17,230**	**17,162**
ශ්‍රම බලකාය පුද්ගලයන් '000	**8,553**	**8,762**	**8,576**	**8,430**	**8,421**	**8,547**
සේවා නියුක්ත	8,114	8,389	8,177	8,010	8,015	8,148
සේවා වියුක්ත	440	373	399	419	406	399
ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඇ)	**49.9**	**51.2**	**50.1**	**49.0**	**48.9**	**49.8**
පුරුෂ	71.0	71.8	70.9	70.4	69.0	70.5
ස්ත්‍රී	31.8	33.6	32.1	31.0	31.6	32.1

(අ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය
(ආ) තාවකාලික
(ඇ) ශ්‍රම බලකාය, කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කුටුම්බ ජනගහනය අතර අනුපාතය වන ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2021 වසරේ වාර්තා වූ සියයට 49.9 සිට 2022 වසර වන විට සියයට 49.8ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය. මෙහිදී, 2021 වසරේ දී සියයට 71.0ක් ලෙස වාර්තා වූ පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2022 වසරේ දී සියයට 70.5ක් දක්වා පහළ ගිය අතර, ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය හිතකර ප්‍රවණතාවයක් පෙන්නුම් කරමින් පෙර වසරේ දී වාර්තා කළ සියයට 31.8ට සාපේක්ෂව සියයට 32.1ක් දක්වා ඉහළ ගියේය. තවද, ස්ත්‍රී පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව පරතරය 2021 වසරේ වාර්තා වූ සියයට 39.2ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 38.4ක් දක්වා පහළ යන ලදී.

සේවා නියුක්තිය

සේවා නියුක්ත ජනගහනය[8] 2021 වසරේ දී වාර්තා වූ මිලියන 8.114 සිට 2022 වසරේ දී මිලියන 8.148ක් දක්වා ඉහළ ගොස් ඇත. මෙහිදී, ප්‍රධාන ආර්ථික කටයුතු අනුව සේවා නියුක්තිය සැලකූ විට, කර්මාන්ත කටයුතුවල සේවා නියුක්තිය 2021 වසරේ දී මිලියන 2.109 සිට 2022 වසරේ දී මිලියන 2.158ක් දක්වා ඉහළ ගිය අතර, සේවා කටයුතුවල සේවා නියුක්තිය 2021 වසරේ දී වාර්තා වූ මිලියන 3.791ට සාපේක්ෂව

8 අදාළ යොමු කාලය තුළ සේවකයන්, සේවයන් සහ තමාගේම වැඩ කටයුතු කරන්නන් හෝ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් ලෙස අවම පැයක්වත් ආර්ථික කටයුත්තක යෙදුන පුද්ගලයන් සේවා නියුක්ත පුද්ගලයන් ලෙස හඳුන්වනු ලබයි. මෙයට ආදාළ යොමු කාලය තුළ ආර්ථික කටයුත්තක යෙදී නොසිටියත් එම ආර්ථික කටයුත්ත සමඟ විධිමත් බැඳීමක් ඇති පුද්ගලයන් ද අයත් වේ.

2.17 සංඛ්‍යා සටහන

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය

අංශය	2021 (අ)	2022 (ආ)	ප්‍රතිශත වෙනස
			2022/2021 (ආ)
රාජ්‍ය	1,181,422	1,181,766	0.0
රජය සතු ව්‍යාවසායයන්	219,838	212,117	-3.5
සමස්ත රාජ්‍ය අංශය	**1,401,260**	**1,393,883**	**-0.5**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

2022 වසරේ දී මිලියන 3.831ක් දක්වා ඉහළ යන ලදී. කෙසේ වුවද, කෘෂිකර්මාන්ත කටයුතු ආශ්‍රිත සේවා නියුක්තිය 2022 වසරේ දී මිලියන 2.159ක් ලෙස වාර්තා වූ අතර, එය පෙර වසරේ වාර්තා වූ මිලියන 2.213ට සාපේක්ෂව පහළ යාමකි. ඒ අනුව, කර්මාන්ත සහ සේවා කටයුතුවලින් සමස්ත සේවා නියුක්තියට සපයන දායකත්වය 2021 වසරේ පිළිවෙළින් පැවති සියයට 26.0 සහ සියයට 46.7 සිට 2022 වසරේ දී පිළිවෙළින් සියයට 26.5ක් සහ සියයට 47.0ක් දක්වා ඉහළ ගිය අතර, කෘෂිකර්මාන්ත කටයුතුවල දායකත්වය පෙර වසරේ වාර්තා කළ සියයට 27.3 සිට 2022 වසර වන විට සියයට 26.5ක් දක්වා පහළ යන ලදී. තවද, රැකියාවේ සේවා තත්ත්වය අනුව සේවා නියුක්තිය සැලකූ විට, රාජ්‍ය අංශයේ සේවකයන්, තමාගේම වැඩකටයුතු කරන්නන් සහ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් 2021 වසරට සාපේක්ෂව 2022 වසරේදී පහත වැටුණු අතර, පෞද්ගලික අංශයේ සේවකයින් හා සේව්‍යයන් සංඛ්‍යාව ඉහළ යන ලදී. තවද, සේවා නියුක්තිය සඳහා ඉහළම දායකත්වය මෙවරද ලබාදුන් පෞද්ගලික අංශය 2022 වසරේදී සමස්ත සේවා නියුක්තියෙන් සියයට 42.9ක් නියෝජනය කළ අතර, ඉන් අනතුරුව විශාලම දායකත්වය දක්වනු ලැබූ තමාගේම වැඩකටයුතු කරන්නන්ගේ ප්‍රතිශතය සියයට 33.1ක් විය.

මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ දත්ත අනුව 2022 වසරේ දී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය මිලියන 1.394ක් ලෙස වාර්තා විය. මේ සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සභා සහ රජය සතු ව්‍යාවසායයන්ගේ සේවා නියුක්තිකයින් ඇතුලත් වෙයි. ඒ අනුව, 2021 වසරේ දී මිලියන 1.401ක් වූ රාජ්‍ය අංශයේ සේවා වියුක්තියෙහි පහත වැටීමක් 2022 වන විට වාර්තා වී ඇති අතර, මේ සඳහා රජය සතු ව්‍යාවසායයන්ගේ සේවක සංඛ්‍යාව පහත වැටීම බලපාන ලදී.

සේවා වියුක්තිය

සේවා වියුක්ති අනුපාතිකය 2021 වසරේ වාර්තා වූ සියයට 5.1 සිට 2022 වසරේ දී සියයට 4.7ක් දක්වා පහළ යන ලදී. ඒ අනුව, පෙර වසරේ දී මිලියන 0.440ක් ලෙස වාර්තා වූ සේවා වියුක්ත ජනගහනය[9] 2022 වසර වන විට මිලියන 0.399ක් දක්වා පහළ ගියේය. මෙහිදී, පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය සියයට 3.7ක මට්ටමේම නොවෙනස්ව පැවති අතර, ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය 2021 වසරේ වාර්තා කළ සියයට 7.9ට සාපේක්ෂව 2022 වසරේ සියයට 6.5ක් දක්වා පහත වැටුණි. තවද, අ.පො.ස. උසස් පෙළ හා ඉන් ඉහළ අධ්‍යාපනය ලැබූ කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතිකය 2021 වසරේ දී වාර්තා වූ සියයට 9.1 සිට 2022 වසරේ දී සියයට 7.8ක් දක්වා සැලකිය යුතු ලෙස පහළ යන ලදී. එසේම, තරුණ (අවුරුදු 15-24) සේවා වියුක්ති අනුපාතිකය 2021 වසරේ වාර්තා වූ සියයට 26.5ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 22.8ක් දක්වා පහත වැටෙන ලදී.

විදේශ සේවා නියුක්තිය

2022 වසරේ දී විදේශ රැකියා සඳහා 311,056 දෙනෙකු පිටත්ව යන ලද අතර, මෙය 2021 වසරේ දී පිටත්ව ගිය 122,264ට සාපේක්ෂව සියයට 154.4ක සැලකිය යුතු වර්ධනයකි. 2022 වසර තුළ දී රට අත්විඳි ආර්ථික අර්බුදය ද මෙසේ විශාල පිරිසක් රැකියා සඳහා විදේශගත වීම කෙරෙහි හේතු විය. ප්‍රතිශතයක් ලෙස ගත් කළ වසර තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව යන ලද පිරිසෙන් සියයට 60.1ක් පුරුෂයින් වූ අතර, සියයට 39.9ක් කාන්තාවන් විය. මෙහිදී, ශ්‍රම කාණ්ඩය අනුව සැලකූ විට, වෘත්තීය, මධ්‍යම මට්ටම, ලිපිකරු හා ඒ ආශ්‍රිත, පුහුණු, අර්ධ පුහුණු, නුපුහුණු හා ගෘහ සේවිකා යන කාණ්ඩ සියල්ලම යටතේ විදේශ රැකියා සඳහා පිටත් වීමේ ඉහළ යෑමක් වාර්තා වූ අතර, එහි සමස්ත වර්ධනය කෙරෙහි විශේෂයෙන්ම පුහුණු, නුපුහුණු සහ ගෘහ සේවිකා කාණ්ඩ ඉහළ දායකත්වයක් දක්වන ලදී. මේ අතර, 2022 වසරේ දී ද රැකියා සඳහා මැද පෙරදිග රටවල්වලට වැඩි වශයෙන් විදේශගත වීම් වාර්තා වූ අතර, එය රැකියා සඳහා සමස්ත විදේශගත වීම් වලින් සියයට 84.7ක් විය. එයින් ද සියයට 91.3ක් කටාර්, සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍ය හා කුවේට් යන රටවල් සඳහා විය.

9 රැකියාවක් සොයන හා රැකියාවක් නොකළ සහ පසුගිය සති හතරක කාලය තුළ රැකියාවක් සෙවීමට යම් පියවරක් ගත් හා ඉදිරි සති දෙක තුළ රැකියාවක් ලැබුණහොත් භාරගැනීමට හැකියාවක් ඇති පුද්ගලයන් සේවා වියුක්ත පුද්ගලයන් ලෙස හඳුන්වනු ලබයි.

2.15 රූප සටහන
සේවා වියුක්ති අනුපාතිකය (%)



මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2.16 රූප සටහන
නිපුණතා කාණ්ඩ අනුව විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්



මූලාශ්‍ර: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

2.17 රූප සටහන
ප්‍රධාන ගමනාන්ත අනුව විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්



මූලාශ්‍ර: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

2

2.18 සංඛ්‍යා සටහන

විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්

විදේශ සේවා නියුක්තිය	2020		2021 (අ)		2022 (ආ)	
	සංඛ්‍යාව	දායකත්වය %	සංඛ්‍යාව	දායකත්වය %	සංඛ්‍යාව	දායකත්වය %
මුළු විදේශ රැකියා සංඛ්‍යාව	**53,711**	**100.0**	**122,264**	**100.0**	**311,056**	**100.0**
මූලයන් අනුව						
ලියාපදිංචි නියෝජිතයන්	18,065	33.6	41,805	34.2	123,420	39.7
වෙනත්	35,646	66.4	80,459	65.8	187,636	60.3
ස්ත්‍රී/පුරුෂ අනුව						
පුරුෂ	32,500	60.5	81,110	66.3	186,965	60.1
ස්ත්‍රී	21,211	39.5	41,154	33.7	124,091	39.9
ශ්‍රම කාණ්ඩය අනුව						
වෘත්තීය	2,957	5.5	8,373	6.8	14,307	4.6
මධ්‍යම මට්ටම	1,496	2.8	4,256	3.5	8,130	2.6
ලිපිකරු හා ඒ ආශ්‍රිත	2,496	4.6	6,540	5.3	12,134	3.9
පුහුණු	16,664	31.0	40,174	32.9	92,836	29.8
අර්ධ පුහුණු	789	1.5	1,930	1.6	4,133	1.3
නුපුහුණු	13,987	26.0	31,676	25.9	105,509	33.9
ගෘහ සේවිකා	15,322	28.5	29,315	24.0	74,007	23.8

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

ශ්‍රම ඵලදායිතාව

වැඩ කරන ලද පැයකට එකතු කළ අගය (2015 මිල අනුව) වශයෙන් මනිනු ලබන ශ්‍රම ඵලදායිතාව, 2021 වසරේ දී වාර්තා වූ පැයකට රුපියල් 768.08 සිට 2022 වසරේ දී පැයකට රු. 686.57ක් දක්වා සියයට 10.6කින් පහත වැටුණි. මෙහිදී, කර්මාන්ත හා සේවා කටයුතුවල ශ්‍රම ඵලදායිතාවෙහි පහත වැටීමක් වාර්තා වූ අතර, ඒ කෙරෙහි එම ක්‍රියාකාරකම්වල එකතු කළ අගය පහත වැටීම මූලික වශයෙන් හේතු විය. ඒ අනුව, කර්මාන්ත හා සේවා කටයුතුවල ශ්‍රම ඵලදායිතාව 2021 වසරේ දී පිළිවෙලින් වාර්තා කළ පැයකට රුපියල් 922.15 සහ පැයකට රුපියල් 945.97 සිට 2022 වසර වන විට පැයකට රුපියල් 759.80ක් සහ පැයකට රුපියල් 839.85ක් දක්වා පහත වැටුණි. කෙසේ වුවද, කෘෂිකාර්මික කටයුතුවල එකතු කළ අගය මෙන්ම වැඩ කරන ලද පැය ගණන ද පහත වැටීම හේතුවෙන් එම කටයුතුවල ශ්‍රම ඵලදායිතාව 2021 වසරේ පැවති මට්ටමට ආසන්න මට්ටමකම පැවතිණි. ඒ අනුව, 2021 වසරේ දී පැයකට රුපියල් 243.04ක් වූ කෘෂිකාර්මික කටයුතුවල ශ්‍රම ඵලදායිතාව 2022 වසරේ දී පැයකට රුපියල් 243.94ක් ලෙස වාර්තා විය. තවද, ශ්‍රම ඵලදායිතා මට්ටම අනුව සැලකූ විට, ශ්‍රම උපයෝජන කාර්යක්ෂමතාව සේවා කටයුතුවල වැඩි අගයක් වාර්තා කළ අතර, ඉන් අනතුරුව කර්මාන්ත කටයුතුවලින් ද අඩුම අගය කෘෂිකර්මාන්ත කටයුතුවලින් ද වාර්තා විය.

3

ආර්ථික සහ සමාජ යටිතල පහසුකම්

3.1 සමස්ත නිරීක්ෂණ

සැලකිය යුතු මට්ටමේ සමාජ ආර්ථික බලපෑම් ඇති කරමින්, විදුලි හා බලශක්ති මෙන්ම මානුෂීය අර්බුද වෙත මග පෑදූ, උග්‍ර වූ ගෙවුම් ශේෂ සහ ස්වෛරීත්ව ණය අර්බුද මධ්‍යයේ, 2022 වසරේ දී ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සේවා සැපයීම පෙර නොවූ අන්දමේ අභියෝගවලට ලක් විය. රජය සතු වාණිජ ව්‍යවසායයන් කිහිපයක් සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණ යාන්ත්‍රණ හඳුන්වාදීම ඇතුළු සැපයුම් සහ ඉල්ලුම් කළමනාකරණ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමත් සමඟ, 2022 වසරේ අග භාගයේ දී ආර්ථික සේවා සැපයීමෙහි යම් ප්‍රගතියක් දක්නට ලැබුණි. කෙසේ වෙතත්, ආර්ථික අභියෝග හේතුවෙන් තීව්‍ර වූ ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සේවා සැපයීමේ දී පැවති දුර්වලතා තුළින්, රාජ්‍ය අංශයේ දිගු කාලයක් මුළුල්ලේ ක්‍රියාත්මක නොවුණු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලබයි. විශේෂයෙන් ම, 2022 වසරේ මැද භාගයේ දී පැවති සැලකිය යුතු අන්දමේ විදුලිය විසන්ධි කිරීම් සහ ඉන්ධන හිඟය මගින් සමාජ ආර්ථික ක්‍රියාකාරකම්වලට පෙර නොවූ අන්දමේ අවහිරතා ඇති කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2022 වසර තුළ සමස්ත ආර්ථික ක්‍රියාකාරකම්වල විශාල පසුබෑමක් සිදු විය. කෙසේ වෙතත්, ජලවිදුලි උත්පාදනයේ දායකත්වය ඉහළ යෑම මෙන්ම, ඉන්ධන සැපයීම සඳහා ඉන්ධන අවසර පත්‍ර කේත ක්‍රමය (QR Code) හඳුන්වා දීම, ගෑස් ආනයනය සඳහා විදේශීය මූල්‍ය සහාය ලබා ගැනීම, දිගු කාලයක් මුළුල්ලේ අවශ්‍යව පැවති ඉන්ධන නිෂ්පාදිත සහ විදුලිය ගාස්තු සඳහා වන පිරිවැය පිළිබිඹු කෙරෙන මිල සූත්‍ර පදනම් මිල සංශෝධන හඳුන්වා දීම ඇතුළු සැපයුම් සහ ඉල්ලුම් අසමතුලිතතාවන් විසඳාලීමට හඳුන්වා දුන් ක්‍රියාමාර්ග මධ්‍යයේ, 2022 වසරේ දෙවන භාගය තුළ දී බලශක්ති අර්බුදයේ තීව්‍රතාව පහව ගියේය. ඒ අනුව, වෙනත් සාධක අතර, ගෝලීය බලශක්ති මිල ගණන්වල වෙනස්වීම පිළිබිඹු කරමින්, බනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය සිල්ලර මිල ගණන් 2022 වසරේ අවස්ථා කිහිපයක දී සංශෝධනය කරන ලද අතර, 2022 වසරේ මැයි මාසයේ සිට මිල සූත්‍රයක් මත පදනම්ව, එම මිල සංශෝධන සිදු කෙරිණි. වසර අටකට වඩා වැඩි කාලයකට පසුව 2022 වසරේ අගෝස්තු මාසයේ දී විදුලි ගාස්තු ඉහළ නැංවූ අතර, 2023 වසරේ සිට මාස හයකට වරක් විදුලි ගාස්තු සංශෝධනය කිරීමේ යාන්ත්‍රණය ආරම්භ කිරීමෙන් අනතුරුව 2023 වසරේ පෙබරවාරි මාසයේ දී විදුලි ගාස්තු යළි ඉහළ නංවන ලදී. ජල ගාස්තු ද 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී ඉහළ නංවන ලදී. මෙම මිල සංශෝධන ද ඇතුළුව, 2022 වසර තුළ දී සමස්ත මිල මට්ටම්වල සිදු වූ කැපී පෙනෙන ඉහළ යෑම් තුළින් ආර්ථික වශයෙන් අවදානමට ලක්විය හැකි කුටුම්භවලට සැලකිය යුතු පීඩාවක් ඇති වූ අතර, එමගින් දරිද්‍රතා මට්ටම් වඩාත් අයහපත් තත්ත්වයකට පත් විය.

2022 වසර තුළ දී රජය සතු මූල්‍ය අවකාශය සීමා වීම මධ්‍යයේ යටිතල පහසුකම් මත කෙරෙන ආයෝජන වියදම් දැරීම දුෂ්කර විය. ගෙවුම් ශේෂ පීඩන මධ්‍යයේ, ආනයනික අමුද්‍රව්‍ය සපයා ගැනීමේ දී පැවති දුෂ්කරතා මගින් යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ ඉදිකිරීම් කටයුතුවලට බලපෑම් ඇති විය. කොවිඩ්-19 වසංගතය පාලනය කිරීමේ දී ශ්‍රී ලංකාව ප්‍රශංසනීය ප්‍රගතියක් ලබා ඇත. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම මධ්‍යයේ ඖෂධ නිෂ්පාදිත සහ අනෙකුත් වෛද්‍ය සැපයුම්වල හිඟතාව සෞඛ්‍ය ක්ෂේත්‍රයට බලපෑ අතර, එම සැපයුම් හිඟය යම්තාක් දුරකට අඩු කර ගැනීමට විදේශීය ආධාර උපකාරී විය. බලශක්ති අර්බුදය සහ කොවිඩ්-19 හේතුවෙන් අධ්‍යාපන

පද්ධතියට ඇති වූ බාධා බොහෝ දුරට පහව යෑමත් සමඟ, 2022 වසරේ දෙවන භාගයේ දී අධ්‍යාපන ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් විය. කෙසේ වෙතත්, පසුගිය වසර කිහිපය තුළ අධ්‍යයන කටයුතුවලට වරින්වර බාධා සිදු වීම හේතුවෙන් ඇති වූ ඉගෙනුම් අවස්ථා අහිමිවීමේ බලපෑම අඛණ්ඩව පැවති අතර, අඩු වරප්‍රසාද සහිත පසුබිමක සිටින ළමුන් අතර අධ්‍යාපනික ප්‍රතිඵලවල අසමානතා පුළුල් වීම මගින් අධ්‍යාපන පද්ධතියේ විෂමතා විසඳාලීම සඳහා වන සාමූහික ප්‍රයත්නවල අවශ්‍යතාව අවධාරණය කරනු ලබයි. ආර්ථික අවහිරතා හා ආර්ථික ක්‍රියාකාරකම්වල මන්දගාමීත්වය හේතුවෙන් ජනගහනය තුළ වඩාත් අවදානමට ලක් වන ප්‍රතිශතය ශීඝ්‍රයෙන් ඉහළ යෑම තුළින් දරිද්‍රතාවය තුරන් කිරීමේ ප්‍රගතිය අඩාල විය. සමස්ත ජනගහනයෙන් අවදානමට ලක්වූ ජන කොටස්වල ජීවන තත්ත්වයන් වෙත ආර්ථික අර්බුදය මගින් ඇති කළ පුළුල් ප්‍රතිවිපාක සැලකිල්ලට ගනිමින්, සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් යටතේ සහන සැලසීමට පියවර කිහිපයක් ගනු ලැබූ අතර, ඒවායෙහි කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට සහ එවැනි යෝජනා ක්‍රම සඳහා ප්‍රතිලාභීන් ඉලක්ක කිරීම විධිමත් කිරීමට පියවර ගන්නා ලදී. මැදි කාලීනව, භෞතික ප්‍රාග්ධනය හා මානව ප්‍රාග්ධනය යන දෙඅංශයම වැඩිදියුණු කිරීම තුළින් ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීමට, තිරසාර හා සෑමට ප්‍රතිලාභ ලැබෙන පරිදි ආර්ථිකයේ ඇති ගැටලු විසඳීම සඳහා වන සාමූහික ප්‍රයත්නවල අවශ්‍යතාවය, නිදහසින් පසු ශ්‍රී ලංකාව මුහුණ දුන් උච්චතම ආර්ථික අර්බුදය මගින් නිර්මාණය කළ සමාජ ආර්ථික ප්‍රතිවිපාක මගින් මනාව අවධාරණය කරනු ලබයි.

3

3.2 ආර්ථික යටිතල පහසුකම් ප්‍රතිපත්ති, ආයතනික රාමුව සහ ක්‍රියාකාරිත්වය

බනිජ තෙල්

2022 වසරේ දී රටේ පැවති පෙර නොවූ අන්දමේ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ, ඉන්ධන සඳහා වන දේශීය ඉල්ලුම සපුරාලීමේ දී රජය දැඩි දුෂ්කරතාවලට මුහුණ දුන්නේය. මෙම වසර තුළ දී, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි පැවති ද්‍රවශීලතා හිඟය සමඟ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි (ලං.ඛ.නී.සං.) මූල්‍ය තත්ත්වය අයහපත් වීම හේතුවෙන් ලං.ඛ.නී.සං.හි ඉන්ධන ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැඩි ලෙස අභියෝගයට ලක් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රට තුළ සමාජ නොසන්සුන්තාවයකට තුඩුදුන් ඉන්ධන අර්බුදයක් ඇති විය. ඉන්ධන බෙදාහැරීමේ අවිධිමත්භාවයන් සහ ඉන්ධන සැපයුම පිළිබඳ අවිනිශ්චිතතා, අධික ලෙස ඉන්ධන තොග ගබඩා කිරීමට මෙන්ම ඉන්ධන ලබා ගැනීම සඳහා දිගු පෝලිම් නිර්මාණය කිරීමට හේතු විය. ආර්ථික ක්‍රියාකාරකම්වල අඛණ්ඩතාව පවත්වා ගැනීම සහතික කිරීම සඳහා ඉන්ධන ආනයනයෙහි ඇති අත්‍යවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්, ලං.ඛ.නී.සං.ට අවශ්‍ය විදේශ විනිමය ද්‍රවශීලතාව සැපයීම හරහා නිසි කලට ඉන්ධන ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට මහ බැංකුව අඛණ්ඩව පහසුකම් සැලසුවේය. තවද, රටේ පැවති දරුණුතම ආර්ථික අර්බුදය මධ්‍යයේ, 2022 වසර තුළ දී බනිජ තෙල් නිෂ්පාදිත මිලදී ගැනීම මූල්‍යනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ඉන්දියානු ආනයන අපනයන බැංකුව වෙතින් එ.ජ. ඩොලර් මිලියන 500ක කෙටි කාලීන ණය පහසුකමක් ලබා ගත් අතර, ඉන්දියානු රාජ්‍ය බැංකුව වෙතින් ලබාගත් එ.ජ. ඩොලර් මිලියන 1,000ක ණය පහසුකමෙන් ඩොලර් මිලියන 200ක් ද බනිජ තෙල් නිෂ්පාදිත මිලදී ගැනීම සඳහා භාවිත කළේය. මේ අතර, 2022 වසරේ මැයි මාසයේ දී, බනිජ තෙල් නිෂ්පාදිත සඳහා නව මිල සූත්‍රයක් ක්‍රියාත්මක කිරීමට අදාළව අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වූ අතර, ඒ අනුව, පිරිවැය පිළිබිඹු කෙරෙන සුදුසු මිල සූත්‍රයක් සැකසීමට කමිටුවක් පත් කරන ලදී. 2018 වසරේ දී සම්මත කරන ලද මිල සූත්‍රය ක්‍රියාත්මක කිරීමට සහ මාසික පදනමින් දේශීය බනිජ තෙල් මිල ගණන් සංශෝධනය කිරීමට රජය තීරණය කිරීමත් සමඟ, 2022 වසරේ මැයි මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද මිල සූත්‍රය, පසුව 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී අවලංගු කරන ලදී. මේ අතර, නාවික කටයුතු වෙනුවෙන් ඉන්ධන ලබාදෙන සමාගම් කිහිපයක් සඳහා ජයා බහලු පර්යන්තයේ පවත්වාගෙන යන තෙල් ගබඩාව හරහා අපනයනකරුවන්ට, බලශක්ති උත්පාදන සමාගම්වලට, සංචාරක සේවා සපයන්නන්ට, බලපත්‍රලාභී විදුලි සංදේශ සේවා සපයන්නන්ට සහ වෙනත් කර්මාන්තවලට නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා, එ.ජ. ඩොලර්වලින් ගෙවීම් සිදු කිරීමේ පදනම මත, තෝරාගත් ඉන්ධන නිෂ්පාදිත සැපයීමට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දෙන ලදී. ඉන්ධන මිලදී ගැනීම සඳහා එ.ජ. ඩොලර්වලින් ගෙවීම් සිදු කළ හැකි, ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ලියාපදිංචි කළ අපනයන ක්ෂේත්‍රයේ රැකියාවල නියුතු ප්‍රමුඛ පාරිභෝගිකයින් ලියාපදිංචි කිරීම 2022 වසරේ ජූලි මාසය ආරම්භයේ දී, ලං.ඛ.නී.සං. විසින් ආරම්භ කරන ලද අතර, එම පාර්ශ්වයන් සඳහා සහතික කළ ඉන්ධන කෝටාවක් යටතේ ඉන්ධන නිකුත් කරන ලදී. ජාතික ඉන්ධන අවසර පත්‍ර ක්‍රම ක්‍රියාත්මක කිරීමට පෙර, ලං.ඛ.නී.සං. විසින් ප්‍රවාහන අංශය වෙත අඛණ්ඩව ඉන්ධන සැපයීම සහතික කිරීම සඳහා 2022

3

3.1 රූප සටහන
ආර්ථික සහ සමාජ යටිතල පහසුකම්වල කාර්යසාධනය



3

වසරේ ජූලි මාසයේ අවසාන භාගයේ සිට වාහන අංක තහඩුවේ අවසාන අංකයට අනුව ලං.ඛ.නී.සං.ට අයත් පිරවුම්හල් හරහා ඉන්ධන නිකුත් කරන ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. 2022 වසරේ අගෝස්තු මාසයේ 01 වන දින සිට ක්‍රියාත්මක වූ ජාතික ඉන්ධන අවසර පත්‍ර ක්ෙත්‍ර ක්‍රමය යටතේ නියමිත වාහන කාණ්ඩ සඳහා සතිපතා ඉන්ධන කෝටා ලබා දුන් අතර, දැඩි අවහිරතා මධ්‍යයේ සීමිත ඉන්ධන තොග ක්‍රමානුකූලව දීපව්‍යාප්තව බෙදා හැරීම එමගින් සිදු කරන ලදී. තවද, වසර තුළ දී කර්මාන්ත, කෘෂිකාර්මික අංශය සහ ධීවර අංශය වෙත ඉන්ධන සැපයීම සහතික කිරීම සඳහා පියවර කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. කොවිඩ්-19 වසංගතයෙන් අනතුරුව සංචාරක කර්මාන්තයෙහි යථා තත්ත්වයට පත් වීමට පහසුකම් සැලසීමේ අරමුණින්, 2022 වසරේ ඔක්තෝබර් මාසය ආරම්භයේ දී සංචාරක ඉන්ධන අවසර පත්‍ර පෙරගෙවුම් කාඩ්පත් ක්‍රමය ක්‍රියාත්මක කරන ලද අතර, එමගින් එ.ජ. ඩොලර් අගයක් සහිත පෙරගෙවුම් කාඩ්පතක් භාවිතයෙන් දිවයින පුරා පිහිටි පිරවුම්හල් හරහා ඉන්ධන මිලදී ගැනීම සඳහා සංචාරකයින්ට අවස්ථාව හිමි විය. මේ අතර, ලං.ඛ.නී.සං. 2022 වසර අග භාගයේ දී බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයනය සඳහා ගබඩා මොඩියුල සංකල්පය (Storage Module Concept) ක්‍රියාවට නංවන ලද අතර, එමගින් ලං.ඛ.නී.සං.වේ සහ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්හි (CPSTL) ගබඩා පර්යන්තවලින් ඉන්ධන ලබා ගන්නා අවස්ථාවේදී ගෙවීම් සිදු කෙරෙන පදනමක් මත, ප්‍රමාදයකින් තොරව නැව්වලින් ඉන්ධන ගොඩබෑමට හැකි විය. යම් සීමා පැනවීම් මධ්‍යයේ වුවද, මෙම ක්‍රමය හරහා අඛණ්ඩ ඉන්ධන සැපයුමක් සඳහා පහසුකම් සැලසීමට හැකිවූ අතර, ලං.ඛ.නී.සං.හි මුදල් ප්‍රවාහ ඌනතාවන් බොහෝ දුරට අඩු කිරීමට එය උපකාරී විය.

ගෝලීය ආර්ථිකය මන්දගාමී වීම පිළිබඳ අවිනිශ්චිතතා සමඟ වසරේ දෙවන භාගයේ දී මිල පීඩන පහළ යෑමේ නැඹුරුවක් දක්නට ලැබුණ ද, මූලික වශයෙන් නැගෙනහිර යුරෝපයේ පවතින භූ දේශපාලනික අර්බුද සහ එහි ප්‍රතිඵලයක් ලෙස ගෝලීය තෙල් සැපයුම් තත්ත්වය දැඩි වීම හේතුවෙන් ගෝලීය බොරතෙල් මිල ගණන් 2022 වසරේ දී ඉහළ මට්ටමක පැවතුණි. ප්‍රධාන වශයෙන් ලොව ප්‍රමුඛතම ඛනිජ තෙල් නිෂ්පාදන අපනයනකරුවෙකු වන රුසියාව වෙත බටහිර රටවල් විසින් පනවන ලද සම්බාධක හේතුවෙන්, 2008 වසරේ ජූලි මාසයෙන් පසු ප්‍රථම වතාවට 2022 වසරේ මාර්තු මාසයේ දී බොරතෙල් (බ්‍රෙන්ට්) බැරලයක දෛනික මිල ගණන් එ.ජ. ඩොලර් 140ක් දක්වා කෙටි කාලයක් තුළ ඉහළ යෑමත් සමඟ, 2022 වසරේ පළමු භාගය තුළ බොරතෙල් මිල ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, ලෝකයේ ප්‍රධාන මහ බැංකුවල මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමේ පියවර හා සමගාමීව ගෝලීය ආර්ථික වර්ධනය මන්දගාමී වීම තුළින් ගෝලීය වශයෙන් බලශක්තිය සඳහා වන ඉල්ලුම පහළ යනු ඇතැයි අපේක්ෂා කිරීම, චීනය විසින් කොවිඩ්-19 ආශ්‍රිත සීමා අඛණ්ඩව පවත්වා ගෙන යෑම සහ එක්සත් ජනපදයේ උපායමාර්ගික සංචිතවලින් බොරතෙල් සැලකිය යුතු ලෙස මුදා හැරීම හේතුවෙන් 2022 වසරේ දෙවන භාගය ආරම්භයේ සිට බොරතෙල් මිල ගණන් පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී ඛනිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානය (OPEC) සහ එහි පාර්ශ්වකරුවන් විසින් නිෂ්පාදන කප්පාදුවක් නිවේදනය කිරීම, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී යුරෝපීය සංගමය රුසියානු බොරතෙල් ආනයනය තහනම් කිරීමත් සමඟ ජී7 කණ්ඩායමේ (G7) රටවල් විසින් රුසියානු බොරතෙල් සඳහා මිල සීමාවක් පැනවීම, සහ චීනයේ ඉල්ලුම යථා තත්ත්වයට පත්වීමේ ලක්ෂණ පෙන්නුම් කිරීමත් හේතුවෙන් 2022 වසරේ දෙවන භාගයේ අවසාන කාලයේදී කෙටි කාලීනව මිල පීඩනයන්ගේ ඉහළ යෑම් දක්නට ලැබුණි. බොරතෙල් (බ්‍රෙන්ට්) බැරලයක මිලෙහි සාමාන්‍යය පෙර වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් 70.80ක සිට 2022 වසරේ දී එ.ජ. ඩොලර් 99.06ක් දක්වා සියයට 39.9කින් ඉහළ ගියේය. වෙස්ට් ටෙක්සාස් ඉන්ටර්මීඩියට් (ඩබ්.ටී.අයි) බොරතෙල් මිල ගණන් ද ඉහළ යන ප්‍රවණතාවක් වාර්තා කළ අතර, 2021 වසරේ දී එ.ජ. ඩොලර් 67.94ක් ලෙස පැවති බැරලයක මිලට සාපේක්ෂව 2022 වසරේ දී බැරලයක සාමාන්‍ය මිල එ.ජ. ඩොලර් 94.41ක් ලෙස වාර්තා විය. කෙසේ වෙතත්, 2023 වසරේ පළමු කාර්තුවේ දී ගෝලීය බොරතෙල් මිල ගණන් සුළු වශයෙන් පහළ යෑමක් පෙන්නුම් කළේය. පෙට්‍රල් ඔක්ටේන් 92, පෙට්‍රල් ඔක්ටේන් 95, සුදු ඩීසල්, සුපිරි ඩීසල් සහ භූමිතෙල් ඇතුළු පිරිපහදු කළ ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදිතවල ගෝලීය මිල ගණන්හි සාමාන්‍යය 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 40-75 දක්වා පරාසය තුළ ඉහළ ගියේය. ගෝලීය බොරතෙල් මිල ගණන්වල ඉහළ යෑමේ ප්‍රවණතාවට අනුව, ලං.ඛ.නී.සං. විසින් ආනයනය කරන ලද බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය, 2021 වසර තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් 68.86ට සාපේක්ෂව, 2022 වසරේ දී එ.ජ. ඩොලර් 100.11ක් දක්වා සියයට 45.4කින් ඉහළ ගියේය.

ලං.ඛ.නී.සං.හි මූල්‍ය අලාභවලට විසඳුමක් ලෙස මෙන්ම, ඉල්ලුම් කළමනාකරණ උපාය මාර්ගයේ කොටසක් ලෙස, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ

3.2 රූප සටහන
ගෝලීය බොරතෙල් මිල ගණන්වල ප්‍රවණතා



මූලාශ්‍ර: බ්ලූම්බර්ග් තොරතුරු සේවය

සහයෝගීතාව ඇතිව ලං.ඛ.නී.සං. විසින් 2022 වසරේ මාර්තු මාසයේ සිට ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදිතවල මිල ගණන් අවස්ථා කිහිපයකදී සංශෝධනය කරන ලදී. ඒ අනුව, 2022 වසරේ මාර්තු, අප්‍රේල්, මැයි, ජූනි හා නොවැම්බර් මාසවල සහ 2023 වසරේ පෙබරවාරි මාසයේ දී ඛනිජ තෙල් නිෂ්පාදිතවල ගෝලීය මිල ගණන් ඉහළ යෑම හා අනුකූලව ලං.ඛ.නී.සං. විසින් අලෙවි කරන ලද ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය මිල ගණන් ඉහළ නංවන ලදී. එසේම, ගෝලීය වෙළඳපොළෙහි ඛනිජ තෙල් මිල ගණන් වල පහළ යෑම් හා අනුව යමින් 2022 වසරේ ජූලි, අගෝස්තු, ඔක්තෝබර් හා දෙසැම්බර් මාසවල සහ 2023 වසරේ ජනවාරි හා මාර්තු මාසවලදී ඛනිජ තෙල් මිල ගණන් අවස්ථා කිහිපයකදී පහළ දමන ලදී. තවද, සැලකිය යුතු මට්ටමේ සහනදායී මිලකට භූමිතෙල් අලෙවි කිරීමෙන් ලං.ඛ.නී.සං.ට සිදුව ඇති විශාල අලාභය අවම කර ගැනීම සඳහා 2022 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට ලං.ඛ.නී.සං. විසින් භූමිතෙල් සිල්ලර මිල ගණන් කැපී පෙනෙන ලෙස ඉහළ නංවන ලදී. ලං.ඛ.නී.සං.හි මෙම මිල සංශෝධන හා සමගාමීව ලංකා අයිඕසී පොදු සීමිත සමාගම (LIOC) විසින් ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය මිල ගණන් ලං.ඛ.නී.සං.වේ මිල ගණන් හා සමාන වන පරිදි අවස්ථා එකොළහක දී ඉහළ නංවන ලද අතර, අවස්ථා අටක දී මිල ගණන් පහළ දැමීය. මේ අතර, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී රජයේ ණය තොගයට එකතු කරන ලද ලං.ඛ.නී.සං.හි විදේශීය ණය තොගයට අදාළ ණය සේවාකරණ වගකීම් සපුරාලීම සඳහා 2023 වසරේ ජනවාරි මාසයේ 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, පිරිපහදු කළ ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයනය මත රජය ලීටරයකට රුපියල් 25.00ක නිෂ්පාදන බද්දක් පැනවීය. ඒ අනුව, 2023 වසරේ ජනවාරි මාසයේ 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙට්‍රල් ඔක්ටේන් 92 සහ පෙට්‍රල් ඔක්ටේන් 95 ලීටරයක් සඳහා වන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද රුපියල් 52.00ක් දක්වා ඉහළ නංවන ලද අතර, සුපිරි ඩීසල් සහ සුදු ඩීසල් ලීටරයක් සඳහා වන නිෂ්පාදන බද්ද, පිළිවෙළින්, රුපියල් 38.00ක් සහ රුපියල් 31.00ක් දක්වා වැඩි කිරීමත් සමඟ ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය මිල ගණන් ඉහළ ගියේය.

විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ ඉන්ධන ආනයන අඩුවීම, දේශීය ඛනිජ තෙල් නිෂ්පාදිතවල මිල ගණන් ඉහළ යෑම, ඇතැම් සීමාවන්ට යටත්ව ඉන්ධන

3.3 රූප සටහන
දේශීය ඛනිජ තෙල් මිල සංශෝධන
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව



මූලාශ්‍ර: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

3.4 රූප සටහන
දේශීය ඛනිජ තෙල් මිල සංශෝධන
ලංකා අයිඕසී පොදු සීමිත සමාගම



මූලාශ්‍ර: ලංකා අයිඕසී පොදු සීමිත සමාගම

3

නිකුත් කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම යනාදියෙහි ඒකාබද්ධ බලපෑම හේතුවෙන් 2022 වසර තුළ දී දේශීය වෙළඳපොළ තුළ ඛනිජ තෙල් නිෂ්පාදිතවල සමස්ත විකුණුම් පරිමාව පහළ යෑමක් වාර්තා කළේය. දේශීය වෙළඳපොළෙහි ඉන්ධන සැපයුම සහ ඉල්ලුම සුමට කිරීමේ අරමුණින් 2022 වසරේ අගෝස්තු මාසයේ සිට ඉන්ධන අවසර පත්‍ර ක්‍රමය මත පදනම්ව, ඉන්ධන සැපයීම ක්‍රියාත්මක කරමින් ඉල්ලුම් කළමනාකරණ උපාය මාර්ග හඳුන්වා දීමට රජය පියවර ගත්තේය. 2022 වසරේ දී, ලං.ඛ.නී.සං.හි විකුණුම් පරිමාව පහත වැටීමත් සමඟ සමස්ත ඛනිජ තෙල් අලෙවිය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 13.8ක පහළ යෑමක් වාර්තා කළ අතර, ලං.ඛ.නී.සං.හි ඉන්ධන සැපයුම අවහිර වීම මධ්‍යයේ සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ ලංකා අයිඕසී පොදු සීමිත සමාගමෙහි අලෙවි පරිමාව කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. ලං.ඛ.නී.සං.හි සමස්ත විකුණුම්වලින් සියයට 73ක් වූ ප්‍රවාහන අංශය වෙත අලෙවි කළ ඉන්ධන ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 17.1ක පහළ යෑමක් වාර්තා කළ අතර, ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2021 වසරේ දී අලෙවිය පහළ යෑමේ පදනම් බලපෑම පිළිබිඹු කරමින්, ගුවන් සේවා අංශය වෙත අලෙවි කළ ඉන්ධන ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 9.8ක වර්ධනයක් වාර්තා කළේය. විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය හේතුවෙන් ඉන්ධන සැපයුම සීමිත වීම මධ්‍යයේ අඛණ්ඩව සිදු කෙරුණු විදුලි කප්පාදුව සහ ජලාශවල පැවති හිතකර ජල මට්ටම් සමඟ වැඩි වශයෙන් ජලවිදුලි උත්පාදනය මත පදනම් වීමේ ප්‍රතිඵලයක් ලෙස සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ විදුලි උත්පාදන අංශයෙන් ඉන්ධන සඳහා වූ සමස්ත ඉල්ලුම පහත

3.5 රූප සටහන
ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය



මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයිඕසී පොදු සීමිත සමාගම

3.1 සංඛ්‍යා සටහන
ඛනිජ තෙල් අංශයේ ක්‍රියාකාරිත්වය

ශීර්ෂය		2021 (අ)	2022 (ආ)	වර්ධන අනුපාතය % 2021(අ)	2022(ආ)
ආනයනය කළ ප්‍රමාණය (මෙ.ටො. '000)					
බොරතෙල්		1,182	649	-29.1	-45.1
පිරිපහදු නිෂ්පාදිත		4,553	3,927	13.0	-13.8
ගල් අඟුරු		2,206	1,707	-15.1	-22.6
එල්.පී. ගෑස්		422	290	-3.3	-31.2
දේශීය එල්.පී. ගෑස් නිෂ්පාදනය (මෙ.ටො.'000)		17	6	-34.1	-65.8
ආනයන වටිනාකම (මි.ර.ගැ.)					
බොරතෙල්	(රු.මිලියන)	123,865	157,408	15.0	27.1
	(එ.ජ.ඩො. මිලියන)	625	484	7.2	-22.6
පිරිපහදු නිෂ්පාදිත	(රු. මිලියන)	564,681	1,294,311	75.5	129.2
	(එ.ජ.ඩො. මිලියන)	2,840	4,048	63.0	42.5
ගල් අඟුරු	(රු.මිලියන)	55,118	99,949	37.1	81.3
	(එ.ජ.ඩො. මිලියන)	278	365	27.8	31.3
එල්. පී. ගෑස්	(රු.මිලියන)	64,436	75,882	47.1	17.8
	(එ.ජ.ඩො. මිලියන)	324	234	37.2	-27.8
බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල (මි.ර.ගැ.)					
	(රු./බැරල්)	13,645	32,573	62.2	138.7
	(එ.ජ.ඩො./බැරල්)	68.86	100.11	51.1	45.4
ඛනිජ තෙල් ආශ්‍රිත අපනයන ප්‍රමාණය	(මෙ.ටො. '000)	853	641	7.0	-24.9
ඛනිජ තෙල් ආශ්‍රිත අපනයන වටිනාකම	(රු.මිලියන)	100,975	177,194	46.7	75.5
	(එ.ජ.ඩො. මිලියන)	506	568	35.6	12.2
දේශීය අලෙවිය - පිරිපහදු නිෂ්පාදිත (මෙ.ටො. '000)		4,447	3,833	-3.3	-13.8
ඉන්, පෙට්‍රල් (ඔක්ටේන් 92) (ඇ)		1,238	1,119	8.7	-9.6
පෙට්‍රල් (ඔක්ටේන් 95)		116	69	-3.5	-40.7
සුදු ඩීසල් (ඇ)		1,875	1,693	7.1	-9.7
සුපිරි ඩීසල්		75	78	8.2	5.0
භූමිතෙල්		185	98	5.6	-46.9
දැව්තෙල්		720	496	-25.8	-31.1
ගුවන්යානා ඉන්ධන		224	246	18.6	9.8
නැප්තා		11	32	-93.5	203.6
දේශීය අලෙවිය - එල්.පී. ගෑස් (මෙ.ටො. '000)		457	294	-3.3	-35.6
දේශීය මිල (වසර අවසානයේ දී) (රු./ලීටර)					
පෙට්‍රල් (ඔක්ටේන් 92)		177.00	370.00	29.2	109.0
පෙට්‍රල් (ඔක්ටේන් 95)		207.00	510.00	28.6	146.4
සුදු ඩීසල්		121.00	420.00	16.3	247.1
සුපිරි ඩීසල්		159.00	510.00	20.5	220.8
භූමිතෙල්		87.00	365.00	24.3	319.5
දැව්තෙල්					
තත්පර 800		110.00	320.00	57.1	190.9
තත්පර 1,500		110.00	320.00	57.1	190.9
එල්.පී. ගෑස් (රු./කි.ග්‍රෑම්)					
ලිට්‍රෝ ගෑස්		214.00	368.80	79.2	72.3
ලාෆ්ස් ගෑස්		227.20	424.00	90.2	86.6
ජාත්‍යන්තර බොරතෙල් මිල ගණන් (එ.ජ.ඩො./බැරල්)					
බ්‍රෙන්ට්		70.80	99.06	63.3	39.9
ඩබ්.ටී.අයි.		67.94	94.41	70.8	39.0
ඛනිජ තෙල් සහ අනෙකුත් ද්‍රව ඉන්ධන					
ලෝක සැපයුම (දිනකට බැරල් මිලියන)		95.7	99.9	1.9	4.3
ලෝක ඉල්ලුම (දිනකට බැරල් මිලියන)		97.1	99.4	5.6	2.4

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) XtraPremium Euro 3 ඇතුළත්ව
(ඈ) XtraMile ඩීසල් ඇතුළත්ව

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයිඕසී පොදු සීමිත සමාගම
ලංකා මැරින් සර්විසස් සමාගම
ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම
ලාෆ්ස් ගෑස් සමාගම
ශ්‍රී ලංකා රේගුව
බිලූම්බර්ග් තොරතුරු සේවය
එ.ජ. බලශක්ති තොරතුරු පරිපාලනය

වැටුණි. ඒ අනුව, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ බලශක්ති උත්පාදනය සඳහා වන ඉන්ධන අලෙවිය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.8ක පහළ යෑමක් වාර්තා කළේය.

විදේශ විනිමය හිඟය සමඟ විධිමත් ලෙස බොරතෙල් ආනයනය නොකිරීම නිසා සපුගස්කන්ද පිරිපහදුව නිරන්තරයෙන් වසා දැමීම හේතුවෙන්, 2022 වසරේ දී සමස්ත ඛනිජ තෙල් පිරිපහදු නිෂ්පාදනය සියයට 55.4ක කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා කළේය. 2022 වසර තුළ, පිරිපහදු කටයුතු සඳහා බොරතෙල් නොමැතිවීම හේතුවෙන් සපුගස්කන්ද පිරිපහදුව දින 225කට ආසන්න කාලයක් වසා දමා තිබුණි. ඒ අනුව, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ සමස්ත බොරතෙල් නිෂ්පාදනය සියයට 58.4කින් පහත වැටුණු අතර, ඩීසල්, පෙට්‍රල්, දැව් තෙල් සහ නැප්තා වැනි ප්‍රධාන නිෂ්පාදිතවල පිරිපහදු නිෂ්පාදනය, පිළිවෙළින්, සියයට 65.4කින්, සියයට 68.8කින්, සියයට 45.7කින් සහ සියයට 71.2කින් පහත වැටුණි.

2022 වසරේ දෙවන භාගයේ දී වැඩි වශයෙන් ක්‍රියාත්මක කරන ලද පිරිවැය පිළිබිඹු කෙරෙන මිල සංශෝධන මධ්‍යයේ වුවද, විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් සිදු වූ මූල්‍යමය අලාභ පදනම් කර ගනිමින් ලං.ඛ.නී.සං.හි මූල්‍ය කාර්යසාධනය 2022 වසරේ දී තවදුරටත් අයහපත් විය. ගෝලීය බොරතෙල් මිල ගණන්වල සැලකිය යුතු ඉහළ යෑම මධ්‍යයේ සිදුකරන ලද දේශීය මිල සංශෝධනවල බලපෑම කිසියම් දුරකට පිළිබිඹු කරමින්, විගණනය නොකළ තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, පෙර වසරේ රුපියල් බිලියන 41.3ක් වූ ලං.ඛ.නී.සං.වේ මෙහෙයුම් අලාභය, 2022 වසරේ දී රුපියල් බිලියන 6.2කට සීමා විය. 2022 වසරේ මාර්තු සිට මැයි දක්වා කාලසීමාව තුළ එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල නාමික වශයෙන් තියුණු ලෙස අවප්‍රමාණය වීමෙහි ප්‍රතිඵලයක් ලෙස ලං.ඛ.නී.සං.වේ විනිමය අනුපාත විචල්‍යතා අලාභය රුපියල් බිලියන 527.0ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් ලං.ඛ.නී.සං.හි මූල්‍යමය ක්‍රියාකාරිත්වයට අහිතකර බලපෑමක් සිදු වී ඇත. ඒ අනුව, 2021 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 81.8ක අලාභයට (බදු පෙර) සාපේක්ෂව 2022 වසර තුළ දී ලං.ඛ.නී.සං.වේ සමස්ත අලාභය රුපියල් බිලියන 615.1ක් විය. කෙසේ වෙතත්, පිරිවැය පිළිබිඹු කෙරෙන මිල සංශෝධන සහ විනිමය අනුපාතික විචල්‍යතාවන් ක්‍රමානුකූලව ස්ථාවර වීම හේතුවෙන් ලං.ඛ.නී.සං. 2022 වසරේ ජූලි මාසයේ සිට මාසික පදනම මත ලාභයක් (බදු පෙර) වාර්තා කළේය. මේ අතර, ලං.ඛ.නී.සං.හි මූල්‍ය ශක්‍යතාව වැඩිදියුණු කිරීමේ පියවරක් ලෙස, රජය විසින් සහතික කරන ලද එ.ජ. ඩොලර් බිලියන 2.5ක් වූ ලං.ඛ.නී.සං.හි විදේශ විනිමය ණය තොගය රාජ්‍ය ණය වගකීම් යටතට පැවරීමට රජය තීරණය කිරීමත් සමඟ, බැංකු ක්ෂේත්‍රය වෙත වූ ලං.ඛ.නී.සං.හි විදේශ මුදලින් නාමනය කරන ලද නොපියවූ ණය ප්‍රමාණය සහ ආනයන බිල්පත් 2021 වසරේ අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 3.4 සිට 2022 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 0.2ක් දක්වා අඩු විය. රාජ්‍ය ආයතනවලින් ලං.ඛ.නී.සං.ට අයවිය යුතු සමස්ත හිඟ ණය මුදල, 2021 වසර අවසානයේ සිට 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 220.3ක් දක්වා රුපියල් බිලියන 59.3කින් ඉහළ ගියේය. 2022 වසර අවසානයේ දී, ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) හා ශ්‍රීලංකන් ගුවන් සේවය වෙතින් අය විය යුතු හිඟ මුදල, ලං.ඛ.නී.සං. වෙත අය විය යුතු සමස්ත හිඟ මුදලින්, 2021 වසර අවසානයේ දී, වාර්තා වූ, පිළිවෙළින්, සියයට 38.6 සහ සියයට 51.5ට සාපේක්ෂව 2022 වසර අවසානයේ දී පිළිවෙළින්, සියයට 49.3ක් සහ සියයට 31.1ක් විය. විනිමය අනුපාතිකය තියුණු ලෙස අවප්‍රමාණය වීමට සමගාමීව, විනිමය අනුපාතික බලපෑම හා ගැළපීම හේතුවෙන් 2022 වසර තුළ ශ්‍රීලංකන් ගුවන් සේවය වෙතින් ලං.ඛ.නී.සං. වෙත අය විය යුතු හිඟ මුදලෙහි රුපියල් අගය කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය.

ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්තයේ කාර්යක්ෂමතාව සහ කාර්යසාධනය ඉහළ නැංවීම අරමුණු කරගත් යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් කිහිපයක් සහ නීති බලගැන්වීමේ ක්‍රියාමාර්ග 2022 වසරේ දී ක්‍රියාත්මක විය. ආර්ථික ක්‍රියාකාරිත්වය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරමින් ශ්‍රී ලංකාව මුහුණ දුන් පෙර නොවූ අන්දමේ ඉන්ධන අර්බුදය මධ්‍යයේ රට තුළ ඉන්ධන සැපයීම විධිමත් කිරීම සඳහා බොහෝ පාලන රීති හා සීමා ඉවත්කිරීමේ උපාය මාර්ග ක්‍රියාවට නංවන ලදී. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, දේශීය වෙළඳපොළ තුළ ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයනය, බෙදාහැරීම සහ විකිණීම සඳහා ශක්‍යතාවෙන් යුතු ව්‍යාපාර ආකෘතියක් ස්ථාපිත කිරීමට, ඛනිජ තෙල් නිෂ්පාදනය කරන රටවල ස්ථාපිත සමාගම් ඇතුළුව, නව ඉන්ධන සැපයුම්කරුවන්ගෙන් කැමැත්ත පළ කිරීමේ ලිපි කැඳවන ලදී. මෙම ක්‍රියාවලිය සඳහා සහාය සලසමින් 2022 වසරේ ඔක්තෝබර් මාසයේ 26 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2022 අංක 27 දරන ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත බලාත්මක කරන ලදී. 2022 වසර තුළ දී, මූල්‍යමය අවහිරතා

3

හේතුවෙන් ලං.ඛ.නී.සං.හි යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන්වලට බාධා ඇති වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එහි සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය මන්දගාමී විය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ කොටසක් ලෙස, ඉදිකෙරෙන නව ගුවන් යානා නවත්වන E කොටස සඳහා හයිඩ්‍රන්ට් ඉන්ධන සැපයුම් පද්ධතිය ස්ථාපනය කිරීම, ලං.ඛ.නී.සං.හි ඉන්ධන ගබඩා සංකීර්ණයෙහි පහසුකම් වැඩිදියුණු කිරීම සහ දැනට පවතින A, B සහ C යන ගුවන් යානා නවත්වන කොටස්වල හයිඩ්‍රන්ට් ඉන්ධන සැපයුම් පද්ධතිය වෙනස් කිරීම සහ නැවත සකස් කිරීම 2022 වසර තුළ දී ක්‍රියාත්මක විය. මේ අතර, ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීම සඳහා වන ගිවිසුම 2022 වසරේ ජනවාරි මාසයේ 06 වන දින ලං.ඛ.නී.සං., ලංකා අයිඕසී පොදු සීමිත සමාගම සහ ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් පුද්ගලික සමාගමෙහි (TPTL) සහභාගීත්වයෙන් යුතුව අත්සන් කරන ලදී. ඒ අනුව, 2022 වසරේ දී, ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් පුද්ගලික සමාගම විසින් එහි විෂය පථය යටතේ ඇති තෙල් ටැංකි 61 සංවර්ධනය කිරීමට අදාළව ක්‍රියාමාර්ග රාශියක් ගන්නා ලදී. මෙහිදී, ගබඩා ටැංකි 10කට අදාළව තත්ත්ව පරීක්ෂණයක් සහ සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනයක් 2022 වසරේ දී සිදු කරන ලදී. මෙම වසර තුළ දී, ත්‍රිකුණාමල තෙල් ගබඩා ටැංකි සංකීර්ණයේ ලං.ඛ.නී.සං. සතු ටැංකි 24 සංවර්ධනය කිරීම සඳහා ලං.ඛ.නී.සං. විසින් සංවර්ධන සැලැස්මක් සහ මූලික අදියරේ ඉඩම් එළිපෙහෙළි කිරීම හා ඉඩම් මැනීමේ කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සකස් කරන ලද අතර, ඊට අදාළව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම වසර තුළ දී සිදු විය. මේ අතර, අක්වෙරළ හයිඩ්‍රොකාබන් ගවේෂණය, සංවර්ධනය සහ නිෂ්පාදන කටයුතු සඳහා වන රජයේ නියාමන ආයතනය ලෙස, ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය (PDASL) ශ්‍රී ලංකාවේ උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය දියුණු කිරීමට අඛණ්ඩ ප්‍රයත්නයක් දැරීය. 2021 අංක 21 දරන ඛනිජ තෙල් සම්පත් පනත මගින් දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය අක්වෙරළ හයිඩ්‍රොකාබන් ගවේෂණ මෙහෙයුම් සඳහා වූ සිය කාර්යභාරය ශක්තිමත් කිරීමට කටයුතු කළේය. තවද, ජාත්‍යන්තර තෙල් නිධි සීමා නිර්ණය කිරීම් සහ වර්තමාන ප්‍රවණතා සමාලෝචනය කිරීමෙන් අනතුරුව, මන්නාරම, කාවේරි සහ ලංකා යන විශාල ද්‍රෝණි තුනක් ආවරණය වන ගවේෂණ බිම තුළ පවතින කුඩා ගවේෂණ බිම් 900කින් පමණ සමන්විත නව අක්වෙරළ හයිඩ්‍රොකාබන් ගවේෂණ බිම් සිතියමක් සකස් කර 2022 වසරේ ජූලි මාසයේ දී ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරන ලදී. අවස්ථා ගණනක දී සයිස්මික් ධ්වනි තරංග දත්ත විශ්ලේෂණය කර ඇති අතර, ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ගවේෂණය සඳහා පවතින ශක්‍යතාව පිළිබඳව විශේෂඥයින් විසින් රජයට මීට දශකයකට වැඩි කාලයක සිට පෙන්වා දී ඇත. කෙසේ වෙතත්, තවමත් එම ක්‍රියාවලියම නැවත නැවතත් සිදුවන අතර බලයට පත්වන රජයයන් විසින් ඊට අදාළ ප්‍රවර්ධන පිරිවැය දරා ඇත. ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ගවේෂණයට අදාළව, සත්‍ය ලෙස ගෑස් හෝ ඛනිජ තෙල් හයිඩ්‍රොකාබන් නිධිවලින් නිස්සාරණය කර ගැනීම තවමත් සිදුව නැත. එම නිසා, ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය විසින් ඵලදායී තෙල් ගවේෂකයකු සමඟ කටයුතු කරමින් ගෑස් හෝ ඛනිජ තෙල් ගවේෂණය නුදුරු අනාගතයේදීම ආරම්භ කිරීම සඳහා ඉලක්ක කරගත යුතුය.

ප්‍රධාන වශයෙන් 2022 වසරේ මුල් භාගය තුළ දී, විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය හේතුවෙන් රටෙහි එල්.පී. ගෑස් (ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව) සැපයුම වෙත දැඩි බාධා එල්ල වූ අතර, එය නාගරික සහ අර්ධ නාගරික ප්‍රජාවට විශාල වශයෙන් බලපෑම් ඇති කළේය. කෙසේ වෙතත්, ලෝක බැංකුව වෙතින් මූල්‍ය ආධාර ලැබීම සහ බැංකු පද්ධතිය තුළ විදේශ විනිමය ද්‍රවශීලතාවය ඉහළ නැංවීම සඳහා මහ බැංකුව ගනු ලැබූ ක්‍රියාමාර්ග මගින් එල්.පී. ගෑස් ආනයනය සඳහා පහසුකම් සැලසුණු අතර, එමගින් දේශීය වෙළඳපොළ තුළ එල්.පී. ගෑස් සැපයුම සාමාන්‍ය තත්ත්වයට පත් විය. දේශීය වශයෙන් එල්.පී. ගෑස් මිල ගණන් තීරණය කිරීම සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිල යාන්ත්‍රණයක් ක්‍රියාවට නැංවීමට 2022 වසරේ අගෝස්තු මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදෙන ලද අතර, ඒ අනුව, 2022 වසරේ අගෝස්තු මාසයේ සිට මෙම මිල යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම ආරම්භ විය. ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම විසින් 2022 වසරේ අප්‍රේල්, ජූලි, නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී සහ 2023 වසරේ පෙබරවාරි මාසයේ දී එල්.පී. ගෑස්වල දේශීය මිල ගණන් ඉහළ නංවන ලද අතර, ගෝලීය වශයෙන් මිල ගණන් පහළ යෑමත් සමඟ 2022 වසරේ අගෝස්තු, සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවලදී මෙන්ම, 2023 වසරේ ජනවාරි මාසයේ දී එල්.පී. ගෑස් මිල ගණන් පහත දැමීමට කටයුතු කරන ලදී. ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම අනුගමනය කරමින්, ලාෆ්ස් ගෑස් පොදු සීමිත සමාගම ද 2022 වසරේ මාර්තු හා ජූනි සහ 2023 වසරේ පෙබරවාරි යන මාසවලදී අවස්ථා තුනක දී දේශීය මිල ගණන් ඉහළ නැංවූ අතර, 2022 වසරේ අගෝස්තු හා ඔක්තෝබර් සහ 2023 වසරේ ජනවාරි යන මාසවලදී තෙවරක් මිල ගණන් පහළ දැමීමට කටයුතු කළේය.

තවද, 2023 වසරේ ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, එල්.පී. ගෑස් ආනයනය සඳහා වන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද ආනයන පිරිවැයෙන් සියයට 7.5ක සිට සියයට 2.5ක් දක්වා පහත දමන ලදී.

2022 වසරේ මැයි මාසයේ සිට දක්නට ලැබුණු මිල පහළ යෑම් මධ්‍යයේ වුවද, ගෝලීය බලශක්ති මිල ගණන්වල සමස්ත ප්‍රවණතාවයට සමගාමීව ගෝලීය වශයෙන් එල්.පී. ගෑස් මිල ගණන්හි සාමාන්‍යය 2022 වසර තුළ ඉහළ මට්ටමක පැවතුණි. ගෝලීය වෙළඳපොළෙහි, එල්.පී. ගෑස් මිල ගණන්වල සාමාන්‍යය (ප්‍රොපේන් හා බියුටේන් අනුපාතය 30:70 මත පදනම්ව), ගෝලීය බලශක්ති වෙළඳපොළෙහි සැපයුම් අවදානම් ඉහළ යෑම හේතුවෙන් 2022 වසරේ අප්‍රේල් මාසයේ දී, මෙට්‍රික් ටොන් එකකට එ.ජ ඩොලර් 954ක් දක්වා ඉහළ ගිය අතර, ගෝලීය පරිභෝජන ඉල්ලුම පහළ යෑම පිළිබිඹු කරමින් 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී මෙට්‍රික් ටොන් එකක මිල එ.ජ. ඩොලර් 650ක් දක්වා සියයට 31.9කින් පමණ පහත වැටුණි. කෙසේ වෙතත්, 2023 වසරේ පළමු කාර්තුව අවසානයේ දී ගෝලීය වශයෙන් එල්.පී. ගෑස් මෙට්‍රික් ටොන් එකක මිල ඩොලර් 700ට වඩා ඉහළ අගයක පැවතුණි.

විදුලිබලය

ප්‍රධාන වශයෙන් විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ, බලශක්ති උත්පාදනය සඳහා වන ඉන්ධන හා ගල් අඟුරු හිඟ වීම සහ ජලාශවල ජල මට්ටම් පහත වැටීම හේතුවෙන් 2022 වසරේ දී විදුලිය සැපයුමට බාධා ඇති විය. මේ හේතුවෙන් විදුලිබල ක්ෂේත්‍රය තුළ සැලකිය යුතු අන්දමේ ඉල්ලුම් කළමනාකරණ ක්‍රියාමාර්ග අවශ්‍ය වූ අතර, ආර්ථික ක්‍රියාකාරකම් මත දැඩි බලපෑම් ඇති කරමින්, විශේෂයෙන් ම මාර්තු සහ අප්‍රේල් මාසවල, දිගු කාලයක් පුරා විදුලිය විසන්ධි කිරීම සිදු විය. ඒ අනුව, 2022 වසරේ මුල් කාලයේ දී ජලාශවල ජල මට්ටම් පහළ යෑම මධ්‍යයේ ඉල්ලුම් කළමනාකරණ උපාය මාර්ගයක් ලෙස, ලං.වි.ම. විසින් 2022 වසරේ පෙබරවාරි මාසයේ සිට දෛනිකව විදුලිය කප්පාදු කිරීම සිදු කරන ලදී. වියළි කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ජලාශවල ජල මට්ටම් ශීඝ්‍ර ලෙස පහත වැටීම, ලං.වි.ම. මුහුණ දුන් මුදල් ප්‍රවාහ සපයා ගැනීමේ දුෂ්කරතා මධ්‍යයේ විදුලිය නිෂ්පාදනය සඳහා ඉන්ධන නොමැති වීම සහ රට තුළ පැවති විදේශ විනිමය පීඩනය හේතුවෙන් ඉන්ධන මිලදී ගැනීමේදී සිදු වූ ප්‍රමාදය පිළිබිඹු කරමින්, 2022 වසරේ අප්‍රේල් මාසය ආරම්භ වන විට විදුලිය සැපයීම විසන්ධි කිරීමේ කාලය දිනකට පැය 10ක් ඉක්මවා දීර්ඝ විය. 2022 වසරේ මැයි සිට සැප්තැම්බර් කාල සීමාව තුළ ලැබුණු ධාරානිපාත මෝසම් වර්ෂාව සමඟ විදුලි සැපයුම විශාල වශයෙන් ජල විදුලි උත්පාදනය මත පදනම් වූ අතර, එමගින් තාප ප්‍රභව මත වැඩි වශයෙන් රඳා පැවතීම සීමා විය. ඒ අනුව, ඉන්ධන හිඟය හේතුවෙන් තාප බලාගාර කිහිපයක් නිතර වසා දැමීම සහ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය තුළ කලින් සැලසුම් කළ නඩත්තු හා අළුත්වැඩියා කිරීම් සඳහා එම බලාගාරයේ ඇතැම් ඒකක වරින් වර වසා දැමීම සිදු කළද, යහපත් කාලගුණික තත්ත්වයන් සමග ජලාශ මට්ටම් හිතකර වීම හේතුවෙන් 2022 වසරේ මැයි මාසයේ සිට විදුලිබල සැපයුම විසන්ධි කිරීමේ කාලය ක්‍රමයෙන්, දිනකට පැයත් පැය තුනත් අතර කාලයකට පමණක් සීමා කරන ලදී. හිතකර ජලාශ මට්ටම් තිබියදීත්, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ සිට 2023 වසරේ අප්‍රේල් මාසය දක්වා ගල් අඟුරු ආනයනය කිරීමේ කාල සීමාව තුළ ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අවහිරතා හේතුවෙන් 2022 වසරේ අවසාන කාලය තුළ විදුලිය සැපයුමට අදාළව අවදානම් ඉහළ ගියේය. විදේශ විනිමය හිඟය, ලං.වි.ම.හි මුදල් ප්‍රවාහ ගැටලු සහ ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියේ ගැටලු හේතුවෙන් ගල් අඟුරු නැව්ගත කිරීම් ප්‍රමාද විය. 2022 වසරේ සැප්තැම්බර් මාසයේ සිට ගල් අඟුරු ආනයනය සඳහා අවශ්‍ය විදේශ විනිමය ලබා දීමට නිදන් අරමුදලක් (sinking fund) ස්ථාපිත කිරීම හරහා ගල් අඟුරු ප්‍රසම්පාදනය සඳහා මහ බැංකුව විසින් පහසුකම් සපයන ලද අතර, විදුලිය සැපයීමට අදාළ අවදානම් අවම කිරීම සඳහා ගල් අඟුරු ප්‍රසම්පාදනය විධිමත් කිරීමට බලධාරීන් විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලදී. කෙසේ වෙතත්, දේශීය වෙළඳපොළෙහි විදේශ විනිමය ද්‍රවශීලතාවය ක්‍රමානුකූලව වර්ධනය

3.6 රූප සටහන
විදුලිබල උත්පාදන සංයුතිය



මූලාශ්‍රය: ලංකා විදුලිබල මණ්ඩලය

වීමත් සමඟ මහ බැංකුව විසින් ගල් අඟුරු මිලදී ගැනීම සඳහා වන අරමුදල වෙනුවෙන් විදේශ විනිමය මිලදී ගැනීම 2023 වසරේ මුල් කාලයේ දී නවතා දැමීමට කටයුතු කරන ලදී.

තාප විදුලිබල උත්පාදනය සඳහා අවශ්‍ය ගල් අඟුරු සහ ඉන්ධන ආනයනය වෙත බාධා සිදු වීමේ ප්‍රතිඵලයක් ලෙස 2022 වසරේ දී සමස්ත විදුලිබල උත්පාදනය සියයට 4.6කින් පහළ යෑමක් වාර්තා කළේය. ඒ අනුව, සමස්ත විදුලිබල උත්පාදනය, 2021 වසරේ දී වාර්තා වූ ගි.වො.පැ. 16,716ට සාපේක්ෂව 2022 වසරේ දී ගි.වො.පැ. 15,942ක් දක්වා අඩු විය. 2021 වසරට සාපේක්ෂව මෙම වසර තුළ සමස්ත ජල විදුලිබල උත්පාදනය, ද්‍රව ඉන්ධන පදනම් කරගත් විදුලිබල උත්පාදනය සහ ගල් අඟුරු භාවිතයෙන් කෙරෙන විදුලිබල උත්පාදනය, පිළිවෙළින්, ගි.වො.පැ. 5,364ක්, ගි.වො.පැ. 2,467ක් සහ ගි.වො.පැ. 5,174ක් දක්වා, පිළිවෙළින්, සියයට 4.9කින්, සියයට 6.3කින් සහ සියයට 6.3කින් පහළ ගියේය. සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිතයෙන් සිදු කෙරෙන විදුලිබල උත්පාදනය, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ ගි.වො.පැ. 2,737ක් දක්වා සියයට 0.5ක සුළු වර්ධනයක් වාර්තා කළේය. වසර තුළ දී, මිල අධික තාප ප්‍රභවයන්ට සාපේක්ෂව අඩු වියදම් පුනර්ජනනීය ප්‍රභව මත වැඩි වශයෙන් පදනම් වීම පිළිබිඹු කරමින්, සමස්ත විදුලිබල උත්පාදන සංයුතිය සඳහා ජල විදුලිය, ද්‍රව ඉන්ධන, ගල් අඟුරු සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව භාවිතයෙන් සිදු කෙරෙන විදුලිබල උත්පාදන දායකත්වය, පිළිවෙළින්, සියයට 33.6ක්, සියයට 15.5ක්, සියයට 32.5ක් සහ සියයට 18.4ක් විය. මීට අමතරව, සමස්ත විදුලිබල උත්පාදනයට ලං.වි.ම.හි දායකත්වය සියයට 76.7ක් වූ අතර, ඉතිරිය ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගෙන් මිලදී ගන්නා ලදී. මේ අතර, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීමේදී සිදු වන සමස්ත විදුලිබල හානිය මුළු විදුලිබල උත්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 2021 වසරේ දී වාර්තා වූ සියයට 9.0ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 8.9ක් විය. වියළි කාලගුණික තත්ත්වය ආරම්භ වීමත් සමඟ ජලාශවල ජල මට්ටම ශීඝ්‍රයෙන් අඩු වීම හේතුවෙන් 2023 වසරේ මුල් කාලයේ සිට විදුලිබල උත්පාදනය ප්‍රධාන වශයෙන් තාප ප්‍රභව මත පදනම් විය.

විදුලිය කප්පාදු කිරීම සහ විදුලිය පරිභෝජනය කරන ප්‍රධාන කාණ්ඩවල ඉල්ලුම පහළ යෑම හේතුවෙන් 2022 වසරේ දී සමස්ත විදුලිබල අලෙවිය, ගි.වො.පැ. 14,520ක් දක්වා සියයට 4.6කින් පහළ ගියේය.

3.2 සංඛ්‍යා සටහන

විදුලිබල අංශයේ ක්‍රියාකාරිත්වය

ශීර්ෂය	2021 (අ)	2022 (ආ)	වර්ධන අනුපාතය ٪ 2021(අ)	2022(ආ)
ස්ථාපිත ධාරිතාව (මෙගාවොට්)	4,186	4,084	-1.9	-2.4
ජල විදුලිබලය (ඇ)	1,383	1,413	-	2.2
ද්‍රව ඉන්ධන (ඈ)	1,087	924	-14.3	-15.0
ගල් අඟුරු	900	900	-	-
සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (ඉ)	817	847	14.3	3.7
ජනනය කළ ඒකක (ගිගාවොට් පැය)	16,716	15,942	6.4	-4.6
ජල විදුලිබලය (ඇ)	5,640	5,364	44.2	-4.9
ද්‍රව ඉන්ධන (ඈ)	2,634	2,467	-37.0	-6.3
ගල් අඟුරු	5,519	5,174	-4.1	-6.3
සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (ඉ)	2,922	2,937	56.6	0.5
මුළු අලෙවිය (ලං.වි.ම.) (ගිගාවොට් පැය)	15,214	14,520	6.5	-4.6
ගෘහස්ථ සහ ආගමික	5,320	5,124	2.9	-3.7
කර්මාන්ත	4,822	4,334	15.8	-10.1
පොදු සේවා, හෝටල් සහ රාජ්‍ය අංශය	3,342	3,415	3.2	2.2
වීදි ආලෝක කිරීම	97	97	-9.8	-0.1
ලං.වි. සමාගම (LECO)	1,633	1,550	1.7	-5.1
ලං.වි. සමාගමේ විදුලි අලෙවියේ සංයුතිය (ගිගාවොට් පැය)	1,603	1,559	-1.3	-2.7
ගෘහස්ථ සහ ආගමික	717	699	-3.0	-2.6
කර්මාන්ත	306	266	9.6	-13.2
පොදු සේවා, හෝටල් සහ රාජ්‍ය අංශය	557	569	-4.5	2.2
වීදි ආලෝක කිරීම	23	26	3.4	10.7
ලං.වි.ම. සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ සමස්ත හානිය (٪)	9.0	8.9	-1.1	-0.7
පාරිභෝගිකයන් සංඛ්‍යාව ('000) (ඊ)	7,401	7,531	2.6	1.7
ඉන්, ගෘහස්ථ සහ ආගමික	6,411	6,509	2.2	1.5
කාර්මික	73	75	4.2	2.5
පොදු සේවා, හෝටල් සහ රාජ්‍ය අංශය	915	944	5.5	3.2

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සුළු පරිමාණ ජල විදුලි බලාගාර ඇතුළත් නොවේ
(ඈ) ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගෙන් මිල දී ගත් විදුලිබලය ද ඇතුළත්ය
(ඉ) සුළු පරිමාණ ජල විදුලිබලය ඇතුළත්ව
(ඊ) සී.ස. ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ පාරිභෝගිකයින් ද ඇතුළත්ව

මූලයන්: ලංකා විදුලිබල මණ්ඩලය
සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

කොවිඩ්-19 වසංගතයෙන් පසු ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීමත් සමඟ 2022 වසරේ මුල් කාලයේ දී විදුලිබල අලෙවියෙහි වර්ධනයක් පැවතියද, ඉන් අනතුරුව විදුලිය කප්පාදු කිරීම හේතුවෙන් විදුලි පරිභෝජන පරිමාව සැලකිය යුතු ලෙස අඩු විය. විදුලිබල සැපයුම සීමා කිරීමේ බලපෑම පිළිබිඹු කරමින්, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ ගෘහස්ථ, කර්මාන්ත, සහ රාජ්‍ය යන පරිභෝජන කාණ්ඩ වෙත සිදු කළ විදුලිබල අලෙවිය, පිළිවෙළින්, සියයට 3.7කින්, සියයට 10.1කින් සහ සියයට 8.3කින් පහළ ගියේය. මූලික වශයෙන් 2021 වසරේ දී පැවති පහළ සංඛ්‍යානමය

3.7 රූප සටහන

විදුලි බලය : සාමාන්‍ය පිරිවැය හා සාමාන්‍ය ගාස්තුව



මූලයඃ ලංකා විදුලිබල මණ්ඩලය

පදනම් බලපෑම හේතුවෙන් හෝටල් සහ පොදු සේවා යන අංශ වෙත සිදු කළ විදුලිබල අලෙවිය, පිළිවෙළින්, සියයට 11.7ක සහ සියයට 2.3ක වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, අති නවීන තාක්ෂණික ක්‍රම භාවිත කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, විදුලි පරිභෝජන මට්ටම් පිළිබඳව පරිශීලකයින් දැනුම්වත් කරන අතර ම, බලශක්ති භාවිතය පිළිබඳ නිවැරදි හා තත්කාලීන අලෙවි දත්ත රැස් කිරීම සඳහා ලං.වි.ම සුහුරු මනු කියවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළේය. කෙසේ වෙතත්, සුහුරු මනු කියවීමේ උපකරණවල අධික පිරිවැය, පරිශීලකයින් අතර පවතින දුර්වල දැනුම්වත්භාවය සහ තාක්ෂණික ගැටලු ඇතුළු කරුණු කිහිපයක් හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ ප්‍රගතියට බාධා ඇති විය. කාර්යක්ෂම මනු කියවීමේ ක්‍රමයක් සක්‍රීය කිරීම සහ බිල්පත් ක්‍රියා පටිපාටියේ ඇති ගැටලු අවම කිරීම සඳහා නිසි සැලකිල්ලක් දක්වමින්, ලං.වි.ම.හි මුදල් ප්‍රවාහය වැඩි දියුණු කර ගැනීම සඳහා තත්කාලීන පදනම්න් නිවැරදි දත්ත රැස් කිරීමට ලං.වි.ම. විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම වැදගත් වේ.

ලං.වි.ම.හි දුර්වල මූල්‍ය තත්ත්වය තවදුරටත් තීව්‍ර කරමින් ඉහළ ගිය විදුලි උත්පාදන පිරිවැය සැලකිල්ලට ගනිමින්, වසර අටකට වැඩි කාලයකට පසුව 2022 වසරේ දී විදුලිය ගාස්තු ඉහළ නංවන ලදී. 2022 වසරේ අගෝස්තු මාසයේ 10 වන දින, විදුලිය ගාස්තු සියයට 75ක සාමාන්‍යයකින් ඉහළ නංවන ලද අතර, අඩු ආදායම්ලාභී කුටුම්භවල බලශක්ති මිලදී ගැනීමේ හැකියාව සැලකිල්ලට ගනිමින්, අඩු පරිභෝජනයක් සහිත ඒකක 0-30 සහ ඒකක 31-60 කාණ්ඩ සඳහා ස්ථාවර ගාස්තුවලට අදාළව සහනයක් ලබා දෙන ලදී. කෙසේ වෙතත්, ලං.වි.ම.හි මූල්‍ය ප්‍රකාශන තුළින් පිළිබිඹු වන පරිදි මෙම ගාස්තු ඉහළ නංවමින් සිදුකරන ලද සංශෝධනවලින් අනතුරුව ද, ලං.වි.ම.හි ආදායම හා පිරිවැය සමාන වන මට්ටමක මූල්‍ය කාර්යසාධනයක් ලබා ගැනීමට නොහැකි වී ඇති අතර, එමගින් ලං.වි.ම.හි මූල්‍ය ශක්‍යතාව සහතික කිරීම සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිල සංශෝධන අබණ්ඩව සිදු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත. ඒ පිළිබඳව සලකා බලමින් ස්වයංක්‍රීය පිරිවැය ආවරණය වන ගාස්තු සංශෝධනයක් හරහා මාස හයකට වරක් ගාස්තු සංශෝධන කිරීමේ යාන්ත්‍රණයක් 2023 වසරේ සිට ස්ථාපිත කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, 2023 වසරේ පෙබරවාරි මාසයේ 15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විදුලිය ගාස්තු සාමාන්‍යය සියයට 66කින් පමණ නැවත ඉහළ නංවන ලදී. මෙම විදුලිය ගාස්තු සංශෝධනය යටතේ, ගෘහස්ථ විදුලි පාරිභෝගිකයින්ගෙන් සියයට 75කට වඩා වැඩි ප්‍රමාණයක් අයත් වන මසකට විදුලි ඒකක 0-90ත් අතර පරිභෝජන පරාසයක් තුළ සිටින ගෘහස්ථ පාරිභෝගික කාණ්ඩය සඳහා වන ස්ථාවර ගාස්තු සහ බලශක්ති ගාස්තු සැලකිය යුතු ලෙස ඉහළ නංවන ලදී. ඒ අනුව, ඒකක 90ට අඩුවෙන් පරිශීලනය කරන පාරිභෝගික කාණ්ඩ සඳහා විදුලි ඒකකයක මිල සියයට 160 සිට සියයට 275ක් දක්වා පරාසයකින් ඉහළ නංවා ඇත.

3.3 සංඛ්‍යා සටහන

සාමාන්‍ය විදුලිබල පිරිවැය සහ සාමාන්‍ය විදුලිබල ගාස්තු

ශීර්ෂය	2021 අවසානයට (අ)	2022 අවසානයට (ආ)	වර්ධන අනුපාතය (%) 2021(අ)	2022(ආ)
ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.)	**9.61**	**20.35**	**-7.1**	**111.8**
ජල විදුලිය	1.72	1.80	-26.2	4.7
දුව ඉන්ධන	32.03	67.69	10.4	111.3
ගල් අඟුරු	12.43	27.32	14.4	119.8
පොදුගලික අංශයේ සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.)	**21.67**	**32.04**	**-5.5**	**47.9**
දුව ඉන්ධන	30.35	69.65	10.2	129.5
සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව	16.22	14.98	-14.6	-7.6
සමස්ත සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.)				
උත්පාදන අවස්ථාවේ දී	12.38	23.01	-11.5	85.9
විකුණුම් අවස්ථාවේ දී	19.42	33.65	-10.4	73.3
සාමාන්‍ය ගාස්තුව (රු./කි.වො.පැ.)	**16.35**	**21.25**	**-2.2**	**30.0**
ගෘහස්ථ	14.91	19.11	0.3	28.2
පොදු සේවා	23.42	27.36	-2.0	16.8
රාජ්‍ය අංශය	18.25	23.84	1.1	30.6
කර්මාන්ත	14.70	20.63	-0.9	40.3
හෝටල්	17.79	21.39	-1.9	20.2

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයඃ ලංකා විදුලිබල මණ්ඩලය

3

තවද, භාවිත කරන ඒකක ප්‍රමාණයට අය කිරීම් කරන විදුලි සම්බන්ධතා වර්ගීකරණය අනුව, පොදු සේවා, හෝටල් සහ රජයේ අනෙකුත් අංශවල විදුලි ඒකකයක මිල සියයට 70 සිට සියයට 100ක් දක්වා පරාසයකින් ඉහළ නංවා ඇති අතර, විදුලි ගාස්තු පිළිබඳ නවතම සංශෝධනයේ දී කර්මාන්ත කාණ්ඩය යටතේ ඇති පාරිභෝගික කාණ්ඩවල විදුලි ඒකකයක මිල සියයට 25කින් ඉහළ ගොස් ඇත. විදුලි ගාස්තු ඉහළ නංවමින් නව සංශෝධන සිදු කළ ද, 2023 වසර සඳහා ලං.වි.ම.යේ ඇස්තමේන්තුගත සාමාන්‍ය විකුණුම් මිල වන, ඒකකයක් (කි.වොැ. 1ක්) සඳහා රුපියල් 48.74 හා සැසඳීමේදී සමහර විදුලි පරිභෝජන කණ්ඩායම් තවදුරටත් සහනාධාර මිල ප්‍රතිලාභ අත්විඳිමින් සිටී. කෙසේ වෙතත්, ලං.වි.ම. විස්තීර්ණ ලෙස ප්‍රතිව්‍යුහගත නොකර පාරිභෝගිකයින් සඳහා ප්‍රතිලාභ ලබා දිය නොහැක. විදුලිය ගාස්තු මිල ගණන් අඛණ්ඩව ඉහළ දැමීම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ ගොස් ඇති අතර, සමාජයේ සමහර කාණ්ඩවලට විදුලිය බිල්පත් සඳහා ගෙවීම් කිරීමට නොහැකි වීමත් සමඟ සමාජ නොසන්සුන්තාවක් නිර්මාණය විය. මේ සම්බන්ධයෙන් ගත්කල, සමහර පුද්ගලයින් හා ආයතන විසින් මේ දක්වා නොගෙවා ඇති හිඟ බිල්පත් අයකර ගතයුතු අතර, ගෙවීම් දීර්ඝ කාලීනව ප්‍රමාද වූ බිල්පත් සඳහා ගෙවීම් කඩිනම් කිරීම කළ යුතු වේ.

තාප විදුලිබල උත්පාදනයේ පිරිවැය ඉහළ ගියද, ජල විදුලි උත්පාදනය මත වැඩි වශයෙන් රඳා පැවතීම මෙන්ම විදුලි ගාස්තු ඉහළ නැංවීම, 2022 වසරේ දී ලං.වි.ම.හි මූල්‍ය කාර්යසාධනය වර්ධනය කිරීමට උපකාරී විය. ඒ අනුව, විදුලි ගාස්තු සංශෝධනයත් සමඟ මුදල් ප්‍රවාහය වර්ධනය වීම කිසියම් දුරකට හේතු කොට ගෙන, 2022 වසරේ අගෝස්තු මාසයේ සිට ලං.වි.ම.හි මෙහෙයුම් අලාභය තරමක් පහළ ගොස් ඇත. කෙසේ වෙතත්, සමුච්චිත පදනම මත, ලං.වි.ම. 2021 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 34.6ක අලාභය සමඟ සැසඳීමේදී 2022 වසරේ දී රුපියල් බිලියන 272.9ක අලාභයක් වාර්තා කළේය. නොරොච්චෝල ගල් අඟුරු බලාගාරයට අදාළව නොපියවා ඇති විදේශ ණය තොගයෙහි ප්‍රත්‍යාගණන අලාභ (revaluation loss) වලින් කොටසක්, එනම්, රුපියල් බිලියන 94.7ක් මෙම අලාභය තුළ ඇතුළත් කර ඇත. ලං.වි.ම. විසින් බැංකු අංශයෙන් ලබාගත් කෙටිකාලීන ණය සහ ලං.ඛ.නී.සං. හා ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් වෙත වූ නොපියවූ වගකීම් 2021 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 289.0ක සිට 2022 වසර අවසානයේ දී රුපියල් බිලියන 361.9ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීම් සඳහා වූ රුපියල් බිලියන 37.3ක මුදලක් 2021 වසර අග භාගයේ සිට ලං.වි.ම. විසින් නොපියවීම, බලශක්ති උත්පාදනය සඳහා පුනර්ජනනීය අංශයේ දායකත්වය පුළුල් කිරීමට බාධාවක්ව පැවතුණි. මේ අතර, රජය සතු ව්‍යාවසායන්හි මූල්‍ය ශක්‍යතාව ශක්තිමත් කිරීමට, එම ආයතනවල හඳුනාගත් වගකීම් රජයේ ශේෂ පත්‍රයට පැවරීම සඳහා වන රජයේ ක්‍රියාමාර්ග යටතේ, ව්‍යාපෘති හතක් යටතේ ලං.වි.ම. වෙත ලබා දුන් රුපියල් බිලියන 61.0ක ණය වගකීම් සහ නොරොච්චෝලේ ව්‍යාපෘතියෙහි රුපියල් බිලියන 85.6ක ණය සේවාකරණය රජය වෙත පැවරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දුන්නේය. එහි ප්‍රතිඵලයක් ලෙස, ලං.වි.ම.හි දිගු කාලීන වගකීම් 2021 වසර අවසානයේ වාර්තා වූ රුපියල් 541.2ක සිට 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 346.0ක් දක්වා අඩු විය. මෙම ක්‍රියාමාර්ග ඇතුළුව විධිමත් ලෙස පිරිවැය පිළිබිඹු කෙරෙන විදුලි ගාස්තු සංශෝධන සමඟින් ලං.වි.ම.යේ මුදල් ප්‍රවාහයේ සැලකිය යුතු දියුණුවක් අපේක්ෂා කරන අතර, එමඟින් රජයේ මුදල් ප්‍රවාහය සහ සමස්ත ආර්ථිකය මත ඇති පීඩනය අඩු කරමින් විදුලි ඉල්ලුම බාධාවකින් තොරව සපුරාලීමට හැකි වනු ඇත.

අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම අඛණ්ඩව ප්‍රමාද වීම හේතුවෙන් විදුලිබල හා බලශක්ති අංශයේ ඉහළ ගිය අවදානම් මඟින් 2022 වසරේ දී ඇතිකළ සැලකිය යුතු සමාජ ආර්ථික පිරිවැය හරහා රටේ බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ප්‍රතිසංස්කරණ කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි. රජයේ අයවැය මත වන පීඩනය අඩු කරමින් විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රය ආර්ථික වශයෙන් ශක්තිමත් අංශයක් බවට පත්කිරීමේ අරමුණින් යුතුව, රජය 2022 වසරේ දී ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාවට නැංවීය. 2022 වසරේ දී, මුදල් ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද, රජය සතු ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය හරහා ලං.වි.ම. ඇතුළු රජය සතු වාණිජ ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා පහසුකම් සැලසීමට අපේක්ෂා කෙරේ. මේ අතර, බලශක්ති ක්ෂේත්‍රය තිරසාර ලෙස සංවර්ධනය කිරීම සඳහා ලං.වි.ම.හි ප්‍රධාන මෙහෙයුම් වන විදුලි උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ අනෙකුත් කාර්යයන් විමධ්‍යගත කිරීම හරහා ලං.වි.ම. ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළු ප්‍රතිපත්ති සහ උපාය මාර්ග හඳුනාගැනීම, යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සහ තීරණ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම් ලබා දීමට 2022 වසරේ අගෝස්තු මාසයේ දී කැබිනට් අනුකමිටුවක් පත් කරන ලදී. ඒ අනුව, 'ඉදිරි

දශකය සඳහා ජාතික බලශක්ති විභවයන්, ක්‍රමෝපායයන් හා මාර්ග සිතියම' පිළිබඳ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව 2022 වසරේ අවසාන කාලයේ දී අනුමත කරන ලදී. මීට අමතරව, 2022-2041 වසර සඳහා වන විදුලිබල උත්පාදනය කිරීමේ දිගු කාලීන සැලැස්ම 2022 වසර තුළ දී සකස් කරන ලදී. එම සංවර්ධන සැලැස්මට අනුව, 2030 වසර වන විට සමස්ත විදුලිබල උත්පාදනයෙන් සියයට 70ක් පමණ පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් සිදු කිරීමට මෙන්ම 2050 වසර වන විට කාබන් විමෝචනය අඩු කිරීමටත්, එමගින් නව ගල් අඟුරු බලාගාර ඉදිකිරීම නතර කිරීම මෙන්ම පරිසරයට හානි සිදු නොවන පිරිසිදු බලශක්තිය සැපයීමත් අපේක්ෂා කෙරේ. යාවත්කාලීන කරන ලද 2023-2042 වසර සඳහා වන විදුලිබල උත්පාදනය කිරීමේ දිගු කාලීන සැලැස්ම රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව කෙටුම්පත් කර ඇති අතර, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, 2023 වසරේ පෙබරවාරි මාසයේ දී ඒ සඳහා අනුමැතිය හිමිවිය. මේ අතර, පුනර්ජනනීය බලශක්ති අංශයේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා කාර්ය පටිපාටියට අදාළ බාධා ඉවත් කරමින්, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කරන ලද අතර, 2022 අංක 16 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත 2022 ජුනි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී.

ඉදිරි කාලසීමාව තුළ, ඉහළ යන බලශක්ති ඉල්ලුම සපුරාලීම සඳහා බලශක්ති ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීම සහ බලශක්ති උත්පාදන ධාරිතාව පුළුල් කිරීම රජයේ ප්‍රධාන ප්‍රමුඛතාවයන් ලෙස පවතී. මන්දගාමීව වුවද, නව බලාගාර කිහිපයක් ඉදිකිරීමේ සැලසුම් සහ ව්‍යාපෘති මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. ගල් අඟුරු සහ ඉන්ධන මත පදනම් වූ සාම්ප්‍රදායික බලශක්ති උත්පාදනයේ ආර්ථික හා පාරිසරික ගැටලු සැලකිල්ලට ගෙන, ස්වභාවික ද්‍රවීකෘත වායුව වැනි නව බලශක්ති ප්‍රභවයන් ඇතුළත් කරමින් බලශක්ති සංයුතිය විවිධාංගීකරණය කිරීමට රජය තීරණය කර ඇත. ඒ අනුව, මෙ.වො. 300ක ධාරිතාවයකින් යුතු කෙරවලපිටිය සොබාදනවි ස්වභාවික ද්‍රවීකෘත වායු බලාගාරය ඉදිවෙමින් පවතින අතර, එය 2024 වසරේ දී ක්‍රියාත්මක කිරීමට නියමිතය. 2025 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත මෙ.වො. 300ක ධාරිතාවයකින් යුතු දෙවන ස්වභාවික ද්‍රවීකෘත වායු බලාගාරයක් කෙරවලපිටියේ ඉදිකිරීමේ මූලික කටයුතු ද මේ වන විට සිදුවෙමින් පවතී. 2023-2042 වසර සඳහා වන විදුලිබල උත්පාදනය කිරීමේ දිගු කාලීන සැලැස්මට අනුව, 2026 සහ 2027 යන වසරවලදී, පිළිවෙළින්, මෙ.වො. 100ක ධාරිතාවයකින් යුත් ගෑස් ටර්බයින බලාගාරයක් (තාප පදනම් වූ) සහ මෙ.වො. 200ක ධාරිතාවයකින් යුත් අභ්‍යන්තර දහන එන්ජින් බලාගාරයක් විදුලිබල පද්ධතියට එක් කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, 2023-2042 වසර සඳහා වන විදුලිබල උත්පාදනය කිරීමේ දිගු කාලීන සැලැස්ම අනුව, පැරණි තාප විදුලි බලාගාර කිහිපයක කාලසීමාව අවසන් වීමත් සමඟ රටෙහි ස්ථාපිත ධාරිතාව පුළුල් කිරීම සඳහා ඉදිරි වසරවලදී තාප විදුලි බලාගාර සහ ස්වභාවික ද්‍රවීකෘත වායු බලාගාර කිහිපයක් විදුලිබල පද්ධතියට එක් කෙරෙනු ඇත. මේ අතර, පද්ධති හානි (system losses) අවම කිරීම, බලශක්ති ප්‍රභවයන් වැඩි ප්‍රමාණයක් විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීම සහ පද්ධති විශ්වසනීයත්වය පවත්වා ගැනීම සඳහා, විවිධ ව්‍යාපෘති හරහා විදුලි සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ පද්ධතිය පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම සිදු කෙරෙමින් පවතී.

පාරිසරික, සමාජයීය සහ යහපාලනය යනාදියට අදාළ ගැටලු පිළිබඳ වාස්තවික විශ්ලේෂණ මත පදනම්ව, පිරිවැය අධික තාප බලශක්තිය මත රඳා පැවතීම අවම කිරීමේ අරමුණින් නව පුනර්ජනනීය බලශක්ති බලාගාර ඉදිකිරීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව, මෙ.වො. 35ක ධාරිතාවයකින් යුතු බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි බලාගාර ව්‍යාපෘතියෙහි මෙහෙයුම් කටයුතු 2022 වසර අවසානය වන විට ආරම්භ කිරීමට ආසන්නව පැවති අතර, අනෙකුත් ජල විදුලි බලාගාර ව්‍යාපෘති වන උමා ඔය (මෙ.වො. 120), මොරගොල්ල (මෙ.වො. 31), ගිං ගඟ (මෙ.වො. 20) සහ තල්පිටිගල (මෙ.වො. 15) යන ව්‍යාපෘති වල ඉදිකිරීම් කටයුතු 2022 වසරේ දී සිදු වෙමින් පැවතුණි. 2021 වසරේ මැද භාගය වන විට මෙ.වො. 100ක ධාරිතාවයකින් යුතු මහා පරිමාණ මන්නාරම සුළං විදුලි බලාගාරය විදුලිබල පද්ධතියට එකතු කිරීමෙන් අනතුරුව, දැනට පවතින මන්නාරම විදුලි බලාගාරයේ දිගුවක් ලෙස මෙ.වො. 50ක විදුලි ජනන ධාරිතාවක් සහිත සුළං බල උද්‍යානය සහ තවත් සුළං විදුලි බලාගාර දෙකක් (අදියර II සහ III යටතේ, එක් බලාගාරයක් සඳහා මෙ.වො. 100ක් බැගින් වූ ධාරිතාවයක් සහිත) ඇතුළුව නව සුළං විදුලි බලාගාර කිහිපයකට අදාළ ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතී. තවද, වේරවිල් සුළං විදුලිබල ව්‍යාපෘතිය (මෙ.වො. 200), කරච්චි සුළං විදුලිබල ව්‍යාපෘතිය (මෙ.වො. 100), පොන්නාලෙයි සුළං විදුලිබල ව්‍යාපෘතිය (මෙ.වො. 100) සහ මාන්තායි බටහිර සුළං විදුලිබල ව්‍යාපෘතිය (මෙ.වො. 100) ඇතුළු පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන

3

සැලැස්ම (2021-2026 වසර සඳහා) මගින් හඳුනාගත් ව්‍යාපෘති සුළං විභවය සහිත ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීම, මූලික අදියරයන්හි පවතී. බලශක්ති උද්‍යාන සංවර්ධන ව්‍යාපෘති යටතේ වන මෙ.වො. 233ක සුළං බල ධාරිතාවක් හා මෙ.වො. 150ක සූර්ය බල ධාරිතාවක් සහිත පුනරීන් පුනර්ජනනීය බලශක්ති උද්‍යාන ව්‍යාපෘතියට අදාළව මෙ.වො. 100ක සුළං බල ධාරිතාවක් ස්ථාපනය කිරීමේ මූලික සංවර්ධන කටයුතු 2022 වසරේ දී සිදු කරන ලදී. මෙ.වො. 100ක ධාරිතාවයකින් යුතු සියඹලාණ්ඩුව සූර්ය බලශක්ති ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු මෙම වසර තුළ ආරම්භ වූ අතර, මෙම විදුලි බලාගාරයේ සැලසුම් සඳහා භාවිත කරන දත්ත රැස් කිරීම සඳහා ව්‍යාපෘති ප්‍රදේශය තුළ කාලගුණික මධ්‍යස්ථානයක් පිහිටුවන ලදී. තවද, සූර්ය බලශක්ති ධාරිතාව පුළුල් කිරීම සඳහා හම්බන්තොට සහ ත්‍රිකුණාමලය ප්‍රදේශවල මහා පරිමාණ සූර්ය ව්‍යාපෘති ඉදිකිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයන් ආරම්භ කරන ලදී. සූර්ය බල සංග්‍රාමය ව්‍යාපෘතිය යටතේ, 2022 වසරේ දී වහල මත සූර්ය පැනල ස්ථාපිත කිරීම මගින් ජාතික විදුලිබල පද්ධතියට එකතු කළ විදුලිය ධාරිතාව මෙ.වො. 231ක් පමණ වූ අතර, සම්පූර්ණ ධාරිතාවය මෙ.වො. 32කින් යුතු ආරම්භ කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරන ලදී. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය යටතේ ආරම්භයේ සිටම සමස්තයක් ලෙස මෙ.වො. 670ක් පමණ ජාතික විදුලිබල පද්ධතියට එක් කර ඇත. එ.ජ. ඩොලර් මිලියන 100ක් වන ඉන්දියානු ණය ආධාර යටතේ රජයේ ගොඩනැගිලිවල වහල මත සූර්ය පැනල ස්ථාපිත කිරීම, අඩු ආදායම්ලාභී නිවාස ඒකක, ආගමික ස්ථාන සඳහා බලශක්ති ගබඩා පහසුකම් සහිත සූර්ය බල කට්ටල, සහ ප්‍රතිලෝම ඔස්මෝසිස් බලාගාර ස්ථාපිත කිරීම මෙන්ම, ජලාශ මත පාවෙන සූර්යබල පැනල සවිකිරීමේ නියමු ව්‍යාපෘතිය ඇතුළු ව්‍යාපෘති මගින් සූර්ය බලශක්ති ධාරිතාවට මෙ.වො. 135ක් එකතු කිරීම 2022 වසරේ දී ආරම්භ කරන ලදී. ඉන්දියාවෙන් ලැබුණු එ.ජ. ඩොලර් මිලියන 11ක ආධාර යටතේ යාපනයේ අනලයිතිව්, ඩෙල්ෆ් සහ නයිනතිව් යන දූපත්වල පුනර්ජනනීය ද්වි ප්‍රභව බලශක්ති පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම ව්‍යාපෘතියට සූර්ය, සුළං, ඩීසල් සහ ලිතියම්-අයන බැටරි මත පදනම් වූ ද්වි ප්‍රභව බලාගාර ඇතුළත් වන අතර, එම ව්‍යාපෘතිය 2024 වසරේ මුල් භාගය වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම කාල සීමාව තුළ පිරිවැය සඳහා වන පරාමිතීන්හි සිදු වූ කැපී පෙනෙන වෙනස්කම් සැලකිල්ලට ගනිමින්, පුනර්ජනනීය බලශක්ති අංශය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, 2012 වසරෙන් පසු ප්‍රථම වතාවට, ලං.වි.ම. විසින් පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීම් සඳහා අදාළ වන ගාස්තු 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සංශෝධනය කරන ලදී. මේ අතර, සූර්ය බලශක්ති උත්පාදනය ව්‍යාප්ත කිරීමට සහාය දැක්වීම සඳහා සූර්ය පැනල ස්ථිතික පරිවර්තක ආනයනය සඳහා අදාළ වන වරාය සහ ගුවන් තොටුපළ බදු 2023 වසරේ මුල් කාලයේ දී ඉවත් කරන ලදී. 2022 වසරේ දී පුනර්ජනනීය බලශක්ති අංශය සංවර්ධනය කිරීම සඳහා නොයෙකුත් ප්‍රයත්න දැරුවද, එම අංශය මුහුණදුන් දුෂ්කරතා රාශියක් හේතුවෙන් එහි ප්‍රගතියට බාධා ඇතිවිය. ප්‍රාග්ධන පිරිවැය සහ ආනයන වියදම් ඉහළ යෑම, කුඩා බලශක්ති නිෂ්පාදකයින්ට ගෙවීම් සිදු කිරීමේදී ඇති වූ ප්‍රමාදය, ජාතික විදුලිබල පද්ධතියේ පවතින ධාරිතා සංරෝධක යනාදී සාධක මගින්, රටේ පුනර්ජනනීය බලශක්ති අංශයේ ප්‍රසාරණය සඳහා අඛණ්ඩව බාධා සිදු කරන ලදී. මෙවැනි පසුබිමක් තුළ, රටේ බලශක්ති සුරක්ෂිතභාවය තිරසාර ලෙස සහතික කිරීම සඳහා පුනර්ජනනීය බලශක්ති අංශයේ ආයෝජන ප්‍රවර්ධනය සඳහා හිතකර පරිසරයක් ගොඩනැගීමේ දී විදුලිබල හා බලශක්ති අංශයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්නයන් අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය රට තුළ තිරසාර බලශක්ති සංවර්ධනය දිරිගැන්වීම සඳහා වන සිය ප්‍රයත්නයන් අඛණ්ඩව ඉදිරියට ගෙන ගියේය. බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, බලශක්ති නාස්තිය අවම කිරීම මගින් බලශක්ති සංරක්ෂණය දිරිගැන්වීම, හිතකර ප්‍රතිපත්ති සැකසීම, බලශක්ති තොරතුරු කළමනාකරණය සහ විශ්ලේෂණය, තිරසාර බලශක්ති ක්ෂේත්‍රය තුළ අවශ්‍ය ආයෝජන සහතික කිරීම සහ ශ්‍රී ලංකාව බලශක්තිය මූලික කරගත් සමාජ ක්‍රමයක් බවට පරිවර්තනය කිරීම යනාදී සෑම ආකාරයකම පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කිරීමේ කටයුතුවල ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය අඛණ්ඩව නිරත විය. බලශක්ති කළමනාකරණය හා සංරක්ෂණ වැඩසටහන්, සම්පත් හඳුනාගැනීමේ වැඩසටහන් හා ප්‍රතිපත්ති උපදේශන වැඩසටහන් මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලද අතර, බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීමේ අරමුණින් 2024-2029 වසර සඳහා වන පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම සංශෝධනය කිරීම ද 2022 වසරේ දී ආරම්භ කරන ලදී. 'ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණය සඳහා පුහුණු මධ්‍යස්ථාන (THREE Lanka) ව්‍යාපෘතිය' යුරෝපයේ හා ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල සහයෝගීතාවයෙන් යුතුව ක්‍රියාත්මක විය. යුරෝපා සංගමය, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව යටතේ, දැරිය හැකි පිරිවැයක් යටතේ පාරිසරික වශයෙන් හිතකර පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා අරමුදල් ලබා ගැනීමට හැකියාවක් පවතින අතර, එය සලකා

බලන රටවල් විසින් අනුගමනය කරන ක්‍රියාවලි සහ පිළිවෙත්වල පාරදෘශ්‍යභාවය අනුව තීරණය වේ. ශ්‍රී ලංකාව ද මෙවැනි ව්‍යාපෘති සඳහා කඩිනමින් ප්‍රවේශයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.

මාර්ග සංවර්ධනය

මුදල් ප්‍රවාහ පීඩන මධ්‍යයේ, දැඩි රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් පිළිබිඹු කරමින්, 2022 වසරේ රජයේ මාර්ග යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. අධිවේගී මාර්ග, මහාමාර්ග සහ මාර්ග නඩත්තු කිරීම, පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම, පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම සහ ස්වාභාවික විපත්වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හරහා මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් විවිධ ක්‍රියාකාරකම් සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය රුපියල් බිලියන 195.4ක් පමණ වැය කර ඇත. ඒ අනුව, මෙම වසර තුළ අධිවේගී මාර්ග සහ මහාමාර්ග සංවර්ධනය සඳහා දරන ලද වියදම, පිළිවෙළින්, රුපියල් බිලියන 34.4ක් සහ රුපියල් බිලියන 145.0ක් වූ අතර, පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම සඳහා රුපියල් බිලියන 6.6ක් වැය කර ඇත. වියදම් කපා හැරීමේ රජයේ ප්‍රයත්නයන් යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා ලබා දෙන වාර්ෂික අයවැය ප්‍රතිපාදන අවස්ථා ගණනාවකදී සංශෝධනය වුවද, 2022 වසර සඳහා දරන ලද වියදම වාර්ෂික ප්‍රතිපාදන යටතේ වෙන් කරන ලද රුපියල් බිලියන 247.8ට වඩා පහළ මට්ටමක පැවතුණි. මේ අතර, පසුගිය වසර කිහිපය තුළ මාර්ග ජාලය පුළුල් කිරීම සඳහා ආයෝජන අඩු මට්ටමක පැවතීම පිළිබිඹු කරමින්, 2020 වසරේ සිට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරනු ලැබූ A සහ B කාණ්ඩයේ ජාතික මහාමාර්ග සහ අධිවේගී මාර්ගවල සමස්ත දිග පෙර වසරට සාපේක්ෂව 2022 වසර අවසන් වන විට පිළිවෙලින් කිලෝමීටර් 12,225ක් හා කිලෝමීටර් 312.6ක් ලෙස පුළුල් වශයෙන් නොවෙනස්ව පැවතුණි.

අධිවේගී මාර්ග ජාලයේ සංවර්ධන කටයුතු මෙම වසර තුළ දී මන්දගාමී විය. බොහෝ දුරට රජයේ දැඩි මූල්‍ය දුෂ්කරතා හේතුවෙන්, කඩවත සිට දඹුල්ල දක්වා දිවෙන මධ්‍යම අධිවේගී මාර්ගයේ සමස්ත ඉදිකිරීම් කටයුතු 2022 වසරේ දී ඉතා සුළු ප්‍රගතියක් වාර්තා කළේය. කඩවත සිට මීරිගම දක්වා විහිදෙන අධිවේගී මාර්ග කොටසට අදාළ සිවිල් වැඩ කටයුතු වල සමුච්චිත ප්‍රගතිය 2021 වසර අවසානයේ පැවති සියයට 19.4 සිට 2022 වසර අවසානය වන විට සියයට 34.8ක් දක්වා වර්ධනය වී ඇත. මීට අමතරව, මීරිගම සිට කුරුණෑගල දක්වා විහිදෙන මධ්‍යම අධිවේගී මාර්ගයේ II කොටස 2022 වසරේ ජනවාරි මාසය මැද භාගයේ දී අවසන් කර මහජනතාව සඳහා විවෘත කරන ලදී. මේ අතර, කහතුඩුව සිට පැල්මඩුල්ල දක්වා දිවෙන රුවන්පුර අධිවේගී මාර්ගය යටතේ කහතුඩුව සිට ඉංගිරිය දක්වා කොටසේ ඉදිකිරීම් කටයුතු 2022 වසරේ දී මන්දගාමී වේගයකින් සිදු විය. තවද, මහාමාර්ග අමාත්‍යාංශයේ තීරණයට අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රුවන්පුර අධිවේගී මාර්ගයේ II සහ III අදියරවලට අදාළ ශක්‍යතා අධ්‍යයනය නැවත සමාලෝචනය කරන ලදී. අමුද්‍රව්‍ය හිඟය, යෙදවුම් පිරිවැය ඉහළ යෑම සහ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය වැනි බාධක හමුවේ වුවද, වරාය නගරය සහ ගාලු මුවදොර අධිවේගී මාර්ග ජාලයට සම්බන්ධ කරමින් කුළුණු මතින් දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් වසර පුරා අඛණ්ඩව සිදු වූ අතර, 2022 වසර අවසන් වන විට සියයට 54.3ක භෞතික ප්‍රගතියක් ලබා ඇත.

2022 වසරේ දී අධිවේගී මාර්ග තුළ ධාවනය කළ සමස්ත රථ වාහන සංඛ්‍යාව පහළ ගියේය. ඉන්ධන හිඟයේ බලපෑම පිළිබිඹු කරමින් දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොට්ටාව සිට ගොඩගම දක්වා සහ පාලටුව සිට මත්තල දක්වා දෛනිකව ධාවනය කළ රථ වාහන සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව, පිළිවෙළින්, 28,448ක් සහ 6,425 දක්වා, පිළිවෙළින්, සියයට 13.3කින් සහ සියයට 18.2කින් පහළ ගියේය. පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ දෛනිකව ධාවනය වූ රථ වාහන සංඛ්‍යාව ද 2021 වසරේ වාර්තා කළ 37,219ක සිට 28,291ක් දක්වා සියයට 24.0කින් පහළ ගියේය. මේ අතර, කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ දෛනිකව ධාවනය වූ රථ වාහන සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව, 2022 වසරේ දී සියයට 14.0කින් ඉහළ ගියේය. 2021 වසරට සාපේක්ෂව මෙම වසර තුළ දී, අධිවේගී මාර්ගවල ආදායම සියයට 10.1ක පහත වැටීමක් වාර්තා කරමින් රුපියල් බිලියන 7.9ක් පමණ දක්වා පහළ ගියේය. කෙසේ වෙතත්, මධ්‍යම අධිවේගී මාර්ගයේ අලුතින් විවෘත කරන ලද මීරිගම සිට කුරුණෑගල දක්වා කොටසෙහි දිනකට සාමාන්‍යයෙන් වාහන 9,106ක් පමණ ගමන් කිරීම සිදු වූ අතර, 2022 වසරේ දී එමගින් රුපියල් මිලියන 703.8ක ආදායමක් උපයා ඇත. එය, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ අධිවේගී මාර්ගවලින් ලැබුණු වාර්ෂික ආදායමේ සමස්ත අඩුවීම යම්තාක් දුරට පියවා ගැනීමට උපකාරී වී ඇත.

2022 වසර තුළ මාර්ග පද්ධති සහ පාලම් සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කටයුතු මන්දගාමීව සිදුවිය. මෙම වසර තුළ දී දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය

බොහෝ දුරට අවසන් කරන ලද අතර, බදුල්ල සිට චෙන්කලඩි දක්වා මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ලුණුගල - බිබිල කොටසේ මූලික වැඩ කටයුතු ආරම්භ කරන ලදී. ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ I අදියර සහ II අදියර, මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය සහ අන්තර් සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය ඇතුළු තවත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. 2022 වසරේ දී ජාතික මාර්ගවල ඇතැම් පාලම් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලද අතර, බාලදක්ෂ මාවත සහ ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත යා කෙරෙන ගුවන් පාලම්, විනිසුරු අක්බර් මාවතේ දුම්රිය හරස් මාර්ගය සහ උත්තරානන්ද මාවතේ දුම්රිය හරස් මාර්ගයට අදාළ ඉදිකිරීම් කටයුතු ද සිදු වෙමින් පැවතුණි.

මාර්ගස්ථ මගී ප්‍රවාහනය

ඉන්ධන හිඟය මෙන්ම ඉහළ ගිය පිරිවැය යටතේ වුවද, කොවිඩ්-19 ආශ්‍රිත අවදානම් පහළ යෑම හේතුවෙන් පුද්ගල සංචරණ කටයුතු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින්, 2022 වසරේ දී මාර්ගස්ථ මගී ප්‍රවාහන ක්‍රියාකාරකම් වැඩිදියුණු විය. ඒ අනුව, මෙම වසර තුළ දී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී ලං.ග.ම.) ධාවන කිලෝමීටර් ගණන සහ මගී කිලෝමීටර් ගණන, පෙර වසරට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 41.2කින් සහ සියයට 141.0කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2022 වසරේ දී ශ්‍රී ලං.ග.ම. සතු මුළු බස් රථ සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව 6,932ක් දක්වා සියයට 1.2කින් සුළු වශයෙන් අඩු වූ අතර, නව බස් රථ කිසිවක් ශ්‍රී ලං.ග.ම. යටතේ ධාවනයේ යොදවා නොතිබුණි. මෙම කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලං.ග.ම. මගින් ධාවනය කළ බස් රථ සංඛ්‍යාවෙහි සාමාන්‍යය 4,279ක් දක්වා සියයට 216.3කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, එම බස් රථ සංඛ්‍යාව ශ්‍රී ලං.ග.ම.යේ පොදු ප්‍රවාහන කටයුතු සඳහා ඵලදායී ලෙස යොදා ගත හැකි බස් රථ සංඛ්‍යාවෙන් සියයට 84.2ක් පමණ විය. මේ අතර, වසර තුළ දී පෞද්ගලික අංශයේ ධාවන කිලෝමීටර් ගණන සහ මගී කිලෝමීටර් ගණන ද, පිළිවෙළින්, සියයට 24.4කින් සහ සියයට 23.4කින් ඉහළ ගියේය. පෞද්ගලික අංශය මගින් ධාවනයේ යෙදවූ බස් රථ සංඛ්‍යාවෙහි සාමාන්‍යය 2021 වසරේ වාර්තා කළ බස් රථ 9,053ක සිට 2022 වසර අවසානයේ දී බස් රථ 9,807ක් දක්වා සියයට 8.3කින් ඉහළ ගියේය. 2022 වසර අවසානය වන විට, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් පෞද්ගලික අංශය වෙත පළාත් අතර බස් රථ ධාවනය සහ පළාත තුළ බස් රථ ධාවනය සඳහා ලබා දුන් බලපත්‍ර සංඛ්‍යාව, පිළිවෙළින්, 3,129ක් සහ 16,733ක් ලෙස වාර්තා විය.

ඉන්ධන මිල ගණන් ඉහළ යෑමෙන් අනතුරුව පොදු ප්‍රවාහන පහසුකම් සඳහා වන ඉල්ලුමෙහි ඇති වූ සැලකිය යුතු ඉහළ යෑම සපුරාලීම සඳහා පොදු ප්‍රවාහන අංශයේ දියුණුව මධ්‍යස්ථව පැවතුණි. 2022 වසර තුළ දී, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ප්‍රවාහන පහසුකම් අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා සිය දෛනික වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර, ජාතික ගමනාගමන කොමිෂන් සභාව මුහුණ දුන් මූල්‍ය අවහිරතා මධ්‍යයේ පොදු ප්‍රවාහනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම ඉලක්ක කරගත් ක්‍රියාමාර්ග කිහිපයක ප්‍රගතිය මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. ජාතික ගමනාගමන කොමිෂන් සභාව යටතේ ඇති විශේෂ බස් රථ සේවා වන 'සිසු සැරිය' සහ 'නිසි සැරිය' යන සේවා සඳහා, පිළිවෙළින්, නව සේවා 52ක් සහ 25ක් යෙදවීම තුළින් එම සේවා තවදුරටත් වැඩි දියුණු කරන ලදී. ඒ අනුව, 2022 වසර අවසන් වන විට 'සිසු සැරිය' යටතේ බස් රථ සේවා 1,617ක් ක්‍රියාත්මක වූ අතර, 'නිසි සැරිය' වැඩසටහන යටතේ බස් රථ සේවා 219ක් ක්‍රියාත්මක විය. මේ අතර, ඉන්ධන මිල ගණන් ඉහළ යෑම මධ්‍යයේ පෞද්ගලික පාසල් ප්‍රවාහන සේවාවල මිල ගණන් ඉහළ යෑමත් සමඟ, ඉහළ යන ඉල්ලුම සපුරාලමින්, පාසල් සිසුන්ට පහසුකම් සැලසීමේ නව වැඩසටහනක් ආරම්භ කරන ලදී. 'සිසු සැරිය' යටතේ නව සේවා සඳහා පහසුකම් සැලසීමට 2022 වසර සඳහා රජය විසින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, මෙම නව වැඩසටහන සහනාධාර මිලක් නොමැතිව, සාමාන්‍ය ගාස්තු යටතේ ක්‍රියාවට නැංවීය. 2022 වසරේ දී, ශ්‍රී ලං.ග.ම.හි සහයෝගය ඇතිව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා පෞද්ගලික මගී ප්‍රවාහන බස් රථ සහ පාසල් ප්‍රවාහන සේවා සඳහා ප්‍රමාණවත් පරිදි ඉන්ධන සැපයීමට ක්‍රියාමාර්ග ගණනාවක් ගනු ලැබීය. මේ අතර, ඉන්ධන හිඟයන් සහ ඉන්ධන මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යෑම මධ්‍යයේ පුද්ගලයන්ට රාජ්‍ය අංශයේ ප්‍රවාහන සේවා තෝරා ගැනීමට සිදු වීමත් සමඟ 2022 වසරේ දී පොදු ප්‍රවාහන පහසුකම් සඳහා ඇති ඉල්ලුමෙහි වර්ධනයක් දක්නට ලැබිණි. ඉන්ධන මිල ගණන් ඉහළ යෑම සහ බදු ප්‍රතිසංස්කරණ මධ්‍යයේ ආදායම් පහළ යෑම ආදිය හේතුවෙන් ඉදිරියේ දී පොදු ප්‍රවාහන පහසුකම් සඳහා ඇති ඉල්ලුම තවදුරටත් ඉහළ යා හැකිය.

මෙමගින් රටේ පොදු ප්‍රවාහන ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීම සඳහා ක්ෂණික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අවශ්‍ය බව පිළිබිඹු කෙරේ.

බොහෝ දුරට, දේශීය වශයෙන් සිදු කරන ලද ඉන්ධන මිල සංශෝධනයන්ට සමගාමීව, මෙම වසර තුළ දී බස් ගාස්තු අවස්ථා හතක දී සංශෝධනය කරන ලදී. ඒ අනුව, වසර තුළ දී බස් ගාස්තු සංශෝධනය කළ මුල් අවස්ථා පහ ඇතුළත අවම බස් ගාස්තුව රුපියල් 17.00 සිට රුපියල් 40.00 දක්වා වැඩි කරන ලදී. කෙසේ වෙතත්, අවසානයට සිදු කළ බස් ගාස්තු සංශෝධන ද්විත්වය මගින් 2022 වසර අවසන් වන විට අවම බස් ගාස්තුව රුපියල් 34.00ක් දක්වා අඩු කරන ලදී. සාමාන්‍ය, සුඛෝපබෝගී සහ අර්ධ සුඛෝපභෝගී බස් සේවාවල ගාස්තු වසර තුළ දෙගුණයකින් පමණ ඉහළ ගියේය. වසර තුළ දී, ඉන්ධන මිල ගණන් ඉහළ යෑමට සමගාමීව 'සිසු සැරිය', 'නිසි සැරිය' සහ 'ගැමි සැරිය' යන සේවාවල බස් ගාස්තු, පිළිවෙළින්, සියයට 135.1කින්, සියයට 136.8කින් සහ සියයට 134.2කින්, ඉහළ නංවා ඇති අතර, නව ගාස්තු, පිළිවෙළින්, රුපියල් 134.00ක්, රුපියල් 45.00ක්, සහ රුපියල් 89.00ක් ලෙස සටහන් වේ.

ආදායම් අංශයේ හිතකර වර්ධනයන් පැවතියද, 2022 වසර තුළ දී ශ්‍රී ලං.ග.ම.යේ මූල්‍ය කාර්යසාධනය අබණ්ඩව දුර්වල මට්ටමක පැවතුණි. අවස්ථා කිහිපයකදී බස් ගාස්තු සංශෝධනය කිරීම හේතුවෙන් වසර තුළ දී ශ්‍රී ලං.ග.ම.යේ ආදායමේ යම් හිතකර දියුණුවක් දක්නට ලැබුණද, එමගින් ඇති වූ බලපෑම අභිබවමින් ඉන්ධන මිල ගණන් ඉහළ යෑම මධ්‍යයේ වියදම් කැපී පෙනෙන ලෙස වැඩි විය. විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ශ්‍රී ලං.ග.ම.හි සමස්ත ආදායම 2022 වසරේ දී රුපියල් බිලියන 69.3ක් දක්වා සියයට 147.0කින් ඉහළ ගිය අතර, සමස්ත වියදම ද රුපියල් බිලියන 69.5ක් දක්වා සියයට 123.7කින් පමණ වැඩි විය. ශ්‍රී ලං.ග.ම. පසුගිය වසරේ වාර්තා කළ රුපියල් බිලියන 3.1ක මෙහෙයුම් අලාභයට සාපේක්ෂව, 2022 වසරේ දී රුපියල් බිලියන 0.3ක මෙහෙයුම් අලාභයක් වාර්තා කළේය. බස් ගාස්තු කැපී පෙනෙන ලෙස ඉහළ යෑම හමුවේ, වාර ප්‍රවේශපත්‍ර සඳහා ඇති ඉල්ලුමේ සැලකිය යුතු වැඩි වීමක් වාර්තා විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සිසුන් සඳහා සහනාධාර වාර ප්‍රවේශපත්‍ර සඳහා පහසුකම් සැලසීමට රජය විසින් සපයනු ලබන සහනාධාරය 2021 වසරේ දී පැවති රුපියල් බිලියන 5.3 සිට 2022 වසරේ දී රුපියල් බිලියන 6.1ක් දක්වා ඉහළ ගිය නමුත්, ආර්ථික වශයෙන් ප්‍රතිලාභ නොලැබෙන මාර්ගවල ප්‍රවාහන සේවා යෙදවීමට රජය විසින් ලබාදුන් සහනාධාර මුදල 2021 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 5.3ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 2.7ක් විය. 2023 වසරේ මුල් කාලයේ දී, ඉන්දියානු ණය ආධාර යටතේ ලැබුණු නව බස් රථ 125කින් බස්රථ 75ක්, ශ්‍රී ලං.ග.ම. විසින් ප්‍රාදේශීය ඩිපෝ අතර බෙදාහරින ලද අතර, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ බස් රථ 50ක් ලියාපදිංචි කරන ලදී. ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ශ්‍රී ලං.ග.ම. සමඟ එක්ව මගීන්ගේ පහසුව සඳහා පෙරගෙවුම් කාඩ්පත් නිකුත් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළ අතර, 2023 වසරේ පෙබරවාරි මාසයේ දී කොට්ටාව මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ සිට ගාල්ල දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගයේ ධාවනය වන පෞද්ගලික බස් රථවල ඊට අදාළ නවතම නියමු ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය මාර්ගස්ථ මගී අංශය තුළ සාර්ථක

3.4 සංඛ්‍යා සටහන
රථවාහන නව ලියාපදිංචි කිරීම

ශීර්ෂය	2021	2022 (අ)	වර්ධන අනුපාතය %	
			2021	2022 (අ)
රථවාහන නව ලියාපදිංචි කිරීම (සංඛ්‍යාව)	**33,850**	**20,510**	**-83.3**	**-39.4**
බස් රථ	281	404	-51.4	43.8
මෝටර් රථ	3,495	1,489	-83.4	-57.4
ත්‍රිරෝද රථ	2,093	36	-70.7	-98.3
ද්විත්ව කාර්ය වාහන	771	760	-91.9	-1.4
යතුරු පැදි	8,011	9,060	-94.7	13.1
භාණ්ඩ ප්‍රවාහන වාහන	4,432	1,832	12.5	-58.7
ඉඩම් වාහන	14,764	6,929	77.8	-53.1
රෝද හතරේ සයිකල් සහ මෝටර් නිවාස	3	-	-99.4	-

(අ) තාවකාලික

මූලයඃ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

3.8 රූප සටහන
රථවාහන නව ලියාපදිංචිය



මූලයඃ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

3

3.5 සංඛ්‍යා සටහන

ගමනාගමන අංශයේ රජය සතු ව්‍යවසායවල මූලික ලක්ෂණ

ශීර්ෂය	2021 (අ)	2022 (ආ)	වර්ධන අනුපාතය % 2021 (අ)	2022 (ආ)
2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය				
ධාවන කිලෝමීටර් (මිලියන)	248	350	-19.7	41.2
මගී කිලෝමීටර් (මිලියන)	6,225	15,000	-27.8	141.0
මුළු ආදායම (රු. මිලියන)	28,035	69,258	-10.2	147.0
මෙහෙයුම් වියදම (රු. මිලියන)	31,089	69,545	-7.0	123.7
මෙහෙයුම් ලාභය (+)/ අලාභය (-) (රු. මිලියන)	-3,054	-287	-38.6	90.6
3. ශ්‍රී ලංකා දුම්රිය සේවය				
ධාවන කිලෝමීටර් ('000)	6,281	10,510	-21.4	67.3
මගී කිලෝමීටර් (මිලියන)	2,158	6,602	-44.7	205.9
භාණ්ඩ ටොන් කිලෝමීටර් (මිලියන)	162	139	41.3	-14.2
මුළු ආදායම (රු. මිලියන)	2,679	11,076	-41.3	313.5
මෙහෙයුම් වියදම (රු. මිලියන)	12,979	23,513	-11.2	81.2
මෙහෙයුම් ලාභය (+)/ අලාභය (-) (රු. මිලියන)	-10,300	-12,437	-2.5	-20.7
4. ශ්‍රීලංකන් ගුවන් සේවය				
පියාසර කරන ලද පැය ගණන	50,287	84,325	20.9	67.7
මගී කිලෝමීටර් ප්‍රමාණය (මිලියන)	2,868	11,042	-21.2	285.0
මගී ආසන පිරීමේ අනුපාතය (%)	36	74	-36.0	106.8
බර පැටවීමේ අනුපාතය (%)	74	64	19.6	-13.8
භාණ්ඩ ප්‍රවාහනය (මෙ.ටො. '000)	93	88	66.0	-5.4
සේවා නියුක්තිය (සංඛ්‍යාව)	5,732	5,572	-11.7	-2.8

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා දුම්රිය සේවය
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

ලෙස ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව, දුම්රිය මගීන් සඳහා ද හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ දී, අභ්‍යන්තර දහන එන්ජින්වලින් සමන්විත ත්‍රිරෝද රථ සහ යතුරුපැදි විද්‍යුත්කරණයට අදාළ මූලික කටයුතු ද ආරම්භ කරන ලදී.

2020 වසරේ සිට බල පැවැත්වෙන මෝටර් රථ ආනයන සීමා හේතුවෙන් 2022 වසරේ දී අඛණ්ඩව තුන්වන වසර සඳහාත් නව මෝටර් රථ ලියාපදිංචියෙහි කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා විය. ඒ අනුව, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ මෝටර් රථ, ත්‍රිරෝද රථ, භාණ්ඩ ප්‍රවාහන වාහන සහ ඉඩම් වාහන ලියාපදිංචි කිරීම්හි පහළ යෑම බොහෝ දුරට පිළිබිඹු කරමින්, 2022 වසරේ දී නව මෝටර් රථ ලියාපදිංචිය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 39.4කින් පහළ ගියේය. කෙසේ වෙතත්, 2021 වසරට සාපේක්ෂව, මෙම වසරේ දී යතුරුපැදි සහ බස් රථ ලියාපදිංචිය, පිළිවෙළින්, සියයට 13.1කින් සහ සියයට 43.8කින් ඉහළ ගියේය.

දුම්රිය ප්‍රවාහනය

කොවිඩ්-19 වසංගතයෙන් අනතුරුව පුද්ගල සංචරණ කටයුතු ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් වීම පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී ලං.දු.සේ.) 2022 වසර තුළ මධ්‍යස්ථ මෙහෙයුම් වර්ධනයක් වාර්තා කළේය. ශ්‍රී ලං.දු.සේ.හි ඇස්තමේන්තුගත සමස්ත ධාවන කිලෝමීටර් ගණන සහ මගී කිලෝමීටර් ගණන, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, සියයට 67.3කින් සහ සියයට 205.9කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, භාණ්ඩ කිලෝමීටර් ගණන, පෙර වසරේ වාර්තා වූ මෙ.ටො. මිලියන 161.6 හා සැසඳීමේදී සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී මෙ.ටො. මිලියන 138.7ක් දක්වා සියයට 14.2ක පහළ යෑමක් වාර්තා කළේය.

ශ්‍රී ලං.දු.සේ.හි මූල්‍ය කාර්යසාධනය 2022 වසරේ දී පහළ මට්ටමක පැවතුණි. තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ශ්‍රී ලං.දු.සේ. 2021 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 10.3ක මෙහෙයුම් අලාභය හා සැසඳීමේ දී, 2022 වසර තුළ දී රුපියල් බිලියන 12.4ක මෙහෙයුම් අලාභයක් වාර්තා විය. ශ්‍රී ලං.දු.සේ.හි සමස්ත ආදායම, පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 11.1ක් දක්වා රුපියල් බිලියන 8.4කින් ඉහළ ගියේය. මේ සඳහා මූලික වශයෙන් 2022 වසරේ ජූලි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි දුම්රිය ගාස්තු ඉහළ නැංවීමේ ප්‍රතිඵලයක් ලෙස මගී ප්‍රවාහන කටයුතුවලින් උපයාගත් ආදායම වර්ධනය වීම හේතු විය. මේ අතර, මූලික වශයෙන් වසර තුළ දී ඉන්ධන මිල ගණන් ඉහළ යෑමත් සමග පුනරාවර්තන වියදම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ දී ශ්‍රී ලං.දු.සේ.හි සමස්ත වියදම රුපියල් බිලියන 42.5ක් දක්වා රුපියල් බිලියන 2.1කින් ඉහළ ගියේය. වසර තුළ පුනරාවර්තන වියදම් රුපියල් බිලියන 23.5ක් දක්වා සියයට 81.2කින් ඉහළ ගිය අතර, ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 19.0ක් දක්වා සියයට 30.7කින් පහළ ගියේය. ඉන්ධන මිල ගණන් ඉහළ යෑමට සමගාමීව, මගීන්, භාණ්ඩ සහ තැපැල් ප්‍රවාහනය සඳහා වන දුම්රිය ගාස්තු, වසර හතරකට පමණ පසු, 2022 වසරේ ජූලි මාසයේ 12 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහළ නංවන ලදී.

ශ්‍රී ලං.දු.සේ. විසින් මගී සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා බාධාවකින් තොරව ප්‍රවාහන පහසුකම් ලබා දීම සහතික කිරීමට යටිතල පහසුකම් සහ සේවා සංවර්ධනය කිරීමේ කටයුතු මධ්‍යස්ථ වේගයකින් වුවද, සිදු කරන ලදී. කෙසේ වෙතත්, මූල්‍යමය අවහිරතා හේතුවෙන් දුම්රිය මාර්ග පද්ධති, දුම්රිය ඒකක සහ දුම්රිය සංඥා හා විදුලි සංදේශ සේවාවලට

අදාළ සියලුම නඩත්තු කටයුතු සහ වැඩිදියුණු කිරීම් මන්දගාමී වේගයකින් සිදු විය. 2022 වසරේ අගෝස්තු මාසයේ දී ශ්‍රී ලං.දු.සේ. විසින් කොළඹ සහ බදුල්ල අතර ධාවනය වන 'ඇල්ල ඔඩිසි' (Ella Odyssey) නගරාන්තර අධි සුඛෝපභෝගී දුම්රිය හඳුන්වා දුන් අතර, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මගීන් හට ඉතා සුවපහසු මෙන්ම ලෝකයේ වඩාත්ම දර්ශනීය දුම්රිය ගමනක අත්දැකීමක් ලබා දීමට එමගින් කටයුතු කෙරිණි. මගී දුම්රිය මැදිරි 100ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, 2022 වසර අවසානයේ දී දුම්රිය මැදිරි 50ක් නැවත ධාවනයට මුදා හරින ලදී. මීට අමතරව, 2017 වසරේ දී ලබා දුන් ඉන්දීය ණය ආධාර යටතේ මගී දුම්රිය මැදිරි 160ක් මිලදී ගැනීමේ කටයුතු මෙම වසර තුළ දී අවසන් කරන ලදී. මේ අතර, දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම, දුම්රිය ස්ථාන සහ පාලම් නඩත්තු කිරීම, දුම්රිය වේදිකා පුළුල් කිරීම, දුම්රිය සංඥා හා විදුලි සංදේශ පද්ධති සැපයීමට අදාළ ව්‍යාපෘති කිහිපයක් වසර තුළ දී ක්‍රියාත්මක විය.

සිවිල් ගුවන් සේවය

කොවිඩ්-19 වසංගතයෙන් අනතුරුව ලෝකය යථා තත්ත්වයට පත්වීමත් සමඟ ගෝලීය සංචාරක කටයුතු ක්‍රමයෙන් ප්‍රකෘතිමත් වීම හේතුවෙන් 2022 වසරේ දී සිවිල් ගුවන් සේවා අංශයේ ක්‍රියාකාරිත්වය වර්ධනය විය. ඒ අනුව, ගෝලීය සංචාරක කටයුතු යළි ආරම්භ වීම මෙන්ම, 2021 වසරේ දී පහළ පදනම් අගය හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය බලපෑමේ සහාය බොහෝදුරට හේතු කොටගෙන, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 266.8ක වර්ධනයක් වාර්තා කරමින්, 2022 වසරේ දී මගී පැමිණීම් සංඛ්‍යාව මිලියන 5.5ක්

3.9 රූප සටහන
ගුවන් මගී හා ගුවන් භාණ්ඩ හැසිරවීම්



මූලය: ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

3.6 සංඛ්‍යා සටහන
ගුවන් සේවා අංශයේ ක්‍රියාකාරිත්වය

ශීර්ෂය	2021 (අ)	2022 (ආ)	වර්ධන අනුපාතය % 2021(අ)	2022(ආ)
1. මගීන් (ගණන) (ඇ)	**1,500,078**	**5,502,539**	**-36.8**	**266.8**
ශ්‍රීලංකන් ගුවන් සේවය	857,158	3,295,841	-30.8	284.5
විදේශ ගුවන් සේවා	642,920	2,206,698	-43.4	243.2
2. භාණ්ඩ ප්‍රවාහනය (මෙ.ටො)	**184,139**	**166,969**	**35.3**	**-9.3**
ශ්‍රීලංකන් ගුවන් සේවය	93,195	88,170	66.0	-5.4
විදේශ ගුවන් සේවා	90,944	78,799	13.8	-13.4
3. ගුවන්යානා ගමනාගමනය (ගණන) (ඇ)	**25,090**	**42,196**	**-1.9**	**68.2**
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ	24,336	41,547	-2.4	70.7
මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ	722	266	43.0	-63.2
යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොළ	32	383	-77.1	1,096.9

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සංක්‍රමණික මගීන් ඇතුළත් නොවේ
(ඈ) දේශීය ගුවන් ගමන් ඇතුළත් වේ

මූලය: ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

දක්වා ඉහළ ගියේය. වසර තුළ දී, භාණ්ඩ මෙහෙයුම් මෙ.ටො. 166,969ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 9.3කින් අඩු විය. 2022 වසර අවසානය වන විට ජාත්‍යන්තර ගුවන් සේවා 33ක් සහ අභ්‍යන්තර ගුවන් සේවා පහක් රට තුළ ක්‍රියාත්මක විය. වසර තුළ දී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ හරහා සිදු වූ ගුවන් යානා හැසිරවීම් සංඛ්‍යාව 41,547ක් දක්වා සියයට 70.7කින් සැලකිය යුතු ලෙස ඉහළ යෑමත් සමඟ, සමස්ත ගුවන් යානා හැසිරවීම් සංඛ්‍යාව 42,196ක් දක්වා සියයට 68.2කින් ඉහළ ගියේය. සංචාරක ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රුසියාව, උස්බෙකිස්තානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ තායිලන්තය යන රටවලින් නව ගුවන් සේවා සමාගම් මෙරටට ආකර්ෂණය කර ගැනීමට රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, එයාර් ෆ්‍රාන්ස්, ස්විස් ඉන්ටර්නැෂනල් එයාර් ලයින්, එලායන්ස් එයාර් ඇතුළු ජාත්‍යන්තර ගුවන් සේවා සමාගම් කිහිපයක මෙහෙයුම් ශ්‍රී ලංකාව තුළ නැවත ආරම්භ කරන ලදී. දේශීය ගුවන් මගී ප්‍රවාහන කටයුතු ද 2022 වසරේ දී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. විශේෂයෙන් ම 2022 වසරේ මැද භාගයේ දී දේශීය වශයෙන් පැවති ඉන්ධන හිඟය හේතුවෙන් ගුවන් සේවා කටයුතුවලට අභියෝග එල්ල වුවද, වසර පුරා ගුවන් යානා මෙහෙයුම් සඳහා ස්ථාවර ලෙස ඉන්ධන සැපයීම සහතික කිරීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරිය, රජය සමඟ එක්ව ගුවන් සමාගම් සහ ගුවන් සේවා කර්මාන්තයේ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කළේය.

3

මේ අතර, ශ්‍රී ලංකා ගුවන් තොටුපළ වෙත ගුවන් සමාගම් වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට නව ගුවන් සමාගම් සහ දැනට මෙහෙයුම් කටයුතු සිදු කරන සමාගම් සඳහා ගුවන්ගත වීමේ බද්ද මෙන්ම, ගුවන් යානා ගොඩ බෑමේ සහ ගුවන් යානා නැවැත්වීමේ ගාස්තුවලට අදාළව සහන කිහිපයක් ලබා දෙන ලදී.

ආර්ථික අර්බුදය උග්‍ර වීම හේතුවෙන් ඇති වූ ඇතැම් අවහිරතා මධ්‍යයේ වුවද, 2022 වසරේ දී ගුවන් සේවා සංවර්ධන ව්‍යාපෘති කිහිපයක ඉදිකිරීම් කටයුතු සිදු කෙරිණි. ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සීමිත සමාගම විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි දැනට පවතින මගී පර්යන්ත ගොඩනැගිල්ල ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ ව්‍යාපෘති වසර තුළ සිදු කරන ලද අතර, එමගින් ගුවන් තොටුපළ භූමි ප්‍රමාණය ඵලදායී ලෙස භාවිත කිරීමට ප්‍රයත්න දරන ලදී. එමෙන්ම, ආනයන භාණ්ඩ පර්යන්ත ගොඩනැගිල්ල ඉදිකිරීම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි අභ්‍යන්තර සහ බාහිර මාර්ග වැඩි දියුණු කිරීම සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ස්ථාපිත ඉලෙක්ට්‍රොනික වෙළඳ සංකීර්ණය සඳහා අනුබද්ධිත ගබඩා සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළ කටයුතු ද මෙම වසර තුළ දී සිදු විය. තවද, ඉදිරි වසර 30ක කාලය තුළ ගුවන් ගමන් ක්ෂේත්‍රයට අදාළව ඉල්ලුම සඳහා පහසුකම් සැපයීමට හැකිවන පරිදි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ක්‍රමානුකූල ලෙස සංවර්ධනය කිරීම සහතික කිරීම සඳහා නව ගුවන් තොටුපළ සැලැස්මක් සංවර්ධනය කිරීමට පියවර ගන්නා ලදී. මේ අතර, 'කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ - රත්මලාන සංවර්ධන ප්‍රධාන සැලැස්ම - 2030 වසර උදෙසා වන දැක්ම' (Colombo International Airport Ratmalana Master Plan-Way to 2030) යටතේ අතිරේක ගුවන් යානා නවත්වන කොටසක් සහිත නව ගුවන් යානා බැහැරුම් පථයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2022 වසරේ මාර්තු මාසයේ දී නිම කරන ලදී.

ශ්‍රී ලංකන් ගුවන් සේවයෙහි මූල්‍ය කාර්යසාධනය සාපේක්ෂ වශයෙන් දුර්වල වූ අතර, සංචාරක කටයුතු සඳහා ගෝලීය වශයෙන් ඇති රුචිකත්වය ඉහළ යෑම පිළිබිඹු කරමින් ගුවන් සේවා කටයුතු තරමක් දුරට වර්ධනය විය. තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 වසරේ දෙසැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි මෙහෙයුම් අලාභය, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රුපියල් බිලියන 15.6ක මෙහෙයුම් අලාභයට සාපේක්ෂව රුපියල් බිලියන 4.4කට සීමා විය. සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි ආදායම සියයට 222.9ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළ අතර, මෙහෙයුම් වියදම සියයට 176.0කින් ඉහළ ගියේය. ශ්‍රී ලංකාවේ ඉන්ධන අර්බුදය මධ්‍යයේ ගුවන් යානා ඉන්ධන හිඟය උග්‍රවීම සහ ඊට සමගාමීව, සාමාන්‍ය පරිදි ගුවන් යානා සඳහා නැවත ඉන්ධන පිරවීමට ඉන්ධන නොමැති බවට සිවිල් ගුවන් සේවා අධිකාරිය ප්‍රකාශ කිරීමත් සමඟ, ගුවන් සමාගම් ආපසු ගුවන් ගමන් සඳහා ප්‍රමාණවත් තරම් ඉන්ධන රැගෙන යෑමට (Tankering) යොමු වීම සහ නැවත ඉන්ධන පිරවීම වෙනත් නැවතුම් හරහා සිදු කිරීමත් හේතුවෙන්, මෙහෙයුම් සම්බන්ධයෙන් අධික පිරිවැයක් දැරීමට සිදු විය. ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි මූල්‍ය සංරෝධක මගින් රාජ්‍ය මූල්‍ය මත ඇති කරන පීඩනය සැලකිල්ලට ගනිමින්, පාරදෘශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියක් හරහා තෝරා ගැනීමට නියමිත ආයෝජකයින් වෙත ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි සහ එහි අනුබද්ධ සමාගම්වල සැලකිය යුතු කොටස් ප්‍රමාණයක් සහ කළමනාකාරීත්වය පැවරීම හරහා එම සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය ප්‍රධාන ක්‍රියාමාර්ග ගනු ලැබීය. ඒ අනුව, ශ්‍රීලංකන් ගුවන් සේවය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ස්ථාපිත රජය සතු ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය වෙත පවරා ඇත.

වරාය සේවා

ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම සහ ආනයන සීමා මධ්‍යයේ ආනයන ඉල්ලුම පහළ යෑම මගින් 2022 වසර තුළ දී වරාය ක්‍රියාකාරකම්වලට අහිතකර බලපෑම් ඇති කළේය. වසරේ පළමු කාර්තුව තුළ හිතකර කාර්යසාධනයක් පෙන්නුම් කළ ද, උග්‍ර ආර්ථික අර්බුදය මධ්‍යයේ වරාය මෙහෙයුම් පිළිබඳ ජාත්‍යන්තර විශ්වාසය දුර්වල වීම මෙන්ම ආනයන සීමා හේතුවෙන් දේශීය ආනයන පරිමා පහත වැටීමේ බලපෑම පිළිබිඹු කරමින්, 2022 වසරේ දී වරාය කටයුතු සමස්තයක් ලෙස පහළ ගියේය. මේ අතර, මෙම වසර තුළ වරාය ක්‍රියාකාරකම් කෙරෙහි, ගෝලීය වෙළඳ පරිමා වර්ධනය පහළ යෑම ද හේතු වී ඇත. ඒ අනුව, සමස්ත බහලු මෙහෙයුම් සහ භාණ්ඩ මෙහෙයුම්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, සියයට 5.3කින් සහ සියයට 8.2කින් පහළ ගොස් ඇති අතර, වසර අවසානයේ දී යම් වර්ධනයක් දක්නට ලැබුණ ද, 2022 වසරේ නැව් පැමිණීම් සංඛ්‍යාව වසර තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 2.6කින් පහළ ගොස් ඇත. කොළඹ වරායේ සියලුම පර්යන්තයන් භාණ්ඩ මෙහෙයුම්

3.10 රූප සටහන
බහලු මෙහෙයුම්, ප්‍රතිනැවිගත කිරීම් සහ නැව් පැමිණීම්



මූලාශ්‍ර: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

සහ බහලු මෙහෙයුම් යන දෙඅංශයෙන්ම පහළ යෑම් වාර්තා කළේය. මෙහෙයවනු ලැබූ සමස්ත බහලු ධාරිතාව සඳහා කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය (කො.ජා.බ.ප.), ජයා බහලු පර්යන්තය, යුනිටි බහලු පර්යන්තය හා නැගෙනහිර බහලු පර්යන්තයේ පළමු තොටුපළ බැම්ම ඇතුළත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය (ශ්‍රී ලං.ව.අ.) සහ දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය (ද.ආ.පි.ප.), පිළිවෙළින්, සියයට 46.4ක, සියයට 28.1ක, සහ සියයට 25.5ක දායකත්වයක් දැක්වූ අතර, කොළඹ වරායේ මෙහෙයවනු ලැබූ බහලු ප්‍රතිනැවිගත කිරීම් සඳහා දායකත්වය, පිළිවෙළින්, සියයට 45.3ක්, සියයට 28.6ක්, සහ සියයට 26.1ක් විය. අවම මට්ටමක පවතින දේශීය රථ වාහන මෙහෙයුම් සම්බන්ධ ක්‍රියාකාරකම් මධ්‍යයේ රථ වාහන ප්‍රතිනැවිගත කිරීම් ඉහළ යෑම හේතුවෙන් 2022 වසර තුළ හම්බන්තොට වරායේ සමස්ත රථ වාහන මෙහෙයුම් ප්‍රමාණය ඉහළ ගියේය. ඒ අනුව, 2022 වසර තුළ දී හම්බන්තොට වරාය තුළ හසුරවන ලද සමස්ත රථ වාහන සංඛ්‍යාව, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 13.1ක වර්ධනයක් වාර්තා කරමින් 558,188ක් ලෙස වාර්තා විය. වසර තුළ දී, සමස්ත රථ වාහන මෙහෙයුම් සංඛ්‍යාවෙන් සියයට 99.8ක් වූ වාහන ප්‍රතිනැවිගත කිරීම්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 13.8ක වර්ධනයක් වාර්තා කළ අතර, රථ වාහන ආනයන සීමා අබණ්ඩව ක්‍රියාත්මක කිරීම හේතුවෙන් දේශීය අරමුණු සඳහා මෙහෙයවනු ලැබූ රථ වාහන සංඛ්‍යාව (එනම් ආනයනය කළ වාහන සංඛ්‍යාව) 1,137ක් පමණක් විය.

වරාය යටිතල පහසුකම් සහ සේවා සංවර්ධනය

රටේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාය පත්‍රයේ ප්‍රධාන ප්‍රමුඛතාවක්ව පවතී. ඒ අනුව, කොළඹ වරාය හා ප්‍රාදේශීය වරායන්වලට අදාළ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති 2022 වසරේ දී අබණ්ඩව ක්‍රියාත්මක විය. නැගෙනහිර බහලු පර්යන්තයෙහි දෙවන අදියරේ ඉදිකිරීම් කටයුතු වසර තුළ සිදු වෙමින් පැවති අතර, 2022 වසර අවසානය වන විට කැණීම් සහ ගොඩකිරීම්වලට අදාළ කාර්යයන්වලින් සියයට 30ක් සම්පූර්ණ කර ඇත. මේ අතර, විදේශීය ආයෝජකයෙකු, දේශීය ආයෝජකයෙකු සහ ශ්‍රී ලං.ව.අ. අතර ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ අයිතිය පැවරීම (Build-Operate-Transfer) යන පදනම යටතේ වසර 35ක කාලයක් ආවරණය වන පරිදි කොළඹ වරායේ බටහිර පර්යන්තයේ සංවර්ධන කටයුතුවලට අදාළ ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව, එහි ඉදිකිරීම් කටයුතු 2022 වසරේ නොවැම්බර් මාසයේ දී ආරම්භ විය. නැගෙනහිර බහලු පර්යන්තය සහ බටහිර බහලු පර්යන්තය, පිළිවෙළින්, 2025 සහ 2027 වසර වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ. පර්යන්ත ද්විත්වයෙහිම ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු, කොළඹ වරායේ ඇස්තමේන්තුගත වාර්ෂික ධාරිතාව අඩි විස්සේ බහලු ඒකක මිලියන 6කින් පමණ ඉහළ නැංවෙනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය කොළඹ වරායට එහි උපායමාර්ගික භූගෝලීය පිහිටීමෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වන පරිදි වරාය කර්මාන්තයේ අනාගත ඉල්ලුම සපුරාලීමට විශාල වශයෙන් සහාය සපයනු ඇත. තවද, උතුරු කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වන ශක්‍යතා අධ්‍යයනය සහ නව වරාය සන්නිවේදන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා වන මූලික සැලසුම් සහ ශක්‍යතා අධ්‍යයනය ද 2022 වසරේ දී ක්‍රියාවට නැංවිණි. ජාත්‍යන්තර වාණිජ වරායක් ලෙස කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණ කිරීමේ කටයුතුවලට අමතරව, කන්කසන්තුරේ සහ

3.11 රූප සටහන
වරාය ක්‍රියාකාරකම්වල ක්‍රියාකාරිත්වය



මූලාශ්‍ර: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

3

3.7 සංඛ්‍යා සටහන

වරාය සේවා ක්‍රියාකාරිත්වය

ශීර්ෂය	2021	2022 (අ)	වර්ධන අනුපාතය %	
			2021	2022(අ)
1. පැමිණි නැව් සංඛ්‍යාව	**4,180**	**4,073**	**-3.6**	**-2.6**
කොළඹ	3,675	3,648	-3.4	-0.7
ගාල්ල	14	7	-36.4	-50.0
ත්‍රිකුණාමලය	117	95	-13.3	-18.8
හම්බන්තොට	374	323	-	-13.6
2. මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය (මෙ.ටො. '000)	**109,369**	**100,376**	**6.3**	**-8.2**
කොළඹ	103,824	96,170	6.3	-7.4
ද.ආ.පි.ප.	24,062	22,731	-3.3	-5.5
කො.ජා.බ.ප.	42,400	41,717	13.6	-1.6
ශ්‍රී ලං.ව.අ.	37,362	31,722	5.3	-15.1
ගාල්ල	106	1	-73.8	-98.9
ත්‍රිකුණාමලය	3,190	2,089	3.8	-34.5
හම්බන්තොට	2,249	2,116	28.5	-5.9
3. බහලු මෙහෙයුම් ප්‍රමාණය (TEUs '000) (ආ)	**7,249**	**6,862**	**5.8**	**-5.3**
ද.ආ.පි.ප.	1,839	1,752	-1.8	-4.7
කො.ජා.බ.ප.	3,212	3,184	11.3	-0.9
ශ්‍රී ලං.ව.අ.	2,198	1,926	4.8	-12.4
4. බහලු ප්‍රතිනැවිගත කිරීම් (TEUs '000) (ආ) (ඇ)	**6,050**	**5,832**	**4.9**	**-3.6**
ද.ආ.පි.ප.	1,573	1,523	-2.1	-3.2
කො.ජා.බ.ප.	2,600	2,640	13.4	1.5
ශ්‍රී ලං.ව.අ.	1,877	1,670	0.6	-11.1

(අ) තාවකාලික
(ආ) TEUs = අඩි විස්සට සමාන බහලු ඒකක
(ඇ) නැවත ගබඩා කිරීම් ද ඇතුළත් ව

මූලය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

දකුණු ඉන්දියාවේ පොන්ඩිචෙරි අතර යාත්‍රා සේවාවක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතියට 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දුන්නේය. මෙහිදී, සැලසුම් කිරීම, ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ අයිතිය පැවරීම (Design, Build Operate and Transfer) ගිවිසුමක් යටතේ මගී පර්යන්තය සංවර්ධනය කිරීම සඳහා වන පර්යේෂණ කටයුතු සහ යෝජනා සඳහා වන ඉල්ලීම (Request for Proposal) මෙම වසර තුළ ප්‍රගතියක් ලබා ඇත. මේ අතර, ආයෝජකයින් ලැයිස්තුගත කිරීම අවසන් කළ පසු ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යෝජනා සඳහා වන ඉල්ලීම සහ ව්‍යාපෘති ගිවිසුම සකස් කිරීම ද සිදු වෙමින් පැවතිණි.

වරාය ක්‍රියාකාරකම් සමස්තයක් ලෙස පහළ ගියද, ප්‍රධාන වශයෙන් විනිමය අනුපාතික සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීමෙහි සහාය සමඟ ආදායම ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ දී ශ්‍රී ලං.ව.අ.යේ මූල්‍ය කාර්යසාධනය වර්ධනය විය. 2022 වසරේ අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වරාය ගාස්තු ඉහළ නැංවීමද ආදායමේ ඉහළ යෑම සඳහා දායක විය. තවද, පර්යන්ත කළමනාකරණ පද්ධතියේ සහ ශ්‍රී ලං.ව.අ.හි පුහුණු ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, 2022 වසරේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දොඹකර ආශ්‍රිත ක්‍රියාකාරකම්වල කාර්යක්ෂමතාවය මෙන්ම, කාල කළමනාකරණය පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස වර්ධනය විය. ඒ අනුව, ශ්‍රී ලං.ව.අ.හි සමස්ත ආදායම රුපියල් බිලියන 68.4ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 50.5කින් ඉහළ ගිය අතර, මෙහෙයුම් වියදම රුපියල් බිලියන 43.7ක් දක්වා සියයට 33.0කින් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 වසරේ දී රුපියල් බිලියන 25.6ක් වූ ශ්‍රී ලං.ව.අ.හි බදුවලට පෙර ලාභය, 2022 වසරේ දී රුපියල් බිලියන 57.0ක් ලෙස වාර්තා විය.

පණිවුඩ හුවමාරු සේවා

ආර්ථික ක්‍රියාකාරිත්වය මන්දගාමී වීම මෙන්ම වසංගත කාලපරිච්ඡේදය තුළ ඉහළ ගිය සන්නිවේදන සේවා සඳහා ඉල්ලුම ක්‍රමයෙන් පහළ යෑම කිසියම් දුරකට හේතුකොටගෙන විදුලි සංදේශ අංශයේ කාර්යසාධනය 2022 වසරේ අග භාගය වන විට පහළ ගියේය. බොහෝ දුරට වසංගතය ආරම්භයේ සිට රැකියා, අධ්‍යාපනය සහ අනෙකුත් දෛනික ක්‍රියාකාරකම් සඳහා අනුගමනය කරන ලද මංගත ක්‍රමවේද අඛණ්ඩව පවත්වාගෙන යෑම හේතුවෙන් 2022 වසරේ පළමු භාගය තුළ විදුලි සංදේශ අංශය ඉහළ වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, පුද්ගල සංචරණ කටයුතු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීම සහ භෞතික වශයෙන් අධ්‍යාපන කටයුතු සාමාන්‍ය පරිදි නැවත ආරම්භ කිරීමෙන් අනතුරුව, විදුලි සංදේශ ක්‍රියාකාරකම් 2022 වසරේ අවසාන කාලය වන විට පහළ ගියේය. මේ අතර, 2022 වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී විදුලි සංදේශ අංශයේ කාර්යසාධනය පහළ යෑම සඳහා විදුලි සංදේශ ගාස්තු

3.12 රූප සටහන

දුරකථන සහ අන්තර්ජාල ඝනත්වය



මූලයන්: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසන් සභාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඉහළ යෑම කිසියම් දුරකට හේතු විය. 2022 වසරේ පළමු භාගයේ දී සියයට 6.3ක වර්ධනයක් වාර්තා වුවද, ස්ථාවර දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව සමස්තයක් ලෙස 2022 වසර තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 7.0කින් පහළ ගියේය. වසර තුළ දී, ජංගම දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව ද වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.7කින් පහළ ගිය අතර, ජංගම සහ ස්ථාවර අන්තර්ජාල සම්බන්ධතා ඇතුළත් සමස්ත අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම සියයට 2.0කින් පහළ ගියේය. පුද්ගලයන් 100කට ග්‍රාහක සංඛ්‍යාව මනිනු ලබන ස්ථාවර සහ ජංගම දුරකථන ඝනත්වය, පිළිවෙළින්, 12.0ක් සහ 142.0ක් වූ අතර, 2022 වසර අවසන් වන විට අන්තර්ජාල ඝනත්වය පුද්ගලයන් 100කට 97.7ක් විය. කෙසේ වෙතත්, වසංගතය ආශ්‍රිත සංචරණ සීමා ඉවත් කිරීම හේතුවෙන් 2021 වසරේ ඔක්තෝබර් මාසයේ සිට පහළ යෑමක් පෙන්නුම් කළ සමස්ත දත්ත භාවිතය, 2022 වසරේ මාර්තු මාසයේ සිට ක්‍රමානුකූලව වැඩි වීමක් පෙන්නුම් කළේය. තවද, දැඩි ඉන්ධන හිඟය හේතුවෙන් ඇති වූ ප්‍රවාහන අවහිරතා මධ්‍යයේ රැකියා සහ අධ්‍යාපන ක්‍රියාකාරකම් දුරස්ථ ක්‍රමවේද වෙත යොමු වීමත් සමඟ, 2022 වසරේ ජූලි මාසයේ දී අන්තර්ජාල දත්ත භාවිතයේ ක්ෂණික ඉහළ යෑමක් නිරීක්ෂණය විය.

අපේක්ෂිත ඩිජිටල් ආර්ථික පරිවර්තනය සිදු කිරීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් 2022 වසර තුළ දී ඩිජිටල් යටිතල පහසුකම් පදනම වැඩිදියුණු කිරීම සඳහා රජය සහ අනෙකුත් ප්‍රධාන පාර්ශ්ව ආයතන අඛණ්ඩව ක්‍රියා කළහ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 'ගමට සන්නිවේදනය'

3.13 රූප සටහන
බ්‍රෝඩ්බෑන්ඩ් දත්ත භාවිතය



මූලයන්: ඩයලොග් ඇක්සියාටා පොදු සීමිත සමාගම
ශ්‍රී ලංකා ටෙලිකොම් පොදු සීමිත සමාගම
මොබිටෙල් (පෞද්.) සමාගම
හාර්ති එයාර්ටෙල් ලංකා (පෞද්.) සමාගම

සටහන: පෙටාබයිට් 1 = ගිගාබයිට් මිලියන 1

3.8 සංඛ්‍යා සටහන
විදුලි සංදේශ අංශයේ ක්‍රියාකාරිත්වය

ශීර්ෂය	2021 (අ)	2022 (ආ)	වර්ධන අනුපාතය % 2021(අ)	2022(ආ)
ස්ථාවර දුරකථන සේවා ('000)	2,852	2,651	9.1	-7.0
රැහැන් සහිත දුරකථන සංඛ්‍යාව	1,264	1,263	1.5	-0.1
රැහැන් රහිත දුරකථන සංඛ්‍යාව	1,587	1,388	16.1	-12.5
ජංගම දුරකථන සංඛ්‍යාව ('000)	29,959	28,838	4.2	-3.7
අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව (ඇ)	22,106	21,668	26.1	-2.0
ඝනත්වය (ඈ)				
ස්ථාවර දුරකථන	12.9	12.0	8.0	-7.1
ජංගම දුරකථන	135.2	130.0	3.1	-3.8
අන්තර්ජාලය (ඇ)	99.8	97.7	24.8	-2.1

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජංගම අන්තර්ජාල සම්බන්ධතා ඇතුළත්ව
(ඈ) පුද්ගලයින් 100 කට ඇති සම්බන්ධතා සංඛ්‍යාව ලෙස අර්ථ දක්වේ.

මූලයන්: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

3

ව්‍යාපෘතිය යටතේ දිවයින පුරා ඩිජිටල් සේවාවන් වෙත බාධාවලින් තොර ප්‍රවේශයක් සහතික කිරීම උදෙසා, දීප ව්‍යාප්තව සිව්වන පරම්පරාවේ (4G) සම්බන්ධතා ආවරණය වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරන ලදී. 2021-2024 දක්වා කාල සීමාව තුළ දිස්ත්‍රික්ක 10ක් පුරා සන්නිවේදන කුළුණු 276ක් පිහිටුවීම මූලික සැලැස්ම වුවද, ප්‍රධාන වශයෙන් ආර්ථික දුෂ්කරතා හේතුවෙන් මෙම ව්‍යාපෘතිය 2026 වසර වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත. 2022 වසර අවසන් වන විට මෙම ව්‍යාපෘතිය යටතේ සන්නිවේදන කුළුණු 38ක් නිම කර ස්ථානගත කර ඇත. මීට අමතරව, 2023 වසර වන විට වාණිජ මට්ටමේ 5G ජාලයක් ස්ථාපිත කිරීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අරමුණු කරයි. මේ අතර, 2022 වසරේ මාර්තු මාසයේ දී 2022 අංක 09 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත නීතිගත කිරීමත් සමඟ විස්තීර්ණ දත්ත ආරක්ෂණ නීති සම්පාදනය කළ පළමු දකුණු ආසියානු රට බවට ශ්‍රී ලංකාව පත් විය. 2023 වසරේ දී දත්ත ආරක්ෂණ අධිකාරියක් පිහිටුවීමත් සමඟ මෙම පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත මගින් කාර්යක්ෂම අධීක්ෂණ හා නියාමන ක්‍රියාවලියක් හරහා මහජනතාවගේ තොරතුරු සුරක්ෂිත කිරීමට අපේක්ෂා කෙරේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් 'ජාතික ඩිජිටල් පරිවර්තන උපායමාර්ගය' යටතේ රාජ්‍ය ආයතනවල සේවා සැපයීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සම්බන්ධ ක්ෂේත්‍රයේ තරගකාරිත්වය ඉහළ නැංවීම සඳහා පියවර ගන්නා ලදී. මෙම වසර

3

තුළ, ලංකා රාජ්‍ය ජාලය 2.0, ලංකා රජයේ ක්ලවුඩ් 2.0, ශ්‍රී ලංකා අනන්‍යසම ඩිජිටල් හැඳුනුම, තාක්ෂණික ව්‍යාප්තකරණ වැඩසටහන, සහ ඩිජිටල්කරණය වූ ලංකාවක් සඳහා වන ධාරිතාව ඉහළ නැංවීම යන මහා පරිමාණ ව්‍යාපෘති ඇතුළුව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ විෂය පථය යටතේ ව්‍යාපෘති 23ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. මීට අමතරව, ජාතික උපාය මාර්ගය යටතේ ක්‍රියාත්මක කරන ලද තවත් ව්‍යාපෘති 17ක් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් තාක්ෂණික විශේෂඥ දැනුම ලබා දෙන ලදී. තවද, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහ තවත් ප්‍රමුඛ පෙළේ පෞද්ගලික අංශයේ විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ සමාගම් දෙකක් එක්ව ජාතික ඉන්ධන අවසර පත්‍ර කේන්ද්‍ර ක්‍රමය ක්‍රියාවට නැංවීය. ජාතික ඉන්ධන අවසර පත්‍ර කේන්ද්‍ර ක්‍රමය හඳුන්වාදීම මගින් 2022 වසරේ දී ඛනිජ තෙල් බෙදා හැරීම හා සම්බන්ධ සමාජ ආතතීන් අවම කිරීමට හැකි වූ අතර, එමගින් මේ හා සමාන ක්‍රමවේද අනෙකුත් පොදු සේවාවන් සඳහා යොදා ගැනීම කෙරෙහි යම් පෙළඹවීමක් සැපයෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, වසර තුළ විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙහෙයුම් පිරිවැය ඉහළ යෑම සැලකිල්ලට ගනිමින්, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ සිට විදුලි සංදේශ ගාස්තු ඉහළ නංවන ලදී. ඒ අනුව, අන්තර්ජාල, දුරකථන සහ මුදල් ගෙවා නරඹන රූපවාහිනී සේවා ගාස්තු සියයට 20කින් ඉහළ නංවන ලද අතර, එම සේවා පරිශීලක ගාස්තු නොවෙනස්ව පැවතුණි.

2022 වසරේ දී සැපයුම් කටයුතුවලට බාධා වීම හේතුවෙන් තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය මන්දගාමී විය. දිවයින පුරා තැපැල් බෙදාහැරීමේ ප්‍රදේශ 8,157ක් ආවරණය වන පරිදි, ප්‍රධාන තැපැල් කාර්යාල 653ක්, උප තැපැල් කාර්යාල 3,342ක් සහ නියෝජිත තැපැල් කාර්යාල 140ක් හරහා තැපැල් සේවා සපයන ලදී. තවද, නව්‍ය සේවා ප්‍රවේශ හරහා තැපැල් දෙපාර්තමේන්තුව සිය සේවා සැපයීම අඛණ්ඩව වැඩිදියුණු කළ අතර, සමාජ මාධ්‍ය ක්‍රම හරහා එවැනි සේවා ප්‍රවර්ධනය කිරීම සහ මහජනතාව දැනුම්වත් කිරීම සිදු කරන ලදී. ඒ අනුව, 2020 වසරේ දී නැවත දියත් කරන ලද, 'ඇණවුම් ලැබුණු පසු මුදල් ගෙවීමේ සේවාව', මගින් 2021 වසරේ දී වාර්තා කරන ලද රුපියල් මිලියන 34.0ක ආදායමට සාපේක්ෂව, 2022 වසරේ දී රුපියල් මිලියන 269.0ක කැපී පෙනෙන ආදායමක් වාර්තා කළේය. වසර හතරකට වැඩි කාලයකට පසුව, දේශීය තැපැල් ගාස්තු 2022 වසරේ අගෝස්තු මාසයේ දී ඉහළ නංවන ලද අතර, තැපැල් සේවාවලට අදාළ සැපයුම් පිරිවැය ඉහළ යෑමට අනුකූල වන පරිදි විදේශීය තැපැල් ගාස්තු සංශෝධනය කරන ලදී. ඒ අනුව, දේශීය සාමාන්‍ය තැපැල් සේවාවට අදාළ අවම තැපැල් ගාස්තුව, සහ අවම ලියාපදිංචි ගාස්තු, පිළිවෙළින්, රුපියල් 35.00කින් සහ රුපියල් 30.00කින්, ඉහළ නැංවූ අතර නව ගාස්තු පිළිවෙළින්, රුපියල් 50.00ක් සහ රුපියල් 60.00ක් ලෙස සටහන් වේ. අනෙකුත් තැපැල් සේවා සඳහා අදාළ බොහෝ ගාස්තු ද වසර තුළ වැඩි කරන ලදී. මෙවැනි වෙනස්කම් සිදු කළද, තැපැල් දෙපාර්තමේන්තුවෙහි සමස්ත මූල්‍ය තත්ත්වය 2022 වසරේ දී දුර්වල මට්ටමක පැවතුණි. තැපැල් දෙපාර්තමේන්තුවෙහි තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ආදායම රුපියල් බිලියන 9.3ක් දක්වා සියයට 29.6කින් ඉහළ ගියද, මෙහෙයුම් වියදම් රුපියල් බිලියන 16.1ක් දක්වා සියයට 15.3කින් ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස, තැපැල් දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී වාර්තා කරන ලද රුපියල් බිලියන 7.2ක අලාභයට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 7.0ක මෙහෙයුම් අලාභයක් වාර්තා කරන ලදී. තැපැල් දෙපාර්තමේන්තුවෙහි මූල්‍ය ශක්‍යතාව ඉහළ නැංවීම සඳහා විධිමත් පරිදි තැපැල් ගාස්තු සංශෝධනය කිරීමට අමතරව, තැපැල් සේවයට අදාළව රටේ පාරිභෝගික අවශ්‍යතාවල වෙනස්වීම් සැලකිල්ලට ගනිමින්, තැපැල් සේවා ස්වයංක්‍රීයකරණය කිරීම, මංගත සේවා පහසුකම් ලබා දීම, එක් තැපැල් ස්ථානයකින් තවත් තැපැල් ස්ථානයකට ලියුම් හුවමාරු වීම පරීක්ෂා කිරීම (point to point tracking), සේවා විවිධාංගීකරණය හරහා පික්-අප් සේවා (pick-up services යොදා ගැනීම ආදී නවීන තාක්ෂණික ක්‍රම, නව්‍ය ප්‍රවණතා සහ පාරිභෝගිකයන් මූලික කරගත් ප්‍රවේශ යොදා ගන්නා පුළුල් ක්‍රමවේදයක් තැපැල් දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය වේ.

ජල සම්පාදනය හා වාරිමාර්ග

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නල ජලය සඳහා ඉහළ යන ඉල්ලුම සපුරාලීමට ආරක්ෂිත සහ තිරසාර පදනමින් ජලය සැපයීම පිණිස වන සිය සේවා 2022 වසර තුළ දී පුළුල් කරන ලදී. නව ජල සැපයුම් සම්බන්ධතා 153,217ක් ලබාදීමත් සමඟ මෙම වසර තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පාලනය කරන ලද සමස්ත ජල සැපයුම් සම්බන්ධතා ප්‍රමාණය මිලියන 2.9ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, 2021 වසර අවසානයේ සියයට 94.4ක්ව පැවති ජනගහනයේ ආරක්ෂිත පානීය ජලය

සඳහා ප්‍රවේශය, 2022 වසරේ දී සියයට 96.0ක් දක්වා ඉහළ ගිය අතර, ගෘහ ඒකකවල නල ජල පහසුකම් ආවරණය සියයට 60.4ක් විය. තවද, රට තුළ ආදායම් නූපදවන ජල පරිභෝජනය, 2021 වසරේ දී පැවති සියයට 25.8ක සිට 2022 වසරේ දී සියයට 25.2ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය. මෙම වසර තුළ දී, මූල්‍යමය අවහිරතා සහ සාර්ව ආර්ථික ගැටලු හේතුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි ජල සම්පාදන සංවර්ධන කටයුතුවලට බාධා සිදු වූ අතර, එමගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය මන්දගාමී විය. 2025 වන විට ශ්‍රී ලංකාවේ නල ජල පහසුකම් ආවරණය සියයට 79ක් දක්වා ඉහළ නැංවීමේ අරමුණින්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි ප්‍රමුඛතම සංවර්ධන ව්‍යාපෘතිය වන 'සැමට ජලය' වැඩසටහන, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2022 වසරේ දී නවතා දමන ලදී. එම ව්‍යාපෘතිය වෙනුවට, දැනට පවතින ජල සම්පාදන යෝජනා ක්‍රමවල සැපයුම මෙන්ම බෙදාහැරීම පුළුල් කිරීම ඉහළ නැංවීමේ අරමුණින්, 'ජල සැපයුම වැඩි කිරීම සහ බෙදාහැරීම පුළුල් කිරීම' යන ව්‍යාපෘතිය මෙම වසර තුළ ආරම්භ කරන ලදී. මේ අතර, මාතලේ නගරය සහ ඒ අවට පවුල් 90,000කට සුරක්ෂිත පානීය ජල පහසුකම් ලබා දෙමින් 2017 වසරේ ආරම්භ කරන ලද විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය මෙම වසර තුළ දී නිම කරන ලද අතර, ගාල්ල පොකුරු ජල සම්පාදන ව්‍යාපෘතිය සහ කොළඹ ජල සම්පාදන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිවල පළමු ව්‍යාපෘතිය ද 2022 වසරේ දී නිම කරන ලදී. මීට අමතරව අලව්ව, පොල්ගහවෙල, පොතුහැර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය සහ මාතර ජල සම්පාදන ව්‍යාපෘතියෙහි

3.14 රූප සටහන
ජල සැපයුම් තත්ත්වය



මූලය: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

IV වන අදියර 2022 වසරේ දී, පිළිවෙළින්, සියයට 93.1ක සහ සියයට 94.0ක භෞතික ප්‍රගතියක් ලබා ඇති අතර, මෙම ව්‍යාපෘති ද්විත්වයම 2023 වසරේ දී නිම කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘති ද්විත්වය අවසන් වූ පසු එමගින් දකුණු සහ වයඹ පළාත්වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20ක සුරක්ෂිත පානීය ජල පහසුකම් වැඩිදියුණු වනු ඇත. තවද, යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි, මෙම දිස්ත්‍රික්ක දෙකෙහි ප්‍රතිලාභීන් ලක්ෂ තුනකගේ ජල අවශ්‍යතාවය සපුරාලීම අරමුණු කරගත් ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය 2022 වසර අවසන් වන විට සියයට 71.4ක භෞතික ප්‍රගතියක් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, තවත් ජල සම්පාදන ව්‍යාපෘති කිහිපයක් තාවකාලිකව අත්හිටුවන ලද අතර, මූල්‍යමය අවහිරතා මධ්‍යයේ 2022 වසර තුළ මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කළ ප්‍රධාන ජල සම්පාදන ව්‍යාපෘති දහයක පමණ වැඩ කටයුතු නිම කිරීමට අපේක්ෂිත කාල සීමා දීර්ඝ කරන ලදී.

වසර දහයකට වැඩි කාලයකට පසු, 2022 වසරේ දී ජල හා මළාපවහන ගාස්තු ඉහළ නැංවීම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි මූල්‍ය කාර්යසාධනය ශක්තිමත් කිරීමට උපකාරී විය. රටෙහි ජල සම්පාදන සහ ජල යටිතල පහසුකම් නඩත්තු පිරිවැය ඉහළ යෑම සහ විධිමත් ලෙස ජල ගාස්තු සංශෝධන සිදු නොවීම හේතුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට දැරීමට සිදු වූ මූල්‍යමය අලාභ සැලකිල්ලට ගනිමින්, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජල හා මලාපවහන ගාස්තු ඉහළ නැංවීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ගෘහස්ත කාණ්ඩය සඳහා වන පරිභෝජන ගාස්තු සියයට 70කින් පමණ ඉහළ දමමින්, සියලුම කාණ්ඩවල පාරිභෝගිකයන් සඳහා වන ස්ථර අනුව සිදු කෙරෙන ජල ගාස්තු ක්‍රමය සැලකිය යුතු ලෙස ඉහළ නංවන ලදී. කෙසේ වෙතත්, පාසල්, ආගමික සහ පුණ්‍ය ආයතන සඳහා අදාළ වන ගාස්තු මෙන්ම, සමෘද්ධිලාභීන් ඇතුළුව අඩු ආදායම්ලාභී පාරිභෝගිකයින්ට අදාළ වන ජල ගාස්තු බොහෝ දුරට නොවෙනස්ව පැවතුණි. තවද, නව ජල සබඳතා සඳහා අය කරනු ලබන ගාස්තු ද 2022 වසරේ ඔක්තෝබර් 17 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහළ නංවන ලදී. මෙම ගාස්තු සංශෝධන වල බලපෑම් කිසියම් දුරකට හේතුකොටගෙන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි මෙහෙයුම් අලාභය පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 3.1ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 1.2ක් දක්වා අඩු විය. මහජනතාවගේ දිගු කාලීන සෞඛ්‍යය

3.9 සංඛ්‍යා සටහන

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය

ශීර්ෂය	2021	2022(අ)	වර්ධන අනුපාතය %	
			2021	2022(අ)
මුළු ජල සම්පාදන යෝජනා ක්‍රම ගණන (ආ)	337	339	1.8	0.6
වසර තුළ දී සපයන ලද නව ජල සම්බන්ධතා ගණන	192,087	153,217	56.5	-20.2
සපයා ඇති මුළු ජල සම්බන්ධතා ගණන (ආ)	2,752,324	2,905,541	7.5	5.6
මුළු ජල නිෂ්පාදනය (ඝන මීටර් මිලියන)	815	818	4.2	0.4
ආදායම් නූපදවන ජලය (ප්‍රතිශතය)				
කොළඹ නගරය	34.8	24.1	-11.4	-30.6
සමස්ත දිවයින	25.8	25.2	4.8	-2.3
පිරිසිදු පානීය ජල පහසුකම් සඳහා ප්‍රවේශය (ප්‍රතිශතය)	94.3	96.0	1.2	1.8
නල ජල පහසුකම් සඳහා ප්‍රවේශය (ප්‍රතිශතය) (ඇ)	54.2	60.4	2.1	11.4

(අ) තාවකාලික මූලයඃ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
(ආ) වසර අවසානයේ දී
(ඇ) අනෙකුත් බලයලත් ආයතන මගින් කළමනාකරණය කරනු ලබන පද්ධති ද ඇතුළත්ව

සහ යහපැවැත්ම ආරක්ෂා කිරීම වෙනුවෙන් රටේ ජල සම්පාදන හා සනීපාරක්ෂක පද්ධතියේ තිරසාර බව සහතික කිරීම සඳහා සැලසුම් ගත කාල පරාස තුළ ජල ගාස්තු සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කෘෂිකාර්මික හා දේශීය අවශ්‍යතා සපුරාලීම සඳහා වාරිමාර්ග ව්‍යාපෘති නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග 2022 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙම වසර තුළ, සමස්ත පිරිවැය රුපියල් බිලියන 3.8ක් වැය කරමින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති 19කට අදාළ කටයුතු පවත්වාගෙන යන ලදී. ඉන් රුපියල් බිලියන 2.0ක් උමා ඔය පහළ ගංගාධාර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වැය කර ඇති අතර, යාන් ඔය ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 616.3ක් වැය කර ඇත. උමා ඔය පහළ ගංගාධාර සංවර්ධන ව්‍යාපෘතිය 2022 වසර අවසන් වන විට සියයට 74.1ක භෞතික ප්‍රගතියක් ලබා තිබුණි. පවුල් 250,000ක් පමණ සඳහා ප්‍රතිලාභ ලබාදීමට සියලුම දිස්ත්‍රික්කවල වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම හා ධාරිතාව වැඩි කිරීම හරහා වාරි ජලය සැපයිය හැකි භූමි ප්‍රමාණය ඉහළ නැංවීමේ ප්‍රයත්නයක් වන 'වාරි සෞභාග්‍ය ජාතික වැඩසටහන', ක්‍රියාත්මක වුණු අතර, ඒ සඳහා වසර තුළ දී වැය කළ පිරිවැය රුපියල් බිලියන 1.1ක් පමණ වේ. මෙම වැඩසටහන යටතේ මූලික සැලැස්මට අනුව ප්‍රතිසංස්කරණය කිරීමට සලකා බලන ලද වැව්/අමුණු 739න්, 2022 වසර අවසන් වන විට වැව් 598ක් ප්‍රතිසංස්කරණය කර අවසන් කරන ලදී. තවද, පේරමඩුව ජලාශ ව්‍යාපෘතිය සහ පදවිය හා වාහල්කඩ යෝජනා ක්‍රමවල ප්‍රතිසංස්කරණ කටයුතු ඇතුළු මධ්‍ය පරිමාණ වාරි ව්‍යාපෘති කිහිපයක භෞතික කාර්යයන් සම්බන්ධ කටයුතු 2022 වසරේ දී ආරම්භ කරන ලදී. මේ අතර, රටේ වාරිමාර්ග යෝජනා ක්‍රම 80ක ඉඩම්, ජලය සහ භෝග ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වාරි පද්ධතියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින්, 2017 වසරේ දී ආරම්භ කරන ලද 'ඵලදායීතාව නැංවීම සහ වාරිමාර්ග පද්ධතිවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය,' සීමිත අයවැය ප්‍රතිපාදන මධ්‍යයේ මන්දගාමීව වුවද, අඛණ්ඩව ක්‍රියාත්මක විය.

3.3. සමාජ යටිතල පහසුකම් පිළිබඳ ප්‍රතිපත්ති, ආයතනික රාමුව සහ ක්‍රියාකාරිත්වය

සෞඛ්‍ය

2022 වසර තුළ උද්ගත වූ අභියෝගාත්මක තත්ත්වයන් සමඟ රටේ සෞඛ්‍ය සේවා සැපයුම අඛණ්ඩව බලපෑමට ලක් විය. 2022 වසරේ පළමු කාර්තුවේ දී කොවිඩ්-19 රෝගීන් වාර්තා වීමේ යම් වැඩිවීමක් දක්නට ලැබුණ ද, වසරේ දෙවන භාගය වන විට රෝග ව්‍යාප්තවීමේ අවදානම ක්‍රමයෙන් පහව ගියේය. 2021 වසර අවසානයේ දී ඔමික්‍රෝන් ප්‍රභේදයේ ව්‍යාප්තියත් සමඟ, 2022 වසරේ අප්‍රේල් මාසය අවසානය දක්වා කාල සීමාව තුළ කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාවේ අඛණ්ඩ ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර, 2022 වසරේ ජූලි මාසයෙන් අනතුරුව වාර්තා වන කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව ක්‍රමයෙන් පහළ ගියේය. ඉන් අනතුරුව, ඉතා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන සහ ප්‍රතිශක්තිකරණයට වඩාත් ප්‍රතිරෝධී වන ඔමික්‍රෝන් BA.5 උප ප්‍රභේදය ව්‍යාප්ත වීම 2022 වසරේ ජූලි මාසයේ මැද කාලය තුළ වඩාත් තීව්‍ර වූ නමුත්, පසුව 2022 වසරේ අවසානයේ දී වෛරසයේ ව්‍යාප්තිය පහළ ගියේය. සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුව, 2023 වසරේ මාර්තු මාසය මැද වන විට, කොවිඩ්-19 රෝගීන් 672,048ක් වාර්තා වූ අතර, මරණ සංඛ්‍යාව 16,831ක් විය. කලාපයේ අනෙකුත් රටවල් හා සසඳන විට ශ්‍රී ලංකාව තුළ වාර්තා වූ කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව සහ මරණ සංඛ්‍යාව සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක පැවති අතර, එමගින් වෛරස් ව්‍යාප්තිය පාලනය කිරීමේදී සහ නිවාරණ උපාය මාර්ග වලට අදාළව ශ්‍රී ලංකාව අත්කරගෙන ඇති සාර්ථකත්වය පිළිබිඹු කරයි. දිවයින පුරා එන්නත් කිරීමේ ක්‍රියාවලිය ශීඝ්‍රයෙන් සිදු කිරීම හා සමගාමීව සංචරණ කටයුතු සීමා කිරීම සහ සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමේ

3.10 සංඛ්‍යා සටහන

සෞඛ්‍ය සේවයේ මූලික ලක්ෂණ

ශීර්ෂය	2021 (අ)	2022 (ආ)
1. රාජ්‍ය අංශය		
රෝහල් සංඛ්‍යාව (බටහිර වෛද්‍ය සේවය)	618	617
ඇඳන් සංඛ්‍යාව	78,228	78,228
ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක	542	544
වෛද්‍යවරුන් සංඛ්‍යාව	20,209	21,045
සහකාර වෛද්‍යවරුන් සංඛ්‍යාව	648	642
හෙද සේවක සංඛ්‍යාව	39,091	40,775
උපස්ථායක සංඛ්‍යාව	8,334	8,310
2. ආයුර්වේද		
රෝහල් සංඛ්‍යාව	118	119
ඇඳන් සංඛ්‍යාව	5,444	5,345
සුදුසුකම්ලත් ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව	1,806	2,303
ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව (ඇ)	26,183	26,650

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති ආයුර්වේද වෛද්‍යවරුන්

මූලයන්: සෞඛ්‍ය අමාත්‍යාංශය
ආයුර්වේද දෙපාර්තමේන්තුව

ක්‍රියාමාර්ග වෛරසය ව්‍යාප්තිය බොහෝ දුරට පාලනය කිරීමට උපකාරී විය. 2023 වසරේ මාර්තු මාසයේ මැද භාගය වන විට, වයස අවුරුදු 12ට වැඩි ජනගහනයෙන් සියයට 97.1ක ප්‍රමාණයකට අවම වශයෙන් එක් එන්නත් මාත්‍රාවක් ලබා දීම සම්පූර්ණ කරමින් ජාතික එන්නත්කරණ වැඩසටහන ඵලදායී ලෙස ක්‍රියාවට නංවා ඇති අතර, එන්නත් මාත්‍රා දෙකක මූලික අවශ්‍යතාව සම්පූර්ණ කළ ප්‍රතිශතය සියයට 83.6ක් විය. මූලික එන්නත් අවශ්‍යතාව සම්පූර්ණ කර ඇති ජනගහනයෙන්, සියයට 55.7ක් පළමු වර්ධක මාත්‍රාව ලබාගෙන ඇති අතර, 2023 වසරේ මාර්තු මාසය මැද භාගය වන විට පළමු වර්ධක මාත්‍රාව සම්පූර්ණ කර ඇති පුද්ගලයින් අතරින් සියයට 2.5ක් දෙවන වර්ධක මාත්‍රාව ලබා ගෙන ඇත. සාමාන්‍ය ජනතාව එන්නත්කරණය කිරීමට පෙර, වැඩිහිටි ජනගහනය සහ ප්‍රතිශක්තිය අඩු පුද්ගලයින්ගට ප්‍රමුඛත්වය ලබා දෙමින්, ෆයිසර් එන්නතෙහි දෙවන වර්ධක මාත්‍රාව ලබා දීම 2022 වසරේ මැයි මාසයේ දී අදියර වශයෙන් ආරම්භ කරන ලදී. කෙසේ වෙතත්, දෙවන වර්ධක මාත්‍රාව සඳහා මහජනතාවගේ රුචිකත්වය අඩු වීම කිසියම් දුරකට පෙන්නුම් කරමින්, දෙවන මාත්‍රාව ලබා දීමේ ප්‍රගතිය 2022 වසර අවසානය වන විට පහළ මට්ටමක පැවතුණි. සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්නයන් තුළින් කොවිඩ්-19 වසංගතය සාර්ථකව පාලනය කළ ද, ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියේ දුර්වලතා මගින් ඇති කළ වෛද්‍ය සැපයුම් සහ ඖෂධ හිඟතාව හේතුවෙන් දැනටමත් අස්ථාවර මට්ටමක පවතින සෞඛ්‍ය සේවා පද්ධතිය තුළ, ඉදිරි කාලයේ දී එවැනි හදිසි සෞඛ්‍ය අවදානමක් පැන නැගුණහොත් එය සෞඛ්‍ය පද්ධතිය මත ඉහළ පීඩනයක් ඇති කරනු ඇත. සෞඛ්‍ය අංශයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීම සහ ස්වයංක්‍රීය කිරීම කරන අතරතුර, රටේ සෞඛ්‍ය පද්ධතියෙහි ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, සෞඛ්‍ය යටිතල පහසුකම් අංශය තුළ කෙරෙන රාජ්‍ය ආයෝජනවලට අමතරව, පෞද්ගලික අංශයේ ආයෝජනද ප්‍රවර්ධනය කිරීම හරහා බාහිර කම්පන සඳහා සෞඛ්‍ය පද්ධතියේ සූදානම ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය.

2022 වසරේ දී, රට තුළ අනෙකුත් බෝවන රෝග ව්‍යාප්ත වීමත් සමඟ, සෞඛ්‍ය සේවා පද්ධතිය පීඩාවට පත් විය. ඩෙංගු රෝගීන් සංඛ්‍යාව, පසුගිය වසරේ වාර්තා වූ 35,924ක සිට 76,689ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, 2021 වසරේ දී 28ක් වූ ඩෙංගු මරණ සංඛ්‍යාව 2022 වසරේ දී 72ක් දක්වා ඉහළ ගියේය. අධික ජන ඝනත්වය හේතුවෙන් ඩෙංගු රෝගය ව්‍යාප්ත වීමේ අවදානම සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතින කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් වැඩිම රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත. 2022 වසරේ දී ඩෙංගු රෝගීන් සංඛ්‍යාව ඉහළ යෑම සඳහා පළිබෝධනාශක සහ ඉන්ධන හිඟය හේතුවෙන් ඩෙංගු රෝගය වැළැක්වීමේ පියවර ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ දුර්වලතා බොහෝ දුරට හේතු විය. එවැනි පළිබෝධනාශක සහ ඉන්ධන හිඟයන් දීර්ඝ කාලයක් පුරා පැවතීම 2023 වසරේ මුල් භාගයේ දී ඩෙංගු රෝගය ආසාදනය වීම් ඉහළ යෑමේ ප්‍රවණතාවය අඛණ්ඩව පැවතීමට හේතු විය හැක. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මහජන සෞඛ්‍ය ගැටලුවක් වන බරවා රෝගය ශ්‍රී ලංකාවෙන් තුරන් කර ඇති බව 2016 වසරේ දී සහතික කර ඇතත්, 2022 වසරේ දී බරවා රෝගීන් 73ක් පමණ වාර්තා වී ඇත. රටේ බරවා පාලන වැඩසටහන පශ්චාත් නිරීක්ෂණ මට්ටමේ පවතින අතර, 2030 වසර වන විට මෙම රෝගය ව්‍යාප්ත වීම සම්පූර්ණයෙන්ම තුරන් කිරීමට ඉලක්ක කර ඇත. 2022 වසරේ දී වාර්තා වූ මී උණ රෝගීන් සංඛ්‍යාව, 2021 වසරේ දී වාර්තා වූ රෝගීන් 6,946ට සාපේක්ෂව 6,970ක් වූ අතර, වැඩිම ආසාදිතයන් පිරිසක් රත්නපුර, කෑගල්ල, ගාල්ල සහ කළුතර යන දිස්ත්‍රික්කවලින් වාර්තා වී ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2016 වසරේ දී ශ්‍රී ලංකාව මැලේරියාවෙන් තොර රටක් ලෙස ප්‍රකාශයට පත් කර තිබුණ ද, කොවිඩ්-19 ආශ්‍රිත සීමා ලිහිල් කිරීමෙන් පසු දේශසීමා හරහා සංචරණ කටයුතු ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස විදේශ රටවලදී මැලේරියා රෝගය ආසාදනය වී මෙරටට පැමිණි රෝගීන් සංඛ්‍යාව 2021 වසරේ දී වාර්තා වූ රෝගීන් 26 දෙනාට සාපේක්ෂව 2022 වසරේ දී

3.15 රූප සටහන
වාර්ෂික ඩෙංගු රෝගීන් සහ මරණ



මූලයඃ සෞඛ්‍ය අමාත්‍යාංශය

37ක් වූ අතර, එමගින් රට තුළ මැලේරියාව නැවත ඉස්මතු වීමේ අවදානමක් නිර්මාණය කර ඇත.

තීව්‍ර වූ සමාජ ආර්ථික ගැටලු මධ්‍යයේ, බෝ නොවන රෝගවලට අදාළ රෝග හා සම්බන්ධ අභියෝගවලට සෞඛ්‍ය අංශය අඛණ්ඩව මුහුණ දුන්නේය. සෞඛ්‍ය සම්පන්න නොවන ආහාර පුරුදු, ව්‍යායාම නොමැතිකම, දුම්පානය, මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය භාවිතය සහ මානසික සෞඛ්‍ය පිරිහීම වැනි අහිතකර ජීවන රටා හේතුවෙන් පසුගිය වසර කිහිපය මුළුල්ලේ රට තුළ බෝ නොවන රෝග අඛණ්ඩව ඉහළ ගියේය. බෝ නොවන රෝග වැළැක්වීම, රෝග විනිශ්චය, පාලනය සහ කළමනාකරණය සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීම ප්‍රවර්ධනය කිරීමෙහි, සෞඛ්‍ය අමාත්‍යාංශය අඛණ්ඩව නිරත විය. ඒ අනුව, 'ශ්‍රී ලංකාව තුළ නිදන්ගත බෝ නොවන රෝග වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය හා උපායමාර්ගික සැලැස්ම' සංශෝධනය කර මහජන අදහස් විමසීම සඳහා ප්‍රකාශයට පත් කරන ලද අතර, ඉලක්කගත සැලසුම්කරණය සහ සේවා සම්බන්ධීකරණය හරහා අනතුරු සිදු වීම වැළැක්වීම සඳහා උපායමාර්ගික නායකත්වය සැපයීමට '2021-2025 සඳහා වන අනතුරු වැළැක්වීම සහ කළමනාකරණය පිළිබඳ බහු ආංශික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම' 2022 වසරේ දී දියත් කරන ලදී. විශේෂයෙන් ම තරුණ ජනගහනය ඉලක්ක කර ගනිමින් බෝ නොවන රෝග ඇතිවීමේ අවදානම අවම කිරීමේ අරමුණින් ශාරීරික ක්‍රියාකාරකම් ප්‍රවර්ධන වැඩසටහන් සහ සෞඛ්‍ය සම්පන්න ආහාර පුරුදු වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. තවද, පිළිකාව කල් ඇතිව හඳුනා ගැනීම සහ වැළැක්වීම ඇතුළුව ප්‍රාථමික මට්ටමින් පිළියම් කර පාලනය කිරීමේ ක්‍රියාකාරකම්වල සෞඛ්‍ය අමාත්‍යාංශය අඛණ්ඩව නිරත විය. ඒ අනුව, රත්නපුර ශික්ෂණ රෝහලේ, පිළිකා කල්තියා හඳුනා ගැනීමේ මධ්‍යස්ථානයක් වසර තුළ ක්‍රියාත්මක කිරීම ආරම්භ විය. කෙසේ වෙතත්, රට තුළ වෛද්‍ය සහ ඖෂධ සැපයුම් හිඟවීම මධ්‍යයේ, බෝ නොවන රෝග වැළඳෙන රෝගීන් සඳහා අඛණ්ඩව ප්‍රතිකාර සැපයීම අභියෝගාත්මක වන බව පෙනී ගොස් ඇති අතර, එමගින් ජනගහනයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් කෙරෙහි විෂමාකාර බලපෑමක් ඇති කිරීමේ හැකියාවක් ඇත. මෙවැනි පසුබිමක් තුළ, හදිසි සෞඛ්‍ය තත්ත්වයන්වලට අවශ්‍ය කෙරෙන වුවමනාවන් සඳහා ප්‍රමුඛතාව ලබා දීම සහ අයවැය ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි වෙන් කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතින අතර, ඖෂධ සහ අනෙකුත් වෛද්‍ය සැපයුම් දේශීයව නිෂ්පාදනය කිරීම සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීම මෙන්ම, රටෙහි පුරවැසියන්ගේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා සෞඛ්‍ය සේවා පද්ධතියේ කාර්යක්ෂමතාව වර්ධනය කළ යුතු වේ.

සෞඛ්‍ය සේවාවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම අරමුණු කරගත් යටිතල පහසුකම් සංවර්ධන සහ සෞඛ්‍ය පද්ධතියේ ධාරිතාව ඉහළ නැංවීමේ වැඩසටහන් කිහිපයක් 2022 වසරේ දී ක්‍රියාත්මක විය. ඒ අනුව, 'ප්‍රාථමික සෞඛ්‍ය සේවා සත්කාර සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය' යටතේ ලෝක බැංකුව විසින් ප්‍රාථමික වෛද්‍ය සත්කාරක ඒකක හරහා ගුණාත්මක සේවා සැපයීම සඳහා ලබා දුන් අරමුදල් යොදා ගනිමින් රෝහල් පහක ප්‍රාථමික සෞඛ්‍ය සේවා පහසුකම් සංවර්ධනය කර ශක්තිමත් කරන ලදී. 2022 වසරේ දී කළුතර සහ අම්පාර දිස්ත්‍රික් මහ රෝහල් ඇතුළු තෝරාගත් රෝහල්වල හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර සේවා ස්ථාපිත කිරීම සිදු විය. තවද, රත්නපුර, කරාපිටිය සහ මොණරාගල වැනි රජයේ රෝහල්වල හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීමේ විවිධ ව්‍යාපෘති ද ක්‍රියාත්මක විය. ඊට අමතරව, ආඝාත රෝගය නිවාරණය (stroke care) සඳහා ජාතික මධ්‍යස්ථානයක් ලෙස මුල්ලේරියාව මූලික රෝහලේ ජාතික ආදර්ශකරණ පුහුණු මධ්‍යස්ථානයක් (simulation centre) ඉදිකිරීම 2022 වසරේ දී සිදු විය. මේ අතර, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මානව ප්‍රාග්ධනය ඉහළ නැංවීම ඉලක්ක කරගත් වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක විය. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉහළ නිපුණතා සහිත වෘත්තිකයන්ගේ හිඟය සැලකිල්ලට ගනිමින්, අතුරු ප්‍රතිපත්තියක් ලෙස, වෛද්‍ය උපදේශකවරුන්, රජයේ වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සහ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන් සඳහා විශ්‍රාම යන වයස, 2022 වසරේ දෙසැම්බර් මාසයේ 12 වන දින සිට

විශේෂ සටහන 5

ආර්ථික අර්බුදය මධ්‍යයේ ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණය තුරන් කරලීම

හැඳින්වීම

2022 වසරේ ආර්ථික අර්බුදය හමුවේ උග්‍ර වූ සමාජ ආර්ථික ගැටලු ගණනාවක් හේතුවෙන් කුටුම්භවල ආහාර අනාරක්ෂිතතා ඉහළ යෑම මධ්‍යයේ, ළමයින් අතර ඉහළ යමින් පවතින මන්දපෝෂණය, සැලකිල්ලක් යොමු විය යුතු ශ්‍රී ලංකාවේ ප්‍රධාන ප්‍රතිපත්තිමය ගැටලුවක් බවට පත්ව ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව, පෝෂණය ලබාගැනීමේ දී පවතින ඌනතාවන් හෝ අධි පෝෂණ මට්ටම්, අත්‍යවශ්‍ය පෝෂ්‍ය පදාර්ථයන්ගේ අසමතුලිතතාවන් හෝ දුර්වල පෝෂණ තත්ත්වයන් මන්දපෝෂණය (malnutrition) යන්නෙන් හඳුන්වයි. මන්දපෝෂණයෙහි ප්‍රධාන ද්විත්ව ගැටලු වන්නේ ඌන පෝෂණය (under nutrition) සහ අධි පෝෂණයයි (over nutrition). උසට සරිලන බරක් නොමැති වීම (කෘෂවීම), වයසට සරිලන උසක් නොතිබීම (මිටිබව), වයසට සරිලන බරක් නොතිබීම (අඩු බර) සහ ක්ෂුද්‍ර පෝෂක ඌනතාවය යන ආකාරයෙන් ඌන පෝෂණය ඇතිවිය හැක. අධි පෝෂණය, මිනිස් සිරුරේ අසාමාන්‍ය හෝ අධික ලෙස මේදය තැන්පත් වීමෙන් ඇතිවන සෞඛ්‍ය අවදානමක් වන අතර, එය අධිබර හා අවසානයේ ස්ථූලතාව වැනි ගැටලු වලට හේතු විය හැක. ජනගහනය අතර පවතින මන්දපෝෂණය මානව ප්‍රග්ධනයේ ඵලදායීතාව මත ඇති කරන සෘජු බලපෑම සහ මානව ප්‍රාග්ධන වර්ධනය මත පරම්පරා වශයෙන් ඇති කරන දිගු කාලීන බලපෑම හේතුවෙන්, ආර්ථික වර්ධනය පසුගාමී කරවන සාධකයක් ලෙස එය හඳුනාගෙන ඇත. එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය මගින් 2013 වසරේ ප්‍රකාශයට පත් කරන ලද ආහාර සහ කෘෂිකර්මාන්ත අංශයේ තත්ත්වය පිළිබඳ වාර්තාවට (The State of Food and Agriculture) අනුව, මන්දපෝෂණය මගින් ගෝලීය ආර්ථිකය මත ඇති කරන සමාජ ආර්ථික බලපෑම වාර්ෂිකව එක්සත් ජනපද ඩොලර් ට්‍රිලියන 3.5ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇති අතර, එම අගය පුද්ගලයෙකු සඳහා ආසන්න වශයෙන් එක්සත් ජනපද ඩොලර් 500කට සමාන වේ. ආර්ථික වර්ධනය තුළ මානව ප්‍රාග්ධනයට හිමිවන වැදගත් භූමිකාව සැලකිල්ලට ගෙන මන්දපෝෂණ ගැටලුව පිළිබඳ සැලකිය යුතු ගෝලීය අවධානයක් යොමු වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ලොව පුරා පවතින මන්දපෝෂණ ගැටලු වළක්වාලීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගණනාවක් ක්‍රියාවට නංවා ඇත. ශ්‍රී ලංකාව, සිය ප්‍රථම ජාතික පෝෂණ ප්‍රතිපත්තිය 1986 වසරේ දී ක්‍රියාවට නංවන ලද අතර, මන්දපෝෂණය අවම කිරීමට සහ ජනතාවගේ පෝෂණ මට්ටම් වැඩි දියුණු කිරීම සඳහා පෝෂණ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කළේය. මානව සංවර්ධන දර්ශක, ඉහළ මට්ටමක් ළඟා කරගෙන තිබුණ ද, රට තුළ පවතින පෝෂණ වැඩසටහන්වල දුර්වලතා සහ දිගු කාලීනව පවතින අදායම් විෂමතාවන් ඉස්මතු කරමින්, ළමා මන්දපෝෂණය දුරලීමෙහි ලා පසුගිය දශක ගණනාවක් තුළ මෙරට අත්කරගෙන ඇති ප්‍රගතිය මන්දගාමී මට්ටමක පවතී. මෙවැනි පසුබිමක් තුළ, ජනතාව මේ වන විටත් මුහුණ දෙමින් සිටින ආහාර සුරක්ෂිතතාව හා පෝෂණයට අදාළ විෂමතාවන්, වසංගතය හේතුවන් සහ ඉන් අනතුරුව උත්සන්න වුණු ආර්ථික අර්බුදය මගින් ඇතිකළ ආහාර මිල ගණන් ඉහළ යෑම, බලශක්ති අර්බුදය මගින් ඇතිකළ සැපයුම් දාමයේ අවහිරතා, අහාර ද්‍රව්‍යවල පැවති හිඟයන්, ජීවනෝපායයන් අහිමිවීම සහ වැය කළ හැකි අදායම සංකෝචනය වීම යනාදී බලපෑම් මගින් තවදුරටත් උග්‍ර කර ඇත.

2022 වසරේ ආර්ථික අර්බුදයට පෙර ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණ තත්ත්වය

නිදහසෙන් පසු කාලය තුළ, ආහාර සුරක්ෂිතතාව, පෝෂණය, සමාජ ආරක්ෂණ ජාල, යනාදී විවිධ මැදිහත්වීම් හරහා පුරවැසියන්ගේ සමාජ ආර්ථික යහපැවැත්ම නංවාලීමට ශ්‍රී ලංකාව පියවර රැසක් ගෙන ඇත. මෙම පියවර අතරට, පාසල් සඳහා ආහාර වේල් සැපයීම, ගර්භණී සහ කිරිදෙන මව්වරුන් හට ආහාර/මුදල් ආධාර ලබාදීම, ත්‍රිපෝෂ වැඩසටහන, පාසල් සඳහා ජල, සනීපාරක්ෂාව හා සෞඛ්‍ය වැඩසටහන් මෙන්ම, අයඩීන් ලුණු භාවිතය ප්‍රවර්ධන කිරීම වැනි වැඩසටහන් ඇතුළත් වේ. දශක ගණනාවක් පුරා ක්‍රියාවට නැංවුණු මෙම ප්‍රයත්නයන්ගේ සහ කැපවීම්වල ප්‍රතිඵලයක් ලෙස, 1975 වසරේ සිට 1995 වසර දක්වා කාලපරිච්ඡේදය තුළ ළමයින් අතර මන්දපෝෂණය කැපී පෙනෙන ලෙස පහළ වැටිණි. ඒ අනුව, වයස අවුරුදු පහට අඩු ළමුන් අතර වයසට සරිලන උස නොමැති දරුවන් ප්‍රතිශතය 1975 වසරේ දී වාර්තා වූ සියයට 49.9ක සිට 1995 වසර වනවිට සියයට 26.1ක් දක්වා පහළ ගොස් ඇති අතර, අඩු බර ළමා ජනගහන ප්‍රතිශතය 1975 වසරේ වාර්තා වූ සියයට 57.3ක සිට 1995 වසරේ දී සියයට 29.3ක් දක්වා අඩු විය. කෙසේවෙතත්, පසුගිය දශක කිහිපය තුළ මන්දපෝෂණය තුරන් කිරීමෙහි ප්‍රගතිය මන්දගාමී වී ඇත. 2016 නවතම ප්‍රජා විද්‍යාත්මක සහ සෞඛ්‍ය සමීක්ෂණයෙන් පිළිබිඹු වන පරිදි, වයස අවුරුදු පහට අඩු දරුවන් අතර උසට සරිලන බර නොමැති දරුවන්ගේ ප්‍රතිශතය, සියයට 15.1ක මට්ටමේ පවතින අතර, එය දරුවන් අතර උසට සරිලන බර නොමැති ප්‍රතිශතයට අදාළව ජාත්‍යන්තර ලෙස පිළිගත් ඉහළ අවදානම් සීමාවක් වෙත ළඟා වීමකි. එසේම, වයස අවුරුදු පහට අඩු දරුවන් අතර උසට සරිලන බර නොමැති දරුවන්ගේ ප්‍රතිශතය 1995/96 වසර සිට 2016 දක්වා කාලය තුළ සමීක්ෂණ සිදුවන අවස්ථාවලදී සැලකියයුතු ප්‍රගතියක් පෙන්වා නැත. ලෝක බැංකු සංඛ්‍යා ලේඛන වලට අනුව, අවුරුදු පහට අඩු දරුවන් අතර උසට සරිලන බර නොමැති දරුවන් ප්‍රතිශතය සැලකීමේ දී, ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපය තුළ වඩාත් බලපෑමට ලක්වූ රටවල් අතර දෙවන ස්ථානයට පත්ව ඇත. තවද, මෙම කාණ්ඩය තුළ අඩු බර ළමුන් ප්‍රතිශතය, 2000 වසරේ සිට සියයට 20.0ක් ආසන්නයේ පවතින අතර, වයසට සරිලන උස නොමැති ළමුන් ප්‍රතිශතයෙහි ද සැලකියයුතු ප්‍රගතියක් වාර්තා වී නොමැත.

3

රූප සටහන වි.ස. 5.1
ළමා මන්දපෝෂණ තත්ත්වය (වයස අවුරුදු 5ට අඩු දරුවන්)
(1975-2016)



මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මේ අතර, රටෙහි ප්‍රාදේශීය වශයෙන් සහ ආර්ථික අංශ අතර පවතින මන්දපෝෂණ තත්ත්වයේ විෂමතා මගින් පෙන්නුම් කෙරන්නේ, පෝෂණ විෂමතා දිගු කාලයක් මුළුල්ලේ නොවිසිඳී පවතින බවයි. නේවාසික අංශ සැලකීමේදී, අවුරුදු පහට අඩු ළමුන් අතර වයසට සරිලන උස අඩු බව සහ අඩු බර දර්ශකවලට අදාළ ඉහළම ප්‍රතිශත වාර්තා කරමින්, වතු අංශය වඩාත් අවධානමට ලක් විය හැකි අංශය බවට පත්ව ඇත. 2016 වසරේ ප්‍රජා විද්‍යාත්මක සහ සෞඛ්‍ය සමීක්ෂණයට අනුව, නාගරික අංශයේ සියයට 14.7කට සහ ග්‍රාමීය අංශයේ සියයට 17.0කට සාපේක්ෂව වයස අවුරුදු පහට අඩු ළමුන්ගෙන් වයසට සරිලන උසක් නොමැති ප්‍රතිශතය වතු අංශයෙහි සියයට 31.7ක් පමණ වේ. තව ද, වතු අංශයේ වෙසෙන වයස අවුරුදු පහට අඩු දරුවන්ගෙන් සියයට 29.7ක් අඩු බර සහිත දරුවන් වේ. දිස්ත්‍රික්ක අතර සැලකුවිට, වයස අවුරුදු පහට අඩු දරුවන් අතර වයසට සරිලන උස නොමැතිවීමේ සහ අඩු බරට අදාළ ඉහළ ම ප්‍රතිශතයන් නුවර එළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. පෝෂණයට අදාළව ප්‍රාදේශීය වශයෙන් පවතින විෂමතා සඳහා මූලික වශයෙන් ආර්ථික සුරක්ෂිතතාව, සෞඛ්‍ය සහ අධ්‍යාපන පහසුකම් සඳහා ඇති ප්‍රවේශය, ප්‍රදේශ අතර සබඳතා සහ යටිතල පහසුකම් සංවර්ධනය වැනි සමාජ ආර්ථික සාධක හේතුවේ. උදාහරණයක් ලෙස මවගේ අධ්‍යාපනික මට්ටම ළමයින්ගේ පෝෂණ මට්ටම කෙරෙහි බලපෑම් කරන ප්‍රධාන සාධකයක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව, උපාධි හෝ ඉන් ඉහළ මට්ටමේ අධ්‍යාපන සුදුසුකම් සහිත මව්වරුන් කාණ්ඩය තුළ උපදින දරුවන් අතර, පිළිවෙළින්, සියයට 12.1ක් හා සියයට 10.0ක් ලෙස වාර්තා වී ඇති වයසට සරිලන උස නොමැති දරුවන්ගේ ප්‍රතිශතය සහ අඩු බර දරුවන්ගේ ප්‍රතිශතය හා සැසඳීමේ දී, විධිමත් අධ්‍යාපනයක් නොලත් මව්වරුන්ට උපදින දරුවන් අතර, මෙම ප්‍රතිශත, පිළිවෙළින්, සියයට 37.6ක් හා සියයට 33.9ක් ලෙස සැලකිය යුතු ඉහළ මට්ටමක පවතී. 2019 ගෘහ ඒකක අදායම් සහ වියදම් සමීක්ෂණය පදනම්ව ගණනය කරන ලද ශ්‍රී ලංකාවේ ළමයින් සඳහා වූ බහුමාන දරිද්‍රතා දර්ශකය මගින් වයස අවුරුදු 0-4 අතර ළමයින්ගෙන් තුනෙන් එකක් බහුමාන වශයෙන් දරිද්‍රතාවයෙන් පෙළෙන අතර, ඔවුන් අඩු බර හෝ වයසට සරිලන උස නොමැති වීම යන මන්දපෝෂණ ගැටලු වලින් පීඩා විඳින බව පෙන්නුම් කරයි. මේ අතර, 2022 තිරසාර සංවර්ධන වාර්තාවට (Sustainable Development Report 2022) (Sachs. J et al. 2022) අනුව, අපේක්ෂිත සහශ්‍ර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට ප්‍රමාණවත් වන පරිදි ප්‍රගතියක් නොපෙන්වන කුසගින්නට අදාළ දර්ශක මගින් පිළිබිඹු වන අයුරින්, 2030 වසර වනවිට කුසගින්න සම්පූර්ණයෙන්ම තුරන් කරලීමේ ඉලක්කය කරා ළඟාකර ගැනීමට ශ්‍රී ලංකාව පෙන්නුම් කරන ප්‍රගතිය මන්දගාමී මට්ටමක පසු වේ.

ළමුන්ගේ පෝෂණ මට්ටම් කෙරෙහි වර්තමාන ආර්ථික අර්බුදයෙන් ඇති බලපෑම

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මගින් ප්‍රකාශිත මන්දපෝෂණයට අදාළ සංකල්පමය රාමුවට[1] අනුව, මන්ද පෝෂණය සඳහා ප්‍රධාන හේතුවක් ලෙස ආර්ථික සාධක හඳුනාගෙන ඇති අතර, මෙම ආර්ථික සාධක මගින් ජනතාවගේ පෝෂණ මට්ටම් කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය හැක. ව්‍යසනකාරී ආර්ථික තත්ත්වයන් මගින්, විශේෂයෙන් ම සැපයුම් මාර්ග සහ ආහාර සැපයුම් පද්ධති මෙන්ම, ජනතාවගේ ආදායම් මාර්ග මත අවහිරතා ඇති කිරීම හරහා පෝෂණීය ආහාර සඳහා කුටුම්භවලට ඇති ප්‍රවේශය මෙන්ම, මිලදී ගැනීමේ හැකියාව මත බලපෑම් කරමින් ජනතාවගේ පෝෂණ යහ පැවැත්මට සෘජු බලපෑම් ඇති කරයි. ආර්ථික කම්පන මගින් බොහෝ අවස්ථාවලදී අවදානමට ලක්විය හැකි ජන කොටස් කැලරි අධික, නමුත් පෝෂණයෙන් අඩු ආහාර වෙත ප්‍රමුඛත්වය දීමට පොළඹවන අතර, එය පුද්ගලයන්ගේ ආහාර වේලෙහි ගුණාත්මකභාවය පිරිහීමට තුඩු දෙන බැවින් එහි අවසාන ප්‍රතිඵලයක් ලෙස මන්දපෝෂණය ඉහළ යෑමක් සිදුවේ.

ශ්‍රී ලංකාව, දැනට වාර්තාගත ස්වකීය දරුණුතම ආර්ථික අවපාතය සහ එහි ප්‍රතිඵලයක් ලෙස උත්සන්න වූ සාර්ව ආර්ථික අස්ථායීතා මගින් ඇති වූ පෙර නොවූ විරූ මෙන්ම, පුළුල් වූ සමාජ හා ආර්ථික බලපෑම් නිර්මාණය වූ ආකාරය නිදර්ශනය කරන අතර, එම බලපෑම් අතුරින් ජනගහනයේ පෝෂණ යහපැවැත්මෙහි පිරිහීම, විශේෂයෙන් ම පරම්පරා ගණනාවකට බලපෑම් ඇති කෙරෙන ළමා මන්දපෝෂණය ඉහළ යෑම, බරපතල ගැටලුවක්ව පවතී. පොහොර හිඟයෙහි ප්‍රතිඵලයක් ලෙස දේශීය ආහාර සැපයුමෙහි පහළ යෑම හා සමගාමීව ආර්ථික අර්බුදය නිසා සැපයුම් දාමයේ ඇතිවූ අවහිරතා සහ පිරිවැය ඉහළ යෑම හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ආහාර මිල ගණන් 2021 වසරේ

1 මන්දපෝෂණය ඇති වීමේ ආසන්නතම හේතු වන්නේ පෝෂණය අඩු ආහාර ගැනීම (ප්‍රමාණය හා ගුණාත්මය), කායිකව ක්‍රියාකාරකම්වල නොයෙදීම හා රෝග තත්ත්වයන් වන අතර, කුටුම්භවල ආහාර අනාරක්ෂිතතාව, ළමුන් හා කාන්තාවන් සඳහා ප්‍රමාණවත් නොවන සැලකිල්ල, ප්‍රශස්ත නොවන මට්ටමේ සෞඛ්‍ය සේවාවන් සහ උදාසීන ජීවන රටා සහ හැසිරීම් යනාදිය මන්දපෝෂණය සඳහා බලපාන මූලික හේතු වේ. මන්දපෝෂණය සඳහා හේතුවන පදනම් සාධක වන්නේ සමාජ-සංස්කෘතික, ආර්ථික හා දේශපාලන මෙන්ම දේශගුණික විවලතාවන්ය. මෙම සාධක ආහාර සඳහා වන ප්‍රවේශය මෙන්ම මිල දී ගැනීමේ හැකියාව මත බලපෑම් ඇති කළ හැක.

සංඛ්‍යා සටහන වි.ස. 5.1

ළමා මන්දපෝෂණ තත්ත්වය පිළිබඳ මෑත කාලීන දත්ත

දර්ශකය	වයස අවු: 05ට අඩු ළමුන්ගේ ප්‍රතිශතය						
	2016	2017	2018	2019	2020	2021	2022
අඩු බර	15.6	14.5	14.3	14.0	13.1	12.2	15.3
වයසට සරිලන උස නොමැතිවීම	9.2	9.0	8.9	8.4	8.2	7.4	9.2
උසට සරිලන බර නොමැතිවීම	11.3	11.1	10.2	9.9	8.6	8.2	10.1
අධි බර	0.5	0.5	0.6	0.6	0.8	0.8	0.6

මූලය: පවුල් සෞඛ්‍ය කාර්යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය

අවසාන කාලපරිච්ඡේදයේ සිට ඉහළ යෑමට පටන් ගත් අතර, ආහාර උද්ධමනය, 2020 වසර අවසානයේ පැවති සියයට 9.2ට සහ 2021 වසර අවසානයේ පැවති සියයට 22.1ට සාපේක්ෂව, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී ඉතිහාසයේ වාර්තා වූ ඉහළම මට්ටම වන සියයට 94.9ක් දක්වා ළඟාවිය. 2022 වසර අග කාලයේ දී ආහාර උද්ධමනයෙහි යම් පහළ යෑමක් දක්නට ලැබුණ ද, 2022 වසර තුළ ආහාර මිල ගණන් සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතුණි. උද්ධමනයෙහි ඉහළ යෑම කුටුම්භ වල මූර්ත ආදායම සැලකිය යුතු ලෙස පිරිහීමට හේතු වූ අතර, අර්බුදය හේතුවෙන්, විශේෂයෙන් ම අවිධිමත් අංශයේ ජීවනෝපායයන් අහිමිවීම හරහා කුටුම්භ මත ඇති පීඩනය උග්‍ර විය. සමස්ත සේවා නියුක්තියෙන් සියයට 58.4ක ප්‍රතිශතයක් අවිධිමත් අංශයේ සේවා නියුක්තිවීම සහ ජනගහනයෙන් සියයට 14.3ක් දරිද්‍රතා මට්ටමට පහළින් පසුවෙන වාතාවරණයක් තුළ, ජීවනෝපායයන්, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණ මට්ටම් කෙරෙහි ආර්ථික අර්බුදය මගින් ඇති කළ හැකි බලපෑම සැලකිය යුතු මට්ටමක පවතී. ඒ අනුව, අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ කුටුම්භ වලට එම අභියෝගයන්ට මුහුණදීම සඳහා විකල්ප උපායමාර්ග අනුගමනය කිරීමට සිදුව ඇත.

පරිගණක ආධාරක දුරකථන සම්මුඛ පරීක්ෂණ (Computer Assisted Telephone Interviewing) පදනම්වූ දත්ත රැස් කිරීමේ ප්‍රවේශය හරහා පළාත් නවයම ආවරණය වන පරිදි සිදුකළ සමීක්ෂණ 2,137කින් සමන්විත, ලෝක ආහාර සංවිධානයේ දුරස්ථ කුටුම්භ ආහාර සුරක්ෂිතතා සමීක්ෂණයට අනුව, 2022 වසර අවසානය වනවිට රටේ ආහාර සුරක්ෂිතතාව අවදානම් සහගත මට්ටමක පැවති අතර, ජනගහනයෙන් සියයට 68.0ක් පමණ ආහාර ගන්නා ප්‍රමාණය අඩු කිරීම, ආහාර වේල් ගණන අඩු කිරීම සහ අඩු රුචිකත්වයක් දක්වන ආහාර මත යැපීම වැනි විකල්ප ආහාර උපායමාර්ග වෙත යොමු වී තිබුණි. මේ අතර, ජනගහනයෙන් සියයට 40ක් පමණ අධ්‍යාපනය සහ සෞඛ්‍ය සඳහා වූ වියදම් කපා හැරීම වැනි ක්‍රියාමාර්ග හරහා ජීවනෝපාය මත පදනම් විකල්ප උපාය මාර්ග වෙත යොමු වී ඇති අතර, එය අවසානයේ දී දිගු කාලීන වශයෙන් පෝෂණ මට්ටම් සහ යහපැවැත්ම පිරිහීම කෙරෙහි හේතුවිය හැක. සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවුල් සෞඛ්‍ය කාර්යාංශය විසින් "පෝෂණ මාසය" සංකල්පය යටතේ 2022 ඔක්තෝබර් මාසයේ දී අවුරුදු පහට අඩු දරුවන්ගේ පෝෂණ මට්ටම පිළිබඳව සිදු කරන ලද නවතම නිල සමීක්ෂණය මගින් ආර්ථිකයේ අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ කුටුම්භ වල යහපැවත්මෙහි සිදු වූ පරිහානිය පිළිබිඹු කරමින් ළමුන්ගේ පෝෂණ මට්ටම් 2022 වසර තුළ දී පිරිහීමකට ලක්ව ඇති බව අනාවරණය කරයි. මෙම අධ්‍යයනයෙහි ප්‍රතිඵල අනුව ළමුන් සඳහා අදාළ වන සියලුම ප්‍රධාන පෝෂණ තත්ත්ව දර්ශකයන්, විශේෂයෙන් ම අවුරුදු පහට අඩු දරුවන් අතර වයසට සරිලන උස නොමැතිවීම, උසට සරිලන බර නොමැතිවීම සහ අඩු බර යන දර්ශක වල තවදුරටත් අයහපත් වීමක් පෙන්නුම් කරයි. ජාතික මට්ටමෙන් සැලකූ විට, අවුරුදු පහට අඩු ළමුන් අතර අඩු බර ළමුන්ගේ ප්‍රතිශතය 2021 වසරේ වාර්තා වූ සියයට 12.2ක සිට 2022 වසර වනවිට සියයට 15.3ක් දක්වා ඉහළ ගොස් ඇත. අවුරුදු පහට අඩු ළමුන් අතර වයසට සරිලන උස නොමැති සහ උසට සරිලන බර නොමැති ප්‍රතිශත, පිළිවෙළින්, 2021 වසරේ වාර්තා වූ සියයට 7.4ක සහ සියයට 8.2ක සිට 2022 වසරේ දී, පිළිවෙළින්, සියයට 9.2ක් සහ සියයට 10.1ක් දක්වා ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, ළමුන් අතර පවත්නා අධි බර තත්ත්වයෙහි යම් යහපත් වර්ධනයක් 2022 වසරේ දී පෙන්නුම් කරයි.

ඉහත සමීක්ෂණයට අනුව, රට පුරා පවතින ළමා පෝෂණ විෂමතා තවදුරටත් තීව්‍ර කරමින් බොහෝ දිස්ත්‍රික්කවල ළමා මන්දපෝෂණ තත්ත්වය අයහපත් ලෙස වර්ධනය වී ඇත. ළමුන් අතර වයසට සරිලන උස නොමැති ළමුන්ගේ වැඩිම ප්‍රතිශතය වන සියයට 22.8 නුවර එළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර, එහි අඩුම ප්‍රතිශතය වන සියයට 5.1 කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. තවද, අවුරුදු පහට අඩු ළමුන් අතර ඉහළ ම අඩු බර ළමුන් ප්‍රතිශතය වන සියයට 23.9 නුවර එළිය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර, අඩු බර ළමුන්ගේ අඩුම ප්‍රතිශතය වන සියයට 9.8 කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. රජයේ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් තිබුණ ද රට තුළ පෝෂණ විෂමතා අඛණ්ඩව පවතින බව මින් පිළිබිඹු වන අතර, මෙම විෂමතා මැඩලීම සඳහා ඒකාබද්ධ ප්‍රයත්නයක් නොගතහොත් ආර්ථික අර්බුදය මධ්‍යයේ මෙම විෂමතාවන් තවදුරටත් උග්‍ර වනු ඇත.

3

රූප සටහන වි.ස. 5.2
දිස්ත්‍රික්ක මට්ටමේ අයහපත් වන ළමා මන්දපෝෂණ තත්ත්වය



මූලයඃ පවුල් සෞඛ්‍ය කාර්යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය

රජයේ ප්‍රතිචාර

ආර්ථික සහ ආහාර අර්බුදය මගින් ජනගහනයේ පෝෂණ මට්ටම් මත ඇති කරන අහිතකර බලපෑම් මැඩ පවත්වා ගැනීමට සහ මන්දපෝෂණ තත්ත්වයන් තවදුරටත් පිරිහීම වළක්වා ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2022-2024 සඳහා වූ හදිසි පෝෂණ සැලසුමක් සකස් කරන ලදී. මෙම සැලැස්ම මගින් ආහාර සුලබතාවයෙහි හා මිල දී ගැනීමේ හැකියාවෙහි පවතින විෂමතා, අවදානමට ලක්විය හැකි ප්‍රජාව සඳහා වූ සෞඛ්‍ය පද්ධති සේවාවන්ගේ දුර්වලතා සහ පෝෂණ ගැටලු වළක්වාලීම සඳහා වූ සන්නිවේදන හා බලගැන්වීමේ ක්‍රියාවලියේ දුර්වලතා යන තීරණාත්මක ගැටලු සඳහා විසඳුම් ලබාදීම ඉලක්ක කරයි. ඒ අනුව, සියලුම පාර්ශ්වකරුවන්, හඳුනාගත් උපායමාර්ග සහ ප්‍රධාන ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධ වන අතර ම, ක්‍රියාවට නැංවීමේ සෑම අදියරයක දී එහි ප්‍රගතිය අධීක්ෂණය කෙරේ. මේ අතර, අඩු ආදායම්ලාභී පවුල්වල ගර්භණී මවුවරුන් සහ කිරිදෙන මවුවරුන්, කාන්තාවන් ගෘහ මූලිකත්වය දරන පවුල්, අවුරුදු පහට අඩු දරුවන් මෙන්ම, මන්දපෝෂණයෙන් පෙළෙන පුද්ගලයින් ඇතුළු අවදානමට ලක්විය හැකි ප්‍රජාව ඉලක්ක කරමින්, ජාත්‍යන්තර ආයතනවල ද සහාය ඇතිව රජය විසින් මූල්‍ය ආධාර වැඩසටහන් ගණනාවක් ක්‍රියාවට නංවන ලදී. මෙම වැඩසටහන් මගින් කුටුම්භවල ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම ඉලක්ක කරන අතර, පාසල් ආහාර වැඩසටහන් හරහා පාසල් ළමුන්ට සමබර ආහාර වේලක් ලබා දීමට ද කටයුතු කර ඇත. මේ අතර, පවුල් සෞඛ්‍ය කාර්යාංශය හරහා අනෙකුත් සෞඛ්‍ය සේවාවන් පවත්වාගෙන යන අතර, උග්‍ර මන්දපෝෂණයෙන් පෙළෙන ළමුන් සඳහා ආහාරමය පෝෂණ අතිරේක ලබාදීම ද අඛණ්ඩව සිදු කෙරිණි.

ළමා මන්දපෝෂණය තුරන් කිරීම සඳහා වූ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රය

මේ දක්වා බලයට පැමිණි රජයයන් විසින් මන්දපෝෂණය දුරලීම සඳහා ගෙන ඇති ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, හදිසි සමාජ ආර්ථික කම්පන සඳහා ඔරොත්තු දීමට ප්‍රමාණවත් නොවේ. බහු ආංශික රාමුවක් තුළ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සහ මන්දපෝෂණය තුරන්කරලීම ඉලක්ක කරගත් උපායමාර්ග නැවත සමාලෝචනය කිරීමේ අවශ්‍යතාව එමගින් අවධාරණය කරයි. ඒ සම්බන්ධව දැනට ක්‍රියාත්මක වන පෝෂණ වැඩසටහන්වල පවතින දුර්වලතා සඳහා විසඳුම් යොදමින්, කෙටි කාලීන සහ දිගු කාලීන වශයෙන් විසඳුම් සපයන ප්‍රතිපත්ති සම්පාදනය කිරීම අවශ්‍ය වේ. සමාජ ආරක්ෂණ ජාල ක්‍රියාත්මක කිරීම සහ දැනට ක්‍රියාත්මක සමාජ ආරක්ෂණ වැඩසටහන් පුළුල් කිරීම වැනි කෙටි කාලීන විසඳුම් මගින් ආහාර මිල ගණන් ඉහළ යෑමෙන් ආදායමට වන බලපෑම් සඳහා විසඳුම් ලබාදීම කළ යුතු අතර, අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම සුබසාධන වැඩසටහන් ක්‍රමවත්ව ඉලක්කකරණය කිරීම සහ අවදානම් තත්ත්වයෙන් බැහැර වූ ප්‍රතිලාභීන් සුභසාධන වැඩසටහන් වලින් විධිමත්ව ඉවත්කිරීමේ ප්‍රවේශයක් තහවුරු කිරීම අවශ්‍ය වේ. රජයේ මුලිකත්වයෙන් සිදු කෙරෙන පෝෂණ මැදිහත්වීම් සඳහා රාජ්‍ය මූල්‍ය අවකාශය සීමිත වීම හමුවේ, අවදානමට ලක්විය හැකි අංශ මුහුණ දී සිටින කුසගින්න අවම කිරීම සඳහා කෙටි කාලීන විසඳුම් ලෙස ආධාර සපයන නියෝජිතායතන සහ මිත්‍ර රටවලින් ආහාර ආධාර කඩිනමින් ලබා ගැනීමට කටයුතු කිරීම ඉතා තීරණාත්මක වන අතර, එවැනි වැඩසටහන් වල අධීක්ෂණය සහ ඇගයීම් පරදෘශ්‍යභාවයකින් සිදු කළ යුතුව ඇත. 'ප්‍රජා මුළුතැන්ගෙය' වැනි ප්‍රජා පදනම් වැඩසටහන් මගින් ඌන පෝෂණයට හේතුවන බොහෝ ගැටලු සඳහා විසඳුම් සැපයීමට පොදු වේදිකාවක් නිර්මාණය කරනු ලබන හෙයින්, එවැනි වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම වඩාත් ප්‍රතිලාභදායක වේ. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මගින් දක්වා ඇති මාතෘ සහ ළමා පෝෂණය වැඩි දියුණු කිරීම සඳහා වූ පද්ධති ප්‍රවේශය අනුව, ළමා මන්දපෝෂණය දුරලීම සඳහා වූ දිගු කාලීන උපාය මාර්ග, ප්‍රධාන වශයෙන් ආහාර සැපයුම් පද්ධතිය, සෞඛ්‍ය පද්ධතිය, ජල හා සනීපාරක්ෂක පද්ධතිය, අධ්‍යාපන පද්ධතිය සහ සමාජ ආරක්ෂණ පද්ධතිය යන පද්ධති මත පදනම් විය යුතු වේ. ඒ අනුව, පෝෂණීය සහ සුරක්ෂිත ආහාර සඳහා තිරසාර ප්‍රවේශය තහවුරු කෙරෙන ආහාර සැපයුම් පද්ධති වෙනුවෙන් කෙරෙන ප්‍රතිසංස්කරණ හා ආයෝජන ඉතා වැදගත් වන අතර, පවුල් සඳහා වඩාත් පෝෂණීය ආහාර තෝරා ගැනීම සඳහා අවස්ථා ලබා දිය යුතු වේ. මේ සම්බන්ධව දැරීමට හැකි මිලක් යටතේ සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ලබා

ගැනීම තහවුරු කිරීම සඳහා රටේ ආහාර පද්ධතියෙහි සැලකිය යුතු පරිවර්තනයක් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ. නවෝත්පාදන සහ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් ඉහළ නැංවීම හා සමගාමීව කෘෂි අංශයේ ඵලදායීතාව ඉහළ නැංවීම, පසු අස්වනු හානිය අවම කිරීම, කෘෂි අංශයේ එකතුකළ අගය ඉහළ නැංවීම, ආහාර පද්ධති වල ආනයන රැඳියාව අඩු කිරීම, කාලගුණයට ඔරොත්තුදෙන ආහාර භෝග හඳුන්වා දීම, විශේෂයෙන් ම සමෝධානික ගොවිතැන ප්‍රචලිත කිරීම හරහා පෝෂණ ගුණයෙන් පිරිපුන්, පුළුල් පරාසයක ආහාර ප්‍රභේද ප්‍රවර්ධනය, කෘෂි අංශයේ සහනාධාර සහ බදු ප්‍රතිතුලනය කිරීම සහ කෘෂි ආර්ථික පරිචයන් වැඩිදියුණු කිරීම මෙන්ම, හදිසි ආහාර අර්බුද තත්ත්වයන්ට මුහුණ දීම සඳහා ප්‍රමාණවත් පරිදි ආහාර ස්වාරක්ෂක තොගයක් පවත්වාගෙන යෑම යනාදිය මේ යටතට ඇතුළත් වේ.

මහජනතාව අතර හිතකර පෝෂණ පිළිවෙත් දියුණු කිරීමට දායක වීමට අමතරව, මන්දපෝෂණය වැළැක්වීමේ සහ එයට ප්‍රතිකාර කිරීම සඳහා වූ සෞඛ්‍ය අංශයේ භූමිකාව ඉටු කිරීමට හැකි වන පරිදි සෞඛ්‍ය අංශය වැඩි දියුණු කළ යුතු වේ. ඊට අදාළව, මූලික සෞඛ්‍ය සහ පෝෂණ සේවාවන් සඳහා ප්‍රවේශය පුළුල් කිරීමේ අරමුණින් එම අංශ වෙත කෙරෙන නව ආයෝජන දිරිමත් කිරීම අත්‍යවශ්‍ය වන අතර, වඩාත් අවදානමට ලක්ව ඇති ප්‍රජාවන් සඳහා මූලික පෝෂණ පැකේජ හඳුන්වාදීම කළයුතු වේ. තවද, අධ්‍යාපනික මට්ටම සහ මන්දපෝෂණය අතර පවතින දැඩි ප්‍රතිලෝම සම්බන්ධතාව සැලකීමේ දී, විශේෂයෙන් ම, අවදානමට ලක්විය හැකි ජන කොටස් ඉලක්ක කරමින් අධ්‍යාපනය මත ආයෝජන සිදු කිරීම ඉතා වැදගත් වේ. විශේෂයෙන් ම, කාන්තාවන්ගේ අධ්‍යාපනය ඉලක්ක කරගත් ආයෝජන, ළමයින්ගේ පෝෂණ මට්ටම තීරණය කිරීමෙහිලා ඉතා වැදගත් කාර්යභාරයක් සිදු කරන අතර, අධ්‍යාපනය තුළින් කාන්තාවන් සඳහා නිර්මාණය වන ආදායම් ඉඩ ප්‍රස්ථා කුටුම්භ වල පෝෂණ අවදානම් මඟ හරවා ගැනීමට උපකාරී වේ.

ආර්ථික අර්බුදය මධ්‍යයේ ළමා මන්දපෝෂණයට අදාළව අලුතින් නිර්මාණය වී ඇති අවදානම්වල පුළුල් හා දිගු කාලීන බලපෑම් සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණය තුරන් කරලීම සඳහා කෙටි හා මධ්‍ය කාලයේ සිට දිගු කාලය දක්වා දිවෙන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයින් කටයුතු කළ යුතුවේ. ඒ අනුව, ළමුන්ගේ පෝෂණ තත්ත්වයන් නංවාලීම සඳහා ප්‍රතිපත්ති තීරණ ක්‍රියාවට නැංවීමේදී, රටේ සමස්ත ජනතාවගේ සහයෝගය මෙන්ම විශේෂයෙන් ම රජය, සෞඛ්‍ය පද්ධතිය, අහාර සැපයුම් පද්ධතියේ සහභාගීවන්නන් ඇතුළු ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික සහ මනාව සම්බන්ධීකරණය වූ ප්‍රයත්නයන් ඉතා වැදගත් වේ. මෙවැනි සාමූහික ප්‍රයත්නයන් හරහා පෝෂණයට අදාළ ක්‍රමෝපායන් සැකසීමේදී පර්ශ්වකරුවන් අතර සම්බන්ධතාව ශක්තිමත් කිරීම, දැනට පවතින පෝෂණ වැඩසටහන් වල ධාරිතාව ශක්තිමත් කිරීම, සහ එවැනි ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සිදු කළ හැකි අතර, පෝෂණය සඳහා ළමුන්ට ඇති අයිතිය සුරක්ෂිත කරලීම සඳහා දත්ත කේන්ද්‍රීය කරගත් සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීමේ ක්‍රියාවලියක් සහතික කළ හැක.

මූලාශ්‍ර

1. Department of Census and Statistics (2016) Demographic and Health Survey Report [Online]. Available at: http://www.statistics.gov.lk/ (Accessed: 10 Feb 2023)
2. Family Health Bureau, Ministry of Health (2022) Nutritional Month Report [Online]. Available at: https://www.fhb.health.gov.lk/ (Accessed: 08 Feb 2023)
3. Food and Agriculture Organization of the United Nations (2013) The State of Food and Agriculture [Online]. Available at: https://www.fao.org/ (Accessed: 10 Feb 2023)
4. Jayawardena, P.(2020) A Proactive Path to Combat Malnutrition in Sri Lanka[Online]. Available at: https://www.ips.lk/ (Accessed: 15 Feb 2023)
5. Sachs, J. Lafortune, G. Kroll, C. Fuller, G. and Woelm, F. (2022) Sustainable Development Report 2022. From Crisis to Sustainable Development: the SDGs as Roadmap to 2030 and beyond [Online]. Available at: https://dashboards.sdgindex.org (Accessed: 10 Feb 2023)
6. United Nations Children's Fund (2020) Nutrition for Every Child. UNICEF Nutrition Strategy 2020-2030 [Online]. Available at: https://www.unicef.org/ (Accessed: 25 Feb 2023)
7. Weerahewa, J. (2018) Food Policies and Nutrition Transition in Sri Lanka: Historical Trends, Political regimes, and options for Interventions [Online]. Available at https://www.researchgate.net/ (Accessed: 19 Feb 2023)
8. World Food Programme (2022) Sri Lanka Food Security Monitoring - Remote Household Food Security Survey [Online]. Available at: https://reliefweb.int/ (Accessed: 01 Mar 2023)
9. World Health Organization (2016) Strategic Action Plan to reduce the double burden of malnutrition in the South-East Asia Region 2016–2025 [Online]. Available at: https://www.who.int/ (Accessed: 22 Feb 2023)

3

ක්‍රියාත්මක වන පරිදි, තවත් වසරකින් දීර්ඝ කරන ලද අතර, එම ප්‍රතිපත්තිමය තීරණයෙහි වලංගුභාවය 2023 වසරේ දෙසැම්බර් මාසයේ 31 වන දින දක්වා පවතී. මීට අමතරව, සෞඛ්‍ය අංශ සේවකයන් ඇතුළු රාජ්‍ය සේවකයන්ට විදේශ ගැකියා සඳහා වසර පහක වැටුප් රහිත නිවාඩුවක් ලබා ගැනීමට අවසර ලබා දීමට රජය තීරණය කළේය. කෙසේ වෙතත්, ආර්ථික අර්බුදය මධ්‍යයේ සෞඛ්‍ය අංශයේ ඉහළ නිපුණතා සහිත පිරිස් රටින් පිටට සංක්‍රමණය වීමේ ප්‍රවණතාව ඉහළ යෑම හේතුවෙන් ඉදිරි කාලසීමාව තුළ මහජන සෞඛ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් එය දැඩි බලපෑම් ඇති කළ හැකි අතර, එමගින් ඉහළ නිපුණත්වයක් සහිත වෛද්‍ය වෘත්තිකයන් සහ විශේෂඥයින් රට තුළ රඳවා ගැනීමට ඉතා ඉක්මන් ප්‍රතිපත්තිමය ප්‍රතිචාරයක් ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කෙරෙයි.

ශ්‍රී ලංකාවේ රෝග වැළැක්වීම සහ රෝග නිවාරණ යන දෙඅංශයෙහිම සෞඛ්‍ය සේවා සැපයීමට අදාළව පෞද්ගලික අංශය අඛණ්ඩව වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. 2022 වසර අවසන් වන විට සමස්ත ඇඳන් සංඛ්‍යාව 5,602කින් සමන්විත ලියාපදිංචි පෞද්ගලික රෝහල් සංඛ්‍යාව 250ක් වූ අතර, වසර තුළ දී නව පූර්ණ කාලීන පෞද්ගලික සත්කාරක

3

ආයතන/බෙහෙත් ශාලා/වෛද්‍ය සායන හයක් ස්ථාපිත කරන ලදී. කොවිඩ්-19 වසංගතය පැතිරීම පාලනය කිරීමෙහිලා රජය විසින් දරන ප්‍රයත්නයට සමගාමීව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන 25ක් සහ කොවිඩ්-19 ප්‍රතිකාර මධ්‍යස්ථාන තුනක් පෞද්ගලික රෝහල් විසින් ක්‍රියාත්මක කරන ලද අතර, 2022 වසරේ දී පී.සී.ආර් පරීක්ෂණ සහ ක්ෂණික ප්‍රතිදේහජනක පරීක්ෂණ සිදුකිරීමට පුද්ගලික රසායනාගාර 13කට බලය පවරන ලදී. වෛද්‍ය සැපයුම් හිඟතාව මධ්‍යයේ රජයේ රෝහල් මගින් සපයනු ලබන විධිමත් සෞඛ්‍ය සේවාවල සීමාවන් සැලකිල්ලට ගනිමින්, 2022 වසර තුළ ජනතාවගෙන් බහුතර පිරිසක් පෞද්ගලික රෝහල්වලින් සපයනු ලබන සේවා වෙත යොමු විය. කෙසේ වෙතත්, වෛද්‍ය සැපයුම්, ඖෂධ, රසායනාගාර පරීක්ෂණ සහ උපදේශන ගාස්තු ඉහළ යෑමත් සමඟ පෞද්ගලික සෞඛ්‍ය සේවා සපයන්නන් නියාමනය කිරීම සඳහා පවතින යාන්ත්‍රණයේ දුර්වලතා පිළිබිඹු කරමින්, මෙම පෞද්ගලික වෛද්‍ය සේවාවන්හි ගාස්තු අය කිරීම් විශාල ලෙස ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, පෞද්ගලික සෞඛ්‍ය සේවා වෙත යොමු වන පුද්ගලයන්, විශේෂයෙන් ම මැදි ආදායම්ලාභීන්, එම පහසුකම් ලබා ගැනීමෙන් ඉවත් වීම වසර තුළ දී නිරීක්ෂණය විය. මෙම පසුබිම තුළ, සැමට සාධාරණ සෞඛ්‍ය ප්‍රවේශයක් සහතික කිරීම සඳහා, බොහෝ දුරට අවධානමට ලක් විය හැකි ජන කණ්ඩායම් සඳහා වූ රජයේ සෞඛ්‍ය සේවා ප්‍රතිලාභ වෙත බලපෑමක් නොමැතිව රජයේ සෞඛ්‍ය සේවා සැපයුමට අනුපූරකයක් ලෙස පෞද්ගලික සෞඛ්‍ය සේවා අංශය පුළුල් කිරීම සඳහා එම අංශය නියාමනය ශක්තිමත් කිරීම සහ පෞද්ගලික සෞඛ්‍ය සේවා සපයන්නන් සම්බන්ධ ප්‍රතීතන සහතික විධිමත් කිරීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති අත්‍යවශ්‍ය වේ.

අධ්‍යාපනය

අධ්‍යාපන පද්ධතිය කෙරෙහි බලශක්ති අර්බුදය හේතුවෙන් ඇති වූ අවහිරතා මෙන්ම කොවිඩ්-19 මගින් ඇති වූ බාධා අවම වීමත් සමඟ 2022 වසරේ දෙවන භාගයේ දී අධ්‍යාපන ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් විය. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 වසරේ සිට පාසල්, විශ්වවිද්‍යාල සහ අනෙකුත් අධ්‍යාපන මධ්‍යස්ථාන වරින්වර වසා දැමීමෙන් අනතුරුව, 2022 වසර ආරම්භයේ දී අධ්‍යයන කටයුතු සාමාන්‍ය පරිදි නැවත ආරම්භ කළ ද, දේශීය ඉන්ධන සැපයුම්වල දැඩි හිඟතාව සමඟ ඇති වූ ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් 2022 වසරේ දෙවන කාර්තුවේ මුල් භාගයේ දී අධ්‍යාපන ක්‍රියාකාරකම් නැවත වරක් අඩාල විය. දිවයින පුරා දක්නට ලැබුණු ප්‍රවාහන දුෂ්කරතා මධ්‍යයේ, 2022 වසරේ ජූනි මාසය මැද භාගයේ දී අධ්‍යයන කටයුතු මංගත ක්‍රමවේද වෙතට යොමු කෙරිණි. කෙසේ වෙතත්, වසර තුළ දී විදුලිය වරින්වර කප්පාදු කිරීම් හේතුවෙන් මෙම මංගත අධ්‍යාපනික ක්‍රමවේදයන්ට ද අහිතකර බලපෑම් ඇති විය. ඉන්ධන සැපයුමට අදාළ ගැටලුවලට යම් විසඳුම් ලබා දීමත් සමඟ අධ්‍යාපනික ක්‍රියාකාරකම් 2022 වසරේ දෙවන භාගය වන විට ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වූ අතර, 2022 වසරේ අගෝස්තු මාසයේ සිට අධ්‍යයන කටයුතු සාමාන්‍ය පරිදි නැවත ආරම්භ කිරීමට හැකි විය. වසර තුළ දී අධ්‍යයන කටයුතු භෞතික වශයෙන් සාමාන්‍ය පරිදි සිදු කිරීම පූර්ණ වශයෙන් නැවත ආරම්භ වුව ද, 2020 වසරේ සිට අධ්‍යයන කටයුතුවලට වරින්වර ඇති වූ බාධා හේතුවෙන් නිර්මාණය වූ ඉගෙනුම් අවස්ථා අහිමිවීමේ බලපෑම අඛණ්ඩව පවතී. අධ්‍යාපන යටිතල පහසුකම් සහ තාක්ෂණය ආශ්‍රිත යටිතල පහසුකම් සම්බන්ධයෙන් දැනටමත් පවතින විෂමතා සැලකිල්ලට ගැනීමේදී, මෙවැනි අවහිරතා මගින් අධ්‍යාපනික ප්‍රතිඵල සම්බන්ධයෙන් දිගු කාලීන අහිතකර බලපෑම් ඇති කිරීමට හැකියාව ඇති අතර, එය විවිධ ආර්ථික හා සමාජීය මට්ටම්වල සහ භූගෝලීය ප්‍රදේශ අනුව ළමුන් අතර අධ්‍යාපනික ප්‍රතිඵලවල විෂමතා පුළුල් වීමට හේතු විය හැකිය. ශ්‍රී ලංකාවේ 3වන ශ්‍රේණියේ ළමුන්ගේ භාෂා සාක්ෂරතාව හා ගණිතයට අදාළ මූලික කුසලතා මට්ටම් ඇගයීම සඳහා 2021-2022 කාලය තුළ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කළ අධ්‍යනයකට අනුව, නියැදිය තුළ භාෂා සාක්ෂරතාවට අදාළ මූලික කුසලතා සාක්ෂාත් කරගත් ළමුන්ගේ ප්‍රතිශතය සියයට 6ක් පමණක් වන අතර, ගණිතයට අදාළ මූලික කුසලතා සාක්ෂාත් කරගත් ප්‍රතිශතය ද සියයට 7ක් වන පහළ මට්ටමක පවතී. තවද, අවදානමට ලක්විය හැකි කුටුම්භවල ළමුන් පාසල් හැරයාම ඉහළ යෑම සඳහා කොවිඩ්-19 ව්‍යාප්ත වීමෙන් අනතුරුව පාසල් දීර්ඝ කාලයක් පුරා වසා තැබීම සහ රට තුළ පැවති පෙර නොවූ අන්දමේ ආර්ථික අර්බුදය මෙන්ම, එමගින් අනෙකුත් අංශවලට ඇති කළ බලපෑම් හේතු විය. 2020 වසර සඳහා වන නවතම දත්තවලට අනුව, ප්‍රාථමික අංශයේ ළමුන් පාසල් හැර යාම, 2019 වසරේ වාර්තා වූ 8,834 සිට 9,269ක් දක්වා ඉහළ ගියේය. මෙවැනි පසුබිමක් තුළ, අර්බුදකාරී අවස්ථාවලදී මුහුණ දුන් ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ, අවදානමට ලක්විය හැකි කුටුම්භයන් අධ්‍යාපන වියදම් කපා හැරීම එක් ආර්ථික උපාය මාර්ගයක් ලෙස තෝරා ගත් බැවින්, 2022 වසරේ දී පාසල් හැර ගිය සංඛ්‍යාව තවදුරටත් ඉහළ යෑමේ

හැකියාවක් පවතී. මේ අතර, අඩු ආදායම්ලාභී කුටුම්භවල ළමුන්, ලිපි ද්‍රව්‍ය හා පාසල් සැපයුම් හිඟතාව මෙන්ම, 2022 වසර තුළ ගෘහ ඒකකවල මූල්‍ය දුෂ්කරතා මධ්‍යයේ උද්ධමනය ඉහළ යෑම හමුවේ පාසල් උපකරණවල මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් තවදුරටත් දුෂ්කරතාවලට මුහුණ දුන් අතර, එමගින් අධ්‍යාපනික ප්‍රතිඵලවල අසමානතා පුළුල් වීමේ අවදානමක් පෙන්නුම් කෙරෙයි. අනෙක් අතට, විකල්ප ඇගයීම් ක්‍රම අනුගමනය කිරීම හෝ විෂය නිර්දේශ සම්බන්ධයෙන් සැලකිය යුතු වෙනස්කම් සිදු කිරීම වෙනුවට, ජාතික මට්ටමේ විභාග කල් දැමීම මගින් කෙටි කාලීන වශයෙන් සිසුන්ගේ අධ්‍යයන ප්‍රගතියට බාධාවක් ඇති වන අතර, දිගුකාලීන වශයෙන් රටේ ඵලදායී මානව ප්‍රාග්ධන පදනමක් වර්ධනය කිරීම කෙරෙහි ද මෙමගින් බලපෑමක් ඇති කරයි. පසුගිය වසර තුනක කාලය තුළ සිසුන් විසින් අඛණ්ඩව මුහුණ දුන් දුෂ්කරතාවල ස්වභාවය අනුව, රාජ්‍ය අධ්‍යාපන ක්‍රමය තුළ ඉගෙනීම් කටයුතු සිදු කරනු ලබන සෑම මට්ටමකම සිසුන්ගේ අධ්‍යාපනික ප්‍රතිඵල කෙරෙහි මෙම බාධා මගින් වූ බලපෑම සහ උසස් අධ්‍යාපනය හැදෑරීමේදී හා රැකියා අවස්ථා හිමි වීමේදී මෙවැනි බාධා මගින් ජීවිත කාලය පුරාවටම ඇති කෙරෙන බලපෑම් පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින් අනාගත ප්‍රතිපත්ති සකස් කළ යුතුය. එබැවින්, එක් එක් අංශ අනුව රටේ ප්‍රමුඛතා පෙළගස්වමින්, මංගත අධ්‍යාපනික ප්‍රතිඵලවල ගුණාත්මකභාවය සහ පවතින යටිතල පහසුකම් පද්ධතිය වැඩිදියුණු කිරීම, නව ඇගයීම් ක්‍රම, සහ සියලු අධ්‍යාපනික මට්ටම් තුළ ශ්‍රම බලකායේ නිපුණතා ඉහළ නැංවීම සඳහා විෂය නිර්දේශවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට සාමූහික උත්සාහයන් අවශ්‍ය වේ.

2022 වසරේ දී, සැමට සමාන අධ්‍යාපන අවස්ථා සඳහා වන ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සේවාවල ගුණාත්මකභාවය, පාලනය සහ සේවා සැපයීම ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. 2022 වසර තුළ දී, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අදාළ පාර්ශ්වකරුවන් සමඟ එක්ව විෂයමාලාව සහ අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, අනාගත ඉගෙනුම් අවශ්‍යතා හඳුනා ගැනීම, අහිමි වූ ඉගෙනුම් අවස්ථා සිසුන්ට යළි ලබා දීම සහ අත්‍යවශ්‍ය අධ්‍යාපනික කුසලතා ලබා දීමට සහාය වීම මෙන්ම, ගුරු සංවර්ධන ක්‍රියාවලිය ප්‍රමිතිගත කිරීම සහ එමගින් ඉදිරි කාලය තුළ සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමවේදයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම ඉලක්ක කර ගනිමින් වත්මන් අධ්‍යාපන ක්‍රමය අඛණ්ඩව සමාලෝචනය කරන ලදී. ජාතික අධ්‍යාපන ආයතනය, 2024 වසරේ දී 1, 6 සහ 10 ශ්‍රේණි සඳහා තෝරාගත් පාසල්වල නියමු ව්‍යාපෘතියක් ලෙස දියත් කිරීමට අපේක්ෂා කෙරෙන නව විෂයමාලා ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් අඛණ්ඩව කටයුතු කළේය. 'නව ජාතික පාසල් සංවර්ධන වැඩසටහන' සහ 'ළඟම පාසල හොඳම පාසල' ව්‍යාපෘතිය වැනි නව වැඩපිළිවෙළ ද වසර තුළ දී ක්‍රියාත්මක විය. දිවයින පුරා පාසල් 525ක් තුළ උසස් පෙළ අධ්‍යාපනය සඳහා වෘත්තීය විෂය ධාරාව පිරිනැමීමත් සමඟ, 'වසර 13ක අනිවාර්ය අධ්‍යාපන' ප්‍රතිපත්තිය 2022 වසරේ දී තවදුරටත් ශක්තිමත් විය. 2022 වසරේ දී වෘත්තීය විෂය ධාරාව

3.11 සංඛ්‍යා සටහන

සාමාන්‍ය අධ්‍යාපනයේ මූලික ලක්ෂණ

ශීර්ෂය	2021 (අ)	2022 (ආ)
1. මුළු පාසල් සංඛ්‍යාව	11,088	11,082
රජයේ පාසල්	10,146	10,134
ප්‍රාථමික පාසල්	3,893	3,883
ද්විතීයික පාසල්	6,253	6,251
එයින්, ජාතික පාසල්	396	396
වෙනත් පාසල්	942	948
පිරිවෙන්	819	823
පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ)	123	125
2. මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (ඈ)	4,260,466	4,236,207
රජයේ පාසල්	4,048,937	4,024,207
වෙනත් පාසල්	211,529	212,000
පිරිවෙන්	70,310	70,500
පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ)	141,219	141,500
ජාත්‍යන්තර පාසල්	ලැ.නො.	ලැ.නො.
3. මුළු ගුරුවරු සංඛ්‍යාව (ඈ)	256,676	ලැ.නො.
රජයේ පාසල්	241,054	ලැ.නො.
වෙනත් පාසල්	15,622	ලැ.නො.
පිරිවෙන්	7,347	ලැ.නො.
පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ)	8,275	ලැ.නො.
ජාත්‍යන්තර පාසල්	ලැ.නො.	ලැ.නො.
4. නව ඇතුළත්කර ගැනීම් (ඉ)	304,105	301,519
5. ශිෂ්‍ය/ගුරු අනුපාතය		
රජයේ පාසල්	17	ලැ.නො.
වෙනත් පාසල්	14	ලැ.නො.
ජාත්‍යන්තර පාසල්	ලැ.නො.	ලැ.නො.
6. ප්‍රාථමික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය (1-5 ශ්‍රේණි)	ලැ.නො.	ලැ.නො.
7. ද්විතීයික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය (6-11 ශ්‍රේණි)	ලැ.නො.	ලැ.නො.
8. වයස් විශේෂිත ඇතුළත්වීමේ අනුපාතය (1-9 ශ්‍රේණි)	ලැ.නො.	ලැ.නො.
9. ගුරු පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව	8	8
10. වසර තුළ දී පුහුණු කළ ගුරුවරු සංඛ්‍යාව	ලැ.නො.	ලැ.නො.
11. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව	19	19
පුහුණුව ලත් මුළු ගුරුවරු සංඛ්‍යාව	ලැ.නො.	ලැ.නො.
වසර තුළ දී පුහුණුව නිමකළ ගුරු සංඛ්‍යාව	ලැ.නො.	ලැ.නො.

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) රජය විසින් අනුමත පෞද්ගලික පාසල් සහ විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා වූ පාසල් (මෙයට සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ ජාත්‍යන්තර පාසල් අයත් නොවේ)
(ඈ) ජාත්‍යන්තර පාසල්වල දත්ත ඇතුළත් නොවේ
(ඉ) රජයේ පාසල් සඳහා පමණි

මූලාශ්‍රය: අධ්‍යාපන අමාත්‍යාංශය

3

යටතේ අධ්‍යාපනය හදාරමින් සිටි සිසුන් 8,000ක් පමණ ආයතනික පුහුණුව සඳහා යොමු කරන ලද අතර, එම වසර තුළ දී, උසස් පෙළ අධ්‍යාපන විෂය ධාරාවේ හත්වැනි විෂය ලෙස ව්‍යාත්තීය අධ්‍යාපන විෂය හඳුන්වා දීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලදී. මේ අතර, වසර තුළ දී අධ්‍යයන කටයුතු භෞතික වශයෙන් සාමාන්‍ය පරිදි සිදු කිරීමට ඇති වූ බාධා මධ්‍යයේ, 2021 වසරේ සිට ක්‍රියාත්මක වූ මංගත අධ්‍යාපනික වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරමින්, අවශ්‍ය පරිදි මිශ්‍ර ඉගෙනුම් ක්‍රම හරහා අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කළේය. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ඉහළ නැංවීම සඳහා 'මූඩ්ල්' (Moodle) ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හරහා 'සවන්දීමේ සහ කථන කුසලතා වැඩිදියුණු කිරීම සහ තක්සේරු කිරීම' නම් පුහුණු වැඩසටහන පවත්වන ලද අතර, 2022 වසරේ දී දිවයින පුරා ඉංග්‍රීසි භාෂා පුහුණුකරුවන් සහ ඉංග්‍රීසි ගුරුවරුන් 150ක් පමණ පුහුණු කරන ලදී. ජර්මානු සහ ප්‍රංශ වැනි විදේශ භාෂා ප්‍රවීණතාව වර්ධනය කිරීම අරමුණු කරගත් ක්‍රියාකාරකම් වසර තුළ දී අධ්‍යාපන අමාත්‍යාංශයෙහි 'ඊ-තක්සලාව' ඉගෙනුම් කළමනාකරණ පද්ධතියට ඇතුළත් කරන ලදී. 2021 වසරේ පැවැත්වීමට නියමිතව තිබූ සියලුම ජාතික මට්ටමේ විභාග 2022 වසරේ මුල් භාගයේ දී පැවැත්වීමට රජය සමත් වූ අතර, 2022 වසරේ අගෝස්තු මාසයේ පැවැත්වීමට නියමිතව තිබූ 5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සහ උසස් පෙළ විභාගය, පිළිවෙළින්, 2022 වසරේ දෙසැම්බර් සහ 2023 වසරේ ජනවාරි දක්වා කල් දමන ලදී. 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී පැවැත්වීමට නියමිතව තිබූ සාමාන්‍ය පෙළ විභාගය, සැලකිය යුතු සහනයක් ලබාදීමකින් තොරව, 2023 වසරේ මැයි මාසයේ දී පැවැත්වීමට සැලසුම් කර ඇත.

2022 වසරේ දී මංගත සහ භෞතික ලෙස මිශ්‍ර යාන්ත්‍රණ හරහා අධ්‍යාපන ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරගෙන යෑම සහතික කිරීමට උසස් අධ්‍යාපන අංශය ප්‍රයත්න දැරූ අතර, රටේ පවතින උසස් අධ්‍යාපන යටිතල පහසුකම් පද්ධතිය ශක්තිමත් කිරීමට ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. වසර තුළ දී, කොවිඩ්-19 වසංගතය ආරම්භයේ සිට ස්ථාපිත කරන ලද ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN) යන මංගත අධ්‍යාපනික ක්‍රමවේදය යටතේ අනුගමනය කරන ලද ඉගෙනුම් ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යන අතරම, අධ්‍යයන කටයුතු භෞතික වශයෙන් සාමාන්‍ය පරිදි පවත්වාගෙන යෑම හරහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ආර්ථික අවහිරතා මගින් ඇති කෙරෙන අහිතකර ප්‍රතිඵල අවම කරමින් රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් සිය අධ්‍යාපන කටයුතු සිදු කරන ලදී. ආර්ථික අර්බුදය මගින් ඇති කරන ලද මූල්‍යමය අවහිරතා මධ්‍යයේ වුව ද, අධ්‍යාපනික කටයුතු අඛණ්ඩව සිදු කිරීම සහතික කරන අතරම, අධ්‍යාපන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට බලධාරීන් කැපවී ක්‍රියා කළේය. ඒ අනුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහ සබරගමුව විශ්වවිද්‍යාලයේ නව පරිගණක පීඨ දෙකක් සහ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයක් ස්ථාපිත කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් වසර තුළ දී අනුමැතිය ලබා දුන් අතර, විශ්වවිද්‍යාල අටක් තුළ නව දෙපාර්තමේන්තු 14ක් ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය හිමි විය. තවද, ප්‍රථම උපාධි වැඩසටහන්, විශේෂ උපාධි වැඩසටහන්, පශ්චාත් උපාධි වැඩසටහන් සහ බාහිර උපාධි වැඩසටහන් ආවරණය වන පරිදි නව උපාධි වැඩසටහන් 54ක් පමණ 2022 වසරේ දී අනුමත කරන ලදී. මේ අතර,

3.12 සංඛ්‍යා සටහන

විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ මූලික ලක්ෂණ (අ)

ශීර්ෂය	2021 (ආ)	2022 (ඇ)
1. විශ්වවිද්‍යාල සංඛ්‍යාව	17	17
2. අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව	19	19
3. ශිෂ්‍ය සංඛ්‍යාව (උපාධි අපේක්ෂක) (ඈ)		
විශ්වවිද්‍යාල (ඉ)	119,068	128,638
ආයතන	3,611	3,712
විවෘත විශ්වවිද්‍යාලය	28,824	28,591
4. මුළු කාර්යමණ්ඩලය (සියලුම විශ්වවිද්‍යාලවල)		
අධ්‍යයන	7,004	7,204
අනධ්‍යයන	13,164	13,150
5. ශිෂ්‍ය/ගුරු අනුපාතය	19.4	20.2
6. වයස් විශේෂිත උපාධි අපේක්ෂක ඇතුළත් වීමේ අනුපාතය (අවුරුදු 18-22) (ඈ)	8.9	9.3
7. අ.පො.ස. උසස් පෙළ සිට විශ්වවිද්‍යාලයට ඇතුළත්වීම		
ඇතුළත්වීමට සුදුසුකම් ලැබූ ප්‍රමාණය (%)	62.47	62.89
සුදුසුකම් ලැබුවන්ගෙන් ඇතුළත් වූ ප්‍රමාණය (%)	22.58	ලැ.නො.
8. උපාධිලත් සංඛ්‍යාව (ඊ)	36,012	ලැ.නො.
ප්‍රථම උපාධි	25,890	ලැ.නො.
පශ්චාත් උපාධි	10,122	ලැ.නො.
9. ප්‍රථම උපාධිය සඳහා නව ඇතුළත් වීම (උ)	43,927	ලැ.නො.
10. විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබූ සංඛ්‍යාව	194,366	171,497

මූලය: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) බාහිර උපාධි පාඨමාලා ඇතුළත් නොවේ
(ඉ) විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් නොවේ
(ඊ) බාහිර උපාධි හා විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් වේ
(උ) බාහිර උපාධි හා විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් නොවේ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මගපෙන්වීම යටතේ සියලුම විශ්වවිද්‍යාලවල තෙවන වසරේ සිසුන් සඳහා ජාතික මට්ටමේ විභාගයක් ලෙස ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය (UTEL) හඳුන්වා දීමට පියවර ගන්නා ලදී. මෙම විභාගය සමත් වූ පසු ජාතික මට්ටමේ සහතිකයක් පිරිනැමීමට සැලසුම් කර ඇත. මීට අමතරව, කලා, මානව ශාස්ත්‍ර සහ සෞන්දර්ය විෂය ධාරාවන් යටතේ අධ්‍යාපනය හදාරණ උපාධි අපේක්ෂකයින්ගේ අනාගත රැකියා අවස්ථා ඉහළ නැංවීමේ අරමුණින්, විශ්වවිද්‍යාල තුළ මානව ශාස්ත්‍ර, කලා සහ සෞන්දර්ය කලා පීඨවල වෙනම තොරතුරු තාක්ෂණ අංශ පිහිටුවීමේ ව්‍යාපෘතියක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලදී.

ශ්‍රම වෙළඳපොළ ගතික ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි තෘතීයික අධ්‍යාපනය ලබා දීම සම්බන්ධයෙන් පෞද්ගලික අංශය 2022 වසරේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. 2022 වසර අවසානය වන විට, අධ්‍යාපන අමාත්‍යාංශයෙහි රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය විසින් පිළිගත් උපාධි ප්‍රදානය කරන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 24ක් පැවති අතර, එම ආයතන මගින් ප්‍රතිඵලය ලත් උපාධි වැඩසටහන් 221ක් පිරිනමනු ලබයි. වසර තුළ දී, එක් නව ආයතනයක් උපාධි පිරිනමන ආයතනයක් ලෙස පිළිගැනුණු අතර, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමනු ලබන නව උපාධි වැඩසටහන් 34ක් ද පිළිගැනිණි. මේ අතර, 2022 වසර තුළ නව උපාධි වැඩසටහන් කිහිපයක් සහ නව ආයතන පිළිබඳ සමාලෝචන සිදු කෙරෙමින් පැවතුණි. උපාධි ප්‍රදානය කරන ආයතන සඳහා වන අවම ප්‍රමිතීන් නිශ්චය කර ගැනීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල විෂයමාලාව සමාලෝචනය කිරීම මෙම වසර තුළ දී අවසන් කරන ලදී.

කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය, ආර්ථිකයේ නූතන අධ්‍යාපනික කුසලතා අවශ්‍යතා සපුරාලීම සඳහා වන ඉඩ ප්‍රස්ථා ඉහළ නැංවීමට අඛණ්ඩව කටයුතු කළේය. 2022 වසර අවසානය වන විට කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අධ්‍යාපනය ලබා දීමේ නිරත ලියාපදිංචි ආයතන 1,136ක් තිබූ අතර, ඉන් 526ක් රාජ්‍ය ආයතන වන අතර, 610ක් රාජ්‍ය නොවන අංශයේ ආයතන විය. මෙම ආයතන හරහා විවිධ තාක්ෂණික සහ වෘත්තීය විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රතිඵලය කළ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අධ්‍යාපන පාඨමාලා 3,043ක් පිරිනමනු ලැබීය. වසර තුළ දී, සුදුසුකම් ලැබූ සිසුන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතික 117,954ක් නිකුත් කරන ලදී. ආර්ථික අර්බුදය මගින් ඇති කරන ලද අවහිරතා මධ්‍යයේ වුව ද, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින්, පුහුණු කිරීමේ, ඇගයීම් සිදු කිරීමේ සහ සහතික කිරීමේ කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා අඛණ්ඩව පියවර ගන්නා ලදී. බොහෝ පුහුණු ආයතන මිශ්‍ර අධ්‍යාපන ක්‍රම අඛණ්ඩව භාවිතා කළ අතර, කාලය අවම කර ගැනීම මෙන්ම, ගමනාගමන කටයුතු වෙනුවෙන් වන මූල්‍ය පිරිවැය, නවාතැන් පිරිවැය සහ පහසුකම් සැපයීමේ පිරිවැය අඩු කිරීම සඳහා නම්‍යශීලී ඉගෙනුම් ක්‍රමවේදය (FLM) ප්‍රවර්ධනය කරන ලදී. මේ අතර, ගෝලීය රැකියා වෙළඳපොළ තුළ 'සාත්තු සේවක' අංශය සඳහා ශීඝ්‍රයෙන් වර්ධනය වන ඉල්ලුම හඳුනා ගනිමින්, ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා 'සාත්තු සේවක' පුහුණු පාඨමාලා පිරිනමන පුහුණු ආයතන සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙහි පාලක සභාව විසින් ආවරණ අනුමැතිය ලබා දෙන ලදී. මීට අමතරව, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙහි පාලක සභාව විසින් 2022 වසරේ නොවැම්බර් මස 01 වන දින සිට ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් කිහිපයක් වෙත සේවය මත පුහුණුව (On-the-Job Training) සඳහා පහසුකම් සලසමින් 05/2022 දරන ජාතික වෘත්තීය සුදුසුකම් (National Vocational Qualification) චක්‍රලේඛය නිකුත් කරන ලද අතර, එමගින් අනාගත රැකියා අවස්ථා සඳහා අනුගත වීම වේගවත් කෙරෙනු ඇත.

3.13 සංඛ්‍යා සටහන

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ මූලික ලක්ෂණ

ශීර්ෂය	2021	2022 (අ)
1. ලියාපදිංචි කළ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතන සංඛ්‍යාව (ආ)	**1,071**	**1,136**
රාජ්‍ය	478	526
පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන	593	610
2. පිළිගත් පාඨමාලා සංඛ්‍යාව	**3,014**	**3,043**
රාජ්‍ය	2,387	2,370
පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන	627	673
3. ප්‍රදානය කළ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් සංඛ්‍යාව	**45,033**	**117,954**
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව	4,633	9,782
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය	7,441	50,029
වෘත්තීය පුහුණු අධිකාරිය	17,253	25,432
ජාතික තරුණ සේවා සභාව	3,897	4,903
පෞද්ගලික ආයතන	11,809	27,808

(අ) තාවකාලික
(ආ) වසර අවසානයේ දී

මූලය: තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

3

නිවාස හා නාගරික සංවර්ධනය

දැඩි රාජ්‍ය මූල්‍ය අවකාශය සහ අමුද්‍රව්‍යවල සැපයුම් හිඟය මෙන්ම, වසර තුළ දී ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෙදවුම් පිරිවැය ඉහළ යෑමෙහි බලපෑම පිළිබිඹු කරමින්, 2022 වසරේ දී රජයේ නිවාස සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය මන්දගාමී විය. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති මැදි ආදායම්ලාභී නිවාස ව්‍යාපෘතිවල මූලික කටයුතු නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් මෙම වසර තුළ සිදු කරන ලදී. කෙසේ වෙතත්, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය යටතේ වූ වත්තල හා නිට්ටඹුව ප්‍රදේශවල මැදි ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ හා කඩුවෙල ප්‍රදේශවල මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති ඇතුළුව ප්‍රධාන ව්‍යාපෘති හතරක් රජය මුහුණ දුන් මුදල් ප්‍රවාහ දුෂ්කරතා හේතුවෙන් 2022 වසරේ දී තාවකාලිකව නවතා දමන ලද අතර, හික්කඩුව සහ නාවලපිටිය ප්‍රදේශයේ සැලසුම් කර තිබූ අඩු ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති ද අයවැය ප්‍රතිපාදන සීමා වීම හේතුවෙන් නතර කෙරිණි. කෙසේ වෙතත්, ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් වතු ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා ඉන්දීය රජයේ මූල්‍ය ආධාර යටතේ නිවාස ව්‍යාපෘති කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර, මීට සමාන ආකාරයේ ව්‍යාපෘති කිහිපයක් ද රජයේ ආධාර යටතේ මෙම වසර තුළ ක්‍රියාත්මක විය. මේ අතර, 'ඔබට ගෙයක් - රටට හෙටක්', 'මිහිඳු නිවහන' සහ 'විරු සුමිතුරු' නිවාස ව්‍යාපෘතිවලට අදාළ සංවර්ධන කටයුතු මධ්‍යස්ථ වේගයකින් සිදු විය.

ආර්ථික අර්බුදය උග්‍ර වීම හා ආශ්‍රිත මූල්‍ය අවහිරතා මධ්‍යයේ 2022 වසරේ දී රජයේ යටිතල පහසුකම් ව්‍යාපෘති මන්දගාමී වේගයකින් අඛණ්ඩව සිදු විය. නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික යටිතල පහසුකම් සහ නගර සංවර්ධන වැඩසටහන (සියක් නගර) යටතේ නගර අලංකරණය සහ නාගරික සංවර්ධන කටයුතු ඇතුළුව රටේ පවතින යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති 180ක් පමණ අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. හෝමාගම තාක්ෂණ නගරයේ (Tech City) මාර්ග පහක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ කොට්ටාව සිට මාහේනවත්ත දක්වා දිවෙන නව පිවිසුම් මාර්ගයක් ඉදිකිරීම වසර තුළ දී අවසන් කරන ලදී. රාජ්‍ය ආයතන සංවර්ධන ව්‍යාපෘති, බේරේ වැව ප්‍රතිසංස්කරණය හා ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය සහ යාපනය නගර ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළු තවත් ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් ද 2022 වසර තුළ දී ක්‍රියාත්මක විය. කොළඹ අගනගර ආශ්‍රිත කලාපයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට අදාළ සංවර්ධන කටයුතු ද වසර තුළ අඛණ්ඩව සිදු වූ අතර, 2022 වසර අවසානයේ දී සියයට 90.0ක සමුච්චිත ප්‍රගතියක් ලබා ගැනීමට හැකි විය. තවද, නාගරික ගංවතුර ආපදා ආශ්‍රිත ගැටලු විසඳීම සහ කොළඹ අගනගර ආශ්‍රිත කලාපය ලෝක මට්ටමේ නගරයක් බවට සංවර්ධනය කිරීම අරමුණු කරගත් කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය 2022 වසර අවසන් වන විට සියයට 99.6ක භෞතික ප්‍රගතියක් වාර්තා කළේය. තවද, ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමෙන් පසු, කොළඹ නෙළුම් කුළුණ 2022 වසරේ පෙබරවාරි මස 28 වන දින ශ්‍රී ලංකා රජයට භාර දෙන ලද අතර, ඒ අනුව එහි මෙහෙයුම් කටයුතු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද කොළඹ නෙළුම් කුළුණ (පුද්ගලික) සමාගම වෙත පවරා ඇත. කොළඹ නෙළුම් කුළුණ 2022 වසරේ සැප්තැම්බර් මාසයේ මැද භාගයේ සිට මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කරන ලද අතර, නෙළුම් කුළුණ පරිශ්‍රය තුළ විනෝදාස්වාද කලාපයක් සංවර්ධනය කිරීම සඳහා පෞද්ගලික ආයෝජකයින් කිහිප දෙනෙකු සමඟ සාකච්ඡා සිදු විය.

වැදගත් සංධිස්ථාන කිහිපයක් සාක්ෂාත් කරමින් කොළඹ වරාය නගරය සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් 2022 වසරේ දී අඛණ්ඩව සිදු විය. ඒ අනුව, සමස්ත ව්‍යාපෘතිය සඳහා අදාළ වන සංවර්ධන පාලන රෙගුලාසි 2022 වසරේ අප්‍රේල් මාසයේ දී ගැසට් පත්‍රයේ පළ කරන ලද අතර, ක්‍රමෝපායික වැදගත්කමක් සහිත ව්‍යාපාර, අක්වෙරළ සමාගම්, බලයලත් පුද්ගලයන් සහ තීරුබදු රහිත පාරිභෝගික වෙළෙඳාම් කටයුතු සම්බන්ධ ප්‍රධාන රෙගුලාසි 2022 වසරේ දී සකස් කර අවසන් කරන ලදී. කෙසේ වෙතත්, වරාය නගරය තුළ ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාලයක් සහ ජාත්‍යන්තර පාසලක් පිහිටුවීමේ වැදගත්කම සලකා බලමින්, 2022 වසර අවසාන කාලයේ දී සංවර්ධන පාලන රෙගුලාසි සංශෝධනය කිරීමට පියවර ගන්නා ලදී. ආසියානු කලාපයේ ප්‍රථම තීරුබදු රහිත සාප්පු සංකීර්ණයෙහි (Downtown Duty-Free Mall) යටිතල පහසුකම් ඉදිකිරීම් සම්පූර්ණ කරන ලද අතර, 2023 වසරේ මැද භාගයේ දී දියත් කිරීමට සැලසුම් කර ඇති කොළඹ වරාය නගරයෙහි තීරුබදු රහිත මගී ප්‍රවේශ පද්ධතිය ද සංවර්ධනය කිරීමේ කටයුතු වසර තුළ දී සිදු විය. කොළඹ වරාය නගර ව්‍යාපෘති සමාගම විසින් බිම් කොටස් 74කින් බිම් කොටස් 42කට අදාළව මූලික ඉඩම් සැකසීම සහ තාක්ෂණික කටයුතු අවසන් කිරීමත් සමඟ කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාවට ව්‍යාපෘති සමාගම වෙත සම්පූර්ණ කිරීමේ සහතික නිකුත් කිරීමට හැකියාව හිමිවුණු අතර, කොළඹ වරාය නගරයේ මරීනා

දිස්ත්‍රික්කයේ බිම් කොටස් හයක් වසර තුළ දී අලෙවි කරන ලදී. අදාළ සියලු රෙගුලාසි සහ පූර්ව මෙහෙයුම් අවශ්‍යතාවලට අනුකූලව බැංකු කටයුතු ආරම්භ කිරීම සඳහා රාජ්‍ය බැංකු දෙකක් ඇතුළුව බැංකු හතරක් සඳහා බලපත්‍ර ලබා දෙන ලදී. කොමිෂන් සභාව විසින් ආයෝජක වීසා, රැකියා වීසා සහ නේවාසික වීසා යනුවෙන් වීසා වර්ග තුනක් හඳුන්වා දී ඇති අතර, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමග එක්වී වීසා අයදුම් කිරීමේ සහ අනුමැතිය ලබා දීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කරමින් ස්වයංක්‍රීයකරණය කර ඇත. තවද, කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානයේ අදියර I, මරිනා වෝටර්ෆ්‍රන්ට් වාණිජ මධ්‍යස්ථානය ඉදිකිරීම, මරිනා හෝටලය සහ අධි සුඛෝපභෝගී නිවාස ඇතුළු ව්‍යාපෘති කිහිපයක් සඳහා සෞදි අරාබිය පදනම් කරගත් සමාගමකින් ආයෝජන සහාය ලබා ගැනීම සඳහා 2023 වසරේ මුල් භාගයේ දී සාකච්ඡා පැවැත්විණි.

සමාජ ආරක්ෂණ ජාල වැඩපිළිවෙළ සහ දිළිඳුකම තුරන් කිරීම

ආර්ථික අවපාතය මධ්‍යයේ බහුවිධ අංශයන්ගෙන් පැනනැගුණු ආර්ථික අවදානම් ඉහළ යෑම සමඟ දරිද්‍රතාවය තුරන් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රගතිය මන්දගාමී වී ඇත. ජාතික මට්ටමින් දරිද්‍රතාවය තුරන් කිරීමෙහිලා ප්‍රශංසනීය ප්‍රගතියක් ලබා ඇතත්, බහුවිධ මානයන්ට අනුව පවතින සැලකිය යුතු මට්ටමේ ආදායම් විෂමතා හේතුවෙන්, ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් තවමත් දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ යාවත්කාලීන කරන ලද දරිද්‍රතා රේඛාවට අනුව, ජනගහනයෙන් දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන ප්‍රතිශතය 2002 වසරේ වාර්තා වූ සියයට 46.8ට සාපේක්ෂව 2019 වසර වන විට සියයට 14.3ක් දක්වා අඩු වී ඇත. කෙසේ වෙතත්, 2019 වසරේ දී ග්‍රාමීය අංශයේ සියයට 15.0ක් සහ නාගරික අංශයේ සියයට 6.0ක් ලෙස පැවති දරිද්‍රතා මට්ටම් හා සැසඳීමේදී වතු අංශයේ දරිද්‍රතා මට්ටම සියයට 33.8ක් ලෙස ඉහළ මට්ටමක පැවති අතර, එමගින් මෙම අංශ අතර පවතින සැලකිය යුතු විෂමතා පිළිබිඹු කෙරෙයි. 2019 වසරේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය අනුව, ජනගහනයෙන් දුප්පත්ම සියයට 20 සඳහා රටේ සමස්ත ගෘහ ඒකක ආදායමෙන් සියයට 4.6ක් පමණක් ද, ජනගහනයෙන් ධනවත්ම සියයට 20 සඳහා සමස්ත ගෘහ ඒකක ආදායමෙන් සියයට 51.3ක් පමණ ද හිමිව ඇති අතර, එමගින් රටේ අඛණ්ඩව පවතින ආදායම් විෂමතාව පිළිබඳ ගැටලුවේ බරපතළකම නැවතත් තහවුරු කෙරෙයි. දරිද්‍රතාවයට අදාළ මෙම සංඛ්‍යාලේඛන මගින්, මෑතකාලීන ආර්ථික අර්බුදයට පෙර ද රටේ ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් දරිද්‍රතාවයෙන් පසුවුණු බව පෙන්නුම් කරනු ලබයි. මෙවැනි පසුබිමක් තුළ, කොවිඩ්-19 වසංගතය ආරම්භයේ සිටම ජනගහනය තුළ දරිද්‍රතාවයෙන් පසුවුණු කාණ්ඩ බොහෝ දුරට ආර්ථික කම්පනවලට මුහුණ දී ඇති අතර, 2022 වසර තුළ දී අයහපත් වූ සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ඔවුන්ගේ අවදානම් තවදුරටත් ඉහළ ගොස් ඇත. ආර්ථික කටයුතු සඳහා අඛණ්ඩව ඇති වූ අවහිරතා සහ ආර්ථික ක්‍රියාකාරිත්වය මන්දගාමී වීම සමඟ, ඒ ආශ්‍රිතව ආදායම් මට්ටම් හා රැකියා අවස්ථා කෙරෙහි ඇති වූ අහිතකර බලපෑම හේතුවෙන් ආර්ථික අර්බුදයට පෙර යහපත් මට්ටමේ ජීවන තත්ත්වයක් පවත්වාගත් ජනගහනයේ ඇතැම් කොටස් ද දරිද්‍රතා රේඛාව ආසන්නයට තල්ලු වී ඇත. මේ අතර, පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම, අවදානමට ලක්විය හැකි කුටුම්භ කෙරෙහි දැඩි බලපෑමක් සිදු කර ඇති අතර, එය පෙර පැවති ආදායම් විෂමතා උත්සන්න කර ඇත. ජනගහනය වර්තමානයේ මුහුණ දෙමින් සිටින අවදානම පිළිබිඹු කරමින්, ජාතික දරිද්‍රතා රේඛාව 2022 වසරේ දෙසැම්බර් මාසය අවසන් වන විට රුපියල් 13,777.00ක් දක්වා ආසන්න වශයෙන් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 74.1කින් ඉහළ ගිය අතර, ඒ සඳහා 2022 වසර තුළ උද්ධමනයෙහි ඉහළ යෑම හේතු විය. නාගරික ප්‍රදේශවල ජීවත් වන පුද්ගලයන්ගේ ජීවන වියදමට උද්ධමනය මගින් සිදු කරන විෂම බලපෑම ඉස්මතු කරමින්, දිස්ත්‍රික් දරිද්‍රතා රේඛා, පිළිවෙළින්, රුපියල් 13,311.00ක් සහ රුපියල් 13,174.00ක්ව පැවති කිලිනොච්චිය සහ මොණරාගල වැනි ග්‍රාමීය දිස්ත්‍රික්ක හා සසඳන විට, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල දරිද්‍රතා රේඛාව රුපියල් 14,500.00 සීමාව ඉක්මවා ගියේය.

දීර්ඝ කාලයක් පුරා පැවති ආර්ථික අර්බුදය සහ ඒ ආශ්‍රිත ආර්ථික අවහිරතා හේතුවෙන් ගෘහ ඒකකවල මූල්‍යමය ශක්‍යතාව අහිමි වීම පමණක් නොව, ජනගහනයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් අතර ආහාර අනාරක්ෂිතභාවය සහ මන්දපෝෂණය ද ඉහළ ගොස් ඇත. 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී ලෝක ආහාර වැඩසටහන සහ එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය එක්ව නිකුත් කරන ලද භෝග සහ ආහාර සුරක්ෂිතතා තක්සේරු මෙහෙයුමේ විශේෂ වාර්තාවට අනුව, ශ්‍රී ලංකාවේ මිලියන 6.3ක ජනතාවක් මධ්‍යස්ථ හා උග්‍ර ආහාර අනාරක්ෂිතභාවයට මුහුණ දී සිටින බව ඇස්තමේන්තු කර ඇත. ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා ආධාරයක් සහ ජීවිකාව

3

සරි කර ගැනීම සඳහා ප්‍රමාණවත් සහායක් නොමැතිව, මෙම පුද්ගලයින්ගේ තත්ත්වය තවදුරටත් අයහපත් විය හැකිය. මෙවැනි පසුබිමක් තුළ, ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය විසින් පිරිනමන සහනදායී ණය වැඩසටහන යටතේ ණය ඉල්ලුම් කිරීම සඳහා ප්‍රතිලෝම ශ්‍රේණිගත කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට ශ්‍රී ලංකා රජය තීරණය කළ අතර, එමගින් ජාත්‍යන්තර සංවර්ධන සංගමය වෙතින් ලබා දෙන සහනදායී මූල්‍යනය සඳහා වන ප්‍රවේශය ඇති කර ගැනීමටත්, ආර්ථිකය ස්ථාවර කිරීමට සහ කුසගින්න හා දරිද්‍රතාවයෙන් ආරක්ෂා වීම සඳහා වෙනත් බහුපාර්ශ්වික සංවර්ධන ආයතනවලින් සහාය ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා නිර්මාණය වීමත් සිදු විය.

ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස නව දරිද්‍රතා කණ්ඩායම් නිර්මාණය වීමට ඇති ප්‍රවණතාවය මධ්‍යයේ, සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් සඳහා ජනගහනයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ඉලක්ක කර ගැනීම ශක්තිමත් කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව බහුපාර්ශ්වික නියෝජිතායතනවල තාක්ෂණික සහාය ඇතිව 'කිසිවෙක් අතහැරෙන්න දෙන්න එපා' (Leave No One Behind) වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී පවුල් ලියාපදිංචි කිරීමේ ලේඛනයක් ස්ථාපිත කිරීම කඩිනම් කිරීම සඳහා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් පියවර ගන්නා ලදී. මෙම වැඩසටහන යටතේ, ලෝක බැංකුවේ සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියේ මූල්‍ය ආධාර ඇතිව, 2023 වසරේ ජූනි මාසය අවසන් වන විට සුබසාධන ප්‍රතිලාභ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට සහ ඒකාබද්ධ සුබසාධන කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත. මෙම වැඩසටහන යටතේ සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් සඳහා සුදුසුකම් තීරණය කිරීමට අදාළ තෝරා ගැනීමේ ක්‍රියාවලිය 2022 වසර තුළ සිදු කරන ලද අතර, නිවෙස් වෙත ගොස් දත්ත තහවුරු කර ගැනීම 2023 වසරේ මුල් කාලයේ දී ආරම්භ විය. තවද, සුබසාධන ප්‍රතිලාභ තොරතුරු පද්ධතිය සඳහා දත්ත එක්රැස් කිරීමේ මූලික ක්‍රියාපටිපාටිය 2022 වසර තුළ දී අඛණ්ඩව සිදු කරන ලද අතර, වසර අවසාන වන විට අයදුම්කරුවන් 3,726,596ක් පිළිබඳ මූලික තොරතුරු ලියාපදිංචි කර ඇත. මෙම වැඩසටහන මගින්, සමාජ සුබසාධන ප්‍රතිලාභීන්ගේ සුදුසුකම් පිළිබඳ අඛණ්ඩ තක්සේරුවක් සිදු කිරීම සහ අවසානයේ දී ඔවුන්ගේ ගෘහ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම මගින් සුබසාධන වැඩසටහන්වලින් ඉවත් වීමට නිසි යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම අරමුණු කරයි. 2023 වසරේ මුල් කාලයේ දී, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සහ තවත් ප්‍රධාන රාජ්‍ය ආයතන කිහිපයක සහයෝගය ඇතිව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින්, ආර්ථික අර්බුදය මගින් ජීවන තත්ත්වයන් මත කර ඇති බලපෑම තක්සේරු කිරීම සඳහා ගෘහස්ථ සමීක්ෂණයක් පැවැත්වීමට පියවර ගන්නා ලදී. අපේක්ෂිත ප්‍රතිලාභීන් වෙත සහනාධාර නිසි කාලයට ලැබෙන බව සහතික කිරීම සඳහා අවශ්‍යතා ඇති පුද්ගලයන් හඳුනා ගැනීමට සහනාධාරලාභීන්ගේ නාම ලේඛනයක් කඩිනමින් සැකසීමේ අවශ්‍යතාවයක් පවතී. සුබසාධන වැඩසටහන් ඩිජිටල්කරණය කිරීම ඇතුළුව සහනාධාරලාභීන් පිළිබඳ එවැනි දත්ත ගබඩාවක් නිර්මාණය කිරීම මගින් දත්තවල ගුණාත්මකභාවය, ප්‍රමාණවත් බව සහ කාලානුරූපී බව වැඩිදියුණු වීම හරහා, දිළිඳුකම තුරන් කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය මැදිහත්වීම් වඩාත් ඵලදායී කරනු ඇති අතර, අනාගතයේ දී සාක්ෂි පදනම් කරගත් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම ශක්තිමත් කෙරෙනු ඇත.

3.14 සංඛ්‍යා සටහන

ප්‍රධාන සුභසාධන වැඩසටහන් - ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව සහ ප්‍රදානයන්හි වටිනාකම

වර්ෂය	දිවිනැගුම / සමෘද්ධි සහනාධාර වැඩසටහන		පෝෂණ දීමනා වැඩසටහන (අ)	
	පවුල් සංඛ්‍යාව (ආ)	වටිනාකම (රු. මිලියන) (ඇ)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව (ආ)	වටිනාකම (රු. මිලියන)
2018	1,384,021	39,239	329,047	5,490
2019	1,800,182	44,660	300,246	5,279
2020	1,770,086	52,434	238,034	4,751 (ඈ)
2021	1,760,485	55,400	250,848	5,248
2022 (ඉ)	1,760,485	120,988 (ඊ)	ලැ.නො.	3,690

(අ) ගර්භණී සහ කිරිදෙන මව්වරුන් සඳහා
(ආ) වසර අවසානයේ දී
(ඇ) භූමිතෙල් සහනාධාරය ද ඇතුළත්ව
(ඈ) සංශෝධිත
(ඉ) තාවකාලික
(ඊ) බහුපාර්ශ්වික ආධාර යටතේ ලබාදුන් සහනාධාර ද ඇතුළත්ව

මූලයන්: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අඩු ආදායම්ලාභී ගෘහ ඒකකවල සමාජ ආර්ථික යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා වසර තුළ දී දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සමාජ ආරක්ෂිත ජාල වැඩසටහන් රජය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින්, රජයේ ප්‍රධානතම සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන වන සමෘද්ධි සහනාධාර වැඩසටහන යටතේ රුපියල් බිලියන 120කට ආසන්න මුදලක් ප්‍රතිලාභී පවුල් මිලියන 1.7ක් සහ දැනට සමෘද්ධි ඇතුළු අනෙකුත් සහනාධාර ප්‍රතිලාභ සඳහා පොරොත්තු ලේඛනවල සිටින පවුල් අතර බෙදා දෙන ලදී. වසංගතය මගින් දරිද්‍රතාවයෙන් පෙළෙන පවුල් වලට ඇති කළ විෂමාකාර හා ක්ෂණික බලපෑම සැලකිල්ලට ගනිමින්, 2022 වසර සඳහා වන රජයේ අයවැයට අනුකූලව, රජය විසින් ප්‍රතිලාභී පවුලකට ලබා දෙන මාසික සමෘද්ධි දීමනාව 2022 වසරේ පෙබරවාරි මාසයේ සිට සියයට 28කින් පමණ ඉහළ නංවන ලදී. ඒ අනුව, පවුලකට රුපියල් 3,500ක්, රුපියල් 2,500ක් සහ රුපියල් 1,500ක් බැගින් වූ පවුල් ඒකක දීමනා, පිළිවෙළින්, එක් පවුලකට රුපියල් 4,500ක්, රුපියල් 3,200ක් සහ රුපියල් 1,900ක් දක්වා ඉහළ නැංවූයේය. බහුපාර්ශ්වික නියෝජිතායතනවල මූල්‍ය සහාය ඇතිව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2022 වසරේ මැයි මාසයේ සිට නොවැම්බර් මාසය දක්වා කාලසීමාව තුළ හදිසි මුදල් ප්‍රදාන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ යටතේ දැනට සමෘද්ධි ප්‍රතිලාභ ලබන පවුල් සහ සමෘද්ධි ප්‍රතිලාභ සඳහා පොරොත්තු ලේඛණ වල සිටින පවුල් මෙන්ම, වැඩිහිටි, ආබාධිත හා වකුගඩු රෝග කාණ්ඩ යටතේ සහනාධාර යෝජනා ක්‍රම සඳහා පොරොත්තු ලේඛනවල සිටි පුද්ගලයන් සඳහා රුපියල් 3,000ක සිට රුපියල් 5,000ක් දක්වා දීමනා ලබා දෙන ලදී. මෙම වැඩසටහන යටතේ, ලෝක බැංකුවේ මූල්‍ය සහාය ඇතිව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිලාභී පවුල් මිලියන 2.6ක් අතර රුපියල් බිලියන 38.5ක් පමණ බෙදා දී ඇති අතර, ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රතිලාභී පවුල් මිලියන 3.0 අතර රුපියල් බිලියන 45.5ක් බෙදා දීම සඳහා මූල්‍ය ආධාර ලබා දී ඇත. තවද, ලෝක ආහාර වැඩසටහනෙහි සහාය ඇතිව, අඩු ආදායම්ලාභී ගර්භණී සහ කිරිදෙන මව්වරුන්, කාන්තාවන් ගෘහ මූලිකත්වය සහිත පවුල්, අවුරුදු පහට අඩු දරුවන් සහ මන්දපෝෂණයෙන් පෙළෙන පුද්ගලයින් ඇතුළු අවදානමට ලක්විය හැකි පවුල්වල පෝෂණ යහපැවැත්ම සහතික කිරීම සඳහා තවත් මූල්‍ය ආධාර වැඩසටහනක් වසර තුළ ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය මගින් අම්පාර, යාපනය, මන්නාරම, මොණරාගල, ගාල්ල, මුලතිව් සහ නුවර එළිය දිස්ත්‍රික්කවල තෝරාගත් පවුල් 41,710ක් ආවරණය කළ අතර, එමගින් 2022 වසර අවසන් වන විට ලබා දී ඇති මුළු අරමුදල් ප්‍රමාණය රුපියල් මිලියන 625.7කි. මේ අතර, වයස අවුරුදු පහට අඩු දරුවන් සිටින පවුල් ආවරණය වන පරිදි, 2022 වසරේ අගෝස්තු මාසයේ දී කළුතර දිස්ත්‍රික්කයේ එක් පවුලකට රුපියල් 10,000 බැගින් සෘජු මුදල් ආධාරයක් ලබා දෙන ලදී. ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා ජීවනෝපාය, සමාජීය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය ඉහළ නැංවීම අරමුණු කරගත් වැඩසටහන් රාශියකට ද වසර තුළ දී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සම්බන්ධ විය. අරමුදල් ලබාදීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා, පාරිභෝගික සම්බන්ධතා මොඩියුලය (CRM) සඳහා මෘදුකාංගයක් සංවර්ධනය කිරීම, සමෘද්ධි නිලධාරීන් සඳහා ජංගම යෙදුමක් හඳුන්වා දීම සහ ප්‍රතිලාභීන් සඳහා තවත් බැංකු අවස්ථා වැනි නව උපාය මාර්ග අනුගමනය කරන ලදී. අර්බුදය හේතුවෙන් තම ජීවනෝපායයන් අහිමි වූ පවුල් සඳහා මූල්‍යමය සහන ලබා දීම සඳහා ධීවර කර්මාන්තයේ නියැළෙන කුඩා බෝට්ටු හිමියන්ට සහ විදුලිය නොමැති වතු අංශයේ පුද්ගලයන්ට භූමිතෙල් සහනාධාරයක් ලබා දීම ඇතුළු තවත් සමාජ සුබසාධන වැඩසටහන් කිහිපයක් රජය විසින් වසර තුළ දී හඳුන්වා දෙන ලදී. මීට අමතරව, ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සහ ළමුන් අතර මන්දපෝෂණය ආශ්‍රිත නව අවදානම් ඇති වීම වැළැක්වීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන මධ්‍යස්ථාන සවිබල ගැන්වීම සඳහා බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණයක් 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී හඳුන්වා දෙන ලදී. මේ අතර, කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සායනවල ලියාපදිංචි වූ ගර්භණී සමයේ අවසාන මාස හය ගතවන ගැබිණි මව්වරුන් සහ කිරිදෙන සමයේ මුල් මාස හතරෙහි පසුවන මව්වරුන් සඳහා රුපියල් 2,000ක පෝෂණ දීමනාව අඛණ්ඩව ලබා දෙන ලදී. ලෝක බැංකුව විසින් ක්‍රියාත්මක කරන මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය අනුග්‍රහය ඇතිව, පෙර පාසල් වයසේ පසුවන අඩු බරින් යුත් දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමට පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාර වේලක් ලබා දීමේ වැඩසටහන ද මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලදී.

පසුගිය දශක කිහිපය තුළ බලයට පත් රජයන් විසින්, දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කළ ද, ශ්‍රී ලංකාව තවමත් විවිධ මානයන්ට අනුව සැලකිය යුතු අන්දමේ ආදායම් විෂමතාවලට

3

මුහුණ දෙන බැවින් ජනතාව සමාජ ආර්ථික අර්බුදවලට පහසුවෙන් ලක් වීමේ වැඩි අවදානමක් ඇත. එබැවින්, සෑම අංශයකටම ප්‍රතිලාභ හිමිවෙන පරිදි සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා වන රටේ සංවර්ධන ඉලක්කය තුළ ප්‍රධාන පියවරක් වන, දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ප්‍රතිපත්ති ප්‍රවේශයන් පිළිබඳව නැවත සමාලෝචනය කිරීමේ අවශ්‍යතාව පවතී. ජාතික මට්ටමින් සහනාධාරලාභීන්ගේ නාම ලේඛනයක් ස්ථාපිත කිරීම මගින් අවශ්‍යතා ඇති කොටස් වෙත සම්පත් ලබා දීම සිදු වනු ඇති බැවින් එය මනා සම්පත් උපයෝජනයකට සහාය වනු ඇත. සහනාධාරලාභීන්ගේ නාම ලේඛනය නිතිපතා යාවත්කාලීන කිරීම සඳහා වැඩි නම්‍යශීලී බවක් ඇති කරගත යුතු වේ. මීට අමතරව, කෙටි කාලීනව ජනගහනයේ අවදානමට ලක්විය හැකි කොටස් මත ඇති කෙරෙන පීඩනය අවම කිරීම සඳහා කටයුතු කරන අතර, මනාව ඉලක්කගත ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් කඩිනමින් ක්‍රියාත්මක කිරීම හරහා මෙම ජන කණ්ඩායම්වල ඔරොත්තු දීමේ හැකියාව දිගුකාලීනව ඉහළ නංවාලීම කෙරෙහි රජය අවධානය යොමු කළ යුතු අතර, එමගින් අනාගතයේ දී එම ජන කොටස් රජයේ සහනාධාර වැඩසටහන් මත පදනම් වීම අවම කෙරෙනු ඇත. තවද, ජනගහන වර්ධනයේ වෙනස්වීම් මෙන්ම ස්වාභාවික විපත් ඇතිවීම, හදිසි සෞඛ්‍ය අවස්ථා ආදිය දරිද්‍රතාවය තුරන් කිරීමේ ප්‍රතිපත්ති තුළින් සැලකිල්ලට ගත යුතුය. වයස්ගත ජනගහනය ඉහළ යෑමේ පසුබිම තුළ මෙන්ම, ජනගහනයෙන් විශාල කොටසක්, අවිධිමත් අංශයේ සේවයේ නියුතු තත්ත්වයක් තුළ විශේෂයෙන් ම රජයට අමතර මූල්‍ය පීඩනයක් ඇති නොවන පරිදි විශ්‍රාම අරමුදලක් ස්ථාපිත කිරීම සහ ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම මගින් විශ්‍රාමික කාල සීමාව තුළ මෙම පිරිසගේ අනාගතය සුරක්ෂිත කිරීමට සහාය සලසනු ඇත. තවද, ප්‍රමුඛතා පදනමක් මත අධ්‍යාපන සහ සෞඛ්‍ය අංශයේ විෂමතා ඉහළ යෑම අවම කළ යුතු අතර, එමගින් ආර්ථිකයේ අවදානමට ලක් විය හැකි ජන කොටස් මුහුණ දෙන දරිද්‍රතාවයේ විෂම චක්‍රීය ප්‍රවණතාව වළක්වාලිය හැකිය. ආර්ථික අර්බුදය හමුවේ, උත්සන්න වෙමින් පවතින දරිද්‍රතා මට්ටම් පාලනය කිරීම සඳහා කෙටි හා දිගු කාලීන වශයෙන් ප්‍රතිපත්ති රාමුවක් සකස් කළ යුතු අතර, එමගින්, අපේක්ෂිත ආර්ථික වර්ධනයේ යථා තත්ත්වයට පත්වීමෙහි සහ ආර්ථික ප්‍රගතියේ ප්‍රතිලාභ රටේ සියලුම පුරවැසියන්ට සමානව බෙදී යෑම සහතික කළ හැකි වනු ඇත. විශේෂයෙන් ම, අවදානමට ලක්විය හැකි කාණ්ඩ සඳහා වන සුබසාධන පැකේජ ලබාදීමේදී දේශපාලනික සහ අනෙකුත් මැදිහත් වීම් අවම කළ යුතුය.

පරිසරය

රටේ වත්මන් සහ අනාගත පාරිසරික තිරසාරභාවය ආරක්ෂා කිරීම සඳහා වන ස්ථාවර ප්‍රතිපත්ති රාමුවක් සංවර්ධනය කිරීමෙහිලා සැලකිය යුතු ඉදිරි පියවරක් තබමින් 2022 වසරේ දී ජාතික පරිසර ප්‍රතිපත්තිය සාර්ථකව දියත් කරන ලදී. භූමිය හා ජල සම්පත්, ජෛව විවිධත්වය හා පරිසර පද්ධති, වෙරළ හා සමුද්‍ර සම්පත්, පරිසර දූෂණය වැළැක්වීම, පාලනය හා කසළ කළමනාකරණය, දේශගුණ විපර්යාස හා ගෝලීය පාරිසරික අභියෝග, නිර්මිත පරිසරය හා හරිත සංවර්ධනය සහ විවිධ අංශ හා සම්බන්ධ වන ගැටලු සහ අභියෝග යන තේමා යටතේ ක්ෂේත්‍ර හතක් පුරා යෝජිත ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වලින් සමන්විත වන ජාතික පරිසර ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා මූලිකත්වය ගැනීමට අමාත්‍ය මණ්ඩලය විසින් 2022 වසරේ ජූනි මාසයේ දී පරිසර අමාත්‍යාංශය වෙත අනුමැතිය ලබා දෙන ලදී. මනාව නිර්වචනය කරන ලද ප්‍රතිපත්තිමය රාමුවක් හරහා ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීමට හැකියාව ලැබෙන පරිදි, ජාතික පරිසර ප්‍රතිපත්තිය මගින් පාරිසරික සම්පත් තිරසාර ලෙස භාවිතය, කළමනාකරණය සහ ආරක්ෂා කිරීම සහතික කිරීම අපේක්ෂා කෙරේ. තවද, ජාතික පරිසර ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් යුතුව, ජාතික පරිසර ප්‍රතිපත්තියෙහි ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාවට නැංවිය හැකි ක්‍රියා බවට පරිවර්තනය කිරීමේ උපාය මාර්ග හඳුනා ගනිමින්, 2022-2030 වසර සඳහා වන ජාතික පරිසර ක්‍රියාකාරී සැලැස්ම මෙම වසර තුළ දී අවසන් කරන ලදී.

ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලියේදී ස්වභාවික සම්පත් තිරසාර හා කාර්යක්ෂම අන්දමින් භාවිත කිරීම කෙරෙහි ඇති අවධානය ශක්තිමත් කිරීම සඳහා පියවර කිහිපයක් තව දුරටත් ක්‍රියාත්මක කිරීමට රජය සහ පරිසර අමාත්‍යාංශය විසින් ඉහළ කැපවීමකින් යුතුව කටයුතු කරන ලදී. 2050 වසර වන විට කාබන් විමෝචනය ශුද්ධ වශයෙන් ශූන්‍ය තත්ත්වය කරා ළඟා කර ගැනීමට 'දේශගුණික සෞභාග්‍ය සැලැස්ම' (Climate Prosperity Plan) එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස සමුළුවට (COP27) ශ්‍රී ලංකාව විසින් 2022 වසරේ දී ඉදිරිපත් කරන ලදී. දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීම වේගවත් කිරීම සහ හරිතාගාර වායු විමෝචනය අවම කරන අතර, ශ්‍රී ලංකාව වෙත විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ ජාතික ආයෝජන උපාය මාර්ගය ලෙස 'දේශගුණික සෞභාග්‍ය සැලැස්ම' ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, බලශක්ති කාර්යක්ෂමතාව, පුනර්ජනනීය බලශක්ති

භාවිතය සහ සිසිලනය සඳහා තිරසාර විසඳුම් ලබා දීම ඇතුළු සිසිලන අංශය (වායු සමීකරණ සහ ශීතකරණ) වැඩිදියුණු කිරීම හරහා හරිතාගාර වායු විමෝචනය අවම කිරීම අරමුණු කරගත් ජාතික සිසිලන ප්‍රතිපත්තියට අදාළ පළමු කෙටුම්පත 2022 වසරේ දී අවසන් කරන ලදී. මෙම ප්‍රතිපත්තිය මගින්, හයිඩ්‍රෝෆ්ලෝරොකාබන් පියවරෙන් පියවර සීමා කිරීම පිළිබඳ මොන්ට්‍රියල් ගිවිසුමට (Montreal protocol) සිදු කරන ලද කිගාලි සංශෝධනය (Cigali Amendment) සඳහා අනුගත වීමට සහාය සපයනු ඇත. රටෙහි සුවිශේෂී ජෛව විවිධත්වයෙන් යුතු පරිසරය ආරක්ෂා කර ගැනීමේ ප්‍රයත්නයේ තවත් වැදගත් ඉදිරි පියවරක් ලෙස, 2022 වසරේ දී, 'ශ්‍රී ලංකාවේ පාරිසරික සංවේදී ප්‍රදේශ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය' සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලද අතර, එමගින් ඉහළ ජෛව විවිධත්වයෙන් යුත් ප්‍රදේශ, තෙත්බිම් සහ වෙරළබඩ කලාප ඇතුළු පාරිසරික සංවේදී ප්‍රදේශ සංරක්ෂණය සහ ආරක්ෂා කිරීම ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

මධ්‍යම පරිසර අධිකාරිය වසර තුළ දී පරිසරය සුරැකීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කළේය. ජාතික දූෂණ විමෝචක (විසර්ජන) සහ විමෝචන අවශ්‍යතාවලට අනුකූලව, විශේෂිත කාර්මික කටයුතු හරහා පරිසරය වෙත දූෂණ විමෝචක මුදා හැරීම වැළැක්වීම සහ අවම කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන ලදී. 2022 වසරේ දී, බලපත්‍රයක් ලබා ගැනීමට නියමිත කටයුතු සහ පරිසර ආරක්ෂණ බලපත්‍ර රෙගුලාසි, පිළිවෙළින්, අංක 2264/18 සහ අංක 2264/17 දරන ගැසට් නිවේදන මගින් සංශෝධනය කරන ලදී. 2022 වසර අවසානය වන විට, කර්මාන්ත 19,160ක් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන ඇති අතර, ආයෝජන මණ්ඩල කලාපයේ කර්මාන්ත 786ක් ද පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලියට අදාළව කටයුතු කර ඇත. තවද, පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා (Environmental Impact Assessments) සහ මූලික පාරිසරික විමර්ශන (Initial Environmental Examinations) හරහා ව්‍යාපෘති මඟින් ඇති විය හැකි පාරිසරික බලපෑම තක්සේරු කිරීමට අදාළව සිය කාර්යභාරය ඉටු කරමින්, මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2022 වසරේ දී පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තා 7ක් සහ මූලික පාරිසරික විමර්ශණ වාර්තා 237ක් අනුමත කරන ලදී.

පාරිසරික කළමනාකරණයට අදාළ අධිකාරීන් විසින් ජාතික ආපදා සඳහා වන සූදානම ඉහළ නැංවීම සඳහා ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කරන ලදී. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2019 වසරේ දී ආරම්භ කරන ලද වායු තත්ත්ව අධීක්ෂණ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ වසර තුළ දී, ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහාය ඇතිව කුරුණෑගල, අනුරාධපුර සහ යාපනය නගරවල සංවේදක පාදක කරගත් වායු තත්ත්ව නිරීක්ෂණ උපකරණ ඒකක ස්ථාපනය කරන ලද අතර, දැනට ක්‍රියාත්මක වන වායු තත්ත්ව නිරීක්ෂණ වැඩසටහන ශක්තිමත් කරන ලදී. මේ අතර, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී, අන්තර්-දේශසීමා වායු දූෂණය හේතුවෙන් දිවයිනේ බොහෝ ප්‍රදේශවල වායුගෝලයේ ගුණාත්මකභාවයේ පිරිහීමක් වාර්තාවීමත් සමඟ, ඒ පිළිබඳව අවධානයෙන් සිටින ලෙස මහජනතාවට දැනුම්දෙන ලදී. එවැනි අභියෝග සඳහා නිරාවරණය වීමට ශ්‍රී ලංකාවට පවතින වැඩි ඉඩකඩ සහ එවැනි තත්ත්වයන් තුළ අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ සඳහා ස්ථාපිත රාමුවක් නොමැති වීමේ ගැටලුව හඳුනා ගනිමින්, පරිසර අමාත්‍යාංශය විසින් මධ්‍යම පරිසර අධිකාරිය සහ තවත් පාර්ශ්වකරුවන් කිහිප දෙනෙකු සමඟ එක්ව, හදිසි ප්‍රතිචාර ක්‍රියාකාරී සැලැස්මක් සංවර්ධනය කිරීම ආරම්භ කරන ලදී. එවැනි අභියෝගාත්මක කාල සීමාවන් තුළ සීමා කළ හැකි දේශීය වායු විමෝචක ප්‍රභවයන් මෙම සැලැස්ම යටතේ හඳුනා ගනී. තවද, ස්වභාවික විපත්වල සමාජ ආර්ථික බලපෑම අවම කිරීම සඳහා බලධාරීන් විසින් මෙම වසර තුළ ආපදා අවම කිරීමේ වැඩසටහන්වල නිරත විය. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ දී පූර්ව සූදානමක් ඇති කිරීම සඳහා සාමාන්‍ය ජනතාවට, අදාළ ආපදා කළමනාකරණ බලධාරීන්ට සහ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට කාලගුණ අනතුරු ඇඟවීම් සහ නිවේදන 568ක් නිකුත් කළේය. මේ අතර, නාය යෑම් අවදානම අවම කිරීම පිළිබඳ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙහි වැඩසටහන යටතේ 2022 වසරේ දී නුවර එළිය සහ කොළඹ දිස්ත්‍රික්කයේ තවත් නාය යෑම් ස්ථාන දෙකක නාය යෑමේ අවදානම අවම කිරීමට කටයුතු කළ අතර, වසර තුළ දී මහනුවර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල වර්ග කිලෝමීටර් 480ක් ආවරණය කරමින් නාය යෑම් කලාප සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතිය අඛණ්ඩව සිදු කරන ලදී.

ලෝකය වඩාත් ශීඝ්‍රයෙන් චක්‍රීය ආර්ථික ක්‍රමයක් වෙත සහ එයින් ඔබ්බට ගමන් කරමින් සිටී. ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල් දේශගුණික විපර්යාසවල

බලපෑම්වලට මුහුණ දී ඇති අතර, එහි බලපෑම් පිළිබඳව ඉහළ අවබෝධයක් පවතී. දේශගුණික වෙනස්වීම්වල දරුණු ව්‍යසනයන්වලට ලක්වීමේ ඉහළ අවදානමක් ඇති රටවලට අරමුදල් ලබාදීමට 2015 පැරිස් ගිවිසුම, 2021 වසරේ එක්සත් ජාතීන්ගේ දේශගුණික වෙනස්වීම් පිළිබඳ සම්මේලනය (COP26) සහ 2022 වසරේ එක්සත් ජාතීන්ගේ දේශගුණික වෙනස්වීම් පිළිබඳ සම්මේලනය (COP 27) සුදානමින් සිටී. මේ පිළිබඳව අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාව ද දේශගුණික වෙනස්වීම්වල බලපෑම් සඳහා සුදානම් වීමට විස්තීර්ණ රාමුවක් සැකසිය යුතු අතර, ඉහත කී සමුළුවලදී එකඟ වූ යහපාලන මූලධර්ම සඳහා ද අනුකූල විය යුතුය. පුළුල් වශයෙන් එකඟ වූ මූලධර්ම සමඟ අනුකූල විය යුතු ශ්‍රී ලංකාවේ එක් ක්ෂේත්‍රයක් වන්නේ ආර්ථික යටිතල පහසුකම් අංශයයි. විශේෂයෙන් ම, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ඇතුළු සුවිශේෂී ලෙස හඳුනාගත් ව්‍යාපෘති සඳහා එවැනි අනුකූලත්වයක් සහිත රටවලට අරමුදල් ලබාගත හැක. මෙය ඉතා කල් ගතවන ක්‍රියාවලියක් හේතුවෙන් ගෝලීය වශයෙන් වූ සම්මුතීන් පිළිබඳව ශ්‍රී ලංකාව අවධානය යොමු කළ යුතු වේ.

3

4

මිල සහ වැටුප්

4.1 සමස්ත නිරීක්ෂණ

නිල පාරිභෝගික මිල දර්ශක මගින් මනිනු ලබන පොදු මිල මට්ටම 2022 වසරේ දී මීන් පෙර පෙන්නුම් නොකළ තීව්‍ර ඉහළ යෑමක් වාර්තා කළ අතර, මේ සඳහා දේශීය හා ගෝලීය වශයෙන් සැපයුම් අංශයේ පැවති අහිතකර තත්ත්වයන්, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම සහ පසුගිය වසර කිහිපය තුළ සිදු කළ මුදල් ලිහිල්කරණයේ පසු බලපෑම් හේතු විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මෙන්ම සැපයුම් තත්ත්වයන්ගේ වර්ධනය හේතුවෙන් වසර අවසානය වන විට මිල මට්ටම ඉහළ යෑමේ වේගය පාලනය විය. 2022 වසරේ දී දේශීයව නිෂ්පාදනය කරන ආහාර අයිතමවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, මේ සඳහා නිෂ්පාදන යෙදවුම් හිඟ වීම හා ඒවායෙහි මිල ඉහළ යෑම මූලික කොටගෙන දේශීය කෘෂි නිෂ්පාදන සැලකිය යුතු ලෙස පහළ වැටීම සහ ඉන්ධන හිඟය හේතුකොටගෙන නිෂ්පාදන බෙදාහැරීම් සඳහා ඇති වූ අවහිරතා හේතු විය. තවද, ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල ඉහළ යෑම, නැව් ගාස්තු ඉහළ යෑම සහ විශේෂයෙන්ම ශ්‍රී ලංකා රුපියල දැඩි ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් ආනයනික ආහාර සහ ආහාර නොවන අයිතමවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එය පොදු මිල මට්ටම ඉහළ යෑම කෙරෙහි දැඩි බලපෑමක් ඇති කළේය. තවද, පරිපාලිත මිල ගණන් ඒවායේ නිෂ්පාදන පිරිවැය පිළිබිඹු වන පරිදි ඉහළ දැමීම මෙන්ම එකතු කළ අගය මත බද්ද ඉහළ නැංවීම හා සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවීම ද ආහාර සහ ආහාර නොවන අයිතමවල මිල ගණන් තවදුරටත් ඉහළ යෑමට හේතු විය. එසේ වුවද, දේශීය මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඇති වූ හිතකර ප්‍රවණතා සමඟ වසර අවසානය වන විට ඉහත සඳහන් කරන ලද අහිතකර තත්ත්වයන් බොහෝදුරට සමනය විය. මේ අනුව, දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අබණ්ඩව පවත්වාගෙන යෑම හේතුවෙන් ඉල්ලුමෙන් හටගත් උද්ධමන පීඩනය පාලනය වීමත්, නිෂ්පාදන යෙදවුම් ක්‍රමයෙන් වෙළඳපොළට පැමිණීමත් සමඟ දේශීය සැපයුම ඉහළ යෑමත් සිදු වූ අතර, එමගින් පොදු මිල මට්ටම ඉහළ යෑමේ වේගය මන්දගාමී විය. අන්තර්-බැංකු එතැන් විදේශ විනිමය වෙළඳපොළ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සිදු කරන ලද මගපෙන්වීම් හේතුවෙන් විනිමය අනුපාතිකය ස්ථායී වීම අතරතුර ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල අඩු වීම් නිසා ආනයනික භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම පාලනය වූ අතර, එයින් පොදු මිල මට්ටම මත ඇති වූ පීඩනය වසර අග භාගයේ දී තවදුරටත් පහත වැටුණි. මෙම ප්‍රවණතා පිළිබිඹු කරමින්, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය 2022 සැප්තැම්බර් මාසය දක්වා ඉහළ ගොස්, ඉන් අනතුරුව පහළ යෑමේ මාවතට අවතීර්ණ විය. නිෂ්පාදක මිල දර්ශකය (නි.මි.ද., 2018 සිව්වන කාර්තුව=100) මත පදනම් වූ උද්ධමනය 2022 අගෝස්තු මාසය දක්වා ඉහළ ගිය අතර, ඉන් අනතුරුව වසර අවසානය දක්වා පහළ ගියේය. වැටුප් සම්බන්ධයෙන් සලකා බැලීමේ දී, 2022 වසර තුළ විධිමත් හා අවිධිමත් පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ නාමික වැටුප්වල ඉහළ

යෑම් නිරීක්ෂණය විය. විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ අවම වැටුප් සංශෝධනය කිරීම, ජීවන වියදම ඉහළ යෑම මධ්‍යයේ අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන් ඉහළ වැටුප් ඉල්ලා සිටීම සහ රාජ්‍ය අංශයේ සියලුම සේවා නියුක්තිකයන් සඳහා විශේෂ දීමනාවක් ලබා දීම, මෙම ඉහළ යෑම් සඳහා හේතු විය. කෙසේ වුවද, භාණ්ඩ හා සේවා මිල ඉහළ යෑමට මුළුමනින්ම අනුරූප වූ වැටුප් ඉහළ යෑමක් දක්නට නොලැබුණි. එබැවින් ආර්ථිකයක මිල හා වැටුප් වැඩිවීම මගින් සිදුවන සර්පිලාකාර බලපෑමක් ඇති නොවූ අතර මූර්ත වැටුප්වල පහළ යෑමක් දක්නට ලැබුණි.

4.2 මිල

පොදු මිල මට්ටමේ විචලන

නිල පාරිභෝගික මිල දර්ශක, එනම් කොළඹ පාරිභෝගික මිල දර්ශකය සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය[1] මගින් මනිනු ලබන පොදු මිල මට්ටම, 2022 මාර්තු මාසයේ සිට සැප්තැම්බර් මාසය අතර කාලයේ දී පෙන්නුම් කළ ශීඝ්‍ර වර්ධනයත් සමඟ, වසර පුරා අඛණ්ඩ ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ ද, ප්‍රධාන වශයෙන් මහ බැංකුව විසින් ක්‍රියාවට නැංවූ දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙන්ම සැපයුම් තත්ත්වයන්ගේ සිදු වූ වර්ධනයන් හේතුවෙන් සමස්ත ඉල්ලුම් පීඩනය මන්දගාමී වීම නිසා වසර අවසානය වන විට පොදු මිල මට්ටම ඉහළ යෑමේ වේගයේ යම් අඩුවීමක් දක්නට ලැබුණි. දේශීය කෘෂිකාර්මික අංශය සැලකිය යුතු ලෙස දුර්වල වීම, ශ්‍රී ලංකා රුපියල කැපී පෙනෙන ලෙස අවප්‍රමාණය වීම, දේශීය වෙළඳපොළ තුළ විදේශ මුදල් ප්‍රමාණවත්ව නොපැවතීම, ජාත්‍යන්තර වෙළඳපොළේ භාණ්ඩ මිල ඉහළ යෑම, ඉහළ නැව් ගාස්තු මෙන්ම ඉන්ධන හිඟය හා ඉහළ ඉන්ධන පිරිවැය වැනි 2022 වසර තුළ පැවති අහිතකර ආර්ථික තත්ත්වයන්, ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල විචලන කෙරෙහි බලපෑම් ඇති කරන ලදී. මීට අමතරව, ඇතැම් භාණ්ඩ සඳහා වෙළඳපොළ පදනම් කරගත් මිල සූත්‍ර අනුගමනය කිරීම, පරිපාලිත අයිතමවල මිල ගණන් ඉහළ නැංවීම සහ විවිධ බදු ඉහළ දැමීම ද පොදු මිල මට්ටම ඉහළ යෑම කෙරෙහි බලපාන ලදී. කෙසේ වෙතත්, පොහොර සැපයුම සම්බන්ධයෙන් පැවති ගැටලු හේතුවෙන් ආහාර අයිතමවල මිල ගණන් කෙරෙහි ඇති වූ අහිතකර බලපෑම, පොහොර සැපයුම වැඩිදියුණු වීමත් සමඟ යම්තාක් දුරකට සමනය වූ අතර, අන්තර්-බැංකු එතැන් විදේශ විනිමය වෙළඳපොළ සඳහා මහ බැංකුව විසින් සිදු කරන ලද මගපෙන්වීම් හේතුවෙන් විනිමය අනුපාතිකය ස්ථාවර වීම 2022 වසර අග භාගය වන විට ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම ආනයනික අයිතමවල මිල ගණන් පහළ යෑම සඳහා දායක විය.

ආහාර කාණ්ඩයේ අයිතමවල මිල 2022 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ඉන් අනතුරුව සුළු වශයෙන් පහළ යෑමේ ප්‍රවණතාවක් අනුගමනය කළේය. මේ අතර, නිතර මිල උච්චාවචන සහිත ආහාර[2] සහ අනෙකුත් ආහාර[3] යන කාණ්ඩ දෙකෙහි අයිතමවල මිල ගණන්, 2022 වසර තුළ සිදු වූ ආහාර කාණ්ඩයේ මිල විචලනයන්ට දායක විය. දේශීය වෙළඳපොළෙහි රසායනික පොහොර ප්‍රමාණවත් පරිදි නොපැවතීම සහ වෙළඳපොළෙහි පැවති රසායනික පොහොරවල මිල ඉතා අධික වීම නිසා ප්‍රධාන වශයෙන් 2021/2022 මහ කන්නයේ අස්වැන්න පහළ යෑම හේතුවෙන් සමස්ත දේශීය සැපයුම පහත වැටුණු අතර, එමගින් දේශීයව නිෂ්පාදනය කරන ලද ආහාර අයිතමවල මිල ඉහළ ගියේය. පසුව රජය විසින් රසායනික පොහොර යොදා ගනිමින් වගා කටයුතු කිරීම සඳහා ගොවීන්ට පහසුකම් සලසා දුන් නමුත් එමගින් යල කන්නයේ අස්වැන්න පෙර පැවති මට්ටමට ඉහළ නංවා ගැනීමට නොහැකි විය. මේ අතර, අවස්ථා ගණනාවක දී සිදු කළ සැලකිය යුතු ඉන්ධන මිල ඉහළ නැංවීම් හේතුවෙන් ප්‍රවාහන ගාස්තු ඉහළ යෑම සහ අයහපත් කාලගුණ තත්ත්වයන් හේතුකොටගෙන ඇති වූ සැපයුම් අවහිරතා ද දේශීය ආහාර අයිතමවල මිල ඉහළ යෑම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. දේශීය සහ ආනයනික සහල් වර්ගවල මිල ගණන් 2022 ජූලි මාසය දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, මේ හේතුවෙන් රජයට දේශීය සහල් සඳහා උපරිම සිල්ලර මිල ගණන් පැනවීමට සිදුවිය. ඒ අනුව, 2022 මැයි මස 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි දේශීය සම්බා සහල් කිලෝග්‍රෑමයක් මත රුපියල් 230ක් සහ නාඩු සහල්

1 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින්, නිල පාරිභෝගික මිල දර්ශක, එනම් කොළඹ පා.මි.ද. සහ ජා.පා.මි.ද. මාසික පදනමින් සම්පාදනය කරයි. කොළඹ පා.මි.ද. මගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික නිවාස නියෝජනය වන ලෙස තෝරාගත් පාරිභෝගික අයිතමවල මිල වෙනස් වීම් පෙන්නුම් කරන අතර, ජා.පා.මි.ද. මගින් එය ජාතික මට්ටමින් පෙන්නුම් කරයි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කොළඹ පා.මි.ද. (2013-100) සහ ජා.පා.මි.ද. (2013-100) සම්පාදනය කිරීම නවතන ලද අතර, ඒවා පිළිවෙළින් 2023 පෙබරවාරි සහ 2023 ජනවාරි සිට කොළඹ පා.මි.ද. (2021-100) සහ ජා.පා.මි.ද. (2021-100) මගින් ප්‍රතිස්ථාපනය කරන ලදී.

2 සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය හා මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ඇට්ණු සහ තෝරාගත් කුළුබඩු නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයට ඇතුළත් වේ.

3 නිතර මිල උච්චාවචන සහිත අයිතම හැර අනෙකුත් ආහාර අයිතම.

4.1 රූප සටහන
මිල සහ වැටුප් විචලන - 2022

2022 වසරේ දී මිල ගණන් පෙර නොවූ විරූ වැඩිවීමක් වාර්තා කළ අතර මූර්ත වැටුප් තියුණු ලෙස පහළ යන ලදී...



(අ) 2021 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2022 දෙසැම්බර් මාසයේ දී කො.පා.මි. දර්ශකයෙහි (2013=100) අයිතමවල මිලෙහි ප්‍රතිශත වෙනස වේ.

(ආ) කො.පා.මි.ද. (2013=100) සහ ජා.පා.මි.ද. (2013=100) මත පදනම් වූ බර තැබීම් වේ.

(ඇ) නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයට සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරාගත් කුළුබඩු වර්ග ඇතුළත් වේ.

(ඈ) අනෙකුත් ආහාර කාණ්ඩයට නිතර මිල උච්චාවචනය වන ආහාර අයිතම හැර අනෙකුත් ආහාර ඇතුළත් වේ.

(ඉ) නාමික සහ මූර්ත වැටුප් වෙනස ලෙස 2021 සහ 2022 වසරවල සාමාන්‍ය අතර ප්‍රතිශතමය වෙනස දක්වා ඇත.

(ඊ) පඩිපාලක සහ මගින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වේ.

කිලෝග්‍රෑමයක් මත රුපියල් 220ක් වශයෙන් උපරිම සිල්ලර මිල ගණන් පනවන ලද අතර, 2022 ජූනි මස 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි දේශීය රතු කැකුළු සහල් සහ සුදු කැකුළු සහල් කිලෝග්‍රෑමයක් මත රුපියල් 210ක් වශයෙන් උපරිම සිල්ලර මිල ගණන් පනවන ලදී. අනතුරුව, දේශීය සහල් වර්ගවල මෙන්ම ආනයනික සහල් වර්ගවල මිල ද පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ශ්‍රී ලංකාවට විදේශ පරිත්‍යාග වශයෙන් ලැබුණු සහල් තොග රජය විසින් අඩු ආදායම්ලාභී පවුල් සඳහා නොමිලයේ බෙදා දීම හේතුවෙන් සහල් සඳහා වූ ඉල්ලුම පහළ යෑම ද සහල් මිල පහළ යෑම කෙරෙහි බලපාන ලදී. 2022 වසරේ

4.2 රූප සටහන
සතිපතා සිල්ලර මිල - සහල්



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

4.3 රූප සටහන
සතිපතා සිල්ලර මිල - එළවළු



(අ) බෝංචි, කැරට්, ගෝවා, බීට්රූට්, ලීක්ස්, තක්කාලි සහ රාබුවල සතිපතා මිල ගණන්හි සාමාන්‍ය වේ.
(ආ) වම්බටු, වට්ටක්කා, මෑකරල්, බණ්ඩක්කා, කරවිල සහ පතෝලවල සතිපතා මිල ගණන්හි සාමාන්‍ය වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

4.4 රූප සටහන
සතිපතා සිල්ලර මිල - පොල් (මධ්‍යම)



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

4.5 රූප සටහන
සතිපතා සිල්ලර මිල - මාළු (අ)



(අ) කෙලවල්ලා, තලපත්, පරා, බලයා, ගල් මාළු, තෝරා, මෝරා, සාලයා, හුරුල්ලා, හාල්මැස්සා, කුම්බලාවා සහ ලින්නා සතිපතා මිල ගණන්හි සාමාන්‍ය වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

4

මුල් මාසවල දී එළවළු මිල පහත වැටීමක් පෙන්නුම් කළ ද, ඉන්ධන හිඟය, ඉහළ ප්‍රවාහන වියදම්, අයහපත් කාලගුණ තත්ත්වයන් මෙන්ම පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍ය හිඟය හේතුවෙන් සැපයුමට ඇති වූ බාධා නිසා 2022 අප්‍රේල් සිට ජුනි දක්වා මාසවල දී එළවළු මිල ගණන් ඉතා ශීඝ්‍රයෙන් ඉහළ ගියේය. වසරේ දෙවන භාගයේ දී එළවළු මිල ගණන් ඉහළ මට්ටමක පැවතිය ද, 2022 ජූලි සහ සැප්තැම්බර් මාස අතර කාලයේ දී එළවළු මිලෙහි සුළු අඩු වීමක් පෙන්නුම් කළේය. මේ අතර, ඉහළ නිෂ්පාදන පිරිවැය මෙන්ම කුකුළු ආහාර, විටමින් හා බෙහෙත් ද්‍රව්‍ය හිඟවීම හේතුවෙන් 2022 ජනවාරි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා කාලය තුළ කුකුළු මස් මිල අඛණ්ඩව ඉහළ ගියේය. තවද, අහිතකර කාලගුණ තත්ත්වයන් ඇතුළුව ඉන්ධන හිඟය සහ ඉන්ධන මිල ඉහළ යෑම් හේතුකොටගෙන ධීවර කටයුතු අඩාල වීම නිසා, 2022 අප්‍රේල් මාසය දක්වා ස්ථාවරව පැවති නැවුම් මත්ස්‍ය මිල ගණන් ඉන් අනතුරුව 2022 සැප්තැම්බර් මාසය දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඉන් පසුව, ධීවර කටයුතු සඳහා භූමිතෙල් සැපයීමට ප්‍රමුඛත්වය දිය යුතු බවට රජය විසින් ගනු ලැබූ තීරණය වසරේ අවසාන මාස තුන තුළ මත්ස්‍ය මිල ගණන්වල පෙන්නුම් කළ පහළ යෑමට යම් දායකත්වයක් දක්වන ලදී. 2022 වසර තුළ බිත්තර නිෂ්පාදන පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුකොටගෙන බිත්තර මිල අධික ලෙස ඉහළ ගියේය. මේ අතර, අසාධාරණ ලෙස බිත්තර මිල ඉහළ යෑම මගින් පාරිභෝගිකයන් අගතියට පත් වීම වැළැක්වීමේ අරමුණින්, 2022 අගෝස්තු මස 19 වන දින සිට බලපැවැත්වෙන පරිදි සුදු බිත්තරයක් මත රුපියල් 43ක් ලෙස උපරිම සිල්ලර මිලක් පනවනු ලැබූ නමුත්, 2022 අවසාන කාර්තුවේ දී, බිත්තරයක මිල රුපියල් 50ක් දක්වා අඛණ්ඩව ඉහළ ගියේය. උත්සව සමයේ දී බිත්තර ඉල්ලුම ඉහළ යෑම ද මෙලෙස බිත්තර මිල ඉහළ යෑම කෙරෙහි යම් බලපෑමක් ඇති කළේය.

4.6 රූප සටහන
සතිපතා සිල්ලර මිල - අර්තාපල්



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

4.7 රූප සටහන
සතිපතා සිල්ලර මිල - ආනයනික ලොකු ළූණු



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

4.8 රූප සටහන
සතිපතා සිල්ලර මිල - සීනි සහ තිරිඟු පිටි



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

4.9 රූප සටහන
සතිපතා සිල්ලර මිල - පරිප්පු



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ආනයනික ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යෑම කෙරෙහි විදේශ විනිමය හිඟය, ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල ඉහළ යෑම, නැව් ගාස්තු ඉහළ යෑම සහ ආර්ථික පසුබෑම සැලකිල්ලට ගනිමින් පැනවූ ආනයන සීමා ප්‍රධාන වශයෙන් හේතු විය. විශේෂයෙන්ම, 2022 මාර්තු මාසයේ සිට විනිමය අනුපාතිකය වෙළඳපොළ බලවේග අනුව තීරණය වීමට ඉඩ හැරීමත් සමඟ දේශීය වෙළඳපොළේ ආනයනික ආහාර ද්‍රව්‍යවල මිල අධික ලෙස ඉහළ ගියේය. මේ අතර, සීනි, පරිප්පු, ලොකු ළූණු, වියළි මිරිස් සහ අර්තාපල් වැනි ආනයනික අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යෑම කෙරෙහි ලෝක වෙළඳපොළේ වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම ද හේතු විය. 2022 ජූනි මස 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි ආනයනික අර්තාපල් කිලෝග්‍රෑමයක් මත රුපියල් 20ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පැන වූ අතර, දේශීය ලොකු ළූණු ගොවීන් ආරක්ෂා කිරීම සඳහා 2022 සැප්තැම්බර් මස 23 වන දින සිට බලපැවැත්වෙන පරිදි ලොකු ළූණු කිලෝග්‍රෑමයක් මත පනවා තිබූ රුපියල් 50ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, දේශීය ලොකු ළූණු කන්නය අවසන් වීමෙන් පසු 2022 දෙසැම්බර් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි රුපියල් 10ක් ලෙස සංශෝධනය කරන ලදී. තවද, වෙළඳපොළ හැසිරීමට අනුව තිරිඟු පිටි, පාන් සහ කිරිපිටි මිල තීරණය වීමට ඉඩ හැරීමත් සමඟ ඒවායේ මිල ගණන් 2022 වසර තුළ දී නිරන්තර සංශෝධනයන්ට ලක් විය. තිරිඟු පිටි මිල ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස 2022 වසර ආරම්භයේ දී රුපියල් 80ක් වශයෙන් පැවති ග්‍රෑම් 450ක් බරැති පාන් ගෙඩියක මිල දෙසැම්බර් මාසය වන විට රුපියල් 140ත් රුපියල් 200ත් අතර මිල පරාසයක පැවතුණි. මේ අතර, තිරිඟු පිටි මිල ඉහළ යෑමට අමතරව, එල්.පී. ගෑස් සහ විදුලි බිල ඉහළ යෑම හේතුවෙන් අනෙකුත් බේකරි අයිතමවල මිල ගණන් ද 2022 වසරේ දී සැලකිය යුතු සංශෝධනයන්ට ලක් විය. තවද, ජාත්‍යන්තර වෙළඳපොළෙහි කිරිපිටි මිල ඉහළ යෑම සහ නැව් ගාස්තු ඉහළ යෑම සැලකිල්ලට

4

4.1 සංඛ්‍යා සටහන
තෝරා ගත් අයිතමවල සිදු වූ පරිපාලිත මිල සංශෝධන - 2022

අයිතමය	ඒකකය	සංශෝධිත මිල (රු.)	බලපැවැත් වූ දිනය
කිරි පිටි			
ආනයනික			
ඇන්කර්	ග්‍රෑම් 400	790.00	2022.03.19
	ග්‍රෑම් 400	1,020.00	2022.04.05
	ග්‍රෑම් 400	1,160.00	2022.06.16
	ග්‍රෑම් 400	1,240.00	2022.10.05
දේශීය			
හයිලන්ඩ්	ග්‍රෑම් 400	495.00	2022.03.10
	ග්‍රෑම් 400	625.00	2022.04.12
	ග්‍රෑම් 400	850.00	2022.06.23
	ග්‍රෑම් 400	950.00	2022.10.05
එල්.පී. ගෑස්			
ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම	කි.ග්‍රෑ. 12.5	4,860.00	2022.04.27
	කි.ග්‍රෑ. 12.5	4,910.00	2022.07.11
	කි.ග්‍රෑ. 12.5	4,664.00	2022.08.09
	කි.ග්‍රෑ. 12.5	4,551.00	2022.09.06
	කි.ග්‍රෑ. 12.5	4,280.00	2022.10.06
	කි.ග්‍රෑ. 12.5	4,360.00	2022.11.06
	කි.ග්‍රෑ. 12.5	4,610.00	2022.12.06
ලාෆ්ස් ගෑස් ලංකා සමාගම	කි.ග්‍රෑ. 12.5	4,199.00	2022.03.20
	කි.ග්‍රෑ. 12.5	6,850.00	2022.06.05
	කි.ග්‍රෑ. 12.5	5,800.00	2022.08.18
	කි.ග්‍රෑ. 12.5	5,300.00	2022.10.11
ඉන්ධන			
පෙට්‍රල් (ඔක්ටේන් 92)			
ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	184.00	2022.02.07
ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	204.00	2022.02.26
ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	254.00	2022.03.11
ලං.බ.නී.සං.	ලීටර් 1	254.00	2022.03.12
ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	303.00	2022.03.26
ලං.බ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	338.00	2022.04.18
ලං.බ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	420.00	2022.05.24
ලං.බ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	470.00	2022.06.26
ලං.බ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	450.00	2022.07.17
ලං.බ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	410.00	2022.10.02
ලං.බ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	370.00	2022.10.17
සුදු ඩීසල්			
ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	124.00	2022.02.07
ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	139.00	2022.02.26
ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	214.00	2022.03.11
ලං.බ.නී.සං.	ලීටර් 1	176.00	2022.03.12
ලං.බ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	289.00	2022.04.18
ලං.බ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	400.00	2022.05.24
ලං.බ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	460.00	2022.06.26
ලං.බ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	440.00	2022.07.17
ලං.බ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	430.00	2022.08.01
ලං.බ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	415.00	2022.10.17
ලං.බ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	430.00	2022.11.13
ලං.බ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	420.00	2022.12.06
භූමිතෙල්			
ලං.බ.නී.සං.	ලීටර් 1	340.00	2022.08.22
ලං.බ.නී.සං.	ලීටර් 1	365.00	2022.11.13
අවම බස් ගාස්තුව		17.00	2022.01.05
		20.00	2022.03.13
		27.00	2022.04.20
		32.00	2022.05.25
		40.00	2022.07.01
		38.00	2022.07.20
		34.00	2022.08.05
අවම දුම්රිය ගාස්තුව		20.00	2022.07.25

(සම්බන්ධයි)

4.1 සංඛ්‍යා සටහන (සම්බන්ධයි)
තෝරා ගත් අයිතමවල සිදු වූ පරිපාලිත මිල සංශෝධන - 2022

අයිතමය	ඒකකය	සංශෝධිත මිල (රු.)	බලපැවැත් වූ දිනය
විදුලි ගාස්තු - ස්ථාවර			
ඒකක 60ට අඩු	0-30	120.00	2022.08.10
	31-60	240.00	2022.08.10
ඒකක 60ට වැඩි	0-60	-	2022.08.10
	61-90	360.00	2022.08.10
	91-120	960.00	2022.08.10
	121-180	960.00	2022.08.10
	180ට වැඩි	1,500.00	2022.08.10
විදුලි ගාස්තු - ඒකක			
ඒකක 60ට අඩු	0-30	8.00	2022.08.10
	31-60	10.00	2022.08.10
ඒකක 60ට වැඩි	0-60	16.00	2022.08.10
	61-90	16.00	2022.08.10
	91-120	50.00	2022.08.10
	121-180	50.00	2022.08.10
	180ට වැඩි	75.00	2022.08.10
ජල ගාස්තු - ගෘහස්ත			
ඒකක ගාස්තුව	0-5	20.00	2022.09.01
	06-10	27.00	2022.09.01
	11-15	34.00	2022.09.01
	16-20	68.00	2022.09.01
	21-25	99.00	2022.09.01
	26-30	150.00	2022.09.01
	31-40	179.00	2022.09.01
	41-50	204.00	2022.09.01
	51-75	221.00	2022.09.01
	75ට වැඩි	238.00	2022.09.01

මූලයන්: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
ජාතික ගමනාගමන කොමිෂන් සභාව
ලංකා විදුලිබල මණ්ඩලය
ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
ශ්‍රී ලංකා මහ බැංකුව

ගනිමින් ආනයනික කිරිපිටි ග්‍රෑම් 400 පැකට්ටුවක මිල අවස්ථා හතරක දී ඉහළ දමන ලදී. එමෙන්ම, නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම හේතුවෙන් දේශීය කිරිපිටි ග්‍රෑම් 400 පැකට්ටුවක මිල ද අවස්ථා කිහිපයක දී ඉහළ දමනු ලැබීය. පරිප්පු, සුදු සීනි සහ කරවල මිල ගණන් 2022 වසරේ පළමු භාගයේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද, ජාත්‍යන්තර වෙළඳපොළෙහි මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2022 වසරේ අග භාගයේ දී ඒවායේ දේශීය මිල ගණන් ද පහළ ගියේය. තවද, ආනයන ඉල්ලුම සීමා කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ විනිමය අනුපාතිකය ස්ථාවර වීම හේතුවෙන්, 2022 වසරේ අග භාගයේ දී ආනයනික ආහාර ද්‍රව්‍යවල මිල ගණන්වල පහළ යෑමක් වාර්තා විය. කෙසේ වෙතත්, 2022 ඔක්තෝබර් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි පැනවූ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මගින්, 2022 වසර අවසානය වන විට ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ඉහළ යෑමට යම් බලපෑමක් ඇති කරන ලදී.

ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් 2022 වසරේ දී සැලකිය යුතු ලෙස ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, දේශීය හා ගෝලීය ආර්ථික පසුබෑම් මධ්‍යයේ විනිමය අනුපාතිකය දැඩි ලෙස අවප්‍රමාණය වීම සහ දේශීය වෙළඳපොළ තුළ විදේශ මුදල් හිඟ වීම වැනි අහිතකර තත්ත්වයන් ඊට හේතු විය. රුපියල අවප්‍රමාණය වීම මෙන්ම වෙළඳපොළ මිල ගණන් ඉහළ යෑම හා අනුගත වෙමින් රජය විසින් නියාමනය කරනු ලැබූ ඛනිජ තෙල් මිල (ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව), එල්.පී. ගෑස් (ලිට්‍රෝ) මිල සහ බස් ගාස්තු, 2022 වසරේ අවස්ථා කිහිපයක දී ඉහළ දමන ලදී. ඒ අනුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියන් ඔයිල් සමාගම (ලංකා අයි.ඕ.සී.) යන ආයතන විසින්, පෙට්‍රල් (ඔක්ටේන් 92) සහ සුදු ඩීසල් මිල, 2022 වසර තුළ කිහිප අවස්ථාවක දී සංශෝධනය කරන ලදී. විශේෂයෙන්ම, 2022 සැප්තැම්බර් මාසයේ සිට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා අයි.ඕ.සී. ආයතනය විසින් සිදු කරන ලද ඉන්ධන මිල සංශෝධන අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද මිල සූත්‍රය මත පදනම් විය. ඉන්ධන මිල ඉහළ නැංවීමත් සමඟ පාසල් වෑන් රථ, කුලී රථ සහ ත්‍රීරෝද රථ ගාස්තු ද 2022 වසරේ අවස්ථා කිහිපයක දී ඉහළ ගියේය. කෙසේ වුවද, සුදු ඩීසල් මිල පහළ යෑමත් සමඟ බස් ගාස්තු 2022 ජූලි මස 20 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 2.23ක් සහ 2022 අගෝස්තු මස 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 11.14ක් වශයෙන් අවස්ථා දෙකක දී පහළ ගියේය. එමෙන්ම, 2022 වසර තුළ දෙවතාවක දී භූමිතෙල් මිල සංශෝධනය වීම හේතුවෙන් 2022 වසරේ දී භූමිතෙල් මිල සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එමෙන්ම, ඉන්ධන හිඟය සහ ඉන්ධන මිල ඉහළ යෑම මගින් ඇති වූ අහිතකර බලපෑම් ආර්ථිකයේ සෑම අංශයකටම සම්ප්‍රේෂණය වූ අතර, වසර හතරකට පමණ පසු 2022 ජූලි මස 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි දුම්රිය ගාස්තු ඉහළ දමන ලදී. තවද, රුපියල අවප්‍රමාණය වීම සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කිරීම මගින් ඇතිවුණු බලපෑම පිළිබිඹු කරමින්, වාහන අමතර කොටස් මිල සහ වාහන සේවා ගාස්තු ද 2022 වසර තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2022 වසරේ දී සකස් කළ ආහාරවල මිල ගණන් අඛණ්ඩව ඉහළ ගිය අතර, මේ සඳහා කිලෝග්‍රෑම් 12.5ක් බරැති එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල අවස්ථා කිහිපයක දී සංශෝධනය වීම හේතු විය. වසර අටකට ආසන්න කාලයක් නොවෙනස්ව පැවති විදුලි ගාස්තු, ජනන පිරිවැය සහ බෙදා හැරීමේ පිරිවැය පියවා ගැනීම සඳහා 2022 අගොස්තු මස 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 75කින් සැලකිය යුතු ලෙස ඉහළ දමන ලදී. මීට අමතරව, වසර 10කට ආසන්න කාලයක් සංශෝධනය නොවූ ජල ගාස්තු ද 2022 සැප්තැම්බර් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. රුපියල අවප්‍රමාණය වීම, ජාත්‍යන්තර වෙළඳපොළේ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම, නැව් ගාස්තු ඇතුළු ප්‍රවාහන වියදම් ඉහළ යෑම සහ ආනයන සීමා පැනවීමෙන් ඇති වූ භාණ්ඩ හිඟය හේතුවෙන් ගෘහ ඒකක නඩත්තුව හා ඒ ආශ්‍රිත උපකරණවල අඛණ්ඩ මිල ඉහළ යෑමක් 2022 වසර තුළ දී වාර්තා විය. තවද, ආර්ථික තත්ත්වය අයහපත් වීම හේතුකොටගෙන 2022 අප්‍රේල් මාසයේ දී පමණක් නිවාස කුලියෙහි සුළු ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී. පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර ගාස්තු සහ පෞද්ගලික රෝහල් ගාස්තු වැනි පාරිභෝගික භාණ්ඩ පැසට ඇතුළත් වී ඇති සෞඛ්‍ය සේවාවලට අදාළ වියදම් 2022 වසර තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, සියයට 11.25ක් වශයෙන් පැවති විදුලි සංදේශ බද්ද, 2022 ජූනි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 15ක් දක්වා ඉහළ දමන ලදී. එමෙන්ම, සියයට 8ක් වශයෙන් පැවති එකතු කළ අගය මත බද්ද, 2022 ජූනි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 12 දක්වා ඉහළ දැමීම, ඉන් අනතුරුව 2022 සැප්තැම්බර් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 15 දක්වා ඉහළ දැමීම සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද හඳුන්වා දීම, ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් තවදුරටත් ඉහළ යෑමට හේතු විය. රජය විසින් මහජනතාවට සහන සැලසීමේ අරමුණින්, ඉන්ධන, එල්.පී. ගෑස් වැනි ප්‍රධාන ආනයනික අයිතම කිහිපයක මිල සහ විදුලිය, ජලය, බස්, දුම්රිය, විදුලි සංදේශ සහ තැපැල් වැනි අත්‍යවශ්‍ය සේවාවල ගාස්තු කාලයක් පුරා සැලකිය යුතු වශයෙන් ඉහළ නොදමා ස්ථාවර මට්ටම්වල පවත්වා ගත් නමුත්, පවත්නා ආර්ථික තත්ත්ව යටතේ එය තවදුරටත් සිදු කළ නොහැකි කාර්යයක් බවට පත්ව ඇත. පසුගිය වසර කිහිපය තුළ පරිපාලිත භාණ්ඩ සහ සේවාවල මිල ගණන් කෘතිමව පහළ මට්ටමක රඳවා ගැනීමකින් තොරව, ලෝක වෙළඳපොළ මිල සහ විනිමය අනුපාතිකයේ විචලනයන්ට අනුකූලව, ක්‍රමානුකූලව සංශෝධනය කළේ නම්, 2022 වසර තුළ දී සිදු වූ අසාමාන්‍ය ලෙස මිල ගණන් ඉහළ යෑම මගහරවා ගැනීමටත්, ඉන් මහජනතාවට ඇති වූ පීඩනය අවම කර ගැනීමටත් හැකියාව තිබුණි. විශේෂයෙන්ම, රජය විසින් මිල සහනාධාර ලබා දීමේ දී, ආර්ථිකයේ සියලුම අංශවල ශක්තීන් සහ දුර්වලතා මැනවින් සලකා බලා රටේ මැදි සහ දිගු කාලීන ආර්ථික පුනර්ජීවනයට බලපෑමක් නොවන පරිදි එම කටයුතු සිදු කළ යුතුය.

4.10 රූප සටහන
කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය - 2022



(අ) ආහාර නොවන කාණ්ඩයේ පරිපාලිත අයිතම ලෙස විදුලිය, එල්.පී. ගෑස්, ඉන්ධන, බස් ගාස්තු සහ දුම්රිය ගාස්තු සැලකේ.
(ආ) ආහාර නොවන කාණ්ඩයේ පරිපාලිත අයිතම හැර ඉතිරි අයිතම

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

4.11 රූප සටහන
ජා.පා.මි. දර්ශකයෙහි මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය - 2022



(අ) ආහාර නොවන කාණ්ඩයේ පරිපාලිත අයිතම ලෙස විදුලිය, එල්.පී. ගෑස්, ඉන්ධන, බස් ගාස්තු සහ දුම්රිය ගාස්තු සැලකේ.
(ආ) ආහාර නොවන කාණ්ඩයේ පරිපාලිත අයිතම හැර ඉතිරි අයිතම

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

4 පාරිභෝගික මිල දර්ශක

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.)

කො.පා.මි. දර්ශකය (2013=100) 2022 ජනවාරි මාසයේ පැවති දර්ශකාංක 158.4හි සිට 2022 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 243.2 දක්වා ඉහළ ගියේය. 2022 වසරේ ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ කො.පා.මි. දර්ශකයෙහි වාර්තා වූ වේගවත් ඉහළ යෑම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම සිදු වූ මාසික මිල ඉහළ යෑම් හේතු වූ අතර, 2022 ජූනි මාසය හැර ඉතිරි මාසවල දී ඒ සඳහා ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ඉහළ යෑම් වැඩි දායකත්වයක් දක්වන ලදී. 2022 වසරේ ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවල දී කො.පා.මි. දර්ශකයෙහි නිරීක්ෂණය වූ මාසික පහළ යෑම් සඳහා ආහාර කාණ්ඩය ප්‍රධාන දායකත්වයක් දක්වන ලදී. කො.පා.මි.ද. ගණනය කිරීම ආරම්භයේ සිට මේ දක්වා, එම දර්ශකයේ මෙන්ම ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පෙන්නුම් කළ ඉහළම මාසික වෙනස්වීම් ප්‍රතිශත 2022 ජූනි මාසයේ දී වාර්තා වූ අතර, ඒවා පිළිවෙළින්, සියයට 12.8ක්, සියයට 18.9ක් සහ සියයට 9.4ක් විය. ඒ අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2013=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2022 ජනවාරි මාසයේ වාර්තා වූ සියයට 14.2හි සිට අඛණ්ඩව ඉහළ ගොස් 2022 සැප්තැම්බර් මාසයේ දී මෙතෙක් වාර්තා කළ ඉහළම අගය වන සියයට 69.8 වාර්තා කරන ලදී. කෙසේ වුවද, අපේක්ෂා කළ පරිදිම 2022 ඔක්තෝබර් මාසයේ දී උද්ධමනය පහළ යෑමේ ක්‍රියාවලිය ආරම්භ වූ අතර, ඒ අනුව, මතුපිට උද්ධමනය 2022 දෙසැම්බර් මාසයේ දී සියයට 57.2ක් කරා ළඟා විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.)

ජා.පා.මි. දර්ශකය (2013=100) 2022 ජනවාරි මාසයේ වාර්තා කළ දර්ශකාංක 166.0හි සිට දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 256.3 දක්වා ළඟා විය. කො.පා.මි. දර්ශකයේ මාසික වෙනස්වීම්වලට සමගාමීව, 2022 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාල සීමාව තුළ ජා.පා.මි. දර්ශකයෙහි වාර්තා වූ ඉහළ යෑම් සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම මිල ගණන් ඉහළ යෑම් දායක විය. කෙසේ වුවද, 2022 ඔක්තෝබර් මාසයේ වාර්තා වූ මාසික ඉහළ යෑම සඳහා ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන් ඉහළ යෑම පමණක් හේතු විය. මේ අතර, 2022 නොවැම්බර් මාසයේ නිරීක්ෂණය වූ මාසික වෙනසෙහි පහළ යෑම සඳහා ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් පහළ යෑම හේතු විය. 2022 දෙසැම්බර් මාසයේ දී ජා.පා.මි. දර්ශක අගය නොවැම්බර් මාසයේ දර්ශක අගය හා සම මට්ටමේ පැවති අතර, ඒ සඳහා ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි සිදු වූ ඉහළ යෑම, ආහාර කාණ්ඩයේ මිල ගණන්හි සිදු වූ පහළ යෑම මගින් නිශේධනය වීම හේතු විය. විශේෂයෙන්ම, ජා.පා.මි.ද. ගණනය කිරීම ආරම්භයේ සිට මේ දක්වා ආහාර කාණ්ඩයේ වාර්තා වූ ඉහළම මාසික වැඩිවීම වන සියයට 14.2, 2022 ජූනි මාසයේ දී වාර්තා වූ අතර,

විශේෂ සටහන 6

පාරිභෝගික මිල දර්ශකයන්ගේ පදනම් වර්ෂ 2021 ලෙස යාවත්කාලීන කිරීම

ශ්‍රී ලංකාවේ නිල පාරිභෝගික මිල දර්ශක සම්පාදනය කිරීමේ වගකීම දරන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් එම දර්ශකවල 2013 ලෙස පැවති පදනම් වර්ෂය 2021 වශයෙන් යාවත්කාලීන කරනු ලැබීය. කාලයත් සමඟ වෙනස් වන පාරිභෝගික පරිභෝජන රටා වඩා නිවැරදිව පිළිබිඹු වීම සඳහා පාරිභෝගික මිල දර්ශක ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ විශිෂ්ට පරිචයන්ට අනුකූලව නිශ්චිත කාලපරාසයන් තුළ යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය වේ. පාරිභෝගික මිල දර්ශක යාවත්කාලීන කිරීම තුළින් ඒවායේ ප්‍රධාන අංගයන්හි වැඩිදියුණුවක් සිදු කෙරෙන අතර විශේෂයෙන්ම, පාරිභෝගික මිල දර්ශකයන්ට අදාළ භාණ්ඩ පැසෙහි අඩංගු භාණ්ඩ හා සේවාවල පරිභෝජන ප්‍රමුඛතාව නිරූපණය වන පරිදි බර තැබීම් සංයුතියේ වෙනස්කම් සිදු කරනු ලබයි. මීට අමතරව, එම දර්ශකවලට අදාළ භාණ්ඩ පැසෙහි සංයුතියෙහි ද වෙනස්කම් සිදු කරනු ලබන අතර, පාරිභෝගික පරිභෝජන රටාවේ සිදුව ඇති වෙනස්කම් අනුව යම් යම් භාණ්ඩ හා සේවා අදාළ භාණ්ඩ පැසෙන් ඉවත් කිරීම මෙන්ම අලුතින් භාණ්ඩ හා සේවා, එම පැසට එක් කිරීම ද සිදු කරනු ලබයි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාවේ නිල පාරිභෝගික මිල දර්ශක වන, ජාතික පාරිභෝගික මිල දර්ශකයේ සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ පදනම් වර්ෂයන් 2021 වශයෙන් යාවත්කාලීන කරන ලද අතර, නව පදනම් වර්ෂය අනුව සම්පාදනය කරනු ලැබූ දර්ශක 2023 පෙබරවාරි මස සිට නිකුත් කරන ලදී. මුල්වරට 1952 වසර පදනම් කරගනිමින් හඳුන්වා දුන් කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි මේ දක්වා පදනම් වර්ෂ යාවත්කාලීන කිරීම් හතරක් සිදු කර ඇති අතර, ඒ අනුව 1952, 2002, 2006/07, 2013 සහ 2021 යන පදනම් වර්ෂවලට අදාළව දර්ශක ශ්‍රේණි ගණනය කරනු ලැබ ඇත. ජාතික පාරිභෝගික මිල දර්ශකය සම්බන්ධයෙන් ගත් කළ, පළමු දර්ශක ශ්‍රේණිය, පදනම් වර්ෂය 2013 ලෙස සලකා ගණනය කරනු ලැබූ අතර, ඉන්පසුව එහි පදනම් වර්ෂය 2021 වශයෙන් යාවත්කාලීන කරන ලදී. පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියේ දී පාරිභෝගික මිල දර්ශක ගණනය කරනු ලබන ක්‍රමවේදයන් ද වෙනස් කරනු ලැබූ අතර, නවතම ක්‍රමවේදයට අනුව දර්ශක ගණනය කිරීම අදියර දෙකකින් සිදු කරනු ලබයි. ඒ අනුව, මූලික දර්ශක ගණනය කිරීම සඳහා ගුණෝත්තර මධ්‍යන්‍යය (geometric mean) හෝ ජෙවෝන්ස් සමීකරණය (Jevons Formula) යොදාගනු ලබන අතර ද්විතීයික දර්ශක ගණනය කිරීම සඳහා යන්ග් සමීකරණය (Young Formula) භාවිතා කරනු ලබයි. පාරිභෝගික මිල දර්ශකයන්හි අයිතමවල බර තැබීම් ගණනය කිරීම සඳහා, කුටුම්බයක් විසින් සිය පරිභෝජනය සඳහා සිදු කරනු ලැබූ සියලුම වියදම් ආවරණය වන පරිදි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ දී සිදු කරනු ලැබූ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයේ දත්ත හා තොරතුරු පදනම් කරගන්නා ලදී. ඒ අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) බර තැබීම් ගණනය කිරීම

සංඛ්‍යා සටහන වි.ස. 6.1

නිල පාරිභෝගික මිල දර්ශකයන්ගේ මූලික ලක්ෂණ

මූලික ලක්ෂණ	කො.පා.මි.ද. (2013=100)	කො.පා.මි.ද. (2021=100)	ජා.පා.මි.ද. (2013=100)	ජා.පා.මි.ද. (2021=100)
දර්ශකයේ මූලාශ්‍ර වසර	2013	2021	2013	2021
බර තැබීමේ මූලාශ්‍ර වසර	2012 ජූලි - 2013 ජූනි	2019 ජනවාරි - 2019 දෙසැම්බර්	2012 ජූලි - 2013 ජූනි	2019 ජනවාරි - 2019 දෙසැම්බර්
භූගෝලීය ආවරණය	කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම නාගරික ප්‍රදේශ	කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම නාගරික ප්‍රදේශ	මුළු දිවයිනේ සියලුම පළාත්	මුළු දිවයිනේ සියලුම පළාත්
එක් කුටුම්බයක ප්‍රමාණය	3.9	3.8	3.9	3.7
මාසික සාමාන්‍ය පරිභෝජන වියදම (රු.)	රු. 60,364.73	රු. 91,880.34	රු. 32,142.69	රු. 50,728.60
දර්ශකාංකයක අගය	603.65	918.80	321.43	507.29
ප්‍රධාන කාණ්ඩ	12	12	12	12
උප කාණ්ඩ	105	105	105	105
මුළු අයිතම ගණන	392	426	407	485
මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස				
ආහාර	28.24	26.23	44.04	39.22
ආහාර නොවන	71.76	73.77	55.96	60.78
මිල එකතු කිරීම සඳහා යොදා ගන්නා මධ්‍යස්ථාන ගණන	14	10	දිස්ත්‍රික්කයක නගරයකින් අලෙවිසැල් තුනක් යොදා ගනු ලබයි.	දිස්ත්‍රික්කයක නගරයකින් අලෙවිසැල් තුනක් යොදා ගනු ලබයි.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

රූප සටහන වි.ස. 6.1
කො.පා.මි.ද. (2013=100) සිට කො.පා.මි.ද (2021=100) දක්වා බර තැබීම් ව්‍යුහයන්හි සිදු වූ වෙනස්කම්



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

රූප සටහන වි.ස. 6.2
ජා.පා.මි.ද. (2013=100) සිට ජා.පා.මි.ද (2021=100) දක්වා බර තැබීම් ව්‍යුහයන්හි සිදු වූ වෙනස්කම්



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

රූප සටහන වි.ස. 6.3
මාසික ප්‍රතිශත වෙනසෙහි විචලන කො.පා.මි.ද. (2013=100) සහ කො.පා.මි.ද (2021=100)



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

රූප සටහන වි.ස. 6.4
මාසික ප්‍රතිශත වෙනසෙහි විචලන ජා.පා.මි.ද. (2013=100) සහ ජා.පා.මි.ද (2021=100)



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සඳහා 2019 වසර යොදා ගෙන ඇති අතර, 2018 ජනවාරි මාසයේ සිට 2019 දෙසැම්බර් මාසය දක්වා කාල පරාසය තුළ වාර්තා වූ මිල ගණන් මෙම පාරිභෝගික මිල දර්ශක ගණනය කිරීමේ දී පදනම් මිල ලෙස යොදා ගනු ලැබ ඇත. තවද, දර්ශක ගණනය කිරීමේ දී දර්ශක අගය සියයට සමාන කරනු ලබන පදනම් වර්ෂය ලෙස 2021 වසර යොදාගනු ලැබ ඇත. නිල පාරිභෝගික මිල දර්ශකයන්ගේ මූලික ලක්ෂණ සංඛ්‍යා සටහන වි.ස. 6.1හි දක්වා ඇත.

පාරිභෝගික මිල දර්ශකයන්ගේ පදනම් වර්ෂ යාවත්කාලීන කිරීමේ දී ඒවායේ බර තැබීමේ ව්‍යුහයන් විවිධ වෙනස්කම්වලට ලක්ව ඇත. ඒ අතර සැලකිය යුතු වෙනසක් වන්නේ භාණ්ඩ පැසෙහි මුළු වියදම්න් ආහාර අයිතම සඳහා වන වියදම් ප්‍රතිශතය පහළ යෑම සහ ආහාර නොවන අයිතම සඳහා වන වියදම් ප්‍රතිශතය ඉහළ යෑමයි. ඒ අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ ආහාර සඳහා වන වියදම් ප්‍රතිශතය සියයට 28.24හි සිට සියයට 26.23 දක්වා පහත වැටුණු අතර ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ආහාර සඳහා වන වියදම් ප්‍රතිශතය සියයට 44.04හි සිට සියයට 39.22 දක්වා පහත වැටුණි. මීට අමතරව, පදනම් වර්ෂ යාවත්කාලීන කිරීමේ දී පෙති කැපූ පාන්, දඹුළ සහ කොමඩු යන අයිතම භාණ්ඩ පැසට අලුතින් එක් වූ අතර නැවුම් හාල්මැස්සන්, කකුළුවන් සහ තල තෙල් වැනි ආහාර අයිතම භාණ්ඩ පැසෙන් ඉවත් කෙරිණි. මේ අතර, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ ආහාර නොවන අයිතම සඳහා වන වියදම් ප්‍රතිශතය සියයට 71.76හි සිට සියයට 73.77 දක්වා ඉහළ ගිය අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ආහාර නොවන කාණ්ඩය සඳහා වන වියදම් ප්‍රතිශතය සියයට 55.96හි සිට සියයට 60.78 දක්වා ඉහළ ගියේය. ආහාර නොවන කාණ්ඩයේ අයිතම සැලකූ විට, මේස සහ මැහුම් කුලී වැනි අයිතම අලුතින් එක් වූ අතර සුරුට්ටු, වානේ අල්මාරි සහ වියළි කෝෂ (බැටරි) වැනි අයිතම භාණ්ඩ පැසෙන් ඉවත් වී ඇත. එමෙන්ම, මෙම පදනම් වර්ෂ යාවත්කාලීන කිරීමේ දී, නිවාස, ජලය, විදුලිය සහ

අනෙකුත් ඉන්ධන; ආහාර සහ මද්‍යසාර නොවන පාන වර්ග; සහ ප්‍රවාහන යන උප කාණ්ඩ, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ සහ ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ඉහළම වියදමක් දරන උප කාණ්ඩ ලෙස තවදුරටත් පවතී.

මෙම පාරිභෝගික මිල දර්ශක දෙකටම පොදු කාලපරාසය 2022 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා වන අතර, එම පොදු කාලපරාසයේ දී ජාතික පාරිභෝගික මිල දර්ශකයේ සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ 2013 සහ 2021 යන පදනම් වර්ෂ දෙකටම අදාළව වාර්තා වූ මාසික ප්‍රතිශත වෙනස්කම්, වි.ස. 6.3 සහ වි.ස. 6.4 රූප සටහන් මගින් පෙන්නුම් කරනු ලබයි. මෙම රූප සටහන්වලින් දක්වා ඇති පරිදි ජා.පා.මි. සහ කො.පා.මි. දර්ශක දෙකෙහි 2013 සහ 2021 පදනම් වර්ෂ යටතේ ගණනය කරනු ලැබූ මාසික ප්‍රතිශත වෙනස්කම් සසඳා බැලීමේ දී ඉතා සුළු වෙනසක් පමණක් දක්නට ලැබෙන අතර, මෙම දර්ශකවල බර තැබීමේ ව්‍යුහයන්හි ඉතා සුළු වෙනස්කම් පමණක් සිදු වීම ඊට හේතු වී තිබේ. කෙසේ වුවද, පාරිභෝගික මිල දර්ශක, ආර්ථිකය සම්බන්ධ තීරණ ගැනීමේ දී ඉතා තීරණාත්මක කර්තව්‍යයක් ඉටු කරන බැවින්, කාලයත් සමඟ වෙනස්වන පාරිභෝගික පරිභෝජන රටා මැනවින් පිළිබිඹු වන ලෙස ඒවායේ පදනම් වර්ෂයන් නියමිත කාලපරාසයක දී යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය වේ.

මූලාශ

1. Department of Census and Statistics. A Briefing on the Rebased Colombo Consumer Price Index (Base 2021=100) for Sri Lanka. Available at: http://www.statistics.gov.lk/Information And Prices/Statistical Information/MonthlyCCP/Technical _Note
2. Department of Census and Statistics. A Briefing on the Rebased National Consumer Price Index (Base 2021=100) for Sri Lanka. Available at:http://www.statistics.gov.lk/InflationAnd Prices/Statistical Information/NCPI/NCPITechnicalNote

ආහාර නොවන කාණ්ඩයේ වාර්තා වූ ඉහළම මාසික වැඩිවීම වන සියයට 8.6, 2022 මැයි මාසයේ දී වාර්තා විය. ඒ අනුව, ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2022 ජනවාරි මාසයේ වාර්තා වූ සියයට 16.8හි සිට සැප්තැම්බර් මාසයේ දී සියයට 73.7 දක්වා අඛණ්ඩව ඉහළ ගිය අතර, ඉන් අනතුරුව 2022 දෙසැම්බර් මාසයේ දී සියයට 59.2 දක්වා පහළ ගියේය.

නිෂ්පාදක මිල දර්ශකය (නි.මි.ද.)

දේශීය භාණ්ඩ නිෂ්පාදකයන්ට සිය නිෂ්පාදන සඳහා ලැබෙන මිල ගණන්වල සාමාන්‍යය මත පදනම්ව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන, නි.මි.ද. (2018 සිව්වන කාර්තුව=100), 2022 ජනවාරි මාසයේ වාර්තා කළ දර්ශකාංක 137.4හි සිට 2022 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 251.4 දක්වා සමස්ත ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. 2022 පෙබරවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා නි.මි.ද. පෙන්නුම් කළ සැලකිය යුතු ඉහළ යෑමට, එම දර්ශකයේ ඉහළම බර තැබීම සහිත නිෂ්පාදන උප අංශය ප්‍රධාන වශයෙන් දායක වූ අතර, ඉන් අනතුරුව, එම දර්ශකය 2022 වසරේ ඉතිරි කාලය තුළ දී ස්ථාවර මට්ටමක පැවතුණි. නි.මි. දර්ශකයෙහි කෘෂිකර්මාන්ත උප දර්ශකය 2022 ජනවාරි මාසයේ දී දර්ශකාංක 164.1ක් ලෙස වාර්තා වූ අතර, 2022 වසරේ පළමු භාගයේ දී එය ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඉන් අනතුරුව ස්ථාවර මට්ටමක පැවතී 2022 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 238.6ක් කරා ළඟා විය. මේ අතර, නිෂ්පාදන උප අංශයේ නි.මි.ද. 2022 ජනවාරි මාසයේ දී දර්ශකාංක 135.3ක් සහ දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 257.0ක් වාර්තා කළ අතර, 2022 වසර තුළ මෙම උප අංශයේ මාසික පහළ යෑම් වාර්තා වූයේ සැප්තැම්බර් සහ නොවැම්බර් මාසවල දී පමණි. 2022 ජනවාරි මාසයේ දී, දර්ශකාංක 103.3ක් වාර්තා කළ උපයෝගිතා (විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම සහ ජලය එක්රැස් කිරීම, ප්‍රතිකාරක යෙදීම හා සැපයීම) උප අංශයේ නි.මි.ද., 2022 වසර තුළ සිදු කළ විදුලි සහ ජල ගාස්තු ඉහළ දැමීම් හේතුවෙන් අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඉන් අනතුරුව, දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 174.2 දක්වා ළඟා විය. ඒ අනුව, නිෂ්පාදක මිල දර්ශකයේ (2018 සිව්වන කාර්තුව=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන නිෂ්පාදක මිල උද්ධමනය 2022 අගෝස්තු මාසය දක්වා ඉහළ ගිය අතර, ඉන් අනතුරුව 2022 දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 89.0 දක්වා පහළ ගියේය.

4.12 රූප සටහන
නි.මි. දර්ශකයෙහි විචලන



මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

4.13 රූප සටහන
2022 වසරේ අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලන



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

4.3 වැටුප්

2022 වසරේ දී විධිමත් සහ අවිධිමත් පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප් ඉහළ ගිය නමුත්, වසර තුළ සිදු වූ මිල ඉහළ යෑම් හා අනුරූපව වැටුප් ඉහළ නොයෑම හේතුවෙන්, 2021 වසරට සාපේක්ෂව එම සියලුම අංශවල සේවා නියුක්තිකයන්ගේ මූර්ත වැටුප් පහළ ගියේය. අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප් වැඩි වීම කෙරෙහි, ජීවන වියදම සැලකිය යුතු ලෙස ඉහළ යෑමත් සමඟ සේවකයන් විසින් ඉහළ වැටුප් ඉල්ලීම ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, රාජ්‍ය අංශයේ සියලු සේවා නියුක්තිකයන් සඳහා රුපියල් 5,000ක විශේෂ දීමනාවක් ගෙවීම, එම අංශයේ නාමික වැටුප් ඉහළ යෑම කෙරෙහි බලපාන ලදී.

පෞද්ගලික අංශයේ වැටුප්

අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100) මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප් 2022 වසර තුළ සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ඒ අනුව, අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100), 2021 වසරේ වාර්තා කළ සියයට 9.2 ඉහළ යෑමට සාපේක්ෂව, 2022 වසරේ දී සියයට 24.5කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එම දර්ශකයේ උප ක්‍රියාකාරකම්, එනම් කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා ක්‍රියාකාරකම්වලට අදාළ දර්ශක 2021 වසරට සාපේක්ෂව 2022 වසර තුළ දී, පිළිවෙළින්, සියයට 27.6කින්, සියයට 22.4කින් සහ සියයට 26.4කින් ඉහළ ගියේය. නොවැම්බර් මාසය හැර 2022 වසරේ අනෙකුත් සියලුම මාසවල දී නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය මාසික ඉහළ යෑම් වාර්තා කළේය. මෙම ඉහළ යෑම් සඳහා වසර තුළ ජීවන වියදම සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් දෛනික වැටුප් ලබන්නන් විසින් ඉහළ වැටුප් සඳහා කළ ඉල්ලීම් ප්‍රධාන වශයෙන් හේතු විය. නොවැම්බර් මාසයේ දී මෙම දර්ශකයේ වාර්තා වූ පහළ යෑම සඳහා කර්මාන්ත (නිෂ්පාදන සහ ඉදිකිරීම්) සහ සේවා (තොග හා සිල්ලර වෙළඳාම; මෝටර් රථ සහ යතුරුපැදි අලුත්වැඩියා කිරීම; නවාතැන් සහ ආහාර සැපයීම් කටයුතු; සහ කොණ්ඩා මෝස්තර සැකසුම් සහ අනෙකුත් රූපලාවන්‍ය සත්කාර) සම්බන්ධ ක්‍රියාකාරකම්වල දක්නට ලැබුණු පහළ යෑම් ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, 2022 වසර තුළ දී ආර්ථිකය සැලකිය යුතු ලෙස සංකෝචනය වීම, පාරිභෝගිකයා විසින් සිය ක්‍රය ශක්තිය අඩු වීම පිළිබඳව සැලකිල්ලට ගනිමින් සිය මූලික අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය ලබා දීම සහ එල්.පී. ගෑස්, ඉන්ධන සහ විදුලිය වැනි උපයෝගිතාවල පැවති සැපයුම් හිඟතා හේතුවෙන් වැඩ කරන පැය ගණන අඩු වීම වැනි හේතු මත පැන නැඟුණු දුෂ්කරතා මධ්‍යයේ අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප් තීරණය කිරීම සඳහා සේව්‍යයා සහ සේවකයා අතර වූ අවබෝධය හා සාකච්ඡා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. මීට අමතරව, සිමෙන්ති නොමැතිකම හේතුවෙන් සිමෙන්ති ගඩොල් හා අනෙකුත් සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය මෙන්ම තිරිඟු පිටි නොමැති වීම හේතුවෙන් බේකරි/ආපනශාලා මෙහෙයුම් වැනි කටයුතු තාවකාලිකව අත්හිටවනු ලැබූ අතර, එමගින් අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ ජීවනෝපායන්ට අහිතකර බලපෑම් ඇති විය. සමස්තයක් ලෙස ගත් කළ, 2022 වසරේ පැවති ඉහළ උද්ධමනකාරී තත්ත්වය හේතුවෙන් අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ මූර්ත වැටුප් 2021 වසරට සාපේක්ෂව සියයට 15.7කින් පහළ ගියේය.

පඩි පාලක සභා මගින් පාලනය වන සේවා නියුක්තිකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය[4] (1978 දෙසැම්බර්=100) මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, 2022 වසරේ දී සුළු ඉහළ යෑමක් පෙන්නුම් කළේය. මෙම සේවා නියුක්තිකයන්ගේ අවම නාමික

4 පඩි පාලක සභා මගින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මගින් ගණනය කරනු ලබයි.

වැටුප් ප්‍රමාණ දර්ශකය, පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 9.8කින් ඉහළ ගිය අතර, මේ සඳහා 2021 වසර ආරම්භයේ දී පැවති පහළ සංඛ්‍යානමය පදනම් බලපෑම හේතු විය. තේ සහ රබර් වගා කිරීම හා නිෂ්පාදනය සඳහා අදාළ පඩි පාලක සභා හරහා, තේ සහ රබර් වතු කම්කරුවන්ගේ අවම දෛනික වැටුප, 2021 මාර්තු මස 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි රුපියල් 1,000 දක්වා වැඩි කෙරිණි. තවද, 2016 අංක 3 දරන ජාතික අවම සේවක වැටුප් පනතට සිදු කළ සංශෝධනය මගින් පෞද්ගලික අංශයේ අවම මාසික වැටුප 2021 අගෝස්තු මස 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි රුපියල් 10,000 සිට රුපියල් 12,500ක් සහ අවම දෛනික වැටුප රුපියල් 400 සිට රුපියල් 500ක් දක්වා ඉහළ දමන ලදී. මේ අතර, විධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 22.7කින් පහළ යෑම සඳහා, පැවති ඉහළ උද්ධමනකාරී තත්ත්වය ප්‍රධාන වශයෙන් හේතු විය.

රාජ්‍ය අංශයේ වැටුප්

ඉහළ යන ජීවන වියදමට සහනයක් ලෙස රාජ්‍ය අංශයේ සියලුම සේවා නියුක්තිකයන්ට මුදල් අමාත්‍යාංශය විසින් 2022 වසර ආරම්භයේ දී රුපියල් 5,000ක විශේෂ දීමනාවක් ලබා දෙන ලදී. විදුහල්පතිවරුන්ගේ සහ ගුරුවරුන්ගේ වැටුප් සම්බන්ධයෙන් පැවති විෂමතා ඉවත් කිරීමේ අරමුණින් ඔවුන්ගේ වැටුප් 2022 ජනවාරි මාසයේ දී ඉහළ නංවන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, වසර දෙකකට පසුව 2022 ජනවාරි මාසයේ දී ඉහළ ගිය ද, එතැන් සිට නොවෙනස්ව පැවතුණි. ඒ අනුව, රාජ්‍ය අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100), පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 16.1කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, පැවති උද්ධමන ප්‍රවණතා මධ්‍යයේ 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ මූර්ත වැටුප් සියයට 20.6ක පහළ යෑමක් පෙන්නුම් කළේය.

4

5

විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

5.1 සමස්ත නිරීක්ෂණ

ශ්‍රී ලංකාවේ විදේශීය අංශය 2022 වසරේ දී, දැඩි ගෙවුම් තුලන පීඩන සමඟ දළ නිල සංචිත අඩු වීම, විනිමය අනුපාතිකය විශාල වශයෙන් අවප්‍රමාණය වීම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා හිඟය යනාදී ගැටලු හමුවේ පෙර නොවූ විරූ අභියෝගවලට මුහුණ දුන්නේය. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා හිඟය හේතුවෙන් බනිජ තෙල්, ආහාර පිසීමට යොදා ගන්නා ගෑස්, ඖෂධ, පොහොර වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයන සඳහා බාධා ඇති වූ අතර එමඟින් සමාජ ආතතීන් ඉහළ ගොස් දේශපාලන අස්ථාවරත්වයක් ඇති විය. ආර්ථික ක්‍රියාකාරකම් හරහා අඛණ්ඩව එල්ල වන අහිතකර බලපෑම් වැළැක්වීම සඳහා මුදල් ප්‍රතිපත්තිය සැලකිය යුතු ලෙස දැඩි කිරීම, 2022 වසරේ අප්‍රේල් මස මැද දී අතුරු කාලසීමාවක් සඳහා තෝරාගත් විදේශීය ණය සේවාකරණය අත්හිටුවීම, ඇතැම් ආනයන සහ ගෙවීම් ක්‍රම තාවකාලිකව අත්හිටුවීම, සහ තෝරාගත් ආනයන සඳහා ආන්තික තැන්පතු අවශ්‍යතා පැනවීම සහ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ පියවර හඳුන්වාදීම ඇතුළුව සැලකිය යුතු ප්‍රතිපත්තිමය මැදිහත්වීමක් අවශ්‍ය විය. ශ්‍රී ලංකාව 2022 වසරේ අප්‍රේල් මාසයේ දී ආර්ථික ගැළපුම් වැඩසටහනක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ. අරමුදල) සමඟ සාකච්ඡා ආරම්භ කළ අතර, ඒ සඳහා නිලධාරී මට්ටමේ එකඟතාව 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී සහ ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය 2023 වසරේ මාර්තු මාසයේ දී ලබා ගන්නා ලදි. ජා.මූ. අරමුදලේ මූල්‍යන ලබා ගැනීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස රාජ්‍ය ණය තිරසාරභාවය සහතික කිරීම අරමුණු කරගත් රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීමට රජය පියවර ගන්නා ලදී. විදේශීය මූල්‍යන ලැබීම් පහළ මට්ටමක පැවතීම සහ අවාසිදායක ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් මධ්‍යයේ තාවකාලික අත්හිටුවීමට යටත් නොවූ ණය සේවාකරණ ගෙවීම් අඛණ්ඩව සිදු කරමින්, අත්‍යවශ්‍ය වෙළඳ භාණ්ඩ ආනයනය සඳහා පහසුකම් සැලසීමට දළ නිල සංචිත යොදා ගැනීමට රජයට සහ ශ්‍රී ලංකා මහ බැංකුවට සිදු විය. බහුපාර්ශ්වික සංවර්ධන හවුල්කරුවන්ගෙන් සහ මිත්‍ර රටවලින් ලැබුණු මානුෂීය ණය පහසුකම් සහ ප්‍රදාන අත්‍යවශ්‍ය භාණ්ඩ සපයා ගැනීම සඳහා පහසුකම් සැලසීමට උපකාරී විය. මේ අතර, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ඉහළ ගිය පීඩනයන් සැලකිල්ලට ගනිමින්, 2022 වසරේ මාර්තු මස මුල දී මුදල් මණ්ඩලය විසින් විනිමය අනුපාතිකයෙහි ක්‍රමානුකූල ගැළපීමකට අවසර දෙන ලදී. කෙසේ වෙතත්, පසුව විනිමය අනුපාතිකය නම්‍යශීලීව තීරණය වීමට ඉඩ හැරීමේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා හිඟය සහ අහිතකර වෙළඳපොළ අපේක්ෂාවන් හේතුවෙන් විනිමය අනුපාතිකය ඉහළ අවප්‍රමාණයකට ලක් විය. ශ්‍රී ලංකා මහ බැංකුව, 2022 වසරේ මැයි මස මැද දී විනිමය අනුපාතිකයෙහි මැදි අගයක් සහ විචලන සීමා ප්‍රකාශයට පත් කිරීම මගින්, එතැන් විනිමය අනුපාතිකය පිළිබඳ වෙළඳපොළ මාර්ගෝපදේශ සැපයීම ආරම්භ කරන ලද අතර එය එක් දිනයක් තුළ විනිමය අනුපාතිකයෙහි සිදුවන සැලකිය යුතු ඉහළ විචලනයන් ස්ථාවර කිරීමට උපකාරී විය.

විදේශීය අංශයේ පීඩනයන් කළමනාකරණය කිරීමට අවශ්‍ය වූ සීමාකාරී වෙළඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, විනිමය අනුපාතිකය සීඝ්‍ර අවප්‍රමාණය වීම සහ දැඩි මුදල් සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් හමුවේ ආනයන ව්‍යදම් කැපී පෙනෙන ලෙස අඩු වීමත් සමඟ වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් විදේශීය ජංගම ගිණුමේ හිඟය 2022

වසරේ දී සැලකිය යුතු ලෙස පහළ ගියේය. ප්‍රධාන වශයෙන් ඇඟලුම් ඇතුළු කාර්මික අපනයන ඉහළ යෑම හේතුවෙන් වෙළඳ භාණ්ඩ අපනයන ඉහළ ගියේය. සංචාරක ඉපැයීම් වැඩිවීම හේතුවෙන් සේවා වෙළඳාම් ගිණුමේ අතිරික්තය යම් ප්‍රමාණයකින් ඉහළ ගිය අතර, සේවා අංශයේ අනෙකුත් උපකාණ්ඩ බොහොමයක් වෙත වූ ලැබීම් වසර තුළ කැපී පෙනෙන අඩු වීමක් වාර්තා කළේය. තවද, වසර තුළ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය 2021 වසරට සාපේක්ෂව සුළු පහළ යෑමක් වාර්තා කළ අතර, 2022 වසරේ දෙවන භාගයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. වසර තුළ දී මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් පහළ මට්ටමක පැවතුණි.

2022 වසරේ දී ශ්‍රී ලංකා රුපියල ඉතිහාසයේ වැඩිම අවප්‍රමාණය වීමක් වාර්තා කිරීමෙන් පසුව, 2023 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී යම් අතිප්‍රමාණය වීමක් පෙන්නුම් කළ අතර, එමඟින් විනිමය අනුපාතිකය විශාල වශයෙන් අවප්‍රමාණය වීම යම් ප්‍රමාණයකට නිවැරදි විය. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළට අදාළ අවසන් එකඟතාවයට පැමිණීම සමඟ වෙළඳපොළ අපේක්ෂාවන් වැඩිදියුණු වීම, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයන් වැඩිදියුණු වීම සහ බලපත්‍රලාභී බැංකු විසින් මහ බැංකුව වෙත විදේශ විනිමය අනිවාර්යයෙන් විකිණීමේ අවශ්‍යතාවය මහ බැංකුව විසින් ලිහිල් කිරීම හා පසුව ඉවත් කිරීම මෙම අතිප්‍රමාණය වීම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. අපේක්ෂිත සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ ගෙවුම් තුලන පීඩනය ලිහිල් වීමත් සමඟ භාණ්ඩ හා සේවා වෙළඳාම සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඇතුළු විදේශීය අංශයේ ක්‍රියාකාරකම් ඉදිරි කාලය තුළ යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙය ඉදිරි කාලය තුළ විදේශීය ජංගම ගිණුමේ ශේෂය තිරසාර ලෙස වැඩිදියුණු කිරීමට දායක වනු ඇති අතර එමඟින් දළ නිල සංචිත ගොඩනැගීමට පහසුකම් සැලසේ. දළ නිල සංචිත ක්‍රමයෙන් ගොඩනැගීම සහ විනිමය අනුපාතිකය ස්ථාවර වීම, සංවර්ධන හවුල්කරුවන්ගෙන් අමතර මූල්‍ය පහසුකම් ලැබීම, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමින් සහය ලබන වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහ නුදුරු කාලීනව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීම තුළින් ආයෝජකයන්ගේ විශ්වාසය සහ රටේ ණය ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු වීම මඟින් ඉදිරි කාලය තුළ විදේශීය අංශයේ ස්ථාවරත්වය තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

5.1 සංඛ්‍යා සටහන

ගෙවුම් තුලනයෙහි විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම

ශීර්ෂය	එ.ජ. ඩොලර් මිලියන		රුපියල් මිලියන	
	2021 (අ)	2022 (ආ)	2021 (අ)	2022 (ආ)
ජංගම ගිණුම (ශුද්ධ)	**-3,284**	**-1,453**	**-656,314**	**-316,154**
වෙළඳ ගිණුම	**-8,139**	**-5,185**	**-1,617,274**	**-1,502,420**
අපනයන	12,499	13,106	2,486,943	4,234,913
ආනයන	20,637	18,291	4,104,218	5,737,333
සේවා (ශුද්ධ)	**1,586**	**2,110**	**316,424**	**644,934**
ලැබීම්	2,475	3,062	493,320	952,999
ගෙවීම්	889	953	176,896	308,066
ප්‍රාථමික ආදායම් (ශුද්ධ)	**-1,959**	**-1,874**	**-390,158**	**-618,071**
ලැබීම්	116	249	22,965	84,209
ගෙවීම්	2,075	2,124	413,122	702,280
ද්විතියික ආදායම් (ශුද්ධ)	**5,228**	**3,496**	**1,034,694**	**1,159,404**
ද්විතියික ආදායම්: ලැබීම්	5,498	3,793	1,088,388	1,253,677
සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ	5,491	3,789	1,087,188	1,252,504
රජයේ සංක්‍රාම	6	3	1,200	1,173
ද්විතියික ආදායම්: ගෙවීම්	270	296	53,694	94,272
ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)	**25**	**19**	**5,009**	**6,123**
ප්‍රාග්ධන ගිණුම: ලැබීම්	50	38	9,850	11,909
ප්‍රාග්ධන ගිණුම: ගෙවීම්	24	19	4,841	5,786
ජංගම සහ ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)	**-3,259**	**-1,433**	**-651,305**	**-310,030**
මූල්‍ය ගිණුම (ශුද්ධ)	**-4,211**	**-1,946**	**-844,973**	**-538,153**
සෘජු ආයෝජන: වත්කම්	**17**	**15**	**3,468**	**4,892**
සෘජු ආයෝජන: වගකීම්	**592**	**898**	**117,894**	**309,142**
විවිධ ආයෝජන: වත්කම්	-	-	-	-
විවිධ ආයෝජන: වගකීම්	**-1,547**	**355**	**-305,900**	**168,647**
හිමිකම්	-232	137	-46,061	30,342
ණය සුරැකුම්පත්	-1,315	218	-259,838	138,305
මූල්‍ය ව්‍යුත්පන්න	-	-	-	-
අනෙකුත් ආයෝජන: වත්කම්	**387**	**1,302**	**77,454**	**390,162**
මුදල් සහ තැන්පතු	306	514	62,761	152,168
වෙළඳ ණය සහ අත්තිකාරම්	257	282	51,199	89,293
අනෙකුත් ලැබිය යුතු ගිණුම්	-176	506	-36,506	148,700
අනෙකුත් ආයෝජන: වගකීම්	**3,053**	**776**	**615,978**	**183,589**
මුදල් සහ තැන්පතු	4,016	272	810,195	-9,248
ණය	-1,503	-92	-299,296	51,432
මහ බැංකුව	-57	-140	-11,377	-48,316
තැන්පතු භාරගන්නා ආයතන	-2,152	-1,645	-429,506	-495,847
රජය	873	1,679	174,382	580,605
අනෙකුත් අංශ	-167	13	-32,795	14,989
වෙළඳ ණය සහ අත්තිකාරම්	-426	-895	-87,405	-279,812
අනෙකුත් ගෙවිය යුතු ගිණුම්	180	1,492	34,713	421,218
විශේෂ ගැනුම් හිමිකම්	787	-	157,771	-
සංචිත වත්කම්	**-2,517**	**-1,234**	**-497,923**	**-271,828**
මූල්‍ය රත්න්	-212	-152	-42,734	-38,820
විශේෂ ගැනුම් හිමිකම්	123	-118	24,635	-41,965
ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම	-	-58	-	-20,980
අනෙකුත් සංචිත වත්කම්	-2,428	-906	-479,823	-170,064
මුදල් සහ තැන්පතු	1,536	-895	300,122	-166,305
සුරැකුම්පත්	-3,967	-11	-780,435	-3,691
වෙනත් හිමිකම්	3	...	490	-69
ශුද්ධ වැරදීම් හා අත්හැරීම්	**-952**	**-513**	**-193,669**	**-228,122**
සමස්ත ශේෂය (ඇ)	**-3,967**	**-2,806**	**-745,312**	**-1,087,831**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස				
වෙළඳ ශේෂය	-9.2	-6.7		
භාණ්ඩ හා සේවා (ශුද්ධ)	-7.4	-4.0		
ජංගම ගිණුමේ ශේෂය	-3.7	-1.9		
ජංගම හා ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)	-3.7	-1.9		

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සමස්ත ශේෂය ගණනය කිරීම සඳහා 5.12 සංඛ්‍යා සටහන පරිශීලනය කරන්න.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

5.1 රූප සටහන
විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

විදේශීය අංශය 2022 වසරේ දී පෙර නොවූ අභියෝගවලට මුහුණ දුන්නේය...



2022 වසරේ දී අත්‍යවශ්‍ය ආනයන සඳහා තිබූ ඉල්ලුම සපුරාලීම සඳහා මහ බැංකුව විසින් වෙළඳපොළට විදේශ විනිමය සපයන ලදී...



විනිමය අනුපාතිකය 2022 වසරේ මාර්තු-මැයි කාලසීමාව තුළ ඉහළම අවප්‍රමාණය වීමකින් පසුව මාර්ගෝපදේශ පරාසය තුළ ස්ථාවර විය...



දළ නිල සංචිත 2022 වසරේ අප්‍රේල් මාසය වන විට පහළ ගිය අතර එතැන් සිට 2023 වසරේ මාර්තු මාසය දක්වා ක්‍රමානුකූලව ගොඩනැගීම ආරම්භ විය...

ජංගම ගිණුමේ හිඟය, වෙළඳ ගිණුමේ හිඟය අඩු වීම සහ සංචාරක ඉපැයීම් තුලින් වූ දායකත්වය හේතුවෙන් 2022 වසරේ දී සැලකිය යුතු ලෙස අඩු විය...

එ.ජ.ඩො. බිලියන -1.5 2022 | ද.දේ.නි.යෙහි % ලෙස -1.9
එ.ජ.ඩො. බිලියන -3.3 2021 | ද.දේ.නි.යෙහි % ලෙස -3.7



මූල්‍ය ගිණුමේ වගකීම්හි ශුද්ධ වෙනස්වීම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය...



විදේශීය ණය අඩුවීමට හේතු වූයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ වටිනාකම සැලකිය යුතු ලෙස අඩු වීමයි...

නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, වසර තුළ දී ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ නාමික ද.දේ.නි.ය එ.ජ. ඩොලරයෙන් වාර්තා කිරීමේ දී සැලකිය යුතු ලෙස අඩු වීමයි.



5.2 රූප සටහන
ගෙවුම් තුලනය



මූලයः ශ්‍රී ලංකා මහ බැංකුව

5.2 ජංගම ගිණුමේ ශේෂය

ද්විතීයික ආදායම් ගිණුමෙහි අතිරික්තය පහත වැටීම මධ්‍යයේ වුව ද, වෙළඳ ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස අඩු වීම, සේවා වෙළඳාම යථා තත්ත්වයට පත් වීම සහ ප්‍රාථමික ආදායම් ගිණුමෙහි හිඟය සුළු වශයෙන් අඩු වීමත් සමඟ, 2021 වසරට සාපේක්ෂව විදේශීය ජංගම ගිණුමේ හිඟය 2022 වසරේ දී අඩු විය. ප්‍රධාන වශයෙන්, ආර්ථික කටයුතු මන්දගාමී වීම සහ දැඩි ගෙවුම් තුලන පීඩන හමුවේ ආනයන සීමා කිරීමට ගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල බලපෑම හේතුවෙන් වෙළඳ භාණ්ඩ ආනයන වියදම පහළ යෑම සහ වෙළඳ භාණ්ඩ අපනයන ඉපැයීම් ඉහළ යෑමත් සමඟ වෙළඳ හිඟය 2022 වසරේ දී කැපී පෙනෙන ලෙස පහළ ගියේය. ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වීම අපනයන ඉපැයීම් ඉහළ යෑමට දායක වූ අතර එය මූලික වශයෙන් ඇඟලුම්, යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ සහ මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ වැනි කාණ්ඩවල අපනයන වර්ධනය වීමෙන් පිළිබිඹු විය. මේ අතර, පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයනවල ඇති වූ ප්‍රමාණාත්මක අඩු වීම මගින් වෙළඳ භාණ්ඩ ආනයන සැලකිය යුතු අඩු වීමක් වාර්තා කළ අතර, අන්තර් භාණ්ඩ ආනයන පෙර වසරට සාපේක්ෂව සමාන මට්ටම්වල පැවතුණි. ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම සහ විනිමය අනුපාතිකය කැපී පෙනෙන ලෙස අවප්‍රමාණය වීම මගින් ආනයන පිරිවැය ඉහළ යෑමත් සමඟ ආනයන ඉල්ලුම පහළ යෑම මෙන්ම, පෙර නොවූ විරූ ලෙස බැංකු පද්ධතිය තුළ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟයක් ඇති වීම හමුවේ අත්‍යවශ්‍ය ආනයන සඳහා ප්‍රමුඛතාව ලබා ගැනීමට රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙන

5.2 සංඛ්‍යා සටහන
ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

ශීර්ෂය	2021 (අ)			2022 (ආ)		
	බැර	හර	ශුද්ධ	බැර	හර	ශුද්ධ
භාණ්ඩ හා සේවා	**14,974**	**21,526**	**-6,552**	**16,169**	**19,244**	**-3,075**
භාණ්ඩ	**12,499**	**20,637**	**-8,139**	**13,106**	**18,291**	**-5,185**
වෙළඳ භාණ්ඩ	12,499	20,636	-8,138	13,106	18,289	-5,183
මූල්‍ය නොවන රත්‍රන්	-	1	-1	-	2	-2
සේවා	**2,475**	**889**	**1,586**	**3,062**	**953**	**2,110**
ප්‍රවාහන	608	256	352	676	333	343
මුහුදු ප්‍රවාහන	450	150	300	410	137	272
නැව් කුලී	450	150	300	410	137	272
ගුවන් ප්‍රවාහන	158	106	52	266	195	71
මගී ගාස්තු	108	89	19	221	180	41
ගුවන් කුලී	50	17	33	46	15	30
සංචාරක (ඇ)	507	239	268	1,136	244	893
ඉදිකිරීම්	10	11	-1	9	11	-2
රක්ෂණ සහ විශ්‍රාම වැටුප්	20	37	-17	19	36	-18
මූල්‍ය සේවා	95	102	-7	92	96	-5
විදුලි සන්දේශ සහ පරිගණක සේවා	1,201	171	1,030	1,097	161	936
විදුලි සන්දේශ	32	31	2	31	28	3
පරිගණක සේවා	1,168	140	1,028	1,066	133	933
වෙනත් ව්‍යාපාරික සේවා	16	17	-1	15	16	-1
රජයේ භාණ්ඩ හා සේවා වියදම් (අන් තැනක සඳහන් නොවන)	19	57	-38	18	56	-38
ප්‍රාථමික ආදායම්	**116**	**2,075**	**-1,959**	**249**	**2,124**	**-1,874**
සේවක වැටුප්	30	74	-43	30	69	-39
ආයෝජන ආදායම්	86	2,002	-1,916	220	2,055	-1,836
සෘජු ආයෝජන	16	567	-551	15	532	-517
ලාභාංශ	12	278	-266	12	418	-407
ප්‍රති ආයෝජිත ඉපැයුම්	4	289	-285	3	114	-111
විවිධ ආයෝජන	-	830	-830	-	784	-784
හිමිකම්	-	25	-25	-	29	-29
පොලී ආදායම්	-	805	-805	-	755	-755
කෙටි කාලීන	-	...	...	-	1	-1
දිගු කාලීන	-	805	-805	-	754	-754
අනෙකුත් ආයෝජන	43	605	-562	200	738	-538
සංචිත වත්කම්	27	-	27	5	-	5
ද්විතීයික ආදායම්	**5,498**	**270**	**5,228**	**3,793**	**296**	**3,496**
රජය	6	-	6	3	-	3
සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ	5,491	270	5,221	3,789	296	3,493
ජංගම ගිණුම	**20,587**	**23,871**	**-3,284**	**20,211**	**21,664**	**-1,453**
ප්‍රාග්ධන ගිණුම	**50**	**24**	**25**	**38**	**19**	**19**
ප්‍රාග්ධන සංක්‍රාම	50	24	25	38	19	19
රජය	11	-	11	6	-	6
සංස්ථා සහ කුටුම්බ	38	24	14	32	19	13
ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුම	**20,637**	**23,896**	**-3,259**	**20,249**	**21,682**	**-1,433**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අනේවාසිකයන්ට සැපයූ මගී සේවාවන්, ප්‍රවාහන සේවාවන්හි ඇතුළත්ය.

මූලයः ශ්‍රී ලංකා මහ බැංකුව

ලද ක්‍රියාමාර්ග ගණනාවක් හේතුවෙන් ආනයන පහළ ගියේය. එසේම, දේශීය සැපයුම් අංශ වෙත තිබූ බාධා පහව යාම සහ ගෝලීය වසංගතය ආශ්‍රිත ගැටලු ලිහිල් වීම හමුවේ ගෝලීය සංචාරක කටයුතු සැලකිය යුතු ලෙස ක්‍රමයෙන් ඉහළ යෑමෙන් ප්‍රධාන වශයෙන් සංචාරක ක්ෂේත්‍රයෙහි ඉපැයුම් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන්, සේවා ගිණුමේ අතිරික්තය ඉහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, පෙර වසරට සාපේක්ෂව, ගුවන් සහ මුහුදු භාණ්ඩ ප්‍රවාහනය, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ අංශයට වූ ලැබීම් ඇතුළු සේවා ගිණුමේ අනෙකුත් අංශවල ක්‍රියාකාරිත්වය සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතුණි. ප්‍රාථමික ආදායම් ගිණුමේ ගෙවීම් සුළු වශයෙන් ඉහළ ගියද, ඉහළ ගිය ජාත්‍යන්තර පොලී අනුපාතිකවල සහ බැංකුවල විදේශීය වත්කම් තත්ත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස බැංකු අංශය වෙත වූ පොලී ආදායම් ඉහළ යෑම හේතුවෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය පෙර වසරට සාපේක්ෂව සුළු වශයෙන් අඩු විය. මේ අතර, ද්විතීයික ආදායම් ගිණුමට ප්‍රධාන දායකත්වයක් දැක්වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2022 වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී ශ්‍රී ලාංකීය ශ්‍රමිකයන් සැලකිය යුතු ලෙස විදේශ රැකියා සඳහා යොමු වීම තුළින් ඉහළ ගිය ප්‍රේෂණ මගින් 2022 වසරේ දෙවන භාගයේ දී යළි ඉහළ ගියද, 2022 වසරේ දී 2021 වසරට සාපේක්ෂව අඩු මට්ටමක් වාර්තා කළේය. සමස්තයක් ලෙස, ජංගම ගිණුම් හිඟය 2021 වසරේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 3,284 (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.7ක්) සාපේක්ෂව, 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,453ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.9ක්) දක්වා පහළ ගියේය.

5.2.1 වෙළඳ ගිණුම

වෙළඳ ශේෂය

2010 වසරේ සිට මේ දක්වා වාර්තා වූ අඩුම වෙළඳ ගිණුමේ හිඟය 2022 වසරේ දී වාර්තා වූ අතර, එය 2022 වසර සඳහා ජංගම ගිණුමේ හිඟය අඩු වීමට ප්‍රධාන වශයෙන් දායක විය. වෙළඳ ශේෂයෙහි 2021 වසරේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 8,139ක හිඟයක සිට 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 5,185ක හිඟයක් දක්වා වූ මෙම අඩු වීම සඳහා වෙළඳ භාණ්ඩ ආනයන වියදම් සැලකිය යුතු ලෙස පහළ යෑම සහ වෙළඳ භාණ්ඩ අපනයන ආදායම කැපී පෙනෙන ලෙස වර්ධනය වීම යන සාධක ද්විත්වය හේතු විය. 2022 වසරේ දී ආනයන වියදම් පහළ යෑමට බොහෝ සාධක දායක වූ අතර, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ පැවති සැලකිය යුතු විදේශ

5.3 රූප සටහන
අපනයන, ආනයන සහ වෙළඳ හිඟය
(එ.ජ. ඩොලර් බිලියන)



මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

විනිමය ද්‍රවශීලතා ගැටලු; එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල විශාල ලෙස අවප්‍රමාණය වීම නිසා ඇති වූ බලපෑම; ඉහළ පොලී අනුපාත පිළිබිඹු කරමින් පෞද්ගලික අංශය වෙත ණය ලබා දීම විශාල වශයෙන් පහළ යෑම සහ උද්ධමනය වේගයෙන් ඉහළ යෑම හේතුවෙන් මූර්ත ආදායම පිරිහීම මධ්‍යයේ ආර්ථික ක්‍රියාකාරකම් සහ සමස්ත ඉල්ලුම් තත්ත්වයන් පහළ යෑම සහ ගෙවුම් තුලන පීඩනයන් හේතුවෙන් ඇතැම් ආනයනවලට ප්‍රමුඛත්වය ලබාදීමට ගත් පරිපාලනමය ක්‍රියාමාර්ග එයට ඇතුළත් විය. අපනයන ආදායමේ කැපී පෙනෙන වර්ධනය සඳහා අපනයනකරුවන්ගේ රුපියල් ආදායම ඉහළ නංවමින් විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම; අපනයන කර්මාන්ත සඳහා අවශ්‍ය යෙදවුම් ආනයනයට ප්‍රමුඛත්වය ලබා දීම; ගෝලීය වෙළඳපොළෙහි ඉහළ වෙළඳ භාණ්ඩ මිල ගණන් පැවතීම; වසරේ පළමු භාගය තුළ ඇඟලුම් වැනි ප්‍රධාන අපනයන භාණ්ඩ සඳහා පැවති ඉහළ ඉල්ලුම සහ ඇතැම් අපනයන ක්‍රියාපටිපාටි විධිමත් කිරීම සඳහා ගත් පරිපාලනමය ක්‍රියාමාර්ග ඒ සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. දළ දේශීය නිෂ්පාදිතයෙහි (ද.දේ.නි.යෙහි) ප්‍රතිශතයක් ලෙස වෙළඳ හිඟය, 2021 වසරේ දී පැවති සියයට 9.2ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 6.7ක් දක්වා පහළ ගියේය.

අපනයන හා ආනයන ක්‍රියාකාරිත්වය, වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දිශාව

අපනයන ක්‍රියාකාරිත්වය

2022 වසරේ දී වෙළඳ භාණ්ඩ අපනයන කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් බිලියන 13ක මට්ටම ඉක්මවා ගිය අතර, ගෝලීය සහ

5

දේශීය වශයෙන් වූ අභියෝග ඉහළ යෑම මධ්‍යයේ වුවද, ප්‍රධාන වශයෙන් හිතකර විනිමය අනුපාතික, ආනයනික යෙදවුම් සැපයීමේ දී අපනයන කර්මාන්ත සඳහා ප්‍රමුඛත්වය ලබා දීම සහ ගෝලීය භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම යනාදී සාධක ඒ සඳහා හේතු විය. ඒ අනුව, වෙළඳ භාණ්ඩ අපනයන ආදායම, 2021 වසරේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 12,499ට සාපේක්ෂව සියයට 4.9ක වර්ධනයක් වාර්තා කරමින් 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 13,106ක් දක්වා ළඟා විය. කාර්මික සහ බනිජ අපනයන යන දෙඅංශයෙහිම ආදායම ඉහළ යෑම මෙම වර්ධනයට හේතු වූ අතර, කෘෂිකාර්මික අපනයන ආදායම පහළ ගියේය. කාර්මික අපනයනවල මෙම ඉහළ යෑම සඳහා විනිමය අනුපාතිකය කැපී පෙනෙන ලෙස අවප්‍රමාණය වීම මෙන්ම විශේෂයෙන්ම, 2022 වසර තුළ ඇඟලුම් සඳහා ගෝලීය වෙළඳපොළ ඉල්ලුම ඉහළ යෑම, මැණික් අපනයනයට අදාළ ක්‍රියාපටිපාටි විධිමත් කිරීමට සහ ශක්තිමත් කිරීමට දරන ලද ප්‍රයත්නයෙහි සහාය හේතුවෙන් මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ අපනයන සැලකිය යුතු ලෙස වර්ධනය වීම සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන වර්ධනය වීම ප්‍රධාන වශයෙන් දායක විය. ගෝලීය ඉල්ලුම මන්දගාමී වීම මධ්‍යයේ, විශේෂයෙන්ම 2022 වසරේ සැප්තැම්බර් මාසයේ සිට ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළඳපොළ ක්‍රියාකාරකම් පහළ යෑම හේතුවෙන් ප්‍රධාන අපනයන අංශ තුළ අපනයන ඉපැයීම්වල පහළ යෑමක් නිරීක්ෂණය විය. අපනයන දර්ශකවල විචලනයන් මගින් පෙන්නුම් කෙරෙන පරිදි, සමස්ත අපනයන ආදායම ඉහළ යෑමට අපනයන පරිමා සහ අපනයන මිල යන දෙඅංශයෙහිම වැඩි වීම හේතු විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, අපනයන ඉපැයීම් 2021 වසරේ දී පැවති සියයට 14.1ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 17.0ක් දක්වා වර්ධනය විය.

සමස්ත වෙළඳ භාණ්ඩ අපනයන සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ කාර්මික භාණ්ඩ අපනයන ආදායම සමස්ත වෙළඳ භාණ්ඩ අපනයනයෙන් සියයට 80කට පමණ දායක වෙමින්, 2021 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 9,702ට සාපේක්ෂව 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 10,465ක් දක්වා සියයට 7.9කින් වර්ධනය විය. රෙදිපිළි සහ ඇඟලුම් අපනයන ආදායම, 2022 වසරේ අවසාන කාලපරිච්ඡේදය තුළ පහළ ගිය ද, සමස්ත අපනයන ආදායමෙන් සියයට 45කට වඩා වැඩි ප්‍රමාණයකට දායක වෙමින් ප්‍රමුඛ අපනයන ආදායම් මාර්ගය වශයෙන් අඛණ්ඩව පැවතුණි. මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ; සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ (ප්‍රධාන වශයෙන්, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ කොටස්) අපනයන ආදායම ද 2022 වසරේ දී කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. ඉහළ බොරතෙල් මිල ගණන්වල බලපෑම පිළිබිඹු කරමින් බනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගිය අතර, නැව් සහ ගුවන් යානා සඳහා සපයන ලද ඉන්ධන පරිමාව සුළු වශයෙන් පහළ යෑමක් වාර්තා කළේය. 2022 වසරේ දී කොවිඩ්-19 වසංගතය ආශ්‍රිත අවදානම් අඩු වීම මධ්‍යයේ ගෘහස්ථ රබර් අත්වැසුම් සඳහා ඇති ඉල්ලුම පහළ යෑම හේතුවෙන් එ.ජ. ඩොලර් බිලියනයක් වූ 2021 වසරේ මට්ටමටත් වඩා අඩු අගයක් වාර්තා කරමින් රබර් නිෂ්පාදිත අපනයන ආදායම පහළ ගියේය. 2022 වසරේ දී ආහාර, පාන වර්ග සහ දුම්කොළ (ප්‍රධාන වශයෙන්, සත්ත්ව හෝ එළවළු මේද සහ තෙල් වර්ග) අපනයන ද පහළ යෑමක් වාර්තා කළේය.

2022 වසරේ දී ප්‍රධාන වශයෙන් ප්‍රමාණවත් තරම් පොහොර නොලැබීමේ පසු බලපෑමෙහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත කෘෂිකාර්මික අපනයන ආදායම, 2021 වසරට සාපේක්ෂව සියයට 5.9ක පහළ යෑමක් වාර්තා කළේය. තේ අපනයන මිල ගණන්වල සාමාන්‍යය ඉහළ ගිය ද, තේ අපනයන පරිමාව විශාල වශයෙන් පහළ යෑම හේතුවෙන් තේ අපනයන ආදායම පහළ ගියේය. අපනයන පරිමා (ප්‍රධාන වශයෙන්, ගම්මිරිස් හා කරාබුනැටි) සහ අපනයන මිල ගණන් (කුරුඳු) අඩු වීම හේතුවෙන් කුළුබඩු වලින් අඩු අපනයන ආදායමක් වාර්තා විය. පොල් ආශ්‍රිත නිෂ්පාදිතවලින් ලැබුණු අපනයන ආදායම පහළ යෑම සඳහා පොල් මද අපනයන මිල ගණන් පහළ යෑම හේතු විය.

5.4 රූප සටහන
අපනයන සංයුතිය



කෙසේ වෙතත්, ඇතැම් සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන පරිමා ඉහළ යෑමේ බලපෑම පිළිබිඹු කරමින්, 2022 වසර තුළ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම කැපී පෙනෙන ඉහළ යෑමක් වාර්තා කළේය. මෙම වර්ධනය සඳහා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ඉන්දියාව වෙත අපනයනය කරන පුවක් මෙන්ම තල බීජ අපනයන ඉහළ යෑම හේතු විය.

බනිජ අපනයන, පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී එ.ඡ. ඩොලර් මිලියන 50ක් දක්වා සියයට 12.3කින් ඉහළ ගියේය. මෙම වර්ධනය සඳහා ටයිටේනියම් ලෝපස් අපනයන ආදායම ප්‍රධාන වශයෙන් දායක වූ අතර, බනිජ අපනයන යටතේ වන අනෙකුත් සියලුම උප අංශවල අපනයන 2022 වසර තුළ පහළ ගියේය. 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ බනිජ අපනයන සමස්ත අපනයන ආදායමෙන් සියයට 0.4ක කුඩා ප්‍රතිශතයක් විය.

ආනයන ක්‍රියාකාරිත්වය

ගෝලීය තෙල් මිල ඉහළ මට්ටමක පැවතිය ද, සැලකිය යුතු ගෙවුම් තුලන පීඩන මධ්‍යයේ විදේශ විනිමය හිඟ වීම, ඉල්ලුම් තත්ත්වයන් පහළ යෑම, විනිමය අනුපාතිකය විශාල වශයෙන් අවප්‍රමාණය වීම, ඇතැම් ආනයනවලට ප්‍රමුඛතාවය ලබා දීමේ පරිපාලනමය ක්‍රියාමාර්ග ආදියෙහි බලපෑම පිළිබිඹු කරමින්, වෙළඳ භාණ්ඩ ආනයන වියදම කැපී පෙනෙන ලෙස පහළ ගියේය. ආයෝජන භාණ්ඩ සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන සැලකිය යුතු ලෙස පහළ යෑම හේතුවෙන් ආනයන වියදම 2021 වසරේ පැවති එ.ඡ. ඩොලර් මිලියන 20,637ක සිට 2022 වසරේ දී එ.ඡ. ඩොලර් මිලියන 18,291ක් දක්වා සියයට 11.4කින් අඩු විය. සමස්තයක් ලෙස ආනයන වියදම් පහළ යෑම මගින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ පැවති ද්‍රවශීලතා ගැටලු, ආර්ථික ක්‍රියාකාරකම් පහත වැටීම්,

5.3 සංඛ්‍යා සටහන

අපනයන සංයුතිය

කාණ්ඩය	2021		2022 (අ)		වටිනාකමේ වෙනස එ.ඡ. ඩොලර් මිලියන	වාර්ෂික වෙනස්වීම %	වෙනස් වීමට වූ දායකත්වය %
	වටිනාකම එ.ඡ. ඩොලර් මිලියන	දායකත්වය %	වටිනාකම එ.ඡ. ඩොලර් මිලියන	දායකත්වය %			
කෘෂිකාර්මික අපනයන	**2,729.5**	**21.8**	**2,568.0**	**19.6**	**-161.5**	**-5.9**	**-26.6**
තේ	1,324.4	10.6	1,258.8	9.6	-65.6	-5.0	-10.8
පොල්	425.2	3.4	400.3	3.1	-25.0	-5.9	-4.1
කුළුබඩු	454.8	3.6	368.7	2.8	-86.0	-18.9	-14.2
මුහුදු ආහාර	274.1	2.2	269.0	2.1	-5.1	-1.8	-0.8
සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත	148.8	1.2	178.8	1.4	30.0	20.2	4.9
රබර්	42.2	0.3	41.4	0.3	-0.8	-1.8	-0.1
එළවළු	28.5	0.2	26.7	0.2	-1.9	-6.6	-0.3
සකස් නොකළ දුම්කොළ	31.6	0.3	24.4	0.2	-7.2	-22.8	-1.2
කාර්මික අපනයන	**9,702.0**	**77.6**	**10,465.3**	**79.8**	**763.3**	**7.9**	**125.6**
රෙදිපිළි හා ඇඟලුම්	5,435.1	43.5	5,952.0	45.4	516.9	9.5	85.0
රබර් නිෂ්පාදිත	1,050.4	8.4	977.0	7.5	-73.4	-7.0	-12.1
යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ	500.9	4.0	580.9	4.4	80.1	16.0	13.2
බනිජ තෙල් නිෂ්පාදිත	506.4	4.1	568.0	4.3	61.6	12.2	10.1
ආහාර, පාන වර්ග හා දුම්කොළ	586.9	4.7	519.5	4.0	-67.4	-11.5	-11.1
මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ	276.7	2.2	450.6	3.4	173.9	62.8	28.6
රසායනික නිෂ්පාදිත	223.2	1.8	223.5	1.7	0.3	0.1	0.1
මූල ලෝහ හා උපාංග	156.4	1.3	176.7	1.3	20.3	13.0	3.3
සත්ත්ව ආහාර	149.4	1.2	170.5	1.3	21.1	14.1	3.5
දැව හා කඩදාසි නිෂ්පාදිත	129.9	1.0	136.9	1.0	7.0	5.4	1.2
අනෙකුත් කාර්මික අපනයන	686.8	5.5	709.6	5.4	22.8	3.3	3.8
බනිජ අපනයන	**44.5**	**0.4**	**50.0**	**0.4**	**5.5**	**12.3**	**0.9**
වර්ග නොකළ අපනයන	**22.6**	**0.2**	**23.2**	**0.2**	**0.6**	**2.6**	**0.1**
මුළු අපනයන (ආ) (ඇ)	**12,498.6**	**100.0**	**13,106.4**	**100.0**	**607.9**	**4.9**	**100.0**

(අ) තාවකාලික
(ආ) ප්‍රතිඅපනයන ඇතුළත් නොවේ.
(ඇ) දත්ත වාර්තා කිරීමේ දී සිදුවන කාල පමාවන් සහ වෙනත් සාධක සඳහා ගැළපීම් කර ඇත.

මූලයන්: ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් බනිජ තෙල් නිෂ්පාදිත අපනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

විනිමය අනුපාතිකය තියුණු ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් ආනයනික භාණ්ඩවල දේශීය මිල ගණන් ඉහළ යෑම, රජය (ඇතැම් ආනයන තාවකාලිකව අත්හිටුවීම, විවිධ ගෙවීම් ක්‍රම යටතේ ඇතැම් ආනයන අත්හිටුවීම, ආනයන බලපත්‍ර අවශ්‍යතා පැනවීම, ඇතැම් භාණ්ඩ සඳහා ආනයන බදු වැඩි කිරීම ඇතුළුව) සහ මහ බැංකුව විසින් (ඇතැම් භාණ්ඩ මත ආන්තික තැන්පතු අවශ්‍යතා පවත්වාගෙන යෑම සහ දැඩි මුදල් හා ණය කොන්දේසි පවත්වාගෙන යෑම ඇතුළුව) ක්‍රියාත්මක කරන ලද පරිපාලනමය ක්‍රියාමාර්ග පිළිබිඹු කරයි. කෙසේ වෙතත්, 2022 වසරේ දී ගෝලීය වෙළඳපොළ තුළ බනිජ තෙල් ඇතුළුව ප්‍රධාන වෙළඳ භාණ්ඩවල මිල ගණන් ඉහළ මට්ටමක පැවති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඉන්ධන ආනයන වියදම ඉහළ යෑම අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. රජය විසින් ඇතැම් ආනයන සීමා ලිහිල් කිරීම සහ ආනයන සඳහා උත්සව සමයේ ඇති වන ඉල්ලුමෙහි බලපෑම පෙන්නුම් කරමින්, 2022 වසර අවසාන කාලපරිච්ඡේදයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ආනයන පරිමා සහ ඒකක මිල දර්ශකයන්හි වෙනස්වීම් මගින් නිරූපණය කරන පරිදි, 2022 වසරේ දී ආනයන ඒකක මිල ඉහළ ගිය ද, පසුගිය වසරට සාපේක්ෂව ආනයන වියදම පහළ යෑම සඳහා ආනයන පරිමා අඩු වීම හේතු වූ බව පිළිබිඹු විය. කෙසේ වුවද, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, ආනයන වියදම 2021 වසරේ පැවති සියයට 23.3ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 23.7ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.

ගෝලීය වශයෙන් ආහාර ද්‍රව්‍ය මිල ගණන් ඉහළ ගිය ද, ආනයන පරිමා පහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී ආහාර සහ පාන වර්ග සඳහා වන ආනයන වියදම සියයට 3.5ක මන්දගාමී වේගයකින් පහළ ගියේය. ධාන්‍ය වර්ග සහ ඇඹරුම් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදිත (සහල් සහ තිරිඟු පිටි වැනි), පාන වර්ග සහ කුළුබඩු හැරුණු විට බොහෝ ප්‍රධාන ආහාර කාණ්ඩවල ආනයන පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී පහළ යෑමක් වාර්තා කළේය. 2022 වසරේ දී පොල් තෙල් ආනයන පරිමාව සැලකිය යුතු ලෙස අඩු වීම සහ 2021 වසරේ දී පැවති ඉහළ සංඛ්‍යානමය පදනම් බලපෑම 2022 වසරේ දී තෙල් සහ මේද වර්ග ආනයන සඳහා වන වියදම පහළ යෑම සඳහා හේතු විය. තවද, 2022 වසරේ දී කිරි නිෂ්පාදිත, පරිප්පු සහ සීනි සඳහා වූ ආනයන මිල ගණන්වල සාමාන්‍යය ඉහළ ගිය ද, ආනයන පරිමා පහළ යෑම හේතුවෙන් ඒවායේ ආනයන වියදම් ද අඩු විය. මීට ප්‍රතිවිරුද්ධව, පොහොර හිඟය හේතුවෙන් දේශීය සහල් නිෂ්පාදනය අඩාල වීමේ ප්‍රතිඵලයක් ලෙස සහල් ආනයනය සඳහා වන වියදම, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 300කින් පමණ සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත සහ විදුලි සංදේශ උපාංග ආනයන වියදම සැලකිය යුතු ලෙස පහළ යෑම හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,205ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 44.8කින් කැපී පෙනෙන ලෙස අඩු විය. 2021 වසරේ දී කොවිඩ්-19 සඳහා ලබා දුන් එන්නත් සඳහා සිදු කළ විශාල වියදම්හි සංඛ්‍යානමය පදනම් බලපෑම ද පිළිබිඹු කරමින්, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ආනයන වියදම මෙම වසරේ දී සැලකිය යුතු ලෙස පහළ ගියේය. තවද, රජය සහ මහ බැංකුව විසින් පනවන ලද හදිසි නොවන ආනයන සීමා කිරීමේ ක්‍රියාමාර්ගවල සහ බැංකු පද්ධතිය තුළ පැවති තීව්‍ර විදේශ විනිමය හිඟය යනාදියෙහි බලපෑම පිළිබිඹු කරමින්, 2022 වසරේ දී ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ කාණ්ඩය යටතේ ඇති අනෙකුත් සියලුම උප අංශයන්හි ආනයන වියදම 2021 වසරට සාපේක්ෂව පහළ ගියේය.

2022 වසරේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම, 2010 වසරෙන් පසු වාර්තා කළ අඩුම වියදම සනිටුහන් කරමින්, එ.ජ. ඩොලර් මිලියන 3,030ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 32.1කින් පහළ ගියේය. ආයෝජන භාණ්ඩ ආනයන වියදමෙහි මෙම

5.5 රූප සටහන
ආනයන සංයුතිය



මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම සහ සැලකිය යුතු අන්දමේ විදේශ විනිමය ද්‍රවශීලතා ගැටලු මධ්‍යයේ ප්‍රමුඛතාවය මත ආනයන සිදු කිරීමට හඳුන්වා දුන් ක්‍රියාමාර්ග දායක විය. 2022 වසරේ දී, 2021 වසරට සාපේක්ෂව යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය, සහ ප්‍රවාහන උපකරණ යන ආයෝජන භාණ්ඩ ප්‍රධාන කාණ්ඩ ත්‍රිත්වයෙහි සහ එම කාණ්ඩ යටතේ ඇති බොහෝ උපකාණ්ඩවල ආනයන වියදම් සැලකිය යුතු ලෙස පහළ යෑමක් නිරීක්ෂණය විය. යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම පහළ යෑම සඳහා කාර්යාල යන්ත්‍රසූත්‍ර (ප්‍රධාන වශයෙන්, පරිගණක), යන්ත්‍රසූත්‍ර හා උපකරණ කොටස් සහ විදුලි සංදේශ උපාංග (ප්‍රධාන වශයෙන්, සම්ප්‍රේෂණ උපකරණ) ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, විද්‍යුත් මෝටර හා විදුලි ජනක කට්ටල ආනයන වියදම ඉහළ ගියේය. ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන පහළ යෑම සඳහා යකඩ හා වානේ, සිමෙන්ති, බනිජ නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, ඇස්බැස්ටෝස්) ආනයන පහළ යෑම හේතු වූ අතර, ප්‍රවාහන උපකරණ වියදම පහළ යෑම සඳහා කෘෂිකාර්මික ට්‍රැක්ටර්, ටැංකි හා බවුසර් සහ දුම්රිය උපකරණ ආනයන පහළ යෑම හේතු විය.

ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම හේතුවෙන් බොහෝ අන්තර් භාණ්ඩ උප කාණ්ඩවල ආනයන වියදම සමස්තයක් ලෙස පහළ ගිය ද, ඉන්ධන සඳහා වූ වියදම් ඉහළ යෑම හේතුවෙන් සමස්ත ආනයනවලින් සියයට 68ක් වූ අන්තර් භාණ්ඩ ආනයන වියදම සුළු වශයෙන් ඉහළ ගියේය. ඒ අනුව, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර්

5.4 සංඛ්‍යා සටහන

ආනයන සංයුතිය

කාණ්ඩය	2021		2022 (අ)		වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන	වාර්ෂික වෙනස්වීම %	වෙනස්වීමට වූ දායකත්වය %
	වටිනාකම එ.ජ. ඩොලර් මිලියන	දායකත්වය %	වටිනාකම එ.ජ. ඩොලර් මිලියන	දායකත්වය %			
පාරිභෝගික භාණ්ඩ	**3,848.7**	**18.6**	**2,813.0**	**15.4**	**-1,035.7**	**-26.9**	**44.1**
ආහාර හා පාන වර්ග	1,666.5	8.1	1,607.9	8.8	-58.6	-3.5	2.5
සහල්	73.0	0.4	292.5	1.6	219.4	300.5	-9.4
සීනි හා රසකැවිලි	288.8	1.4	257.8	1.4	-31.0	-10.7	1.3
කිරි නිෂ්පාදිත	317.7	1.5	225.3	1.2	-92.4	-29.1	3.9
පරිප්පු	143.0	0.7	116.9	0.6	-26.1	-18.2	1.1
පොල් තෙල්	166.1	0.8	27.2	0.1	-138.9	-83.6	5.9
වෙනත්	677.8	3.3	688.3	3.8	10.4	1.5	-0.4
ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ	2,182.2	10.6	1,205.1	6.6	-977.1	-44.8	41.6
බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත	882.5	4.3	533.4	2.9	-349.1	-39.6	14.9
රෙදිපිළි හා උපාංග	221.3	1.1	215.6	1.2	-5.7	-2.6	0.2
ගෘහ හා දැව භාණ්ඩ	161.2	0.8	116.3	0.6	-45.0	-27.9	1.9
ගෘහ උපකරණ	257.1	1.2	85.5	0.5	-171.6	-66.7	7.3
විදුලි සන්දේශ මෙවලම්	382.9	1.9	69.0	0.4	-313.9	-82.0	13.4
වෙනත්	277.2	1.3	185.4	1.0	-91.8	-33.1	3.9
අන්තර් භාණ්ඩ	**12,308.9**	**59.6**	**12,438.8**	**68.0**	**129.8**	**1.1**	**-5.5**
ඉන්ධන	3,742.9	18.1	4,896.8	26.8	1,153.9	30.8	-49.2
රෙදිපිළි හා රෙදිපිළි උපාංග	3,066.9	14.9	3,065.2	16.8	-1.8	-0.1	0.1
රසායනික නිෂ්පාදිත	1,074.4	5.2	966.2	5.3	-108.2	-10.1	4.6
ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත	765.7	3.7	650.8	3.6	-114.9	-15.0	4.9
කඩදාසි, සන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත	468.9	2.3	465.9	2.5	-3.0	-0.6	0.1
රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත	400.7	1.9	334.7	1.8	-66.0	-16.5	2.8
මූල ලෝහ	866.4	4.2	323.2	1.8	-543.3	-62.7	23.2
අනෙකුත් අන්තර් භාණ්ඩ	1,922.9	9.3	1,736.0	9.5	-186.9	-9.7	8.0
ආයෝජන භාණ්ඩ	**4,462.7**	**21.6**	**3,030.5**	**16.6**	**-1,432.2**	**-32.1**	**61.0**
යන්ත්‍රසූත්‍ර හා උපකරණ	2,809.5	13.6	1,969.0	10.8	-840.5	-29.9	35.8
ගොඩනැගිලි ද්‍රව්‍ය	1,248.9	6.1	926.3	5.1	-322.5	-25.8	13.7
ප්‍රවාහන උපකරණ	398.5	1.9	132.1	0.7	-266.4	-66.8	11.4
අනෙකුත් ආයෝජන භාණ්ඩ	5.8	0.03	3.0	0.02	-2.8	-47.9	0.1
වර්ග නොකළ ආනයන	**17.1**	**0.1**	**8.8**	**0.05**	**-8.3**	**-48.8**	**0.4**
මුළු ආනයන (ආ) (ඇ)	**20,637.4**	**100.0**	**18,291.0**	**100.0**	**-2,346.4**	**-11.4**	**100.0**

(අ) තාවකාලික
(ආ) ප්‍රතිඅනයන ඇතුළත් නොවේ.
(ඇ) දත්ත වාර්තා කිරීමේ දී සිදුවන කාල පමාවන් සහ වෙනත් සාධක සඳහා ගැළපීම් කර ඇත.

මූලයන්: ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

5.5 සංඛ්‍යා සටහන

ප්‍රධාන ආනයනවල පරිමාවන්

මෙට්‍රික් ටොන් දහස්

ශීර්ෂය	2018	2019	2020	2021	2022 (අ)
පිරිපහදු කළ බනිජ තෙල් (ආ)	**4,959**	**4,740**	**4,028**	**4,553**	**3,927**
පළමු කාර්තුව	1,382	1,199	1,249	1,378	1,184
දෙවන කාර්තුව	1,207	1,206	678	1,008	935
තෙවන කාර්තුව	1,317	1,211	1,123	865	853
සිව්වන කාර්තුව	1,054	1,124	978	1,302	954
තිරිඟු	**1,297**	**1,159**	**1,404**	**1,307**	**583**
පළමු කාර්තුව	412	164	272	323	208
දෙවන කාර්තුව	329	318	285	288	129
තෙවන කාර්තුව	285	292	498	335	80
සිව්වන කාර්තුව	271	385	348	360	167
බොරතෙල් (ආ)	**1,674**	**1,842**	**1,667**	**1,182**	**649**
පළමු කාර්තුව	283	461	464	274	179
දෙවන කාර්තුව	459	460	265	368	80
තෙවන කාර්තුව	461	461	568	362	199
සිව්වන කාර්තුව	471	460	370	178	191
සීනි	**645**	**556**	**683**	**582**	**460**
පළමු කාර්තුව	205	140	193	293	119
දෙවන කාර්තුව	166	153	108	140	68
තෙවන කාර්තුව	119	100	209	14	131
සිව්වන කාර්තුව	154	164	172	136	143
පොහොර	**861**	**707**	**952**	**412**	**363**
පළමු කාර්තුව	256	148	88	114	37
දෙවන කාර්තුව	154	142	294	182	32
තෙවන කාර්තුව	225	238	126	17	84
සිව්වන කාර්තුව	226	179	444	98	210
සහල්	**249**	**24**	**16**	**147**	**783**
පළමු කාර්තුව	203	8	8	3	270
දෙවන කාර්තුව	37	3	2	4	156
තෙවන කාර්තුව	2	5	2	3	249
සිව්වන කාර්තුව	7	8	4	137	108

(අ) තාවකාලික
(ආ)ගළපන ලද

මූලයන්: ලංකා බනිජ තෙල් නිතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මිලියන 12,439ක් දක්වා සියයට 1.1කින් ඉහළ ගියේය. ඉන්ධන සලාකනය කිරීම සහ පිරිවැය පිළිබිඹු කෙරෙන මිල ගැලපීම් ආදී ඉල්ලුම් කළමණාකරණ ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් පෙර වසරට සාපේක්ෂව සියලුම උප අංශවල ආනයන පරිමා පහළ ගිය ද, ප්‍රධාන වශයෙන් බොරතෙල්, පිරිපහදු කළ බනිජ තෙල් (LP ගෑස් ඇතුළුව) සහ ගල් අඟුරු යන සියලුම උප කාණ්ඩවල ආනයන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ආනයන පැසෙහි විශාලතම ආනයන අයිතමය වන ඉන්ධන ආනයන වියදම ඉහළ ගියේය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉන්ධන මිලෙහි වෙනස්වීම්වලට සමගාමීව, 2021 වසරේ දී එ.ජ. ඩොලර් 68.86ක් වූ බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය 2022 වසරේ දී එ.ජ. ඩොලර් 100.11ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2022 වසරේ දී බොරතෙල් කඩින් කඩ ආනයනය කිරීම හේතුවෙන් රටේ බනිජ තෙල් අවශ්‍යතාවයෙන් වැඩි ප්‍රමාණයක් පිරිපහදු කළ බනිජ තෙල් ආනයනය මගින් සම්පූර්ණ කරන ලදී. 2022 වසරේ දී පොහොර ආනයන පරිමා පහළ මට්ටමක තිබියදීත්, ආනයන මිල ගණන්හි සාමාන්‍යය ඉහළ යෑම හේතුවෙන් පොහොර ආනයන වියදම 2021 වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ඉහළ යෑමක් පෙන්නුම් කළේය. මේ අතර, දෙවන විශාලතම ආනයන අයිතමය වන රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම 2022 වසරේ දී 2021 වසරට සාපේක්ෂව සමස්තයක් ලෙස නොවෙනස්ව පැවතුණි. මීට ප්‍රතිවිරුද්ධව, මූල ලෝහ (ප්‍රධාන වශයෙන්, යකඩ හා වානේ) සහ තිරිඟු ඇට ආනයනය විශාල වශයෙන් පහත වැටීම ද ඇතුළුව අන්තර් භාණ්ඩ යටතේ ඇති අනෙකුත් බොහෝ උප කාණ්ඩවල ආනයන වියදම් පහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 වසරේ දී ඉන්ධන නොවන අන්තර් භාණ්ඩ ආනයන වියදම, 2021 වසරට සාපේක්ෂව සියයට 12.0කින් පහළ ගියේය.

වෙළඳ මිල අනුපාතය

2022 වසරේ දී අපනයන මිල දර්ශකයට වඩා වැඩි වේගයකින් ආනයන මිල දර්ශකය ඉහළ ගිය බැවින්, අපනයන භාණ්ඩවල මිල ගණන් සහ ආනයන භාණ්ඩවල මිල ගණන් අතර අනුපාතය නිරූපණය කරනු ලබන වෙළඳ මිල අනුපාතය තවදුරටත් පහළ ගියේය. සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩවල මිල දර්ශකවල වැඩි වීම අපනයන මිල ගණන් ඉහළ යෑමට හේතු වූ අතර, සමස්ත ආනයන මිල දර්ශකයේ වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් ගෝලීය ඉන්ධන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ඉහළ ගිය අන්තර් භාණ්ඩ ආනයන මිල ගණන් හේතු විය. එබැවින්, 2022 වසරේ දී වෙළඳ මිල අනුපාතය 2021 වසරට සාපේක්ෂව

5.6 රූප සටහන

වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දර්ශක



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව

5.6 සංඛ්‍යා සටහන

වෙළඳ දර්ශක (අ)

2010 = 100

කාණ්ඩය	වටිනාකම් දර්ශකය			පරිමා දර්ශකය			ඒකක වටිනාකම් දර්ශකය		
	2021	2022 (ආ)	වාර්ෂික වෙනස්වීම%	2021	2022 (ආ)	වාර්ෂික වෙනස්වීම%	2021	2022 (ආ)	වාර්ෂික වෙනස්වීම%
අපනයන									
කෘෂිකාර්මික අපනයන	**118.4**	**111.4**	**-5.9**	**101.1**	**93.1**	**-7.9**	**117.1**	**119.7**	**2.1**
තේ	92.0	87.4	-5.0	87.2	76.6	-12.1	105.5	114.1	8.2
රබර්	24.3	23.9	-1.8	29.3	29.2	-0.01	83.2	81.7	-1.8
පොල්	256.7	241.7	-5.9	188.1	193.5	2.9	136.5	124.9	-8.5
කුළුබඩු	219.5	178.0	-18.9	146.9	116.2	-20.9	149.4	153.1	2.5
සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත	208.3	250.3	20.2	188.4	240.9	27.9	110.6	103.9	-6.0
කාර්මික අපනයන	**159.3**	**171.8**	**7.9**	**183.2**	**194.9**	**6.4**	**86.9**	**88.1**	**1.4**
රෙදිපිළි හා ඇඟලුම්	162.1	177.5	9.5	140.6	144.6	2.8	115.3	122.7	6.5
ඛනිජ තෙල් නිෂ්පාදිත	192.4	215.8	12.2	282.8	189.2	-33.1	68.0	114.1	67.7
රබර් නිෂ්පාදිත	188.7	175.5	-7.0	112.6	106.6	-5.3	167.6	164.7	-1.7
ඛනිජ අපනයන	**183.7**	**206.3**	**12.3**	**111.4**	**114.2**	**2.5**	**164.8**	**180.7**	**9.6**
මුළු අපනයන	**145.0**	**152.0**	**4.9**	**156.9**	**163.0**	**3.9**	**92.4**	**93.3**	**0.9**
ආනයන									
පාරිභෝගික භාණ්ඩ	**155.5**	**113.7**	**-26.9**	**127.8**	**104.8**	**-18.0**	**121.7**	**108.5**	**-10.9**
ආහාර හා පාන වර්ග	126.0	121.5	-3.5	125.5	133.4	6.3	100.4	91.1	-9.2
ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ	189.5	104.7	-44.8	130.4	71.9	-44.8	145.3	145.5	0.1
අන්තර් භාණ්ඩ	**152.9**	**154.5**	**1.1**	**152.0**	**121.1**	**-20.3**	**100.6**	**127.6**	**26.9**
ඉන්ධන	123.1	161.0	30.8	134.2	106.8	-20.4	91.7	150.7	64.3
පොහොර	65.9	114.9	74.4	74.5	68.1	-8.6	88.4	168.6	90.7
රසායනික නිෂ්පාදිත	206.6	185.8	-10.1	177.3	142.8	-19.4	116.6	130.1	11.6
තිරිඟු සහ ඉරිඟු	157.6	114.2	-27.5	134.2	90.4	-32.7	117.4	126.4	7.6
රෙදිපිළි හා රෙදිපිළි උපාංග	169.5	169.4	-0.1	153.9	142.3	-7.6	110.2	119.1	8.1
ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත	181.0	153.9	-15.0	169.5	135.3	-20.2	106.8	113.7	6.5
දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග	38.0	54.0	41.9	41.9	46.0	9.9	90.9	117.3	29.1
ආයෝජන භාණ්ඩ	**162.0**	**110.0**	**-32.1**	**230.6**	**162.8**	**-29.4**	**70.3**	**67.6**	**-3.8**
ගොඩනැගිලි ද්‍රව්‍ය	152.0	112.7	-25.8	154.5	99.2	-35.8	98.3	113.7	15.6
ප්‍රවාහන උපකරණ	67.3	22.3	-66.8	46.7	19.8	-57.6	144.2	112.7	-21.9
යන්ත්‍රසූත්‍ර හා උපකරණ	210.1	147.2	-29.9	359.0	265.4	-26.1	58.5	55.5	-5.2
වෙනත් ආයෝජන උපකරණ	174.5	90.8	-47.9	142.6	77.7	-45.5	122.3	116.9	-4.4
මුළු ආනයන	**153.9**	**136.4**	**-11.4**	**162.2**	**126.0**	**-22.4**	**94.9**	**108.3**	**14.1**
වෙළඳ මිල අනුපාතය							**97.4**	**86.1**	**-11.6**

(අ) එ.ජ. ඩොලර් වටිනාකම් අනුව
(ආ) තාවකාලික

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

දර්ශකාංක 86.1ක් දක්වා සියයට 11.6කින් පහළ ගිය අතර, එමගින් අපනයන ඒකකයකින් මිලදීගත හැකි ආනයන ප්‍රමාණය අඩු වූ බව පෙන්නුම් කළේය.

2022 වසර තුළ අපනයන ඉපැයීම් සහ ආනයන වියදම්හි සමස්ත විචලනය සඳහා වෙළඳ පරිමාවන් සැලකිය යුතු ලෙස හේතු විය. කෘෂිකාර්මික අපනයන හැර අනෙකුත් සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩ සඳහා වන පරිමා දර්ශක වර්ධනය වූ අතර, සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩ සඳහා වන පරිමා දර්ශක පහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස 2022 වසර තුළ සමස්ත ආනයන වියදම පහළ ගියේය.

වෙළඳ දිශාව

2021 වසර හා සසඳන විට 2022 වසරේ දී ඇතැම් ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය (අපනයන සහ ආනයන යන දෙඅංශයම) පහත වැටුණ ද, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් සමස්තයක් ලෙස නොවෙනස්ව පැවතුණි. වටිනාකම අනුව සැලකූ විට, 2022 වසරේ දී ඉන්දියාව, ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වෙළඳ හවුල්කරු ලෙස අඛණ්ඩව කටයුතු කළ අතර, ඉන් අනතුරුව ඇමෙරිකා එක්සත් ජනපදය සහ චීනය පැවති අතර, මෙම රටවල් තුන සාමූහිකව ශ්‍රී ලංකාවේ සමස්ත වෙළඳාමෙන් සියයට 41කට පමණ දායක විය. ප්‍රධාන

වශයෙන් ආනයන සඳහා සහාය වීමට ඉන්දියාව විසින් සපයනු ලැබූ ණය පහසුකම් භාවිත කිරීම සහ නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සිදු කළ ඉහළ අපනයන හේතුවෙන් ඉන්දියාව සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 5.5ක් ඉක්මවා ගිය අතර, ඇමෙරිකා එක්සත් ජනපදය සහ චීනය සමඟ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එක් එක් රට සඳහා එ.ජ. ඩොලර් බිලියන 3.5 ඉක්මවා ගියේය. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් චීනයේ සැපයුම් දාම සඳහා අවහිරතා ඇති වීම මෙන්ම ආනයන සීමා සහ ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම මධ්‍යයේ පාරිභෝගික හා ආයෝජන භාණ්ඩ ආනයන අඩු වීම මූලික කරගෙන චීනයෙන් සිදු කළ ආනයන කැපී පෙනෙන ලෙස පහළ යෑම හේතුවෙන්, 2022 වසරේ දී චීනය සමඟ සිදු කළ සමස්ත වෙළඳාම සැලකිය යුතු ලෙස පහළ ගියේය. එක්සත් රාජධානිය, මැලේසියාව, ජර්මනිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ සිංගප්පූරුව අනෙකුත් ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් වූ අතර, එක් එක් රට සඳහා 2022 වසරේ වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවීය. ඉන්ධන ආනයනය ඉහළ යෑම හේතුවෙන් 2022 වසර තුළ රුසියාව සමඟ සිදු කළ සමස්ත වෙළඳාම වර්ධනය වුව ද, රුසියාව සහ යුක්‍රේනය අතර භූ දේශපාලනික අර්බුදවල ප්‍රතිඵලයක් ලෙස යුක්‍රේනය සමඟ සිදු කළ සමස්ත වෙළඳාම 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී අඩකින් පමණ පහළ ගියේය. 2022 වසරේ දී ප්‍රධාන රටවල් අනුව, වෙළඳ ශේෂ බොහෝ දුරට නොවෙනස්ව පැවති අතර, ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ජර්මනිය, ඉතාලිය, නෙදර්ලන්තය, සහ කැනඩාව සමඟ සැලකිය යුතු වෙළඳ අතිරික්තයන් වාර්තා වූ අතර, ඉන්දියාව, චීනය, මැලේසියාව, සිංගප්පූරුව සමඟ සැලකිය යුතු වෙළඳ හිඟයන් වාර්තා විය. දශකයක් පුරා වෙළඳ දිශාව සමස්තයක් ලෙස නොවෙනස්ව පවතින අතර, ශ්‍රී ලංකාව විශේෂයෙන්ම කලාපය තුළ අපනයන සඳහා නව වෙළඳපොළ ගවේෂණය කිරීම අවශ්‍ය වේ.

2022 වසරේ සමස්ත අපනයන ආදායමෙන් අඩකට පමණ දායක වෙමින්, ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපීය රටවල් ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්ත ලෙස පැවතුණි. ඇමෙරිකා එක්සත් ජනපදය, ශ්‍රී ලංකාවේ අපනයන සඳහා තවදුරටත් තනි විශාලතම ගැනුම්කරුවා වූයේ, සමස්ත අපනයන අතරින් සියයට 25.3ක්, එනම් එ.ජ. ඩොලර් බිලියන 3.3ක් ඉක්මවූ අපනයන මිල දී ගැනීම් තුළින් වන අතර,

5.7 රූප සටහන
රටවල් අනුව වෙළඳ ශේෂයන් (එ.ජ. ඩොලර් බිලියන)



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉන් පසුව, එක්සත් රාජධානිය (සියයට 7.3ක්), ඉන්දියාව (සියයට 6.6ක්), ජර්මනිය (සියයට 5.7ක්) සහ ඉතාලිය (සියයට 4.9ක්) අනෙකුත් ප්‍රධාන අපනයන ගමනාන්ත විය. 2022 වසරේ දී සමස්ත අපනයන ඉහළ යෑමට සමගාමීව බොහෝ අපනයන ගමනාන්ත වෙතින් ලද ආදායම, ප්‍රධාන අපනයන ගමනාන්ත දහය ද (ජර්මනිය, බෙල්ජියම සහ ඕස්ට්‍රේලියාව හැර) ඇතුළුව ඉහළ ගියේය. ඇමෙරිකා එක්සත් ජනපදය තවදුරටත් ශ්‍රී ලංකාවේ තනි විශාලතම ඇඟලුම් අපනයන ගමනාන්තය ලෙස 2022 වසරේ සමස්ත ඇඟලුම් අපනයන වටිනාකමෙන් සියයට 42කට දායක විය. ඇඟලුම්වලට අමතරව, ඇමෙරිකා එක්සත් ජනපදය වෙතින් ලැබුණු අපනයන ආදායම ප්‍රධාන වශයෙන් රබර් නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ රසායනික නිෂ්පාදිත සඳහා විය. ඇඟලුම්, රබර් නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ එක්සත් රාජධානිය වෙත අපනයනය කරන ලද ප්‍රධාන නිෂ්පාදිත විය. ඉන්දියාව වෙත සිදු කළ අපනයන අතර සත්ත්ව ආහාර, කුළුබඩු, රෙදිපිළි සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත ප්‍රධාන විය. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වඩාත්ම ප්‍රමුඛ කලාපය වන යුරෝපා සංගමයට අයත් රටවල් වෙත 2022 වසරේ සිදු කළ අපනයන සමස්ත අපනයන ආදායමෙන් සියයට 23ක් පමණ වූ අතර, සමස්ත ඇඟලුම් අපනයන ආදායමෙන් සියයට 30ක් පමණ ඊට ඇතුළත් විය. යුරෝපා සංගමය වෙත අපනයනය කරන ලද අනෙකුත් ප්‍රධාන අයිතම අතර, රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ සහ තේ ඇතුළත් වන අතර,

5.8 රූප සටහන
අපනයන වෙළඳ දිශාව



මූලයඃ ශ්‍රී ලංකා රේගුව

5.9 රූප සටහන
ආනයන වෙළඳ දිශාව



*එක්සත් රාජධානිය අයත් නොවේ.

මූලයඃ ශ්‍රී ලංකා රේගුව

එම අයිතම බොහොමයක් යුරෝපා සංගමයේ විශේෂ ප්‍රතිලාභ සහිත වරණීය වෙළඳාම් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී.+) යටතේ අපනයනය කරන ලදී. 2022 වසරේ දී, මැද පෙරදිග රටවල් සහ ප්‍රධාන වශයෙන් රුසියාව ඇතුළුව ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් ශ්‍රී ලංකාවේ තේ සඳහා ප්‍රධාන අපනයන ගමනාන්ත වූ අතර, එම රටවල් සාමූහිකව සමස්ත තේ අපනයන ආදායමෙන් සියයට 59කට පමණ දායක විය.

2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී ආසියානු කලාපයේ බොහෝ රටවල් සමග සිදු කළ සමස්ත ආනයන ප්‍රමාණය පහළ ගිය ද, එම රටවල් ශ්‍රී ලංකාව විසින් තවදුරටත් භාණ්ඩ ආනයනය කරන ලද ප්‍රධාන රටවල් විය. ඉන්දියාව විසින් සපයනු ලැබූ ණය පහසුකම් යටතේ සිදු කළ ආනයන ද මූලික කර ගනිමින්, 2022 වසරේ එ.ජ. ඩොලර් බිලියන 4.7කට වඩා වැඩි ආනයන ප්‍රමාණයකට හා සමස්ත ආනයන අතුරින් සියයට 25.9කට පමණ දායක වෙමින් ඉන්දියාව 2018 වසරට පසුව ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභවය ලෙස සිය ස්ථානය යළි හිමි කරගත්තේය. ඒ අනුව, ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත සහ සහල් ආනයන හේතුවෙන් ඉන්දියාවෙන් සිදු කළ ආනයන සඳහා වූ වියදම සියයට 2.4කින් සුළු වශයෙන් ඉහළ ගියේය. මේ අතර, චීනය සහ මැලේසියාව, 2022 වසර සඳහා දෙවන සහ තෙවන විශාලතම ආනයන ප්‍රභව වූයේ, පිළිවෙළින්, සියයට 18.0ක සහ සියයට 5.3ක ප්‍රතිශතයන් සඳහා දායක වෙමිනි. 2022 වසරේ දී යන්ත්‍රසූත්‍ර හා උපකරණ, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත (කොවිඩ්-19 සඳහා ලබා දුන් එන්නත්), විදුලි සංදේශ උපාංග (ප්‍රධාන වශයෙන්, ජංගම දුරකථන) සහ ගොඩනැගිලි ද්‍රව්‍ය වැනි චීනයෙන් ආනයනය කළ බොහෝ ප්‍රධාන ආනයන සඳහා වූ වියදම පහළ ගියේය. ඛනිජ තෙල් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත සහ ආහාර සැකසුම් මැලේසියාවෙන් සිදු කළ ප්‍රධාන ආනයන වූ අතර, මැලේසියාවෙන් සිදු කළ මුළු ආනයන අතරින් සියයට 65කට පමණ ඛනිජ තෙල් නිෂ්පාදිත දායක විය. ආනයන ප්‍රභවයන් ලෙස, සිංගප්පූරුව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය 2022 වසරේ දී සිව්වන සහ පස්වන ස්ථානවල පසු විය. 2022 වසරේ සිංගප්පූරුවෙන් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් ආනයනය කළ ප්‍රධාන ආනයන අයිතම වූයේ ඛනිජ තෙල් නිෂ්පාදිතයි. 2022 වසරේ දී සමස්ත ආනයන වියදම පහළ යෑමට සමගාමීව, ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභවයන් දහය (ඉන්දියාව,

මැලේසියාව, රුසියාව සහ සිංගප්පූරුව හැර) ඇතුළුව බොහෝ ආනයන ප්‍රභවයන්වලට අදාළ ආනයන වියදමෙහි පහළ යෑමක් වාර්තා කළේය.

විදේශ වෙළඳ ප්‍රතිපත්ති, ප්‍රවණතා සහ ආයතනික සහාය

මෙතෙක් වාර්තා වූ දරුණුතම ආර්ථික පසුබෑමට 2022 වසරේ දී ශ්‍රී ලංකාව ලක් වුවද, වෙළඳ අංශය සියලු පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව ශක්තිමත්ව පැවතුණි. 2018-2022 යන කාලපරිච්ඡේදය සඳහා වන ජාතික අපනයන ක්‍රමෝපාය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහ ආයතනික සහයෝගය සැපයීම අපනයන අංශය යථා තත්ත්වයට පත් කිරීමට උපකාරී වූ අතර, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම මගින් අපනයන අංශය සඳහා බොහෝ ප්‍රතිලාභ හිමි විය. වෙළඳ අංශය වෙත අපහසුතාවයක් ඇති වුව ද, අපනයන ඉපැයීම් රට වෙත ආපසු ගෙන්වා ගැනීම හා එම මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාව, ආනයන සීමා කිරීම්, ආන්තික අවශ්‍යතා පැනවීම් ආදී වූ ඇතැම් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය විය. මෙවැනි ක්‍රියාමාර්ග ගැනීමට සිදුවූයේ නිදහසින් පසු ආර්ථිකයේ දක්නට ලැබුණු දරුණුම ගෙවුම් තුලන අර්බුදය මධ්‍යයේ ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා වේ. දැනට පවතින වෙළඳ ගිවිසුම්වල කොන්දේසි වැඩිදියුණු කිරීමට පියවර ගන්නා අතරම, නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා කඩිනමින් නැවත ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී. 2023 වසර සඳහා වන අයවැය මගින් සියලුම වෙළඳ සාකච්ඡා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ජාත්‍යන්තර වෙළඳ කාර්යාලයක් පිහිටුවීම සහ විදේශීය වෙළඳාමේ නියැලී සිටින ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට විදේශ වෙළඳාම සහ ආයෝජන සඳහා නියෝජිතායතනයක් පිහිටුවීම මෙන්ම වෙළඳ ගැළපුම් වැඩසටහනක් නැවත හඳුන්වාදීම වැනි වෙළඳ ආධාරක ප්‍රතිපත්ති කිහිපයක් රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ඉදිරි කාලපරිච්ඡේදය තුළ ආර්ථිකය යථා තත්ත්වයට පත්වන විට අපනයන සඳහා සහාය දැක්වීමට සහ තෝරාගත් ආනයන සඳහා ආදේශන සිදු කිරීම සඳහා වන ස්ථාවර සහ පුළුල් ප්‍රතිපත්ති මෙන්ම එම ප්‍රතිපත්ති කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී. කොවිඩ්-19 වසංගතයෙහි ඍණාත්මක පසුබලපෑම් අභිබවා යමින් 2022 වසරේ පළමු භාගයේ දී ගෝලීය ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත් වූ නමුත්, රුසියා-යුක්‍රේන යුද්ධය, උද්ධමනය ඉහළ යෑම, දැඩි මුදල් ප්‍රතිපත්තිය සහ ගෝලීය වෙළඳපොළ තුළ ආර්ථික අවපාතය පිළිබඳ පැවති අවිනිශ්චිත බව හේතුවෙන් 2022 වසරේ දෙවන භාගයේ දී වඩා අභියෝගාත්මක විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ලෝක වෙළඳ සංවිධානය විසින් ගෝලීය භාණ්ඩ වෙළඳ පරිමාවේ වර්ධනය 2022 වසරේ දී සියයට 3.5කට සීමා වනු ඇතැයි ද (2021 වසරේ වාර්තා වූ සියයට 9.7ට සාපේක්ෂව පහළ යෑමක්) 2023 වසරේ දී සියයට 1.0ක අඩු වර්ධනයක් වාර්තා කරනු ඇතැයි ද ඇස්තමේන්තු කරයි. මෙවන් පසුබිමක, මැදි කාලීන සහ දිගු කාලීන වශයෙන් අනාගතයේ දී ඇති විය හැකි දේශීය හා ගෝලීය අභියෝග මැඩපැවැත්වීම සඳහා බලධාරීන් විසින් තවදුරටත් තිරසාර ප්‍රතිපත්තිමය මැදිහත්වීම් ඒකාකාරී ලෙස සිදු කරන අතරම, මෑත කාලීනව ගැටලු නිරාකරණය කිරීමට ක්‍රියාකාරී ප්‍රතිපත්ති වැදගත් වේ. නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම වැනි සැපයුම් පාර්ශ්වීය බාධක අවම කිරීම, විභව ගෝලීය අගය දාමයන් සහ නිෂ්පාදන ජාල උපයෝගී කර ගැනීමට මඟ සලසමින් නවෝත්පාදනය සඳහා හේතු වන පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන්වල සහාය ඇතිව අපනයන අභිමුඛකරණය ශක්තිමත් කරන අතර, අගය එකතු කිරීම වැඩිදියුණු කිරීම, ආයතනික රාමුව තාර්කීකරණය කිරීම, නිලධාරිවාදී අවහිරතා ඉවත් කිරීම සහ වෙළඳ සහ ආයෝජක හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රමුඛත්වය දිය යුතුය.

2022 වසරේ දී ආනයන වියදම පාලනය කිරීම සඳහා වැදගත් වෙළඳ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ආරම්භ කළේය. 2022 වසරේ පළමු කාර්තුව තුළ ආනයන වියදම් විශාල වශයෙන් ඉහළ යෑම සහ විනිමය අනුපාතිකය මත පැවති පෙර නොවූ අන්දමේ පීඩනය සැලකිල්ලට ගනිමින්, රජය සහ මහ බැංකුව විසින් 2022 වසරේ පළමු භාගය තුළ ආනයන සඳහා වන ඉල්ලුම සීමා කිරීමට පියවර කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, රජය විසින් 2022 වසරේ මාර්තු මාසයේ සිට බලපත්‍ර අවශ්‍යතා, ආනයන බදු ඉහළ නැංවීම වැනි ක්‍රියාමාර්ග පනවන ලද අතර, මහ බැංකුව විසින් 2022 වසරේ මාර්තු මාසයේ දී විනිමය අනුපාතිකයේ වැඩි නම්‍යශීලී බවක් සඳහා ඉඩ ලබා දී, 2022 මැයි මාසයේ සිට තෝරාගත් ආනයන සඳහා සියයට 100ක ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතාවයක් පැනවීය. අවිධිමත් ක්‍රම හරහා සිදු කෙරෙන ආනයන ගෙවීම් සහ එහි ප්‍රතිඵලයක් ලෙස සමාන්තර වෙළඳපොළ මගින් විනිමය අනුපාතිකය මත ඇති කෙරෙන පීඩන සීමා කිරීම සැලකිල්ලට ගනිමින්, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් විවෘත ගිණුම් (open account), භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ ක්‍රමය (consignment account), පිළිගැනීම මත ලේඛන

විශේෂ සටහන 7
අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම සහ පරිවර්තනය අධීක්ෂණය කිරීම

හැඳින්වීම

කොවිඩ්-19 වසංගතය පැතිර යෑම සහ ගෝලීය ආර්ථිකයේ අහිතකර වර්ධනයන් මධ්‍යයේ, මෑත වසර වල මුහුණ දීමට සිදු වූ පෙර නොවූ විරූ අභියෝග හේතුවෙන්, විදේශ විනිමය ගලා ඒම පහත වැටීමත් සමඟ ශ්‍රී ලංකාවේ විදේශීය අංශයට උග්‍ර අවදානම් තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවිය. සංචාරක ඉපැයීම් අඩු වීම, සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මන්දගාමී වීම සහ ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍යකරණය වීම හේතුවෙන් ආනයන වැඩි වීම හේතුවෙන් ජංගම ගිණුමේ හිඟය පුළුල් විය. ඉහළ ණය සේවාකරණ අවශ්‍යතා තිබිය දීත් රටෙහි ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම පහත හෙලීම නිසා ගෝලීය ප්‍රාග්ධන වෙළෙඳපොලවල් වෙත ප්‍රවේශය සීමා වීම මගින් මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර විය. විදේශ විනිමය ප්‍රේෂණ අවම වීම හේතුවෙන් විදේශීය අංශයේ ඇති වෙමින් පැවති අසමතුලිතතාවයන් සැලකිල්ලට ගනිමින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොල තුළ විදේශ මුදල් ද්‍රවශීලතාවය වැඩි දියුණු කිරීම උදෙසා සහ ජාත්‍යන්තර සංචිත නැවත ගොඩ නැගීම උදෙසා ක්‍රියාමාර්ග රැසක් ගන්නා ලදී. ඒ අනුව, 2021 වසරේ දී, අපනයන ඉපැයීම් දින 180 ක් ඇතුළත මෙරටට ගෙන්වා ගැනීම සහ එම ආදායම ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්ය කරමින් 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ රීති පිහිටුවීම සිදු කරන ලදී (සංඛ්‍යා සටහන වි.ස. 7.1).

අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම සහ පරිවර්තනය සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තිවල විකාශය

ඕනෑම ආර්ථිකයක බාහිර කම්පන වලට එරෙහි ස්වාරක්ෂකයක් ගොඩනැගීමේ දී උපකාරී වන ඉතා වැදගත් මූලාශ්‍රයක් ලෙස අපනයන ආශ්‍රිත විදේශ විනිමය ප්‍රේෂණ ක්‍රියා කරයි. අපනයනයේ වැදගත්කම හඳුනාගත් ශ්‍රී ලංකාවේ අනුප්‍රාප්තික රජයන්, සජීවී අපනයන අංශයක් ගොඩනැගීම සඳහා හිතකර වූ ප්‍රතිපත්ති සකස් කර ඇත. කෙසේ වෙතත්, ගෙවුම් ශේෂය මත පීඩනයක් ඇති නොවන ලෙස අපනයන අංශයෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අපනයන ඉපැයීම් යලි මෙරටට ගෙන්වා ගැනීම සහතික කරගත යුතු ය. 1953 අංක 24 දරන විනිමය පාලන පනත (ECA) යටතේ 1973 දී මුල් වරට අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ අවශ්‍යතාවය පනවන ලද අතර එය 1993 දක්වා පැවතින. 1994 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ VIII වන වගන්තිය පිළිගැනීමෙන් පසුව ජංගම ගිණුම් ගනුදෙනු තවදුරටත් ලිහිල් කිරීම සහ රටේ ස්ථායිකරණ වැඩසටහන දිගටම පවත්වාගෙන යාම අරමුණු කරගෙන, මෙම අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීමේ සහ පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවය ලිහිල් කරන ලදී. ඒ අනුව, අපනයන ඉපැයීම් මෙරටට ගෙන්වා ගැනීමටත් එම මුදල් රුපියල් වලින් හෝ විදේශ මුදල් ගිණුම් වල පවත්වා ගැනීම හෝ විදේශ බැංකුවක පවත්වාගෙන යන විදේශ මුදල් ගිණුමක රඳවා ගැනීමට අපනයනකරුවන්ට අවසර ලැබිණි. කෙසේ වෙතත්, සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම දින 90ක් ඇතුළත අපනයන ඉපැයීම් නැවත ගෙන්වා ගැනීම අත්‍යවශ්‍ය කරමින්, ECA යටතේ අපනයන ඉපැයීම් නැවත මෙරටට ගෙන්වා ගැනීමේ අවශ්‍යතාවය 2016 අප්‍රේල් මාසයේදී නැවත හඳුන්වා දෙන ලදී. පසුව මෙම අවශ්‍යතාව දින 120 දක්වා දීර්ඝ කරන ලදී. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත (FEA) බලාත්මක කිරීමත් සමඟ මෙම රෙගුලාසි නැවත නිකුත් කරන ලද අතර 2019 ඔක්තෝම්බර් මාසයේදී දින 180 දක්වා තවදුරටත් දීර්ඝ කරන ලදී. ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සම ආර්ථිකයන්ද අපනයන ඉපැයීම් සම්බන්ධ එවැනි ප්‍රතිපත්ති අනුගමනය කිරීම මගින් අපනයන ඉපැයීම් ප්‍රශස්ථ ලෙස වර්ධනය කරගෙන ඇත (සංඛ්‍යා සටහන වි.ස. 7.2).

විදේශ සංචිත ගොඩනැගීමට අපනයන ඉපැයීම් උපකාර වන අයුරු

අපනයන ඉපැයීම් රට තුළට ලැබීමෙන් පසු, එයින් කොටසක් අවසරලත් ගෙවීම් වැනි විදේශ ව්‍යවහාර මුදලින් සිදුකළ යුතු ගෙවීම් පියවීම සඳහා භාවිතා කරනු ලැබේ. ශේෂය බලයලත් වෙළෙන්දකු[1] හට විදේශ විනිමය ලෙස විකුණනු ලැබුවහොත්, එම විකුණුම දේශීය විදේශ විනිමය වෙළෙඳපොලට එකතු වීම මගින් ද්‍රවශීලතාව වර්ධනය වේ. එමෙන්ම, බලයලත් වෙළෙන්දකු වෙත විකුණනු ලබන විදෙස්ගත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ, සංචාරක ඉපැයීම් සහ විදේශ ආයෝජන ප්‍රවාහයන් වැනි අනෙකුත් විදේශ විනිමය ගලාඒම් මගින් ද දේශීය වෙළඳපොල ද්‍රවශීලතාවය වර්ධනය වේ. ගනුදෙනුකරුවන්ගේ ජංගම හා ප්‍රාග්ධන ස්වභාවයේ විවිධ වූ විදේශ විනිමය අවශ්‍යතාවන් සපුරාලීමට අවශ්‍ය බැවින්, බැංකු පද්ධතිය මගින් මෙසේ මිල දී ගනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ඒ සඳහා භාවිතා කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ ව්‍යවහාර වෙළෙඳපොලෙන් විදේශ විනිමය මිල දී ගැනීම මගින් සිය සංචිත ගොඩනගා ගැනීම සිදු කරයි. අපනයන ඉපැයීම් වල ඇති ප්‍රධානතම ප්‍රතිලාභය නම් ඒවා ගෙවුම් ශේෂය මත පීඩනයක් ඇති නොකරන, ණය නොවන විදේශ විනිමය ගලා ඒම් වීමයි.

මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාව තුළට ගෙන ඒම සම්බන්ධයෙන් දැනට පනතින රීති (රීති)

ශ්‍රී ලංකා රුපියලේ ස්ථාවරත්වය බිඳවැටීමට හේතු විය හැකි ජාත්‍යන්තර සංචිතවල සිදුවේයැයි අපේක්ෂාකල බරපතල පහත වැටීම සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවතින තත්ත්වය ආරක්ෂා කර ගැනීම සඳහා, අපනයන ඉපැයීම් රටතුලට ගෙන්වා ගැනීම සහ ඒවා

1 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී බැංකුවක්

රුපියල් බවට පරිවර්තනය කිරීමට අදාල රීති හඳුන්වාදීම ඇතුළු අවශ්‍ය ප්‍රතිපත්ති හඳුන්වාදීමට මුදල් නීති පනතේ ප්‍රතිපාදන යටතේ කඩිනම් පියවර ගන්නා ලදී (සංඛ්‍යා සටහන වි.ස. 7.1).

පවතින රීති ප්‍රකාර ව (සංඛ්‍යා සටහන වි.ස. 7.1), අපනයනය කල සියලු භාණ්ඩ හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට සපයනු ලැබූ සියලුම සේවා වෙනුවෙන් නැව්ගත දිනයේ සිට හෝ සේවාව සපයා දුන් දිනයේ සිට දින 180 ක් ඇතුළත අපනයන

සංඛ්‍යා සටහන වි.ස. 7.1

1949 අංක 58 දරන මුදල් නීති පනතේ ප්‍රතිපාදන යටතේ නිකුත් කරන ලද රීති

රීතිය	මූලික අංග
2021.02.18 දින නිකුත් කරන ලද 2021 අංක 1 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාව වෙත රැගෙන ඒමේ රීති.	▪ නැව්ගත කළ දින සිට දින 180 ක් ඇතුළත සියලුම අපනයන කළ භාණ්ඩ වලට අදාල අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම. ▪ එම අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ලද විගස එම ඉපැයීම් වලින් 25% ක් ශ්‍රී ලංකා රුපියල් වල ට පරිවර්තනය කිරීම.
2021.03.09 දින නිකුත් කරන ලද 2021 අංක 2 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති.	▪ අපනයන ඉපැයීම් ලද දින සිට දින 14 ක කාලයක් ඇතුළත එම මුළු අපනයන ඉපැයීම් වලින් 25% ක් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම.
2021.04.09 දින නිකුත් කරන ලද 2021 අංක 3 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති.	▪ අපනයන ඉපැයීම් ලද දින සිට දින 30 ක කාලයක් ඇතුළත එම මුළු අපනයන ඉපැයීම් වලින් 10% ක් ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කිරීම.
2021.05.28 දින නිකුත් කරන ලද 2021 අංක 4 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති.	▪ අපනයන ඉපැයීම් ලද දින සිට දින 30 ක කාලයක් ඇතුළත එම මුළු අපනයන ඉපැයීම් වලින් 25% කට නොඅඩු අගයක් ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කිරීම.
2021.10.28 දින නිකුත් කරන ලද 2021 අංක 1, 2, 3 සහ 4 අහෝසි කරමින් නිකුත් කරන ලද අංක 5 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති.	▪ ශ්‍රී ලංකාවෙන් අපනයන කරන ලද භාණ්ඩ හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් වන අපනයන ඉපැයීම්, එම අදාල භාණ්ඩ නැව්ගත කළ දින සිට හෝ සේවාව සැපයූ දින සිට දින 180 ක් ඇතුළත අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකාවට ගෙන්වා ගත යුතු ය. ▪ ශ්‍රී ලංකාවට ලැබෙන අපනයන ඉපැයීම්, අවසරලත් ගෙවීම් සඳහා පමණක් භාවිතා කිරීමෙන් අනතුරුව, ශේෂය අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කිරීම.
2022.03.11 දින නිකුත් කරන ලද 2021 අංක 5 දරන රීති අහෝසි කරමින් 2022 අංක 1 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති.	▪ ශ්‍රී ලංකාවෙන් අපනයන කරන ලද භාණ්ඩ හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් වන අපනයන ඉපැයීම්, එම අදාල භාණ්ඩ නැව්ගත කළ දින සිට හෝ සේවාව සැපයූ දින සිට දින 180 ක් ඇතුළත අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකාවට ගෙන්වා ගත යුතු ය. ▪ ශ්‍රී ලංකාවට ලැබෙන අපනයන ඉපැයීම්, අවසරලත් ගෙවීම් සඳහා පමණක් භාවිතා කිරීමෙන් අනතුරුව, ශේෂය අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කිරීම. ▪ දේශීය සැපයුම්කරුවන්ට අවසරලත් ගෙවීම් සිදු කිරීම සහ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා මෙම නීතිය අදාල වීමෙන් නිදහස් කිරීම.
2022.08.12 දින 2022 අංක 1 දරන රීති සංශෝධනය කරමින් නිකුත් කරන ලද 2022 අංක 2 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති.	▪ සේවා අපනයන සම්බන්ධයෙන් වන අපනයන ඉපැයීම් පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවය ඉවත් කිරීම

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉපැයීම් ශ්‍රී ලංකාව වෙත ලබාගැනීම අනිවාර්ය වේ. තවදුරටත්, සිය ව්‍යාපාරයේ විදේශ ව්‍යවහාර මුදල් අවශ්‍යතා සඳහා ඉඩ ලබාදෙමින්, අවසරලත් ගෙවීම් වෙනුවෙන් පමණක් අපනයන ඉපැයීම් භාවිතා කිරීමෙන් පසු ශ්‍රී ලංකාවට ලැබුණු එම ඉපැයීම්වල ශේෂය ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අපනයන ඉපැයීම් සිදු කරන ලබාගන්නා සෑම භාණ්ඩ අපනයනකරුවෙකු වෙතම අනිවාර්ය[2] කර ඇති අතර එමගින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොලෙහි ද්‍රවශීලතාවය වෙත ක්ෂණික බලපෑම් ඇති වේ. අපනයනයක අදාල ජංගම ගනුදෙනු සඳහා වන බාහිර ප්‍රේෂණ, සංචාරක අරමුණු සඳහා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු ගැනීම් හෝ මුදල් මාරු කිරීම්, ණය සේවාකරණ වියදම් හා අවසරලත් ණය ආපසු ගෙවීම්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා සිදුකරණ ආයෝජන, දේශීය සැපයුම්කරුවන්ට කරනු ලබන අවසරලත් ගෙවීම්, අනේවාසික ආයෝජකයන් හට කරනු ලබන ලාභාංශ ගෙවීම්, ප්‍රවාසික ශ්‍රමිකයන් හට කරනු ලබන වැටුප් ගෙවීම් සහ භාණ්ඩ හා සේවා අපනයනයට අදාලව මාසයක කාලයක් ඇතුළත සිදුකල යුතු ගෙවීම්, අවසරලත් ගෙවීම් වේ.

2 අවසරලත් ගෙවීම සඳහා අපනයන ආදායම භාවිතා කිරීමෙන් පසු අපනයනකරුවන් විසින් දෛනික ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා වන දේශීය මුදල් අවශ්‍යතා සඳහා අපනයන ආදායම පරිවර්තනය කරන අතර අපනයන ආදායමේ ශේෂය එළඹෙන මස 07 වන දින හෝ ඊට ප්‍රථම අනිවාර්යයෙන්ම රුපියල් බවට පත්කළ යුතු ය.

සංඛ්‍යා සටහන වි.ස. 7.2

තෝරාගත් රටවල අපනයන ඉපැයීම් රැගෙන ඒම හා පරිවර්තනය කිරීමට අදාල ප්‍රධාන විදේශ විනිමය රෙගුලාසි.

රට	අපනයන ආදායම රටට ගෙන ඒමේ අවශ්‍යතාවය	භාණ්ඩ/සේවා අපනයන සඳහා යෙදීම	පරිවර්තන අවශ්‍යතාවය
ඉන්දියාව	මාස 15 ක් තුළ	භාණ්ඩ හා සේවා සඳහා	විදේශ විනිමය උපයන්නන් හට ඔවුන්ගේ විදේශ විනිමය ඉපැයීම්වලින් 100% ක් විදේශ මුදල් ගිණුමකට බැර කිරීමට හැකියාව ඇත. අනුමත අරමුණ හෝ ඉදිරි වගකීම් සඳහා ශේෂයන් භාවිතා කිරීමෙන් පසු ගිණුමේ ඇති උපචිත අගය ඊළඟ මාසයේ අවසාන දිනයේ හෝ ඊට පෙර රුපියල් බවට පරිවර්තනය කළ යුතු ය.
බංගලාදේශය	මාස 7 ක් ඇතුළත	භාණ්ඩ හා සේවා සඳහා	ඉහළ ආනයනය අන්තර්ගතයක් සහිත නිමි ඇඳුම් හා අනෙකුත් භාණ්ඩ අපනයනයෙන් 85% ක් සහ අනෙකුත් වෙළෙඳ භාණ්ඩ හා සේවා අපනයනයෙන් ලැබෙන ආදායමෙන් 40% ක් පරිවර්තනය කළ යුතු ය.
පකිස්තානය	මාස 6 ක් ඇතුළත	භාණ්ඩ හා සේවා සඳහා	භාණ්ඩ අපනයන ලැබීම් වලින් 85%-98% සහ සේවා අපනයන ලැබීම් වලින් 65% ක්.
මැලේසියාව	අපනයන ලැබීම් මැලේසියන් රිංගිට් 200,000 ට නොඉක්මවන්නේ නම් මාස 24 ක් තුළ සහ එසේ නොවන අවස්ථාවල දී මාස 6 ක් තුළ	භාණ්ඩ පමණි	2021 අප්‍රේල් මස සිට අපනයනකරුවන්හට ඔවුන්ගේ විදේශ මුදල් ප්‍රධාන අවශ්‍යතා අනුව අපනයන ආදායම පරිවර්තනය කිරීම කළමනාකරණය කළ හැකිය. 2018ට පෙර අපනයන ඉපැයීම් වලින් 75% ක් පරිවර්තනය කළ යුතු ව තිබුණි.
තායිලන්තය	වසරක් තුළ දී	භාණ්ඩ හා සේවා සඳහා	ඩොලර් මිලියනයකට හෝ ඊට වැඩි මුදලකට සමාන අපනයන ආදායමක් ආපසු රටට ගෙන්වා ගත යුතු අතර ලැබුණු වහාම එය තායි බාත් බවට පරිවර්තනය කළ යුතු ය.
තුර්කිය	දින 180 ක් තුළ	භාණ්ඩ පමණි	අපනයන ආදායමෙන් අවම වශයෙන් 80%ක් බැංකුවකට විකිණීමට අවශ්‍ය වේ.

මූලාශ්‍රයන්: ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විනිමය විධිවිධාන සහ විනිමය සීමා කිරීම් පිළිබඳ 2020 වාර්ෂික වාර්තාව සහ අදාළ මහ බැංකු වෙබ් අඩවි

දේශීය විදේශ විනිමය වෙළෙඳපොලේ වර්ධනයන් සැලකිල්ලට ගෙන, මෙකී රීති මගින් පනවා ඇති පරිවර්තන අවශ්‍යතා අඛණ්ඩව සමාලෝචනය කර සංශෝධනය කෙරේ.

අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම දැඩි ලෙස අධීක්ෂණය කිරීම, ගෙන්වා ගැනීමෙන් නියමිත කාල සීමාව තුළ ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය සිදු වන බවට සහතික කිරීම සහ අදාල භාණ්ඩ/සේවා අපනයනයට සම්බන්ධව අවසරලත් ගෙවීම් පමණක් සිදුවන බවට තහවුරු කිරීම, දැනට පවත්නා රීතීන්ට අනුව බලයලත් වෙළෙඳුන් විසින් සිදු කලයුතු වේ. වර්තමානයේදී, අපනයන ආදායම ගෙන්වා ගැනීම සහ එම ආදායම් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය සම්බන්ධ කාලානුරූපී තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත: අත් හුරුවෙන් වාර්තා කරනු ලබන අතර, තෛතික විධිවිධානවලට පූර්ණ සහ දැඩි ලෙස අනුකූල වීම සහතික කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් විසින් සපයන ලද වාර්තා විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂා කරනු ලබයි. රීතිවල ප්‍රතිපාදනයන්ට අනුව අපනයනකරුවන් සහ බලයලත් වෙළෙඳුන්ගේ අනනුකූලතාවන් අධීක්ෂණය කිරීමට සහ ඊට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට රීති මගින් බලය ලබා දී ඇත.

ඒ අනුව, සියලුම බලයලත් වෙළෙඳුන්, අපනයන ආදායම ආපසු ගෙන්වා ගැනීම සහ එය පරිවර්තනය කිරීම පිළිබඳ පහත සඳහන් මාසික තොරතුරු ඊළඟ මාසයේ 15 වැනිදා හෝ ඊට පෙර විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

- ශ්‍රී ලංකාවෙන් පිටතට සපයනු ලබන සියලුම භාණ්ඩ සහ/හෝ සේවා වලට අදාලව නැව්ගත කළ හෝ සේවා සැපයීමේ දිනයේ සිට දින 180 ක් ඇතුළත අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම්.
- අවසර ලත් ගෙවීම් සඳහා භාවිතා කිරීමෙන් පසුව ඉතිරි වන අපනයන ඉපැයුම් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම්.
- දින 180 ක් ඇතුළත ගෙන්වා ගනු ලැබූ භාණ්ඩ අපනයන ඉපැයීම් වලින් කරනු ලැබූ අවසරලත් ගෙවීම් සහ ඒවාට අදාල තොරතුරු.
- අපනයන ඉපැයීම් වලින් දේශීය සැපයුම්කරුවන්ට විදේශ මුදලින් සිදු කරන අවසර ලත් ගෙවීම් සහ ඔවුන්ගේ ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම්.
- අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම පිළිබඳ රීතිවල අවශ්‍යතාවයට අනුකූලව නැව්ගත කළ දින සිට හෝ

5

සේවා සැපයීමේ දින සිට දින 180 ක් ඇතුළත ගෙන්වා නොගත් අපනයන ඉපැයීම්.

- නැවිගත කළ දින සිට හෝ සේවා සැපයීමේ දින සිට දින 180 ඉක්මවා ගොස් අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම් සහ ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම්.

රීතිවලට අනුකූල වීම අධීක්ෂණය කිරීම

බලයලත් වෙළෙඳුන් විසින් මාසිකව වාර්තා කරනු ලබන තොරතුරු මත පදනම්ව, භාණ්ඩ නැවිගත කළ දින සිට හෝ සේවා සැපයීමේ දින සිට දින 180 ක් ඇතුළත අපනයන ඉපැයීම් ගෙන්වා නොගත් අපනයනකරුවන්ගෙන් ඒ සඳහා පැහැදිලි කිරීම් ලබා දෙන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ඉල්ලා සිටී. එම පිළිතුරු මත පදනම්ව, අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ රීතිවලට අනුකූල නොවන අපනයනකරුවන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමේ හැකියාව පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සලකා බලනු ලැබේ. තවද, අවසර ලත් ගෙවීම් සඳහා අපනයන ඉපැයීම් භාවිතා කිරීම දැඩි ලෙස අධීක්ෂණය කරනු ලබන අතර, රීති මගින් අවසර ලබා දී ඇති ගෙවීම් සඳහා පමණක් බලයලත් වෙළෙඳුන් විසින් අවකාශ සැලසීම පිළිබඳ සහතික කර ගැනීම සඳහා බලයලත් වෙළෙඳුන් වෙතින් විමසීම් සිදු කරනු ලැබේ.

අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම සහ ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම මාසිකව අධීක්ෂණය කිරීමට අමතරව, තෝරාගත් අපනයනකරුවන්ගෙන් සෘජුවම තොරතුරු ලබා ගැනීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම සහ ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම පිළිබඳව විමර්ශන සිදු කරයි. මෙමගින් බලයලත් වෙළෙඳුන් විසින් වාර්තා කරන ලද තොරතුරු සත්‍යාපනය කිරීමට සහ දත්ත වාර්තා කිරීම විධිමත් කිරීමට පහසුකම් සලසා දීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ලැබී ඇත. අපනයන ඉපැයීම් භාවිතා කිරීම සහ ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම රීතිවලට අනුකූල බව සහතික කර ගැනීම උදෙසා බලයලත් වෙළෙඳුන් විසින් ලබා දී ඇති විදේශ මුදල් ණය, දේශීය සැපයුම්කරුවන්ට සිදු කරන ගෙවීම්, දේශීය සැපයුම්කරුවන් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම් ආදිය පිළිබඳ විශේෂ විමර්ශන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබයි.

තවද, පවතින රීති පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සහ ඒවාට දැඩි ලෙස අනුකූල වීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපනයනකරුවන් සමඟ තනි තනිව පවත්වන රැස්වීම්, අපනයන අංශ අනුව පවත්වන රැස්වීම්, අනුකූලතා නිලධාරීන් සමඟ රැස්වීම් සහ අපනයන අංශයේ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පවත්වනු ලබයි.

කාලානුරූපී රීති පැනවීම සහ ඒ සමඟ කරනු ලබන දැඩි අධීක්ෂණය හේතුවෙන් 2021 ඔක්තෝම්බර් මාසයේ සිට අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීමේ කැපී පෙනෙන දියුණුවක් ඇති විය (රූප සටහන වි.ස. 7.1). 2022 වසර තුළ වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම එක්සත් ජනපද ඩොලර් මිලියන 17,755.8 ක් වූ අතර එහිදී භාණ්ඩ අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම එක්සත් ජනපද ඩොලර් මිලියන 14,595.7 ක් ලෙස සහ සේවා අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම එක්සත් ජනපද ඩොලර් මිලියන 3,160.1 ක් ලෙස සටහන් විය. 2022 වසර සඳහා වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන වටිනාකම එක්සත් ජනපද ඩොලර් මිලියන 16,168.8 ක් විය.

මේ අතර, 2022 වර්ෂය තුළ වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනයට අදාළව ගෙන්වා ගත් අපනයන ඉපැයීම්වල මාසිකව ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ එකතුව ප්‍රතිශතයක් ලෙස 20.6%-28.5% අතර පරාසයක පවතී (රූප සටහන වි.ස. 7.2 සහ රූප සටහන වි.ස. 7.3). අවසර ලත් ගෙවීම් සඳහා අපනයන ඉපැයීම් භාවිතා කිරීම පිළිබඳ අවධානයෙන් නිරීක්ෂණය කිරීම, වසරේ අග භාගයේදී අපනයන ඉපැයීම් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම ක්‍රමානුකූලව වැඩි වීමට හේතු විය. වෙළඳ භාණ්ඩ අපනයන ඉපැයීම් වලින් එක්සත් ජනපද ඩොලර් මිලියන 3,614.6 ක් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම සහ සේවා අපනයනය ඉපැයීම් මගින් එක්සත් ජනපද ඩොලර් මිලියන 605.6 ක් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම ඇතුළත්ව 2022 වසර සඳහා වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනවලින් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන ලද මුළු වටිනාකම එක්සත් ජනපද ඩොලර් මිලියන 4,220.2 කි.

රූප සටහන වි.ස. 7.1
අපනයනය, නැවත ගෙන්වා ගැනීම සහ භාණ්ඩ අපනයන ඉපැයීම් පරිවර්තනය කිරීමේ ප්‍රවණතා



රූප සටහන වි.ස. 7.2
භාණ්ඩ අපනයන ඉපැයීම් නැවත ගෙන්වා ගැනීම සහ පරිවර්තනය කිරීමේ ප්‍රවණතා: ජනවාරි - දෙසැම්බර් 2022



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන වි.ස. 7.3
සේවා අපනයන ඉපැයීම් ආපසු ගෙන්වා ගැනීමේ සහ පරිවර්තනය කිරීමේ ප්‍රවණතා: ජනවාරි - දෙසැම්බර් 2022



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

අපනයන ඉපැයීම් අධීක්ෂණය පද්ධතිය (Export Proceeds Monitoring System - EPMS)

අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම් කාර්යක්ෂම ව අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්, තොරතුරු තාක්ෂණය මත පදනම් වූ ස්වයංක්‍රීය අධීක්ෂණ පද්ධතියක් ලෙස අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතිය (EPMS) 2022 ජූනි මස හඳුන්වා දෙන ලදී. අපනයන ඉපැයීම් නියමිත කාලසීමාව තුළ ගෙන්වා ගැනීම් සහ අපනයන ඉපැයීම් දේශීය ව්‍යවහාර මුදල්වලට පරිවර්තනය කිරීම අධීක්ෂණය කිරීම මගින්, රීතින් හඳුන්වාදීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙම පද්ධතිය පහසුකම් සපයනු ලබයි. අත් හුරුවෙන් දත්ත සැකසීම් සහ විවිධ අදියරවල දී දත්ත ඇතුළත් කිරීම් ද්විත්වකරණය වීම අවම කිරීම මගින්, වාර්තා කිරීමේ සහ අධීක්ෂණයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම මෙම පද්ධතිය මගින් බලාපොරොත්තු වේ.

මෙම පද්ධතියේ ප්‍රධාන සහභාගිකරුවන් තිදෙනා වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව සහ බලයලත් වෙළෙඳුන් ය. රටින් නැව්ගත කරන සෑම අපනයනකට ම අදාල තොරතුරු ශ්‍රී ලංකා රේගුව විසින් සපයන අතර එම අපනයනවලට අදාල ඉපැයීම් ගෙන්වා ගැනීම් සහ පරිවර්තනය කිරීම්වලට අදාල තොරතුරු බලයලත් වෙළෙඳුන් විසින් මෙම පද්ධතියට ලබාදෙනු ලැබේ (රූප සටහන වි.ස. 7.4). ඒ අනුව, ඉදිරියේ දී අපනයන පිළිබඳ වඩාත් නිවැරදි තොරතුරු ලබා ගැනීමට හැකිවනු ඇත. නියමිත කාල සීමාව තුළ අපනයන ඉපැයීම් ගෙන්වා නොගැනීම අනාවරණය කරගැනීම මගින් එවැනි අපනයකරුවන්ට එරෙහි ව ක්‍රියාමාර්ග ගැනීමට ද මෙම පද්ධතිය මගින් පහසුකම් සලසනු ඇත.

2022 ජූනිවල දී පද්ධතිය හඳුන්වාදීමේ සිට එහි විකාශය අඛණ්ඩව සිදු වී ඇති අතර බලයලත් වෙළෙඳුන් විසින් අපනයන ප්‍රේෂණවලට අදාල රේගු නිෂ්කාශන ලියවිලි මත පදනම් වූ දත්ත උඩුගත කිරීමේ දී ඇති වූ දෝෂ වැනි

5

රූප සටහන වි.ස. 7.4
EPMS පිළිබඳ දළ විශ්ලේෂණය

වෙබ් සේවාවන් හරහා භාණ්ඩ අපනයනයට අදාළ සියලුම තොරතුරු ග්‍රහණය කර ගැනීම.

රීතිය අනුව ලද අපනයන ආදායම EPMS හරහා ගැලපීම. හඳුනාගැනීමේ ලේඛනය වන්නේ CUSDEC (Custome Declaration)

බලයලත් වෙළෙඳුන් CUSDECs තොරතුරු අනුව ප්‍රේෂණ ගලපා උඩුගත කරනු ඇත. ඒ. වෙ. සතුව නැවත මෙරටට අපනයන ආදායම ගෙන්වා නොගත් අපනයනකරුවන් පිලිබඳ තොරතුරු ඇති අතර ඔවුන් සඳහා රීතිය තුළ ගෙන ඇති ක්‍රියාමාර්ග දැනුම් දෙනු ලබයි.

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

ඇතැම් තාක්ෂණික දෝෂ සාර්ථකව නිරාකරණය කරන ලදී. වර්තමානයේ දී, අපනයනකරුවන් හා බලයලත් වෙළෙඳුන් සම්බන්ධ කරන තොරතුරු තාක්ෂණ විසඳුම් වැඩි දියුණු කිරීම් සිදුකරමින් පවතින අතර එමගින් තොරතුරු සැපයීම් තවදුරටත් සරල වනු ඇත.

ඒ අනුව, රේගු නිෂ්කාෂණ ලියවිලිවලට එදිරි ව අපනයන ලැබීම් වල තොරතුරු ලැබීම් හා ගැලපීම් අතර තිබූ බාධාවන්, විශේෂයෙන්ම විවෘත ගිණුමවලට අදාල ගනුදෙනුවල තිබූ බාධාවන් අවම වනු ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව සහ බලපත්‍රලාභී වෙළෙඳුන් සම්බන්ධ, අදාල තොරතුරු ඇතුළත් ජාතික පද්ධතියක් ගොඩනැගීම හරහා, අනාගතයේ දී මෙම පද්ධතිය විසින් අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම් අධීක්ෂණ යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාවය වර්ධනය කෙරෙනු ඇති අතරම, අපනයන ඉපැයීම් රට තුළට ගෙන්වා ගැනීම් වර්ධනය කෙරෙනු ඇත.

මෙම පද්ධතිය හරහා සිදුකරන ලද අපනයන ගනුදෙනුවල අධීක්ෂණ හා පසු විපරම් පිළිබඳ සාර්ථකත්වය සාක්ෂාත් කරගැනීමට හැකිවනු ඇත්තේ පද්ධතියේ සියලු පාර්ශවවල ඵලදායී සහයෝගිතාවය මත පමණි. එබැවින්, මෙම පද්ධතියේ සැම සහභාගිකරුවකුගේ ම වගකීම වනුයේ මෙම ජාතික ප්‍රයත්නය සාර්ථක කර ගැනීම උදෙසා කටයුතු කිරීම ය.

මූලාශ්‍ර

1. ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා
2. අපනයනය නැවත මෙරටට ගෙන්වා ගැනීමේ රීති

(Documents against Acceptance - DA), ගෙවීම් මත ලේඛන (Documents against Payment - DP) වැනි ගෙවීම් ක්‍රම භාවිතය සඳහා සීමා හඳුන්වා දෙන ලදී. ඒ අනුව, 2022 වසරේ මැයි මස 20 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඍජු සහ වක්‍ර අපනයනකරුවන් සඳහා පමණක් විවෘත ගිණුම්/භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම මත ආනයනය කිරීමට අවසර ලබා දී ඇති අතර, අපනයන සඳහා යොදා ගන්නා ආනයන ද්‍රව්‍යවලට හැර අනෙකුත් ආනයනය සඳහා පිළිගැනීම මත ලේඛන සහ ගෙවීම් මත ලේඛන භාවිත කිරීම, බලපත්‍රලාභී බැංකු සමඟ පූර්ව සැලසුම් කිරීම් යටතේ පමණක් සිදු කිරීමට අවසර ලබා දෙන ලදී. මෙවැනි ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය ආනයන සඳහා බැංකු පද්ධතිය වෙතින් විදේශ විනිමය ලබා ගැනීමේ හැකියාව කළමනාකරණය කිරීමට උපකාරී විය. කෙසේ වෙතත්, එවැනි සීමා හේතුවෙන් දේශීය වෙළඳපොළෙහි ඇති විය හැකි අත්‍යවශ්‍ය ආහාර සහ අමුද්‍රව්‍ය හිඟය සැලකිල්ලට ගනිමින්, 2022 වසරේ ජුනි මාසයේ සිට තෝරාගත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහ දේශීය නිෂ්පාදන සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීමට හැකිවන පරිදි ආනයන සීමා ලිහිල් කිරීම් කිහිපයක් හඳුන්වා දෙන ලදී. විදේශ විනිමය ලබා ගැනීමේ හැකියාව සහ විනිමය අනුපාතිකය මත පීඩනය තවදුරටත් වර්ධනය වීම සැලකිල්ලට ගනිමින්, 2022 වසරේ අගෝස්තු මාසයේ දී තෝරාගත් පාරිභෝගික සහ ආයෝජන භාණ්ඩ ප්‍රධාන වශයෙන් ඉලක්ක කර ගනිමින් තාවකාලික ආනයන අත්හිටුවීම් හරහා රජය තවදුරටත් ආනයන සීමා පැනවූ නමුත්, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී ආනයන සීමා ලිහිල් කිරීම් කිහිපයක් සිදු කිරීම මගින් එවැනි සීමාවල කාර්යක්ෂමතාව අඩු විය. කෙසේ වූවත්, 2022 වසර තුළ විදේශීය අංශයෙහි පීඩනයන් පාලනය කිරීමේ දී මෙම ක්‍රියාමාර්ග ඉතා වැදගත් විය.

2022 වසර තුළ විදේශීය අංශය වෙත ආයතනික සහයෝගය වර්ධනය කිරීම සඳහා පියවර කිහිපයක් ගනු ලැබීය. අපනයන සංවර්ධන මණ්ඩලය 2018-2022 යන කාලපරිච්ඡේදය සඳහා වන ජාතික අපනයන ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව ඉදිරියට ගෙන ගිය අතර, ජාතික අපනයන ක්‍රමෝපායෙහි ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පාර්ශ්වකරුවන් අතර සම්බන්ධීකරණයක් නොමැතිකම සහ ඒ සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය වෙත බලය නොමැති වීම වැනි එම ක්‍රමෝපායන් වේගවත් ක්‍රියාකාරීත්වයට බාධා ඇති කෙරෙන අවහිරතාවලට පිළියම් සෙවීය. ඒ අනුව, 2027 වසර වන විට ජාතික අපනයන ක්‍රමෝපායෙහි අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා වත්මන් ප්‍රවණතා සමඟ අනුගත වීමට අවශ්‍ය වෙනස්කම් හඳුන්වා දීම සඳහා ජාතික අපනයන ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය නැවත සමාලෝචනය කිරීමට අපේක්ෂා කෙරේ. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මාර්ගගත සහ භෞතික ප්‍රවර්ධන ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කළ අතර, අපනයනකරුවන් සඳහා වෙළඳ තොරතුරු සහ වෙළඳපොළ ආශ්‍රිත දැනුම ලබා දුන්නේය. වාණිජ මණ්ඩලයන් ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ ගැටලු නිරාකරණයේ දී රාජ්‍ය හා පෞද්ගලික අංශවල පාර්ශ්වකරුවන් සම්බන්ධ කරවීමට උපකාර කළ අතර, අපනයනකරුවන් අගය කිරීම සහ අපනයන සම්මාන උළෙල පැවැත්වීම මගින් අපනයන ප්‍රවර්ධනය සඳහා ද දායක විය. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ජාතික ප්‍රමිතීන් සම්පාදනය සහ යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් ක්‍රියාත්මක කළේය. මෙහිදී, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් 2022 වසරේ දී ප්‍රමිති 204ක් ප්‍රකාශයට පත් කර ඇති අතර, ප්‍රමිති 128ක්

5.7 සංඛ්‍යා සටහන

ශ්‍රී ලංකාව වරණීය වෙළඳ ගිවිසුම් යටතේ සිදු කළ අපනයන

වරණීය වෙළඳ ගිවිසුම	2021	2022 (අ)			ප්‍රධාන අපනයන නිෂ්පාදන (අපනයන ප්‍රමාණ අනුව අනුපිළිවෙලින්)
	වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන)	වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන)	වර්ධනය (%)	දායකත්වය (%)	
වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී.)	4,312.6	4,314.7	0.05	81.4	ඇඟලුම්, රබර් නිෂ්පාදිත, තේ, ආහාර, පාන වර්ග හා දුම්කොළ, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, මුහුදු ආහාර
එයින් යුරෝපා සංගමය (ජී.එස්.පී. ප්ලස් සහිතව) (ආ)	2,402.1	2,440.3	1.6	46.0	ඇඟලුම්, රබර් නිෂ්පාදිත, තේ, ආහාර, පාන වර්ග හා දුම්කොළ, මුහුදු ආහාර, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ
ඇමෙරිකා එක්සත් ජනපදය (ඇ)	677.8	719.0	6.1	13.6	ඇඟලුම්, රබර් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත
එක්සත් රාජධානිය	680.7	659.0	-3.2	12.4	ඇඟලුම්, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, මුහුදු ආහාර, තේ
රුසියානු සම්මේලනය (ඇ)	132.9	125.7	-5.4	2.4	තේ, රබර් නිෂ්පාදිත, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, ඇඟලුම්, මුහුදු ආහාර
ඕස්ට්‍රේලියාව	103.5	97.0	-6.2	1.8	ඇඟලුම්, රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, තේ, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත
කැනඩාව	87.9	86.2	-2.0	1.6	ඇඟලුම්, රබර් නිෂ්පාදිත, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, මුහුදු ආහාර
ජපානය	87.6	80.7	-7.9	1.5	තේ, මුහුදු ආහාර, ආහාර, පාන වර්ග හා දුම්කොළ, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත
තුර්කිය	74.1	45.3	-38.8	0.9	තේ, රබර් නිෂ්පාදිත, ඇඟලුම්, රසායනික නිෂ්පාදිත, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත
වෙනත් ජී.එස්.පී. ක්‍රම	66.1	61.6	-6.8	1.2	
ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) 2000 වසරේ සිට ක්‍රියාත්මකයි	525.8	561.5	6.8	10.6	සත්ත්ව ආහාර, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, ඇඟලුම්, දැව හා කඩදාසි නිෂ්පාදිත
ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) (ඉ) 1975 වසරේ සිට ක්‍රියාත්මකයි	238.6	228.4	-4.3	4.3	ඇඟලුම්, තේ, රසායනික නිෂ්පාදිත, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත
ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP) 1989 වසරේ සිට ක්‍රියාත්මකයි	91.8	62.5	-32.0	1.2	කුළුබඩු, සත්ත්ව ආහාර, පොල් මද ආශ්‍රිත නොවන / මද ආශ්‍රිත නිෂ්පාදිත, මූල ලෝහ හා උපාංග
පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) 2005 වසරේ සිට ක්‍රියාත්මකයි	62.3	56.6	-9.0	1.1	සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත, ස්වාභාවික රබර්, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත
දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) 2006 වසරේ සිට ක්‍රියාත්මකයි	101.6	75.2	-26.0	1.4	කුළුබඩු, මූල ලෝහ හා උපාංග, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත, ඇඟලුම්, රෙදිපිළි, රසායනික නිෂ්පාදිත
සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) 1995 වසරේ සිට ක්‍රියාත්මකයි	1.4	1.5	1.9	0.03	රබර් නිෂ්පාදිත, තේ, ස්වාභාවික රබර්, ආහාර, පාන වර්ග හා දුම්කොළ
වරණීය වෙළඳ ගිවිසුම් යටතේ මුළු අපනයන	**5,334.2**	**5,300.4**	**-0.6**	**100.0**	
ශ්‍රී ලංකාවේ මුළු වෙළඳ භාණ්ඩ අපනයනවලින් ප්‍රතිශතයක් ලෙස	**42.7**	**40.4**			

(අ) තාවකාලික

(ආ) යුරෝපා සංගමය මගින් ලබාදෙන ජී.එස්.පී. සහනය මගින් යුරෝපා සංගමයේ රටවල් වෙත ආනයනය කරන භාණ්ඩවලින් තීරු බදු අයිතම සියයට 66 කට වරණීය ප්‍රවේශය ලබා දෙන අතර යුරෝපා සංගමය මගින් ලබා දෙන ජී.එස්.පී. ප්ලස් සහනය මගින් යුරෝපා සංගමයේ රටවල් වෙත ආනයනය කරන එම තීරු බදු අයිතම සඳහාම තීරු බදු රහිත ප්‍රවේශයක් ලබා දේ.

(ඇ) එක්සත් ජනපදය මගින් ලබා දුන් ජී.එස්.පී. සහනය 2020 වසරේ දී අවසන් වූ බැවින් ජී.එස්.පී. සහනය ලැබීමට සුදුසු අපනයන පෙන්නුම් කරන අතර එය නැවත බලාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(ඈ) රුසියාව, බෙලාරුස් හා කසකස්ථානය ඇතුළත් වේ.

(ඉ) පෙරදී මෙය බැංකොක් ගිවිසුම (1975) ලෙස හඳුන්වන ලදී.

මූලයන්: වාණිජ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව

සංශෝධනය කරන ලදී. ආනයනික භාණ්ඩවල තත්ත්ව සහතික කිරීමේ ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් විදේශීය නිෂ්පාදකයින් සහ රසායනාගාර කිහිපයක් ලියාපදිංචි කරන ලද අතර, විවිධ නිෂ්පාදන සඳහා නව පර්යේෂණ පහසුකම් සහ පර්යේෂණ ක්‍රම සංවර්ධනය කරන ලදී. අභියෝගාත්මක වෙළඳපොළ වාතාවරණය මධ්‍යයේ, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම මගින් ද යම් ප්‍රමාණයකට සහාය ලබමින් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් රුපියල් බිලියන 70ක් පමණ වටිනා රක්ෂණය කිරීම් වාර්තා කරන ලදී. ජාතික තනි කවුළු පද්ධතිය තවමත් ක්‍රියාත්මක කර නොමැති බැවින්, ශ්‍රී ලංකා රේගුව රජයේ නියාමන ආයතන 15ක් පමණ රේගු දත්ත සඳහා වන ස්වයංක්‍රිය පද්ධතියට (ASYCUDA) ඒකාබද්ධ කර වෙළඳාම් කටයුතු සඳහා පහසුකම් සැලසීමට කටයුතු කළේය. මේ අතර, ලෝක වෙළඳ සංවිධානයෙහි වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුම ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමට

අදාළව, 2023 වසරේ ජනවාරි මාසය වන විට සියයට 70කට වැඩි සමස්ත ප්‍රගතියක් පෙන්නුම් කර ඇති අතර, මේ වෙනුවෙන් ශ්‍රී ලංකා රේගුව සිය ක්‍රියාකාරකම් තවදුරටත් විධිමත් කර ඇත. ශ්‍රී ලංකා රේගුවට අදාළ කරුණු විමර්ශනය කර වාර්තා කිරීම සඳහා 2021 වසරේ පෙබරවාරි මාසයේ දී පත් කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව සිය අවසන් වාර්තාව 2022 වසරේ ජූනි මාසයේ දී ජනාධිපතිතුමා වෙත භාර දෙන ලදී. වගකීම් බෙදා ගැනීමේ දී ශ්‍රී ලංකා රේගුවේ පරිපාලනමය හා මෙහෙයුම් ක්‍රියාවලීන් ඵලදායී සහ කාර්යක්ෂම අන්දමට සිදු කළ හැකි ආකාරය පිළිබඳ නිර්දේශ මෙම වාර්තාවට ඇතුළත් වේ.

2021 වසරට සාපේක්ෂව අපනයනවලින් ලැබුණු සමස්ත ආදායම වර්ධනය වුවද වරණීය වෙළඳාම් පිළිබඳ පොදු ක්‍රම (ජී.එස්.පී.) යටතේ ශ්‍රී ලංකාවේ අපනයන 2022 වසරේ දී නොවෙනස්ව පැවතීය. 2022 වසරේ දී ජී.එස්.පී. ක්‍රම තුළින් ශ්‍රී ලංකාව අඛණ්ඩව ප්‍රතිලාභ ලැබූ අතර, යුරෝපා සංගමය, ඇමෙරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය විසින් පිරිනමන ලද ජී.එස්.පී. පහසුකම ශ්‍රී ලංකාවේ සමස්ත වරණීය අපනයන ආදායමෙන් සියයට 72කට පමණ දායක විය. ශ්‍රී ලංකාව යුරෝපා සංගමයේ වත්මන් ජී.එස්.පී.+ වලංගු කාලසීමාව 2023 වසරේ දී අවසන් වන තෙක් ප්‍රතිලාභ අත්විඳිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, වත්මන් ජී.එස්.පී.+ යෝජනා ක්‍රමය මගින් ආවරණය වන සම්මුතීන් 27ට අමතරව, 2024 වසරේ ජනවාරි මස 01 දා සිට 2033 වසරේ දෙසැම්බර් මස 31 වන දින දක්වා කාල සීමාව සඳහා වන යුරෝපා සංගමයේ වසර 10ක නව යෝජනා ක්‍රමය තවත් ජාත්‍යන්තර සම්මුතීන් හයක් සමඟ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාව දැනටමත් මෙම නව සම්මුතීන් හය අනුමත කර ඇති බැවින් ජී.එස්.පී.+ සහනය සඳහා නැවත අයදුම් කළ හැකි තත්ත්වයක පවතී. යුරෝපා සංගමයේ ජී.එස්.පී.+ ප්‍රතිලාභියෙකු ලෙස ශ්‍රී ලංකාව 2021 වසර තුළ එක්සත් රාජධානියේ නව ගෝලීය තීරු බදු යෝජනා ක්‍රමය සහ 2022 වසර තුළ එක්සත් රාජධානියේ ජී.එස්.පී. යෝජනා ක්‍රමය යටතේ එක්සත් රාජධානිය වෙත තීරු බදු රහිත ප්‍රවේශය අඛණ්ඩව භුක්ති විඳින ලදී. කෙසේ වෙතත්, එක්සත් රාජධානිය සිය නව ජී.එස්.පී. යෝජනා ක්‍රමය වන 'සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළඳ යෝජනා ක්‍රමය (DCTS)' 2022 වසරේ අගෝස්තු මාසයේ දී හඳුන්වා දුන් අතර, එම යෝජනා ක්‍රමය 2023 වසරේ සිට ක්‍රියාත්මක වනු ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළඳ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දින සිට වසර 3ක් සඳහා එම ක්‍රමයෙහි වැඩිදියුණු කළ වරණීය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි. මීට අමතරව, රුසියානු සමූහාණ්ඩුව, ඕස්ට්‍රේලියාව, කැනඩාව, තුර්කිය, ස්විට්සර්ලන්තය, නෝර්වේ සහ නවසීලන්තය වැනි තවත් රටවල් කිහිපයක් විසින් පිරිනමනු ලබන ජී.එස්.පී. යෝජනා ක්‍රමවලින් ශ්‍රී ලංකාව අඛණ්ඩව ප්‍රතිලාභ ලබන නමුත් අපනයන සඳහා ඔවුන්ගේ දායකත්වය සාපේක්ෂව අඩු මට්ටමක පැවතුණි. ශ්‍රී ලංකාවේ අපනයන පදනම පහළ මට්ටමක පැවතීම සහ ජී.එස්.පී. යෝජනා ක්‍රමවල නිෂ්පාදන ආවරණය අඩු වීම හේතුවෙන් ශ්‍රී ලංකාවට එවැනි ජී.එස්.පී. යෝජනා ක්‍රමවල පූර්ණ ප්‍රතිලාභය ලබා ගැනීමට නොහැකි වී ඇත.

ද්විපාර්ශ්වික සහ කලාපීය වෙළඳ ගිවිසුම්වල කාර්යසාධනය 2022 වසරේ දී අතෘප්තිකර මට්ටමක පැවති අතර, 2018 වසරේ සිට ප්‍රගතියක් නොපෙන්වූ වෙළඳ සාකච්ඡා නැවත ආරම්භ කිරීමට ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ, ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්ථාන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) ශ්‍රී ලංකාවට අඛණ්ඩව ප්‍රතිලාභ ලබා දුන්නේය. ඉන්දියාව සහ පකිස්ථානය සමඟ නිදහස් වෙළඳ ගිවිසුම් හරහා සිදු කළ අපනයන 2022 වසරේ දී ඉහළ මට්ටමක පැවති අතර, මෙම රටවල් වෙත සිදු කරන ලද සමස්ත අපනයනවලින් ප්‍රතිශතයක් ලෙස, පිළිවෙළින්, සියයට 65ක් සහ සියයට 73ක් විය. මේ අතර, ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සහ පාකිස්ථාන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සිදු කළ ආනයන වසර තුළ අඛණ්ඩව පහළ මට්ටමක පැවති අතර, ඉන්දියාවෙන් සහ පකිස්ථානයෙන් සිදු කළ මුළු ආනයනවලින් ප්‍රතිශතයක් ලෙස, පිළිවෙළින්, සියයට 3ක් (එ.ජ. ඩොලර් මිලියන 119) සහ සියයට 4ක් (එ.ජ. ඩොලර් මිලියන 13) පමණ විය. මේ අතර, දැනට පවතින ඇඟලුම් මිලියන 8ක කෝටා සීමාව ඉවත් කිරීම හෝ එම කෝටාව තවදුරටත් ඉහළ නැංවීම ඇතුළුව, ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ගැටලු සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ඇතුළත් කරමින් වාණිජ දෙපාර්තමේන්තුව විසින් 2022 වසරේ දී තීරුබදු නොවන ක්‍රියාමාර්ග පිළිබඳ ලේඛනය යාවත්කාලීන කරන ලදී. චීනය වෙත සිදු කළ අපනයන පහළ යෑමෙන් ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA) යටතේ ද සහ මෙක්සිකෝව වෙත සිදු කළ කුරුඳු අපනයනය පහළ යෑමෙන් ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය

(GSTP) යටතේ ද වෙළඳාම පහළ යෑම හේතුවෙන්, 2022 වසරේ දී කලාපීය වෙළඳ ගිවිසුම් හරහා සිදු කළ වෙළඳාම පහළ ගියේය. 2022 වසරේ දී සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) යටතේ සිදු කළ අපනයන තවදුරටත් ඉතා අඩු අගයක පැවතුණ අතර, දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) යටතේ සිදු කළ අපනයන පහළ ගියේය. මෙම කරුණු මගින් කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්වය (RCEP) වැනි නව සහ පුළුල් කලාපීය හවුල්කාරිත්වයන්ට ඇතුළුත්වීමේ හැකියාව අවශ්‍යයෙන්ම සොයා බලන අතරම, පවතින කලාපීය ගිවිසුම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කලාපීය රටවල් සමඟ වෙළඳ සබඳතා ශක්තිමත් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමේ අවශ්‍යතාව පෙන්නුම් කරයි. 2018 වසරේ දී අත්සන් කළ ද අපේක්ෂා කළ පරිදි ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වූ සිංගප්පූරු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමේ (SLSFTA) සමාලෝචන ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා 2022 වසරේ දී නව පියවර ගන්නා ලදී. ඒ අනුව, සිංගප්පූරු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අරමුණින්, දැනට හඳුනාගෙන ඇති සංශෝධන පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා 2023 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී සිංගප්පූරුව සමඟ සමාලෝචන රැස්වීම් පැවැත්වීමට සැලසුම් කර ඇත. වෙළඳ ප්‍රතිපත්ති වෙනස්වීම්වල අනුකූලතාව නොමැතිවීම, තීරු බදු නොවන අනෙකුත් බාධක සහ නිෂ්පාදන විවිධාංගීකරණයක් නොපැවතීම වැනි සාධක දැනට පවතින ද්විපාර්ශ්වික සහ කලාපීය වෙළඳ ගිවිසුම් පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීමට බාධා කරයි. මේ අතර, තායිලන්තය (ශ්‍රී ලංකා-තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම-SLTFTA), චීනය (චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම-CSFTA) සහ ඉන්දියාව (ආර්ථික හා තාක්ෂණ සහයෝගිතා ගිවිසුම-ETCA) සමඟ විස්තීරණ ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා නැවත ආරම්භ කිරීමේ කටයුතු 2022 වසරේ දී අඛණ්ඩව සිදු විණි. තායිලන්තය සමඟ තුන්වන වටයේ සාකච්ඡා 2023 වසරේ ජනවාරි මාසයේ දී අවසන් වූ අතර, චීනය සහ ඉන්දියාව සමඟ තවත් සාකච්ඡා වට කිහිපයක් 2023 වසරේ පළමු භාගයේ දී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. 2022 වසරේ දී නිදහස් වෙළඳ ගිවිසුම් සම්බන්ධයෙන් සාකච්ඡා සිදු කිරීම සඳහා නව ජාතික වෙළඳ සාකච්ඡා කමිටුවක් පත් කර ඇත. මීට අමතරව, විශේෂයෙන්ම ඇඟලුම් ක්ෂේත්‍රයට අදාළව අනාගත වෙළඳ හැකියාවන් ඉහළ මට්ටමක පවතින ඉන්දුනීසියාව සහ බංගලාදේශය සමඟ වරණීය වෙළඳ ගිවිසුම්වලට එළඹීමට සාකච්ඡා සිදු කරමින් පවතී. ලෝක වෙළඳ සංවිධානයෙහි 12වන අමාත්‍ය මණ්ඩල සමුළුව 2022 වසරේ ජුනි මාසයේ දී ජිනීවාහි දී සාර්ථකව අවසන් කරන ලද අතර, එහිදී ඇති වූ බහුපාර්ශ්වික සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස තහවුරු වූ 'ජිනීවා යෝජනා මාලාව' තුළ ධීවර සහනාධාර පිළිබඳ යෝජනා බොහොමයක්, හදිසි අවස්ථා සම්බන්ධයෙන් ලෝක වෙළඳ සංවිධානයෙහි ක්‍රියාමාර්ග සහ ලෝක වෙළඳ සංවිධානය සඳහා වන ප්‍රතිසංස්කරණ ආදිය ඇතුළත් වේ.

5.2.2 සේවා ගිණුම

සේවා වෙළඳාම් ගිණුම, ප්‍රධාන වශයෙන් සංචාරක ඉපැයීම් ඉහළ යෑම හේතුවෙන්, පෙර වසරට සාපේක්ෂව, 2022 වසරේ දී ඉහළ අතිරික්තයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, භාණ්ඩ ප්‍රවාහන කිරීමේ සේවා සහ තොරතුරු තාක්ෂණය මත පදනම් වූ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සම්බන්ධ අංශ ඇතුළුව, සේවා ගිණුමෙහි අනෙකුත් බොහෝ උප අංශවලට වූ ලැබීම් සැලකිය යුතු අඩු වීමක් වාර්තා කළේය. මෙම ප්‍රවණතාවල ප්‍රතිඵලයක් ලෙස, සේවා ගිණුමේ අතිරික්තය 2021 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,586ට සාපේක්ෂව 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,110ක් විය.

විදේශ ගමන් සහ සංචාරක සේවා

සමාජ ආතතීන් ඉහළ යෑම මධ්‍යයේ පෙර නොවූ විරූ ආකාරයේ බාධාවීම්, ඉන්ධන හිඟය සහ අඛණ්ඩ විදුලිය සැපයුමක් සිදු නොවීම, විවිධ රටවල් විසින් ශ්‍රී ලංකාවේ සංචාරය අධෛර්යමත් කරමින් සිදුකළ සංචාරක උපදේශන ආදීය හේතුවෙන් සැලකිය යුතු බාධාවීම් ඇති වුවද, ශ්‍රී ලංකාවේ සංචාරක පැමිණීම් 2022 වසරේ දී ස්ථාවර ලෙස යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළේය. මෙම යථා තත්ත්වයට පත් වීම සඳහා ප්‍රධාන වශයෙන් ගෝලීය කෝවිඩ්-19 සඳහා එන්නත් කිරීමේ අනුපාතය ඉහළ යෑම, ගුවන් සම්බන්ධතා වර්ධනය වීම සහ ප්‍රධාන සංචාරක ප්‍රභවයන් විසින් නිකුත් කරන ලද සංචාරක සීමා ඉවත් කර ගැනීම හේතු විය. විනිමය අනුපාතිකය කැපී පෙනෙන ලෙස අවප්‍රමාණය වීම සහ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ද ශ්‍රී ලංකාව සංචාරයන් සඳහා ආකර්ශණීය ගමනාන්තයක් ලෙස අවධානය යොමු වීමට උපකාරී විය. සංචාරක පැමිණීම්, 2021 වසරේ අග කාලපරිච්ඡේදයේ සිට වේගයෙන් ඉහළ ගිය අතර, 2022 වසරේ මාර්තු මාසයේ දී එහි උපරිමය කරා ළඟා වුවද, ඉන්පසු සමාජ ආතතීන් ඉහළ යෑම, රට තුළ සංචාරය කිරීම සඳහා

ඉන්ධන ප්‍රමාණවත් පරිදි නොතිබීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන සංචාරක ප්‍රභව විසින් නිකුත් කරන ලද සෘණාත්මක ප්‍රචාරණ සහ ශ්‍රී ලංකාවේ සංචාරය තහනම් කරමින් සිදුකළ සංචාරක උපදේශන මගින් එම වර්ධන ප්‍රවණතාවයට බාධා සිදු විණි. දේශීය සාධකවලට අමතරව, රුසියා-යුක්‍රේන යුද්ධය ප්‍රධාන වශයෙන් යුරෝපීය රටවලට බලපෑම් සිදු කළ අතර, චීනය විසින් විදේශ රටවල් වෙත සංචාරය කිරීම තහනම් කිරීම ද සංචාරක පැමිණීම් යථා තත්ත්වයට පත්වීමට අහිතකර ලෙස බලපෑවේය. කෙසේ වෙතත්, සමාජ ආතතීන් සමනය වීමත් සමඟ ඇතැම් රටවල් විසින් ශ්‍රී ලංකාවේ සංචාරය තහනම් කරමින් සිදු කළ සංචාරක උපදේශන ලිහිල් කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2022 වසරේ ඔක්තෝබර් මාසයේ සිට සංචාරක පැමිණීම් ක්‍රමානුකූලව වර්ධනය වී එම ප්‍රවණතාව 2023 වසරේ මුල් කාලපරිච්ඡේදය දක්වා අඛණ්ඩව පැවතුණි. බොහෝ ජාත්‍යන්තර ගුවන් සේවා නැවත ආරම්භ කිරීම, විශේෂ ගුවන් යානා (charter flights) සහ මගී නෞකා සංචාරක කර්මාන්තය මෙන්ම බොහෝ රටවල ගෝලීය සංචාරක ප්‍රවර්ධන කටයුතු ද සංචාරක පැමිණීම් නැවත යථා තත්ත්වයට පත් වීමට දායක විය. ඒ අනුව, 2021 වසරේ දී වාර්තා වූ සංචාරක පැමිණීම් 194,495ක සිට 2022 වසරේ දී 719,978ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතය පැතිරීමට පෙර ශ්‍රී ලංකාවට සංචාරකයින් වසරකට සාමාන්‍යයෙන් මිලියන 2කට වඩා පැමිණ තිබේ. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය එහි විභව මට්ටම වෙත ළඟා වීම සඳහා වේගවත් ලෙස එය යථා තත්ත්වයට පත්විය යුතු බව මින් ගම්‍ය වේ.

යුරෝපය, ශ්‍රී ලංකාවේ සංචාරක පැමිණීම් සඳහා ප්‍රමුඛ කලාපය ලෙස අඛණ්ඩව පැවති අතර, ඉන්දියාව, සංචාරක පැමිණීම් සඳහා තනි රටක් ලෙස මුල් තැන පසු විය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අනුව, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී සියලුම ප්‍රධාන කලාප වෙතින් වූ සංචාරක පැමිණීම් ඉහළ ගොස් ඇති අතර, යුරෝපය මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 60කට දායක වෙමින් සංචාරක පැමිණීම් 432,226ක් වාර්තා කළේය. ආසියා පැසිපික් කලාපය, මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 30කට පමණ දායක වෙමින් සංචාරක පැමිණීම් 213,537ක් වාර්තා කළ අතර, එය දෙවන විශාලතම සංචාරක පැමිණීම වේ. රටවල් අනුව සංචාරක පැමිණීම ගත් කළ, 2022 වසරේ දී ඉන්දියාව සංචාරක පැමිණීම්වලින් සියයට 17කට පමණ දායක වෙමින් සංචාරක පැමිණීම් 123,004ක් සමගින් ප්‍රධානතම සංචාරක ප්‍රභවය ලෙස පෙරමුණ ගත් අතර, ඉන් අනතුරුව රුසියාව (91,272), එක්සත් රාජධානිය (85,187), ජර්මනිය (55,542), සහ ප්‍රංශය (35,482) සමස්ත සංචාරක පැමිණීම්වලින් සියයට 54කට සාමූහික වශයෙන් දායක විය.

2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී සංචාරක ඉපැයීම්වල සැලකිය යුතු වැඩි වීමක් වාර්තා විය. සංචාරක ඉපැයීම්, 2021 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 507ට සාපේක්ෂව 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,136ක් වූ අතර, එය සියයට 124.2ක ආකර්ෂණීය වාර්ෂික වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, එම සංචාරක ඉපැයීම් අගය, 2018 වසරේ දී ලැබුණු එ.ජ. ඩොලර් බිලියන 4.4ක සංචාරක ඉපැයීම් ප්‍රමාණයට සාපේක්ෂව ඉතා අඩු අගයකි. සංචාරකයින්ගේ වියදම් සහ මෙරට ගත කරන කාලය පිළිබඳ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත තක්සේරුව අනුව, සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම 2021 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් 172.6ට සාපේක්ෂව 2022 වසරේ දී එ.ජ. ඩොලර් 169.0ක් විය. මේ අතර, සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය, 2021 වසර සඳහා ඇස්තමේන්තු කළ දින 15.1 සමඟ සසඳන විට 2022 වසරේ දී දින 9.3ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2021 වසරේ දී සංචාරකයෙකු මෙරට වැඩි කාලයක් රැඳී සිටීම සඳහා ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 වසංගතය ආශ්‍රිත සීමා මධ්‍යයේ පනවන ලද නිරෝධායන අවශ්‍යතා හේතු විය. මේ අතර, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන්ගේ විදෙස් සංචාර පහළ මට්ටමක පැවතුණු අතර, එමගින් රට තුළ පැවති සැලකිය යුතු විදේශ විනිමය හිඟයෙහි බලපෑම පිළිබිඹු කරයි.

අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ ආයෝජකයින් විසින් ව්‍යාපෘති ප්‍රමාද කිරීම සහ එම ව්‍යාපෘතීන්වල විශාලත්වය අඩු කිරීම මෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඇති වූ බාධා හේතුවෙන් 2022 වසරේ දී සංචාරක ක්ෂේත්‍රයේ ආයෝජන අඩාල විය. 2022 වසරේ දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත එ.ජ. ඩොලර් මිලියන 68ක වටිනාකමකින් සහ කාමර 1,054ක ධාරිතාවයකින් යුතු සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ නව ආයෝජන ව්‍යාපෘති 42ක් අනුමැතිය සඳහා ලැබුණි. 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී එසේ ලැබුණු ව්‍යාපෘතිවල ආයෝජන වටිනාකමෙන් සියයට 48.8ක අඩුවීමක් දක්නට ලැබේ. අනුමැතිය ලබා දුන් ව්‍යාපෘති සම්බන්ධයෙන් ගත් කල, සංචාරක

5.8 සංඛ්‍යා සටහන

සංචාරක අංශයේ ක්‍රියාකාරිත්වය

ශීර්ෂය	2018	2019	2020	2021	2022 (අ)	වාර්ෂික වෙනස්වීම (%) 2022
සංචාරක පැමිණීම් (සංඛ්‍යාව)	2,333,796	1,913,702	507,704	194,495	719,978	270.2
පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින් ගණන						
විනෝදාස්වාදය	1,979,819	1,592,212	444,328	157,766	428,838	171.8
ව්‍යාපාර	71,255	70,068	13,946	3,956	30,057	659.8
වෙනත්	282,722	251,422	49,430	32,773	261,083	696.6
සංචාරකයින් ගත කළ රාත්‍රී ගණන (දහස්)	25,205	19,902	4,315	2,937	6,725	129.0
කාමර උපයෝජන අනුපාතය (%)	72.8	57.1	15.0	18.6	30.4	63.4
දළ සංචාරක ලැබීම් (රු.මිලියන)	711,961	646,362	124,189	101,903	338,052	231.7
ඒක පුද්ගල සංචාරක ලැබීම් (රු.)	305,066	337,755	244,609	523,936	469,531	-10.4
මුළු සේවා නියුක්තිය (සංඛ්‍යාව) (ආ)	388,487	402,607	347,751	357,927	386,236	7.9
ඍජු සේවා නියුක්තිය	169,003	173,592	175,990	177,476	190,521	7.4
වක්‍ර සේවා නියුක්තිය	219,484	229,015	171,761	180,451	195,715	8.5

(අ) තාවකාලික
(ආ) ඇස්තමේන්තු

මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

සංවර්ධන අධිකාරිය විසින් එ.ජ. ඩොලර් මිලියන 36ක වටිනාකමකින් සහ කාමර 363ක සමස්ත ධාරිතාවයකින් යුතු සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ ව්‍යාපෘති 20ක් සඳහා 2022 වසරේ දී අනුමැතීන් ලබා දෙන ලදී. මීට අමතරව, කාමර 5,424ක් සහිත හෝටල් ව්‍යාපෘති 95ක් මේ වන විට විවිධ අදියරයන්හී ඉදිකරමින් පවතින අතර, කාමර 1,623ක ධාරිතාවයකින් යුත් හෝටල් ව්‍යාපෘති 25ක් 2023 වසර වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2022 වසරේ දී කාමර 25,597ක සමස්ත ධාරිතාවයකින් යුතු ශ්‍රේණිගත ආයතන 469ක් සහ අති සුඛෝපභෝගී කුඩා හෝටල්, බංගලා, නිවාඩු නිකේතන, පෞරාණික බංගලා, පෞරාණික නිවාස, සංචාරක සත්කාර නිවාස ඒකක, කුලියට ගත් තට්ටු නිවාස සහ කුලියට ගත් නිවාස ඇතුළුව කාමර 22,523ක සමස්ත ධාරිතාවයකින් යුතු අතිරේක ආයතන 3,360ක් ක්‍රියාත්මක විය.

සංචාරකයන් වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම සඳහා 2022 වසරේ දී ප්‍රතිපත්තිමය හඳුන්වාදීම් කිහිපයක් සහ විවිධ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළේය. දියුණු ගෝලීය සංචාරක කර්මාන්තය වෙතින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයට නව සංචාරක වෙළඳපොළ සොයා යෑමට සහ ශක්තිමත් ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සිදු වනු ඇත. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ දී, සංචාරක අංශය යථා තත්ත්වයට පත් කිරීම සහ අනාගත ඔරොත්තු දීමේ හැකියාව සම්බන්ධයෙන් ක්‍රියාපටිපාටියක් සැකසීම සඳහා පවතින ගැටලු, අවස්ථාවන් සහ යෝජිත ක්‍රියාමාර්ග හඳුනා ගනිමින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2022 වසරේ අප්‍රේල් මාසයේ දී 2022-2025 යන කාල රාමුවට අදාළව ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සඳහා ක්‍රමෝපායික සැලැස්මක් ප්‍රකාශයට පත් කරන ලදී. සංචාරක පැමිණීම් ක්‍රියාවලිය ලිහිල් කිරීමට සහාය දැක්වීම සඳහා බොහෝ රටවල් වෙත 2022 වසරේ ජනවාරි මාසයේ සිට ජාත්‍යන්තර සංචාරකයින් සඳහා පිරිනමන පැමිණීමේ දී වීසා පහසුකම් ලබා දීම ශ්‍රී ලංකාව නැවත ආරම්භ කළේය. වසංගතය සහ ආර්ථික අර්බුදය මධ්‍යයේ විවිධ සංචාරක සේවා සපයන්නන් මුහුණ දෙන දුෂ්කරතා විසඳීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සියලු ආකාරයේ සංචාරක මාර්ගෝපදේශ බලපත්‍රවල වලංගු කාලය දීර්ඝ කිරීම, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලැයිස්තුගත කර ඇති සියලුම සංචාරක ආයතනවල සහ පුද්ගලයින්ගේ වාර්ෂික ලියාපදිංචි ගාස්තුව ඉවත් කිරීම වැනි ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත. කොවිඩ්-19 නොවැළඳුණු බවට

5.10 රූප සටහන

සංචාරක පැමිණීම් සහ ඉපැයීම්



මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

පී.සී.ආර්. පරීක්ෂණ වාර්තාවක් රටට ඇතුළුවීමේ දී ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව ඇතුළු කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා එම කාලසීමාව තුළ ගනු ලැබූ වෙනත් ක්‍රියාමාර්ග 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී ඉවත් කරන ලදී. මේ අතර, 2022 වසරේ දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කළ සමස්ත සංචාරක නවාතැන් සංඛ්‍යාව ඉහළ ගියේය. 2022 වසරේ පැවති සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2022 වසරේ දෙසැම්බර් මාසය දක්වා මාස හයක කාලයක් සඳහා ඒ ඒ අවස්ථාව අනුව සංචාරක ව්‍යාපාරය ඇතුළු සියලුම ආර්ථික අංශවල බලපෑමට ලක් වූ ණය හිමියන්ට සහන ලබා දෙන ලෙස සියලුම බැංකුවලින් ඉල්ලා සිටියේය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්වලින් සංචාරකයින් වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට රුසියාවේ සහ යුක්‍රේනයේ සංචාරක නියෝජිතයින් සඳහා සංචාරක ගමනාන්තය පිළිබඳ මනා අවබෝධයක් ලබා දෙන වැඩසටහන් සංවිධානය කරන ලද අතර, මැද පෙරදිග කලාපය දක්වා ද එවැනි උපායමාර්ග පුළුල් විය. තවද, චිත්‍රපට සංචාරක ව්‍යාපාරය සහ මාර්ග සංදර්ශන පැවැත්වීම වැනි විවිධ ප්‍රවර්ධන වැඩසටහන් ඉන්දියානු වෙළඳපොළ ඉලක්ක කරගනිමින් පැවැත්විණි. මේ අතර, ශ්‍රී ලංකාවේ පුද්ගල සුවතාවය හා සබැඳුණු සංචාරක කර්මාන්ත පාර්ශ්වකරුවන්ගේ ව්‍යාපෘතිය (Wellness Tourism Stakeholder Project), 2022 වසරේ පෙබරවාරි මාසයේ දී නිල වශයෙන් දියත් කරන ලදී. එමෙන්ම, ශ්‍රී ලංකාවේ ඇතැම් හෝටල් සහ නිවාඩු නිකේතන ගෝලීය සංචාරක කර්මාන්තයේ විවිධ සංසදවල දී ඇගයීමට ලක්ව ඇත. ඒ අනුව, වර්ල්ඩ්පැකර්ස් (Worldpackers) වෙබ් අඩවිය විසින් ශ්‍රී ලංකාව ගමන් කිරීමට ලෝකයේ ආරක්ෂිතම රටවලින් එකක් ලෙසත්, එක්සත් රාජධානියේ ඉන්ඩිපෙන්ඩන්ට් (Independent) සඟරාව විසින් ශ්‍රී ලංකාව 2023 වසරේ දී සංචාරය කිරීමට හොඳම ගමනාන්තයක් ලෙසත් නම් කරන ලදී. තවද, කොන්ඩේ නාස්ට් ට්‍රැවලර් (Condé Nast traveller) විසින් 2022 වසරේ පැවති පාඨක තේරීම් සම්මාන උළෙලේ දී ලෝකයේ සංචාරය කිරීමට හොඳම රටවල් 20 අතරට ශ්‍රී ලංකාව ඇතුළත් කර ඇත. විදුලි බිල වැඩිවීම; සංචාරක ක්ෂේත්‍රයේ නියැලෙන ව්‍යාපාරවලින් අය කෙරෙන බදු සහ ගාස්තු; ශ්‍රම සංක්‍රමණය ඉහළ යෑම හේතුවෙන් හෝටල්වල පුහුණු කාර්ය මණ්ඩලය නොමැතිකම; රුසියා-යුක්‍රේන යුද්ධය හේතුවෙන් ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්වලින් සංචාරකයින් පැමිණීමට බාධා ඇති වීම; ගෝලීය සහ දේශීය වශයෙන් උද්ධමනය ඉහළ යෑම; ගෝලීය ආර්ථික අවපාතමය තත්ත්වයන් ඇති වීම සහ ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය; ඇතුළු අභියෝග රාශියකට සංචාරක ක්ෂේත්‍රය මුහුණ දී සිටී. මෙම අභියෝග ජය ගැනීම සඳහා සංචාරක කර්මාන්තයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්නයන් අවශ්‍ය වේ.

ප්‍රවාහන, විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා සහ අනෙකුත් සේවා

ප්‍රවාහනය, පරිගණක හා තොරතුරු සේවා යනාදිය ඇතුළුව, ගෙවුම් තුලනයේ සේවා ගිණුමෙහි උප අංශ බොහොමයක් 2022 වසරේ දී සැලකිය යුතු මට්ටමක ඌණ කාර්යසාධනයක් වාර්තා කළේය. මුහුදු සහ ගුවන් භාණ්ඩ ප්‍රවාහන උප අංශ දෙකෙහිම සෘණ වර්ධනයක් වාර්තා විය. භාණ්ඩ හැසිරවීම, ප්‍රතිනැවිගත කිරීම්, නැව් පැමිණීම් සහ බහාලුම් හැසිරවීම ඇතුළුව මුහුදු භාණ්ඩ ප්‍රවාහනය යටතේ තිබෙන සියලු දර්ශක, විශේෂයෙන් ම 2022 වසරේ දෙවන භාගයේ දී පහළ යමින්, වසර තුළ දී සෘණ වර්ධනයන් වාර්තා කළේය. මෙම අඩුවීම සඳහා ප්‍රධාන හේතුව වුයේ 2022 වසරේ පළමු කාර්තුවෙන් පසු වෙළඳ භාණ්ඩ ආනයන පහත වැටීමයි. ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම, ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම ප්‍රකාශ කිරීමට තුඩු දුන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ හට ගත් දැඩි විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය, රජය විසින් පනවන ලද ආනයන සීමා කිරීම් මෙන්ම, 2022 වසරේ දෙවන භාගයේ දී ගෝලීය වෙළඳාම පහළ යෑම, ඉහත කී අඩුවීම උග්‍ර කළේය. මෙය සහ ජාත්‍යන්තර භාණ්ඩ ප්‍රවාහන ගාස්තු 2020 සහ 2021 වසර වල දී වාර්තා වූ වාර්තාගත ඉහළ මිල ගණන්වලින් අනතුරුව, කොවිඩ්-19 වසංගතයෙන් එල්ල වූ බාධා හේතුවෙන් ක්‍රමානුකූලව පහළ යෑමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස, මුහුදු සහ ගුවන් භාණ්ඩ ප්‍රවාහන සේවා යන දෙඅංශයේම ඉපැයීම් පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී පහත වැටීමට හේතු විය. කෙසේ වෙතත්, සංචාරක පැමිණීම් ඉහළ යෑම සහ ශ්‍රී ලාංකික නේවාසිකයන් විදෙස් සංචාරවල නිරත වීම ක්‍රමිකව යළි ආරම්භ කිරීමත් සමඟ ගුවන් මගී ප්‍රවාහන සේවා ලැබීම් සහ ගෙවීම් යන දෙකෙහිම ධනාත්මක වර්ධනයක් වාර්තා විය. තවද, සංචාරක අංශයට අදාළ ගෙවීම් 2022 වසරේ දී පෙර වසරේ දී මෙන්ම පහළ

අගයක පැවතුණි. තොරතුරු තාක්ෂණය මත පදනම් වූ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ අංශය 2022 වසර තුළ දී සැලකිය යුතු අභියෝගවලට මුහුණ දුන්නේය. රට තුළ පැවති ආර්ථික අස්ථාවරත්වය, මෙම ක්ෂේත්‍රයේ රැකියාවල නියුතු බොහෝ වෘත්තිකයන්ට රටින් බැහැර වඩා හොඳ අවස්ථා වෙත යොමු වීමට හේතු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙම කර්මාන්තය තුළ අත්දැකීම් සහිත වෘත්තිකයන්ගේ සැලකිය යුතු හිඟයක් ඇති විය. තවද, 2022 වසරේ කෙටි කාලයක් සඳහා බලපැවැත්වූ සේවා අපනයනවලින් ලත් ආදායම් රුපියල්වලට පරිවර්තනය අනිවාර්ය කිරීමද කර්මාන්තය විසින් අහිතකර ලෙස සලකනු ලැබීය. සේවා බාහිරව ලබා ගැනීමේ ගෝලීය මූලාශ්‍ර වල හටගත් සාමාන්‍ය මන්දගාමීත්වය සහ තාක්ෂණික මට්ටමේ සේවකයන්ගේ රැකියා අහිමි වීම් මගින් මෙම තත්ත්වය තවත් උග්‍ර විය. මෙම අහිතකර ප්‍රවණතාවල ප්‍රතිඵලයක් ලෙස, පරිගණක සේවා අපනයන අංශය 2021 වසරට සාපේක්ෂව, 2022 වසරේ දී සෘණ වර්ධනයක් වාර්තා කළේය. මූල්‍ය සේවා, ඉදිකිරීම් සේවා, රාජ්‍ය සේවා සහ වෙනත් ව්‍යාපාර සේවා ඇතුළුව, අනෙකුත් සේවා අපනයන උප අංශ වෙත වූ ලැබීම් ද මෙම වසර තුළ දී පැවති ආර්ථික ක්‍රියාකාරකම්වල පහළ යෑම සහ ආර්ථික අස්ථාවරත්වයට සමගාමීව සෘණ වර්ධනයක් වාර්තා කළේය.

5.2.3 ප්‍රාථමික ආදායම

ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය 2021 වසරට සාපේක්ෂව, 2022 වසරේ දී සුළු වශයෙන් පහළ යෑමක් වාර්තා කළේය. 2022 වසරේ අප්‍රේල් මස මැද සිට සමහර රජයේ විදේශීය ණය සේවාකරණයන් තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් එම ණයවලට අදාළව ගෙවිය යුතුව තිබූ පොළී වගකීම්ද ඇතුළුව, සියලු පොළී ගෙවීම් මෙම ප්‍රාථමික ආදායම් ගිණුමේ ගෙවීම් මගින් පිළිබිඹු වේ.[1] ඒ අනුව, ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය 2021 වසරේ පැවති එ.ජ. ඩොලර් මිලියන 1,959ට සාපේක්ෂව, 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,874ක් විය. විදේශීය සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි ලාභාංශ ගෙවීම් පසුගිය වසරට සාපේක්ෂව, මෙම වසර තුළ දී කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමහර විශාල විදේශීය සෘජු ආයෝජන සමාගම් විසින් සැලකිය යුතු ලෙස ඉහළ ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම මීට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, විදේශීය සෘජු ආයෝජන සමාගම්හි ප්‍රති ආයෝජිත ඉපැයීම් පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී පහළ ගියේය. මේ අතර, 2021 වසරේ ජූලි මාසයේ දී සහ 2022 වසරේ ජනවාරි මාසයේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආපසු ගෙවීමෙහි ප්‍රතිඵලයක් ලෙස නොපියවා ඉතිරි වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි වගකීම් අඩු වීමත් සමඟ, ගෙවිය යුතුව තිබූ කුපන වගකීම්ද ඇතුළුව, විවිධ ආයෝජනයන්ගේ කුපන ගෙවීම් සුළු වශයෙන් පහළ ගියේය. කෙසේ වෙතත්, ඉහළ පොලී පිරිවැය ගෙවූ, රජය, බැංකු අංශය සහ පෞද්ගලික සංස්ථා ඇතුළු සියලු අංශ විසින් ගෙවිය යුතුව තිබූ පොලී වගකීම්ද ඇතුළුව, විදේශීය ණය මත සිදුකළ පොලී ගෙවීම්වල සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්නුම් කළේය. මෙම පොලී ගෙවීම් ඉහළ මට්ටමක පැවතීමට තෝරාගත් විදේශීය ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවීම සහ රටේ ණය ශ්‍රේණිගත කිරීම් පහළ යෑම හේතුවෙන් ශ්‍රී ලංකාවේ බැංකු සහ සංස්ථා විසින් මුහුණ දෙන ලද ඉහළ අවදානම් වාරික මෙන්ම, ගෝලීය පොලී අනුපාතික ඉහළ යෑමත් සමඟ විචල්‍ය පොලී අනුපාතික ණය මත පොලී ගෙවීම් ඉහළ යෑම හේතු වූවා විය හැකිය. මේ අතර, 2022 වසර තුළ දී දළ නිල සංචිත කැපී පෙනෙන ලෙස පහළ යෑමත් සමඟ සංචිත වත්කම්වලින් ලැබුණු ආදායම පහත වැටුණි.

5.2.4 ද්විතීයික ආදායම

2022 වසරේ දෙවන භාගයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස නැවත යථා තත්ත්වයට පත්වීම හමුවේ වුව ද, ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය පසුගිය වසරට සාපේක්ෂව 2022 වසරේ දී අඩු විය. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2021 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 5,491ට සාපේක්ෂව, 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 3,789ක් විය. මෙය, 2021 වසර සමඟ සැසඳීමේ දී 2022 වසරේ දී සියයට 31ක පහළ යෑමක් වූ අතර, එමඟින් ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය 2021 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 5,228ට සාපේක්ෂව, 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 3,496ක් දක්වා සීමා විය. බැංකු පද්ධතිය සහ මුදල් හුවමාරු කරන්නන් විසින් ලබා දෙන විනිමය අනුපාතික අතර පැවති විශාල පරතරය හමුවේ, බැංකු පද්ධතිය වෙත ලැබුණු විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ විශේෂයෙන් ම වසරේ මුල් භාගයේ දී අඩු විය. 2022 වසරේ මාර්තු මස මුල දී විනිමය අනුපාතිකයෙහි සිදු කළ ගැළපීමේ

1 ගෙවුම් තුලන සහ අන්තර්ජාතික ආයෝජන තත්ත්ව අත්පොතෙහි 6වන සංස්කරණයට (BPM6) අනුකූලව ගිණුම්කරණයේ උපචිත පදනම මත

ප්‍රතිඵලයක් ලෙස විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම සහ බැංකු විසින් පිරිනමනු ලබන විනිමය අනුපාතිකය බැංකු පද්ධතියෙන් පිටත ඇති විනිමය අනුපාතිකය අතර පරතරය ක්‍රමිකව පහළ යෑම බැංකු පද්ධතිය හරහා ලැබෙන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ යළි ඉහළ නැංවීමට උපකාරී විය. බැංකු පද්ධතියේ විදේශ විනිමය ද්‍රවශීලතාව සැලකිය යුතු ලෙස පහළ යෑමත් සමඟ, ආනයන මූල්‍යනය සඳහා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අවිධිමත් වෙළඳපොළ තුළ භාවිතා කිරීමේ හැකියාවක් ද පැවතුණි. ආර්ථිකය වසරේ අග භාගය වන විට ක්‍රමානුකූලව ස්ථාවරත්වයට පත් වීමත් සමඟ, මහ බැංකුව ගත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්හි ප්‍රතිඵලයක් ලෙස විනිමය අනුපාතිකය වඩා ස්ථාවරත්වයට පත් වීමෙන්, විධිමත් වෙළඳපොළෙහි විනිමය අනුපාතිකවලට සාපේක්ෂව සමාන්තර වෙළඳපොළ තුළ පිරිනමන ලද ඉහළ විනිමය අනුපාතික වඩා අවම මට්ටමකට පහළ ගිය අතර, එම නිසා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ රට වෙත එවීම සඳහා බැංකු පද්ධතිය භාවිත කිරීම ක්‍රමයෙන් යළි ආරම්භ විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 වසරේ ජනවාරි-සැප්තැම්බර් කාලය තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 286ක පමණ මාසික සාමාන්‍යයට සාපේක්ෂව, 2022 වසරේ සිව්වන කාර්තුවේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ කැපී පෙනෙන ලෙස ඉහළ යමින් මසකට එ.ජ. ඩොලර් මිලියන 400ක පමණ, සාමාන්‍යයක් වාර්තා කළේය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ ලියාපදිංචි වී විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රමිකයින් ගණන 2020 වසරේ දී වාර්තා වූ 53,711ට සහ 2021 වසරේ වාර්තා වූ 122,264ට සාපේක්ෂව, සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, 2022 වසරේ දී 311,056ක් විය. ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ රට වෙත ගෙන්වා ගැනීම දිරිමත් කරවමින්, දිරිදීමනා යෝජනා ක්‍රම ඇතුළුව ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබූ අතර, බැංකු අංශය ද විදේශ විනිමය ප්‍රේෂණය සඳහා නිල මාර්ග භාවිතය ප්‍රවර්ධනය කළේය. ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකු අංශය, ලංකා ක්ලියර් (Lanka Clear) සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව, ඩිජිටල්කරණය තුළින් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ රට වෙත ගෙන්වා ගැනීම ප්‍රවර්ධනය කිරීමට 'SLRemit' නම් ඩිජිටල් යෙදවුම හඳුන්වා දුන්නේය.

5.3 ප්‍රාග්ධන ගිණුමේ ශේෂය

2022 වසරේ දී ප්‍රාග්ධන ගිණුම වෙත වූ ශුද්ධ ලැබීම් පහළ මට්ටමක පැවතුණි. රජය වෙත වූ ප්‍රාග්ධන ප්‍රදාන මධ්‍යස්ථ මට්ටමක පැවතීම සමඟ රජය සහ පෞද්ගලික අංශය වෙත වූ ප්‍රාග්ධන සංක්‍රාම පසුගිය වසරට සාපේක්ෂව, 2022 වසරේ දී පහළ ගියේය. ඒ අනුව, ප්‍රාග්ධන ගිණුම 2021 වසරේ වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 25ක අතිරික්තයට සාපේක්ෂව, 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 19ක අතිරික්තයක් වාර්තා කළේය.

5.4 මූල්‍ය ගිණුම

ගෙවුම් තුලනයෙහි, මූල්‍ය ගිණුමෙහි වගකීම්වල ශුද්ධ වෙනස්වීම් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් මධ්‍යස්ථ ඉහළ යෑමක් වාර්තා කළේය. භාවිත කළ හැකි දළ නිල සංචිත මට්ටම් පෙර නොවූ විරූ ලෙස පහත වැටීම හමුවේ 2022 වසරේ අප්‍රේල් මස මැද සිට තෝරාගත් රජයේ ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම 2022 වසරේ මූල්‍ය ගිණුමෙහි ගනුදෙනු සඳහා බලපෑ ප්‍රධාන සාධකයක් විය. මෙම ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවීමත් සමඟ, රටේ විදේශීය ණය සඳහා අදාළ වන ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ දී එය ණය පැහැර හැරීමක් ලෙස වර්ගීකරණය වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රට වෙත මූල්‍ය ප්‍රවාහ ආකර්ෂණය කර ගැනීමේ දී සැලකිය යුතු දුෂ්කරතා මතු විය. ණය ගෙවීම් අත්හිටුවීමට පෙර, එ.ජ. ඩොලර් මිලියන 500ක කල් පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් 2022 වසරේ ජනවාරි මාසයේ දී ආපසු ගෙවා දැමූ අතර, ඉන්දියානු සංචිත බැංකුවෙන් එ.ජ.

5.11 රූප සටහන
මූල්‍ය ගිණුම



ඩොලර් මිලියන 400ක ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකමක් හිමි විය. තෝරාගත් විදේශීය ණය සේවාකරණ අත්හිටුවීමත් සමඟ, අත්‍යවශ්‍ය ආනයන සඳහා අවශ්‍ය විදේශ විනිමය සපුරා ගැනීමට මූල්‍යන ලබා ගැනීම පවා අතිශය දුෂ්කර බවට පත් විය. මෙම කාලය තුළ දී කලාපීය රටවල් ඉන්ධන, ඖෂධ, පොහොර වැනි දෑ ආනයනය කිරීම සඳහා ණය පහසුකම් ලබාදෙමින් සහ ද්විපාර්ශ්වික ණය සහ ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම්වල ආපසු ගෙවීමේ දිනයන් දීර්ඝ කරමින් කඩිනමින් සහය දක්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 වසරේ දී රජය වෙත විදේශීය ණය වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 2,391ක් පමණ ලැබුණු අතර, එය මූල්‍ය ගිණුමේ ප්‍රධාන ලැබීම විය. මෙහි, හදිසි ණය පහසුකම් මෙන්ම බහුපාර්ශ්වික ආයතන හදිසි ආධාර ලෙස සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබා දුන් අරමුදල් මුල් අරමුණින් වෙනස්කොට හදිසි අරමුදල් ආධාර සඳහා යොමු කිරීම් ඇතුළත් විය.

වගකීම්වල ශුද්ධ වෙනස්වීම් 2022 වසරේ දී වැඩි වීමක් වාර්තා කළේය. වගකීම්වල ශුද්ධ වෙනස්වීම්, 2021 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,098ක ශුද්ධ ඉහළ යෑමට සාපේක්ෂව, 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,030ක ශුද්ධ ඉහළ යෑමක් වාර්තා කළේය. ඍජු ආයෝජන ව්‍යාපාර ලබා ගත් විදේශීය ණය ද ඇතුළුව, විදේශීය ඍජු ආයෝජන පෙර වසරට සාපේක්ෂව, 2022 වසරේ දී වර්ධනයක් වාර්තා කළ ද, එය රටේ විදේශීය ඍජු ආයෝජන ලැබීමේ විභවය සහ කලාපීය සම රටවල් වෙත ලැබුණු විදේශීය ඍජු ආයෝජන හා සැසඳීමේ දී බෙහෙවින් පහළ අගයක පැවතුණි. විදේශීය ඍජු ආයෝජන වෙත ප්‍රධාන දායකත්වය හිමිකම් කොටස් වල ආයෝජන ස්වරූපයෙන් වූ අතර ඒ සඳහා කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත ඇතැම් ප්‍රධාන සමාගම්වලට 2022 වසරේ දී විදේශ විනිමය දැඩි ලෙස හිඟ වීම හේතුවෙන් මෙරට ලාභාංශ රටින් බැහැර කිරීමට නොහැකි වීම නිසා ඔවුන්ගේ ලාභ නැවත ආයෝජනය කිරීමට තීරණය කිරීම යම් ප්‍රමාණයකට හේතු විය. තවද, ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ සමාගම් වෙත ලද විදේශ කොටස්හිමියන්ගේ අත්තිකාරම් සහ විදේශ අන්තර් සමාගම් ණයෙහි ද සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා විය. මේ අතර, ආයෝජන මණ්ඩලයේ සමාගම්වලට, ඍජු ආයෝජකයන්ට සම්බන්ධ නොවන පාර්ශ්වයන්ගෙන් විදේශීය ණය ලැබීම් ඉහළ යෑමක් ද 2022 වසරේ දී වාර්තා විය. එහි ප්‍රතිඵලයක් ලෙස,

5.9.අ. සංඛ්‍යා සටහන

මූල්‍ය ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

ශීර්ෂය	2021 (අ)		2022 (ආ)	
	මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්	වගකීම්හි ශුද්ධ වෙනස්වීම්	මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්	වගකීම්හි ශුද්ධ වෙනස්වීම්
මූල්‍ය ගිණුම	**-2,113**	**2,098**	**84**	**2,030**
ඍජු ආයෝජන	**17**	**592**	**15**	**898**
හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්	13	312	11	289
ප්‍රති ආයෝජිත ඉපැයුම් නොවන හිමිකම්	9	23	7	125
ප්‍රති ආයෝජිත ඉපැයුම්	4	289	3	164
ණය උපකරණ	5	281	5	610
විවිධ ආයෝජන	**-**	**-1,547**	**-**	**355**
හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්	-	-232	-	137
ණය සුරැකුම්පත්	-	-1,315	-	218
රජය	-	-1,315	-	212
කෙටි කාලීන (භාණ්ඩාගාර බිල්පත්)	-	-2	-	30
දිගු කාලීන	-	-1,313	-	183
භාණ්ඩාගාර බැඳුම්කර	-	-25	-	21
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	-	-2	-	2
ස්වෛරීත්ව බැඳුම්කර	-	-1,285	-	159
නිකුතු	-	-	-	-
කල්පිරීම්	-	-700	-	-391
ද්විපාර්ශ්වික වෙළඳපොළ ගනුදෙනු	-	-586	-	-
උපචිත පොලිය	-	-	-	551
අනෙකුත් අංශ	-	-	-	6
දිගු කාලීන	-	-	-	6
උපචිත පොලිය	-	-	-	6
මූල්‍ය ව්‍යුත්පන්න	-	-	-	-
අනෙකුත් ආයෝජන	**387**	**3,053**	**1,302**	**776**
මුදල් සහ තැන්පතු	306	4,016	514	272
මහ බැංකුව	-	1,375	-	403
කෙටි කාලීන	-	1	-	...
දිගු කාලීන	-	1,374	-	403
විදේශ විනිමය හුවමාරු පහසුකම්	-	1,374	-	400
උපචිත පොලිය	-	-	-	3
තැන්පතු භාරගන්නා ආයතන	306	2,641	514	-131
කෙටි කාලීන	256	2,641	605	-131
දිගු කාලීන	50	-	-91	-
විශේෂිත අයිතමයන්				
විදේශීය ඍජු ආයෝජන				
ප්‍රති ආයෝජිත ඉපැයුම් නොවන හිමිකම්		23		125
BOI සමාගම් (ඇ)		29		72
CSE සමාගම් (ඇ)		-6		45
අනෙකුත් සමාගම්		-1		8
ප්‍රති ආයෝජිත ඉපැයුම්		289		164
BOI සමාගම් (ඇ)		284		153
CSE සමාගම් (ඇ)		5		-39
අනෙකුත් සමාගම්		-		50
අන්තර් සමාගම් ණය		281		610
BOI සමාගම්හි කොටස් හිමියන්ගේ අත්තිකාරම්		162		204
BOI සමාගම්වල අන්තර් සමාගම් ණය		119		365
අනෙකුත් සමාගම්		-		41
මුළු විදේශීය ඍජු ආයෝජන (1)		**592**		**898**
BOI සමාගම්වලට ලබා දුන් ණය (2)		187		282
BOI සමාගම්වලට ලබා දුන් ණයද ඇතුළුව මුළු විදේශීය ඍජු ආයෝජන (1+2) (ඉ)		**779**		**1,181**
CSE වෙත වූ මුළු ශුද්ධ ලැබීම්		**-238**		**182**
ඍජු ආයෝජන		-6		45
විවිධ ආයෝජන		-232		137
රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත්හි ශුද්ධ විදේශීය ආයෝජන (භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර)		**-27**		**51**
විදේශීය මිල දී ගැනීම්		17		69
විදේශීය විකුණුම්		44		18

පිටු අංක 192 හා සම්බන්ධයි

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) ලියාපදිංචි සමාගම්
(ඈ) කොළඹ කොටස් වෙළඳපොළෙහි (CSE) ලියාපදිංචි, ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි නොවූ සමාගම්
(ඉ) BOI ඇස්තමේන්තු සමඟ සසඳන විට යම් වෙනසක් වේ නම් එසේ වනුයේ ආවරණ සහ ගණනය කිරීමේ ක්‍රමවේදයන්හි වෙනස්කම් හේතුවෙනි.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

විදේශීය ණයද ඇතුළුව, විදේශීය සෘජු ආයෝජන 2021 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 779ට සාපේක්ෂව 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,181ක් විය. විදේශීය ණය ද ඇතුළත් සමස්ත විදේශීය සෘජු ආයෝජනවලින්, එ.ජ. ඩොලර් මිලියන 1,076ක් ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ සමාගම් වෙත වාර්තා විය. තවද, ණය හැර විදේශීය සෘජු ආයෝජන 2021 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 592ට සාපේක්ෂව, 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 898ක් විය. අංශ මත පදනම්ව, ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි සමාගම් වෙත විදේශීය සෘජු ආයෝජන ලැබීම් ප්‍රධාන වශයෙන් විදුලි සන්දේශ, නිෂ්පාදන, දේපල සංවර්ධන යන අංශයන්ට ලැබුණු අතර, ආයෝජන මණ්ඩලය සමඟ ලියාපදිංචි නොවූ, කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමාගම් වෙත විදේශීය සෘජු ආයෝජන ලැබීම් ප්‍රධාන වශයෙන් සැපයුම් සහ ඉන්ධන, ගෑස් සහ ඛනිජ තෙල් යනාදී අංශ වෙත විය. තවද, කොළඹ වරායේ බටහිර බහාලුම් පර්යන්ත වෙත විදේශීය සෘජු ආයෝජන ලැබීම ද 2022 වසරේ අග භාගයේ දී ආරම්භ විය. කොළඹ වරාය නගරය සහ හම්බන්තොට වරාය ව්‍යාපෘතිය වෙත විදේශීය සෘජු ආයෝජන ප්‍රවාහ නුදුරු කාලයේ දී ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සුළුතර කොටස් හිමියන් කොළඹ කොටස් වෙළඳපොළෙහි සිදු කරන හිමිකම් කොටස්හි ආයෝජන සහ රජයේ සුරැකුම්පත් වල විදේශීය ආයෝජන ඇතුළුව, විවිධ ආයෝජන පසුගිය වසරේ දී සිදු වූ අඩු වීම සමඟ සැසඳීමේ දී මෙම වසරේ දී ඉහළ ගියේය. අනේවාසිකයන් සතු රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජන සැලකිය යුතු පහළ අගයක පැවතීමට පසුගිය වසර කිහිපයේ දී විදේශීය ආයෝජකයන් විසින් මෙම ආයෝජන වැඩි වශයෙන් ආපසු පැවරීම හේතු විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආපසු ගෙවීම් ප්‍රකාරව, රජය විසින් 2022 වසර මුල දී එ.ජ. ඩොලර් මිලියන 500ක් ආපසු ගෙවන ලදී. 2022 වසරේ ජූලි මාසයේ දී ගෙවීමට නියමිතව තිබූ, එ.ජ. ඩොලර් මිලියන 1,000ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආපසු ගෙවීම තාවකාලික අත්හිටුවීමට යටත් විය. ගෙවුම් තුලන සංඛ්‍යා දත්ත උපචිත සංකල්පයට අනුව වාර්තා කරන බැවින්, කුපන සහ විදේශීය ණය මත පොලී නොගෙවීම හේතුවෙන් එකතු වන වගකීම් අදාළ ණය උපකරණයේ නොපියවා ඉතිරිව පවතින වගකීමට එකතු කළ යුතුය. ඒ අනුව, එ.ජ. ඩොලර් මිලියන 551ක

5.9.ආ. සංඛ්‍යා සටහන

මූල්‍ය ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

ශීර්ෂය	2021 (අ)		2022 (ආ)	
	මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්	වගකීම්හි ශුද්ධ වෙනස්වීම්	මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්	වගකීම්හි ශුද්ධ වෙනස්වීම්
පිටු අංක 191 හා සම්බන්ධයි				
අනෙකුත් ආයෝජන				
ණය	-	-1,503	-	-92
මහ බැංකුව	-	-57	-	-140
ජා.මු. අරමුදලෙන් ලද ණය	-	-57	-	-140
විස්තීර්ණ ණය පහසුකම	-	-57	-	-140
තැන්පතු භාරගන්නා ආයතන	-	-2,152	-	-1,645
කෙටි කාලීන	-	-2,169	-	-1,301
දිගු කාලීන	-	17	-	-344
රජය	-	873	-	1,679
දිගු කාලීන	-	873	-	1,679
ණය මුදාහැරීම්	-	2,544	-	2,391
උපචිත පොලිය	-	-	-	133
ගෙවීම්	-	-1,671	-	-845
අනෙකුත් අංශ (ඇ)	-	-167	-	13
දිගු කාලීන	-	-167	-	13
ණය මුදාහැරීම්	-	187	-	332
උපචිත පොලිය	-	-	-	16
ගෙවීම්	-	-354	-	-335
වෙළඳ ණය සහ අත්තිකාරම්	257	-426	282	-895
තැන්පතු භාරගන්නා ආයතන	-3	-	-27	-
කෙටි කාලීන	-3	-	-27	-
අනෙකුත් අංශ (ඇ)	260	-426	310	-895
කෙටි කාලීන	260	-426	310	-895
අනෙකුත් ලැබිය යුතු / ගෙවිය යුතු ගිණුම්	-176	180	506	1,492
මහ බැංකුව	-	180	-	1,492
කෙටි කාලීන (ඉ)	-	180	-	1,492
තැන්පතු භාරගන්නා ආයතන	-176	-	506	-
කෙටි කාලීන	-176	-	506	-
විශේෂ ගැනුම් හිමිකම්		787		-
සංචිත වත්කම්	**-2,517**		**-1,234**	
මූල්‍ය රත්‍රන්	-212		-152	
විශේෂ ගැනුම් හිමිකම්	123		-118	
ජා.මු. අරමුදලේ සංචිත මට්ටම	-		-58	
අනෙකුත් සංචිත වත්කම්	-2,428		-906	
මුදල් සහ තැන්පතු	1,536		-895	
මූල්‍ය අධිකාරියේ හිමිකම්	1,055		-526	
අනෙකුත් ආයතනයන්හි හිමිකම්	481		-369	
සුරැකුම්පත්	-3,967		-11	
ණය සුරැකුම්පත්	-3,967		-11	
දිගු කාලීන	-3,967		-11	
අනෙකුත් හිමිකම්	3		...	
මූල්‍ය ගිණුම (ශුද්ධ)	**-4,211**		**-1,946**	
විශේෂිත අයිතමයන්				
රජයේ දිගුකාලීන ණය (ශුද්ධ)		**873**		**1,679**
ණය මුදාහැරීම්		2,544		2,391
උපචිත පොලිය		-		133
ගෙවීම්		-1,671		-845

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ පෞද්ගලික අංශයේ සමාගම් ඇතුළත් වේ.
(ඈ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්වල වෙළඳ ණය ඇතුළත් වේ.
(ඉ) ආසියානු නිෂ්කාශණ සංගමයේ වගකීම්වල ශුද්ධ ගනුදෙනු ඇතුළත් වේ.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

අනේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වලට අදාළ ගෙවීමට තිබූ කුපන වගකීම්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර පොලී ගෙවීම් වලට එකතු වූ අතර, එ.ජ. ඩොලර් මිලියන 149ක් වූ විදේශීය ණය මත ගෙවීමට තිබූ පොලී වගකීම් විදේශීය ණය මත පොලී ගෙවීම් වලට එකතු විය. තවද, රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් අනේවාසිකයන්ට නිකුත් කරන ලද ජාත්‍යන්තර බැඳුම්කරවලට අදාළ ගෙවීමට තිබූ පොලී වගකීම් එ.ජ. ඩොලර් මිලියන 6ක් ලෙස වාර්තා විය. මේ අතර, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට වසර තුළ දී නව වෙළඳ ණය පහසුකම් ලබා ගැනීමට නොහැකිවූ අතර, එහි වෙළඳ ණය වගකීම් වසර පුරා ආපසු ගෙවීමට අඛණ්ඩව කටයුතු කිරීමත් සමඟ වෙළඳ ණය සහ අත්තිකාරම් වගකීම්වල සැලකිය යුතු පහළ යෑමක් වාර්තා කළේය. විශේෂයෙන් ම, 2022 වසරේ අග කාලපරිච්ඡේදයේ දී බැංකු පද්ධතිය තුළ විදේශ විනිමය ද්‍රවශීලතාව ඉහළ යෑමත් සමඟ, පවත්නා ණය අඛණ්ඩව ආපසු ගෙවීම හේතුවෙන් මෙන්ම නව විදේශීය ණය ගැනීම් ඉතා අඩු මට්ටමක පැවතීම හේතුවෙන්, බැංකු අංශයේ විදේශීය ණය වසර තුළ දී පහත වැටුණි. මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව 2015-2019 කාලය තුළ දී ජා.මූ. අරමුදලෙන් ලබා ගත් විස්තීර්ණ ණය පහසුකම ආපසු ගෙවීමට අඛණ්ඩව කටයුතු කළ අතර, ණය ගෙවීම් අත්හිටුවීමට යටත් නොවූ, අනෙකුත් බහුපාර්ශ්වික සංවිධානවලින් ලබා ගත් විදේශීය ණය ආපසු ගෙවීමට රජය අඛණ්ඩව කටයුතු කළේය. පෞද්ගලික සමාගම් අංශයේ ණය ගැනීම් ද සැලකිය යුතු ලෙස සීමිතව පැවති අතර, මෙම අංශය වෙත වසර තුළ දී ලද ශුද්ධ ලැබීම් ඉතා සුළු අගයක් විය.

2022 වසරේ දී මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් සුළු වශයෙන් ඉහළ යෑමක් වාර්තා කළේය. මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් 2021 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,113ක ශුද්ධ අඩුවීමට සාපේක්ෂව, 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 84ක සුළු ඉහළ යෑමක් වාර්තා කළේය. 2022 වසරේ අප්‍රේල් මස මැද භාගයේ දී ණය ගෙවීම් අත්හිටුවීමට පෙර ප්‍රධාන වශයෙන් සිදු කළ ණය සේවාකරණ ගෙවීම් හේතුවෙන් සහ සැලකිය යුතු ගෙවුම් තුලන පීඩන හමුවේ අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයන සඳහා පහසුකම් සැලසීමට බැංකු පද්ධතිය වෙත විදේශ විනිමය සැපයීම හේතුවෙන් වසර තුළ දී දළ නිල සංචිත එ.ජ. ඩොලර් මිලියන 1,234කින් පහළ ගියේය. කෙසේ වෙතත්, විශේෂයෙන්ම 2022 වසර අග කාලපරිච්ඡේදයේ දී බැංකු අංශයේ මුදල් හා තැන්පතු සහ අනෙකුත් ලැබිය යුතු ගිණුම්හි වත්කම්වල ශුද්ධ අත්කර ගැනීම් ඉහළ ගියේය. ශ්‍රී ලාංකික අපනයනකරුවන් විසින් අනේවාසිකයන් වෙත ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම් පෙර වසරට සාපේක්ෂව, 2022 වසරේ දී වෙළඳ භාණ්ඩ අපනයන වැඩිවීම තුළින් ඉහළ යෑමක් වාර්තා කළේය.

5.5 සමස්ත ශේෂය

ශුද්ධ ජාත්‍යන්තර සංචිතවල වෙනස් වීම නිරූපණය කරන ගෙවුම් තුලනයෙහි සමස්ත ශේෂය 2022 වසරේ දී අඛණ්ඩව සැලකිය යුතු හිඟයක් වාර්තා කළේය. අඛණ්ඩව මධ්‍යස්ථ අගයක පැවති මූල්‍ය ගිණුම වෙත ලැබීම්, රජයේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීමට පෙර සිදුකළ විදේශීය ණය සේවාකරණ ගෙවීම් සහ වසර තුළ දී මූලික වශයෙන් අත්‍යවශ්‍ය ආනයන සිදු කිරීමට මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත සිදු කළ ශුද්ධ විකුණුම් හේතුවෙන්, 2022 වසරේ දී දළ නිල සංචිත සැලකිය යුතු ලෙස පහත වැටුණි. වසර තුළ දී සංචිත වත්කම් පහළ වැටුණු අතර, ඉන්දියානු සංචිත බැංකුවෙන් ලබා ගත් එ.ජ. ඩොලර් මිලියන 400ක ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම ලැබීම මෙන්ම, වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 1,492ක පමණ ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් එක් රැස් වීමත් සමඟ, සංචිතවලට අදාළ වගකීම් සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, සමස්ත ශේෂය 2021 වසරේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 3,967ක හිඟයට සාපේක්ෂව 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,806ක හිඟයක් වාර්තා කිරීම, 2022 වසර අවසානය වන විට ශුද්ධ ජාත්‍යන්තර සංචිත සැලකිය යුතු ලෙස අඩු වීමට හේතු විය.

5.6 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

2021 වසර අවසානයට සාපේක්ෂව, 2022 වසර අවසානයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය වගකීම් තත්ත්වය පහළ ගිය අතර, විදේශීය වත්කම් තත්ත්වය ඒ හා සමාන මට්ටම්වල පැවතුණි. රටේ විදේශීය වගකීම් තත්ත්වය 2021 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 63,967ට සාපේක්ෂව 2022 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 58,862ක් විය. රජය සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි වෙළඳපොළ

5

5.10 සංඛ්‍යා සටහන

අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

එ.ජ. ඩොලර් මිලියන

(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)

ශීර්ෂය	2021 (අ)		2022 (ආ)	
	වත්කම්	වගකීම්	වත්කම්	වගකීම්
සෘජු ආයෝජන (ඇ)	**1,522**	**16,384**	**1,534**	**13,877**
හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්	1,482	11,050	1,489	7,933
ණය උපකරණ	40	5,334	45	5,944
විවිධ ආයෝජන	**...**	**7,502**	**...**	**5,285**
හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්		1,142		1,251
අනෙකුත් අංශ		1,142		1,251
ණය සුරැකුම්පත් (ඈ)	...	6,360	...	4,035
තැන්පතු භාරගන්නා ආයතන	...	-	...	-
දිගු කාලීන	...	-	...	-
රජය		6,266		3,957
කෙටි කාලීන		1		31
දිගු කාලීන		6,265		3,926
අනෙකුත් අංශ		94		78
දිගු කාලීන		94		78
මූල්‍ය ව්‍යුත්පන්න	-	-	-	-
අනෙකුත් ආයෝජන	**4,096**	**40,081**	**5,399**	**39,700**
මුදල් සහ තැන්පතු	**1,142**	**5,749**	**1,656**	**5,880**
මහ බැංකුව		1,775		2,037
කෙටි කාලීන		1		1
දිගු කාලීන		1,774		2,036
තැන්පතු භාරගන්නා ආයතන	1,142	3,974	1,656	3,843
කෙටි කාලීන	878	3,974	1,483	3,843
දිගු කාලීන	264		173	
ණය		**30,565**		**29,508**
මහ බැංකුව		1,265		1,062
ජා.මු. අරමුදලෙන් ලද ණය		1,265		1,062
තැන්පතු භාරගන්නා ආයතන		3,172		1,527
කෙටි කාලීන		2,005		704
දිගු කාලීන		1,167		823
රජය		21,289		23,562
දිගු කාලීන		21,289		23,562
අනෙකුත් අංශ (ඉ)		4,838		3,357
දිගු කාලීන		4,838		3,357
වෙළඳ ණය සහ අත්තිකාරම්	**1,211**	**1,915**	**1,493**	**1,020**
තැන්පතු භාරගන්නා ආයතන	98		70	
කෙටි කාලීන	98		70	
අනෙකුත් අංශ (ඊ)	1,113	1,915	1,423	1,020
කෙටි කාලීන	1,113	1,915	1,423	1,020
අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම්	**1,744**	**523**	**2,250**	**2,028**
මහ බැංකුව (උ)		523		2,028
කෙටි කාලීන		523		2,028
තැන්පතු භාරගන්නා ආයතන	1,744		2,250	
කෙටි කාලීන	1,744		2,250	
විශේෂ ගැනුම් හිමිකම්		**1,330**		**1,265**
සංචිත වත්කම්	**3,139**		**1,898**	
මූල්‍ය රත්න	175		28	
විශේෂ ගැනුම් හිමිකම්	124		2	
ජා.මු. අරමුදලේ සංචිත මට්ටම	67		4	
අනෙකුත් සංචිත වත්කම්	2,773		1,864	
මුදල් සහ තැන්පතු	2,729		1,834	
මූල්‍ය අධිකාරියේ හිමිකම්	899		373	
අනෙකුත් ආයතනයන්හි හිමිකම්	1,830		1,462	
සුරැකුම්පත්	44		30	
ණය සුරැකුම්පත්	44		30	
මුළු වත්කම්/වගකීම්	**8,758**	**63,967**	**8,830**	**58,862**
ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය		**-55,210**		**-50,032**
විශේෂිත අයිතිමයන් පරිණත කාලය අනුව අන්තර්ජාතික ආයෝජන තත්ත්වය	8,758	63,967	8,830	58,862
කෙටි කාලීන	6,804	9,560	7,091	8,877
දිගු කාලීන	1,954	54,407	1,739	49,985

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ, කොළඹ කොටස් හුවමාරුවේ සහ අනෙකුත් පොදුගලික සමාගම්වල පැවති සෘජු ආයෝජන තත්ත්වය ද ඇතුළත් වේ.
(ඈ) විදේශ විනිමය ණය නිකුතුව වෙළඳපොළ වටිනාකම මත පදනම් වන අතර දේශීය විනිමය ණය නිකුතුව පොත් අගය මත පදනම් වේ.
(ඉ) රජය සතු වාණිජ ව්‍යවසායයන් ලබාගත් ව්‍යාපෘති ණය සම්බන්ධයෙන් වූ නොපියවා ඉතිරිව ඇති ණය ඇතුළත් වේ.
(ඊ) ලංකා බබිප තෙල් නීතිගත සංස්ථාවේ සහ පොදුගලික සමාගම්වල නොපියවූ වෙළඳ ණය ඇතුළත් වේ.
(උ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිශ්කාෂණ සංගමයේ වගකීම්වල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය.

අගය පහත වැටීම, මුළු වගකීම් තත්ත්වය පහළ යෑමට ප්‍රධාන හේතුව විය. මේ අතර, රටේ විදේශීය වත්කම් තත්ත්වය 2021 වසර අවසානයේ පැවති තත්ත්වය හා සමානව 2022 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 8,830ක් විය. බැංකු අංශයේ විදේශීය වත්කම් ඉහළ යෑම සහ සංචිත වත්කම් තත්ත්වය සැලකිය යුතු ලෙස පහළ යෑමක් වාර්තා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, වසර අවසානයේ දී සමස්ත වත්කම් තත්ත්වය සම මට්ටම්වල පමණ පැවතුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, අන්තර්ජාතික ආයෝජන තත්ත්වයේ ශුද්ධ වගකීම් තත්ත්වය 2021 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 55,210ට සාපේක්ෂව, 2022 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 50,032ක් දක්වා පහත වැටුණි.

අනේවාසිකයන් සතුව ඇති ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම් තත්ත්වය 2022 වසර තුළ දී සමාන මට්ටම්වල පැවතුණි. දළ නිල සංචිත 2021 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 3,139ක සිට 2022 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,898ක් දක්වා සැලකිය යුතු පහළ යෑමක් වාර්තා කළේය.[2] කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් 2022 වසර අවසානයේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ විදේශ විනිමය ද්‍රවශීලතාව ක්‍රමානුකූලව ඉහළ යෑම හේතුවෙන්, මුදල් හා තැන්පතු තත්ත්ව සහ අනෙකුත් ලැබිය යුතු ගිණුම් වසර තුළ දී කැපී පෙනෙන ඉහළ යෑමක් වාර්තා කරමින්, තැන්පතු භාර ගන්නා ආයතනවල වත්කම් තත්ත්වය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, ශ්‍රී ලාංකික අපනයනකරුවන් විසින් මූලික වශයෙන් වසර තුළ දී ඔවුන්ගේ ගනුදෙනුකරුවන් වෙත ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම් ඉහළ යෑම හේතුවෙන්, 2022 වසර අවසානයේ දී නොපියවා ඉතිරි වූ වෙළඳ ණය සහ අත්තිකාරම්වල වත්කම් තත්ත්වය 2021 වසර අවසානයේ පැවති තත්ත්වයට වඩා ඉහළ ගියේය. තවද, විදේශීය සෘජු ආයෝජන වත්කම් තත්ත්වය වසර තුළ දී සුළු වශයෙන් ඉහළ යෑමක් වාර්තා කළේය.

අනේවාසිකයන් වෙත වූ ශ්‍රී ලංකාවේ සමස්ත වගකීම් තත්ත්වය වසර තුළ දී එ.ජ. ඩොලර් බිලියන 5.1කින් පමණ පහළ ගියේය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි නොපියවා ඉතිරි වූ තත්ත්වය වෙළඳපොළ අගය අනුව අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි පිළිබිඹු වූ පරිදි, 2021 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 6,233ක සිට 2022 වසර

2 විදේශ සංචිත තත්ත්වයෙහි සවිස්තරාත්මක විශ්ලේෂණයක් 5.6.1 කොටසෙහි අන්තර්ගත වේ.

අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 3,315ක් දක්වා සැලකිය යුතු ලෙස පහළ යෑම මේ සඳහා බලපෑ ප්‍රධාන හේතුව විය. කෙසේ වෙතත්, මුහුණත අගය ප්‍රකාරව අනේවාසිකයන් සතු නොපියවා ඉතිරි වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි තත්ත්වය, 2021 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 11,191ට සාපේක්ෂව, 2022 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 10,800ක් විය. ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරි වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි වෙළඳපොළ අගය, 2022 වසරේ අප්‍රේල් මස මැද භාගයේ සිට රජයේ ඇතැම් විදේශීය ණය තාවකාලිකව ගෙවීම අත්හිටුවීම නිවේදනය කිරීමත් සමඟ සැලකිය යුතු මට්ටමකින් පහළ ගියේය. කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සෘජු ආයෝජන ව්‍යවසායයන්හි වෙළඳපොළ මිල සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගිය සෘජු ආයෝජනවල වගකීම් තත්ත්වය, 2022 වසරේ දී මෙම පොදු ලැයිස්තුගත සමාගම්වල වෙළඳපොළ මිල ගණන් පහළ යෑමත් සමඟ, කැපී පෙනෙන ලෙස පහළ ගියේය. ඉන්දියානු සංචිත බැංකුවෙන් එ.ජ. ඩොලර් මිලියන 400ක ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකමක් ලැබීමත් සමඟ වසර තුළ දී මහ බැංකුවේ නොපියවා ඉතිරි වූ මුදල් සහ තැන්පතු වගකීම් තත්ත්වය ඉහළ ගියේය. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව සහ බංග්ලාදේශ බැංකුව 2023 වසරේ දී ගෙවීමට නියම වන පරිදි එ.ජ. ඩොලර් මිලියන 200ක් වූ විදේශ විනිමය හුවමාරු පහසුකම අඛණ්ඩව ඉදිරියට ගෙන යෑමට එකඟතාවයකට එළඹුණි. මේ අතර, වසර තුළ දී තැන්පතු භාර ගන්නා ආයතනවල මුදල් සහ තැන්පතු වගකීම් තත්ත්වයෙහි සුළු පහළ යෑමක් වාර්තා විය. තවද, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාවය ඉහළ යෑමත් සමඟ, විශේෂයෙන් ම වසරේ අග කාලපරිච්ඡේදයේ දී බැංකු සිය විදේශීය වගකීම් තත්ත්වය අඛණ්ඩව අඩු කිරීමත් සමඟ වාණිජ බැංකුවල නොපියවා ඉතිරි වූ විදේශීය ණය වගකීම් කැපී පෙනෙන ලෙස පහත වැටුණි. ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීම නිවේදනය කළ ද, ඉන්දියාවෙන් ණය පහසුකම් ආකාරයෙන් වූ සැලකිය යුතු හදිසි මානුෂීය ආධාර ලැබීම් හේතුවෙන්, රජයේ නොපියවා ඉතිරි වූ විදේශීය ණය වගකීම් තත්ත්වය ඉහළ ගියේය. තවද, වසර තුළ දී ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් පියවීම ප්‍රමාද කිරීම හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් ගෙවිය යුතු ගිණුම් ලෙස නිරූපිත වගකීම්වල සැලකිය යුතු ඉහළ යෑමක් පිළිබිඹු විය. මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව 2015-2019 කාලය තුළ දී ජා.මූ. අරමුදලෙන් ලබා ගත් විස්තීර්ණ ණය පහසුකමට අදාළ වගකීම අඛණ්ඩව ආපසු ගෙවීමට කටයුතු කළේය. රජය සතු වාණිජ ව්‍යවසායයන්හි හැර, පෞද්ගලික අංශයේ නොපියවා ඉතිරි වූ විදේශීය ණය වගකීම් තත්ත්වය වසර තුළ දී සමාන මට්ටම්වල පැවතුණි. රජය සතු වාණිජ ව්‍යවසායයන්හි වගකීම් සැලකීමේ දී, අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි සහ විදේශීය ණය සංඛ්‍යා දත්තවල අනෙකුත් අංශ යටතේ මෙතෙක් දුරට වර්ගීකරණය කර ඇති රජය සතු වාණිජ ව්‍යවසායයන් ගණනාවක විදේශීය ණය වගකීම් යළි රජයේ විදේශීය ණය වගකීම් ලෙස වර්ගීකරණය කිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දුන්නේය. ඒ අනුව, 2021 වසර අවසානය වන විට 'අනෙකුත් අංශ' යටතේ වාර්තා කළ රජය සතු වාණිජ ව්‍යවසායයන්හි නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය වගකීම් වලින් කොටසක් 2022 වසර අවසානය වන විට 'රජය' යටතේ නැවත වර්ගීකරණය කර ඇත.[3]

5.6.1 සංචිත වත්කම් තත්ත්වය

2021 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,139ට සාපේක්ෂව, 2022 වසර අවසානය වන විට දළ නිල සංචිත එ.ජ. ඩොලර් මිලියන 1,898ක් දක්වා අඩු විය. විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම හේතුවෙන්, 2021 සහ 2022 වසර වල අවසානයේ දළ නිල සංචිතවල පිළිවෙළින් එ.ජ. ඩොලර් මිලියන 1,574ක් හා එ.ජ. ඩොලර් මිලියන 1,433ක් වූ චීන මහජන බැංකුවෙන් ලැබුණු විදේශ විනිමය හුවමාරු පහසුකම ඇතුළත්ය. මෙම විදේශ විනිමය හුවමාරු පහසුකමට අදාළ කොන්දේසි 2022 වසර තුළ දී සපුරාලීමට නොහැකි වූ බැවින් එය භාවිත කිරීමට නොහැකිව පැවතුණි. 2022 වසර තුළ දී දළ නිල සංචිත පහත වැටීමට හේතු වූයේ රජය විසින් තෝරා ගත් විදේශීය ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවීම පිළිබඳව නිවේදනය කිරීමට පෙර, බොහෝ විට 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම සහ මහ බැංකුව අත්‍යවශ්‍ය ආනයන සඳහා පහසුකම් සැලසීමට ශුද්ධ පදනම මත විදේශ විනිමය ද්‍රවශීලතාව සැපයීම මගින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මැදිහත් වී කටයුතු කිරීමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙසය. මෙම වසරේ මුල කාලපරිච්ඡේදයේ දී සිදු කළ ණය සේවාකරණ වගකීම්වලට ප්‍රධාන වශයෙන් 2022 වසරේ ජනවාරි මාසයේ දී කල් පිරුණු එ.ජ. ඩොලර් මිලියන 500ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආපසු ගෙවීම ඇතුළත් විය. අත්‍යවශ්‍ය ආනයන

3 රජය සතු වාණිජ ව්‍යවසායයන්හි නොපියවා ඉතිරි වූ විදේශීය වගකීම්වලින් 2022 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,427ක් රජයේ වගකීම් ලෙස යළි වර්ගීකරණය කරන ලදී.

මූල්‍යනය සඳහා එ.ජ. ඩොලර් මිලියන 2,716ක විදේශ විනිමය සැපයීම මගින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ මැදිහත් වීම ද වසර තුළ දී දළ නිල සංචිත පහත වැටීමට හේතු විය. මේ අතර, ඉන්දියානු සංචිත බැංකුවෙන් ලැබුණු ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම, නොපිය වූ ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් හා සම්බන්ධිත ලැබීම්, මානුෂීය ආධාර සඳහා ඉන්දියාවෙන් ලද හදිසි ණය හා ව්‍යාපෘති ණය සහ බහුපාර්ශ්වික ආයතනවලින් ලැබුණු හදිසි සහාය හැර, 2022 වසරේ දී විදේශ විනිමය ලැබීම් මධ්‍යස්ථ ප්‍රමාණයක් වාර්තා විය. එහි ප්‍රතිඵලයක් ලෙස, දළ නිල සංචිත 2021 වසර අවසානයේ දී පැවති මාස 1.8ක ආනයන ආවරණයට සාපේක්ෂව, 2022 වසර අවසානයේ දී ආනයනික මාස 1.2කට සමාන විය.

දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ පවතින සැලකිය යුතු ද්‍රවශීලතා හිඟය සහ විදේශීය මූල්‍යන මූලාශ්‍ර වෙත ප්‍රවේශය දුෂ්කර වීම හේතුවෙන්, දළ නිල සංචිත මට්ටම තීරණාත්මක පහළ මට්ටම්වල පැවතුණි. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි සැලකිය යුතු ද්‍රවශීලතා හිඟය, විදේශ මූල්‍යන මූලාශ්‍ර වෙත ප්‍රවේශය නොමැතිකම සහ දළ නිල සංචිත තීරණාත්මක ලෙස පහළ මට්ටමකට පත්වීම හේතුවෙන් විදේශීය අංශය සැලකිය යුතු පීඩනයකට ලක් විය. මෙවැනි වාතාවරණයක දී, දළ නිල සංචිත ක්‍රමානුකූලව ගොඩනංවා ගැනීම සඳහා රුපියල්වලට පරිවර්තනය කළ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ අපනයන ආදායම්, බලපත්‍රලාභී බැංකු විසින් මහ බැංකුවට අනිවාර්යයෙන් විකිණීමේ අවශ්‍යතාවය 2022 වසරේ දී අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විශේෂයෙන් ම ඉන්ධන සහ ගල් අඟුරු ආනයන මූල්‍යනයට පහසුකම් සැලසීම සඳහා ඉන්ධන සහ ගල් අඟුරු අරමුදල් පිහිටුවීම මගින් 2022 වසරේ දී විවිධ අවස්ථාවල දී බැංකු පද්ධතියෙන් විදේශ විනිමය අවශෝෂණය කරන ගන්නා ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රධාන වශයෙන් ඉන්ධන, ගල් අඟුරු, එල්.පී. ගෑස්, ඖෂධ සහ අත්‍යවශ්‍ය ආහාර යනාදී අත්‍යවශ්‍ය ආනයනයන් සඳහා පහසුකම් සැපයීමට දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 2,716ක් සපයන ලදී. ඉන්ධන සහ ගල් අඟුරු අරමුදල් මගින් අවශෝෂණය කර ගත් විදේශ විනිමය සහ රුපියල්වලට පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් සහ අපනයන ඉපැයීම් තුළින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුව වෙත සිදු කරන ලද අනිවාර්ය විකුණුම් මගින් ලද විදේශ විනිමය මේ සඳහා උපයෝගී කරගන්නා ලදී. 2022 වසරේ දී නිශ්චිත විදේශ විනිමය මූල්‍යන සැපයුම් නොමැති පසුබිමක දී පවා, රටේ මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මෙම ක්‍රියාමාර්ග

5.11 සංඛ්‍යා සටහන

මහ බැංකුවේ දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීම්, විදේශ විනිමය ණය සේවාකරණය සහ දළ නිල සංචිත

එ.ජ. ඩොලර් මිලියන

ශීර්ෂය	2021	2022 (අ)
මහ බැංකුව විසින් මිලදී ගැනීම්	**506**	**2,148**
විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ආශ්‍රිත මිලදී ගැනීම්	213	550
අපනයන ආදායම් ආශ්‍රිත මිලදී ගැනීම්	214	1,184
වෙළඳපොළ ආශ්‍රිත මිලදී ගැනීම්	79	68
ඉන්ධන බිල්පත් මූල්‍යනය කිරීම	-	68
ගල් අඟුරු බිල්පත් මූල්‍යනය කිරීම	-	278
මහ බැංකුවේ සැපයුම්	**1,253**	**2,716**
ශුද්ධ මිලදී ගැනීම්	**-747**	**-568**
විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම් (පොලිය + ණය ආපසු ගෙවීම්)	**6,836**	**3,237**
රජය (ආ)	6,354	3,077
මහ බැංකුව	481	160
දළ නිල සංචිත	**3,139**	**1,898**

(අ) තාවකාලික
(ආ) නේවාසිකයන් හා අනේවාසිකයන් වෙත සිදුකරන ලද විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම් ඇතුළත් වේ.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

උපකාරී වූ අතර එමගින් මෙම ගෙවුම් තුලන අර්බුදයේ අහිතකර බලපෑම් යම් ප්‍රමාණයකට අවම කර ගැනීමට හැකි විය. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව, එ.ජ. ඩොලර් මිලියන 3,237ක් වූ මහ බැංකුවේ සහ රජයේ විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම් 2022 වසරේ දී අඛණ්ඩව සිදු කරන ලදී. 2022 වසරේ අප්‍රේල් මස මැද භාගයේ දී ණය ගෙවීම අත්හිටුවීම නිවේදනය කිරීම හමුවේ වුව ද, බහුපාර්ශ්වික ආයතන වෙත තිබූ විදේශීය ණය වගකීම් 2022 වසරේ දී අඛණ්ඩව සිදු කිරීම මෙම විදේශීය

5.12 රූප සටහන

කාර්තුමය දළ නිල සංචිත සහ මුළු විදේශීය වත්කම්



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

5.12 සංඛ්‍යා සටහන

දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේ දී තත්ත්වය)

ශීර්ෂය	2018	2019	2020	2021	2022 (අ)
1. රජයේ විදේශීය වත්කම්	817	386	155	177	39
2. මහ බැංකුවේ විදේශීය වත්කම්	6,102	7,256	5,510	2,962	1,858
3. **දළ නිල සංචිත වත්කම් (1+2)**	**6,919**	**7,642**	**5,664**	**3,139**	**1,898**
4. තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය වත්කම්	2,664	2,760	2,856	2,983	3,976
5. **මුළු විදේශීය වත්කම් (3+4) (ආ)**	**9,583**	**10,402**	**8,521**	**6,122**	**5,874**
6. සංචිතවලට අදාළ වගකීම් (ඇ)	1,425	1,771	2,121	3,562	5,127
7. **ශුද්ධ ජාත්‍යන්තර සංචිත (3-6)**	**5,495**	**5,871**	**3,543**	**-423**	**-3,229**
8. **සමස්ත ශේෂය (ඇ)**	**-1,103**	**377**	**-2,328**	**-3,967**	**-2,806**
9. දළ නිල සංචිත මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන					
9.1 වෙළඳ භාණ්ඩ	3.7	4.6	4.2	1.8	1.2
9.2 වෙළඳ භාණ්ඩ හා සේවා	3.1	3.7	3.7	1.8	1.2
10. මුළු විදේශීය වත්කම් මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන					
10.1 වෙළඳ භාණ්ඩ	5.2	6.3	6.4	3.6	3.9
10.2 වෙළඳ භාණ්ඩ හා සේවා	4.3	5.1	5.6	3.4	3.7

(අ) තාවකාලික
මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව
(ආ) 'විදේශයන්හි සිදුකරන ලද ඍජු ආයෝජන' සහ 'ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්' යන විදේශීය වත්කම් ඇතුළත් නොවේ.
(ඇ) මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය (විශේෂ ගැනුම් හිමිකම් හැර)
(ඇ) කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වයේ වෙනස් වීම්

විනිමය ණය සේවාකරණවල ඇතුළත් වූ අතර, එය 2022 වසරේ දී දළ නිල සංචිත සැළකිය යුතු ලෙස අඩු කිරීමට හේතු විය.

බැංකු අංශයේ විදේශීය වත්කම් තත්ත්වය සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කළ ද, මුළු ජාත්‍යන්තර සංචිත 2022 වසර තුළ දී පහළ ගියේය. විශේෂයෙන් ම, 2022 වසර අග භාගයේ දී බැංකු පද්ධතිය තුළ විදේශ විනිමය ක්‍රමානුකූලව ගොඩනැඟීම හේතුවෙන්, බැංකු අංශයේ විදේශීය වත්කම් තත්ත්වය 2021 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 2,983ක සිට 2022 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 3,976ක් දක්වා ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, තැන්පතු භාරගන්නා ආයතන සතු විදේශීය වත්කම් ඉහළ යෑමක් වාර්තා කළ ද, ප්‍රධාන වශයෙන් දළ නිල සංචිත පහළ යෑම හේතුවෙන්, දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය සංචිත 2022 වසරේ දී පහත වැටුණි. 2022 වසර අවසානය වන විට රටේ මුළු විදේශීය වත්කම් 2021 වසර අවසානය වන විට පැවති, ආනයනික මාස 3.6ට සාපේක්ෂව ආනයනික මාස 3.9කට සමාන විය.

5.7 විදේශීය ණය සහ ණය සේවාකරණය

5.7.1 විදේශීය ණය

ප්‍රධාන වශයෙන් රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ වටිනාකම් සැලකිය යුතු ලෙස පහළ යෑම හේතුවෙන්, ශ්‍රී ලංකාවේ විදේශීය ණය 2022 වසර අවසානය වන විට පහළ ගියේය. රටේ මුළු විදේශීය ණය ප්‍රමාණය 2021 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 51,775ට

5.13.අ. සංඛ්‍යා සටහන

නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය

එ.ජ. ඩොලර් මිලියන (කාලපරිච්ඡේදය අවසානයේ දී තත්ත්වය)

ශීර්ෂය	2021 (අ)	2022 (ආ)
රජය	**27,556**	**27,518**
කෙටි කාලීන	**1**	**31**
ණය සුරැකුම්පත්	1	31
භාණ්ඩාගාර බිල්පත් (ඇ)	1	31
දිගු කාලීන	**27,555**	**27,488**
ණය සුරැකුම්පත්	6,265	3,926
භාණ්ඩාගාර බැඳුම්කර (ඇ)	8	34
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ඇ)	24	27
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ඉ)	6,233	3,866
වෙළඳපොළ මිල		3,315
උපචිත පොලිය		551
ණය	21,289	23,562
නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය		23,413
රජයේ විදේශීය ණයවල උපචිත පොලිය		149
මහ බැංකුව	**4,892**	**6,391**
කෙටි කාලීන	**526**	**2,029**
මුදල් සහ තැන්පතු	3	15
අනෙකුත් ගෙවිය යුතු ගිණුම්	523	2,014
ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්	523	2,014
දිගු කාලීන	**4,367**	**4,362**
විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම්	1,330	1,265
මුදල් සහ තැන්පතු	1,774	2,036
ඉන්දියානු සංචිත බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම		400
බංගලාදේශ බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම	200	200
චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම	1,574	1,433
විදේශ විනිමය හුවමාරු පහසුකම් සඳහා අදාළ වන උපචිත පොලිය		3
ණය	1,263	1,062
ජා.මූ. අරමුදලේ ණය	1,263	1,062
විස්තිර්ණ ණය පහසුකම	1,263	1,062
තැන්පතු භාරගන්නා ආයතන	**7,146**	**5,370**
කෙටි කාලීන	**5,979**	**4,547**
මුදල් සහ තැන්පතු (ඊ)	3,974	3,843
වාණිජ බැංකු	3,974	3,843
ණය	2,005	704
වාණිජ බැංකු	2,005	704
දිගු කාලීන	**1,167**	**823**
ණය	1,167	823
වාණිජ බැංකු	1,084	823
තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන	83	-
පිටු අංක 198 හා සම්බන්ධයි		

(අ) සංශෝධිත
මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව
(ආ) තාවකාලික
(ඇ) පොත් අගය මත පදනම්ව
(ඈ) මුහුණත වටිනාකම මත පදනම්ව
(ඉ) වෙළඳපොළ මිල මත පදනම්ව
(ඊ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්ගේ තැන්පතු ඇතුළත් වේ.

සාපේක්ෂව, 2022 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් මිලියන 49,678ක් විය. රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද, රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය වෙළඳපොළ මිලට අනුව පහළ යෑම හේතුවෙන්,

5.13.ආ. සංඛ්‍යා සටහන

නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය

එ.ජ. ඩොලර් මිලියන (කාලපරිච්ඡේදය අවසානයේ දී තත්ත්වය)

ශීර්ෂය	2021 (අ)	2022 (ආ)
පිටු අංක 197 හා සම්බන්ධයි		
අනෙකුත් අංශ (ඇ)	**6,847**	**4,454**
කෙටි කාලීන	**1,915**	**1,020**
වෙළඳ ණය සහ අත්තිකාරම් (ඈ)	1,915	1,020
දිගු කාලීන	**4,932**	**3,435**
ණය සුරකුම්පත් (ඉ)	94	78
ජාත්‍යන්තර බැඳුම්කරවල වෙළඳපොළ මිල		72
ජාත්‍යන්තර බැඳුම්කරවල උපචිත පොලිය		6
ණය	4,838	3,357
පොද්ගලික අංශය	2,293	2,372
රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ රාජ්‍ය සංස්ථා	2,545	985
සෘජු ආයෝජන: අන්තර් සමාගම් ණය (ඊ)	**5,334**	**5,944**
දළ විදේශීය ණය තත්ත්වය	**51,775**	**49,678**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් වශයෙන්		
දළ විදේශීය ණය	58.5	64.5
කෙටි කාලීන ණය	9.5	9.9
දිගු කාලීන ණය	49.0	54.6
දළ විදේශීය ණයෙහි ප්‍රතිශතයක් වශයෙන්		
කෙටි කාලීන ණය	16.3	15.4
දිගු කාලීන ණය	83.7	84.6
අනේවාසිකයන් සඳහා වන මුළු උපචිත පොලිය		**709**
රජය - ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල කුපන		551
රජය - විදේශීය ණය		149
මහ බැංකුව - ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම්		3
රජය සතු වාණිජ ව්‍යවසායයන් - ජාත්‍යන්තර බැඳුම්කරවල කුපන		6
වියෝජිත අයිතමයන්		
අනේවාසිකයන් සතු ණය සුරකුම්පත්හි මුහුණත වටිනාකම - ආංශික වර්ගීකරණය	**11,400**	**11,622**
රජය	11,225	11,447
භාණ්ඩාගාර බිල්පත්	1	34
භාණ්ඩාගාර බැඳුම්කර	9	36
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	24	27
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර	11,191	10,800
අනේවාසිකයන්ට ගෙවිය යුතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කුපනවල උපචිත පොලිය		551
අනෙකුත් අංශ	175	175
නොපියවා ඉතිරිව ඇති මුළු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල මුහුණත වටිනාකම	**13,050**	**12,550**
අනේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය	11,191	10,800
නේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය (උ)	1,859	1,750

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පොද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් ඇතුළත් වේ.
(ඈ) ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව සහ පොද්ගලික අංශයේ සමාගම්හි නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ඇතුළත් වේ.
(ඉ) වෙළඳපොළ මිල මත පදනම්ව
(ඊ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ඇතුළත් වේ.
(උ) 2019 දෙසැම්බර් සිට විදේශීය ණය සංඛ්‍යානවල ඇතුලත් නොවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රජයේ මුළු විදේශීය වගකීම් සමාන මට්ටම්වල පැවතුණි. බහුපාර්ශ්වික ණය දෙන්නන් වෙත ගෙවිය යුතු ණය හැර, රජයේ විදේශීය ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීම මගින් විදේශීය ණය ගෙවීම අවම වීමෙන්, යම් අවකාශයක් සලසා දුන් නමුත්, රජය විසින් ද්විපාර්ශ්වික ණය ස්වරූපයෙන් ඉන්දියාවෙන්, ඉන්ධන, ඖෂධ සහ පොහොර ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීම සඳහා හදිසි ණය පහසුකම් ගණනාවක් ලබා ගැනීම 2022 වසර තුළ දී විදේශීය ණය ලැබීම් සැලකිය යුතු ලෙස ඉහළ යෑමට හේතු විය. තවද, 2022 වසරේ අප්‍රේල් මස මැද සිට තෝරාගත් විදේශීය ණය සඳහා ණය සේවාකරණය අත්හිටුවීම හේතුවෙන් නොපියවා ඉතිරි වූ විදේශීය ණයවල ගෙවීමට තිබූ උපචිත පොලී සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවලට අදාළ ගෙවීමට තිබූ කුපන වගකීම් ද අදාළ ණය උපකරණවල නොපියවා ඉතිරිව ඇති වගකීම් වලට ඇතුළත් කර ඇත.[4] ණය සේවාකරණය තාවකාලිකව අත්හිටුවීමෙන් පසු රජය වෙත වාණිජමය වශයෙන් ණය ලැබීම් පහළ ගියද, රජයේ විදේශීය ණය වගකීම් තවදුරටත් ඉහළ යෑමට මෙය හේතු වී තිබේ. මුදල් හා තැන්පතු යටතේ වර්ගීකරණය කරන ඉන්දියානු සංචිත බැංකුව වෙතින් ලද ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම ලැබීමත්, 'ගෙවිය යුතු වෙනත් ගිණුම්' යටතේ වර්ගීකරණය කරන ලද ආසියානු නිශ්කාෂණ සංගමයේ වගකීම් වැඩි වීමත් සමඟ මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය ද සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, වාණිජ බැංකු විසින් ඔවුන්ගේ

4 නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය සංඛ්‍යා දත්තවල සහ අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි පිළිබිඹු වන පරිදි ණය වාරික ආපසු නොගෙවීම රජයේ නොපියවා ඉතිරිව ඇති ණය වගකීම් තත්ත්වයෙහි වෙනසක් සිදු නොකරයි.

5.13 රූප සටහන

අංශ අනුව විදේශීය ණය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

විශේෂ සටහන 3

විදේශීය අංශයේ තුලනය ශක්තිමත් කිරීම සඳහා පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා

හැඳින්වීම

ද්විත්ව හිඟය ලෙස ප්‍රචලිත, රටක ධාරිතාවට වඩා සහ ඊට ඉහළින් අධික ලෙස වියදම් කිරීම නිසා ඇතිවන අසමතුලිතතාවයන් තුළින් ඇති වන රජයේ අයවැය සහ විදේශීය ජංගම ගිණුමේ සමගාමී හිඟයන් පැවතීමේ සංසිද්ධිය, අවුරුදු ගණනාවක් පුරා ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන ව්‍යුහාත්මක බාධාවක් වන අතර, සාර්ව ආර්ථිකයේ ඇති අවදානම් සඳහා ප්‍රධාන සාධකයකි. ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් වෙළඳ භාණ්ඩ ගිණුමෙහි සහ ප්‍රාථමික ආදායම් ගිණුමෙහි වසර ගණනාවක් තිස්සේ පවතින විශාල හිඟයන් හේතුවෙන් ඇතිවන අඛණ්ඩ විදේශීය ජංගම ගිණුමේ හිඟයන් අත්විඳිමින් සිටී. සේවා වෙළඳාම් ගිණුමේ සහ ද්විතීයික ආදායම් ගිණුමේ (ප්‍රධාන වශයෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සමන්විත) අතිරික්තයන් වාර්තා කළද, මෙම අතිරික්තයන් ජංගම ගිණුමේ වෙළඳ භාණ්ඩ සහ ප්‍රාථමික ආදායම් ගිණුම්වල නිරන්තරයෙන් පුළුල් වන හිඟයන්ගේ බලපෑම අවම කිරීමට ප්‍රමාණවත් නොවීය. තවද, ව්‍යුහාත්මක සහ ප්‍රතිපත්තිමය බාධාවන් හේතුවෙන් පශ්චාත් යුධ සමයේ පවා අපේක්ෂිත මට්ටම දක්වා විදේශීය සෘජු ආයෝජන වැනි ණය නොවන විදේශීය මූල්‍ය ප්‍රවාහයන් ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකාව අසමත් විය. එපමණක් නොව, පසුගිය දශකය තුළ දී රටේ ඉහළ ගිය විදේශීය ණය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන විශාල ණය සේවාකරණ ගෙවීම්, රටේ ණය තිරසාරභාවය පිළිබඳ ගැටලු තීව්‍ර කරමින් විදේශීය අංශයේ අසමතුලිතතාවයන් ඇති කිරීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. විදේශීය අංශයේ මෙම ව්‍යුහාත්මක දුර්වලතා මධ්‍යයේ, රාජ්‍ය මූල්‍ය අංශයේ විචක්ෂණශීලී නොවන හා නිරන්තරයෙන් වෙනස්වන ප්‍රතිපත්ති, කොවිඩ්-19 වසංගතය සහ ඒ ආශ්‍රිත අවිනිශ්චිතතාවයන් සාර්ව ආර්ථික දුර්වලතා තීව්‍ර කරමින් ව්‍යසන මාලාවක් ඇති කළේය. 2022 වසරේ අප්‍රේල් මස වන විට ද්‍රවශීලී සංචිත ප්‍රමාණය ශූන්‍ය මට්ටමට ආසන්න වීමත් සමඟ දළ නිල සංචිත ඉතිහාසයේ පැවති අවම මට්ටම්වලට පහත වැටුණු අතර, 2022 වසරේ මාර්තු මස මුල දී විනිමය අනුපාතිකය විශාල ලෙස ඉහළ ගියේය. මෙම ප්‍රවණතා හමුවේ, රජය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් අපේක්ෂාවෙන්, 2022 වසරේ අප්‍රේල් මාසයේ දී අතුරු කාලසීමාවක් සඳහා ණය සේවාකරණය නතර කිරීමක් නිවේදනය කළ අතර, ජා.මූ. අරමුදල සමඟ මූල්‍ය පහසුකමක් ලබා ගැනීමේ වැඩපිළිවෙළක් සඳහා සාකච්ඡා ආරම්භ කළේය. ශ්‍රී ලංකාවේ ණය තිරසාර නොවන බව තක්සේරු කර ඇති බැවින්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළෙහි සාර්ථකත්වය රඳා පවතිනුයේ පවතින ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය මතය. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ පරාමිතීන් ශ්‍රී ලංකාවේ නිල සහ පෞද්ගලික ණය හිමියන් සමඟ සාකච්ඡා කර එකඟ වූ පසු, ශ්‍රී ලංකාවට වඩා දිගු කල්පිරීමක් සහිත කුඩා පරිමාණයෙන් ණය සේවාකරණ ගෙවීම් නැවත ආරම්භ කරනු ඇත. මෙම ප්‍රථම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රයත්නය, අතීතයේ සිදු කළ වැරදි නිවැරදි කර ගැනීමටත්, ඇතැම් රටවල් අත්විඳින පරිදි නැවත නැවතත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැටසටහන් වෙත යොමු වීමෙන් රට පීඩාවට පත් නොවීම සහතික කිරීම සඳහා තීරණාත්මක ලෙස අනාගත ක්‍රියාමාර්ග සැලසුම් කිරීමටත්, නැවත හිමි නොවිය හැකි වටිනා අවස්ථාවක් ලබා දෙනු ඇත. රටේ රාජ්‍ය මූල්‍ය හා විදේශීය තත්ත්වයන් ශක්තිමත් කිරීමට සහ ඉදිරි කාලසීමාව තුළ අභියෝගවලට මුහුණ දීමේ හැකියාව ගොඩනඟා ගැනීම සඳහා ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය පමණක් නොව, පශ්චාත් ප්‍රතිව්‍යුහගත ආර්ථිකයේ ඉදිරි මාවත හොඳින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු බව මෙයින් අවධාරණය කෙරේ.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියෙහි අභියෝග

1950 වසරේ සිට 2010 වසර දක්වා රටවල් 95ක් සම්බන්ධව ගෝලීය වශයෙන් ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සිදුවීම් 600කට වැඩි ප්‍රමාණයක් සිදු වී ඇත (Das, Papaioannou, & Trebesch, 2012). සාමාන්‍යයෙන්, සාර්ථක ණය ප්‍රතිව්‍යුහගතකරණයකින් පසු රටක් තිරසාර ලෙස ඉදිරියට ණය කළමනාකරණය කර ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, සාර්ථක ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියකින් පසු සිය ණය තිරසාර ලෙස කළමනාකරණය කර ගැනීමට ඉහත සියලු රටවල් සමත් නොවූ අතර, එසේ අසමත් වූ රටවලින් පසුව තවදුරටත් ණය පැහැර හැරීම් වාර්තා විය. ඇතැම් රටවල් ණය ප්‍රතිව්‍යුහගත කිරීම හරහා ඔවුන්ගේ ආර්ථික වර්ධනයෙහි විභව මට්ටමට ළඟා වීමට සහ විදේශීය අංශයේ ස්ථාවරත්වය සහතික කිරීමට අපොහොසත් වීමට හේතු කිහිපයක් ඇති අතර, පහත විස්තර කර ඇති පරිදි දැක්විය හැකිය.

1. **අභිතකර ආර්ථික තත්ත්වයන්:** නැවත ගොඩනැඟීමේ අදියරේ දී රටක බාහිර පරිසරය සහ පුළුල් ආර්ථික තත්ත්වයන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලය තීරණය කිරීමට ඉතා වැදගත් වේ. නිදසුනක් වශයෙන්, පශ්චාත් ප්‍රතිව්‍යුහගතකරණ අවධිය තුළ ගෝලීය ආර්ථිකය මන්දගාමී වුවහොත් හෝ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් ආර්ථික සංකෝචනයකට මුහුණ දෙන්නේ නම්, රටක ආර්ථික වර්ධනයෙහි විභව මට්ටම සහ ගෙවුම් තුලනයේ තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීමට අපහසු විය හැක.

5

ශ්‍රී ලංකාවේ පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගතකරණ අවධියේ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම අභියෝගයට ලක් කරමින් දැඩි මුදල් ප්‍රතිපත්ති හා මූල්‍ය වෙළඳපොළ තත්ත්වයන් මධ්‍යයේ, 2023 වසරේ දී ගෝලීය ආර්ථික ආතතීන් ඉහළ යා හැකි බවට පූර්ව ලක්ෂණ දක්නට ලැබේ.

2. **ක්‍රියාවට නැංවීමේ අභියෝග:** බාහිර ණයකරුවන්ගේ සහ ඔවුන්ගේ අවශ්‍යතාවල විවිධත්වය මෙන්ම භූ දේශපාලනික අවශ්‍යතා අනුව, ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ අදියර සංකීර්ණ විය හැක. මෙමගින්, ණය හිමියන් සමඟ එකඟතාවයකට එළඹීම අභියෝගාත්මක විය හැකි අතර, එමගින් සාකච්ඡා දීර්ඝ වීම තුළින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීමේ අවදානම ඉහළ යා හැකිය. බොහෝ කල්ගත වන ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියකින් ආයෝජකයින්ගේ විශ්වාසය තවදුරටත් පළුදු විය හැකි අතර විදේශීය අංශයෙහි ස්ථාවරත්වය නැවත ලබා ගැනීම සඳහා ප්‍රධාන දුෂ්කරතාවයක් විය හැකිය.

3. **ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවීම:** ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සාර්ව රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ සහ අවශ්‍ය ගැලපීම් අවධාරණය කරමින්, කෙටිකාලීනව හා මැදි කාලීනව තිරසාර වර්ධන මාවතක් කරා ආර්ථිකය ගෙන යන ප්‍රතිපත්ති සංකලනයක් අනුගමනය කිරීමට අවශ්‍ය වේ. කෙසේ වෙතත්, ප්‍රතිපත්තිමය ප්‍රතිචාර ඵලදායී ලෙස සැලසුම් කර නොමැති නම් හෝ ක්‍රියාත්මක කිරීමේ දී සම්බන්ධීකරණය අවම නම්, අපේක්ෂිත ප්‍රතිඵලය ළඟා කර ගත නොහැක. ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මුහුණ දෙන ආවේණික ගැටලු සලකා බලන විට අවශ්‍ය ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ ප්‍රමාණවත් තරම් ශක්තිමත් විය යුතුය.

4. **දේශපාලන අස්ථාවරත්වය:** ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියකින් පසු ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම රඳා පවතිනුයේ ණය හිමියන් සමඟ එකඟ වූ ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය සහ එහි දක්වා ඇති ඉලක්ක පිළිපැදීම මතය. ප්‍රධාන ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා ගත යුතු තීරණ, ජනප්‍රිය තීරණ නොවන නිසා රජයන් එවැනි ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීමේ දී දැඩි පීඩනයකට ලක් වනු ඇති අතර, ඇතැම් විට ජන්දදායකයන්ගේ බලපෑම්වලට ඉඩදීමට සිදුවිය හැකිය. දේශපාලන ස්ථාවරත්වයක් පැවතීම, ආයෝජකයින්, බහුපාර්ශ්වික හා ද්විපාර්ශ්වික ණය දෙන්නන් සහ ණයහිමියන් ඇතුළු පාර්ශ්වකරුවන් අතර ආර්ථිකය පිළිබඳ විශ්වාසය යළි ගොඩනැංවීමට උපකාරී වනු ඇත. තවද, දේශපාලන අස්ථාවරත්වය ප්‍රතිපත්තිමය අසංගතතාවයට හේතු විය හැකි අතර, එය තිරසාර සාර්ව ආර්ථික ගැලපීම් ක්‍රියාත්මක කිරීම සඳහා විශාල බාධාවක් විය හැක. මේ අනුව, පශ්චාත් ප්‍රතිව්‍යුහගත ආර්ථික පුනර්ජීවනය මෙන්ම ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව, දේශපාලන ස්ථාවරත්වය අඛණ්ඩව පවත්වාගෙන යෑම මෙන්ම ප්‍රතිසංස්කරණ සඳහා මහජන සහයෝගය මත තීරණය වනු ඇත.

5. **දුර්වල ආයතන:** දුර්වල ආයතන නීතියේ ආධිපත්‍යය පිරිහීමට, විනිවිදභාවය හා වගවීම නොමැති වීමට සහ දූෂණය වැඩි වීම හේතු වන අතර, ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල ඵලදායීතාවය සීමා කරමින් සහ ආයෝජකයන්ගේ විශ්වාසය පළුදු කරමින් ආර්ථික වර්ධනයට අහිතකර පරිසරයක් නිර්මාණය කළ හැක.

මෙම පසුබිම තුළ, ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කරන අතරම විදේශීය අංශයේ ස්ථාවරත්වයක් ඇති කිරීම අරමුණු කරගත් ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවක් සැකසීම යෝග්‍ය වේ. ඒ අනුව, අනාගතයේ දී නැවත නැවතත් ජ.මූ. අරමුදලේ ණය ආධාර ලබා ගැනීමේ සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම් සඳහා ප්‍රවේශ වීමේ අවශ්‍යතාවයන් වැළැක්වීමට නම් හැකි ඉක්මනින් අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමටත්, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යටතේ ණයහිමියන් විසින් ලබා දෙන ණය සහන කාලය අවසන් වී ණය වගකීම් නැවත ගෙවීම ආරම්භ වන අවස්ථාව වන විට ඇතිවන මූල්‍යකරණ අවශ්‍යතාවන් සපුරා ගැනීමේ මූලාශ්‍ර පිලිබඳවත් රජය පැහැදිලි උපාය මාර්ගයක් ප්‍රකාශ කළ යුතුය. රටක සාර්ව ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ළඟා කර ගැනීම සඳහා විදේශීය අංශයේ ස්ථිර ස්වාරක්ෂක ගොඩනැඟීම ඉතා වැදගත් වේ. එවැනි ස්වාරක්ෂක, මනා සම්බන්ධීකරණයකින් යුතු ජාතික ප්‍රතිපත්ති ප්‍රවාහයක් තුළින් විදේශීය ජංගම හා මූල්‍ය ගිණුම ශක්තිමත් කිරීම මෙන්ම අයවැය හිඟය හා විදේශීය ජංගම ගිණුමේ හිඟය ණය ලබා ගැනීම් තුළින් මූල්‍යකරණය කිරීම යන දිශානතියෙන් ඉවත් වීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය හැකිය.

විදේශීය ජංගම ගිණුම ශක්තිමත් කිරීම සඳහා වන ප්‍රතිපත්ති

අධි තක්සේරු වූ විනිමය අනුපාතිකය හා වෙළඳ අංශය වෙත ප්‍රමාණවත් ආයෝජන නොමැති වීම මධ්‍යයේ සීමිත විවිධාංගීකරණය, අවම අගය එකතු කිරීම, ගෝලීය අගය දාමයන් සමඟ ඒකාබද්ධ වීම මන්දගාමී වීම සහ තරඟකාරීව සිටීමට අවශ්‍ය සංකීර්ණත්වය නොමැතිකම වැනි අවේනික ගැටලු හේතුවෙන් පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ අපනයන අඛණ්ඩ හෝ ඉහළ වර්ධනයක් ලබා ගැනීමක් දක්නට නොලැබුණි. මේ අතර, ප්‍රධාන වශයෙන් විදේශීය

අංශයේ ණය ගැනීම් හරහා මූල්‍යකරණය කරන ලද සියලුම වර්ගයේ ආනයන සඳහා වන වියදම් වඩා වැඩි වේගයකින්, විශේෂයෙන්ම 2011 වසරේ සිට ඉහළ යෑම වෙළඳ හිඟයන් පුළුල් වීමට හේතු විය. ඒ අනුව, විදේශීය ජංගම ගිණුමේ හිඟය පියවා ගැනීමේ ඕනෑම ප්‍රයත්නයක්, සේවා ගිණුමේ අතිරික්තය ඉහළ නංවන අතරම වෙළඳ භාණ්ඩ අපනයන ආදායම ඉහළ නැංවීමේ සමගාමී ක්‍රියාමාර්ග මගින් වෙළඳ හිඟය අඩු කිරීම කෙරෙහි අවධානය යොමු කරන උපායමාර්ග විය යුතුය. ආනයන තාර්කීකරණය සහ ආනයන ආදේශනය සඳහා වන ප්‍රයත්නයන් හරහා ඉල්ලුම් කළමණාකරණ ක්‍රියාමාර්ග හඳුන්වා දිය හැක්කේ තාවකාලික පදනමක් මත ආර්ථික ස්ථාවරත්වය ආරක්ෂා කර ගැනීම සඳහා පමණක් වන අතර, එවැනි ක්‍රියාමාර්ග දිගු කාලීනව අනුගමනය කිරීමෙන් ආර්ථිකයේ තරඟකාරීත්වය දුර්වල විය හැක. තවද, නවෝත්පාදන සඳහා වන පර්යේෂණ හා සංවර්ධනය තුළින් නිෂ්පාදන විවිධාංගීකරණය, සිරස් සහ තිරස් ඒකාබද්ධ වීම, කොටස් වශයෙන් නිෂ්පාදනය කිරීමේ ජාලයන්ට සහභාගී වීම සහ උපාංග නිෂ්පාදනය හරහා ගෝලීය අගය දාම වෙත ඇතුළත් වීම මෙන්ම නව වෙළඳපොළ ගවේෂණය කිරීම මගින් අපනයන ගමනාන්තයන් ලෙස සාම්ප්‍රදායික වෙළඳපොළ මත අධික ලෙස රඳා පැවතීම අඩු කිරීම යනාදිය වැදගත් ක්‍රියාමාර්ග ලෙස සැලකිය හැක. විශේෂයෙන්ම, නම්‍යශීලී විනිමය අනුපාතිකයක්, ස්ථාවර බදු හා ආයෝජන ප්‍රතිපත්ති, මිල ස්ථායිතාව හා එමඟින් අඩුවෙන් උච්චාවචනය වන පොළී අනුපාත ව්‍යුහයක් සහ අත්‍යවශ්‍ය යටිතල පහසුකම් පවත්වා ගැනීම වැනි හිතකර සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මගින් අපනයන අංශයට සහාය විය හැකිය. ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකා ජාතික අපනයන ක්‍රමෝපායේ දක්වා ඇති ක්‍රියාමාර්ග කඩිනමින් සහ බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම, එහි අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. ඒකාබද්ධ කිරීම් හරහා ආනයන ඵලදායී ලෙස ආදේශ කරන අතර, අපනයන අංශයේ දේශීය අගය එකතු කිරීම ඉහළ නැංවීමට ප්‍රධාන අපනයන සඳහා අවශ්‍ය අන්තර් භාණ්ඩ සපයන දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. නිදහස් වෙළඳ ගිවිසුම් තුළින් සමාන අවස්ථාවන් නිර්මාණය කිරීම අමතර වාසිදායක තත්ත්වයක් වනු ඇත. තවද, පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ක්‍රියාමාර්ග තුළින් මැදි හා දිගුකාලීනව ෆොසිල ඉන්ධන මත රඳා පැවත්ම අඩු කරන අතර, එය ඉන්ධන ආනයනය මගින් ජංගම ගිණුමට ඇති කරන පීඩනය අවම කිරීමට උපකාරී වනු ඇත.

මේ අතර, විදේශීය ජංගම ගිණුමේ හිඟය පියවීම සඳහා සේවා අපනයන අත්‍යවශ්‍ය වන බැවින් එවැනි සේවා අපනයනවල පවතින පූර්ණ විභවය උකහා ගැනීම අත්‍යවශ්‍ය වේ. විශාලම සේවා අපනයන අංශය වන සංචාරක අංශය යථා තත්ත්වයට පත් වීමේ ලකුණු පෙන්නුම් කරන අතර, සංචාරක කර්මාන්තයෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සුවිශේෂී සහ සාම්ප්‍රදායික නොවන සංචාරක වෙළඳපොළ සහ විවේකය සඳහා සංචාර හැර වෙනත් හේතු සඳහා සංචාරය කරන සංචාරකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරෙන පරිදි සංචාරක අංශය විවිධාංගීකරණය කිරීම අත්‍යවශ්‍ය වේ. එසේම, ශුද්ධ විදේශ විනිමය රට වෙත ගලා ඒමට ඇතැම් සේවා අපනයන විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණය/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන අංශයට සැලකිය යුතු හැකියාවක් ඇත. කොවිඩ්-19 වසංගතයෙන් පසු ලොව පුරා ආර්ථිකයන්හි ඩිජිටල්කරණය වැඩි වීමත් සමඟ තොරතුරු තාක්ෂණය/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන අංශවල වර්ධන ඉඩ ප්‍රස්ථා පුළුල් වී ඇත. එබැවින්, ශ්‍රී ලංකාව ඩිජිටල්කරණයට ලක් වූ රටක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා රටෙහි පුහුණු ශ්‍රම බලකායක් සිටීම සහ නවීන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වලින් සමන්විත වීම යන කරුණු ප්‍රයෝජනයට ගත යුතුය. එසේම, මෙම අංශයේ වර්ධනයට සමගාමීව අවශ්‍ය කෙරෙන මානව ප්‍රාග්ධන සංවර්ධනය කිරීම සහ වෙළඳපොළ ඉල්ලුමට ගැළපෙන පරිදි ද්විතීයික සහ තෘතීයික තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය හැඩගැස්වීම කළ යුතු වේ. ණය ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය ද පහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, පොළී නොවන ආදායම් ගිණුමේ අතිරික්තයක් ඇති කිරීම අවශ්‍ය වේ.

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා විදේශ රැකියා ප්‍රවර්ධනය, විදේශ රැකියා වෙළඳපොළ විවිධාංගීකරණය කිරීම සහ ඉහළ ඉපැයුම් හැකියාවක් සහිත රැකියා අවස්ථා වැඩි ප්‍රමාණයක් සුරක්ෂිත කර ගැනීමට සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ කුසලතා ඉහළ නැංවීම සහ අඩු පිරිවැයකින්, තත්කාලීනව හා පහසුවෙන් දේශසීමා හරහා අරමුදල් ප්‍රවාහ ගමන් කිරීමට පහසුකම් සැලසීම මගින් නිල ප්‍රේෂණ ප්‍රවාහයන් දිරිමත් කිරීම සඳහා පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාකාරී දායකත්වය අවශ්‍ය වේ. ශ්‍රී ලංකාව පසුගිය කාලයේ මැදපෙරදිග කලාපයෙන් ලබාගත් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් ප්‍රතිලාභ ලබා ඇතත්, විශේෂයෙන්ම දකුණු කොරියාව, සිංගප්පූරුව, ජපානය සහ යුරෝපීය රටවල් වැනි පුළුල් පරාසයක විවිධ රැකියා සඳහා ඉහළ වැටුප් විභවයක් සහිත දියුණු ආර්ථිකයන් විකල්ප ගමනාන්තයන් ලෙස ප්‍රවර්ධනය කිරීම කාලෝචිත වන අතර, එමඟින් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ප්‍රමාණය ඉහළ යෑම මෙන්ම ප්‍රේෂණ ලැබීම්වල භූ දේශපාලනික වශයෙන් ඇතිවන අවදානම් අවම වීම ද සිදු වේ. මේ අතර, ශ්‍රී ලංකාවෙන් වෘත්තිකයන් විශාල ලෙස ස්ථිර පදනමක් මත සංක්‍රමණය වීම, විදේශ සේවා නියුක්තිකයන්ගේ

ප්‍රේෂණවලට අහිතකර ලෙස බලපෑම මෙන්ම බුද්ධි ගලනය හේතුවෙන් දිගුකාලීන ආර්ථික ප්‍රතිවිපාකවලට ද හේතු විය හැකි බැවින්, ඒ සඳහා කඩිනමින් විසඳුම් සෙවිය යුතුය.

විදේශීය මූල්‍ය ලැබීම් ශක්තිමත් කිරීම සඳහා වන ප්‍රතිපත්ති

ඉහළ විදේශීය ජංගම ගිණුම් හිඟය පියවා ගැනීම සඳහා ඉලක්කගත ක්‍රියාමාර්ගයන්ට අමතරව, විදේශීය සෘජු ආයෝජන සහ විවිධ ආයෝජන වැනි ණය නොවන ප්‍රාග්ධන ලැබීම් ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම තුළට වැඩි වශයෙන් ආකර්ශණය කර ගනිමින්, විදේශීය අංශයේ ඉහළ ස්ථාවරත්වය මෙන්ම වැඩිදියුණු කළ සාර්ව ආර්ථික ස්ථායීතාවය සහතික කිරීම අවශ්‍ය වේ. අඛණ්ඩ විදේශ විනිමය ණය සේවාකරණ අවශ්‍යතා සහ ණය ආපසු ගෙවීම සඳහා රාජ්‍ය මූල්‍ය අවකාශය අඩු වීම හමුවේ විදේශීය අංශයේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා විදේශීය අංශය අවදානම් සඳහා මුහුණ දීමේ හැකියාව වැඩිදියුණු කිරීමට, ඉදිරියේ දී ණය නොවන විදේශීය මූල්‍ය ලැබීම් ආකර්ෂණය කර ගැනීම දැඩි අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. ජංගම ගිණුමේ හිඟය පියවීමට සහ දේශීය ආයෝජන වැඩි කිරීමට සහාය දැක්වීමට අමතරව, විවිධ අංශ සඳහා තාක්ෂණික දැනුම ව්‍යාප්ත කිරීම, ව්‍යාපාර පුළුල් වීම සඳහා සහාය වීම සහ විදේශ වෙළඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කිරීම හරහා ජාත්‍යන්තර වෙළඳ සම්බන්ධතා වැඩිදියුණු කරවීම යනාදිය තුළින් විදේශීය සෘජු ආයෝජන ආර්ථික වර්ධනයට දායක වේ. සමහර නීතිමය, ව්‍යුහාත්මක සහ ආයතනික දුර්වලතා, එනම් දැඩි ශ්‍රම වෙළඳපොළ නීති, උපයෝගීතා ලබාගැනීමේ අපහසුතා, සංකීර්ණ සහ අස්ථාවර බදු ව්‍යුහයන්, විශේෂයෙන්ම කොන්ත්‍රාත් බලාත්මක කිරීම, ආනයන අපනයන ලියකියවිලි අවශ්‍යතා, ව්‍යාපාර ආරම්භ කිරීම, දේපළ අත්පත් කර ගැනීම යනාදිය සම්බන්ධයෙන් පවත්නා සංකීර්ණ නියාමන ව්‍යුහයන් සහ හොඳින් සංවර්ධිත යටිතල පහසුකම් නොමැතිකම හේතුවෙන් පසුගිය දශක කිහිපය පුරා ශ්‍රී ලංකාවේ විදේශීය සෘජු ආයෝජන ලැබීම් කලාපීය සම රටවල් සමඟ සසඳන විට ඉතා පහළ මට්ටමක පැවතුණි. මෙම සාධක හැරුණු විට, ප්‍රතිපත්ති අවිනිශ්චිතතාවය, සිදුවිය හැකි වංචා දූෂණ සහ දුර්වල සම්බන්ධීකරණය වැනි ආයතනික සහ පාලන දුර්වලතා ශ්‍රී ලංකාව තුළ හිතකර ආයෝජන වාතාවරණයක් ඇති කිරීමට අඛණ්ඩව බාධා පමුණුවා ඇත. එබැවින්, ආයෝජකයන්ගේ විශ්වාසය වර්ධනය කිරීම සඳහා, ශ්‍රී ලංකාව පුළුල් ආයෝජන ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවමින් විනිවිදභාවයකින් යුතු සහ ඵලදායී ප්‍රතිපත්තිමය රාමුවක් ස්ථාපිත කළ යුතු අතර, ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මානව නිපුණතා සහ ආයතනික හැකියාවන් ගොඩනඟා ගැනීම සිදු කළ යුතුය. වෙළඳ හා කාර්මික ප්‍රතිපත්ති වැනි අනෙකුත් සංවර්ධන ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සමඟ විදේශීය ආයෝජන ප්‍රතිපත්තිය ඒකාබද්ධව ක්‍රියාවට නැංවීම මෙන්ම, මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී අන්තර් නියෝජිතායතන සම්බන්ධීකරණය ද එක සේ වැදගත් වේ. ආර්ථික වර්ධනයට දායක වීමෙන් පමණක් නොව සමස්ත ආර්ථිකයටම කාර්යක්ෂම ප්‍රතිලාභ අත්කරගැනීම සඳහා සාර්ව-රාජ්‍ය මූල්‍ය ගැළපුම් වැඩසටහන යටතේ ආර්ථිකයට මැදි කාලීන සිට දිගු කාලීනව යථා තත්ත්වයට පත් වීම සඳහා විදේශීය සෘජු ආයෝජන සහ ඒ හා සබැඳි ප්‍රතිලාභ උපකාරී වනු ඇත. මෙම ගැටලු නිරාකරණය කිරීම සඳහා අදාළ බලධාරීන් දැනටමත් ප්‍රයත්න දරා ඇති අතර, ගෝලීය විදේශීය සෘජු ආයෝජන ප්‍රවාහයන් පූර්ව වසංගත මට්ටම්වලට නැවත ළඟාවීමට පෙරාතුව මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම අත්‍යවශ්‍ය වේ.

වාණිජ ව්‍යාපෘති මූල්‍යනය සීමා කිරීම සහ ණය සේවාකරණය සඳහා විදේශ විනිමය උත්පාදනය කළ හැකි වෙළඳාම් අංශ සඳහා මූල්‍යන අවස්ථා දිරිගැන්වීම ද අවශ්‍ය වේ. ණය ගැනීම්වල ඵලදායී ප්‍රයෝජනය ඉහළ නැංවීම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත සහ රටේ විදේශ සංචිත වෙත පීඩනය අවම කිරීම සඳහා විදේශීය ණය ගැනීම්, ඒවායේ භාවිතය සහ ආර්ථික බලපෑම් සම්බන්ධයෙන් මහජනතාවට විනිවිදභාවය සහ වගවීම වැඩිදියුණු කරන අතරම, පැහැදිලි සහ විනිවිදභාවයෙන් යුත් ඇගයීම් සහ තේරීම් යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය. තවද, විදේශීය ණය ගැනීම් හා සම්බන්ධ ඉහළ අවදානම් වාරික අඩු කිරීම සඳහා ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු කිරීමේ උපාය මාර්ගයක් ගොඩ නැගීම අවශ්‍ය වේ. එසේ වුවද, ඉදිරි කාලය තුළ රටේ ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු වන බැවින්, සමස්ත ණය කළඹ තුළ වාණිජ ණය කොටස වැඩි කිරීමේ ප්‍රවණතාව වැළැක්විය යුතුය. බලශක්ති සහ ආහාර සුරක්ෂිතතා, දේශගුණික අනුගත වීම වැනි අත්‍යවශ්‍ය ව්‍යාපෘති සඳහා අඩු පිරිවැයක් සහිත අරමුදල් විකල්පයන් තුළින් ගෝලීය වශයෙන් පුළුල් ලෙස ලබා ගත හැකි තිරසාර මූල්‍යන විකල්පයන් පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයන් කිරීම මෙන්ම හරිත මූල්‍යන විකල්පයන් භාවිතා කිරීම ප්‍රයෝජනවත් වේ. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම මගින් දළ නිල සංචිත ගොඩනැගීමට අවශ්‍ය විදේශීය අරමුදල් රටට ආකර්ෂණය කර ගැනීම සඳහා සහාය වන වෙළඳපොළ අපේක්ෂාවන් වැඩිදියුණු කිරීමට අවස්ථාව හිමි වේ. 2032 වසර වන විට රජයේ ණය මට්ටම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 95ට වඩා අඩු කිරීම, 2027-32 වන කාලපරිච්ඡේදය තුළ දී මධ්‍යම රජයේ සාමාන්‍ය දළ මූල්‍යයන අවශ්‍යතාවය අඩු කිරීම වෙනුවෙන් ඉතා අපහසු තත්ත්වයන් යටතේ මූල්‍යනයන් නැවත ලබා ගැනීමේ අවදානම් කළමනාකරණය කළ හැකි වන පරිදි අවිනිශ්චිත වගකීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 13කට අඩු මට්ටමක තබා ගැනීම 2027-32 වන කාලපරිච්ඡේදය තුළ ඕනෑම වසරක දී මධ්‍යම රජයේ විදේශ විනිමය ණය සේවාකරණය කිරීම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක්

ලෙස සියයට 4.5කට අඩුවෙන් තබා ගැනීම, රාජ්‍ය මූල්‍ය හා විදේශීය මූල්‍යන හිඟය පියවීම සහතික කිරීම යනාදී මධ්‍යම හා දිගු කාලීන ඉලක්ක ළඟා කරගනිමින් බලධාරීන් විසින් ණය තිරසාරභාවය අත්කර ගැනීම අවශ්‍ය වේ.

සමාජීතිය

ඉහත කරුණු සලකා බැලීමේ දී, වත්මන් ආර්ථික අර්බුදයෙන් ස්ථිරසාරව නැවත යථා තත්ත්වයට පත්වීම උදෙසා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ දී කෙටි කාලීනව ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම පමණක් නොව පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගත කිරීම් සහ පශ්චාත් ජා.මූ. අරමුදලෙහි පහසුකම් අවධිය තුළදීත් ප්‍රමාණවත් ආරක්ෂාවන් සහ අභියෝගවලට මුහුණ දීමේ හැකියාව සහිතව රට යළි ගොඩනැඟීම සඳහා යොමුවීම ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාව අත්විඳින අඛණ්ඩ ද්විත්ව හිඟය අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර සකස් කරන ලද හා වෙනස්වන දේශපාලන පාලන තන්ත්‍රවල බලපෑම්වලින් මිදුණු පුළුල් ජාතික ප්‍රතිපත්ති පැකේජයක් හරහා ගොඩ නැගෙන තිරසාර පදනමක් මත ගෙවුම් තුලන ගැටලු විසඳීමේ වැදගත්කම ඉස්මතු කරයි. තවද, වාණිජමය විදේශීය ණයවලින් ජංගම ගිණුමේ හිඟය පියවීමේ අවශ්‍යතාවය අවම කරන අතරම, ණය නොවන විදේශ විනිමය උත්පාදන මූලාශ්‍ර ගවේෂණය කර දිරිමත් කළ යුතුය. එසේම, ජාත්‍යන්තර අත්දැකීම්වලට අනුව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සහ ඉන්පසු ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමේ ප්‍රතිඵලවල ප්‍රධාන නිර්ණායකය වන්නේ ප්‍රතිසංස්කරණ වැඩසටහනේ සාර්ථකත්වය සඳහා බලධාරීන්ගේ කැපවීම් මට්ටමයි. එසේම, රජයේ අයවැය හිඟයන් සහ විදේශීය ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කිරීමේ සංයුතිය ඉදිරි කාලසීමාව තුළ ණය නොවන මූල්‍යන තුළින් සිදු නොවන්නේ නම්, ඉදිරි ගමන සඳහා අනිවාර්ය කොන්දේසි වන ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ ඇති ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සහ සාර්ව-රාජ්‍ය මූල්‍ය ගැළපුම් වැඩසටහන ඇතුළුව ආර්ථික ප්‍රශ්න විසඳීමට දැනට දරණ අඛණ්ඩ උත්සාහයන් තුළින් පමණක් රටේ ගැඹුරින් මුල් බැසගත් ව්‍යුහාත්මක දුර්වලතා සහ සාර්ව ආර්ථික සංකූලතා සඳහා ස්ථිර විසඳුමක් සහතික නොකරනු ඇත.

මූලාශ්‍රය

1. Das, U., Papaioannou, M., & Trebesch, C. (2012). 'Sovereign Debt Restructurings 1950-2010: Literature Survey, Data, and Stylized Facts'. IMF Working Paper, IMF.

නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය සහ මුදල් හා තැන්පතු වගකීම් තත්ත්වය පහත දැමීම සමඟ, විශේෂයෙන් වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී, තැන්පතු භාර ගන්නා ආයතනවල නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු විය. ණය ගෙවීම අත්හිටුවීමෙහි ප්‍රතිඵලයක් ලෙස ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහත වැටීමත් සමඟ පවතින ණය වගකීම් අඛණ්ඩව ආපසු ගෙවීමට වාණිජ බැංකුවලට සිදු වූ අතර, එම බැංකුවලට ණය පහසුකම් ලබා ගැනීමට නොහැකි වීම ද බැංකු අංශයේ විදේශීය ණය ප්‍රමාණය පහත වැටීමට හේතු විය. ප්‍රධාන වශයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ගෙවිය යුතු වෙළඳ ණය සම්බන්ධයෙන් පවතින නොපියවා ඉතිරිව ඇති වගකීම් අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස, පුද්ගලික සංස්ථාවල නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය ද පහත වැටුණි. තවද, 2022 වසර අවසන් වන විට රජය සතු වාණිජ ව්‍යවසායයන් කිහිපයක නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ජා.මූ. අරමුදලේ නිර්දේශ සමඟ නැවත වර්ගීකරණය කිරීමට ගත් අමාත්‍ය මණ්ඩල තීරණය ද සමඟින් රජය විසින් රජයේ නොපියවූ විදේශීය ණය ලෙස නැවත වර්ගීකරණය කරන ලදී. මෙම ණයවලට හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය, මත්තල හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපළ ව්‍යාපෘතිය සහ පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය සම්බන්ධ ණය ඇතුළත් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස විදේශීය ණය සංඛ්‍යා දත්තවල 'අනෙකුත් අංශය' යටතේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණයෙහි කැපී පෙනෙන අඩු වීමක් සිදු විය. තවද, ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ණය සුරැකුම්පතකට අදාළ කුපන ගෙවීමක් නොගෙවීමත් සමඟ උපචිත වූ පොලිය එකතු වීමක්ද සිදු විය. මේ අතර, වසර තුළ දී ඍජු ආයෝජන ව්‍යවසායයන්හි නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණයෙහි ඉහළ යෑමක් වාර්තා වුණි.

රටේ සමස්ත නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, වසර තුළ දී ඉහළ ගියේය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, සමස්ත නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය 2021 වසර අවසානයේ දී පැවති සියයට 58.5ට සාපේක්ෂව, 2022 වසර අවසානයේ දී සියයට 64.5ක් විය. වසර තුළ දී සමස්ත විදේශීය ණයෙහි නාමික අගය සැලකිය යුතු ලෙස පහළ ගිය ද, එ.ජ. ඩොලර්වලින් ප්‍රකාශිත නාමික ද.දේ.නි.යෙහි අගය සැලකිය යුතු ලෙස පහළ යෑම මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

තවද, සමස්ත විදේශීය ණය තත්ත්වයෙන් රජය විසින් නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය තත්ත්වය 2021 වසර අවසානයට පැවති සියයට 53.2ට සාපේක්ෂව, 2022 වසර අවසානය වන විට සියයට 55.4ක් දක්වා වැඩි විය. ණය කල්පිරීමේ කාලය අනුව, සමස්ත විදේශීය ණයෙහි ප්‍රතිශතයක් ලෙස දිගු කාලීන ණය 2021 වසර අවසානය වන විට පැවති සියයට 83.7ට සාපේක්ෂව, 2022 වසර අවසානය වන විට සියයට 84.6ක් විය.

5.7.2 විදේශීය ණය සේවාකරණ ගෙවීම්

2022 වසරේ අප්‍රේල් මස මැද භාගයේ සිට තෝරාගත් විදේශීය ණය සේවාකරණයන් තාවකාලිකව අත්හිටුවීමත් සමඟ, නොගෙවූ වගකීම් හැර, 2022 වසරේ දී ණය වාරික සහ පොලී මත සිදු කරන ලද ණය ආපසු ගෙවීම් පමණක් සලකමින් ගණනය කළ විදේශීය ණය ආපසු ගෙවීම් 2022 වසරේ දී සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළේය. රජය විසින් ද්විපාර්ශ්වික විදේශීය ණය සහ වාණිජ ණය හිමියන් වෙත ගෙවිය යුතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ඇතුළුව, බහුපාර්ශ්වික ආයතන හැර වෙනත් අනේවාසිකයින් වෙත ණය වාරික සහ පොලී ගෙවීම් රජය විසින් සිදු නොකිරීම ණය සේවාකරණයෙහි මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, සමස්ත විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2021 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 4,597ට සාපේක්ෂව, 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,471ක් විය. රජය විසින් සිදු කළ ණය වාරික ආපසු ගෙවීම් 2021 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,377ට සාපේක්ෂව, 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,236ක් විය. තවද, රජය විසින් සිදු කළ පොලී ආපසු ගෙවීම් 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,187ක් වූ අතර, 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 465ක් විය. රජය විසින් විදේශීය ණය සේවාකරණය තාවකාලිකව අත්හිටුවීමෙන් පසු බහුපාර්ශ්වික ආයතනවලට ගෙවිය යුතු විදේශීය ණය පමණක් ආපසු ගෙවන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව කලාපීය මහ බැංකු සමඟ පවත්නා ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම් අඛණ්ඩව ඉදිරියට ගෙන යමින්, ජා.මූ. අරමුදලෙන් මින් පෙර ලබා ගත් විස්තීර්ණ ණය පහසුකමට අදාළ ණය සේවකරණය අඛණ්ඩව සිදු කළේය. මේ අතර, පෞද්ගලික අංශය සිය විදේශීය ණය වගකීම් ගෙවීම සාමාන්‍ය පරිදි අඛණ්ඩව සිදු කරන ලදී. කෙසේ වෙතත්, විදේශීය ණය ලබා ගෙන ඇති ඇතැම් රජය සතු වාණිජ ව්‍යවසායයන් විදේශීය වගකීම් අර්ධ වශයෙන් පමණක් ආපසු ගෙවූ අතර, රජය විසින් ණය ගෙවීම් තාවකාලිකව අත්හිටුවනු ලැබීමත් සමඟ එය බලපෑමට ලක් විය. මෙම රජය සතු වාණිජ ව්‍යවසායයන් යටතට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලි බල මණ්ඩලය, ශ්‍රී ලංකා විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගම ඇතුළත් වන අතර, මෙම නැවත නොගෙවූ ඇතැම් රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ ණය 5.7.1 කොටසේ සඳහන් පරිදි රාජ්‍ය ණය ලෙස නැවත වර්ගීකරණය කෙරිණි.

5.14 සංඛ්‍යා සටහන

විදේශීය ණය සේවාකරණ ගෙවීම්

එ.ජ. ඩොලර් මිලියන

ශීර්ෂය	2021 (අ)	2022 (ආ)
1. ණය සේවාකරණ ගෙවීම්	**4,597**	**2,471**
1.1 ණය ආපසු ගෙවීම්	**3,187**	**1,710**
රජය	2,377	1,236
ව්‍යාපෘති ණය	1,671	845
ණය සුරැකුම්පත්	706	391
මහ බැංකුව	457	140
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	57	140
ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම්	400	-
පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන	354	335
විදේශීය ණය	354	335
1.2 පොලී ගෙවීම්	**1,410**	**761**
රජය	1,187	465
ව්‍යාපෘති ණය	394	273
ණය සුරැකුම්පත්	793	192
මහ බැංකුව	15	58
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	15	42
ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම්	1	16
පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන	197	207
විදේශීය ණය	184	200
ණය උපකරණ	12	6
සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි අන්තර් සමාගම් ණය	11	31
2. වෙළඳ භාණ්ඩ හා සේවාවන්ගේ අපනයන ඉපැයුම්	**14,974**	**16,169**
3. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයුම්, ආදායම් හා ජංගම සංක්‍රාම	**20,587**	**20,211**
4. ණය සේවාකරණ අනුපාතිකය		
4.1 ඉහත 2හි ප්‍රතිශතයක් වශයෙන්		
සමස්ත අනුපාතිකය	30.7	15.3
ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර	30.2	14.2
4.2 ඉහත 3හි ප්‍රතිශතයක් වශයෙන්		
සමස්ත අනුපාතිකය	22.3	12.2
ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර	22.0	11.3
5. රජයේ ණය සේවාකරණ ගෙවීම්		
5.1 රජයේ ණය සේවාකරණ ගෙවීම් (ඇ)	3,564	1,701
5.2 ඉහත 1හි ප්‍රතිශතයක් වශයෙන්	77.5	68.8

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ගනුදෙනු හැර

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

5.8 විනිමය අනුපාතිකයේ හැසිරීම

ශ්‍රී ලංකා රුපියල 2022 වසරේ මැයි මාසයේ දී හඳුන්වා දුන් ද්වෛනික විචලන සීමාවන්ට අනුව ස්ථාවර වීමට පෙර, 2022 වසරේ මුල් භාගයේ දී ඉහළ අස්ථාවරත්වයක් පෙන්නුම් කරමින්, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ඉතිහාසයේ ඉහළම අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත්වීම සහ ශිෂ්ට ප්‍රයෝග අබණ්ඩව භාවිතා කිරීම 2022 වසරේ මුල් කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයකට රුපියල් 200-203 පරාසයක පවත්වා ගැනීමට උපකාරී විය. කෙසේ වෙතත්, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි සැලකිය යුතු ද්‍රවශීලතා හිඟය, නිල විනිමය අනුපාතිකය සහ 'අවිධිමත් වෙළඳපොළ අනුපාතිකය' අතර පරාසය පුළුල් වීම සහ ගෝලීය තත්ත්වය අයහපත් අතට හැරීම මඟින් විනිමය අනුපාතිකය මත දිගින් දිගටම පීඩනය එල්ල වීම හේතුවෙන් විනිමය අනුපාතිකයට අවශ්‍ය ගැළපුම් සිදු කිරීම සඳහා 2022 වසරේ මාර්තු මස මුල දී ඉඩහරින ලදී. කෙසේ වෙතත්, වෙළඳපොළ අවිනිශ්චිතතාවයන් හමුවේ පසුව වෙළඳපොළ බලවේග මගින් විනිමය අනුපාතිකය විශාල ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් 2022 වසරේ අප්‍රේල් මස අවසන් වන විට ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 41.4කින් සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වුණි. අධික සමපේක්ෂණය සහ ආර්ථිකය මත ඇති වන අහිතකර බලපෑම් මගින් මෙහෙයවනු ලබන මෙම සැලකිය යුතු අස්ථාවරත්වය අවම කිරීම සඳහා මහ බැංකුව විසින් විනිමය අනුපාතිකයෙහි දිනක් තුළ සිදුවන උච්චාවචන කළමනාකරණය කිරීමේ තාවකාලික ක්‍රියාමාර්ගයක් ලෙස දිනපතා ප්‍රකාශයට පත් කරනු ලබන විචලන සීමාවන් හඳුන්වා දෙන ලදී. පෙර නොවූ විරූ ගෙවුම් තුලන පීඩනය මධ්‍යයේ අධික සමපේක්ෂණය මගින් මෙහෙයවනු ලබන විනිමය අනුපාතිකයෙහි විශාල උච්චාවචනයක් සීමා කිරීමට මෙය උපකාරී විය. 2022 වසරේ මැයි මස 13වන දා සිට හඳුන්වා දුන් මෙම නව විනිමය අනුපාතික නිර්ණය කිරීමේ ක්‍රමවේදයට අනුව, මහ බැංකුව විසින් අන්තර් බැංකු ගනුදෙනුවලට අදාළ එ.ජ. ඩොලරයට ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතිකයෙහි බර තැබූ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකයක් මත පදනම්ව මධ්‍ය එතැන් විනිමය අනුපාතිකයක් සහ එම මධ්‍ය එතැන් විනිමය අනුපාතිකයේ දෙපසට අදාළ විචලන සීමාවන් ප්‍රකාශයට පත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 වසරේ මැයි මස 13වන දා සිට 2022 වසරේ දෙසැම්බර්

5

5.15 සංඛ්‍යා සටහන

විනිමය අනුපාතික වෙනස්වීම්

මුදල් වර්ගය	විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය						පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම (අ)			
	වර්ෂය අග අනුපාතිකය			වාර්ෂික සාමාන්‍ය අනුපාතිකය			වර්ෂය අග		වාර්ෂික සාමාන්‍යය	
	2020	2021	2022	2020	2021	2022	2021	2022	2021	2022
යූරෝ	229.42	226.86	386.93	212.07	235.10	339.04	1.13	-41.37	-9.80	-30.66
ඉන්දියානු රුපියල්	2.55	2.69	4.39	2.50	2.69	4.11	-5.33	-38.67	-6.96	-34.56
ජපන් යෙන්	1.81	1.74	2.74	1.74	1.81	2.44	3.91	-36.46	-3.95	-25.93
බ්‍රිතාන්‍ය පවුම්	254.35	270.60	437.35	238.22	273.51	396.89	-6.00	-38.13	-12.90	-31.09
එක්සත් ජනපද ඩොලර්	186.41	200.43	363.11	185.52	198.88	324.55	-7.00	-44.80	-6.72	-38.72
විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.)	268.48	280.53	483.24	258.61	283.18	431.91	-4.29	-41.95	-8.68	-34.43

සඵල විනිමය අනුපාතික දර්ශක (ආ) (ඇ) (2017 = 100)	වර්ෂය අග දර්ශකය			වාර්ෂික සාමාන්‍ය දර්ශකය			පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම්			
							වර්ෂය අග දර්ශකය		වාර්ෂික සාමාන්‍ය දර්ශකය	
	2020	2021	2022	2020	2021	2022	2021	2022	2021	2022
නා.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව	83.12	79.65	47.32	85.93	78.64	53.99	-4.18	-40.59	-8.48	-31.34
මූ.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව	88.37	83.31	46.23	91.52	83.58	54.33	-5.72	-44.51	-8.67	-35.00

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) වෙනස්වීම් ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය විදේශ ව්‍යවහාර මුදල් ඒකකයට සාපේක්ෂව අවප්‍රමාණය වීමක් පෙන්නුම් කරයි.

(ආ) නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) යනු වෙළඳ හවුල්කරුවන් සහ තරඟකාරී රටවල් 24ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමඟ සිදු කරන වෙළඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැලපීම මගිනි. සෘණ ලකුණින් දර්ශකය අවප්‍රමාණය වීම පෙන්වයි. මූ.ස.වි.අ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගෙන ගණනය කර ඇත.

(ඇ) විනිමය අනුපාතික දර්ශකයන් අනුව අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය අතිප්‍රමාණය වීම/අවප්‍රමාණය වීම සඵල විනිමය අනුපාතිකයන්හි අගය ඉහළයාම/පහළයාම මගින් පිළිවෙළින් පිළිබිඹු කෙරෙයි.

අවසානය දක්වා, ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට එරෙහිව සුළු අවප්‍රමාණයක් පමණක් වාර්තා කළේය. මෙම කාල සීමාව තුළ විනිමය අනුපාතිකය පුළුල් ලෙස ස්ථාවරව පැවතීමට රටේ ආර්ථික තත්ත්වයන් පිළිබඳ වෙළඳපොළෙහි පැවති අවිනිශ්චිතතා හමුවේ එතැන් වෙළඳපොළ අක්‍රියව පැවතීම ද බොහෝ දුරට හේතු විය. ඒ අනුව, 2022 වසර තුළ දී රුපියලේ වාර්ෂික අවප්‍රමාණය එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 44.8කට සීමා විය. මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව 2021 වසරේ දී ශුද්ධ පදනම මත සිදු කළ එ.ජ. ඩොලර් මිලියන 747ක විදේශ විනිමය සැපයුමට සාපේක්ෂව 2022 වසර තුළ ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 568ක් දේශීය විදේශ විනිමය වෙළඳපොළට සපයා ඇත. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2022 වසර අවසන් වන විට ශ්‍රී ලංකා රුපියල යුරෝ (සියයට 41.4ක්), ස්ටර්ලින් පවුම (සියයට 38.1ක්), ජපන් යෙන් (සියයට 36.4ක්) සහ ඉන්දියානු රුපියලට (සියයට 38.6ක්) සාපේක්ෂව අවප්‍රමාණය විය. විදේශ විනිමය ද්‍රවශීලතාව ඉහළ යෑමත්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ අවසන් අදියරට පැමිණීමේ ධනාත්මක වර්ධනයන්, පහළ ගිය ආර්ථික ක්‍රියාකාරකම් සහ දැඩි ණය තත්ත්වයන් මධ්‍යයේ ආනයන ඉල්ලුම සැලකිය යුතු ලෙස අඩු වීමත් සමඟ දේශීය විදේශ විනිමය වෙළඳපොළ ක්‍රියාකාරීත්වය 2022 වසරේ අග සිට කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. ශ්‍රී ලංකා මහ බැංකුවේ නම්‍යශීලී උද්ධමන ඉලක්ක රාමුවට අනුකූලව දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ක්‍රියාකාරකම් දිරිමත් කිරීම සහ වෙළඳපොළ මත පදනම් වූ විනිමය අනුපාතිකයක් නැවත ඇති කිරීමේ අරමුණින්, අනිවාර්ය විකුණුම් අවශ්‍යතා ලිහිල් කරන අතරම, ශ්‍රී ලංකා මහ බැංකුව විනිමය අනුපාතිකය සම්බන්ධ දෛනික විචලන සීමාවන් ක්‍රමානුකූලව ලිහිල් කිරීමට ආරම්භ කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විනිමය අනුපාතිකය සඳහා විචලන සීමාවන් ක්‍රමයෙන් පුළුල් වීමත් සමඟ බැංකු පද්ධතිය තුළ විදේශ විනිමය ද්‍රවශීලතාව වැඩි කිරීමට ඉඩ සැලසීමේ පළමු පියවර ලෙස මහ බැංකුව විසින්, රුපියල්වලට පරිවර්තනය කළ අපනයන ආදායම සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මහ බැංකුවට විකුණුම් අවශ්‍යතාවය සියයට 25ක සිට සියයට 15ක් දක්වා 2023 වසරේ පෙබරවාරි 27වන දින අඩු කරන ලදී. මෙම ක්‍රියාමාර්ග සමඟින්, 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී විනිමය අනුපාතිකය අධික ලෙස අවප්‍රමාණය වීම නිවැරදි කරමින්, සේවා අංශයට ස්ථාවර විදේශ විනිමය ලැබීම්, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, විවිධ ආයෝජන වෙත ලැබුණු මූල්‍ය ප්‍රවාහ සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම වැඩපිළිවෙළට අදාළ අවසන් එකඟතාවකට පැමිණීම සමඟ යළි ඇති වූ වෙළඳපොළ විශ්වාසය, 2023 වසරේ මාර්තු මස මුල දී විනිමය අනුපාතිකය කැපී පෙනෙන ලෙස අතිප්‍රමාණය වීමට දායක විය. කෙසේ වුවත්, සාපේක්ෂ වශයෙන් කෙටි කාලයක් තුළ විනිමය අනුපාතිකය වෙත ඇති වූ සැලකිය යුතු ඉහළ අතිප්‍රමාණය වීමේ පීඩන හමුවේ විනිමය අනුපාතිකයෙහි ක්‍රමානුකූල අතිප්‍රමාණය වීමකට ඉඩ දීම සඳහා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ

5.14 රූප සටහන
විනිමය අනුපාතිකයේ වෙනස්වීම්



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

වෙත මැදිහත් විය. ඒ අනුව, 2023 වසරේ මාර්තු මාසයේ දී මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් එ.ජ. ඩොලර් මිලියන 451ක් මිලදී ගනු ලැබීය. මේ අතර, 2023 වසරේ මාර්තු 7වන දින සිට බලපැවැත්වෙන පරිදි විනිමය අනුපාතික සම්බන්ධ දෛනික විචලන සීමා සහ බලපත්‍රලාභී බැංකු විසින් මහ බැංකුවට අනිවාර්ය විකුණුම් අවශ්‍යතාවට අදාළ නියමයන් සම්පූර්ණයෙන් ඉවත් කළ බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිවේදනය කරන ලදී. මෙම ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග සහ විදේශීය අංශයේ කෙටිකාලීන දැක්ම පිළිබඳ අපේක්ෂා වැඩිදියුණු වීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස, 2023 වසරේ මාර්තු අවසානය වන විට ශ්‍රී ලංකා රුපියල ක්‍රමයෙන් සියයට 10.9කින් අතිප්‍රමාණය වී එ.ජ. ඩොලරයකට සාපේක්ෂව රු. 327.29ක් ලෙස වාර්තා විය.

එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාත ඉහළ දැමීම මධ්‍යයේ, එ.ජ. ඩොලරය පුළුල් පදනමින් ශක්තිමත් වීමෙන් අනෙකුත් ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල් ඒකක එ.ජ. ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය විය. ඒ අනුව, 2022 වසර අවසානයේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව යුරෝ (සියයට 5.9ක්), ජපන් යෙන් (සියයට 13.2ක්), ස්ටර්ලින් පවුම (සියයට 10.8ක්), සහ ඉන්දියානු රුපියල (සියයට 10.1ක්) කින් අවප්‍රමාණය විය. බොහෝ ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීමේ ඒකාබද්ධ බලපෑම හේතුවෙන් 2022 වසර තුළ දී ශ්‍රී ලංකා රුපියල වි.ගැ.හි.ට එරෙහිව සියයට 41.9කින් අවප්‍රමාණය වුවද, 2023 වසරේ පළමු කාර්තුව තුළ බොහෝ ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව රුපියලේ අගය අතිප්‍රමාණය වීමත් සමඟ, 2023 වසරේ මාර්තු අවසානය වන විට ශ්‍රී ලංකා රුපියල වි.ගැ.හි.ට එරෙහිව සියයට 9.8කින් අතිප්‍රමාණය විය.

5.8.1 නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතිකය

ව්‍යවහාර මුදල් වර්ග කිහිපයකින් සැදුම්ලත් පැසකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි හැසිරීම මනිනු ලබන, මුදල් වර්ග 5කින් සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික (නා.ස.වි.අ.) සහ මූර්ත සඵල විනිමය අනුපාතික (මූ.ස.වි.අ.) දර්ශක 2022 වසර තුළ දී සැලකිය යුතු ලෙස පහළ ගියේය. විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම සමඟින් අනෙකුත් තෝරාගත් ප්‍රධාන මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි සිදු වූ නාමික අවප්‍රමාණය වීම පිළිබිඹු කරමින්, නා.ස.වි.අ. දර්ශක පහළ ගියේය. ඒ අනුව, 2022 වසර තුළ දී, මුදල් වර්ග 5කින් සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැසමත පදනම් වූ නා.ස.වි.අ. දර්ශක, පිළිවෙළින්, සියයට 41.1කින් හා සියයට 40.6කින් පහළ ගියේය. මේ අතර, මුදල් වර්ග 5කින් සැදුම්ලත් පැසමත සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැසමත මගින් මනිනු ලබන ශ්‍රී ලංකාවේ විදේශීය තරඟකාරිත්වය පිළිබිඹු කරන මූ.ස.වි.අ. දර්ශකය, වසර තුළ දී, පිළිවෙළින්, සියයට 13.5කින් සහ සියයට 44.5කින් පහත වැටුණි. සමස්තයක් වශයෙන්, රටේ වෙළඳ තරඟකාරිත්වය පවත්වා ගැනීමට සහය වෙමින් මූ.ස.වි.අ. දර්ශක පදනම් වර්ෂයේ දර්ශක අංක 100 සීමාවට (2017=100) වඩා පහළ මට්ටමක පැවතුණි. 2023 වසරේ මාර්තු මස විනිමය අනුපාතිකය තියුණු ලෙස අතිප්‍රමාණය වීමත් සමඟ, පැසෙහි ඇතුළත් එ.ජ. ඩොලරයට සහ අනෙකුත් ප්‍රධාන මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වූ නාමික අතිප්‍රමාණය වීම පිළිබිඹු කරමින්, නා.ස.වි.අ. සහ මූ.ස.වි.අ. යන දර්ශක දෙකම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, 2023 වසරේ මාර්තු මස අවසානය වන විට, මුදල් වර්ග 5කින් සැදුම්ලත් පැසමත පදනම් වූ නා.ස.වි.අ. සියයට 9.4කින් ඉහළ ගිය අතර මුදල් වර්ග 5කින් සැදුම්ලත් පැසමත පදනම් වූ මූ.ස.වි.අ. දර්ශක සියයට 15.5කින් පහළ ගියේය. 2023 වසරේ මාර්තු මස අවසානය වන විට, මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැසමත පදනම් වූ නා.ස.වි.අ. සහ මූ.ස.වි.අ. දර්ශක පිළිවෙළින් සියයට 10.3කින් සහ සියයට 10.0කින් ඉහළ ගියේය.

5.8.2 දේශීය විදේශ විනිමය වෙළඳපොළ වර්ධනයන්

දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ සිදු වූ ගනුදෙනු පරිමාවන් 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී තවදුරටත් පහළ ගියේය. අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු පරිමාව 2021 වසරේ පැවති එ.ජ. ඩොලර් මිලියන 12,160ට සාපේක්ෂව 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 9,570ක් දක්වා අඩු විය. 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 5,852ක් වූ මුළු එතැන් විනිමය පරිමාව 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 5,479ක් (මුළු ගනුදෙනු ප්‍රමාණයෙන් සියයට 57.3ක්) දක්වා පහළ ගියේය. 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 6,308ක් වූ

5.15 රූප සටහන
කාර්තුමය අන්තර් බැංකු ඉදිරි විනිමය ගනුදෙනු පරිමාවන්



මුළු ඉදිරි විනිමය පරිමාව 2022 වසරේ දී ඇ.ජ. ඩොලර් මිලියන 4,091ක් දක්වා අඩු විය. මේ අතර, 2022 වසරේ දී මහ බැංකුව ශුද්ධ පදනම මත ඇ.ජ. ඩොලර් මිලියන 568ක් සපයමින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ කටයුතු සඳහා මැදිහත් විය. මෙය, ඇ.ජ. ඩොලර් මිලියන 2,148ක විදේශ විනිමය මිලදී ගැනීමෙහි සහ ඇ.ජ. ඩොලර් මිලියන 2,716ක විදේශ විනිමය සැපයුමෙහි ප්‍රතිඵලයක් විය. වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම ප්‍රධාන වශයෙන් සිදු වූයේ අපනයන ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ රුපියල්වලට පරිවර්තනය කිරීම මත බලපත්‍රලාභී බැංකු විසින් මහ බැංකුවට සිදු කළ අනිවාර්ය විකුණුම් හරහා වන අතර, මහ බැංකුව විසින් විදේශ විනිමය විකිණීම අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනයට පහසුකම් සැලසීම සඳහා සිදු විය. දළ නිල සංචිත ශක්තිමත් කිරීමට මෙන්ම විනිමය අනුපාතිකයෙහි අධික උච්චාවචනය අවම කිරීම සඳහා ශුද්ධ පදනම මත ඇ.ජ. ඩොලර් මිලියන 861ක් මිලදී ගැනීම ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුව 2023 වසරේ පළමු කාර්තුව තුළ දේශීය විදේශ විනිමය වෙළඳපොළ කටයුතු සඳහා මැදිහත් විය.

5

6

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය කටයුතු

6.1 සමස්ත නිරීක්ෂණ

දශක කිහිපයක් පුරා රාජ්‍ය මූල්‍ය අංශයේ පැවති අසමතුලිතතාවයන්, 2022 වසරේ දී තීරණාත්මක සංධිස්ථානයක් කරා ළඟා වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පෙර නොවූ අන්දමේ දේශපාලන අර්බුද ද ඇතුළුව සමාජ ආර්ථික ගැටලු රැසක් නිර්මාණය විය. අඛණ්ඩව පැවති අයවැය හිඟයන් මෙන්ම, 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත හා එහි සංශෝධන සහ 2018 අංක 8 දරන සක්‍රීය වගකීම් කළමනාකරණ පනත යටතේ පනවා ඇති සීමා මධ්‍යයේ වූවද ගන්නා ලද නුසුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මෑත වසරවල දී රාජ්‍ය මූල්‍ය අංශය සැලකිය යුතු ලෙස දුර්වලව පැවතීම නිසා ඉහළ ගිය රාජ්‍ය ණය, තිරසාර නොවන මට්ටමක් කරා ළඟා විය. වසර ගණනාවක් පුරා රාජ්‍ය ආදායම පහත වැටීම සහ ණය සේවාකරණ වගකීම් ඉහළ යෑම හේතුවෙන්, දේශීය සහ ගෝලීය ආර්ථික කම්පනවලට ලක් වීමට ශ්‍රී ලංකා ආර්ථිකයේ ඇති අවදානම වර්ධනය විය. ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින්, 2020 ජනවාරි මාසයෙන් ආරම්භ කර 2021 වසරේ දෙවන භාගයේ සිට 2022 වසරේ මුල් අවධිය දක්වා කාලය තුළ දී ඉතා වේගයෙන් ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම හේතුවෙන් විදේශීය ණය සේවාකරණය සඳහා අවශ්‍ය විදේශීය මූල්‍යන සපයා ගැනීම රජයට ප්‍රබල අභියෝගයක් විය. විදේශීය මූල්‍යනයට ඇති ප්‍රවේශය සීමා වීම සහ භාවිත කළ හැකි නිල සංචිත 2022 වසරේ මුල් කාලය තුළ දී අවම අගයකට ආසන්න වීම, රජයේ විදේශීය ණය සේවාකරණය සඳහා ගැටලු ඇති කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 වසරේ අප්‍රේල් මස 12 වැනි දින තෝරාගත් විදේශීය ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවන බව රජය නිවේදනය කළේය. 2022 වසරේ මාර්තු මාසය වන විට රජය විසින් විස්තීර්ණ ණය පහසුකමක් (Extended Fund Facility) සඳහා ජාත්‍යන්තර මූල්‍ය (ජා.මූ.) අරමුදලේ සහාය ඉල්ලා සිටියේය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය තිරසාර නොවන මට්ටමකට ළඟා වී ඇති නිසා විස්තීර්ණ ණය පහසුකම සඳහා වන සාකච්ඡාවල ප්‍රගතියක් ඇති නොවුනු අතර, එමගින් ණය සේවාකරණය අත්හිටුවීමේ නිවේදනයෙන් පසු ණය ප්‍රතිව්‍යුහගත කිරීමට පියවර ගැනීමේ අවශ්‍යතාවය මතු විය. පසුව, 2022 සැප්තැම්බර් මුල දී නිලධාරී මට්ටමේ එකඟතා ගිවිසුමකට එළඹුණු අතර, ද්වීපාර්ශ්වික ණය හිමියන්ගෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සඳහා මූල්‍ය සහතික ලබා ගැනීමත් සමඟ, 2023 මාර්තු මස දී ජා.මූ. අරමුදලෙහි විධායක මණ්ඩලය විසින් විස්තීර්ණ ණය පහසුකම හරහා අයවැයට සහාය දීමට ක්‍රියාත්මක වන වැඩසටහනකට අනුමැතිය ලබා දෙන ලදී. මෑත වසරවල දී, අයවැය හිඟය මූල්‍යනය සඳහා දේශීය මූලාශ්‍ර මත, එනම්, ප්‍රධාන වශයෙන් මහ බැංකුව හරහා අයවැය හිඟය මූල්‍යනය කිරීම මත, රඳා පැවතීමට රජයට සිදු වූ අතර, මහ බැංකුව මගින් සිදු කළ මූල්‍යනය 2021 වසරේ දී විශාල ලෙස ඉහළ ගොස් එම තත්ත්වය 2022 වසරේ ද පැවතීම හේතුවෙන් සැලකිය යුතු උද්ධමන පීඩනයන් ඇති විය. ශීඝ්‍රයෙන් වැඩි වන උද්ධමනය අඩු කර ගැනීම සඳහා 2022 වසරේ මුල් භාගයේ දී සැලකිය යුතු ලෙස මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමක් අවශ්‍ය වීමෙහි ප්‍රතිඵලයක් ලෙස රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතික ඉහළ ගිය අතර, පසුව රජයේ දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව ඇති වූ අවිනිශ්චිතතා හේතුවෙන් සුරැකුම්පත්වල ඵලදා අනුපාතික තවදුරටත් ඉහළ යෑමේ බලපෑමකට ලක් විය. 2022 වසරේ දී රාජ්‍ය මූල්‍ය අංශයේ පැවති පීඩනය දැඩි වීමත් සමඟ, නැවත විශ්වාසය දිනා ගැනීම සහ ස්ථාවරත්වය ළඟා කරගැනීම අරමුණු කරගෙන,

නුදුරු කාලීනව සැලකිය යුතු ගැළපුම් පිරිවැයක් සහිතව වුවද, පෙර නොවූ මට්ටමේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියේ ආරම්භයේ දී ම ක්‍රියාත්මක කිරීමට රජයට සිදු විය. රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසායයන් විසින් සපයනු ලබන උපයෝගිතා සඳහා පිරිවැය පිළිබිඹු වන මිල යාන්ත්‍රණයක් හඳුන්වා දුන් අතර, ආදායම වැඩි කිරීම ප්‍රධාන වශයෙන් පදනම් කරගත්, ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ගමන් මගකට, රජය අවතීර්ණ විය. කෙසේ වෙතත්, 2022 වසර තුළ දී වියදම් තාර්කීකරණ ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කළ ද, රජයේ වියදම් අබණ්ඩව ඉහළ ගියේය. විශාල ලෙස වර්ධනය වන දේශීය ණය සඳහා වූ ඉහළ පොලී ගෙවීම් සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත ණය ලබා දීම මෙන්ම සහනාධාර හා පැවරුම් සඳහා වූ වියදම්වල සැලකිය යුතු වැඩිවීම ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින් රාජ්‍ය වියදම් නාමික වශයෙන් වැඩි විය. එසේ වුවද, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග මෙන්ම ඉහළ අවධමනාත්මක බලපෑමක් සහිතව නාමික දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) ඇති වූ ප්‍රසාරණය, 2022 වසර තුළ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂවල හිඟය පාලනය කිරීමට රජයට උපකාර විය. 2021 වසරට සාපේක්ෂව, ප්‍රාථමික හිඟය නාමික වශයෙන් මෙන්ම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ද අඩු වූ අතර, රාජ්‍ය ණය තිරසාර බව සහතික කිරීම සඳහා ඉදිරි කාලය තුළ ප්‍රාථමික ශේෂය තවදුරටත් යහපත් ලෙස වර්ධනය කරගැනීම අවශ්‍ය වේ. එකතු කළ අගය මත බදු සහ පුද්ගලික ආදායම් බදු පදනම පුළුල් කිරීම මෙන්ම පුද්ගලික සහ ආයතනික ආදායම් බදු අනුපාත ඉහළ නැංවීම ඇතුළුව, 2022 වසරේ අග භාගයේ දී හඳුන්වා දුන් ක්‍රියාමාර්ගවල සම්පූර්ණ ප්‍රතිලාභ පිළිබිඹු කරමින් 2023 වසරේ දී රජයේ ආදායම ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2023 වසරේ දී ශ්‍රී ලංකාව විසින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර, මැදි සහ දිගුකාලීනව රාජ්‍ය ණය මට්ටමේ මාවත ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ ඉදිරිපත් කර ඇති ණය තිරසාරභාවයේ ඉලක්ක වෙත ගෙන ඒමට අපේක්ෂා කෙරේ. ආදායම් වර්ධනය කිරීම සහ වියදම් තාර්කීකරණය සඳහා අබණ්ඩව ප්‍රයත්න දැරීමත් සමඟ, 2024 වසරේ සිට ප්‍රාථමික ශේෂයේ අතිරික්තයක් ඇති වනු ඇතැයි පුරෝකථනය කෙරෙන අතර, එමගින් මැදි හා දිගු කාලීනව රාජ්‍ය ණය තිරසාර බව සහතික කෙරෙනු ඇත. ඒ අතරම, විශේෂයෙන්ම, කඩිනමින් කළ යුතු නොවන සහ අත්‍යවශ්‍ය නොවන ක්‍රියාකාරකම් සඳහා වැයවන වියදම් රජය විසින් කපා හැරීම, ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම හරහා අයවැයට සහාය ලබා දීමට ක්‍රියාත්මක වන වැඩසටහන සාර්ථකව නිම කිරීමට අනිශයින් ම වැදගත් වේ. රජය සතු වාණිජ ව්‍යවසායයන්හි සිදුවිය යුතු ප්‍රතිසංස්කරණ ඇතුළුව, අනෙකුත් ප්‍රතිසංස්කරණ කඩිනමින් සිදු කිරීමට දැඩිව කැපවීම හරහා, අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා මාවත සැබෑ කර ගැනීමට සියලු පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්න සහ මහජන සහයෝගය ඉදිරි කාලය තුළ දී අත්‍යවශ්‍ය සාධක වේ. ඉදිරි කාලය තුළ දී ආර්ථිකය තිරසාර ලෙස යථා තත්ත්වයට පත්වීම සහ ස්ථායීතාව සහතික කිරීම මෙන්ම සමාජයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ආරක්ෂා කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සාක්ෂාත් කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

6

6.2 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

ප්‍රධාන වශයෙන්, ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම හරහා අයවැයට සහාය ලබා දීමට ක්‍රියාත්මක වන වැඩසටහන ආදියේ සහාය ඇතිව, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සහ ණය තිරසාර බව ඉලක්ක කර ගනිමින්, රජය විසින් 2022 වසරේ දී සැලකිය යුතු ප්‍රතිසංස්කරණ සිදු කිරීම ආරම්භ කරන ලදී. 2022 අයවැය මගින් රජයේ ආදායම් සහ වියදම් සඳහා ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, පිළිවෙළින්, සියයට 12.0ක් සහ සියයට 20.8ක් වශයෙන් ඉහළ අභිලාෂයක් සහිත ඉලක්ක යෝජනා කර තිබුණි. කෙසේ වෙතත්, ආර්ථික ක්‍රියාකාරකම්වලට ඇති වූ බාධාවල බලපෑම පිළිබිඹු කරමින් වසරේ මුල් භාගයේ දී රජයේ ආදායම් ලැබීම් දුර්වල මට්ටමක පැවතීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් පැවති අවිනිශ්චිතතා නිසා අවදානම් පාරිතෝෂික (risk premia) වැඩි වීම හේතුවෙන්, ඉහළ ගිය පොලී අනුපාතික යටතේ දේශීය වෙළඳපොළෙන් විශාල වශයෙන් ණය ගැනීම හරහා දේශීය පොලී ගෙවීම් අධික වීම හේතුවෙන්, මෙම ඉලක්ක සපුරා ගැනීම අභියෝගාත්මක විය. රජය විසින් 2022 මාර්තු සහ අප්‍රේල් මාසවල දී වියදම් තාර්කීකරණ ක්‍රියාමාර්ග ප්‍රකාශයට පත් කළ අතර, 2022 මැයි මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් ආදායම් ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් අනුමත කරන ලදී. 2022 සැප්තැම්බර් මාසයේ දී, ආදායම් ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග වඩාත් ශක්තිමත් කිරීම, මූලික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අත්‍යවශ්‍ය ක්‍රියාකාරකම් සඳහා තවදුරටත් අයවැය ප්‍රතිපාදන ලබා දීම සහ අමාත්‍යාංශවල ව්‍යුහයේ සිදු කරන ලද වෙනස්කම්වලට අනුකූලව අයවැය ප්‍රතිපාදන සිදු කිරීම අරමුණු කරගත් 2022 අතුරු අයවැය පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. 2022 අතුරු අයවැයට අනුව, වසර සඳහා රජයේ ආදායම් ඉලක්කය ද.දේ.නි.යෙන් සියයට 8.8ක් දක්වා සංශෝධනය කරන ලද අතර, වියදම් සහ සමස්ත මූල්‍ය

6.1 රූප සටහන
රාජ්‍ය මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය

ණය තිරසාරභාවය පිළිබඳ ගැටලුව රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කර ගැනීමේ සහ රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාවය මතු කරන ලදී...

ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහළ දමන ලදී



නොපියවූ මධ්‍යම රජයේ ණය

දශක කිහිපයක් පුරා පැවති රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවල ප්‍රතිඵලයක් ලෙස ණය තිරසාර නොවන මට්ටමක් කරා ළඟා වූ අතර, රජය ජා.මූ.අ. වෙතින් විස්තීරණ අරමුදල් පහසුකමක් ලබා ගන්නා අතර, ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය ආරම්භ කළේය.



මැදි කාලීන සහ දිගු කාලීන ඉලක්ක



ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්
(ද.දේ.නිෂ්පාදිතයෙහි % ලෙස)



ආදායම සහ වියදම (ද.දේ.නිෂ්පාදිතයෙහි % ලෙස)



රාජ්‍ය ආදායම



රාජ්‍ය වියදම



ශුද්ධ මූල්‍යනය (ද.දේ.නිෂ්පාදිතයෙහි % ලෙස)



මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම් (ද.දේ.නිෂ්පාදිතයෙහි % ලෙස)



6

හිඟය, පිළිවෙළින්, ද.දේ.නි.යෙන් සියයට 18.6ක් සහ සියයට 9.8ක් දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරිණි. ඒ අනුව, 2022 සඳහා වන ප්‍රාථමික හිඟයේ ඉලක්කය ද.දේ.නි.යෙන් සියයට 4.0ක් දක්වා සංශෝධනය කරන ලදී.

රජයේ බදු ආදායම පහත වැටීමේ ප්‍රවණතාවය ආපසු හැරවීම සහ රජයේ ආදායම් එකතු කිරීමේ ව්‍යුහාත්මක දුර්වලතා මඟහරවා ගැනීමේ අරමුණින්, 2022 වසරේ දී ආදායම් ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙන ලදී. 2022 වසර සඳහා වන අයවැය ප්‍රකාශයට අනුව, 2020/2021 බදු තක්සේරු කිරීමේ වසර සඳහා බදු අය කළ හැකි ආදායම රුපියල් බිලියන 2.0ක් ඉක්මවන පුද්ගලයන්, සමාගම් සහ හවුල් ව්‍යාපාර මත, එක් වරක් පමණක් ගෙවිය යුතු සියයට 25ක අධිභාර බද්දක් රජය විසින් පනවා ඇත. මේ අතර, 2022 වසරේ ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සේවා සඳහා අදාළ වන එකතු කළ අගය මත බද්ද සියයට 15 සිට සියයට 18ක් දක්වා ඉහළ නංවන ලදී. මේ අතර, 2022 වසරේ ජූනි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 8 සිට සියයට 12ක් දක්වා වැඩි කරන ලද අතර, විදුලි සංදේශ බද්ද සියයට 11.25 සිට සියයට 15ක් දක්වා ඉහළ නංවන ලදී. 2022 වසර සඳහා වන අතුරු අයවැය මඟින් යෝජනා කරන ලද ආකාරයට 2022 වසරේ සැප්තැම්බර් මාසයේ 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සාමාන්‍ය එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 12 සිට සියයට 15ක් දක්වා නැවත වරක් ඉහළ නංවන ලදී. බදු පදනම පුළුල් කරමින්, 2022 වසරේ ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු ලියාපදිංචි කිරීමේ පිරිවැටුම් සීමාව වසරකට රුපියල් මිලියන 300.0 සිට රුපියල් මිලියන 80.0 දක්වා පහළට ගෙන එමින් 2022 අංක 44 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත 2022 දෙසැම්බර් 15 වන දින බලාත්මක කෙරිණි. මීට අමතරව, 2022 වසරේ ඔක්තෝබර් මාසයේ 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 120.0 ඉක්මවන ආනයනකරුවන්, නිෂ්පාදකයින්, සේවා සපයන්නන්, තොග වෙළෙඳුන් සහ සිල්ලර වෙළෙඳුන් සඳහා, පිරිවැටුම මත සියයට 2.5ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් පනවා ඇත. තවද, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාව හිඟවීම සහ ආනයන බලපත්‍ර ලබා දීම සම්බන්ධ ගැටලු සැලකිල්ලට ගනිමින් 2022 වසරේ ජූනි මාසයේ 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස හයක කාලයක් සඳහා තෝරාගත් ආනයනික භාණ්ඩ සඳහා අධිභාරයක් රජය විසින් හඳුන්වා දෙන ලදී. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පතේ සඳහන් ක්‍රියාමාර්ග ද ඇතුළුව ආදායම් බදු ව්‍යුහයට නීතිමය සංශෝධන සිදු කළ ද, මෙම සංශෝධන බලාත්මක වන්නේ 2023 වසරේ ජනවාරි මාසයේ සිටය. 2022 වසරේ දී හඳුන්වා දුන් ආදායම් ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ගවලින් බොහොමයක් 2022 වසරේ දෙවන භාගයේ සහ 2023 වසරේ ආරම්භයේ සිට ක්‍රියාත්මක වන බැවින්, රජයේ ආදායම කෙරෙහි එම ක්‍රියාමාර්ගවල සම්පූර්ණ බලපෑම 2023 වසරේ සිට ලබාගත හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශයක් තුළ වුවත්, සැලකිය යුතු සමාජ-ආර්ථික පීඩනයන් මධ්‍යයෙහි, සමාජයේ අවදානමට ලක්විය හැකි කොටස්වලට උපකාර කිරීම සඳහා රජය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කරන ලදී. ආර්ථික අර්බුදය හේතුවෙන් මූල්‍යමය වශයෙන් මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා ලිහිල් කිරීම සඳහා, 2022 වසරේ ජනවාරි මාසයේ දී රාජ්‍ය අංශයේ සේවකයින්, විශ්‍රාමිකයන් සහ අඩු ආදායම්ලාභීන්හට සහාය වීම සඳහා සහන පැකේජයක් රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව, රාජ්‍ය අංශයේ සේවකයින් සහ විශ්‍රාමිකයින් හට රුපියල් 5,000ක මාසික දීමනාවක් ගෙවන ලද අතර, සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා වන මාසික දීමනාව එක් පවුලකට රුපියල් 1,000කින් ඉහළ නංවන ලදී. අයවැය ප්‍රතිපාදනවලට සාපේක්ෂව රාජ්‍ය ව්‍යයම් ඉහළ යෑම සැලකිල්ලට ගනිමින්, 2022 වසරේ ජනවාරි මාසයේ දී හඳුන්වා දුන් සහන පැකේජය ඉදිරියට පවත්වාගෙන යාමට සහ අනෙකුත් ව්‍යයම් සඳහා මුදල් වෙන් කිරීම සඳහා 2022 වසරේ ජූනි මාසයේ දී රුපියල් බිලියන 695.0ක (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.9ක්) පරිපූරක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. ආර්ථික අර්බුදය හේතුවෙන් පෙර නොවූ විරූ අන්දමේ දුෂ්කරතා ඇති වීම සැලකිල්ලට ගනිමින්, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව මඟින් ඒ වන විටත් ක්‍රියාත්මක වෙමින් තිබූ ව්‍යාපෘතිවල අරමුදල්වලින් යම් ප්‍රමාණයක් පීඩාවට පත් ප්‍රජාවන්ට උපකාර කිරීම සඳහා ලබා දෙන ලදී. දිළිඳු සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා මුදල් ප්‍රදානය කිරීම, කෘෂිකාර්මික කටයුතු සඳහා පොහොර සැපයීම, අත්‍යවශ්‍ය ඖෂධ මිලදී ගැනීම සහ එල්.පී. ගෑස් (ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු) මිලදී ගැනීම හා නාගරික සහ අර්ධ නාගරික ප්‍රදේශවල එල්.පී. ගෑස් සිලින්ඩර බෙදා හැරීම වැනි බොහෝ ක්‍රියාකාරකම් සඳහා මෙම අරමුදල් භාවිතා කරන ලදී.

6.2 රූප සටහන
ප්‍රධාන රාජ්‍ය මූල්‍ය දර්ශක (අ)
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධනය කර ඇත.

මූලාශ්‍ර: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අයවැය හිඟය පුළුල් වීම සහ රජයට ඇති අයවැය මූල්‍යන මාර්ග සීමිත වීම සැලකිල්ලට ගනිමින්, 2022 වසරේ මාර්තු මාසයේ සිට වියදම් තාර්කීකරණ පියවර කිහිපයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, රාජ්‍ය අංශය වෙත නව බඳවාගැනීම් සීමා කරන අතරම, අත්‍යවශ්‍ය නොවන හා හදිසි නොවන ප්‍රාග්ධන වියදම් අත්හිටුවීම, අතිකාල ගෙවීම්, රාජ්‍ය අංශයේ සේවකයන් හට ලබා දෙන ණය මෙන්ම ලිපිද්‍රව්‍ය සහ මුද්‍රණ වියදම් යනාදී පුනරාවර්තන වියදම් සීමා කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට උපදෙස් ලබා දෙමින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය චක්‍රලේඛයක් නිකුත් කළේය. තවද, වාණිජ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල වියදම් සීමා කිරීමට උපදෙස් ලබා දෙමින් 2022 වසරේ අගෝස්තු මාසයේදී ද එවැනිම චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. රට මුහුණ දී ඇති බලශක්ති අර්බුදය සහ ඉහළ යන රාජ්‍ය වියදම සැලකිල්ලට ගෙන, 2022 වසරේ මාර්තු මාසයේ දී, මෙම ආයතනවල ඉන්ධන සහ විදුලිය සඳහා වන වියදම් අඩු කිරීමට උපදෙස් ලබා දෙමින් රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය චක්‍රලේඛයක් නිකුත් කළේය.

විදුලි ගාස්තු සහ ඉන්ධන සඳහා ක්‍රමවත් ලෙස මිල ගැළපීම් සම්බන්ධයෙන් පැවති දීර්ඝ විරාමයකින් පසු, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ (ලං.ඛ.නී.සං.) සහ ලංකා විදුලිබල මණ්ඩලයේ (ලං.වි.ම.) අඛණ්ඩව පවතින මූල්‍ය අලාභ සැලකිල්ලට ගනිමින්, රජය විසින් ඛනිජ තෙල්වල සිල්ලර මිල ගණන් සහ පාරිභෝගික අන්තයේ විදුලි ගාස්තු, පිරිවැය ප්‍රතිසාධන මට්ටම දක්වා කිහිපවරක් සංශෝධනය කරන ලදී. රජය විසින් ඉන්ධනවල සිල්ලර මිල ගණන් 2022 ජූනි මාසයේ සිට මාසික පදනමින් සංශෝධනය කරන ලද අතර, සිල්ලර මිල තීරණය කිරීම සඳහා 2018 ඉන්ධන මිල සූත්‍රය භාවිතා කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. මේ අතර, 2022 අගෝස්තු සහ 2023 පෙබරවාරි මාසවල දී විදුලි ගාස්තු ඉහළ නංවමින් සංශෝධනය කෙරිණි. තවද, සෑම වසරකම ජනවාරි සහ ජූලි මාසවල දී විදුලි ගාස්තු පිරිවැය ප්‍රතිසාධන මට්ටමට සංශෝධනය කිරීමට 2022 නොවැම්බර් මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. අනාගතයේ දී, පිරිවැය ප්‍රතිසාධනය පදනම් කරගත් විදුලි ගාස්තු, විදුලිය සම්බන්ධයෙන් ලබා දෙන සහනාධාරය සහ එයට අදාළව අයවැය තුළින් ලං.වි.ම.ට සිදු කිරීමට අවශ්‍ය වන පැවරුම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා විදුලි තොග සැපයුම් ගනුදෙනු ගිණුම (Bulk Supply Transaction Account) වැඩිදියුණු කෙරෙනු ඇත. පිරිවැය පිළිඹිබු කෙරෙන මිල ගැළපීම් මගින් ලං.වි.ම.හි සහ ලං.ඛ.නී.සං.හි මූල්‍ය කාර්යසාධනය ශක්තිමත් කිරීමට අපේක්ෂා කරන අතර එමගින් අසම්භාව්‍ය වගකීම් (Contingent Liabilities) නිසා ඇති විය හැකි රාජ්‍ය මූල්‍ය පීඩනය අවම කිරීමට අපේක්ෂිතය.

අයවැය හිඟය සහ නාමික වශයෙන් දළ මූල්‍යන අවශ්‍යතා ඉහළ යෑම සැලකිල්ලට ගනිමින් 2022 වසර සඳහා දළ ණය ගැනීමේ සීමාව කිහිපවතාවක් සංශෝධනය කරන ලද අතර, සීමිත විදේශීය මූල්‍යකරණය මධ්‍යයේ දේශීය මූල්‍යකරණය සඳහා එමගින් අමතර අවකාශයක් නිර්මාණය විය. 2021 අංක 30 දරන විසර්ජන පනත යටතේ 2022 වසර සඳහා රුපියල් බිලියන 3,200ක දළ ණය ගැනීමේ සීමාවක් අනුමත කරන ලදී. 2022 වසර සඳහා වූ අයවැය යටතේ අත්‍යවශ්‍ය ක්‍රියාකාරකම් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනවලට වඩා වියදම් ඉහළ යාම සහ දේශීය ණය සේවාකරණ ගෙවීම් වැඩි වීම සැලකිල්ලට ගනිමින් 2022 වසරේ සැප්තැම්බර් මාසය ආරම්භයේ දී, 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනත මගින් මෙම ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 3,844ක් දක්වා ඉහළ නංවන ලදී. තවද, ඉහළ පොලී අනුපාතික පවතින පසුබිමක් යටතේ ඉහළ යන රජයේ මූල්‍යන අවශ්‍යතා සැපිරීම පිණිස 2022 වසර සඳහා වන දළ ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 4,507ක් දක්වා තවත් රුපියල් බිලියන 663කින් තවදුරටත් ඉහළ නැංවීමට 2022 වසරේ නොවැම්බර් මාසයේ දී පාර්ලිමේන්තුව අනුමැතිය ලබා දුන්නේය. මේ අතර, නොපියවූ භාණ්ඩාගාර බිල්පත් තොග සීමාව රුපියල් බිලියන 3,000ක සිට රුපියල් බිලියන 4,000ක් දක්වා ඉහළ නැංවීමට 2022 වසරේ ජූනි මාසයේ දී පාර්ලිමේන්තුව අනුමැතිය ලබා දුන්නේය. ඉහළ වෙළඳපොළ පොලී අනුපාතික හේතුවෙන් මුහුණත

අගය අනුව ණය ගැනීමේ අවශ්‍යතාවය වැඩි වීම සැලකිල්ලට ගනිමින්, පාර්ලිමේන්තු අනුමැතිය ඇතිව මෙම නොපියවූ භාණ්ඩාගාර බිල්පත් තොගයේ සීමාව 2022 වසරේ නොවැම්බර් මාසයේ දී රුපියල් බිලියන 5,000ක් දක්වා තවදුරටත් ඉහළ නංවන ලදී.

ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවීම මධ්‍යයේ විදේශීය මූල්‍යනය සඳහා ඇති ප්‍රවේශය සීමා වීම සහ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම කිහිපවරක් පහළ දැමීම සැලකිල්ලට ගෙන, සහනදායී විදේශීය මූල්‍යනයන්ට ප්‍රවේශ වීමේ අරමුණින් ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර සංවර්ධන සමායතනය (International Development Association) හරහා අරමුදල් ලබාගැනීම සඳහා ප්‍රතිලෝම ශ්‍රේණිගත කිරීමේ ප්‍රතිපත්තියක්, කෙටි කාලපරිච්ඡේදයක් සඳහා අනුගමනය කිරීමට රජය පියවර ගත්තේය. ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහළ දැමීම හේතුවෙන් ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව (International Bank for Reconstruction and Development) විසින් ලබා දෙන ණය සඳහා ශ්‍රී ලංකාව තවදුරටත් සුදුසුකම් නොලබයි. එබැවින්, ඉතාමත් අවදානමට ලක්ව ඇති රටවල් සඳහා 'ගැප්' (Gap) පහසුකම යටතේ සහනදායී මූල්‍යන පහසුකම් සපයන ජාත්‍යන්තර සංවර්ධන සමායතනය විසින් ලබා දෙන අරමුදල් සඳහා ප්‍රවේශය ලබා ගැනීමට ලෝක බැංකුව වෙතින් ඉල්ලීමක් සිදු කිරීමට අමාත්‍ය මණ්ඩලය 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී අනුමැතිය ලබා දුන්නේය. ඒ අනුව, අවදානමට ලක් විය හැකි පුද්ගලයින්ට ආරක්ෂාව සපයන අතරම සාර්ව ආර්ථික ස්ථායීකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට රටට හැකියාව ලැබෙන පරිදි ජාත්‍යන්තර සංවර්ධන සමායතනය වෙතින් අරමුදල් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙන් ලද ඉල්ලීම ලෝක බැංකුව විසින් 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී අනුමත කරන ලදී.

දළ නිල සංචිත ක්ෂය වීම සහ රටට ගලා එන සීමිත විදේශ විනිමය මධ්‍යයේ රජයට විශාල විදේශීය ණය සේවාකරණ ගෙවීම් ඉදිරියේ දී සිදු කිරීමට නිබෙන බව සැලකිල්ලට ගනිමින්, තාවකාලික පියවරක් ලෙස, තෝරා ගත් විදේශීය රාජ්‍ය ණය කාණ්ඩ සඳහා ණය සේවාකරණ ගෙවීම් නතර කිරීම පිළිබඳව 2022 අප්‍රේල් 12 වන දින රජය විසින් නිවේදනයක් නිකුත් කරන ලදී. ඊට සමගාමීව, විදේශීය ප්‍රභවයන්ගෙන් ලබා ගත් රජයේ ද්විපාර්ශ්වික සහ වාණිජ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ අභිප්‍රාය රජය නිවේදනය කළේය. රජය විසින් ජා.මූ. අරමුදල වෙතින් විස්තීර්ණ ණය පහසුකමක් හරහා සහාය ලබා දෙන ලෙස ඉල්ලා සිටි අතර, එය ලබා ගැනීම සඳහා ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් තුළින් ණය තිරසාර බව සහතික කිරීමට ප්‍රයත්න දැරීමට අවශ්‍ය විය. ඒ අනුව, රජයේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට සහාය ලබා ගැනීම සඳහා, ලසාර්ඩ් ෆෙයර් එස්.ඒ.එස්. (Lazard Frères SAS) සහ ක්ලිෆර්ඩ් චාන්ස් සීමිත වගකීම් හවුල්කාරිත්වය (Clifford Chance LLP), පිළිවෙළින්, මූල්‍ය සහ නීති උපදේශකයන් ලෙස පත් කරන ලදී. විස්තීර්ණ ණය පහසුකමේ සහාය ඇතිව ක්‍රියාත්මක වන වැඩසටහන සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රයත්නයන්ට සමගාමීව, ණය සහ රාජ්‍ය මූල්‍ය අංශයේ තිරසාරභාවය කෙටි කාලීන සිට දිගු කාලීන කාල පරාසයන් දක්වා සහතික කිරීම සඳහා පුළුල් සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කෙරිණි. මෙම සාර්ව ආර්ථික වැඩසටහන තුළ, උපයෝගිතා සැපයීම සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිල යාන්ත්‍රණ පිහිටුවීම ඇතුළුව, රාජ්‍ය ව්‍යවසායන් සම්බන්ධයෙන් සිදු කෙරෙන ආයතනික ප්‍රතිසංස්කරණවලට අමතරව ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියක් ද ඇතුළත් වේ. මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා රජය සහ ජා.මූ. අරමුදල 2022 වසරේ සැප්තැම්බර් මාසය ආරම්භයේ දී අයවැය සඳහා ආධාර සපයන විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනකට නිලධාරී මට්ටමේ එකඟතා ගිවිසුමකට එළැඹිණි. පැරිස් සමාජයේ (Paris Club) සාමාජික රටවල්, ඉන්දියාව සහ චීනය ඇතුළු සියලුම ප්‍රධාන ද්විපාර්ශ්වික ණයහිමියන් විසින් ජා.මූ. අරමුදලට පිළිගත හැකි මට්ටමට, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සඳහා ඔවුන්ගේ මූල්‍ය සහතික වීම් ලබා දී ඇත. ඒ අනුව, 2023 මාර්තු 20 වැනි දින ජා.මූ. අරමුදලෙහි විධායක මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව සඳහා විස්තීර්ණ ණය පහසුකම යටතේ විශේෂ ගැනුම් හිමිකම් බිලියන 2.286ක් (ඇමරිකානු ඩොලර් බිලියන 3ක් පමණ) අනුමත කරන ලදී. විස්තීර්ණ ණය පහසුකම සඳහා අනුමැතිය ලැබීම සමඟ, ද්විපාර්ශ්වික සහ වාණිජ ණය හිමියන් සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා 2023 වසර තුළ දී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

පසුගිය වසරවල දී පහළ හෙළන ලද ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම්, තෝරා ගත් විදේශීය ණය සේවාකරණ ගෙවීම් පූර්ව දැනුම්දීමක් සහිතව අත්හිටුවීමෙන් අනතුරුව, 2022 වසරේ දී තවදුරටත් පහළ හෙළන ලදී. ඒ අනුව, එස් ඇන්ඩ් පී ගෝලීය ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය විසින් 2022 වසරේ අප්‍රේල් මාසයේ 13 වන දින ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම, 'CCC (සෘණ)' සිට 'CC (සෘණ)' දක්වා ද, 2022 වසරේ අප්‍රේල් මාසයේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා වූ පොලී ගෙවීම සිදු නොකිරීම හේතුවෙන් 2022 වසරේ අප්‍රේල්

මස 25 වන දින, 'SD' (Selective Default) දක්වා ද ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම පහත හෙළන ලදී. තවද, 2022 වසරේ අප්‍රේල් 18 වන දින, මූඩීස් ආයෝජක සේවය ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම 'Caa2 (ස්ථාවර)' සිට 'Ca (ස්ථාවර)' දක්වා පහත හෙළීමට කටයුතු කළේය. 2022 වසරේ මැයි මාසයේ 19 වන දින, ෆිච් ශ්‍රේණිගත කිරීමේ ආයතනය විසින් ද ශ්‍රී ලංකාවේ දිගුකාලීන විදේශ විනිමය ණය පැහැර හැරීමට අදාළ ණය ශ්‍රේණිගත කිරීම (Long Term Foreign Currency Issuer Default Rating) 'C' සිට 'RD' (Restricted Default) දක්වා පහත හෙළන ලදී. මීට අමතරව, 2022 වසරේ දෙසැම්බර් මාසයේ 01 වන දින, දේශීය වශයෙන් ණය පැහැර හැරීමට ඇති හැකියාව සැලකිල්ලට ගනිමින් ෆිච් ශ්‍රේණිගත කිරීම් මගින් දිගුකාලීන දේශීය ණය පැහැර හැරීමට අදාළ ණය ශ්‍රේණිගත කිරීම (Long Term Local Currency Issuer Default Rating) 'CCC' සිට 'CC', දක්වා පහත හෙළනු ලැබුවේය.

2022 වසර අවසානය වන විට රජයේ වාණිජ ව්‍යවසායයන්හි ඇතැම් ණය වගකීම් මධ්‍යම රජයේ ණය ලෙස නැවත වර්ගීකරණය කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මධ්‍යම රජයේ ණය ප්‍රමාණය ඉහළ ගියේය. 2023 වසරේ ජනවාරි මාසයේ දී, චීන අපනයන ආනයන බැංකුවෙන් ලබා ගත්, රජයේ වාණිජ ව්‍යවසායයන්ගේ ණය ලෙස වාර්තා කෙරුණු ණය පහසුකම් අටක් මධ්‍යම රජයේ ණය වශයෙන් ඇතුළත් කර ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය. ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ලං.වි.ම. සහ සීමාසහිත ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගම යටතේ වර්ගීකරණය කරන ලද මෙම ණය, 2022 වසර අවසානයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 1,427.3ක් වූ අතර, හම්බන්තොට වරාය, නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය සහ මත්තල ගුවන් තොටුපළ සඳහා මෙම ණය ලබාගෙන ඇත. මීට අමතරව, ලං.ඛ.නී.සං.හි ඩොලර් මිලියන 2,434.8ක විදේශීය මුදලින් නාමනය කරන ලද ණය වගකීම් කිහිපයක් ද මධ්‍යම රජයේ ණය යටතේ නැවත වර්ගීකරණය කරන ලදී.

සාර්ව ආර්ථික අසමතුලිතතාවලට පිළියම් යෙදීම සහ රාජ්‍ය ණය තිරසාරභාවය නැවතත් ඇති කිරීමේ පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනේ අංගයක් ලෙස රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඇති කිරීමේ මාවතට කැපවී සිටීම සඳහා රජය විසින් දැඩි පියවර කිහිපයක් ගෙන ඇත. 2023 වසර සඳහා සියලුම රාජ්‍ය ආයතනවල අනුමත පුනරාවර්තන වියදම් ඇස්තමේන්තුවලින් සියයට 6ක් අඩු කිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, වැටුප්, විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ, ඖෂධ, කුලී සහ දේශීය බදු, පොලී ගෙවීම්, සහ අනිවාර්ය සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් වැනි අත්‍යවශ්‍ය වියදම් හැර පුනරාවර්තන වියදම්වලින් සියයට 6ක් කපා හරින ලෙස සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වලට මුදල් අමාත්‍යාංශය චක්‍රලේඛයක් නිකුත් කළේය. තවද, සෘජු බදු සහ සමස්ත බදු අතර අනුපාතය ඉහළ නැංවීම තුළින් බදු ව්‍යුහයේ අනුක්‍රමික බව ඉහළ නැංවීමේ අරමුණින්, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී පුද්ගලික සහ ආයතනික යන දෙඅංශයේ ම ආදායම් බදු ව්‍යුහයන් සංශෝධනය කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත අනුමත කරන ලදී. මෙම නීතිමය සංශෝධනය තුළ, පුද්ගල ආදායම් බදු සඳහා වූ බදු නිදහස් සීමාව වසරකට රුපියල් මිලියන 3.0ක සිට රුපියල් මිලියන 1.2ක් දක්වා සංශෝධනය කිරීම; අධ්‍යාපනය, සෞඛ්‍ය, නිවාස ණය මත ගෙවනු ලබන පොලිය, විශ්‍රාම යෝජනා ක්‍රම සඳහා දරන දායකත්ව යනාදී වියදම් සඳහා ලබා දුන් රුපියල් මිලියන 1.2ක වියදම් සහනය ඉවත් කිරීම; පුද්ගල ආදායම් බදු අනුපාතික පෙර තිබූ සියයට 6, සියයට 12, සහ සියයට 18 යන මට්ටම්වලට සාපේක්ෂව සියයට 6, සියයට 12, සියයට 18, සියයට 24, සියයට 30 සහ සියයට 36 දක්වා ඉහළ නැංවීම; රුපියල් මිලියන 1.2ක බදු නිදහස් සීමාව ඉක්මවා බදු අය කෙරෙන ආදායම් බදු කාණ්ඩ රුපියල් මිලියන 0.5ක් දක්වා සංශෝධනය කිරීම; උපයන විට බදු ගෙවීම අනිවාර්ය කිරීමේ ක්‍රමය යළි හඳුන්වා දීම; විවිධ අංශ වෙනුවෙන් විශේෂයෙන් ලබා දුන් ආයතනික ආදායම් බදු නිදහස් කිරීම් සහ සමාගම් සඳහා ලබා දුන් සහනදායී බදු අනුපාතික ඉවත් කරමින් ආයතනික ආදායම් බදු අනුපාතික සියයට 30ක් දක්වා ඉහළ නැංවීම ඇතුළු තවත් ප්‍රතිපත්ති ඇතුළත් කර ඇත. මේ අතර, රජය, 2023 ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි, සිගරට්, මද්‍යසාර සහ බනිජ තෙල් නිෂ්පාදන සඳහා වන සුරා/නිෂ්පාදන බද්ද වැඩි කළේය. එපමණක් නොව, ආනයනික භාණ්ඩ කිහිපයක් සඳහා වන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද (PAL) සංශෝධනය කරන ලදී. බදු පදනම පුළුල් කිරීමට මෙතෙක් ප්‍රයත්න දරා ඇති නමුත්, දැනටමත් බදු දැල තුළ සිටින පුද්ගලයන් මත දැඩි පීඩනයක් ඇති නොකරමින් රජයට ආදායම් උපයා ගැනීම පිණිස, බදු පැහැර හැරීම් අවම කර ගැනීම සඳහා බදු පදනම තවදුරටත් පුළුල් කර ගැනීමට රජය විසින් බදු පරිපාලනය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

6.1 සංඛ්‍යා සටහන

2022 වසරේ දී සහ 2023 වසරේ මුල් කාලය තුළ ක්‍රියාත්මක කරන ලද සහ නුදුරු සහ මැදි කාලීනව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

දිනය	ක්‍රියාමාර්ගය
2022 ජනවාරි 01	2022 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි, මූල්‍ය ආයතන විසින් සපයනු ලබන මූල්‍ය සේවාවන් මත වන එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 15 සිට සියයට 18ක් දක්වා සංශෝධනය කෙරිණි.
2022 ජනවාරි 13	2022 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි, විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ දී සලකා නොබලන, රුපියල් 5,000ක මාසික දීමනාවක් රජයේ නිලධාරීන් සහ විශ්‍රාමිකයන් වෙත ලබා දෙන ලදී.
2022 මාර්තු 08	විදුලිබලය සහ ඉන්ධන භාවිතය අවම කිරීම සඳහා රාජ්‍ය අංශය වෙත මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.
2022 අප්‍රේල් 08	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව බදු අය කළ හැකි ආදායම ගණනය කරනු ලබන සහ 2020 අප්‍රේල් 01 වන දින සිට ආරම්භ වන බදු තක්සේරු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම රුපියල් බිලියන 2 ඉක්මවන, තනි පුද්ගලයන්ගේ, හවුල් ව්‍යාපාර සහ සමාගම් මත එක් වරක් පමණක් අය කළ හැකි, අතීතයට බලපැවැත්වෙන පරිදි සියයට 25ක අධිභාර බද්දක් පැනවීමට 2022 අංක 14 දරන අධිභාර බදු පනත බලාත්මක කරන ලදී.
2022 අප්‍රේල් 12	තෝරාගත් විදේශීය රාජ්‍ය ණය සේවාකරණය අත්හිටුවීම පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය නිවේදනය කරන ලදී.
2022 අප්‍රේල් 26	හදිසි නොවන/අත්‍යවශ්‍ය නොවන වියදම් සීමා කිරීම සඳහා රාජ්‍ය අංශය වෙත මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.
2022 මැයි 31	ජා.ජ්‍ර. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමේ සහාය ඇතිව ක්‍රියාත්මක වන වැඩසටහනේ පරාමිතීන්ට සමගාමීව ආදායම ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග කිහිපයක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය.
2022 ජූනි 01	භාණ්ඩ සහ සේවා සැපයුම මත වන එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 8 සිට සියයට 12 දක්වා ඉහළ නංවන ලදී.
2022 ජූනි 04	විදුලි සංදේශ බද්ද සියයට 11.25 සිට සියයට 15 දක්වා ඉහළ නංවන ලදී.
2022 ජූනි 07	භාණ්ඩාගාර බිල්පත් සඳහා වන සීමාව පෙර පැවති රුපියල් බිලියන 3,000 සීමාවේ සිට රුපියල් බිලියන 4,000ක් දක්වා ඉහළ නංවන ලදී.
2022 අගෝස්තු 08	හදිසි නොවන/අත්‍යවශ්‍ය නොවන වියදම් සීමා කිරීම සඳහා වාණිජ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම් වෙත මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.
2022 සැප්තැම්බර් 01	භාණ්ඩ සහ සේවා සැපයුම මත වන එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 12 සිට සියයට 15 දක්වා ඉහළ නංවන ලදී.
2022 සැප්තැම්බර් 09	2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. දළ ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 3,200 සිට රුපියල් බිලියන 3,844ක් දක්වා ඉහළ නංවන ලදී.
2022 සැප්තැම්බර් 13	රජය සතු ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය කිරීමේ ඒකකයක් පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය.
2022 ඔක්තෝබර් 01	රුපියල් මිලියන 120කට වැඩි වාර්ෂික පිරිවැටුමක් ඇති ආනයනකරුවන්, නිෂ්පාදකයන්, සේවා සපයන්නන්, තොග අලෙවිකරුවන් සහ සිල්ලර අලෙවිකරුවන් සඳහා, 2022 ඔක්තෝබර් 01 සිට ක්‍රියාත්මක වන පරිදි, පිරිවැටුම මත සියයට 2.5ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් පැනවීම පිණිස 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත බලාත්මක කරන ලදී.
2022 ඔක්තෝබර් 18	2023 වසර සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.
2022 නොවැම්බර් 21	ජා.ජ්‍ර. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමේ සහාය ඇතිව ක්‍රියාත්මක කෙරෙන වැඩසටහනේ පූර්ව ක්‍රියාමාර්ගයක් ලෙස, පිරිවැය ප්‍රතිසාධනය කර ගැනීමේ අරමුණ ඇතිව, 2018 ඉන්ධන මිල සූත්‍රය මත පදනම්ව, ස්වයංක්‍රීයව ඉන්ධන මිල ගැළපුම් සිදු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.
2022 නොවැම්බර් 21	ජා.ජ්‍ර. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමේ සහාය ඇතිව ක්‍රියාත්මක කෙරෙන වැඩසටහනේ පූර්ව ක්‍රියාමාර්ගයක් ලෙස, පිරිවැය ප්‍රතිසාධනය කර ගැනීම සහ අර්ධ වාර්ෂික පදනම මත විදුලි ගාස්තු ගැළපුම් ස්වයංක්‍රීයව සිදු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.
2022 නොවැම්බර් 30	දළ ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 3,844 සිට රුපියල් බිලියන 4,507ක් දක්වා ඉහළ නංවන ලදී.
2022 නොවැම්බර් 30	භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ සීමාව රුපියල් බිලියන 4,000 සිට රුපියල් බිලියන 5,000ක් දක්වා ඉහළ නංවන ලදී.
2022 දෙසැම්බර් 08	2022 අංක 43 දරන විසර්ජන පනත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.
2022 දෙසැම්බර් 14	එකතු කළ අගය මත බදු අනුපාතික වැඩි කිරීම නීත්‍යානුකූල කිරීම, බදු පදනම පුළුල් කිරීම සහ එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම් ඉවත් කිරීම සඳහා 2022 අංක 44 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත ක්‍රියාත්මක කරන ලදී.
2022 දෙසැම්බර් 19	සාමූහික සහ පුද්ගල ආදායම් බදු සඳහා වන බදු ව්‍යුහය සංශෝධනය කරමින්, සහ රඳවා ගැනීමේ බද්ද යළි හඳුන්වා දෙමින්, 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත ක්‍රියාත්මක කරන ලදී.
2023 ජනවාරි 01	පෙට්‍රල්, ඩීසල් සහ දුම්වැටි මත නිෂ්පාදන බදු සංශෝධනය කරන ලදී.
2023 ජනවාරි 03	මද්‍යසාර මත වන සුරා බදු සංශෝධනය කරන ලදී.
2023 අප්‍රේල් 04	1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.
ඉදිරි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග	
2023 මැයි අවසානය	සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමය පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබීම සහ සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් ලබන අඩු ආදායම්ලාභී පවුල් හඳුනා ගැනීම සඳහා නව යෝග්‍යතා නිර්ණායක යොදා ගැනීම.
2023 ජූනි අවසානය	ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව, ශ්‍රීලන්කන් ගුවන් සේවය සහ මාර්ග සංවර්ධන අධිකාරියෙහි ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා කාල නියමයන් සහ ක්‍රමවේද පැහැදිලිව ඉදිරිපත් කෙරෙන විස්තීර්ණ මාර්ගෝපායක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දීම.
2023 සැප්තැම්බර් අවසානය	භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධති ව්‍යාපෘතිය (ITMIS) දියත් කිරීම සම්පූර්ණ කිරීම සහ එහි ආවරණය පුළුල් කිරීම.
2023 ඔක්තෝබර් අවසානය	ජා.ජ්‍ර. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමේ සහාය ඇතිව ක්‍රියාත්මක කෙරෙන වැඩසටහනේ පරාමිතීන්ට අනුකූලව 2024 විසර්ජන පනත් කෙටුම්පත මුල් වර කියවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
2023 දෙසැම්බර් අවසානය	ජා.ජ්‍ර. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමේ සහාය ඇතිව ක්‍රියාත්මක කෙරෙන වැඩසටහනේ පරාමිතීන්ට අනුකූලව, විසර්ජන පනත සහ වියදම් ප්‍රතිපාදන සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා දීම.
2023 දෙසැම්බර් අවසානය	අයවැය සම්පාදන ක්‍රියාවලිය, අදාළ නියෝජිත ආයතනවල කාර්යභාරයන් සහ වගකීම් මෙන්ම තොරතුරු ලබා දීමේ සහ වගවීමේ අවශ්‍යතා සඳහා බලය ලබා දෙන නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
2023 දෙසැම්බර් අවසානය	විදුලිබල සහනාධාරය නිවැරදිව මැනීම සඳහා විදුලි තොග සැපයුම් ගනුදෙනු ගිණුම (BSTA) වැඩිදියුණු කිරීම සහ එය භාවිත කරමින් පිරිවැය ප්‍රතිසාධනය කෙරෙන විදුලි ගාස්තු සහ රජය විසින් මේ සම්බන්ධයෙන් සිදු කළ යුතු පැවරුම් නිර්ණය කිරීම ආරම්භ කිරීම.
2024 ජනවාරි 01	උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති සහ ආයෝජන මණ්ඩල පනත් යටතේ ලබා දුන් බදු දිරිදීමනා මඟින් ඇති වන ඍජු පිරිවැය තක්සේරු කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කිරීම.
2024 ජනවාරි 01	බද්දෙන් නිදහස් කිරීම්වලින් අතිශය බහුතරයක් අහෝසි කිරීම මඟින් එකතු කළ අගය මත බදු ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම.
2024 ජනවාරි 01	එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් වලංගු ආපසු ගෙවීම් සිදු කිරීම සැලකිය යුතු ලෙස වේගවත් කිරීම සහ සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය අහෝසි කිරීමට ක්‍රියාමාර්ග ගැනීම.
2024 ජනවාරි 01	නිෂ්පාදන බදුවලට උද්ධමනය සඳහා ස්වයංක්‍රීයව ගැළපුම් සිදු කිරීම හඳුන්වා දීම.
2025 ජනවාරි 01	දේපළ සඳහා දීප ව්‍යාප්ත බද්දක් හඳුන්වා දීම.
2025 ජනවාරි 01	බදු නිදහස් දීමනාවක් සහ අවම බදු නිදහස් කිරීමක් සහිතව ත්‍යාග සහ ප්‍රවේණි බද්දක් හඳුන්වා දීම.

මූලාශ්‍ර: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ආර්ථික පසුබෑම නිසා උපයන ආදායම් අඩු වීම සහ බදු ගෙවීමට විභවයක් ඇති පුද්ගලයන් විදේශ රටවලට සංක්‍රමණය වීමේ අනුපාතය ඉහළ යෑම හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අපේක්ෂිත පුද්ගලික සහ සාමූහික ආදායම් බදු ඉලක්ක සපුරා ගැනීම නුදුරු කාලයේ දී අභියෝගාත්මක වනු ඇත. එබැවින්, ආදායමේ ඇතිවන මෙම අඩුව පිරවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, අධිකරණයේ ද සහාය ඇතිව, බදු සම්බන්ධයෙන් තවම නොවිසඳී ඇති නඩු ඉක්මනින් විසඳා අවසන් කළ යුතු අතර, බදු වංචාකරුවන් සහ බදු පැහැර හරින්නන් පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග කඩිනමින් සම්පූර්ණ කළ යුතුය.

තිරසාර ආර්ථික වර්ධනයක් ප්‍රවර්ධනය කිරීම සහ රටේ ආර්ථිකයේ කම්පන දරා ගැනීමට ඇති හැකියාව ඉහළ නැංවීම පිණිස දිගු කාලීන රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය පවත්වා ගැනීම සහතික කිරීමේ අරමුණින්, ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමේ සහායෙන් ක්‍රියාත්මක වන වැඩසටහන යටතේ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමට සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට රජය කැපවී සිටිය යුතුය. ආර්ථික අසමතුලිතතා විසඳීමට රජයේ කැපවීම පෙන්නුම් කරන අතරම, ජා.මූ. අරමුදලෙහි වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට මග පෑදීම සඳහා, ජා.මූ. අරමුදලෙහි විධායක මණ්ඩලය විසින් විස්තීර්ණ ණය පහසුකම අනුමත කිරීමට පෙර, රජය විසින් එම වැඩසටහන සඳහා අවශ්‍ය සියලු පූර්ව ක්‍රියාමාර්ග කොන්දේසි සපුරන ලදී. ආදායම් ඉහළ නැංවීමේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දීම, 2022 අතුරු අයවැය සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා දීම, විස්තීර්ණ ණය පහසුකමේ සහාය ඇතිව ක්‍රියාත්මක කෙරෙන වැඩසටහනේ පරාමිතීන්ට අනුව 2023 වසර සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම, පිරිවැය ප්‍රතිසාධන පදනම මත මාසිකව ඉන්ධනවල සිල්ලර මිල ගැළපීම් ස්වයංක්‍රීයව සිදු කිරීමට සහ පිරිවැය ප්‍රතිසාධන පදනම මත අර්ධ වාර්ෂිකව විදුලි ගාස්තු ගැළපීම් ස්වයංක්‍රීය කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම යනාදිය මෙම ක්‍රියාමාර්ගවලට ඇතුළත් වේ. මීට අමතරව, ජා.මූ.අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායක, දර්ශක ඉලක්ක සහ ව්‍යුහාත්මක මිණුම් දඬු කිහිපයක් නිශ්චිත කාලසීමාවක් තුළ සාක්ෂාත් කර ගැනීම සඳහා නියම වී ඇත. ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායකවලට ප්‍රාථමික ශේෂය සහ රජයේ නොපියවූ හිඟ වියදම් තොගය පිළිබඳ ඉලක්ක ඇතුළත් වන අතර, ජා.මූ. අරමුදල විසින් වැඩසටහනේ සෑම අර්ධ වාර්ෂික සමාලෝචනයක දී ම එම නිර්ණායකයන්ට සාපේක්ෂව රටේ කාර්යසාධනය මනිනු ලැබේ. ඒ අනුව, 2023 වර්ෂය සඳහා ප්‍රථමික හිඟයේ ඉලක්කය ද.දේ.නි.යෙන් සියයට 0.7ක් සපුරා ගැනීමට නියමිත අතර, රජයේ නොපියවූ හිඟ වියදම් 2023 ජූනි මාසය වන විට ගෙවා අවසාන කළ යුතුය. තවද, එයින් පසු කිසිදු හිඟ මුදලක් එයට එකතු වීමට ඉඩ නොදිය යුතුය. මීට අමතරව, ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමේ සහාය ඇතිව ක්‍රියාත්මක වන වැඩසටහන මගින් රාජ්‍ය ආදායම, මධ්‍යම රජය විසින් දරනු ලබන සමාජ සුභසාධන වියදම්, ඉන්ධන සහ විදුලිය සඳහා වන වාණිජමය නොවන බැඳීම්වල පිරිවැය සහ භාණ්ඩාගාර ඇපකර සඳහා උපරිම සීමා සම්බන්ධයෙන් ද දර්ශක

6.2 සංඛ්‍යා සටහන

රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය

ශීර්ෂය	2021	2022 (අ)
රුපියල් මිලියන		
මුළු ආදායම සහ ප්‍රදාන	**1,463,810**	**2,012,589**
මුළු ආදායම	1,457,071	1,979,184
බදු ආදායම	1,298,019	1,751,132
බදු නොවන ආදායම	159,052	228,052
ප්‍රදාන	6,740	33,405
වියදම් සහ ශුද්ධ ණය දීම්	**3,521,735**	**4,472,556**
පුනරාවර්තන	2,747,512	3,519,633
ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම්	774,223	952,923
එයින් රාජ්‍ය ආයෝජන	789,636	1,014,293
වර්තන ගිණුමේ ශේෂය	**-1,290,441**	**-1,540,448**
ප්‍රාථමික ශේෂය	**-1,009,542**	**-894,777**
සමස්ත අයවැය ශේෂය	**-2,057,925**	**-2,459,967**
මූල්‍යනය	**2,057,925**	**2,459,967**
විදේශීය මූල්‍යනය	-13,901	424,822
දේශීය මූල්‍යනය	2,071,826	2,035,145
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (අ)		
මුළු ආදායම සහ ප්‍රදාන	**8.3**	**8.3**
මුළු ආදායම	8.3	8.2
බදු ආදායම	7.4	7.3
බදු නොවන ආදායම	0.9	0.9
ප්‍රදාන	0.04	0.1
වියදම් සහ ශුද්ධ ණය දීම්	**20.0**	**18.5**
පුනරාවර්තන	15.6	14.6
ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම්	4.4	3.9
එයින් රාජ්‍ය ආයෝජන	4.5	4.2
වර්තන ගිණුමේ ශේෂය	**-7.3**	**-6.4**
ප්‍රාථමික ශේෂය	**-5.7**	**-3.7**
සමස්ත අයවැය ශේෂය	**-11.7**	**-10.2**
මූල්‍යනය	**11.7**	**10.2**
විදේශීය මූල්‍යනය	-0.1	1.8
දේශීය මූල්‍යනය	11.8	8.4

මූලය: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

(අ) තාවකාලික

(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 මාර්තු 15 වන දින නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) උපයෝගී කොටගෙන ඇත.

ඉලක්ක ලබා දී ඇත. මේ අතර, මාසික පදනමින් පිරිවැය ප්‍රතිසාධන මට්ටමට ඉන්ධනවල සිල්ලර මිල ගණන් සංශෝධනය, අර්ධ වාර්ෂික පදනමින් පිරිවැය ප්‍රතිසාධන මට්ටම් දක්වා විදුලි ගාස්තු සංශෝධනය, පිරිවැය ප්‍රතිසාධනය පදනම් කරගත් විදුලි ගාස්තු තීරණය කිරීම සඳහා විදුලි තොග සැපයුම් ගනුදෙනු ගිණුම වැඩිදියුණු කිරීම, සුබසාධන ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය සඳහා පාර්ලිමේන්තු අනුමැතිය සහ මෙම යෝජනා ක්‍රමවල ප්‍රතිලාභීන් හඳුනා ගැනීම සඳහා නව සුදුසුකම් නිර්ණායක භාවිතා කිරීම, ලං.වි.ම., ලං.ඛ.නී.සං., ශ්‍රීලන්කන් එයාර්ලයින් සහ මාර්ග සංවර්ධන අධිකාරිය යන ආයතනවල ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වන පුළුල් උපායමාර්ගයක් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම, ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ තොරතුරු පද්ධතිය (Integrated Treasury Management Information System) එළිදැක්වීම අවසන් කිරීම සහ එහි ආවරණය පුළුල් කිරීම, 2024 වසර සඳහා ආදායම් ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම, වැඩසටහනේ පරාමිතීන්ට අනුකූලව විසර්ජන පනත ඉදිරිපත් කිරීම හා 2024 අයවැය පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම මෙන්ම නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ඇතුළු තවත් කරුණු ව්‍යුහාත්මක මිණුම් දඬු අතරට අයත් වේ. නියමිත කාල සීමාව තුළ මෙම ව්‍යුහාත්මක මිණුම් දඬු සපුරාලීම ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමේ සහාය ඇතිව ක්‍රියාත්මක වන වැඩසටහන පවත්වාගෙන යාමට තීරණාත්මක ලෙස බලපානු ඇත. ආර්ථිකයේ දුර්වලතාවලට හේතු වූ රාජ්‍ය ව්‍යවසායයන්ගේ දිගුකාලීන ගැටලුවලට විසඳුම් ලබා දෙන අතර ම ඉදිරි කාලය තුළ දී රාජ්‍ය මූල්‍ය තිරසාරත්වය ළඟා කර ගැනීම සඳහා මෙම ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම අතිශයින් වැදගත් වනු ඇත.

6.3 රජයේ අයවැය කටයුතු

ආදායම සහ ප්‍රදාන

ආදායම

වසර තුළ දී ක්‍රියාත්මක කරන ලද ආදායම් පාදක කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග සහ මිල මට්ටම්වල සිදු වූ ශීඝ්‍ර වැඩි වීම හේතුවෙන් 2022 වසරේ දී නාමික වශයෙන් රජයේ ආදායම සහ ප්‍රදාන ඉහළ ගියේය. බදු සහ බදු නොවන ආදායමෙහි ඉහළ යෑම පිළිබිඹු කරමින් රජයේ

6.3 සංඛ්‍යා සටහන

රාජ්‍ය ආදායම පිළිබඳ සම්පිණ්ඩනය

ශීර්ෂය	2021	2022 (අ)
රුපියල් මිලියන		
බදු ආදායම	**1,298,019**	**1,751,132**
ආදායම් බදු	302,115	534,021
එකතු කළ අගය මත බදු	308,213	463,072
නිෂ්පාදන/සුරා බදු	306,861	342,523
වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද	154,125	180,595
ආනයන මත බදු	64,339	50,009
අනෙකුත් බදු	162,365	180,912
බදු නොවන ආදායම	**159,052**	**228,052**
මුළු ආදායම	**1,457,071**	**1,979,184**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (අ)		
බදු ආදායම	**7.4**	**7.3**
ආදායම් බදු	1.7	2.2
එකතු කළ අගය මත බදු	1.8	1.9
නිෂ්පාදන/සුරා බදු	1.7	1.4
වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද	0.9	0.7
ආනයන මත බදු	0.4	0.2
අනෙකුත් බදු	0.9	0.7
බදු නොවන ආදායම	**0.9**	**0.9**
මුළු ආදායම	**8.3**	**8.2**

මූලාශ්‍ර: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

(අ) තාවකාලික

(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 මාර්තු 15 වන දින නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) උපයෝගී කොටගෙන ඇත.

ආදායම, නාමික වශයෙන්, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 35.8කින් වර්ධනය විය. ආදායම් බදු, එකතු කළ අගය මත බදු, වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු, මත්පැන් මත වන සුරා බදු සහ සිගරට් මත වන නිෂ්පාදන බදුවලින් ලද ආදායම ඉහළ යෑම හේතුවෙන් 2022 වසරේ දී බදු ආදායම සියයට 34.9කින් ඉහළ ගියේය. මේ අතර, බදු නොවන ආදායමෙහි, ලාභ සහ ලාභාංශ හැර, අනෙක් සියලුම කාණ්ඩවලින් ලද ආදායම ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස වසර තුළ දී බදු නොවන ආදායම සියයට 43.4කින් වැඩි විය. ආදායම ඉහළ නැංවීම සඳහා වසර තුළ දී හඳුන්වා දෙන ලද ක්‍රියාමාර්ගවලින් වැඩි ප්‍රමාණයක් 2022 වසරේ දෙවන භාගයේ දී සහ 2023 වසරේ මුල් භාගයේ දී ක්‍රියාත්මක කෙරිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, නාමික ද.දේ.නි.ය සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රජයේ ආදායම සුළු වශයෙන් අඩු විය. 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී ප්‍රදාන, රුපියල් බිලියන 33.4ක් දක්වා සියයට 395.7කින් වැඩි විය. ඒ අනුව, පෙර වසර සමඟ සැසඳීමේ දී 2022 වසරේ දී රජයේ ආදායම සහ ප්‍රදාන ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස නොවෙනස්ව පැවතුණි.

6.3 රූප සටහන
රාජ්‍ය ආදායමේ සංයුතිය - 2022



අතීතයට බලපාන පරිදි පනවන ලද, එක් වරක් පමණක් ගෙවිය යුතු අධිභාර බද්ද හේතුවෙන් ආදායම් බදු මගින් ලද ආදායම ඉහළ ගිය අතර, එය රජයේ ආදායම ඉහළ යෑමට මූලික වශයෙන් හේතු විය. ආදායම් බදුවලින් ලද ආදායම, නාමික වශයෙන්, සියයට 76.8ක වාර්ෂික වර්ධනයක් වාර්තා කළ අතර, වසර තුළ දී, මුළු ආදායම් බදු එකතුවෙන් පහෙන් එකකට වඩා වැඩි ප්‍රමාණයකට දායක වූ අධිභාර බද්දෙන් ලද ආදායම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ආදායම් බදුවලින් ලද ආදායම, 2021 වසරේ පැවති සියයට 1.7 සිට 2022 වසරේ දී සියයට 2.2ක් දක්වා ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2021 වසරේ දී මුළු බදු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 23.3ක් ලෙස වාර්තා වූ සෘජු බදු ආදායම, 2022 වසරේ දී සියයට 30.5ක් දක්වා ඉහළ ගියේය. අධිභාර බද්ද ඇතුළුව සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදුවලින් ලද ආදායම, 2021 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 273.6ට සාපේක්ෂව, 2022 වසරේ දී රුපියල් බිලියන 488.4ක් දක්වා සියයට 78.5කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2022 වසරේ, අප්‍රියෙල් සහ ජූලි මාසවල දී වාරික දෙකක් වශයෙන් එකතු කරන ලද අධිභාර බද්දෙන් ලද ආදායම රුපියල් බිලියන 120.7කි. මේ අතර, අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන් සහ රඳවා ගැනීමේ බද්දෙන් ලද ආදායම, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී, පිළිවෙළින්, රුපියල් බිලියන 25.5ක් සහ රුපියල් බිලියන 19.8ක් දක්වා, පිළිවෙළින්, රුපියල් බිලියන 10.2කින් සහ රුපියල් බිලියන 7.4කින් ඉහළ ගිය අතර, වසංගතය හේතුවෙන් ආදායම් එකතු කිරීමේ කටයුතු අඩාල වී පැවති 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී බදු පරිපාලන කටයුතුවල සිදු වූ වර්ධනය මේ සඳහා හේතු විය. 2020 වසරේ මුල් භාගයේ දී ඉවත් කරන ලද ආර්ථික සේවා ගාස්තුව සඳහා ලද හිඟ මුදල් 2022 වසරේ දී රුපියල් බිලියන 0.2ක් ලෙස වාර්තා විය.

2022 ජූනි සහ සැප්තැම්බර් මාසවල දී එකතු කළ අගය මත බදු අනුපාතිකය ඉහළ දැමීම සඳහා සිදු කළ සංශෝධන සහ මිල මට්ටම් ඉහළ යෑමේ බලපෑම පිළිබිඹු කරමින් 2022 වසර තුළ දී එකතු කළ අගය මත බදුවලින් ලද ආදායම, නාමික වශයෙන්, සියයට 50.2කින් ඉහළ ගියේය. එකතු කළ අගය මත බදු අනුපාතිකයට සිදු කළ සංශෝධන 2022 වසරේ දෙවන භාගයේ සිට බලපැවැත්වුණු බැවින් එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2021 වසරේ දී වාර්තා වූ සියයට 1.8 සිට 2022 වසරේ දී සියයට 1.9 දක්වා සුළු ඉහළ යෑමක් පමණක් වාර්තා කළේය. දේශීය ආර්ථික කටයුතු මත වන එකතු කළ අගය මත බදු ආදායම, 2021 වසරේ පැවති රුපියල් බිලියන 185.5ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 291.6ක් දක්වා වැඩි වූ අතර, ආනයන ආශ්‍රිත කටයුතු මත වන එකතු කළ අගය මත බදු ආදායම පෙර වසරේ පැවති රුපියල් බිලියන 122.8ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 171.5ක් දක්වා වැඩි විය. එකතු කළ අගය මත බදු ආදායමෙහි නාමික වර්ධනය පිළිබිඹු කරමින්, එකතු කළ අගය මත බදු ආදායම, මුළු ආදායමෙහි සහ මුළු බදු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස, 2021 වසරේ දී වාර්තා වූ සියයට 21.2 සහ සියයට 23.7ට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 23.4ක් සහ සියයට 26.4ක් දක්වා ඉහළ ගියේය.

මත්පැන් මත වන සුරා බදු සහ සිගරට් මත වන නිෂ්පාදන බදුවලින් ලද ආදායම ඉහළ යෑම හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී සුරා/නිෂ්පාදන බදු ආදායම, නාමික වශයෙන්, සියයට 11.6කින් වර්ධනය විය. ඒ අනුව, මත්පැන් මත වන සුරා බදු ආදායම 2022 වසරේ දී රුපියල් බිලියන 165.2ක් දක්වා සියයට 19.2කින් ද, සිගරට් හා දුම්වැටි මත වන නිෂ්පාදන බදු ආදායම රුපියල් බිලියන 104.2ක් දක්වා සියයට 17.6කින් ද ඉහළ ගිය අතර, 2021 වසරේ නොවැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි මත්පැන් හා සිගරට් සඳහා වන බදු ඉහළ නැංවීම සඳහා සුරා/නිෂ්පාදන බදු ව්‍යුහයට සිදු කළ සංශෝධන මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. නිෂ්පාදන බදු ඉහළ නැංවීමට අමතරව සිගරට් අලෙවියේ වර්ධනය ද සිගරට්වලින් ලද බදු ආදායම ඉහළ යෑමට හේතු විය. මෝටර් රථ ආනයන මත පනවන ලද සීමා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමත් සමඟ මෝටර් රථවලින් ලද නිෂ්පාදන බදු ආදායම 2022 වසරේ දී රුපියල් බිලියන 14.5ක් දක්වා

සියයට 19.9කින් තවදුරටත් පහළ ගියේය. තවද, 2022 වසරේ දී රට තුළ පැවති විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය මධ්‍යයෙහි ඛනිජ තෙල් ආනයනය පහළ යෑම හේතුවෙන් ඛනිජ තෙල් මත වන නිෂ්පාදන බදු ආදායම, 2021 වසරේ පැවති රුපියල් බිලියන 55.3ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 53.1ක් දක්වා අඩු විය. එසේම, මත්පැන් සහ සිගරට් සඳහා උද්ධමනය පාදක කරගත් සුරා/නිෂ්පාදන බදු ව්‍යුහයක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිබිඹු කරමින්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සුරා/නිෂ්පාදන බදු ආදායම 2021 වසරේ පැවති සියයට 1.7 සිට 2022 වසරේ දී සියයට 1.4ක් දක්වා අඩු විය. උද්ධමනයෙහි සිදු වන වෙනස් වීම් සුරා/නිෂ්පාදන බදුවලට ගැළපීමේ අරමුණ ඇතිව, 2023 වසරේ ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි රජය විසින් සිගරට්, මද්‍යසාර සහ ඛනිජ තෙල් නිෂ්පාදන මත වන සුරා/නිෂ්පාදන බදු ඉහළ නංවන ලදී.

ගෙවුම් ශේෂය මත වන පීඩනය සැලකිල්ලට ගනිමින් ක්‍රියාත්මක කරන ලද ආනයන පාලන ක්‍රියාමාර්ගවල බලපෑම යම් තරමකට පිළිබිඹු කරමින්, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද හැර, විදේශ වෙළඳාම හා සම්බන්ධ සියලුම බදුවලින් ලද ආදායම පහළ ගියේය. අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ සඳහා බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දීම ඇතුළු ආනයන පාලන ක්‍රියාමාර්ග පැනවීම සහ විදේශ විනිමය අනුපාතය අවප්‍රමාණය වීම හා සීමාකාරී මූල්‍ය තත්ත්ව මධ්‍යයෙහි ආනයන සඳහා වූ ඉල්ලුම පහළ යෑම හේතුවෙන්, ආනයන බදුවලින් ලද ආදායම, 2021 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 64.3ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 50.0 දක්වා සියයට 22.3කින් අඩු විය. මේ අතර, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මගින් ලද ආදායම, 2021 වසරේ පැවති රුපියල් බිලියන 55.8 සිට 2022 වසරේ දී රුපියල් බිලියන 40.2ක් දක්වා සැලකිය යුතු ලෙස පහළ ගියේය. තවද, සෙස් බද්දෙන් ලැබෙන ආදායම, 2021 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 75.5 සිට 2022 වසරේ දී රුපියල් බිලියන 70.3ක් දක්වා අඩු විය. කෙසේ වුවද, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් ලැබෙන ආදායම, 2021 වසරේ පැවති රුපියල් බිලියන 154.1ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 180.6ක් දක්වා ඉහළ ගියේය. ඛනිජ තෙල් නිෂ්පාදන, සිමෙන්ති ක්ලින්කර්, යකඩ, අමුද්‍රව්‍ය සහ අනෙකුත් පාරිභෝගික භාණ්ඩ වැනි භාණ්ඩ කිහිපයක ජාත්‍යන්තර මිල ගණන් අවස්ථා කිහිපයක දී ඉහළ යෑම සහ ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් ලැබෙන ආදායම වැඩිවීමට හේතු විය.

බදු නොවන ආදායම සියයට 43.4කින් ඉහළ ගිය අතර, ගාස්තු හා අයකිරීම්වලින් ලැබෙන ආදායම සහ 2021 වසරේ මූල්‍ය ප්‍රකාශ මත පදනම්ව මහ බැංකුව විසින් සිදු කළ ලාභ පැවරුම් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, ගාස්තු හා අයකිරීම්වලින් ලැබෙන ආදායම, 2022 වසරේ දී රුපියල් බිලියන 90.1ක් දක්වා රුපියල් බිලියන 47.4කින් ඉහළ ගිය අතර, ප්‍රධාන වශයෙන් තැපැල් සහ දුම්රිය දෙපාර්තමේන්තුවල ගාස්තු හා අයකිරීම් සංශෝධනය කිරීම මෙයට හේතු විය. මහ බැංකුව විසින් සිදු කළ ලාභ පැවරුම්, 2021 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 15.0ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 30.0ක් දක්වා වැඩි විය. මීට අමතරව, සමාජ ආරක්ෂණ දායක මුදල්වලින් ලද ආදායම ද 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 37.4ක් දක්වා සියයට 8.1කින් වැඩි විය. මේ අතර, පොලී සහ බදු කුලී ආදායම වසර තුළ දී රුපියල් බිලියන 13.2ක් දක්වා සියයට 14.1කින් ඉහළ ගිය ද, ලාභ හා ලාභාංශ රුපියල් බිලියන 28.1ක් දක්වා සියයට 8.2කින් පහළ ගියේය.

ප්‍රදාන

ද්විපාර්ශ්වීය සහ බහුපාර්ශ්වීය මූලාශ්‍රවලින් ලද මුළු විදේශීය ප්‍රදාන, 2021 වසරේ පැවති රුපියල් බිලියන 6.7 සිට 2022 වසරේ දී රුපියල් බිලියන 33.4ක් දක්වා ඉහළ ගියේය. ද්විපාර්ශ්වීය මූලාශ්‍රවලින් ලද විදේශීය ප්‍රදාන, 2021 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 3.3 සිට 2022 වසරේ දී රුපියල් බිලියන 18.9ක් දක්වා ඉහළ ගිය අතර, බහුපාර්ශ්වීය මූලාශ්‍රවලින් ලද විදේශීය ප්‍රදාන, 2021 වසරේ පැවති රුපියල් බිලියන 3.5 සිට 2022 වසරේ දී රුපියල් බිලියන 14.5ක් දක්වා ඉහළ ගියේය.

රාජ්‍ය වියදම් සහ ශුද්ධ ණය දීම්

2022 වසරේ දී රාජ්‍ය වියදම් සහ ශුද්ධ ණය දීම් නාමික වශයෙන් වැඩි වූ අතර, නාමික ද.දේ.නි.යෙහි සැලකිය යුතු වර්ධනය පිළිබිඹු කරමින්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය වියදම් සහ ශුද්ධ ණය දීම් පහළ ගියේය. 2022 වසරේ දී වියදම් තාර්කීකරණ ක්‍රියාමාර්ග හඳුන්වා දෙනු ලැබුව ද, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී පුනරාවර්තන වියදම් සියයට 28.1කින් වැඩි වූ අතර, එම කාලය තුළදී ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්, නාමික වශයෙන්, සියයට 23.1කින් ඉහළ ගියේය. ඒ අනුව, 2021 වසරට සාපේක්ෂව 2022 වසර තුළ දී සමස්ත වියදම් සහ ශුද්ධ

6.4 සංඛ්‍යා සටහන

ආර්ථික වර්ගීකරණයට අනුව වියදම් සහ ශුද්ධ ණය දීම්

ශීර්ෂය	2021	2022 (අ)
රුපියල් මිලියන		
පුනරාවර්තන වියදම්	**2,747,512**	**3,519,633**
භාණ්ඩ හා සේවා වියදම	1,014,612	1,139,066
එයින් වැටුප් හා වේතන	845,680	956,210
පොලී ගෙවීම්	1,048,382	1,565,190
විදේශීය	253,750	128,621
දේශීය	794,633	1,436,569
වර්තන පැවරුම් හා සහනාධාර	684,518	815,376
එයින් කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට	595,696	719,467
සමෘද්ධි	55,400	120,988
විශ්‍රාම වැටුප්	269,827	309,067
පොහොර සහනාධාර	21,235	56,810
අනෙකුත්	249,233	232,602
ප්‍රාග්ධන වියදම්	**767,606**	**715,429**
මූර්ත වත්කම් අත්පත් කර ගැනීම්	438,753	445,521
ප්‍රාග්ධන පැවරුම්	326,578	268,601
අනෙකුත්	2,275	1,307
ශුද්ධ ණය දීම්	**6,617**	**237,495**
ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්	**774,223**	**952,924**
මුළු වියදම සහ ශුද්ධ ණය දීම්	**3,521,735**	**4,472,556**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ආ)		
පුනරාවර්තන වියදම්	**15.6**	**14.6**
භාණ්ඩ හා සේවා වියදම	5.8	4.7
එයින් වැටුප් හා වේතන	4.8	4.0
පොලී ගෙවීම්	6.0	6.5
විදේශීය	1.4	0.5
දේශීය	4.5	5.9
වර්තන පැවරුම් හා සහනාධාර	3.9	3.4
එයින් කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට	3.4	3.0
සමෘද්ධි	0.3	0.5
විශ්‍රාම වැටුප්	1.5	1.3
පොහොර සහනාධාර	0.1	0.2
අනෙකුත්	1.4	1.0
ප්‍රාග්ධන වියදම්	**4.4**	**3.0**
මූර්ත වත්කම් අත්පත් කර ගැනීම්	2.5	1.8
ප්‍රාග්ධන පැවරුම්	1.9	1.1
අනෙකුත්	0.0	0.0
ශුද්ධ ණය දීම්	**0.0**	**1.0**
ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්	**4.4**	**3.9**
මුළු වියදම සහ ශුද්ධ ණය දීම්	**20.0**	**18.5**

මූලාශ්‍රය: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

(අ) තාවකාලික

(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 මාර්තු 15වන දින නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) උපයෝගී කොටගෙන ඇත.

ණය දීම්, නාමික වශයෙන්, සියයට 27.0කින් වර්ධනය විය. කෙසේ වෙතත්, නාමික ද.දේ.නි.යේ තියුණු වැඩිවීමත් සමඟ, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මුළු වියදම් සහ ශුද්ධ ණය දීම්, පෙර වසරේ වාර්තා වූ සියයට 20.0ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 18.5ක් දක්වා පහළ ගියේය.

ණය ගැනීමේ අවශ්‍යතාව විශාල ලෙස ඉහළ යෑම සහ ඉහළ පොලී අනුපාත නිසා දේශීය පොලී ගෙවීම් වැඩිවීම මෙන්ම වැටුප් හා වේතන සහ සහනාධාර හා පැවරුම් සඳහා වන වියදම් ඉහළ යාම, 2022 වසරේ දී රජයේ පුනරාවර්තන වියදම් සැලකිය යුතු ලෙස වර්ධනය වීමට මූලික වශයෙන් හේතු විය. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධ අවදානම් පාරිතෝෂික හේතුවෙන් රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතික ඉහළ ගියේය. ඵලදා අනුපාතිකවල මෙම ඉහළ යාම උද්ධමන පීඩන නිසා ප්‍රතිපත්ති පොලී අනුපාත ඉහළ යාමේ බලපෑමෙන් ඔබ්බට ඉහළ ගියේය. ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම මධ්‍යයෙහි විදේශීය මූල්‍යනය සඳහා ප්‍රවේශය සීමිත වීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස දේශීය මූලාශ්‍රවලින් විශාල ලෙස ණය ගැනීමට අවශ්‍යතාවක් මතු වීම රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතික මත වන පීඩනය තවදුරටත් ඉහළ නංවන ලදී. ඒ අනුව, සමස්ත පුනරාවර්තන වියදම්වලින් සියයට 44.5ක් වූ පොලී ගෙවීම් සඳහා වන වියදම, 2021 වසරට සාපේක්ෂව 2022 වසර තුළ දී සියයට 49.3කින් වර්ධනය වූ අතර, 2022 වසරේ දී දේශීය පොලී ගෙවීම් සියයට 80.8කින් ඉහළ ගියේය. 2022 වසරේ දී පොලී ගෙවීම් සඳහා වූ වියදම රාජ්‍ය ආදායමෙන් සියයට 79.1ක් විය. කෙසේ වෙතත්, අන්තර්වාර කාලසීමාව තුළ ද්විපාර්ශ්වික සහ වාණිජ ණය සඳහා වන විදේශීය ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන්, 2022 වසර තුළ දී විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් කැපී පෙනෙන ලෙස සියයට 49.3කින් පහළ ගියේය. භාණ්ඩ හා සේවා සඳහා වන වියදම, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 12.3කින් ඉහළ ගියේය. 2022 වසරේ ජනවාරි මාසයේ දී හඳුන්වා දුන් සහන පැකේජය හරහා රාජ්‍ය

6.4 රූප සටහන

රාජ්‍ය පුනරාවර්තන වියදමේ සංයුතිය - 2022



මූලාශ්‍රය: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

6.5 රූප සටහන
කාර්යයන් අනුව මුළු වියදම හා ණය දීම් - 2022



මූලාශ්‍රය: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංශයේ සේවකයන්ට ගෙවන ලද අතිරේක මාසික දීමනාව මෙන්ම සාමාන්‍ය වාර්ෂික වැටුප් වර්ධකවල බලපෑම හේතුවෙන් වසර තුළ දී වැටුප් සහ වේතන සියයට 13.1කින් වැඩි වූ අතර, 2022 වසරේ දී වැටුප් සහ වේතන මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 27.2ක් විය. එසේම, අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා වන වියදම, පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 8.2කින් වර්ධනය විය. මේ අතර, ප්‍රධාන වශයෙන් විශ්‍රාමිකයින්ට සහ සමෘද්ධිලාභීන්ට ගෙවනු ලැබූ අතිරේක මාසික දීමනාව සහ පොහොර සහනාධාරය සඳහා වන වියදම් වැඩි වීම හේතුවෙන් සහනාධාර සහ පැවරුම් සඳහා වන වියදම් 2022 වසරේ දී සියයට 19.1ක වාර්ෂික වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතය අවසන් වීමත් සමඟ නොමිලේ ඖෂධ සැපයීම සඳහා වන වියදම සියයට 0.8කින් සුළු වශයෙන් අඩු විය.

ප්‍රධාන වශයෙන් රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත ලබා දුන් ණය ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් නාමික වශයෙන් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ඒ අනුව, 2022 වසරේ දී, නාමික වශයෙන්, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් 2021 වසරට සාපේක්ෂව සියයට 23.1කින් ඉහළ ගියේය. හදිසි නොවන ප්‍රාග්ධන වියදම් නතර කිරීමට රජය විසින් ගත් තීරණයෙන් පසුව, 2022 වසරේ දී රාජ්‍ය ආයතන, පළාත් සභා සහ රාජ්‍ය සංස්ථා වෙත සිදු කරන ලද ප්‍රාග්ධන පැවරුම් සියයට 17.8කින් පහළ ගියේය. කෙසේ වෙතත්, ඉන්ධන ආනයනය කිරීම සඳහා ඉන්දියානු ණය පහසුකම හරහා ලං.ඛ.නී.සං.ට රජය විසින් ලබා දී ඇති ණය සහ ලෝක බැංකුවෙන් ලැබුණු අරමුදල් යොදා ගනිමින් රාජ්‍ය ව්‍යවසායයන් වෙත එල්.පී. ගෑස් සහ පොහොර මිලදී ගැනීමට ලබා දී ඇති ණය මූලිකව හේතු කරගෙන, පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී රජයේ ශුද්ධ ණය දීම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, 2022 වසරේ දී රාජ්‍ය ආයෝජන ද රුපියල් බිලියන 1,014.3ක් දක්වා සියයට 28.5කින් වර්ධනය විය. 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී

6.5 සංඛ්‍යා සටහන
කාර්යයන් අනුව වියදම් වර්ගීකරණය

ශීර්ෂය	2021	2022 (අ)
රුපියල් මිලියන		
පුනරාවර්තන වියදම්	**2,747,512**	**3,519,633**
සාමාන්‍ය පොදු සේවා	499,629	570,918
සිවිල් පරිපාලනය	134,930	170,303
ආරක්ෂක කටයුතු	257,918	281,643
පොදු නීතිය හා ආරක්ෂාව	106,782	118,971
සමාජ සේවා	974,821	1,092,615
අධ්‍යාපනය	261,716	328,969
සෞඛ්‍යය	275,165	279,803
සුබසාධන	397,343	445,635
ප්‍රජා සේවා	40,597	38,208
ආර්ථික සේවා	164,590	203,491
කෘෂිකර්මය සහ වාරිමාර්ග	68,206	109,330
බලශක්ති සහ ජල සම්පාදන	1,385	1,259
ප්‍රවාහන සහ සන්නිවේදනය	47,255	45,935
වෙනත්	47,744	46,967
අනෙකුත්	1,108,472	1,652,609
එයින් පොලී ගෙවීම්	1,048,382	1,565,190
ප්‍රාග්ධන වියදම සහ ණය දීම්	**789,636**	**1,014,293**
සාමාන්‍ය පොදු සේවා	61,675	36,100
සිවිල් පරිපාලනය	54,624	30,271
පොදු නීතිය හා ආරක්ෂාව	7,051	5,829
සමාජ සේවා	189,733	116,818
අධ්‍යාපනය	48,897	38,522
සෞඛ්‍යය	111,956	43,734
නිවාස	18,333	25,434
ප්‍රජා සේවා	10,547	9,128
ආර්ථික සේවා	537,370	859,835
කෘෂිකර්මය සහ වාරිමාර්ග	79,463	108,697
බලශක්ති සහ ජල සම්පාදන	96,520	458,295
ප්‍රවාහන සහ සන්නිවේදනය	263,042	234,408
වෙනත්	98,346	58,434
අනෙකුත්	858	1,540
මුළු වියදම සහ ණය දීම්	**3,537,148**	**4,533,926**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ආ)		
සාමාන්‍ය පොදු සේවා	3.2	2.5
සමාජ සේවා	6.6	5.0
ආර්ථික සේවා	4.0	4.4
අනෙකුත්	6.3	6.9
එයින් පොලී ගෙවීම්	6.0	6.5
මුළු වියදම හා ණය දීම්	**20.1**	**18.8**

මූලාශ්‍රය: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

(අ) තාවකාලික
(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 මාර්තු 15 වන දින නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) උපයෝගී කොටගෙන ඇත.

වසංගත සම්බන්ධයෙන් දැරීමට සිදු වූ වියදම් අඩුවීමේ බලපෑම පිළිබිඹු කරමින් සෞඛ්‍ය අංශයේ ප්‍රාග්ධන වියදම් අඩු වූ අතර, සලකා බලන කාලසීමාව තුළ දී සමාජ සේවා සඳහා වන ප්‍රාග්ධන වියදම් සියයට 38.4කින් පහළ යාමට මෙය මූලික වශයෙන් හේතු විය. මේ අතර, ලං.බ.නී.සං.ට ණය දීම සහ ලං.වී.ම., ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ලංකා බැංකුව වැනි රාජ්‍ය ව්‍යවසායයන් වෙත සිදු කරන ලද ප්‍රාග්ධන පැවරුම් හේතුවෙන්, ආර්ථික සේවා සඳහා වන ප්‍රාග්ධන වියදම සියයට 60.0කින් ඉහළ ගියේය.

ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් සහ අයවැය හිඟය මූල්‍යනය

නාමික ද.දේ.නි.යෙහි සිදු වූ සැලකිය යුතු වර්ධනය මෙන්ම රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කිරීම සඳහා ගත් ප්‍රයත්න හේතුවෙන්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් වශයෙන් ගත් කල, 2022 වසරේ දී සියලුම ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් යහපත් අතට වර්ධනය විය. ඒ අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සමස්ත අයවැය හිඟය, 2021 වසරේ දී වාර්තා වූ සියයට 11.7ට සාපේක්ෂව, 2022 වසරේ දී සියයට 10.2ක් දක්වා පහළ ගියේය. කෙසේ වෙතත්, නාමික වශයෙන් ගත් කල, 2021 වසරේ දී රුපියල් බිලියන 2,057.9ක් වූ සමස්ත අයවැය හිඟය, 2022 වසරේ දී රුපියල් බිලියන 2,460.0ක් දක්වා ඉහළ ගියේය. එසේම, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ගත් කල, වර්තන ගිණුමේ හිඟය ද 2021 වසරේ දී වාර්තා වූ සියයට 7.3ට (රුපියල් බිලියන 1,290.4ට) සාපේක්ෂව, 2022 වසරේ දී සියයට 6.4ක් (රුපියල් බිලියන 1,540.4ක්) දක්වා පහළ ගියේය. සමස්ත අයවැය හිඟයෙන් පොලී ගෙවීම් ඉවත් කිරීම මගින් ගණනය කෙරෙන, රජයේ අභිමතානුසාරී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිළිබිඹු කෙරෙන ප්‍රාථමික ගිණුමේ හිඟය, නාමික වශයෙන් මෙන්ම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ද පහළ ගියේය. ඒ අනුව, ප්‍රධාන වශයෙන් 2022 වසර තුළ දී ආදායම් වැඩිදියුණු කර ගැනීම හරහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කිරීමට ගත් පියවර පිළිබිඹු කරමින් ප්‍රාථමික ගිණුමේ හිඟය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2021 වසරේ දී වාර්තා වූ සියයට 5.7 (රුපියල් බිලියන 1,009.5) සිට 2022 වසරේ දී සියයට 3.7ක් (රුපියල් බිලියන 894.8ක්) දක්වා පහළ ගියේය.

විදේශීය මූලාශ්‍ර වෙත ප්‍රවේශ වීමට ඇති හැකියාව සීමාසහිත වීම මධ්‍යයෙහි, 2022 වසරේ දී අයවැය හිඟය මූල්‍යනය කිරීමේ දී රජය ප්‍රධාන වශයෙන් දේශීය මූලාශ්‍ර මත රඳා පැවතුණි. 2021 වසරේ දී සමස්ත මූල්‍යන අවශ්‍යතාවයෙන් සියයට 100.7ක් (රුපියල් බිලියන 2,071.8ක්) වූ ශුද්ධ දේශීය මූල්‍යනය,[1] 2022 වසරේ දී සමස්ත ශුද්ධ මූල්‍යනයෙන් සියයට 82.7ක් (රුපියල් බිලියන 2,035.1ක්) විය. ඒ අනුව, දේශීය මූලාශ්‍ර මගින් සිදු කරනු ලැබූ ශුද්ධ මූල්‍යනය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2021 වසරේ දී වාර්තා වූ සියයට 11.8ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 8.4ක් විය. මේ අතර, විදේශීය මූලාශ්‍ර මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2021 වසරේ දී සමස්ත ශුද්ධ මූල්‍යනයෙන් සියයට 0.7ක (රුපියල් බිලියන 13.9ක) ශුද්ධ ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා වූ අතර, එය 2022 වසරේ දී සියයට 17.3ක් (රුපියල් බිලියන 424.8ක්) දක්වා වැඩි විය. ඒ අනුව, විදේශීය මූලාශ්‍ර මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ගත් කල, 2021 වසරේ දී වාර්තා වූ සියයට 0.1ක ශුද්ධ ණය ආපසු ගෙවීමට සාපේක්ෂව, 2022 වසරේ දී සියයට 1.8ක මූල්‍යනයක් විය.

පසුගිය වසර හා සැසඳීමේ දී ප්‍රසාරණාත්මක මූලාශ්‍ර මගින් සිදු කළ ශුද්ධ දේශීය මූල්‍යනයේ සාපේක්ෂ දායකත්වය අඩු මට්ටමක පැවතුනත්, ප්‍රසාරණාත්මක මූලාශ්‍ර මගින් ණය ගැනීම් 2022 වසර තුළ දී සැලකිය යුතු මට්ටමක පැවතුණි. ඒ අනුව, සමස්ත ශුද්ධ දේශීය මූල්‍යනයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට, බැංකු අංශයෙන් සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2021 වසරේ දී සියයට 63.0ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 7.4ක්) වූ අතර, මෙම අගය 2022 වසරේ දී සියයට 50.5ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.3ක්) දක්වා පහළ ගියේය. 2021 වසරේ දී මහ බැංකුව විසින් සිදු කළ රුපියල් බිලියන 1,225.2ක මූල්‍යනයට සාපේක්ෂව, 2022 වසරේ දී මහ බැංකුව හරහා සිදු කළ මූල්‍යනය රුපියල් බිලියන 1,338.4ක් දක්වා ඉහළ ගියේය. රජයේ සුරැකුම්පත් සඳහා වූ අභිරුචිය දුර්වලව පවතින පසුබිමක, මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් සඳහා ලබා දුන් සෘජු දායක වීම් මෙන්ම රජයේ ඉහළ ගිය දළ මූල්‍යන අවශ්‍යතා සැපිරීම සහ අතිශය අභියෝගාත්මක තත්ත්වයන් යටතේ මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහ අවශ්‍යතා සපුරාලීම සඳහා මහ බැංකුව වෙත පරිපාලනමය වශයෙන් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම නිසා ඇති වූ බලපෑම, මහ බැංකුව මගින් කරන ලද ඉහත සඳහන් කළ මූල්‍යනය මගින් පිළිබිඹු වේ. කෙසේ වෙතත්, රජයේ ආදායම් ලැබීම ඉහළ යෑම සහ ප්‍රධාන වශයෙන් ලෝක බැංකු සමූහය යටතේ පවතින ජාත්‍යන්තර සංවර්ධන සමායතනය හා ප්‍රතිසංස්කරණ සහ සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික බැංකුව මෙන්ම ආසියානු

1 භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත්, අක්වෙරළ බැංකු ඒකක සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලින් ලබා ගත් සියලුම ශුද්ධ ණය ගැනීම් ඇතුළත් වේ.

6.6 සංඛ්‍යා සටහන

දේශීය මූල්‍යනයේ මූලාශ්‍ර (ශුද්ධ)

රුපියල් මිලියන

ශීර්ෂය	2021	2022 (අ)
ණය උපකරණ අනුව	**2,071,826**	**2,035,145**
භාණ්ඩාගාර බැඳුම්කර	1,301,543	1,440,190
භාණ්ඩාගාර බිල්පත්	635,098	1,608,211
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	-68,324	-380,069
මහ බැංකු තාවකාලික අත්තිකාරම්	-2,950	85,510
අක්වෙරළ බැංකු ඒකකවලින් ලබාගත් ණය	-103,547	-52,236
අනෙකුත්	310,006	-666,461
ආයතන අනුව	**2,071,826**	**2,035,145**
බැංකු	1,304,287	1,027,721
බැංකු නොවන	767,539	1,007,424

(අ) තාවකාලික

මූලය: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

සංවර්ධන බැංකුව සහ ඉන්දියානු ණය ආධාර යටතේ ලැබුණු බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික විදේශීය මූලාශ්‍ර මගින් ලැබුණු අරමුදල් හේතුවෙන්, 2022 වසරේ පළමු භාගයට සාපේක්ෂව වසරේ දෙවන භාගය තුළ දී මහ බැංකුව විසින් සිදු කළ මූල්‍යනය සාපේක්ෂව අඩු විය. මහ බැංකුව විසින් තාවකාලික අත්තිකාරම් ලෙස රජයට ලබා දුන් ශුද්ධ මූල්‍යනය මහ බැංකුව විසින් සිදු කළ සමස්ත මූල්‍යනයට අයත් වන අතර, පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 3.0ක ශුද්ධ තාවකාලික අත්තිකාරම් ණය ආපසු ගෙවීම්වලට සාපේක්ෂව, 2022 වසරේ දී රුපියල් බිලියන 85.5ක ශුද්ධ ණය ගැනීමක් වාර්තා විය. මේ අතර, 2021 වසරේ දී රුපියල් බිලියන 79.1ක් වූ වාණිජ බැංකු මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2022 වසරේ දී රුපියල් බිලියන 310.7ක ණය ආපසු ගෙවීමක් ලෙස සටහන් විය. බැංකු නොවන අංශයෙන් සිදු කළ ශුද්ධ මූල්‍යනය 2021 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 767.5ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 1,007.4 දක්වා වර්ධනය වූ අතර, 2021 වසරේ දී සියයට 37.0ක් වූ බැංකු නොවන අංශය මගින් සමස්ත ශුද්ධ දේශීය මූල්‍යනය සඳහා දක්වන ලද දායකත්වය, 2022 වසරේ දී සියයට 49.5ක් දක්වා ඉහළ ගියේය. ද.දේ.නියෙහි ප්‍රතිශතයක් ලෙස බැංකු නොවන අංශයෙන් සිදු කළ මූල්‍යනය, 2021 වසරේ දී වාර්තා වූ සියයට 4.4ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 4.2ක් දක්වා අඩු විය.

දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතා හමුවේ කෙටි කාලීන ණය උපකරණ සඳහා ඇති වෙළඳපොළ අභිරුචිය පිළිබිඹු කරමින් භාණ්ඩාගාර බිල්පත් මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය 2022 වසරේ දී සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගියේය. ණය උපකරණ මගින් ලබාගත් ශුද්ධ දේශීය ණය, 2021 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 1,868.3ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 2,668.3ක් දක්වා වැඩි විය. භාණ්ඩාගාර බිල්පත් මගින් සිදු කළ මූල්‍යනය, 2021 වසරේ රුපියල් බිලියන 635.1ක් වූ අතර, එය 2022 වසරේ දී රුපියල් බිලියන 1,608.2ක් දක්වා සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගිය අතර, භාණ්ඩාගාර බැඳුම්කර මගින් සිදු කළ මූල්‍යනය, 2021 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 1,301.5ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 1,440.2ක් දක්වා වැඩි විය. කෙසේ වුවද, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මගින් සිදු කළ මූල්‍යනය, 2021 වසරේ දී රුපියල් බිලියන 68.3ක ශුද්ධ ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා වූ අතර, 2022 වසරේ දී එම බැඳුම්කර සඳහා ශුද්ධ ණය ආපසු ගෙවීම රුපියල් බිලියන 380.1ක් විය. මේ අතර, 2022 වසර තුළ දී රජයේ අයිරා පහසුකමේ ශේෂයන් පියවීම මූලිකව හේතුකරගෙන, ණය උපකරණ නොවන මූලාශ්‍ර වලින් ලබාගත් ශුද්ධ දේශීය ණය ලබා ගැනීම්, 2021 වසරේ පැවති රුපියල් බිලියන 203.5ක ශුද්ධ ණය ගැනීමට සාපේක්ෂව, 2022 වසරේ දී රුපියල් බිලියන 633.2ක ශුද්ධ ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය. 2022 වසර තුළ දී අක්වෙරළ බැංකු ඒකක වෙත සිදු කරන ලද ශුද්ධ ණය ආපසු ගෙවීම් රුපියල් බිලියන 52.2ක් විය.

පෙර නොවූ විරූ ආර්ථික අර්බුදය හමුවේ බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික මූලාශ්‍ර මගින් ලද අරමුදල් පිළිබිඹු කරමින්, 2021 වසරට සාපේක්ෂව 2022 වසර තුළ දී විදේශීය මූලාශ්‍ර මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය ඉහළ ගියේය. 2021 වසරේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා රුපියල් බිලියන 199.9ක (එ.ජ. ඩොලර් බිලියන 1.0ක) ශුද්ධ ණය ආපසු ගෙවීමක් සිදු වූ අතර, ශ්‍රී ලංකාවේ විදේශීය ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීමට පෙර 2022 වසරේ ජනවාරි මාසයේ දී කල්පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය සඳහා සිදු කළ ණය ආපසු ගෙවීම හේතුවෙන් 2022 වසරේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා රුපියල් බිලියන 100.5ක (එ.ජ. ඩොලර් මිලියන 500ක) ශුද්ධ ණය ආපසු ගෙවීමක් වාර්තා විය. කෙසේ වෙතත්, බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික මූලාශ්‍ර කිහිපයක් ඇතුළුව විදේශීය ව්‍යාපෘති සහ වැඩසටහන් ණය මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2021 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 39.3ට සාපේක්ෂව, සමාලෝචිත කාලසීමාව තුළ දී රුපියල් බිලියන 525.3ක් දක්වා ඉහළ ගියේය. ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව මගින්

දැනට ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති සඳහා වෙන් කළ අරමුදල්, අර්බුදය මධ්‍යයෙහි ඖෂධ, පොහොර සහ එල්.පී. ගෑස් ආනයනය මෙන්ම අවධානමට ලක්වූ කණ්ඩායම් වෙත මුදල් පැවරුම් සිදු කිරීම වැනි ජනතාවගේ දැඩි අවශ්‍යතා සපුරා ගැනීමේ අරමුණු සඳහා යොදවන ලදී. මේ අතර, 2022 වසර තුළ දී ඉන්ධන, පොහොර, වෛද්‍ය අයිතමයන් සහ ආහාර ආදිය ආනයනය කිරීම සඳහා ඉන්දියානු රජය විසින් ශ්‍රී ලංකාවට ණය පහසුකම් ලබා දෙන ලදී. අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය සඳහා ඉන්දියානු රාජ්‍ය බැංකුව මගින් එ.ජ. ඩොලර් බිලියන 1.0ක වටිනාකමකින් යුතු ණය පහසුකමක් ලබා දුන් අතර, ඉන්දියානු අපනයන ආනයන බැංකුව මගින් ඉන්ධන සහ පොහොර ආනයනය සඳහා, පිළිවෙළින්, එ.ජ. ඩොලර් මිලියන 500ක සහ එ.ජ. ඩොලර් මිලියන 55ක කෙටි කාලීන ණය පහසුකම් ලබා දෙන ලදී. ඉන්ධන ආනයනය සඳහා ඉන්දියානු රාජ්‍ය බැංකුවේ ණය පහසුකම මාර්ගයෙන්, ආසන්න වශයෙන්, එ.ජ. ඩොලර් මිලියන 200ක් ලබාගෙන ඇත.

6.4 රාජ්‍ය ණය සහ ණය සේවාකරණ ගෙවීම්

මධ්‍යම රජයේ ණය[2]

විශේෂයෙන් ම පසුගිය වසර කිහිපය පුරා, තිරසාරාත්මක නොවන මට්ටම් කරා ක්‍රමයෙන් ගමන් කළ මධ්‍යම රජයේ නොපියවූ ණය, 2022 වසරේ මුල් භාගයේ දී තීරණාත්මක මොහොතක් කරා ළඟා වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස තෝරාගත් විදේශීය ණය ආපසු ගෙවීම රජය විසින් තාවකාලිකව අත්හිටුවීමක් නිවේදනය කරන ලදී. ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම පහළ යෑම් හමුවේ විදේශීය මූල්‍යනය වෙත පවතින ප්‍රවේශය සීමිත වීම හේතුවෙන්, දළ නිල සංචිත යොදා ගෙන ණය සේවාකරණයේ අඛණ්ඩව නියැලීම, දළ නිල සංචිත උග්‍ර ලෙස පහත වැටීමට හේතු විය. විදේශ මුදලින් සිදු කළ යුතු ණය සේවාකරණ වියදම් වර්ධනය වීම සහ 2022 වසරේ අප්‍රේල් මස මුල් භාගය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ

6.6 රූප සටහන
මධ්‍යම රජයේ නොපියවූ ණය



(අ) සංශෝධිත

මූලයන්: මුදල්, ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

භාවිත කළ හැකි සංචිත සම්පූර්ණයෙන් ම සිඳී යෑමට ආසන්න වීමත් සමඟ තාවකාලික ක්‍රියාමාර්ගයක් ලෙස තෝරාගත් විදේශීය ණය ආපසු ගෙවීම අත්හිටුවීමක් නිවේදනය කිරීමට රජයට සිදු වූ අතර, විස්තීර්ණ ණය පහසුකමක සහාය ඇතිව ක්‍රියාත්මක කෙරෙන වැඩසටහනක් හරහා ජා.මූ. අරමුදලෙහි සහාය ලබා ගැනීමටත්, ඉදිරි කාලය තුළ දී ණය තිරසාරභාවය තහවුරු කිරීම අරමුණු කර ගත් ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියක් පසුව ආරම්භ කිරීමටත් පියවර ගනු ලැබිණි.

රජයේ විශාල මූල්‍යන අවශ්‍යතාවල බලපෑම, විනිමය අනුපාතිකයේ තියුණු අවප්‍රමාණය වීම මෙන්ම රජය සතු ව්‍යවසායයන්ගේ තෝරාගත් ණය මධ්‍යම රජයේ ණය වශයෙන් අවශෝෂණය කර ගැනීම පිළිබිඹු කරමින්, මධ්‍යම රජයේ නොපියවූ ණය, 2021 වසර අවසානයට සාපේක්ෂව, 2022 වසර අවසානයේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මධ්‍යම රජයේ සමස්ත නොපියවූ ණය තොගය,[3] නාමික වශයෙන්, 2021 වසර අවසානය වන විට පැවති රුපියල් බිලියන 17,614.2 සිට 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 27,492.0ක් දක්වා සියයට 56.1කින් ඉහළ ගියේය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයේ ණය, 2021 වසර අවසානයට පැවති සියයට 100.1ට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 113.8ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, 2022 වසර තුළ දී ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණ වීම මූලික

2 දැනට සිදු කෙරෙමින් පවතින ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සහ හිඟ ගෙවීම් සමඟ, ණය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීම අභියෝගාත්මක විය. ණය ආපසු ගෙවීම තාවකාලිකව අත්හිටුවීමේ අන්තර්කාලීන ප්‍රතිපත්තිමය තීරණයට අනුව ප්‍රාග්ධනීකරණය කළ යුතු යැයි සැලකෙන, එම තීරණයෙන් බලපෑමට ලක් වූ ණයවල හිඟ පොලී ගෙවීම් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට අදාළව හිඟ පොලී ගෙවීම් කිහිපයක් ඇතුළුව, හිඟ ණය සේවාකරණ ගෙවීම් කිහිපයක් මෙම ණය සංඛ්‍යාලේඛනවලට එකතු කර නොමැති බැවින්, 2022 වසර අවසානයට මධ්‍යම රජයේ නොපියවූ ණය සංඛ්‍යාලේඛන තාවකාලික අගයන් වේ. එවැනි හිඟ ගෙවීම්වල විස්තර, වත්මන් ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය යටතේ දත්ත ප්‍රචාරණ ප්‍රයත්නවල කොටසක් ලෙස, මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි පළ කරන ලදී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ණය සංඛ්‍යාලේඛන වාර්තා කිරීම සඳහා සාමාන්‍යයෙන් භාවිත කරන දත්ත මූලාශ්‍රය වන, පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම්-ණය දත්ත වාර්තාකරණ සහ කළමනාකරණ පද්ධතියට (Commonwealth Secretariat Debt Recording and Management System - CS-DRMS) එම තොරතුරු තවමත් ඇතුළත් කෙරෙමින් පවතියි.

3 මුදල් අමාත්‍යාංශයේ පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම්-ණය දත්ත වාර්තාකරණ සහ කළමනාකරණ පද්ධතියෙන් 2023 මාර්තු 09 සහ 10 යන දිනවලදී ලබා ගත් වාර්තා, මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ වාර්තා සහ මහ බැංකුවේ මුදල් සමීක්ෂණය අනුව සම්පාදනය කර ඇත.

6.7 සංඛ්‍යා සටහන

මධ්‍යම රජයේ නොපියවූ ණය (වසර අවසානයේ දී) (අ)

රුපියල් මිලියන

ශීර්ෂය	2019	2020	2021 (ආ)	2022 (ඇ) (ඈ)
මුළු රාජ්‍ය ණය	**13,031,543**	**15,117,247**	**17,614,181**	**27,492,031**
දේශීය ණය (ඉ)	**6,830,260**	**9,065,068**	**11,097,223**	**15,033,876**
කල්පිරීමේ කාලය අනුව				
කෙටි කාලීන (ඊ)	1,270,374	2,197,594	3,139,794	4,267,724
මැදි හා දිගු කාලීන (ඉ) (උ)	5,559,887	6,867,473	7,957,430	9,882,058
දේශීය වෙනත් (උආ)	ලැ.නො.	ලැ.නො.	ලැ.නො.	884,093
ආයතන අනුව (එ)				
බැංකු (එ)	2,737,223	4,542,155	5,247,919	8,525,718
බැංකු නොවන (එ)	3,825,703	4,210,099	4,822,098	6,164,063
ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු වෙන් කිරීම් (ඒ) (ඔ)	267,334	312,814	1,027,207	344,096
විදේශීය ණය (ඕ) (ක)	**6,201,283**	**6,052,179**	**6,516,958**	**12,458,155**
බහුපාර්ශ්වීය	1,469,867	1,601,482	1,895,340	3,611,552
ද්විපාර්ශ්වීය සහ වාණිජ ණය	4,731,415	4,450,697	4,621,618	8,846,603
එයින්,				
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර	2,531,493	2,203,279	2,243,049	3,921,587
විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම්	242,191	279,612	445,521	797,589
භාණ්ඩාගාර බිල්පත්වල අනේවාසිකයන්ගේ ආයෝජන	23,727	670	204	12,476
භාණ්ඩාගාර බැඳුම්කරවල අනේවාසිකයන්ගේ ආයෝජන	80,294	6,204	1,710	13,078
ව්‍යවහාර මුදල් අනුව				
වි.ගැ.හි.	927,372	970,714	989,442	1,604,694
එ.ජ. ඩොලර්	4,076,588	3,875,950	4,295,194	8,716,938
ජපාන යෙන්	624,956	664,291	623,206	979,567
යූරෝ	228,713	251,406	240,974	417,406
වෙනත්	343,653	289,818	368,142	739,550
මධ්‍යම රජයේ ණය / ද.දේ.නි. (ග)	**81.9**	**96.5**	**100.1**	**113.8**
විශේෂිත අයිතමයන්				
විනිමය අනුපාතයේ මුළු විචලනය	12,401	355,663	499,681	5,617,220
විදේශීය ණය මත	16,857	329,895	473,796	5,262,420
විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කළ දේශීය ණය මත	-4,456	25,767	25,884	354,800

මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2014 වසරේ දී ජා.මූ. අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, අනේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන විදේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇති අතර, නේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආයෝජන දේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇත.

(ආ) සංශෝධිත

(ඇ) තාවකාලික

(ඈ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණ පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් මධ්‍යම රජයේ නොගෙවූ ණය ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවේ. අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව බලපෑමකට ලක් වූ විදේශ ණය කාණ්ඩවල ප්‍රාග්ධනයට එකතු කළ යුතු, ගෙවීමට නියමිත පොලී ගෙවීම් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට අදාළව නොගෙවූ ණය පොලී ගෙවීම් මෙම නොගෙවූ ණය සේවාකරණ ගෙවීම්වලට අයත් වේ.

(ඉ) 2012 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778ක් සහ 2022 ජනවාරි මස 01 දින රුපියල් මිලියන 25,217ක් වටිනා බැඳුම්කර කල්පිරීම් නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 31,446කි) ඇතුළත් වේ.

(ඊ) අනේවාසික ආයෝජකයන් සතු භාණ්ඩාගාර බිල්පත් වටිනාකම් ඇතුළත් නොවේ.

(උ) අනේවාසික ආයෝජකයන් සතු භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම් ඇතුළත් නොවේ.

(උආ) 2022 දෙසැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි මධ්‍යම රජයේ ණය තුළට ඇතුළත් කෙරුණු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ පැවති රුපියල් මිලියන 884,093.4ක වටිනාකමකින් යුතු භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති ඇපකර යටතේ ලබාගත් නොපියවූ ණය අයත් වේ.

(එ) මධ්‍යම තැන්පතු පද්ධතියෙහි පවතින තොරතුරු මත පදනම්ව 2022 වාර්ෂික වාර්තාවේ සිට ආයතන අනුව වර්ගීකරණය සංශෝධනය කර ඇති අතර, 2019-2021 කාලසීමාවන්ට අදාළ දත්ත ඒ අනුව සංශෝධනයට ලක් කර ඇත.

(ඒ) පරම අයිතිකරු සොයා ගැනීමට අපහසු ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් යටතේ කළ ආයෝජනයන් සඳහා වෙන් කරන ලද සුරැකුම්පත් ඇතුළත් වේ.

(ඔ) විවට වෙළඳ කටයුතු යටතේ සිදු කරන ලද ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුවලට අදාළ ආයෝජන, අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකු හෝ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් යටතේ 2022 වසරේ දී පමණක් වෙන් කර ඇත.

(ඕ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් පවත්වාගෙන යන පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම්-ණය වාර්තාකරණ හා කළමනාකරණ පද්ධතියෙන් 2023 මාර්තු 09 සහ 10 වැනි දිනයන්හි දී ලබා ගත් දත්ත මත පදනම්ව 2021 සහ 2022 වසරවලට අදාළ විදේශීය ණය දත්ත සහ විදේශීය ණය වර්ගීකරණය සකස් කර ඇත.

(ක) 2022 දෙසැම්බර් මස සිට, ලංකා විදුලිබල මණ්ඩලය, සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පැවති ව්‍යාපෘති ණය කිහිපයකට අදාළ නොගෙවූ ණය ශේෂයන්, මධ්‍යම රජයේ ණය වෙත ඇතුළත් කර ඇත.

(ග) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දේපාර්තමේන්තුව විසින් 2022 මාර්තු 15 වන දින නිකුත් කරන ලද ද.දේ.නි ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) භාවිතා කර ඇත.

6.7 රූප සටහන
මධ්‍යම රජයේ නොපියවූ දේශීය ණය සංයුතිය - 2022 වසර අවසානයට



මූලයන්: මුදල්, ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

වශයෙන් පිළිබිඹු කරමින්, 2021 වසර අවසානයේ දී ද.දේ.නි.යෙන් සියයට 37.0ක්ව පැවති දේශීය ව්‍යවහාර මුදලින් තක්සේරු කළ මධ්‍යම රජයේ නොපියවූ විදේශීය ණය, 2022 වසර අවසානය වන විට ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 51.6ක් දක්වා ඉහළ ගියේය.

විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීමත් සමඟ, විදේශීය ණයෙහි සාපේක්ෂ දායකත්වය 2022 වසර අවසානය වන විට ඉහළ ගිය අතර, සමස්ත ණය තොගයට දේශීය ණයෙහි සාපේක්ෂ දායකත්වය 2021 වසර අවසානයේ පැවති සියයට 63.0 සිට 2022 වසර අවසානය වන විට සියයට 54.7ක් දක්වා පහත වැටුණි. 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 2,270.5ක් වූ නොපියවූ භාණ්ඩාගාර බිල්පත් තොගය 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 4,113.9ක් දක්වා ඉහළ යෑම මූලිකව ම පිළිබිඹු කරමින්, නොපියවූ කෙටි කාලීන දේශීය ණය, 2021 වසර අවසානයේ සිට 2022 වසර අවසානය වන විට සියයට 35.9කින් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, සමස්ත දේශීය ණය තොගයට භාණ්ඩාගාර බිල්පත්වල දායකත්වය, 2021 වසර අවසානයේ පැවති සියයට 20.5 සිට 2022 වසර අවසානය වන විට සියයට 27.4ක් දක්වා ඉහළ ගියේය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් තාවකාලික අත්තිකාරම් ගිණුමේ නොපියවූ ණය තොගය, 2021 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 150.1 සිට 2022 වසර අවසානයේ දී රුපියල් බිලියන 235.6ක් දක්වා ඉහළ ගියේය. රජය විසින් 2022 වසරේ දී බැංකු අයිරාවේ ශේෂයෙන් කොටසක් පියවූ බැවින්, බැංකු තැන්පතු අඩු කළ විට ඉතිරිව පවතින අනෙකුත් ශුද්ධ කෙටි කාලීන ණය, 2022 වසර අවසානයේ දී රුපියල් බිලියන 81.8ක ඍණ ශේෂයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, මැදි සහ දිගු කාලීන දේශීය ණය තොගය, 2021 වසර අවසානයේ දී වාර්තා වූ රුපියල් බිලියන 7,957.4ක සිට 2022 වසර අවසානය වන විට සියයට 24.2කින් ඉහළ ගියේය. නොපියවූ දේශීය ණය තොගයේ ප්‍රධානම කොටස පිළිබිඹු කරමින් භාණ්ඩාගාර බැඳුම්කර, 2021 වසර අවසානයේ දී සමස්ත නොපියවූ ණය තොගයෙන් සියයට 62.8කට (රුපියල් බිලියන 6,966.2කට) දැක්වූ දායකත්වයට සාපේක්ෂව, 2022 වසර අවසානයේ දී මුළු ණය තොගයෙන් සියයට 57.9කට (රුපියල් බිලියන 8,709.1කට) දායක විය. මේ අතර, මෙම වසර තුළ දී ආයෝජකයන්ට සිදු කළ යුතු ගෙවීම් පියවීම හේතුවෙන්, 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 455.2ක් (එ.ජ. ඩොලර් මිලියන 2,271.1ක්) වූ නේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර 2022 වසර අවසානයේ දී රුපියල් බිලියන 382.1ක්[4] (එ.ජ. ඩොලර් මිලියන 1,052.3ක්) දක්වා අඩු විය. විනිමය අනුපාතිකය තියුණු ලෙස අවප්‍රමාණය වීම නිසා, නේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වටිනාකම, දේශීය මුදලින්, 2021 වසර අවසානයට පැවති රුපියල් බිලියන 372.6ක අගයේ සිට 2022 වසර අවසානයේ දී රුපියල් බිලියන 635.4ක්[5] දක්වා ඉහළ ගිය අතර, එහි විදේශීය ව්‍යවහාර මුදල් අගය, එ.ජ. ඩොලර් මිලියන 500ක කල්පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් පියවීම හේතුවෙන්, 2021 වසර අවසානයේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,859.0ක සිට 2022 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,750.0ක් දක්වා පහළ ගියේය. සමාලෝචනයට ලක් කෙරෙන කාලය අවසන් වන විට, අක්වෙරළ බැංකු ඒකකවලින් ලබා ගත් නොපියවූ ණය ප්‍රමාණය රුපියල් බිලියන 131.4ක් (එ.ජ. ඩොලර් මිලියන 361.8ක්) දක්වා, 2021 වසර අවසානයේ සිට රුපියල් බිලියන 7.9කින් අඩු විය. තවද, 2021 වසර අවසානයේ දී බැංකු අංශය හරහා ලබා ගත් ණය සමස්ත දේශීය ණයෙන් සියයට 47.3ක් වූ අතර, එය 2022 වසර අවසානය වන විට සියයට 56.7ක් දක්වා ඉහළ ගියේය. 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 1,391.3ක් වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය, 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 2,575.7ක් දක්වා කැපී පෙනෙන ලෙස ඉහළ යෑම හේතුවෙන්, 2022

4 2022 අප්‍රේල් මාසයේ දී තෝරාගත් ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවන බව ප්‍රකාශ කිරීමෙන් පසු, නොගෙවූ හිඟ පොලී ගෙවීම් මෙයට ඇතුළත් නොවේ.

5 ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම නිවේදනයෙන් පසු නොගෙවූ හිඟ පොලී ගෙවීම් මෙයට අයත් නොවේ.

වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මධ්‍යම රජයට ලබා දෙන ලද ණයෙහි සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා විය. වෙළඳපොළ දායකත්වය අඩු වීම හමුවේ මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත්වලට ලබා දෙන ලද ඍජු දායකත්වය සහ මහ බැංකුව වෙත පරිපාලනමය වශයෙන් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මෙම ඉහළ යෑමට හේතු විය.

මධ්‍යම රජයේ නොපියවූ විදේශීය ණය ප්‍රමාණය,[6] නාමික වශයෙන්, 2021 වසර අවසානයේ දී පැවති රුපියල් බිලියන 6,517.0 සිට 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 12,458.2ක් දක්වා ඉහළ ගියේය. 2022 වසර තුළ දී ශ්‍රී ලංකා රුපියල ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට එරෙහිව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම මූලිකව හේතු කරගෙන, සමස්ත ණය සඳහා විදේශීය ණය දැක්වූ දායකත්වය, 2021 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 37.0 සිට 2022 වසර අවසානය වන විට සියයට 45.3ක් දක්වා ඉහළ ගියේය. දේශීය මුදල අවප්‍රමාණය වීමේ බලපෑම මෙන්ම ආර්ථිකය අර්බුදය තුළ දී ඉලක්කගත සහනාධාර ලබා දීම සඳහා බහුපාර්ශ්වික ණය අරමුදල් ලැබීම හේතුවෙන්, විදේශීය ණය කළඹ තුළ බහුපාර්ශ්වික ණය, 2021 වසර අග වාර්තා වූ රුපියල් බිලියන 1,895.3 සිට 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 3,611.6ක් දක්වා ඉහළ ගියේය. තවද, ලං.ඛ.නී.සං., ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගම, ලං.වි.ම. සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ණය වගකීම් කිහිපයක් මධ්‍යම රජයේ ණය වෙත ඇතුළත් කර ගැනීම, ඉන්දීය ණය පහසුකම වැනි මානුෂීය ආධාර සැපයීම පිණිස ලද ණය පහසුකම් මෙන්ම ව්‍යවහාර මුදල අවප්‍රමාණය වීම මූලිකව හේතුකරගෙන, 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 4,621.6ක් ලෙස පැවති ද්විපාර්ශ්වික සහ වාණිජ ණය, 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 8,846.6ක්[7] දක්වා කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. වාණිජ ණය අතර, අනේවාසිකයන් විසින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල සිදු කළ ආයෝජනයන්හි රුපියල් අගය, එ.ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 1,678.5කින් ඉහළ ගියේය. අනේවාසිකයන් විසින් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල සිදු කළ ආයෝජන, 2021 වසර අවසානයේ දී, පිළිවෙළින්, රුපියල් බිලියන 0.2ක් සහ රුපියල් බිලියන 1.7ක් ලෙස වාර්තා වූ අතර, එය 2022 වසර අවසානය වන විට, පිළිවෙලින්, රුපියල් බිලියන 12.5ක් සහ රුපියල් බිලියන 13.1ක් දක්වා ඉහළ ගියේය. 2022 වසර තුළ දී විදේශ ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම නිසා ඇති වූ අගයේ විචලනය (parity variation) හේතුවෙන් විදේශ විනිමයෙන් නාමනය කරන ලද ණයෙහි රුපියල් අගය 2022 වසර අවසානයේ දී රුපියල් බිලියන 5,617.2කින් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 23.3කින්) පමණ ඉහළ ගියේය.

තෝරාගත් රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම 2023 වසරේ දී සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, ජා.මූ. අරමුදල විසින් සිදු කරන ලද ණය තිරසාරත්ව විශ්ලේෂණයට අනුව ණය තිරසාරත්ව ඉලක්ක සපුරාලිය හැකි සහ නොපියවූ ණය කළමනාකරණය කළ හැකි මට්ටමකට ණය අඩු කිරීමට මෙන්ම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ විකල්ප ඇගයීමේ ක්‍රියාවලියක රජය නිරත ව සිටී. 2032 වසර වන විට නොපියවූ රාජ්‍ය ණය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 95කට වඩා පහළ මට්ටමකට අඩු කිරීම, 2027 සිට 2032 දක්වා කාලය තුළ දී මධ්‍යම රජයේ දළ මූල්‍යන අවශ්‍යතාවයේ සාමාන්‍යය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 13කට වඩා අඩු අගයක පවත්වා ගැනීම සහ මධ්‍යම රජයේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2027 සිට 2032 දක්වා යන කාලයේ දී ඕනෑම වසරක් තුළ ද.දේ.නි.යෙන් සියයට 4.5කට වඩා අඩුවෙන් පවත්වා ගැනීම රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම මගින් අපේක්ෂිතය.

මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම්

අන්තර්කාලීන ක්‍රියාමාර්ගයක් ලෙස, 2022 වසරේ අප්‍රේල් 12 වන දින සිට රජය විසින් තෝරාගත් ද්විපාර්ශ්වික සහ වාණිජ විදේශීය ණය සඳහා සිදු කරන ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවන ලදී. මෙම ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවීම මගින් සැලකිය යුතු අගයක විදේශ විනිමය ගෙවීම් ඉතිරි කර ගැනීමට හැකියාව ලැබුණු අතර, ගෙවුම් තුලන අර්බුදය හමුවේ එමගින් තාවකාලික සහනයක් සැලසිණි. 2022 වසරේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා වන කාලය තුළ දී ද්විපාර්ශ්වික සහ වාණිජ ණය ආපසු ගෙවීම තාවකාලිකව අත්හිටුවීම ඔස්සේ විදේශ විනිමය ගෙවීම්වල ඇස්තමේන්තුගත ඉතිරිය එ.ජ. ඩොලර්

6 2014 දී ජා.මූ. අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන අත්පොතට අනුව, අනේවාසිකයන් සතු මධ්‍යම රජයේ ණය විදේශීය ණය ලෙස වර්ගීකරණය කර ඇත.

7 තෝරාගත් විදේශීය ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම නිවේදනය කිරීමෙන් පසුව, ද්විපාර්ශ්වික සහ වාණිජ ණයවල නොගෙවූ හිඟ පොලී ගෙවීම් මෙයට අයත් නොවන අතර, මෙම හිඟ ගෙවීම් පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම්-ණය දත්ත වාර්තාකරණ සහ කළමනාකරණ පද්ධතියෙහි ප්‍රාග්ධනීකරණය කරන ලද පොලී ලෙස සටහන් කිරීම තවමත් සිදුවෙමින් පවතී.

6.8 සංඛ්‍යා සටහන

මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම්

රුපියල් මිලියන

ශීර්ෂය	2019	2020	2021 (අ)	2022 (ආ)
ණය සේවාකරණ ගෙවීම්	**2,022,507**	**1,941,373**	**2,380,599**	**2,997,645**
දේශීය	1,213,698	1,169,522	1,594,328	2,510,281
විදේශීය	808,809	771,851	786,271	487,364
ණය ආපසු ගෙවීම්	**1,121,155**	**961,071**	**1,332,216**	**1,432,455**
දේශීය	546,315	455,899	799,695	1,073,712
විදේශීය	574,839	505,172	532,521	358,743
පොළී ගෙවීම්	**901,352**	**980,302**	**1,048,383**	**1,565,190**
දේශීය	667,383	713,623	794,633	1,436,569
කෙටි කාලීන	81,029	77,965	98,668	555,171
මැදි හා දිගු කාලීන	586,354	635,658	695,965	881,398
විදේශීය	233,970	266,679	253,750	128,621

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

බිලියන 2.8කි. ණය ආපසු ගෙවීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන්, 2022 ජූලි මාසයේ දී කල්පිරීමට නියමිතව තිබූ ඒ.ජ. ඩොලර් බිලියන 1.0ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය ආපසු නොගෙවන ලදී. මීට අමතරව, ණය සේවාකරණය අත්හිටුවනු ලැබූ මෙම කාලය තුළ දී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට අදාළ ණය සේවාකරණ ගෙවීම් කිහිපයක් ද සිදු නොවීය. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට අදාළ මෙම ණය සේවාකරණ ගෙවීම් අතරින් කොටසක් ශ්‍රී ලංකා රුපියල්වලින් පියවනු ලැබුණි. මේ අතර, බහුපාර්ශ්වික ණය, නව ණය පහසුකම් සහ පවතින ණය පහසුකම් යටතේ 2022 අප්‍රේල් 12 වන දිනෙන් පසුව ලබා ගත් ඕනෑම මුදල් ප්‍රමාණයක් අන්තර්කාලීන ප්‍රතිපත්තියට යටත් නොවේ.

6.8 රූප සටහන

මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම්

(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලයන්: මුදල්, ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

දේශීය ණයට අදාළව ණය ආපසු ගෙවීම් සහ පොළී ආපසු ගෙවීම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන්, සමස්ත ණය සේවාකරණ ගෙවීම් 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී නාමික වශයෙන් සියයට 25.9ක කැපීපෙනෙන වර්ධනයක් වාර්තා කළේය. රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතික ඉහළ යෑම සහ විදේශීය මූල්‍යන මූලාශ්‍ර වෙත පවතින ප්‍රවේශය සීමා වීම හේතුවෙන් අයවැය හිඟය මූල්‍යනය සඳහා දේශීය මූලාශ්‍ර මත විශාල වශයෙන් රඳා පැවතීම පිළිබිඹු කරමින්, 2022 වසරේ දී දේශීය ණය සේවාකරණ ගෙවීම් පසුගිය වසරට සාපේක්ෂව සියයට 57.5කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, රජය විසින් 2022 වසරේ අප්‍රේල් මාසයේ සිට තෝරාගත් විදේශීය ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම අත්හිටුවීම සම්බන්ධව තම අන්තර්කාලීන ප්‍රතිපත්තිය

6.9 සංඛ්‍යා සටහන

මධ්‍යම රජයේ ණය දර්ශක (අ)

ප්‍රතිශත

දර්ශකය	2019	2020	2021	2022 (ආ)
මධ්‍යම රජයේ ණය/ද.දේ.නි.	81.9	96.5	100.1	113.8
දේශීය ණය/ද.දේ.නි. (ඇ)	42.9	57.8	63.1	62.3
විදේශීය ණය/ද.දේ.නි.	39.0	38.6	37.0	51.6
දේශීය ණය/මධ්‍යම රජයේ ණය	52.4	60.0	63.0	54.7
විදේශීය ණය/මධ්‍යම රජයේ ණය	47.6	40.0	37.0	45.3
විදේශීය ණය/අපනයන (ඈ)	178.6	250.2	218.7	240.1
ණය සේවාකරණ/ද.දේ.නි.	12.7	12.4	13.5	12.4
ණය සේවාකරණ/රජයේ ආදායම	107.0	141.9	163.4	151.5
එයින් දේශීය ණය සේවාකරණ/රජයේ ආදායම	64.2	85.5	109.4	126.8
ණය සේවාකරණ ගෙවීම්/රජයේ වියදම (ඉ)	45.4	48.5	49.0	50.8
එයින් දේශීය ණය සේවාකරණ/රජයේ වියදම (ඉ)	27.2	29.2	32.8	42.5
විදේශීය ණය සේවාකරණ/අපනයන (ඈ)	23.3	31.9	26.4	9.4
ණය පොළී ගෙවීම්/ද.දේ.නි.	5.7	6.3	6.0	6.5
ණය පොළී ගෙවීම්/රජයේ වියදම (ඉ)	20.2	24.5	21.6	26.5
දේශීය ණය පොළී ගෙවීම්/ද.දේ.නි.	4.2	4.6	4.5	5.9
විදේශීය ණය පොළී ගෙවීම්/ද.දේ.නි.	1.5	1.7	1.4	0.5
ණය පොළී ගෙවීම්/ රජයේ පුනරාවර්තන වියදම්	37.2	38.5	38.2	44.5
විදේශීය ණය පොළී ගෙවීම්/අපනයන (ඈ)	6.7	11.0	8.5	2.5

මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2022 මාර්තු 15 වන දින නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) භාවිත කර ඇත.

(ආ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශීය ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් මධ්‍යම රජයේ නොගෙවූ ණය ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවේ. අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව බලපෑමකට ලක් වූ විදේශ ණය කාණ්ඩවල ප්‍රාග්ධනයට එකතු කළ යුතු, ගෙවීමට නියමිත පොළී ගෙවීම් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට අදාළව නොගෙවූ ණය පොළී ගෙවීම් මෙම නොගෙවූ ණය සේවාකරණ ගෙවීම්වලට අයත් වේ.

(ඇ) 2012 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778ක් සහ 2022 ජනවාරි මස 01 දින රුපියල් මිලියන 25,217ක් වටිනා බැඳුම්කර කල්පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 31,446කි) ඇතුළත් වේ.

(ඈ) භාණ්ඩ හා සේවා අපනයන

(ඉ) ණය ආපසු ගෙවීම් ඇතුළත්ව රජයේ වියදම

නිවේදනය කිරීමත් සමඟ, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී විදේශීය ණය සේවාකරණ ගෙවීම් සියයට 38.0කින් අඩු විය.

සමස්ත ණය සේවාකරණ ගෙවීම්වලින් සියයට 47.8කට දායක වූ සමස්ත ණය ආපසු ගෙවීම්, පසුගිය වසරට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 7.5කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර කල්පිරීම් ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ දී දේශීය ණය ආපසු ගෙවීම් සියයට 34.3කින් ඉහළ ගියේය. කෙසේ වුවත්, තෝරා ගත් විදේශීය ණය සේවාකරණය තාවකාලිකව අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස, 2022 වසරේ දී රජයේ විදේශීය ණය ආපසු ගෙවීම් රුපියල් බිලියන 358.7ක් දක්වා සියයට 32.6කින් අඩු විය. 2021 වසරේ දී කල්පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ගෙවීම්වලට ගෙවන ලද රුපියල් බිලියන 199.9ට (එ.ජ. ඩොලර් බිලියන 1.0) සාපේක්ෂව, 2022 වසරේ ජනවාරි මාසයේ දී කල්පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් සඳහා ආපසු ගෙවන ලද රුපියල් බිලියන 100.5 (එ.ජ. ඩොලර් මිලියන 500) 2022 වසරේ ගෙවන ලද විදේශීය ණය සේවාකරණ ගෙවීම් සඳහා ඇතුළත් විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස දේශීය ණය ආපසු ගෙවීම, 2021 වසරේ වාර්තා වූ සියයට 4.5 අගයේ සිට 2022 වසරේ දී සියයට 4.4ක් දක්වා සුළු වශයෙන් පහළ ගිය අතර, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස විදේශීය ණය ආපසු ගෙවීම්, 2021 වසරේ පැවති සියයට 3.0ක සිට 2022 වසරේ දී සියයට 1.5ක් දක්වා අඩු විය.

රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සහ දේශීය ණය ගැනීම් කැපී පෙනෙන ලෙස ඉහළ යෑමත් සමඟ, 2022 වසරේ දී මධ්‍යම රජයේ ණය සඳහා පොලී ගෙවීම් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 49.3ක වර්ධනයක් වාර්තා කළේය. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් පැවති අවිනිශ්චිතතා හේතුවෙන්, අවදානම් පාරිතෝෂික ඉහළ යෑම ඔස්සේ, ප්‍රතිපත්ති පොලී අනුපාතික සඳහා සිදු කරන ලද ගැළපුම අභිබවා රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතික ඉහළ ගියේය. සීමිත විදේශීය මූල්‍යනය හමුවේ අයවැය හිඟය මූල්‍යනය සඳහා දේශීය මූලාශ්‍ර මත වැඩි පීඩන තත්ත්වයන් ඇති වීම ද රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතික ඉහළ යෑමට දායක විය. එහි ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන් ම භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙනුවෙන් සිදු කළ පොලී ගෙවීම් හේතුවෙන්, මධ්‍යම රජයේ දේශීය ණය සඳහා පොලී ගෙවීම්, පසුගිය වසරට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 80.8කින් ඉහළ ගියේය. ණය සේවාකරණය තාවකාලිකව අත්හිටුවීමෙන් පසු, විදේශීය ද්විපාර්ශ්වික සහ වාණිජ ණය සඳහා පොලී නොගෙවීමත් සමඟ, 2021 වසරේ අනුරූපී ගෙවීම්වලට සාපේක්ෂව, 2022 වසරේ දී විදේශීය ණය සඳහා පොලී ගෙවීම් රුපියල් බිලියන 128.6ක් දක්වා සියයට 49.3කින් අඩු විය. ඒ අනුව, 2021 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 4.5ක් වූ දේශීය ණය සඳහා පොලී ගෙවීම්, 2022 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 5.9ක් දක්වා ඉහළ ගිය අතර, පෙර වසරේ ද.දේ.නි.යෙන් සියයට 1.4ක් වූ විදේශීය ණය සඳහා පොලී ගෙවීම් 2022 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 0.5ක් දක්වා පහළ ගියේය.

ණය සහ ණය සේවාකරණ අනුපාත මෙන්ම ණය සේවාකරණ ආවරණ අනුපාත ඇතුළත් ණය සේවාකරණ දර්ශක 2022 වසරේ දී මිශ්‍ර කාර්යසාධනයන් පෙන්නුම් කළේය. ප්‍රධාන වශයෙන් ආදායම් රැස් කිරීමෙහි කැපී පෙනෙන නාමික වර්ධනය සහ විදේශීය ණය සේවාකරණය තාවකාලික අත්හිටුවීමේ බලපෑම හේතුවෙන්, රාජ්‍ය ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස සමස්ත ණය සේවාකරණ ගෙවීම් 2022 වසරේ දී සැලකිය යුතු ලෙස පහත වැටුණි. කෙසේ වෙතත්, රාජ්‍ය ආදායම සහ රාජ්‍ය වියදමට සාපේක්ෂව දේශීය ණය සේවාකරණ ගෙවීම්වල තියුණු ඉහළ යෑම මගින් පෙන්නුම් කරන පරිදි, 2022 වසර තුළ දී දේශීය ණය සේවාකරණ ගෙවීම්වල සැලකිය යුතු ඉහළ යෑම රාජ්‍ය අයවැය මත විශාල පීඩනයක් එල්ල කළේය. විදේශීය ණය සේවාකරණ ගෙවීම් හා අපනයන අතර අනුපාතය සහ විදේශීය ණය සේවාකරණ ගෙවීම් හා ද.දේ.නි. අතර අනුපාතය මගින් පිළිබිඹු වන පරිදි, තෝරාගත් විදේශීය ණය සේවාකරණය තාවකාලික අත්හිටුවීම හේතුවෙන් 2022 වසරේ දී විදේශීය ණය සේවාකරණ බර තාවකාලිකව ලිහිල් විය. ඉදිරි කාලයේ දී විදේශීය ණය සේවාකරණ ගෙවීම් යළි ආරම්භ කිරීමට පෙර, දැනට සිදු කෙරෙන ණය ප්‍රතිව්‍යුහගතකරණ සාකච්ඡා තුළින් දළ විදේශීය මූල්‍යන අවශ්‍යතා අවම කිරීම සඳහා ප්‍රමාණාත්මක සහනයක් මැදි කාලීනව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. දළ මූල්‍යන අවශ්‍යතා සහ විදේශ ව්‍යවහාර මුදල් ණය සේවාකරණය 2027-2032 කාලය තුළ දී, ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමේ සහාය ඇතිව ක්‍රියාත්මක වන වැඩසටහනෙහි අපේක්ෂිත මට්ටම්වල පවත්වා ගෙන යෑම තහවුරු කිරීමට රජයට සිදු වේ.

රාජ්‍ය ණය

මධ්‍යම රජයේ ණය, රජය සතු ව්‍යාපාර ව්‍යවසායයන් විසින් ලබාගෙන ඇති විදේශ විනිමය ණය සහ රාජ්‍ය ඇපකර මත ගනු ලැබූ ණය[8] ඇතුළත් වන නොපියවූ රාජ්‍ය ණය, 2021 වසර අවසානයේ දී

8 රාජ්‍ය ඇපකර මත ලබාගනු ලැබූ ණය, 2023 වසරේ මාර්තු 10 වන දින මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් ලැබුණු දත්ත මත පදනම්ව සම්පාදනය කර ඇත.

6.10 සංඛ්‍යා සටහන

නොපියවූ රාජ්‍ය ණය (වසර අවසානයේ දී)

	2019	2020	2021	2022 (අ)
රුපියල් මිලියන				
මධ්‍යම රජයේ සමස්ත නොපියවූ ණය (ආ) (ඇ) (ඈ)	**13,031,543**	**15,117,247**	**17,614,181**	**27,492,031**
රජයේ ඇපකර රහිතව රාජ්‍ය ව්‍යවසායයන් ලද විදේශ ව්‍යාපෘති ණය (ඇ)	**345,453**	**323,510**	**311,191**	**-**
සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම	22,317	22,189	21,833	-
ලංකා විදුලිබල මණ්ඩලය	150,418	136,720	128,026	-
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	172,717	164,602	161,332	-
රජයේ ඇපකර මත ලබාගෙන ඇති ණය (ඉ)	**778,305**	**986,391**	**1,506,743**	**1,180,701**
සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම	16,532	34,801	115,332	59,756
ලංකා බැංකුව සහ මහජන බැංකුව	ලැ.නො.	ලැ.නො.	36,540	66,889
ලංකා විදුලිබල මණ්ඩලය	25,212	70,559	89,311	139,593
ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව (ඈ)	297,220	345,500	561,267	100,969
සීමාසහිත ලංකා නැව් සංස්ථාව	12,613	12,505	12,263	19,959
ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය	35,311	35,562	35,738	35,670
සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම	5,398	9,692	13,899	2,080
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය	102,339	138,180	200,851	291,526
වී අලෙවි මණ්ඩලය	11,420	2,023	1,313	759
මාර්ග සංවර්ධන අධිකාරිය	206,563	262,015	349,895	341,736
ශ්‍රීලන්කන් ගුවන් සමාගම (ඊ)	32,083	43,530	60,336	72,598
අනෙකුත් සංස්ථා	33,615	32,023	29,998	49,164
රාජ්‍ය ණය	**14,155,301**	**16,427,148**	**19,432,115**	**28,672,731**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (උ)				
මධ්‍යම රජයේ සමස්ත නොපියවූ ණය (ආ) (ඇ) (ඈ)	81.9	96.5	100.1	113.8
රජයේ ඇපකර රහිතව රාජ්‍ය ව්‍යවසායයන් ලද විදේශ ව්‍යාපෘති ණය (ඇ)	2.2	2.1	1.8	-
රජයේ ඇපකර මත ලබාගෙන ඇති ණය (ඉ) (ඊ)	4.9	6.3	8.6	4.9
රාජ්‍ය ණය	**89.0**	**104.8**	**110.4**	**118.7**

මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) 2012 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778ක් සහ 2022 ජනවාරි මස 01 දින රුපියල් මිලියන 25,217ක් වටිනා බැඳුම්කර කල්පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 31,446කි) ඇතුළත් වේ.
(ඇ) 2022 දෙසැම්බර් මස සිට, ලංකා විදුලිබල මණ්ඩලය, සීමාසහිත ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පැවති ව්‍යාපෘති ණය කිහිපයකට අදාළව නොගෙවූ ණය ශේෂයන්, මධ්‍යම රජයේ ණය වෙත ඇතුළත් කර ඇත.
(ඈ) ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් විදේශීය මුදලින් නාමනය කරන ලද රාජ්‍ය ඇපකර මත ලබාගෙන ඇති නොපියවූ ණය 2022 දෙසැම්බර් මාසයේ දී මධ්‍යම රජයේ ණයවලට ඇතුළත් කර ඇත.
(ඉ) රාජ්‍ය ඇපකර මත වන ණය, 2023 මාර්තු 10 වන දින මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් ලැබුණු දත්ත මත පදනම්ව සම්පාදනය කර ඇත.
(ඊ) 2014 ජූනි මාසයේ දී ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් නිකුත් කරන ලද එ.ජ. ඩොලර් මිලියන 175ක ජාත්‍යන්තර බැඳුම්කර ඇතුළත් වේ. මෙම ජාත්‍යන්තර බැඳුම්කරය 2019 ජූනි මාසයේ දී කල්පිරුණු අතර, වසර 05ක කාලයක් සඳහා යළි නිකුත් කරන ලදී.
(උ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2022 මාර්තු 15 වන දින නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) භාවිත කර ඇත.

වාර්තා වූ ද.දේ.නි.යෙන් සියයට 110.4ක සිට 2022 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 118.7ක් දක්වා ඉහළ ගියේය. 2022 වසර තුළ දී මධ්‍යම රජයේ ණය ඉහළ යෑම සහ ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල්වලට එරෙහිව රුපියල අවප්‍රමාණය වීම මීට ප්‍රධාන වශයෙන් හේතු විය. නාමික වශයෙන්, 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 19,432.1ක් වූ සමස්ත නොපියවූ රාජ්‍ය ණය, 2022 වසර අවසානයේ දී රුපියල් බිලියන 28,672.7ක් දක්වා ඉහළ ගියේය. රාජ්‍ය ණයෙහි විශාලතම කොටස වන, මධ්‍යම රජයේ නොපියවූ ණය, සමස්ත රාජ්‍ය ණයෙහි සියයට 95.9ක් නියෝජනය කරමින්, 2022 වසර අවසානයේ දී රුපියල් බිලියන 27,492.0ක් දක්වා සියයට 56.1කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්, ලං.ඛ.නී.සං.ට අයත් විදේශීය මුදලින් නාමනය කරන ලද රාජ්‍ය ඇපකර මත ලබාගෙන ඇති ණය 2022 වසර අවසානයේ දී මධ්‍යම රජයේ ණය වලට ඇතුළත් කිරීම හේතුවෙන්, 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 1,506.7ක් වූ රාජ්‍ය ඇපකර මත ලබාගෙන ඇති ණය, සමස්ත නොපියවූ රාජ්‍ය ණයෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.1ක් නිරූපණය කරමින්, 2022 වසර අවසානයේ දී රුපියල් බිලියන 1,180.7ක් දක්වා පහළ ගියේය. 2022 ජාතික අයවැය මගින් යෝජනා කර ඇති පරිදි, 2023 ජනවාරි 30 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව, ලං.වි.ම., ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගමෙහි තෝරා ගත් විදේශීය ව්‍යාපෘති ණය, මධ්‍යම රජයේ ණය තුළට ඇතුළත් කර ඇත.

6.5 උප රාජ්‍ය ආයතනවල අයවැය කටයුතු

උප රාජ්‍ය ආයතනවල ප්‍රතිපත්ති දිශාව හා ක්‍රියාමාර්ග

2022 වසරේ දී, උප රාජ්‍ය මට්ටමින් සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම සහ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් අත්පත් කර ගැනීමේ අරමුණ ඇතිව ආයෝජනවලට පහසුකම් සැලසීම සඳහා, උප රාජ්‍ය ආයතන[9] වෙත ප්‍රතිපත්ති උපදේශන සැපයීමේ දී රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යභාරයක් අඛණ්ඩව ඉටු කළේය. අයවැය බාධක පැවතිය ද, ජනතාවගේ ජීවන තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා, අධ්‍යාපන සහ සෞඛ්‍ය අංශ ඉහළ නැංවීම ඇතුළුව, ආර්ථික සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලදී. ඒ අනුව, 2022 වසර තුළ දී, මෙම අමාත්‍යාංශය විසින් ග්‍රාමීය ප්‍රදේශවල මූලික සෞඛ්‍ය ආරක්ෂණ පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය සහ සාමාන්‍ය අධ්‍යාපනය නවීකරණ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. තවද, නාගරික මෙන්ම අනෙකුත් ප්‍රදේශවල භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, පළාත් පාලන වැඩිදියුණු කිරීමේ අංශ ව්‍යාපෘතිය (පුර නැඟුම වැඩසටහන), නැඟී එන ප්‍රදේශවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සහ මහ කොළඹ අපජලය කළමනාකරණ ව්‍යාපෘතිය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් 2022 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි.

සියලු පළාත්වල තුලිත සහ සැමට සාධාරණ අන්දමේ සමාජ ආර්ථික සංවර්ධනයක් තහවුරු කිරීමේ අරමුණින් මුදල් කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කිහිපයක් වසර තුළ දී නිර්දේශ කරන ලදී. ඒ අනුව, මුදල් කොමිෂන් සභාව මගින් ජාතික සහ පළාත්බද යන තල දෙකෙහි ම තාර්කීකව සම්පත් විභජනය සඳහා වගකිව යුතු ප්‍රබල නියෝජිත ආයතනයක් පිහිටුවීමට නිර්දේශ කෙරිණි. ඉහළ ආර්ථික ප්‍රතිලාභ සහිත ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය ලබා දීම සඳහා ආයෝජන සම්බන්ධ යෝජනා මෙම නියෝජිත ආයතනය විසින් ස්වාධීනව සහ දැඩි ලෙස ඇගයීමට ලක් කෙරෙනු ඇති අතර, ඵලදායී සම්පත් උපයෝජනයක් සහතික කරනු ඇත. මුදල් කොමිෂන් සභාව විසින් පළාත්බද මට්ටමින් සෞඛ්‍යාරක්ෂණ සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා රෝහල් සහ අනෙකුත් සෞඛ්‍යාරක්ෂණ ආයතන පිහිටුවීමේ/ව්‍යාප්ත කිරීමේ ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමට පරිපූර්ණ සහ ස්වාධීන අධ්‍යයනයක් සිදු කළ යුතු යැයි රජය වෙත නිර්දේශ සපයා ඇත. තවද, ඉහළ ආදායම් උත්පාදනයක් සහිත පළාත් සභා සහ පළාත් පාලන ආයතන මධ්‍යම රජයේ අයවැය මත යැපීම අවම කිරීම සඳහා සවිබල ගැන්වීමට නව මාවත් ගවේෂණය කිරීමේ අවශ්‍යතාව මුදල් කොමිෂන් සභාව විසින් ඉස්මතු කරන ලදී. මෝටර් රථ බලපත්‍ර ගාස්තු සහ පළාත් සභා විසින් රැස් කරනු ලබන මත්පැන් අලෙවිසැලේවල බලපත්‍ර ගාස්තු ඇතුළුව, බොහෝ බදු සහ ගාස්තු, වෙළඳපොළ තත්ත්වයන්ට අනුකූල වන පරිදි සංශෝධනය කර නොමැත. මෙම ගාස්තු සහ බදු සංශෝධන අදාළ රේඛීය අමාත්‍යාංශවල විෂය පථය යටතට ඇතුළත් වන බැවින්, පළාත්බද මට්ටමින් ආදායම් එක්රැස් කිරීම ඉහළ නැංවීම සඳහා එවැනි ගාස්තු සහ බදු අනුපාතික සංශෝධනය කිරීමට මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදී.

පළාත් සභාවල අයවැය කටයුතු

පළාත් සභාවල බදු සහ බදු නොවන ආදායම් යන දෙකම ඉහළ යෑමත් සමඟ, පළාත් සභාවල ආදායම් රැස් කිරීමේ ධනාත්මක වර්ධනය 2022 වසරේ දී ද පිළිබිඹු විය. ඒ අනුව, පළාත් සභාවල සමස්ත ආදායම පෙර වසරට සාපේක්ෂව, 2022 වසරේ දී, නාමික වශයෙන්, සියයට 15.4කින් ඉහළ ගියේය. මුද්දර බදු ආදායම පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 41.2 සිට 2022 වසරේ දී රුපියල් බිලියන 45.1ක් දක්වා සියයට 9.4කින් ඉහළ යෑම හේතුවෙන්, බදු ආදායම 2022 වසරේ දී සියයට

6.11 සංඛ්‍යා සටහන

පළාත් සභාවල අයවැය තත්ත්වය

රුපියල් මිලියන

ශීර්ෂය	2019	2020	2021 (අ)	2022 (ආ)
මුළු ආදායම	**91,344**	**52,245**	**63,942**	**73,793**
බදු ආදායම	81,499	43,096	55,165	59,894
බදු නොවන ආදායම	9,845	9,149	8,777	13,899
මුළු වියදම	**310,124**	**337,006**	**382,248**	**392,512**
පුනරාවර්තන වියදම්	286,884	289,667	323,762	382,792
එයින් වැටුප් හා වේතන	219,698	228,561	252,582	300,073
ප්‍රාග්ධන වියදම්	23,240	47,339	58,486	9,720
මධ්‍යම රජයේ පැවරුම්	**218,780**	**284,761**	**318,306**	**318,719**
සාමූහික ප්‍රදාන	199,968	265,593	284,602	298,737
උපමාන පාදක ප්‍රදාන	2,205	1,752	2,559	745
පළාත් විශේෂිත සංවර්ධන ප්‍රදාන	11,376	11,004	12,632	5,102
විශේෂ යෝජනා ක්‍රම සඳහා විදේශීය ප්‍රදාන	5,230	6,412	18,513	14,135

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

9 උප රාජ්‍ය ආයතන, පළාත් සභා 9කින් සහ මහ නගර සභා 24ක්, නගර සභා 41ක් හා ප්‍රාදේශීය සභා 276ක් ඇතුළත් පළාත් පාලන ආයතන 341කින් සමන්විත විය.

8.6කින් ඉහළ ගියේය. පළාත් සභාවල ප්‍රධාන ආදායම් මූලාශ්‍රයක් ලෙස අඛණ්ඩව පවතින මුද්දර බද්ද පළාත් සභාවල මුළු බදු ආදායමට දැක්වූ දායකත්වය, 2021 වසරේ දී වාර්තා වූ සියයට 74.7ට සාපේක්ෂව, 2022 වසරේ දී සියයට 75.3ක් විය. මේ අතර, පෙර වසරේ දී රුපියල් බිලියන 2.2ක් ලෙස වාර්තා වූ පොලී ආදායම, ලාභ හා ලාභාංශ යනාදියෙන් රැස් කරගත් ආදායම 2022 වසරේ දී රුපියල් බිලියන 6.5ක් දක්වා ඉහළ යෑම මූලිකව හේතුකරගෙන, 2022 වසරේ දී බදු නොවන ආදායම සියයට 58.4කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, පළාත් සභාවල සමස්ත ආදායම් රැස් කිරීම සඳහා බස්නාහිර පළාත් සභාවෙහි දායකත්වය, 2021 වසරේ වාර්තා වූ සියයට 52.1 සිට 2022 වසරේ දී සියයට 54.2ක් දක්වා ඉහළ ගියේය. අනෙකුත් පළාත් සභා අතර, වයඹ සහ දකුණු පළාත් සභා සමස්ත ආදායමෙන්, පිළිවෙළින්, සියයට 9.6කට සහ 9.3කට දායක විය.

රජයේ වියදම් තාර්කීකරණ ක්‍රියාමාර්ගවලට අනුකූලව, ප්‍රාග්ධන වියදම් සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන්, පළාත් සභාවල සමස්ත වියදම්වල වර්ධනය පෙර වසරට සාපේක්ෂව, 2022 වසරේ දී සියයට 2.7ක පහළ අගයකට වැටුණි. 2022 වසරේ දී පළාත් සභාවල සමස්ත පුනරාවර්තන වියදම් සඳහා සියයට 78.4ක් වැනි වැඩිම දායකත්වයක් දක්වන ලද වැටුප් සහ වේතන වියදම ඉහළ යෑම පිළිබිඹු කරමින්, පුනරාවර්තන වියදම් සියයට 18.2කින් ඉහළ ගියේය. මේ අතර, පළාත් සභාවල වැටුප් සහ වේතනවලින් සියයට 87.5ක් අධ්‍යාපන සහ සෞඛ්‍ය අංශ සඳහා වැය කෙරුණි. වසර තුළ දී, පළාත් සභාවල සමස්ත පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් ගත කළ, බස්නාහිර, මධ්‍යම සහ දකුණු පළාත් සභා වැඩිම වියදම් වාර්තා කළ අතර, එය පළාත් සභාවල සමස්ත පුනරාවර්තන වියදමෙන්, පිළිවෙළින්, සියයට 21.7ක්, සියයට 12.9ක් සහ සියයට 12.7ක් විය. අත්‍යවශ්‍ය නොවන සහ හදිසි නොවන ප්‍රාග්ධන වියදම් සීමා කිරීම මගින් වියදම් අවම කිරීම සඳහා රජය කැපවීමත් සමඟ, පළාත් සභාවල ප්‍රාග්ධන වියදම් පෙර වසරට වඩා මෙම වසර තුළ දී, සියයට 83.4කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය.

මධ්‍යම රජය විසින් පළාත් සභා වෙත ලබා දුන් පැවරුම්, පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 318.7ක් දක්වා සියයට 0.1කින් සුළු වශයෙන් ඉහළ ගියේය. වසර තුළ දී, සාමූහික ප්‍රදානවල පමණක් වර්ධනය වීමක් නිරීක්ෂණය වූ අතර, අනෙකුත් සියලුම වර්ගවල ප්‍රදාන අඩු විය. ඒ අනුව, සමස්ත පැවරුම්වලින් සියයට 93.7ක් නියෝජනය කරන, පළාත් සභා වෙත ලබා දුන් සාමූහික ප්‍රදාන 2022 වසරේ දී සියයට 5.0කින් ඉහළ ගියේය. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින්, උපමාන පාදක ප්‍රදාන, පළාත විශේෂිත සංවර්ධන ප්‍රදාන සහ විශේෂ ව්‍යාපෘති සඳහා වන ප්‍රදාන යටතේ සිදු කරන ලද පැවරුම්, වසර තුළ දී, පිළිවෙලින්, සියයට 70.9කින්, සියයට 59.6කින් සහ සියයට 23.6කින් පහළ ගියේය. මේ අතර, 2021 වසරේ ද.දේ.නි.යෙන් සියයට 1.8ක් වූ මධ්‍යම රජයේ පැවරුම්, 2022 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 1.4ක් දක්වා පහත වැටුණි. තවද, සමස්ත වියදම්වල ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජය විසින් පළාත් සභා වෙත කරන ලද පැවරුම් පෙර වසරේ දී වාර්තා වූ සියයට 83.3ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 81.2ක් දක්වා පහළ ගියේය.

6

7

මුදල් ප්‍රතිපත්තිය, පොලී අනුපාතික, මුදල් සහ ණය

7.1 සමස්ත නිරීක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුව 2022 වසරේදී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ඉතා දැඩි කළ අතර එසේ මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම හරහා අධික ලෙස ඉහළ යන මිල පීඩන සහ අඛණ්ඩව වැඩි වන උද්ධමනය මැඩපැවැත්වීම මෙන්ම උද්ධමන අපේක්ෂා පාලනය කිරීම සහ යටිදැරි ඉල්ලුම් පීඩන වැළැක්වීම අරමුණු විය. නිදහසින් පසු ආර්ථිකය මුහුණ දුන් දරුණුතම ගෙවුම් ශේෂ අර්බුදය මධ්‍යයේ විදේශීය අංශයේ පැවති පෙර නොවූ අන්දමේ අවදානම් සමනය කිරීමට සහ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ අවිනිශ්චිතතා වර්ධනය වීම මධ්‍යයේ රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සම්බන්ධයෙන් පවතින අවදානම් ඉහළ යෑම හේතුවෙන් පොලී අනුපාතික ව්‍යුහයෙහි සිදු වන විෂමතා අවම කිරීම සඳහා එලෙස මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම අවශ්‍ය විය. දේශීය සැපයුම් අංශයේ බාධා, ගෝලීය බනිජ තෙල් හා වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හා සමගාමීව දිගු කාලයක් ප්‍රමාදව පැවති පරිපාලිත මිල ගණන් සංශෝධන සහ එමගින් අනෙකුත් අංශවලට ඇති වූ බලපෑම්, ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීමේ බලපෑම වේගයෙන් ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වීම සහ කොවිඩ්-19 වසංගත කාලය තුළ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ පසු බලපෑම ඇතුළු සාධක රාශියක් හේතුවෙන් මෙම වසර තුළදී මිල පීඩන ඉහළ ගියේය. දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ බලපෑම පිළිබිඹු කරමින් දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව හිඟ තත්ත්වයක පැවති අතර ණය සහ තැන්පතු පොලී අනුපාතික ඉහළ යෑම මගින් මුදල් සහ ණය ප්‍රසාරණය සීමා විය. දැඩි මුදල් ප්‍රතිපත්තිය ශීඝ්‍රයෙන් වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම, ඉහළ ද්‍රවශීලතා හිඟය සහ අවදානම් ඉහළ යෑම පිළිබිඹු කරමින් විශේෂයෙන් වෙළඳපොළ ණය සහ තැන්පතු පොලී අනුපාතික මාස කිහිපයක් තුළ සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මීට ප්‍රතිචාර වශයෙන්, පෞද්ගලික අංශය විසින් ලබා ගත් ණය ප්‍රසාරණයට සැලකිය යුතු ලෙස බලපෑමක් සිදු කරමින් 2022 ජූනි මාසයේ සිට මාසිකව ණය සංකෝචනය අඛණ්ඩව සිදු වූ අතර එමගින් පුළුල් මුදල් සැපයුම සහ ණය ප්‍රසාරණය විශාල ලෙස මන්දගාමී විය. දැඩි මුදල් තත්ත්වයේ බලපෑම සහ ගෙවුම් ශේෂ පීඩන අඩු වීමත් සමඟ සැපයුම් අංශයේ ඇති වූ වර්ධනයන් 2022 වසරේ අවසාන කාලයේදී මිල පීඩන පාලනය කිරීමට උපකාරී විය. මතුපිට උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේදී උපරිම අගයක් දක්වා ඉහළ ගිය අතර එතැන් සිට ස්ථාවර නිර්-උද්ධමන මාවතක ගමන් කරමින් පවතී. කෙසේ වෙතත්, විදේශීය ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවන බවට 2022 අප්‍රේල් මාසයේදී ප්‍රකාශයට පත් කිරීමෙන් පසු විදේශීය මූල්‍යන සඳහා ප්‍රවේශය සීමා වීම සහ රජයේ ආදායම පහළ යෑම මධ්‍යයේ බැංකු පද්ධතිය මගින් රජය වෙත ලබා දුන් ණය ප්‍රමාණය වසර තුළදී සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවතුණි. රජයේ ණය ගැනීමේ අවශ්‍යතාව අඛණ්ඩව ඉහළ යෑම මෙන්ම දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳව පැවති අවිනිශ්චිතතා හේතුවෙන් වසර තුළදී රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික විශාල ලෙස වැඩි වී ඉහළ මට්ටම්වල පැවතිය ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම සඳහා වූ වැඩසටහන පිළිබඳ සාකච්ඡා අවසන් අදියරේ පැවතීම මත

වෙළඳපොළ අපේක්ෂා වර්ධනය වෙමින් පැවතීමත් සමඟ 2022 වසරේ අවසාන කාලයේදී රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතිකවල යම් අඩු වීමක් දක්නට ලැබුණි. මේ අතර, රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ඉහළ යෑමත් සමඟ අධික ලෙස ඉහළ ගිය වෙළඳපොළ පොලී අනුපාතික පහළ දැමීමේ අවශ්‍යතාවය අවධාරණය කරමින් සිදු කරන ලද මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනයට සමගාමීව වෙළඳපොළ තැන්පතු පොලී අනුපාතික මෙන්ම කෙටි කාලීන වෙළඳපොළ ණය පොලී අනුපාතික ද ක්‍රමයෙන් පහළ යෑම ආරම්භ විය. තවද, දිගු කාලීන පදනම මත ද්‍රවශීලතාව ලබා දෙමින් මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතා පීඩන අඩු කිරීමට මහ බැංකුව පියවර ගත් අතර මහ බැංකුවේ නිත්‍ය පහසුකම් මත වාණිජ බැංකු අධික ලෙස රඳා පැවතීම ද අඩු කළේය. එමගින් මෙතෙක් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමීමේ ප්‍රමාණයට අසමානුපාතිකව අධික ලෙස ඉහළ ගිය පොලී අනුපාතික ව්‍යුහය ක්‍රමයෙන් පහළ යෑම සඳහා පහසුකම් සැලසුණි. මේ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි සම්පූර්ණ කිරීමට නියමිත අවසාන 'පූර්ව ක්‍රියාමාර්ගය' සපුරාලීම සඳහා මහ බැංකුව 2023 මාර්තු මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීය. මෙමගින් ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ වෙළඳපොළ පොලී අනුපාතික අතර පරතරය තවදුරටත් අඩු කිරීමට උපකාරී විය. ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල මෙම වැඩි වීම හමුවේ වුවද 2022 වසරේ අවසාන කාලයේ සිට මහ බැංකුව විසින් සපයන ලද වෙළඳපොළ මාර්ගෝපදේශයන්ට අනුකූලව වෙළඳපොළ පොලී අනුපාතික අඩු වීමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතිණි. මුදල් ප්‍රතිපත්ති සහ අනෙකුත් ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් මතුපිට උද්ධමනය 2023 වසරේ අග භාගය වන විට තනි අගයක මට්ටමට ළඟා වී මැදි කාලීනව ඉලක්කගත මට්ටමේ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම, උද්ධමනය පහළ යෑම සහ දේශීය ණය ප්‍රශස්තකරණය සඳහා විකල්පයන් පිළිබඳ වඩාත් පැහැදිලි දැනුම්වත් වීමක් ලැබීමෙන් පසු සහ එහි ප්‍රතිඵලයක් ලෙස රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සම්බන්ධයෙන් වන ඉහළ අවදානම් අඩු වීමේ සහායයෙන් වෙළඳපොළ පොලී අනුපාතිකවල මෙතෙක් දක්නට ලද පහළ යෑම ඉදිරි කාල සීමාව තුළදී අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙමගින් මුදල් තත්ත්වයන්හි පවතින සැලකිය යුතු දැඩි බව ලිහිල් කිරීමට මෙන්ම පෞද්ගලික අංශයට ලබා දෙන ණය ක්‍රමානුකූලව ඉහළ නැංවීමට උපකාරී වනු ඇත. මේ අතර, ඉදිරියේදී බලාත්මක කිරීමට නියමිත මහ බැංකු නීති පනත හරහා රාජ්‍ය මූල්‍ය බලපෑම් අවම වීම මගින් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී වඩාත් හිතකර තත්ත්වයක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

7.2 මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය

උද්ධමන පීඩන වැළැක්වීමට සහ උද්ධමන අපේක්ෂා ඉහළ යෑමට ඇති හැකියාව සැලකිල්ලට ගනිමින් 2021 අගෝස්තු මාසයේ සිට ආරම්භ වූ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය 2022 වසරේදීත් මහ බැංකුව අඛණ්ඩව පවත්වාගෙන ගියේය. විදේශීය හා රාජ්‍ය මූල්‍ය අංශයේ අසමතුලිතතා මධ්‍යයේ උද්ධමනය සැලකිය යුතු ලෙස ඉහළ යෑම සහ ප්‍රතිපත්ති පොලී අනුපාතික හා වෙළඳපොළ පොලී අනුපාතික අතර පැවති විශාල විෂමතාව සැලකිල්ලට ගනිමින් මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම ආරම්භ වූ 2021 අගෝස්තු මාසයේ සිට 2022 වසර අවසානය වන විට මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික, එනම් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය ප්‍රතිශතාංක 10කින් ඉහළ නැංවූ අතර එම ඉහළ නැංවීමෙන් වැඩි ප්‍රමාණයක් එනම් ප්‍රතිශතාංක 7කින් ඉහළ නැංවීම 2022 අප්‍රේල් මාසයේදී සිදු කළේය. 2020 මුල් කාලයේ කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීම ආරම්භයේ සිට අඛණ්ඩව ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් පවත්වා ගැනීම සහ 2022 මාර්තු මාසයේදී එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල විශාල වශයෙන් අවප්‍රමාණය වීමේ ප්‍රතිඵලයක් ලෙස උද්ධමන ඉදිරි දැක්ම කෙරෙහි පැවති අහිතකර අවදානම් හේතුවෙන් මහ බැංකුවට ප්‍රතිපත්ති පොලී අනුපාතික 2022 අප්‍රේල් මාසයේදී ප්‍රතිශතාංක 7කින් සහ 2022 ජූලි මාසයේදී තවත් පදනම් අංක 100කින් ඉහළ නැංවීමට සිදු විය. ඉල්ලුම හේතුවෙන් ඇති වූ උද්ධමන පීඩන ඉහළ යෑම පාලනය කිරීමට සහ අහිතකර උද්ධමන අපේක්ෂා ඇති වීම වැළැක්වීමට මෙන්ම විදේශීය අංශයේ පීඩන ලිහිල් කිරීම සහ පොලී අනුපාතික ව්‍යුහයේ නිරීක්ෂණය වූ විෂමතා නිවැරදි කිරීමට එවැනි මුදල් තත්ත්වයන් දැඩි කිරීම් උපකාරී විය. මීට අමතරව, තෝරාගත් ණය උපකරණ මත මෙන්ම විදේශ විනිමය තැන්පතු සඳහා පනවා තිබූ උපරිම පොලී අනුපාතික සීමා ඉවත් කරන ලද අතර ඒ හරහා මුදල් තත්ත්වයන් දැඩි කිරීම සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස්වීම් කාර්යක්ෂම ලෙස වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම සඳහා අවකාශ සැලසීය. දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට සහාය දැක්වීම සඳහා 2022 වසර තුළදී දේශීය මුදල් වෙළඳපොළෙහි එක් දින ද්‍රවශීලතාව සෘණ මට්ටම්වල පවත්වාගෙන ගිය

රූප සටහන 7.1
මුදල් අංශයේ ප්‍රවණතා

ශ්‍රී ලංකා මහ බැංකුව මිල ස්ථායීතාවය යථා තත්ත්වයට පත් කිරීමේ අරමුණින් ක්‍රියාමාර්ග ගණනාවක් ගනු ලැබිය



පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය වර්ධනය අඛණ්ඩව පහළ ගියේය



7.1 සංඛ්‍යා සටහන

මෑත කාලීන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

දිනය	ක්‍රියාමාර්ගය
2020 ජනවාරි 30	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් ඒකක 50කින්, පිළිවෙළින්, 6.50% සහ 7.50% දක්වා අඩු කරන ලදී.
2020 මාර්තු 17	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් ඒකක 25කින්, පිළිවෙළින්, 6.25% සහ 7.25% දක්වා අඩු කරන ලදී.
2020 මාර්තු 17	2020 මාර්තු මස 16 වැනි දින සිට ආරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 1.00කින් 4.00% දක්වා අඩු කරන ලදී.
2020 මාර්තු 27	කොවිඩ්-19 මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාරවලට සහාය වීම සඳහා 4.00% පොලී අනුපාතිකයක් යටතේ රුපියල් බිලියන 50ක් දක්වා වූ සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම (ප්‍රතිමූලික යෝජනා ක්‍රමය - පළමු අදියර) හඳුන්වාදෙන ලදී.
2020 අප්‍රේල් 03	2020 අප්‍රේල් මස 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් ඒකක 25කින්, පිළිවෙළින්, 6.00% සහ 7.00% දක්වා අඩු කරන ලදී.
2020 මැයි 06	2020 මැයි මස 06 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් ඒකක 50කින්, පිළිවෙළින්, 5.50% සහ 6.50% දක්වා අඩු කරන ලදී.
2020 ජූනි 16	2020 ජූනි මස 16 වැනි දින සිට ආරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2.00කින් 2.00% දක්වා අඩු කරන ලදී.
2020 ජූනි 16	කොවිඩ්-19 මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාරවලට සහාය වීම සඳහා 4.00% පොලී අනුපාතිකයක් යටතේ 2020 මාර්තු 27 දින හඳුන්වා දුන් සහනදායී ණය පහසුකම රුපියල් බිලියන 150ක් දක්වා ඉහළ නංවන ලදී (සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම - දෙවන අදියර).
2020 ජූලි 09	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් ඒකක 100කින්, පිළිවෙළින්, 4.50% සහ 5.50% දක්වා අඩු කරන ලදී.
2021 අගෝස්තු 19	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් ඒකක 50කින්, පිළිවෙළින්, 5.00% සහ 6.00% දක්වා වැඩි කරන ලදී.
2021 අගෝස්තු 19	2021 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ආරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2.00කින් 4.00% දක්වා වැඩි කරන ලදී.
2022 ජනවාරි 20	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් ඒකක 50කින්, පිළිවෙළින්, 5.50% සහ 6.50% දක්වා වැඩි කරන ලදී.
2022 මාර්තු 04	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් ඒකක 100කින්, පිළිවෙළින්, 6.50% සහ 7.50% දක්වා වැඩි කරන ලදී.
2022 මාර්තු 07	විනිමය අනුපාතිකයෙහි ක්‍රමානුකූල ගැලපීමක් සඳහා ඉඩ හරින ලදී.
2022 අප්‍රේල් 08	2022 අප්‍රේල් මස 08 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් ඒකක 700කින්, පිළිවෙළින්, 13.50% සහ 14.50% දක්වා වැඩි කරන ලදී.
2022 මැයි 12	විදේශ විනිමය වෙළඳපොළ විධිමත්ව හැසිරීම පහසු කිරීම සහ විනිමය අනුපාතිකයෙහි දෛනිකව සිදුවන අනිසි උච්ඡාවචන කළමනාකරණය කිරීම සඳහා 2022 මැයි මස 13 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළ ගනුදෙනු සඳහා අදාළ වන එ.ස. ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් විවෘත ආන්තිකයක් ද සමඟ දිනපතා ප්‍රකාශයට පත් කිරීමට නියමිත එ.ස. ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් මධ්‍ය විනිමය අනුපාතිකයක් හඳුන්වාදීම.
2022 ජූලි 07	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් ඒකක 100කින්, පිළිවෙළින්, 14.50% සහ 15.50% දක්වා වැඩි කරන ලදී.
2023 ජනවාරි 02	2023 ජනවාරි මස 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සඳහා නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගැනීම දින දර්ශින මසකට උපරිම අවස්ථා පහක් (05) දක්වා සීමා කරන ලදී. මීට අමතරව, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සඳහා නිත්‍ය ණය පහසුකම ලබා ගැනීම අදාළ දිනකදී එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයෙන් සියයට 90ක් දක්වා සීමා කෙරිණි.
2023 මාර්තු 03	2023 මාර්තු මස 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් ඒකක 100කින්, පිළිවෙළින්, 15.50% සහ 16.50% දක්වා වැඩි කරන ලදී.
2023 මාර්තු 03	2023 මාර්තු මස 07 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එ.ස. ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් මධ්‍ය විනිමය අනුපාතිකය සහ විවෘත ආන්තිකය නිවේදනය කිරීම හරහා වෙළඳපොළ මාර්ගෝපදේශ නිකුත් කිරීම නතර කරන ලදී.

සටහන: මහ බැංකුව විසින් පහත පරිදි පොලී අනුපාතික මත උපරිම සීමා පනවන ලදී/ සංශෝධනය කරන ලදී.

- 2020.04.27: බලපත්‍රලාභී බැංකුවල උකස් පහසුකම් මත උපරිම පොලී අනුපාතික සීමා පනවන ලදී.
- 2020.08.24: බලපත්‍රලාභී බැංකුවල තෝරා ගත් ණය උපකරණ මත පනවා තිබූ උපරිම පොලී අනුපාතික සීමා තවදුරටත් අඩු කරන ලදී.
- 2020.11.26: බලපත්‍රලාභී බැංකුවල දේපළ ඇපකර සහිත නිවාස ණය සඳහා උපරිම පොලී අනුපාතික සීමා පනවන ලදී.
- 2021.08.24: බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ විනිමය තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික මත උපරිම සීමා පනවන ලදී.
- 2021.12.30: බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ විනිමය තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික මත පැනවූ උපරිම සීමා සංශෝධනය කරන ලදී (දින 364 භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික හා සම්බන්ධ කරන ලදී)
- 2021.12.31: බලපත්‍රලාභී බැංකුවල දේපළ ඇපකර සහිත නිවාස ණය මත පැනවූ උපරිම පොලී අනුපාතික සීමා සංශෝධනය කරන ලදී (මරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය හා සම්බන්ධ කරන ලදී).
- 2022.03.04: බලපත්‍රලාභී බැංකුවල තෝරාගත් ණය උපකරණ මත පැනවූ උපරිම පොලී අනුපාතික සීමා වැඩි කරන ලදී.
- 2022.03.11: බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ විනිමය තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික මත පැනවූ උපරිම පොලී අනුපාතික සීමා ඉවත් කරන ලදී.
- 2022.04.21: බලපත්‍රලාභී බැංකුවල තොරාගත් ණය උපකරණ මත පැනවූ උපරිම පොලී අනුපාතික සීමා ඉවත් කරන ලදී.

බැංකු අනුපාතිකය මුදල් ප්‍රතිපත්ති උපකරණ ලැයිස්තුවෙන් ඉවත් කළ අතර එය මහ බැංකුව අවසාන ණය දෙන්නා ලෙස බැංකු හා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට සහාය වීමට භාවිත කරන ප්‍රතිපත්ති උපකරණයක් ලෙස සලකනු ලබයි (2023.03.01 සිට බලපැවැත්වෙන පරිදි).

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අතර මුදල් වෙළඳපොළෙහි මෙහෙයුම් සඳහා අවශ්‍ය ද්‍රවශීලතාව නිත්‍ය ණය පහසුකම හරහා ලබා දෙන ලදී. ප්‍රධාන වශයෙන් අත්‍යවශ්‍ය ආනයන සහ රජයේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් සඳහා පහසුකම් සැලසීමේදී මහ බැංකුව විසින් සිදු කරන ලද විදේශ විනිමය ගනුදෙනුවල බලපෑම හේතුවෙන් 2022 වසරේ මැද භාගයේදී දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතාව සැලකිය යුතු ලෙස සෘණ අගයක් විය. කෙසේ වෙතත්, රජයේ මුදල් ප්‍රවාහ අවශ්‍යතා සඳහා සහාය දැක්වීමට මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළඳපොළ වෙතින් මිලදී ගැනීම සහ ඉහළ තැන්පතු පොලී අනුපාතික හමුවේ බැංකු පද්ධතිය වෙත මුදල් ආපසු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස විශාල සෘණ ද්‍රවශීලතා මට්ටමෙහි ක්‍රමානුකූල අඩු වීමක් ඉන් පසුව දක්නට ලැබුණි. ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම සහ ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ අවිනිශ්චිතතා මධ්‍යයේ රජයේ සුරැකුම්පත් සම්බන්ධයෙන් පවතින අවදානම් ඉහළ යෑම හේතුවෙන් 2022 වසරේ නොවැම්බර් මාසය වන තෙක් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. දැඩි මුදල් තත්ත්ව වේගයෙන් වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම පිළිබිඹු කරමින් වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර බොහෝ අනුපාතික ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම මට්ටම් වාර්තා කළේය. කෙසේ වෙතත්, වෙළඳපොළ පොලී අනුපාතික හා සැසඳීමේදී රජයේ සුරැකුම්පත් සම්බන්ධයෙන් පවතින ඉහළ අවදානම්වල බලපෑම හේතුවෙන් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීමට සමානුපාතික නොවන ලෙස අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ ගියේය. මේ හේතුවෙන් මහ බැංකුව ශිෂ්ට ප්‍රයෝග ක්‍රියාත්මක කරමින් 2022 නොවැම්බර් මාසයේ සිට අධික ණය සහ තැන්පතු පොලී අනුපාතික අඩු කරන ලෙස බැංකුවලින් ඉල්ලා සිටියේය. ප්‍රතිපත්ති පොලී අනුපාතිකවලට වඩා ඉහළ මට්ටමක පවත්වා ගෙන ගිය වෙළඳපොළ පොලී අනුපාතික අඩු කිරීමේ අවශ්‍යතාව පිළිබඳව මහ බැංකුව විසින් කිහිපවරක් සිදු කරන ලද ඉල්ලීම්වලට අනුකූලව 2022 වසර අවසාන කාලයේදී වෙළඳපොළ පොලී අනුපාතිකවල යම් පහළ යෑමක් දක්නට ලැබුණ ද එම පොලී අනුපාතික 2022 වසර තුළදී ඉහළ මට්ටම්වල පැවතුණි. පෙර නොවූ අන්දමේ ආර්ථික අර්බුද මධ්‍යයේ දැඩි මුදල් තත්ත්ව සහ සමස්ත ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම පිළිබිඹු කරමින් බැංකු පද්ධතිය විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය අබණ්ඩව පහළ ගියේය. මේ අතර, මෙතෙක් වාර්තා වූ වැඩිම ණය සංකෝචනය පිළිබිඹු කරමින්

7.2 රූප සටහන
ප්‍රධාන ප්‍රතිපත්ති උපකරණවල සහ මෙහෙයුම් ඉලක්කයේ හැසිරීම (අ)



(අ) අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ අක්‍රියව පැවති දින සඳහා ඵලිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයන් වාර්තා නොවේ.

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

2022 ජූනි මාසයේ සිට 2023 පෙබරවාරි මාසය දක්වා කාලය තුළදී පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය මාසිකව සංකෝචනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, පෞද්ගලික අංශයට ලබා දුන් ණය වර්ධනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2022 වසර අවසානය වන විට සියයට 6.2ක් දක්වා අඩු වූ අතර 2020 ජූලි මාසයෙන් පසු අඩුම වර්ධනය වාර්තා කරමින් 2023 පෙබරවාරි මස අවසානය වන විට එය සියයට 3.0ක් දක්වා තවදුරටත් මන්දගාමී විය. කෙසේ වෙතත්, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ බලපෑම යම් ප්‍රමාණයකට පිළිබිඹු කරමින් බැංකු පද්ධතිය වෙතින් රජය සතු වාණිජ ව්‍යාපාර ලබා ගත් ණය 2022 වසර තුළදී ඉහළ ගියේය. තවද, රජයට ලබා දුන් විශාල මූල්‍යන මධ්‍යයේ මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන 2022 වසර තුළදී බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ද ඉහළ ගියේය. පහළ යමින් පවතින විදේශීය මූල්‍යන සහ රාජ්‍ය ආදායම් හිඟය මධ්‍යයේ රජයේ මුදල් ප්‍රවාහය මත වන පීඩනය ලිහිල් කිරීම සඳහා තාවකාලික පියවරක් ලෙස එවැනි මූල්‍යන රජයට ලබා දීමට මහ බැංකුවට සිදු විය. මහ බැංකුව විසින් රජයට ලබා දුන් එම මූල්‍යනයෙන් වැඩි කොටසක් බහුපාර්ශ්වික ණය දෙන ආයතනවල විදේශ විනිමය ණය සේවාකරණයට අවශ්‍ය විදේශ විනිමය මිලදී ගැනීම සඳහා නැවත මහ බැංකුව වෙත ලබා දෙන ලදී. කෙසේ වෙතත්, යෝජිත මහ බැංකු පනත යටතේ මහ බැංකුවෙන් රජයට මූල්‍යන ලබා දීම සීමා වනු ඇති අතර එමගින් ඉදිරි කාලය තුළදී මුදල් ප්‍රතිපත්ති ස්වාධීනත්වය ශක්තිමත් කරනු ඇත. මේ අතර, යටිදැරි උද්ධමනය සහ උද්ධමන අපේක්ෂා අවශ්‍ය පරිදි පාලනය කිරීම සහතික කිරීම සඳහා මහ බැංකුව 2023 වසරේ මේ දක්වා කාලය තුළදී සිය දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වාගනු ලැබීය. කෙසේ වෙතත්, දිගු කාලයක් පුරා දේශීය මුදල් වෙළඳපොළ තුළ පැවති විශාල ද්‍රවශීලතා හිඟය හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික මත වූ ඉහළ පීඩනය පාලනය කිරීම සඳහා මහ බැංකුව විවට වෙළඳපොළ කටයුතු හරහා දිගු කාලීන පදනමක් මත ද්‍රවශීලතාව ලබා දුන්නේය. තවද, ද්‍රවශීලතාව විශාල වශයෙන් අසමමිතික ලෙස ව්‍යාප්ත වී පැවතීම හේතුවෙන් බාධා වූ දේශීය මුදල් වෙළඳපොළෙහි කටයුතු ඉහළ නැංවීම සඳහා 2023 ජනවාරි මස මැද සිට බලපැවැත්වෙන පරිදි මහ බැංකුවේ නිත්‍ය පහසුකම් සඳහා වන ප්‍රවේශය සීමා කරමින් මහ බැංකුව විසින් නියාමන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලද අතර එමගින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිත්‍ය පහසුකම් මත අධික ලෙස රඳා පැවතීම අඩු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, දේශීය මුදල් වෙළඳපොළෙහි එක් දින ද්‍රවශීලතාව ඉහළ ගිය අතර අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ සහ ප්‍රතිමිලදී ගැනීමේ වෙළඳපොළ ක්‍රියාකාරකම් වර්ධනය විය. මෙම ප්‍රවණතා සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම සඳහා වූ වැඩසටහන පිළිබඳ සාකච්ඡා අවසන් අදියරේ පැවතීම මත ආයෝජක අපේක්ෂා වර්ධනය වීම හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සහ අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික ක්‍රමයෙන් පහළ යෑම ආරම්භ වූ අතර එමගින් මුදල් තත්ත්වයන් යම් ප්‍රමාණයකට ලිහිල් කරමින් වෙළඳපොළ පොලී අනුපාතික අක්‍රමවත් ලෙස ඉහළ යෑම අඩු විය. මේ අතර, මහ බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩලයේ උද්ධමන පුරෝකථනවල ඇතැම් වෙනස්කම් මධ්‍යයේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ පිළිබඳව අවසන් එකඟතාවයකට පැමිණීම සඳහා සියලු 'පූර්ව ක්‍රියාමාර්ග' සපුරාලීම සහ ඉදිරි කටයුතු සිදු කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් මූලික සාකච්ඡාවලදී තීරණය කළ ප්‍රමාණයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු අගයකින් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම සඳහා 2023 වසරේ මාර්තු මාසය ආරම්භයේදී එකඟතාවයකට එළැඹුණි. ඒ අනුව, 2023 මාර්තු 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසානයේ සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100කින් ඉහළ නංවන ලදී. මෙමගින් ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ ඉහළ වෙළඳපොළ පොලී අනුපාතික අතර පරතරය තවදුරටත් අඩු කිරීමට උපකාරී වූ අතර,

ඉදිරි කාලය තුළදී රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රමෝපාය සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ලැබීමත් සමඟ වෙළඳපොළ පොලී අනුපාතික පහළ යෑම අඛණ්ඩව සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එලෙස පොලී අනුපාතික ව්‍යුහය පහළ යෑම මගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට අතිශය අභියෝගාත්මක ආර්ථික තත්ත්ව යටතේ සිය ව්‍යාපාර අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා පැවති පෙර නොවූ අන්දමේ පීඩන ලිහිල් කිරීමට උපකාරී වනු ඇති අතර ආර්ථික ක්‍රියාකාරකම් දැනටමත් පහළ මට්ටමක පවතින බැවින් උද්ධමන පීඩන ඉහළ නැංවිය හැකි මට්ටමේ මුදල් තත්ත්ව ලිහිල් කිරීමක් අපේක්ෂා නොකෙරේ.

ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම උද්ධමන මට්ටම් මධ්‍යයේ මිල ස්ථායීතාව යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන මහ බැංකුවේ කැපවීම යළිත් අවධාරණය කරමින් 2022 වසරේ මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන උපායමාර්ගය වසර පුරා අඛණ්ඩව පවත්වාගෙන ගිය දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සමඟ අනුගත විය. ඉහළ උද්ධමනයක් පවතින කාලයකදී, විශේෂයෙන්ම ආර්ථික කටයුතු පිළිබඳ මහජන විශ්වාසය නොමැති අවස්ථාවක මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය අතිශයින් අභියෝගාත්මක විය. ඇති විය හැකි අධි උද්ධමනය, දිගු කාලීන ආර්ථික අර්බුදය ආදිය පිළිබඳ කරුණු දක්වමින් උද්ධමනයේ සහ පොලී අනුපාතික දිශානතිය පිළිබඳ ඇතැම් විචාරකයින් විසින් සිදු කරන ලද අදූරදර්ශී සහ සාවද්‍ය ප්‍රකාශ මගින් මහජනතාව ව්‍යාකුලත්වයට පත් විය. 2022 අප්‍රේල් මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමත් සමඟ එලෙස පොලී අනුපාතික ඉහළ නැංවීමේ අවශ්‍යතාවය පිළිබඳව මහජනතාව දැනුම්වත් කරමින් අයහපත් විය හැකි උද්ධමන අපේක්ෂා පාලනය කිරීම සඳහා කාර්යක්ෂම මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනයක් අවශ්‍ය විය. මහජනතාවට නිරන්තරයෙන් සහ පැහැදිලි ලෙස මුදල් ප්‍රතිපත්තිය සන්නිවේදනය කිරීමේ වැදගත්කම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ පැවති අවිනිශ්චිතතා හේතුවෙන් රජයේ සුරකුම්පත් මත ඵලදා අනුපාතික ඇතුළු වෙළඳපොළ පොලී අනුපාතික අධික ලෙස ඉහළ යෑම වැනි කරුණු මගින් පිළිබිඹු වේ. සිය සන්නිවේදන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී මහ බැංකුව සාම්ප්‍රදායික ක්‍රමවේද මෙන්ම සමාජ මාධ්‍ය සහ ඩිජිටල් ක්‍රම ද අඛණ්ඩව භාවිතා කළේය. උද්ධමන ඉදිරි දැක්ම පිළිබඳ අවදානම් සහ අවිනිශ්චිතතා මධ්‍යයේ මුදල් ප්‍රතිපත්ති මාධ්‍ය නිවේදන හරහා නිසි පරිදි ප්‍රතිපත්ති සන්නිවේදනය අඛණ්ඩව සිදු කරන ලද අතර උද්ධමන ව්‍යාප්ති සටහන ප්‍රකාශයට පත් කිරීම මෙම වසර තුළදී නැවත ආරම්භ කරන ලදී. මෙම මුදල් ප්‍රතිපත්ති නිවේදන සමඟ මාධ්‍ය සාකච්ඡා ද පවත්වන ලද අතර එම සාකච්ඡා සමාජ මාධ්‍ය හරහා පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත සජීවීව විකාශනය කරන ලදී. උද්ධමන අපේක්ෂා පාලනය කිරීම සඳහා උද්ධමන ප්‍රවණතා පිළිබඳ මාසික මාධ්‍ය නිවේදන තුළද උද්ධමන ව්‍යාප්ති සටහන ප්‍රකාශයට පත් කිරීම මහ බැංකුව ආරම්භ කළේය. මීට අමතරව, මහ බැංකු අධිපතිවරයා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විවිධ සම්මුඛ සාකච්ඡා, සමුළු, සම්මන්ත්‍රණ, ආරාධිත දේශන සහ මංගත සම්මන්ත්‍රණ සඳහා සහභාගී වූ අතර එමගින් ප්‍රතිපත්ති සන්නිවේදනය ඉහළ නැංවීමට සහ ප්‍රතිපත්තිමය අරමුණු පිළිබඳ සාවද්‍ය වැටහීම් නිවැරදි කිරීමට උත්සාහ කළේය. මහ බැංකු වාර්ෂික වාර්තාව සහ මෑත කාලීන ආර්ථික ප්‍රවණතා ඇතුළු මහ බැංකුවේ නිත්‍ය ප්‍රකාශන, භාෂා ත්‍රිත්වයෙන්ම නියමිත කාලයට ප්‍රකාශයට පත් කරන ලද අතර සැප්තැම්බර් 15 වැනි දින වාර්තාව සහ මුදල් නීති පනතේ 64 සහ 68 වගන්ති යටතේ වාර්තා කිහිපයක් රජය වෙත ඉදිරිපත් කිරීමෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීමට මහ බැංකුව රජයට සහාය විය. ඉදිරි කාලයේදී බලාත්මක කිරීමට නියමිත නව මහ බැංකු පනතට අනුව සිය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට මහ බැංකුව පියවර ගනු ඇති අතර වසරකට දෙවතාවක් මුදල් ප්‍රතිපත්ති වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම ආරම්භ වනු ඇත.

7.3 උද්ධමනයේ ප්‍රවණතා

2022 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළදී මතුපිට උද්ධමනය ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම අගය දක්වා විශාල ලෙස ඉහළ ගිය අතර ඉන් පසුව පහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය. මතුපිට උද්ධමනය පෙර නොවූ අන්දමින් ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් ආහාර මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හා සැපයුම් අංශයේ අවහිරතා, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම සහ ඉන් පසුව බලශක්ති සහ ප්‍රවාහන මිල ගණන් වැනි පරිපාලිත මිල ගණන් වෙනස්වීම හා එමගින් අනෙකුත් අංශවලට ඇති කළ බලපෑම් මෙන්ම පසුගිය වසර කිහිපය තුළදී මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ පසු බලපෑම හේතුවෙන් සමස්ත ඉල්ලුම් පීඩන ඉහළ යෑම හේතු විය. කොළඹ පාරිභෝගික

7.3 රූප සටහන
කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)



(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 පෙබරවාරි මාසයේ සිට කොා.පා.මි.ද. නව පදනම් වර්ෂය වන 2021=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලද අතර පැරණි පදනම් වර්ෂය වන 2013=100 යටතේ කොා.පා.මි.ද. ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී. ඒ අනුව 2023 ජනවාරි මාසයේ සිට රූප සටහනේ දක්වා ඇති දත්ත නව පදනම් වර්ෂය වන 2021=100 මත පදනම් වේ.

මූලයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

7.4 රූප සටහන
ජාතික පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)



(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 ජනවාරි මාසයේ සිට ජා.පා.මි.ද. නව පදනම් වර්ෂය වන 2021=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලද අතර පැරණි පදනම් වර්ෂය වන 2013=100 යටතේ ජා.පා.මි.ද. ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී. ඒ අනුව 2023 ජනවාරි මාසයේ සිට රූප සටහනේ දක්වා ඇති දත්ත නව පදනම් වර්ෂය වන 2021=100 මත පදනම් වේ.

මූලයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මිල දර්ශකයේ (කොා.පා.මි.ද., 2013=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන පරිදි ප්‍රවාහන අංශයේ උද්ධමනය 2022 වසරේ දෙවන භාගයේ සියයට 100කට වැඩි අගයක් වාර්තා කරමින් 2022 සැප්තැම්බර් මාසයේදී සියයට 150.4ක උපරිමයක් දක්වා ඉහළ ගිය අතර එම මාසයේදී ආහාර උද්ධමනය ද සියයට 94.9ක උපරිමයක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම තුළින් ඇති වූ පසු බලපෑම් හේතුවෙන් සමස්ත ඉල්ලුම් පීඩන අඩු වීම මෙන්ම ආහාර සහ බලශක්ති උද්ධමනය පහළ යෑම හේතුවෙන් 2022 වසරේ අවසාන කාලයේ සිට මතුපිට උද්ධමනය පහළ ගියේය. ඒ අනුව, කොා.පා.මි.ද. (2013=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2021 වසර අවසානයේදී පැවති සියයට 12.1 සිට 2022 සැප්තැම්බර් මාසයේදී සියයට 69.8ක් දක්වා ඉහළ ගොස් 2022 වසර අවසානය වන විට සියයට 57.2ක් දක්වා පහළ ගියේය. කොා.පා.මි.ද. (2013=100) මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2021 වසරේදී පැවති සියයට 6.0 සිට 2022 වසරේදී සියයට 46.4ක් දක්වා ඉහළ ගියේය. ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය ද මීට සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කරමින් 2021 වසර අවසානයේ පැවති සියයට 14.0ට සාපේක්ෂව 2022 සැප්තැම්බර් මාසයේදී සියයට 73.7ක උපරිමයක් දක්වා ඉහළ ගොස් 2022 වසර අවසානය වන විට සියයට 59.2ක් දක්වා පහළ ගියේය. ජා.පා.මි.ද. (2013=100) මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2021 වසරේදී පැවති සියයට 7.0ට සාපේක්ෂව 2022 වසරේදී සියයට 50.4ක් ලෙස වාර්තා විය. 2022 ඔක්තෝබර් මාසයේ සිට ආරම්භ වූ උද්ධමනය පහළ යෑම 2023 වසරේ මුල් කාලයේදී ද අඛණ්ඩව පැවතුණි. වෙනස් වන වියදම් රටාවන් සහ වෙළඳපොළෙහි පවතින භාණ්ඩ හා සේවා වෙනස්වීම් සලකා බැලීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කොා.පා.මි.ද. සහ ජා.පා.මි.ද. යන දර්ශකවල පදනම් වර්ෂය 2013 සිට 2021 දක්වා සංශෝධනය කරන ලදී. කෙසේ වෙතත්, පදනම් වර්ෂයේ සංශෝධනයක් සිදු වුවද මෙම දර්ශක ද්විත්වයෙන්ම මනිනු ලබන උද්ධමනය පහළ යෑමේ ප්‍රවණතාව සමස්තයක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. ඒ අනුව, කොා.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2023 පෙබරවාරි මාසයේදී සියයට 50.6ක් දක්වා අඩු වූ අතර ජා.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2023 පෙබරවාරි මාසයේදී සියයට 53.6ක අගයක් වාර්තා කළේය.

යටිදැරි ඉල්ලුම් පීඩන පිළිබිඹු කරමින් මූලික උද්ධමනය ද 2022 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළදී ඉහළ ගිය අතර ඉන් පසුව මතුපිට උද්ධමනයට සාපේක්ෂව අඩු වේගයකින් පහළ ගියේය. මූලික උද්ධමනය ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් පසුගිය කාලයේ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ පසු බලපෑම හේතුවෙන් ඇති වූ ඉල්ලුම ඉහළ යෑම, ආනයනික භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම මෙන්ම ආපනශාලා සහ හෝටල්, සෞඛ්‍යය, අධ්‍යාපනය වැනි ආහාර නොවන කාණ්ඩවල පිරිවැය ඉහළ යෑම හේතු විය. කොා.පා.මි.ද. සහ ජා.පා.මි.ද. යන දර්ශක දෙක මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේදී උපරිම මට්ටම් දක්වා ඉහළ ගොස් ඉන් පසුව පහළ ගියේය. නිතර මිල උච්චාවචන සහිත ආහාර සහ බලශක්ති අයිතමයන්ගේ මිල ගණන් පහළ යෑම මතුපිට උද්ධමනය පහළ යෑම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑ අතර එම අයිතමයන් මූලික උද්ධමනය මැනීමේදී ඇතුළත් නොවීම හේතුවෙන් මතුපිට උද්ධමනයට සාපේක්ෂව මූලික උද්ධමනය අඩු වේගයකින් පහළ ගියේය. මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඉල්ලුම අඩු වීම මූලික උද්ධමනය පහළ යෑම සඳහා බලපෑ ප්‍රධාන සාධකය විය. කොා.පා.මි.ද. (2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2021 වසර අවසානයේ පැවති සියයට 8.3 සිට 2022 සැප්තැම්බර් මාසයේදී සියයට 50.2ක් දක්වා ඉහළ ගොස් 2022 වසර අවසානය වන විට සියයට 47.7ක් දක්වා පහළ ගියේය. කොා.පා.මි.ද. (2013=100) මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2021 වසරේදී වාර්තා වූ සියයට 4.4ට සාපේක්ෂව 2022 වසරේදී සියයට 34.6ක් විය. ජා.පා.මි.ද. (2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය ද 2021 වසර අවසානයේ පැවති සියයට 10.8 සිට 2022 සැප්තැම්බර් මාසයේදී සියයට 64.1ක් දක්වා ඉහළ ගිය අතර 2022 වසර අවසානය වන විට සියයට 57.5ක් දක්වා පහළ ගියේය. ජා.පා.මි.ද. (2013=100) මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2021 වසරේදී පැවති සියයට 5.5ට සාපේක්ෂව 2022 වසරේදී සියයට 43.9ක් ලෙස වාර්තා විය. මතුපිට උද්ධමනයට සමාන අන්දමින් මූලික උද්ධමනය ද 2023 වසරේ මුල් කාලය තුළදී අඛණ්ඩව පහළ ගිය අතර කොා.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2023 පෙබරවාරි මාසයේදී සියයට 43.6ක් දක්වා පහළ ගියේය. ජා.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2023 පෙබරවාරි මාසයේදී සියයට 50.1ක් දක්වා පහළ ගියේය.

7.5 රූප සටහන
මූලික උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)



(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජා.පා.මි.ද. සහ කොා.පා.මි.ද. නව පදනම් වර්ෂය වන 2021=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම, පිළිවෙළින්, 2023 ජනවාරි සහ පෙබරවාරි මාසවල දත්ත නිකුත් කිරීමේ සිට ආරම්භ කරන ලද අතර පැරණි පදනම් වර්ෂය වන 2013=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම් අත්හිටුවන ලදී. ඒ අනුව, 2023 ජනවාරි මාසයේ සිට රූප සටහනේ දක්වා ඇති දත්ත නව පදනම් වර්ෂය වන 2021=100 මත පදනම් වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

උද්ධමන අපේක්ෂා ඉහළ මට්ටමක පැවතියද සමස්තයක් ලෙස ප්‍රකාශිත උද්ධමනයෙහි ප්‍රවණතාවය අනුගමනය කළේය. බොහෝ දුරට ප්‍රකාශිත උද්ධමනය අනුගමනය කරන ආයතනික සහ කුටුම්භ යන අංශ

7.2 සංඛ්‍යා සටහන
උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය)

සියයට

		2013=100						2021=100	
		දෙසැ.-17	දෙසැ.-18	දෙසැ.-19	දෙසැ.-20	දෙසැ.-21	දෙසැ.-22	ජන.-23	පෙබ.-23
මතුපිට උද්ධමනය	කොා.පා.මි.ද.	**7.1**	**2.8**	**4.8**	**4.2**	**12.1**	**57.2**	**51.7**	**50.6**
	ආහාර උද්ධමනය	14.4	-1.5	6.3	9.2	22.1	64.4	60.0	54.4
	ආහාර නොවන උද්ධමනය	4.2	4.8	4.3	2.0	7.5	53.4	47.9	48.8
	ජා.පා.මි.ද.	**7.3**	**0.4**	**6.2**	**4.6**	**14.0**	**59.2**	**53.2**	**53.6**
	ආහාර උද්ධමනය	12.8	-4.5	8.6	7.5	21.5	59.3	53.6	49.0
	ආහාර නොවන උද්ධමනය	2.9	4.7	4.2	2.2	7.6	59.0	52.9	57.4
මූලික උද්ධමනය	කොා.පා.මි.ද.	**4.3**	**3.1**	**4.8**	**3.5**	**8.3**	**47.7**	**45.6**	**43.6**
	ජා.පා.මි.ද.	**2.7**	**3.1**	**5.2**	**4.7**	**10.8**	**57.5**	**52.0**	**50.1**

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දෙකෙහි නුදුරු කාලීන උද්ධමන අපේක්ෂා 2022 වසරේදී සමස්තයක් ලෙස සමාන අගයන් ගන්නා ලදී. උද්ධමනය පහළ යෑමට අනුකූලව මෑත මාසවලදී සියලුම කාල සීමාවන් සඳහා උද්ධමන අපේක්ෂා පහළ යෑමක් දක්නට ලැබුණි. මහ බැංකුවේ උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයට අනුව ඉදිරි කාලය තුළදී උද්ධමනය පහළ යෑම සඳහා දේශීය සැපයුම් තත්ත්වයන්හි අපේක්ෂිත වර්ධනයන්, ආනයන සීමා ලිහිල් කිරීම, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන්වල අපේක්ෂිත පහළ යෑම, ආදායම් මට්ටම් අඩු වීම සහ දැඩි මුදල් තත්ත්ව හේතු වනු ඇත.

7.4 පොලී අනුපාතිකවල හැසිරීම

වෙළඳපොළ ද්‍රවශීලතාව සහ කෙටි කාලීන පොලී අනුපාතික

2022 වසරේ පළමු භාගය තුළදී දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතාව විශාල හිඟ මට්ටමක පැවති අතර වසර අවසානය වන විට ද්‍රවශීලතාව ක්‍රමයෙන් වර්ධනය විය. 2021 සැප්තැම්බර් මාසයේදී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ නැංවීම හේතුවෙන් සෘණ මට්ටම් දක්වා අඩු වූ දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව, ඉහළ උද්ධමනය මධ්‍යයේ දැඩි මුදල් තත්ත්ව පවත්වා ගැනීමේ අවශ්‍යතාවය පිළිබිඹු කරමින් සෘණ මට්ටම්වල පැවතීමට ඉඩ සලසන ලදී. මුදල් වෙළඳපොළෙහි මෙවැනි විශාල සෘණ ද්‍රවශීලතාවක් සඳහා හේතු වූ අනෙකුත් ප්‍රධාන සාධක අතර අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා පහසුකම් සැලසීමට මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත විදේශ විනිමය විකිණීම, දළ නිල සංචිත යොදා ගනිමින් ශුද්ධ පදනම මත රජයේ විදේශීය ණය ආපසු ගෙවීම්, බැංකු පද්ධතිය වෙතින් මහජනතාව ශුද්ධ පදනම මත මුදල් ආපසු ගැනීම් සහ දේශීය බැංකු සමඟ පැවති ගැනුම්-විකුණුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම් කල්පිරීම යනාදිය විය. 2022 මැයි මාසයේ සිට දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව ක්‍රමයෙන් වර්ධනය වීමට බලපෑ සාධක අතර මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් ප්‍රාථමික වෙළඳපොළ වෙතින් මිලදී ගැනීම, ඉහළ තැන්පතු පොලී අනුපාතික හේතුවෙන් බැංකු පද්ධතිය වෙත වූ ව්‍යවහාර මුදල් තැන්පතු ඉහළ යෑම සහ ඇතැම් බැංකුවල පැවති සැලකිය යුතු ද්‍රවශීලතා හිඟය අවම කිරීම සඳහා දිගු කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීම යනාදිය විය. ඒ අනුව, දේශීය මුදල් වෙළඳපොළ දෛනික ද්‍රවශීලතා හිඟයෙහි සාමාන්‍යය, 2022 වසරේ පළමු භාගය තුළදී වාර්තා වූ රුපියල් බිලියන 531 හා සැසඳීමේදී 2022 වසරේ අවසාන කාර්තුව තුළ රුපියල් බිලියන 279ක් පමණ විය. කෙසේ වෙතත්, මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා ව්‍යාප්තිය විශාල ලෙස අසමමිතිකව පැවතිණි. ඇතැම් දේශීය බැංකු, විශේෂයෙන්ම රජය සතු වාණිජ බැංකු රජය සහ රජය සතු වාණිජ ව්‍යාපාර සමඟ සිදු කළ ගනුදෙනු පිළිබිඹු කරමින් සැලකිය යුතු ද්‍රවශීලතා හිඟයක් වාර්තා කළේය. මේ අතර, විදේශීය බැංකු රජය වෙත ඇති නිරාවරණය සම්බන්ධයෙන් වූ විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ ගැටලු පිළිබිඹු කරමින් විශාල ද්‍රවශීලතා අතිරික්ත පවත්වාගෙන ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, බලපත්‍රලාභී වාණිජ බැංකු කිහිපයක් අන්තර් බැංකු වෙළඳපොළ තුළ ගනුදෙනු සිදු නොකර මහ බැංකුවේ නිත්‍ය පහසුකම් මත අඛණ්ඩව රඳා පැවතුණි. ඒ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකුවල එක් දින ද්‍රවශීලතා හා සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීමේ අදහසින් 2023 ජනවාරි මස මැද සිට බලපැවැත්වෙන පරිදි වාණිජ බැංකු සඳහා නිත්‍ය පහසුකම් භාවිතය සීමා කිරීමට මහ බැංකුව තීරණය කළේය.[1] මෙම නියාමන ක්‍රියාමාර්ගය මෙන්ම මීට සමගාමීව ද්‍රවශීලතා අවශ්‍යතාවය ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ද්‍රවශීලතාව සැපයීමට දිගු කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීම සහ අනෙකුත් ද්‍රවශීලතා පහසුකම් ලබා දීම හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාවයේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණු අතර මාස 16කට පසු 2023 ජනවාරි මස මැද වනවිට ද්‍රවශීලතාව අතිරික්ත මට්ටමක් වාර්තා කළේය. ඉන් පසුව ප්‍රධාන වශයෙන් ද්‍රවශීලතා අතිරික්ත සහිත බැංකු විසින් නිත්‍ය තැන්පතු පහසුකම භාවිත කරන ආකාරය අනුව දේශීය මුදල් වෙළඳපොළෙහි එක් දින ද්‍රවශීලතාව උච්ඡාවචනය විය. මේ අතර, මූලික වශයෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාව වර්ධනය වීම හේතුවෙන් මහ බැංකුව විසින් විදේශ විනිමය සැපයීම පහළ යෑම සහ මහ බැංකුව විසින් විශේෂයෙන්ම 2023 වසරේ මේ දක්වා කාලය තුළදී විදේශ විනිමය ශුද්ධ පදනමින් මිලදී ගැනීම හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළෙහි රුපියල් ද්‍රවශීලතාව සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, 2023 වසරේ පළමු කාර්තුව තුළදී එක් දින ද්‍රවශීලතා හිඟයෙහි සාමාන්‍යය රුපියල් බිලියන 72ක් පමණ දක්වා අඩු විය.

1 2023 ජනවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම (බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සිය අතිරික්ත ද්‍රවශීලතාව තැන්පත් කිරීමට සහ පොලී ආදායමක් උපයා ගැනීම සඳහා වන එක් දින තැන්පතු පහසුකම) දින දර්ශිත මසකට උපරිම අවස්ථා පහක් දක්වා සීමා කරන ලදී. ඒ අතරම, දිනය අවසානයේදී මහ බැංකුව හරහා සිය හිඟ ද්‍රවශීලතා අවශ්‍යතා තවදුරටත් සපුරා ගැනීමට බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා සුරැකුම් මත ලබා දෙන නිත්‍ය ණය පහසුකම ද අදාළ දිනකදී බලපත්‍රලාභී වාණිජ බැංකුවක ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයෙන් සියයට 90ක් දක්වා සීමා කෙරිණි.

දැඩි ද්‍රවශීලතා තත්ත්වයට සහ දැඩි මුදල් ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන යෑමට ප්‍රතිචාර වශයෙන් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව ආසන්නයේ පැවතුණි. 2022 වසර ආරම්භයේදී නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාවට ආසන්නයෙන් පැවති බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය බැංකු පද්ධතියේ අඛණ්ඩව පැවති විශාල ද්‍රවශීලතා හිඟය හේතුවෙන් නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව කරා ළඟා විය. 2022 අප්‍රේල් මාසයේ සිට අන්තර් බැංකු මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් ක්‍රමයෙන් අඩු වීමක් දක්නට ලැබුණු අතර 2022 ජූලි මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීමෙන් පසුව අන්තර් බැංකු මුදල් වෙළඳපොළ බොහෝ දුරට අක්‍රීයව පැවතුණි. අසමමිතික ද්‍රවශීලතා ව්‍යාප්තිය සහ විදේශීය බැංකුවල ආයතනික වශයෙන් පවතින සීමා වැනි විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ ගැටලු මධ්‍යයේ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධයෙන් වූ වෙළඳපොළ අවිනිශ්චිතතා අන්තර් බැංකු වෙළඳපොළෙහි දුර්වල ක්‍රියාකාරකම් සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, දිගු කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි නිතිපතා පැවැත්වීම මෙන්ම නිත්‍ය පහසුකම් භාවිතයට සීමා පැනවීම වැනි මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් අන්තර් බැංකු මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් ක්‍රමයෙන් වර්ධනය වීමක් දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 ජනවාරි මස මැද සිට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාවේ සිට සුළු වශයෙන් පහළ යෑමක් වාර්තා කළේය. ඒ අනුව, 2022 වසරේදී සමස්තයක් ලෙස ප්‍රතිපත්ති පොලී අනුපාතික ප්‍රතිශතාංක 9.50කින් ඉහළ යෑමට ප්‍රතිචාර වශයෙන් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය 2022 වසරේදී ප්‍රතිශතාංක 9.55කින් ඉහළ ගියේය. මේ අතර, 2023 මාර්තු මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100කින් ඉහළ නැංවීමත් සමඟ 2023 මාර්තු 07 වන විට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සියයට 16.46ක් දක්වා ඉහළ ගොස් 2023 මාර්තු මස අවසානය වන විට නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව ආසන්නයෙන් පැවතුණි.

7.6 රූප සටහන
දේශීය මුදල් වෙළඳපොළ රුපියල් ද්‍රවශීලතාව සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (අ)



(අ) අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ අක්‍රියව පැවති දින සඳහා බරිත සාමාන්‍යය ඒක්ෂණ මුදල් අනුපාතිකයන් වාර්තා නොවේ.

මූලයා: ශ්‍රී ලංකා මහ බැංකුව

රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතික

දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධ අවිනිශ්චිතතා සහ රජයේ ඉහළ ණය ගැනීමේ අවශ්‍යතාවය මධ්‍යයේ රජයේ සුරැකුම්පත් සම්බන්ධයෙන් පවතින ඉහළ අවදානම් පිළිබිඹු කරමින් මෙන්ම මිල පීඩන අඛණ්ඩව ඉහළ යෑම පාලනය කිරීම සඳහා මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම හේතුවෙන් 2022 වසරේදී රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. විදේශීය මූල්‍යන සඳහා ප්‍රවේශය සීමා වීම සමඟ දේශීය වෙළඳපොළ මූල්‍යන මත රජය අඛණ්ඩව යොමු වීම සහ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ අවිනිශ්චිතතා ඉහළ යෑම හේතුවෙන් වෙළඳපොළ අපේක්ෂා අයහපත් වූ බැවින් 2022 වසරේදී රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතික අතර විශාල පරතරයක් දක්නට ලැබුණු අතර රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතිකවල හැසිරීම් හා සමගාමීව අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික අඛණ්ඩව ඉහළ ගියේය. 2022 වසරේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික ප්‍රතිශතාංක 9.50කින් ඉහළ නැංවීමට සාපේක්ෂව සියලු කල්පිරීම්වල ප්‍රාථමික වෙළඳපොළ භාණ්ඩාගාර බිල්පත් මත එලදා අනුපාතික වසර තුළදී ඒවායේ උපරිම මට්ටම් දක්වා ප්‍රතිශතාංක 22.30-25.00කින් පමණ සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම සම්බන්ධයෙන් අවසන් එකඟතාවයකට එළඹීමේ අපේක්ෂා සමඟ ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය වූ බැවින් 2022 වසර අවසානයේ සහ 2023 වසර මුල් කාලයේදී රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතික සැලකිය යුතු ලෙස පහළ යෑමක් දක්නට ලැබුණි. නිත්‍ය පහසුකම් මත

7.7 රූප සටහන
භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික (අ)



(අ) ලංසු පිළිගත නොහැකි වීම හෝ අදාළ පරිණත කාලය සඳහා සුරැකුම්පත් නිකුතු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඇතැම් සති සඳහා ඵලදා අනුපාතික වාර්තා නොවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සීමා පැනවීම සහ දිගු කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි හරහා ද්‍රවශීලතාව සැපයීම මෙන්ම අනෙකුත් ද්‍රවශීලතා සැපයීමේ පහසුකම් ඇතුළු මහ බැංකුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්ව වර්ධනය වීම රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික පහළ යෑම සඳහා සහාය විය. ඒ අනුව, දින 364ක කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික 2022 සැප්තැම්බර් මාසය ආරම්භයේදී එහි උපරිමයක් වාර්තා කළ අතර, දින 91 සහ දින 182 කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික 2022 නොවැම්බර් මස මැදදී උපරිම අගයක් වාර්තා කළේය. ඒ අනුව, සියලුම කල්පිරීම්වල භාණ්ඩාගාර බිල්පත් මත ඵලදා අනුපාතික ඒවායේ උපරිම මට්ටම්වල සිට 2023 පෙබරවාරි මස අවසානය වන විට ප්‍රතිශතාංක 2.80-3.90කින් පමණ අඩු විය. සමස්තයක් ලෙස භාණ්ඩාගාර බිල්පත් සඳහා වන වෙළඳපොළ කැමැත්ත නොවෙනස්ව පැවතිය ද දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ අවිනිශ්චිතතා හේතුවෙන් කෙටි පරිණත කාල සහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා වන වෙළඳපොළ කැමැත්ත ඉහළ යෑමක් දක්නට ලැබුණි. කෙසේ වෙතත්, වෙළඳපොළ අපේක්ෂා ඉහළ යෑම හේතුවෙන් 2022 වසර අවසානයේදී සහ 2023 වසර මුල් කාලයේදී සියලුම කල්පිරීම්වල භාණ්ඩාගාර බිල්පත් සඳහා වන කැමැත්ත ක්‍රමානුකූලව වර්ධනය විය. ඒ හා සමාන ප්‍රවණතාවක් අනුගමනය කරමින්, සියලු කල්පිරීම්වල ප්‍රාථමික වෙළඳපොළ භාණ්ඩාගාර බැඳුම්කර මත ඵලදා අනුපාතික 2022 ජනවාරි සිට නොවැම්බර් මස මැද දක්වා කාල සීමාව තුළදී සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර ඉන් පසුව පහළ යෑමක් දක්නට ලැබුණි. භාණ්ඩාගාර බිල්පත් මෙන් නොව ඉහළ ඵලදා අනුපාතිකයක් සහිත දිගු කාලීන භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන වෙළඳපොළ කැමැත්ත වැඩි විය. ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතිකවලට සමගාමීව ද්විතීයික වෙළඳපොළ රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කළ ද ප්‍රාථමික වෙළඳපොළ තුළ නිරීක්ෂණය වූ ප්‍රවණතා අනුගමනය කරමින් රජයේ සුරැකුම්පත් මත ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික ඉන් පසුව අඩු විය.

7.8 රූප සටහන
රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

තැන්පතු සහ ණය පොලී අනුපාතික

මහ බැංකුව විසින් ගනු ලැබූ දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම සහ දේශීය මුදල් වෙළඳපොළෙහි හිඟ ද්‍රවශීලතා තත්ත්වයන් පිළිබිඹු කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පිරිනමනු ලබන තැන්පතු පොලී අනුපාතික 2022 වසරේදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම, රජයේ සුරැකුම්පත් සම්බන්ධයෙන් පවතින අවදානම් වැඩි වීම හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ඉහළ යෑම සහ දේශීය මුදල් වෙළඳපොළෙහි විශාල හිඟ ද්‍රවශීලතාවක් අඛණ්ඩව පැවතීමත් සමඟ පවතින තැන්පතු රඳවා තබා ගැනීමට සහ නව තැන්පතු ප්‍රවර්ධනය කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු අතර තරඟකාරිත්වය ඉහළ යෑම හේතුවෙන් තැන්පතු පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. දේශීය මුදල් වෙළඳපොළෙහි සැලකිය යුතු ද්‍රවශීලතා හිඟයක් පැවතීම මධ්‍යයේ බැංකු විසින් ඉහළ පොලී අනුපාතික සහිත විශේෂයෙන් කෙටි කාලීන පරිණත කාල සඳහා නව තැන්පතු

7.9 රූප සටහන
තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

උපකරණ හඳුන්වා දෙන ලදී. තවද, රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතික විශාල ලෙස ඉහළ යෑම තැන්පතු පොලී අනුපාතික ඉහළ යෑම සඳහා හේතු විය. මෙම ප්‍රවණතාවලට අනුව, බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR)[2] 1991 වසර අවසානයේ සිට මෙතෙක් වාර්තා වූ ඉහළම මට්ටම වාර්තා කරමින් 2022 දෙසැම්බර් මාසය අවසානය වන විට සියයට 14.06ක් විය. බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය ද (AWFDR)[3] මීට සමාන ප්‍රවණතාවක් අනුගමනය කළේය. තවද, බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR)[4] සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR),[5] 2022 නොවැම්බර් මාසයේදී ඉතිහාසයේ මෙතෙක් පැවති ඉහළම මට්ටම් වාර්තා කරමින්, පිළිවෙළින්, සියයට 23.63ක් සහ සියයට 24.05ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, 2022 වසර තුළදී ප්‍රතිපත්ති පොලී අනුපාතික ප්‍රතිශතාංක 9.50කින් වැඩි වීමට සමානුපාතික නොවන ලෙස බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය මගින් ගණනය කරනු ලබන නව තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික 2022 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළදී ප්‍රතිශතාංක 17කින් පමණ ඉහළ ගියේය. 2022 වසරේදී වෙළඳපොළ තැන්පතු පොලී අනුපාතික විශාල ලෙස ඉහළ යෑම සහ එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳපොළ ණය පොලී අනුපාතික කෙරෙහි ඇති වූ බලපෑම සැලකිල්ලට ගනිමින්, විශේෂයෙන්ම 2022 වසර අග භාගයේදී දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව වැඩිදියුණු කිරීමට පියවර ගන්නා අතරම තැන්පතු රැස් කිරීමේ අහිතකර තරගකාරිත්වය ඉවත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව මහ බැංකුව බලපත්‍රලාභී බැංකුවලට අවධාරණය කළේය. ඒ අනුව, 2022 වසර අවසානය වන විට ද්‍රවශීලතා තත්ත්වයන් වර්ධනය වීමේ බලපෑම පිළිබිඹු කරමින්, වෙළඳපොළ තැන්පතු පොලී අනුපාතික පහළ යෑම ආරම්භ විය. තවද, 2023 වසරේ මුල් භාගයේදී අන්තර් බැංකු වෙළඳපොළ සක්‍රීය කිරීම සඳහා මහ බැංකුව විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව වර්ධනය කිරීමට උපකාරී විය. මෙම ක්‍රියාමාර්ග සහ විශේෂයෙන්ම 2023 ජනවාරි මාසයේ සිට රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතික සැලකිය යුතු ලෙස පහළ යෑම හේතුවෙන් තැන්පතු පොලී අනුපාතික පහත වැටීමේ ප්‍රවණතාවය ඉදිරි කාල සීමාව තුළදී අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

දැඩි මුදල් හා ද්‍රවශීලතා තත්ත්වයන්ට ප්‍රතිචාර දක්වමින් 2022 වසර තුළදී වෙළඳපොළ ණය පොලී අනුපාතික ද සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර ඇතැම් ණය පොලී අනුපාතික 2022 වසර අවසානය වන විට පහළ යෑම ආරම්භ විය. මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික පෙර නොවූ අන්දමින් ඉහළ නැංවීම, දේශීය මුදල් වෙළඳපොළෙහි පැවති සැලකිය යුතු ද්‍රවශීලතා හිඟය සහ එමගින් තැන්පතු පොලී අනුපාතික ඉහළ යෑම, ආර්ථික ක්‍රියාකාරකම් සංකෝචනය වීම මධ්‍යයේ ණය අවදානම ඉහළ යෑම සහ රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතික විශාල ලෙස ඉහළ යෑම 2022 වසරේදී වෙළඳපොළ ණය පොලී අනුපාතික ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඇතැම් වෙළඳපොළ ණය පොලී අනුපාතික 2022 වසරේදී මෙතෙක් වාර්තා කළ ඉහළම මට්ටම් වාර්තා කළේය. 2022 වසර අවසානය වන විට බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR)[6] සියයට 18.70ක් දක්වා ප්‍රතිශතාංක 9කින් පමණ 2021 වසර අවසානයට සාපේක්ෂව ඉහළ ගිය අතර බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR)[7] ප්‍රතිශතාංක 17කින් පමණ ඉහළ යමින්

2 බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති සියලුම පොලී උපයන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

3 බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති සියලුම පොලී උපයන කාලීන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

4 බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය, මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවල තැන්පත් කර ඇති සියලුම පොලී උපයන නව රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

5 බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය, මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවල තැන්පත් කර ඇති සියලුම පොලී උපයන නව කාලීන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

6 බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද සියලුම රුපියල් ණය සහ අත්තිකාරම්වලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

7 බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය, මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද නව රුපියල් ණය සහ අත්තිකාරම්වලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

7.3 සංඛ්‍යා සටහන

පොලී අනුපාතිකවල හැසිරීම

වාර්ෂික පොලී අනුපාතිකය සියයට

පොලී අනුපාතිකය	2021 අවසානයට	2022 අවසානයට	ප්‍රතිශතාංක වෙනස
ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික			
නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය	5.00	14.50	9.50
නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය	6.00	15.50	9.50
බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය	5.95	15.50	9.55
රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික			
ප්‍රාථමික වෙළඳපොළ (අ)			
භාණ්ඩාගාර බිල්පත්			
දින 91	8.16	32.64	24.48
දින 182	8.33	32.20	23.87
දින 364	8.24	29.27	21.03
භාණ්ඩාගාර බැඳුම්කර			
වසර 2	9.16(ආ)	33.01(ඇ)	23.85
වසර 3	9.70(ආ)	31.36(ඇ)	21.66
වසර 4	8.55(ආ)	-	-
වසර 5	11.14(ආ)	31.78(ඇ)	20.64
වසර 10	8.86(ආ)	30.86(ඇ)	22.00
ද්විතියික වෙළඳපොළ			
භාණ්ඩාගාර බිල්පත්			
දින 91	7.77	30.75	22.98
දින 182	8.07	29.50	21.43
දින 364	8.22	28.39	20.17
භාණ්ඩාගාර බැඳුම්කර			
වසර 2	8.58	28.19	19.61
වසර 3	9.55	28.32	18.77
වසර 4	10.38	27.60	17.22
වසර 5	10.66	26.78	16.12
වසර 10	11.71	26.18	14.47
තැන්පතු පොලී අනුපාතික			
බලපත්‍රලාභී වාණිජ බැංකු (ඇ)			
ඉතිරිකිරීමේ තැන්පතු	0.05-6.35	0.25-6.00	-
එක් අවුරුදු ස්ථාවර තැන්පතු (ඉ)	0.15-15.00	4.50-30.00	-
බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (ඊ)	4.94	14.06	9.12
බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (ඊ)	5.94	18.49	12.55
බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (ඊ)	6.45	23.07	16.62
බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (ඊ)	6.67	23.73	17.06
අනෙකුත් මූල්‍ය ආයතන (උ)			
ජාතික ඉතිරිකිරීමේ බැංකුව			
ඉතිරිකිරීමේ තැන්පතු	3.50	3.00	-0.50
එක් අවුරුදු ස්ථාවර තැන්පතු	5.50	12.00	6.50
බලපත්‍රලාභී මුදල් සමාගම් (උෆ)			
ඉතිරිකිරීමේ තැන්පතු	3.46-4.69(එ)	4.63-8.03	-
එක් අවුරුදු ස්ථාවර තැන්පතු	9.02-10.13	20.48-27.15	-

වාර්ෂික පොලී අනුපාතිකය සියයට

පොලී අනුපාතිකය	2021 අවසානයට	2022 අවසානයට	ප්‍රතිශතාංක වෙනස
ණය පොලී අනුපාතික			
බලපත්‍රලාභී බැංකු (ඒ)			
බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය	10.49	20.73	10.24
බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය	10.04	26.91	16.87
බලපත්‍රලාභී වාණිජ බැංකු (ඈ)			
බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (මාසික)	8.33	28.19	19.86
බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය	9.87	18.70	8.83
බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය	9.48	26.20	16.72
බලපත්‍රලාභී විශේෂිත බැංකු			
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	7.50-11.50	28.00-32.00	-
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (ඔ)	7.50-12.50	18.00-27.25	-
බලපත්‍රලාභී මූල්‍ය සමාගම් (උෆ)			
මූල්‍ය කුලියකට	12.77-28.33	21.53-35.37	-
කුලිපිට ගැනුම්	11.08-27.00	16.94-38.28	-
නිශ්චල දේපළ මත ලබා දුන් ණය	15.29-16.77(එ)	26.80-28.43	-
විදේශ විනිමය තැන්පතු මත පොලී අනුපාතික (ඕ)			
ඉතිරිකිරීමේ තැන්පතු - එ.ජ.ඩොලර්	0.03-4.60	0.10-7.77	-
ඉතිරිකිරීමේ තැන්පතු - ස්ටර්ලින් පවුම්	0.03-3.00	0.20-4.83	-
කාලීන තැන්පතු - එ.ජ.ඩොලර්	0.02-7.00	0.02-11.50	-
කාලීන තැන්පතු - ස්ටර්ලින් පවුම්	0.02-5.75	0.02-7.00	-
සාංගමික ණය වෙළඳපොළ			
ණයකර	8.00-12.00	15.42-28.00	-
වාණිජ පත්‍රිකා	6.00-12.00	11.00-36.00	-

(අ) ආසන්නතම වෙන්දේසියේදී නිකුත් කළ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික
(ආ) 2021 වසරේදී අවසාන ප්‍රාථමික වෙන්දේසිය
වසර 2 - නොවැ. 11; වසර 3 - දෙසැ. 13; වසර 4 - අගෝ. 30;
වසර 5 - ඔක්. 12; වසර 10 - ජූලි 29
(ඇ) 2022 වසරේදී අවසාන ප්‍රාථමික වෙන්දේසිය
වසර 2 - දෙසැ. 13; වසර 3 - දෙසැ. 29;
වසර 5 - ඔක්. 28; වසර 10 - නොවැ. 11
(ඈ) වාණිජ බැංකු විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.
(ඉ) ඇතැම් වාණිජ බැංකු විසින් සැපයූ විශේෂ පොලී අනුපාතික මෙහි උපරිම පොලී අනුපාතිකය වේ.
(ඊ) රජයේ අනුමැතිය මත ලබා දෙන සියයට 15ක් වූ ජ්‍යේෂ්ඨ පුරවැසි විශේෂ ස්ථාවර තැන්පතු අනුපාතිකයෙහි බලපෑම ඉවත් කිරීම සඳහා 2018 වසරේ ජූලි මස සිට බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය ගණනය කරනු ලබන්නේ අදාළ වෙළඳපොළ පොලී අනුපාතික මිශ්‍රිති. 2018 ජූනි මස සිට බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය ගණනය කිරීම සඳහා මෙම ක්‍රමය භාවිතා වේ.
(උ) තෝරාගත් අනෙකුත් මූල්‍ය ආයතන විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.
(උෆ) පොලී අනුපාතික පරාසයන් බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අදාළ මාසයේදී තැන්පතු ලබා ගැනීම සහ ණය ලබා දීම සඳහා ඉදිරිපත් කරනු ලබන උපරිම සහ අවම සාමාන්‍ය පොලී අනුපාතික මත පදනම් වේ. 2022 වසර සඳහා දත්ත තාවකාලික වේ.
(එ) සංශෝධිත
(ඒ) බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.
(ඔ) නිවාස කටයුතු සඳහා දෙන ලද ණය පමණි.
(ඕ) පොලී අනුපාතික පරාසයන් බලපත්‍රලාභී වාණිජ බැංකු හා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් සපයන ලද උපරිම හා අවම පොලී අනුපාතික මත පදනම් වේ.

මූලයන්: අදාළ මූල්‍ය ආයතන
කොළඹ කොටස් හුවමාරුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2022 වසර අවසානයේදී සියයට 26.20ක් ලෙස ඉතිහාසයේ මෙතෙක් වාර්තා කළ ඉහළම අගය වාර්තා කළේය. මේ අතර, ප්‍රධාන ගනුදෙනුකරුවන් සඳහා ණය ලබා දීමේ අනුපාතිකය වන මාසික බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR),[8] අනෙකුත් ණය පොලී අනුපාතිකවල ඉහළ යෑම් අබිබවා යමින් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතිකවල සිදු වූ විශාල වෙනස්වීම් අනුගමනය කළ අතර 2022 නොවැම්බර් මාසයේදී සියයට 28.25ක උපරිමයක් දක්වා ඉහළ ගියේය. දැඩි මුදල් තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, ණය කාඩ්පත් අත්තිකාරම්, පෙර ගිවිසගෙන ඇති තාවකාලික බැංකු අයිරා සහ උකස් අත්තිකාරම් සඳහා පනවා තිබූ උපරිම පොලී අනුපාතික 2022 අප්‍රේල් මාසයේදී ඉවත් කරන ලද අතර, එමගින් අනෙකුත් වෙළඳපොළ ණය පොලී අනුපාතික වෙනස්වීම්වලට අනුකූලව එම ණය උපකරණ සඳහා අදාළ පොලී අනුපාතික ද ඉහළ යෑමට ඉඩ සලසන ලදී. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය සමීක්ෂණය[9] මගින් මනිනු ලබන පරිදි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් ණය සඳහා වූ පොලී අනුපාතික වැඩි ණය අවදානම් ආන්තිකයක් සහිතව බලපත්‍රලාභී වාණිජ බැංකුවල සමස්ත ණය පොලී අනුපාතික වැඩි වීමේ ප්‍රවණතාව බොහෝ දුරට

8 බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය, සතියක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය ප්‍රධාන ගනුදෙනුකරුවන්ට ලබා දුන් කෙටි කාලීන රුපියල් ණය සහ අත්තිකාරම් සඳහා වන පොලී අනුපාතික මත පදනම් වේ.

9 වාර්ෂික පිරිවැටුම රුපියල් බිලියන 1කට නොවැඩි සහ සේවකයන් 300කට අඩු සංඛ්‍යාවක් සේවා නියුක්ත ව්‍යාපාර, මාසික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය සමීක්ෂණය උදෙසා සලකා බලන ලෙස බැංකුවලින් ඉල්ලා සිටින ලදී.

7.10 රූප සටහන
සුරැකුම් වර්ගය අනුව බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතික (%)



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

අනුගමනය කළේය. ඒ අනුව, 2022 වසර තුළදී බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය (AWSR)[10] සහ බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය (AWNSR),[11] පිළිවෙළින්, ප්‍රතිශතාංක 10කින් සහ ප්‍රතිශතාංක 17කින් පමණ ඉහළ ගියේය. කෙසේ වෙතත්, වෙළඳපොළ ද්‍රවශීලතාව වර්ධනය වීම සහ 2022 වසර අවසානය වන විට රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් ඇතැම් වෙළඳපොළ ණය පොලී අනුපාතික 2022 වසර අවසානය වන විට පහළ යෑමේ සලකුණු පෙන්නුම් කළේය. විශේෂයෙන්ම, 2023 ජනවාරි සිට පෙබරවාරි දක්වා කාලය තුළදී මාසික බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය පදනම් අංක 348කින් අඩු විය. අනෙකුත් වෙළඳපොළ ණය පොලී අනුපාතික ද ඉදිරි කාලය තුළදී පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සෑම වසරක් අවසානයේදීම රජයේ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කරනු ලබන නෛතික පොලී අනුපාතිකය සහ වෙළඳපොළ පොලී අනුපාතිකය,[12] 2022 වසර සඳහා වූ සියයට 7.48 හා සැසඳීමේදී 2023 වසර සඳහා සියයට 16.97ක් ලෙස මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. පවතින වෙළඳපොළ පොලී අනුපාතික පිළිබිඹු කිරීමේ අදහසින්, 2023 වසර සඳහා නෛතික පොලී අනුපාතිකය සහ වෙළඳපොළ පොලී අනුපාතිකය, දෙසැම්බර් මාසයට පෙර මාස හය තුළ (එනම්, 2022 වසරේ ජූනි සිට නොවැම්බර් දක්වා කාලය සඳහා) බලපත්‍රලාභී වාණිජ බැංකුවල මාසික බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකවල සරල සාමාන්‍යය මත පදනම්ව ගණනය කර ඇත.[13]

විදේශ විනිමය තැන්පතු මත වන පොලී අනුපාතික

ගෝලීය මූල්‍ය තත්ත්වයන් දැඩි වීම, රටෙහි ඉහළ අවදානම් ආන්තිකය මෙන්ම දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි සැලකිය යුතු ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ විදේශ විනිමය තැන්පතු රැස් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු අතර තරගය ඉහළ යෑම පිළිබිඹු කරමින් විදේශ විනිමය තැන්පතු මත වන පොලී අනුපාතික 2022 වසරේදී සැලකිය යුතු ලෙස ඉහළ යෑමක් වාර්තා විය. ගෝලීය උද්ධමනය ඉහළ යෑම පාලනය කිරීමට සහ උද්ධමන අපේක්ෂා ඉහළ යෑම වැළැක්වීම සඳහා බොහෝ දියුණු ආර්ථිකයන්හි මහ බැංකු දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ලෝකයේ බොහෝ රටවල මූල්‍ය තත්ත්වයන් දැඩි විය. එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව, යුරෝපීය මහ බැංකුව සහ එංගලන්ත මහ බැංකුව 2022 වසරේදී සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ නංවන ලදී. මේ අතර, සැලකිය යුතු අන්දමේ ගෙවුම් ශේෂ පීඩන මධ්‍යයේ බැංකු තුළ පැවති උග්‍ර විදේශ විනිමය ද්‍රවශීලතා හිඟයට ප්‍රතිචාර වශයෙන් බලපත්‍රලාභී බැංකු විසින් විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු රැස් කිරීම සඳහා ආකර්ෂණීය පොලී අනුපාතික ලබා දෙන ලදී. 2021 අගෝස්තු මාසයේ සිට දැඩි මුදල් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් රුපියල් තැන්පතු උපකරණ සඳහා වූ වෙළඳපොළ පොලී අනුපාතික අඛණ්ඩව ඉහළ යෑමත් සමඟ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් පිරිනමනු ලබන විදේශ විනිමය තැන්පතු පොලී අනුපාතික මත පනවා

10 බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය ගණනය කිරීමේදී, රජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම ඇතුළත් නොවන අතර, බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් සියලුම රුපියල් ණය සහ අත්තිකාරම්වල පොලී අනුපාතික මත පදනම් වේ.

11 බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය ගණනය කිරීමේදී, රජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම ඇතුළත් නොවන අතර, මාසයක් තුළ බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් සියලුම නව රුපියල් ණය සහ අත්තිකාරම්වල පොලී අනුපාතික මත පදනම් වේ.

12 නෛතික පොලී අනුපාතිකය 1990 අංක 06 දරන සිවිල් විධාන සංග්‍රහය (සංශෝධන) පනතේ නිර්වචනය කර ඇති අතර, එය මුදලක් අයකර ගැනීම සම්බන්ධයෙන් වූ ඕනෑම නීතිමය ක්‍රියාමාර්ගයකදී අදාළ වේ. වෙළඳපොළ පොලී අනුපාතිකය, 1990 අංක 2 දරන ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ නිර්වචනය කර ඇති අතර, ණය දෙන ආයතන විසින් වාණිජමය ගනුදෙනුවක් සම්බන්ධයෙන් වූ නීතිමය ක්‍රියාමාර්ගයකදී රුපියල් 150,000කට වඩා වැඩි ණය මුදලක් අයකර ගැනීමේදී, ඒ සඳහා එකඟ වූ පොලී අනුපාතිකයක් නොමැති විටෙක අදාළ වේ.

13 2022 වසරේදී, පවතින ඉහළ පොලී අනුපාතික ව්‍යුහය සැලකිල්ලට ගනිමින් නෛතික පොලී අනුපාතිකය සහ වෙළඳපොළ පොලී අනුපාතිකය ගණනය කිරීමේ ක්‍රමය සංශෝධනය කරන ලදී. ඒ අනුව, 2022 නොවැම්බර් මාසයෙන් අවසන් වන මාස හය තුළ පැවති මාසික බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකයෙහි සරල සාමාන්‍යය මත පදනම්ව 2023 සඳහා වන නෛතික පොලී අනුපාතිකය සහ වෙළඳපොළ පොලී අනුපාතිකය ගණනය කරන ලදී.

තිබූ උපරිම සීමාව 2022 මාර්තු මාසයේදී ඉවත් කරන ලදී. මෙමගින් ගෝලීය මෙන්ම දේශීය වෙළඳපොළ තත්ත්වයන්ට අනුකූලව බලපත්‍රලාභී බැංකුවල විදේශ විනිමය තැන්පතු මත වන පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ යෑමට අවස්ථාව ලබා දුන්නේය. ඒ අනුව, එ.ජ. ඩොලර්වලින් සහ ස්ටර්ලින් පවුම්වලින් පවත්වා ගෙන යනු ලබන දේශීය ඉතිරිකිරීමේ තැන්පතු සහ කාලීන තැන්පතු සඳහා පිරිනමන ලද පොලී අනුපාතික 2021 වසර අවසානයට සාපේක්ෂව 2022 වසර අවසානයේදී ඉහළ ගියේය.

7.5 මුදල් සහ ණය සමස්තවල ප්‍රවණතා

සංචිත මුදල්

සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය මෙන්ම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන තැන්පතු ප්‍රමාණයේ වර්ධනය අඩු වීමත් සමඟ ආර්ථිකයේ මුදල් පදනම වන සංචිත මුදල් 2021 වසරට සාපේක්ෂව විශේෂයෙන්ම 2022 වසර අවසාන කාලයේදී අඩු වර්ධනයක් වාර්තා කළේය. උද්ධමනය ඉහළ යෑමෙන් වියදම් අවශ්‍යතා වැඩි වීම සහ ඇතැම් අත්‍යවශ්‍ය භාණ්ඩවල සැපයුම් හිඟය මධ්‍යයේ අවිනිශ්චිතතා හේතුවෙන් ඉදිරියේදී ඇති විය හැකි අවශ්‍යතා සඳහා මුදල් ළඟ තබා ගැනීමට වැඩි කැමැත්තක් දැක්වීම හමුවේ මහජනතාව ගනුදෙනු සඳහා වන මුදල් ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් 2022 වසරේ මුල් භාගය තුළදී සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතුණි. කෙසේ වෙතත්, 2022 වසර තුළදී මුදල් ප්‍රතිපත්තිය සැලකිය යුතු ලෙස දැඩි කිරීමෙන් පසුව වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ යෑම මධ්‍යයේ ව්‍යවහාර මුදල් ළඟ තබා ගැනීමේ ඉහළ ආවස්ථික පිරිවැය පිළිබිඹු කරමින් 2022 වසර අවසානය වන විට සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වීම ආරම්භ විය. ඒ අනුව, සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය, කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ 2020 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 156.8ක ඉහළ යෑම සහ 2021 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 170.3ක ඉහළ යෑමට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 1,026.6ක් දක්වා වසර තුළදී රුපියල් බිලියන 21.5ක අඩු ප්‍රමාණයකින් ඉහළ ගියේය. මේ අතර, 2022 වසර තුළදී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය නොවෙනස්ව පැවතීමත් සමඟ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන තැන්පතු ප්‍රමාණය වසර තුළදී සුළු වැඩි වීමක් වාර්තා කළේය. බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන තැන්පතු ප්‍රමාණය 2021 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 171.1කින් සැලකිය යුතු ලෙස ඉහළ යෑමට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 322.8ක් දක්වා වසර තුළදී රුපියල් බිලියන 22.1කින් ඉහළ ගියේය. ඒ අනුව, සංචිත මුදල්, 2021 වසර අවසානයේදී වාර්තා වූ සියයට 35.4ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 1,349.4ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.3කින් වර්ධනය විය. 2021 වසරේදී සංචිත මුදල් රුපියල් බිලියන 341.4කින් සැලකිය යුතු ලෙස ඉහළ යෑමට සාපේක්ෂව 2022 වසර තුළදී රුපියල් බිලියන 43.6කින් ඉහළ ගියේය. මේ අතර, නිත්‍ය තැන්පතු පහසුකම සහ නිත්‍ය ණය පහසුකම සඳහා ප්‍රවේශය සීමා කරමින් මහ බැංකුවේ නිත්‍ය පහසුකම් මත බලපත්‍රලාභී වාණිජ බැංකු අධික ලෙස රඳා පැවතීම අවම කිරීම සඳහා මහ බැංකුව විසින් ගෙන ඇති පරිපාලන ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් 2023 ආරම්භයේ සිට සංචිත මුදල් දෛනිකව විශාල වශයෙන් උච්ඡාවචනය වීමක් දක්නට ලැබුණි. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම සඳහා ප්‍රවේශ වීම සීමා කිරීම හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය අතිරික්ත සංචිත අවධිමත් කාල අන්තරයන් මත මහ බැංකුවේ පවත්වා ගෙන යෑම මගින් දෛනික සංචිත මුදල් ශේෂවල උච්ඡාවචන ඇති විය.

මහ බැංකු ශේෂ පත්‍රයේ වත්කම් අනුව සලකා බැලීමේදී 2022 වසර තුළදී සංචිත මුදල් ප්‍රසාරණය සඳහා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් වැඩි වීම මුළුමනින්ම දායක වූ අතර මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් වසර තුළදී සැලකිය යුතු ලෙස අඩු විය. මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය 2021 වසරේදී රුපියල් බිලියන 1,225.2කින් ඉහළ යෑම හා සැසඳීමේදී 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 3,432.5ක් දක්වා රුපියල් බිලියන 1,338.4කින් ඉහළ යෑම මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් වැඩි වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මෙමගින් 2022 වසර තුළදී මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය (ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රතිවිකුණුම්හි ශුද්ධ අගය ගැළපීමෙන් පසු) සැලකිය යුතු ලෙස ඉහළ යෑම පිළිබිඹු වේ. රාජ්‍ය ආදායම අඩු වීම, විදේශීය ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් විදේශීය මූල්‍යන සඳහා රජයේ ප්‍රවේශය සීමා වීම සහ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ අවිනිශ්චිතතා හමුවේ රජයේ සුරැකුම්පත් සඳහා වන වෙළඳපොළ කැමැත්ත

7.11 රූප සටහන
මහ බැංකු ශේෂ පත්‍රයේ සංයුතිය (අ)



(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

අඩු වීම මධ්‍යයේ මහ බැංකු මූල්‍යාන මත රජය අඛණ්ඩව රඳා පැවතීම මත භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළඳපොළෙන් මහ බැංකුව අඛණ්ඩව මිලදී ගැනීම සහ රජය මහ බැංකුව වෙත ඍජු ලෙස භාණ්ඩාගාර බිල්පත් පැවරීම හේතුවෙන් මහ බැංකුව සතු රජයේ සුරකුම්පත් තොගය ඉහළ ගියේය. ඒ අනුව, මහ බැංකුව සතු රජයේ සුරකුම්පත් තොගය (ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රතිවිකුණුම්හි ශුද්ධ අගය ගැළපීමෙන් පසු) 2022 වසර අවසානයේදී රුපියල් බිලියන 3,197.1ක් දක්වා රුපියල් බිලියන 1,251.7කින් ඉහළ ගියේය. මේ අතර, තාවකාලික අත්තිකාරම් ලෙස රජයට ලබා දුන් ණය ද 2022 වසර තුළදී ඉහළ ගිය අතර එය මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ඉහළ යෑමට හේතු විය. කෙසේ වෙතත්, විදේශ විනිමය හුවමාරු ගිවිසුම් හා සම්බන්ධ විදේශ විනිමය අලාභ හේතුවෙන් මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත සපයන ලද ණය පහළ යෑම සහ කොවිඩ්-19 වසංගත කාල සීමාව තුළදී ව්‍යාපාර සහ පුද්ගලයන් වෙත සහාය වීම සඳහා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා ලබා දුන් සහන ණය නැවත පියවීම හේතුවෙන් මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් ඉහළ යෑම පාලනය විය. ඒ අනුව, මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් 2021 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 1,255.4ක ඉහළ යෑම හා සැසඳීමේදී 2022 වසර තුළදී රුපියල් බිලියන 1,270.2කින් ඉහළ ගියේය. මේ අතර, මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් 2022 වසර තුළදී රුපියල් බිලියන 1,226.6කින් සැලකිය යුතු ලෙස සංකෝචනය වූ අතර එය 2021 වසර තුළදී රුපියල් බිලියන 914.0කින් සංකෝචනය වී 2021 අගෝස්තු මාසයේ සිට ශුද්ධ විදේශීය වත්කම් සෘණ අගයක් ගන්නා ලදී. ප්‍රධාන වශයෙන් අත්‍යවශ්‍ය ආනයන සඳහා පහසුකම් සැලසීමට සහ විශේෂයෙන්ම 2022 වසරේ මුල් කාලයේදී රජයේ විදේශීය ණය වගකීම් සපුරාලීම සඳහා දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සැපයීමට මහ බැංකුව සතු විදේශීය වත්කම්වලින් විශාල ප්‍රමාණයක් යොදා ගැනීම හේතුවෙන් 2022 වසරේදී මහ බැංකුවේ විදේශීය වත්කම් ප්‍රමාණය අඩු විය. මහ බැංකුවේ විදේශීය වත්කම්වලට සාපේක්ෂව නොපියවූ විදේශීය වගකීම් ඉහළ මට්ටමක පැවති අතර එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම මත විදේශීය වත්කම් ඉහළ යෑමට වඩා විදේශීය වගකීම් විශාල ලෙස ඉහළ යෑම සිදු විය. එමගින් 2022 වසරේදී මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් ප්‍රමාණය තවදුරටත් අඩු විය. මහ බැංකුව විසින් එළඹෙන ලද විදේශ විනිමය හුවමාරු ගිවිසුම් සඳහා අදාළ වන ණය ගෙවීමේ කාලය දීර්ඝ කිරීම සහ ආසියානු නිෂ්කාශන සංගමය වෙත ගෙවිය යුතු මුදල් කල් දැමීම ද මහ බැංකුවේ විදේශීය වගකීම් ඉහළ යෑම සඳහා හේතු විය. මේ අතර, ශ්‍රී ලංකා රුපියල්වලට අනිවාර්යෙන් පරිවර්තනය කිරීමට යටත් අපනයන ආදායම සහ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවලින් අවශේෂ කොටස බලපත්‍රලාභී බැංකුවලින් මහ බැංකුව මිලදී ගැනීම ඉහළ යෑම හේතුවෙන් 2022 වසර අවසානය වන විට මහ බැංකුවේ විදේශීය වත්කම් ඉහළ යෑමක් නිරීක්ෂණය විය.

පුළුල් මුදල් සැපයුම (M_{2b}) සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වීම සහ සංචිත මුදල් ප්‍රසාරණය අඩු මට්ටමක පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස පුළුල් මුදල් සැපයුම සහ සංචිත මුදල් අතර සම්බන්ධය පෙන්නුම් කරනු ලබන මුදල් ගුණකය 2022 වසර තුළදී ඉහළ ගියේය. ඒ අනුව, 2022 වසර තුළදී සංචිත මුදල් අඩු ප්‍රමාණයකින් ප්‍රසාරණය වීම මධ්‍යයේ රාජ්‍ය අංශයේ ණය ලබාගැනීම් ඉහළ යෑම හා මුදල් ප්‍රමාණ රුපියල්වලින් ගණනය කිරීමේදී ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම නිසා සිදු වූ බලපෑම පිළිබිඹු කරමින් පුළුල් මුදල් සැපයුම (M_{2b}) ප්‍රසාරණය වීම හේතුවෙන් M_{2b} මුදල් සැපයුම මත පදනම් වන මුදල් ගුණකය 2021 වසර අවසානයේදී වාර්තා කළ 8.15 සිට 2022 වසර අවසානය වන විට 9.11ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේදී මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් අඩු වීම සහ මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් ව්‍යවහාර මුදල් හා තැන්පතු අතර අනුපාතය 2021 වසර අවසානයේදී වාර්තා වූ සියයට 8.0 සිට 2022 වසර අවසානය වන විට සියයට 6.4ක් දක්වා අඩු විය.

පුළුල් මුදල් (M_{2b}) සැපයුම සහ දේශීය ණය

රාජ්‍ය අංශය වෙත ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම මෙන්ම විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිසා බැංකු පද්ධතියේ රුපියල්වලින් ගණනය කළ දේශීය ණය ඉහළ යෑම (එනම් විදේශ මුදලින් නාමනය කරන ලද දේශීය ණය ශ්‍රී ලංකා රුපියල්වලින් ගණනය කිරීමේදී විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිසා සිදු වූ ප්‍රසාරණාත්මක බලපෑම) මධ්‍යයේ වුවද පෞද්ගලික අංශයට ලබා දුන් ණය සැලකිය යුතු ලෙස සංකෝචනය වීම හේතුවෙන් 2022 වසරේදී පුළුල් මුදල් සැපයුමෙහි (M_{2b}) වර්ධනය මන්දගාමී විය. දැඩි මුදල් තත්ත්වයන්හි සහායයෙන් 2021 වසරේ මුල් කාලයේ සිට ක්‍රමයෙන් මන්දගාමී වූ පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම මධ්‍යයේ දේශීය ණය රුපියල්වලින් ගණනය කිරීමේදී සිදු වූ ප්‍රසාරණාත්මක බලපෑම හේතුවෙන් 2022 වසරේ මුල් කාලයේදී සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර 2022 අප්‍රේල් මස අවසානය වන විට සියයට 20.0ක උපරිම අගයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, රාජ්‍ය අංශය වෙත විශේෂයෙන්ම බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද මුදල් තත්ත්වයන් විශාල ලෙස ලෙස දැඩි කිරීම මත පෞද්ගලික අංශයට ලබා දුන් ණය සංකෝචනය වීම හේතුවෙන් 2022 මැයි මාසයේ සිට පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය මන්දගාමී වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2022 වසර අවසානය වන විට සියයට 15.4ක් දක්වා මන්දගාමී විය. එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ බලපෑම ඉවත් කළ පසු[14] පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2022 වසර අවසානය වන විට සියයට 7ක් පමණ දක්වා මන්දගාමී වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

පුළුල් මුදල් සැපයුමෙහි (M_{2b}) වගකීම් අංශයට අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකුවල පවත්වාගෙන යනු ලබන මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු ඉහළ යෑම 2022 වසරේදී පුළුල් මුදල් සැපයුම ප්‍රසාරණය වීම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය.

7.12 රූප සටහන
පුළුල් මුදල්වල (M_{2b}) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස සඳහා තුඩු දුන් සාධක (වත්කම් අනුව) (අ)



(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

2021 වසරේදී වාර්තා වූ සියයට 77ක දායකත්වය හා සැසඳීමේදී 2022 වසරේදී පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රසාරණය සඳහා මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු ඉහළ යෑම විශාල වශයෙන් දායක විය. 2022 වසර තුළදී බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු ද සුළු වශයෙන් ඉහළ ගිය අතර ඉහළ වෙළඳපොළ පොළී අනුපාතික මධ්‍යයේ ව්‍යවහාර මුදල් ළඟ තබා ගැනීමේ ඉහළ ආවස්ථික පිරිවැය හේතුවෙන් මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් වසර තුළදී සංකෝචනය විය. මුදල් වෙළඳපොළෙහි හිඟ ද්‍රවශීලතා තත්ත්ව මධ්‍යයේ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පිරිනමනු ලැබූ ඉහළ තැන්පතු පොළී අනුපාතිකවල බලපෑම පිළිබිඹු කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකුවල පවත්වාගෙන යනු ලබන මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු 2021 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 958.8ක ඉහළ යෑමට සාපේක්ෂව 2022 වසරේදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 17.9ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 1,648.6කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, ඉහළ පොළී අනුපාතික සහ ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම මධ්‍යයේ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉල්ලුම් තැන්පතු වර්ධනය 2021 වසර අවසානයේ පැවති සියයට 26.0ට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 5.3ක් දක්වා අඩු විය. 2021 වසර අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 22.4ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් 2022 වසර අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 5.4කින් සංකෝචනය විය.

14 මෙහිදී සියලුම විදේශ මුදලින් නාමනය කරන ලද අගයන් 2022 පෙබරවාරි මස අවසානයේ පැවති විනිමය අනුපාතිකය භාවිත කරමින් රුපියල්වලින් ගණනය කිරීමෙන් මුදල් සැපයුමේ වර්ධනය ඇස්තමේන්තු කර ඇත.

7.4 සංඛ්‍යා සටහන

මුදල් සමස්තවල ප්‍රවණතා

රුපියල් බිලියන

	අයිතමය	2020 අවසානයට	2021 අවසානයට	2022 අවසානයට (ඒ)	වෙනස					
					2020		2021		2022	
					ප්‍රමාණය	%	ප්‍රමාණය	%	ප්‍රමාණය	%
1.	සමස්ත ව්‍යවහාර මුදල් එකතුව	834.8	1,005.1	1,026.6	156.8	23.1	170.3	20.4	21.5	2.1
	1.1 මහජනයා වෙතැති ව්‍යවහාර මුදල්	641.0	784.4	742.0	146.8	29.7	143.4	22.4	-42.4	-5.4
	1.2 වාණිජ බැංකු වෙතැති ව්‍යවහාර මුදල්	193.8	220.6	284.5	10.0	5.5	26.9	13.9	63.9	28.9
2.	මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතු (ආ)	129.6	300.7	322.8	-125.0	-49.1	171.1	132.0	22.1	7.4
3.	මහ බැංකුව වෙතැති රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු (ඇ)	0.03	0.01	0.01						
4.	**සංචිත මුදල් (1 + 2 + 3)**	**964.4**	**1,305.8**	**1,349.4**	**31.8**	**3.4**	**341.4**	**35.4**	**43.6**	**3.3**
5.	වාණිජ බැංකු වෙතැති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු	536.1	675.4	711.6	164.9	44.4	139.3	26.0	36.1	5.3
6.	**පටු මුදල් සැපයුම, M_1 (1.1 + 5)**	**1,177.2**	**1,459.9**	**1,453.6**	**311.7**	**36.0**	**282.7**	**24.0**	**-6.3**	**-0.4**
7.	වාණිජ බැංකු වෙතැති මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු	7,318.6	8,179.0	9,043.5	1,271.4	21.0	860.4	11.8	864.4	10.6
8.	**පුළුල් මුදල් සැපයුම, M_2 (6 + 7)**	**8,495.8**	**9,638.9**	**10,497.1**	**1,583.1**	**22.9**	**1,143.1**	**13.5**	**858.1**	**8.9**
9.	ගැළපුම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු (ඈ)	909.9	1,008.4	1,792.6	198.5	27.9	98.5	10.8	784.2	77.8
10.	**ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම, M_{2b} (8 + 9)**	**9,405.7**	**10,647.3**	**12,289.6**	**1,781.6**	**23.4**	**1,241.6**	**13.2**	**1,642.3**	**15.4**
මුදල් ගුණකය, M_{2b}		**9.75**	**8.15**	**9.11**						
සංසරණ ප්‍රවේගය, M_{2b} (ඉ)		**1.84**	**1.73**	**2.05**						

(ඒ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතු සහ මහ බැංකුව වෙතැති ප්‍රාථමික වෙළඳුන්ගේ තැන්පතු ඇතුළත් වේ.

(ඇ) මහ බැංකුව වෙතැති රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු 2020 වසර අවසානයේදී රුපියල් මිලියන 30.4ක් ලෙස, 2021 වසර අවසානයේදී රුපියල් මිලියන 5.5ක් ලෙස සහ 2022 වසර අවසානයේදී රුපියල් මිලියන 11.6ක් ලෙස පැවතුණි.

(ඈ) අක්වෙරළ බැංකු ඒකකවල නේවාසික තැන්පතු සහ දේශීය බැංකු ඒකකවල විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවලින් දේශීය වගකීම් ලෙස හඳුනාගත් කොටසක් ඇතුළත් වේ.

(ඉ) මුදලේ සංසරණ ප්‍රවේගය පුළුල් මුදල් (M_{2b}) වාර්ෂික සාමාන්‍ය සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පදනම් වර්ෂය වෙනස් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (පදනම් වර්ෂය 2015) මත පදනම්ව ගණනය කර ඇත.

පුළුල් මුදල් සැපයුමෙහි (M_{2b}) වත්කම් අංශය සලකා බැලීමේදී 2021 වසරේදී දක්නට ලැබුණු ප්‍රවණතාව අබණ්ඩව පෙන්නුම් කරමින් මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් අඩු වීම හේතුවෙන් 2022 වසරේදී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් සැලකිය යුතු ලෙස සංකෝචනය වූ අතර බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් වසරේ දෙවන භාගයේදී වර්ධනයක් වාර්තා කළේය. විදේශ විනිමය වත්කම් ඉහළ යෑමට සාපේක්ෂව විදේශ විනිමය වගකීම් සැලකිය යුතු ලෙස වැඩි වීම මෙන්ම විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ බලපෑම හේතුවෙන් මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් 2021 වසරේදී රුපියල් බිලියන 914.0කින් සංකෝචනය වීමට සාපේක්ෂව 2022 වසර තුළදී රුපියල් බිලියන 1,226.6කින් සැලකිය යුතු ලෙස සංකෝචනය විය. කලාපීය රටවල් සමඟ මහ බැංකුව විසින් එළඹෙන ලද විදේශ විනිමය හුවමාරු ගිවිසුම් වෙතින් ලබා ගත් ණය පියවීමේ කාලය දීර්ඝ කිරීම සහ ආසියානු නිෂ්කාශන සංගමය වෙත ගෙවිය යුතු විශාල මුදල් ප්‍රමාණය හේතුවෙන් ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් වෙත ගෙවිය යුතු විදේශ මුදල් ප්‍රමාණය වැඩිවීමත් සමඟ මහ බැංකුවේ විදේශීය වගකීම් ඉහළ ගියේය. ශ්‍රී ලංකා රුපියල්වලට අනිවාර්යෙන් පරිවර්තනය කිරීමට යටත් අපනයන ආදායම සහ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවලින් අවශේෂ කොටස බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් මහ බැංකුව මිලදී ගැනීම හේතුවෙන් මහ බැංකුවේ විදේශීය වත්කම් ඉහළ ගිය ද සැලකිය යුතු ගෙවුම් ශේෂ පීඩන මධ්‍යයේ අත්‍යවශ්‍ය ආනයන සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය විදේශ විනිමය සැපයීමට සහ විශේෂයෙන්ම 2022 වසරේ මුල් කාලයේදී රජයේ විදේශීය ණය සේවා වගකීම් සපුරාලීම සඳහා මෙම වත්කම් යොදා ගන්නා ලදී. කෙසේ වෙතත්, වෙළඳපොළෙහි විදේශ විනිමය ද්‍රවශීලතාව ක්‍රමයෙන් වර්ධනය වීමත් සමඟ දළ නිල සංචිත ඉහළ නංවා ගැනීම සඳහා මහ බැංකුව විසින් විදේශ විනිමය මිලදී ගැනීම හේතුවෙන් මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ නැංවිණි. මේ අතර, අක්වෙරළ බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑමත් සමඟ බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් 2021 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 141.5ක වැඩිවීමට

7.5 සංඛ්‍යා සටහන

සංචිත මුදල් සහ පුළුල් මුදල් (M_{2b}) සැපයුමෙහි වත්කම් අංශය

රුපියල් බිලියන

අයිතමය	2021 අවසානයට	2022 අවසානයට (අ)	වෙනස			
			2021		2022	
			ප්‍රමාණය	%	ප්‍රමාණය	%
සංචිත මුදල්	**1,305.8**	**1,349.4**	**341.4**	**35.4**	**43.6**	**3.3**
මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම්	-387.3	-1,613.9	-914.0	-173.5	-1,226.6	-316.7
මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම්	1,693.1	2,963.2	1,255.4	286.8	1,270.2	75.0
රජයට ලබා දුන් ශුද්ධ ණය	2,094.1	3,432.5	1,225.2	141.0	1,338.4	63.9
වාණිජ බැංකුවලට ලබා දුන් ණය	143.2	-11.5	28.7	25.1	-154.6	-108.0
අනෙකුත් අයිතම (ශුද්ධ) (ආ)	-544.2	-457.8	1.5	0.3	86.4	15.9
පුළුල් මුදල් (M_{2b})	**10,647.3**	**12,289.6**	**1,241.6**	**13.2**	**1,642.3**	**15.4**
ශුද්ධ විදේශීය වත්කම්	-982.0	-1,766.8	-772.5	-368.8	-784.8	-79.9
මුදල් අධිකාරීන් (ඇ)	-387.3	-1,613.9	-914.0	-173.5	-1,226.6	-316.7
වාණිජ බැංකු	-594.7	-153.0	141.5	19.2	441.8	74.3
ශුද්ධ දේශීය වත්කම්	11,629.3	14,056.4	2,014.1	20.9	2,427.2	20.9
දේශීය ණය	14,002.0	16,632.3	2,280.8	19.5	2,630.3	18.8
රජයට ලබා දුන් ශුද්ධ ණය	5,832.4	7,471.1	1,284.4	28.2	1,638.7	28.1
මහ බැංකුව	2,094.1	3,432.5	1,225.2	141.0	1,338.4	63.9
වාණිජ බැංකු	3,738.3	4,038.6	59.2	1.6	300.3	8.0
රාජ්‍ය සංස්ථාවලට/රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය	1,188.1	1,747.0	185.9	18.6	558.9	47.0
පෞද්ගලික අංශයට ලබා දුන් ණය	6,981.4	7,414.1	810.5	13.1	432.7	6.2
අනෙකුත් අයිතම (ශුද්ධ) (ආ)	-2,372.7	-2,575.8	-266.7	-12.7	-203.2	-8.6

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) අනෙකුත් අයිතම වත්කම් සහ අනෙකුත් අයිතම වගකීම් අතර වෙනස මගින් ගණනය කරනු ලැබේ.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් මෙන්ම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරනු ලබන රජයේ රන් පවුම් ගේෂය ද මෙහි අන්තර්ගත වේ.

සාපේක්ෂව 2022 වසරේදී රුපියල් බිලියන 441.8කින් වර්ධනය වූ අතර දේශීය බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් මෙම වසර තුළදී සංකෝචනය විය. ප්‍රධාන වශයෙන් විදේශ බැංකු සමඟ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ඉහළ යෑම සහ අනේවාසිකයන් වෙත ණය දීම මෙන්ම විශේෂයෙන්ම කෙටි කාලීන ණය වගකීම් පියවීම හේතුවෙන් විදේශීය වගකීම් අඩු වීම මත අක්වෙරළ බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් 2022 වසරේදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, විදේශ බැංකු සමඟ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ඉහළ යෑමට සාපේක්ෂව අනේවාසිකයන් සතු තැන්පතු වගකීම් ලෙස විදේශ විනිමය වගකීම් වැඩි වශයෙන් ඉහළ යෑම හේතුවෙන් දේශීය බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් 2022 වසරේදී සංකෝචනය විය.

බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය 2022 වසර තුළදී සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර එය ශුද්ධ දේශීය වත්කම් ප්‍රසාරණයට හේතු විය. 2021 වසරේදී දක්නට ලැබුණු ප්‍රවණතාව අබණ්ඩව පෙන්නුම් කරමින්, රජයේ ආදායම් රැස්කිරීම අපේක්ෂිත මට්ටමට වඩා අඩු වීම සහ විදේශීය මූල්‍යන සඳහා ප්‍රවේශය සීමා වීම මධ්‍යයේ 2022 වසරේදී රජයේ ඉහළ අරමුදල් අවශ්‍යතාව දේශීය බැංකු පද්ධතියෙන් විශේෂයෙන්ම මහ බැංකුවෙන් විශාල වශයෙන් සපුරා ගන්නා ලදී. මෙම කාලය තුළදී බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම මගින් පෞද්ගලික අංශයේ ආයෝජන පහළ යෑම පෙන්නුම් කරයි. බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය 2021 වසරේදී රුපියල් බිලියන 1,284.4කින් ඉහළ යෑමට සාපේක්ෂව 2022 වසර තුළදී රුපියල් බිලියන 1,638.7කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2022 වසරේදී මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 1,338.4කින් ඉහළ ගිය අතර එය බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ඉහළ යෑම සඳහා සියයට 80කට වඩා වැඩි දායකත්වයක් සැපයීය. භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවලදී වෙළඳපොළෙන් සපුරා ගැනීමට නොහැකි වූ හිඟ මුදල් ප්‍රමාණය මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළඳපොළ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම හරහා ලබා දීමට අමතරව මුදල් ප්‍රවාහ හිඟතාව මත රජය විසින් මහ බැංකුව වෙත භාණ්ඩාගාර බිල්පත් සෘජුවම පැවරීම මෙන්ම තාවකාලික අත්තිකාරම් ලබා දීම මගින් මහ බැංකුව විසින් රජය වෙත මූල්‍යන පහසුකම් සපයන ලදී. භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර මෙන්ම ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කිරීම හේතුවෙන් 2022 වසර තුළදී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත

7.13 රූප සටහන
දේශීය ණයෙහි මාසික වෙනස් වීම (අ)



(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ඇ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය ද රුපියල් බිලියන 300කින් පමණ ඉහළ ගියේය. මේ අතර, මෙම වසර තුළදී බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති රජයේ අයිරා ශේෂයන් සැලකිය යුතු ලෙස පහළ ගියේය.

ප්‍රධාන වශයෙන් විදේශ මුදලින් නාමනය කරන ලද ණය රුපියල්වලින් ගණනය කිරීමේදී විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිසා සිදු වූ බලපෑම හේතුවෙන් රජය සතු වාණිජ ව්‍යාපාර බැංකු පද්ධතිය වෙතින් ලබා ගත් ණය 2022 වසරේදී ඉහළ ගිය අතර රජය සතු වාණිජ ව්‍යාපාරවල දුර්වල මූල්‍ය කාර්යසාධනය හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් අඛණ්ඩව ණය ගැනීමට සිදු විය. රජය සතු වාණිජ ව්‍යාපාර බැංකු පද්ධතිය වෙතින් ලබා ගත් ණය 2021 වසරේදී රුපියල් බිලියන 185.9කින් ඉහළ යෑමට සාපේක්ෂව 2022 වසර තුළදී රුපියල් බිලියන 558.9කින් සැලකිය යුතු ලෙස වැඩි වූ අතර ඉන් සියයට 70කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා විදේශ මුදලින් නාමනය කරන ලද ණය රුපියල්වලින් ගණනය කිරීමේදී විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම නිසා ඇති වූ ප්‍රසාරණාත්මක බලපෑම හේතු විය. ඉන්ධන ආනයනයට පහසුකම් සැලසීම සඳහා වූ ඉහළ මූල්‍යන අවශ්‍යතාව පිළිබිඹු කරමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලබා ගත් ණය ප්‍රමාණය 2022 වසර තුළදී රුපියල් බිලියන 477.3කින් ඉහළ ගිය අතර එය රජය සතු වාණිජ ව්‍යාපාර ලබා ගත් සමස්ත ණය ප්‍රමාණය ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් දායක විය. තවද, වසර තුළදී ශ්‍රීලංකන් ගුවන් සමාගම ලබා ගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 36.5කින් ඉහළ ගිය අතර ලංකා විදුලිබල මණ්ඩලය ලබා ගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 31.9කින් ඉහළ ගියේය. මීට අමතරව, සීමාසහිත ලංකා නැව් සංස්ථාව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, නාගරික සංවර්ධන අධිකාරිය සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබා ගත් ණය ප්‍රමාණය ද 2022 වසර තුළදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම, වී අලෙවි මණ්ඩලය සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් 2022 වසරේදී ඒවායේ ණය වගකීම් ශුද්ධ පදනම මත බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නැවත පියවා ඇත. ඒ අනුව, රජය සතු වාණිජ ව්‍යාපාර ලබා ගත් නොපියවූ ණය ප්‍රමාණය 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 1,747.0ක් විය.[15]

දැඩි මුදල් තත්ත්ව සහ ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑමට ප්‍රතිචාර වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් සමස්ත ණය ප්‍රමාණය 2022 වසරේ මැද භාගයේ සිට අඛණ්ඩව සංකෝචනය විය. විදේශ මුදලින් නාමනය කරන ලද ණය රුපියල්වලින් ගණනය කිරීමේදී විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිසා සිදු වූ ප්‍රසාරණාත්මක බලපෑම හේතුවෙන් මෙන්ම පෞද්ගලික අංශය වෙත සපයන ලද ණයෙහි සාමාන්‍ය වර්ධනය ද හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් සමස්ත ණය ප්‍රමාණය 2022 වසරේ මුල් කාලයේදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, මුදල් ප්‍රතිපත්තිය සැලකිය යුතු ලෙස දැඩි කිරීම සහ බැංකු පද්ධතිය තුළ පැවති විශාල හිඟ ද්‍රවශීලතාව පිළිබිඹු කරමින් 2022 අප්‍රේල් මාසයේ සිට වෙළඳපොළ ණය පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ යෑමත් සමඟ 2022 ජූනි මාසයේ සිට මාසික පදනමින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස සංකෝචනය වීම ආරම්භ විය. විශේෂයෙන්ම, 2022 ජූනි සිට දෙසැම්බර් දක්වා කාලය තුළදී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය සමස්තයක් ලෙස රුපියල් බිලියන 340.7කින් සංකෝචනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් වාර්ෂික ණය ප්‍රසාරණය 2021 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 810.5ට සාපේක්ෂව 2022 වසර තුළදී රුපියල් බිලියන 432.7කට සීමා විය. ඒ අනුව, පෞද්ගලික අංශය වෙත සපයන ලද ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021

15 2022 දෙසැම්බර් මාසයේ සිට බලපැවැත්වෙන පරිදි රජයේ ඇපකර යටතේ ලබා ගත් රුපියල් බිලියන 884.1ක ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නොපියවූ විදේශ විනිමය ණය ප්‍රමාණය මධ්‍යම රජයේ ණය ලෙස හුවමාරු කිරීම මෙහි ඇතුළත් නොවේ.

7.14 රූප සටහන
වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය (අ)



(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ඒ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

වසර අවසානයේ වාර්තා වූ සියයට 13.1 සිට 2022 අවසානය වන විට සියයට 6.2ක් දක්වා මන්දගාමී විය. විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමෙන් ඇති වූ බලපෑම ඉවත් කළ පසු[16] පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය පෙර වසරට සාපේක්ෂව 2022 වසරේදී රුපියල් බිලියන 231.1කින් සංකෝචනය වී වසර අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.3ක සංකෝචනය වීමක් වාර්තා කර ඇති බවට ඇස්තමේන්තු කර ඇත.

දැඩි මුදල් තත්ත්ව, ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ආදියෙහි සැලකිය යුතු බලපෑම පිළිබිඹු කරමින්, වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණයට අනුව, ප්‍රධාන ආර්ථික අංශ වෙත සපයන ලද ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2022 වසර තුළදී විශේෂයෙන්ම වසරේ දෙවන භාගය තුළදී සැලකිය යුතු ලෙස පහළ ගියේය. ප්‍රධාන වශයෙන් විදේශ මුදලින් නාමනය කරන ලද ණය රුපියල්වලින් ගණනය කිරීමේදී විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිසා සිදු වූ බලපෑම හේතුවෙන් 2022 වසරේ පළමු භාගය තුළදී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සියලු ප්‍රධාන ආර්ථික අංශ වෙත සපයන ලද සමස්ත ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය ඉහළ ගියේය. විදේශ මුදලින් නාමනය කරන ලද ණය විශාල ප්‍රමාණයක් කර්මාන්ත හා සේවා අංශ සඳහා වන බැවින් කර්මාන්ත හා සේවා අංශ සඳහා වූ ණය වර්ධනය ඉහළ අගයක් විය. කෙසේ වෙතත්, ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම මෙන්ම සැපයුම් හිඟතාව, දැඩි මුදල් තත්ත්ව මධ්‍යයේ වෙළඳපොළ ණය පොලී අනුපාතික විශාල ලෙස ඉහළ යෑම සහ සැලකිය යුතු රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ හේතුවෙන් ණය වර්ධන ප්‍රවණතාව වෙනස් වී 2022 වසර අවසානය වන විට සියලුම ප්‍රධාන ආර්ථික අංශ වෙත සපයන ලද ණය වර්ධනය මන්දගාමී විය. ආර්ථිකයේ එක් එක් අංශ වෙත ලබා දුන් ණය සලකා බැලීමේදී, කර්මාන්ත අංශය වෙත ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 වසර අවසානයේ වූ සියයට 12.6 සිට 2022 වසර අවසානය වන විට සියයට 8.4ක් දක්වා මන්දගාමී විය. කර්මාන්ත අංශය තුළ, ඉදිකිරීම් අමුද්‍රව්‍ය හිඟ වීම සහ යෙදවුම් පිරිවැය ඉහළ යෑම මෙන්ම ඉහළ පොලී අනුපාතික යටතේ ඉල්ලුම අඩු වීම මධ්‍යයේ 2022 වසර තුළදී ඉදිකිරීම් ආශ්‍රිත ක්‍රියාකාරකම් පහළ යෑම පිළිබිඹු කරමින් ඉදිකිරීම් උප අංශය වෙත ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 වසර අවසානයේදී පැවති සියයට 13.1 සිට 2022 වසර අවසානය වන විට සියයට 3.1ක් දක්වා සැලකිය යුතු ලෙස මන්දගාමී විය. ගෝලීය ඉල්ලුම් තත්ත්ව පහළ යෑම සහ සැපයුම් අංශයේ අවහිරතා හේතුවෙන් රෙදිපිළි සහ ඇඟලුම් උප අංශය වෙත ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 වසර අවසානයේදී පැවති සියයට 16.1 සිට 2022 වසර අවසානය වන විට සියයට 7.6ක් දක්වා සැලකිය යුතු ලෙස මන්දගාමී විය. සේවා අංශය වෙත ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය ද 2021 වසර අවසානයේදී පැවති සියයට 16.3 සිට 2022 වසර අවසානය වන විට සියයට 4.2ක් දක්වා මන්දගාමී විය. සේවා අංශය තුළ, වෙළඳාම, ප්‍රවාහනය සහ සන්නිවේදනය සම්බන්ධ දුර්වල ක්‍රියාකාරිත්වය මෙන්ම යෙදවුම් පිරිවැය ඉහළ යෑම පිළිබිඹු කරමින් තොග හා සිල්ලර, ප්‍රවාහන සහ සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ යන

7.15 රූප සටහන
ප්‍රධාන අංශවලට ලබා දුන් පෞද්ගලික අංශයේ ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (%) (අ)



(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ඒ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

16 මෙහිදී සියලුම විදේශ මුදලින් නාමනය කරන ලද ණය 2022 පෙබරවාරි මස අවසානයේ පැවති විනිමය අනුපාතිකය භාවිත කරමින් රුපියල්වලින් ගණනය කිරීමෙන් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය වර්ධනය ඇස්තමේන්තු කර ඇත.

7.6 සංඛ්‍යා සටහන

වාණිජ බැංකු විසින් ලබා දුන් ණය සහ අත්තිකාරම්හි ආංශික වර්ගීකරණය (අ) (ආ)

රුපියල් බිලියන

අංශය	2021 අවසානයට (ඇ)	2022 අවසානයට (ඈ)	2022 දායකත්වය (%)	2022 ප්‍රතිශතාංක වෙනස
කෘෂිකාර්මික සහ ධීවර	**551.7**	**601.7**	**7.7**	**9.1**
එයින්, තේ	101.2	108.2	1.4	6.9
රබර්	41.4	59.1	0.8	42.7
පොල්	33.7	30.0	0.4	-11.0
වී	44.4	38.9	0.5	-12.5
එළවළු, පලතුරු සහ සුළු ආහාර භෝග	30.9	32.2	0.4	4.1
ධීවර	24.0	26.4	0.3	10.0
කර්මාන්ත	**2,860.9**	**3,100.6**	**39.8**	**8.4**
එයින්, ඉදිකිරීම්	1,525.1	1,571.9	20.2	3.1
ආහාර සහ පාන වර්ග	174.7	214.6	2.8	22.8
රෙදිපිළි සහ ඇඟලුම්	273.1	293.8	3.8	7.6
සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ	152.8	144.9	1.9	-5.1
සේවා	**1,996.5**	**2,079.6**	**26.7**	**4.2**
එයින්, තොග සහ සිල්ලර වෙළඳාම	570.2	563.7	7.2	-1.1
සංචාරක ව්‍යාපාරය	288.2	372.8	4.8	29.4
මූල්‍ය සහ ව්‍යාපාරික සේවා	437.2	446.6	5.7	2.2
නාවික, ගුවන් සහ භාණ්ඩ නිෂ්කාශනය	30.3	32.0	0.4	5.9
පෞද්ගලික ණය සහ අත්තිකාරම් (ඉ)	**1,799.8**	**2,013.0**	**25.8**	**11.8**
එයින්, කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ	375.0	368.5	4.7	-1.7
උකස් ණය	302.4	423.4	5.4	40.0
ණය කාඩ්පත්	144.8	149.3	1.9	3.2
එකතුව (ඊ)	**7,208.8**	**7,794.8**	**100.0**	**8.1**

(අ) වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මත පදනම් වේ.
(ආ) ණය සහ අත්තිකාරම්වලට අයිරා සහ වට්ටම් කළ බිල්පත් ඇතුළත් වන අතර එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂ ඇතුළත් නොවේ.
(ඇ) සංශෝධිත
(ඈ) තාවකාලික
(ඉ) 'කර්මාන්ත' යටතේ වර්ගීකරණය කර ඇති 'ඉදිකිරීම්' කාණ්ඩයට අයත්වන පෞද්ගලික නිවාස ණය ඉවත්කර ඇති අතර ආරක්ෂණ ජාල ආශ්‍රිත ණය ක්‍රම මගින් ලබාදෙන ණය ඇතුළත් වේ.
(ඊ) ගණනය කිරීමේ ක්‍රමවේදයන්හි වෙනස්කම් හේතුවෙන්, කාර්තුමය සමීක්ෂණයට අනුව පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත ණය, මුදල් සමීක්ෂණයේ ඇති එම අගයට වඩා වෙනස් වේ.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

උප අංශ වෙත ලබා දුන් ණය 2022 වසර අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, සියයට 1.1කින්, සියයට 27.1කින් සහ සියයට 21.8කින් සංකෝචනය විය. පොලී අනුපාතික ඉහළ යෑම මධ්‍යයේ මූල්‍ය සහ ව්‍යාපාරික සේවා සඳහා ණය ලබා දීම පහළ මට්ටමක පැවතීම ද සේවා අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය අඩු වීමට හේතු විය. කෙසේ වෙතත්, සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ක්‍රමයෙන් වර්ධනය වීම මෙන්ම ණය ආපසු ගෙවීම සඳහා ලබා දෙන සහන කාලය දීර්ඝ කිරීම සහ අනෙකුත් සහනදායී ක්‍රියාමාර්ග පිළිබිඹු කරමින් සංචාරක උප අංශය වෙත ලබා දුන් ණය ප්‍රසාරණය වූ අතර 2022 වසර අවසානය වන විට සියයට 29.4ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. කෘෂිකාර්මික හා ධීවර අංශය සඳහා ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 වසර අවසානය වන විට පැවති සියයට 12.7 හා සැසඳීමේදී 2022 වසර අවසානය වන විට සියයට 9.1ක් දක්වා මන්දගාමී විය. මෙම අංශය තුළ, 2022 වසර තුළදී පොල් සහ වී උප අංශ වෙත ලබා දුන් ණය සංකෝචනය වූ අතර තේ සහ රබර් උප අංශ වෙත ලබා දුන් ණයෙහි යම් වර්ධනයක් දක්නට ලැබුණි. පරිභෝජනය ආශ්‍රිත ණය ඉහළ යෑම පිළිබිඹු කරමින් පෞද්ගලික ණය සහ අත්තිකාරම් ලෙස ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 වසර අවසානයේදී පැවති සියයට 10.3ට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 11.8ක් දක්වා ඉහළ ගියේය. ජීවන වියදම ඉහළ යෑම මධ්‍යයේ මහජනතාව මුහුණ දෙන දුෂ්කරතා පිළිබිඹු කරමින් උකස් ආශ්‍රිත අත්තිකාරම් 2022 වසර තුළදී රුපියල් බිලියන 121.0කින් පමණ ඉහළ ගිය අතර උකස් ආශ්‍රිත අත්තිකාරම්හි 2021 වසරේදී වාර්තා වූ සියයට 21.6ක වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 40.0ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ යටතේ ලබා දුන් ණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2021 වසර අවසානයේදී පැවති සියයට 13.3ක වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 1.7කින් සංකෝචනය විය. ණය කාඩ්පත් අත්තිකාරම් වර්ධනය ද වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2021 වසර අවසානයේදී වූ සියයට 13.3 හා සැසඳීමේදී

7.7 සංඛ්‍යා සටහන

වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් සමස්ත ණය ශේෂයේ පරිණත කාල පිළිබඳ විශ්ලේෂණය (අ) (ආ)

අංශය	පරිණත කාලය	දෙසැම්බර් 2021 (ඇ)		දෙසැම්බර් 2022 (ඈ)	
		දායකත්වය (%)	වර්ධනය (%)	දායකත්වය (%)	වර්ධනය (%)
කෘෂිකාර්මික සහ ධීවර	කෙටි කාලීන	4.6	17.4	4.8	12.0
	මැදි කාලීන	1.6	9.2	1.6	3.0
	දිගු කාලීන	1.4	2.4	1.4	6.5
කර්මාන්ත	කෙටි කාලීන	12.2	19.5	12.4	9.8
	මැදි කාලීන	8.4	10.8	7.9	1.8
	දිගු කාලීන	19.1	9.4	19.5	10.4
සේවා	කෙටි කාලීන	9.3	21.7	9.8	14.1
	මැදි කාලීන	8.8	9.9	7.7	-5.5
	දිගු කාලීන	9.6	17.5	9.2	3.4
පෞද්ගලික ණය සහ අත්තිකාරම්	කෙටි කාලීන	9.8	19.4	11.1	23.2
	මැදි කාලීන	5.0	3.5	5.2	11.4
	දිගු කාලීන	10.2	6.0	9.5	1.2
එකතුව	කෙටි කාලීන	35.9	19.7	38.1	14.8
	මැදි කාලීන	23.9	8.7	22.3	5.1
	දිගු කාලීන	40.2	10.1	39.5	6.3

(අ) වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මත පදනම් වේ.
(ආ) මූලික කල්පිරීම් පදනම් කරගනිමින් ණය වර්ගීකරණය සිදුකර ඇති අතර එය වසරකට වඩා අඩු - කෙටි කාලීන, වසර 1-5 අතර - මැදි කාලීන හා වසර පහකට වඩා වැඩි - දිගු කාලීන වශයෙන් දක්වා ඇත.
(ඇ) සංශෝධිත
(ඈ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2022 වසර අවසානය වන විට සියයට 3.2ක් දක්වා පහළ ගියේය. මේ අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත ණය ශේෂයේ පරිණත කාල පිළිබඳව සැලකීමේදී, 2021 වසරේ අවසානයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියලුම පරිණත කාල සඳහා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ණය ප්‍රසාරණයේ මන්දගාමී වීමක් පෙන්නුම් කළ ද ඉහළ පොලී අනුපාතික වාතාවරණය මධ්‍යයේ අනෙකුත් කාල සීමාවන්ට වඩා කෙටි කාලීන ණය ලබා ගැනීම සඳහා වැඩි වෙළඳපොළ කැමැත්තක් පෙන්නුම් කළේය.

මාසික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය සමීක්ෂණය[17] **මගින් පිළිබිඹු වන පරිදි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය වෙත ලබා දුන් සමස්ත ණය ප්‍රමාණය බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් සමස්ත ණය ප්‍රමාණයෙහි පහළ යෑමට අනුකූලව 2022 වසරේදී සංකෝචනය විය.** බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු මගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය වෙත ලබා දුන් සමස්ත ණය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2021 වසර අවසානයේ පැවති සියයට 21.7ක වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 8.3කින් සංකෝචනය විය. දැඩි මුදල් තත්ත්වයන් මධ්‍යයේ බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය වෙත ලබා දෙන ණය සඳහා වන පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම, සමස්ත ඉල්ලුම් තත්ත්ව පහළ යෑම, ඇතැම් කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීම සීමිත වීම සහ පිරිවැය ඉහළ යෑම, අක්‍රිය ණය හේතුවෙන් ණය අවදානම් ඉහළ යෑම මධ්‍යයේ බලපත්‍රලාභී බැංකු විසින් අනුගමනය කරන ලද ආරක්ෂාකාරී පිළිවෙත සහ ව්‍යාපාර අපේක්ෂා පහළ යෑම ආදී සාධක කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් ණය පහළ යෑම සඳහා හේතු විය. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ එක් එක් අංශ වෙත ලබා දුන් ණය සලකා බැලීමේදී, 2022 වසර අවසානය වන විට කෘෂිකාර්මික, කර්මාන්ත සහ සේවා යන අංශ සඳහා ලබා දුන් සමස්ත ණය ප්‍රමාණය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, සියයට 6.1කින්, සියයට 6.5කින් සහ සියයට 11.1කින් සංකෝචනය විය. 2021 වසරට සාපේක්ෂව 2022 වසරේදී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය වෙත ලබා දුන් නව ණය ප්‍රමාණයෙන් වැඩි කොටසක් කෙටි කාලීන වන අතර මැදි හා දිගු කාලීන ණය සැලකිය යුතු ලෙස අඩු විය. මෙමගින්, පෙර වසරට සාපේක්ෂව 2022 වසර තුළදී කාරක ප්‍රාග්ධන අරමුණු සඳහා නව ණය ලබා දීම් ඉහළ යෑමක් සහ ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම හේතුවෙන් ආයෝජන අරමුණු සඳහා වූ ණය ලබා දීම්හි අඩු වීමක් පෙන්නුම් කරයි.

17 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයෙහි සාමාන්‍ය පිරිවැය සහ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් එම අංශය සඳහා ලබා දී ඇති ණය ප්‍රමාණය හඳුනාගැනීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 ජූලි මාසයේ සිට පවත්වනු ලබන මාසික සමීක්ෂණයකි.

පුළුල් මුදල් සැපයුම (M_4)

M_{2b} පුළුල් මුදල් සැපයුමෙහි ප්‍රවණතාව අනුගමනය කරමින්, මූල්‍ය සමීක්ෂණය[18] මගින් මනිනු ලබන පුළුල් මුදල් සැපයුමේ (M_4) වර්ධනය 2022 වසර තුළදී ඉහළ ගියේය. M_4 පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 වසර අවසානයේදී වාර්තා වූ සියයට 13.3 සිට 2022 වසර අවසානය වන විට සියයට 14.3ක් දක්වා ඉහළ ගියේය. වත්කම් අංශය අනුව සලකා බැලීමේදී, 2022 වසර තුළදී M_4 පුළුල් මුදල් සැපයුමේ ප්‍රසාරණය සඳහා ශුද්ධ දේශීය වත්කම් ඉහළ යෑම මුළුමනින්ම දායක වී ඇත. ශුද්ධ දේශීය වත්කම් තුළ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් සපයන ලද දේශීය ණය රුපියල් බිලියන 102.3කින් ඉහළ ගිය අතර බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් සපයන ලද දේශීය ණය රුපියල් බිලියන 106.8කින් ඉහළ ගියේය. M_4 පුළුල් මුදල් සැපයුමට අනුව, 2022 වසර තුළදී රජයට ලබා දුන් ශුද්ධ ණයෙහි වැඩි වීම රුපියල් බිලියන 1,699.3ක් වූ අතර එයින් රුපියල් බිලියන 37.0ක් බලපත්‍රලාභී විශේෂිත බැංකුවලින් ද රුපියල් බිලියන 23.7ක් බලපත්‍රලාභී මුදල් සමාගම් මගින් ද ලබා දෙන ලදී. තවද, ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීමේ බලපෑම පිළිබිඹු කරමින් බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2022 අප්‍රේල් මාසය වන තෙක් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර ඉන් අනතුරුව දැඩි මුදල් තත්ත්ව හේතුවෙන් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය පහළ ගියේය. ඒ අනුව, බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 වසර අවසානයේදී වාර්තා වූ සියයට 12.7ට සාපේක්ෂව 2022 වසර තුළදී සියයට 6.2ක් විය. බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2022 වසරේදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.0ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 65.4කින් ඉහළ ගියේය. මේ අතර, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2022 වසරේදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.6ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 83.1කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්,

18 මූල්‍ය සමීක්ෂණය දුවශීලතාව පිළිබඳ වඩාත් පුළුල් මිනුමක් වන අතර එමගින් ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු මෙන්ම බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් ද ඇතුළුව සියලුම තැන්පතු බාරගන්නා ආයතන ආවරණය කරනු ලබයි.

7.8 සංඛ්‍යා සටහන

පුළුල් මුදල් (M_4) සැපයුමෙහි වත්කම් අංශය
(මූල්‍ය සමීක්ෂණය අනුව ගණනය කරන ලදී)

රුපියල් බිලියන

අයිතමය	2021 අවසානයට	2022 අවසානයට (අ)	වෙනස			
			2021		2022	
			ප්‍රමාණය	%	ප්‍රමාණය	%
පුළුල් මුදල් (M_4)	**12,985.4**	**14,839.8**	**1,523.5**	**13.3**	**1,854.4**	**14.3**
තුඩුදුන් සාධක						
ශුද්ධ විදේශීය වත්කම්	**-998.6**	**-1,766.8**	**-781.5**	**-360.0**	**-768.2**	**-76.9**
මුදල් අධිකාරීන් (ආ)	-387.3	-1,613.9	-914.0	-173.5	-1,226.6	-316.7
බලපත්‍රලාභී වාණිජ බැංකු	-594.7	-153.0	141.5	19.2	441.8	74.3
බලපත්‍රලාභී විශේෂිත බැංකු	-16.6	0.0	-9.0	-117.9	16.6	-
ශුද්ධ දේශීය වත්කම්	**13,984.0**	**16,606.6**	**2,305.0**	**19.7**	**2,622.6**	**18.8**
දේශීය ණය	**17,296.4**	**20,135.8**	**2,643.9**	**18.0**	**2,839.4**	**16.4**
රජයට ලබා දුන් ශුද්ධ ණය	**6,769.3**	**8,468.6**	**1,403.6**	**26.2**	**1,699.3**	**25.1**
මහ බැංකුව	2,094.1	3,432.5	1,225.2	141.0	1,338.4	63.9
බලපත්‍රලාභී වාණිජ බැංකු	3,738.3	4,038.6	59.2	1.6	300.3	8.0
බලපත්‍රලාභී විශේෂිත බැංකු	844.5	881.5	102.3	13.8	37.0	4.4
බලපත්‍රලාභී මුදල් සමාගම්	92.4	116.0	16.9	22.4	23.7	25.6
රාජ්‍ය සංස්ථාවලට/රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය (බලපත්‍රලාභී වාණිජ බැංකු)	**1,188.1**	**1,747.0**	**185.9**	**18.6**	**558.9**	**47.0**
පෞද්ගලික අංශයට ලබා දුන් ණය	**9,338.9**	**9,920.2**	**1,054.4**	**12.7**	**581.2**	**6.2**
බලපත්‍රලාභී වාණිජ බැංකු	6,981.4	7,414.1	810.5	13.1	432.7	6.2
බලපත්‍රලාභී විශේෂිත බැංකු	1,093.7	1,159.1	157.3	16.8	65.4	6.0
බලපත්‍රලාභී මුදල් සමාගම්	1,263.8	1,346.9	86.7	7.4	83.1	6.6
අනෙකුත් අයිතම (ශුද්ධ) (ඇ)	**-3,312.4**	**-3,529.2**	**-339.0**	**-11.4**	**-216.8**	**-6.5**

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් මෙන්ම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරනු ලබන රජයේ රන් පවුම් ශේෂය ද මෙහි අන්තර්ගත වේ.
(ඇ) අනෙකුත් වත්කම් සහ අනෙකුත් වගකීම් අතර වෙනස මගින් ගණනය කරනු ලැබේ.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

7.16 රූප සටහන
මුදල් සමස්තවල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (අ)



(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

M_4 පුළුල් මුදල් සැපයුමට අනුව මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් අඩු වීම පිළිබිඹු කරමින් සමස්ත ශුද්ධ විදේශීය වත්කම් 2022 වසර තුළදී රුපියල් බිලියන 768.2කින් අඩු වූ අතර විදේශීය ණය වගකීම් පියවීම හේතුවෙන් වසර තුළදී බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 16.6කින් වැඩි විය.

M_4 පුළුල් මුදල් සැපයුමෙහි වගකීම් අංශය සලකා බැලීමේදී, බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් වෙතැති මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතුවල වර්ධනය 2022 වසරේදී ඉහළ ගියේය. විශේෂයෙන්ම 2022 වසරේ අවසාන කාලයේදී බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පිරිනමනු ලැබූ ඉහළ පොලී අනුපාතික හේතුවෙන් M_4 පුළුල් මුදල් සැපයුමට අනුව කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතුවල සමස්ත වර්ධනය ඉහළ ගියේය. ඒ අනුව, M_4 පුළුල් මුදල් සැපයුමට අනුව කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2021 වසර අවසානයේදී වාර්තා වූ සියයට 11.6ක වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 16.0කින් වර්ධනය විය. බලපත්‍රලාභී මුදල් සමාගම් වෙතැති කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2021 වසරේදී වාර්තා වූ සියයට 5.5ක වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 11.5කින් වර්ධනය විය. කෙසේ වෙතත්, බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙතැති කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2021 වසර අවසානයේදී වාර්තා වූ සියයට 13.5ක වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 6.8කින් පමණක් වර්ධනය විය. දැඩි ද්‍රවශීලතා තත්ත්වයන් මධ්‍යයේ තැන්පතු ලබා ගැනීම සඳහා තරග කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් සාපේක්ෂ වශයෙන් ඉහළ පොලී අනුපාතික පිරිනමනු ලැබීම බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙතැති කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු අඩු වේගයකින් වර්ධනය වීම සඳහා බොහෝ දුරට හේතු විය හැකිය.

7

8

මූල්‍ය අංශයේ ක්‍රියාකාරීත්වය සහ පද්ධති ස්ථායීතාව

8.1 සමස්ත නිරීක්ෂණ

2022 වසර තුළ දී මූල්‍ය පද්ධතියට හැකි විය. සියලුම ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම, බැංකු අංශය රාජ්‍ය අංශය වෙත වැඩි වශයෙන් නිරාවරණය වීම, ආර්ථිකය සංකෝචනය වීම, උග්‍ර විදේශ විනිමය හිඟය සහ 2022 වසරේ අප්‍රේල් මාසයේ දී ද්විපාර්ශ්වික සහ වාණිජ ණය මත විදේශ ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම පිළිබඳ නිවේදනයත් සමඟ ඉහළ මට්ටමක පැවති උද්ධමනය, මූල්‍ය අංශයේ ක්‍රියාකාරකම් කෙරෙහි පෙර නොවූ දැඩි අහිතකර බලපෑමක් ඇති කළ අතර මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව ද අභියෝගයට ලක් කළේය. කෙසේ වුවද, ණයවල ගුණාත්මකභාවය අබණ්ඩව පහළ යෑම, ද්‍රවශීලතාව මත ඇති වූ උග්‍ර පීඩනය, ඉහළ ණය හානිකරණය හේතුවෙන් ලාභදායීත්වය අඩු මට්ටමක පැවතීම සහ අනපේක්ෂිත අලාභ අවශෝෂණය කර ගැනීමට ප්‍රාග්ධන ස්වාරක්ෂක පිරිහීම හේතුවෙන් පැන නගින අභියෝග මධ්‍යයේ වුවද 2022 වසර තුළ දී බැංකු අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීමට හැකි විය. මේ අතර, මහ බැංකුවේ විචක්ෂණ අවශ්‍යතාවලට ප්‍රතිඵල ලෙස අනුකූල වන අතරම, මෙම අංශය වත්කම් හා තැන්පතු අනුව වර්ධනය විය. ණය වර්ධනය මන්දගාමී වීම, ලාභදායීත්වය අඩුවීම සහ අදියර 3 යටතේ පවතින ණය මගින් පිළිබිඹු වන අක්‍රීය ණය ඉහළ යෑම වැනි අභියෝග මධ්‍යයේ වුවද, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය 2022 වසර තුළ දී ප්‍රමාණවත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක සහිතව වත්කම් සහ තැන්පතු අනුව අබණ්ඩව ප්‍රසාරණය විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ගොඩනැගෙමින් තිබූ පීඩනය සැලකිල්ලට ගෙන 2022 වසරේ මාර්තු මස මුල දී මුදල් මණ්ඩලය විසින් විනිමය අනුපාතිකයේ නිසි ගැලපීමක් සිදු වීමට ඉඩ හරින ලදී. කෙසේ වුවද, පසුව විනිමය අනුපාතිකය පාවීමට ඉඩ හැරීමත් සමඟ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි පැවති උග්‍ර ද්‍රවශීලතා හිඟය සහ අහිතකර වෙළඳපොළ ආකල්ප හේතුවෙන් විනිමය අනුපාතිකය විශාල වශයෙන් අවප්‍රමාණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විනිමය අනුපාතිකයේ ස්ථායීතාව සහතික කිරීම සඳහා මහ බැංකුව විසින් අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළ වෙත වෙළඳපොළ මාර්ගෝපදේශයක් හඳුන්වා දෙන ලදී. 2022 වසරේ පළමු භාගය තුළ දී මුදල් වෙළඳපොළ තුළ අබණ්ඩව ඉහළ මට්ටමක පැවති ද්‍රවශීලතා හිඟය, ප්‍රධාන වශයෙන් මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් 2022 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට සැලකිය යුතු ලෙස පහත වැටුණි. මේ අතර, සහභාගිවන්නන් තුළ පැවති අවදානම් දැරීම සඳහා වූ නොකැමැත්ත ඉහළ යෑම මධ්‍යයේ මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් දුර්වල කාර්යසාධනයක් වාර්තා කළේය. ස්ථාවර ආදායම් සුරැකුම්පත් සඳහා පැවති ඉහළ ඵලදා අනුපාතික සහ අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් සහිත පසුබිමක් තුළ පවතින සෘණාත්මක වෙළඳපොළ ආකල්ප පිළිබිඹු කරමින් කොටස් වෙළඳපොළ 2022 වසර තුළ දී දුර්වල කාර්යසාධනයක් වාර්තා කළේය. මෙම අභියෝගාත්මක ආර්ථික පරිසරය තුළ මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සඳහා මූල්‍ය යටිතල පහසුකම් අබණ්ඩව සහාය විය. මේ සියලු අභියෝග මධ්‍යයේ වුවද, 2023 මාර්තු 20 වන දින අනුමත කරන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම සඳහා අනුමැතිය හිමි වීම හේතුවෙන් වැඩිදියුණු වූ වෙළඳපොළ විශ්වාසය මගින් විදේශ විනිමය වෙළඳපොළ සහ මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා පීඩනය ක්‍රමානුකූලව ලිහිල් වීම සහ රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතික පහත වැටීමත් සමඟ, 2023 වසර මුල දී මූල්‍ය අංශය තුළ යම් දියුණුවක් දක්නට ලැබුණි. කෙසේ වෙතත්, ණය ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් මූල්‍ය අංශය වෙත අභියෝග එල්ල විය හැක. එසේ වුවද, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ දී මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා රජය සහ මහ බැංකුව කටයුතු කරනු ඇත.

8.2 බැංකු අංශයේ කාර්යසාධනය

ණයවල ගුණාත්මකභාවය අබණ්ඩව පහළ යෑම, උග්‍ර ද්‍රවශීලතා පීඩනය, ලාභදායීත්වය පහළ මට්ටමක පැවතීම සහ ප්‍රාග්ධන මට්ටම පිරිහීම හේතුවෙන් පැන නැඟුනු අභියෝග මධ්‍යයේ වුව ද 2022 වසර තුළ බැංකු අංශයේ ස්ථාවරත්වය ආරක්ෂා විය. කෙසේ වුවද, මහ බැංකුවේ විවක්ෂණ අවශ්‍යතාවලට පුළුල් ලෙස අනුකූල වෙමින් බැංකු අංශය සිය වර්ධන වේගය පවත්වා ගෙන ගියේය.

2022 වසර අවසන් වන විට මූල්‍ය අංශයේ සමස්ත වත්කම්වලින් සියයට 61.9කට හිමිකම් වාර්තා කරමින් බැංකු අංශය[1], මූල්‍ය අංශයේ මූලිකත්වය දරනු ලැබීය.

8.1 සංඛ්‍යා සටහන

මූල්‍ය අංශයේ සමස්ත වත්කම්

ආයතනය	2021 (අ)		2022 (ආ)	
	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)
බැංකු අංශය	**19,872.5**	**74.6**	**23,926.9**	**76.3**
මහ බැංකුව	3,046.3	11.4	4,510.3	14.4
බලපත්‍රලාභී වාණිජ බැංකු	14,724.3	55.3	17,225.2	54.9
බලපත්‍රලාභී විශේෂිත බැංකු	2,101.9	7.9	2,191.4	7.0
තැන්පතු බාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන	**1,646.2**	**6.2**	**1,830.9**	**5.8**
බලපත්‍රලාභී මුදල් සමාගම්	1,452.0	5.4	1,610.2	5.1
සමූපකාර ග්‍රාමීය බැංකු (ඇ)	193.4	0.7	220.0	0.7
සංකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිති	0.7	0.0	0.8	0.0
විශේෂිත මූල්‍ය ආයතන	**369.4**	**1.4**	**328.9**	**1.0**
විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්	35.7	0.1	1.0	0.0
බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්	8.3	0.0	9.9	0.0
ප්‍රාථමික අලෙවිකරුවන්	78.7	0.3	131.7	0.4
කොටස් තැරැව්කරුවන්	36.5	0.1	24.8	0.1
ඒකක භාර / ඒකක භාර කළමනාකරණ සමාගම්	198.5	0.7	153.5	0.5
වෙළඳපොළ අතරමැදියන් (ඇ)	11.8	0.0	8.0	0.0
ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම්	ලැ.නො.	ලැ.නො.	ලැ.නො.	ලැ.නො.
රිවිසුම්ගත ඉතිරිකිරීම් ආයතන	**4,758.2**	**17.9**	**5,292.3**	**16.9**
රක්ෂණ සමාගම්	881.8	3.3	947.3	3.0
සේවක අර්ථසාධක අරමුදල	3,166.1	11.9	3,459.9	11.0
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල	419.1	1.6	468.8	1.5
අනුමත විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල්	207.6	0.8	330.4	1.1
රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල	83.5	0.3	85.9	0.3
එකතුව	**26,646.3**	**100.0**	**31,379.0**	**100.0**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) දත්ත නොමැතිකම හේතුවෙන්, 2022 වසර අවසානයේ සමූපකාර ග්‍රාමීය බැංකුවල වත්කම් පදනම ලෙස එම වසරේ 3 වන කාර්තුවේ වත්කම් පදනම යොදා ගෙන ඇත.
(ඈ) වෙළඳපොළ අතරමැදියන් ලෙස ලියාපදිංචි වී ඇති බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් හැර.

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
කම්කරු දෙපාර්තමේන්තුව
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
සණස මහා සංගමය
ශ්‍රී ලංකා ඒකක භාර සංගමය
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

1 බැංකු අංශය බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවලින් සමන්විත වේ. මහ බැංකුව සලකා නොමැත.

8.2 සංඛ්‍යා සටහන

බැංකු, බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක ව්‍යාප්තිය

වර්ගීකරණය	2021 අවසානයට (අ)	2022 අවසානයට (ආ)
බලපත්‍රලාභී වාණිජ බැංකු		
i. මුළු බලපත්‍රලාභී වාණිජ බැංකු සංඛ්‍යාව	**24**	**24**
දේශීය බැංකු	13	13
විදේශීය බැංකු	11	11
ii. මුළු බලපත්‍රලාභී වාණිජ බැංකු ඒකක සංඛ්‍යාව	**6,710**	**6,718**
ශාඛා (ඇ)	2,917	2,924
දේශීය බැංකු	2,871	2,878
විදේශීය බැංකු	46	46
ශිෂ්‍ය ඉතුරුම් ඒකක	3,793	3,794
iii. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර	**5,972**	**6,204**
බලපත්‍රලාභී විශේෂිත බැංකු		
i. මුළු බලපත්‍රලාභී විශේෂිත බැංකු සංඛ්‍යාව	**6**	**6**
ජාතික මට්ටමේ ඉතිරි කිරීමේ බැංකු	1	1
නිවාස ණය ආයතන	2	2
අනෙකුත් බලපත්‍රලාභී විශේෂිත බැංකු	3	3
ii. මුළු බලපත්‍රලාභී විශේෂිත බැංකු ඒකක සංඛ්‍යාව	**705**	**706**
ශාඛා (ඇ)	705	706
ජාතික මට්ටමේ ඉතිරි කිරීමේ බැංකු	267	268
නිවාස ණය ආයතන	64	64
අනෙකුත් බලපත්‍රලාභී විශේෂිත බැංකු	374	374
iii. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර	**466**	**474**
මුළු බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක සංඛ්‍යාව	**7,415**	**7,424**
මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව	**6,438**	**6,678**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ශිෂ්‍ය ඉතුරුම් ඒකක හැර සියලුම බැංකු ඒකක

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මහ බැංකුවේ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ අභියෝගාත්මක සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් 2022 වසරේ දී බැංකු අංශයේ ණය වර්ධන වේගය 2021 වසරට සාපේක්ෂව අඩු විය. තැන්පතු, බැංකු අංශයට අරමුදල් සැපයීමේ ප්‍රධාන ප්‍රභවය ලෙස අබණ්ඩව පැවතුණු අතර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහත වැටීම සහ 2022 වසරේ අප්‍රේල් මාසයේ දී රජය විසින් ද්වීපාර්ශ්වික සහ වාණිජ ණය මත වන විදේශ ණය සේවාකරණය තාවකාලිකව අත්හිටුවීම පිළිබඳව සිදු කළ නිවේදනය හේතුවෙන් 2022 වසර තුළ විදේශීය මුදල් ණය ගැනීම්වල කැපී පෙනෙන අඩු වීමක් දක්නට ලැබුණි.

ව්‍යාපාර පුළුල් කිරීම

2022 වසර අවසානය වන විට බැංකු අංශය බැංකු 30කින් සමන්විත වූ අතර, එය විදේශ බැංකු 11ක ශාඛා ද ඇතුළත්ව බලපත්‍රලාභී වාණිජ බැංකු 24කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6කින් සමන්විත විය. බැංකු අංශය විසින් බැංකු සේවා වැඩි දියුණු කිරීම සහ බැංකු ජාලය පුළුල් කිරීම මගින් ආර්ථිකය තුළ මූල්‍ය

8.1 රූප සටහන

මූල්‍ය අංශයේ කාර්යසාධනය

නිදහසින් පසු ඇති වූ උග්‍රතම ආර්ථික අර්බුදයෙන් පැන නැගුණු අභියෝගයන්ට මුහුණ දීමට මූල්‍ය පද්ධතියට හැකිවිය..



8.3 සංඛ්‍යා සටහන

බැංකු අංශයේ වත්කම් සහ වගකීම් සංයුතිය

අයිතමය	2021 (අ)		2022 (ආ)		වෙනස (%)	
	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	2021 (අ)	2022 (ආ)
වත්කම්						
ණය සහ අත්තිකාරම්	10,726.7	63.8	11,337.9	58.4	14.5	5.7
ආයෝජන	4,968.5	29.5	5,934.3	30.6	16.4	19.4
වෙනත් (ඇ)	1,131.0	6.7	2,144.3	11.0	15.0	89.6
වගකීම්						
තැන්පතු	12,879.2	76.5	15,299.1	78.8	13.3	18.8
ණය ගැනුම්	2,172.9	12.9	1,872.5	9.6	27.1	-13.8
ප්‍රාග්ධන අරමුදල්	1,348.3	8.0	1,593.4	8.2	13.1	18.2
වෙනත්	425.8	2.5	651.5	3.4	20.4	53.0
මුළු වත්කම්/වගකීම්	**16,826.2**	**100.0**	**19,416.6**	**100.0**	**15.1**	**15.4**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුදල් හා බැංකු ශේෂයන්, ස්ථාපනයන්, ප්‍රති විකුණුම් ගිවිසුම් සහ ස්ථාවර වත්කම් ඇතුළත් වේ.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

8.2 රූප සටහන

බැංකු අංශයේ ශේෂ පත්‍ර නොවන අයිතම (2022 අවසානයට)



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

අතරමැදිකරණය සඳහා අබණ්ඩව සහයෝගය ලබා දෙන ලදී. ඒ අනුව, 2022 වසරේ දී බැංකු ශාඛා 11ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 327ක් ස්ථාපිත කළ අතර බැංකු ශාඛා 3ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 87ක් වසා දමා ඇත. ඒ අනුව, 2022 වසර අවසානය වන විට සමස්ත බැංකු ඒකක සංඛ්‍යාව සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව, පිළිවෙලින්, 7,424ක් සහ 6,678ක් දක්වා ඉහළ ගොස් ඇත.

2022 වසර තුළ දී බැංකු අංශය වත්කම් පදනම අනුව සලකා බලන විට අබණ්ඩව වර්ධනය විය. බැංකු අංශයේ වත්කම් පදනම 2022 වසර තුළ රුපියල් ට්‍රිලියන 2.6කින් ඉහළ ගිය අතර 2021 වසර අවසානයේ වාර්තා වූ සියයට 15.1ක වර්ධනයට සාපේක්ෂව සියයට 15.4ක වර්ධනයක් වාර්තා කරමින් 2022 වසර අවසානය වන විට රුපියල් ට්‍රිලියන 19 ඉක්මවිය. මාර්තු සහ අප්‍රේල් මාසවල දී ශ්‍රී ලංකා රුපියල එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 44.1කින් අවප්‍රමාණය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස විදේශ මුදලින් නාමනය කරන ලද වත්කම්වල වර්ධනයක් ඇති විය. කෙසේ වුවද, පැවති දැඩි මුදල් ප්‍රතිපත්තිය හමුවේ 2021 වසරේ දී පැවති සියයට 14.5ක ණය හා අත්තිකාරම්වල වර්ධනය 2022 වසරේ දී සියයට 5.7ක් දක්වා පහළ ගියේය. මේ අතර, ආයෝජනවල වර්ධනය 2021 වසර අවසානයේ සියයට 16.4 සිට 2022 වසර අවසානය වන විට සියයට 19.4ක් දක්වා වැඩි විය. ආයෝජනවල මෙම වර්ධනයට, ක්‍රමක්ෂිත පිරිවැය (Amortized Cost) මත ගණනය වන මූල්‍ය ආයෝජන රුපියල් බිලියන 1,635.2කින් වැඩි වීම සහ ලාභ සහ අලාභ හිඟුම හරහා සාධාරණ වටිනාකම ගණනය වන (Fair Value through Profit or Loss) ආයෝජන රුපියල් බිලියන 29.9කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු විය.

අරමුදල් සැපයීමේ ප්‍රධාන ප්‍රභවය ලෙස තැන්පතු අබණ්ඩව පැවති අතර එය 2022 වසර අවසානය වන විට මුළු වගකීම්වලින් සියයට 78.8ක් වූ අතර, ණය ගැනීම් මුළු වගකීම්වලින් සියයට 9.6කට දායක විය. 2022 වසර තුළ දී සිදු වූ සමස්ත තැන්පතුවල වර්ධනයට කාලීන තැන්පතු ප්‍රධාන වශයෙන් දායක වූ අතර සමස්ත තැන්පතුවලට කාලීන තැන්පතු දැක්වූ දායකත්වය 2021 වසරේ දී සියයට 61.0ක සිට 2022 වසර අවසන් වන විට සියයට 67.9ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, 2022 වසර අවසන් වන විට සමස්ත තැන්පතුවලින් ඉතුරුම් තැන්පතු සහ කාලීන තැන්පතු, පිළිවෙලින්, සියයට 24.3ක් සහ සියයට 6.9ක් විය. ඒ අනුව, ජංගම හා ඉතුරුම් ගිණුම් අනුපාතය 2021 වසරේ පැවති සියයට 38.0ක සිට 2022 වසරේ දී සියයට 31.2ක් දක්වා පහළ ගියේය. බැංකු අංශයේ සමස්ත ණය ගැනීම් 2021 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 462.8ක, එනම් සියයට 27.1ක වර්ධනයට සාපේක්ෂව, 2022 වසරේ දී රුපියල් බිලියන 300.4ක, එනම් සියයට 13.8ක පහත වැටීමක් පෙන්නුම් කළේය.

8.4 සංඛ්‍යා සටහන

බැංකු අංශයේ තැන්පතු සංයුතිය

අයිතමය	2021 (අ)		2022 (ආ)		වෙනස (%)	
	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	2021 (අ)	2022 (ආ)
ඉල්ලුම් තැන්පතු	888.0	6.9	1,060.0	6.9	25.9	19.4
ඉතුරුම් තැන්පතු	4,011.8	31.1	3,713.0	24.3	19.7	-7.4
ස්ථාවර තැන්පතු	7,860.4	61.0	10,393.0	67.9	8.6	32.2
වෙනත් තැන්පතු	118.9	0.9	133.2	0.9	80.0	12.0
මුළු තැන්පතු	**12,879.2**	**100.0**	**15,299.1**	**100.0**	**13.3**	**18.8**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

විශේෂ සටහන 9

පද්ධතිමය මූල්‍ය අර්බුද වළක්වාලීමේ සහ බැංකු අංශය තුළ මහජන විශ්වාසය යළි පිහිටුවීමෙහිලා මහ බැංකු සතු කාර්යභාරය

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ බැංකු අංශය, රටේ මූල්‍ය අතරමැදිකරණය වෙනුවෙන් අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරන අතර, මූල්‍ය අංශයේ සැලකියයුතු කොටසක් දරමින්, 2022 වසර අවසන් වන විට මූල්‍ය අංශයේ මුළු වත්කම්වලින් 61.9% ක ප්‍රතිශතයක් නියෝජනය කරයි. මෑත කාලීන බහුවිධ අභියෝග මධ්‍යයේ වුවද, ප්‍රමාණවත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂකයන් මඟින් පෙන්නුම් කරන පරිදි, ශ්‍රී ලංකාවේ බැංකු අංශය ශක්තිමත්ව පවතියි. කෙසේවෙතත්, 2019 පාස්කු ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ මෑත කාලීන සාර්ව ආර්ථිකය සම්බන්ධ ගැටලු ඇතුළු විවිධ හේතූන් නිසා බැංකු ක්ෂේත්‍රය කෙරෙහි ඇති වූ පෙර නොවූ විරූ මට්ටමේ ආතතීන් හමුවේ, ශක්තිමත් අර්බුද කළමනාකරණ රාමුවක පැවැත්ම සහතික කිරීම වැදගත් වේ.

2. බැංකු පද්ධතියෙහි ස්ථාවරත්වයෙහි වැදගත්කම සහ ගෝලීය මූල්‍ය අර්බුදය තුලින් උගත් පාඩම්

ආර්ථික වර්ධනය සහ මහජනතාවගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා කාර්යක්ෂම මූල්‍ය අතරමැදිකරණයකට බැංකු අංශයේ ස්ථාවරත්වය අත්‍යවශ්‍ය වේ. මෙය වඩාත් වැදගත් වන්නේ ආර්ථික කම්පන සහ ආතතිමය අවස්ථා තුල දී ය. කෙසේ වෙතත්, ඉතිහාසය පුරා, බැංකු පද්ධතිය කෙරෙහි විශ්වාසය බිඳ වැටීම් සහ බැංකු පද්ධතිය කඩා වැටෙතියි යන අනිසි බියෙන් තැන්පතුකරුවන් තම මුදල් බැංකු පද්ධතියෙන් ආපසු ගැනීම් හේතුවෙන්, පද්ධතිමය මූල්‍ය අර්බුද කරා මඟපාදමින්, ලොව පුරා රටවල ආර්ථික කටයුතු කෙරෙහි සැලකිය යුතු ඍණාත්මක බලපෑම් එල්ල වී ඇත. ඉහළ උත්තෝලනය (හිමිකම් ප්‍රාග්ධනයට සාපේක්ෂව ණය ප්‍රාග්ධනය ඉහළ වීම), ණය ඉහළ යෑම, ණය ඇගයීම් ප්‍රමිති දුර්වල වීම, පාලනය සහ අවදානම් කළමනාකරණයෙහි අඩුලුහුඬුකම්, දේපළ සහ අනෙකුත් වත්කම්වල මිල අධික ලෙස ඉහළ යෑම්, ඉතා ඉහළ ලෙස රජය වෙත ණය ලබා දීම, අප්‍රමාණවත් අධීක්ෂණය සහ බාහිර ජංගම ගිණුමේ පවත්නා හිඟ තත්වයන් මෙම පද්ධතිමය අර්බුද ඇතිවීම සඳහා පොදු හේතූන් ලෙස හඳුනාගත හැකිය. පෙරදිග ආසියානු අර්බුදය (1997), ගෝලීය මූල්‍ය අර්බුදය (2007-2008) සහ යුරෝපීය අර්බුදය (2010) වැනි ජාත්‍යන්තර උදාහරණ මඟින් අනාවරණය වන පරිදි, පද්ධතිමය අර්බුදයකින් හට ගන්නා මූල්‍ය ව්‍යසන සාමාන්‍යයෙන් වසර ගණනාවක් දක්වා පවතින අතර, එවැනි අර්බුදකාරී තත්වයන් නිසා සැලකියයුතු ලෙස ආර්ථික සංකෝචන වීම් සහ රාජ්‍ය මූල්‍ය පිරිවැය වැඩි වීම් කෙරෙහි විශාල වශයෙන් හේතුසාධක වෙමින් සමස්ත සමාජයට ම බලපෑම් එල්ල කරනු ලබයි.

ගෝලීය මූල්‍ය අර්බුදයෙන් උගත් පාඩම්

2007-2008 ගෝලීය මූල්‍ය අර්බුදය ඉන් පෙර පැවති මූල්‍ය අර්බුදවලට සමාන ලක්ෂණ වලින් සමන්විත වුවද, එම අර්බුදයෙහි ප්‍රතිඵල එයින් ඍජුවම බලපෑමට ලක් වූ රටවලට පමණක් සීමා නොවී, පෙර නොවූ විරූ ආකාරයෙන් ලොව පුරා ශීඝ්‍රයෙන් පැතිර ගියේය. ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොලෙහි වඩාත් පුළුල් මූල්‍ය සම්බන්ධතා ඇති දියුණු ආර්ථිකයන් සහිත රටවල් වල ගෝලීය අර්බුදය හට ගැනීම, එම අර්බුදයෙහි ප්‍රතිඵල විශාල වශයෙන් ලොව පුරා අනෙකුත් රටවල් වල ව්‍යාප්ත වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. ගෝලීය මූල්‍ය අර්බුදය නිසා හටගත් නව අභියෝගයන් ලොව පුරා මහ බැංකු සහ ප්‍රතිපත්ති සම්පාදකයන්ට දැනට පවතින නෛතික සහ ප්‍රතිපත්ති රාමුවල ඇති හිඩැස් සහ දුර්වලතා වටහා ගැනීමටත්, නව්‍ය අර්බුද කළමනාකරණ මෙවලම් හඳුන්වා දීමටත්, විශාල වශයෙන් දායක විය.

ඉහත දුර්වලතා සඳහා පිළියම් යෙදීමේ අරමුණින්, කඩා වැටෙන මූල්‍ය ආයතන විධිමත්ව කළමනාකරණය කිරීමට සහාය ලබා දීම සහ එමඟින් මූල්‍ය පද්ධතියට සහ මූර්ත ආර්ථිකයට ඇති වන ඍණාත්මක බලපෑම් අවම කිරීම සඳහා ශක්තිමත් මූල්‍ය ආරක්ෂණ ජාලයක් සමඟ ඵලදායී අර්බුද කළමනාකරණ රාමුවක් අවශ්‍ය වන බවට, ගෝලීය නායකයන් විසින් පොදු එකඟත්වයකට පැමිණෙන ලදී. ඵලදායී අර්බුද කළමනාකරණ රාමුවක් සාමාන්‍යයෙන් පහත සඳහන් කොටස්වලින් සමන්විත වේ (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2020):

(i) අර්බුද වලට පෙර සූදානම් වීම සඳහා වන ආයතනික රාමුව

(ii) පූර්ව අධීක්ෂණ අතරමැදිකරණය

(iii) හදිසි ද්‍රවශීලතා සහාය

(iv) මූල්‍ය ආයතන නිරාකරණය

(i) අර්බුද වලට පෙර සූදානම් වීම සඳහා වන ආයතනික රාමුව

අර්බුද කළමනාකරණ රාමුවක් ඵලදායී වීමට නම්, මූල්‍ය ආරක්ෂණ ජාලයේ මූලික ආයතන අතර ඵලදායී ප්‍රතිපත්ති සම්බන්ධීකරණයක් සහිත ශක්තිමත් සහ ස්වාධීන ආයතනික රාමුවක් තිබීම අත්‍යවශ්‍ය වේ. මූල්‍ය ආරක්ෂණ ජාලයක මූලික ආයතන ලෙස මහ බැංකුව, මූල්‍ය අධීක්ෂණ සහ නියාමන නියෝජිත ආයතන, නිරාකරණ අධිකාරිය සහ මුදල් අමාත්‍යාංශය හඳුනා ගත හැක. මෙම ආයතනවලට ඕනෑම අවස්ථාවක දී අර්බුද කළමනාකරණ කාර්යයන් සඳහා සූදානම් වීමට, සම්බන්ධීකරණය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි පැහැදිලි බලතල සහ ප්‍රමාණවත් ස්වාධීනත්වයක් තිබිය යුතුය.

(ii) පූර්ව අධීක්ෂණ අතරමැදිකරණය

පූර්ව අධීක්ෂණ ක්‍රියාමාර්ග මඟින් බැංකු ආයතනවල මූල්‍ය තත්ත්වයෙහි පිරිහීම පිළිබඳ අනතුරු ඇඟවීමේ සලකුණු කල්තියා හඳුනා ගැනීමට හැකි වන අතර,

එමගින් එවැනි ආයතනවල මූල්‍ය ව්‍යසනයක් ඇතිවීමේ සම්භාවිතාව සහ එවැනි ව්‍යසන වල පිරිවැය අවම කරගැනීමට හැකියාව ලැබේ. ශක්තිමත් සහ විස්තීරණ අධීක්ෂණයක් සහතික කිරීම සඳහා අධීක්ෂකවරුන්ට ප්‍රමාණවත් සම්පත්, ශක්තිමත් නෛතික අධිකාරියක් සහ ආරක්ෂාවක්, නිසි බලතල සහ ශක්තිමත් පාලන ව්‍යුහයක් සහිත මෙහෙයුම් ස්වාධීනත්වයක් අවශ්‍ය වේ.

(iii) මහ බැංකු විසින් ලබා දෙන හදිසි ද්‍රවශීලතා සහාය

මහ බැංකු විසින් මූල්‍ය ආයතන වෙත හදිසි ද්‍රවශීලතා සහාය සැපයීම අර්බුද කළමනාකරණ රාමුවක අත්‍යවශ්‍ය අංගයක් වනුයේ, එමඟින් මූල්‍ය ආයතනයක හෝ ආයතන කිහිපයක හටගන්නා තාවකාලික ද්‍රවශීලතා අවදානම් අවම කිරීමට මෙන්ම එම මූල්‍ය ආයතන බුන්වත්භාවය කරා ළඟාවීම හෝ පද්ධතිමය මූල්‍ය අස්ථාවරත්වයක් ඇතිවීමේ අවදානම මඟහරවා ගැනීමට සහාය ලබා දෙන බැවිනි. ඒ අනුව, මහ බැංකු විසින් හදිසි ද්‍රවශීලතා සහාය සැපයීම සඳහා වන රාමුව මූල්‍ය අර්බුද සඳහා සූදානම් වීමේ මෙවලමක් ලෙස මැනවින් ස්ථාපනය කළ යුතුය. තවද, මෙම ද්‍රවශීලතා සහාය ලබා දිය යුත්තේ මහ බැංකු ශේෂ පත්‍ර වල ආරක්ෂකභාවය සහතික කර ගනිමින් මෙන්ම බැංකු ක්ෂේත්‍රයෙහි පැවතිය යුතු විනය කෙරෙහි ඇතිවිය හැකි බලපෑම් ද අවම වන ලෙසයි.

ගෝලීය මූල්‍ය අර්බුදයට පෙර, අවශ්‍ය ඇප සුරැකුම් නැති බැංකු බුන්වත්යැයි යන උපකල්පනය මත, මහ බැංකු විසින් ණය ලබා දිය යුත්තේ මනා ඇප සුරැකුම් සහිත බැංකු වෙත පමණක් බව හදිසි ද්‍රවශීලතා සහාය සැපයීමෙහි මූලික සංකල්පය විය. හදිසි ද්‍රවශීලතා සහාය සැපයීමේ රාමුවෙහි සැලකිය යුතු වැඩි දියුණු කිරීම් සිදු කිරීමට මහ බැංකුවලට උපකාරී වූ, ගෝලීය මූල්‍ය අර්බුදයෙන් උගත් ප්‍රධාන පාඩම් පහත පරිදි සාරාංශ ගත කළ හැකිය (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2020):

(අ) සුදුසුකම - පද්ධතිමය වශයෙන් වැදගත් බැංකු පමණක් නොව, සියලු බැංකු හදිසි ද්‍රවශීලතා සහාය සඳහා සුදුසුකම් ලැබිය යුතුය. ඇතැම් අවස්ථාවල දී, මූල්‍ය ස්ථාවරත්වය රැක ගැනීම සඳහා පද්ධතිමය වශයෙන් වැදගත් වන බැංකු නොවන මූල්‍ය සමාගම් වෙත ද මහ බැංකු විසින් හදිසි ද්‍රවශීලතා සහාය සපයනු ලැබීමට හැකි විය යුතුය.

(ආ) නුබුන්වත්භාවය - අධීක්ෂකවරුන් විසින් නුබුන්වත් සහ ශක්‍ය යැයි සලකනු ලබන බැංකු වෙත පමණක්, මහ බැංකුවල අභිමතය පරිදි හදිසි ද්‍රවශීලතා සහාය යටතේ ණය ලබා දීම සිදු කළ යුතුය. නුබුන්වත් සහ ශක්‍යභාවය ඇගයීමේදී විෂය ප්‍රවීනයන්ගේ පෙර සහ පසු දැක්මක් සහිත විනිශ්චයක් යොදාගත යුතුයි. බුන්වත් ආයතන වෙත එවැනි සහායක් දීමට අවශ්‍ය වුවහොත්, රජයෙන් හානිපූර්ණයක් ඉල්ලා සිටිය යුතුය.

(ඇ) ඇප සුරැකුම් - හදිසි ද්‍රවශීලතා සහාය යටතේ ලබා දෙන ණය පහසුකම් සඳහා සෑම විටම ප්‍රමාණවත් පරිදි ඇප සුරැකුම් තැබිය යුතු අතර, විශාල පරාසයකට අයත් වන්නා වූ, වගකීම් වලින් නිදහස් වත්කම් ඇපකර ලෙස පිළිගැනීමට මහ බැංකුවලට හැකි විය යුතුය. ප්‍රතිපාර්ශ්වයක් ණය පැහැර හරින අවස්ථාවකදී, පියවීමට, කළමනාකරණය කිරීමට සහ උපලබ්ධි කිරීමට නිවැරදි ක්‍රියාවලි සමඟ මින් පෙර නිගමනය කළ කපා හැරීම් ද ඇතුලත්ව, එවැනි වත්කම් අගය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයන් ස්ථාපන කළ යුතුය.

හදිසි ද්‍රවශීලතා සහාය සැපයීමෙහි ප්‍රධාන අභියෝග- අපකීර්තිය, එනම්, මහජන විශ්වාසය පළුදු වේ යැයි යන මතය හේතුවෙන් මහ බැංකු ද්‍රවශීලතා සහාය වෙත යොමු වීමට බැංකු ආයතන දක්වන අකමැත්ත, විදේශ ව්‍යවහාර මුදලින් ණය සැපයීම සහ නිරාකරණය යටතේ පවතින බැංකුවකට හදිසි ද්‍රවශීලතා සහාය සැපයීම, මහ බැංකු විසින් මුහුණ දෙනු ලබන ප්‍රධාන අභියෝග වේ.

(iv) මූල්‍ය ආයතන නිරාකරණය

මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට බාධා කිරීමකින් තොරව, දුර්වල හෝ ආර්ථික වශයෙන් බිඳ වැටෙන බැංකුවල ගැටලු සඳහා පිළියම් යෙදීමේ තීරණාත්මකභාවය හේතුවෙන්, ශක්තිමත් අර්බුද කළමනාකරණ රාමුවක් සඳහා විධිමත් නිරාකරණ ක්‍රියාවලියක් අතිශයින් වැදගත් වේ. බැංකු ආයතනයක් බුන්වත් ලෙසට හෝ බුන්වත් වීමට ඉඩ ඇති ලෙසට හෝ එම ආයතනය නියාමන අවශ්‍යතා දැඩි ලෙස උල්ලංඝණය කරන බවට හෝ හඳුනා ගැනීමෙන් පසු, එහි අහිතකර ප්‍රතිවිපාක මුළු මහත් ආර්ථිකය වෙත ගලා යෑම වළක්වමින්, මහජන විශ්වාසය පවත්වා ගැනීම සඳහා ශක්තිමත්, තීරණාත්මක සහ කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වේ. නිරාකරණය පිළිබඳ ජාත්‍යන්තර පරිචයන් තුළ ඇති මූලධර්ම මඟින් තැන්පතුකරුවන්ගේ සහ ණය හිමියන්ගේ අපේක්ෂාවන් ආරක්ෂා කරමින්, මූල්‍ය පද්ධති ස්ථායීතාවය රැක ගැනීම සඳහා කඩිනමින් ක්‍රියා කිරීමටනම් අවශ්‍ය බලතල සහ මෙවලම් බලධාරීන් සතුව ඇති බව සහතික කළ යුතු වේ.

ගෝලීය මූල්‍ය අර්බුදයෙන් වසර 15කට පසුව පවා, අධික උද්ධමනය, වැඩි වන පොලී අනුපාත සහ මූල්‍ය වෙළඳපල අස්ථාවරත්වය තුලින් පෙන්නුම් කරන පරිදි, විශේෂයෙන් කොවිඩ්-19 වසංගතයෙන් පසුව ගෝලීය

මූල්‍ය ස්ථායිතාවයේ අවධානම වැඩිවීමක් පෙන්නුම් කරයි. මෑතකදී කඩා වැටුණු කැලිෆොනියාවෙහි සිලිකන් වැලි බැංකුව සහ නිව්යෝර්ක්හි සිග්නේචර් බැංකුව ලෝකය පුරා ගෝලීය මූල්‍ය වෙළඳපලට දැඩි බලපෑමක් එල්ල කළ අතර, යුරෝපීය වෙළඳපල තුල පෙන්නුම් කරන ලද අස්ථාවරත්වයන්, ඵලදායී අර්බුද කළමනාකරණ රාමුවක අවශ්‍යතාවය නැවතත් මනාව අවධාරණය කරන ලදී.

3. ශ්‍රී ලාංකික බැංකු ක්ෂේත්‍රය තුළ පද්ධතිමය මූල්‍ය අර්බුද වළක්වාලීම සහ මහජන විශ්වාසය යළි නගා සිටුවීම

ඉතිහාසයේ විශාලතම සෞඛ්‍ය හා ආර්ථික ව්‍යසනය වන කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ 2020 වසරේ සිට පසුගිය වසර තුන තුළ ශ්‍රී ලංකාව නොයෙකුත් ආකාරයේ බහුවිධ අභියෝග රැසකට මුහුණ දුන්නේය. විදේශ සංචිත පහත වැටීම, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම, රාජ්‍ය මූල්‍ය අංශයේ අසමතුලිතතා, ඉහළ උද්ධමනය, අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සහ අමුද්‍රව්‍ය හිඟ වීම ඇතුළු අසාමාන්‍ය සාර්ව ආර්ථික තත්ත්වයන් ඇති වීමට වසංගතයෙන් පසු කාලීනව හට ගත් අවහිරතා මෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු මන්දගාමීව යථා තත්ත්වයට පත් වීම සහ දේශපාලන අවිනිශ්චිතතාවයන් ද හේතු විය. මෙම අසාමාන්‍ය වූ සාර්ව ආර්ථික තත්වයන් හමුවේ ශ්‍රී ලාංකික බැංකු ක්ෂේත්‍රය හට පෙර නොවූ විරූ මට්ටමේ ආතතියක් සමඟින් අභියෝග රැසකට මුහුණ දීමට සිදු විය.

3.1. වත්මන් අභියෝග හමුවේ මූල්‍ය පද්ධති ස්ථාවරත්වය රැක ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග

සාමාන්‍ය අවස්ථාවල දී, බලපත්‍රලාභී වාණිජ බැංකු වලට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සපයනු ලබන විවිධ ද්‍රවශීලතා සහායන් ලබා ගැනීමේ විකල්ප මාර්ගයන් පහත දක්වා ඇත.

අ) නිත්‍ය ණය පහසුකම් බලපත්‍රලාභී වාණිජ බැංකු වලට සපයනු ලබන ඇපකර සහිත එක්දින ණය පහසුකම්

ආ) දිනය තුල ලබා දෙන ණය පහසුකම් බලපත්‍රලාභී වාණිජ බැංකු වලට දිනය තුළ සපයනු ලබන ඇපකර සහිත ණය පහසුකම්

ඇ) කාලීන ප්‍රතිමිලදී ගැනීමේ පහසුකම් බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා විවට වෙළඳපොල කටයුතු ක්‍රමය යටතේ පවත්වනු ලබන වෙන්දේසි හරහා ලබා දෙන ණය පහසුකම්

කෙසේ වෙතත්, දැඩි අහිතකර ආර්ථික සහ වෙළඳපොල ප්‍රවණතාවලින් හට ගන්නා සුවිශේෂී තත්ත්වයන් තුළ දී මෙම විකල්ප ක්‍රම මගින් බැංකු අංශය සඳහා ලබාදෙන ණය තුලින් ප්‍රමාණවත් ද්‍රවශීලත්වයක් සහතික නොකෙරෙනු ඇත.

3.2. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන අර්බුද කළමනාකරණ මෙවලම්

කොවිඩ්-19 වසංගතය පැතිර යෑමත් සමඟ මෑතක දී ශ්‍රී ලංකාවේ දිගින් දිගට ම හටගත් සුවිශේෂී සාර්ව ආර්ථික ප්‍රවණතා හමුවේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය රැක ගැනීමේ අරමුණ ඇතිව බැංකු අංශයේ ද්‍රවශීලතාව ඉහළ නංවන අතරතුර, මූල්‍ය පද්ධතිය පිළිබඳව මහජනතාවගේ විශ්වාසය සුරැකීමත් බැංකු අංශයේ අර්බුද කළමනාකරණ සූදානම් වීම් ශක්තිමත් කිරීමත් සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් දියත් කරන ලදී. මෙම ලිපිය මගින් බැංකු අංශය වෙත ලබා දෙන හදිසි ණය සහ අත්තිකාරම් පිළිබඳව වන රාමුව (ELA), බැංකු නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම, අර්බුද කළමනාකරණ රාමුව ස්ථාපනය කිරීම සහ වඩාත් තීව්‍ර වූ අධීක්ෂණ ප්‍රවේශයන් යනාදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද පූර්ව ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රධාන වශයෙන් විස්තර කෙරේ.

3.2.1. අවසන් ණය දෙන්නා - හදිසි ණය සහ අත්තිකාරම් පිළිබඳව වන රාමුව

1949 අංක 58 දරන වත්මන් මුදල් නීති පනතට අනුකූලව මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය පවත්වා ගෙන යෑමේ මූලික අරමුණ යටතේ, මූල්‍ය පද්ධතිය තුළ මහජන විශ්වාසය තහවුරු කිරීමේ අවසන් වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. මේ සම්බන්ධයෙන්, මූල්‍ය ආයතනවල සුරක්ෂිත බව සහ ශක්තිමත් බව ප්‍රවර්ධනය කිරීම මඟින් මූල්‍ය පද්ධතිය තුළ හට ගත හැකි ඕනෑම අහිතකර බලපෑමක් අවම කිරීම සඳහා අවසන් ණය ලබා දෙන්නා ලෙස කටයුතු කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කළ යුතු ප්‍රධාන කාර්යභාර අතරින් එකකි.

ශ්‍රී ලංකාවේ බැංකු අංශය සඳහා අවසන් ණය දෙන්නා ලෙස, පද්ධතිමය මූල්‍ය ව්‍යාකූලතාවයක් ඇති කළ හැකි ඕනෑම අහිතකර ප්‍රවණතාවක් මැඩපැවැත්වීම සඳහා මුදල් නීති පනත යටතේ පවතින විධිවිධාන/ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව සතුව බලය පවතින අතර, ඒ සඳහා වගකිව යුතු වේ. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 වසරේ දී මූල්‍ය සහ බැංකු ස්ථාවරත්වය සම්බන්ධයෙන් හට ගන්නා ඕනෑම තර්ජනයක් වැළක්වීමේ අරමුණ ඇතිව මුදල් නීති පනතේ 86 වන වගන්තිය යටතේ, හදිසි ණය සහ අත්තිකාරම් පිළිබඳ රාමුව පිහිටුවන ලදී. ආර්ථිකය වෙත අබාධිත ණය සැපයුමක් තහවුරු කිරීමට සහ සුවිශේෂී අවස්ථාවල දී හදිසි ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා බැංකු ආයතනවල ද්‍රවශීලතා මට්ටම ශක්තිමත් කිරීම සහ එමඟින් මූල්‍ය පද්ධතිය පිළිබඳ මහජන විශ්වාසය පවත්වා ගෙන යෑම, මෙම හදිසි ණය සහ අත්තිකාරම් පිළිබඳ රාමුවෙන් අපේක්ෂිත ප්‍රධාන ප්‍රතිඵල විය.

2022 වසරේ දී, පුළුල් පරාසයකට අයත් ඇප සුරැකුම් ගණනාවක් සහ එම සුරැකුම් සඳහා තක්සේරු කිරීමේ ක්‍රමවේදයක්, ද්‍රවශීලතාව සහ නුබුන්වත්භාවය පිළිබඳ

ඇගයීමේ නිර්ණායක, අධීක්ෂණ ක්‍රියාමාර්ග සහ මෙම හදිසි ණය සහ අත්තිකාරම් පිළිබඳ රාමුව ක්‍රියාත්මක කිරීමෙහි නිරත වී සිටින ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු අතර දියුණු සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ඇතුළත් කිරීම මගින් මෙම රාමුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තවදුරටත් වැඩි දියුණු කරන ලදී.

3.2.2. හදිසි ණය සහ අත්තිකාරම් පිළිබඳව වන රාමුවේ ප්‍රධාන ලක්ෂණ

අ) **සුදුසුකම්ලත් මූල්‍ය ආයතන:** තාවකාලික ද්‍රවශීලතා ආතතියක පසුවන, එමෙන්ම පවත්නා සියලුම ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීමේ විකල්ප භාවිත කර ඇති, සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින්මතු "බලපත්‍රලාභී බැංකු" ලෙස හැඳින්වෙනු ලැබේ).

ආ) **හදිසි ණය සහ අත්තිකාරම් සැපයීම ශ්‍රී ලංකා මහ බැංකුවේ අභිමතය පරිදි සිදු කෙරේ,** එබැවින්, එය බලපත්‍රලාභී බැංකුවල අයිතියක් ලෙස නොසැලකෙනු ඇත.

ඇ) **ව්‍යවහාර මුදල්:** හදිසි ණය සහ අත්තිකාරම් සෑම විටදී ම ශ්‍රී ලංකා රුපියල්වලින් පමණක් සපයනු ලැබේ. විනිමය අනුපාතිකය සම්බන්දයෙන් හට ගත හැකි අවදානම් මෙන්ම ව්‍යවහාර මුදල් නොගැළපීම් සහ ණය ආපසු අය කර ගැනීමේ අවදානම් අවම කර ගැනීම සඳහා මෙම ණය පහසුකම් විදේශ ව්‍යවහාර මුදලින් සපයන්නේ නැත.

ඈ) **පොලී අනුපාතිකය:** පවත්නා වෙළඳපොල පොලී අනුපාතික සහ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සලකා බැලීමෙන් අනතුරුව, මුදල් මණ්ඩලය විසින් පොලී අනුපාතිකය තීරණය කරනු ඇත.

ඉ) **හදිසි ණය සහ අත්තිකාරම් පහසුකම සැපයීම සඳහා පිළිගත හැකි ඇප සුරැකුම්:** ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, ඉඩම් හා ගොඩනැගිලි සහ ඇපකර සහිත ලැබිය යුතු ණයවලින් සමන්විත පිළිගත හැකි ඇප සුරැකුම් ගණනාවක් මේ සඳහා සලකා බලනු ලැබේ.

ඊ) **හදිසි ණය සහ අත්තිකාරම් පහසුකම ලබා දීම පිළිබඳ තක්සේරු කිරීම:** ශ්‍රී ලංකා මහ බැංකු ශේෂ පත්‍රය මත හට ගත හැකි ඕනෑම අහිතකර බලපෑමක් වැළැක්වීමේ අරමුණින්, නුබුන්වත් යැයි සැලකෙන බලපත්‍රලාභී බැංකුවලට පමණක් මෙම ණය පහසුකම සැපයෙනු ඇත. කෙසේ වෙතත්, හදිසි ණය සහ අත්තිකාරම් ඉල්ලනු ලැබූ බැංකුවට ප්‍රමාණවත් ඇපකර නැති අවස්ථාවකදී, ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකා මහා බැංකුවට දෙනු ලැබූ පැහැදිලි ඇපකරයක් මත, පද්ධතිමය අවදානමක් අවම කිරීම අවශ්‍ය වන්නා වූ සුවිශේෂී තත්ත්වයන් යටතේ, එක් එක් සිදුවීම මත පදනම්ව, මෙම හදිසි ණය පහසුකම බුන්වත් හෝ අනාගතයේ දී බුන්වත්බවට පත් වීමට ඉඩ ඇතැයි තක්සේරු කළ බැංකුවක් වෙත ද පිරිනැමීමේ හැකියාව ඇත.

උ) **හදිසි ණය සහ අත්තිකාරම් පහසුකම ලබාගන්නා බැංකු සඳහා ශ්‍රී ලංකා මහා බැංකුව විසින් අනුගමනය කරන්නා වූ අධීක්ෂණ ක්‍රියාමාර්ග:** හදිසි ණය සහ අත්තිකාරම් පහසුකම ලබන බැංකු ශ්‍රී ලංකා මහ බැංකුවේ දැඩි අධීක්ෂණයට යටත් වනු ඇති අතර එම බැංකුවල ණය කළඹ ප්‍රසාරණය කිරීම සහ අභිමතානුසාරී ගෙවීම් සිදු කිරීමට අදාළව සීමාවන් පනවනු ලැබේ.

3.2.3. බැංකුවල නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, බැංකු අංශයෙහි අභියෝගාත්මක ඉදිරි දැක්ම සහ මූල්‍ය අංශයෙහි ආරක්ෂණ ජාල සම්බන්ධයෙන් පවතින ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව සලකා බලමින්, අර්බුද කළමනාකරණ රාමුව යටතේ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු ප්‍රමුඛ අංගයක් ලෙස බලපත්‍රලාභී බැංකුවල නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම හඳුනා ගන්නා ලදී. ඒ අනුව, නිරාකරණය, තැන්පතු රක්ෂණය සහ බලපත්‍රලාභී බැංකු වසා දැමීමට අදාළ විධිවිධාන ඇතුළත් කරමින් 1988 අංක 30 දරන බැංකු පනතට පරිපූරකයක් ලෙස බැංකු (විශේෂ විධිවිධාන) පනත කෙටුම්පත් කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු (විශේෂ විධිවිධාන) පනත කෙටුම්පත් කිරීමේ දී මූල්‍ය ස්ථාවරත්ව මණ්ඩලය (Financial Stability Board) විසින් මූල්‍ය ආයතන සඳහා නිකුත් කරන ලද සඵලදායී නිරාකරණ තන්ත්‍රයන්හී ප්‍රධාන ලක්ෂණ සහ තැන්පතු රක්ෂණ කරුවන්ගේ ජාත්‍යන්තර සංගමය (International Association of Deposit Insurers) විසින් නිකුත් කරන ලද සඵලදායී තැන්පතු රක්ෂණ ක්‍රම සඳහා වන ප්‍රධාන මූලධර්ම සලකා බලන ලදී. මෙම යෝජිත බැංකු (විශේෂ විධිවිධාන) පනත 2023 වසරේ දී ක්‍රියාත්මත කිරීමට අපේක්ෂිත ය.

3.2.4. අර්බුද කළමනාකරණ කමිටුවක් පිහිටුවීම

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පවතින මූල්‍ය සහ ආර්ථික තත්වයන් වල පෙර නොවූ විරූ මට්ටමේ පීඩාවන්, මූල්‍ය අංශයේ පාලන අධිකාරීන් අතර අර්බුද කළමනාකරණයට අදාළ ප්‍රතිපත්ති සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමේ හදිසි අවශ්‍යතාවක් පැන නැගීමට හේතු සාධක විය. ශ්‍රී ලංකාව තුල මෙතෙක් අර්බුද කළමනාකරණය සඳහා ආයතනික රාමුවක් නොමැති වීම, අර්බුද සඳහා සූදානම් වීම සඳහා ශ්‍රී ලංකා මහා බැංකුව සහ මුදල් අමාත්‍යාංශය අතර ප්‍රතිපත්ති සම්බන්ධීකරණ බිඳ වැටීමේ

අවදානම අඩු කිරීම, සහ මූල්‍ය අර්බුදයේ බලපෑම අවම කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය අතර "මූල්‍ය අංශය සඳහා වූ අර්බුද කළමනාකරණ කමිටුවක්" (FCMC) පිහිටුවීම සඳහා හේතු වී ඇත. මූල්‍ය අංශයෙහි අර්බුද කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුව (TCMC) විසින් යෝජිත මූල්‍ය අංශය සඳහා වූ අර්බුද කළමනාකරණ කමිටුව (FCMC) වෙත සහාය ලබා දෙනු ඇති අතර, මෙම යෝජිත කමිටු අර්බුද පවතින මෙන්ම අර්බුද නොපවතින කාලයන්හි දී ද ක්‍රියාත්මක වනු ඇත. මූල්‍ය අංශය සඳහා වූ අර්බුද කළමනාකරණ කමිටුවෙහි (FCMC) මූලසුන මහ බැංකු අධිපතිතුමන් විසින් දරනු ඇති අතර මුදල් මණ්ඩලයෙහි සාමාජිකයෙකු, භාණ්ඩාගාර ලේකම් තුමා, මුදල් අමාත්‍යාංශයේ නියෝජ්‍ය ලේකම් තුමා සහ ශ්‍රී ලංකා මහා බැංකුවේ නිලධාරීන් මෙම කමිටුවේ සාමාජිකත්වය දරනු ඇත.

3.2.5. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන වැඩි දියුණු කළ අධීක්ෂණ ප්‍රවේශ

මෑත කාලීනව බැංකු අංශයට අදාළව සිදු වූ සාර්ව ආර්ථික තත්වයන්ගේ බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණ ක්‍රියාමාර්ග තීව්‍ර කරන ලද අතර ඒ යටතට බලපත්‍රලාභී බැංකුවල මූල්‍ය නිර්ණායකයන් සමීපව සුපරීක්ෂණය කිරීම, තෝරාගත් බැංකු කාර්යයන් විස්තරාත්මකව සමාලෝචනය කිරීම සහ ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමනාකරණ කාර්යයන්හී නිරත වන නිලධාරීන් සමඟ එම බැංකුවල ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන තත්වයන් පිළිබඳව නිරන්තරයෙන් සාකච්ඡා පැවැත්වීම අන්තර්ගත වේ. තවද, බැංකු වල තත්වයන් සහ අර්බුද සඳහා ඇති පෙර සූදානම හොඳින් අවබෝධ කරගැනීම පිණිස මුදල් මණ්ඩලය විසින් අඛණ්ඩව බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂක මණ්ඩල, ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමනාකරණ කාර්යයන්හී නිරත වන නිලධාරීන් සමඟ නිරන්තර සාකච්ඡා පවත්වන ලදී.

3.2.6 සන්නිවේදන උපායමාර්ග:

බැංකු අංශයෙහි ස්ථාවරත්වය පිළිබඳ මහජන විශ්වාසය තහවුරු කිරීම පිණිස, අර්බුද සඳහා පෙර සුදනමෙහි ඇති පුළුල් පැතිකඩයන් ආවරණය කරමින් වර්තමානයේ පවත්නා සන්නිවේදන උපායමාර්ග තවදුරටත් පුළුල් කර ඇත.

ඉදිරි ගමන්මග: ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අර්බුද සඳහා වූ පෙර සූදානම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂා කරන අතර මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය පිළිබඳ මහජන විශ්වාසය තහවුරු කිරීමේ අරමුණින් යෝජිත බැංකු (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීම සහ බලපත්‍රලාභී බැංකු වෙත හදිසි ණය සහ අත්තිකාරම් සැපයීමේ සූදානම සහතික කිරීම ද ඉදිරියේදී අපේක්ෂා කෙරේ.

මූලාශ්‍ය

1. International Monetary Fund. (2020). Managing Systemic Banking Crises - New Lessons and Lessons Relearned. Departmental Paper No. 2020/003. International Monetary Fund, Washington D.C.

ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහත වැටීම්වල බලපෑම පිළිබිඹු කරමින් 2022 වසරේ දී විදේශ විනිමය ණය ගැනීම් සියයට 55.2කින් අඩු වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇති අතර 2022 වසරේ දී රුපියල් ණය ගැනීම් ද සියයට 11.5ක, එනම් රුපියල් බිලියන 171.5ක පහත වැටීමක් වාර්තා කළේය.

අභියෝගාත්මක ව්‍යාපාරික වාතාවරණය හමුවේ ශේෂ පත්‍රයෙන් බාහිර නිරාවරණ 2021 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 131.5ක එනම් සියයට 2.7ක පහළ යෑමට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 26.3ක එනම් සියයට 0.6ක පහළ යෑමක් පෙන්නුම් කළේය. ප්‍රතිග්‍රහණ, ලේඛිත ණය, විදේශ විනිමය විකුනුම්, සහ විදේශ විනිමය මිලදී ගැනීම්වල, පිළිවෙලින්, රුපියල් බිලියන 318.3, රුපියල් බිලියන 204.2, රුපියල් බිලියන 172.4, සහ රුපියල් බිලියන 171.7ක සැලකිය යුතු පහළ යෑමක් නිරීක්ෂණය කරන ලදී. මේ අතර, භාවිත නොකළ ණය සීමා හා ඇපකර සහ බැඳුම්කර 2022 වසර තුළ දී පිළිවෙලින්, රුපියල් බිලියන 470.9ක සහ රුපියල් බිලියන 122.6ක වර්ධනයක් වාර්තා කළේය.

බැංකු අංශයේ අවදානම්

ණය අවදානම

අඛණ්ඩව පැවති අහිතකර ව්‍යාපාරික තත්ත්වයන් හේතුවෙන් පීඩාවට පත් වූ පුද්ගලයන් සහ ඇතැම් අංශවල ව්‍යාපාර වෙනුවෙන් ලබා දෙන ලද ණය පමා කාලයන් සහ ණය සහන සඳහා 2022 වසර තුළ දී දීර්ඝ කිරීම් කිහිපයක් ලබා දෙන ලදී. ඒ අනුව, ණය සහන කාලසීමාව තුළ දී අක්‍රීය කාණ්ඩ වෙත ණය හා අත්තිකාරම් වර්ගීකරණය කිරීම අත්හිටුවූ අතර, ණය සහන අවසන් වීමෙන් පසු සාමාන්‍ය වර්ගීකරණ නීති ක්‍රියාත්මක විය. කෙසේ වුවද, අපේක්ෂිත ණය හානි (Expected Credit Losses) ඇස්තමේන්තු කිරීම සඳහා ඉහළ අවදානමක් සහිත අංශ හඳුනාගැනීම බැංකු විසින් අඛණ්ඩව සිදු කරන ලදී. ණය සහන කාලය තුළ දී ණය පහසුකම් ණය අවදානම අනුව වර්ගීකරණය අත්හිටුවා තිබුන ද, අදියර 3 යටතේ පවතින ණය (භාවිතා නොකළ ණය සීමා ඇතුළුව) මගින් පෙන්නුම් කරන අක්‍රීය ණය (Non-Performing Loans -NPLs),

8.3 රූප සටහන
බැංකු අංශයේ අදියර 3 යටතේ පවතින ණය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2021 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 20.1ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 53.6ක, එනම් රුපියල් බිලියන 447.3ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් ට්‍රිලියන 1.3ක් දක්වා ළඟා විය.

අදියර 3 යටතේ පවතින ණයවල ඉහළ වර්ධනය සහ සමස්ත ණයවල අඩු වර්ධනය හේතුවෙන් සමස්ත ණයට අදියර 3 යටතේ පවතින ණයවල අනුපාතය (භාවිතා නොකළ ණය සීමා ඇතුළුව) මගින් පෙන්නුම් කරන අක්‍රිය ණය අනුපාතය (NPL ratio) 2021 වසර අවසානයේ සියයට 7.6 සිට 2022 වසර අවසානයේ සියයට 11.3ක් දක්වා වර්ධනය විය. මේ අතර සමස්ත ණය හානිකරණය (Impairment) වසර තුළ දී සියයට 60.6ක වර්ධනයක් වාර්තා කරමින් 2022 වසර අවසානයේ දී රුපියල් බිලියන 909ක් දක්වා ඉහළ යන ලදී.

බැංකු අංශයේ සමස්ත ණය කළඹෙන් සියයට 68.2ක් පරිභෝජන, ඉදිකිරීම්, තොග හා සිල්ලර වෙළඳාම්, නිෂ්පාදන සහ යටිතල පහසුකම් සංවර්ධනය යන

8.4 රූප සටහන
බැංකු අංශයේ ණය සහ අත්තිකාරම් සඳහා වෙන් කිරීම්



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8.5 සංඛ්‍යා සටහන
බැංකු අංශයේ ණය සහ අත්තිකාරම් සංයුතිය

අංශය	වටිනාකම රුපියල් බිලියන (අ)	මුළු ණයෙන් ප්‍රතිශතයක් ලෙස (%)	සමස්ත ණයවලට අදියර iii යටතේ පවතින ණය (%)
පරිභෝජන	1,864.4	16.4	4.7
ඉදිකිරීම්	1,795.5	15.8	16.1
තොග හා සිල්ලර වෙළඳාම	1,716.3	15.1	12.8
නිෂ්පාදන	1,243.9	11.0	14.7
යටිතල පහසුකම් සංවර්ධනය	1,115.3	9.8	4.8
කෘෂිකර්ම, වන සම්පත් හා ධීවර	920.3	8.1	11.8
විදේශ අංශය සඳහා ණය දීම්	593.4	5.2	6.1
සංචාරක	525.7	4.6	23.4
මූල්‍ය සේවාවන්	458.9	4.0	5.5
සෞඛ්‍ය, සමාජ සේවා හා සහාය සේවාවන්	400.2	3.5	7.4
ප්‍රවාහනය හා ගබඩා කිරීම	302.7	2.7	26.1
වෘත්තීය, විද්‍යාත්මක සහ කාර්මික කටයුතු	133.2	1.2	7.0
මුදල් අමාත්‍යාංශයට ණය දීම්	109.2	1.0	-
තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන සේවාවන්	81.0	0.7	10.9
අධ්‍යාපන	65.1	0.6	12.5
කලා, විනෝදය සහ විනෝදාත්මක	12.8	0.1	12.7
මුළු ණය	**11,337.9**	**100.0**	**11.1**

(අ) තාවකාලික
මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ආර්ථික අංශ 5 වෙත කේන්ද්‍රගත වී තිබුණි. ප්‍රවාහනය හා ගබඩා කිරීම, සංචාරක, ඉදිකිරීම්, නිෂ්පාදන, තොග හා සිල්ලර වෙළඳාම, කලා, විනෝදය හා රසාස්වාදය සහ අධ්‍යාපන අංශයන්හි සමස්ත ණයවලට අදියර 3 යටතේ පවතින ණයවල අනුපාතය, 2022 වසර අවසන් වන විට පැවති බැංකු අංශයේ සමස්ත ණයවලට අදියර 3 යටතේ පවතින ණයවල අනුපාතය (භාවිතා නොකළ ණය සීමා රහිතව) වන සියයට 11.1ට වඩා ඉහළ අගයක් වාර්තා කරන ලදී. බැංකු ක්ෂේත්‍රය වැඩි වශයෙන් නිරාවරණය වී ඇති ඇතැම් ආර්ථික අංශ සමස්ත ණයවලට අදියර 3 යටතේ පවතින ණය ඉහළ අනුපාතයන් වාර්තා කර ඇති බැවින් බැංකු විසින් අභ්‍යන්තරව වඩාත් දැඩි ණය අවදානම් අවම කිරීමේ යාන්ත්‍රණයන් අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වෙළඳපොළ අවදානම

පොලී අනුපාතය පිළිබඳ සංවේදිතා අනුපාතය[2] 2021 වසර අවසන් වන විට පැවති සියයට 79.6ක අගයේ සිට 2022 වසර අවසන් වන විට සියයට 76.3 දක්වා පහත වැටුණු අතර එමගින් 2021 වසරට

2 මෙය ගණනය කරනු ලබන්නේ මාස 12ට අඩු කල්පිරීම් සහිත පොළී දරන වත්කම්, පොළී දරන වගකීම්වල ප්‍රතිශතයක් ලෙස දක්වමින් ය.

8

සාපේක්ෂව 2022 වසරේ දී පොලී අනුපාත අවදානමට නිරාවරණය ඉහළ ගියේය. ලාභ සහ අලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකම ගණනය වන ආයෝජනයන්හි ශුද්ධ ලාභය 2022 වසරේ දී රුපියල් බිලියන 11.5ක් වූ අතර, එය 2021 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 2.4ට සාපේක්ෂව ඉහළ අගයකි. වසර තුළ රාජ්‍ය සුරැකුම්පත්වල පැවති ඉහළ ඵලදා අනුපාතිකවල ප්‍රතිඵලයක් ලෙස, 2021 වසරට සාපේක්ෂව 2022 වසර තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙත වැඩිපුර අරමුදල් යොමු කිරීම මීට ප්‍රධාන වශයෙන් හේතු විය.

2022 වසර තුළ දී කොටස් මිල විචලනය වීම මගින් බැංකු අංශය වෙත ඇති වූ අවදානම අවම මට්ටමක පැවතුණි. 2022 වසර අවසන් වන විට ලාභ සහ අලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකම ගණනය වන ආයෝජන කළඹේ සහ වෙනත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකම ගණනය වන ආයෝජන කළඹේ කොටස් වෙළඳපොළ ආයෝජනවල වටිනාකම, පිළිවෙලින්, රුපියල් බිලියන 7.4ක් සහ රුපියල් බිලියන 2.2ක් විය. බැංකු අංශයේ සමස්ත ආයෝජන කළඹ තුළ කොටස් වෙළඳපොළ ආයෝජන අවම වීම, කොටස් මිල උච්චාවචනයන් හේතුවෙන් ඇතිවන වෙළඳපොළ අවදානම අවම කරයි.

බැංකු අංශයේ ශුද්ධ විදේශ විනිමය නිරාවරණය, 2021 වසරේ පැවති එ.ජ. ඩොලර් මිලියන 133.2ක අතිරික්ත විදේශ විනිමය නිරාවරණයට සාපේක්ෂව 2022 වසර අවසානයේ එ.ජ. ඩොලර් මිලියන 659.4ක අතිරික්ත විදේශ විනිමය නිරාවරණයක් වාර්තා කරන ලදී. 2022 වසරේ දී විදේශ මුදලින් රැස් කරන ලද ශේෂ පත්‍ර වත්කම්වල අඩුවීමට සාපේක්ෂව විදේශ මුදලින් නිදහස් කළ යුතු ශේෂ පත්‍ර වගකීම් ඉහළ අගයකින් අඩු වීම ශුද්ධ විදේශ විනිමය නිරාවරණයන්හි අතිරික්තය වර්ධනය වීමට දායක විය. විදේශ මුදලින් රැස් කරන ලද ශේෂ පත්‍ර වත්කම් අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වසර තුළ දී විදේශ විනිමය ණය සහ අනෙක් බැංකුවල තැන්පත් කිරීම් පහළ යාමයි. ඒ අනුව, ශුද්ධ විදේශ විනිමය නිරාවරණ, බැංකුවල ශේෂ පත්‍රයේ වූ මුළු විදේශ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස 2022 වසර අවසානය වන විට සියයට 4.7ක අගයක් වාර්තා කළේය. බැංකු අංශය 2021 වසරේ දී වාර්තා කළ ප්‍රත්‍යාගණන (revaluation) ලාභය වූ රුපියල් බිලියන 26.3ට සාපේක්ෂව 2022 වසර තුළ දී රුපියල් බිලියන 28.1ක ශුද්ධ විදේශ මුදල් ප්‍රත්‍යාගණන ලාභයක් වාර්තා කළේය.

ද්‍රවශීලතා අවදානම

බැංකු අංශය 2022 වසර තුළ දැඩි ද්‍රවශීලතා පීඩනයකට මුහුණ දුන්නේය. බැංකු අංශය විසින් දේශීය මෙහෙයුම් අංශවල ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය ඒ සඳහා අවම අවශ්‍යතාවය වන සියයට 20ට ඉහළින් පවත්වා ගනු ලැබුව ද එය 2021 වසර අවසානයේ දී පැවති සියයට 33.8 සිට 2022 වසර අවසානයේ දී සියයට 29.9ක් දක්වා පහත වැටුණි. වසර තුළ ඇතැම් දේශීය බැංකු ඔවුන්ගේ දෛනික ද්‍රවශීලතා කළමනාකරණය සඳහා මහ බැංකුව විසින් සපයන ලද ස්ථාවර පහසුකම මත දැඩි ලෙස රඳා පැවතුණි. 2022 වසරේ දී ණයවල අඩු වර්ධනය හේතුවෙන්, තැන්පතු හා ණය ගැනීම්වලට ණය ලබා දීම් අනුපාතය සුළු වශයෙන් පහත වැටුණ අතර, මුළු වත්කම්වලට ද්‍රවශීලතා වත්කම් අනුපාතය සහ තැන්පතුවලට ද්‍රවශීලතා වත්කම් අනුපාතය ද අඩු වීමක් වාර්තා කළේය.

2022 වසර අවසානය වන විට බැංකු අංශයේ රුපියල් සහ සියලු මුදල් ඒකක සඳහා අදාළ ද්‍රවශීලතා ආවරණ අනුපාත, පිළිවෙලින්, සියයට 237.5ක් හා සියයට 191.2ක් වශයෙන්, ඒවා පවත්වා ගත යුතු අවම නියාමන අවශ්‍යතාවය වන සියයට 90ට වඩා ඉහළ අගයක පැවතුණි. ද්‍රවශීලතා ආවරණ අනුපාතය යනු ද්‍රවශීලතා ආතති තත්වයක් යටතේ දින 30ක කාල සීමාවක් තුළ බැංකුවක ද්‍රවශීලතා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ද්විතීයික වෙළඳපොළේ පහසුවෙන් සහ ඉක්මනින් මුදල් බවට පත් කරගත හැකි, නිදහස් සහ ගුණාත්මකභාවයෙන් ඉහළ ද්‍රවශීල වත්කම් වේ. මීට අමතරව, බැංකුවලට ප්‍රමාණවත් ලෙස ස්ථායී අරමුදල් මූලාශ්‍ර පවත්වා ගැනීම සඳහා 2019 වසරේ දී හඳුන්වා

8.5 රූප සටහන
බැංකු අංශයේ ද්‍රවශීලතා අනුපාත



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

8.6 සංඛ්‍යා සටහන

බැංකු අංශයේ ද්‍රවශීල වත්කම්වල සංයුතිය

අයිතමය	2021 (අ)		2022 (ආ)		වෙනස (රු. බිලියන)	
	රු. බිලියන	ප්‍රතිශතය (%)	රු. බිලියන	ප්‍රතිශතය (%)	2021 (අ)	2022 (ආ)
භාණ්ඩාගාර බිල්පත්	1,040.6	20.8	982.6	18.5	-109.3	-58.0
භාණ්ඩාගාර බැඳුම්කර	2,142.3	42.9	1,887.8	35.6	457.1	-254.5
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	577.0	11.5	466.2	8.8	-78.8	-110.9
මුදල්	231.8	4.6	273.3	5.2	28.7	41.6
ඒක්ෂණ මුදල්	177.2	3.5	385.5	7.3	-160.5	208.4
විදේශ බැංකු ගිණුම්වල ශේෂයන්	538.9	10.8	1,144.4	21.6	69.0	605.5
වෙනත්	290.3	5.8	161.6	3.0	-203.3	-128.7
ද්‍රවශීල වත්කම්වල එකතුව	**4,998.0**	**100.0**	**5,301.4**	**100.0**	**2.9**	**303.4**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

දුන් ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය සියයට 140.8ක්ව පැවතුණු අතර එය අවම නියාමන අවශ්‍යතාවය වන සියයට 90ට වඩා ඉහළ අගයක පැවතුණි. 2022 වසර අවසානය වන විට මුළු ද්‍රවශීල වත්කම් ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 5.3ක් වූ අතර එයින් සියයට 62.9ක්ම රාජ්‍ය සුරැකුම්පත්වල කර තිබූ ආයෝජන වේ. 2022 වසර ආරම්භයේදී පරිණත පරතරයන් අධීක්ෂණය කිරීම සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වාදෙන ලදී. ඒ අනුව, දිගු කාලීන වත්කම් සඳහා කෙටි කාලීන අරමුදල් ප්‍රභව හරහා අරමුදල් සපයා ගත් බව පෙන්නුම් කරමින් මාස 12ට අඩු පරිණත කාලයන් සඳහා, සමුච්චිත පරිණත පරතරය, සමුච්චිත පිටතට ගලායාම්වල ප්‍රතිශතයක් ලෙස ඉහළ අගයක් පෙන්නුම් කළේය. අවම ද්‍රවශීලතා අවශ්‍යතාවයන් සපුරාලීමට බැංකු සමත් වුවද පරිණත පරතරය විශාල ලෙස පුළුල් වීම ද්‍රවශීලතා අවදානම ඉහළ යාමට හේතු විය හැකිය.

8.6 රූප සටහන

සමුච්චිත පරිණත කාලය බැංකු අංශයේ සමුච්චිත පිටතට ගලා යාමේ ප්‍රතිශතයක් ලෙස



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ලාභදායීත්වය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය

ණය හානිකරණය ඉහළ යෑම හේතුවෙන් වසර තුළ දී ලාභදායීත්වය අඩු විය. 2022 වසර තුළ වාර්තා වූ පොලී ආදායම සියයට 74.7කින් වැඩිවීම සහ පොලී වියදම සියයට 106.2කින් වැඩිවීම හේතුවෙන් බැංකු අංශයේ ශුද්ධ පොලී ආදායම සියයට 37.8කින් වර්ධනය වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2021 වසර අවසානයේ සියයට 3.5ක්ව පැවති ශුද්ධ පොලී ආන්තිකය, 2022 වසරේ දී සියයට 4.0ක් දක්වා වර්ධනය විය. 2022 වසරේ දී ශුද්ධ පොලී ආදායම රුපියල් බිලියන 207.7කින් වර්ධනය වූ අතර, ඉහළ ගාස්තු සහ කොමිස් ආදායම හේතුවෙන් පොලී නොවන ආදායම රුපියල් බිලියන 124.1කින් 2022 වසරේ දී ඉහළ ගොස් ඇත. රුපියල් බිලියන 26.8කින් සේවක පිරිවැය ඉහළ යෑම

8.7 සංඛ්‍යා සටහන

බැංකු අංශයේ ලාභදායීත්වය

අයිතමය	2021 (අ)		2022 (ආ)	
	වටිනාකම (රු. බිලියන)	සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස	වටිනාකම (රු. බිලියන)	සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස
ශුද්ධ පොලී ආදායම	**549.9**	**3.5**	**757.6**	**4.0**
පොලී ආදායම	1,193.8	7.5	2,085.2	11.0
පොලී වියදම	643.9	4.1	1,327.6	7.0
පොලී නොවන ආදායම	**152.9**	**1.0**	**277.0**	**1.5**
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	88.6	0.6	127.5	0.7
පොලී නොවන වියදම	**266.8**	**1.7**	**325.9**	**1.7**
සේවක පිරිවැය	147.0	0.9	173.8	0.9
ණය සහ වෙනත් අලාභ සඳහා වෙන්කිරීම්	**157.6**	**1.0**	**456.1**	**2.4**
බදු පෙර ලාභය (එකතු කළඅගය මත බදු අඩු කළ පසු)	**227.5**	**1.4**	**192.2**	**1.0**
බදු පසු ලාභය	**172.1**	**1.1**	**150.2**	**0.8**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

8.7 රූප සටහන
බැංකු අංශයේ ලාභදායීත්ව දර්ශක



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8.8 රූප සටහන
බැංකු අංශයේ ප්‍රාග්ධන අනුපාත



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රධාන වශයෙන් හේතුකොට ගෙන පොළී නොවන වියදම රුපියල් බිලියන 59.1කින් ඉහළ ගිය අතර, ණය හානිකරණ සහ අනෙකුත් අලාභ වෙන් කිරීම් 2022 වසරේ දී රුපියල් බිලියන 298.5කින් ඉහළ ගියේය. ඒ අනුව, 2022 වසර සඳහා වන බදු පෙර ලාභය නියාමන වාර්තාකරණයට අනුව රුපියල් බිලියන 192.2ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව රුපියල් බිලියන 35.3ක අඩු වීමකි.

2022 වසර තුළ දී බැංකු අංශයෙහි බදු පසු ලාභය රුපියල් බිලියන 150.2ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව සියයට 12.7ක අඩු වීමකි. ගිණුම්කරණ නම්‍යශීලීබාවයක් ලබා දෙමින් වෙනත් විස්තීර්ණ ආදායම් කළඹ හරහා සාධාරණ වටිනාකම ගණනය වන කළඹේ සිට ක්‍රමක්ෂිත පිරිවැය මත ගණනය වන කළඹ වෙත ආයෝජන එක් වරක් පමණක් නැවත වර්ගීකරණය කිරීමට ඉඩ ලබා දීම මගින් බැංකුවල ස්ථාවර ආදායම් කළඹ මත පොළී අනුපාතිකවල විචලනයන් හේතුවෙන් ඇති විය හැකි අලාභ තරමක් දුරට අවම විය. මෙම ලාභයෙහි අඩුවීම, වත්කම් මත ප්‍රතිලාභ (බදු පෙර) අනුපාතය 2021 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 1.4 සිට 2022 වසර අවසානය වන විට සියයට 1.0 දක්වා අඩු වීම මෙන්ම හිමිකම් මත ප්‍රතිලාභ (බදු පසු) අනුපාතය 2021 වසරේ දී පැවති සියයට 13.4 සිට 2022 වසරේ දී සියයට 10.2 දක්වා අඩු වීම තුළින් ද පිළිබිඹු විය. තවද, ශුද්ධ පොළී ආදායම සහ පොළී නොවන ආදායම ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ දී සියයට 38.0ක් වූ කාර්යක්ෂමතා අනුපාතය 2022 වසර වන විට සියයට 31.5ක් දක්වා පහළ ගියේය.

සමස්තයක් වශයෙන්, 2022 වසර අවසානයේ දී ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට අනුකූල වීමට බැංකු අංශය සමත් විය. කෙසේ වුවද, පවතින සාර්ව ආර්ථික තත්ත්වයන් තුළ නව ප්‍රාග්ධනය උත්පාදනය කරගැනීම සඳහා පවතින අභියෝග සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී දේශීය වාණිජ බැංකු සඳහා රුපියල් බිලියන 20.0ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා රුපියල් බිලියන 7.5ක් වූ අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීමට ලබා දී තිබූ දින නියමයන් 2023 වසරේ දෙසැම්බර් මාසය දක්වා දීර්ඝ කරන ලදී. අභියෝගාත්මක ව්‍යාපාරික තත්ත්වයන් මගින් පැන නගින අවදානම් හේතුවෙන් සිදු විය හැකි අලාභ අවශෝෂණය කර ගැනීම පිණිස උසස් තත්ත්වයේ ප්‍රාග්ධනය එක් රැස් කිරීමට බැංකු දිරිමත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 වසර තුළ දී බැංකු විසින් ලාභ රඳවා ගැනීම් (රුපියල් බිලියන 64.0ක්), සංචිත ඉහළ

8.8 සංඛ්‍යා සටහන
බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධන සංයුතිය

අයිතමය	වටිනාකම (රු. බිලියන)		සංයුතිය (%)	
	2021 (අ)	2022 (ආ)	2021 (අ)	2022 (ආ)
ප්‍රථම ස්ථරය : ප්‍රාග්ධන	**1,083.8**	**1,152.0**	**100.0**	**100.0**
කොටස් ප්‍රාග්ධනය	352.1	366.7	32.5	31.8
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල්	66.7	74.3	6.2	6.4
නොබෙදූ ලාභ	480.5	544.5	44.3	47.3
පොදු හා අනෙකුත් සංචිත	250.5	295.2	23.1	25.6
වෙනත්	21.6	67.2	2.0	5.8
නියාමක ගැලපීම්	-87.5	-195.9	-8.1	-16.9
දෙවන ස්ථරය : ප්‍රාග්ධන	**279.8**	**278.0**	**100.0**	**100.0**
ප්‍රත්‍යාගණන සංචිත	35.3	35.4	12.6	12.7
උපකාරක ණය	160.2	135.4	57.2	48.7
පොදු වෙන්කිරීම් සහ වෙනත්	84.7	107.3	30.3	38.6
නියාමක ගැලපීම්	-0.4	-0.2	-0.1	-0.1
සමස්ත නියාමන ප්‍රාග්ධන පදනම	**1,363.6**	**1,429.9**		

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නැංවීම (රුපියල් බිලියන 44.7ක්) සහ නව කොටස් නිකුත් කිරීම (රුපියල් බිලියන 14.6ක්) හරහා පළමු ස්ථර ප්‍රාග්ධනය ඉහළ නංවාගෙන ඇත. වසර තුළ දී බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධනය සියයට 4.9කින් වර්ධනය වූ අතර, එයට පළමු ස්ථර ප්‍රාග්ධනයේ වර්ධනය වැඩි දායකත්වයක් දැක්වීය.

2022 වසර තුළ බැංකු අංශයේ අධීක්ෂණ සහ නියාමන ප්‍රවණතා

2022 වසර තුළ දී මහ බැංකුව විසින් පවතින කැළඹිලි සහිත සාර්ව ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීමට රෙගුලාසි නිකුත් කිරීම සහ අධීක්ෂණ ප්‍රවේශය ශක්තිමත් කිරීම ඇතුළු විචක්ෂණශීලී ප්‍රතිපත්තිමය මැදිහත්වීම් කිහිපයක් සිදු කරන ලදී. මේ අතර, විවිධ අභියෝග මධ්‍යයේ බැංකු අංශයේ ද්‍රවශීලතාව පවත්වා ගැනීම සඳහා සහ ඵලදායී මූල්‍ය අතරමැදිකරණයක් සඳහා පහසුකම් සැලසීමට ඇතැම් නියාමනයන් සුපරීක්ෂාකාරීව ලිහිල් කිරීමට ද මහ බැංකුව විසින් කටයුතු කරන ලදී.

ඒ අනුව, වත්මන් සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ඇති වී තිබෙන සුවිශේෂී තත්ත්වයන් සුපරීක්ෂාකාරීව සලකා බැලීමෙන් අනතුරුව මහ බැංකුව විසින් ඇතැම් නියාමන අවශ්‍යතා හඳුන්වා දෙන ලදී. ඒ අතරට, ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය (Capital Conservation Buffer) භාවිතා කිරීමට අවසර ලබා දීම, අවම ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) සහ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය (NSFR) සඳහා වන අවම නියාමන අවශ්‍යතා අඩු කිරීම, රාජ්‍ය සුරැකුම්පත්වලට අදාළව වෙළඳපොළ මිල මත ලකුණු කළ අලාභය වසර දෙකක කාලයක් තුළ ගැළපීමට අවසර ලබා දීම, බලපත්‍රලාභී බැංකුවල ප්‍රාග්ධන අනුපාතයන් ගණනය කිරීමේ දී මෙහෙයුම් අවදානමට අදාළව අවදානම මත බර තැබූ වත්කම් ගණනය කිරීම සඳහා වැඩිදියුණු කළ ක්‍රියාමාර්ග වෙත මාරු වීමට ඉඩ ලබා දීම සහ අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීමේ ක්‍රියාවලියට අදාළ වාර්තාව භාර දීම සඳහා නියමිත කාලසීමාවන් දීර්ඝ කිරීම යනාදිය ඇතුළත් වේ. තවද, නැවත දැනුම් දෙන තුරු සමස්ත බැංකුව සඳහා ඒකාබද්ධ පදනමින් ගැළපුම් කළ මුළු වගකීම්වලින් සියයට 20කට නොඅඩු අගයක ද්‍රවශීල වත්කම් පවත්වා ගත යුතු බවට බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. එලෙසම, සමීප අධීක්ෂණය සහ නිරන්තර වාර්තා කිරීම් සමඟින් 2022 වසරේ දෙසැම්බර් අවසානය දක්වා අවම වශයෙන් සියයට 90කට නොඅඩු ද්‍රවශීලතා ආවරණ සහ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාත පවත්වා ගෙන යාමට බලපත්‍රලාභී බැංකු සඳහා අවසර ලබා දෙන ලදී.

තවද, පවතින සාර්ව ආර්ථික තත්ත්වයන් යටතේ බලපත්‍රලාභී බැංකුවල ද්‍රවශීලතාවය සහ අනෙකුත් ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් මත ඇතිවිය හැකි අයහපත් බලපෑම සැලකිල්ලට ගනිමින් සහ බලපත්‍රලාභී බැංකු විසින් පවත්වාගත යුතු ද්‍රවශීලතා මට්ටම් සහ ප්‍රාග්ධන ස්වාරක්ශකයන්හි වැදගත්කම සැලකිල්ලට ගනිමින් වාණිජ බැංකුවල අභිමතානුරූපී ගෙවීම් සීමා කිරීම නැවත හඳුන්වා දෙන ලදී. ඒ අනුව සියලුම බලපත්‍රලාභී බැංකු විසින් 2022 වසර සඳහා වන වාර්ෂික/කාර්තුමය මූල්‍ය වාර්තා අවසන් කර බාහිර විගණනය ද අවසන් වන තුරු මුදල් ලාභාංශ ගෙවීම් සහ ප්‍රකාශයට පත් කර නොමැති ලාභ මෙරටින් බැහැර කිරීම් ප්‍රමාද කළ යුතු වේ. මීට අමතරව, සියලුම බලපත්‍රලාභී බැංකු තම බැංකුවේම කොටස් නැවත මිලදී ගැනීම, කළමනාකාර දීමනා සහ අධ්‍යක්ෂ මණ්ඩල ගෙවීම් ඉහළ දැමීම සහ අත්‍යාවශ්‍ය නොවන සහ/හෝ හදිසි නොවන වියදම් යනාදිය සිදුකිරීමෙන් වැළකී සිටීමට මෙන්ම 2022 වසර අවසානය වන තෙක් ප්‍රාග්ධන වියදම් සිදු කළ යුතු අවස්ථාවල ඉතාමත් සුපරීක්ෂාකාරීව සහ විචක්ෂණශීලීව කටයුතු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී.

මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ විනිමය අනුපාතික විචලනයන් සැලකිල්ලට ගනිමින්, විදේශ මුදල් තැන්පතු ඇතුළු බලපත්‍රලාභී බැංකුවල ණය සහ තැන්පතුවල පොලී අනුපාතිකවල සීමාවන් සංශෝධනය කරමින් 2022 වසරේ මුල් භාගයේ දී 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ නියෝග කිහිපයක් නිකුත් කරන ලදී. වෙළඳපොළ වර්ධනයන් සහ මහ බැංකුව විසින් අනුගමනය කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සලකා බලමින් පසුකාලීනව එම සීමාවන් අවලංගු කරන ලදී. එලෙසම, විදේශ මුදල් ඉදිරි විකුණුම් සහ මිලදී ගැනීම් සඳහා තිබූ සීමාවන් ද අවලංගු කරන ලද අතර විනිමය අනුපාතිකයේ ස්ථායීතාවය සහ බැංකු පද්ධතියේ විදේශ මුදල් ද්‍රවශීලතාවය සුරක්ෂිත කර ගැනීම උදෙසා, අත්‍යාවශ්‍ය නොවන සහ හදිසි නොවන භාණ්ඩ ආනයනය සීමා කිරීමට ආනයන සඳහා ආන්තික තැන්පතු අවශ්‍යතාවයන් නැවත හඳුන්වා දෙන ලදී.

තවද, 2022 වසරේ දී බැංකු වෙත තිරසාර මූල්‍ය සම්බන්ධයෙන් විධානයක් නිකුත් කරන ලදී. තිරසාර මූල්‍ය කටයුතු ප්‍රවර්ධනයේ ජාතික වැදගත්කම සහ ඒ සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකුවලට යහපාලන හා අවදානම් කළමනාකරණ රාමුවක් ලබාදීමේ අවශ්‍යතාව

විශේෂ සටහන 10
ශ්‍රී ලංකාව තුළ සාර්ව විචක්ෂණ අධිකාරියක් පිහිටුවීම

පසුබිම

බලාත්මක කිරීමට අපේක්ෂිත නව ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් මූල්‍ය පද්ධති ස්ථායීතාව සුරක්ෂිත කිරීම මහ බැංකුවේ අරමුණක් ලෙස හඳුනාගනු ලබන අතරම ශ්‍රී ලංකාවේ සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස ද මහ බැංකුව නම් කරනු ලබයි. මෙම නව පනත මගින් මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වාගෙන යාම පිළිබඳ මහ බැංකුවේ වත්මන් බලතල සහ විෂය පථය පුළුල් කෙරේ. ඒ අනුව මෙම සටහන මගින් සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති සහ පද්ධතිමය අවදානම පිළිබඳ සංකල්ප; සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති සහ මහ බැංකුවේ අනෙකුත් ප්‍රතිපත්ති සමඟ ඇති අන්තර්සබැඳියාව; සාර්ව විචක්ෂණ මෙවලම් සහ එම මෙවලම්හි අරමුණු ශ්‍රී ලංකාවේ සාර්ව විචක්ෂණ අධිකාරිය වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය මෙන්ම ඉදිරි දැක්ම පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීමට ද අපේක්ෂා කෙරේ.

සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති සහ පද්ධතිමය අවදානම

2007-2009 කාල සීමාව තුළ ඇති වූ ගෝලීය මූල්‍ය අර්බුදයෙන් උගත් පාඩම් මගින් මහ බැංකුකරණය තුළ සාර්ව විචක්ෂණ ප්‍රවේශයක ඇති වැදගත්කම ඉස්මතු විය. 2007-2009 ගෝලීය මූල්‍ය අර්බුදය මගින් ස්ථාවර ආර්ථික පරිසරයක් තුළ පවා අර්බුදයක් මතුවිය හැකි බවත්, තනි ආයතන ඉලක්ක කරගත් නියාමන ප්‍රතිපත්ති කෙරෙහි පමණක් යොමු වීම සහ පද්ධතිමය අවදානම් ඉලක්ක කරගත් ප්‍රතිපත්ති නොමැති වීම හේතුවෙන් මූල්‍ය අර්බුදයක් වළක්වා ගැනීම සඳහා හුදෙක් ක්ෂුද්‍ර විචක්ෂණ ප්‍රතිපත්ති පමණක් ප්‍රමාණවත් නොවන බව අවබෝධ විය. සමස්ත මූල්‍ය පද්ධතියට හෝ එහි කොටසකට හානි වීම හේතුවෙන් මූල්‍ය සේවා සැපයීම අකර්මණ්‍ය වීම මෙන්ම එමගින් මූර්ත ආර්ථිකයට බරපතල ප්‍රතිවිපාක ඇති වීමේ අවදානම පද්ධතිමය අවදානම ලෙස අර්ථ දැක්වෙයි. (International Monetary Fund, Financial Stability Board and Bank for International Settlements, 2009). එබැවින්, ගෝලීය මූල්‍ය අර්බුදය මගින් මූල්‍ය පද්ධතිය තුළ අවදානම් ගොඩනැගීම සීමා කිරීම සඳහා ශක්තිමත් සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති රාමුවක අවශ්‍යතාවය ඉස්මතු කරන ලදී. සාර්ව ආර්ථිකය සහ මූල්‍ය පද්ධතිය අතර සම්බන්ධතා, එනම් සාර්ව මූල්‍ය සම්බන්ධතාවල වැදගත්කම ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසු යුගයේ දී මහ බැංකු විසින් හඳුනාගෙන ඇත. මේ අනුව, මූල්‍ය අංශය සඳහා විශේෂ වූ ප්‍රතිපත්ති මගින් පද්ධතිමය අවදානම සීමා කරන අතරම සාර්ව මූල්‍ය සම්බන්ධතා සහ ආයතන අතර පවතින අන්තර් සබඳතා හඳුනා ගැනීම ද අත්‍යවශ්‍ය බව පෙනී යයි. මේ අනුව, 'සාර්ව විචක්ෂණය', සම්මත සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සහ තනි මූල්‍ය ආයතන නියාමනය ඉලක්ක කරගත් සාම්ප්‍රදායික ක්ෂුද්‍ර විචක්ෂණ නියාමනය අතර ඇති පරතරය පිරවීම සඳහා වන මූල්‍ය නියාමන ප්‍රවේශයක් ලෙස හැඳින්විය හැක (Elliott, 2011). ඒ අනුව මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම මගින් මෙන්ම පද්ධතිමය අවදානම සීමා කිරීම තුළින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කිරීම මගින් ද සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තිය එම පරතරය පුරවනු ලබයි.

පද්ධතිමය අවදානම බොහෝ විට ක්‍රමානුකූලව මෙන්ම අනපේක්ෂිතව පැන නගින අතර, මූල්‍ය පද්ධතියේ එවැනි අවදානම්, අහිතකර තත්ත්වයක් හෝ අහිතකර වර්ධන මාලාවක් තුළින් පැහැදිලි ලක්ෂණ පිළිබිඹු නොවේ. එබැවින්, තත්කාලීන අවිනිශ්චිතතාවය මෙන්ම මූල්‍ය චක්‍රයත් සමඟ පද්ධතිමය අවදානම වෙනස් වීමේ ස්වභාවය හේතුවෙන් අදාළ වර්ධන පිළිබඳ නිරන්තර තක්සේරු කිරීම සහ ඒ සඳහා ගනු ලබන සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තිවල ප්‍රමාණවත් බව ඇගයීම ද අවශ්‍ය වේ. ඒ අනුව බලන විට, සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති මගින් නියෝජනය වන්නේ, මූල්‍ය චක්‍රය සමඟ කාලානුරූපී ලෙස වෙනස් කළ හැකි සහ අවශ්‍ය වූ විට නම්‍යශීලි ලෙස ප්‍රතිචාර දැක්විය හැකි මෙවලම් සහ ක්‍රියාමාර්ගවලින් සමන්විත ක්‍රියාකාරී විචක්ෂණ ප්‍රවේශයකි. සාර්ව විචක්ෂණ ස්ථාවරය මගින් ඒකරාශී වන සමස්ත සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති සංකලනය, මූල්‍ය චක්‍රයේ[1] අවදානම ගොඩනැගෙන එහි ප්‍රසාරණ අවධියේදී දැඩි කිරීමට නැඹුරුවක් දක්වන අතර මූල්‍ය චක්‍රයේ අවපාත අවධියේදී ලිහිල් කිරීම කෙරෙහි නැඹුරු වේ (රූප සටහන වි.ස. 10.1 බලන්න).

රූප සටහන වි.ස. 10.1
මූල්‍ය චක්‍රය සමඟ චක්‍රීය අවදානම් වල විකාශය



මූලය: චෙක් නැෂනල් බැංකුව (2022)

1 ආර්ථික චක්‍රයේ දී මෙන්ම, මූල්‍ය චක්‍රය තුළ දී ප්‍රසාරණ අවධියක්, අවපාත අවධියක් සහ ශීර්ෂ හා නිම්න ආදී හැරවුම් ලක්ෂ පවතියි. ඇතැම් අවධීන් කිසිසේත්ම දක්නට නොලැබීම හෝ ඇතැම් අවධීන් අසාමාන්‍ය ලෙස ඉතා කෙටි කලක් හෝ ඉතා දිගු කලක් පැවතීමත් සමඟ ඇතැම් කාල තුළ දී මූල්‍ය චක්‍රය අසාමාන්‍ය ගමන් මාර්ගයක් අනුගමනය කළ හැක.

හරස්කඩ සහ චක්‍රීය ලෙස සංරචක දෙකක් ඔස්සේ පද්ධතිමය අවදානම මැඩපැවැත්වීම සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තියේ අරමුණ වේ. හරස්කඩ සංරචකය මගින් පද්ධතිමය වශයෙන් වැදගත් එක් එක් මූල්‍ය ආයතන බාහිර බලපෑම් හේතුවෙන් අකර්මණ්‍ය වීමේ අවදානම සහ මූල්‍ය පද්ධතිය තුළ පවතින මූල්‍ය ආයතන අතර අන්තර් සම්බන්ධිතභාවයෙන් පැන නගින පද්ධතිමය අවදානම අවම කිරීම හෝ එවැනි අවදානම්වලට එරෙහි ප්‍රතිරෝධයක් ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කෙරේ. මේ අතර, චක්‍රීය සංරචකය මගින් කාලයත් සමඟ පද්ධතිමය අවදානම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීමට හෝ එවැනි අවදානම් අවම කිරීමට උත්සාහ කරයි. (Adrian, 2017). ශීඝ්‍රයෙන් වර්ධනය වන තෝලන (leverage) සහ ණය තත්ත්ව හා සම්බන්ධ වත්කම් මිල බුබුලු (asset price bubbles) එවැනි චක්‍රීය අවදානම්වලට අයත් වේ (Elliott, Feldberg, & Lehnert, 2013).

අනෙකුත් ප්‍රතිපත්ති සමඟ ඇති සහසම්බන්ධතාව

මූර්ත ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා විශාල කම්පනවලට ප්‍රතිචාර වශයෙන් පවතින සියලුම ප්‍රතිපත්ති මෙවලම් (විචක්ෂණ ප්‍රතිපත්ති ඇතුළුව) යොදා ගැනීමේ ප්‍රවණතාවය 2009 වසරේ ඇතිවූ ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසුව නිරීක්ෂණය විය. තවද, කොවිඩ්-19 වසංගත කාල සීමාව තුළදී, සාම්ප්‍රදායික රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති සමඟින් විචක්ෂණ ප්‍රතිපත්ති මගින් ද සාර්ව-ස්ථායීකරණ කාර්යභාරයක් ඉටු කරමින් මහ බැංකුවේ ප්‍රතිපත්ති සංකලනය තුළ ප්‍රධාන කාර්යභාරයක් සිදු කරනු ලැබීය (Warjiyo & Juhro, 2022). සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තිය අනෙකුත් ප්‍රතිපත්ති සමඟ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විය හැකි වන අතර, මූල්‍ය ප්‍රතිපත්ති සහ ක්ෂුද්‍ර විචක්ෂණ ප්‍රතිපත්ති සමඟ ඉහළ සහසම්බන්ධතාවක් පවතී. ඒ අනුව, මුදල් හා මූල්‍ය පද්ධති ස්ථායීතා ප්‍රතිපත්ති සහ මෙවලම් එකිනෙකට විරුද්ධ වීමට හෝ අනුපූරක වීමට හැකිය. එනම්, ඇතැම් තත්ත්ව යටතේ මුදල් ප්‍රතිපත්තිය අසමතුලිතතා ගොඩනැගීමට දායක වෙමින් පාර්ශවකරුවන්ගේ අවදානම් ගැනීමේ ස්වභාවය දිරිමත් කරයි. නිදසුනක් ලෙස ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ලබන කාල සීමාවන් වත්කම් මිල බුබුලු සහ අධික ණය වර්ධනයකට හේතු විය හැක. එවැනි මූල්‍ය ස්ථායීතා අවදානම් යටපත් කිරීම සඳහා චක්‍රයට ප්‍රතිවිරුද්ධ (counter cyclical) සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති මෙවලම් අවශ්‍ය විය හැකිය. මීට අමතරව, ස්ථාවර මූල්‍ය පද්ධතියක් මඟින් මූල්‍ය ප්‍රතිපත්තිය සුමට ලෙස සම්ප්‍රේෂණය කිරීමට මෙන්ම ආර්ථිකය තුළ වඩා හොඳින් සම්පත් බෙදී යාමටද ඉඩ සලසනු ඇත. මෙම සමීප සබඳතාව මගින් මුදල් හා සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තිවල බලපෑම නිරීක්ෂණය, විශ්ලේෂණය සහ තක්සේරු කිරීමේ අවශ්‍යතාවය සහ එවැනි ප්‍රතිපත්ති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන ක්‍රියාමාර්ග මෙන්ම අවශ්‍ය විට දී එම ප්‍රතිපත්ති අතර සම්බන්ධීකරණය කිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරයි. එකම තොරතුරු පදනම භාවිත කිරීම සහ ක්ෂුද්‍ර විචක්ෂණ අධීක්ෂණයේ දී ලබා ගන්නා තොරතුරුවලින් සැලකිය යුතු ප්‍රමාණයක් සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති සකස් කිරීමේ දී යොදා ගැනීම හේතුවෙන් ක්ෂුද්‍ර විචක්ෂණ අධීක්ෂණය සහ සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාකාරකම් ද එකිනෙකට අනුපූරක වේ. ප්‍රතිපත්තීන් අතර පවතින එවැනි අනුපූරකතා සහ ගැටුම් ප්‍රවේශමෙන් සලකා බැලිය යුතු අතර, සුදුසු අවස්ථාවන්හි දී එම ප්‍රතිපත්තීන් ඒකාබද්ධ කරමින් භාවිතා කළ යුතු වේ (Warjiyo & Juhro, 2022). තවද, මෙම අරමුණු එකිනෙක වෙන් කිරීමට අපහසු මෙන්ම එලෙස වෙන් කිරීම ඵලදායී නොවන බැවින් ඒවායේ සමීප සම්බන්ධීකරණයක් අත්‍යවශ්‍ය වේ.

සාර්ව විචක්ෂණ රාමුව ක්‍රියාත්මක කිරීම - ප්‍රතිපත්ති මෙවලම් සහ ඉලක්කගත අංශ

පද්ධතිමය අවදානම් ඇති වන වාර ගණන සහ ඒවායේ තීව්‍රතාව අවම කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් විවිධ සාර්ව විචක්ෂණ මෙවලම් භාවිතා කරනු ලබයි. මෙලෙස භාවිතා කරනු ලබන සාර්ව විචක්ෂණ මෙවලම් පුළුල් පාදක (broad based) මෙවලම්, ආංශික (sectoral) (උදා: ගෘහස්ථ/ආයතනික) මෙවලම්, ද්‍රවශීලතා (liquidity) මෙවලම් සහ ව්‍යුහාත්මක (structural) මෙවලම් ලෙස වර්ග කළ හැක.

පුළුල් පාදක මෙවලම් බැංකු පද්ධතියේ සියලුම ණය නිරාවරණයන්ට බලපාන අතර චක්‍රයට ප්‍රතිවිරුද්ධව ගොඩ නැගිය යුතු ප්‍රාග්ධන ස්වාරක්ෂක (Countercyclical Capital Buffers -CCyBs), තෝලන අනුපාත සහ අක්‍රීය ණය සඳහා ගතික වෙන්කිරීමේ අවශ්‍යතා (Dynamic Provisioning Requirement - DPRs) (International Monetary Fund, 2014) මීට ඇතුළත් වේ. ගෘහස්ථ සහ ආයතනික අංශ වැනි නිශ්චිත අංශවලට අධික ණය ලබා දීම් තුළින් පැන නගින අවදානම් ආංශික මෙවලම් මගින් අවම කළ හැකි අතර, මීට එක් එක් අංශ සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා පැනවීම/වැඩි කිරීම (අවදානම් බර), ණය වර්ධනයේ සීමාවන්, වටිනාකම මත ණය අනුපාතය (Loan to Value Ratio - LTV) සහ ණය සේවාකරණයට ආදායම් (Debt Service to Income Ratio - DSTI) අනුපාත ඇතුළත් වේ. ද්‍රවශීලතා මෙවලම් (උදාහරණයක් ලෙස, සති කිහිපයක අර්බුදකාරී කාල සීමාවකට අදාල මුදල් ගෙවීම් ආවරණය කිරීමට ප්‍රමාණවත් ද්‍රවශීලතා වත්කම් බැංකු සතුව ඇති බවට සහතික කරන ද්‍රවශීලතා ස්වාරක්ෂක අවශ්‍යතා;

8

(liquidity buffer requirements) බැංකු ඔවුන්ගේ ද්‍රවශීල නොවන වත්කම්වලට (ණය වැනි) අරමුදල් සැපයීම සඳහා ස්ථාවර වගකීම් ඇති බව සහතික කරන ස්ථාවර අරමුදල් අවශ්‍යතා; සහ ද්‍රවශීලතා ගාස්තුවක් මගින් මූලික නොවන අරමුදල් මත අය කිරීමක් පැනවීම) පද්ධතිමය ද්‍රවශීලතා අවදානම් මැඩපවත්වයි.

අන්තර්සම්බන්ධිතභාවය (interconnectedness) සහ පද්ධතිමය වශයෙන් වැදගත් වන ආයතන අකර්මණ්‍ය වීම මගින් ඇති විය හැකි සංස්පර්ෂණ (contagion) අවදානම යන කරුණු හේතුවෙන් පද්ධතිමය අවදානමේ ව්‍යුහාත්මක අංශයෙන් පිළිබිඹු වේ. පද්ධතිමය වශයෙන් ඉතා වැදගත් ආයතනවල ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සහ මූල්‍ය පද්ධතිය තුළ පවතින අධික නිරාවරණ (exposures) අවම කිරීම වශයෙන් අරමුණු දෙකක් ව්‍යුහාත්මක සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති මෙවලම් මඟින් ඉලක්කගත කෙරේ. පද්ධතිමය වශයෙන් වැදගත් මූල්‍ය ආයතනවල ඔරොත්තු දීමේ හැකියාව හඳුනා ගැනීම සහ ශක්තිමත් කිරීම "පද්ධතිමය වශයෙන් ඉතා වැදගත්" ආයතනවල ගැටලුව විසඳීමේ ප්‍රධාන උපාය මාර්ගය ලෙස හඳුනාගෙන ඇති අතර බොහොමයක් රටවල් එවැනි ආයතන මත ප්‍රාග්ධන අධිභාර පැනවීමට කටයුතු කර ඇත. තවද, මෙම ආයතනවලට නිරාවරණය වීම අධෛර්යමත් කිරීම හෝ එවැනි නිරාවරණ වඩාත් සුරක්ෂිත කිරීම, මෙම මූල්‍ය ආයතන අධික ලෙස නිරාවරණය වීම සීමා කිරීමේ උපාය මාර්ග ලෙස භාවිතා වේ.

ශ්‍රී ලංකාවේ සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව

වර්තමානයේදී මහ බැංකුව සාර්ව විචක්ෂණ අධ්‍යයන සිදු කිරීම, එවැනි විශ්ලේෂණ සඳහා මෙවලම් සකස් කිරීම සහ මහ බැංකුව විසින් නියාමනය කරන ලද මූල්‍ය ආයතන සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හඳුන්වාදීමේ නිරත වුවද, බලාත්මක වීමෙන් පසුව නව මහ බැංකු පනත මගින් මහ බැංකුව රටේ සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස නම් කරනු ලබයි. ඒ අනුව මූල්‍ය පද්ධති ස්ථායීතාවය පවත්වාගෙන යාමේ වත්මන් භූමිකාව තුළ මහ බැංකුවේ බලතල සහ විෂය පථය පුළුල් වනු ඇත. නව පනත බලාත්මක වීමත් සමඟ සාර්ව විචක්ෂණ මෙවලම් භාවිතාව සඳහා වූ සමස්ත ප්‍රවේශය කලින් කලට යාවත්කාලීන කරමින් අර්බුදකාරී ආර්ථික සහ මූල්‍ය තත්ත්වයන් මධ්‍යයේ පවා මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගනිමින් සාර්ව විචක්ෂණ අරමුණු ළඟා කර ගැනීම් සඳහා නව පනත බලාත්මක වීමත් සමඟ මහ බැංකුවට පැවරෙනු ඇත. ඒ අනුව, තිරසාර නොවන උච්චාවචනයන් නොමැතිව මූල්‍ය ආයතන අතර යහපත් ණය සහ තෝලන තත්ත්වයන් පවත්වාගෙන යාම මෙන්ම සංස්පර්ෂණය සහ පද්ධතිමය වශයෙන් වැදගත් ආයතන අකර්මණ්‍ය වීම මගින් පැන නගින අවදානම් මැඩපවත්වා ගනිමින් එම ආයතන ආරක්ෂා කිරීම ද මහ බැංකුවේ සාර්ව විචක්ෂණ ප්‍රවේශයට ඇතුළත් වේ. මූල්‍ය පද්ධතිය සමස්තයක් ලෙස අධීක්ෂණය කිරීමට, අවදානම් තක්සේරු කිරීමට, සාර්ව විචක්ෂණ මෙවලම් හඳුන්වා දීමට සහ මූල්‍ය අංශයේ අනෙකුත් නියාමන අධිකාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීමට මහ බැංකුවට බලය පැවරෙනු ඇත.

ඉදිරි දැක්ම

අවදානම් තක්සේරු කිරීමේ සහ මෙවලම් සකස් කිරීම පිළිබඳ ක්‍රමවේද ශක්තිමත් කිරීම සිදුකරන අතරම, මෙම ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර මට්ටමේ විශේෂඥ සහාය ඇතිව මහ බැංකුව දැනටමත් සිය සාර්ව විචක්ෂණ රාමුව ශක්තිමත් කිරීම ආරම්භ කර ඇත. ගතික නුබුන්වත් බැංකු ආතති පරීක්ෂණය, ද්‍රවශීලතා ආතති පරීක්ෂණය සහ අන්තර් සම්බන්ධිතභාවය විශ්ලේෂණය සහ එවැනි අවදානම් විශ්ලේෂණවලට අදාළ දත්ත රැස් කිරීමේ ක්‍රමවේද දැනටමත් ස්ථාපිත කර ඇති අතර ඵලදායී පරීක්ෂණ වට කිහිපයක් ද අවසන් කර ඇත.

මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන මූල්‍ය අංශයේ සහභාගිවන්නන් හෝ ඔවුන්ගේ නිරාවරණයන් ඉලක්ක කරගත් සාර්ව විචක්ෂණ මෙවලම් මාලාවක් දැනට මහ බැංකුව විසින් වැඩි දියුණු කරමින් පවතී. ජාත්‍යන්තර යහභාවිතාවන්ට සමගාමීව, සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම සඳහා පැවරී ඇති බලතල ක්‍රියාවට නැංවීමේදී, මූල්‍ය අංශයේ පාර්ශවකරුවන් නියාමනය කරනු ලබන නියාමන අධිකාරීන් විසින් යොදා ගනු ලබන විචක්ෂණ ප්‍රමිතීන් යෝජනා කිරීම සහ වැඩි දියුණු කිරීම මහ බැංකුව විසින් සිදු කරනු ඇත. එම ක්‍රියාවලියේ දී පවතින දත්ත සම්බන්ධයෙන් වූ අඩුපාඩු හඳුනා ගනිමින් පවතින අතර මහ බැංකුව විසින් එම අඩුපාඩු මඟ හරවා ගැනීම පිණිස කටයුතු කරමින් සිටියි. නව පනත බලාත්මක වීමෙන් පසු සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්ති සම්පාදනය සඳහා මනාව සම්බන්ධීකරණය වූ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා මහ බැංකුව එහි සාර්ව විචක්ෂණ බලතල සඳහා සහාය වන ආයතනික රාමුව ශක්තිමත් කිරීමට ද කටයුතු කරනු ඇත. මෙහි දී, මූල්‍ය ස්ථායීතාව සම්බන්ධ කටයුතුවලදී, මහ බැංකුව විසින් ඉදිරිපත් කරන යෝජනා/නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය අංශයේ නියාමන අධිකාරීන් සමඟ සම්බන්ධීකරණය කරනු ලබන මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවේ (Financial System Oversight Committee – FSOC) මැදිහත් වීම මහ බැංකුව විසින් ශක්තිමත් කරනු ලැබේ. මහ බැංකුව විසින් දැනට ප්‍රකාශයට පත් කරනු ලබන මූල්‍ය පද්ධති

ස්ථායීතා සමාලෝචනය වැඩි දියුණු කරනු ලබන අතර එම වාර්තාව වාර්ෂික පදනමින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පිළිබඳ සමාලෝචන වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීමේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාව සපුරාලනු ඇත. මෙම වාර්තාවට මහ බැංකුවේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පිළිබඳ තක්සේරුව, එහි දී හඳුනාගත් අවදානම් සහ දුර්වලතා, හඳුනාගෙන ඇති අවදානම් අවම කිරීම සඳහා මහ බැංකුව සහ මූල්‍ය අංශයේ අනෙකුත් අධිකාරීන් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග, මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව විසින් සිදු කරන ලද නිර්දේශ පිළිබඳව සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ද ඇතුළත් වනු ඇත.

සාර්ව විචක්ෂණ අධිකාරිය පිහිටුවීමත් සමඟ මූල්‍ය පද්ධති ස්ථායීතාව ශක්තිමත් කිරීම සඳහා උපකාරී වන ජාත්‍යන්තර යහභාවිතාවන්ට අනුකූල, සාර්ව විචක්ෂණ මූල්‍ය ස්ථායීතාව පිළිබඳ අරමුණ ඉටුකර ගත හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මූලාශ්‍ර

1. Adrian, T., 2017, September. Macroprudential policy and financial vulnerabilities. In Speech at the European Systemic Risk Board Annual Conference, September (Vol. 22). Berner, R. (2018). Financial Stability and Regulatory Policy. Cambridge University Press.
2. Czech National Bank. (2022). The CNB's approach to setting the countercyclical capital buffer. Czech National Bank.
3. Elliott, D., 2011. An overview of macroprudential policy and countercyclical capital requirements. Unpublished manuscript, The Brookings Institution, 10.
4. Elliott, D., Feldberg, G. and Lehnert, A., 2013. The history of cyclical macroprudential policy in the United States.
5. International Monetary Fund, Financial Stability Board, and Bank for International Settlements. (2009) Guidance to Assess the Systemic Importance of Financial Institutions, Markets and Instruments: Initial Considerations. Washington: International Monetary Fund.
6. International Monetary Fund. (2014) *Staff Guidance Note on Macroprudential Policy.* Washington : International Monetary Fund.
7. Warjiyo, P. and Juhro, S.M. (2022) *Central Bank Policy Mix: Issues, Challenges, and Policy Responses: Handbook of Central Banking Studies (p. 280)*. Springer.
8. Liang, K.Y. and N. (2022) *What are macroprudential tools?*[Online]. Available at: *https://www.brookings.edu/blog/up-front/2020/02/11/what-are-macroprudential-tools/* (Accessed: 15 January 2023)

සලකා බලමින් ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය සඳහා වන ඉදිරි දැක්මට (Road Map for Sustainable Finance) අනුකූලව බලපත්‍රලාභී බැංකුවල තිරසාර මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

පොදුවේ සහ සංචාරක අංශයට ලබා දුන් පෙර පැවති ණය සහන දීර්ඝ කිරීමේ අරමුණින්, කොවිඩ්-19 වසංගතය සහ ඉන් පසු ඇති වූ සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් පීඩාවට පත් වූ ණය ගනුදෙනුකරුවන් හට පුළුල් වශයෙන් සහන ලබා දෙන ලෙස මහ බැංකුව බලපත්‍රලාභී බැංකු වෙතින් ඉල්ලා සිටින ලදී. බැංකු අංශයේ ස්ථායීතාව මත අනවශ්‍ය පීඩන ඇතිවීම වළක්වා ගන්නා අතරතුර පවතින අයහපත් සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් සහ/හෝ කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූ ණය ගනුදෙනුකරුවන් වෙත ඔවුන්ගේ අනාගත ණය ආපසු ගෙවීමේ හැකියාව සහ ව්‍යාපාරයේ/ව්‍යාපෘතියේ සාර්ථකභාවය මත පදනම්ව 2022 වසරේ දෙසැම්බර් මස අවසානය තෙක් මාස හයක කාලයක් සඳහා අවස්ථානුකූලව ණය සහන ලබා දෙන ලෙස මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත උපදෙස් ලබා දෙන ලදී. කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක් වී අදායම් හෝ විකුණුම් අඩු වීම සහ ව්‍යාපාර කටයුතු අඩාල වීම හෝ වසා දැමීම හේතුවෙන් මූල්‍ය අපහසුතාවලට ලක් වූ, ඌන ක්‍රියාකාරී සහ අක්‍රීය ණය ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම සහ ඔවුන්ට සහන සැලසීම සඳහා බලපත්‍රලාභී බැංකුවල කොවිඩ්-19 පුනර්ජීවන ඒකක පිහිටුවීමට මාර්ගෝපදේශ සපයන චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

ඉහත සඳහන් ක්‍රියාමාර්ගවලට අමතරව 2022 වසර තුළ දී තවත් වැදගත් නියාමන ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙන ලදී. විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන් සඳහා බැංකු සේවා සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීමට ක්‍රියාමාර්ග හඳුන්වා දීම සඳහා බලපත්‍රලාභී බැංකුවල පාරිභෝගික ප්‍රඥප්තිය සංශෝධනය කිරීම, ඉන්දියානු රුපියල නම් කරන ලද විදේශ මුදල් ඒකකයක් ලෙස තීරණය කිරීම, 2023 වසර සඳහා බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික බලපත්‍ර ගාස්තු දැනුම් දීම සහ බලපත්‍රලාභී බැංකු විසින් තැන්පතුකරුවන්ගේ අනන්‍යතාවය හඳුනාගැනීමේ අංක සටහන් කිරීම අනිවාර්ය කිරීම යනාදිය මීට ඇතුළත් වේ.

8.3 බැංකු නොවන මූල්‍ය ආයතනවල කාර්යසාධනය

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය

රටෙහි ආර්ථිකය සංකෝචනය වීම මධ්‍යයේ වුවද බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය 2022 වසර තුළ දී ද අඛණ්ඩව වර්ධනය විය. ණය වර්ධනය අඩුවීම, ලාභදායීත්වය අඩුවීම සහ 3 වන අදියර යටතේ පවතින ණය තුළින් පිළිබිඹු වන අක්‍රීය ණය වැඩිවීම නිසා මුහුණ දීමට සිදුවූ අභියෝග හමුවේ වුවද, 2022 වසර තුළ දී ප්‍රමාණවත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා සංචිත සමඟ වත්කම් සහ තැන්පතු පදනම අනුව, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය වර්ධනය විය. මැදි කාලීනව ශක්තිමත්

සහ ස්ථාවර බලපත්‍රලාභී මුදල් සමාගම් ස්ථාපිත කිරීම සහ එමගින් මෙම අංශයේ තැන්පත්කරුවන්ගේ යහපත සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතිව බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමේ වැඩපිළිවෙල (ඒකාබද්ධකරණ වැඩපිළිවෙල) ක්‍රියාත්මක විය.

ව්‍යාපාර වර්ධනය

2022 වසර අවසානය වන විට, මෙම අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණය ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ මුළු වත්කම්වලින් සියයට 5.2ක් නියෝජනය කරමින් රුපියල් බිලියන 1,611.2ක අගයක් වාර්තා කරන ලදී. 2022 වසර අවසානයේ දී මෙම අංශය බලපත්‍රලාභී මුදල් සමාගම් 36[3]කින් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 1කින් සමන්විත වූ අතර ශාඛා 1,834ක් අතරින් ශාඛා 1,204ක් (සියයට 65.6) බස්නාහිර පළාතෙන් පිටත පිහිටා තිබුණි. තවද, 2022 වසර තුළ දී මෙම අංශය විසින් නව ශාඛා 127ක් ස්ථාපිත කරන ලදී.

2021 වසරේ දී වාර්තා කළ සියයට 6.1ක වර්ධනයට සාපේක්ෂව, මෙම අංශයේ වත්කම් පදනම සියයට 8.3ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 123කින් ප්‍රසාරණය වූ අතර 2022 වසර අවසානය වන විට එය රුපියල් බිලියන 1,611.2ක් විය. ණය සහ අත්තිකාරම් කළඹේ වර්ධනය මෙන්ම ආයෝජන සහ ද්‍රවශීල වත්කම් ඉහළ යාම මෙම අංශයේ වත්කම් වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. ණය සහ අත්තිකාරම් මෙම අංශයේ සමස්ත වත්කම්වලින් සියයට 74.4ක් විය. මෙම අංශයේ ණය සහ අත්තිකාරම් කළඹේ වැඩි නියෝජනය මූල්‍ය කල්බදු මගින් සිදු කර ඇති අතර එය 2021 වසර අවසානයේ දී වාර්තා කළ සමස්ත ණය සහ අත්තිකාරම්වලින් සියයට 48.3ට සාපේක්ෂව

3 ඊ ටී අයි ෆිනෑන්ස් ලිමිටඩ් ඇතුළත් නොවේ.

8.9 සංඛ්‍යා සටහන

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ශාඛා ව්‍යාප්තිය - පළාත් අනුව

පළාත	2021 අවසානයට	2022 අවසානයට (අ)	වසර තුළ වෙනස
මධ්‍යම	184	193	9
නැගෙනහිර	142	154	12
උතුරු මැද	111	120	9
වයඹ	180	187	7
උතුර	119	139	20
සබරගමුව	122	127	5
දකුණ	178	193	15
ඌව	82	91	9
බස්නාහිර	589	630	41
එකතුව	**1,707**	**1,834**	**127**

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2022 වසර අවසානය වන විට සියයට 41.6ක් විය. ප්‍රධාන වශයෙන්, විදේශ විනිමය පිටතට ගලා යාම සීමා කිරීමේ පියවරක් ලෙස මෝටර් රථ ආනයනය සඳහා රජය විසින් පනවා ඇති අඛණ්ඩ සීමා කිරීම් හේතුවෙන් මූල්‍ය කල්බදු කළඹ සංකෝචනය වීමේ ප්‍රතිඵලයක් ලෙස මුළු ණය සහ අත්තිකාරම්වලට මූල්‍ය කල්බදු කළඹ දැක්වූ දායකත්වය පහත වැටුණි. කෙසේ වුවද, මෙම අංශයේ ණය සහ අත්තිකාරම් කළඹ 2021 වසර අවසානයේ පැවති සියයට 9.9ක වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානයේ සියයට 5.0කින්, රුපියල් බිලියන 1,199.2ක් දක්වා වර්ධනය විය. 2022 වසර අවසානයේ දී උකස් අත්තිකාරම්/රන් ණයවල සිදු වූ සියයට 77.5ක වර්ධනය ණය සහ අත්තිකාරම් කළඹෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක විය.

පවතින සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ණය ගනුදෙනුකරුවන්ට සහාය සැලසීමට

8.10 සංඛ්‍යා සටහන

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ වත්කම් සහ වගකීම් සංයුතිය

අයිතමය	2021		2022 (අ)		වෙනස (%)	
	රුපියල් බිලියන	ප්‍රතිශතයක් ලෙස	රුපියල් බිලියන	ප්‍රතිශතයක් ලෙස	2021	2022 (අ)
වත්කම්						
ණය සහ අත්තිකාරම් (ශුද්ධ)	1,142.4	76.8	1,199.2	74.4	9.9	5.0
ආයෝජන	167.4	11.3	199.6	12.4	5.4	19.3
වෙනත්	177.9	12.0	212.4	13.2	-12.4	19.4
වගකීම්						
සමස්ත තැන්පතු	783.3	52.7	864.5	53.7	4.6	10.4
සමස්ත ණය ගැනීම්	325.9	21.9	322.6	20.0	-0.6	-1.0
ප්‍රාග්ධන මූලිකාංග	304.0	20.4	364.1	22.6	22.6	19.8
වෙනත්	74.5	5.0	60.1	3.7	-3.3	-19.4
සමස්ත වත්කම්/වගකීම්	**1,487.7**	**100.0**	**1,611.2**	**100.0**	**6.1**	**8.3**

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8.9 රූප සටහන

2021 සහ 2022 වසර සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ සේවාවන් අනුව සපයන ලද සමස්ත ණය සහ අත්තිකාරම් (දළ)



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ණය සහන සහ ණය ආපසු ගෙවීමේ සහන 2022 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. 2022 වසර අවසානය වන විට, ණය සහන යටතේ ඇති ණය ප්‍රමාණය බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ණය සහ අත්තිකාරම් කළඹෙන් ආසන්න වශයෙන් සියයට 13.2ක් පමණ විය.

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ආයෝජන කළඹ කොටස්, ආයතනික ණය උපකරණ, රජයේ සුරැකුම්පත් සහ දේපළ ආයෝජනවලින් සමන්විත වේ. ප්‍රධාන වශයෙන්, කෙටි කාලීන කල්පිරීම්වල පොලී අනුපාතික ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස, මාස 12කට අඩු කාලයක දී

8.11 සංඛ්‍යා සටහන

කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක්වූ ණය ගනුදෙනුකරුවන් සඳහා ලබා දුන් ණය සහනවල තත්ත්වය (2020 මාර්තු සිට)

ණය සහන අදියර	අනුමත කරන ලද ඉල්ලීම්	ණය සහන ලබා දෙන විට පැවති හිඟ ශේෂය (රු. බිලියන)	2022.12.31ට හිඟ ශේෂය (රු. බිලියන)
අදියර 1 (2020 මාර්තු -2020 සැප්.)	814,336	312.61	44.58
අදියර 2 (2020 ඔක්. - 2021 මාර්තු)	99,912	59.93	11.82
අදියර 3 (2021 අප්‍රේල් - 2021 සැප්.)	492,734	168.14	68.41
අදියර 4 (2021 ඔක්. - 2022 මාර්තු)	54,387	37.63	17.16
අදියර 5 (2022 ජූලි - 2023 ජන.)	42,283	20.19	32.62
මුළු එකතුව	**1,503,652**	ලැ.නො.*	**174.58**

ලැ.නො. - ලැබී නොමැත.
*එකම ණයගැතියන් යෝජනා ක්‍රම කිහිපයක් යටතේ සහන ලබාගෙන තිබිය හැක.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

8.12 සංඛ්‍යා සටහන

බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ තැන්පතුවල සංයුතිය

අයිතමය	වටිනාකම (රු. බිලියන)		සංයුතිය %	
	2021	2022 (අ)	2021	2022 (අ)
ස්ථාවර තැන්පතු	744.3	830.2	95.0	96.0
ඉතුරුම් තැන්පතු	38.4	34.3	4.9	4.0
තැන්පතු සහතිකපත්	0.6	0.0	0.1	0.0
මුළු තැන්පතු	**783.3**	**864.5**	**100.0**	**100.0**

(අ) තාවකාලික

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

කල් පිරෙන රජයේ සුරැකුම්පත් තුළ ආයෝජන ඉහළ යෑම හේතුවෙන්, ආයෝජන කළඹ 2021 වසරේ පැවති සියයට 5.4ක සුළු වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 19.3ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 199.6ක් දක්වා ළඟා විය. මුදල් සහ බැංකු හා මූල්‍ය ආයතනවල පවත්වාගෙන යන ශේෂයන් යනාදියෙන් ප්‍රධාන වශයෙන් සමන්විත වන අනෙකුත් වත්කම්, 2021 වසරේ ඇති වූ සියයට 12.4ක සංකෝචනයට සාපේක්ෂව 2022 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකුවල පවත්වාගෙන යන ශේෂයන් ඉහළ යෑම හේතුවෙන් සියයට 19.4ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.

බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ වගකීම්වලින් ප්‍රධාන කොටස තවදුරටත් ගනුදෙනුකරුවන්ගේ තැන්පතු ලෙස පවතින අතර එය මුළු වගකීම්වලින් සියයට 53.7ක් විය. 2022 වසර තුළ දී තැන්පතු සියයට 10.4ක වාර්ෂික වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 81.1කින් රුපියල් බිලියන 864.4ක් දක්වා වර්ධනය වූ අතර ණය ගැනීම් රුපියල් බිලියන 322.6ක් දක්වා සියයට 1.0කින් පහත වැටුණි.

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ අවදානම්

ණය අවදානම

සමස්ත දළ අක්‍රීය ණය/3වන අදියර යටතේ පවතින ණය වාර්ෂික ලක්ෂමය පදනම් මත 2021 වසර අවසානයේ වාර්තා වූ සියයට 13.9ක පහළ යෑමට සාපේක්ෂව, 2022 වසර අවසානය වන විට සියයට 66.1කින් වර්ධනය වී ඇත. කාලය පදනම් කරගත් අක්‍රීය ණය වර්ගීකරණය, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 9 පදනම් කරගත් 3වන අදියර ණය මගින් 2022 අප්‍රේල් 01 වන දින ප්‍රතිස්ථාපනය කෙරුණු අතර මේ සමඟ බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් වර්ගීකරණය සඳහා පෙර පැවති දින 180ක සීමාව වෙනුවට 3වන අදියරේ ණය වර්ගීකරණය සඳහා දින 120ක සීමාව යොදා ගත යුතු වේ. ණය වර්ගීකරණ ක්‍රමවේදය ශ්‍රී ලංකා

මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති පදනම් කරගත් ප්‍රවේශයකට වෙනස් වීම, ණය සහන කාලය අවසන් වීම සහ අයහපත් සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන්, මෙම අංශයේ 3 වන අදියරේ දළ ණය අනුපාතය 2021 වසර අවසානයේ වාර්තා වූ සියයට 11.0 සිට 2022 වසර අවසානය වන විට සියයට 17.5ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය.

3 වන අදියරේ ශුද්ධ ණය හානිකරණ අනුපාතය 2021 වසර අවසානයේ වාර්තා වූ සියයට 2.7 සිට 2022 වසර අවසානය වන විට සියයට 12.3ක් දක්වා වර්ධනය විය. 3 වන අදියරේ ණය සඳහා හානිකරණ ආවරණ අනුපාතය[4] 2022 වසර අවසානය වන විට සියයට 29.6ක් ලෙස වාර්තා විය. පොලී අනුපාතිකවල හැසිරීම්, ආර්ථිකය සංකෝචනය වීම, පිරිනැමූ ණය සහන යෝජනා ක්‍රමවල බලපෑම සහ රජයේ බදු ප්‍රතිපත්තිය දැඩි කිරීම ඇතුළුව මෑත කාලීන වෙළඳපොළ වර්ධනයන් මෙම අංශයේ වත්කම්වල ගුණාත්මකභාවයට සහ අක්‍රීය ණය සඳහා අනාගතයේ දී අහිතකර ලෙස බලපානු ඇත.

පොලී අනුපාතික අවදානම

භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික තියුණු ලෙස ඉහළ යෑමට දැඩි මුදල් ප්‍රතිපත්තිය සහ දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ වෙළඳපොළ අවිනිශ්චිතතා හේතු විය. මෙය බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තැන්පතු සහ ණය උපකරණ මත ලබා දුන් උපරිම පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ යෑමට සහ ණය අනුපාත ඉහළ නැංවීමට හේතු විය. 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී පොලී අනුපාතික ඉහළ යෑමෙන් පොලී අනුපාතික අවදානමට නිරාවරණය වීම පහළ යෑම පෙන්නුම් කරමින් පොලී සංවේදිතා අනුපාතය (මාස 12කට අඩු කල් පිරීම් සහිත පොලී දරන වත්කම්, පොලී දරන වගකීම්වල ප්‍රතිශතයක් ලෙස) 2021 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 85.6ක සිට 2022 වසර අවසානය වන විට සියයට 96.8ක් දක්වා ඉහළ ගියේය.

වෙළඳපොළ අවදානම

මෙම අංශයේ කොටස් අවදානම 2022 වසර පුරා අවම මට්ටමක පැවතුණි. වෙළඳ කළඹ කොටස් වෙළඳපොළ වෙත නිරාවරණය වීම 2021 වසරේ දී සමස්ත වත්කම්වලින් සියයට 0.8 සිට 2022 වසරේ දී සියයට 0.3ක් දක්වා පහත වැටුණි.

ද්‍රවශීලතා අවදානම

සමස්තයක් ලෙස, 2022 වසර තුළ දී මෙම අංශයේ ද්‍රවශීල වත්කම් ප්‍රමාණය අවශ්‍ය නියාමන මට්ටමට වඩා ඉහළ අගයක පවත්වා ගැනීමට හැකි විය. මෙම අංශයේ අවම ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවය රුපියල් බිලියන 98.0ක සහ සමස්ත නියාමන ද්‍රවශීල වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 184.9ක පැවති අතර 2021 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 66.0ක ද්‍රවශීලතා අතිරික්තයට සාපේක්ෂව 2022 වසර අවසානයේ රුපියල් බිලියන 86.9ක ද්‍රවශීලතා අතිරික්තයක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, අහිතකර ආර්ථික තත්ත්වයන් හේතුවෙන් නියමිත කාලයට පෙර මුදල් ආපසු ගැනීම්, ණය පැහැර හැරීම් සහ අරමුදල් සපයන මාර්ග නොමැති වීම හේතුවෙන් අනාගතයේ දී මෙම අංශය තුළ ද්‍රවශීලතා අවදානමක් ඇති විය හැකිය.

4 වෙන්කිරීම් ආවරණ අනුපාතය, හානිකරණ ආවරණ අනුපාතය ලෙස ප්‍රතිස්ථාපනය වීම 2022 වසරේ අප්‍රේල් මස සිට ආරම්භ වූ අතර 3වන අදියරේ හානිකරණ ණය පහසුකම්, 3 වන අදියරේ ණයවලින් බෙදීම මගින් හානිකරණ අනුපාතය ගණනය කරනු ලැබේ.

8.10 රූප සටහන
බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ අක්‍රීය ණය පහසුකම් සහ වෙන්කිරීම් ආවරණයන්



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

8.11 රූප සටහන
බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම්



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

8.12 රූප සටහන
බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ලාභදායීත්ව දර්ශක



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ලාභදායීත්වය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය

මෙම අංශයේ ලාභදායීත්වය පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී පහත වැටුණි. මෙම අංශයේ බදු පසු ලාභය, ප්‍රධාන වශයෙන්ම පොලී වියදමේ සිදු වූ සැලකිය යුතු වර්ධනය හේතුවෙන්, 2021 වසරේ පැවති රුපියල් බිලියන 55.6 සිට 2022 වසරේ දී රුපියල් බිලියන 43.9ක් දක්වා සියයට 21.0කින් පහළ ගියේය. 2021 වසරේ දී වාර්තා කළ හිමිකම් මත ප්‍රතිලාභ සහ බදු පෙර වත්කම් මත ප්‍රතිලාභ, පිළිවෙලින්, සියයට 20.2ට සහ සියයට 5.4ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 12.6ක් සහ සියයට 3.7ක් දක්වා සැලකිය යුතු ලෙස පහළ යාමෙන් ලාභදායීත්වයේ පහත වැටීම පිළිබිඹු වේ. ආදායම මත පිරිවැය අනුපාතය 2021 වසරේ පැවති සියයට 72.6 සිට 2022 වසරේ දී සියයට 87.3ක් දක්වා වර්ධනය වූ අතර, 2022 වසර තුළ දී කාර්යක්ෂමතා අනුපාතය සියයට 68.9ක් දක්වා වර්ධනය විය.

මෙම අංශයේ ශුද්ධ පොලී ආදායම 2021 වසරේ වාර්තා වූ සියයට 18.2ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 115.2ක් දක්වා සියයට 12.3කින් පහත වැටුණි. පවතින සාර්ව ආර්ථික තත්ත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස පොලී අනුපාතිකයේ සිදු වූ සැලකිය යුතු වර්ධනය හේතුවෙන් පොලී ආදායම සියයට 25.2කින් එනම් රුපියල් බිලියන 54.7කින් වර්ධනය වුවද, පොලී වියදම සියයට 82.8ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 70.9කින් සැලකිය යුතු ලෙස ඉහළ යාම මෙයට හේතු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, මෙම අංශයේ ශුද්ධ පොලී ආන්තිකය 2021 වසරේ පැවති සියයට 8.6 සිට 2022 වසරේ දී සියයට 6.7ක් දක්වා පහත වැටුණු අතර එය මෙම අංශයේ ලාභදායීත්වය පහළ යාමට හේතු විය.

2022 වසරේ දී පොලී නොවන ආදායම සියයට 12.1කින් සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, පොලී නොවන වියදම් සියයට 0.7කින් සුළු වශයෙන් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් 2022 වසරේ මුල් මාස කිහිපය තුළ දී ණය අලාභ වෙන් කිරීම් ආපසු ගැලපීම හේතුවෙන් අක්‍රීය ණයවලට එරෙහිව සිදු කර ඇති ණය අලාභ වෙන් කිරීම් රුපියල් බිලියන 4.5කින් පහළ ගියේය.

8.13 සංඛ්‍යා සටහන
බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ආදායම් සහ වියදම් සංයුතිය

අයිතමය	2021		2022 (අ)	
	වටිනාකම (රු. බිලියන)	සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස	වටිනාකම (රු. බිලියන)	සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස
පොලී ආදායම	217.0	14.2	271.7	15.8
පොලී වියදම	85.6	5.6	156.5	9.1
ශුද්ධ පොලී ආදායම	**131.4**	**8.6**	**115.2**	**6.7**
පොලී නොවන ආදායම	49.5	3.2	43.5	2.5
පොලී නොවන වියදම	87.1	5.7	87.7	5.1
අක්‍රීය ණය සඳහා වෙන් කිරීම් (ශුද්ධ)	11.1	0.7	6.6	0.4
බදු පෙර ලාභය	**82.7**	**5.4**	**64.4**	**3.7**
බදු පසු ලාභය	**55.6**	**3.6**	**43.9**	**2.6**

(අ) තාවකාලික
මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

වසර තුළ සමස්තයක් ලෙස අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාවට වඩා ඉහළ මට්ටමක ප්‍රාග්ධනය පවත්වා ගෙන යාම තුළින් මෙම අංශයේ ඔරොත්තුදීමේ හැකියාව පෙන්නුම් කෙරිණි. බලපත්‍රලාභී මුදල් සමාගම් 6[5]ක් අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතා සහ/හෝ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාවලට අනුකූල නොවූවත්, පෙර මුදල් වර්ෂය තුළ දී විශාල බලපත්‍රලාභී මුදල් සමාගම් කිහිපයක් විසින් වාර්තා කරන ලද ලාභ රඳවා ගැනීම්, විශාල සෘණ ශුද්ධ වත්කම් සහිත බලපත්‍රලාභී මුදල් සමාගමක බලපත්‍රය අත්හිටුවීම සහ සම්පූර්ණ කරන ලද ඒකාබද්ධකරණ ගනුදෙනු කිහිපයක් මගින් ප්‍රාග්ධනය වර්ධනය වීම හේතුවෙන්, ප්‍රාග්ධන පදනම 2021 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 251.6ට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 317.5ක් දක්වා වර්ධනය විය. මෙම අංශයේ මූලික ප්‍රාග්ධන සහ සමස්ත ප්‍රාග්ධන අනුපාත, පිළිවෙලින්, 2021 වසර අවසානය වන විට වාර්තා වූ සියයට 15.5 සහ සියයට 17.0 සිට 2022 වසර අවසානය වන විට සියයට 20.6 සහ සියයට 22.0 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ දුර්වලතා සහ අවදානම්වලට නිරාවරණය වීම් සඳහා පිළියම් යෙදීමේ අරමුණින් 2020 වසරේ දී ඒකාබද්ධකරණ වැඩපිළිවෙල හඳුන්වා දෙන ලදී.

8.13 රූප සටහන
අවදානම මත බර තැබූ වත්කම් සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5 අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතා සහ/හෝ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාවලට අනුකූල නොවූ බලපත්‍රලාභී මුදල් සමාගම්වලට තැන්පතු සීමාවන්, ණය ප්‍රදානය කිරීමේ සීමාවන්, නව තැන්පතු පිළිගැනීම සහ නව ණය ප්‍රදානය කිරීම අත්හිටුවීම වැනි නියාමන සීමාවන් පනවා ඇත. තවද, බලපත්‍රලාභී මුදල් සමාගම් කිහිපයක් ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ ගනුදෙනු සම්පූර්ණ කිරීමේ ක්‍රියාවලියක නිතර වේ.

මෙම වැඩපිළිවෙළෙහි පළමු අදියර යටතේ, 2022 වසර තුළ දී ගනුදෙනු 5ක් පූර්ණ වශයෙන් නිමා කෙරුණු අතර, 2022 වසර තුළ මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද යෝජිත ඒකාබද්ධ කිරීම් 3ක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතියි. තවද, ඒකාබද්ධවීම් සඳහා හවුල්කරුවෙකු තෝරා ගැනීමට අපොහොසත් වූ සමාගම්වල බලපත්‍රය අවලංගු කිරීමෙන් පසු වෙළඳපොළෙන් පිටවීමට යොමු කර ඇති අතර එවැනි ගනුදෙනු ද්විත්වයක් දැනට සිදු කරමින් පවතී.

රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික අලෙවිකාර සමාගම්

2022 වසර අවසානය වන විට බලපත්‍රලාභී වාණිජ බැංකු 6ක් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් 7ක් ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි ලියාපදිංචි වී ඇත. එසේ වුවද, පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී. සහ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම යන ආයතනවල ප්‍රාථමික අලෙවිකාර ව්‍යාපාර සහ ක්‍රියාකාරකම්හි නියැලීම, පිළිවෙලින්, 2017 වසරේ අගෝස්තු මස 15 දින සිට සහ 2017 වසරේ ජූලි මස 06 දින සිට අත්හිටුවා ඇත. 2017 වසරේ ජූලි මස 24 දින සිට එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී.එල්.සී. ආයතනයට ප්‍රාථමික වෙන්දේසි සඳහා සහභාගී වීම තහනම් කරන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකු 5ක් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් 5ක් පමණක් 2022 වසර අවසන් වන විට රජයේ සුරැකුම්පත් වෙළඳපොළ සඳහා වන ප්‍රාථමික අලෙවිකරුවන් වශයෙන් ක්‍රියාකාරීව සහභාගී වේ.

වත්කම්

ප්‍රාථමික අලෙවිකාර සමාගම්හි සමස්ත වත්කම් ප්‍රමාණය 2022 වසරේ දී රුපියල් බිලියන 131.7ක් දක්වා සියයට 67.4කින් ඉහළ ගියේය. වෙළෙඳ කළඹ, අලෙවිය සඳහා පවතින කළඹ සහ කල්පිරීම් තෙක් රඳවා ගන්නා කළඹ යනාදියෙන් සමන්විත රජයේ සුරැකුම්පත්හි සමස්ත ආයෝජන කළඹ 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 126.1ක් දක්වා සියයට 79ක වාර්ෂික වර්ධනයක් වාර්තා කළේය. වෙළෙඳ කළඹ සහ කල් පිරීම් තෙක් රඳවා ගන්නා කළඹ 2021 වසර අවසානයේ දී වාර්තා කළ, පිළිවෙලින්, රුපියල් බිලියන 54.9 සහ රුපියල් බිලියන 12 සිට 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 100.7ක් සහ රුපියල් බිලියන 23.8ක් දක්වා වැඩි වී ඇති අතර අලෙවිය සඳහා පවතින කළඹ 2021 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 3.6 සිට 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 1.7ක් දක්වා අඩු විය.

ලාභදායීත්වය

ප්‍රාථමික අලෙවිකාර සමාගම් ලාභදායීත්වයෙහි සැලකිය යුතු වර්ධනයක් පිළිබිඹු කරමින්, 2021 වසර තුළ වාර්තා කළ රුපියල් බිලියන 0.4ක අලාභයට සාපේක්ෂව, 2022 වසර තුළ රුපියල් බිලියන 1.7ක බදු පසු ලාභයක් වාර්තා කළේය. රජයේ සුරැකුම්පත්හි සමස්ත ආයෝජනවලින් ඉපැයූ පොලී ආදායමෙහි සැලකිය යුතු ඉහළ යෑම සහ 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී ප්‍රාථමික අලෙවිකාර සමාගම් විසින් වාර්තා කරන ලද ඉහළ ගිය ප්‍රත්‍යාගණන ලාභ 2022 වසරේ දී වාර්තා වූ ලාභවලට ඉහළ දායකත්වයක් සපයා ඇත. තවද, ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය 2021 වසර අවසානයේ වාර්තා වූ, පිළිවෙලින්, සියයට සෘණ 0.7 සහ සියයට සෘණ 2.5 සිට 2022 වසර අවසානය වන විට, පිළිවෙලින්, සියයට 3ක් සහ සියයට 11.4ක් දක්වා ඉහළ ගියේය.

ප්‍රාග්ධනය

ප්‍රධාන වශයෙන්, වසර තුළ ඉපැයූ ලාභ හේතුවෙන් ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල කොටස් හිමිකම සියයට 68.3කින් ඉහළ ගියේය. ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල අවදානම් මත බර තබන ලද ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතිකය 2021 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 42.8 සිට 2022 වසර අවසානයේ දී සියයට 23.2ක් දක්වා සැලකිය යුතු පහළ යෑමක් වාර්තා කළ ද, එහි අවම අවශ්‍යතාව වන සියයට 10ට වඩා වැඩි අගයක පැවතුණි.

ප්‍රාථමික අලෙවිකාර අංශයේ අවදානම්

වෙළඳපොළ අවදානම

ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල සමස්ත ආයෝජන කළඹ තුළ වෙළෙඳ කළඹෙහි දායකත්වය සුළු වශයෙන් ඉහළ ගියේය. මෙම අංශයේ සාපේක්ෂ වෙළඳපොළ අවදානම සුළු වශයෙන් ඉහළ යෑම පිළිබිඹු කරමින්, ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල සමස්ත ආයෝජන කළඹ තුළ වෙළෙඳ කළඹෙහි දායකත්වය 2021 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 77.8ට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 79.8ක් ලෙස වාර්තා විය.

ද්‍රවශීලතා අවදානම

2022 වසර අවසානය වන විට, දිනක් ඇතුළත කල්පිරෙන වත්කම් සහ වගකීම්වල සෘණාත්මක නොගැලපීම වැඩිවීම, ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල සමස්ත ද්‍රවශීලතා අවදානම සඳහා නිරාවරණය වැඩි වීමට හේතු විය. දිනක් ඇතුළත කල්පිරෙන වත්කම් හා වගකීම්වල සෘණ නොගැලපීම 2021 වසර අවසානයේ රුපියල් බිලියන 20.3 සිට 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 78.1ක් දක්වා සැලකිය යුතු ලෙස සියයට 270කින් වර්ධනය විය. 2022 වසර අවසානය වන විට දිනක් ඇතුළත කල් පිරෙන වගකීම් සියයට 219.9කින් සැලකිය යුතු ලෙස ඉහළ යෑම ප්‍රධාන වශයෙන් මීට හේතු විය. රාජ්‍ය සුරැකුම්පත් විශාල ප්‍රමාණයක් පවත්වා ගෙන යෑම සහ එවැනි රාජ්‍ය සුරැකුම්පත් අනපේක්ෂිත ද්‍රවශීලතා පරතරයන් පියවා ගැනීමට අරමුදල් සපයා ගැනීමේ සුරැකුමක් ලෙස යොදා ගැනීමට ඇති හැකියාව අනුව, ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දෙමින් සිටි එක් ප්‍රාථමික අලෙවිකාර සමාගමක් හැර අනෙකුත් ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල ද්‍රවශීලතා අවදානම වසර පුරා පහළ මට්ටමක පැවතුණි. ද්‍රවශීලතා පරතරය පියවා ගැනීම සඳහා පෙර සූදානම් කරගත් හදිසි අරමුදල් සපයා ගැනීමේ සැලසුම් ප්‍රාථමික අලෙවිකරුවන් බොහොමයක් සතුව පැවතුණි. කෙසේ වුවද, සිදුවිය හැකි ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධ අවිනිශ්චිතතාවයන් හේතුවෙන් ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම ඉහළ යා හැකි අතර එය ප්‍රාථමික අලෙවිකාර සමාගම්හි ප්‍රාග්ධන මට්ටම් කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය.

වෙළඳපොළ සහභාගීත්වය

ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල ප්‍රාථමික වෙළඳපොළ ක්‍රියාකාරකම්

භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන ප්‍රාථමික වෙළඳපොළ වෙන්දේසි සඳහා ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සහභාගීත්වය 2022 වසර තුළ දී මිශ්‍ර කාර්යසාධනයක් පෙන්නුම් කළේය. 2022 වසරේ දී පවත්වන ලද සමස්ත භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි 52න් පිළිගන්නා ලද සමස්ත ලංසු ප්‍රමාණයන් සඳහා ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල සඵලදායී සහභාගීත්වය සියයට 49.5ක් වූ අතර, 2022 වසරේ දී පවත්වන ලද භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි 24දී ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල සඵලදායී සහභාගීත්වය වූයේ සියයට 22.4ක් පමණි.

ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල ද්විතීයික වෙළඳපොළ ක්‍රියාකාරකම්

2022 වසර තුළ දී රාජ්‍ය සුරැකුම්පත් හා සම්බන්ධ ද්විතීයික වෙළඳපොළ ගනුදෙනුවල වටිනාකම රුපියල් බිලියන 15,423.4ක් දක්වා සියයට 204.3කින් සැලකිය

යුතු ලෙස ඉහළ ගිය අතර එයින් සියයට 76.4ක් ප්‍රතිමිලදී ගැනුම් ගණුදෙනු විය. 2021 වසර සමඟ සැසඳීමේ දී 2022 වසර තුළ දී එකවර මිලදී ගැනුම් සියයට 94කින් ඉහළ ගිය අතර, එකවර විකුණුම් සියයට 80.7කින් වැඩි විය.

බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්

බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් අංශය සමාගම් 4කින් සමන්විත වූ අතර, එහි මුළු වත්කම් පදනම සියයට 18.7ක වර්ධනයක් සමඟින් 2022 වසර අවසානයේ දී රුපියල් බිලියන 9.9ක් විය. බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණයෙන් සියයට 74.1ක් නියෝජනය කරමින් ක්ෂුද්‍ර ණය වැඩි දායකත්වයක් ලබා දුන්නේය. 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 6.9ට සාපේක්ෂව ක්ෂුද්‍ර ණය 2022 වසර අවසානයේ දී සියයට 8.4ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 7.4ක් ලෙස සටහන් විය. 2022 වසර අවසානය වන විට බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල අක්‍රීය ණය අනුපාතය සියයට 8.7ක් විය. මෙම අංශයේ සමස්ත තැන්පතු පදනම 2021 වසරේ පැවති රුපියල් මිලියන 544ක සිට 2022 වසරේ දී රුපියල් මිලියන 648ක් දක්වා සියයට 19කින් වර්ධනය විය. මෙම අංශයේ සමස්ත වගකීම් 2021 වසරේ පැවති රුපියල් බිලියන 5.5 සිට 2022 වසරේ දී රුපියල් බිලියන 7.2ක් දක්වා සියයට 29කින් ඉහළ යෑමත් සමඟ, ණයවලට හිමිකම් අනුපාතය 2022 වසර අවසානය වන විට සියයට 4.3ක් දක්වා ඉහළ ගියේය. මෙම අංශයේ මූලික ප්‍රාග්ධන මට්ටම රුපියල් බිලියන 2.5ක් ලෙස වාර්තා වූ අතර, සියලුම බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් මූලික ප්‍රාග්ධනය සඳහා වන අවම විචක්ෂණශීලී රෙගුලාසිවලට අනුගතව ක්‍රියාත්මක විය.

ඒකක භාර අංශය

ක්‍රියාත්මකව පවතින ඒකක භාර සංඛ්‍යාව 2021 වසර අවසානයේ වාර්තා වූ 75 සිට 2022 වසර අවසානය වන විට 80 දක්වා ඉහළ ගියේය. ඒකක භාර කළමනාකරණ සමාගම් සංඛ්‍යාව 2021 වසර අවසානයට සාපේක්ෂව 2022 වසර අවසානයේ 16ක් ලෙස නොවෙනස්ව පැවතුණි. ඒකක භාර අරමුදල් ප්‍රධාන වශයෙන් මුදල් වෙළඳපොළ අරමුදල් සහ ආදායම් අරමුදල්වලින් සමන්විත වූ අතර එමගින් ඒකක භාර අංශයේ, සියයට 22.5ක් බැගින් නියෝජනය විය. මීට අමතරව, ගිල්ට් එඩ්ජ් අරමුදල්, වර්ධන අරමුදල් සහ සමතුලිත අරමුදල්, ඒකක භාර අංශය සඳහා පිළිවෙලින්, සියයට 15.0ක්, සියයට 12.5ක් සහ සියයට 12.5ක් ලෙස දායක විය.

8.14 රූප සටහන
අරමුදල් සංඛ්‍යාව අනුව ඒකක භාර අංශයේ වර්ගීකරණය



* වෙනත්: භාරියා අරමුදල් 3ක්, ඩොලර් අරමුදල් 3ක්, මූලික හිමිකම් නිකුතු අරමුදලක්, වර්ධන සහ ස්ථාවර අදායම් අරමුදලක්

මූලය: ශ්‍රී ලංකා විනිමය සහ සුරුකුම්පත් කොමිෂන් සභාව

2022 වසර අවසානයේ දී ඒකක භාර අංශයේ මුළු වත්කම් පදනමෙහි සංකෝචනයක් දක්නට ලැබුණි. 2022 වසර අවසානයේ දී මෙම අංශයේ සමස්ත වත්කම් 2021 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 195 සිට රුපියල් බිලියන 150ක් දක්වා සියයට 23.1කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. නිකුත් කරන ලද ඒකක සංඛ්‍යාව 2021 වසර අවසානයේ දී වාර්තා වූ මිලියන 7,835 සිට 2022 වසර අවසානයේ දී මිලියන 6,283ක් දක්වා අඩු වී ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, සමස්ත ඒකක හිමියන් සංඛ්‍යාව 2021 වසර අවසානයේ වාර්තා වූ 59,426ක සිට 2022 වසර අවසානයේ දී 67,912ක් දක්වා ඉහළ ගියේය.

ඒකක භාර විසින් රජයේ සුරුකුම්පත්වල කරන ලද ආයෝජන මෙම අංශයේ සමස්ත ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස 2021 වසර අවසානයේ වාර්තා වූ සියයට 12.1ක සිට 2022 වසර අවසානයේ සියයට 56.7ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, මෙම අංශයේ කොටස්වල ආයෝජනය ශුද්ධ

8.14 සංඛ්‍යා සටහන
ඒකක භාර අංශයේ ක්‍රියාකාරිත්වය

අයිතමය	2021 (අ)	2022 (ආ)
ඒකක භාර සංඛ්‍යාව	75	80
සමස්ත ඒකක හිමියන්ගේ සංඛ්‍යාව	59,426	67,912
නිකුත් කළ ඒකක ගණන (මිලියන)	7,835	6,283
සමස්ත වත්කම් (රු. බිලියන)	195	150
ශුද්ධ වත්කම් අගය (රු. බිලියන)	191	143
කොටස්වල ආයෝජන (රු. බිලියන)	17.6	11.8
සමස්ත ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස (%)	9.1	7.9
රජයේ සුරුකුම්පත්වල ආයෝජනය (රු. බිලියන)	23.4	84.9
සමස්ත ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස (%)	12.1	56.7

(අ) සංශෝධිත
(ආ)තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා ඒකක භාර සංගමය
ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

වත්කම්වල ප්‍රතිශතයක් ලෙස 2021 වසර අවසානයේ පැවති සියයට 9.1ට සාපේක්ෂව 2022 වසර අවසානයේ සියයට 7.9ක් දක්වා පහළ ගියේය.

රක්ෂණ අංශය

අයහපත් සාර්ව ආර්ථික තත්ත්වයන්ගෙන් හට ගත් අභියෝග මධ්‍යයේ වුවද, 2022 වසර අවසන් වන විට වත්කම් පදනම සහ දළ ලියාහළ වාරිකය අනුව රක්ෂණ අංශය සුළු වර්ධනයක් වාර්තා කළේය. මෙම අංශය මෙහෙයුම් කටයුතුවල නිරත වන සමාගම් 27කින් සමන්විත වූ අතර, ඉන් සමාගම් 14ක් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි පමණක් ද, සමාගම් 11ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි පමණක් ද, සමාගම් 2ක් දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ යන ව්‍යාපාර දෙකෙහිම නිරත විය. ප්‍රධාන වශයෙන්, ඉහළ උද්ධමනය හේතුවෙන් ඉහළ ගිය වෙළඳපොළ මිල අනුව ගණනය කරන දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ වර්ධනය සහ වාර්ෂික පදනම මත දළ ලියාහළ වාරිකයෙහි වර්ධනය අඩුවීම හේතුවෙන්, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සමස්ත වාරිකය මත පදනම්ව ගණනය කරන ලද, ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාප්තිය 2021 වසර සඳහා සියයට 1.4 සිට 2022 වසර සඳහා සියයට 1.0ක් දක්වා සුළු වශයෙන් අඩු විය. සම තත්ත්වයේ රටවල් හා සසඳන විට ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාප්තිය ඉතා පහළ මට්ටමක පවතී. 2022 වසර තුළ දී දිගුකාලීන රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ උප අංශවල රක්ෂණ ව්‍යාප්තිය, පිළිවෙලින්, සියයට 0.6 සහ සියයට 0.5ක් විය.

ව්‍යාපාර ව්‍යාප්තිය

2022 වසර අවසානය වන විට රක්ෂණ අංශයේ මුළු වත්කම් ප්‍රමාණය සියයට 7.4කින් රුපියල් බිලියන 947.3ක් දක්වා වර්ධනය විය. දිගුකාලීන රක්ෂණ උප අංශයේ වත්කම් පදනම 2021 වසර අවසානය වන විට වාර්තා වූ සියයට 12.2ක වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 668.7ක් දක්වා සියයට 5.7කින් වර්ධනය විය. මේ අතර, සාමාන්‍ය රක්ෂණ උප අංශයේ වත්කම් පදනම 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 278.6ක් දක්වා සියයට 11.8කින් ඉහළ ගියේය. 2022 වසර අවසානය වන විට, රක්ෂණ අංශයේ සමස්ත වත්කම්වල ප්‍රතිශතයක් ලෙස දිගුකාලීන රක්ෂණ උප අංශයේ වත්කම් පදනම, 2021 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 71.7ක සිට සුළු අඩුවීමක් සිදු වුවද සියයට 70.6ක ඉහළ මට්ටමක පැවතුණි. මෙම පහත වැටීමට සමගාමීව, රක්ෂණ අංශයේ සමස්ත වත්කම්වල ප්‍රතිශතයක් ලෙස සාමාන්‍ය රක්ෂණ උප අංශයේ වත්කම් පදනම, 2021 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 28.3ක සිට 2022 වසර අවසානය වන විට සියයට 29.4ක් දක්වා වර්ධනය විය.

8.15 සංඛ්‍යා සටහන

රක්ෂණ අංශයේ ක්‍රියාකාරිත්වය*

රු. බිලියන

අයිතමය	2021 (අ)	2022 (ආ)
සමස්ත වත්කම්	881.8	947.3
රජයේ සුරැකුම්පත්	338.6	413.3
හිමිකම් කොටස්	55.7	47.2
අතැති මුදල් හා තැන්පතු	132.1	112.5
දළ වාරිකය	233.5	257.6
සමස්ත ආදායම	299.0	336.1
වාරික ආදායම	233.5	257.6
අයෝජන ආදායම	65.5	78.6
බදු පෙර ලාභය	42.2	50.3
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%)		
- දිගු කාලීන රක්ෂණය	384.0	303.0
- සාමාන්‍ය රක්ෂණය	307.0	210.0
රඳවා ගැනීම් අනුපාතය (%)		
- දිගු කාලීන රක්ෂණය	96.0	95.1
- සාමාන්‍ය රක්ෂණය	76.4	75.3
හිමිකම් අනුපාතය (%)		
- දිගු කාලීන රක්ෂණය	38.5	47.1
- සාමාන්‍ය රක්ෂණය	55.6	64.0
ඒකාබද්ධ මෙහෙයුම් අනුපාතය (%)		
- දිගු කාලීන රක්ෂණය	81.1	89.5
- සාමාන්‍ය රක්ෂණය	95.3	105.3
වත්කම් මත ප්‍රතිලාභය (%)		
- දිගු කාලීන රක්ෂණය	3.9	3.6
- සාමාන්‍ය රක්ෂණය	8.0	10.1
හිමිකම් මත ප්‍රතිලාභය (%)		
- දිගු කාලීන රක්ෂණය	17.7	17.1
- සාමාන්‍ය රක්ෂණය	16.3	20.8
ප්‍රාරක්ෂණ අනුපාතය (%)		
- සාමාන්‍ය රක්ෂණය	24.8	16.9

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
*ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු හැර

මූලය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

රක්ෂණ අංශයේ දළ ලියාහළ වාරිකය 2021 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 233.5 සිට 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 257.6ක් දක්වා සියයට 10.3කින් වර්ධනය විය. සලකා බලන කාල පරිච්ඡේදය තුළ දී දිගුකාලීන රක්ෂණ උප අංශයේ සහ සාමාන්‍ය රක්ෂණ උප අංශයේ දළ ලියාහළ වාරික, පිළිවෙලින්, සියයට 8.5කින් සහ සියයට 12.4කින් ඉහළ ගියේය. කෙසේ වුවද, දිගුකාලීන රක්ෂණ උප අංශය, මුළු දළ ලියාහළ වාරිකයේ ප්‍රධාන කොටසක් ලෙස පැවතුණ අතර 2022 වසර අවසානය වන විට සියයට 52.6ක දායකත්වයක් දක්වන ලදී. සාමාන්‍ය රක්ෂණ උප අංශයෙන් සියයට 53.5ක කොටසක් නියෝජනය කරන එහි ප්‍රධාන ව්‍යාපාර අංශය වන මෝටර් රථ රක්ෂණ අංශයේ දළ ලියාහළ වාරිකය 2022 වසර අවසානය වන විට සියයට 9.5කින් වර්ධනය විය.

8.15 රූප සටහන
රක්ෂණ අංශයේ දළ ලියාහළ වාරික ආදායම



මූලාශ්‍ර: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

මෙම අංශයේ ආයෝජන කළඹ 2022 වසර අවසානයේ දී වාර්ෂිකව සියයට 5.6කින් රුපියල් බිලියන 776.6ක් දක්වා වර්ධනය විය. මෙම අංශයෙහි ආයෝජන තවදුරටත් වැඩි වශයෙන් රජයේ සුරැකුම්පත් මත කේන්ද්‍රගත වී ඇති අතර, 2022 වසර තුළ දී පැවති සාපේක්ෂ ඉහළ පොලී අනුපාතික සමඟ, දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ උප අංශ දෙකෙහිම මුළු ආයෝජනවලට සාපේක්ෂව රජයේ සුරැකුම්පත්වල ආයෝජන 2021 වසර අවසානයේ පැවති සියයට 46.1 සහ සියයට 45.9ට සාපේක්ෂව, පිළිවෙලින්, සියයට 53.8ක් සහ සියයට 51.3ක් දක්වා වැඩි විය. මේ අතර, දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ උප අංශවල සමස්ත ආයෝජනවලින් කොටස්වල සිදු කරන ලද ආයෝජන 2021 වසර අවසානයේ පැවති සියයට 7.5 සහ සියයට 7.8 සිට 2022 වසර අවසානය වන විට, පිළිවෙලින්, සියයට 6.2ක් සහ සියයට 5.8ක් දක්වා අඩු විය.

ලාභදායීත්වය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව

2022 වසර තුළ දී රක්ෂණ අංශයේ ලාභදායීත්වය ඉහළ ගිය අතර බදු පෙර ලාභයෙහි සියයට 19.4ක වාර්ෂික වර්ධනයක් වාර්තා විය. 2022 වසර අවසානයේ මුළු ආදායමෙහි වාර්තා වූ සියයට 15.4ක වැඩිවීමත් සමඟ සාමාන්‍ය රක්ෂණ උප අංශයේ බදුපෙර ලාභය සලකා බලන කාල සීමාව තුළ දී සියයට 41.2ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, 2022 වසර අවසානයේ හිමිකම්පෑම්වල වාර්තා වූ සියයට 31.5ක වැඩිවීම හේතුවෙන් දිගුකාලීන රක්ෂණ උප අංශයේ බදුපෙර ලාභයෙහි සියයට 1.3ක සුළු වර්ධනයක් වාර්තා විය.

2021 වසරට සාපේක්ෂව 2022 වසර අවසානයේ දිගුකාලීන රක්ෂණ උප අංශයේ වත්කම් මත ප්‍රතිලාභය සහ හිමිකම් මත ප්‍රතිලාභය පහළ ගිය අතර සාමාන්‍ය රක්ෂණ උප අංශයේ වත්කම් මත ප්‍රතිලාභය සහ හිමිකම් මත ප්‍රතිලාභය ඉහළ ගියේය. දිගුකාලීන රක්ෂණ උප අංශයේ වත්කම් මත ප්‍රතිලාභය සහ හිමිකම් මත ප්‍රතිලාභය 2021 වසර අවසානයේ වාර්තා වූ සියයට 3.9 සහ සියයට 17.7 සිට 2022 වසර අවසන් වන විට, පිළිවෙලින්, සියයට 3.6ක් සහ සියයට 17.1ක් දක්වා පහත වැටුණි. මේ අතර, සාමාන්‍ය රක්ෂණ උප අංශයේ වත්කම් මත ප්‍රතිලාභය සහ හිමිකම් මත ප්‍රතිලාභය 2021 වසර අවසානයේ වාර්තා වූ සියයට 8.0 සහ සියයට 16.3 සිට 2022 වසර අවසන් වන විට, පිළිවෙලින්, සියයට 10.1ක් සහ සියයට 20.8ක් දක්වා ඉහළ ගියේය.

දිගුකාලීන රක්ෂණ උප අංශයේ සහ සාමාන්‍ය රක්ෂණ උප අංශයේ සමස්ත වත්කම් මත ප්‍රාග්ධනය 2021 වසර අවසානයේ පැවති සියයට 21.3 සහ 49.7ක සිට 2022 වසර අවසානය වන විට සියයට 20.8ක් සහ සියයට 47.5ක් දක්වා පහත වැටුණි. මේ අතර, දිගුකාලීන රක්ෂණ උප අංශයේ සහ සාමාන්‍ය රක්ෂණ උප අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය 2021 වසර අවසානයේ පැවති සියයට 384 සහ සියයට 307 සිට 2022 වසර අවසානය වන විට, පිළිවෙලින්, සියයට 303 සහ සියයට 210 දක්වා අඩු විය.

විශ්‍රාම අරමුදල්

2022 වසර අවසානයේ දී විශ්‍රාම අරමුදල්වල වත්කම්, මූල්‍ය අංශයේ මුළු වත්කම්වලින් සියයට 13.8ක් වූ අතර එය රුපියල් බිලියන 4,345.0ක් ලෙස වාර්තා විය. කෙසේ වුවද, විශ්‍රාම අරමුදල් අංශයේ මුළු වත්කම්වලින් සියයට 79.6ක් නියෝජනය කරන සේවක අර්ථසාධක අරමුදල එම අංශයේ ප්‍රමුඛත්වය දරයි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සහ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල නම් වූ රාජ්‍ය අංශය විසින් කළමනාකරණය කරන ලද අරමුදල් දෙක 2022 වසර අවසානයේ දී, විශ්‍රාම අරමුදල් අංශයේ මුළු වත්කම්වලින්, පිළිවෙලින්, සියයට 10.8ක් සහ සියයට 2.0ක් විය. මීට අමතරව, 2022 වසර අවසන් වන විට පුද්ගලික අංශය විසින් කළමනාකරණය කරන ලද අනුමත විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් 117ක් විය.

සේවක අර්ථසාධක අරමුදල

2022 වසර අවසානයේ විශ්‍රාම අරමුදල් අංශයේ මුළු වත්කම්වලින් සියයට 79.6ක් නියෝජනය කරමින් සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ./අරමුදල) එම අංශයේ ප්‍රධාන අරමුදල ලෙස අඛණ්ඩව පැවතුණි.

අරමුදලෙහි මුළු වටිනාකම 2021 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 3,166.1ට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 9.3ක වර්ධනයක් පෙන්නුම් කරමින්, රුපියල් බිලියන 3,459.9ක් දක්වා රුපියල් බිලියන 293.7කින් ඉහළ ගියේය. සාමාජිකයන්ගේ ශුද්ධ දායක මුදල් ලැබීම්වල (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) මෙන්ම අරමුදල් ආයෝජනය තුළින් උපයාගත් ආදායම්වල සමස්ත ප්‍රතිඵලය මෙම වර්ධනයට හේතු විය. අරමුදල, සාමාජිකයන් වෙත වූ මුළු වගකීම 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 3,380.6ක් වූ අතර, එය 2021 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 3,066.9ට සාපේක්ෂව සියයට 10.2ක වර්ධනයකි. 2022 වසර සඳහා මුළු දායක මුදල් ලැබීම් සියයට 17.4කින් රුපියල් බිලියන 194.6ක් දක්වා වර්ධනය වූ අතර සාමාජිකයන් හා ඔවුන්ගේ නෛතික උරුමක්කරුවන් හට සිදු කළ සමස්ත ප්‍රතිලාභ ගෙවීම් රුපියල් බිලියන 163.0ක් වූ අතර, එය 2021 වසරට සාපේක්ෂව සියයට 37.9ක වර්ධනයකි. ඒ අනුව, 2022 වසරට අදාළ ශුද්ධ දායක මුදල් ලැබීම් පෙර වසරේ පැවති රුපියල් බිලියන 47.5ට සාපේක්ෂව රුපියල් බිලියන 31.6ක් විය. අරමුදලෙහි ශුද්ධ ආදායම පෙර වසරේ වාර්තා කළ රුපියල් බිලියන 299.1ට සාපේක්ෂව සියයට 11.7කින් පහළ යමින් 2022 වසර අවසානයේ දී රුපියල් බිලියන 264.1ක් විය. මෙයට ප්‍රධානතම හේතුව වූයේ පෙර වසරේ ලැයිස්තුගත කොටස් මත පැවති උපලබ්ධි නොවූ වෙළඳපොළ මිලට අගය කළ ලාභය වූ රුපියල් බිලියන 41.8ට සාපේක්ෂව 2022 වසරේ දී ලැයිස්තුගත කොටස් මත උපලබ්ධි නොවූ වෙළඳපොළ මිලට අගය කළ අලාභය රුපියල් බිලියන 40.9ක් වීමයි.

8.16 සංඛ්‍යා සටහන

සේවක අර්ථසාධක අරමුදලේ කාර්යසාධනය පිළිබඳ වසර පහක සාරාංශය

අයිතමය	2018	2019	2020	2021	2022(අ)
අරමුදලේ සමස්ත වටිනාකම (රු. බිලියන)	2,289.4	2,540.4	2,824.3	3,166.1	3,459.9
සාමාජිකයන් සඳහා වූ මුළු වගකීම (රු. බිලියන)	2,254.2	2,497.6	2,767.8	3,066.9	3,380.6
මුළු දායක මුදල් ලැබීම් (රු. බිලියන)	145.0	157.2	150.7	165.7	194.6
මුළු ප්‍රතිලාභ ගෙවීම් (රු. බිලියන)	108.0	126.3	109.7	118.2	163.0
ශුද්ධ දායක මුදල් ලැබීම් (රු. බිලියන)	37.0	30.9	41.0	47.5	31.6
සාමාජික ගිණුම් සඳහා ගෙවූ පොලී අනුපාතිකය (%)	9.50	9.25	9.00	9.00	9.00
මුළු සාමාජික ගිණුම් (මිලියන)	18.7	19.4	19.8	20.3	20.4
සක්‍රීය සාමාජික ගිණුම් (මිලියන)	2.9	2.9	2.6	2.5	2.4

(අ) තාවකාලික

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව

අරමුදලෙහි සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම (පොත් අගය) 2021 වසරේ පැවති රුපියල් බිලියන 3,173.3ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 3,466.5ක් දක්වා සියයට 9.2කින් වර්ධනය විය. අරමුදලෙහි ආයෝජන ප්‍රතිපත්තිය, අරමුදලෙහි සුරක්ෂිතභාවය ආරක්ෂා කර ගනිමින්, සාමාජිකයින්ට අවදානම්වලට ගළපන ලද ප්‍රශස්ත ප්‍රතිලාභයක් ලබා දීමේ අරමුණ පෙරදැරිව ක්‍රියාත්මක කෙරුණු අතර එහිදී සාමාජිකයන්ට ප්‍රතිලාභ ගෙවීම් සහ අනෙකුත් මෙහෙයුම් වියදම් සපුරාගැනීම සඳහා අවශ්‍ය ද්‍රවශීලතාව පවත්වා ගැනීම ද සලකා බලනු ලැබීය. ඒ අනුව, 2022 වසර අවසානය වන විට අරමුදලෙහි සමස්ත ආයෝජන කළඹෙන් සියයට 96.9ක් රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කර තිබූ අතර, සමාගම් කොටස්වල සියයට 2.3ක් ද සාංගමික ණයකරවල සියයට 0.7ක් ද ඉතිරි සියයට 0.1 ප්‍රතිවිකුණුම් ගිවිසුම්වල ද ආයෝජනය කර තිබුණි.

අරමුදලෙහි සමස්ත ආයෝජන ආදායම 2022 වසරේ දී රුපියල් බිලියන 315.9ක් ලෙස වාර්තා වූ අතර, එය පෙර වසරේ වාර්තා කළ රුපියල් බිලියන 342.2 හා සැසඳීමේ දී සියයට 7.7ක පහත වැටීමකි. පොලී ආදායම, අරමුදලෙහි ප්‍රධාන ආදායම් ප්‍රභවය ලෙස අඛණ්ඩව පැවති අතර එය 2021 වසරේ උපයන ලද රුපියල් බිලියන 293.7ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 349.3ක් දක්වා සියයට 18.9කින් වර්ධනය විය. 2022 වසරේ ලාභාංශ ආදායම 2021 වසරේ දී වූ රුපියල් බිලියන 6.7ට සාපේක්ෂව සියයට 12.6කින් රුපියල් බිලියන 7.5ක් දක්වා වර්ධනය විය. පෙර සඳහන් කළ පරිදි, 2021 වසරේ දී ලැයිස්තුගත කොටස් මත පැවති උපලබ්ධි නොවූ වෙළඳපොළ මිලට අගය කළ ලාභය රුපියල් බිලියන 41.8ක් ලෙස වාර්තා වූ අතර 2022 වසරේ දී එය රුපියල් බිලියන 40.9ක අලාභයක් ලෙස දැක්විණි.

2022 වසරේ දී අරමුදලේ සමස්ත දළ ආදායම රුපියල් බිලියන 316.2ක් ලෙස සටහන් වූ අතර, එය පෙර වසරේ වාර්තා කළ රුපියල් බිලියන 342.4 හා සැසඳීමේ දී සියයට 7.6ක අඩු වීමකි. මෙහෙයුම් වියදම් සහ බදු වියදම් සඳහා වෙන් කිරීම් කළ පසු 2022 වසර සඳහා ශුද්ධ ලාභය රුපියල් බිලියන 264.1ක් වන අතර එය 2021 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 299.1ට සාපේක්ෂව සියයට 11.7ක අඩුවීමකි. ඒ අනුව, 2022 වසරේ සේවක අර්ථසාධක අරමුදලේ සාමාන්‍ය ආයෝජනය මත ප්‍රතිලාභය සියයට 9.96ක් විය. භාණ්ඩ හා සේවාවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබියදීත්, 2022 වසරේ දී අරමුදලේ දළ ආදායමට සාපේක්ෂව මෙහෙයුම් වියදම් අනුපාතය

සියයට 0.67ක් ලෙස පවත්වා ගෙන යාමට හැකිවිය. කෙසේ වුවද, 2022 වසරේ පොලී අදායම සහ ලාභාංශ අදායම වැඩිවීමත් සමඟ අරමුදලේ ආදායම් බදු වියදම 2021 වසර හා සැසඳීමේ දී රුපියල් බිලියන 7.3කින් වැඩි විය. කෙසේ වුවද, මූල්‍ය උපකරණ වර්ගීකරණය හා මිනුම්කරණය සඳහා අදාළ වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 09ට අනුව ලැයිස්තුගත ව්‍යාපාර කොටස්, සාධාරණ වටිනාකමට ගණනය කරන ලද අතර, පැවති අහිතකර වෙළඳපොළ තත්ත්වය හේතුවෙන් 2022 වසරේ දී රුපියල් බිලියන 40.9ක ශුද්ධ අලාභයක් වාර්තා විය. තවද, 2022 වසරේ අප්‍රේල් මාසය දක්වා වෙළඳපොළෙහි පැවති අඩු පොලී අනුපාතික සලකා බැලීමේ දී, 2022 වසරේ මැයි මාසයෙන් පසුව ආයෝජනය කරන ලද අරමුදල් පමණක්, ඉහළ පොලී අනුපාතික යටතේ ආයෝජනය කළ අතර, පසුගිය කාලසීමාවන් තුළ රැස්කරගත් ආයෝජනය කළ හැකි අරමුදල් අඩු පොලී අනුපාතිකයන් යටතේ ආයෝජනය කර තිබුණි.

තවද, ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන හා මූල්‍ය වෙළඳපොළට සාපේක්ෂව අරමුදල විශාල වීම හේතුවෙන් ආයෝජන අවස්ථා සීමා සහිත වීමත් සමඟ සිය ආයෝජන රාජ්‍ය සුරැකුම්පත්වල බොහෝ දුරට යෙදවීමට සේවක අර්ථසාධක අරමුදලට සිදු විය. ඇතිවිය හැකි දේශීය ණය ප්‍රශස්තිකරණ ක්‍රියාවලියක දී මෙලෙස වැඩි වශයෙන් රජයේ සුරැකුම්පත් මත යැපීමට සිදු වීම මගින් සේවක අර්ථසාධක අරමුදලට යම් අවදානමකට මුහුණ දීමට සිදුවිය හැක. පැවති අහිතකර ආර්ථික හා මූල්‍ය තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ ආයෝජන පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රියාවලිය වසර තුළ දී අභියෝගාත්මක විය. ඉහත අභියෝග සැලකිල්ලට ගෙන මුදල් මණ්ඩලය මගින් අනුමත කර ඇති අවදානම් කළමනාකරණ රාමුවට (ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය, උපාය මාර්ගික වත්කම් විභජනයන් සහ ආයෝජන මාර්ගෝපදේශ) සහ අභ්‍යන්තර පාලන පද්ධතියට අනුකූල වන පරිදි අවදානම් ගලපන ලද ප්‍රශස්ත ප්‍රතිලාභයක් ළඟා කර ගැනීම සඳහා සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් සිය ආයෝජන ක්‍රමෝපායන් හැඩගස්වන ලදී.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

විශ්‍රාම අරමුදල් අංශයේ වත්කම් පදනමෙන් සියයට 10.8කට දායක වූ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, 2022 වසරේ දී එහි වත්කම් පදනම, මුළු දායකත්වය සහ ආයෝජන අනුව වර්ධනයක් වාර්තා කළේය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි සාමාජික ගිණුම් මිලියන 16.8න් 2022 වසර අවසන් වන විට පැවති සක්‍රීය ගිණුම් ප්‍රමාණය මිලියන 2.4ක් පමණි. අරමුදලට දායක වන සේවා යෝජකයින් සංඛ්‍යාව 2021 වසර අවසානයේ 44,501 සිට 2022 වසර අවසන් වන විට 68,488ක් දක්වා ඉහළ ගියේය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි මුළු සාමාජික ශේෂය 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 422.9ක් දක්වා සියයට 4.1කින් වර්ධනය විය. 2022 වසර අවසානය වන විට, අරමුදල වෙත ලැබුණු මුළු දායකත්වය වාර්ෂිකව සියයට 17.4කින් රුපියල් බිලියන 34.8ක් දක්වා වර්ධනය වූ අතර සාමාජිකයින්ට ගෙවන ලද මුළු ප්‍රතිලාභ වාර්ෂික පදනම මත සියයට 26.4කින් රුපියල් බිලියන 25.0ක් දක්වා වර්ධනය විය.

මේ අතර, 2022 වසර අවසානය වන විට සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි සමස්ත වත්කම් රුපියල් බිලියන 468.8ක් දක්වා සියයට 11.9කින් ඉහළ ගියේය. අරමුදල මගින් කරන ලද ආයෝජන 2022 වසර අවසානයේ රුපියල් බිලියන 442.5ක් වූ අතර එය 2021 වසර අවසානයට සාපේක්ෂව සියයට 7.8ක වැඩිවීමකි. 2022 වසර අවසානය වන විට මෙම ආයෝජනවලින් සියයට 94ක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර තිබූ අතර පෙර වසරේ දී එම අගය සියයට 86.7ක් විය. 2022 වසර අවසන් වන විට අරමුදල විසින් ස්ථාවර තැන්පතුවල ආයෝජිත ප්‍රමාණය මුළු ආයෝජනයන්ගෙන් සියයට 0.1ක් වූ අතර එය 2021 වසර අවසන් වන විට වාර්තා වූ සියයට 6.9ට සාපේක්ෂව සැලකිය යුතු අඩු වීමකි. 2022 වසර සඳහා

8.17 සංඛ්‍යා සටහන
සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ ක්‍රියාකාරිත්වය

අයිතමය	2021 (අ)	2022 (අා)
සමස්ත වත්කම් (රු. බිලියන)	419.1	468.8
සමස්ත නොපියවූ සාමාජික ගිණුම් ශේෂය (රු. බිලියන)	406.3	422.9
සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන)	14.7	16.8
ක්‍රියාකාරී සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන)	2.1	2.4
දායකවන්නා වූ සේවා යෝජකයන් සංඛ්‍යාව	44,501	68,488
සමස්ත දායකත්වය (රු. බිලියන)	29.7	34.8
සමස්ත ප්‍රතිගෙවුම් (රු. බිලියන)	19.8	25.0
සමස්ත ආයෝජන කළඹ (රු. බිලියන)	410.6	442.5
එයින් රජයේ සුරැකුම්පත් (%)	86.7	94.0
එයින් ස්ථාවර තැන්පත් (%)	6.9	0.1
දළ ආදායම (රු. බිලියන)	35.5	47.5
බෙදාහැරීම සඳහා පවත්නා ලාභය (රු. බිලියන)	28.6	38.5
ආයෝජනය මත ප්‍රතිලාභය (%)	8.6	9.2
සාමාජික ගිණුම් සඳහා ගෙවූ පොලී අනුපාතිකය (%)	7.3	8.8

(අ) සංශෝධිත
(අා)තාවකාලික

මූලයඃ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

එහි සාමාජික ශේෂයන් මත සියයට 8.8ක ප්‍රතිලාභයක් ගෙවීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සමත් වූ අතර එය පෙර වසර තුළ ගෙවූ ප්‍රතිලාභය වන සියයට 7.3ට සාපේක්ෂව වැඩිවීමකි.

අනෙකුත් විශ්‍රාම අරමුදල්

විශ්‍රාම අරමුදල් අංශයෙන් සියයට 2.0ක් නියෝජනය කරනු ලබන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල, 2022 වසර තුළ දී වත්කම් පදනම සහ ආයෝජන අනුව ඉහළ යාමක් වාර්තා කළ අතර ශුද්ධ දායකත්වයෙහි අඩුවීමක් වාර්තා කරන ලදී. 2022 වසර අවසානය වන විට අරමුදලෙහි වත්කම් පදනම රුපියල් බිලියන 85.9ක් දක්වා සියයට 2.9කින් වර්ධනය විය. අරමුදලේ සක්‍රීය සාමාජිකයින් සංඛ්‍යාව 2021 වසර අවසානයේ පැවති 241,384 හා සසඳන විට 2022 වසර අවසානයේ දී 267,367ක් විය. මේ අතර, 2022 වසර අවසානය වන විට අරමුදලෙහි ආයෝජන ද සියයට 5.4කින් වර්ධනය වෙමින් රුපියල් බිලියන 85.4ක් දක්වා ළඟා විය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල 2022 වසර අවසන් වන විට එහි මුළු ආයෝජනවලින් සියයට 42.7ක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර තිබූ අතර අනෙකුත් ආයෝජන මුළු ආයෝජනවලින් සියයට 57.3ක් විය. අරමුදල විසින් පසුගිය වසරේ වාර්තා කළ රුපියල් මිලියන 835ක ශුද්ධ දායකත්වයට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් මිලියන 262ක ශුද්ධ දායකත්වයක් වාර්තා කරන ලදී. සාමාජික ශේෂයන් මත ප්‍රතිලාභ අනුපාතය 2022 වසරේ දී සියයට 8.00හි නොවෙනස්ව පැවතුණි.

අනුමත විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් 2022 වසර අවසානය වන විට විශ්‍රාම අරමුදල් අංශයේ වත්කම්වලින් සියයට 7.6ක් විය. මෙම අරමුදල් මගින් ආවරණය වන ඇස්තමේන්තුගත සාමාජිකයින් සංඛ්‍යාව 122,800ක් වූ අතර අරමුදල්වල මුළු වත්කම් 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 330.4ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

8.4 මූල්‍ය වෙළඳපොළ කාර්යසාධනය

දේශීය මුදල් වෙළඳපොළ

මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව

2022 වසරේ පළමු භාගය තුළ දී දේශීය මුදල් වෙළඳපොළ තුළ අඛණ්ඩ ඉහළ ද්‍රවශීලතා හිඟයක් වාර්තා වුවද, 2021 වසර අවසානයට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට එම ද්‍රවශීලතා හිඟය සැලකිය යුතු ලෙස අඩු වී රුපියල් බිලියන 231ක් ලෙස වාර්තා විය. 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 366ක් වූ ද්‍රවශීලතා හිඟය, 2022 වසරේ මුල් මාස හතර තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර එය 2022 වසරේ අප්‍රේල් මස අවසානය වන විට රුපියල් බිලියන 688ක් ලෙස වාර්තා විය. මහ බැංකුව විසින් ප්‍රාථමික වෙන්දේසි මගින් භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම මෙන්ම, මහ බැංකුව විසින් රජය වෙත තාවකාලික අත්තිකාරම් සැපයීම සහ ලාභ පැවරුම් සිදු කිරීම මගින් ද්‍රවශීලතාවය ඉහළ නැංවුවද, බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් ව්‍යවහාර මුදල් ආපසු ලබා ගැනීම, ගෙවීමට නියමිත වූ විදේශ ණය ගෙවීම මෙන්ම විදේශ විනිමය හුවමාරු ගනුදෙනු කල්පිරීම සහ අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා මුදල් සැපයීමට විදේශ විනිමය විකිණීම හේතුවෙන් 2022 වසරේ දී ද්‍රවශීලතා හිඟය සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවතුණි. කෙසේ වුවද, ඉහළ පොලී අනුපාතික හේතුවෙන් බැංකු අංශය වෙත තැන්පතු ලැබීම් ඉහළ යෑම සහ රජයේ හදිසි මුදල් අවශ්‍යතා සඳහා මහ බැංකුව විශේෂ නිකුතු හරහා භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම හේතුවෙන් 2022 වසරේ මැයි මාසයේ සිට හිඟ ද්‍රවශීලතාව ක්‍රමිකව අඩු විය. මීට අමතරව, බලපත්‍රලාභී වාණිජ බැංකු කිහිපයක් මුහුණ පෑ දැඩි ද්‍රවශීලතා හිඟය තුළින් ඇති වූ පීඩනය අවම කිරීමේ අරමුණින් 2022 වසරේ දී මහ බැංකුව විසින් කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි හරහා වරින් වර ද්‍රවශීලතාව සපයන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට වෙළඳපොළ ද්‍රවශීලතා හිඟය අඩු විය. මේ අතර, මහ බැංකුව විසින්

8.16 රූප සටහන
මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවයේ දෛනික වෙනස්කම් සඳහා බලපාන සාධක



ප්‍රාථමික වෙළඳපොළ වෙතින් භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම තුළින් ද්‍රවශීලතාව ඉහළ යෑමේ බලපෑම යම්තාක් දුරකට අවම කිරීම සඳහා 2022 වසරේ ජූනි මස මැද භාගයේ සිට අවශ්‍ය අවස්ථාවල දී මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනමින් විවට වෙළඳපොළ වෙන්දේසි හරහා විකිණීම සිදු කළේය. 2022 වසර තුළ දී වෙළඳපොළ ද්‍රවශීලතාව අසමතුලිතව ව්‍යාප්ත වී තිබූ අතර රජයේ ණය ගැනීම් ඉහළ යෑම හේතුවෙන් විශේෂයෙන්ම රාජ්‍ය බැංකු ඇතුළු බලපත්‍රලාභී දේශීය බැංකු කිහිපයක් සැලකිය යුතු හිඟ ද්‍රවශීලතාවක් වාර්තා කළ නමුත් විදේශීය බැංකුවල සැලකිය යුතු අතිරික්ත ද්‍රවශීලතාවක් වාර්තා විය.

මුදල් වෙළඳපොළ පොලී අනුපාතික

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව වෙත ගමන් කර එහි ඉහළ සීමාවෙහි රැඳී පැවතුණි. දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට සමගාමීව මහ බැංකුව විසින් 2022 වසර තුළ දී අවස්ථා හතරක දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 950කින් සමුච්චිත පදනමින් ඉහළ නැංවූ අතර පසුව 2022 වසර අවසානය වන විට නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙලින්, සියයට 14.50 සහ සියයට 15.50ක් දක්වා ඉහළ නංවන ලදී.

8.17 රූප සටහන

විවට වෙළඳපොළ වෙන්දේසි, නිත්‍ය පහසුකම, නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

දැඩි මුදල් ප්‍රතිපත්තියට ප්‍රතිචාර ලෙස බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාවේ තවදුරටත් පැවති අතර 2022 වසරේ දෙසැම්බර් අවසානය වන විට එය සියයට 15.50ක් විය. 2023 වසරේ පළමු කාර්තුවේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික තවත් පදනම් අංක 100කින් ඉහළ දැමීම හේතුවෙන් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ද ඊට සමාන ප්‍රමාණයකින් ඉහළ ගියේය. බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාවේ පැවතුණද, 2022 වසරේ අප්‍රේල් මස මැද භාගයේ සිට ඒක්ෂණ මුදල් වෙළඳපොළ අවම ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. විශේෂයෙන් රාජ්‍ය මූල්‍ය අංශයේ වර්ධනයන්

8.18 සංඛ්‍යා සටහන

මුදල් වෙළඳපොළ ගනුදෙනු සහ විවට වෙළඳපොළ කටයුතුවල සමස්ත සාරාංශය

ගනුදෙනු	පරිමාව (රුපියල් බිලියන)		බරිත සාමාන්‍ය පොලී අනුපාතිකය (අවම-උපරිම) - %	
	2021	2022	2021	2022
වෙළඳපොළ				
ඒක්ෂණ මුදල් (එක්දින)	7,935	3,746	4.53 - 5.97	5.94 - 15.50
ප්‍රතිමිලදීගැනුම් (එක්දින)	3,533	1,568	4.55 - 6.00	5.95 - 15.50
විවට වෙළඳපොළ කටයුතු				
එක්දින පදනමින්				
ප්‍රතිමිලදීගැනුම්	1,183	1,533	5.71 - 5.99	5.96 - 6.49
ප්‍රතිවිකුණුම්	-	-	-	-
ද්‍රවශීලතා ආධාරක පහසුකම (අ)	-	-	-	-
කෙටිකාලීන පදනමින්				
ප්‍රතිමිලදීගැනුම්	423	22	5.96 - 5.99	5.95 - 6.49
ප්‍රතිවිකුණුම්	-	235	-	7.50
ද්‍රවශීලතා ආධාරක පහසුකම (අ)	-	-	-	-
දිගුකාලීන පදනමින්				
ප්‍රතිමිලදීගැනුම්	60	-	6.04 - 6.05	-
ප්‍රතිවිකුණුම්	204	955	6.13 - 7.20	7.73 - 33.07
ද්‍රවශීලතා ආධාරක පහසුකම (අ)	-	-	-	-
ස්ථිර පදනමින්				
භාණ්ඩාගාර බිල්පත් මිලදීගැනීම්	-	-	-	-
භාණ්ඩාගාර බැඳුම්කර මිලදීගැනීම්	-	-	-	-
භාණ්ඩාගාර බිල්පත් විකුණුම්	14	24	7.00-7.23	20.75 - 26.97
භාණ්ඩාගාර බැඳුම්කර විකුණුම්	-	-	-	-
නිත්‍ය පහසුකම (ප්‍රතිපත්ති පොලී අනුපාතික යටතේ)				
නිත්‍ය තැන්පතු පහසුකම	29,450	54,528	5.00 (ආ)	14.50 (ආ)
නිත්‍ය ණය පහසුකම	30,095	163,058	6.00 (ආ)	15.50 (ආ)

(අ) ද්‍රවශීලතා ආධාරක පහසුකම යනු විවට වෙළඳපොළ කටයුතු යටතේ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා වන ප්‍රතිවිකුණුම් වෙන්දේසි වර්ගයකි.
(ආ) වසර අග අනුපාතික

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

විශේෂ සටහන 11

මුදල් හා මූල්‍ය ස්ථායීතාව සුරක්ෂිත කිරීම සඳහා අර්බුදකාරී අවධිවලදී පද්ධතිමය ද්‍රවශීලතා ගැටලු විසඳීම පිණිස මහ බැංකුවේ මැදිහත් වීම

1. හැඳින්වීම

2007 වසරෙහි මැද භාගයේ දී ඇති වූ ගෝලීය මූල්‍ය අර්බුදය, මූල්‍ය ස්ථායීතාව සහතික කිරීමේ අවශ්‍යතාව සහ පද්ධතිමය අර්බුද කළමනාකරණය කිරීමේදී සහ වැළැක්වීමේදී මහ බැංකුවල මූලික භූමිකාව කෙරෙහි අලුතින් අවධානය යොමු කිරීමේ අවශ්‍යතාව පිළිබඳ නව උනන්දුවක් ඇති කිරීමට හේතු විය. ගෝලීය මූල්‍ය අර්බුදය විසින් ඇති කරන ලද කැළඹීමට ප්‍රතිචාර වශයෙන් ලොව පුරා මහ බැංකු විසින් මූල්‍ය ආයතන සහ වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සැපයීම සඳහා නව උපකරණ සහ පවතින උපකරණ ද භාවිතා කරන ලදී. 1948 දී බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලැබීමෙන් පසු ඇතිවූ දරුණුතම ආර්ථික අර්බුදයට ශ්‍රී ලංකා ආර්ථිකය 2022 කාලපරිච්ඡේදය තුළ දී මුහුණ දුන්නේය. එම අර්බුදය රටේ මූල්‍ය පද්ධතියෙහි අවදානම හා අවදානමට ලක්වීමට ඇති හැකියාව ඉහළ නංවමින්, මූල්‍ය පද්ධතියට බලපෑම් සිදු කර ඇත. රටෙහි අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් නිසා පැනනැගුණු විවිධාකාර අභියෝගවලට දේශීය මුදල් වෙළඳපොළට මුහුණ පෑමට සිදු විය. මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්වය අඛණ්ඩව හිඟ මට්ටම්වල පැවති අතර, මුදල් වෙළඳපොළ තුළ සෙසු පාර්ශ්වකරුවන් සමග කටයුතු කිරීමේදී පනවා තිබූ සීමාවලට යටත් වීම හේතුවෙන් වෙළඳපොළ සහභාගිවන්නන් අතර ද්‍රවශීලතාව බෙදී යෑමේ සැලකිය යුතු අසමානතාවක් දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ සක්‍රීය මූල්‍ය මැදිහත් වීමේ භූමිකාවක අවශ්‍යතාව තහවුරු කරමින් වෙළඳපොළ සහභාගිවන්නන් දැඩි ලෙස මහ බැංකු පහසුකම් ලබා ගැනීම වෙත යොමුව පැවතිණි. එබැවින්, මුදල් හා මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සඳහා සුදුසු උපකරණ හරහා ද්‍රවශීලතාව සැපයීමේ කාර්යභාරය ඉටු කිරීමට මහ බැංකුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. අසාමාන්‍ය හෝ අර්බුද සහිත කාලසීමා තුළදී ශ්‍රී ලංකාවේ මුදල් සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව තහවුරු කිරීම සඳහා පද්ධතිමය ද්‍රවශීලතා ගැටළු විසඳීමේදී මහ බැංකුවේ ප්‍රතිපත්තිමය මැදිහත්වීම පිළිබඳව දැනුම්වත් කිරීම සහ අවබෝධය ඉහළ නැංවීම අරමුණු කොට ගෙන මෙම විශේෂ සටහන ඉදිරිපත් කරනු ලැබේ.

2. ද්‍රවශීලතා කළමනාකරණයේදී මහ බැංකුවේ කාර්යභාරය

'ද්‍රවශීලතාව' යන යෙදුම සඳහා එය භාවිතා වන සන්දර්භය මත පදනම්ව පුළුල් අර්ථකථන කිහිපයක් ඇත. සාමාන්‍යයෙන් ද්‍රවශීලතාව පිළිබඳ සංකල්ප 3 ක් ද්‍රවශීලතා කළමනාකරණයට අදාළ වේ. පළමුවැන්න 'වෙළඳපොළ ද්‍රවශීලතාවයි' (Market Liquidity). එය කෙටි දැනුම්දීමකින් හා වෙළඳපොළ මිල කෙරෙහි සීමිත බලපෑමක් ඇතිව සහ සැලකිය යුතු අලාභයකින් තොරව මූල්‍ය වත්කම් අලෙවි කිරීමේ හැකියාවයි. එබැවින් වෙළඳපොළ ද්‍රවශීලතාව, වෙළඳපොළ පුළුල් වීමට සහ ඔරොත්තු දීමේ හැකියාව සමග සම්බන්ධ වේ. දෙවැන්න නම්, 'අරමුදල් ද්‍රවශීලතාවයි' (Funding Liquidity). එයින් අදහස් කරන්නේ වෙළඳපොළ පිළිගත හැකි පිරිවැයක් යටතේ නියමිත වේලාවට පියවීම් සිදු කිරීම සඳහා මූල්‍ය ආයතන වත්කම් විකිණීමෙන් හෝ ණය ගැනීම මඟින් අරමුදල් රැස් කරන්නේ කෙසේද යන්නයි. තෙවැන්න නම්, 'මහ බැංකු ද්‍රවශීලතාවයි' (Central Bank Liquidity). එය මහ බැංකුවේ ද්‍රවශීලතා කළමනාකරණ අරමුණ ඉටු කර ගැනීම සඳහා බැංකු ආයතන මහ බැංකුව සමග යම් දිනෙක පවත්වාගෙන යන සංචිත ගිණුම්වල ශේෂයන්හි එකතුවට සමාන වේ. මෙය සමස්ත ද්‍රවශීලතාව නියෝජනය කරයි. එනම්, මහ බැංකුව විසින් මෙහෙයුම් කටයුතු සඳහා බැංකු පද්ධතියට සපයන සංචිත ප්‍රමාණයයි (Cecchetti & Disyatat 2009).

කෙටිකාලීන පොලී අනුපාතික පාලනය කිරීම සඳහා වාණිජ බැංකුවල සංචිත ප්‍රමාණය මෙහෙයවීම සඳහා යොදා ගන්නා රාමුව, මහ බැංකුවේ ද්‍රවශීලතා කළමනාකරණ උපකරණ සහ මෙවලම් ලෙස විස්තර කෙරේ. මහ බැංකු ද්‍රවශීලතා කළමනාකරණයෙහි මූලික පරමාර්ථය වන්නේ පොලී අනුපාතික හැසිරවීම සහ ගෙවීම් පද්ධතිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රතිපත්ති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකු පද්ධතියේ සමස්ත සංචිත මට්ටම නියාමනය කිරීමයි. එබැවින්, වෙළඳපොළ පොලී අනුපාතික සහ ණය මැවීම, ද්‍රවශීලතාව හා සමීපව සම්බන්ධ වන බැවින්, මහ බැංකු ද්‍රවශීලතාව, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීමේ වැදගත් විචල්‍යයක් වේ. කෙසේ වෙතත්, පුළුල් ලෙස බලන කල, මිල හා මූල්‍ය පද්ධති ස්ථායීතාව යන අරමුණු දෙකම සාක්ෂාත් කර ගැනීමේදී මහ බැංකුවේ අරමුණුවලට අදාළ සියලුම මූලික ක්‍රියාකාරකම් සඳහා සක්‍රීය ද්‍රවශීලතා කළමනාකරණය අඩු වැඩි වශයෙන් සම්බන්ධ වේ. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ද්‍රවශීලතා කළමනාකරණය වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතරම, ගෙවීම් පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වය සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කිරීමට ද එය ඉතා වැදගත් වේ. ඒ අනුව, ද්‍රවශීලතා කළමනාකරණයේදී භාවිතා කරනු ලබන මහ බැංකුවක මුදල් ප්‍රතිපත්ති උපකරණ මහ බැංකුවේ අරමුණු කෙරෙහි, එනම් මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව යන දෙකටම බලපාන ද්‍රවශීලතාවයෙහි සහ මුදල්වල පිරිවැයෙහි (පොලී අනුපාතික) උච්චාවචන සීමා කිරීමට දායක වේ.

ලොව පුරා මහ බැංකු සහ මුදල් අධිකාරීන්, මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීමේදී මුහුණ දෙන අභියෝගවලට ප්‍රතිචාර වශයෙන් ද්‍රවශීලතා කළමනාකරණය පිළිබඳ සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන ප්‍රතිපත්ති හඳුන්වා දී ඇත. විශේෂයෙන්ම අර්බුදකාරී අවධිවලදී, අරමුදල්

සහ වෙළඳපොළ ද්‍රවශීලතාව සමග මහ බැංකු ද්‍රවශීලතා සැපයීම ධනාත්මක සම්බන්ධයක් පෙන්නුම් කරයි. අවසාන ද්‍රවශීලතා සැපයුම්කරු ලෙස මහ බැංකුවේ ධාරිතාව අනුව, මහ බැංකු විවිධ ආකාරයෙන් බැංකු පද්ධතියට ද්‍රවශීලතාව සපයයි. ඒවා අතර, බැංකු පද්ධතියෙහි ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමට සහ එමඟින් සාමාන්‍ය ආර්ථික තත්ත්වය තුළ කෙටිකාලීන පොලී අනුපාතික මෙහෙයවීමට යොදා ගන්නා ප්‍රධාන ද්‍රවශීලතා කළමනාකරණ උපකරණය වනුයේ විවට වෙළඳපොළ කටයුතු හරහා අරමුදල් සැපයීමයි. තාවකාලික පදනමක් මත ද්‍රවශීලතාව සැපයීම සඳහා මහ බැංකුව මූල්‍ය ආයතන සමග ගනුදෙනුවල නිරත වන අතර, එහිදී යළි මූල්‍ය ආයතන වෙත විකිණීම සඳහා වන එකඟතාව යටතේ රජයේ සුකුම්පත් මිලදී ගනී. එසේම, ස්ථිර පදනම මත ද්‍රවශීලතාව සැපයීම සඳහා මහ බැංකුව ද්විතීයික වෙළඳපොළෙහි සුරකුම්පත් මිලදී ගනියි. විවට වෙළඳ කටයුතු තරගකාරී ලංසු වෙන්දේසි මඟින් පවත්වනු ලබන බැවින්, මෙම වෙන්දේසි නිශ්චිත මූල්‍ය ආයතනයක් වෙත ඉලක්ක නොවේ. එසේම, ගෙවීම් හා පියවීම් පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා සහ මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව අදාළ ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉලක්ක සපුරා ගැනීමේ අරමුණින් යුතුව සමස්ත සංචිත මට්ටම නියාමනය කිරීම සඳහා මහ බැංකුවේ අභිමතය පරිදි මෙම මෙහෙයුම් කටයුතු සිදු කෙරේ.

තවද, ද්‍රවශීලතාව සමස්තයක් ලෙස වෙළඳපොළ වෙත සැපයීම වෙනුවට විශේෂිත ආයතන ඉලක්ක කර ගනිමින් ද්‍රවශීලතාව සැපයීම ද මහ බැංකුව සිදු කරයි. පවතින අරමුදල් මත පදනම්ව මූල්‍ය ආයතනයකට අවශ්‍ය පරිදි සහ අවශ්‍ය විටදී සිදු කළ හැකි මෙම ආකාරයේ ගනුදෙනු සඳහා නිත්‍ය පහසුකම සාමාන්‍ය උදාහරණයකි. නිදසුනක් වශයෙන්, අන්තර් බැංකු මුදල් වෙළඳපොළෙහි ගනුදෙනු සඳහා අදාළ කොන්දේසි දැඩි වූ විට හෝ යම් මූල්‍ය ආයතනයක් කෙටිකාලීන අරමුදල් පීඩනයකට මුහුණ දෙන විට අවශේෂ අරමුදල් අවශ්‍යතා දිනය අවසානයේදී සපුරාලීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි නිත්‍ය ණය පහසුකම හරහා සහභාගිත්ව ආයතනවලට ඍජුවම ද්‍රවශීලතාව සපයනු ලැබේ. එමෙන්ම, මූල්‍ය ආයතනයක් සතුව දිනය අවසානයේදී අතිරික්ත මුදල් පවතී නම්, එම අතිරික්තය නිත්‍ය තැන්පතු පහසුකම භාවිතයෙන් මහ බැංකුවේ තැන්පත් කර පොලී ආදායමක් උපයා ගත හැකිය. මෙම මෙවලම් ද්‍රවශීලතා කළමනාකරණයේදී මහ බැංකුව භාවිත කරන සාම්ප්‍රදායික උපකරණ ලෙස සැලකේ. සාම්ප්‍රදායික උපකරණ හා ද්‍රවශීලතා පහසුකම් භාවිතය හැරුණු විට, මූල්‍ය අර්බුද සහ වෙළඳපොළ අවිනිශ්චිතතා හේතුවෙන් ද්‍රවශීලතා මෙහෙයුම් සිදු කිරීම සහ මූල්‍ය ආයතන සහ මූල්‍ය වෙළඳපොළ වෙත මහ බැංකු ද්‍රවශීලතාව සැපයීම සඳහා වන උපකරණ කට්ටල පුළුල් කිරීමට මහ බැංකු වෙත පෙළඹුමක් ඇති වේ.

දේශීය බැංකු පද්ධතියෙහි ද්‍රවශීලතා හිඟය

විදේශ ණය ගෙවීම්, පැවති අවිනිශ්චිතතා හේතුවෙන් ව්‍යවහාර මුදල් සංසරණය ඉහළ යෑම සහ විදේශ විනිමය වෙළඳපොළට මහ බැංකුව මැදිහත් වීම යනාදිය හේතුවෙන් දේශීය බැංකු පද්ධතිය තුළ ඇති වූ ද්‍රවශීලතා හිඟය, 2021 සැප්තැම්බර් මස මුල් භාගයේ සිට පද්ධතිමය ද්‍රවශීලතා හිඟයක් බවට ක්‍රමිකව පරිවර්තනය විය. සාර්ව ආර්ථික සමතුලිතතාව යළි තහවුරු කිරීමේ අරමුණින් 2022 වසරේදී පෙර නොවූ විරූ ආකාරයේ ප්‍රතිපත්ති මෙහෙයුම් කෙරෙහි යොමු වීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදු විය. පිරිහී යමින් පැවති ආර්ථික තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා මහ බැංකුව පළමුව ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 700 කින් ඉහළ නැංවූ අතර, පසුව වරින් වර පොලී අනුපාතික ඉහළ නැංවීය. කෙසේ වෙතත්, වෙළඳපොළ ද්‍රවශීලතා හිඟය අබණ්ඩව ඉහළ යෑම සහ වෙළඳපොළ සහභාගිවන්නන් අතර ද්‍රවශීලතාව බෙදී යෑමේදී පැවති අසමතුලිතතාව, පද්ධති ද්‍රවශීලතා හිඟයක් නිර්මාණය කිරීමට හේතු විය. එක් එක් සහභාගිත්ව ආයතනවල පැවති ද්‍රවශීලතා හිඟයට වඩා සමස්තයක් වශයෙන් වෙළඳපොළ ද්‍රවශීලතා හිඟයක් පැවතීම හේතුවෙන් බොහෝ බැංකුවලට මහ බැංකුවේ ද්‍රවශීලතා අවශ්‍යතාව (සංචිත අවශ්‍යතාව) සම්පූර්ණ කර ගැනීම අභියෝගාත්මක විය. අන්තර්බැංකු මුදල් වෙළඳපොළ ගනුදෙනු අවම මට්ටමක තිබියදී එවන් සමස්ත වෙළඳපොළ පීඩන තත්ත්වයක් පැවතීම මූල්‍ය හා සාර්ව ආර්ථික ස්ථායීතාව කෙරෙහි අයහපත් බලපෑමක් ඇති කිරීමේ හැකියාවක් පැවතුණි. ආර්ථිකය සඳහා අරමුදල් සම්පාදන කාර්යයේදී බැංකු වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතරම, ආර්ථිකයේ ගෙවීම් පියවීම් පද්ධතියේ ප්‍රධාන අතරමැදිකරුවන් වශයෙන් ක්‍රියා කරති. එබැවින් එක් බැංකුවක ද්‍රවශීලතා අවශ්‍යතාව සපුරාලිය නොහැකි වුවහොත්, එය සමස්ත ගෙවීම් පියවීම් පද්ධතියම අවහිර වීමට බලපෑ හැකි අතර, එමඟින්, බැංකු පද්ධතියේ සිදු විය හැකි බිඳවැටීම් තුළින් අනෙකුත් මූල්‍ය ආයතනවල ද බිඳවැටීම් සිදු විය හැකි අතර, ද්‍රවශීලතාව අවශ්‍ය පරිදි සපුරා ගත හැකි වූ විට එවැනි බිඳවැටීම් වළක්වාගත හැකිය. බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන අතර පවත්නා අන්තර් බැඳියාව හේතුවෙන් මූල්‍ය ස්ථායීතාව මත පුළුල් ප්‍රතිවිපාක ඇති කළ හැකි පැතිර යෑමේ මෙන්ම පිටාර යෑමේ ප්‍රතිවිපාකය (Contagion and Spillover Effects) හේතුවෙන් අවසාන වශයෙන් මූල්‍ය ස්ථායීතාව, මහජන විශ්වාසය මෙන්ම මූර්ත ආර්ථිකයට ද සැලකිය යුතු බලපෑමක් ඇති විය හැකිය. එබැවින් මූල්‍ය අස්ථායී බව මෙන්ම, මූල්‍ය පද්ධති අස්ථායී බව වළකාලීමේ හා කළමනාකරණය කිරීමේ මහ බැංකු කාර්යභාරය ද තර්ජනයට ලක් කිරීමේ හැකියාව ඇති දිගුකල් පවත්නා ද්‍රවශීලතා හිඟයක් පවතින අවස්ථාවලදී ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් හා මූල්‍ය යන දෙඅංශයෙහිම ස්ථායීතාව සහතික කිරීම සඳහා පුළුල් පරාසයක පැතිරුණු සාම්ප්‍රදායික මෙන්ම සාම්ප්‍රදායික නොවන ද්‍රවශීලතා කළමනාකරණ උපකරණ භාවිතා කිරීමට කටයුතු කළේය.

ද්‍රවශීලතා පීඩනයක් පවතින කාලපරිච්ඡේදවලදී සාම්ප්‍රදායික උපකරණ භාවිතය

2022 වසරේ පළමු භාගය තුළදී සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවති දේශීය මුදල් වෙළඳපොළ හිඟ ද්‍රවශීලතාව 2022 වසරේ අග භාගය තුළ අඩු විය. බැංකු අතර පවත්නා ද්‍රවශීලතා පීඩනය අවම කිරීමේ අරමුණින්,

ද්‍රවශීලතා මෙහෙයුම් පුළුල් කිරීම, කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි හරහා ද්‍රවශීලතාව සැපයීම සහ සපුරා ගත නොහැකි වූ ද්‍රවශීලතා අවශ්‍යතා නිත්‍ය පහසුකම හරහා සීමාවකින් තොරව සපුරා ගැනීමට අවස්ථාව දීම යනාදිය ද්‍රවශීලතාව නිතිපතා කළමනාකරණය කිරීමේදී මහ බැංකුව විසින් උපයෝගී කර ගන්නා ලදී. මහ බැංකුව දැඩි වශයෙන් වෙළඳපොළට මැදිහත් වීම නව සංකල්පයක් නොවන අතර, කෝවිඩ්-19 වසංගතය කාලයේදී සිදු කළ ආකාරයට මූල්‍ය වෙළඳපොළට අසාමාන්‍ය ප්‍රමාණයකින්, වේගයකින් සහ අරමුණකින් යුතුව අවශ්‍ය තරම් ද්‍රවශීලතාව සැපයීම සහ ණය ගැනුම් පිරිවැය අවම කිරීම සහ එමඟින් මූල්‍ය වෙළඳපොළ යථා තත්ත්වයට පත් කිරීම සඳහා සහාය වීමට මහ බැංකුව කටයුතු කොට ඇත. ඒ අනුව, මහ බැංකුව පුළුල් ලෙස විවට වෙළඳපොළ කටයුතු සිදු කරන ලද අතර, කෝවිඩ් වසංගතය හේතුවෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය අරමුදල් සැපයීමට පුළුල් පරාසයක ඇප සුරැකුම්පත් පිළිගනිමින් සහනදායී ණය යෝජනා ක්‍රමයක් (කෝවිඩ්-19 සෞභාග්‍යා පුනරුද ණය පහසුකම) හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත්, 2022 වසර අවසාන භාගයේ සිට මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව වර්ධනය වුවද, ඒක්ෂණ මුදල් වෙළඳපොළ ක්‍රියාකාරිත්වය මන්දගාමී තත්ත්වයක පැවතීම හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතුණි. ඒ සමගම, බලපත්‍රලාභී වාණිජ බැංකු තම ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වෙළඳපොළ පදනම් කරගත් අරමුදල් සපයා ගැනීමෙන් තොරව, මහ බැංකුවේ විවට වෙළඳපොළ පහසුකම් යටතේ එක්දින පදනමින් සපයනු ලබන නිත්‍ය පහසුකම අඛණ්ඩව හා වැඩි වශයෙන් උපයෝගී කර ගනිමින් ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගන්නා ලදී. බලපත්‍රලාභී වාණිජ බැංකු සිය අරමුදල් සපයා ගැනීමට අනෙකුත් විකල්ප භාවිතා කිරීමෙන් පසුව පමණක් සලකා බැලිය යුතු මහ බැංකුව විසින් එක් දින පදනමින් සපයන ලද පහසුකම් මත එලෙස වැඩි වශයෙන් රඳා පැවතීම අඩු කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමක් දක්නට නොලැබුණි. බලපත්‍රලාභී වාණිජ බැංකුවල එවැනි හැසිරීම්, මහ බැංකුව විසින් මුදල් වෙළඳපොළ, එනම් ඒක්ෂණ ණය වෙළඳපොළ සහ ප්‍රතිමිලදීගැනුම් වෙළඳපොළ ක්‍රියාකාරී කරවීමට ගන්නා ලද උත්සාහයන් සඳහා බලපෑම් සිදු කළ අතර, ගෙවීම් හා පියවීම් පද්ධතිය හරහා ආර්ථිකය වෙත අරමුදල් සුමටව ගලායෑමට බාධා ද ඇති කළේය.

ඒ අනුව, මුදල් හා මූල්‍ය අංශවල පැවති අවදානම් කළමනාකරණය කිරීම ඇතුළු සමස්ත සාර්ව ආර්ථික ස්ථායීතාව අත් කර ගැනීමේ අරමුණ ඇතිව 2022 අප්‍රේල් මස සිට ගනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට අමතරව, මහ බැංකුව විසින් විවට වෙළඳපොළ කටයුතු යටතේ සපයනු ලබන නිත්‍ය පහසුකම සඳහා සීමා පනවන ලදී. ඒ අනුව, 2023 ජනවාරි මස 16 දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු සතු අතිරික්ත ද්‍රවශීලතාව තැන්පත් කොට පොලී උපයා ගත හැකි එක්දින පදනමින් සපයනු ලබන නිත්‍ය තැන්පතු පහසුකම ලිත් මාසයක් ඇතුළත උපරිම දින 05 කට සීමා කරන ලදී. ඒ සමගම, සිය දෛනික ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීමට බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා සුරැකුම්පත් යටතේ සපයනු ලබන නිත්‍ය ණය පහසුකම, එක් දිනක පවත්නා ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයෙන් සියයට 90 ක ප්‍රමාණය දක්වා පමණක් ලබාගත හැකි වන පරිදි සීමා කරන ලදී. මෙම සීමා කිරීම් හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු නිත්‍ය ණය පහසුකම යටතේ ණය ලබාගැනීම් සැලකිය යුතු ලෙස අඩුවූ අතර, ද්‍රවශීලතා ගැටලු සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට පෙළඹවීම් කිරීමට මෙන්ම මුදල් වෙළඳපොළ හරහා අරමුදල් ලබාගැනීමට කටයුතු කිරීමට හේතු විය. තවදුරටත්, නිත්‍ය තැන්පතු පහසුකම සීමා කිරීම හේතුවෙන් ඒක්ෂණ මුදල් වෙළඳපොළ ක්‍රියාකාරී වීමත්, අතිරික්ත ද්‍රවශීලතාව පැවති බැංකු වෙතින් හිඟ ද්‍රවශීලතාව සහිත බැංකු වෙතට අරමුදල් ගලා යෑමත් දක්නට ලැබිණි. මෙවැනි සීමා කිරීම් නිසා උද්ගත විය හැකි වෙළඳපොළ කැළඹීම් අවම කිරීම සඳහා ඉදිරියේදී අභ්‍යන්තර නිවැරදි කිරීම් කර ගන්නා තුරු මහ බැංකුව විසින් කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීම හරහා බැංකු ආයතන වෙත ද්‍රවශීලතාව සපයන ලදී. වෙළඳපොළ පොලී අනුපාතික සමස්තයක් ලෙස අඩු වීම (එනම් වෙළඳපොළ පොලී අනුපාතික මෙන්ම රජයේ සුරැකුම්පත් පොලී අනුපාතික) සමග වෙළඳපොළ ද්‍රවශීලතාව වර්ධනය වීම සහ අවදානම් සඳහා අයකරන වාරික අඩු කිරීම මඟින් ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ස්ථාවරත්වයට සහාය වීමට සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව තහවුරු කිරීමට මෙම ක්‍රියාමාර්ග හේතු විය.

ද්‍රවශීලතා කළමනාකරණ රාමුව යටතේ සාම්ප්‍රදායික නොවන උපකරණ භාවිතය

මෙයට අමතරව, සමාජ පිරිවැය අවම කිරීමට උත්සාහ කරන අතරතුර, මූල්‍ය පද්ධතියෙහි සුරක්ෂිතභාවය උදෙසා අනාගතයේදී ඇති විය හැකි මූල්‍ය කම්පන සහ ඒවායේ ප්‍රතිවිපාක කළමනාකරණය කිරීම සඳහා මහ බැංකුව සිය ද්‍රවශීලතා කළමනාකරණ ප්‍රතිපාදන යටතේ පියවර ගණනාවක් ගනු ලැබීය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව පද්ධතිය තුළ ද්‍රවශීලතා අවදානම අවම කිරීම සඳහා පෙර නොවූ විරූ පරිමාණයෙන් සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ප්‍රතිපත්ති භාවිතා කළේය. දැනට බලාත්මක නීතිමය ප්‍රතිපාදන යටතේ මූල්‍ය ආයතන හා මූල්‍ය වෙළඳපොළට ද්‍රවශීලතාව සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සාම්ප්‍රදායික නොවන නව ද්‍රවශීලතා සැපයුම් මෙවලම් නිර්මාණය කරන ලද අතර, අර්බුදයකට පෙර සූදානමක් ලෙස මෙන්ම පද්ධති ද්‍රවශීලතා පීඩනය අවම කිරීම අරමුණු කර ගනිමින් යොදා ගන්නා ලද සාම්ප්‍රදායික නොවන එවැනි පහසුකම් පිළිබඳව සාරාංශයක් පහත දැක්වේ.

1. ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්‍රවශීලතා උපකාරක පහසුකම හඳුන්වා දීම

ද්‍රවශීලතා උපකාරක පහසුකම (Liquidity Assistance Facility) පවත්නා නෛතික රාමුව යටතේ එනම්, මුදල් නීති පනතේ අංක 82 සහ 83 (1) (c) වගන්ති යටතේ සපයනු

ලබන පහසුකමකි. මෙය බැංකු ආයතනවලට ද්‍රවශීලතා උපකාරක පහසුකමක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබාගත හැකි ණය මුදලක් වන අතර, එම ණය මුදල දින 180 නොඉක්මවන ඕනෑම නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා පොරොන්දු නෝට්ටුවක් මඟින් සුරක්ෂිත කරන ලද රාජ්‍ය සුරැකුම්පත් ඇප වශයෙන් තබා ලබාගත හැකිය. එසේම, මෙම පහසුකම පවතින බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) මත ආන්තිකයක් එකතු කොට තීරණය කරනු ලැබූ පොලී අනුපාතිකයක් යටතේ ලබාගත හැකිය.

මෙම පහසුකම යටතේ ලබා දෙනු ලබන ණය ප්‍රමාණය, ණය ඉල්ලුම් කරනු ලබන බැංකුවෙහි ද්‍රවශීලතා අවශ්‍යතාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තක්සේරු කිරීමෙන් පසු තීරණය කරනු ලබයි. මෙම පහසුකම හඳුන්වා දීමත් සමඟ, විවට වෙළඳපොළ කටයුතු යටතේ ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගනු වෙනුවට දිගුකාලීනව ද්‍රවශීලතා අවශ්‍යතා තරගකාරී මිලකට සපුරා ගැනීමට බැංකුවලට අවස්ථාව පවතී. මූල්‍ය පද්ධතියේ පවත්නා ද්‍රවශීලතා ගැටලු විසඳීමට සහ බැංකු ආයතන වෙත ඇති වන බලපෑම අවම කිරීමට මෙම පහසුකම යටතේ හැකියාව පවතී. එබැවින්, හදිසි ද්‍රවශීලතා අවශ්‍යතා පහසුකමක් ලබා ගැනීමකින් ඇති වන අපකීර්තියේ බලපෑම (Stigma Effect) වැළැක්වීම සඳහා මෙම පහසුකම වඩාත් ඵලදායී ක්‍රමයක් වේ.[1]

2. හදිසි ද්‍රවශීලතා ආධාරක පහසුකම සහ එහි මෙහෙයුම් රාමුව ශක්තිමත් කිරීම

බැංකු පද්ධතියෙහි ඇති විය හැකි අවදානමට සූදානම් වීමේ ප්‍රතිපත්ති උපකරණයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව සිය හදිසි ද්‍රවශීලතා ආධාරක පහසුකම් (Emergency Liquidity Assistance) රාමුව ශක්තිමත් කරන ලදී. මුදල් නීති පනතේ 86 වන වගන්තිය අනුව, මුදල් සහ බැංකු ස්ථායීතාව සඳහා දැඩි අහිතකර බලපෑම් එල්ල විය හැකි හදිසි හෝ ඇති වීමට ඉතා ආසන්න මූල්‍ය අර්බුදයක් පවතින කාලසීමාවලදී ශ්‍රී ලංකා මහ බැංකුවට බැංකු ආයතන වෙත ණය සහ අත්තිකාරම් ලබාදීමට ඉඩප්‍රස්ථාව ලබාදී ඇත. ඒ අනුව, හදිසි ද්‍රවශීලතා ආධාරක පහසුකම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආයතනික වශයෙන් විශේෂිත වූ එක් බැංකුවකට හෝ බැංකු ආයතන කිහිපයකට බලපානු ලබන ද්‍රවශීලතා ගැටලු විසඳීම සඳහා ලබාදෙනු ලබන ණය හෝ අත්තිකාරමකි. හදිසි ද්‍රවශීලතා ආධාරක පහසුකමෙහි මූලික අරමුණ වනුයේ ද්‍රවශීලතා හිඟය හේතුවෙන් බුන්වත්භාවය ඇති වීමට අවදානමක් පවතින විට එය වැළැක්වීම සහ ඒ තුළින් අනෙකුත් ආයතනවලට ඇති විය හැකි බලපෑම සහ බාහිරතා වැළැක්වීමයි. බැංකු ආයතනයක් සිය අරමුදල් ද්‍රවශීලතාව සපුරා ගැනීමේදී ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දෙනු ලබන්නේ නම්, එය එම බැංකු ආයතනය අසාර්ථක වීමට හේතු වේ. එබැවින්, මුදල් ප්‍රතිපත්තිය යටතේ කෙටිකාලීන පොලී අනුපාතික පාලනය කිරීම සඳහා ද්‍රවශීලතා කළමනාකරණය කිරීමට අමතරව, තාවකාලික ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දෙනු ලබන බැංකු ආයතනවලට ද්‍රවශීලතාව සැපයීමේ විශේෂිත ක්‍රියාමාර්ගයක් ලෙස මහ බැංකුව, මෙම හදිසි ද්‍රවශීලතා ආධාරක පහසුකම යොදා ගනී. ඒ අනුව, ඉහත නීතිමය ප්‍රතිපාදන යටතේ බුන්වත් නොවන නමුත් තාවකාලික ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දී ඇති ඕනෑම බැංකු ආයතනයක් එහි ද්‍රවශීලතා තත්ත්වය ශක්තිමත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට පිළිගත හැකි විවිධ ඇප සුරැකුම් ගණනාවක් මත මෙම හදිසි ද්‍රවශීලතා උපකාරක පහසුකම ලබා ගැනීමට සුදුසුකම් ලබයි. මෙම පහසුකම, ස්ථාවර පොලී අනුපාතිකයක් යටතේ එනම්, පවතින බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය මත ආන්තිකයක් එකතු කොට නිර්ණය කරනු ලබන බැංකු අනුපාතිකය (Bank Rate) යටතේ ලබාගත හැකිය. ඒ අනුව, සංචිත ආකාරයෙන් ද්‍රවශීලතාව නිර්මාණය කිරීමට මහ බැංකුවට අනන්‍ය වූ හැකියාව උපයෝගී කර ගෙන සහ අවසාන ණය දෙන්නා (Lender of Last Resort) වශයෙන් සිය ප්‍රධාන වගකීමක් ලෙස බැංකු ආයතන වෙත මහ බැංකුව මෙම පහසුකම ලබා දෙයි. තවද, බැංකු ආයතන, සිය බැංකු කටයුතු සම්බන්ධව දැඩි කොන්දේසි අනුගමනය කිරීම සහතික කිරීම අවශ්‍ය වන අතර, ඒ තුළින් සදාචාර උපද්‍රවය (Moral Hazard) අඩු වීම සහ මහ බැංකුවේ ස්වාධීනත්වයට බාධා පමුණුවනු ලබන හෝ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාවට බාධා ඇති කරනු ලබන මූල්‍යමය හානි අවම වීමක් සිදු වේ.[2]

ඉහත ද්‍රවශීලතා පහසුකම් සපයමින්, ශ්‍රී ලංකා මහ බැංකුව, මූල්‍ය අංශයේ පීඩනයක් සහිත තත්ත්වයකදී වඩාත් විචක්ෂණශීලී ලෙස කටයුතු කිරීමට ඇති හැකියාව සහ මූල්‍ය අංශයේ බුන්වත්භාවය සඳහා ඇති විය හැකි තර්ජන කල්තියා ඉවත් කිරීමට ඇති හැකියාව මෙන්ම ඒ සඳහා වන මහ බැංකුවේ අභිමතය පෙන්නුම් කොට ඇත. මූල්‍ය වෙළඳපොළ සහභාගිවන්නන් අතර මූල්‍ය පද්ධතිය පිළිබඳව පවත්නා විශ්වසනීයත්වය නැවත ඇති කිරීම සහ වත්කම් ක්ෂණිකව විකිණීම වැළැක්වීම සහ සමස්තයක් ලෙස මූල්‍ය පද්ධතියේ ක්‍රියාකාරීත්වය ආරක්ෂා කිරීම ද එමඟින් සිදු කෙරේ.

සමෝධානය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම් සියල්ලම පාහේ මහ බැංකු විධිවිධාන යටතේ පවත්නා සියලු අත්‍යවශ්‍ය කටයුතු හා සම්බන්ධ වේ. එය, මුදල් ප්‍රතිපත්ති යාන්ත්‍රණය සඳහා මෙන්ම ගෙවීම් සහ පියවීම් පද්ධති සුමටව පවත්වාගෙන යෑම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා ඉතා වැදගත් පසුබිමක් සපයනු ලබයි. නිදහසින් පසුව රට මුහුණ දුන් දරුණුතම ආර්ථික අර්බුදය තුළදී මුහුණ දුන් ද්‍රවශීලතා අර්බුදයට ප්‍රතිචාරයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මෙම ද්‍රවශීලතා පහසුකම්

1 මූල්‍ය ආයතන විසින් මහ බැංකු ණය පහසුකම් ලබාගැනීම නිසා, ඔවුන්ගේ යහපත් මූල්‍ය පැවැත්ම පිළිබඳ සෘණාත්මක සංඥා නිකුත් වනු ඇතැයි අපේක්ෂාවෙන් එම පහසුකම් ලබාගැනීමට ඇති අකැමැත්ත මෙයින් අදහස් කෙරේ.

2 බැංකු ආයතනයක් සිය දෛනික ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම් කටයුතු සඳහා වෙන් කරන ලද අරමුදල් ඵලදායී ලෙස භාවිතා කිරීම සලකා නොබැලීමට පෙළඹී සිටී නම් ඒ හේතුවෙන් සදාචාර උපද්‍රවයක් ඇති විය හැකිය.

නිශ්චිතවම මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. බැංකු සහ මූල්‍ය අංශයෙහි පෙර නොවූ විරූ අභියෝග කළමනාකරණය කිරීමේදී, දේශීය මුදල් වෙළඳපොළ තත්ත්වයන් මත පදනම්ව ඇති විය හැකි ද්‍රවශීලතා ගැටලු වැළැක්වීම සඳහා මහ බැංකුවට නවතම උපකරණ උපයෝගී කර ගැනීමේ අවශ්‍යතාව ඇති කරනු ලබයි. මේ අනුව, මිල ස්ථායීතා අරමුණ සපුරා ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව කෙටිකාලීන පොලී අනුපාතික පාලනය කිරීම සාම්ප්‍රදායික සහ සම්මත ද්‍රවශීලතා කළමනාකරණ උපකරණ මගින් සහතික කරයි. එමෙන්ම, වඩාත් දැඩි ද්‍රවශීලතා තත්ත්වයන් තුළ මහ බැංකුවේ ශේෂ පත්‍රයෙහි ශක්තිමත් භාවය මත සැලකිය යුතු බලපෑමක් ඇති නොකොට, ඇති විය හැකි සැලකිය යුතු පද්ධති අවදානම් ඉවත් කරමින් මූල්‍ය වෙළඳපොළ ස්ථායී කිරීම සඳහා මහ බැංකුව, සාම්ප්‍රදායික නොවන ද්‍රවශීලතා කළමනාකරණ උපකරණ වඩාත් ඵලදායීව සහ කාලීනව භාවිතා කරයි.

මූලාශ්‍ර:

1. Allen, F., Carletti, E., Krahnen, J.P., and Tyrell, M. (Eds.). (2011). Liquidity and Crises, Oxford University Press.
2. Andrew, H., and Lorie L. (2022). 'Market dysfunction and central bank tools', Markets Committee Working Group paper, Federal Reserve Bank of New York.
3. Bagehot, W. (1873). 'Lombard Street: A Description of the Money Market', London.
4. Cecchetti, S.G., and Disyatat, P. (2009). 'Central bank tools and liquidity shortages' (www.newyorkfed.org/research/conference/2009).
5. Cao, J., and G. Illing (2008). Liquidity shortages and monetary policy, CESifo Working Paper Series No. 2210, Available at: SSRN: http://ssrn.com/abstract1090825.
6. Corbo, V. (2010). 'Financial stability in a crisis: What is the role of the central bank', BIS Papers, 51, pp. 27-30.
7. Douglas, W.D., Raghuram, G.R. (2003). 'Liquidity Shortages and Banking Crisis', NBER WP Series 10071.
8. Holmström, B., and J. Tirole. (1998). 'Private and public supply of liquidity', Journal of Political Economy, 106, pp. 1–40.
9. Praet, P. (2016). 'The ECB and its role as lender of last resort during the crisis', Speech, 10 February.

පිළිබඳ අපේක්ෂා සමඟ වෙළඳපොළ අවිනිශ්චිතතාව ඉහළ යෑම මධ්‍යයේ වෙළඳපොළ සහභාගීවන්නන් විසින් දැඩි ප්‍රතිපාර්ශ්ව සීමා පැනවීමත් සමඟ වසරේ මුල් මාස කිහිපය හා සැසඳීමේ දී, එක්දින ඒක්ෂණ මුදල් වෙළඳපොළ තුළ ගනුදෙනු සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතුණි. බරිත සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකයද, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි හැසිරීමට සමානව පැවති අතර, 2022 වසරේ දෙසැම්බර් අවසානය වන විට සියයට 15.50ක අගයක පැවතුණි. මේ අතර, නිත්‍ය ණය පහසුකම හරහා අරමුදල් ලබා ගැනීමට හෝ නිත්‍ය තැන්පතු පහසුකම හරහා අතිරික්ත අරමුදල් තැන්පත් කිරීම තුළින් සහභාගීත්ව ආයතන විසින් මහ බැංකුව මගින් සපයනු ලබන පහසුකම් ලබා ගැනීම සඳහා වැඩි වශයෙන් යොමු විය. ව්‍යුහාත්මක ද්‍රවශීල අවශ්‍යතා සඳහා වෙළඳපොළ පදනම් කරගත් මූලාශ්‍රවලින් අරමුදල් සපයා ගැනීමෙන් තොරව, මහ බැංකුව විසින් සපයනු ලබන එක්දින පහසුකම් මත පදනම්ව ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීමට ඉහළ ද්‍රවශීල අවශ්‍යතා ඇති සහභාගීත්ව ආයතන වැඩි නැඹුරුවක් පෙන්නුම් කරන ලදී. සහභාගිත්ව ආයතනවල, විශේෂයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවල එවැනි හැසිරීම්, ක්‍රියාකාරී මුදල් වෙළඳපොළ ගනුදෙනුවලට මෙන්ම මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සඵලදායීත්වය සඳහා ද බලපෑමක් ඇති කළේය. එබැවින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා සපයනු ලබන අතිරික්ත අරමුදල් තැන්පත් කිරීමට සහ පොලී ඉපයීම සඳහා ලබා දෙන එක්දින තැන්පතු පහසුකම වන නිත්‍ය තැන්පතු පහසුකම භාවිතා කිරීම 2023 ජනවාරි මස 16 සිට බලපැවැත්වෙන පරිදි ලිත් මාසයක් තුළ උපරිම වාර 5කට සීමා කරන ලදී. ඒ සමඟම, දිනය අවසානයේ දී තවදුරටත් ද්‍රවශීලතා හිඟයක් පවතී නම් එය සපුරා ගැනීම සඳහා මහ බැංකුව විසින් එක්දින පදනම මත බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත සපයනු ලබන නිත්‍ය ණය පහසුකම ලබාගැනීම ද අදාළ දිනයේ දී පවතින ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයෙන් සියයට 90ක ප්‍රමාණයකට සීමා කර ඇත. ද්‍රවශීලතා ගැටලු නිවැරදි කර ගැනීමේ අරමුණින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ නිත්‍ය පහසුකම් ලබාගැනීම මත සීමා පැනවීමත් සමඟින් මුදල් වෙළඳපොළ ක්‍රියාකාරීවීමක් මෙන්ම බැංකු පද්ධතිය තුළ ද්‍රවශීලතා මට්ටමෙහි වර්ධනයක් ද දක්නට ලැබුණි.

දේශීය විදේශ විනිමය වෙළඳපොළ

2022 වසර තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි අගය 2021 වසර අවසානයේ පැවති රුපියල් 200.43 සිට 2022 වසර අවසානය වන විට රුපියල් 363.11ක් දක්වා සියයට 44.8කින් සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. වසර ආරම්භයේ දී රුපියල් 200.00ත් රුපියල් 203.00ත් අතර උච්චාවචනය වූ විනිමය අනුපාතිකය, 2022 මාර්තු 7වන දින සිට වඩා නම්‍යශීලීව තීරණය වීමට ඉඩ හැරීමෙන් පසුව සීඝ්‍රයෙන් අවප්‍රමාණය විය. කෙසේ වුවද, ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් අඛණ්ඩව පහත හෙළීමෙන් පසුව ඇති වූ විදේශ අරමුදල් රැස් කර ගැනීමේ අභියෝග මධ්‍යයේ විදේශ විනිමය සඳහා ඇතිවූ ඉහළ ඉල්ලුමත්, මහ බැංකුවේ භාවිත කළ හැකි විදේශ සංචිතවල තියුණු අඩු වීමට හේතු වූ විදේශ විනිමය ගලා ඒම් හිඟයත් හේතුවෙන්

කොවිඩ්-19 වසංගතයෙන් පසු දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි පැවති අඛණ්ඩ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය 2022 වසර ආරම්භයේ දී පෙර නොවූ මට්ටමකට පත් විය. කෙසේ වෙතත්, එවකට පැවති විදේශ විනිමය තත්ත්වයන් හමුවේ, 2022 මැයි 13 දින සිට බලපැවැත්වෙන පරිදි විචල්‍යය ආන්තිකයක් සමඟ දෛනික විනිමය අනුපාතික මාර්ගෝපදේශයක් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කිරීමත් සමඟ විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ පීඩනය බොහෝ දුරට අඩු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2022 වසරේ දෙවන භාගයේ දී විනිමය අනුපාතිකය ආසන්න වශයෙන් රුපියල් 363.00ක මට්ටමේ ක්‍රමයෙන් ස්ථාවර වීම ආරම්භ විය.

2021 වසරේ දී මෙන්ම 2022 වසරේ දී ද මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ශුද්ධ විකුණුම්කරුවෙකු විය. විදේශ සංචිත තියුණු ලෙස පහත වැටීමට ලක් වූ තත්ත්වයක් හමුවේ වුව ද, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි පැවති දැඩි ද්‍රවශීලතා හිඟය හේතුවෙන් අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීම සඳහා මුදල් යෙදවීමට මහ බැංකුවට සිදු විය. ඒ අනුව, 2022 වසරේ දී මහ බැංකුව විසින් වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 2,712ක් සපයන ලදී. බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මත පනවන ලද අනිවාර්ය විදේශ විනිමය විකුණුම් අවශ්‍යතාවය යටතේ මිලදී ගත් එ.ජ. ඩොලර් මිලියන 2,133ක් භාවිතයට ගනිමින් මහ බැංකුව විසින් වෙළඳපොළ වෙත සැපයීම සඳහා අවශ්‍ය විදේශ විනිමය ප්‍රමාණය ප්‍රධාන වශයෙන් කළමනාකරණය කරගන්නා ලදී.

කෙසේ වුවද, 2022 වසර අවසාන භාගයේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතා තත්ත්වය වැඩිදියුණු විය. මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගවලට අමතරව, රජය විසින් ඇතැම් ආනයන සඳහා සීමා පැනවීම, බැංකු විසින් විචක්ෂණශීලීව විදේශ විනිමය ද්‍රවශීලතා කළමනාකරණය කිරීම හා ඉන්ධන ඉල්ලුම කළමනාකරණය කිරීම සහ බලශක්ති ආශ්‍රිත නිශ්පාදන හා ආහාර පිසීමට භාවිත කරන ගෑස්වල මිල ගණන් සංශෝධනය කිරීම හේතුවෙන් රාජ්‍ය ව්‍යවසායයන් වෙතින් විදේශ විනිමය සඳහා පැවති ඉල්ලුම අඩුවීම, විනිමය අනුපාතිකයේ අවප්‍රමාණය වීම නිසා වූ අධික පිරිවැය සහ දේශීය වෙළඳපොළ පොලී අනුපාතිකවල බලපෑම ඇතුළු කරුණු ගණනාවක් මෙම වැඩිදියුණුවීමට හේතු විය. තවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ පැවති සාකච්ඡා සාර්ථක වීම හමුවේ විනිමය අනුපාතිකයේ ස්ථායීතාව පිළිබඳ ඇති වූ ධනාත්මක ආකල්ප හේතුවෙන් 2022 වසරේ අවසාන මාස කිහිපය තුළ අපනයන ආදායම් රුපියල් බවට පරිවර්තනය කිරීමේ ක්‍රමානුකූල වැඩිවීමක් දක්නට ලැබුණි. තවද, මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලද ක්‍රියාමාර්ග හේතුවෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අවිධිමත් විදේශ විනිමය වෙළඳපොළ සිට විධිමත් බැංකු පද්ධතිය වෙත වැඩි වශයෙන් ගලා ඒමක් සිදු වන බවක් දක්නට ලැබුණි. මීට අමතරව, සංචාරක ඉපැයීම් වැඩිදියුණු විය. ඒ අනුව, සිය විදේශ විනිමය අවශ්‍යතා වෙළඳපොළෙන් සපුරා ගැනීම සඳහා මහ බැංකුව විසින් අදාළ ආයතන දිරිමත් කරනු ලැබූ අතර, එම නිසා අත්‍යවශ්‍ය ආනයන සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් මහ බැංකුවට සෘජු මැදිහත්වීම් ඔස්සේ විදේශ විනිමය ද්‍රවශීලතාව සැපයීම වසර අවසානය වන විට සම්පූර්ණයෙන්ම පාහේ අත්හිටුවීමට හැකි විය. මෙම යහපත් තත්ත්වයන් සමඟ, විදේශ විනිමය ගලා ඒමට අදාළව විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ සාමාන්‍ය ජනතාව සඳහා ලබා දෙන ලද දිරිගැන්වීමේ යෝජනා ක්‍රම ගණනාවක් 2022 වසරේ දී අහෝසි කෙරිණි.

2021 වසර අවසන් වන විට රුපියල් 198.50ක් සහ රුපියල් 203.00ක් වූ විදුලි පැවරුම් සඳහා වාණිජ බැංකුවල එ.ජ. ඩොලර් මිලදී ගැනීමේ සහ විකිණීමේ සාමාන්‍ය විනිමය අනුපාතික, 2022 වසර අවසන් වන විට, පිළිවෙලින්, රුපියල් 360.41ක් සහ රුපියල් 371.61ක් විය. මේ අතර, 2022 වසර තුළ දී, ස්ටර්ලිං පවුම, ඉන්දීය රුපියල සහ ඔස්ට්‍රේලියානු ඩොලරය ඇතුළු සියලුම ප්‍රධාන මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය විය.

දේශීය විදේශ විනිමය අන්තර් බැංකු වෙළඳපොළෙහි වෙළඳ පරිමාවන් 2021 වසරට සාපේක්ෂව 2022 වසර තුළ දී සියයට 21.3කින් අඩු විය. 2022 වසරේ දී අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනුවල මුළු පරිමාව එ.ජ. ඩොලර් බිලියන 9.6ක් වූ අතර, එය 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 12.2ක් විය. මෙම තත්ත්වයට සමගාමීව, අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළෙහි සාමාන්‍ය දෛනික පරිමාව 2021 වසරේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 50 සිට 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 40 දක්වා අඩු විය. තවද, විදේශ විනිමය ඉදිරි වෙළඳපොළ ගනුදෙනු පරිමාව, 2021 වසරේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 6.3ට සාපේක්ෂව 2022 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 4.1ක් දක්වා අඩු වූ අතර, එතැන් විනිමය අනුපාතික ගනුදෙනු පරිමාව 2021 වසරේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 2.2ට සාපේක්ෂව 2022 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 0.8ක් දක්වා අඩු විය.

රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ

ණයසේවාකරණ ගෙවීම් අත්හිටුවීම පිළිබඳ රජයේ නිවේදනය, පෙර නොවූ ලෙස ප්‍රතිපත්ති පොලී අනුපාතිකයන්ගේ ගැලපීම සහ රුපියල්

සුරැකුම්පත්වල ප්‍රතිලාභ මත දැඩි පීඩනයක් ඇති කළ රජයේ ඉහළ අයවැය හිඟය පියවාගැනීමේ මූල්‍යන අවශ්‍යතා හේතුවෙන් 2022 වසරේ නොවැම්බර් මස මැද වන විට රාජ්‍ය සුරැකුම්පත්හි ඵලදා අනුපාතික ඉතිහාසයේ ඉහළම අගයන්ට ළඟා විය. පිළිගැනීමේ උපරිම ඵලදා අනුපාතිකයක් නිවේදනය කිරීමේ වැඩපිළිවෙළෙහි මූලික බලපෑම හේතුවෙන් දීර්ඝ කාලීනව අඩු මට්ටමක ස්ථාවරව පැවති පොලී අනුපාතික වාතාවරණය නිමා කරමින්, 2022 වසරේ අප්‍රේල් මස අග භාගයේ දී රාජ්‍ය සුරැකුම්පත් ඵලදා අනුපාතික දැඩිලෙස ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන්ම අයහපත් සමාජ ආර්ථික වාතාවරණය හේතුවෙන් දුර්වල වූ ආයෝජක විශ්වාසයත්, පුළුල් ලෙස පැතිර ගිය මහජන කැළඹීමත්, 2022 අප්‍රේල් 8 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පදනම් අංක 700කින් සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීමත් හේතු විය. මේ අතර, රජය විසින් විදේශ ණයසේවාකරණ ගෙවීම් අත්හිටුවීම සම්බන්ධයෙන් 2022 අප්‍රේල් 12 වන දින නිවේදනය කිරීම සමඟ ඉන් පසු මාසවල දී අඛණ්ඩව පැන නැගුණු සමාජ දේශපාලනික අර්බුද හමුවේ, අනාගතයේ දී රජයට දේශීය ණයසේවාකරණයට ඇති හැකියාව පිළිබඳ වෙළඳපොළ අවිනිශ්චිතතා, රජයේ ඉතා ඉහළ මූල්‍යන අවශ්‍යතා සපුරාලීමට දැඩි අභියෝගයක් එල්ල කළේය. ආයෝජකයන් විසින් ඔවුන්ගේ ආයෝජන තීරණ මත ඉහළ අවදානම් වාරික එකතු කිරීමත් සමඟින් අවිනිශ්චිතතා හේතුවෙන් රාජ්‍ය සුරැකුම්පත් ඵලදා අනුපාතික මත ඇතිවූ ඉහළ යෑමේ පීඩනය හේතුවෙන් රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතික, ඉතිහාසයේ ඉහළම අගයන් කරා ළඟා විය.

ප්‍රාථමික වෙන්දේසිවල දී වෙළඳපොළෙහි කැමැත්ත දිගු පරිණත කාලයන් වන දින 182 හා දින 364 යන භාණ්ඩාගාර බිල්පත් වලට සාපේක්ෂව,

8.18 රූප සටහන

ප්‍රාථමික වෙළඳපොළ තුළ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මත බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතික (වාර්ෂික ප්‍රතිශතය)



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

8.19 සංඛ්‍යා සටහන

රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතික

වාර්ෂික ප්‍රතිශතය

අයිතමය	ප්‍රාථමික වෙළඳපොළ		ද්විතීයික වෙළඳපොළ	
	2021	2022	2021	2022
භාණ්ඩාගාර බිල්පත්				
දින 91	4.69 - 8.43	8.26 – 33.14	4.63 - 8.00	7.84 – 31.37
දින 182	4.75 - 8.33	8.30 – 32.53	4.71 - 8.07	8.12 – 30.17
දින 364	4.98 - 8.26	8.39 – 30.50	4.94 - 8.33	8.28 – 28.78
භාණ්ඩාගාර බැඳුම්කර				
වසර 2	6.19 - 9.36	14.41 – 33.01	5.25 - 8.96	8.59 – 28.29
වසර 3	6.25 - 9.94	20.30 – 32.63	5.68 - 9.81	9.61 – 28.55
වසර 4	6.34 - 8.55	-	6.21 - 10.40	10.33 – 28.33
වසර 5	6.72 - 11.14	11.92 – 31.78	6.43 - 11.03	10.65 – 27.60
වසර 6	7.44 - 10.90	11.70 – 21.86	6.61 - 11.26	11.04 – 28.02
වසර 8	7.16 - 11.63	26.51 – 30.85	6.98 - 11.55	11.38 – 27.83
වසර 10	8.86 - 11.91	12.01 – 30.86	7.44 - 11.80	11.64 – 28.51
වසර 15	8.44 - 12.06	-	7.76 - 11.85	11.77 – 27.80
වසර 20	-	-	7.89 - 11.83	11.72 – 25.34
වසර 30	-	-	8.04 - 11.81	11.78 – 22.96

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

පරිණත කාලය දින 91 වන භාණ්ඩාගාර බිල්පත්වලට නැඹුරු විය. දින 91, දින 182 සහ දින 364 යන පරිණත කාලයන් සඳහා භාණ්ඩාගාර බිල්පත්වල ඵලදා අනුපාතික 2021 වසර අවසානයේ පැවති, පිළිවෙලින්, සියයට 8.16, 8.33, සහ 8.24 යන අගයන් හා සැසඳීමේදී 2022 වසර අවසානයේ දී එම ඵලදා අනුපාතික, පිළිවෙලින්, සියයට 32.64, 32.20 සහ 29.27 ලෙස වාර්තා විය. භාණ්ඩාගාර බිල්පත් මෙන් නොව, භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වෙළඳපොළ කැමැත්ත සාපේක්ෂව දිගුකාලීන භාණ්ඩාගාර බැඳුම්කර කෙරෙහි කේන්ද්‍රගතව පැවතුණි. ඉහළ පොලී අනුපාතික ව්‍යූහය සැලකිල්ලට ගනිමින් වසරේ අග භාගයේ දී නිකුත්කරන්නා විසින් ප්‍රාථමික වෙන්දේසිවලදී වසර 5ට අඩු භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම හිතකර ලෙස සලකනු ලැබීය. වසරකට පෙර පැවති සියයට 12ට අඩු ඵලදා අනුපාතික මට්ටම හා සැසඳීමේ දී, වසර තුළ රාජ්‍ය සුරැකුම්පත්වල ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ යාම පිළිබිඹු කරමින් 2022 වසර අවසානය වන විට භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතික සියයට 30ට වඩා ඉහළ මට්ටමක පැවතුණි. රාජ්‍ය සුරැකුම්පත් සඳහා වන ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික ද, බොහෝ සෙයින් ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික හා සමගාමීව විචලනය විය.

2021 වසරේ දී සියයට 8.70ක බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකයක් යටතේ රුපියල් බිලියන 1,762.0ක භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කර ඇති අතර ඊට සාපේක්ෂව 2022 වසරේ සියයට 21.29ක බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකයක් යටතේ රුපියල් බිලියන 2,373.0ක භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කර ඇත. තවද,

8.20 සංඛ්‍යා සටහන

භාණ්ඩාගාර බිල්පත්හි ප්‍රාථමික වෙළඳපොළ භරිත සාමාන්‍ය ඵලදා අනුපාතික

වාර්ෂික ප්‍රතිශතය

වසර	පරිණත කාලය			සමස්ත සාමාන්‍යය
	දින 91	දින 182	දින 364	
2018	8.40	8.58	9.68	9.36
2019	8.15	8.44	9.40	9.06
2020	5.93	5.72	6.37	6.09
2021	6.35	6.13	5.33	6.24
2022	23.23	26.85	25.65	23.73

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

දළ පදනම මත 2021 වසරේ දී සියයට 6.09ක සමස්ත බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකයක් යටතේ රුපියල් බිලියන 3,821.4ක භාණ්ඩාගාර බිල්පත් නිකුත් කර ඇති අතර ඊට සාපේක්ෂව 2022 වසරේ සියයට 25.21ක සමස්ත බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකයක් යටතේ රුපියල් බිලියන 9,942.8ක භාණ්ඩාගාර බිල්පත් නිකුත් කර ඇත[6].

රජය සිය අරමුදල් අවශ්‍යතා සපුරා ගැනීම ප්‍රධාන වශයෙන් දේශීය මූලාශ්‍රවලට සීමා විය. කෙසේ වෙතත්, ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කරමින්, භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත්හි සිදු කරනු ලැබූ විදේශ ආයෝජන 2021 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 27.3ක ශුද්ධ ගලායෑමට සාපේක්ෂව 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 50.6ක ශුද්ධ ගලාඒමක් වාර්තා කරන ලදී.

කොටස් වෙළඳපොළ

අහිතකර සාර්ව ආර්ථික වර්ධනයන් මධ්‍යයේ, 2022 වසර තුළ දී මිල දර්ශක, වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය සහ දෛනික පිරිවැටුම අනුව කොටස් වෙළඳපොළ දුර්වල කාර්යසාධනයක් වාර්තා කළේය. තවද, මිල දර්ශකවල සැලකිය යුතු උච්චාවචන නිරීක්ෂණය වූ අතර, දර්ශක පාදක පරිපථ කඩනයන් අවස්ථා කිහිපයකදී ක්‍රියාත්මක කරන ලදී. පවතින ආර්ථික සංකෝචනය, ඉහළ උද්ධමනය, දේශීය මෙන්ම විදේශීය වශයෙන් ද ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම සඳහා ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීම, ඉහළ බදු ගැලපීම් හේතුවෙන් ආයතනික අංශයේ ලාභය පහත වැටීමේ අපේක්ෂාවන්, භූ දේශපාලනික ආතතීන් සහ අහිතකර ගෝලීය ආර්ථික තත්ත්වයන් කොටස් වෙළඳපොළෙහි උච්චාවචනයන්ට දායක විය. 2022 ජනවාරි 19 වන දින සමස්ත කොටස් මිල දර්ශකය (ASPI) ඉතිහාසයේ ඉහළම අගය වන 13,462.4ක් වාර්තා කළ ද, 2021 වසර තුළ දී නිරීක්ෂණය වූ ඉහළ යෑමේ ප්‍රවණතාව ආපසු හරවමින්, 2022 වසරේ පෙබරවාරි මස මුල සිට දර්ශකයන් පහත වැටීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2022 වසර තුළ දී සමස්ත කොටස් මිල දර්ශකය සහ ස්ටැන්ඩර්ඩ් සහ පුවර්ස් ශ්‍රී ලංකා 20 දර්ශකය (S&P SL20), පිළිවෙලින්, සියයට 30.6කින් සහ සියයට 37.7කින් සංකෝචනය වූ අතර වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය සියයට 29.9කින් අඩු වෙමින් 2022 වසර අවසන් වන විට එය රුපියල් බිලියන 3,847.2ක් ලෙස පැවතුණි. තවද, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය 2021 වසර අවසානයේ වාර්තා වූ සියයට 31.2ට සාපේක්ෂව 2022 වසර අවසානයේ සියයට 15.9ක් දක්වා පහළ ගියේය. මේ අතර, කොළඹ කොටස් වෙළඳපොළ 2022 වසර තුළ දී රුපියල් මිලියන 2,972.3ක සාමාන්‍ය දෛනික පිරිවැටුමක් වාර්තා කළ අතර එය 2021 වසර තුළ දී වාර්තා වූ රුපියල් මිලියන 4,888.2ට සාපේක්ෂව සැලකිය යුතු අඩුවීමකි.

කෙසේ වුවද, ප්‍රධාන සමාගම් කිහිපයක් විසින් විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව 2022 වසර තුළ දී ශුද්ධ විදේශ ගලා ඒම්වල කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි. ඒ අනුව, 2021 වසර තුළ දී වාර්තා වූ රුපියල් බිලියන 52.6ක (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 264.4ක) ශුද්ධ විදේශ ගලා යාමට සාපේක්ෂව 2022 වසර තුළ දී රුපියල් බිලියන 30.6ක (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 74.3ක) ශුද්ධ විදේශ ගලා ඒම් වාර්තා විය. මීට අමතරව, විදේශීය තනිපුද්ගල සහ ආයතනික ආයෝජකයින් සතු වූ සුරැකුම්පත් ප්‍රමාණය 2021 වසර අවසානයේ වාර්තා කළ සියයට

8.19 රූප සටහන

මිල දර්ශකවල විචලනයන් සහ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය



මූලයඃ කොළඹ කොටස් හුවමාරුව

6 සමස්ත බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකයට, මුළු සාමාන්‍ය ණය ගැනීමේ පිරිවැය ඇතුළත් වන අතර, එයට පරිපාලන උපදෙස් මත සිදු කරන ලද නිකුතුන් ද ඇතුළත් වේ.

8.20 රූප සටහන
කොටස් වෙළඳපොළෙහි විදේශ සහභාගිත්වය



මූලාශ්‍රය: කොළඹ කොටස් හුවමාරුව

0.3ක සහ සියයට 2.6ක වාර්ෂික වර්ධනයට සාපේක්ෂව 2022 වසර අවසානයේ සියයට 4.7ක සහ සියයට 5.5ක වාර්ෂික වර්ධනයක් වාර්තා කර ඇත. කෙසේ වුවද, 2022 වසර තුළ දී සාපේක්ෂ ඉහළ පොලී අනුපාතික සහිත ස්ථාවර ආදායම් ආයෝජන වෙත ආයෝජක කැමැත්ත යොමු වීමත් සමඟ, දේශීය තනිපුද්ගල සහ ආයතනික ආයෝජකයින් සතු වූ සුරැකුම්පත් ප්‍රමාණය 2022 වසර අවසානයේ දී, පිළිවෙලින්, සියයට 7.2ක සහ සියයට 15.1ක වාර්ෂික වර්ධනයක් වාර්තා කර ඇති අතර, එය 2021 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 53.3ක සහ 17.8ක වාර්ෂික වර්ධනයට සාපේක්ෂව සැලකිය යුතු අඩු වීමකි.

2022 වසර තුළ දී වෙළඳපොළ තක්සේරු දර්ශක සැලකිය යුතු පසුබෑමක් වාර්තා කළේය. මිල ඉපැයීම් අනුපාතය සහ මිල පොත් අගය, 2021 වසර අවසානයේ දී පැවති 13.6ට හා 1.7ට සාපේක්ෂව 2022 වසර අවසානයේ දී 4.9ක් සහ 0.9ක් දක්වා සැලකිය යුතු ලෙස පහළ ගියේය. මේ අතර, 2022 වසර තුළ දී නව කොටස් මූලික මහජන නිකුතු (Initial Public Offerings) 4ක් සිදු කරමින් රුපියල් බිලියන 4.8ක් රැස්කළ අතර එය 2021 දී නව කොටස් මූලික මහජන නිකුතු 13ක් සමඟින් රැස්කළ රුපියල් බිලියන 12.7ට සාපේක්ෂව සැලකිය යුතු අඩුවීමකි.

සාංගමික ණය සුරැකුම්පත් වෙළඳපොළ

වාණිජ පත්‍රිකා (Commercial Papers) වෙළඳපොළ 2021 වසර හා සැසඳීමේ දී 2022 වසරේදී සාපේක්ෂව අඩු ක්‍රියාකාරිත්වයක් පෙන්වීය. 2022 වසරේ දී බලපත්‍රලාභී බැංකුවල සහය ඇතිව නිකුත් කරන ලද වාණිජ පත්‍රිකාවල වටිනාකම රුපියල් බිලියන 2.0ක් වූ අතර 2021 වසරේ දී එම අගය රුපියල් බිලියන 5.8ක් විය. පසුගිය වසරේ වාර්තා වූ සියයට 6.00 සිට 12.00 දක්වා පරාසයට සාපේක්ෂව වාණිජ පත්‍රිකාවල පොලී අනුපාතික 2022 වසර තුළ දී සියයට 11.00 සිට 36.00ක් දක්වා පරාසයක විචලනය විය.

ඉහළ පොලී අනුපාතික සහ අයහපත් ආර්ථික තත්ත්වයන් හේතුවෙන් 2021 වසරට සාපේක්ෂව 2022 වසර තුළ දී සාංගමික ණයකර වෙළඳපොළෙහි ක්‍රියාකාරකම් සැලකිය යුතු පසුබෑමක් වාර්තා කළේය. 2021 වසරේ දී සමාගම් 14ක් විසින් සාංගමික ණයකරවල මූලික නිකුතු 27ක් මගින් රැස් කරන ලද රුපියල් බිලියන 84.4ට සාපේක්ෂව 2022 වසර තුළ දී කොළඹ කොටස් වෙළඳපොළෙහි සමාගම් 4ක් විසින් නිකුත් කරන ලද සාංගමික ණයකරවල මූලික නිකුතු 10ක් මගින් රුපියල් බිලියන 12.7ක් රැස් කරන ලදී. ස්ථාවර සහ පාවෙන පොලී අනුපාතික සහිත ණයකර 2022 වසර තුළ දී නිකුත් කරන ලද අතර ස්ථාවර පොලී අනුපාතික පසුගිය වසරේ පැවති සියයට 8.00-12.00 දක්වා පරාසයට සාපේක්ෂව සියයට 15.42-28.00 දක්වා පරාසයක පැවතුණි.

8.5 සංවර්ධන මූල්‍ය සහ මූල්‍ය ප්‍රවේශය

2022 වසර තුළ දී මහ බැංකුව විසින් ණය පරිපූරක සේවා රැසක් සපයමින්, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ පුද්ගලයින් හට දැරිය හැකි මූල්‍ය පහසුකම් ලබාදීමේ අරමුණින් විවිධ ප්‍රතිමූල්‍ය පොලී සහනාධාර සහ ණය ඇපආවරණ යෝජනා ක්‍රම සම්බන්ධීකරණය කිරීම, පහසුකම් සැලසීම, සහ ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2022 වසර තුළ දී, සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා ප්‍රතිලාභීන් 63,202ක් අතරේ රුපියල් මිලියන 17,244.4ක මුදල් ප්‍රමාණයක් මුදා හරින ලද අතර මුළු ණය ප්‍රමාණයෙන්, සියයට 57.6ක් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 17ක් යටතේ සහ සියයට 42.4ක් පොලී සහනාධාර සහ ණය ඇපකර යෝජනා ක්‍රම 5ක් යටතේ ලබා දෙන ලදී.

මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රමයන්ට අදාලව 2022 වසර තුළ දී පූර්වෝපායික ක්‍රියාමාර්ග රැසක් මහ බැංකුව විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, අහිතකර ආර්ථික තත්ත්වයන් සහ වෙළඳපොළ පොලී අනුපාතයන්හි කැපී පෙනෙන ඉහළ යෑම සැලකිල්ලට ගනිමින්, සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ පොලී අනුපාතිකය වසර තුළ දී සියයට 6.00 සිට සියයට 9.00 දක්වා ඉහළ නංවන ලදී. එමෙන්ම, ඉදිරියේදී රටේ ඇතිවිය හැකි ආහාර හිඟය සැලකිල්ලට ගනිමින්, මුදාහරිනු ලබන නව ණයවලින් සියයට 80ක් කෘෂිකාර්මික, පශු සම්පත්, ධීවර වැනි අංශ

සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ලබාදීම සහතික කරන ලෙස සහභාගිත්ව මූල්‍ය ආයතනවලට උපදෙස් ලබාදෙන ලදී. මීට අමතරව, පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් දැඩි බලපෑමට ලක්වූ ව්‍යාපාරවලට සහය වීමේ අරමුණින්, මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම සඳහා ආපසු ගෙවීමේ ණය සහන කාලයක් ලබාදීම ද සිදු කරන ලදී. තවද, ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම, ආහාර ආනයනය සඳහා විදේශ විනිමය මෙරටින් පිටතට ගලායාම අඩු කිරීම, කෘෂිකාර්මික නිෂ්පාදන කෙරෙහි ජනතාව තුළ වැඩි නැඹුරුවක් ඇති කිරීම සහ සුළු පරිමාණ ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීම වැනි රටේ කෘෂිකාර්මික අංශය දිරිගැන්වීම සඳහා රජයේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ රටේ පවතින ආර්ථික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයෙහි අදාළ පොලී අනුපාතය සහ මුදල් ප්‍රමාණයන් සංශෝධනය කරන ලදී.

තවද, නියමිත ඉලක්ක සපුරා ගැනීම සහතික කිරීම සඳහා එහි ක්‍රියාකාරී සැලැස්මට සමගාමීව මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම මහ බැංකුව විසින් අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගයෙහි පුළුල් ක්‍රියාමාර්ගයන් 82න්, ආසන්න වශයෙන් සියයට 24ක ප්‍රතිශතයක් මේ වනවිට සම්පූර්ණ කර ඇති අතර අනෙකුත් ක්‍රියාමාර්ග අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනයනවල සහයෝගය ඇතිව සිදුවෙමින් පවතී. වත්මන් මූල්‍ය සාක්ෂරතා මට්ටම අවබෝධ කරගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ සහයෝගය ද ඇතිව ප්‍රථම දීප ව්‍යාප්ත මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණය සාර්ථකව නිම කරන ලදී. එහිදී අනාවරණය වූ මූලික කරුණු මහජනතාවට ලබාගත හැකි වන පරිදි මහ බැංකු වෙබ් අඩවියෙහි පළ කර ඇත. මූල්‍ය සාක්ෂරතාවය හා හැකියා සංවර්ධනය සඳහා පෙර දැක්මක් සකස් කිරීම සඳහා ලෝක බැංකුවෙන් තාක්ෂණික සහය ලබාගැනීමේ අරමුණින් උපදේශන මෙහෙයුමක් ද පවත්වන ලදී. තවද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය අපනයන වෙළඳපොළ වෙත යොමු වීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, රට තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ පවතින විභවතා සහ බාධක හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමේ අරමුණින්, මහ බැංකුව සිය ප්‍රාදේශීය කාර්යාල 6හි සහාය ඇතිව වසර තුළ දී වැඩසටහන් කිහිපයක් ආරම්භ කරන ලදී. ඒ අනුව, 2022 වසර තුළ දී, පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්, ගුවන්විදුලි හා රූපවාහිනී වැඩසටහන්, දැනුම බෙදාගැනීමේ වැඩසටහනක් සහ මූල්‍ය සාක්ෂරතාව, ව්‍යවසායකත්වය, ධාරිතා සහ කුසලතා සංවර්ධනය පිළිබඳ වැඩසටහන් රාශියක් පවත්වන ලදී.

8.6 මූල්‍ය යටිතල පහසුකම්

ගෙවීම් සහ පියවීම් පද්ධති

රට තුළ පවතින ගෙවීම් සහ පියවීම් පද්ධති 2022 වසරේ දී සුමටව සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක වූ අතර, මහජනතාව සහ ගෙවීම් සේවා සපයන්නන් යන දෙපිරිසම වැඩි වශයෙන් ඩිජිටල් ගනුදෙනු සඳහා යොමු විය. 2022 වසරේ පළමු භාගයේ දී, විදුලිය විසන්ධි කිරීම් සහ අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟ වීම හේතුවෙන් ඇති වූ සමාජ නොසන්සුන්තාවය මධ්‍යයේ, ජාතික ගෙවීම් සහ පියවීම් යටිතල පහසුකම්වල අඛණ්ඩ, කාර්යක්ෂම සහ ආරක්ෂිත මෙහෙයුම් සහතික කිරීම සඳහා මෙන්ම රට තුළ ආර්ථික කටයුතුවලට පහසුකම් සැලසීම සහ මහජනතාවට සේවය සැපයීම සඳහා මහ බැංකුව විසින් සේවකයින් සඳහා නිවසේ සිට වැඩ කිරීම (Work From Home - WFH) වැනි ක්‍රියාමාර්ග ද ඇතුළත්ව සිය ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම (Business Continuity Plan - BCP) ක්‍රියාත්මක කරන ලදී.

තත්කාලීන දළ පියවීම් (Real Time Gross Settlement – RTGS) සහ ලංකාසෙකියු (LankaSecure) යන පද්ධතීන්ගෙන් සමන්විත, පද්ධතිමය වශයෙන් වැදගත් ඉහළ වටිනාකමින් යුතු ගෙවීම් සහ පියවීම් පද්ධතිය වන ලංකාසෙට්ල් පද්ධතිය (LankaSettle System), 2022 වසරේ දී සිදු වූ විදුලි කප්පාදු කිරීම් වැනි බාධා මධ්‍යයේ වුව ද ඉහළ උපයෝගිතාවයකින් සහ ඔරොත්තු දීමේ හැකියාවකින් ක්‍රියාත්මක විය. සලකා බලනු ලබන කාලසීමාව තුළ දී, තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහා පියවූ ගනුදෙනු ප්‍රමාණය සියයට 42කින් වැඩි වූ අතර නිත්‍ය තැන්පතු පහසුකම් සහ නිත්‍ය ණය පහසුකම් ගනුදෙනු ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් එම පද්ධතිය හරහා පියවූ මුළු ගනුදෙනුවල වටිනාකම 2021 වසරේ දී වාර්තා වූ රුපියල් ට්‍රිලියන 295 සිට 2022 වසරේ දී රුපියල් ට්‍රිලියන 827ක් දක්වා සියයට 181කින් වර්ධනය විය. තවද, 2021 වසරේ දී සහභාගිත්ව ආයතන විසින් භාවිතා කරන ලද එක්දින ද්‍රවශීලතා පහසුකමෙහි[7] සාමාන්‍ය දෛනික වටිනාකම වූ රුපියල් බිලියන 208.5ට සාපේක්ෂව 2022 වසරේ දී දේශීය මූල්‍ය වෙළඳපොළ තුළ ද්‍රවශීලතා හිඟයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 658.5ක් ලෙස වාර්තා විය. තවද, 2022 වසර තුළ දී, ජාතික

7 ව්‍යාපාරික දිනය තුළ LankaSettle පද්ධතියේ ගනුදෙනු සුමටව පියවීම සහතික කිරීම සඳහා මහ බැංකුව පොලී රහිත එක්දින ද්‍රවශීලතා පහසුකම සපයයි.

8.21 සංඛ්‍යා සටහන

ගෙවීම් පද්ධති සහ උපකරණවල ක්‍රියාකාරිත්වය - ගනුදෙනු ප්‍රමාණය

ගෙවීම් පද්ධති/ උපකරණ	2018 ('000)	2021 ('000)	2022 (අ) ('000)	වර්ධනය %	
				2018-22	2021-22
විශාල වටිනාකමින් යුත් ගෙවීම් පද්ධති					
තත්කාලීන දළ පියවීම් පද්ධතිය	405.2	449.8	638.7	57.6	42.0
සුළු පරිමාණ ගෙවීම් පද්ධති/ උපකරණ					
අන්තර් බැංකු චෙක්පත් නිශ්කාෂණ පද්ධතිය	50,352.2	33,021.2	33,049.6	-34.4	0.1
ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (මාර්ගගත අරමුදල් හුවමාරු කිරීම)	32,943.3	41,867.7	45,536.4	38.2	8.8
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය	40,464.4	58,210.5	84,141.2	107.9	44.5
විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) (මාර්ගගත අරමුදල් තත් කාලිනව හුවමාරු කිරීම)	7,233.6	54,675.5	91,782.0	1,168.8	67.9
එයින් විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය තුළ ඇති;					
ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LPOPP)	15.4	514.0	891.7	5,690.3	73.5
ජස්ට්පේ (JustPay)	45.6	9,014.7	14,512.4	31,725.4	61.0
LANKAQR*	-	848.9 (ආ)	599.5	-	-29.4
මාර්ගගත සහ විකුණුම්පළ (POS) ගෙවීම් යන්ත්‍ර මඟින් සිදුවන ණය කාඩ්පත් ගනුදෙනු	43,599.8	50,689.1	59,843.5	37.3	18.1
POS ගෙවීම් යන්ත්‍ර මඟින් සිදුවන හර කාඩ්පත් ගනුදෙනු	56,595.1	108,039.7	146,478.9	158.8	35.6

*2018 වසර තුළදී LANKAQR හඳුන්වා දෙන ලද අතර 2020 වසරේ සිට දත්ත ලබා ගත හැකිය.
(අ) තාවකාලික
(ආ) සංශෝධිත

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉතිරිකිරීමේ බැංකුවට මූල්‍ය වෙළඳපොළ තුළ සක්‍රීයව ගනුදෙනු කිරීමේ හැකියාව ලබා ගනිමින්, ලංකාසෙට්ල් පද්ධතියෙහි සහභාගිත්ව තත්ත්වය ලබා ගත් පළමු බලපත්‍රලාභී විශේෂිත බැංකුව බවට පත් වීමට ද හැකි විය.

ලංකාසෙක්‍යු පද්ධතිය 2022 වසර තුළ දී සියලුම රාජ්‍ය සුරැකුම්පත් සම්බන්ධ ගනුදෙනු සඳහා අඛණ්ඩව සහාය විය. 2022 වසර අවසානයේ දී, ලංකාසෙක්‍යු සතු මුළු නිර්ලේඛිත සුරැකුම්පත් ප්‍රමාණය රුපියල් බිලියන 12,848.5ක් (මුහුණත අගය) වූ අතර එය භාණ්ඩාගාර බිල්පත් රුපියල් බිලියන 4,126.4ක් හා භාණ්ඩාගාර බැඳුම්කර රුපියල් බිලියන 8,722.1කින් සමන්විත විය. ලංකාසෙක්‍යු පද්ධතියෙහි නිර්ලේඛිත සුරැකුම්පත් පියවීම් පද්ධතිය මඟින් 2021 වසර තුළ සිදු වූ රුපියල් ට්‍රිලියන 262.8ට සාපේක්ෂව 2022 වසර තුළ දී ගනුදෙනු රුපියල් ට්‍රිලියන 1,028.6ක් සඳහා පහසුකම් සලසා ඇත[8].

මහජනතාව වැඩි වශයෙන් ඩිජිටල් ගෙවීම් ක්‍රම අනුගමනය කිරීමත් සමඟ රට තුළ සුළු පරිමාණ ඩිජිටල් ගෙවීම්වල ඉහළ වර්ධනයක් වාර්තා විය. බහුවිධ ගෙවීම් නාලිකා හරහා තත්කාලීනව සුළු පරිමාණ අරමුදල් හුවමාරු කිරීමේ හැකියාව ලබා දෙන විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (Common Electronic Fund Transfer Switch - CEFTS), ඩිජිටල් ගෙවීම් රට තුළ ජනප්‍රියත්වයට පත්වීමට සැලකිය යුතු ලෙස දායක විය. 2022 වසර තුළ සිදු වූ විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණ ගනුදෙනු ප්‍රමාණය මිලියන 54.7 සිට මිලියන 91.8ක් දක්වා සියයට 67.9කින් වර්ධනය වූ අතර එම ගනුදෙනුවල මුළු වටිනාකම රුපියල් බිලියන 4,926.6 සිට රුපියල් බිලියන 8,881.3 දක්වා සියයට 80.3කින් වර්ධනය විය.

ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LankaPay Online Payment Platform-LPOPP), LANKAQR, ජස්ට්පේ (JustPay) සහ ජංගම ගෙවීම් යෙදුම් වැනි ගෙවීම් යටිතල පහසුකම් තුළ ඇති නවෝත්පාදන කිහිපයක් සඳහා විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය මඟින් තාක්ෂණික පදනම ස්ථාපිත කර ඇත. රාජ්‍ය ආයතන වැඩි වශයෙන් ඩිජිටල් ගෙවීම් ක්‍රම කෙරෙහි යොමුවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරමින් මහජනතාවට ඔවුන්ගේ ජංගම සහ ඉතුරුම් ගිණුම්වලින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව වැනි රාජ්‍ය ආයතන සඳහා සෘජුවම ගෙවීමට හැකියාව ලබා දෙන ලංකාපේ මංගත ගෙවීම් වේදිකාවෙහි, 2022 වසර තුළ දී ගනුදෙනු ප්‍රමාණය සහ එම ගනුදෙනුවල වටිනාකම, පිළිවෙලින්, සියයට 73.5කින් සහ 151.4කින් සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. පසුගිය වසර තුළ LANKAQR ගනුදෙනුවල සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබුණ ද, 2022 වසරේ පළමු කාර්තු තුන තුළ LANKAQR

8 ප්‍රාථමික නිකුතු, ද්විතියික වෙළඳපොළ කටයුතු (එකවර මිලදී ගැනීම්, ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු, ඇප ගනුදෙනු), විවට වෙළඳපොළ කටයුතු සහ එක්දින ද්‍රවශීලතා පහසුකම ද ඇතුළත්ව රජයේ සුරැකුම්පත් සම්බන්ධ සියලුම ගනුදෙනු ලංකාසෙක්‍යු පද්ධතිය මඟින් පියවීම් සිදුකරනු ලබයි.

8.22 සංඛ්‍යා සටහන

ගෙවීම් පද්ධති සහ උපකරණවල ක්‍රියාකාරිත්වය - ගනුදෙනු වටිනාකම

ගෙවීම් පද්ධති/ උපකරණ	2018 (රු.බිලියන)	2021 (රු.බිලියන)	2022 (අ) (රු.බිලියන)	වර්ධනය %	
				2018-22	2021-22
විශාල වටිනාකමින් යුත් ගෙවීම් පද්ධති					
තත්කාලීන දළ පියවීම් පද්ධතිය	100,473.1	294,602.0	827,105.1	723.2	180.8
සුළු පරිමාණ ගෙවීම් පද්ධති/ උපකරණ					
අන්තර් බැංකු චෙක්පත් නිශ්කාෂණ පද්ධතිය	10,528.4	8,311.5	9,813.8	-6.8	18.1
ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (මාර්ගගත අරමුදල් හුවමාරු කිරීම)	1,972.2	2,862.2	3,368.4	70.8	17.7
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය	344.6	671.0	1,012.9	193.9	51.0
විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) (මාර්ගගත අරමුදල් තත් කාලීනව හුවමාරු කිරීම)	660.3	4,926.6	8,881.3	1,245.0	80.3
එයින් විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය තුළ ඇති;					
ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LPOPP)	12.5	198.2	498.3	3,886.4	151.4
ජස්ට්පේ (JustPay)	0.1	34.6	67.8	67,700.0	96.0
LANKAQR*	-	1.9	2.0	-	5.3
මාර්ගගත සහ විකුණුම්පළ (POS) ගෙවීම් යන්ත්‍ර මඟින් සිදුවන ණය කාඩ්පත් ගනුදෙනු	241.8	282.6	401.5	66.0	42.1
POS ගෙවීම් යන්ත්‍ර මඟින් සිදුවන හර කාඩ්පත් ගනුදෙනු	158.7	315.9	528.9	233.3	67.4

*2018 වසර තුළදී LANKAQR හඳුන්වා දෙන ලද අතර 2020 වසරේ සිට දත්ත ලබා ගත හැකිය.
(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ගනුදෙනු ප්‍රමාණයේ සුළු අඩුවීමක් දක්නට ලැබීම, QR ගෙවීම් පිළිබඳ පාරිභෝගිකයන් සහ වෙළෙඳුන් යන දෙඅංශයේම දැනුම්වත්භාවය වැඩි කිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරයි. තවද, ලංකාපේ පුද්ගලික සමාගම විසින් 2022 වසරේ දී මහ බැංකුව සමඟ සහයෝගීතාවයෙන් 'LankaRemit' නම් ජංගම ප්‍රේෂණ යෙදුමක් දියත් කරන ලද අතර එමඟින් විදේශයන්හි දී නිකුත් කරන ලද ගෙවීම් කාඩ්පත් හරහා විදෙස්ගත ශ්‍රමිකයින්ට ශ්‍රී ලංකාවට මුදල් ප්‍රේෂණය කිරීමට සහ උපයෝගිතා බිල්පත් ගෙවීමට ද හැකියාව ලැබුණි.

විශ්‍රාම වැටුප් හා වැටුප් වැනි සුළු පරිමාණ සමූහ ගෙවීම් සහ දිනය තුළදීම පියවීමට නියමිත අනෙකුත් සුළු පරිමාණ ගෙවීම් සඳහා පහසුකම් සලසන ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (Sri Lanka Interbank Payment System - SLIPS), ගනුදෙනුවල වටිනාකම සහ ප්‍රමාණය අනුව මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය මගින් 2022 වසරේ දී රුපියල් බිලියන 3,368.4ක් වටිනා ගනුදෙනු සඳහා පහසුකම් සලසන ලද අතර එය 2021 වසරට සාපේක්ෂව සියයට 17.7ක වර්ධනයකි.

2022 වසර තුළ, ණය කාඩ්පත් සහ හර කාඩ්පත් ගනුදෙනු ප්‍රමාණය පිළිවෙලින් මිලියන 59.9 සහ මිලියන 146.5 දක්වා සියයට 18.1කින් සහ සියයට 35.6කින් ඉහළ ගොස් ඇති අතර, ණය කාඩ්පත් සහ හර කාඩ්පත්වලින් සිදු වූ ගනුදෙනුවල වටිනාකම පිළිවෙලින් රුපියල් බිලියන 401.5ක් සහ රුපියල් බිලියන 528.9ක් දක්වා සියයට 42.1කින් සහ සියයට 67.4කින් වර්ධනය වී ඇත. විද්‍යුත් වාණිජ (e-commerce) වෙළඳාම, ජංගම ගෙවීම් යෙදුම් (mobile payment apps) සහ අන්තර්ජාල බැංකුකරණය (internet banking) හරහා සිදුවන ගනුදෙනු ඉහළ යාම, මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

චෙක්පත් පිළිබිඹු භාවිතයෙන් චෙක්පත ඉදිරිපත් කර එක් ව්‍යාපාරික දිනයක් තුළ දී අන්තර් බැංකු චෙක්පත් ගෙවීම් නිෂ්කාශනය කරනු ලබන ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතිය (Cheque Imaging and Truncation System - CITS), ශ්‍රී ලංකාවේ අන්තර් බැංකු චෙක්පත් නිෂ්කාශන පද්ධතිය ලෙස සැලකෙන අතර, මෑත වසරවල දී මෙමඟින් නිෂ්කාශනය කරන ලද චෙක්පත්වල ප්‍රමාණය සහ වටිනාකම යන දෙඅංශයේම පහත වැටීමේ ප්‍රවණතාවක් වාර්තා විය. කෙසේ වෙතත්, 2021 වසරේ දී පැවති කොවිඩ්-19 වසංගතය හේතුවෙන් රජය විසින් සංචරණ සීමා පැනවීමත් සමඟ ව්‍යාපාරවලට සාර්ථකව සිය කටයුතු පවත්වා ගෙන යාමට නොහැකි වීම හා පසුව 2022 වසරේ දී එම සංචරණ සීමාවන් ඉවත් කිරීම, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී චෙක්පත්වල වටිනාකම සියයට 18.1කින් වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය **(Common ATM Switch – CAS)** මගින් එම යාන්ත්‍රණයට සම්බන්ධ ඕනෑම ටෙලර් යන්ත්‍රයකින් සාමාජික මූල්‍ය ආයතනවල ගනුදෙනුකරුවන් හට මුදල් ආපසු ගැනීමේ සහ ශේෂය පරීක්ෂා කිරීමේ හැකියාව ලබාදෙන අතර, 2022 වසරේ දී ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා සිදු කළ ගනුදෙනු ප්‍රමාණය 2021 වසරට සාපේක්ෂව මිලියන 84.1 දක්වා සියයට 44.5කින් වැඩි වී ඇති අතර, එහි වටිනාකම රුපියල් බිලියන 1,012.9ක් දක්වා සියයට 51.0කින් වර්ධනය වී ඇත. 2022 වසර අවසානයේ දී ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය හා ඒකාබද්ධ වූ මූල්‍ය ආයතන සංඛ්‍යාව 30කි. මේ අතර, තමන්ටම හිමි ස්වයංක්‍රීය ගෙවීම් කාඩ්පත් කළමනාකරණ පද්ධති මෙහෙයවීමට නොහැකි මූල්‍ය ආයතනවලට සේවා සැපයීම සඳහා 2015 දී දියත් කරන ලද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ හවුල් යාන්ත්‍රණය සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වූ අතර එය 2022 වසර තුළ දී සිය ක්‍රියාකාරිත්වය සුමටව පවත්වාගෙන ගියේය.

මහ බැංකුව විසින් 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනත යටතේ ගෙවීම් සහ පියවීම් පද්ධති සම්බන්ධ නියාමන සහ අධීක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, ගෙවීම් කාඩ්පත් සහ ජංගම ගෙවීම් පද්ධතිවල සේවාවන් සුමටව ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා එතැන් පරීක්ෂණ සහ දුරස්ථ ආවේක්ෂණ කටයුතු සිදු කරන ලදී. තවද, ජංගම ගෙවීම් යෙදුම් භාවිතා කරමින් මූල්‍ය ගනුදෙනු සිදු කිරීමේ දී ඇති විය හැකි අවදානම් අවම කිරීම සඳහා, මහ බැංකුව විසින් ජංගම ගෙවීම් යෙදුම් සපයන්නන්ගේ අනුකූලතාව අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී. මීට අමතරව, නිසි අවිනිශ්චිතතා සැලසුම් (Contingency plans) සහිතව ගෙවීම් සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිවන්නන්ගේ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් වාර්තා සමාලෝචනය කිරීම සහ ඔවුන්ගේ ආපදා ප්‍රතිසාධන අඩවි (Disaster Recovery sites) වෙත පිවිසීම මගින් මහ බැංකුව ඔවුන්ගේ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් සහ ආපදා සැලසුම් අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී.

ජාතික ගෙවීම් කවුන්සිලය **(National Payments Council - NPC)**[9] විසින් මෙම කාල සීමාව තුළ, ගෙවීම් කාඩ්පත් **EMV**[10] ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි ඉහළ නංවාලීම මගින් ආරක්ෂිත ඩිජිටල් ගනුදෙනු ප්‍රවර්ධනය කිරීම, පාරිභෝගිකයින්ට සිය ඩිජිටල් ගනුදෙනු තත්කාලීනව දැන ගැනීමට සැලැස්වීම සහ නව ඩිජිටල් ගෙවීම් ක්‍රම සහ ගෙවීම් සම්බන්ධ වංචාවන් පිළිබඳ පාරිභෝගික දැනුම්වත්භාවය වැඩි කිරීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හරහා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන ලදී. මීට අමතරව, රට තුළ ගෙවීම් පද්ධති යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින්, ජාතික ගෙවීම් කවුන්සිලය විසින් ගෙවීම් පද්ධති ඉදිරි දැක්ම 2022-2024 අඛණ්ඩව අධීක්ෂණය කරන ලද අතර කවුන්සිලය විසින් පත් කරන ලද කමිටු කිහිපයක් මගින් නව ගෙවීම් තාක්ෂණයන්, සුරක්ෂිත ඩිජිටල් ගනුදෙනු සහ ඩිජිටල් ගනුදෙනු ක්‍රම පිළිබඳ පාරිභෝගික දැනුම්වත්භාවය ඉහළ නැංවීම වැනි ගෙවීම් සහ පියවීම් පද්ධති හා සම්බන්ධ අධ්‍යයන කිහිපයක් ද සිදු කරන ලදී. ඩිජිටල් ක්‍රම භාවිතයෙන් සිදුකරනු ලබන මූල්‍ය වංචා පිළිබඳ මහජනතාවගේ දැනුම්වත්භාවය සම්බන්ධ සමීක්ෂණයක් පැවැත්වීම ද මෙම අධ්‍යයනයන්ට ඇතුළත් විය. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල, මහ බැංකුව සහ මූල්‍ය ආයතන විසින් සිය ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අරමුණින් පුළුල් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා අඛණ්ඩව යොදා ගන්නා ලදී.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

2022 වසර තුළ දී රටෙහි පැවති ආර්ථික අර්බුදය මධ්‍යයේ, මූල්‍ය බුද්ධි ඒකකය විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව එහි මූලික කාර්යයන් අඛණ්ඩව සිදු කරන ලදී. වාර්තාකරණ ආයතන සහ මහජනතාව විසින් මෙම වසර තුළ දී මූල්‍ය බුද්ධි ඒකකය වෙත සැකකටයුතු ගනුදෙනු වාර්තා 1,481ක් යොමු කරන ලදී. ඒ අතරින්, වාර්තා 419ක් විශ්ලේෂණයන්ගෙන් පසුව වැඩිදුර විමර්ශන සහ නියාමන ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ නීතිය බලාත්මක කිරීමේ ආයතන සහ නියාමන අධිකාරීන් වෙත යොමු කරන ලදී. එමෙන්ම, සැකකටයුතු ගනුදෙනු වාර්තා 605ක් අඛණ්ඩ පරීක්ෂාව යටතේ තබා ඇති අතර, සැකකටයුතු ගනුදෙනු වාර්තා 134ක් වැඩිදුර අධ්‍යනය සඳහා යොමු කිරීමට තීරණය කර ඇත. ඉතිරි සැක කටයුතු ගනුදෙනු වාර්තා වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නොවන කාණ්ඩය යටතේ

9 බලපතුලාභී බැංකු සහ මූල්‍ය සමාගම්, ලංකාපේ පුද්ගලික සමාගම, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව, ශ්‍රී ලංකා බැංකු සංගමය, ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමය, ප්‍රාථමික අලෙවි නියෝජිත සංගමය, ලංකා මූල්‍ය සේවා කාර්යාංශය, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය, මුදල් අමාත්‍යාංශය සහ ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාත්මක කරන්නන්ගේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ.

10 EMV යනු ගෙවීම් කාඩ්පත් ගනුදෙනුවල ආරක්ෂාව සහ අන්තර් ක්‍රියාකාරිත්වය වැඩි කිරීම සඳහා චිප් (chip) මත පදනම් වූ හර සහ ණය කාඩ්පත් ගනුදෙනු සඳහා වන ගෝලීය තාක්ෂණික ප්‍රමිතිය වේ. EMV යන්නෙන් අදහස් කරන්නේ මෙම ප්‍රමිතිය මුලින්ම නිර්මාණය කළ සමාගම් තුනේ නම් වන Europay, Mastercard සහ Visa යන්නයි.

වර්ගීකරණය කරන ලදී. තවද, 2022 වසර තුළ දී, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 6 වන වගන්තිය අනුව, වාර්තාකරණ ආයතන විසින් වාර්තා කළ යුතු සීමාව වන රුපියල් මිලියනයකට හෝ වෙනත් විදේශ මුදලකින් එයට සමාන වන වටිනාකමට වැඩි මුදල් ගනුදෙනු මිලියන 7.6ක් (තාවකාලික) සහ විද්‍යුත් අරමුදල් හුවමාරු ගනුදෙනු මිලියන 10.8ක් (තාවකාලික) මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන ලදී.

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත, එම පනත යටතේ නිකුත් කරන ලද විධිවිධාන සහ මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන් සඳහා නිකුත් කරන ලද ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්‌යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතින්හි නියම කරන ලද මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නීතිමය අවශ්‍යතා කෙරෙහි ආයතනික අනුකූලතාවය සහතික කිරීම සඳහා අවදානම මත පදනම් වූ අධීක්ෂණ ක්‍රියාවලිය මූල්‍ය බුද්ධි ඒකකය විසින් අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, මූල්‍ය බුද්ධි ඒකකය විසින් වාර්තාකරණ ආයතනවල මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම කෙරෙහි අනුකූලතාවය තක්සේරු කිරීම සඳහා අවදානම මත පදනම් වූ එතැන් පරීක්ෂණ 03ක් ද, අවදානම මත පදනම් වූ ඒකාබද්ධ එතැන් පරීක්ෂණ 22ක් ද, ස්ථානීය පරීක්ෂණ 22ක් ද සිදු කරන ලදී. තවද, මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන් සඳහා තේමාත්මක සමාලෝචන 5ක් ද පවත්වන ලදී. 2022 වසර තුළ සිදු කරන ලද ස්ථානීය පරීක්ෂණ මත පදනම්ව, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත හා ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්‌යෝගයෙන් ක්‍රියාකිරීමේ රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් මූල්‍ය බුද්ධි ඒකකය විසින් බලපත්‍රලාභී බැංකු 6ක් සඳහා රුපියල් මිලියන 11.75ක මූල්‍යමය දණ්ඩන පනවන ලදී. එසේම, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි විධිවිධාන සහ ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්‌යෝගයෙන් ක්‍රියාකිරීමේ රීති ප්‍රකාරව වාර්තා වූ අනුකූල නොවීම් සම්බන්ධයෙන් හේතු පැහැදිලි කිරීමේ අවශ්‍යතාවය දන්වමින් ලිපි 8ක් හා අනතුරු ඇඟවීමේ ලිපි 9ක් ද මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. තවද, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම කෙරෙහි අනුකූලතාවය වැඩි දියුණු කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනිමින් නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන්හි මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම අධීක්ෂණ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට මූල්‍ය බුද්ධි ඒකකය විසින් කටයුතු කරන ලදී.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් වූ ජාත්‍යන්තර ප්‍රමිතීන් සමඟ අනුකූල වන පරිදි රටෙහි මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පාලන තන්ත්‍රයෙහි සඵලතාව වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව 2022 වසර තුළ දී මූල්‍ය බුද්ධි ඒකකය විසින් ඒ සම්බන්ධ නීතිමය රාමුව සඳහා නීතිමය සංශෝධන ගෙන ඒම උදෙසා ක්‍රියාමාර්ග රැසක් ගන්නා ලදී. තවද, මූල්‍ය කාර්ය සාධන බලකායෙහි නිර්දේශයන්හි නිර්දේශ අංක 1 සමඟ අනුකූලව ලෝක බැංකුවේ තාක්ෂණික සහාය ද ඇතිව ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ ජාතික අවදානම් තක්සේරුව මූල්‍ය බුද්ධි ඒකකය විසින් අඛණ්ඩව සිදුකරන ලදී. මෙම ජාතික අවදානම් තක්සේරුවෙහි ප්‍රතිඵලය 2023 වසරේ ප්‍රථම භාගය වන විට ප්‍රකාශයට පත්කිරීමට නියමිතය. මීට අමතරව, මූල්‍ය බුද්ධි ඒකකය විසින් ඒ හා සම්බන්ධ සියලුම පාර්ශ්වකරුවන්ගේ දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීම සඳහා විවිධ පියවර හඳුන්වාදෙන ලදී. එමෙන්ම, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධ අධීක්ෂණ ක්‍රියාවලිය හා ආයතනික අනුකූලතාව ශක්තිමත් කිරීම සඳහා, 2022 වසර තුළ දී මූල්‍ය බුද්ධි ඒකකය විසින් චක්‍රලේඛ කිහිපයක් නිකුත් කළ අතර දැනුම්වත් කිරීමේ වැඩසටහන් ද පවත්වන ලදී.

මූල්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ නීති ප්‍රතිසංස්කරණ

2022 වසර තුළ දී, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබා ගැනීමේ වැඩසටහනෙහි පූර්ව ක්‍රියාමාර්ගයක් ලෙස 2019 වසරේ නොවැම්බර් මස 01 වන දින ගැසට් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු පනත් කෙටුම්පත සැකසීමෙහිලා මහ බැංකුව විසින් මුදල් අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව වැනි විවිධ පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව කටයුතු කරන ලදී. මෙම පනත් කෙටුම්පත ඉහත දැක්වූ පාර්ශ්වයන්ගේ සහාය ඇතිව මහ බැංකුකරණයේ නව්‍ය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි තව දුරටත් වැඩිදියුණු කරන ලදී. වැඩි දියුණු කරන ලද පාලන ප්‍රමිතීන්, මහ බැංකුවේ අරමුණු සුරක්ෂිත කිරීම සඳහා වූ උසස් මට්ටමේ පාලන මණ්ඩල ව්‍යුහය මෙන්ම වැඩි දියුණු කරන ලද නියාමන සහ අධීක්ෂණ බලතල ද සහිතව මහ බැංකුවේ ස්වාධීනත්වය සඳහා වූ ප්‍රතිපාදන ශ්‍රී ලංකා මහ බැංකු පනත් කෙටුම්පතට

ඇතුළත් කර ඇත. එකී කෙටුම්පත නීතියක් ලෙස බලාත්මක වීමෙන් අනතුරුව, 1949 අංක 58 දරන මුදල් නීති පනත අහෝසි වනු ඇත.

මීට අමතරව, 2022 වසරේ දී මහ බැංකුව විසින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය ඉහළ නැංවීම සඳහා දායක වන තවත් නීති කිහිපයක් කෙටුම්පත් කරන ලදී. මහ බැංකුවේ නියාමන, අධීක්ෂණ සහ නිරාකරණ රාමුව වැඩි දියුණු කරන වෙළඳ නිෂ්කාශන සහ පියවීම් පිළිබඳ පනත, බැංකු (විශේෂ විධිවිධාන) පනත සහ ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත වැනි පනත්, නව නීති අතරට ඇතුළත් වේ. මීට අමතරව, රට තුළ වත්මන් වෙළඳපොළ වර්ධනයන්ගෙන් පැන නගින අභියෝග රැසකට විසඳුම් ලබා දීම උදෙසා මහ බැංකුවේ නියාමන සහ අධීක්ෂණ අධිකාරිය වැඩිදියුණු කිරීමේ අරමුණින් 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත, 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත සහ 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනත සඳහා සංශෝධන ඉදිරිපත් කිරීමට ද කටයුතු කරන ලදී.

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය

මහ බැංකුව විසින් සිය නියාමනය යටතේ පවතින මූල්‍ය ආයතනවල මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය ශක්තිමත් කිරීම සඳහා 2022 වසර තුළ දී අඛණ්ඩව කටයුතු කරන ලදී. මෙම වසර තුළ දී මහ බැංකුව වෙත පැමිණිලි සහ දුක්ගැනවිලි 5,149ක් ලැබී ඇති අතර ඉන් බොහොමයක් ලබාගත් මූල්‍ය පහසුකම් සඳහා සහන ඉල්ලීම, ඉහළ පොලී අය කිරීම, ණය සහන ලබා දීම සම්බන්ධ ගැටලු, ඉල්ලා සිටින ලද තොරතුරු/ලියවිලි ලබා නොදීම, ඉහළ ගාස්තු හා කොමිස් අයකිරීම සම්බන්ධ ගැටලු විය. සලකා බලනු ලබන වසර තුළ දී මූල්‍ය පාරිභෝගිකයන්ගෙන් ලද වලංගු පැමිණිලි සහ දුක්ගැනවිලිවලින් සියයට 75ක් සම්බන්ධයෙන් කටයුතු නිම කිරීමට ද මහ බැංකුවට හැකි විය.

සිය නියාමනය යටතේ පවතින මූල්‍ය ආයතන සඳහා ඒකාබද්ධ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවක් හඳුන්වා දීමේ අරමුණින් මහ බැංකුව විසින් නව විස්තීරණ රෙගුලාසි මාලාවක් සකස් කරන ලදී. මෙම රෙගුලාසි මගින්, මූල්‍ය සේවා සැපයීමේ දී හෝ ලබා ගැනීමේ දී සලකා බැලිය යුතු ක්ෂේත්‍ර පිළිබඳ සේවා සපයන්නන් සහ සේවාලාභීන් යන දෙපාර්ශ්වයටම පැහැදිලි අදහසක් ලබාදෙන අතරම, වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණය පිණිස අධීක්ෂකවරුන් සඳහා අවශ්‍යවන නිශ්චිත නියාමන බලතල නිර්වචනය කිරීමට ද අපේක්ෂා කෙරේ. පාර්ශ්වකරුවන්ගෙන් අදහස් ලබා ගැනීම සඳහා මෙම රෙගුලාසි කෙටුම්පත් මූල්‍ය ක්ෂේත්‍රය සහ මහජනතාව වෙත ඉදිරිපත් කර ඇති අතර අවසාන රෙගුලාසි මාලාව 2023 වසරේ මැද භාගයේ දී බලාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව, මහ බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ සහයෝගය ඇතිව මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් මාධ්‍ය වැඩසටහන් මාලාවක් නිර්මාණය කරමින් පවතින අතර මෙම වැඩසටහන් මාලාව 2023 වසරේ මුල් භාගයේ දී දියත් කිරීමට නියමිත වේ.

තැන්පතු රක්ෂණය, නිරාකරණ කටයුතු සහ තහනම් යෝජනා ක්‍රම පිළිබඳ විමර්ශනය

මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මහ බැංකුව විසින් අඛණ්ඩව කළමනාකරණය කරන ලදී. බලපත්‍ර අවලංගු කරන ලද හෝ අත්හිටුවන ලද මුදල් සමාගම්, එනම් සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් සහ ෆිනෑන්ස් පීඑල්සී, ද ස්ටැන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ්, ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ්, ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී, ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් සහ ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී යන සමාගම්වල තැන්පත්කරුවන්ට රක්ෂණ වන්දි මුදල් ගෙවීමේ කටයුතු වසර තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2022 වසර වන තුරු ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ, තැන්පතුකරුවන් 72,641ක් සඳහා රක්ෂණ වන්දි මුදල් ලෙස රුපියල් මිලියන 30,499.24ක මුදලක් ගෙවා අවසන් කර ඇත. එම අගය රක්ෂණ වන්දි මුදල්වල සම්පූර්ණ අගය වන රුපියල් මිලියන 35,229.22ක මුදලෙන් සියයට 86.57කි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවතින තැන්පතු රක්ෂණ යාන්ත්‍රණයට අදාළව නෛතික ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින් යෝජිත බැංකු (විශේෂ විධිවිධාන) පනත සඳහා සුදුසු විධිවිධාන හඳුන්වා දීමට කටයුතු කරන ලදී. මෙම නව නීති කෙටුම්පතෙහි මහ බැංකුව විසින් නියාමන සහ අධීක්ෂණ කටයුතු කරනු ලබන බලපත්‍රලාභී බැංකු මෙන්ම බැංකු නොවන මූල්‍ය ආයතන නිරාකරණය කිරීම හා සම්බන්ධ නෛතික ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම අරමුණු කරගත් විධිවිධාන ද අන්තර්ගත වේ. මෙම නීති කෙටුම්පත පිළිබඳ අවධානය යොමු කිරීමේ දී, ශ්‍රී ලංකාවේ නෛතික පද්ධතිය විසින් මෙතෙක් ආවරණය නොකළ නව ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය වන පරිදි නව නීති කෙටුම්පත් කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව ලබා දුන් විශේෂඥ සහ තාක්ෂණික සහාය විශේෂයෙන් වැදගත් විය. 2022 වසරේ නොවැම්බර් මස මැද භාගයේ දී මෙම නව නීති

විශේෂ සටහන 12

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව සහ එහි ඉදිරි ගමන

හැඳින්වීම

ජනතාවගේ මූල්‍ය සාක්ෂරතා මට්ටම මෙන්ම මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවල ශක්තිමත්භාවය, රටක තිරසාර සංවර්ධනයේ මූලික සංරචකයක්වූ මූල්‍ය අන්තර්ගතභාවය නිර්ණය කරන්නාවූ මූලික අංග දෙක වේ. තාක්ෂණයේ අබණ්ඩ දියුණුව, මූල්‍ය සේවාවන් වල සංකීර්ණභාවය ඉහළ යෑම සහ වෙළඳපොළ සහභාගීකරුවන් අතර තරඟකාරීත්වය තීව්‍රවීම හේතුවෙන් මූල්‍ය අංශයේ නියාමකයින්හට පාරිභෝගිකයන්ගේ දැනුවත්භාවය සහ පාරිභෝගික ආරක්ෂණ රාමුවේ ප්‍රමාණවත්බව කෙරෙහි වඩාත් ඉහළ අවධානයක් යොමු කිරීමට සිදුවී ඇත. අප විසින් අත්දුටු ගෝලීය ආර්ථික අර්බුදයේදී, අනෙකුත් කරුණු අතර මෙම වැදගත් ක්ෂේත්‍රයේ පැවැති අඩුපාඩු ද මනාව හෙලිදරවු කරන ලදී. එහිදී, අර්බුදයකදී මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය තහවුරු කිරීම සඳහා අත්‍යවශ්‍ය සංරචකයක් වන මහජන විශ්වාසය පවත්වා ගැනීම සඳහා ශක්තිමත් පාරිභෝගික ආරක්ෂණ රාමුවක අවශ්‍යතාවය හොඳින් පිළිඹිබු විය. වෙනත් අයුරින් ගත් කල, ශක්තිමත් මූල්‍ය ආරක්ෂණ රාමුවක් මඟින් වඩාත් ඵලදායී ලෙස සහ අප්‍රමාදව පාරිභෝගික ආරක්ෂාව සම්බන්ධ ගැටළු අපේක්ෂා කිරීම, හඳුනාගැනීම සහ නිරාකරණය කිරීම සඳහා ඉඩ සලසන අතර එමඟින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සම්බන්ධයෙන් බලපානු ලබන ගැටළු ද අවම කරනු ලබන බව පොදුවේ පිළිගනු ලැබේ.

මෙම සන්දර්භය තුළ, රටේ මූල්‍ය වෙළඳපොළේ ප්‍රමුඛතම ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රට තුළ මූල්‍ය අන්තර්ගතභාවය සහ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය ඉහළ නැංවීම සඳහා මූලික පියවර සහ පරිශ්‍රමයන් ගණනාවක් ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට ලක්වන ආයතන සම්බන්ධ කරගනිමින් සිදුකර ඇත. අවස්ථානුකූලව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වර්තමාන පාරිභෝගික ආරක්ෂණ රාමුවේ අඩුපාඩුකම් මෙන්ම ලෝකයේ සෙසු රටවල මෙම අංශයේ ප්‍රවණතාවයන් හඳුනාගෙන සියලු පාර්ශ්වකරුවන් සම්බන්ධ කරගනිමින් පවතින මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව

ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය විවිධ නීති සහ රෙගුලාසි යටතේ විවිධ නියාමන තන්ත්‍රයන්ට භාජනයවන විවිධ මට්ටමේ මූල්‍ය සේවා සපයන්නන් පරාසයක් සහිතව ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ මුළු වත්කම්වලින් සියයට 70 ක් පමණ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන ආයතන සතු වන බැවින්, මෙම ආයතන වල පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් මහ බැංකුව විසින් ගනු ලබන නියාමන ක්‍රියාමාර්ග මඟින් මූල්‍ය පාරිභෝගිකයන් සහ රටේ සමස්ථ මූල්‍ය පද්ධතිය යන දෙඅංශයේම යහපැවැත්ම සඳහා කැපී පෙනෙන සහ කල් පවත්නා බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. පසුගිය වසර ගණනාවක් තුළ, මහ බැංකුවේ නියාමන දෙපාර්තමේන්තු විසින් ඔවුන්ගේ විෂය පථයට අයත් ආයතනවලට අදාළ වන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමු ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන ඇත. නිදසුනක් වශයෙන්, ප්‍රථම වරට 2011 අංක 08 දරන බලපත්‍රලාභී බැංකුවල පාරිභෝගිකයන්ට අදාල ප්‍රඥප්තිය සඳහා වන විධානයන් යටතේ මූල්‍ය පාරිභෝගිකයින් සහ බලපත්‍රලාභී බැංකු අතර යහපත් සබඳතාවක් ස්ථාපිත කිරීම අරමුණු කරගනිමින් එම බැංකු විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දෙන ලදී. මෙම විධානවල බැංකු නිමැවුම් සහ සේවා මූල්‍ය පාරිභෝගිකයන් වෙත හඳුන්වාදීම සහ ප්‍රවර්ධනය කිරීම, බැංකු මට්ටමින් පැමිණිලි හැසිරවීමේ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීම, බැංකු නිමැවුම් හා සේවාවල නියමයන් සහ කොන්දේසි පිළිබඳ දැනුවත් කිරීම සහ අවබෝධය ප්‍රවර්ධනය කිරීම, බැංකුවල නියෝජිතයින්ගෙන් ආරක්ෂාව සැලසීම සහ විශේෂ අවශ්‍යතා ඇති මූල්‍ය පාරිභෝගිකයින් සඳහා විශේෂ අවධානයක් සහ සැලකිල්ලක් දැක්වීම සම්බන්ධ නියාමන අපේක්ෂාවන් ඇතුලත් වේ. තවද, 2018 අංක 01 දරන මුදල් ව්‍යාපාර පනතේ විධානයන් සහ 2018 අංක 01 දරන කල්බදු මූල්‍යකරණ පනතේ විධානයන් යටතේ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල මූල්‍ය පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් සහ ළබැදියාවන් ආරක්ෂා වීම තහවුරු කිරීම සඳහා මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවක් හඳුන්වාදෙන ලදී. මෙම විධානයන් මඟින්, තොරතුරු හෙළිදරව් කිරීම සහ විනිවිදභාවය, පාරිභෝගික අධ්‍යාපනය සහ දැනුවත් කිරීම, වගකිවයුතු ව්‍යාපාර හැසිරීම, පැමිණිලි හැසිරවීම සහ නිරාකරණය, සමාන සහ සාධාරණ සැලකීම, සහ පාරිභෝගික දත්ත සහ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම යන අංශවල මූල්‍ය පාරිභෝගික ආරක්ෂණයට අදාල අවම ප්‍රමිතීන් නියම කර ඇත. තවද, මෙම විධානයන් මඟින් ඉතුරුම්, ණය දීම, සහ පාරිභෝගිකයන් හා සම්බන්ධ අනෙකුත් ක්‍රියාකාරකම්වලට අදාළ ගනුදෙනු ආවරණය කරනු ලබයි. මේ ආකාරයෙන්ම, රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික අලෙවිකරුවන් විසින්ද 1923 අංක 08 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සහ 1937 අංක 07 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ 2013 දී නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තියට අනුගත විය යුතුය. මෙම ක්‍රියාමාර්ග තුලින් මූල්‍ය ආයතන සඳහා තම පාරිභෝගිකයින්හට දැනුවත්භාවයෙන්යුතුව තීරණගැනීම සහ විනිවිද සහ සාධාරණ මූල්‍ය සේවා ලබා ගැනීම තහවුරු කිරීම සඳහා තරමක ශක්තිමත් පදනමක් සකස්කරනු ඇත.

එසේ වුවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉහත නියාමන රාමු එකිනෙකට වෙන් වූ ප්‍රවේශයක් සහිත වීම හේතුවෙන් පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් නොගැලපීම් සහ සංකීර්ණතා මතු කර ඇති අතර එය පාරිභෝගික ආරක්ෂණයේ සමස්ථ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙදී බාධාවක් වී ඇත. මේ අනුව, සිය නියාමනය යටතේ පවතින ආයතනවලට අදාළ වන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීම අරමුණු කරගත් ඒකාබද්ධ සහ විස්තීර්ණ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවක් හඳුන්වා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී. මෙහි පළමු පියවර ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව, 2020 අගෝස්තු මාසයේදී මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙනම දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කරන ලදී. මේ වන විට මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් එහි මධ්‍ය කාලීන ඉලක්කය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට යටත් ආයතන සඳහා නව විස්තීර්ණ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවක් නිකුත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටින අතර දැනට මූල්‍ය පාරිභෝගිකයින් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මූල්‍ය ආයතන සම්බන්ධයෙන් යොමු කරනු ලබන සියලුම පැමිණිලි සහ දුක්ගැනවිලි ලබා ගැනීම සහ විසඳුම් සඳහා බෙදා හැරීම සඳහා තනි සම්බන්ධතා ඒකකය ලෙසද කටයුතු කරමින් සිටී.

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ නව රෙගුලාසි

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ (International Finance Corporation -IFC) සහ ලෝක බැංකුවේ තාක්ෂණික සහාය ඇතිව මුදල් නීති පනතේ 10 වැනි වගන්තිය යටතේ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ රෙගුලාසි නිකුත් කිරීම සඳහා, රෙගුලාසි කෙටුම්පත් කරන ලද අතර එය 2023 මැද භාගයේදී නිකුත් කිරීමට නියමිත වේ. මෙම රෙගුලාසි කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියේ පාරදෘශ්‍යභාවය පවත්වා ගැනීම සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සඳහා පහසුකම් සැලසීම අරමුණු කරගනිමින් මෙම කෙටුම්පත මහජන සහ මූල්‍ය ක්ෂේත්‍රයේ නිරීක්ෂණ/උපදේශන සඳහා ඉදිරිපත් කරන ලදී. යෝජිත රෙගුලාසි මඟින් දැනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සියලුම ආයතන, එනම් බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, මුදල් තැරැව්කරුවන් සහ ගෙවීම් සහ පියවීම් පද්ධතිවල සහභාගිවන්නන් ආවරණය වේ. යෝජිත රෙගුලාසි තුළ දැනට පවතින පාරිභෝගික ආරක්ෂණ මූලධර්ම, නීති මෙන්ම වර්තමාන පරිචයන් සහ පාරිභෝගික ආරක්ෂණයට අදාළ ක්ෂේත්‍රවල ඇති විය හැකි උපනතීන් ද අන්තර්ගත වේ. මෙම රෙගුලාසි කෙටුම්පත් කිරීමේදී පහත සඳහන් විධානයන්/අංශයන් පිළිබඳව විශේෂ සැලකිල්ලක් යොමු කරන ලදී;

(අ) බලපත්‍රලාභී බැංකුවල පාරිභෝගික ප්‍රඥප්තිය පිළිබඳ 2011 අංක 08 දරන බැංකු පනතේ විධානයන්

(ආ) බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව පිළිබඳ 2018 අංක 01 දරන මුදල් ව්‍යාපාර පනතේ විධානයන් සහ 2018 අංක 01 දරන කල්බදු මූල්‍යකරණ පනතේ විධානයන්.

(ඇ) වෙනත් රටවල භාවිතා වන පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ දියුණු පරිචයන් සහ රෙගුලාසි

(ඈ) මූල්‍ය පාරිභෝගිකයින් මුහුණපාන වත්මන් ගැටළු සහ ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂණ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මහ බැංකුව විසින් හඳුනාගෙන ඇති අඩුලුහුඬුකම්/ ප්‍රවණතා.

ඒ අනුව, මෙම කෙටුම්පත් කරන ලද රෙගුලාසිවල, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන ආයතනවල ඵලදායී පාරිභෝගික ආරක්ෂණ රාමුවක් සඳහා අවශ්‍ය වන පහත සඳහන් ප්‍රධාන අංශ ඇතුළත් වන අතර, මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට සහ මෙම ආයතන සමීපව අධීක්ෂණය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අවශ්‍ය නියාමන බලතල ද මෙයින් ලබා දී ඇත.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ බලතල, අධීක්ෂණ ක්‍රියාමාර්ග සහ මූල්‍ය සේවා සපයන්නන්ගේ පාලන ක්‍රියාදාමයන්

(ආ) තොරතුරු අනාවරණය, විනිවිදභාවය සහ ප්‍රවේශභාවය සම්බන්ධ ක්‍රියාපටිපාටි

(ඇ) වගකීම් සහගත ව්‍යාපාරික හැසිරීම, පැමිණිලි හැසිරවීම සහ විසඳුම් යාන්ත්‍රණය

(ඈ) තරඟකාරී පරිසරය සහ පාරිභෝගිකයාගේ වත්කම් සහ තොරතුරු ආරක්ෂණය

(ඉ) පාරිභෝගිකයින් සඳහා සාධාරණ හා සමාන සැලකීම, මූල්‍ය අධ්‍යාපනය සහ දැනුවත්භාවය

මෙම රෙගුලාසි මඟින් පාරිභෝගික ආරක්ෂාව සහ වෙළඳපොළ හැසිරීම ඵලදායී ලෙස අධීක්ෂණය කිරීමට ඉඩ සලසමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට යටත්වන ආයතනවල පොත්, වාර්තා, ගිණුම්, ලේඛන, තොරතුරු සහ අනෙකුත් අධීක්ෂණ ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විශේෂ බලතල ලබාදෙනු ඇත. තවද, මෙම යෝජිත රෙගුලාසි මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට යටත්වන ආයතනවල වෙළඳපොළ හැසිරීම අධීක්ෂණය සඳහාද මූල්‍ය පාරිභෝගිකයින්ට, වෙළඳපොළට සහ මූල්‍ය පද්ධතියට බලපාන වෙළඳපොළ විෂමාචාර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට නියාමන

ක්‍රියාමාර්ග ගැනීමට ඇති හැකියාව බලාත්මක කිරීම සඳහාද අවශ්‍ය පදනම සකසා දෙනු ලබයි. තවද, මෙම රෙගුලාසි මඟින් මූල්‍ය ආයතන සහ ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ක්‍රියාත්මක කරන ද්විස්තර පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටිය විධිමත් කරනු ඇති අතර මූල්‍ය පාරිභෝගිකයින් විසින් ඉදිරිපත් කරනු ලබන වලංගු පැමිණිලි සඳහා නෛතික ක්‍රියාමාර්ග වලින් බැහැර බේරුම්කරණයක් ලෙස මූල්‍ය ආයතන ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින තීරණ ලබාදීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත බලය ලබාදීමට නියමිතය. සමස්තයක් වශයෙන්, මෙම රෙගුලාසි මඟින් විශේෂයෙන්ම 2011 අංක 08 දරන බැංකු පනතේ විධානයන්, 2018 අංක 01 දරන මුදල් ව්‍යාපාර පනතේ විධානයන් සහ 2018 අංක 01 දරන කල්බදු මූල්‍යකරණ පනතේ විධානයන් යටතේ ස්ථාපනය කර ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමු, ජාත්‍යන්තර සම්මතයන්ට අනුකූලව ශක්තිමත් කරනු ඇත. තවද, මූල්‍ය පාරිභෝගිකයන්ගේ විශ්වාසය තහවුරු කරමින් ශ්‍රී ලංකාව තුළ විශ්වාසනීය සහ ස්ථායී මූල්‍ය පද්ධතියක් ගොඩනැගීම උදෙසා පහසුකම් සලසනු වස් ශ්‍රී ලංකා මහබැංකුව විසින් සිදුකරන වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණය සඳහා අවශ්‍ය පදනමද මෙමඟින් ස්ථාපිත කරනු ඇත.

අභියෝග සහ ඉදිරි ගමන

ප්‍රමාණය, විෂය පථය, මූල්‍ය නිමැවුම් සහ සේවා සහ පාරිභෝගික කාණ්ඩයන් යන අංශයන්ගේ විශාල වෙනස්කම් පරාසයක් සහිත විවිධ මූල්‍ය සේවා සපයන්නන් වෙනුවෙන් ඒකාබද්ධ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවක් ක්‍රියාත්මක කිරීම එම මූල්‍ය ආයතනවලට මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවට ද භාරදූර කාර්යයක් වේ. විශාල මූල්‍ය ආයතන බොහොමයක් විසින් දැනටමත් ඔවුන්ගේ ව්‍යාපාර මෙහෙයුම් සහ පරිචයන් නව රෙගුලාසි මඟින් අපේක්ෂිත ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරනු ලැබේ. කෙසේ වුවද, නව රෙගුලාසිවලට අනුකූල වීම සඳහා තමන්ගේ පවතින ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, මෙහෙයුම්, සම්පත් සහ යටිතල පහසුකම් පද්ධති සඳහා සැලකිය යුතු වෙනස්කම් සිදු කළයුතු ආයතන බොහෝමයක් පවතින අතර එවැනි ආයතන මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදෙනු ලබන සංක්‍රාන්ති කාලසීමාව තුළ අදාල රෙගුලාසිවලට අනුගත වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කෙටුම්පත වෙනුවෙන් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හිමි වූ අතර 2023 වසරේ මුල් භාගයේ දී මෙම කෙටුම්පත පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.

1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධානයන් උල්ලංඝනය වන බවට චෝදනා එල්ල වූ ඇතැම් යෝජනා ක්‍රම සම්බන්ධයෙන් මහ බැංකුව විසින් විමර්ශන කටයුතු කිහිපයක් සිදු කරන ලදී. මේ වන විට අවසන් කර ඇති විමර්ශන මඟින් හෙළිකරගත් වරදකරුවන් වෙත නඩු පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති ඉල්ලීම් සම්බන්ධයෙන් පසුවිපරම් කිරීමට වැඩිදුරටත් කටයුතු කරන ලදී. තවද, විවිධ තරාතිරම්වල පසුවන සාමාන්‍ය ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා මෙන්ම තහනම් යෝජනා ක්‍රමවලට සම්බන්ධ වීමේ අහිතකර බලපෑම් පිළිබඳව ද විශේෂයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා වසර තුළ දී මහ බැංකුව විසින් හැකි සෑම මාධ්‍යයක් හරහාම දිවයින පුරා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

විදේශ විනිමය නියාමනය සහ අධීක්ෂණය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ රජයේ නියෝජිතයා වශයෙන් මහ බැංකුව විසින් රට තුළ විදේශ විනිමය ප්‍රවර්ධනය සහ නියාමනය කිරීම සඳහා 2022 වසර තුළ දී පියවර රැසක් ගන්නා ලදී. ඒ අනුව, අමුද්‍රව්‍ය ආනයනය සඳහා අදාල ගෙවීම්වලට පහසුකම් සැලසීම වෙනුවෙන්, විදේශීය මව් සමාගමෙන් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගම් සමූහයේ සමාගම්වලින් කෙටි කාලීන ණය ලබාගැනීම සඳහා 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගම්වලට අවසර ලබාදෙමින් නියෝගයන් සහ විධානයන් නිකුත් කරන ලදී. තවද, ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයින් හට තම සන්තකයේ තබාගත හැකි උපරිම විදේශ ව්‍යවහාර මුදල් එ.ජ. ඩොලර් 15,000 සිට 10,000 දක්වා අඩු කරන ලද අතර, විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු අතැති පුද්ගලයින් හට එම මුදල් විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක තැන්පත් කිරීමට හෝ බලයලත් වෙළෙඳෙකු වෙත විකිණීම සඳහා මාස 2ක පොදු සමා කාලයක් ලබා දෙන ලදී. ඒ අනුව, පොදු සමා කාලය තුළ දී විකුණන ලද/තැන්පත් කරන ලද මුළු විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය එ.ජ.

8.23 සංඛ්‍යා සටහන

2022 වසර තුළ අපනයන ආදායම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම

එ.ජ. ඩොලර් මිලියන

	1 වන කාර්තුව	2 වන කාර්තුව	3 වන කාර්තුව	4 වන කාර්තුව	එකතුව
ගෙන්වා ගත් මුළු අපනයන ආදායම් (අ)	4,286.15	4,370.37	4,575.14	4,524.20	17,755.85
රුපියල්වලට පරිවර්තනය කරන ලද මුළු අපනයන ආදායම් (අ)	1,164.77	954.27	1,030.93	1,070.20	4,220.18

(අ) තාවකාලික

මූලයः ශ්‍රී ලංකා මහ බැංකුව

8.24 සංඛ්‍යා සටහන

විදේශ ව්‍යාවහාර මුදල් ගිණුම්හි ගනුදෙනුවල සාරාංශය

එ.ජ. ඩොලර් මිලියන

ගිණුම් වර්ගය	ආමුඛ ප්‍රේෂණ		ප්‍රතිමුඛ ප්‍රේෂණ		දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	
	2021	2022(අ)	2021	2022(අ)	2021	2022 (අ)
පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්	663.2	601.8	234.1	270.7	2,715.4	2,804.8
ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්	7,647.9	8,209.4	3,756.9	5,269.7	3,071.7	2,795.0
ආමුඛ ආයෝජන ගිණුම්	854.7	862.2	1,221.9	843.2	1,969.2	1,714.1
විශේෂ තැන්පතු ගිණුම්	207.1(ආ)	111.7(ආ)	83.0	61.4	585.2	751.6
ප්‍රතිමුඛ ආයෝජන ගිණුම්	11.2	31.3	6.9	7.4	ලැ.නො.	ලැ.නො.

ලැ.නො. - ලැබී නොමැත

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) ආමුඛ ආයෝජන ගිණුම්, අක්වෙරළ බැංකු ඒකකයේ ගිණුම් සහ විදේශ ව්‍යාවහාර මුදල් තැන්පතුවලින් මාරු කරන ලද අරමුදල් හැර

ඩොලර් මිලියන 35.4ක් විය. තවද, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන "රන් පාරාදීසය වීසා වැඩසටහන" යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයන්ගෙන් ලැබෙන ආමුඛ ප්‍රේෂණ දිරි ගැන්වීම සඳහා එම යෝජනා ක්‍රමය යටතේ අදාල ගනුදෙනුවලට පහසුකම් සැලසීමට මහ බැංකුව විසින් විදේශ විනිමය පනත යටතේ විධානයන් නිකුත් කරන ලදී. තවද, විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමේ වලංගු කාලය ද දීර්ඝ කරන ලද අතර, දැනට පවතින විශේෂ තැන්පතු ගිණුම් නැවත ආයෝජනය කිරීම සඳහා ද ඉඩ සලසන ලදී. මීට අමතරව, ඇතැම් ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ අත්හිටුවීම සහ සීමා කිරීම සඳහා මුදල් අමාත්‍යවරයා විසින් විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද නියෝගය වසර තුළ දී තවදුරටත් දීර්ඝ කරන ලදී.

ආයෝජන සහ ද්විපාර්ශ්වික වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ද්‍රවශීලතාව වැඩි දියුණු කිරීම සඳහා මහ බැංකුව විසින් ක්‍රියාමාර්ග රැසක් ගන්නා ලදී. කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය (කොළඹ වරාය නගරය) තුළ ආයෝජන සහ ගනුදෙනුවලට පහසුකම් සැලසීම සඳහා, එහි පවතින සමාගම්වල ආයෝජකයන්, ආයෝජිතයන් සහ සේවකයන් හට විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට අවසර ලබා දෙමින් නියෝගයන් හා විධානයන් නිකුත් කරන ලදී. තවද, විදේශ විනිමය පනත යටතේ, ඉන්දියානු රුපියල, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ඒකකයක් ලෙස තීරණය කරන ලදී. මීට අමතරව, පැවති දැඩි විදේශ මුදල් ද්‍රවශීලතා තත්ත්ව මධ්‍යයේ, අත්‍යවශ්‍ය ආනයන අඛණ්ඩව සැපයීමට පහසුකම් සැලසීම සඳහා, විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් 29ක් ආරම්භ කිරීමට විශේෂ අවසර ලබා දෙන ලදී. තවද, අපනයන ලැබීම් දින 180ක් ඇතුළත ශ්‍රී ලංකාවට ගෙන ඒම සහ භාණ්ඩ අපනයනකරුවන් විසින් ඔවුන්ගේ එම ආදායම රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්ය කරමින් මුදල් නීති පනත යටතේ නව රීති නිකුත් කරන ලදී. ඒ අනුව, වසර තුළ දී අඛණ්ඩ අධීක්ෂණය සමඟින් අපනයන ආදායම් නැවත මෙරටට ගෙන්වා ගැනීම් වැඩිවන ප්‍රවණතාවක් දක්නට ලැබුණු අතර ලැබුණු අපනයන ආදායම් රුපියල් බවට පරිවර්තනය කිරීම් ද වසර අවසානය වන විට වර්ධනයක් වාර්තා කළේය. මීට අමතරව, ශ්‍රී ලංකා රේගුව සහ බලයලත් වෙළෙඳුන් සමඟ සහයෝගීතාවයෙන් විදේශ විනිමය ගනුදෙනු පුළුල් ලෙස අධීක්ෂණය කිරීමට සඳහා මහ බැංකුව විසින් ස්වයංක්‍රීය අපනයන ආදායම් අධීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට මූලිකත්වය ගන්නා ලදී. මේ අතර, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාව වැඩිදියුණු කිරීම සඳහා උපකාර වෙමින් බලයලත් වෙළෙඳුන් විසින් වසර තුළ දී ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම් වාර්තා කර තිබූ අතර සංක්‍රමණ දීමනාව යටතේ සිදු කරන ලද ප්‍රතිමුඛ ප්‍රේෂණ සහ වසර තුළ දී විවෘත කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් ප්‍රමාණය ද අඩුවී ඇත.

මහ බැංකුව විසින් වසර තුළ දී, පරිසීමිත වෙළෙඳුන්ගේ කාර්යසාධනය සමීපව නිරීක්ෂණය කළ අතර විනිමය අනුපාතය මත අනවශ්‍ය පීඩනයක් ඇතිවීම අවම කිරීමේ අරමුණින් ඉහළ විනිමය අනුපාත පිරිනැමීම තහනම් කරමින් මුදල් හුවමාරු ව්‍යාපාරයේ

8.25 සංඛ්‍යා සටහන

ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හරහා සිදු කළ ප්‍රේෂණයන් (CTRAs) සහ ශ්‍රී ලංකා රුපියල්වලට විදේශ විනිමය විකුණුම් සහ ශ්‍රී ලංකා රුපියල් මගින් සිදු කළ විදේශ විනිමය මිලට ගැණුම්

	2021	2022
සංක්‍රමණික මාරු කිරීම්		
සංක්‍රමණික දීමනාව ප්‍රේෂණය කිරීම සඳහා මහ බැංකුවේ ලියාපදිංචි කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් ගණන	787	215
ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හරහා කරන ලද ප්‍රතිමුඛ ප්‍රේෂණ (එ.ජ. ඩොලර් මිලියන)	4.5	0.9
විදේශ විනිමය විකුණුම් සහ මිලට ගැණුම් (එ.ජ. ඩොලර් මිලියන)		
විදේශ විනිමය විකුණුම් (ආකෘතිය 1)	11,974.43	11,158.81 (අ)
විදේශ විනිමය මිලට ගැණුම් (ආකෘතිය 2)	12,039.72	12,141.28 (අ)

(අ) තාවකාලික

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

විශේෂ සටහන 13

ශ්‍රී ලංකාව තුල මූල්‍ය ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීම

1. හැඳින්වීම

මූල්‍ය ආරක්ෂණ ජාලයක් යනු සාමාන්‍ය ආර්ථික තත්ත්වයටතේදී කාර්යක්ෂම සහ ස්ථාවර බැංකු පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම සහ අනපේක්ෂිත මූල්‍ය අර්බුදකාරී අවස්ථාවකදී එය කළමනාකරණය කිරීම අරමුණු කරගත් ආයතන, නීති සහ ක්‍රියා පටිපාටි සමූහයකි. එය රටක ආර්ථික වර්ධනය සහ මූල්‍ය ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් විචක්ෂණශීලි නියාමනය, අධීක්ෂණය, නිරාකරණය, අවසාන ණය දෙන්නා, තැන්පතු රක්ෂණය සහ මුදල් අමාත්‍යාංශයේ (MOF) හෝ භාණ්ඩාගාරයේ කාර්යභාරය යන සංරචක මගින් සැදුම්ලත් පුළුල් ව්‍යුහාත්මක රාමුවකි. ආර්ථිකයක් සඳහා අර්බුද වැළැක්වීමේ යාන්ත්‍රණයන් සැපයීම, අර්බුදයකදී මූල්‍යකරණය කිරීම සහ ස්ථිර සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සඳහා දිරිගැන්වීම් සැපයීමේ මාධ්‍යයක් ලෙස මූල්‍ය ආරක්ෂණ ජාලය වැදගත් වේ.

ඕනෑම ආර්ථිකයක ක්‍රියාකාරිත්වය සඳහා මූල්‍ය පද්ධතිය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මූල්‍ය ආයතන, මූල්‍ය අතරමැදිකරණය සපයන අතරම ඔවුන්ගේ විවිධ හා සංකීර්ණ තැන්පතු වගකීම් හරහා ඉහළ අවදානම් නිරාවරණයක් ලබා ගැනීමට නැඹුරු වේ. එබැවින්, ආර්ථිකයක මූල්‍ය ආරක්ෂණ ජාලය හරහා සුළු පරිමාණ තැන්පතුකරුවන් ආරක්ෂා කිරීම අතිශයින්ම වැදගත් සාධකයක් වේ. රටක අධීක්ෂණ ව්‍යුහය මත පදනම්ව, එරට මූල්‍ය ආරක්ෂණ ජාලය තුළ විවිධ ආයතන වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. කෙසේ වෙතත්, සමහර රටවල නිශ්චිත හෝ ව්‍යංග තැන්පතු රක්ෂණ ආරක්ෂණය මෙන්ම බැංකු නියාමනය, අධීක්ෂණය සහ නිරාකරණය සඳහා වගකිව යුතු එකම අධිකාරි බලය මහ බැංකුව සතු වේ.

ශ්‍රී ලංකාව තුළ, මෑත වසරවලදී මූල්‍ය පද්ධතියේ ඇති වූ කැපී පෙනෙන වර්ධනය සහ මූල්‍ය පද්ධතියේ සංකීර්ණත්වය වැඩිවීම හේතුවෙන් මූල්‍ය ක්ෂේත්‍රයේ කම්පන සහ අර්බුදකාරී තත්වයන් මත ඇතිවිය හැකි අනතුරුදායක බව දිගින් දිගටම ඉහළ යාම සිදු වූ අතරම එවැනි තත්වයන්ට මුහුණදීම සඳහාත්, තැන්පතුකරුවන්ගේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ ලැදියාවන් ආරක්ෂා කිරීම සඳහාත්, ශක්තිමත් මූල්‍ය ආරක්ෂණ ජාලයක අවශ්‍යතාවය අවධාරණය කරයි. මූල්‍ය පද්ධතියේ ශක්තිමත්බව සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) සහ මුදල් අමාත්‍යාංශය, මූල්‍ය ආරක්ෂණ ජාලයේ මූලික පාර්ශවකරුවන් ලෙස සමීපව සහයෝගයෙන් කටයුතු කරයි.

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ මුදල් අමාත්‍යාංශයේ කාර්යභාරය

ශ්‍රී ලංකාව තුල මූල්‍ය ආරක්ෂණ ජාලය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව අවසාන ණය දෙන්නා, බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන (NBFIs) සම්බන්ධ අධීක්ෂණ අධිකාරිය, නිරාකරණ අධිකාරිය සහ බලපත්‍රලාභී බැංකු (LBs) සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල (LFCs) තැන්පතු රක්ෂණකරු ලෙසින් කටයුතු කරයි. තවද, සාමාන්‍ය ආර්ථික තත්වයන් තුළ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති නිර්මාණය මගින් සහ හදිසි මූල්‍ය අවශ්‍යතාවයන් උද්ගතවීමකදී මූල්‍ය අර්බුද කළමනාකරණය කිරීම තුළින් මුදල් අමාත්‍යාංශය, මූල්‍ය ආරක්ෂණ ජාලයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

3. අවසාන ණය දෙන්නා

මූල්‍ය කැලඹිලි සහිත කාලවලදී, බැංකුවලට ඔවුන්ගේ දෛනික මෙහෙයුම් සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම අභියෝගකාරී වූ විට ඔවුන්ගේ අවසාන ණය දෙන්නා වන ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු වේ. බැංකු එකිනෙකාට ණය ලබා දීමට පසුබට වන අවස්ථාවන්හීදී සහ තැන්පතුකරුවන් තම බැංකු ගිණුම්වලින් මුදල් ආපසු ගැනීම ආරම්භ කරන අවස්ථාවන්හීදී මෙය සිදුවිය හැක. උක්ත අවස්ථාවන්හිදී, ශ්‍රී ලංකා මහ බැංකුව, අවසාන ණය දෙන්නා ලෙස කටයුතු කරනුයේ මූල්‍ය වෙළඳපොල සුමට ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සහ ස්ථාවර මූල්‍ය පද්ධතියක් පවත්වාගෙන යාම එහි ප්‍රධාන අරමුණ වන බැවිනි.

ශ්‍රී ලංකා මහ බැංකුව සාමාන්‍යයෙන් මූල්‍ය හා බැංකු ස්ථාවරත්වයට තර්ජනයක් ඇති විය හැකි මූල්‍ය කැළඹිලි සහිත හදිසි අවස්ථාවන්හිදී අවසාන ණය දෙන්නා ලෙස ක්‍රියාකරයි. එවැනි අවස්ථාවලදී, හදිසි ණය සහ අත්තිකාරම් පිළිබඳ රාමුවේ පිළිගත හැකි යැයි දක්වා ඇති ඕනෑම ඇපයක් ඉදිරිපත් කර ඇති බැංකුවකට, සුවිශේෂී ණය හෝ අත්තිකාරම් ලබා දීමට සහ අවශ්‍ය අයුරින් එම හදිසි ණය සහ අත්තිකාරම් අලුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට තම අභිමතය අනුව කටයුතු කිරීමේ හැකියාවක් පවතී.

වර්තමානයේදී බැංකු විසින් හදිසි ණය සහ අත්තිකාරම් වෙත ප්‍රවේශ වීම සඳහා නිශ්චිත අවශ්‍යතාවයන් කිසිවක් සපුරාලීමට අවශ්‍ය නොවේ. එනමුත්, අදාළ පොලී අනුපාත, ණය කාලය, අලුත් කිරීම්, ඇපකර සහ වෙනත් අදාළ කරුණු යනාදිය තීරණය කිරීමේ පූර්ණ අභිමතය ශ්‍රී ලංකා මහ බැංකුව සතුවේ. කෙසේ වෙතත්, සුවිශේෂී අවස්ථාවක හැර බලපත්‍රලාභී බැංකුවක් බුන්වත් යැයි සලකනු ලබන හෝ බුන්වත් වීමට ඉඩ තිබේ නම් හෝ අනාගතයේදී නුබුන්වත් විය හැකි බවට සාධාරණ අපේක්ෂාවක් නොමැති නම්, එම බැංකුව හදිසි ණය සහ අත්තිකාරම් සඳහා නුසුදුසු යැයි සලකනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලබා දෙන හදිසි ණය සහ අත්තිකාරම්, නුබුන්වත් බැංකුවල පැන නැගී ඇති ද්‍රවශීලතා ගැටළු සඳහා පමණක් භාවිත කිරීමේ උපකරණයක් ලෙස පැහැදිලිව දැක්විය හැක. කෙසේ වුවද, ප්‍රායෝගිකව මෙවැනි ද්‍රවශීලතා ගැටළු පැන නැගිය හැකි අවස්ථා

ඉතා අල්ප බව සඳහන් කළ යුතුය. බැංකු ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දෙන බොහෝ අවස්ථාවන්හිදී, ඒ හා සම්බන්ධ වූ ආයතනයන්හි නුබුන්වත්භාවය පිළිබඳ යම් අවිනිශ්චිතතාවයක් පවතී. සාමාන්‍යයෙන්, විචක්ෂණශීලි නියාමන සහ අධීක්ෂණ ක්‍රියාමාර්ගවලින් ආවරණය වන ආයතනයක නුබුන්වත්භාවය තක්සේරු කිරීමට යම් කාලයක් ගතවේ.

4. විචක්ෂණශීලි නියාමන සහ අධීක්ෂණ රාමු

විචක්ෂණශීලි නියාමනය මගින් මූල්‍ය ආයතන පිළිපැදීමට අපේක්ෂා කරන ප්‍රමිතීන් සහ ප්‍රතිපත්ති ස්ථාපිත කරයි. අධීක්ෂණ රාමුව යටතේ මූල්‍ය අංශයේ ආරක්ෂාව සහ ස්ථාවරභාවය සහතික කිරීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතා පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම ප්‍රමිති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරයි.

ශ්‍රී ලංකාවේ බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා නියාමන සහ අධීක්ෂණ රාමුව මූලික වශයෙන් 1949 අංක 58 දරන මුදල් නීති පනතේ, 1988 අංක 30 දරන බැංකු පනතේ සහ 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ නිශ්චිතව දක්වා ඇත. බැංකු සහ මුදල් සමාගම්වලට බලපත්‍ර නිකුත් කිරීම, බලපත්‍රලාභී ආයතන සඳහා විචක්ෂණශීලි විධානයන්, නීර්ණයන්, නියෝග සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම, අධීක්ෂණය කිරීම, විමර්ශන පැවැත්වීම සහ නියාමන ක්‍රියාමාර්ග බලාත්මක කිරීම සහ දුර්වල බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් ආයතන නිරාකරණය කිරීම සඳහා මහ බැංකුවට බලය පවරා ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් බැංකු අධීක්ෂණය සඳහා වූ බාසල් කමිටුව විසින් ස්ථාපිත කරන ලද ජාත්‍යන්තරව පිළිගත් අධීක්ෂණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරයි. අනාගත අර්බුදකාරී තත්වයන්ට සූදානම් වීම සඳහා, අධීක්ෂණ අධිකාරියෙහි නියමයන් පරිදි බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන, එම ආයතනවල අසාර්ථකත්වයන්ට මුහුණ දීම සඳහා අවශ්‍ය පියවර ඇතුළත් ආපදා සැලසුම් නිර්මාණය සහ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

5. තැන්පතු රක්ෂණ යාන්ත්‍රණය

තැන්පතු රක්ෂකගේ කාර්යභාරය වන්නේ විශේෂයෙන්ම බැංකු පද්ධතිය බිඳ වැටෙන අවස්ථාවකදී මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කරමින් මූල්‍ය පද්ධතිය ස්ථාවර කිරීමයි. තැන්පතු රක්ෂක තැන්පතුකරුවන්ට තම බැංකුව හෝ බැංකු නොවන මූල්‍ය ආයතනය බිඳ වැටුනද, ඔවුන්ගේ රක්ෂණ අරමුදල් ඉතා ඉක්මණින් ලබා ගැනීමට හැකියාවක් ඇති බවට සහතිකයක් ලබා දීම මගින් එවැනි අවස්ථාවකදී තැන්පතුකරුවන් තම තැන්පතු ආපසු ගැනීම සඳහා දක්වන නොසන්සුන්බව හා අවදානම ව්‍යාප්ත වීම වලක්වමින් මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය පෝෂණය කරන අතරම අනෙක් අතට එය පුළුල් ආර්ථිකය මත ධනාත්මක බලපෑමක් ඇති කරයි.

තැන්පතු රක්ෂණ යාන්ත්‍රණ සාමාන්‍යයෙන් පාලනය වන්නේ තැන්පතු රක්ෂණ නියෝජිතායතන නමින් හැඳින්වෙන ආයතන මගින් වන අතර එහි විධිනියෝගයන් පටු ආකෘතියක් වන 'pay box' ආකෘතියේ සිට පුළුල් බලතල සහ වගකීම් දක්වා එනම් අවදානම් හා අලාභ අවම කිරීමේ විවිධ සංයෝජනයන් සහිතව තිබිය හැක. සමහර තැන්පතු රක්ෂණ යාන්ත්‍රණයන් සඳහා අසාර්ථක මූල්‍ය ආයතනවල රක්ෂිත තැන්පතුකරුවන් ප්‍රතිපූරණයට පමණක් අවධානය යොමු කරන සීමිත 'pay box' ආකෘතිය පමණක් පවතින අතර සමහර තැන්පතු රක්ෂණ යාන්ත්‍රණයන් සඳහා වත්කම් වෙන් කිරීම, යා කිරීමේ බැංකුවක් විවෘත කිරීම, විවෘත බැංකු ආධාර සැපයීම, 'bailing in' හෙවත් ප්‍රතිව්‍යුහගතකරණය/මුදවා ගැනීම වැනි මූල්‍ය ආයතනවල නිරාකරණ ක්‍රියාමාර්ග සඳහා මූල්‍ය සහය ලබා දීමේ පුළුල් වගකීම් සහ බලතල සහිත 'pay box plus' ආකෘතියක් තිබිය හැක. රක්ෂණ නියෝජිතායතනවලට අලාභය හෝ අවදානම අවම කිරීම අරමුණු කරගත් සෘජු ආකෘතියක් පමණක් භාවිත කල හැක. බිඳ වැටුන බැංකුවක නිරාකරණ පිරිවැය අවම කිරීම අරමුණු කොට ගෙන අලාභ අවම කරන්නන් ක්‍රියාත්මක වන අතර, අවදානම් අවම කරන්නන් සමස්තයක් ලෙස මූල්‍ය පද්ධතියට ඇති අවදානම අවම කිරීම අරමුණු කරයි.

6. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකාවේ තැන්පතු රක්ෂණ නියෝජිතායතනය ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය ලෙස හැඳින්වෙන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ විෂය පථයට අයත් වේ. මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කිරීමේ අරමුණින්, මුදල් නීති පනත, බැංකු පනත සහ එවකට පැවති මූල්‍ය ව්‍යාපාර පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරමින් අනිවාර්ය තැන්පතු රක්ෂණ ක්‍රමයක් ලෙස ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය 2010 දී පිහිටුවන ලදී. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය, වර්තමානය වන විට 2021 අංක 02 දරණ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රම රෙගුලාසි මගින් පාලනය වේ.

බලපත්‍රලාභී බැංකුවක් හෝ බලපත්‍රලාභී මුදල් සමාගමක් අසාර්ථක වූ අවස්ථාවකදී සුළු පරිමාණ තැන්පතුකරුවන් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණයක් එමගින් දක්වා ඇත. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය විසින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල නමින් Ex-Ante අරමුදලක් පවත්වාගෙන යන අතර ඒ සඳහා මූලික සහ ක්‍රමවත් අරමුදල් මූලාශ්‍රය වන්නේ සාමාජික ආයතන විසින් ගෙවනු ලබන වාරිකයි. ශ්‍රී ලංකාවේ සියලුම බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන වන අතර ඔවුන්ගේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය මත පිළිවෙලින් කාර්තුමය වශයෙන් සහ මාසික සමවර්ත අනුපාතයකට අනුව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ

ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය වෙත රක්ෂණ වාරික ගෙවනු ලබයි. වර්තමානයේ, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය 'pay-box' ආකෘතිය යටතේ ක්‍රියාත්මක වන අතර එය අර්බුද වැළැක්වීමේ සහ කළමනාකරණ මෙවලමක් ලෙසද ක්‍රියා කරයි.

7. මූල්‍ය ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීම

මූල්‍ය ආරක්ෂණ ජාලයේ නිසි ක්‍රියාකාරීත්වය ආර්ථික වර්ධනය ඉහළ නැංවීම සඳහා අත්‍යවශ්‍ය වන අතර එය ශක්තිමත් කිරීමේ ක්‍රම සහ විධි සොයා බැලීමද අත්‍යවශ්‍ය වේ. පසුගිය මූල්‍ය අර්බුද, ගෝලීය, කලාපීය හා ජාතික මට්ටමෙන් ප්‍රමාණවත් ආරක්ෂිත ජාල යාන්ත්‍රණයක් පැවතීමේ වැදගත්කම අවධාරණය කර ඇත. අවදානම්කාරී මූල්‍ය තත්ව පවතින කාලවලදී වෙළඳපල විශ්වාසය ශක්තිමත් කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ආරක්ෂණ ජාලයක අවශ්‍යතාවය එය අවධාරණය කරයි. මූල්‍ය ස්ථාවරත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කිරීම සඳහා වැඩිදියුණු කළ කලාපීය සහයෝගීතාව ගැටළුකාරී ව්‍යාවරණ සහිත කාලවලදී අත්‍යවශ්‍ය ආරක්ෂාවක් ලෙස පිළිගැනේ. අරමුදල් නොමැතිකම නිසාවෙන් බරපතල අභියෝග සහ අමතර වියදම් ඇති වීමේ අවදානමක් පවතී. එබැවින්, නිරාකරණ අධිකාරියට අවශ්‍ය ද්‍රවශීලතාව ලබා දෙන නිරාකරණ ශිල්පීය ක්‍රම වෙත නැඹුරු වීමේ හැකියාවක් පවතී. මීට අමතරව, ප්‍රමාණවත් අරමුදල් නොමැතිකම නිසා, නිරාකරණ ක්‍රියාවලිය ප්‍රමාද විය හැක. යම් ආයතනයක නිරාකරණ ක්‍රියාවලිය ප්‍රමාද කිරීමට නිරාකරණ අධිකාරියට සිදුවුවහොත් වත්කම්වල ගුණාත්මකභාවය තවදුරටත් හීන වී යා හැකි අතර සදාචාරාත්මක අවදානම් ගැටළු වඩාත් පැහැදිලිව දැක ගත හැකි වනු ඇත.

මූල්‍ය ආරක්ෂණ ජාලයේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සඳහා බලපැවැත්වෙන නෛතික රාමුව විධිමත් කිරීම සහ ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. දැනට, බැංකු නිරාකරණය සඳහා බලපැවැත්වෙන නෛතික රාමුව විසිරී පවතින අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සංකීර්ණ, ව්‍යාකුල සහ බොහෝ විට විනිවිද භාවයෙන් තොර යාන්ත්‍රණයක් ලෙස ව්‍යාප්ත වී පවතී. තවද, බැංකු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ අනුගමනය කරනු ලබන වර්තමාන අධිකරණ ක්‍රියාමාර්ග ඉතා මන්දගාමී ස්වභාවයක් පෙන්නුම් කරන අතර එමනිසා බැංකුවක කොටස් හිමියන් විසින්, බැංකු නිරාකරණය සම්බන්ධ නිරාකරණ අධිකාරියට අභියෝග කල අවස්ථාවකදී නිරාකරණ ක්‍රියාවලිය තවදුරටත් ප්‍රමාද විය හැක. බැංකු ඒකාබද්ධ කිරීම් හා සම්බන්ධ දරදඬු ක්‍රියා පිළිවෙත (bureaucratic process), බැංකු නිරාකරණය කිරීම තවදුරටත් සංකීර්ණ කරන අතර එමගින් මූල්‍ය පද්ධතිය අස්ථාවර කළ හැකි තරමේ අවිනිශ්චිතතාවයක් මතු කරයි. මේ සඳහා වර්තමාන රාමුවේ ඇති අඩුපාඩු නිවැරදි කර ගනිමින් බැංකු නිරාකරණය සහ ඒකාබද්ධ කිරීම් සඳහා වඩාත් කාර්යක්ෂම හා විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කිරීම අවශ්‍ය වේ.

මූල්‍ය පද්ධති ස්ථායීතාවය වැඩි දියුණු කිරීම සඳහා තැන්පතු රක්ෂණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. පසුගිය වසර 10 කට අධික කාලය තුල, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මගින් 'pay box' ආකෘතියේ භූමිකාව ඉටු කර ඇත. කෙසේ වෙතත්, තැන්පතුකරුවන්ට නියමිත වේලාවට ගෙවීම් කිරීමට දරන ප්‍රයත්නයන්හි දී, බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තැන්පතුකරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු ලබා නොදීම හේතුවෙන් ද, අනන්‍ය වූ හැඳුනුම් අංකයක් යටතේ තැන්පතුකරුවන්ගේ තොරතුරු පවත්වාගෙන යාමට අපොහොසත් වීම හේතුවෙන් ද, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා යෝජනා ක්‍රමයට විවිධ අභියෝගවලට මුහුණ පෑමට සිදුවේ. මෙම අභියෝග සඳහා විසඳුම් සොයමින්, ශක්තිමත් තොරතුරු බෙදාගැනීමේ සහ තැන්පතුකරුවන් සඳහා හඳුනාගැනීමේ පද්ධති ක්‍රියාවට නැංවීම ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි සඵලතාවය ඉහළ නැංවීමට සහ අවසානයේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය ශක්තිමත් කිරීමට අත්‍යවශ්‍ය වේ.

ගෝලීය වශයෙන්, තැන්පතු රක්ෂණ යාන්ත්‍රණ, පුළුල් ආකෘතීන්ගෙන් සමන්විත වන අතර ගැටලුකාරී බැංකු නිරාකරණය කිරීමේදී සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මෙම ක්‍රමවේදය මගින් රක්ෂකයාට පිරිවැය සම්බන්ධ ගැටළු විසඳීමේදී 'pay-box' ආකෘතිය හා සසඳන විට වැඩි පහසුවක් ලබා දෙයි. මේ අනුව, අසාර්ථක ආයතනයක් නිරාකරණය කිරීමේදී ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය විසින් අවම පිරිවැයක් සහිත ප්‍රවේශයක් අනුගමනය කළ යුතුය. මෙම ප්‍රවේශය, ආරක්ෂිත ජාල හා සම්බන්ධ පාර්ශවකරුවන්, රජය, නියාමන ආයතන, මහ බැංකුව සහ තැන්පතු රක්ෂක අතර සමීප සහයෝගීතාවයක් සහ සම්බන්ධීකරණයක් ඇති කරයි. ප්‍රමාණවත් තරම් පුළුල් ආකෘතීන්, ප්‍රමාණවත් බලතල, මෙහෙයුම් ස්වාධීනත්වය සහ සහතික කළ ආපදා අරමුදල් මූලාශ්‍ර සහිත තැන්පතු රක්ෂකයින් මහජන විශ්වාසය ගොඩනැගීම සහ පවත්වා ගැනීම, සහ මූල්‍ය අර්බුද අවස්ථාවන්හි කටයුතු කිරීමේදී වඩාත් ඵලදායී වී ඇති බව අත්දැකීම් මගින් පෙන්නුම් කරයි. බැංකු පද්ධතිමය බිඳ වැටීමක් වැනි අසාමාන්‍ය තත්වයක් තුළ, මූල්‍ය ස්ථාවරත්වයට හානි නොවන පරිදි තැන්පතු රක්ෂකට අසීමිත සහ ක්ෂණික පිවිසුම් සහිත හදිසි අරමුදල් සම්පාදනය කරගත හැකි වීම අත්‍යවශ්‍ය වේ. සමස්තයක් වශයෙන්, තැන්පතු රක්ෂණ ක්‍රමයේ සාර්ථකත්වය රඳා පවතින්නේ තැන්පතුකරුවන්ට විශ්වාසනීය සහ ඵලදායී ආරක්ෂාවක් සැපයීමට ඇති හැකියාව මතය.

මූල්‍ය ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීම සඳහා බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා පවතින නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා එකිනෙකට අනුකූල විය යුතුය. නව බැංකු පනත සම්පාදනයේදී සහ සම්මත කිරීමේදී මෙම සාධකය සැලකිල්ලට ගත යුතුය.

අලාභවලින් ආරක්ෂා වෙමින් තම අවදානම් ආයෝජනවලින් ප්‍රතිලාභ ලබනු ඇතැයි විශ්වාස කරන මූල්‍ය අවදානම් ගන්නන් අතර අවදානම් හැසිරීම් දිරිමත් කිරීම මගින් ආරක්ෂිත ජාලය සදාචාරාත්මක අවදානමකට මඟ පෙන්වයි. සියලු බලපත්‍රලාභී මුදල් සමාගම් වලින් ඒකාකාර අනුපාතයකින් වාරික අයකිරීම නිසා සදාචාරාත්මක අවදානම ඉහළ නැංවීම සිදුවේ. සදාචාරාත්මක අවදානම් අතර හුවමාරුව කළමනාකරණය කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාවට නංවන අතරම දැනටමත් දුර්වල වී ඇති බැංකු මත ඉහළ වාරිකයක අමතර බරක් පැටවීම සඳහා, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මගින් අවදානම මත පදනම් වූ වාරිකයක් අය කිරීම තෝරා ගත යුතුය. කෙසේ වෙතත්, වෙළඳපල මත පදනම් වූ අවදානම් වාරික පැනවීම මගින් ඉහළ වාරික බර හේතුවෙන් දුර්වල බැංකුවල කොටස් මිල කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇති විය හැකිය. ඒ අනුව, අවදානම මත පදනම් වූ වාරික හඳුන්වා දීම, රක්ෂණ ආවරණයෙන් සමහර තැන්පතු බාණ්ඩ බැහැර කිරීම, දැඩි අධීක්ෂණය හා නියාමනය, කාලීන මැදිහත්වීම සහ පීඩාවට පත් ආයතන නිරාකරණය වැනි සුදුසු පාලනයන් මගින් මූල්‍ය ස්ථායිතාවය සහ වෙළඳපල විනය අතර තුලනයක් ඇති කිරීම සහතික කල යුතුය. බංකොලොත් මූල්‍ය ආයතන අසාර්ථක වීමට ඉඩ හැරීමෙන් සහ අසාර්ථක වීමට ආසන්න ආයතන මත පිරිවැය පැටවීමෙන් වෙළඳපොලෙහි මූල්‍ය අවදානම් ගන්නන් හික්මවීම සහ සදාචාරාත්මක අවදානම් සීමා කිරීම ආරක්ෂක ජාලයක සැලසුම තුල වඩාත් ඵලදායී විය හැකිය. සදාචාරාත්මක අවදානම් සහ ස්ථාවර මූල්‍ය පද්ධතියක් අතර සාධාරණ සමතුලිතතාවයක් ඇති කිරීම මඟින් වෙළඳපල විනයානුකූල නොවන හැසිරීම් මත පද්ධතිමය අවදානමක් ඇති කිරීම සඳහා ඉතා සීමිත ව්‍යතිරේකයකට පමණක් ඉඩ සැලසේ. එබැවින්, බුන්වත් බැංකුවලට සාමාන්‍යයෙන් අසාර්ථක වීමට ඉඩ දිය යුතු අතර එවැනි බැංකුවක් විවෘතව සිටීමට සහාය වන්නේ නම් කොටස් හිමියන්ට ඔවුන්ගේ කොටස් හිමිකම අහිමි විය යුතුය. ස්ථාවර මූල්‍ය පද්ධතියක් සහ සදාචාරාත්මක අවදානම අතර නිසි සමතුලිතතාවය ආරක්ෂිත ජාලය බුන්වත් ආයතන අසාර්ථක වීමට ඉඩ සලසන ජාලයක් මිස අසාර්ථක වීමට තරම් හැකියාවක් ඇති බුන්වත් ආයතන බිඳ වැටීම වළක්වන ජාලයක් නොවන බවට සහතික කරයි.

8. මූල්‍ය ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමට ගෙන ඇති පියවර සහ එහි ඉදිරි ගමන

මේ වන විට ශ්‍රී ලංකාවේ මූල්‍ය ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සැලකිය යුතු ක්‍රියාමාර්ග ගනිමින් සිටියි. ඒ අතර තම නියාමන බලතල පුළුල් කිරීම, මූල්‍ය ආයතන සම්බන්ධයෙන් විශේෂ නිරාකරණ අධිකාරියක් පිහිටුවීම මගින් නිරාකරණ යාන්ත්‍රණ රාමුව වැඩි දියුණු කිරීම, නිරාකරණ මෙවලම් පුළුල් කිරීම, තැන්පතු රක්ෂණය දියුණු කිරීම සහ හදිසි ද්‍රවශීලතා සහාය තවදුරටත් වර්ධනය කිරීම අවධාරණය කළ යුතුය.

නව බැංකු (විශේෂ විධිවිධාන) පනත කෙටුම්පත් කිරීම සහ සම්මත කිරීම මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තවදුරටත් උපකාරී වනු ඇත. විශාල සහ වඩාත් සංකීර්ණ මූල්‍ය ආයතන දැඩි නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතාවලට යටත් විය යුතු වුවද, අත්‍යවශ්‍යයෙන්ම සමාන මෙහෙයුම්වල නිරතවන බැංකු සහ මුදල් සමාගම් ද සම මට්ටමේ නිර්ණායකයන් පවත්වා ගැනීම ද වැදගත් වේ. දැනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති මහ බැංකු කෙටුම්පත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ආයතන නිරාකරණය සඳහා වගකිව යුතු අධිකාරිය ලෙස පිළිගන්නා අතර යෝජිත බැංකු (විශේෂ විධිවිධාන) පනත මගින් ප්‍රතිසාධන සහ නිරාකරණ සැලසුම් ක්‍රියාවලිය, නිරාකරණය සඳහා වන ප්‍රේරක සහ වඩාත් සුවිශේෂී වන ශ්‍රී ලංකා මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය යන අධිකාරීන් දෙකටම ක්‍රියාත්මක කළ හැකි නිරාකරණ බලතල යනාදිය සවිස්තාරාත්මක ලෙස පැහැදිලි කර ඇත. ආරක්ෂිත ජාල පියවරක් ලෙස, මූල්‍ය ආයතනයක නිරාකරණය මගින්;

i. ගෙවීම්, නිෂ්කාශන සහ පියවීම් පද්ධති ඇතුළුව මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය;

ii. බලපත්‍රලාභී බැංකුවල තීරණාත්මක කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම;

iii. රාජ්‍ය මූල්‍ය ආධාර අවම කිරීම මගින් මහජන මුදල් ආරක්ෂා කිරීම;

iv. එවැනි බැංකුවල තැන්පතුකරුවන්ගේ ආරක්ෂාව; සහ

v. වත්කම්වල වටිනාකම අනවශ්‍ය ලෙස හීන වීම වැළැක්වීම සහ ණයහිමියන්ට සිදුවන පාඩු සහ සමස්ත නිරාකරණ වියදම් අවම කර ගැනීමට උත්සාහ කිරීම සහතික කරනු ඇත.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මගින් එක් තැන්පතුකරුවෙකුට එක් ආයතනයක තැන්පතු වෙනුවෙන් ගෙවිය යුතු උපරිම වන්දි මුදල ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිහිටුවීමේදී රුපියල් 200,000 සිට මේ වන විට රුපියල් 1,100,000 දක්වා වැඩි කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය හරහා බලපත්‍ර අවලංගු කරන ලද/අත්හිටවූ මූල්‍ය සමාගම් හයක එනම්, සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (CIFL), ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් (TSCFL), ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ් (TKSFL), ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී (TFC), ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් (ETIFL) සහ ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පීඑල්සී (SFSP) හි, රක්ෂිත තැන්පතුකරුවන්ට වන්දි ගෙවීම් සිදු කරනු ලැබේ.

යෝජිත බැංකු (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීමත් සමඟ, නිත්‍යානුකූලව ස්ථාපිත කරන ලද තැන්පතු රක්ෂණ යාන්ත්‍රණය මගින් දැනට පවතින ("pay-box") ආකෘතිය වෙනුවට පුළුල් වූ ආකෘතියක්

සහිතව ක්‍රියාත්මක විය හැකි වනු ඇත. තවද, පරීක්ෂණ අවධියේ පවතින Depositor Wise Data Collection පද්ධතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හැකියාව සහ ගෙවීමේ සූදානම සහතිකවනු ඇත. තැන්පතු රක්ෂණ යාන්ත්‍රණය මගින් අවදානම් මත පදනම් වූ වාරික ක්‍රමය ක්‍රියාත්මක කිරීම හරහා මූල්‍ය ආයතන අධික අවදානම් ගැනීම වැළැක්වීම සහතික කරනු ඇති අතර වාරික ගෙවීමේ සාධාරණත්වය පිළිබිඹු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, ජාත්‍යන්තර මූල්‍ය ආයතන වැනි විකල්ප අරමුදල් මූලාශ්‍ර හරහා තැන්පතු රක්ෂණ යාන්ත්‍රනය සතු අරමුදල් ප්‍රමාණවත් වීම සහතික කෙරෙනු ඇති අතර රජය සමඟ උපස්ථ අරමුදල් සැලසුම් වලට එළඹීමෙන් හදිසි අරමුදල් අවශ්‍යතා සපුරා ගනු ඇත.

අතිරේකව, යථා කාලයේදී ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත නව හදිසි ණය සහ අත්තිකාරම් යාන්ත්‍රණයේ කෙටුම්පත අනුව සදාචාරාත්මක අවදානම් වළක්වා ගැනීම මූල්‍ය ආරක්ෂණ ජාල ක්‍රියාමාර්ගයක් ලෙස ක්‍රියාත්මක වන අතර අවසානයේ මෙමගින් මහ බැංකු ශේෂ පත්‍රයට සිදුවිය හැකි අහිතකර බලපෑම් වළක්වා ගැනීම සලකා බලයි.

මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සහතික කිරීම සඳහා සහ එයට සමගාමීව බැංකු අසාර්ථක වීම් නිරාකරණය කිරීමේ පිරිවැය අඩු කිරීම සඳහා, බුන්වත් බැංකුවල ප්‍රාග්ධනය ක්ෂය වීමට පෙර විවෘතව තැබීම වළක්වා ගැනීම සහ අසමත් බැංකු ඉක්මනින් වසා දැමීමට යෝජිත රෙගුලාසි සහ නීති මගින් ප්‍රමාණවත් පියවර ගන්නා බවට මහ බැංකුව සහතික විය යුතුය. මෙය සාක්ෂාත් කර ගත හැක්කේ, වට්ටම්කවුළු ණය දීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සතු අභිමතය අවම කරමින්, ද්‍රවශීලතා ගැටළු වලින් මුදවා ගැනීමට හැකියාවක් සහිත බැංකුවලට පමණක් ණය දීමට අවසර දීමෙන් සහ මූල්‍ය ආයතන කඩිනමින් නිරාකරණය මගිනි.

පමණක් යෙදී සිටින පරිසීමිත වෙළෙඳුන් (එනම්, මුදල් හුවමාරුකරුවන්) හට විධානද නිකුත් කරන ලදී. ඒ අනුව, ආර්ථික තත්ත්වය යම් ප්‍රමාණයකට ක්‍රමානුකූලව ස්ථාවර වීමත්, වසරේ අග භාගය වන විට සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධනයක් දක්නට ලැබීමත් සමඟ පරිසීමිත වෙළෙඳුන් විසින් වසර තුළ බැංකු පද්ධතියට එ.ජ. ඩොලර් මිලියන 159.8ක් තැන්පත් කර ඇති අතර එ.ජ. ඩොලර් මිලියන 10.5ක් අලෙවිකර ඇත. එය පෙර වසරට සාපේක්ෂව කාර්යසාධනයේ සැලකිය යුතු වර්ධනයකි.

ණය තොරතුරු

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය විසින් 2022 වසරේ දී, ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් වැඩි දියුණු කළ නවාංග රැසකින් සමන්විත අති නවීන ණය තොරතුරු කළමනාකරණ පද්ධතියක් දියත් කරන ලදී. ඒ අනුව, සාමාජික ණයදෙන ආයතන 9ක සහභාගීත්වයෙන් 2022 වසරේ මැයි මාසයේ දී ආරම්භ කළ නව පද්ධතියෙහි නියමු දියත් කිරීම, ඒ සඳහා සම්බන්ධ වූ සාමාජිකයින්ගේ ධනාත්මක ප්‍රතිචාර ද සමඟින් 2022 වසරේ ජූලි මාසයේදී සාර්ථකව නිම කරන ලදී. ඉන් අනතුරුව, නව පද්ධතියට හුරුවීම සඳහා සාමාජික ණයදෙන ආයතනවල සියලුම පරිශීලකයින් හට ප්‍රවේශය ලබා දෙමින්, නව පද්ධතිය සහ මෙතෙක් පැවති පද්ධතිය සමගාමීව ක්‍රියාත්මක කිරීම 2022 වසරේ අගෝස්තු මාසයේ දී ආරම්භ කරන ලදී. අනතුරුව, 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී ණය තොරතුරු කළමනාකරණ පද්ධතිය පරිපූර්ණ වශයෙන් දියත් කරන ලදී. මෙම නව පද්ධතිය මගින් ණය තොරතුරු කාර්යාංශය මගින් සිදු කරනු ලබන කාර්යයන් ඉහළ කාර්යක්ෂමතාවයකින් මෙන්ම ජාත්‍යන්තර භාවිතයන්ට අනුකූල වන අයුරින් ද සිදු කරනු ලබන අතර එහි නිෂ්පාදන කළඹ ද පුළුල් කරමින් ණයදෙන ආයතනවල ණය කළඹ වඩාත් හොඳින් කළමනාකරණය කිරීම සඳහා අවදානම් කළමනාකරණය සහ ණය ඇගයීමේ ක්‍රමවේදයන්හි විප්ලවීය වෙනසක් ඇති කෙරෙනු ඇත. මීට අමතරව, මෙම නව පද්ධතිය මගින් සාම්ප්‍රදායික නොවන දත්ත රැස් කිරීම සඳහා කාර්යාංශය සතු හැකියාව ද වැඩි දියුණු වනු ඇත.

මේ අතර, ණය තොරතුරු කාර්යාංශය විසින් ණයදෙන සාමාජික ආයතන වෙත 2022 වසරේ දී මිලියන 6.1ක ණය වාර්තා ලබාදීමෙන් ජාතික ණය ලේඛනය වශයෙන් වූ සිය ව්‍යවස්ථාපිත කාර්යභාරය අඛණ්ඩව සිදු කරන ලදී. කෙසේ වුවද, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී නිකුත් කරන ලද ණය වාර්තාවල සියයට 27ක අඩුවීමක් වාර්තා විය. 2022 වසර තුළ දී සාමාජික ණයදෙන ආයතන විසින් පාරිභෝගික ණය වාර්තා මිලියන 5.6ක් සහ ආයතනික ණය වාර්තා මිලියන 0.4ක් ලබාගෙන ඇත. තවද, 2022 වසර තුළ දී, ණය තොරතුරු කාර්යාංශය විසින් "තොග ඉල්ලීම්" මාදිලිය හරහා ණයදෙන ආයතන වෙත ණය වාර්තා 729,635ක් නිකුත් කර ඇත. මේ අතර, පෞද්ගලික ණය වාර්තා (iReports) සඳහා වන ඉල්ලුම 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 13.7ක අඩුවීමක් වාර්තා කළේය.

ශ්‍රී ලංකාව සඳහා තිරසර මූල්‍ය පෙර දැක්ම ක්‍රියාත්මක කිරීම

මහ බැංකුව විසින් අදාළ පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාවය ද ඇතිව 2022 වසරේ මැයි මාසයේ දී ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණය දියත් කරන ලදී. මෙම වර්ගීකරණය මගින් හරිත/දේශගුණික මූල්‍ය නිෂ්පාදන සහ සේවා සඳහා අරමුදල් රැස්කිරීමේ දී පාරිසරික වශයෙන් තිරසර ලෙස සැලකිය හැකි ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ මූල්‍ය ආයතනවලට මගපෙන්වීමේ අරමුණින් සවිස්තරාත්මක වර්ගීකරණයක් සපයනු ලබයි. 2019 වසරේ දී දියත් කරන ලද ශ්‍රී ලංකා තිරසර මූල්‍ය පෙර දැක්මෙහි කොටසක් ලෙස මෙම වර්ගීකරණය සිදු කළ අතර එය යුරෝපීය සහ චීන වර්ගීකරණයන් දෙකෙහිම සුසංයෝගයක් වන, තිරසර මූල්‍ය සඳහා වන ජාත්‍යන්තර පද්ධතිය (IPSF) විසින් හඳුන්වා දෙනු ලැබූ පොදු වර්ගීකරණය මත පදනම් විය. ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව විසින් මෙම වර්ගීකරණය වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය ලබා දුන් අතර සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, පරිසර අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය ඇතුළු තවත් පාර්ශ්වකරුවන් රැසක් මෙම ක්‍රියාවලියට සහභාගී විය.

2022 වසර තුළ දී, ශ්‍රී ලංකාව තුළ තිරසර මූල්‍ය පෙර දැක්ම ක්‍රියාවට නැංවීම අරමුණු කරගත් තවත් ක්‍රියාමාර්ග රැසක මහ බැංකුව නිරත විය. තිරසර මූල්‍ය කටයුතුවලදී මූල්‍ය ක්ෂේත්‍රයට අවැසි පාලනය සහ අවදානම් කළමනාකරණ රාමුවක් ලබා දීමේ අවශ්‍යතාවය සලකා බලමින්, ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණයට අනුව තිරසර මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීමේ මාර්ගෝපදේශ ඇතුළත් කරමින් මහ බැංකුව විසින් 2022 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා විධානයක් සහ බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා මාර්ගෝපදේශයක් නිකුත් කරන ලදී. තවද, මුදල් අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද ස්වෛරීත්ව හරිත බැඳුම්කර නිකුත් කිරීම සඳහා හරිත බැඳුම්කර රාමුවක් සකස්කිරීමේ ක්‍රියාවලිය සඳහා දමහ බැංකුව සම්බන්ධ විය. ප්‍රාග්ධන වෙළඳපොළෙහි ප්‍රගමනය සඳහා තිරසර මූල්‍ය පෙර දැක්ම මගින් හඳුනාගත් නියාමන ක්‍රියාමාර්ගයක් වන හරිත බැඳුම්කර රාමුව සංවර්ධනය කිරීම සඳහා ආසියා සහ පැසිෆික් කලාප සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම (UNESCAP) තාක්ෂණික සහාය සපයයි. තවද, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව, ආසියා සහ පැසිෆික් කලාප සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම වැනි ජාත්‍යන්තර නියෝජිතායතන සහ අනෙකුත් අදාළ දේශීය සහ ගෝලීය පාර්ශ්වකරුවන් සමඟ මහ බැංකුව රට තුළ තිරසර මූල්‍යකරණ කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහිලා සමීපව කටයුතු කරයි.

8

සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය

		සංඛ්‍යා සටහන් අංක
1.	ජාතික නිෂ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය	1 - 42
2.	ආර්ථික සහ සමාජ යටිතල පහසුකම්	43 - 48
3.	මිල සහ වැටුප්	49 - 61
4.	විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති	62 - 96
5.	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය කටයුතු	97 - 115
6.	මුදල් ප්‍රතිපත්තිය, පොළී අනුපාතික, මුදල් සහ ණය	116 - 127
7.	මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ පද්ධති ස්ථායීතාව	128 - 147

බර සහ මිණුම්

පරිවර්තන සාධක

බ්‍රිතාන්‍ය ඒකක සඳහා මෙට්‍රික් ඒකක

අක්කර 1	=	හෙක්ටයාර (හෙ.) 0.405
රාත්තල් 1	=	කිලෝග්‍රෑම් (කි.ග්‍රෑ.) 0.454
දිගු ටොන් 1 (රා. 2,240)	=	මෙට්‍රික් ටොන් (මෙ.ටො.) 1.016
හොණ්ඩර 1	=	කිලෝග්‍රෑම් 50.802
සැතපුම් 1	=	කිලෝමීටර් (කි.මී.) 1.609
දිගු ටොන් සැතපුම් 1	=	මෙට්‍රික් ටොන් කිලෝමීටර් 1.635
අක්කරයකට රාත්තල් 1	=	හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 1.121
අක්කරයකට හොණ්ඩර 1	=	හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 125.535
එ.රා. පයින්ට් 1	=	ලීටර් 0.568
එ.රා. ගැලුම් 1	=	ලීටර් 4.55

මෙට්‍රික් ඒකක සඳහා බ්‍රිතාන්‍ය ඒකක

හෙක්ටයාර 1	=	අක්කර 2.471
කිලෝග්‍රෑම් 1	=	රාත්තල් 2.205
මෙට්‍රික් ටොන් 1 (කිලෝග්‍රෑම් 1,000)	=	දිගු ටොන් 0.984
මීටර් 1	=	අඩි 3.281
කිලෝමීටර් 1	=	සැතපුම් 0.621
මෙට්‍රික් ටොන් කිලෝමීටර් 1	=	දිගු ටොන් සැතපුම් 0.612
ලීටර් 1	=	එ.රා. පයින්ට් 1.76 = එ.රා.ගැ. 0.220
හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 1	=	අක්කරයට රාත්තල් 0.892

වී/සහල් පරිවර්තන

වී බුසල් 1 (රාත්තල් 46)	=	කිලෝග්‍රෑම් 20.87
වී මෙට්‍රික් ටොන් 1	=	වී බුසල් 47.92
	=	සහල් මෙට්‍රික් ටොන් 0.7
සහල් මෙට්‍රික් ටොන් 1	=	වී බුසල් 68.46
	=	වී මෙට්‍රික් ටොන් 1.43
අක්කරයකට වී බුසල් 1	=	හෙක්ටයාරයට වී කිලෝග්‍රෑම් 51.55

පොල්/පොල් නිෂ්පාදන පරිවර්තන

කපාපු පොල් (දිසිදි පොල්) මෙට්‍රික් ටොන් 1	=	පොල් ගෙඩි 8,960
පොල් තෙල් මෙට්‍රික් ටොන් 1	=	පොල් ගෙඩි 9,250
කොප්පරා මෙට්‍රික් ටොන් 1	=	පොල් ගෙඩි 5,500
උකු කළ පොල් කිරි මෙට්‍රික් ටොන් 1	=	පොල් ගෙඩි 4,000

කර්මාන්ත මූලය අනුව දළ ජාතික ආදායම (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)

රුපියල් මිලියන

ආර්ථික කටයුතු	2018	2019	2020 (ආ)	2021 (ආ)(ඇ)	2022 (ඇ)
කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය	**1,165,529**	**1,154,540**	**1,291,023**	**1,554,911**	**2,112,745**
1. ධාන්‍ය වගාව (වී හැර)	17,748	18,186	35,108	47,528	59,869
2. වී වගාව	136,184	132,031	179,453	184,588	267,729
3. එළවළු වගාව	121,355	118,117	147,502	171,581	256,315
4. උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග	3,648	3,930	5,263	5,134	9,384
5. පළතුරු වගාව	107,686	118,920	126,588	113,464	148,416
6. තෙල් සහිත පලතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් ෆාම්)	118,776	90,050	117,443	169,782	182,686
7. තේ වගාව	112,801	103,060	111,739	121,213	203,024
8. වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී)	3,285	2,121	3,808	4,535	4,162
9. කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළැටි වගාව	90,503	87,816	98,436	190,289	211,187
10. රබර් වගාව	30,606	24,914	29,363	49,241	62,491
11. වෙනත් බහුවාර්ෂික භෝග වගාව	28,312	35,404	41,000	42,222	63,676
12. කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන්	126,760	132,978	138,275	170,355	249,676
13. පැල බෝකිරීම	765	868	779	1,070	1,195
14. කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන්	24,385	26,139	26,849	37,369	44,181
15. වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන	55,956	55,415	56,811	58,533	74,032
16. කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීව වගාව	158,847	176,421	140,588	154,681	231,430
17. මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීව වගාව	27,913	28,170	32,018	33,327	43,291
කර්මාන්ත	**4,614,303**	**4,644,574**	**4,417,850**	**5,275,605**	**7,308,952**
18. පතල් හා කැණීම් කර්මාන්තය	368,863	366,638	317,949	355,214	451,139
19. ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය	905,427	905,062	951,961	1,097,498	1,705,041
20. රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනය	667,765	740,054	697,055	953,158	1,518,255
21. ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	31,087	30,340	28,253	28,785	38,087
22. කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය	65,001	79,846	76,555	84,358	119,671
23. අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන	44,880	78,430	61,084	62,754	44,390
24. රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	75,419	116,243	115,622	149,555	247,223
25. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන	100,841	112,302	105,789	146,604	174,031
26. ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන	130,289	168,971	158,007	200,824	290,128
27. ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන	76,655	87,436	84,430	113,642	143,466
28. යන්ත්‍රෝපකරණ නිෂ්පාදන	64,671	78,271	87,190	109,379	150,446
29. ගෘහභාණ්ඩ නිෂ්පාදනය	59,118	74,223	75,188	81,599	93,178
30. වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවිකිරීම	86,670	100,163	107,009	135,927	207,700
31. විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම	125,176	99,421	127,609	143,272	149,772
32. ජලය එක්රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීම	17,177	15,818	15,472	13,925	19,396
33. මලාපවහන කටයුතු, කසළ කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය	27,323	29,078	27,886	26,900	34,350
34. ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන්	1,767,942	1,562,278	1,380,791	1,572,211	1,922,678
සේවාවන්	**8,234,366**	**8,869,710**	**9,048,602**	**9,791,997**	**13,549,054**
35. තොග හා සිල්ලර වෙළඳාම	1,814,188	1,941,394	2,081,177	2,254,632	3,338,997
36. මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම	1,550,420	1,662,077	1,551,372	1,623,556	2,548,683
37. තැපැල් සහ කුරියර් සේවාවන්	17,198	18,558	19,746	21,385	23,346
38. නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන්	252,646	246,728	149,678	164,560	350,958
39. ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු	38,463	38,972	38,477	40,417	41,281
40. විදුලි සංදේශ සේවාවන්	87,669	97,850	108,286	124,833	96,523
41. පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය සහ තොරතුරු තාක්ෂණ සේවාවන්	181,146	212,369	239,218	309,878	427,644
42. මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවාවන් සහ ඒ ආශ්‍රිත වෙනත් සේවාවන්	558,310	599,130	722,084	880,471	1,497,227
43. රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණය	116,842	141,381	168,027	211,646	140,486
44. නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම	663,136	737,948	741,750	800,835	993,423
45. ව්‍යාත්තීයමය සේවාවන්	322,269	365,255	352,460	382,833	431,125
46. රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය	876,071	835,910	903,348	948,050	1,024,812
47. අධ්‍යාපනය	294,344	358,734	381,342	390,175	455,195
48. සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන්	275,980	335,800	381,273	432,013	467,715
49. වෙනත් පුද්ගලික සේවාවන්	1,185,685	1,277,604	1,210,362	1,206,712	1,711,640
මූලික මිල අනුව සමස්ත එකතු කළ අගය	**14,014,197**	**14,668,824**	**14,757,475**	**16,622,513**	**22,970,752**
භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු . සහනාධාර	1,337,736	1,242,152	914,060	977,678	1,176,974
වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)	**15,351,933**	**15,910,976**	**15,671,535**	**17,600,191**	**24,147,726**
විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම (ඇ)	-389,601	-441,394	-423,063	-395,539	-621,353
වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම	**14,962,333**	**15,469,582**	**15,248,473**	**17,204,651**	**23,526,373**

(අ) 2015 නව පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ (2010 පදනම් වර්ෂය වෙනුවට). 2015 වර්ෂයේ සිට දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ අන්තර්ගත වේ.

මූලයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(ආ) සංශෝධිත

(ඇ) තාවකාලික

(ඈ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයෙන් කුමන හෝ වෙනසක් වනුයේ ගණනය කිරීමේ දී ඇතිවන කාල පමාව හේතුවෙනි.

කර්මාන්ත මූලය අනුව දළ ජාතික ආදායම (2015 ස්ථාවර මිල අනුව) (අ)

රුපියල් මිලියන

ආර්ථික කටයුතු	2018	2019	2020 (ආ)	2021 (ආ)(ඇ)	2022 (ඇ)
කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය	**945,292**	**949,582**	**941,046**	**949,929**	**906,505**
1. ධාන්‍ය වගාව (වී හැර)	14,676	13,355	21,342	21,949	17,200
2. වී වගාව	106,333	112,919	121,663	107,359	93,377
3. එළවළු වගාව	105,072	102,037	111,088	109,147	99,960
4. උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග	3,116	3,275	4,021	3,729	3,797
5. පළතුරු වගාව	70,906	77,200	81,823	72,949	73,310
6. තෙල් සහිත පලතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් ෆාම්)	89,706	102,800	92,197	102,490	111,315
7. තේ වගාව	75,219	72,733	67,971	73,741	62,005
8. වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී)	1,748	1,302	1,613	1,352	1,229
9. කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව	91,543	90,880	93,776	98,021	101,235
10. රබර් වගාව	26,050	24,029	24,081	25,571	23,863
11. වෙනත් බහුවාර්ෂික භෝග වගාව	27,185	28,751	29,781	26,963	27,513
12. කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන්	94,582	90,284	86,907	94,039	81,874
13. පැල බෝකිරීම	795	772	622	813	881
14. කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන්	23,159	22,969	26,102	29,810	34,202
15. වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන	44,606	43,133	42,587	44,440	51,611
16. කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීව වගාව	149,782	141,700	111,307	112,814	95,451
17. මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීව වගාව	20,815	21,444	24,166	24,742	27,682
කර්මාන්ත	**4,101,467**	**3,933,728**	**3,724,566**	**3,937,880**	**3,309,764**
18. පතල් හා කැණීම් කර්මාන්තය	322,522	318,658	284,079	287,969	198,661
19. ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය	896,813	929,371	980,863	1,014,150	869,715
20. රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනය	463,618	469,028	416,312	473,911	512,399
21. ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	39,879	36,321	32,831	35,579	29,758
22. කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය	57,716	54,064	51,896	56,811	52,069
23. අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන	19,846	24,630	22,108	15,492	6,474
24. රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	88,399	90,144	92,157	95,793	82,350
25. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන	101,890	98,429	81,182	97,436	67,507
26. ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන	102,554	107,062	102,685	119,973	85,188
27. ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන	84,102	80,312	77,859	81,174	58,781
28. යන්ත්‍රෝපකරණ නිෂ්පාදන	64,638	66,114	65,187	73,090	59,181
29. ගෘහභාණ්ඩ නිෂ්පාදනය	88,078	95,470	81,651	82,694	60,837
30. වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවිකිරීම	97,155	96,432	87,586	101,048	79,088
31. විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම	175,518	184,041	180,176	188,924	177,783
32. ජලය එක්රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීම	15,857	14,701	15,908	13,083	13,168
33. මලාපවහන කටයුතු, කසළ කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය	27,271	29,253	28,960	27,992	29,088
34. ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන්	1,455,612	1,239,700	1,123,127	1,172,761	927,719
සේවාවන්	**7,099,084**	**7,307,036**	**7,166,506**	**7,414,251**	**7,265,095**
35. තොග හා සිල්ලර වෙළඳාම	1,579,590	1,636,752	1,650,889	1,675,083	1,672,370
36. මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම	1,370,263	1,398,230	1,313,312	1,325,233	1,372,116
37. තැපැල් සහ කුරියර් සේවාවන්	16,495	17,099	17,620	18,714	19,780
38. නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන්	230,929	216,976	128,556	130,743	166,059
39. ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු	40,839	42,752	43,841	42,161	37,510
40. විදුලි සංදේශ සේවාවන්	87,840	103,325	118,845	135,663	139,919
41. පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය සහ තොරතුරු තාක්ෂණ සේවාවන්	158,565	175,634	194,893	243,971	238,455
42. මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවාවන් සහ ඒ ආශ්‍රිත වෙනත් සේවාවන්	511,418	510,367	557,357	596,106	530,274
43. රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණය	111,838	120,550	117,595	148,665	78,509
44. නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම	580,367	610,231	604,259	630,570	554,473
45. වෘත්තීයමය සේවාවන්	282,095	297,462	287,781	301,890	289,841
46. රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය	600,932	605,938	616,176	621,834	629,213
47. අධ්‍යාපනය	267,448	283,605	284,751	290,475	301,510
48. සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන්	228,368	235,136	246,735	260,482	238,638
49. වෙනත් පුද්ගලික සේවාවන්	1,032,097	1,052,980	983,900	992,662	996,429
මූලික මිල අනුව සමස්ත එකතු කළ අගය	**12,145,842**	**12,190,346**	**11,832,118**	**12,302,060**	**11,481,364**
භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු . සහනාධාර	1,089,616	1,015,930	763,432	735,874	536,485
වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)	**13,235,458**	**13,206,276**	**12,595,550**	**13,037,934**	**12,017,849**
විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම	-340,683	-372,819	-336,620	-294,091	-304,249
වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම	**12,894,775**	**12,833,457**	**12,258,930**	**12,743,843**	**11,713,600**

(අ) 2015 නව පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ (2010 පදනම් වර්ෂය වෙනුවට). 2015 වර්ෂයේ සිට දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ අන්තර්ගත වේ.

(ආ) සංශෝධිත

(ඇ) තාවකාලික

මූලයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කර්මාන්ත මූලය අනුව දළ ජාතික ආදායම (අ)

රුපියල් මිලියන

කාලපරිච්ඡේදය		කෘෂිකාර්මික	කර්මාන්ත	සේවා	භාණ්ඩ හා සේවා මත පනවන ලද සහනාධාර අඩු කරන ලද බදු	ද.දේ.නි.	ද.ජා.ආ.
පවත්නා වෙළඳපොළ මිල							
2018		1,165,529	4,614,303	8,234,366	1,337,736	15,351,933	14,962,333
2019		1,154,540	4,644,574	8,869,710	1,242,152	15,910,976	15,469,582
2020 (ආ)		1,291,023	4,417,850	9,048,602	914,060	15,671,535	15,248,473
2021 (ආ)(ඇ)		1,554,911	5,275,605	9,791,997	977,678	17,600,191	17,204,651
2022 (ඇ)		2,112,745	7,308,952	13,549,054	1,176,974	24,147,726	23,526,373
2020 (ආ)	පළමු කාර්තුව	305,306	1,205,711	2,405,489	249,161	4,165,667	4,046,761
	දෙවන කාර්තුව	294,477	837,499	1,866,975	162,070	3,161,022	3,062,532
	තෙවන කාර්තුව	326,318	1,278,811	2,380,889	241,529	4,227,547	4,114,023
	සිව්වන කාර්තුව	364,921	1,095,829	2,395,249	261,300	4,117,300	4,025,167
2021 (ආ)(ඇ)	පළමු කාර්තුව	371,137	1,391,829	2,579,416	249,947	4,592,330	4,496,001
	දෙවන කාර්තුව	394,007	1,140,473	2,114,415	238,585	3,887,480	3,802,337
	තෙවන කාර්තුව	355,113	1,432,119	2,400,673	207,975	4,395,880	4,286,105
	සිව්වන කාර්තුව	434,653	1,311,184	2,697,494	281,170	4,724,501	4,620,209
2022 (ඇ)	පළමු කාර්තුව (ආ)	430,665	1,699,993	3,134,023	278,624	5,543,306	5,449,743
	දෙවන කාර්තුව (ආ)	549,069	1,793,716	2,823,585	275,993	5,442,362	5,271,366
	තෙවන කාර්තුව (ආ)	529,422	2,219,087	3,569,834	268,259	6,586,602	6,370,251
	සිව්වන කාර්තුව	603,589	1,596,156	4,021,613	354,099	6,575,456	6,435,014
ස්ථාවර (2015) මිල							
2018		945,292	4,101,467	7,099,084	1,089,616	13,235,458	12,894,775
2019		949,582	3,933,728	7,307,036	1,015,930	13,206,276	12,833,457
2020 (ආ)		941,046	3,724,566	7,166,506	763,432	12,595,550	12,258,930
2021 (ආ)(ඇ)		949,929	3,937,880	7,414,251	735,874	13,037,934	12,743,843
2022 (ඇ)		906,505	3,309,764	7,265,095	536,485	12,017,849	11,713,600
2020 (ආ)	පළමු කාර්තුව	224,001	1,030,038	1,917,378	215,190	3,386,607	3,291,245
	දෙවන කාර්තුව	215,264	720,905	1,473,013	132,039	2,541,221	2,461,910
	තෙවන කාර්තුව	244,219	1,058,131	1,875,863	204,554	3,382,767	3,292,785
	සිව්වන කාර්තුව	257,562	915,492	1,900,252	211,649	3,284,956	3,212,989
2021 (ආ)(ඇ)	පළමු කාර්තුව	233,575	1,097,762	1,999,974	206,689	3,537,999	3,463,868
	දෙවන කාර්තුව	240,190	883,911	1,583,741	185,209	2,893,051	2,828,217
	තෙවන කාර්තුව	236,244	1,039,389	1,846,925	153,252	3,275,811	3,193,724
	සිව්වන කාර්තුව	239,919	916,819	1,983,610	190,724	3,331,073	3,257,689
2022 (ඇ)	පළමු කාර්තුව (ආ)	223,222	1,057,366	2,035,646	203,165	3,519,400	3,458,741
	දෙවන කාර්තුව (ආ)	221,249	794,227	1,554,497	110,101	2,680,074	2,591,018
	තෙවන කාර්තුව (ආ)	220,362	817,545	1,768,873	93,874	2,900,654	2,806,053
	සිව්වන කාර්තුව	241,673	640,626	1,906,078	129,344	2,917,721	2,857,789

(අ) 2015 නව පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ (2010 පදනම් වර්ෂය වෙනුවට). 2015 වර්ෂයේ සිට දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ අන්තර්ගත වේ.

(ආ) සංශෝධිත

(ඇ) තාවකාලික

මූලයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කර්මාන්ත මූලය අනුව පළාත් දළ දේශීය නිෂ්පාදිතය (පවත්නා වෙළඳපොළ මිල අනුව) (2017-2021) (අ)

වර්ෂය/පළාත	බස්නාහිර	මධ්‍යම	දකුණ	උතුර	නැගෙනහිර	වයඹ	උතුරු මැද	ඌව	සබරගමුව	ශ්‍රී ලංකාව
ද.දේ.නි. (රු.මිලියන)										
2017	5,061,327	1,613,128	1,332,555	549,750	747,652	1,455,091	748,798	772,204	1,047,598	13,328,103
2018	5,595,202	1,676,090	1,447,992	598,885	797,183	1,531,660	817,205	777,237	1,049,454	14,290,907
2019 (ආ)	6,703,457	1,660,097	1,489,169	754,053	831,294	1,740,670	751,232	875,927	1,105,077	15,910,976
2020 (ආ)(ඇ)	6,616,934	1,655,492	1,425,534	655,584	918,637	1,715,526	788,154	820,005	1,075,670	15,671,535
2021 (ආ)(ඇ)	7,514,447	1,791,668	1,619,026	729,573	952,822	1,934,402	852,240	918,457	1,287,556	17,600,191
ද.දේ.නි. දයකත්වය (ප්‍රතිශතය)										
2017	38.0	12.1	10.0	4.1	5.6	10.9	5.6	5.8	7.9	100.0
2018	39.2	11.7	10.1	4.2	5.6	10.7	5.7	5.4	7.3	100.0
2019 (ආ)	42.1	10.4	9.4	4.7	5.2	10.9	4.7	5.5	6.9	100.0
2020 (ආ)(ඇ)	42.2	10.6	9.1	4.2	5.9	10.9	5.0	5.2	6.9	100.0
2021 (ආ)(ඇ)	42.7	10.2	9.2	4.1	5.4	11.0	4.8	5.2	7.3	100.0
ද.දේ.නි. ආර්ථික අංශ අනුව (රු.මිලියන)										
2017										
කෘෂිකාර්මික	101,464	148,838	185,018	77,185	107,167	144,208	83,700	102,682	93,733	1,043,994
කාර්මික	1,653,090	457,551	212,134	122,546	137,517	377,654	117,034	214,658	276,374	3,568,560
සේවා	2,836,492	856,853	811,586	298,938	433,498	798,027	478,489	383,114	580,151	7,477,148
ද.දේ.නි. (අඅ)	**5,061,327**	**1,613,128**	**1,332,555**	**549,750**	**747,652**	**1,455,091**	**748,798**	**772,204**	**1,047,598**	**13,328,103**
2018										
කෘෂිකාර්මික	107,257	144,971	187,689	90,923	133,470	191,511	108,798	89,987	92,066	1,146,672
කාර්මික	1,838,385	448,019	255,884	141,073	133,884	353,808	129,375	205,984	245,956	3,752,368
සේවා	3,179,429	942,269	882,754	316,568	462,846	857,646	510,367	415,959	623,252	8,191,090
ද.දේ.නි. (අඅ)	**5,595,202**	**1,676,090**	**1,447,992**	**598,885**	**797,183**	**1,531,660**	**817,205**	**777,237**	**1,049,454**	**14,290,907**
2019 (ආ)										
කෘෂිකාර්මික	123,519	124,015	185,250	103,491	108,932	221,604	95,227	98,100	94,404	1,154,540
කාර්මික	2,114,857	491,972	310,520	243,602	215,693	523,227	171,615	265,779	307,310	4,644,574
සේවා	3,941,749	914,509	877,142	348,092	441,771	859,947	425,742	443,666	617,091	8,869,710
ද.දේ.නි. (අඅ)	**6,703,457**	**1,660,097**	**1,489,169**	**754,053**	**831,294**	**1,740,670**	**751,232**	**875,927**	**1,105,077**	**15,910,976**
2020 (ආ)(අඅ)										
කෘෂිකාර්මික	136,548	158,700	179,731	100,770	120,488	240,312	137,647	113,286	103,540	1,290,023
කාර්මික	2,095,898	436,100	288,799	166,824	292,223	493,963	151,427	206,057	286,559	4,417,850
සේවා	3,998,547	964,134	873,858	349,752	452,346	881,191	453,110	452,834	622,831	9,048,602
ද.දේ.නි. (අඅ)	**6,616,934**	**1,655,492**	**1,425,534**	**655,584**	**918,637**	**1,715,526**	**788,154**	**820,005**	**1,075,670**	**15,671,535**
2021 (ආ)(අඅ)										
කෘෂිකාර්මික	158,078	213,281	237,622	104,458	137,334	268,119	164,386	146,523	125,110	1,554,911
කාර්මික	2,543,426	500,015	331,299	205,614	299,402	608,436	169,642	240,157	377,614	5,275,605
සේවා	4,395,521	978,845	960,169	378,974	463,158	950,393	470,870	480,758	713,309	9,791,997
ද.දේ.නි. (අඅ)	**7,514,447**	**1,791,668**	**1,619,026**	**729,573**	**952,822**	**1,934,402**	**852,240**	**918,457**	**1,287,556**	**17,600,191**

(අ) 2017 සහ 2018 වර්ෂවල දත්ත, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සම්පාදිත පාද වර්ෂ 2010 ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වන අතර 2019, 2020 සහ 2021 වර්ෂවල දත්ත පාද වර්ෂ 2015 ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

(ආ) සංශෝධිත

(ඇ) තාවකාලික

(අඅ) භාණ්ඩ හා සේවා මත පනවන ලද බදු සහ සහනාධාර ගැලපුම ඇතුළත් නොවන බැවින්, මෙහි කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන අංශවල අගයන්ගේ එකතුව ද.දේ.නි. අගයට සමාන නොවේ.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

සම්පත් සහ ඒවායේ උපයෝජනය (අ)

රුපියල් මිලියන

ශීර්ෂය	පවත්නා වෙළඳපොළ මිල අනුව					ස්ථාවර (2015) මිල අනුව				
	2018	2019	2020 (ආ)	2021 (ආ)(ඇ)	2022 (ඇ)	2018	2019	2020 (ආ)	2021 (ආ)(ඇ)	2022 (ඇ)
අ. සම්පත්										
දළ දේශීය නිෂ්පාදිතය	15,351,933	15,910,976	15,671,535	17,600,191	24,147,726	13,235,458	13,206,276	12,595,550	13,037,934	12,017,849
භාණ්ඩ සහ සේවා ආනයන	4,354,292	4,391,746	3,384,516	4,281,313	6,045,399	3,685,940	3,556,742	2,842,981	2,959,641	2,371,412
එකතුව	**19,706,225**	**20,302,722**	**19,056,051**	**21,881,503**	**30,193,125**	**16,921,399**	**16,763,018**	**15,438,531**	**15,997,575**	**14,389,261**
ආ. උපයෝජනය										
පරිභෝජනය	10,571,361	11,403,356	11,469,129	12,434,283	16,700,557	9,213,784	9,601,526	9,127,604	9,293,726	8,596,156
දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය	4,719,486	4,541,974	3,999,818	4,630,388	5,644,020	4,178,613	3,737,727	3,416,755	3,645,971	2,819,646
තොග/පරිලේඛන වෙනස්වීම් සහ වටිනාදේ අත්පත්කරගැනීම් සහ අතහැරීම	1,122,965	885,056	1,168,563	1,836,569	2,660,607	791,292	639,400	932,832	898,117	592,920
භාණ්ඩ සහ සේවා අපනයන	3,292,414	3,472,337	2,418,542	2,980,263	5,187,941	2,737,710	2,784,366	1,961,341	2,159,760	2,380,539
එකතුව	**19,706,225**	**20,302,722**	**19,056,051**	**21,881,503**	**30,193,125**	**16,921,399**	**16,763,018**	**15,438,531**	**15,997,575**	**14,389,261**

(අ) 2015 නව පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ (2010 පදනම් වර්ෂය වෙනුවට). 2015 වර්ෂයේ සිට දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ අන්තර්ගත වේ.

(ආ) සංශෝධිත

(ඇ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

පවත්නා වෙළඳපොළ මිල අනුව ප්‍රධාන එකතුවන්ගේ තුලනය (අ)

රුපියල් මිලියන

ශීර්ෂය	2018	2019	2020 (ආ)	2021(ආ)(ඇ)	2022(ඇ)
1. දළ දේශීය නිෂ්පාදිතය	**15,351,933**	**15,910,976**	**15,671,535**	**17,600,191**	**24,147,726**
එකතු කළා : විදේශීය ප්‍රාථමික ආදායම් ලැබීම් (ඇ)	40,204	44,989	36,766	22,965	84,209
අඩු කළා : විදේශීය ප්‍රාථමික ආදායම් ගෙවීම් (ඇ)	429,805	486,383	459,829	418,504	705,561
2. දළ ජාතික ආදායම	**14,962,333**	**15,469,582**	**15,248,473**	**17,204,651**	**23,526,373**
එකතු කළා : විදේශීය ජංගම සංක්‍රාම ලැබීම් (ඇ)	1,139,324	1,202,334	1,319,377	1,088,388	1,253,746
අඩු කළා : විදේශීය ජංගම සංක්‍රාම ගෙවීම් (ඇ)	139,821	171,644	168,589	53,694	94,272
3. වැයකළ හැකි දළ ජාතික ආදායම	**15,961,836**	**16,500,272**	**16,399,261**	**18,239,346**	**24,685,847**
අඩු කළා : අවසාන පරිභෝජනය	10,571,361	11,403,356	11,469,129	12,434,283	16,700,557
4. ජාතික ඉතුරුම්	**5,390,476**	**5,096,916**	**4,930,132**	**5,805,063**	**7,985,291**
එකතු කළා : ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ හිඟය (ඇ)	451,975	330,114	238,248	661,894	319,337
